2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.07.17 වේලාව: ප.ව 1.35

සටහන් කළේ - නිල්මිණි කුමාරි විසිනි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අධිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, රජයේ අධිනීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.
* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ දුතික පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි කැඳවීම ආරම්භ කරමි.

සාක්ෂි අංකය	:	**403**
නම	:	**නුගගහ කපල්ලෙ ඉලංගකෝන්**
වයස	:	**අවු 64යි**
ජාතිය	:	**සිංහල**
ආගම	:	**බුද්ධාගම**
දැනට දරණ තනතුර	:	**විශ්‍රාමික පොලිස්පති**
පෞද්ගලික ලිපිනය	:	**37/1/A, G.H. පෙරේරා මාවත, රත්තනපිටිය,බොරලැස්ගමුව**

ප්‍රතිඥා දී කැඳවයි.

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය

ප්‍ර: ඉලංගකෝන් මහත්මයා ඔබ මොන වසරේ ද පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණේ?

පි: 1980 ජනවාරි මාසේ 28 වෙනිදා.

ප්‍ර: ඔබ කුමන තනතුරකට දෙපාර්තමේන්තුවේ බැඳුනේ ද?

පි: පළමුවෙන්ම උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන්.

ප්‍ර: ඒ පිළිතුරෙන් හඟවනවා ඔබ ඉන් අනතුරුව තනතුරේ වෙනස්වීමක් වුණාය කියලා මොකක්ද ඒ ?

පි: මම ඉන් පසුව 1982 මැයි මාසේ 20 වෙනිදා ආධුනික සහකාර පොලිස් අධිකාරිවරයෙක් වශයෙන් නැවත සේවයට ඇතුළු වුණා.

ප්‍ර: මා කිව්වොතින් නිවැරදිද ඔබ එසේ නැවත පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයට බැඳුණේ පොලිස් දෙපාර්තමේන්තුව මූලික වශයෙන් පොලිස් කොස්තාපල් , පොලිස් රියදුරු, උපපොලිස් පරීක්ෂක, ඒවගේම සහකාර පොලිස් අධිකාරි කියන තනතුරු වලට කෙළින්ම අයදුම් කරලා නිලධාරීන් බඳවා ගන්න නිසා කියලා?

පි: ඔබ හරි ස්වාමීනි.

ප්‍ර: එහෙම නම් ඔබට කියන්න පුළුවන්ද ඔබ 1982 මැයි 20 වෙනිදා සහකාර පොලිස් අධිකාරිවරයෙක් විදිහට බැඳුණාට පස්සේ පොලිස් දෙපාර්තමේන්තුවේ සේවයට නැවත එතැන් පටන් ඔබ මොන මොන ස්ථානවලද සේවය කරලා තියෙන්නේ කියලා?

පි: ස්වාමීනි මම සහකාර පොලිස් අධිකාරිවරයෙක් විදිහට පුහුණුවීම් වලින් පස්සේ පළමුවෙන්ම පත්වීම ලැබුණේ කුරුණෑගල දිස්ත්‍රික්කයට. කුරුණෑගල දිස්ත්‍රික්කයේ සහකාර පොලිස් අධිකාරි 3 වශයෙන් මම කටයුතු කරා. ඉන් පස්සේ 1983 සැප්තැම්බර් මාසේ පොලිස් විශේෂ කාර්ය බලකාය ආරම්භ කරන අවස්ථාවේදී ඒ ආරම්භක සාමාජිකයෙකු වශයෙන් බැඳිලා මම විශේෂ කාර්ය බලකායට මාරු කරා. ඉන් පස්සේ එම බලකායේ පුහුණුව ලබලා වසර 11ක් උතුරු හා නැගෙනහිර

FAIR COMMENT BY JEZEEM

ප්‍රදේශවල රාජකාරි කටයුතු කරා. කටයුතු වල නිරත වුණා. ඉන් පස්සේ 1994 නැවත වරක් විශේෂ කාර්ය බලකායෙන් ඉවත් වෙලා සාමාන්‍ය පොලිස් රාජකාරි වලට මම අනුයුක්ත වුණා මම. ඒ අනුව අනුරාධපුර කොට්ඨාශ බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා වශයෙන් වාර්තා කරා. ඒ කොට්ඨාශයේ අවුරුදු 3 1/3 පමණ කටයුතු කරා. ඉන් පසුව ගම්පහ කොට්ඨාශයට මාරුවීම් ලැබුණා කොට්ඨාශ භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා විදියට. එහේ වසරක් පමණ රාජකාරි කටයුතු කරනකොට පොලිස් විශේෂ කාර්යාංශය ඒ වෙනකොට බුද්ධි අංශය අඩපණවෙලා එහෙම නැත්නම් වසා දමලා තිබුණේ පොලිසිය. නැවත ආරම්භ කරනකොට එහි පළවෙනි අධ්‍යක්ෂකවරයා විදිහට මාව පත්කරා. ඒ අංශය භාර මතක විදිහට අවුරුද්දක් පමණ කටයුතු කරා. එහිදී මම නියෝජ්‍ය පොලිස්පති තනතුරට උසස් වීම් ලැබුවා එම අංශය භාර ඉන්න කාලය තුල. ඉන් පසුව මම බස්නාහිර පළාත උතුර භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විදිහට රාජකාරි කටයුතු කරා. එලෙස කටයුතු කරන කොට 2019 වගේ මතක විදිහට ජනාධිපති ආරක්ෂක අංශයේ භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විදිහට ඒ කියන්නේ එවකට හිටි ජනාධිපතිතුමිය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියට කොළඹ නගර ශාලාවේ දී බෝම්බ ප්‍රහාරයට ලක් වුණාට පස්සේ

ප්‍ර: ඒ කියන්නේ 2009 අවුරුද්දේ?

පි: 2009ය. 2009 නෙවේ මැතිනියනි. 1999 දෙසැම්බර් 18 වෙනිදා මට මතකයි ඒ ප්‍රහාරයේ දී එතුමියගේ ප්‍රධාන ආරක්ෂක නිලධාරියා වශයෙන් සිටි නියෝජ්‍ය පොලිස්පති වික්ටර් පෙරේරා මහත්මයාට තුවාල සිද්ධ වුණා. ඒ අවස්ථාවේ දී එතුමා අනතුරුට පත්වුණ නිසා පහුවදා මම ඒ ස්ථානයට මාරු කරා නියෝජ්‍ය පොලිස්පති වශයෙන්. ඒ අංශය බාරව මම අවුරුදු 6ක් රාජකාරි කරා. ඊට පස්සේ 2005 මම පොලිස් මූලස්ථානයට මාරු වුණා. පොලිස් මූලස්ථානයේ ටික කාලයක් සේවය කරලා 2005 ඉඳලා අවුරුදු 3ක් පමණ බස්නාහිර පළාත ඒ කාලය ඇතුළත මම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුරට උසස්වීම ලැබුවා. ලබලා බස්නාහිර පළාත භාරව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් අවුරුදු 3ක් විතර මට මතක හැටියට කටයුතු කරා. ඊට පස්සේ මගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව ආපහු පොලිස් මූලස්ථානයට ඇවිල්ලා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහායක සේවා වශයෙන් කටයුතු කරා. ඉන් පසුව මගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව මම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන තනතුරුට ඒ කියන්නේ පොලිසියේ දෙවැනි නිලයට මාව පත්වුණා. ඉන් පස්සේ 2011 එවකට සිටි පොලිස්පතිවරයා විශ්‍රාම ගියාට පස්සේ පොලිස්පති තනතුරට පත්වුණා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඉලංගකෝන් මහත්මයා 2011 ජුනි 29 වෙනිදා පොලිස්පතිවරයා විදිහට මේ ශ්‍රී ලංකාවේ වැඩ භාරගනු ලබන ඔබ එම තනතුරෙන් විශ්‍රාම ගියේ කවදාද?

පි: 2016 අප්‍රේල් මාසයේ 12 වෙනිදා.

ප්‍ර: එතකොට 1980 ජනවාරි 28 වෙනිදා උප පොලිස්පරීක්ෂකවරයෙක් විදිහට මුල් අවස්ථාවේ බැඳුණු විට පටන් 2016 අප්‍රේල් මාසේ 12 වෙනිදා දක්වා වූ මේ මුළු කාල පරිච්ඡේදය තුල දීම එහෙමනම් ඔබට මේ පොලිස් දෙපාර්තමේන්තුව පිළිබඳව ඉතා හොඳ මනා වැටහීමක් තියෙනවානේ?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: එහෙනම් ඔබට මේ ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන් ද පොලිස් දෙපාර්තමේන්තුවේ පරිපාලන ව්‍යුහය කොයි ආකාරයට ද ක්‍රියාත්මක වෙන්නේ කියලා ?

පි: පොලිස් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වන්නේ මූලික වශයෙන් අමාත්‍යවරයෙක් ඉන්නවා. අමාත්‍යවරයා සහ ඊළඟට අමාත්‍යාංශය භාර ලේකම්වරයෙක් ඉන්නවා. ඊළඟට ලේකම්වරයෙක්

ප්‍ර: මං මදක් බාධා කරන්නම් ඒ අවස්ථාවේ ඔබ කිව්වානේ අමාත්‍යවරයෙක් ඉන්නවා කියලා. ඔබ පොලිස්පතිවරයා විදිහට බැඳුණු වකවානුවේදී පොලිස් දෙපාර්තමේන්තුව එහි භාරව හිටියේ කුමන අමාත්‍යවරයාද කුමන අමාත්‍යාංශයක් යටතේ ද ඒ ආවේ?

පි: වැඩිකාල පරිච්ඡේදයක් පැවතුණේ ආරක්ෂක අමාත්‍යාංශ යටතේ. ටික කාලයක් නීතිය හා සාමය අමාත්‍යාංශය යටතේ පැවතුණා.

ප්‍ර: ඒ ඔබේ ධුර කාලයේ තුලදී?

පි: ඔබ හරි ස්වාමීනි.

ප්‍ර: ඊට පස්සේ ඔබ කිව්වානේ අමාත්‍යවරයෙක් යටතේ පැවැත්වෙනවා. ඊළඟට?

පි: අමාත්‍යවරයා ළඟට පොලිස්පතිවරයා. පොලිස්පතිවරයා මූලික වශයෙන් වග කියන්න ඕනේ ලේකම්වරයා හරහා අමාත්‍යවරයාට. ඊළඟට පොලිස්පතිවරයා තමන්ගේ රාජකාරි කටයුතු විමධ්‍ය ගත කරලා තියෙනවා. දිවයිනේ පළාත් 9 භාරව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු 9 දෙනෙක් පත් කර තිබෙනවා. එතකොට පොලිස්පතිවරයා වෙනුවෙන්. ඒ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු ඒ පළාතේ සිදු වෙන සියලුම කටයුතු සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට වගකිව යුතු වෙනවා. එතකොට මේ අපි කතා කරේ ප්‍රදේශිය පොලිස් පරිපාලන කටයුතු සම්බන්ධයෙන්. ඊළඟට පොලිස් මූලස්ථානය හරහා ක්‍රියාත්මක වන අපි කියනවා Functional Divisions කියලා. මේ අංශ වලත් සෑම

ප්‍ර: ඒ කියන්නේ අනුබද්ධ ක්‍රියාකාරී කොට්ඨාශ?

පි: ක්‍රියාකාරී කොට්ඨාශ. ඒ ක්‍රියාකාරී කොට්ඨාශත් භාරව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් එහෙම නැත්නම් නියෝජ්‍ය පොලිස්පතිවරයෙක්

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

සමහර අවස්ථාවල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් භාරව සිටිනවා. ඒ අංශ භාර සිටින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා හෝ නියෝජ්‍ය පොලිස්පතිවරයා හෝ ඉතාමත් කලාතුරකින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් ඒ තමන්ට පැවරී තිබෙන කොට්ඨාශ සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට සම්පූර්ණයෙන් වගකිව යුතු වෙනවා.

ප්‍ර: ඔබ කියනකොට මේ තමන්ට පැවරිලා තියෙන කොට්ඨාශය සම්බන්ධයෙන් ඔහු ඒ අදාළ නිලධාරියා, පොලිස්පතිවරයාට වගකියනවා කියලා එයින් අදහස් කරන්නේ කුමක්ද? ඔහුගේ වගකිම මොන ස්ථානයෙන් පටන් ගන්නේ මොන ස්ථානයෙන්ද ඉවර වෙන්නේ ?

පි: ඒ අපි පළාතක් ගත්තොත් ඒ පළාතේ සිදුවෙන සියලුම අපරාධ හෝ වේවා පරිපාලන කටයුතු හෝ වේවා ඒ සියලුම දේ සම්බන්ධයෙන් ඒ නිලධාරියා වගකියන්න ඕනේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වගකියන්න ඕනි පොලිස්පතිට. ඔහුගේ පරිපාලන සීමාවට අයිති නොවන එහෙම නැත්නම් බලතල වලට අයත් නොවන යම්කිසි සිද්ධියක් තියෙනවා නම් ඔහු ඒ කාරණාව පොලිස්පතිවරයාට යොමු කරන්න ඕනි.

ප්‍ර: මා කිව්වොතින් එහෙනම් නිවැරදිද පොලිස්පතිවරයා වෙනුවෙන් තමයි ඒ අදාල ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ඒ අදාළ රාජකාරිය සිදු කරනු ලබන්නේ අදාළ පළාතේ කියලා?

පි: එසේයි ස්වාමීනි. පොලිස්පතිවරයාගේ නියෝජිතයා.

ප්‍ර: ඊළඟට දැන් ඔබ ඒ කිව්වේ ක්‍රියාකාරී කොට්ඨාශ පිළිබඳව..

පි: පළාත් බදව ගත්තොත් ඊළඟට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා යටතේ අපි කියනවා. Range එක්ක කියලා ඒ කියන්නේ දිසාවක්. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට දිසාවන් 2ක් හෝ 3ක් බොහෝ විට ඇතුළත් වෙනවා. ඒ දිසාවක් භාරව නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් ඉන්නවා. එතකොට පරිපාලන ව්‍යුහය විදිහට ඒ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ඔහුගේ දිසාවේ කටයුතු සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට වගකියන්න ඕනි. ඊළඟට දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා යටතේ පොලිස් කොට්ඨාශ තියෙනවා. පොලිස් කොට්ඨාශ අවම වශයෙන් 2ක් තියෙනවා. සමහර තැන් වල 4 දක්වාත් යනවා. එතකොට මේ කොට්ඨාශ භාරව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් ඉන්නවා. එතකොට මේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා තමන්ගේ කොට්ඨාශයේ කටයුතු සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පතිවරයාට වගකියන්න ඕනි. ඊළඟට කොට්ඨාශයෙන් පල්ලෙහාට ගියාම පොලිස් දිස්ත්‍රික්ක කියලා තියෙනවා. පරිපාලන දිස්ත්‍රික්ක වලට වඩා වෙනස්. පොලිස් දිස්ත්‍රික්ක කියලා තියෙනවා. පොලිස් දිස්ත්‍රික්කයක් භාරව සහකාර පොලිස් අධිකාරිවරයෙක් හෝ පොලිස් අදිකාරිවරයෙක් ක්‍රියාකරනවා. මේ දිස්ත්‍රික්කයකට පොලිස් ස්ථාන 2ක් අවම වශයෙන් 2ක් ,3ක් , 4ක් දක්වා අයත් වෙනවා.

FAIR COMMENT BY JEZEEM

එතකොටා ඒ දිස්ත්‍රික්ක භාර නිලධාරියා ඒ තමන්ට අයිති පොලිස් ස්ථාන කීය හරි ඒ සංඛ්‍යාව සම්බන්ධයෙන් ඒවා කටයුතු සම්බන්ධයෙන් තමන්ගේ කොට්ඨාශය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා හෝ පොලිස් අධිකාරිවරයාට වගකිව යුතු වෙනවා. පොලිස් ස්ථානයක් භාරව ස්ථානාධිපතිවරයෙක් සිටිනවා. පොලිස් ස්ථාන අපි වර්ග කරලා තියෙනවා. A ශ්‍රේණිය, B ශ්‍රේණිය සහ C ශ්‍රේණිය කියලා.

ප්‍ර: ඒ මොන පදනම මතද එම වර්ගීකරණය සිදු කරන්නේ?

පි: ස්වාමීනි A ශ්‍රේණිය නැවත A1, A2, A3 කියලා බෙදලා තියෙනවා. මේ වර්ගීකරණය කරලා තියෙන්නේ මූලික කාරණා කිහිපයක් පදනම් කරගෙන ප්‍රධාන වශයෙන් ඒ ප්‍රදේශයේ සිදුවෙන අපරාධ සංඛ්‍යාව ගණනය කරලා ඊළඟට ප්‍රදේශයේ ජනගහනය, ඊළඟට ප්‍රදේශයේ විශාලත්වය මෙන්න මේ කියන ප්‍රධාන ඊළඟට ප්‍රදේශයේ තියෙන වැදගත්කම ගත්තොත් දැන් කොළඹ ගත්තොත් කොළඹ පොලිස් බල ප්‍රදේශයක විශාලත්වය සමහරක් විට 2 km^2 ක් වත් නැහැ. දැන් අනුරාධපුරය ගත්තොත් එහේ පොලිස් ස්ථානයක විශාලත්වය 10 km^2 , 15 km^2 වෙන්න පුළුවන්. ඒ වගේ ප්‍රදේශයේ තියෙන වැදගත්කම, ආර්ථිකමය වශයෙන් තියෙන වැදගත්කම ඒ ආදී සියලු කාරණා බලලා තමයි පොලිස් ස්ථානයක් වර්ගීකරණය කරන්නේ. ඒ ප්‍රදේශයේ තියෙන වැදගත්කම අනුව.

ප්‍ර: ඒ කියන්නේ ඉන්න ජනසංඛ්‍යාව, අපරාධ සිදුවීමේ ප්‍රවණතාවය ඒ සියල්ලත් සැළකිල්ලට ගන්නවද ඒ අවස්ථාවේදී?

පි: එසේමයි. ආර්ථිකමය වශයෙන් තියෙන වැදගත්කමත් බලනවා ආරක්ෂා කළ යුතු ආර්ථිකමය වැදගත්කමත්.

ප්‍ර: එතකොට දැන් එවැනි පොලිස් ස්ථාන වල ප්‍රධානියා විදිහට කටයුතු කරන්නේ කවුද?

පි: ඒ A1 ශ්‍රේණිය පොලිස් ස්ථානයක් භාරව සෑම විටම වගේ බොහෝ විට නොවේ සෑම විටම වගේ පත්වෙන්නේ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙක්. CI කෙනෙක්. A2 ශ්‍රේණියටත් බොහෝ විට මං හිතන්නේ 90%ක්ම පත්වෙන්නේ CI කෙනෙක්. IP කෙනෙක්. එහෙම නැත්නම් පොලිස් පරීක්ෂකවරයෙක්. කලාතුරකින් තමයි A2 ශ්‍රේණියට පත්වෙන්නේ. A3 ශ්‍රේණියට CI කෙනෙක් හරි එහෙම නැත්නම් IP කෙනෙක් හරි පත්වෙන්න පුළුවන්. එතනින් පල්ලෙහා B, සහ C ශ්‍රේණිවලට IP කෙනෙක් B ශ්‍රේණියට IP කෙනෙක් පත් වෙනවා. C ශ්‍රේණියට සමහරක් විට SI කෙනෙක් වුණත් පත්වෙන්නත් පුළුවන්. B ශ්‍රේණියටත් සමහර විට SI කෙනෙක් පත්වෙන්න පුළුවන්. ඒ ඒ නිලධාරියාට තියෙන දක්ෂතාවය අනුව.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ස්වාමීනි ඉතා ගෞරවයෙන් මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවේ අවධානයට යොමු කරනවා මෙතෙක් අපි විසින් මෙහෙය වන සාක්ෂි අතරතුරදී අපි කොමිෂන් සභාවේ අවධානය වෙත යොමු කර තිබෙනවා කාත්තන්කුඩි පොලිස් ස්ථානය A 2 ශ්‍රේණියේ පොලිස් ස්ථානයක් බවට වර්ගීකරණය කොට ඇති බව.

පි: ඒ 2ක දැන් මගේ මතයේ හැටියටනම් කාත්තන්කුඩි අනිවාර්යයෙන්ම CI කෙනෙක් සිටිය යුතු පොලිස් ස්ථානයක්. A2 ශ්‍රේණිය පොලිස් ස්ථානයක්නම්. ඒ ප්‍රදේශයේ තියෙන ජනගහනය සහ ඒ ප්‍රශ්න දිහා බැලුවාම A2 ශ්‍රේණියේ CI කෙනෙක් ස්ථානාධිපතිව සිටිය යුතු පොලිස් ස්ථානයක් කියන එක මගේ මතය.

ප්‍ර: එතකොට දැන් ප්‍රභූ ආරක්ෂාව සම්බන්ධයෙන් ගත්තාම කොයි ආකාරයට ද පොලිස් දෙපාර්තමේන්තුව ඒ සඳහා දායක වෙන්නේ ඔබේ ව්‍යුහය සැළකුවාම?

පි: ප්‍රභූ ආරක්ෂාව සම්බන්ධයෙන් කොට්ඨාශ කිහිපයක් යොදවලා තිබෙනවා. ප්‍රථමයෙන්ම ජනාධිපති ආරක්ෂක දිසාව. ඊළඟට අගමැති ආරක්ෂක දිසාව. ඊළඟට ඇමැති ආරක්ෂක දිසාව, ඊළඟට ගරු විනිසුරුතුමන්ලාගේ ආරක්ෂක දිසාව වෙනම තියෙනවා. ජනාධිපති ආරක්ෂක දිසාව භාරව නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් ඉන්නවා. අගමැති ආරක්ෂක දිසාව භාරව නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් ඉන්නවා. ඇමැති ආරක්ෂක දිසාව භාරව නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් ඉන්නවා. ඔවුන් යටතේ අධ්‍යක්ෂකවරු සහ ඊළඟට වෙනත් රාජ්‍ය නිවේදිත නිලධාරීන්, පොලිස් අධිකාරිවරුන් සහ සහකාර පොලිස් අධිකාරිවරු සහ අනිකුත් තනතුරු වල නිලධාරීන් කටයුතු කරනවා.

ප්‍ර: ඔවුන්ගේ රාජකාරිය වෙන්නේ මොකක්ද?

පි: ඔවුන්ගේ ප්‍රධාන රාජකාරිය වෙන්නේ තමන්ට පැවරී තිබෙන කොට්ඨාශයේ ප්‍රභූවරුන්ගේ ආරක්ෂාව සහතික කිරීම.

ප්‍ර: එහෙමනම් එම ආරක්ෂාව පිළිබඳව සහතික වීම ඔවුන්ගේ රාජකාරිය වන නිසා ඒ ප්‍රභූන්ගේ ඇතැම් අවස්ථාවල අවශ්‍යතාවයන් ඇති වෙනවද ඒ අදාළ ප්‍රභූවරයා සම්බන්ධයෙන් ආරක්ෂිත තත්වය පිළිබඳව තක්සේරු වාර්තාවක් කැඳවන්නට?

පි: විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමාගේ සහ අගමැතිතුමාගේ ආරක්ෂක විධි විධාන සම්බන්ධයෙන් ආරක්ෂක ප්‍රධානීන් ආරක්ෂක තක්සේරු වාර්තාවක් වරින් වර කැඳවීම විශේෂයෙන්ම කැඳවන්නේ රාජ්‍ය බුද්ධි සේවයෙන් කැඳවනවා. විශේෂයෙන්ම දැන් අතිගරු ජනාධිපතිතුමා හෝ ගරු අග්‍රාමාත්‍ය තුමා උතුරු නැගෙනහිර ප්‍රදේශ වල සංචාරයක් කරනවානම් අනිවාර්යයෙන්ම වගේ ආරක්ෂක තත්ව වාර්තාවක් රාජ්‍ය බුද්ධි සේවයෙන් කැඳවනවා. ආරක්ෂක විධිවිධාන සාම්පාදනය කරන්නට කළින්. එහෙම නැතත් සාමාන්‍ය තත්වය යටතේ වුණත් ඒ අය

LEAK COMMENT BY JEZEEM

කාලානුරූපීව වරින් වර බුද්ධි වාර්තා, තත්ව වාර්තා කැඳවීම සිදු කරනවා. ඇමැති ආරක්ෂක අංශය සාමාන්‍යයෙන් එවැනි ක්‍රියාවක් සාම්ප්‍රදානුකූලව කරන්නේ නැහැ. යම්කිසි අමාත්‍යවරයෙකුට විශේෂ තර්ජනයක් තිබ්බොත් තොරතුරක් ලැබුණොත් පමණක් අර වගේ බුද්ධි වාර්තාවක් කැඳවනවා.

ප්‍ර: දැන් එතකොට ඔය පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් විශේෂ කාර්යාංශයක් තිබෙනවානේ?

පි: ඔබ හරි ස්වාමීනි.

ප්‍ර: ඒ විශේෂ කාර්යාංශය මොකටද පිහිටවලා තියෙන්නේ ?

පි: රාජ්‍ය බුද්ධි සේවය කියන්නේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයක්. ඒ ආයතනය සෘජුවම පොලිසියට එහෙම නැත්නම් පොලිස්පතිට බුද්ධි තොරතුරු සැපයීමට බැඳිලා නැහැ. එමනිසා පොලිස්පතිගේ බුද්ධි අංශය තමයි පොලිස්පති යටතේ ක්‍රියාත්මක වෙන බුද්ධි අංශය තමයි පොලිස් විශේෂ Special Branch එක.

ප්‍ර: විශේෂ කාර්යාංශය?

පි: පොලිස් විශේෂ කාර්යාංශ. ඒක පොලිස්පතිගේ බුද්ධි අංශය.

ප්‍ර: එතකොට පොලිස් විශේෂ කාර්යාංශය කෙළින්ම වගකියනවද පොලිස්පතිවරයාට?

පි: පොලිස් විශේෂ කාර්යාංශය සෘජුවම පොලිස්පති යටතේ ක්‍රියාත්මක වන දිසාවක්.

ප්‍ර: දැන් ඔබ ඔය කරුණ කිව්ව නිසා මා ඔබේ අවධානයට යොමු කරන්නට කැමැතියි රාජ්‍ය බුද්ධි සේවාව. රාජ්‍ය බුද්ධි සේවාව පොලිස්පතිවරයා යටතේ ඔහුගේ පාලනය යටතේ තිබෙන සේවාවක්ද?

පි: රාජ්‍ය බුද්ධි සේවාව ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයක්. නමුත් මේ රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් මං හින්නේ 90%කටත් වැඩි කොටසක් මං හිතන්නේ 99% ගත්තොත් වැරදි නැහැ සිටින්නේ පොලිස් නිලධාරින්. ඒක නිසා ඔවුන්ගේ විනය සහ පරිපාලන කටයුතු උසස්වීම්, මාරුවීම් , විනය ඒ කටයුතු සිදු කරන්නේ පොලිස්පතිවරයා පොලිස් දෙපාර්තමේන්තුවෙන්. නමුත්, operational deployment, operational duties ඒ සියල්ල සිද්ධ වෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් සහ ඔවුන්ගේ කටයුතු පිළිබඳව බුද්ධි සම්බන්ධ සියලු කටයුතු නියාමනය වෙන්නේ සහ වාර්තා කිරීම් සිදු වෙන්නේ ආරක්ෂක ලේකම්වරයාට.

ප්‍ර: මා ඔබේ අවධානයට C – 1 වශයෙන් ලකුණු කොට තිබෙන Organizational Structure of Sri Lanka Police වශයෙන් මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් වෙලා තියෙන ලේඛනයක් යොමු කරනවා එහි පළමුවෙනුවෙන්ම තිබෙනවා. පොලිස්පතිතුමා ඉහළින් ඉන්නවා. එතුමා යටතේ Functional ඒ කියන්නේ ක්‍රියාකාරී සහ Territorial

FAIR COMMENT BY JEZEEM

ප්‍රදේශිය වශයෙන් මේ පොලිසියේ තියෙන කොටස් 2 බෙදිලා ඔවුන් ඒ අංශ 2 යටතේ එන්නේ මොන මොන නිලධාරීන්ද කියන එක ලැයිස්තු ගත කොට තිබෙනවා නේද?

පි: ඔබ හරි ස්වාමිනි.

ප්‍ර: එහි අවසානයේ Inspector General of Police යටතේ වම්පැත්තේ දක්වලා තිබෙන පොලිස් නිලධාරීන් තනතුරු සහ නාම තිබෙනවා. එහි අවසානයට තියෙනවා නේද State Intelligence Service කියලා?

පි: ඔබ හරි ස්වාමීනි.

ප්‍ර: මට දැන ගන්නට අවශ්‍ය වෙන්නේ මේක නිවැරදි ද කියන එක පමණයි?

පි: මේක යම්කිසි දෝෂ සහගත තත්වයක් තියෙනවා.

ප්‍ර: ඇයි ඔබ කියන්නේ එය සදොස් කියලා?

පි: දෝෂ සහගතයි. State Intelligence Services කියන එක මම මුලින් කිව්වා වගේ මේක ආරක්ෂක අමාත්‍යාංශයේ යටතේ පවතින ආයතනයක්. මේක පරිපාලන සහ විනය කටයුතු මම මුලින් කිව්වා වගේ ඒ කටයුතු පමණක් පොලිස් මූලස්ථානයෙන් සිදු වෙනවා. ගරු ස්වාමීනි දැන් ඒක ඉතාමත් පැහැදිලිවම SIS එක භාරව ඉන්නේ ජෙනරල්වරයෙක්. යුධ හමුදාවේ ජනරල්වරයෙක් තමයි දැන් SIS ප්‍රධානියා.

ප්‍ර: මේජර් ජනරාල් සලේ?

පි: ඔව්.

ප්‍ර: එතකොට ඔහු එන්නේ නැහැ පොලිස් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතට. පොලිස්පතිවරයාගේ. ඒක හොඳම උදාහරණය. එහෙමනම් මා කිව්වොතින් නිවැරදිද ?

පි: වර්තමානයේ රාජ්‍ය බුද්ධි සේවයේ කටයුතු කරන්නේ යුධ හමුදාවේ මේජර් ජෙනරල්වරයෙක්. ඔහු පොලිස්පතිවරයාගේ පාලනයට යටත් වෙන කෙනෙක් නෙවෙයි.

ප්‍ර: ඒක නිසා ඔබ කියන්නේ එයම හොඳ නිදසුනක්. රාජ්‍ය බුද්ධි සේවය පොලිස්පතිවරයාගේ පාලනයට වැටෙන්නේ නැහැ කියන කරුණ support කිරීම සඳහා.

පි: ඔබ හරි ස්වාමිනි.

ප්‍ර: එහෙනම් C- 1 වශයෙන් ලකුණු කරලා ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරලා තියෙන මේ ලේඛනයේ පොලිස් දෙපාර්තමේන්තුවේ පරිපාලන ව්‍යුහය දක්වන මේ පළමුවෙන පිටුවේ තියෙන මේ සටහනේ වම් පස අවසානයට දක්වලා තියෙනවා. State Intelligence Service කියලා පොලිස්පතිතුමාගේ යටතේ එන බව දක්වමින් ඊතලයක් මාර්ගයෙන්. ඔබ කියන්නේ එම සටහන එහෙනම් ඔය කියන කරුණු මත දෝෂ සහගත බව පොලිස්පතිතුමා පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විදිහට

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

එහෙමනම් රජය සමඟ කටයුතු කරනකොට ඔහුට වගකීමක් තියෙනවා නේද?

පි: ශ්‍රී ලංකා පොලිසියේ සිදුවෙන සියලුම කටයුතු සම්බන්ධයෙන් පොලිස්පතිවරයා අමාත්‍ය ලේකම්වරයා හරහා අමාත්‍යවරයාට වග කියන්න ඕනි.

ප්‍ර: එතකොට ශ්‍රී ලංකාවේ ජීවත් වෙන ජනතාවගේ ආරක්ෂාව සම්බන්ධයෙන් මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් පොලිස්පතිවරයාට මොනවගේ වගකීමක් ද තියෙන්නේ?

පි: දිවයිනේ නීතිය හා සාමය ආරක්ෂා කර ගැනීමේ වගකීම පැවරිලා තියෙන්නේ ශ්‍රී ලංකා පොලිසියට. ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධානියා වශයෙන් දැන් ඒකේ මූලික වගකීම පැවරෙන්නේ පොලිස්පතිට. පොලිස්පති ඒ වගකීම තමන්ගේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු හරහා විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් හරහා ඒ බලය විමධ්‍යගත කරලා තියෙනවා අනිත් නිලධාරීන්ට.

ප්‍ර: ඒ බලය බෙදා හැරීමේ පරමාර්ථය වන්නේ එහෙමනම් පොලිස්පතිවරයාට මේ සියලුම ස්ථාන වල ඉන්න බැරි නිසා ඒ ඒ ස්ථාන වලින් සිදුවන්නට ඕනි නීතිය හා සාමය රැකීමේදී පොලිස් දෙපාර්තමේන්තුවෙන් අපේක්ෂිත වූ ඒ අභිලාෂයන් ඉෂ්ඨ සිද්ධ කරගැනීම නේද?

පි: නිවැරදියි ස්වාමීනි. පොලිසිය කියන්නේ 85000ක මං හිතන්නේ දැන් ඊටත් වැඩියිද දන්නේ නැහැ. මගේ කාලේ 85000කට ආසන්න හට පිරිසක් සිටි විශාල ආයතනයක්. ඒ නිසා පොලිස්පතිවරයෙකු තනිවම 85000ක් මෙහෙයවන්න බැහැ. ඒ නිසා ඒකට පරිපාලන ව්‍යුහයක් සකස් කරලා තිබුණා. ඒ ඒ ව්‍යුහය හරහා ඒ අංශ වලට නිලධාරීන් පත්කරලා ඒ අයට ඒ වගකීම පවරලා ඒ විමධ්‍යගත එහෙම නැත්නම් ඒ බලය බෙදා හැරීම තුලින් ඒ තමන්ගේ පොලිස්පතිගේ කාර්ය භාරය ඉටුකරගැනීම තමයි අනුගමනය කළ ක්‍රමවේදය.

ප්‍ර: ඒ හැරෙන්නට දැන් ඔබගේ ධුර කාලය ගැන සළකලා බැලුවාම 2011 ඉඳලා 2016 වෙනකම් ඔය වකවානුව තුලදී ඔබගෙන් යම් යම් අවස්ථාවල දී ගරු ජනාධිපතිතුමා රටේ සිදුවන යම්දේවල් පිළිබඳව ප්‍රශ්න කරන්නට ඇති?

පි: ස්වාමීනි ජනාධිපතිතුමා මම මුලින්ම සඳහන් කරා වගේ පොලිස් දෙපාර්තමේන්තුව වැඩිකාලයක් මගේ පොලිස්පති තනතුර දරපු කාලයෙන් වැඩිකාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ පැවතුණේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ. ඒ කියන්නේ ජනාධිපතිතුමා අමාත්‍යවරයා වශයෙන් සිටියේ. ඒක නිසා යම් යම් කරුණු සම්බන්ධයෙන් මට කතා කරපු අවස්ථාවල් තිබුණා. ඒත් එක්කම දිවයිනේ යම් යම් වැදගත් සිදුවීම් ඊළඟට මහජන කැළඹීම් ඊළඟට රජයේ අවධානය යොමු විය යුතු සිද්ධින් ඒ වගේ දේවල් වාර්තා වුණහම මම ඒ

FAIR COMMENT BY JEZEEM

සම්බන්ධයෙන් අමාත්‍යාවරයා විදිහට ලේකම්වරයාත් ජනාධිපතිතුමාත් දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් තිබුණා. සමහර විට දෛනිකව තිබුණා. දෛනිකව දැනුවත් කරා.

ප්‍ර: ඔබගේ ධුර කාලය තුලදී පොලිස්පති තනතුරෙහි ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විදිහට නැත්නම් ජනාධිපතිවරුන් විදිහට ජනාධිපති ධුරය දැරුවේ කවුද?

පි: ගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පමණයි මගේ මතකයේ හැටියට. මගේ කාලයේ ආරක්ෂක ඇමතිතුමා වශයෙන් ජනාධිපතිවරයෙක් විදිහට කටයුතු කළේ.

ප්‍ර: එතකොට එතුමාම තමයි ඔබ කියන විදිහට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙහි අමාත්‍යවරයා විදිහටත් රාජකාරි කරනු ලැබුවේ?

පි: නිවැරදියි ස්වාමීනි. ඊට අමතරව නීතිය හා සාමය අමාත්‍යාංශය පවතින කාලයේ ගරු ජොන් අමරතුංග අමාත්‍යතුමා ඊළඟට සාගල රත්නායක ඇමැතිතුමා . මෙතුමන්ලා දෙන්නාත් මගේ අමාත්‍යවරයා විදිහට කටයුතු කරා. එතකොට

ප්‍ර: එතකොට ඔබ 2016නේ විශ්‍රාම ගියේ?

පි: ඔබ හරි ස්වාමීනි.

ප්‍ර: එහෙනම් 2015දී රජයේ වෙනස්වීමක් ඇතිවුණා නේද පවතින රජයේ?

පි: නිවැරදියි ස්වාමීනි.

ප්‍ර: එතකොට එහෙමනම් ඔබ යම්කිසි කාලයක් තුලදී එවකට ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ධුරකාලයෙන් පසු අනුප්‍රාප්තිකයා වුණ ගරු ජනාධිපති සිරිසේන මැතිතුමාගේ ධුරකාලය තුලදීත් පොලිස්පතිවරයා විදිහට එම තනතුර දැරුවා නේද?

පි: නිවැරදියි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ ඒ කාලයේ දී ඒ කියන්නේ එවකට ගරු ජනාධිපති සිරිසේන මැතිතුමාත් ඔය විෂය ඒ කියන්නේ ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයා විදිහට කටයුතු කළාද එතකොටත් ඔබේ ධුර කාලය තුළ?

පි: 2015 ඒ නව රජය පත්වීමත් සමඟම නීතිය හා සාමය අමාත්‍යාංශයටයි පොලිසිය භාර වුණේ. එතනදී ජෝන් අමරතුංග ගරු අමාත්‍යතුමාටයි අමාත්‍යාංශය පැවරුණේ.

ප්‍ර: ඒවගේම ඔබ කිව්වා එවකට ගරු අමාත්‍ය සාගල රත්නායක මැතිතුමත් මේ අමාත්‍යාංශයේ කටයුතු කරනු ලැබුවාය කියලා?

පි: ඒ ජෝන් අමරතුංග අමාත්‍යතුමාගෙන් පස්සේ .

ප්‍ර: එතකොට එහෙනම් ඔබගේ ධුරකාලය තුලදී ඔබ කියන විදිහට ඔබේ පොලිස් දෙපාර්තමේන්තුව අයත්වුණ අමාත්‍යාංශය භාර අමාත්‍යවරු, ඒවගේම ඇතැම්විට ජනාධිපතිවරයා වෙන්නට පුළුවන්. ගරු අග්‍රාමාත්‍යවරුන් ඒවගේම යම් යම් අවස්ථාවල ගරු ඇමැතිවරුන් සහ තවත් තොරතුරු දැන ගැනීම සඳහා වූ යම් යම් තැනැත්තන් ඔබව

FAIR COMMENT BY JEZEEM

අමතලා රටේ තිබුණු යම් ආරක්ෂිත තත්වයන් පවත්නාවූ තත්වයන් පිළිබඳව ඔබෙන් ප්‍රශ්න කරන්නට ඇති නේද? ඔබෙන් කරුණු දැනගන්නට?

පි: මගේ රාජකාරි පිළිවෙත අනුව මම සාමාන්‍යයෙන් වාර්තා කරනු ලැබුවේ රාජකාරියක් විදිහට මගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ අමාත්‍යාංශය භාර අමාත්‍යාංශයට පමණයි මම වාර්තා කළේ. නමුත් යම්කිසි විදිහකින් ගරු අග්‍රාමාත්‍ය තුමා හෝ ගරු ජනාධිපතිතුමා අමාත්‍යවරයා නොවෙන එනම් ඒ අවස්ථාවේ කාලයේදී ජනාධිපතිතුමා හෝ වෙනත් කවුරුහරි මගෙන් රාජකාරි කටයුත්තක් ගැන හරි ඒ සම්බන්ධයෙන් විමසීමක් කලොත් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබදීම සිද්ධ කරා.

ප්‍ර: ඔව් ඉලංගකෝන් මැතිතුමනි දැන් ඒ ආකාරයට ඔබෙන් යම් තොරතුරක් දැන ගැනීම සඳහා ඔවුන් ඔබෙන් ඇහුවොතින් එහෙම රටේ පවතින තත්වයක් පිළිබඳව තියෙන ප්‍රශ්නයක් පිළිබඳව ඔවුන්ට තොරතුරු ලබාදීම සඳහා ඔබ කොහොමද තොරතුරු රැස් කරගත්තේ? මොකක් හරි ක්‍රමවේදයක් ඔබ ඒ සඳහා සකස් කරගෙන හිටියද?

පි: ස්වාමීනි පොලිස්පතිවරයා වශයෙන් මම දිවයිනේ සිදුවෙන සිදුවීම් සම්බන්ධයෙන් දෛනිකව සෑම විටම අවධානයෙන් සිටියා. ඒක මේ මගේ තනතුරේ කාර්යභාරය ඉෂ්ඨ කිරීමට අත්‍යවශය කාරණයක් බව මම අවබෝධ කරගෙන හිටියා. අපි පොලිස් පරිපාලනය තුල මිරිහානයේ තියෙනවා අපේ සන්නිවේදන කොට්ඨාශයක් කියලා කොට්ඨාශයක් com center කියලා අපි ඉංග්‍රිසියෙන් කියනවා. මෙතන පැය 24 මුළුල්ලේ ක්‍රියාත්මක වෙන සන්නිවේදන මධ්‍යස්ථානයක් තියෙනවා. මේ සන්නිවේදන මධ්‍යස්ථානයට දිවයිනේ පොලිසිය භාරසීය තිස්ගාණක් තිබුණා මගේ කාලේ. දැන් ඊට වැඩියි. සෑම පොලිස් ස්ථානයකටම ගුවන් විදුලියෙන් රේඩියෝ එකෙන් අමතලා ඕනෑම අවස්ථාවක කතා කරන්නට පුළුවන්. ඊළඟට අපේ දෙපාර්තමේන්තු පරිපාලනය අනුව සෑම පොලිස් ස්ථානයකටම නියෝග තියෙනවා. ඒ පළාතේ තමන්ගේ බලප්‍රදේශයේ සිදුවෙන සියලුම වැදගත් සිද්ධීන් වහාම com center එකට එහෙම නැත්නම් මේ communication division එකට මධ්‍යස්ථානයට වහාම වාර්තා කරන්න ඕනි. පොලිස්පතිට දැනුම් දෙන්න ඕනි. පොලිස්පති වෙනුවෙන් ඒ ස්ථානයට දැනුම් දෙන්න ඕනි කියලා. ඒ අනුව යම්කිසි වැදගත් සිදුවීමක් බරපතල සිදුවීමක් වුණොත් වහාම ඒ මධ්‍යස්ථානය භාරව ඉන්නවා රාජ්‍ය නිවේදිත නිලධාරියෙක් හැම විටම පැය 24මේ. ඔහු පොලිස්පතිවරයා දැනුවත් කරනවා. යම්කිසි වැදගත් සිදුවීමක් හටගෙන තිබුණොත් වහාම එය එසැනින්ම පොලිස්පතිවරයා දැනුවත් වෙනවා. ඊට අමතරව සෑම දවසකම උදෑසන 6 වෙනකොට අපි සිදුවීම් වාර්තාව කියලා වාර්තාවක් මෙතැනින් සකස් කරනවා. ඒ කියන්නේ දිවයිනේ මුළු

FAIR COMMENT BY JEZEEM

පොලිස් ස්ථාන භාරසීය ගානෙම ගතවෙච්ච පැය 24 තුල සිදු වුණ අපරාධ මීනිමැරුම් රථවාහන fetal accident මේ ආදී වශයෙන් අපේ තියෙනවා ලැයිස්තුවක් වාර්තා කළ යුතු සිද්ධීන්.

ප්‍ර: යම් ඉංග්‍රිසි අක්ෂරයකින් එය හඳුන්වනවාද?

පි: අපරාධනම් තියෙනවා ග්‍රහණ අපරාධ සහ D ගණයේ අපරාධ කියලා. ඒ සියල්ල අනිවාර්යයෙන්ම වාර්තා වෙන්න ඕනි පොලිස්පති මෙහෙයුම් මැදිරියට සහ තවත් තියෙනවා . fetal accidents ඊළඟට මහජන කැළැඹීම් ඊළඟට පුපුරන ද්‍රව්‍ය සොයාගැනීම් ත්‍රස්තවාදීන් අත්අඩංගුවට ගැනීම් ඒවගේ ලොකු ලැයිස්තුවක් තියෙනවා. ඒවාට අදාල සියලුම සිද්ධීන් මේ com center එකට වාර්තා වෙන්න ඕනි. ඒවා අල්ලලා හැමදාම දිනපතාම පාන්දර 6 වෙනකොට වාර්තාවක් සිද්ධීන් වාර්තාවක් සකස් කරනවා. ඒක උදේ පාන්දර පොලිස්පතිට ලැබෙන්න සලස්වනවා. පොලිස්පතිට අමතරව ඒක තවත් අමාත්‍යවරයාට ලේකම්වරයාට ඒ ආදී වශයෙන් පිටපත් යවනවා. ඒ අනුව දිනපතා උදෑසන 6 , 7 වෙනකොට පොලිස්පතිවරයා එදා කළින් දවසේ පැය 24 දිවයිනේ සිදු වුණු සියලුම දේවල් සම්බන්ධයෙන් බොහෝ දේවල් සම්බන්ධයෙන් දැනුවත් වෙලා සිටින්නේ. ඊට අමතරව මගේ ක්‍රමවේදය තිබුණා මම පාන්දර 5.30ට වගේ නැගිටලා

ප්‍ර: ඔබ ඒ පිළිතුරට යන්නට පෙර මම පොඩි ප්‍රශ්නයක් මම ඔබට බාධා කරමින් අහන්නට කැමැතියි. ඔබ ඔය සඳහන් කරපු ආකාරයට මෙහෙයුම් මැදිරියට අවශ්‍ය තොරතුරු ලබාදීම කාගේ වගකීම වෙනවද?

පි: පොලිස් ස්ථාන භාර නිලධාරීන්ගේ වගකීම.

ප්‍ර: හරි බොහොම ස්තුතියි. එතකොට ඔවුන් තමයි ඒ තොරතුරු සපයනු ලබන්නේ එහෙමනම් මෙහෙයුම් මැදිරියට?

පි: නිවැරදියි.

ප්‍ර: ඒවගේම ඔවුන් ඔවුන්ගේ අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ඒ තොරතරු ලබාදීම සිද්ධ කරනවද?

පි: එසේයි ස්වාමීනි. ඒ පොලිස්පති මෙහෙයුම් මැදිරියට බැහැර කරන පණිවිඩය අනිවාර්යයෙන්ම ඒගොල්ලෝ, ඒගොල්ලන්ගේ දිස්ත්‍රික්ක භාර සහකාර පොලිස් අධිකාරිවරයාට, කොට්ඨාශ භාර පොලිස් අධිකාරිවරයාට, නියෝජ්‍ය පොලිස්පතිවරයාට සහ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාටත් ඒකේ පිටපත් ඒ සමඟම යොමු කරනවා.

ප්‍ර: මා ඔබේ නැවත අවධානය යොමු කරනවා. ඔබ කිව්වා ඔබටම සකස් වුවෙනම ක්‍රමවේදයක් ඔබ හදාගෙන තිබුණායි කියලා ඔය පැහැදිලි කරපු ක්‍රමවේදය හැරෙන්නට. මොකක්ද ඒ ක්‍රමවේදය?

පි: මීට අමතරව මම දිනපතාම පාන්දර නැඟිට්ට ගමන්ම පළවෙනි කාර්ය විදිහට මෙහෙයුම් මැදිරියට Report එක එන්න කලින්ම කතා කරලා

FAIR COMMENT BY JEZEEM

වැදගත් දේවල් ගැන දැනුවත් වෙනවා. ඊට අමතරව පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් 9දෙනාටම මම දුරකථනයෙන් කතා කරනවා. කතා කරලා ඒ අයගෙනුත් දැනුවත් වීමක් කර ගන්නවා. ඒ සියල්ලම කරගෙන දවසේ උදෑසන 7 වෙනකොට සියල්ල සම්පූර්ණ කරගෙන දැනුවත් වෙලා ඉන්නවා පහුගිය පැය 24 තුල ලංකාවේ සිදුවුණේ මොකක්ද කියන එක.

ප්‍ර: එතකොට අර පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව තිබෙන පොලිස් විශේෂ කාර්යාංශය ඒ සමඟ ඔබ සම්බන්ධීකරණ කටයුතු කෙරුවද ඔබේ වකවානුව තුල දී?

පි: ස්වාමීනි මේ එන වාර්තාව සිදුවීම් වාර්තාව සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගෙන් ලැබෙන වාර්තා අනුව යම්කිසි සංකීර්ණතාවක් දක්වන සිද්ධියක් තිබුණොත් මම විශේෂ කාර්යාංශයේ අධ්‍යක්ෂකවරයාට කතා කරලා ඒ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කර ගැනීමක් සිදු කරනවා. යම්කිසි අවස්ථාවක ඒ ලැබෙන තොරතුරු මට ප්‍රමාණවත් නැත්නම් මම ඔහුට උපදෙස් දෙනවා. මේ ගැන වැඩිදුරටත් හොයලා මට මේකේ හරි තත්ත්වේ පැහැදිලි කරලා දෙන්න කියලා. එතකොට ඒ නිලධාරියා වැඩිදුරටත් ගැඹුරට ගිහිල්ලා ඒ ගැන හොයලා බලලා මේ මට වාර්තා කරනවා. එතකොට මම ලේකම්වරයා හෝ අමාත්‍යවරයා මේ ගැන විමසීමක් කරනකොට මම උදෑසන 7, 7.30 වෙනකොට ඒ සියලු දේ මම පිළිතුරු දෙන්න සූදානමින් ඉන්නවා.

ප්‍ර: ඒ කියන්නේ දෙනිකව ඔබ විසින් සිදු කරනු ලබන රාජකාරියක් පිළිබඳව තමයි ඔබ මේ පැහැදිලි කරනු ලැබුවේ?

පි: නිවැරදියි ස්වාමීනි. සමහර විට මම උදේ පාන්දර වෙනකොහේ හරි පිටව ගියොත් ඒ කටයුත්ත කෙරෙන්නේ නැහැ. බොහෝ විට යනගමන් දුරකතනයෙන් පුළු පුළුවන් විදිහට කතාකරනවා. එහෙම නැත්නම් මම නිවසේ ඉන්න බොහෝ විට ඒ ඉන්න වේලාවට මේක වැඩිපුර සතියේ වැඩි වශයෙන් ක්‍රියාත්මක වෙන ප්‍රායෝගික ක්‍රමවේදය ඒක වෙනස් වෙන්නේ බොහොම කලාතුරකින් මම පිටව ගිය දවසක කොළඹ හදිස්සියේ මේක ක්‍රියාත්මක වෙන්න ඉඩ තිබෙනවා. එදත් මම පුළු පුළුවන් වේලාවට දවසේ කොහේ හරි අවස්ථාවක් ලැබුණු වේලාවක අපේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරනවා.

ප්‍ර: ඔබ මේ ගරු කොමිෂන් සභාවට මේ සඳහන් කරලා ඉන්නේ නීතිය හා සාමය පිළිබඳව රටේ ජනතාවට වගකියනු ලබන ඒ ආරක්ෂා කරනු ලබන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විදිහට උදෑසන 7 වනවිට ඔබ දෙනිකව මෙහෙයුම් මැදිරියෙන් ලැබෙන තොරතුරු වලට ඔබ පෞද්ගලිකව අවශ්‍යතාවය ඇති වුණොත් ඒ එළැඹෙන අවස්ථානුගත කරුණු අනුව අදාල පුද්ගලයින්ව හා සම්බන්ධ වෙලා ඔබට අවශ්‍ය තොරතුරු ලබාගෙන ඒ තොරතුරු වලින් සන්නද්ධ වීමට හැම අවස්ථාවක පියවර ගත් බවද?

FAIR COMMENT BY JEZEEM

පි: නිවැරදියි. නිවැරදියි ස්වාමීනි. ඒක අත්‍යවශ්‍යයි. එහෙම නොවුණොත් මේ තනතුරේ කාර්යභාරය කරන්න අමාරුයි.

ප්‍ර: දැන් එසේ රැස්කර ගනු ලබන තොරතුරු වලට අමතරව දැන් යම් යම් අවස්ථාවන් වලදී විවිධ ආයතන විසින් ඔබ වෙත තොරතුරු ලැබෙනවා ඇතිනේ ලිඛිතව. උදාරහණයක් විදිහට ගත්තොත් ඔබේ දෙපාර්තමේන්තුවේ යටතේම තිබෙන ත්‍රස්ත මර්දන කොට්ඨාශය, ඒවගේම ඔබේ දෙපාර්තමේන්තුව යටතේ පවතින්නේ නැති වුණත් නමුත් ඇතැම් පරිපාලන කටයුතු සඳහා ඔබට බලය තිබෙන රාජ්‍ය බුද්ධි සේවය ඒවගේම ඔබේ අධීක්ෂණය යටතේ කෙළින්ම එන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඒකියන්නේ පොලිස්පතිවරයා යටතේ ඒවගේ ස්ථානවල සහ අනිකුත් ආයතන වලින් ලැබෙන ලිපි මඟිනුත් ඔබට තොරතුරු ලැබෙනවානේ?

පි: නිවැරදියි ස්වාමීනි. පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. දැන් රාජ්‍ය බුද්ධි සේවය මගේ යටතේ නොතිබුණාට නීතිය හා සාමය ජාතික ආරක්ෂාවට අදාළ බුද්ධි තොරතුරුක් තිබ්බොත් ඒ අය කෙළින්ම පොලිස්පතිවරයාට දැනුවත්කිරීමේ ප්‍රායෝගික වැඩපිළිවෙළක් තිබුණා. එය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබුණායැයි කියලා ඒ අය අපිව සම්පූර්ණයෙන්ම අමතක කිරීමේ ක්‍රමවේදයක් තිබුණේ නැහැ. ඒ වැදගත්කම අනුව අධ්‍යක්ෂකවරයා බොහෝ විට පොලිස්පතිවරයාට සෘජුව දැනුම් දීමේ ක්‍රමවේදයකුත් තිබුණා.

ප්‍ර: ඔබ පොලිස්පතිවරයා ලෙස සේවය කරපු 2011, 2016 වූ ඒකාල වකවානුව තුල දීත් රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා විදිහට රාජකාරි කෙරුවේ කුමන නිලධාරීන්ද ?

පි: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිලන්ත ජයවර්ධන මහත්මයා.

ප්‍ර: 2011 ඉඳලා?

පි: චන්ද්‍රා වාකිෂ්ඨ මහතා. 2015 ඉඳලා නිලන්ත ජයවර්ධන මහත්මයා.

ප්‍ර: එතකොට ඔබ කියන්නේ ඔබේ ධුර කාලයතුල දී මේ නිලධාරීන් දෙදෙනාගෙන්ම ඔබට අවශ්‍ය වූ සහාය ලැබුණු බවද?

පි: නිවැරදියි ස්වාමීනි. නීතිය හා සාමය පවත්වාගෙන යෑමටත් ජාතික ආරක්ෂාවට අදාළ යම් යම් තොරතුරු සම්බන්ධයෙනුත් ඒ අය තොරතුරු සැපයුවා පොලිස්පතිට.

ප්‍ර: එතකොට මා ඔබේ අවධානය යොමුකරමින් සිටියේ ඔය විවිධ ආයතන වලින් ඔබේ දෙපාර්තමේන්තුවේම විවිධ අංශ , විවිධ ඒකක මඟින් පොලිස්පතිවරයා වෙත ලැබෙන ලිඛිත තොරතුරු පිළිබඳව. ඒවා මොන ආකාරයට ද පොලිස්පතිවරයාගේ අවධානයට වෙත යොමු වුණේ ඔබේ වකවානුවේ කියලා දැන ගන්නට පුළුවන්ද?

පි: මගේ කාර්යාලයේ මගේ සහායට මාණ්ඩලික නියෝජ්‍ය පොලිස්පතිවරයා staff DIG. මාණ්ඩලික නියෝජ්‍ය පොලිස්පතිවරයෙක්

FAIR COMMENT BY JEZEEM

සහ පුද්ගලික සහකාර වශයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් වශයෙන් කාර්යාල 2ක් තිබුණා. එතකොට මට ලැබෙන ලියුම් සියල්ල මගේ මතකයේ විදිහට මාණ්ඩලික නියෝජ්‍ය පොලිස්පති තමයි විවෘත කරන්නේ.

ප්‍ර: මම එහිදි ඔබට යම් බාධාවක් කරන්න කැමැතියි. දැන් සාමාන්‍යයෙන් පොලිස්පතිවරයෙක්ට එවන ලියුම් ආකාර 2ට ආමන්ත්‍රණය කෙරෙන්න පුළුවන්නේ. එකක් තමයි තනතුරු නාමයෙන් පොලිස්පතිවරයා විදිහට. දෙවැනි එක තමයි පෞද්ගලික නමට. ඔබේ පෞද්ගලික නමට. දැන් ඒවගේ ලියුම් ආවාම ඔය විවෘත කිරීමේ යම් වෙනසක් තියෙනවද ඒ කියන්නේ ඒක පළවෙනි ප්‍රශ්නය? දෙවැනි ප්‍රශ්නය යම් අවස්ථාවක දී ඒ ලිපිය ඔබ විතරක් ඔබේ අවධානයට පමණක් යොමු විය යුතු බවට හඟවන ලබන යම් ආකාරයක සටහනක් එහි කවරයේ තියෙන්නට පුළුවන්. අන්න ඒ වගේ අවස්ථාවක දී කොයි ආකාරයට ද ඔබ ඔය සඳහන් කරනු ලබන ඒ ලිපි විවෘත කිරීම සිදු වුණේ?

පි: ලිපි විවෘත කිරීමේ දී මගේ නමින් ලියුම් ලැබුණොත් ඒ ලියුම් අනිවාර්යයෙන්ම මට පෞද්ගලිකව යොමු කරනවා. විවෘත කිරීමක් කිසිම නිලධාරියෙක් සිදු කරන්නේ නැහැ.

ප්‍ර: ඉලංගකෝන් මැතිතුමනි ඇයි ඒ?

පි: ඒක මගේ පෞද්ගලික නමට ආපු පෞද්ගලික ලියුමක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් ඒක රහසිගත ලියුමක් වෙන්න පුළුවන්. මම දැන ගත යුතු දෙයක් නිසා තමයි මගේ නමට එවන්නේ. එහෙම නැත්නම් ඒක තනතුරට එවන්නේ. විශේෂත්වයක් තිබෙන නිසා තමයි මගේ නමට පෞද්ගලිකව එවන්නේ. ඒ නිසා තමයි පෞද්ගලිකව ඒක මම විසින් විවෘත කළ යුතුයි. ඒ නිසා මම උපදෙස් දීලා තියෙන්නේ මගේ නමින් එන ලියුම් සියල්ල මම පුද්ගලිකව විවෘත කරන්න අවශ්‍යයි කියන එක.

ප්‍ර: එතකොට ඒ හැරෙන්නට ලියුම් කවරය බලලා ඔබ විතරක් ඒ කියන්නේ පොලිස්පතිවරයා විතරක් විවෘත කළ යුතුයි කියලා ඔබේ staff DIG එහෙම නැත්නම් පෞද්ගලික සහකාර ඒ දෙදෙනාට තීරණය කිරීමේ හැකියාවක් තිබුණද ?

පි: සමහර ලියුම් Secret කියලා එනවා. Confidential කියලා එනවා. මේවගේ විශේෂත්වයකින් එන ලියුම් අනිවාර්යයෙන්ම මට යොමු කරනවා ඒවා විවෘත කරන්නේ නැහැ.

ප්‍ර: ඇයි ඒ?

පි: දැන් Secret කියලා ගහන එක වෙන අය දකින්න අවශ්‍ය නැහැ. ඒක මම පමණක් දකින්න ඕනි මම පමණක් විවෘත කරන්න ඕනි කියන ලියුමක් කියන එකයි ඒකෙන් අදහස් වෙන්නේ. ඒ නිසා ඒක වෙනත් අය දකින්න අවශ්‍ය තාවයක් නැති නිසා කෙළින්ම ඒක මගේ අතට යොමු වෙනවා. මම තමා ඒක ඒ ලියමු විවෘත කරලා අවශ්‍ය නම් මම ඒක ඒ

FAIR COMMENT BY JEZEEM

නිලධාරීන්ට ඉදිරි කටයුතු සඳහා භාර දීම හෝ නොදීම මම තමයි තීරණය කරන්නේ.

ප්‍ර: එය ඔබ තමයි අභිමතය පරිදි තමයි එය සිද්ධ වෙන්නේ?

පි: නිවැරදියි.

ප්‍ර: එතකොට දැන් ඔය ආකාරයට ඔබ කොයි විදිහට ද මොන ලියුම්ද ඔබගේ වකවානුව තුල දී ධූර කාලය තුල දී staff DIGට ගියේ?

පි: අපි කොටස් 2කට බෙදලා තිබුණා මට ලැබෙන ලියුම්. staff DIG මෙන්න මේ කොටස් පුද්ගලික සහකාරට මේ කොටස් කියන එක. මගේ මතකයේ විදිහට පළාත් බද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ගෙන් ලැබුණු ලිපි සියල්ලම වගේ යොමු වුණේ පුද්ගලික සහකාරට ඒගොනු. ඊළඟට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රාජ්‍ය බුද්ධි සේවය මට අනිත් ඒවා මතක නැහැ. ඒවගේ වැදගත් ආයතන වලින් ලැබෙන ලියුම් සියල්ල පුද්ගලික මෙහෙයවුණේ මගේ මාණ්ඩලික නියෝජ්‍ය පොලිස්පතිවරයා. ඒවගේ දෙන්නාට කොටස් 2කට බෙදලා දීලා තියෙන්නේ.

ප්‍ර: පොලිස්පතිවරයා වෙත ලැබුණු ලිපි වලට ඇතැම් අවස්ථාවන් වලදී අවශ්‍යතාවය ඇති වන්නට ඇති ඒවා යම් කෙනෙක්ට යොමු කරලා යම් ආයතනකයට යොමු කරලා ඒ සම්බන්ධයෙන් යම් ප්‍රතිචාරයක් ලබා ගන්නට. එහෙම අවස්ථාවන් තිබෙන්නට ඇතිනේ?

පි: එසේයි ස්වාමීනි.

ප්‍ර: එහෙනම් ඔබතුමාට කියන්ට පුළුවන්ද ඒ වගේ අවස්ථාවන් වලදී ඔබ කොහොමද ක්‍රියාත්මක වුණේ කියලා ?

පි: සමහර වැදගත් ලියුම් වලදී මම ඒ සම්බන්ධයෙන් උදාහරණයක් වශයෙන් ගත්තොත් මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යම්කිසි විමර්ශනයක් භාරදුන්නොත් ලිඛිතව සහ ඒකේ මම ප්‍රගතිය වාර්තා කරන්නේ කියලා අහවල් දවසට දැනුම් දීලා යැව්වොත් මගේ ඒ පුද්ගලික මාණ්ඩලික සහකාර අනිවාර්යයෙන්ම ඒ ලියුම මුල් පිටපත අනිවාර්යයෙන්ම යවන අතර ඒකේ පිටපතක් තියාගෙන එයාගේ calendar file කියලා එකක් තියෙනවා දන්නවා. එකේ. calendar file එකට එකේ ඒ දිනයට Copy එක දාලා තියාගන්නවා. තියාගෙන නියමිත දවසට ඒ වාර්තාව ගෙන්වා ගන්නවා. ආවේ නැත්නම් සිහිකැඳවීමක් සකස්කරලා මට ගෙනත් දෙනවා ඒ වාර්තාව ලැබිලා නැහැ කියලා එතකොට මම සිහිකැඳවීම යවලා ඒක ගෙන්වා ගැනීමට කටයුතු කරනවා. සමහර අවස්ථාවලදී ඉතාම රහසිගත ලියුම් වගේ තියෙන අවස්ථාවලදී ඒ ලියුම් මම තියාගන්නවා. පුද්ගලිකව මම තියාගන්නවා. මගේ කාර්යාලයේ. මට ඒකට සහායට වෙනම නිලධාරියෙක් හිටියා. මම එතන පුද්ගලිකව ඒ නිලධාරියා හරහා calendar file එකක් maintain

Registrar Copy
FAIR COMMENT BY JEZEEM

කරා. Copy එකක් අදාල නිලධාරියාට යවලා Copy එකක් මම තියාගන්නවා. අර ක්‍රමවේදයමයි නියමිත දිනයට ආවේ නැත්නම් මගේ අර නිලධාරියා මට දැනුවත් කරනවා. මම සිහිකැඳවීමක් යවලා ගෙන්ව ගන්නවා. මේක තමයි අනුගමනය කළ ක්‍රමවේදය.

ප්‍ර: එතකොට දැන් ඔබට යම් අවස්ථාවක අවශ්‍යතාවයක් ඇති වුණොත් මොනවා හරි කරුණක් පිළිබඳව තව දුරටත් සොයා බලන්නට අතීතයේදී මේ අදාළ ප්‍රස්තුත කරුණ සම්බන්ධයෙන් අපට ලිපි ලැබිලා තිබෙනවද පොලිස්පතිවරයා විදිහට මාව දැනුවත් කරලා තියෙවද කියන ප්‍රශ්නයට ඔබට පිළිතුරක් අවශ්‍ය වුණානම් ඒ අවස්ථාවේදී ඔබ මොකක් ද අනුගමනය කළ ක්‍රමවේදය?

පි: ස්වාමීනි දැන් මූලස්ථානයේ පොලිස්පතිට ලැබෙන සෑම ලියුමක්ම අපි අපේ ලේඛන 2ක් තියෙනවා. එකක් තමයි එන ලිපි. අනිත් එක බැහැර කරන ලිපි. Inward register outward register එතකොට ආපු හැම ලියුමක්ම අපේ අර Inward register යේ enter වෙලා තියෙනවා. එතකොට පොලිස්පතිට කොහෙන් හරි ලියුමක් ආවානම් දිනය සමහර වේලාවට වෙලාවත් දාල තියෙනවා. ඒක බැලුවාම කියන්න පුළුවන් පොලිස්පතිට ලියුමක් ඇවිල්ලා තියෙනවද කියලා. ඊළඟට ඒක කොහාට ගියේ කියන එක outward registerයෙන් බලා ගන්න පුළුවන්. (ප්‍රශ්නය නැවත සාක්ෂිකරුට ඉංග්‍රීසි බසින් පැහැදිලි කරයි) ස්වාමීනි දැන් ඒ ලිපිය ලැබුණු ආයතනය දැන් උදාහරණයක් ගත්තොත් SIS එක. අපි SIS එකෙන් ලැබෙන ලිපි වෙනුවෙන් අපි වෙනම ගොනුවක් පවත්වාගෙන යනවා. එතකොට අපි SIS එකේ ගොනුව බැලුවම පරිශීලනය කෙරුවාම අපිට පේනවා මීට කළින් මීට පෙර ලියුම් ඇවිල්ලා තියෙනවා. වර්ෂ අනුව මාස අනුව අපිට හොයා ගන්න පුළුවන් බොහොම පහසුවෙන්. ඒ වගේ සියලුම වැදගත් ආයතන CID එකට. TID එකට. SIS එකට. ඊළඟට පළාත් වශයෙන් ගත්තොත් එහෙම සියලුම පළාත් වලටත් වෙන වෙනම ගොනු තියෙනවා. ඒ ආපු ලියුම් ගොනු කරලා තියෙන්නේ ඒ පළාත් අනුව ගොනු කරලා තියෙනවා. අපට කවුරුහරි කිව්වොත් එහෙම අහවල් තැනින් ආවා කියලා අපට ඒ අදාල File ටික බැලුවාම හොයා ගන්න පුළුවන්. Inward register යටඅමතරව.

ප්‍ර: හොඳයි ඒ කියන්නේ ඔබ පැහැදිලි කරන්නෙ මේ ගරු කොමිෂන් සභාවට ඔබගේ ධූරකාලය තුල දී ක්‍රමවේදයක් තිබුනාය කියලා ඔබට යම් තොරතුරුක් සොයා ගැනීමට අවශ්‍ය වුණානම් පොලිස්පතිවරයා ලෙස එතෙක් පොලිස් දෙපාර්තමේන්තුව වෙත නැත්නම් පොලිස් මූලස්ථානය වෙත ඔබ වෙත යොමු කරලා තිබුණ එම තොරතුරු පහසුවෙන් සොයා ගැනීමේක්‍රමවේදයන් ඔබේ ප්‍රධාන කාර්යාලයේ තිබුණාය කියලා?

FAIR COMMENT BY JEZEEM

පි: ඒ කියන්නේ අවුරුදු 2ක් 3ක් වගේ කාලයක් වගේ ඇතුලත නම් මගේ කාර්යාලයේම තිබුණා. අනිත් ඒවා බොහෝ විට අපි record room එකට ගොනු කිරීම සඳහා යවලා තියෙනවා. record room එකේ මං හිතන්නේ නිශ්චිත කාලයක් තියෙනවා. අවුරුදු 5ක් ද කොහේදෝ. ඊට පස්සේ විනාශ කරලා දානවා තියාගන්න බැරි නිසා ගොඩාක් ඒවා. ඒ කියන්නේ ගොඩාක්ම ඔය අතිශෙයින් රහසිගත දේවල් categorize කරලා තියෙනවා. ඒ categorization එකට අනුව විනාශ කරලා දාන්න පුළුවන් ඒවා විනාශ කරලා දානවා අවුරුදු 5න්ද කොහේදෝ පස්සේ.

ප්‍ර: පොලිස්පතිවරයා විදිහට ඔබගේ ධුර කාලය තුල දී ඔබ බුද්ධි සමාලෝචන රැස්වීම් වලට සහභාගී වන්නට ඇති නේද? ආරක්ෂක අමාත්‍යාංශයේ පැවැති Intelligence review meetings ?

පි: 2015 පස්සේ මම සහභාගී වෙලා තියෙනවා.

ප්‍ර: 2015න් පස්සේ ඔබ සහභාගී වෙලා තියෙනවා. 2015ට ඉස්සරවෙලා ඔබ සහභාගී වුණේ නැද්ද?

පි: නැහැ ස්වාමීනි.

ප්‍ර: 2015දී ඔබ බුද්ධි සමාලෝචන රැස්වීම්වලට සහභාගී වෙනකොට එහි මුල සුන ගත්තේ කවුද සාමාන්‍යයෙන්?

පි: නිවැරදි කිරීමක් කරන්න අවශ්‍යයි ස්වාමීනි. 2015 කළින්ම මම නිත්‍ය සාමාජිකයෙක් වුණේ නැහැ ඒ සාකච්ඡාවේ. නමුත් වරින් වර යම් කිසි පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවශ්‍ය වුණ අවස්ථාවලදී විතරක් මාව කැඳෙව්වා. නමුත් 2015න් පස්සේ මම ඒකේ සාමාජිකයෙක් විදිහට සෑම දවසේම වගේ සහභාගී වුණා.

ප්‍ර: මෙම රැස්වීම් පැවතුණේ ආරක්ෂක ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන්ද නැත්නම් රාජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන්ද කොහොමද?

පි: රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යවරයා සිටින අවස්ථාවල එතුමා ප්‍රධානත්වයෙන් මේ රැස්වීම පැවැත්වුණා. එතුමා නැති අවස්ථාවල ආරක්ෂක ලේකම්වරයා ප්‍රධානත්වය ගත්තා.

ප්‍ර: ආරක්ෂක අමාත්‍යාංශයේද මේ රැස්වීම පැවැත්වුණේ?

පි: ආරක්ෂක අමාත්‍යාංශයේ

ප්‍ර: ඒසඳහා සහභාගී වුණ අනිකුත් නිලධාරීන් කවුද කියලා ඔබට මතක ද ඔබේ වකවානුව තුලදී?

පි: ත්‍රිවිධ හමුදාපතිවරුන්, ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ඊළඟට රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා. ත්‍රිවිධ හමුදා වල බුද්ධි අංශ ප්‍රධානීන්.

ප්‍ර: ලේකම්වරු කවුරුහරි සහභාගී වුණාද?

පි: නැහැ. ලේකම්වරු ඒ සඳහා සහභාගී වෙච්ච බවක් මගේ මතකයක් නැහැ. නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඊළඟට ත්‍රස්ත මර්දන කොට්ඨාශය ඒ නිලධාරීන් නිතිපතා සහභාගී වුණ බවක් මට මතක නැහැ.

FAIR COMMENT BY JEZEEM

නමුත් වරින් වර ඒගොල්ලෝ ඒ යම් යම් සිද්ධින් ඒගොල්ලන්ට අදාළ සිද්ධීන් ගැන සාකච්ඡා වන අවස්ථා වලදී ආවයි කියලයි මට මතක. නමුත් මම අර මුලින් කියපු කණ්ඩායම අනිවාර්යෙන්ම නිතිපතා සහභාගී වුණා.

****

දැන් වේලාව: ප.ව.2.35
මෙතැන් සිට ල/ලේ: චන්දිමා මෙනවිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව: ප.ව2.35
පෙර සටහන් ල/ලේ: නිල්මිණි කුමාරි
මෙතැන් සිට ල/ලේ: චන්දිමා දිල්හානි .

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: එතකොට ඔය කියපු නිලධාරීන්ට අමතරව යුධ හමුදාව නියෝජයනය කරමින් යුධහමුදා බුද්ධි ප්‍රධානීන් එයට සහභාගි වුනද?

පි: නිවැරදියි මම ඒක ගැන සඳහන් කරේ බුද්ධි අංශ සියලුම බුද්ධි අංශවල නිලධාරින් ප්‍රධානීන්,

ප්‍ර: ඒ කියන්නේ ත්‍රිවිධ හමුදාව,පොලීසිය,ආරක්ෂක අමාත්‍යාංශය ලේකම්වරයා.

පි: පොලිසියෙන් සහභාගි වුනේ නැහැ .

ප්‍ර: ඇයි ඔබ හිටියානේ?

පි: පොලිසියේ මම හිටියා special Branch director ගියේ නෑ?

ප්‍ර: බුද්ධි ගැන කිව්වාම ඔවුන් හිටියේ නැහැ කියලා ඔබ කියන්නේ නමුත් පොලිස්පතිවරයා විදියට දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විදියට ඔබ සහභාගී වුනානේ?

පි: මම සහභාගී වුනා ගරු ස්වාමිනි.

ප්‍ර: එතකොට ඔය ත්‍රිවිධ හමුදාව පොලිසිය,රාජ්‍ය බුද්ධි සේවය, මේ සියල්ල අතර සම්බන්ධීකරණ කටයුතු කරන යම් නිලධාරියෙක් හිටියානේද ජාතික බුද්ධි ප්‍රධානී කියලා?

පි: නිවැරදියි ස්වාමිනි

ප්‍ර: ඒ ජාතික බුද්ධි ප්‍රධානී ඔය එම රැස්වීම්වලට සහභාගි වුනාද?

පි: සහභාගි වුනා.

ප්‍ර: එහෙම නම් ඔබට කියන්නට පුළුවන්ද ඔබ ඔය රැස්වීම්වලට සහභාගි වෙලා ලබා ගන්න ලද ඒ පරිච්චය අනුව මෙම රැස්වීම් පැවැත්වීමේදී යම් න්‍යාය පත්‍රයක් අනුගමනය කරාද කියලා?

පි: රැස්වීමට කලින් අපිට කවදාවත් න්‍යාපත්‍රයක් ලැබුණේ නැහැ. නමුත් ඒ අවස්ථාවේදී ඒ රැස්වීම මෙහෙයවන ලේකම්තුමා හරි රාජ්‍ය අමාත්‍යතුමා හරි න්‍යාපත්‍රයක් තියාගෙන කථා කරනවද කියන එක මට හරියටම කියන්න බැහැ. නමුත් අපිට කවදාවත් ඒ රැස්වීමේ න්‍යායපත්‍රයක් තියාගෙන යොමු වෙච්ච බවක් මට නම් මතකයක් නැහැ.

ප්‍ර: නමුත් රැස්වීම් පවත්වන කොට යම් ආකාරයකට යම් රටාවකට පවත්වන්ට ඇතිනේ?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ඔව් ඒක එහෙම නම් න්‍යාපත්‍රයක් අනුව සකස් වන්නට පුළුන්නේ?

පි: වෙන්න පුළුවන් ස්වාමිනි

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මන්ද ඉලංගකෝන් මැතිතුමනි ගරු කොමිෂන් සභාව ඉදිරියේ ජාතික බුද්ධි ප්‍රධානී වෙනුවෙන් ඒක කාර්යාලය වෙනුවෙන් පැමිණ සාක්ෂි ලබාදුන් නිලධාරීන් පැහැදිලි කරලා තියෙනවා මෙම රැස්වීම් පැවත්වීම් සඳහා ඔවුන් විසින් න්‍යාපත්‍රයක් හැම අවස්ථාවකදීම පිළියෙල කරන ලද බව?

පි: වෙන්න පුළුවන් ස්වාමිනි ඕනම තැනක රැස්වීමක් පවත්වන කොට ඒ ගොල්ලෝ න්‍යාය පත්‍රයක් සකස්කරගෙන තමයි ඒ ක්‍රමවේදය අනුගමනය කරන්නේ කියලා මා විශ්වාස කරනවා

ප්‍ර: එතකොට මොන වගේ දේවල්ද එහෙම නම් ඔය රැස්වීමේදී කථා කරන්නේ මොන අරමුණෙන්ද ඔය රැස්වීම පවත්වන්නේ මොනවගේ දේවල්ද ඔය රැස්වීමේ දී කථා කරේ.

පි: මේ සාකච්ඡාවේදී ප්‍රධාන වශයෙන්ම සිද්ධවුනේ ඒ ගත වෙච්චි වකවානුතුල විතරක් නොවේ ඒ වෙනකොට රටේ තියෙන ආරක්ෂක තත්ත්වය ප්‍රධාන වශයෙන්. ආරක්ෂක තත්ත්වය විශේෂයෙන් ජාතික ආරක්ෂාවට අදාල කාරණා තමයි ප්‍රධාන වශයෙන් සාකච්ඡා වෙන්නේ ඉතින් ඒ එක එක ආයතන වලින් ඉදිරිපත් කිරීම් කරනවා මං හිතන්නේ පළමුවෙන්ම පටන් ගන්නේ රාජ්‍ය බුද්ධි සේවයෙන් ඊළඟට DMI presentation එකත් ඉදිරිපත් කරනවා ඊට පස්සේ හමුදා පතිවරුන්ගේ අදහස් ඉදිරිපත් කරනවා. පොලිස්පතිවරයා අදහස් ඉදිරිපත් කරනවා. මේ ආකාරයෙන් සහභාගිවෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවේ හිටියොත් ඒ ගොල්ලෝ කථා කරනවා. ඒ සියලු දෙනාම තම තමන්ගේ අදහස් ඉදිරිපත් කරලා වෙනම සාකච්ඡා කරලා ගතයුතු ක්‍රියාමාර්ගය ඉදිරියේදී මොනවාහරි තියෙනවා නම් ඒවා තීන්දු තීරණ ගන්නවා

ප්‍ර: ඔබ මේ මේ පිළිතුර වගේම මීට පෙර දෙන ලද පිළිතුරකත් සඳහන් කරා මේ ජාතික ආරක්ෂාව පිළිබඳව ?ජාතික ආරක්ෂාව වැදගත්ද?

පි: අනිවාර්යෙන්ම

ප්‍ර: ඇයි ඔබ එහෙම කියන්නේ ?

පි: ජාතික ආරක්ෂාව බිඳ වැටුනොත් එතන ඒ රටේ ඉදිරිය ගැන අපිට හිතන්න බැහැ.

ප්‍ර: ඒ මොකද ?

පි: මූලිකම දේ රටේ ජාතික ආරක්ෂාව රටක් පවතින්න නම් රටේ ජාතික ආරක්ෂාව තියෙන්න ඕනේ.ඒක තමයි අංක එක. ඒ කියන්නේ රටක් පවතින්නේ ඒ රටේ ජාතික ආරක්ෂාව මත රටක ආරක්ෂාව නැත්නම් ජාතික ආරක්ෂාව නැත්නම් ඒ කියන්නේ නීතිය හා සාමයක් නැනේ. රටේ ජාතික ආරක්ෂාව බිඳ වැටෙනවා කියන්නේ නීතිය හා සාමයක් නෑ. සාමය පවත්වාගෙන යාමක් නැහැ. අරාජික වෙනවා.එතකොට අරාජික

FAIR COMMENT BY JEZEEM

රටක් කොහොමද පවත්වගෙන යන්නේ ඒකයි සියලුදේටම කලින් ජාතික ආරක්ෂාවට අපි ප්‍රමුඛතාවය දෙන්න ඕනේයි කියලා කියන්නේ.

ප්‍ර: ස්තුති ඔබේ පැහැදිලි කිරීමට. එහෙම නම් ඉලංගකෝන් මැතිතුමනි ඔබට කියන්නට පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට ඔබ අර සඳහන් කරපු යම් ක්‍රමවේදයක් ගැන කිව්වානේ මේ රැස්වීම පැවැත්වීමේදී ඔබ කිව්වා ප්‍රථමයෙන්ම රාජ්‍ය බුද්ධිසේවයේ නිලධාරියා තමයි මේ යම් ඉදිරිපත් කිරීමක් කරන්නේ කියලා?

පි: නිවැරදියි ස්වාමිනි බොහෝ විට රැස්වීම මෙහෙයවන ආරක්ෂක ලේකම්තුමා හරි නියෝජ්‍ය අමාත්‍යතුමා හරි කෙටි පැහැදිලි කිරීමක් කරනවා ඊට පස්සේ රැස්වීම ආරම්භ කරන්නේ මං කියපු විදියට බොහෝ විට රාජ්‍ය බුද්ධිසේවයේ ඒ ප්‍රධානියාගේ පැහැදිලි කිරීමේ ඉදිරිපත් කිරීමේදී.

ප්‍ර: හිටපු පොලිස්පතිවරයෙක් විදියට මා ඔබෙන් දැනගන්නට කැමතියි බුද්ධි සමාලෝචන රැස්වීමේදී බුද්ධි අංශවලට සම්බන්ධ ත්‍රිවිධ හමුදාවෙන් ඒ වගේම රාජ්‍ය බුද්ධි සේවයෙන් මේ නිලධාරින් ඉන්නකොට ඇයි නාවික යුධ,ගුවන්, හමුදාවල බුද්ධි නිලධාරීන්ට ප්‍රමුඛත්වය දෙන්නේ නැතිව රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරියාට ප්‍රමුඛත්වය දීලා මේ පළමුවෙන්ම ඔහුගේ ඉදිරිපත් කිරීම කරන්නට කියන්නේ කියලා ?

පි: අපේ රටේ ක්‍රියාත්මක වන බුද්ධි අංශ දිහා බැලුවාහම ශක්තිමත්ම බුද්ධි අංශ දෙක තමයි රාජ්‍ය බුද්ධි සේවය සහ යුධ හමුදා බුද්ධි අංශය DMI මේ දෙක තමයි වඩාත්ම ශක්තිමත්ම බුද්ධි අංශ දෙක මං හිතන්නේ සංඛ්‍යාත්මක වශයෙන් සහ අනෙකුත් Professionalism ඒ දෙක අතින් බැලුවාම ඒක නිසා විය යුතුයි රාජ්‍ය බුද්ධි සේවයටත් ඊළඟට මං හිතන්නේ මේ ඉදිරිපත් කිරීම කරන්නේ DMI එක බොහෝ විට මේ දෙකට ප්‍රමුඛත්වය දීලා තියෙන්නේ මේ දෙකේ තියෙන ශක්තිය වෘත්තිමයභාවය Professionalism මේ කාරණා දෙක නිසා වෙන්න ඕන කියන එකයි මගේ අදහස

ප්‍ර: එහෙම නම් පොලිස්පතිවරයෙක් විදියට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාට ඒවගේම යුධ හමුදාවේ අධ්‍යක්ෂවරයාට සවන් දෙන අවස්ථාවේදී ඔවුන්ගේ ඉදිරිපත් කිරීම්වලට ඔබේ අපේක්ෂා කරාද පසු ගිය අහඹරුවාදා ඉඳලා මේ අහඹරුවාදා දක්වා වූ රටේ පැවති තත්ත්වය බුද්ධි අංශවලට අදාලව ඔවුන් දැනගෙන තිබෙන තොරතුරු පිළිබඳව ඔබ නීතිය හා සාමය සුරැකීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විදියට දැන ගැනීම අත්‍යවශ්‍යයි කියලා ?

පි: නිවැරදියි ස්වාමිනි ඒ අයගෙන් අපට ලැබුණු දායකත්වය ඉතාමත් වැදගත් වුනා නමුත් මම පොලිස්පති වශයෙන් මම ඒ ප්‍රතිඵලයෙන් පමණක් මම යැපුනේ නැහැ ඊට අමතරව මම මගේ විශේෂකාර්යංශය

LAW COMMENT — BY JEZEEM

තිබුනා. ඊට පස්සේ මම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු හරහා යම් යම් තොරතුරු ලබා ගත්තා මේ සියල්ලම එකතුකරගෙන තමයි මගේ පරිපාලනය මම ගෙන ගියේ. මේක මට විශාල වශයෙන් අධාර වුනා නමුත් මම ඒ මතම මම රැඳුන් නැහැ මේවා වුනේ නැහැ.

ප්‍ර: නමුත් මා ඔබෙන් ඇහුවොත් මේ ප්‍රශ්නය එවැනි අවස්ථාවකදී ඔබේ දෙපාරත්මෙන්තුවෙන් ලැබෙන තොරතුරු පමණක් නෙවෙයි ත්‍රිවිධ හමුදාවෙන් ලැබෙන ඒවා රාජ්‍ය බුද්ධිසේවයෙන් ලැබෙන ඒවා සමහරවෙලාවට ඒ අංශ සම්බන්ධීකරණය කරනු ලබන ජාතික බුද්ධි ප්‍රධානී කථා කරමින් ඔවුන්ගෙන් ලැබෙන දේ මේ සියලුම කරුණු එකම වේදිකාවක ඔබලාට ඉතා ඉක්මනින් කඩිනමින් ලබා ගැනීමේ හැකියාව තියෙනවා. එතකොට ඒකෙන් යම් ප්‍රයෝජනයක් තියෙනවද ඔබලා වෙත ජනතාව වෙනුවෙන් පවරා තියෙන මේ රාජකාරි ඉෂ්ඨ කිරීමේ ?

පි: අනිවාර්යෙන්ම අපිට පොලිස්පති වශයෙන් මට මේ හමුදා බුද්ධි අංශයත් සමඟ සම්බන්ධීකරණයක් තිබුණේ නැහැ. ඒ අයගේ බුද්ධි තොරතුරු ගැන අපිට කිසිම අවබෝධයක් තිබුණේ නැහැ ඉතින් මෙතන තමයි එකම ස්ථානය මේ සියලු දේ ඒක රාශිවෙලා සාකච්ඡා වෙන තැන ඒ නිසා මේ සාකච්ඡාව ඉතාමත් ප්‍රයෝජනවත් වුනා.

ප්‍ර: ඒ අවස්ථාවේදී ඒ අවශ්‍ය තොරතුරු වැදගත් කියලා හිතෙනවානම් එහෙනම් ඔබලාට සටහන් දමා ගැනීමේ හැකියාවක් තිබුණානේ එතකොට ?

පි: අනිවර්යෙන්ම අපි වැදගත් වන සටහන් කර ගන්නවා.

ප්‍ර: ඒ අනුව ඔබේ දෙපාර්තමේන්තුව විසින් ඉදිරියට පවත්වාගෙන යන විමර්ශන සඳහා එය ඉවහල් වන්නට පුළුවන් නේද?

පි: අනිවාර්යෙන්ම

ප්‍ර: එතකොට ජාතික බුද්ධි ප්‍රධානීගේ කාර්යබාර්ය මොකක්ද ඔබට පෙනෙන විදියට?

පි: මම දකින විදියට නම් ජාතික බුද්ධි ප්‍රධානීන්ගේ ප්‍රධාන කාර්යභාරිත්වය විය යුත්තේ මේ ත්‍රිවිධ හමුදාවක ජාතික බුද්ධි ප්‍රධානීට වාර්තා කරන්නේ ත්‍රිවිධ හමුදාවේ බුද්ධි අංශ සහ SIS එක අපි පොලිස් විශේෂ කාර්යංශයේ වාර්තා කිරීමක් වෙන්නේ නැහැ.

ප්‍ර: කෙරෙන්නේ නැහැ?

පි: ඔව් මේ කණ්ඩායම් 4 සම්බන්ධීකරණය කරලා ඒ හතරෙන් ලැබෙන බුද්ධි තොරතුරු විශ්ලේෂණය කරලා හොඳ විශ්ලේෂණාත්මකව ආරක්ෂක ලේකම්වරයා දැනුවත් කිරීම සහ ඒ හරහා රජය දැනුවත් කිරීම තමයි එයාගේ ප්‍රධාන කාර්ය වියයුත්තේ මං හිතන්නේ ඒ සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය චක්‍රලේඛයක් හරි ඩියුටි ලිස්ට් එකක් හදලා තියෙන්න ඇතියි කියලා මං හිතනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: 2011,2016 දක්වා වූ කාල පරිච්ඡේදය තුලදී ජාතික බුද්ධි ප්‍රධානී විදියට සේවය කරේ කුමන නිලධාරීන් ද කියලා ඔබට මතක ද ?

පි: 2011 ඉදලා 2015 දක්වා

ප්‍ර: බිගේඩියර් හේන්දවිතාරණ?

පි: මං හිතන්නේ මිස්ටර් හේන්දවිතාරණ 2015 ඉඳලා සිසිර මෙන්ඩිස්

ප්‍ර: නියෝජ්‍ය පොලිස්පති සිසිර මෙන්ඩිස්?

පි: සිසර මෙන්ඩිස් තමයි.

ප්‍ර: එතකොට ඔබට මතකද 2011 සිට 2016 දක්වා වූ ඒ කාල වකවානුව තුල දී රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය ලේකම්වරයා නැත්නම් ලේකම්වරුන් විදියට කටයුතු කරේ කවුද කියලා?

පි: 2011 ඉඳලා 2015 වෙනකම් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් වර්තමාන ගරු ජනාධිපතිතුමා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කටයුතු කලා. ඒ අතරේ 2014 සුළු කාලයක් මට මතක විදියට මාස ගානකට වගේ කාලයක් නීතිය හා සාමය අමාත්‍යාංශය පිහිටුවලා මැතිවරණ කාලය වෙනකොට නීතිය හා සාමය අමාත්‍යාංශය යටතේ තිබුණේ ඒ කාලයේ ජෙනරල් මල්වආරච්චි තමයි ලේකම් විදියට පොඩිකාලයක් හිටියේ ඊට පස්සේ 2015 යහපාලන රජය පිහිටෙව්වාට පස්සේ නීතිය හා සාමය අමාත්‍යාංශයට පොලිසිය අනුයුක්ත වුනේ. එතැනදි අමාත්‍යවරයා වුනේ ගරු ජෝන් අමරතුංග මහත්මයා ලේකම් වශයෙන් තෙන්නකෝන් කියලා මහත්මයෙක් පත්වුනේ ඊට පස්සේ කාලයකදී අමාත්‍යාංශයෙන් ඉල්ලා අස්වෙලා මාරපන ඇමතිතුමා වෙනස්වුනා ඊට පස්සේ එතුමා පත්වුනා ඒ අතරේ ටික කාලයක ඇමතිතුමත් පත්වුනා ඊට පස්සේ ලේකම්වරයා වෙනස් වෙලා ලේකම් විදියට පත්වුනා මට නම මතක නෑ ජගත් විජේවීර මහත්මයා අවසාන වශයෙන් පත්වුනා මගේ විශ්‍රාම යන කාලය වෙන කොට.

ප්‍ර: මා ඔබෙන් මතයක් දැනගන්නට කැමතියි ඉලංගකෝන් මැතිතුමණි දැන් ඔබේ පිළිතුර අනුව මනාව පෙන්නුම් කරනවා කෙටිකාලයක් තුලදි මේ තනතුරවල දී වෙනස්කම් සිදුවන බව අමාත්‍ය ධූරවල ඒ වගේම ලේකම්ධූරවල පොලිස්පතිවරයෙක් විදියට රාජකාරි කරන කොට මේ ආකාරයේ නිරතුරු තනතුරු වෙනස්කිරීම් නිසා ඔබේ රාජකාරියට යම් ආකාරයක එයින් බලපෑමක් ඇතිවුණාද? බලපෑමක් කියලා මං අදහස් කරන්නේ it is about smooth running

පි: නැත ස්වාමිනි මගේ නීතිය හා සාමය පවත්වාගෙන යෑමේ කටයුතු වලට මට නම් කිසිම ගැටලුවක් වුනේ නැත. ස්වාමිනි මට නම් ඒ ඉහල අමාත්‍යවරු ලේකම්වරු මාරුවුනායි කියලා නීතිය හා සාමය පවත්වාගෙන යාමේ පවත්වාගෙන යාමේ කිසිම ගැටලුවක් ඇතිවුනේ නැහැ. මගේ කටයුතු මම සුපුරුදු පරිදි කරගෙන ගියා මොකද නීතිය හා සාමය පවත්වාගෙන යාමේ බලතල සහ වගකීම තියෙන්නේ

FAIR COMMENT BY JEZEEM

පොලිස්පතිවරයාට අමාත්‍යාංශයෙන් බොහෝ විට සිදුවෙන්නේ වගකීම financial කටයුතු සහ අනිත් පරිපාලන කටයුතු ඒවායි යම් යම් ප්‍රමාදයන් ඇති වෙන්න ඉඩ තිබුණා.නමුත් රටේ නීතිය හා සාමය පවත්වාගෙන යමේදී ඒවාට එහෙම දැඩි බලපෑමක් ඇති වුන් නැහැ මම මගේ කටයුතු ඒ ආකාරයෙන් සිදු කරගෙන ගියා.

ප්‍ර: ස්වාධීනව කටයුතු කරපු නිලධාරීයෙක් විදියටනේ ඔබ ඔය පිළිබඳව සඳහන් කරන්නේ. මං මෙහෙම ඇහුවොතින් ඒ කියන්නේ ඔබගේ පොලිස් දෙපාර්තමෙන්තුව ඔබේ ධුර කාලය තුලදී යම් වකවානුවක් තුලදි යම් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයෙ යටතේ පැවතුණා

පි: නිවැරදියි.

ප්‍ර: අනතුරුව එය එයින් ඉවත් කරලා එතකොට රාජ්‍ය ආරක්ෂක ඒ වකවානුවේදී රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා වුනේ ගරු ජනාධිපතිතුමා?

පි: නිවැරදියි

ප්‍ර: ඊළඟට ඇති වුන ආණ්ඩු මාරුවේදී රජයන් මාරුවීමේදී පොලිස් දෙපාර්තමේන්තුව ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ඉවත් කරලා නීතිය හා සාමය කියන ආමාත්‍යාංශය යටතට ගෙන එනු ලැබුවා?

පි: නිවැරදියි

ප්‍ර: එතකොට පොලිස් දෙපාර්තමේන්තුවේ ඔබට වාර්තා කරන්නට සිදුවුනේ පොලිස් ප්‍රධානියා විදියට ලේකම්වරයා හරහා අදාල ගරු අමාත්‍යවරයාට ?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: දැන් එතකොට ගරු අමත්‍යවරයෙක්ට තියෙන බලතලත් ගරු ජනාධිපතිවරයා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා විදියට ඒ තනතුරේ කටයුතු කරන කොට ඒ තියෙන බලතලත් අතර යම් වෙනස්කමක් තියෙනවානේ පැහැදිලිවම ?

පි: පැහැලියි ස්වාමිනි දැන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා විදියට අපි නීතිය හා සාමය පවත්වාගෙන යාමේ දී අපිට මේ ත්‍රිවිධ හමුදා සමඟ සම්බන්ධීකරණය අත්‍යවශ්‍යවයි. එතනදී මේ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා එහෙම නැත්නම් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයත් එක්ක ඉන්න කොට ඒ සම්බන්ධීකරණය බොහොම පහසුයි ඒක නිසා ඒක අපේ නීතිය හා සාමය පවත්වාගෙන යාමට විශාල රුකුලක් වුනා. නමුත් අර නීතිය හා සාමය කියන වෙනම අමාත්‍යාංශයකට ගිහිල්ලා වෙනත් අමාත්‍යවරයකු යටතේ වැඩකරන කොට ඒක ටිකක් ඒ සම්බන්ධීකරණය ටිකක් අඩු වුනා.

ප්‍ර: දැන් මී ලඟට මම ඔබගේ අවධානය යොමු කරන්නේ ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම්වලට ඔබ ආරක්ෂක කවුන්සලයේ රැස්වීම්වලට 2011 සිට 2016 දක්වා කාල පරිච්ඡේදය තුලදී පොලිස්පතිවරයා විදියට සහභාගි වුනාද?

FAIR COMMENT BY JEZEEM

පි නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: එහි මුලසුන ගනු ලැබුවේ කවුරුන් විසින්ද ඔබේ ධූරකාලය තුලදී?

පි: ගරු ජනාධිපතිතුමා .

ප්‍ර: ඒ කියන්නේ මුල් අවස්ථාවේදි එවකට ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා ?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: අනතුරුව ඔබ කිව්වා 2015 වසරේ ඉදලා 2016 වෙනකම් ඔබේ දූර කාලය තුල දී ගරු ජනාධිපතිවරයා විදියට හිටියේ ගරු සිරිසේන මැතිතුමා කියලා?

පි: නිවැරදියි ගරු මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා.

ප්‍ර: එතකොට එහෙම නම් ආරක්ෂක කවුන්සිලයේ 2015. සිට 2016 දක්වා වූ ඔබේ ධූර කාල තුලදී මුලසුන හොබවනු ලැබුවේ එවකට ගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා ?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: දැන් ඒ රැස්වීමට ඔබ සමඟ සහභාගී වූ අනෙත් නිලධාරීන් කවුද කියලා ඔබට මතකද ? කුමන ආයතනය ද ඔවුන් නියෝජනය කලේ?

පි: මගේ මතකයේ හැටියට ත්‍රිවිධ හමුදාපතිවරුන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීන් ජනාධිපති ලේකම්,ආරක්ෂක ලේකම්, රාජ්‍ය බුද්ධි ප්‍රධානී director DMI ,CNI, ජාතික බුද්ධි ප්‍රධානීන්,ජනාධිපති ලේකම්,මූලික වශයෙන් මේ කණ්ඩායම තමයි.

ප්‍ර: සහභාගි වුනා එතකොට..?

පි: අගමැතිතුමා රාජ්‍ය ඇමතිතුමා ආරක්ෂක කටයුතු පිළිබඳ රාජ්‍ය ඇමතිතුමා ආවද නැද්ද කියන්න මට හරියට මතකයක් නැහැ සමහර අවස්ථාවල ආවා වගේ මතකයි නමුත් අර මං මුලින් කියපු කණ්ඩායම නිතරම වගේ සහභාගී වුනා.

ප්‍ර: ඒ කියන්නේ MOD එකේ බුද්ධි සමාලෝචන රැස්වීමට සහභාගී වුන සියලුම දෙනා පැමිණියා ඒ කියන්නේ ප්‍රධානින් ආයතන ප්‍රධානීන් ඔවුන් පැමිණියාද අනිවාර්යෙන්ම ආරක්ෂක කවුන්සිලලේ රැස්වීම්වලට ?

පි: නෑ සමාලෝචන රැස්වීමට ආපු සියලුම දෙනා ආවේ නැහැ.

ප්‍ර: නෑ මං කියන්නේ ඒ සියලු දෙනා නෙමේ ආයතන ප්‍රධානීන්?

පි: අර අතන බුද්ධි ප්‍රධානීන් සියලුම දෙනා ආවානේ ත්‍රිවිධ හමුදාවේ ඒ සියලුම දෙනා මෙතෙන්ට ආවේ නැහැ. මෙතෙන්ට ආවේ DMI විතරයි.

ප්‍ර: DMI විතරයි?

පි: DMI,අනිත් Navy, Air force ඒ ගොල්ලෝ මෙතෙන්ට ආවේ නැහැ.

ප්‍ර: ඒ ගොල්ලන් ආවේ නැහැ?

පි: මෙතෙන්ට ආවේ SIS,DMI සහ CNI විතරයි

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට කොයි ආකරයටද ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම් පැවැත් වුනේ ඒකට න්‍යාය පත්‍රයක් තිබුණද 2011 සිට 2015 දක්වා වූ කාලය තුලදී?

පි: අපිට න්‍යායපත්‍රයක් අපි මෙසේට අතට හරි ලැබෙන්න නම සැලස්වුවේ නැහැ. නමුත් ජනාධිපතිතුමාගේ table එකේ න්‍යාපත්‍රයක් තිබුණාද කියන එක අපි හරියටම ඒක ගැන කියන්න දන්නේ නැහැ නමුත් ඒක පවත්වාගෙන අර කලින් අර coordinating conference වගේ පවත්වාගන යාමේ යම් කිසි ක්‍රමවේදයක් තිබුණා?

ප්‍ර: මොකක්ද ක්‍රමවේදය?

පි: කලින් මුලදිම ඒ ජනාධිපතිතුමා හැඳින්වීමක් කරනවා ඊට පස්සේ බොහෝ විට පටන් ගන්නේ SIS එකේ හදුන්වා දීමේ එහෙම නැත්නම් ඉදිරිපත් කිරීමේ.

ප්‍ර: බුද්ධි සමාලෝචන රැස්වීමේ විදියටමයි?

පි: බොහෝ දුරට ඒ විදියටමයි. හැබැයි ඒක වෙනස් වෙනවා ඊට කලින් මොනවාහරි ලොකු ප්‍රශ්න ගත කාරණයක් රටේ ඒ වෙනකොට ඇති වෙලා තිබුණානම් ඒක ඉස්සෙල්ලාම සාකච්ඡා කරනවා.

ප්‍ර: සාකච්ඡා කරනවා හරි?

පි: ඒ ඒ ප්‍රශ්නගත සාකච්ඡාවට අදාල නිලධාරීනුත් එදා ඉදලා තියෙනවා ඇවිල්ලා ඒක ඉස්සෙල්ලාම සාකච්ඡා කරනවා කරලා ඒක ඉවර කරලා ඊට පස්සේ මේ සාකච්ඡාව පටන් ගන්නකොට ඉස්සෙල්ලාම රාජ්‍ය බුද්ධිසේවයෙන් තමයි පටන් ගන්නේ ඊළඟට DMI එකෙන් පටන් ගන්නවා ඊළඟට ඉතින් ත්‍රිවිධ හමුදාපතිවරු පොලිස්පති අදහස් ඉදිරිපත් කරලා .

ප්‍ර: එතකොට ඒ සම්බන්ධයෙන් අර රටේ තත්ත්වය පිළිබඳව තමයි ගරු ජනාධිපතිතුමාව දැනුවත් කිරීමක් එහිදි සිදුවන්නේ ඔබ කියන විදියට.

පි: විශේෂයෙන් ආරක්ෂක තත්ත්වය ගැන තමයි

ප්‍ර: ආරක්ෂක තත්ත්වය ගැන තමයි සාකච්ඡාවෙන්නේ?

පි: ආරක්ෂක තත්ත්වය ගැන තමයි සාකච්ඡාවෙන්නේ.

ප්‍ර: එතකොට ඒ අවස්ථාවේදී ආරක්ෂක ගැටලු පිළිබඳව හදුනා ගෙන ඒ සම්බන්ධයෙන් යම් උපදෙස් දීමක් ගරු ජනාධිපතිතුමා කරනවාද?

පි: අනිවාර්යෙන් සිද්ධවෙනවා කිසි ප්‍රශ්නයක් ගැන සාකච්ඡා වුනාම ඊට පස්සේ ඒකට තීන්දු තීරණ ගන්නවා ඒක නවත්වන්නේ කොහොමද ඒකට ගත යුතු පියවර මොනවද ඉදිරියේදී කලයුත්තේ මොනවද ඒ ආදි වශයෙන් තීන්දු තීරණ ගන්නවා අරගෙන විතරක් නෙමේ ඊළඟ සාකච්ඡාවේදී ඒවා නැවත සමාලෝචනය කරනවා .

ප්‍ර: සමාලෝචනය කිරීමක් කරනවා?

පි: සමාලෝචනය කිරීමක් කරනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඔබට මතකයි ද බුද්ධි සමාලෝචන රැස්වීම්වලදී පැවැත්වුවාට පස්සේ ඊට අදාලව ඒ රැස්වීම්වල සටහන් නැත්නම් minutes එයට සහභාගි වුන නිලධාරීන් වෙත එවනු ලැබුවා ?

පි: ඒ පිළිබඳ මතකයක් නැහැ.

ප්‍ර: ඔබට ඒ පිළිබඳ පැහැදිලි මතකයක් නැහැ?

පි: පැහැදිලි මතකයක් නැහැ.

ප්‍ර: හොඳයි එතකොට දැන් මා ඔබෙන් ඒ ප්‍රශ්නය ඇහුවේ මොකද මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් වෙලා තියෙනවා ඒ පවත්වනු ලැබූ රැස්වීම්වලට අදාල සටහන් ලබා ගැනීමක් ජාතික බුද්ධි ප්‍රධානීන්ගේ කාර්යාලය විසින් සිදු කරනු ලැබුවාය කියලා?

පි: ඒ පිළිබඳ පැහැදිලි මතකයක් නැහැ

ප්‍ර: දැන් එහෙම නම් ඔබ දන්නේ නැතුව ඇති ඇතැම් විට ඔබ දන්නවද ජාතික ආරක්ෂක කවුන්සලයේ national security council ඒකේ පැවැත්වෙන රැස්වීම්වලට අදාලව සටහන් ගැනීමක් සිදුවුනාද කියලා?

පි: මං දන්න තරමින් නම් එහෙම මිනිට් එකක් නම් අපිට කවදාවත්ම ලැබිලා නැහැ කිසිම දවසක ලැබිලා නැහැ.

ප්‍ර: නමුත් ඔබ කියන්නේ සාකච්ඡා කරන කරුණු ඇතැම් අවස්ථාවලදී නැවත ඒ පිළිබඳව සමාලෝචනය කිරීම අවශ්‍ය නම් නැවත නැවතත් ඒ පිළිබඳවත් සාකච්ඡා කරනවාය කියලා?

පි: සාකච්ඡා කරනවා මම හිතන්නේ මම නිවැරදි නොවෙන්නත් පුළුවන් වෙන්නත් පුළුවන් ජනාධිපති ලේකම්තුමා සමඟර විට නෝට් එකක් තියාගෙන ඊළඟ රැස්වීමේදී ජනාධිපතිතුමා දැනුවත් කරනවා ඇති මෙන්න මේ කාරණා අද අපි සමාලෝචනය කරන්න ඕනි කියන එක මම නිවැරදි වෙන්නත් පුළුවන් නොවෙන්නත් පුළුවන්.

ප්‍ර: ඔබ නමුත් ඒ ගැන පෞද්ගලිකව දන්නේ නැනේ?

පි: පෞද්ගලිකව මම දන්නේ නැහැ.

ප්‍ර: එතකොට ඔය ඔබ කිව්වා ජනාධිපතිතුමා විසින් උපදෙස් ලබා දෙනවාය කියලා මේ රැස්වීම්වල සාකාච්ඡා කරන කරුණු සම්බන්ධයෙන් මොනවද සිද්ධ වෙන්නට ඕනේ කියලා?

පි: නිවැරදියි.

ප්‍ර: එතකොට රටේ ආරක්ෂක තත්ත්වයට අදාලව යම් ප්‍රශ්න පැන නැගිලා තියෙනවා නම් ඒ පිළිබඳ සාකච්ඡා කෙරුවානම් එතකොට ඒ සම්බන්ධයෙනුත් ගරු ජනාධිපතිතුමා ඒ ආකාරයට උපදෙස් ලබා දුන්නද?

පි: නිවැරදියි.

ප්‍ර: මම දැන් ඔබෙන් අහන්නේ ඔබ කියන ඔය ආකාරයට 2011 ඉදන් 2015 කාල පරිච්ඡේදය තුලදී එහෙම උපදෙස් ලැබීමක් සිදු වුනාද? ඒ කියන්නේ ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා එම ධුරය හොබවන අවස්ථාවේ ?

FAIR COMMENT BY JEZEEM

පි: ස්වාමිනි මොන විෂය සම්බන්ධයෙන් මට උපදෙස් .....

ප්‍ර: රටේ ආරක්ෂක තත්ත්වය පිළිබඳව ඇති වන ප්‍රශ්න පිළිබඳව?

පි: උපදෙස් නම් නිතරම ලැබුණා මොනවද විෂය කියලා පිළිබඳව හරියටම මතකයක් නැහැ අහවල් එක කියලා නිශ්චිත වශයෙන් කියලා කියන්න බැහැ.නමුත් ඒ ආරක්ෂක මණ්ඩලයේදී සාකච්ඡාවන කාරණාවලදි පොලිසියට අදාල දේවල් සම්බන්ධයෙන් මට උපදෙස් ලබා දෙනවා. මේ මේ සම්බන්ධයෙන් මේ විදියට කටයුතු කරන්න කියලා. ඒ අනුව අපි කටයුතු කරනවා. එවැනි අවස්ථා ඕන තරම් තිබුණා.

ප්‍ර: ඔබ 2015 වසරේ ඉදලා 2016 අප්‍රේල් 12 වෙනකම්නේ එතකොට එහෙම නම් තනතුර දැරුවේ ඊට පස්සේ ආපු රජය යටතේ?

පි: අප්‍රේල් 11 තමයි මගේ අවසාන දවස වුනේ කාර්යාලයේ.

ප්‍ර: ඔය වකවානුව තුලදී ඒ නව රජය යටතේ එවකට ගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා ඔය ආරක්ෂක කවුන්සිලයේදී රටේ ආරක්ෂක තත්ත්වය පිළිබඳව නිශ්චිතව මඟ පෙන්වීමක් උපදෙස් දීමක් දුන්නාද කියන කරුණ ඔබට මතකද ?

පි: ඒ වකවානුවේ සිට ජාතික ආරක්ෂාවට අදාල මාතෘකාවක් විදියට ආවේ මේ ඉස්ලාම් අන්තවාදය පිළිබඳව කාරණාවක් තමයි ඒ එතනදී සාකච්ඡා වුනේ විශේෂයෙන්ම ඒ සාකච්ඡාවලදී සකච්ඡාවට භාජනය වුනේ ISIS ත්‍රස්තවාදය පිළිබඳවයි නැත්නම් ජාත්‍යන්තර වශයෙන් ඒ කාලේ සිරියාවේ ක්‍රියාත්මක වන ISIS ත්‍රස්වාදය සහ ඒකේ බලපෑම කොයි විදියටද ලංකාවට එයිද කියන කාරණාව පිළිබඳව තමයි සාකච්ඡා වුනේ. ඒක නිසා උපදෙස් ලැබුණේ මේ පිළිබඳව දැඩි අවධානයෙන් ඉන්න කියන එක ඒකට තමයි ඒ කාලයේ ඒ වකවානුවේ ආරක්ෂක මණ්ඩලයේදී සාකච්ඡා වුනේ.

ප්‍ර: සාකච්ඡා කිරීම් සිදු වුනා දැන් ඔබ ඒ කරුණ කිව්ව නිසා මා කැමතියි ඔබේ අවධානයට රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂක විසින් ඔබ වෙත 2015 ඔක්තෝම්බර් මාසේ 16 වෙනිදා යොමු කරලා තියෙන මේ ලිපිය අවධානයට යොමු කරන්න. එහි මාතෘකාව අන්තර් ආගමික සමුළුව විසින් IS සංවිධානය සම්බන්ධව පවත්වන ලද සාකච්ඡාව? රාජ්‍ය බුද්ධි ප්‍රධානී විසින්නේ ඔබ වෙත ඔය ලියුම එවලා තියෙන්නේ?

පි: නිවැරදියි ස්වාමිනි

ප්‍ර: ඔබට මතකයක් තියෙනවද මේ සම්බන්ධයෙන් ඔබ ගත්තේ මොන පියවරක් ද කියලා කියන්න ?

පි: ස්වාමිනි මගේ පොලිස්පති තනතුර දැරූ කාල සීමාව තුල රාජ්‍ය බුද්ධි සේවයෙන් ISIS සංවිධානයට අදාලව ලිපි තුනක් නැත්නම් 4 ක් විතර ලැබුණේ මට මතකය . ඒ ලිපි සියල්ලම වගේ ලැබුණේ මේ IS ජාත්‍යන්තර IS සංවිධානයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් සහ ඒ

FAIR COMMENT BY JEZEEM

බලපෑම ලංකාවට කොයි විදියට වෙයිද කියන කාරණාව සම්බන්ධයෙන් ඒ ඇරෙන්නට ලංකාව තුල අන්තවාදී කණ්ඩායමක් ක්‍රියාත්මක වෙන බවක් හෝ ප්‍රචණ්ඩකාරී කණ්ඩායමක් ක්‍රියාත්මක වන බවක් හෝ ඒ වගේ නිශ්චිත බුද්ධි තොරතුරු කිසිවක් ඒ කාලය තුල ලැබුණේ නැහැ. සුලු වශයෙන් හෝ ලැබුනේ මේ සහාරාන්ගේ වෛරී ප්‍රකාශ සහිත දේශන පවත්වන කියන කාරණාව පමණයි ඒ ලැබුණු වාර්තාවල සඳහන් වෙලා තිබුණේ. ඉතින් මේ කාරණා තමයි අපි සාකච්ඡා වුනේ ආරක්ෂක මණ්ඩලයේදී ඒක නිසා තමයි තීරණය කරේ මේ කටයුතු ගැන දැඩි අවධානයෙන් සිටිය යුතුයි කියන එක ආරක්ෂක අංශයේ සියලුම දෙනා. එතකොට මේකට මුහුණ දීමේ ක්‍රමවේදයන් වශයෙන් මම රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධානීයාත් සමඟ කීපවරක් සාකච්ඡා කරා. සාකච්ඡා කරලා මේකට මුහුණ දෙන්න අපි ක්‍රියාත්මක විය යුතු ආකාරය ගැන සාකච්ඡා කරා මම උපදෙස් විශේෂයෙන්ම ඒ ප්‍රධානීයාත් උපදෙස් දුන්නා ඇත්තටම සිරියාව, ඉරාකය වගේ රටවල් වල බුද්ධි ප්‍රධානීන් එක්ක සම්බන්ධතා ගොඩ නගා ගැනීම ඒ අයගෙන් බුද්ධි තොරතුරු ලබා ගැනීම ඒ IS සංවිධානය පිළිබඳව ඒ ආකාරයෙන් ක්‍රමවේද සකස් කිරීම ගැන අපි සාකච්ඡා කරලා මං හිතන්නේ ඔය කටයුතුත් කළා. ඊළඟට රාජ්‍ය බුද්ධි සේවයට අවශ්‍ය කරන සම්පත් වගයක් කිව්වා මං හිතන්නේ වාහන නිලධාරීන් ඒවාත් අපි ලබා දුන්නා. මේ ආකාරයට මේ IS සංවිධානය සහ ඉස්ලාම් අන්තාවාදී කටයුතු monitor කරන්න අපි ක්‍රමවේද කිපයක්ම ඒ කාලය තුල සකස් කරා ඊට අමරතව පොලිස් මූලස්ථාන මට්ටමින් මම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුගේ ප්‍රධානත්වයෙන් විශේෂ කමිටුවක් පිහිටෙව්වා ඒ කමිටුවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයෙන්, රාජ්‍ය බුද්ධි සේවයෙන්, special branch, එකෙන් මං හිතන්න් පොලිස් විශේෂ කාර්ය බලකායෙන් ඒ වගේ මේ ත්‍රස්තවාදය සම්බන්ධයෙන් කටයුතු කරන සෑම ආයතනයකම නිලධාරීන් මගින් අනුයුක්ත කරලා සතියකට හෝ සති දෙකකට වරක් මේ කණ්ඩායම් රැස්වුනා රැස්වෙලා මේ අන්තවාදය ගැන ලංකාවේ ක්‍රියාත්මක වෙන ජාත්‍යයන්තර වශයෙන් ISIS සංවිධානය ගැන ඉස්ලාම් අන්තවාදය ගැන මේ අය සාකච්ඡා කරලා කොයි තරම් අපිට මේක බලපානවාද කියන එක ගැන නිරන්තර අවදියෙන් හිටියා. ඉදලා යම් යම් අවස්ථාවලදී මාවත් දැනුවත් කරා. එතනදී ජාතික ආරක්ෂක මණ්ඩලයට යොමුවිය යුතු කරුණු යම් කිසි කරුණක් තිබුණා නම් මම ඒවා ඒ නිලධාරීන්ගෙන් ආරක්ෂක මණ්ඩලයට කරුණු ඉදිරිපත් කරලා ඒ වගේ ක්‍රමවේදයක් අපි අනුගමනය කරලා මේ ඉස්ලාම් අන්තවාදය ගැන Monitor කිරීමේ ක්‍රමවේදයක් මේ වාර්තා සමඟ අපි අනුගමනය කරා.

FAIR COMMENT
BY JEZEEM

ස්වාමිනි 2015.10 වෙනි මස 16 වන දින අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවාව නිලන්ත ජයවර්ධන මහතා විසින් පොලිස්පති NK. ඉලංගකෝන් මහතා වෙත එවා ඇති මෙම ලිපිය X 118 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

ප්‍ර: ස්වාමිනි තවත් ලිපියක් සාක්ෂිකරුගේ අවධානයට යොමු කිරීමට අවසර අයදිනවා ඒ ලිපියේ දාතම වන්නේ 2015.11. වෙනි මාසේ 17 වෙනිදා ඔබ වෙත එයත් රාජ්‍ය බුද්ධි සේවාවෙන් නිලන්ත ජයවර්ධන මහතා විසින් යොමු කොට තිබෙන ලිපියක් නේද ඉලංගකෝන් මහතාණනි?

පි: ඔව්

ප්‍ර: එහි මාතෘකාව වන්නේ අන්තර් ආගමික සමුළුව විසින් IS සංවිධානය සම්බන්ධව පවත්වන ලද සාක්ච්ඡාවක් නේද ?

පි: නිවැරදියි.

ස්වාමිනි එම ලිපිය X 119 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.එසේම සාක්ෂිකරුගේ අවධානයට 2015.12 වෙනි මාසේ 14 දින දරණ අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවයේ නිලන්ත ජයවර්ධන මහතා විසින් ඒවා ඇති ලිපියක් එහි මාතෘකාව ස්වාමිනි ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාම් සංවිධානය විසින් මුස්ලිම් තරුණයින් සඳහා නේවාසික පුහුණු වැඩමුළුවක් පැවැත්වීම යන හෙඩිම එය X 120 වශයෙන් ලකුණු කිරීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර: ඉලංගකෝන් මහත්මයා මා ඔබේ අවධානය යොමු කරන්නට කැමතයි X 118 වශයෙන් අපි ලකුණු කරලා ඉදිරිපත් කල පළවෙනි ලිපිය? ඔබට සාරංශගත කරලා මේ ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා මොකක්ද ISIS සංවිධානයට අදාලව ඔබේ අවධානයට යොමු කරලා තයෙන්නේ කියලා?

පි: එකේ අවසාන වශයෙන් කියලා තියෙන්නේ සහජීවනය පලදුවීමට හේතුවක් වේ. ඒක තමයි අන්තිම final observation එක

ප්‍ර: මොකක්ද සහජීවන පලදු වෙන්න හේතු වෙන්නේ ?

****

<u>ගරු විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරු X 118 ලේඛනය බලයි.

****

FAIR COMMENT BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: X 118 එය ස්වාමිනි අන්තර් ආගමික සමුළුව විසින් IS සංවිධානය සම්බන්ධව පවත්වන ලද සාකච්ඡාව කියන ශීර්ෂය යටතේ තියෙන්නේ?

පි: ස්වාමිනි මේ මේක මේ සම්මේලනයකට සහභාගීවීමක් ගැන තියෙන්නේ මෙතන මේ ප්‍රශ්න සහ පිළිතුරු දිහා බැලුවාහම මේ ලංකාවෙන් ගිය අය දීපු පිළිතුරු දිහා බැලුවාම පෙන්නේ ඒ අය අනෙක් පාර්ශව ආපු IS සංවිධානයේ සම්බන්ධතා ගැන අහපු සියලු ප්‍රශ්නවල මේ ගොල්ලෝ දීලා තියෙන්නේ මේ ගොල්ලෝ දීලා තියෙන්නේ නෙගෙටිව් පිළිතුරු දීලා තියෙන බවයි පෙනෙන්නේ. ඒ කියන්නේ ඒ අයත් පිළිඅරගෙන තියෙන්නේ ඒ වෙන කොට මෙහෙම IS සංවිධානයේ ක්‍රියාකාරිත්වයක් මෙහෙ නැහැ කියන එක තමයි මෙතනින් බොහෝ දුරට කියවෙන්නේ . ඒ කියන්නේ ඒකයි අපිට ලැබුණු තොරතුරු අනුව මේ වකවානුව වෙන කොට එහෙම විශාල ක්‍රියාකාරිත්වයක් පිළිබඳව අපිට බුද්ධි අංශවලින් වාර්තාවීමක් තිබුන් නැහැ කියන එකයි.

ප්‍ර: එතකොට දැන් මේ X 118 සඳහන් වෙනවා නේද මේ අන්තර් ආගමික සමුළුව පවත්වලා තියෙන්නේ බෞද්ධාලෝක මාවතේ කොළඹ 07 කියන ස්ථානයේ 2015 .10 වෙනි මාසේ 13 වෙනිදා කියලා?

පි: නිවැරදියි.

ප්‍ර: එතකොට මේ සමුළුවේ සාකච්ඡා වෙලා තියෙනවා IS සංවිධානය හා ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව කියන කරුණු නේද?

පි: නිවැරදියි .

ප්‍ර: ඒ සඳහා දේශකයා විදියට සමස්ථ ලංකා ජමෙයිතුල් උලමා සභාවේ දේශක අශ්ෂේක් මොහොමඩ් දහ්ලාන් මන්සූර් මහත්මයා සහභාගි වෙලා තිබිලා තියෙනවා?

පි: නිවැරදියි

ප්‍ර: එතකොට අන්තර් ජාතික සමුළුවේ නියෝජිතයින් 15ක් පමණ සහභාගිවෙලා තියෙනවා කියලා රාජ්‍ය බුද්ධි සේවය ඔබට වාර්තා කරලා තියෙනවා නේද ?

පි: නිවැරදියි ස්වාමිනි

ප්‍ර: එතකොට ඒ IS සංවිධානයේ ආරම්භයේ ඉඳලා මේ වාර්තාව ඉදිරිපත් කරන දවස දක්වා සිදු කරන ලද ක්‍රියාදාමයන් පිළිබඳව සමාවෙන්න මේ සමුළුව පවත්වන ලද අවස්ථා වන තුරු සිදු වූ ක්‍රියාදාමයන් පිළිබඳව මෙන්න මේ කරුණු 6 ක් යටතේ මේ අෂේක් මොහොමඩ් දහ්ලාන් මහතා විසින් කරුණු පැහැදිලි කරලා තියෙනවායි කියන එක පිළිබඳව ඔබට වාර්තා වෙලා තියෙනවා නේද?

පි: නිවැරදියි

ප්‍ර: මොනවද ඒ කරුණු 06 ඉලංගකෝන් මහත්මයා?

FAIR COMMENT BY JEZEEM

පි: IS සංවිධානයේ නායක යුදෙව් ජාතිකයෙකු වූ නායකයා යුදෙව් ජාතිකයෙකු බව හා ඇමරිකාවට අවශ්‍ය ආකාරයෙන් සංවිධාන කටයුතු ක්‍රියාත්මක කරන බව ඇමරිකාව අල්කයිඩා සංවිධානය බිහිකල ආකාරයට මෙම සංවිධානයත් ආරම්භ කරමින් සිරියාවේ ජනාධිපති බසිර් අසාර්ත්ගේ පාලනය පෙරලා දැමීමට කටයුතු කළ බව, බටහිර අධිරාජ්‍යවාදීන් තම බලය ව්‍යාප්ත කිරීමට මුස්ලිම් සමාජය විනාශ කිරීම මෙම සංවිධානය ආරම්භ කර ඇති බව, IS සංවිධානයේ සිටින සමාජිකයන් සුන්නි මුස්ලිම්වරුන් වන්නේ නම් ඔවුන් බහුතරය සුන්නි මුස්ලිම් ජාතිකයන් සිටින රටවල්වලට ප්‍රහාරය එල්ල කිරීම හා සුළු යුදෙව් ජාතිකයන් සිටින ප්‍රදේශවලට ප්‍රහාර එල්ල නොකිරීම ගැටලු සහගත බව, රුසියාව විසින් IS සංවිධානය ප්‍රහාරය එල්ල කිරීම සම්බන්ධව ඇමරිකාව කනස්සල්ලෙන් පසුවන බව හා රුසියා විසින් තමන්ට හිතවත් බසිර් අල්අසාද් බේරා ගැනීමට කටයුතු කරන බව , ශ්‍රී ලාංකිකයාද තම සහෝදරයාගේ මඟ පෙන්නීම යටතේ IS සංවිධානයට සම්බන්ධ වී ඇති බව හා ඔහු බටහිර රටවලට සම්බන්ධ රාජ්‍ය නොවන සංවිධානයක ක්‍රියාකාරී පුද්ගලයකු බව.

ප්‍ර: ඒ තමයි ඔය කරුණු 06?

පි: කරුණු 06.

ප්‍ර: එතකොට ඊට අමතරව ඔබ වෙත වාර්තා කරලා තියෙනවා නේද ඒ සමුළුවට සහභාගී වුන සමාජිකයෝ විසින් කරන ලද ඉදිරිපත් කරපු ප්‍රශ්නත් ඒ සම්බන්ධයෙන් සමස්ථ ලංකා ජමෙයිතුල් උලමා සභාවේ සාමාජිකයෝ ලබා දුන්න පිළිතුරුත් ඇමුණුමක් විදියට?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: එතකොට අහලා තියෙන එක ප්‍රශ්නයක් තමයි ශ්‍රී ලාංකික මුස්ලිම් ජාතිකයින් 07 දෙනෙක් මේ සංවිධානයට සම්බන්ධ වී සිටින බවට මාධ්‍ය හරහා ප්‍රචාරය වීම හා එහි සත්‍යතාවය පිළිබඳව එතකොට දීලා තියෙන උත්තරය මොකක්ද ජමෙයිතුල් උලමා සංවිධානය?

පි: මෙතෙක් මෙවැනි පුවතක් අනාවරණය වී නොමැති වී ඇති අතර මේ සම්බන්ධයෙන් සමස්ථ ලංකා ජමෙයිතුල් උලමා සභාව විසින් මුස්ලිම් සියලු අධ්‍යාපන ආයතන දැනුවත් කිරීමට කටයුතුකරන බවත් එවැනි ප්‍රවර්ධනයක් සිදුනොවන බවට සහතිකයක් තම සංවිධානයට විය හැකි බව.පිළිතුර මිය ගිය නිලාම්ගේ පවුලේ දරුවන් ද ඇතුලුව සමාජිකයන් 20 දෙනෙකු පමණ මෙම සංවිධාන සමඟ සම්බන්ධ වී ඇත. අපගේ දැනීමේ හැටියට වෙනත් කිසිවෙකු සම්බන්ධ වී නොමැත.

ප්‍ර: එහෙම තමයි උත්තර දීලා තියෙන්නේ ජමෙයිතුල් උලමා. ඊට පස්සේ දැන් අන්තර්ජාතික සමුළුවේ සාමාජිකයෝ අහලා තියෙනවා ප්‍රශ්නයක් මුස්ලිම් කාන්තාවන් පෙරට වඩා කලු පැහැති අබායා ඇදුම භාවිතා

Registrar Secretary's Copy
FAIR COMMENT — BY JEZEEM —

කිරීමට පෙළඹීම අන්තවාදය හෝ මෙවැනි ත්‍රස්වාදී සංවිධානවල පෙළඹීමක්ද ඒකට මොකක්ද දීලා තියෙන උත්තරේ?

පි: මුස්ලිම් කාන්තාවන්ට කලු පැහැති ඇඳුමක් ආගමේ දක්වා නොමැති අතර මැද පෙරදිග අභාෂයෙන් මුස්ලිම් කාන්තාවන් මෙවැනි ඇඳුම් වලට හුරුවී සිටී. පල්ලිය විසින් හෝ තම සංවිධානය විසින් කිසිදු පෙළඹවීමක් කර නොමැති බව .

ප්‍ර: ඊළඟට ප්‍රශ්නයක් අහලා තියෙනවා මුස්ලිම් මද්‍රසා හා අනෙකුත් විශ්ව විද්‍යාලවල විදේශ IS සමාජිකයන් අධ්‍යාපනය ලබනවද කියලා ඒකට මොකක්ද දීලා තියෙන උත්තරය?

පි: මෙතෙක් මෙවැනි පුවතක් අනාවරණය වී නොමැති අතර මේ සම්බන්ධව සමස්ථ ලංකා ජමෙයිතුල් උලමා සභාව විසින් මුස්ලිම් සියලු අධ්‍යාපන ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන බවත් මෙවැනි ප්‍රවර්ධනයක් සිදු නොවන බවට සහතිකයක් තම සංවිධානයට දිය හැකි බව .

ප්‍ර: ඊළඟට ප්‍රශ්නයක් අහලා තියෙනවා මුස්ලිම් සමාජය IS සංවිධානය අනුමත කරන්නේද හා මේ සඳහා සමස්ථ ලංකා ජමෙයිතුල් උලමා සංවිධානය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවද කියලා? ඒකට මොනවද ඒ ගොල්ලන් කියන්නේ?

පි: IS සංවිධානය ඉස්ලාම් නොවන සංවිධානයක් නිසා සමස්ථ ලංකා ජමෙයිතුල් උලමා සභාව විසින් 2014 වර්ෂයේ දී ප්‍රකාශයක් නිකුත් කර ඇත. 2015 වර්ෂයේ නිලාම් මියගිය පසුවත් නැවත ප්‍රකාශයක් නිකුත් කරමින් තම ස්ථාවරය සමාජයට ඉදිරිපත් කල අතර ඉදිරියටත් එම ස්ථාවරය ගෙනයාම හා තම සමාජය ආරක්ෂා කිරීම සංවිධානයේ වගකීම බවය.

ප්‍ර: ජමෙයිතුල් උලමා කියලා තියෙන්නේ එහෙමයි. හරි. X 119 මගිනුත් කියලා තියෙන්නේ අන්තර් ආගමික සමුළුව විසින් IS සංවිධානය සම්බන්ධව පවත්වන ලද සාකච්ඡාව ගැන ?

පි: නිවැරදියි

ප්‍ර: එතකොට 120 නමුත් ඒක කියන්නේ ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාම් සංවිධානය විසින් මුස්ලිම් තරුණයින් සඳහා නේවාසික පුහුණු වැඩමුළුවක් පැවැත්වීම ඒ ගැන නේද එකේ නිරීක්ෂණයක් ඉදිරිපත් කරලා තියෙනවා නේද ඔබේ අවධානයට රාජ්‍ය බුද්ධි සේවයේ එය අපට වැදගත් වන්නට පුළුවන් මන්ද මේ ගරු කොමිෂන් සභාව ඉදිරියට සාක්ෂි ඉදිරිපත් වෙලා තියෙනවා ජමාතේ ඉස්ලාම් සංවිධානය විසින් තරුණ දරුවන්ව විවිධ පුහුණුවීම් සඳහා ඔවුන් යොමු කරන බව ? ඔබ කියෙව්වානේ ඒක?

පි: කියෙව්වා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මොකක්ද ඒ නිරීක්ෂණය ඉදිරිපත් කරන්නේ රාජ්‍ය බුද්ධි සේවය ඔබේ අවධානයට?

පි: බුද්ධි සේවය කියන්නේ මේ තරුණ කොටස්වලට මුස්ලිම් අන්තවාදය ගැන දේශන පවත්වමින් යනවා කියලා එක්තරා සංවිධානයක්.

ප්‍ර: ඔව් ඒ කියන්නේ ශ්‍රී ලංකා ජමාත් ඉස්ලාම් සංවිධානය ?

පි: නිවැරදියි.

ප්‍ර: ඒ වගේම ඔවුන් කියනවා නේද මහනුවර, පුත්තම, හා කෑගල්ල යන දිස්ත්‍රික්ක වල ඒවා ක්‍රියාකාරිව තියෙනවා කියලා

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: 2015.12.මාසේ 14 වෙනිදා ඔබ වෙත දානමින් ඔබ වෙත එවලා ඇති මේ X 120 ලිපියේ සඳහන් වෙනවා නේද එහි නායකයා විදියට උද්සාත් රෂීඩ් හජ්ජුල් අක්බර් යන අය කටයුතු කරනවා කියලා?

පි: නිවැරදියි ගරු ස්වාමිනි.

ප්‍ර: ඒ විතරක් නොවෙයි රාජ්‍ය බුද්ධි සේවය ඔබ වෙත ඒවන විටත් කරුණු වාර්තා කරලා තියෙනවා නේද මේ සංවිධානය සෞදි අරාබියාව,කටාර් ඉන්දියාව හා පාකිස්ථානය යන රටවල් සමඟ සම්බන්ධතා පවත්වනවා කියලා?

පි: නිවැරදියි ස්වාමිනි

ප්‍ර: එහි සඳහන් වෙනවද රාජ්‍ය බුද්ධි සේවය විසින් වාර්තා කරලා දැඩි මතධාරී මුස්ලිම් ආගමික සංවිධානයක් ලෙස මේ ශ්‍රී ලංකා තවුහිද් ජමාත් සංවිධානය හඳුනාගෙන තියෙනවා ඒ වගේම මේ ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාම් සංවිධානයත් මුස්ලිම් තරුණ කොටස් ඉලක්ක කරගනිමින් විවිධ දේශන හා පුහුණු කඳවුරු පැවැත්වීම වර්ධනය වෙලා තියෙනවා කියලා?

පි: නිවැරදියි.

ප්‍ර: එතකොට ඉලංගකෝන් මහත්මයා ඔබ මොකක්ද මේ සම්බන්ධයෙන් ගත්ත පියවර?

පි: ස්වාමිනි මේ සම්බන්ධයෙන් මට මේ අවස්ථාවේදී පැහැදිලි උත්තරයක් දෙන්න බැහැ අනිවාර්යෙන්ම මේ සම්බන්ධයෙන් මෙම ක්‍රියාමාර්ගයක් අරගෙන ඇති ඒ පිළිබඳව අදාල ලිපිගොනු පොලිස් මූලස්ථානයේ ඇති මේ ලිපියට මං ක්‍රියාමාර්ගයක් ගත්තේ මොකක්ද ක්‍රියාමාර්ගය කියන එක ඒ ලිපි ගොනු පරීක්ෂා කරලා බලලා තමයි මට නිවැරදි පිළිතුරක් දෙන්න පුළුවන් වෙන්නේ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු යම් කිසි පියවරක් ගන්න ඕන බව ඔබ පිළි ගන්නවද?

පි: පිළිගන්නවා.

****

FAIR COMMENT BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර: ඔබ මීට ස්වල්ප වේලාවකට පෙර ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරනු ලැබුවා ඔබ යම් ක්‍රමවේදයක් ආරම්භ කරනු ලැබුවාය කියලා රාජ්‍ය බුද්ධි ප්‍රධානීව කැඳවලා ඒ වගේම CID එක,TID එක ඇතුළු පොලිස් විශේෂ කාර්යංශය මේ සියල්ලෝම කැඳවලා යම් කමිටුවක් හැදුවයි කියලා ?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ඒ කමිටුව ක්‍රියාත්මක වුනේ කාගේ යටතේ ද?

පි: මගේ මතකය හැටියට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නන්දන මුණසිංහ මහත්මයා යටතේ.

ප්‍ර: එතකොට ඒ කමිටුව පිහිටුවීමෙන් ඔබ මොකක්ද අදහස් කරේ බලාපොරොත්තු වුනේ කියන එක නැවතත් ගරු කොමිෂන් සභාවේ අවධානයට ගෙන්නට පුළුවන්ද ඔබට?

පි: විශේෂයෙන්ම බලාපොරොත්තු වුනේ දැන් මේ මුස්ලිම් අන්තවාදය පිළිබඳව ක්‍රියාකරන ආයතනික කීපයක් තියෙනවානේ TID එක CID එක SIS එක special branch එක එතකොට අපි ප්‍රයෝගික දැකපු දෙයක් තමයි මේ කණ්ඩායම් එක එක්කෙනා ලඟ තියෙනවා කොටස් ටික ටික මේවා සම්බන්ධීකරණයක් වෙන්න ඕනේ එතකොට තමයි අපිට නිවැරදි පින්තූරය දැන ගන්න පුළුවන් වෙන්නේ. ඒ සම්බන්ධීකරණය නැතිවීම නිසා තමයි බොහෝ තැන් වල ගැටලු ඇතිවෙලා තියෙන්නේ. මේක තමයි මූලික පරමාර්ථය වුනේ

ප්‍ර: මේ කමිටුවේ පිහිටුවීමේ මුඛ්‍ය පරමාර්ථය වුනේ මේ හැම ආයතනයක්ම සම්බන්ධීරණයද ඔබේ යටතේ ඉන්න?

පි: සම්බන්ධීකරණය කිරීම තමයි ප්‍රධාන පරමාර්ථය ඊළඟට මේක ගැන follow up කරන්න අවදියෙන් ඉන්න අවධානයෙන් ඉන්න.

ප්‍ර: පසු විපරම් කිරීම?

පි: පසු විපරම් කිරීම සහ පස්සෙන් යන්න

ප්‍ර: ඔබ ඒ වගේම කිව්වා මේ සම්බන්ධයෙන් මේ කමිටුවට කාලිනව ඔබට වාර්තා කිරීමක් සිදු කරනු ලැබුවාය කියලා?

පි: ඔව් වරින් වර වාර්තා කරා.

ප්‍ර: දැන් එහෙම නම් ඔබට කියන්නට පුළුවන්ද මේ පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විදියට පොලිස්පතිවරයාට වක්‍රලේඛ සහ උපදෙස් පත්‍රිකා නිකුත් කරන්නට පුළුන්ද කියලා?

පි: පුළුවන් කම තියෙනවා.

ප්‍ර: ඒ සඳහා ඔහුට බලතල ලැබෙන්නේ කුමන විදිවිධාන යටතේද?

පි: පොලිස් දෙපාර්තමේන්තුව නියෝග තියෙනවා ඒක පොලිස් දෙපාර්තමේන්තුවේ මං හිතන්නේ ඒක ආරම්භ වෙච්ච දවසේ ඉදලා සිදුවෙන ක්‍රියාදාමයක් පොලිස්පතිට බලය තියෙනවා මට විතරක්

FAIR COMMENT BY JEZEEM

නෙවේ. දැන් නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට පොලිස් අධිකාරි වරුන්ට පවා තියෙනවා එයාලාත් කොට්ඨාශ මට්ටමින් උපදෙස් චක්‍රලේඛන නිකුත් කිරීමේ බලය තියෙනවා.

ප්‍ර: උපදෙස් පත්‍රිකාවක් චක්‍රලේඛයකින් වෙනස් **(සකස් කර නැවත ප්‍රශ්නය අසයි)** චක්‍රලේඛයක් කියන්නේ මොකක්ද උපදෙස් පත්‍රිකාවක් චක්‍රලේඛයකින් වෙනස් වෙන්නේ කොහොමද?

පි: චක්‍රලේඛයක් ප්‍රධාන වශයෙන් නිකුත් කරන්නේ පොදු පරිපාලන කටයුත්තක් සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සඳහා උපදෙස් පත්‍රිකාවක් නිකුත් වෙන්නේ එක්කෝ නිශ්චිත කාරණාවක් පිළිබඳව පැහැදිලි කරලා ඒ කාරණාවට අවශ්‍ය උපදෙස් ලබාදෙන්න එහෙමත් නැත්නම් කලින් චක්‍රලේඛනයකින් හෝ උපදෙස් පත්‍රිකාවකින් නිකුත් කරපු නියෝගයක් උපදෙසක් හරි ආකාරව ක්‍රියාත්මක නොවන අවස්ථාවක නැවත ඒක සිහිපත් කරලා ඒකට තව අතිරේක උපදෙස් දීලා දැනුවත් කිරීම සඳහා තමයි උපදෙස් පත්‍රිකාවක් විශේෂයෙන් නිකුත් වෙන්නේ operation matters වලදි .

ප්‍ර: මොකක්ද operation matters කියන්නේ?

පි: පරිපාලනයට අදාල චක්‍රලේඛනයකටඋදාහරණයක් ලෙස ගත්තොත් දැන් පුද්ගලයෙක් . clearance certificate එකක් ඉල්ලුවොත් මොකක්ද අනුගමනය කරන්න ඕන ක්‍රියා මාර්ග?

ප්‍ර: ඒ කියන්නේ ඔය නිශ්කාශන වාර්තාවක් ඉල්ලා සිටීමේදී ගත යුතු ක්‍රියාමාර්ගය මොකක්ද?

පි: මේක පැහැදිලි කරන්න අපි නිකුත් කරන්නේ චක්‍රලේඛයක් ඒක පරිපාලන ක්‍රමවේදයක් ඊළඟට අපි කිව්වොත් දැන් ඊයේ කොහේ හරි පොලිසියක බිට් එකේ හිටපු රාළහාමි කෙනෙක්ගේ රිවෝල්ව් වරය අපරාධ කාරයෙක් හරි මිනිහෙක් හරි උදුරගෙන ගියා.

ප්‍ර: ඔව් උදාහරණය?

පි: උදාහරණයක් ඒ අවස්ථාවේදී හෙට මම දාන්නේ උපදෙස් පත්‍රිකාවක් මේ රිවෝල්ව්වරය පැළඳුගෙන යාම සම්බන්ධයෙන් මීට කලින් උපදෙස් රාශියක් දීලා තියෙනවා ඒවා පැහැර ඇරලා තියෙනවා Len yard යාඩ් එක දාලා ඒකට ගැටගහලා දාගෙන යන්න කියලා තියෙනවා ඒවා පැහැර හැරලාමේක වෙලා තියෙන්නේ මේක නොවිය යුතුයි මින් ඉදිරියට මෙහෙම මෙහෙම කරන්න කියලා නැවත උපදෙස් පත්‍රිකාවක් යනවා ඒකතමයි මං කිව්වේ Operational matters එකක් කියලා මේක තමයි

ප්‍ර: එතකොට උපදෙස් පත්‍රිකාවක් බලපවත්වන්නේ කොපමණ කාලයක් ද එකේ බලපැවැත්ම රදා පවතින්නේ මොකක් මතද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඒක ක්‍රියාත්මක වෙනවා ඊළඟට චක්‍රලේඛනයකින් හරි උපදෙස් පත්‍රිකාවකින් හරි ඒක evaluate කරලා නැවත නිකුත් කිරීමක් වෙනකම් ඒක ක්‍රියාත්මක වෙනවා.

දැන්වේලාව . ප.ව. 3.35
මෙතැන් සිට : මුතුමාලි මෙනවිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.03.35 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : ඔබේ ධූර කාලය තුළදීත් ඔබ උපදෙස් පත්‍රිකා නිකුත් කරන්නට ඇතිනේ?

පි : නිකුත් කරලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : මා ඔබේ අවධානයට උපදෙස් පත්‍රිකා අංක 15/2014 කියන උපදෙස් පත්‍රිකාව යොමු කරන්නට කැමති? ඒක කියවලා ඔබට ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන්ද ඔබේ මතකය අවධි කරගෙන කුමන අවස්ථාවක කුමන අවස්ථානුගත කරුණු යටතේ ද ඔබ මේ උපදෙස් පත්‍රිකාව නිකුත් කළේ කියලා? මොන අවස්ථාවේද ඕක නිකුත් කළේ?

පි : මේ උපදෙස් පත්‍රිකාව නිකුත් කරන්න හේතු වුණේ 2014 බේරුවල සිද්ධියෙන් පස්සේ ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ඒ සිද්ධිය කෙටියෙන් කියන්න පුළුවන් නම්?

පි : බේරුවල මුස්ලිම් සිංහල ගැටුමක් ඇති වුණා එතෙන්දී විශාල වශයෙන් දේපල හානියක් සහ ජීවිත හානියකුත් සිද්ධ වුණා.

ප්‍ර : මොන වකවානුවේද සිද්ධ වුණේ?

පි : 2014 මට මතක විදිහට.

ස්වාමිනි අංක 15/2014 දරණ උපදෙස් පත්‍රිකාව C 855 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.

ප්‍ර : ඔබ කිව්වා බේරුවල සිදු වූ සිංහල මුස්ලිම් ගැටුමෙන් පස්සේ තමයි මේ උපදෙස් පත්‍රිකාව ඔබ නිකුත් කරනු ලැබුවේ කියලා?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : උපදෙස් පත්‍රිකාවක් එහෙම නම් නිකුත් කරන්නට ඔබ යම් යම් කරුණු සලකලා බලන්නට ඇතිනේ. දැන් මේ C 855 ලේඛනයේ මාතෘකාව වෙන්නේ බුද්ධි තොරතුරු එක් රැස් කිරීමට පොලිස් ස්ථාන මට්ටමින් නිලධාරීන් අනුයුක්ත කිරීම? ඔබ කියනවා ඔබේ පිළිතුරේ මේ C 855 නිකුත් කරන්නට ඔබට හේතු වුණේ 2014 බේරුවල සිදු වූ සිංහල මුස්ලිම් ගැටුම කියලා?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : මොකක්ද මේ දෙක අතර තියෙන සම්බන්ධය?

පි : ඒ සිද්ධියේදී අපිට පෙනී ගියා අපිට නිවැරදි බුද්ධි තොරතුරු තිබුණා නම් මේ සිද්ධිය මීට වඩා අවම කර ගන්න තිබුණා සමහර විට ඇති වීම නවත්ත ගන්නත් තිබුණා. එතෙන්දී ඒ බුද්ධි

FAIR COMMENT BY JEZEEM

තොරතුරු ලබා ගැනීමට එතෙක් තිබුණ ක්‍රමවේදයේ අඩුපාඩු රාශියක් මම දැක්කා.

ප්‍ර : මම දැන් කැමති ඔබට එහිදී බාධා කරන්න දැන් ඔබට තියෙනවනේ පොලිස් විශේෂ කාර්යාංශය ඔය තොරතුරු බුද්ධි තොරතුරු රැස් කරන්නට ඉතින් එතකොට කොහොමද ඒක ඇවිල්ලා විශේෂයෙන් බුද්ධි තොරතුරු රැස් කිරීම සඳහා තියෙන කාර්යාංශයක්නේ. එහෙනම් මොකද මේ නැවත උපදෙස් පත්‍රිකාවක් මඟින් ඔබ ඒ ගැන අවධානය යොමු කරන්නේ?

පි : විශේෂ කාර්යාංශය පොලිස්පතිගේ සෘජු අධීක්ෂණයට යටතේ තියෙන ආයතනයක්.

ප්‍ර : ඔව්.

පි : එතකොට ඒ විශේෂ කාර්යාංශයට අනුයුක්ත බුද්ධි නිලධාරීන් ප්‍රධාන වශයෙන් ඒ ගොල්ලන්ගේ ඒ ප්‍රාදේශීය අධීක්ෂණ නිලධාරීන් හරහා ඒ ගොල්ලො වාර්තා කරන්නේ පොලිස් මූලස්ථානයේ ඉන්න ඒ ගොල්ලන්ගේ අධ්‍යක්ෂකවරයාට. ඒ ගොල්ලන්ට ලැබෙන බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් ස්ථානාධිපතිවරයාට හෝ ඒ පළාතේ ඉන්න අවම වශයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාටවත් ඒ ගොල්ලො සෘජුවම වාර්තා කරන්නේ නෑ. හුහක් අඩුයි. ඒ කියන්නේ බැඳීමක් නෑ ඒ ගොල්ලන්ගේ. ඒ ගොල්ලන්ගේ බැඳීම තියෙන්නේ පොලිස් මූලස්ථානයේ ඒ ගොල්ලන්ගේ අධ්‍යක්ෂකවරයාට වාර්තා කරන්න. මේක තමයි මෙතන අපි දැකපු අඩුපාඩුව. පොලිස් ස්ථානාධිපතිවරයාට මේ බුද්ධි තොරතුරු ලැබීමේ යම් කිසි ප්‍රමාදයක් හෝ අඩුවක් තියෙනවා කියන එක . ඒකට විසඳුමක් වශයෙන් තමයි මම මේ උපදෙස් පත්‍රිකාව නිකුත් කළේ. Special Branch එක මත පමණක් රැඳෙන්න එපා ස්ථානාධිපතිවරයා තමන්ගේ ස්ථානයෙන් තමන්ගේ නිලධාරීයෙක් බුද්ධි තොරතුරවලට යොදවලා තමන්ට අවශ්‍ය විදිහට බුද්ධි තොරතුරු රැස් කරන්නයි කියන එක.

ප්‍ර : දැන් මේ ලිපිය ඒ කියන්නේ උපදෙස් පත්‍රිකාව ඔබ විසින් යම් විශේෂිත නිලධාරීන් කණ්ඩායමක් වෙත තමයි නිකුත් කරලා තියෙන්නේ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් හරිනේ?

පි : එසේමයි ස්වාමිනි.

ප්‍ර : සියළුම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් වෙත?

පි : මගේ පරිපාලන ක්‍රමවේදය අනුව මගේ නියෝජිතයා වෙන්නේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයයි. එම නිසා මම බොහෝ විට

FAIR COMMENT BY JEZEEM

මගේ නියෝග නිකුත් කරන්නේ ඔහු හරහා. ඔහුටයි මම භාර දෙන්නේ මගේ නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම.

ප : ඉලංගකෝන් මහත්මයා දැන් ඔය පරිපාලන කටයුතුවලදීත් තියෙනවනේ වගකීම් සහ වගවීම. Accountability and responsibility එතකොට ඔය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් වෙත පළාත් භාර ඔබ මේ උපදෙස් පත්‍රිකාව නිකුත් කළාම බුද්ධි තොරතුරු එක් රැස් කිරීමට පොලිස් ස්ථාන මට්ටමින් නිලධාරීන් අනුයුක්ත කිරීම කියලා වගකියන්නේ කවුද ඔබට?

පි : අනිවාර්යෙන්ම ඒ ලිපිය

ප : වගවෙන්නේ කවුද?

පි : මට වගකියන්න ඕනේ ඒ ලිපිය යොමු කරපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් ඒකේ මම පැහැදිලිවම කියලා තියෙනවා මේක ක්‍රියාත්මක වන බව තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් සකස් කරන්නත් කියලා කියලා තියෙනවා. එතකොට මේ ලිපිය යොමු කරපු එක්කෙනාට තමයි මේවා කියන්නේ. එතකොට එයා තමයි මට වගකියන්න ඕනේ.

ප : වගකියන්න ඕනේ? එතකොට ඔබ ඒ වගේම කියනවා ඒ ලිපිය අනුව 4 වෙනි ඡේදයේ සඳහන් කරනවා ඔබ බුද්ධි තොරුතුරු එක් රැස් කිරීමට අනියුක්ත කරනු ලබන නිලධාරීන් අනෙකුත් සියළු රාජකාරී කටයුතුවලින් මුදා හල යුතු අතර ඔවුන් පොලිස් ස්ථානාධිපතිගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියා කළ යුතුය කියලා. ඇයි ඔබ ඒ විදිහට මේ උපදෙස් පත්‍රිකාවේ අදහස් ගලපන්නට තීරණය කළේ?

පි : ප්‍රධානතම හේතුව ස්වාමිනි නැවත වරක් අර අලුත්ගම වගේ සිද්ධියක් ඇති වීම වැළැක්වීමට අවශ්‍ය බුද්ධි තොරතුරු කල්වේලා ඇතිව සාර්ථක බුද්ධි තොරතුරු ලබා ගැනීම. දෙවැනි කාරණාව තමයි ඒ වගේ ටිකක් දැඩි විදිහට මේක සඳහන් නොකළොත් මේ නිලධාරීන් වෙනත් වෙනත් රාජකාරී වලට යෙදවීමේ ප්‍රවණතාවයක් තියෙනවා. සමහර විට විශේෂ රාජකාරියක් සඳහා වෙනත් පොලිසියකින් ඉල්ලුවොත් මේ අය සමහර විට යවන්නට ඉඩ තියෙනවා. සමහර විට වෙනත් පරීක්ෂණයක් සඳහා යවන්න ඕනේ වුනොත් ඒකටත් සමහරක් විට යවන්න ඉඩ තියෙනවා. ඒ දේවල් වළක්වලා මේ අය සම්පූර්ණයෙන්ම බුද්ධි තොරතුරු සඳහා පමණක් යෙදවීමේ ඇති වදැගත්කම බුද්ධි තොරතුරු වල තියෙන වැදගත්කම ලබා ගැනීමේ තියෙන වැදගත්කම නිසාමයි මේ වගේ ටිකක් දැඩි වාක්‍යයක් මේකට ඇතුළත් කළේ. ඊළඟට ස්වාමිනි මම ඒකේ සඳහන් කරලා තියෙනවා මේ මෙලෙස බුද්ධි තොරතුරු රැස්

FAIR COMMENT BY JEZEEM

කිරීමට අනියුක්ත කරනු ලබන නිලධාරීන් අනිකුත් සියළු රාජකාරී කටයුතුවලින් මුදා හල යුතු අතර ඔවුන් පොලිස් ස්ථානාධිපතිගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියා කළ යුතුය. එම නිලධාරීන් විසින් ලබා ගන්නා බුද්ධි තොරතුරු නොපමාව පොලිස් ස්ථානාධිපතිවරයාට දැනුම් දිය යුතු අතර එලෙස ලබා දෙන බුද්ධි තොරතුරු ස්ථානාධිපතිවරයා විසින් විශ්ලේෂණය කොට අවශ්‍ය ක්‍රියා මාර්ග වහාම අනුගමනය කළ යුතුය. එමෙන්ම ජාතික ආරක්ෂාවට අදාළ හෝ වෙනත් සංවේදී sensitive කරුණක් සම්බන්ධයෙන් ලබා දෙන්නා වූ බුද්ධි තොරතුරු ස්ථානාධිපතිවරයා විසින් වහාම තම දිස්ත්‍රික්කය සහ කොට්ඨාශ භාර නිලධාරියාට දැනුම් දීමට ක්‍රියා කළ යුතුයි.

ප්‍ර : ඔව් එතකොට ඒක කරන ක්‍රමවේදය පිළිබඳව පවා ඔබ එහි සඳහන් කරලා තියෙනවා නේද?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම ඔබ තීරණය කරලා තියෙනවා නේද මේ උපදෙස් පත්‍රිකාව මඟින් උපදෙස් දෙමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් වෙත ඔබට වගකියන මෙසේ බුද්ධි තොරතුරු එක් රැස් කිරීම සඳහා දක්ෂතාවයක් දක්වන උනන්දුවක් දක්වන ඉහළ බුද්ධි මට්ටමකින් යුත් නිලධාරීන් පිරිසක් තෝරා ගැනීම සිදු කරන්නට ඕනේ කියලා?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම ඔවුන්ව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් තෝරා ගන්නට ඕනේ කියලා?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : එසේ තෝරා ගනු ලබන නිලධාරීන් රාජ්‍ය බුද්ධි සේවාව මඟින් පුහුණුවක් ලබා දෙන්නට ඕනේ කියලා?

පි : නිවැරදි.

ප්‍ර : ඇයි ඔබ එසේ තීරණය කළේ ඔවුන්ට රාජ්‍ය බුද්ධි සේවාව මඟින් පුහුණුවක් ලබා දෙන්නට ඕනේ කියලා?

පි : ස්වාමිනි මේ බුද්ධි තොරුතුරු එහෙම නැත්නම් බුද්ධි අංශ නිලධාරීයෙක් විදිහට කටයුතු කිරීම සියළු දෙනාටම කරන්න බැහැ. ඒක විශේෂ කාර්යයක් Specialized job එකක්. විශේෂයෙන්ම මේකට IQ එහෙම නැත්නම් common sense කියන එක මේ මේ දේවල් ඉතාමත් වැදගත්. ඒකයි සම්මුඛ පරීක්ෂණයක් පවත්වන්න කිව්වේ. සම්මුඛ පරීක්ෂණයේදී හඳුනා ගන්න ඕනේ මේ බුද්ධි නිලධාරීයෙකුට අවශ්‍ය මූලික ලක්ෂණ දක්ෂතාවයන් තියෙනවනේ කියන එක. එහෙම නැතුව සියළු දෙනාටම මේ ඔළු ගෙඩි දිහා බලලා මූණ බලලා මේ රාජකාරියට

FAIR COMMENT BY JEZEEM

යොදවන්න පුළුවන්කමක් නෑ. ඒකයි සම්මුඛ පරීක්ෂණයක් පවත්වලා තෝර ගන්න කියලා කිව්වේ පළවෙනි කාරණාව. දෙවෙනි කාරණාව එහෙම තෝර ගත්තත් ඒ සියළු දෙනාටම එක පාරටම බුද්ධි තොරතුරු රැස් කිරීම කරන්න බැහැ. මේකට පුහුණුවක් අවශ්‍යයි. මේක Specialized job විශේෂ රාජකාරියක්. විශේෂ නිපුණතාවයක් අවශ්‍යයි. ඒක නිසා තමයි දැනට මම හිතන්නේ කවුරුත් පිළිගන්නවා ඇති රටේ ඉන්න බුද්ධි කටයුතු සම්බන්ධයෙන් වෘත්තීමය වශයෙන් ඉහළ මට්ටමක ඉන්න ආයතනය තමයි රාජ්‍ය බුද්ධි සේවය. ඒ නිලධාරීන් දේශීය විදේශීය පුහුණුව ලබපු අය. ඒක නිසයි මම යොමු කළේ ඒ අය ලවා මේගොල්ලන් පුහුණු කරවලා රාජකාරියට යොදවන්න කියලා. නුපුහුණු නිලධාරියෙක් මේකට යොදවලා කවදාකවත් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගන්න බැහැ. ඒ කාරණා නිසා තමයි මේ වාක්‍ය ඇතුළත් කළේ.

ප : ඒ වගේම ඔබ නියෝගයක් කරලා තියෙනවා නේද උපදෙස් පත්‍රිකාව මඟින් නැත්නම් උපදෙසක් දීලා තියෙනවා නේද බුද්ධි තොරතුරු අංක 7 බුද්ධි තොරතුරු එක් රැස් කිරීම සඳහා අනුයුක්ත කළ නිලධාරීන්ගේ සාර්ථක හා අසාර්ථක භාවය සතිපතා මැන බැලිය හැකි විධිමත් ක්‍රම්වේදයක් සකස් කරන්නට ඕනේ කියලා?

පි : නිවැරදි ස්වාමිනි.

ප : ඇයි ඔබ ඒ වගේ වගන්තියක් ඇතුළත් කළේ මේ උපදෙස් පත්‍රිකාවට?

පි : අපි මේ චක්‍රලේඛ යවලා නිකුත් කරලා කොළවලට සීමා වෙලා කවදාවත් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. ඒකේ පසුවිපරමක් අවශ්‍යයි. මේ නිලධාරීන් පුහුණු කරලා යොමු කරලා ක්ෂේත්‍රයට දැම්මට පස්සේ අපි බලන්න ඕනේ මොකක්ද ඒකේ ඒ අයගේ සාර්ථකත්වය කියලා. එහෙම නැත්නම් ඒ ඒ අපේ උත්සහයේ ප්‍රතිඵලයක් නැහැ. ඉතින් ඒක නිසා තමයි මම මේ යොමු කරලා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට තමයි ඒ උපදෙස දීලා තියෙන්නේ. ඒකට ක්‍රමවේදයක් ඒගොල්ලො සකස් කරන්න කියලා. ඒගොල්ලොන්ගෙන් දෙනික, weekly report එකක් කැඳවන්න පුළුවන්. කැඳවලා සෑම බුද්ධි නිලධාරියෙක්ගෙන්ම අහන්න පුළුවන්. පහුගිය සතියේ ඔබ ගත්ත බුද්ධි තොරතුරු මොකක්ද කොයි තරම් සාර්ථකද එහෙම හැමදාම එයාට බුද්ධි තොරතුරු නැත්නම් ඒ කියන්නේ එයා අසාර්ථකයි එහෙම නම් එයා අයින් කරන්න ඕනේ. ඒ වෙනුවට වෙන නිලධාරියෙක් යොදවන්න ඕනේ. එතකොට සාර්ථක බුද්ධි තොරතුරු නම්

FAIR COMMENT BY JEZEEM

එයාව දිරිමත් කරන්න ඕනේ. එයාට reward එකක් දෙන්න ඕනේ. ඒක තමයි වැඩ පිළිවෙල.

ප : එතකොට ඉලංගකොන් මහත්මයා ඔබ හිතනවද භූමියේ සිටින බුද්ධි තොරතුරු රැස් කරන්නා වූ තැනැත්තා ඔබ විසින් මහ පෙන්වන ලද ආකාරයට මේ උපදෙස් පත්‍රිකාව මඟින් තෝරා ගෙන විධිමත්ම ක්‍රියාත්මක කළා නම් එවිට පොලිස්පතිවරයා දක්වා වූ ඒ ස්ථානය දක්වා මේ අවශ්‍ය තොරතුරු ගලා ඒම බාධාවකින් තොරව සිදු වෙනවා කියලා?

පි : මේ උපදෙස් නිසියාකාරව ක්‍රියාත්මක වුණා නම් අනිවාර්යෙන්ම ඒක මේ විදිහට සිද්ධ විය යුතුයි.

ප : ඔබේ මේ C 855 හයවන ඡේදයේ ඔබ කියනවා බුද්ධි තොරතුරු එක් රැස් කිරීමේ කාර්යය සඳහා තෝරා ගනු ලබන නිලධාරීන් අදාළ පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අනුමැතියකින් තොරව වෙනත් ස්ථානයකට මාරු කර යැවීම එම රාජකාරී කටයුතුවලින් ඉවත් කිරීම හෝ අලුතින් නිලධාරීන් අනියුක්ත කිරීම සිදු නොකළ යුතුයි කියලා නේද?

පි : නිවැරදි ස්වාමිනි.

ප : ඒ කියන්නේ පුහුණුව ලබා දුන්න නිලධාරීන් ඒ අදාළ ස්ථානයේම අනුයුක්ත වෙලා ඉන්නට ඕනේ කියන එකද ඔබ අදහස් කළේ?

පි : නිවැරදි. ස්වාමිනි දැන් අපේ පරිපාලන බලතල අනුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන්ට පුළුවන් මේ පොලිස් කොස්තාපල්වරු සාජන්වරුන් මාරු කරන්න.

ප : ඔව්.

පි : ඉතින් ඒ බලතල පාවිච්චි කරලා මේ නිලධාරීන් එහාට මෙහාට මාරු කළොත් මේ ව්‍යායාමය අසාර්ථක වෙනවා.

ප : අසාර්ථක වෙනවා. එතකොට ඒක ජාතික ආරක්ෂාවට බලපාන්නට පුළුවන්?

පි : බලපාන්න පුළුවන්. අපේ ව්‍යායාමය සම්පූර්ණයෙන් අසාර්ථක වෙනවා.

ප : එහෙම නම් මට තියෙනවා ඔබෙන් දෙයක් දැන ගන්නට. ඔබ මේ ආකාරයට උපදෙස් පත්‍රිකාවේ උපදෙස් ලබා දුන්නට පස්සේ එම නිලධාරීන්ට ඒ කියන්නේ බුද්ධි නිලධාරීන් විසින් ලබා දුන්න සේවය පැය 24 කට වූ කාලයක් සඳහාද නැත්නම් යම් නිශ්චිත පැය ගණනකටද තියෙන්නේ දවසකට. ඒ කියන්නේ අනිත් අයට වගේ ඒ ගොල්ලන්ට තිබුණද යම් කාලයකට විතරක් රාජකාරී කරන්න. නැත්නම් ඒ ගොල්ලොන්ගේ රාජකාරියේ කාල සීමාවල් දින සීමාවල් සේවා මුර අනුවද ඔවුන් සේවය කළේ වෙන විදිහකින් කියනවා නම් එහෙම නැත්නම් ඔවුන්ගේ රාජකාරිය බැලුවාම

FAIR COMMENT BY JEZEEM

ඔවුන්ට ඔවුන්ට දින වකවානු නොමැතිවද ඔවුන් සේවය කිරීම ඔබ විසින් අපේක්ෂා කළේ?

පි : ස්වාමිනි පොලිස් ආඥා පනතේ 56 වෙනි වගන්තිය යටතේ දවසේ පැය 24 ම පොලිස් නිලධාරීන් රාජකාරී. ඒක මේ සියළු දෙනාටම අදාළයි.

ස්වාමිනි පොලිස් ආඥා පනතේ 56 වන වගන්තිය ආරම්භ වෙන්නේ පොලිස් නිලධාරීන්ගේ යුතුකම් හා වගකීම් කියන ශීර්ෂය යටතේ. 56 මෙහෙම කියනවා මෙම පනතෙහි සියළුම කාර්යයන් සඳහා සෑම පොලිස් නිලධරයෙක්ම සෑම වෙලෙහිම සිය ආරක්ෂාවෙහි නියුක්ත ලෙස සලකනු ලැබේ. පොලිස් නිලධරයෙකුගේ බලතල දිවයිනේ සෑම කොටසකම පාවිච්චි කිරීමට ඔහුට බලය ඇත්තේය. ඔහුගේ යුතුකම් පහත සඳහන් වන්නේය.

(අ) සියළුම අපරාධ වැරදි සහ පොදු හිරිහැර වැළැක්වීමට තමාගේ සම්පූර්ණ ධෛර්ය සහ ශක්තිය යෙදවීම.

(ආ) සාමය ආරක්ෂා කිරීම.

(ඇ) අනිසි ලෙස හැසිරෙන සහ අවිශ්වාස උපදවන තැනැත්තන් සිර භාරයට ගැනීම.

(ඈ) වරදකරුවන් සොයා දැන ගැනීම හා ඔවුන් අධිකරණයට ඉදිරිපත් කිරීම.

(ඉ) පොදු සාමය සම්බන්ධයෙන් ආරංචි එක් රැස් කිරීම සහ ඒවා දැන්වීම සහ

(ඊ) යම් කිසි බලධරයෙකු විසින් නීත්‍යානුකූලව නිකුත් කරනු ලැබූ සියළුම නියෝග සහ වරෙන්තු තමා වෙත කරනු ලැබූ නියමය අනුව අප්‍රමාදව පිළිපැදීම හා ඉටු කිරීම.

ප්‍ර : ඒකේ කියන්නේ නැනේ?

පි : පළවෙනි කොටසේ තියෙනවා. ඉංග්‍රීසි එකේ බලන්න පැහැදිලිවම තියෙනවා.

ප්‍ර : සියළු අවස්ථාවල?

පි : සියළු අවස්ථාවන් කියලා තියෙන්නේ.

ප්‍ර : සියළු අවස්ථා කියලා කියන්නේ ඒ කියන්නේ පැය 24 ම?

පි : පැය 24 ම කියන එකයි. ඉංග්‍රීසි එක බලන්න මැතිනියනි පැහැදිලිවම ඒකේ තියෙනවා. සෑම පොලිස් නිලධාරියෙක්ම සෑම වේලෙහිම සිය ආරක්ෂාවේ නියුක්තව ආරක්ෂාව කියන එක මෙතන duty කියන එකයි මේකෙන් අදහස් වෙන්නේ. සෑම නිලධාරියෙක්ම සෑම වේලෙහිම සිය ආරක්ෂාවෙහි නියුක්ත ලෙස සලකනු ලැබේ.

ප්‍ර : Always on duty?

පි : Always on duty.

ප්‍ර : හැම අවස්ථාවේදීම සෑම අවස්ථාවකදීම. එතකොට එහෙනම් සේවා මුර නෑ ඔවුන්ට?

FAIR COMMENT BY JEZEEM

පි : නෑ.

ප්‍ර : එහෙම නම් මා කිව්වොත් නිවැරදිද

පි : ස්වාමිනි පරිපාලනමය වශයෙන් අපි අර සේවා මුර හදලා වෙන් කරලා තියෙනවා. නමුත් නිත්‍යානුකූලව අපි විවේක වේලාවක් කියාල අපිට නැහැ. අපි විවේක වේලාවේ අපරාධකාරයෙක් දැක්කොත් වරෙන්තුකරුවො දැක්කොත් අපි එයාව අල්ල ගන්න බැඳිලා ඉන්නවා.

ප්‍ර : ඔව්.

පි : අපරාධයක් වෙනවා දැක්කොත් ඒක වළක්වන්න අපි බැඳිලා ඉන්නවා. ඒකයි මේ සැම විටම සේවය කියලා කියන්නේ.

ප්‍ර : ඔබ කියන්නේ පොලිස් ආඥා පනතේ 56 වෙනි වගන්තිය අනුව පොලිස් නිලධාරීයෙකුට නිශ්චිත සේවා මුරයක් නෑ. නිශ්චිත සේවා වේලාවක් නෑ. නමුත් පරිපාලනමය වශයෙන් ඔවුන් මනුෂ්‍යයන් විදිහට සලකලා ඔවුන්ට යම් පහසුකමක් සලසලා තියෙනවා. එහෙම නම් බුද්ධි නිලධාරීන්ට ඔබ විසින් මේ C 855 මඟින් ස්ථානාධිපතිවරුන්ට සෘජුව වාර්තා කළ යුතු සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගැනීමෙන් පසු පුහුණුවක් ලබා දී ඒ තනතුරට පත් කරන බුද්ධි නිලධාරීන්ට තියෙනවද සේවා මුර?

පි : සේවා මුරයක් වශයෙන් නෑ මැතිනියනි. සේවා මුරයක් කියන එක මම දන්නේ නෑ අදහස් කරන්නේ මොකක්ද කියලා සාමාන්‍යයෙන් මේ ගොල්ලො පැය අටේ රාජකාරිය තමයි කරන්නේ. නමුත් පැය 8 යි කියලා එතනින් එයාගේ අර වගකීම ගැළවෙන්නේ නෑ.

ප්‍ර : ඒ කියන්නේ බුද්ධි තොරතුරු ඒ පැය අටෙන් පස්සේ ගියත් ඉකුත් වෙලාවේ ලැබුනොත් ඒක රැස් කර ගන්න පුළුවන්ද?

පි : අනිවාර්යෙන්ම ගෙදර හිටියත් එයාගේ informant කෙනෙක් ඇවිල්ලා කතා කළොත් ඒකට ඒයා මේවා වෙන්න ඕනේ. පැය අට කරන්නේ රාජ්‍ය සේවකයින් පැය 8 ක් කරන්න ඕනේ රාජකාරිය ඒ පරිපාලනය අවශ්‍යතාවයන් නිසා පැය 8 කට duty roster එක හදනවා ඇති. නමුත් මේගොල්ලන්ගේ රාජකාරිය කාර්ය භාරය ගෙදර හිටියත් ඒක අනිවාර්යෙන්ම ඒ ගොල්ලෝ ඒක ක්‍රියාත්මක වෙනවා. ක්‍රියාත්මක කරන්න ඕනේ. ගෙදර ඉන්න කොටත් කවුරුහරි එයාගේ informant කෙනෙක් ඇවිල්ලා කිව්වොත් එහෙම මෙන්න මෙහෙම අහවල් තැන අහවල් දේ වෙනවා කියලා ඒක එයාට off duty ඉන්න කියලනේ නිකම් ඉන්නේ නෑ.

ප්‍ර : ඔබ ඔය දෙන පිළිතුර බස්නාහිරට, නැගෙනහිරට, උතුරට, දකුණට, වයඹට, ගිණිකොණට මේ හැම පළාතකටම පොදුයි නේද?

LEAK COMMENT BY JEZEEM

පි : පොදුයි ස්වාමිනි.

ප්‍ර : යම් කරුණක් ඔබෙන් අපිට පැහැදිලි කර ගන්න අවශ්‍යයි ඒ තමයි ඔබ ඔය සඳහන් කරපු මේ C 855 ලේඛනය ඔබ යොමු කරලා තියෙන්නේ සියළුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ටනේ?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට. එහෙම නම් මේ පළාත් නවයේම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ටනේ?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : බස්නාහිර පළාත ඔබේ ඔය උපදෙස් පත්‍රිකාව යටතට එහෙම නම් වැටෙනවද?

පි : බස්නාහිර පළාත සම්බන්ධයෙන් විශේෂත්වයක් තිබුණා මට මතක විදිහට.

ප්‍ර : මොකක්ද විශේෂත්වය?

පි : මොකද බස්නාහිර පළාතට බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශය කියලා වෙනම එකක් තිබුණා. ඒකයි මේකයි ගැළපුණේ කොහොමද කියන එක මට ටිකක් මේ වේලාවේ හරියටම කියන්න අපහසුයි. මොකද ඒක විශේෂත්වයක් තිබුණා බස්නාහිර පළාතට විතරක්.

ප්‍ර : නමුත් ඔබ පිළිගන්නවා බස්නාහිර පළාතට වෙනම බුද්ධි කොට්ඨාශයක් තිබුණා කියලා?

පි : තිබුණා. වෙනම බුද්ධි කොට්ඨාශයක් තිබුණා අධ්‍යක්ෂකවරයෙක් හිටියා.

ප්‍ර : අධ්‍යක්ෂකවරයෙක් ඒකට වෙනම හිටියා?

පි : වෙනම හිටියා බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශ අධ්‍යක්ෂ කියලා. ඒක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති බස්නාහිර පළාත යටතේ ක්‍රියාත්මක වුණේ.

ප්‍ර : එහෙම වෙනම බුද්ධි කොට්ඨාශයක් බස්නාහිර පළාතට ලබා දෙන්නට මොකක්ද තිබ්බ වැදගත්කම?

පි : ඒක ඇත්තටම ඒක ආරම්භ වුණේ මේ ත්‍රස්තවාදී කාලයේ. මොකද මේ බස්නාහිර පළාතේ තමයි වැඩිම ඒ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් තිබුණේ.

ප්‍ර : ඒ කියන්නේ LTTE සමඟ

පි : LTTE

ප්‍ර : LTTE සමඟ සිවිල් යුද්ධය තිබ්බ කාලේ?

පි : යුද්ධ කාලේ ඔව්. ඒ කාලේ තමයි මේ කොට්ඨාශය පිහිටෙව්වේ. මේ කොළඹ සහ අනිත් තැන්වල බෝම්බ පුපුරන කොට වෙනම බුද්ධි කොට්ඨාශයක් බස්නාහිර පළාතට ආරම්භ කළා. ඒක

FAIR COMMENT BY JEZEEM

එහෙමම දිගටම ක්‍රියාත්මක වුණා. මම හිතන්නේ අදටත් ඒක තියෙනවා ඇති. ඒක තමයි ඔය බස්නාහිර පළාත් බුද්ධි කොට්ඨාශය කියලා කියන්නේ. ඒකයි මේකයි කොහොමද ගැළපුණේ කියන එක ගැන නම් මට හරියටම මේ වේලාවේ කියන්න ටිකක් අපහසුයි.

ප්‍ර : හොඳයි කමක් නෑ. මීළඟට මා ඔබේ අවධානය වෙත ලේඛනයක් යොමු කරන්නට කැමතියි.

ස්වාමිනි X 94 ලේඛනය සාක්ෂිකරුගේ අවධානයට යොමු කිරීමට අවසර අයැදිනවා.

ප්‍ර : එහි දාතම තමයි 2019/04/09 වෙනිදා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රාජ්‍ය බුද්ධි සේවාව විසින් පොලිස්පති පූජිත් ජයසුන්දර මහතා වෙත එවලා තියෙන්නේ. කරුණාකරලා එහි අන්තර්ගතය ඔබට කියවන්නට පුළුවන්ද. ඊට පස්සේ මම ප්‍රශ්න අහන්නම්.

(සාක්ෂිකරු X 94 කියවා බලයි.)

ප්‍ර : X 94 ලේඛනය රාජ්‍ය බුද්ධි සේවාව විසින් එව්වේ ඔබට නම් ඔබ පොලිස්පතිවරයා විදිහට ඉන්න කොට ඔබට කියන්නට පුළුවන්ද මෙම X 94 හි අඩංගු කරුණු ඔබට වැදගත් වෙනවද කියලා පොලිස්පතිවරයා විදිහට කෙටි පිළිතුරක් විතරයි මට ඕනේ ඊට පස්සේ ඉතුරු ටික ගමු?

පි : වැදගත් වෙනවා ස්වාමිනි. මේක ත්‍රස්තවාදී ප්‍රහාරයක් පිළිබඳ පූර්ව දැනුම් දීමකට අදාළ තොරතුරක් ඒක නිසා තමයි වැදගත් වෙන්නේ.

ප්‍ර : එහෙම නම් ඉලංගකෝන් මහත්මයාණනි මේ X 94 හි තියෙන මොන තොරතුරුද ඔබ ඔය වැදගත් සහ ත්‍රස්තවාදී ප්‍රහාරයක් කියන ඒ පිළිතුර සඳහා ඒ තීරණයට එළඹීමට පාදක කර ගනු ලබන්නේ?

පි : පළවෙනි කාරණාව ස්වාමිනි මම දන්න පමණින් 2009 ද්‍රවිඩ ඊලාම් ත්‍රස්තවාදය අවසන් කිරීමෙන් පස්සේ මේ වගේ මේ මරාගන මැරෙන ත්‍රස්තවාදී ප්‍රහාරයක් පිළිබඳව බුද්ධි තොරතුරක් ලැබිච්ච ප්‍රථම අවස්ථාව මේක. මම දන්න තරමින් මම වැරදි හෝ නිවැරදි වෙන්න පුළුවන්. ඒක නිසා මේක අපේ දැඩි අවධානය යොමු විය යුතු අවස්ථාවක් කියන එක මට හැඟෙනවා. දෙවෙනි කාරණාව මේ බුද්ධි තොරතුර යොමු වෙලා තියෙන්නේ විදේශීය බුද්ධි අංශයකින්. සාමාන්‍යයකින් රටකින් රටකට බුද්ධි තොරතුරක් සපයන කොට එය සෑහෙන පරිස්සම් වෙනවා. ඒ නිවැරදිභාවය සම්බන්ධයෙන්. ඒක නිසා මේ තොරතුරත් අපිට නිකම්ම බලලා

FAIR COMMENT BY JEZEEM

පැත්තකට දාන්න තරම් සුදුසු බුද්ධි තොරතුරක් නොවෙයි කියන එකයි දෙවෙනි කාරණාව. තුන්වෙනි කාරණාව මේ සහරාන් කියන පුද්ගලයාගේ පසුබිම මේ අපි නොදන්න පුද්ගලයෙක් මේ ප්‍රහාරය එල්ල කරනවා කිව්වා නම් අපිට තව ටිකක් හිතාමතා බලන්න තිබුණා. නමුත් මේක එල්ල කරන්නේ මේ සහරාන් කියන පුද්ගලයෙක් කියලා සඳහන් කරලා තියෙනවා. එතකොට කවුද මේ සහරාන් කියන පුද්ගලයා. එයාගේ පසුබිම මොකක්ද කියන කාරණාව. මෙන්න මේ සියල්ල දිහා බලලා තමයි මට හැඟෙන්නේ මේක වැදගත් බුද්ධි තොරතුරක් කියන එක.

ප : එහෙමනම් මා කිව්වොතින් නිවැරදිද X 94 මඟින් ඔබට ඔබ කිව්ව ආකාරයට වගේම ඊට වැඩමනත් වශයෙනුත් පහත තොරතුරු ලැබිලා තිබෙනවා කියලා. පළවෙනි එක තමයි සහරාන් කියන තැනැත්තා කුමන සංවිධානයක නායකයෙක්ද කියන එක?

පි : නිවැරදි ස්වාමිනි එයාගේ සංවිධානය තියෙනවා. ඊළඟට ඒ ප්‍රහාරයට සම්බන්ධ වන පුද්ගලයන්ගේ නම් කිහිපයකුත් සඳහන් වෙනවා.

ප : සඳහන් වෙනවා.

පි : එතකොට මේක සෑහෙන දුරට specific ක්.

ප : ඔව්.

පි : සාමාන්‍යයෙන් නිකම්ම නිකම් තොරතුරකුත් නෙවෙයි.

ප : ඒ වගේම ඒ සහරාන් හෂීම් කියන තැනැත්තා සහ ඉහීඩ් කියන තැනැත්තා මේ විදේශීය බුද්ධි අංශවලින් ලබා දීලා තියෙන තොරතුර අනුව

ස්වාමිනි මෙම ලේඛනයට සමාගමීව සාක්ෂිකරුගේ අවධානයට C 4 (B) ලේඛනයක් යොමු කරනවා.

ප : ඒ විදේශීය බුද්ධි අංශයෙන් ලැබුණු තොරතුරු අනුව ඊට සම්බන්ධ වන අයගේ නම් තිබෙනවා කියලා ඔබ කිව්වනේ නේද?

පි : මේ කිහිපයක් තියෙනවා ස්වාමිනි.

ප : එතකොට එහි දැන් ඇමුණුමක් විදිටහ ඔබට ලැබිලා තියෙනවා එහෙම නම් මේ X 94 සමඟ රාජ්‍ය බුද්ධි සේවාව විසින් ඔය ඔවුන්ට ලැබුණු තොරතුරේ පිටපතකුත්. ඒ කියන්නේ C 4 (B) ලේඛනයේ පිටපතකුත්. ඒ අනුව එහෙනම් ඔබට පේනවා මේ ප්‍රහාරය සඳහා ඔබ කිව්ව විදිහට එය සිදු කරන්නට ඉඩ ඇත්තේ කුමන පුද්ගලයින් විසින්ද කියලා?

පි : පැහැදිලි ස්වාමිනි.

ප : ඒ අනුව ඔබ එක නමක් කිව්වා සහරාන් හෂීම්. ඒ වගේම C 4 (B) ලේඛනයේ ඇමුණුම විදිහට ආවා නම් ඔබ දන්නවා එහෙනම්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ෂාහිඩ් කියලා නමකුත් එහි සඳහන් වෙනවා ප්‍රහාරය සඳහා යෙදෙන්නට පුළුවන් පුද්ගලයෙක් විදිහට. එතකොට ඔබට ලැබුණු X 94 එහෙනම් තියෙනවා නේද සහරාන් හෂීම් සහ ෂාහීඩ් යන අයවලුන්ගෙන් 2018/12/26 වෙනිදා මාවනැල්ල ප්‍රදේශයේ ආගමික ප්‍රතිමාවලට පහරදීමේ සිදුවීම්වලින් පසු ප්‍රදේශයෙන් ඔවුන් පලා ගිහිල්ලා දැනට අක්කරෙයිපත්තු ඔළුවිල් ප්‍රදේශයේ රහසිගතව සැඟවී සිටින බවට තොරතුරු වාර්තා වෙලා තියෙනවා කියලා?

පි : පැහැදිලි ස්වාමිනි.

ප්‍ර : පැහැදිලිව තිබෙනවා ඔබට එහෙනම් අවබෝධ වෙනවා. ඒ වගේම ඔබට සහරාන් සහ ඔය විදේශ බුද්ධි තොරතුරු සේවයෙන් ලැබුණු අනෙකුත් නම් බලන කොට රිල්වාන් කියන නමත් තියෙනවා. ඒ රිල්වාන් කියන කෙනා රාජ්‍ය බුද්ධි සේවාව මඟින් එහෙම නම් ඔබට වාර්තා කරනවා ඔහු

පි : සහරාන්ගේ මල්ලි කියලා.

ප්‍ර : සහරාන්ගේ මල්ලි කියලා. ඒ කියන්නේ මේ තියෙන සම්බන්ධකම් පිළිබඳවත් ඔබට එහෙනම් වාර්තා වෙලා තියෙනවා. එයට හැරෙන්නට ඔවුන් කොයි ස්ථානවල ගැවසෙනවද කියන එක පිළිබඳවත් X 94 න් ඔබේ අවධානය වෙත යොමු වෙලා තියෙනවා නේද?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම සියළු X 94 මඟින් ඔබේ අවධානයට යොමු කරලා තියෙනවා නේද වැඩිදුරටත් එහෙම නම් අපි යන්නේ කල්පිතයක් මත ඔබටයි මේ ලිපිය ලැබුණේ කියලා සියළු අන්‍යාගමිකයන් ඝාතනය කිරීම උතුම් ආගමික කරුණක් බවත් අන්‍යාගමිකයන් විනාශ කරමින් ඉස්ලාමය ප්‍රවර්ධනය කළ යුතු බවටත් සඳහන් කරමින් 2016 වර්ෂයේ සිට සිය සමාජ ජාල සහ ආගමික දේශනා හරහා අනුගාමිකයන් අභප්‍රේරණය කරන බවට මේ සහරාන් නිරීක්ෂණය වෙලා තියෙනවා කියලත් රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂකවරයා එහෙනම් පොලිස්පතිවරයාගේ අවධානයට යොමු කරලා තියෙනවා නේද?

පි : නිවැරදි ස්වාමිනි .

ප්‍ර : එතකොට ඔබට ඔය තොරතුරු තිබුණා නම් ඔබට මේ X 94 ලැබිලා ඔබ ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද මොකක්ද ඔබ විසින් ගනු ලබන පියවර? We want a detail account what would you have done as the IGP?

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි පළමුවෙන්ම මම මුලින් සඳහන් කරපු ආකාරයට මේ තොරතුරු ලැබුණාම අපි බලන්න ඕනේ මේ තොරතුර කොයි තරම් බැරෑරුම්ද කියන එක ඒ තොරතුරු දිහා බැලුවාම. දෙවෙනි කාරණාව මේ තොරතුර දිහා අපි මම නම් බලන්නේ මේ කඩදාසිය දිහා බලලා විරතක් නෙවෙයි. මේක කියන්න ඕනේ කියවන්නේ මේහා සමඟ බැඳුණු අනිත් වටපිටාවේ කරුණු කාරණාත් සමඟ. දැන් මේ සහරාන් සහ එයාගේ මේ පිරිසට මේ වගේ ප්‍රහාරයක් එල්ල කරන්න හැකියාවක් තියෙනවද කියන එකයි ඉස්සෙල්ලම ඔළුවට අරගෙන බලන්න ඕනේ.

ප්‍ර : කොහොමද ඒක කරන්නේ?

පි : ඒකට අපි බලන්න ඕනේ වෙනත් තියෙන සාධක මොනවද කියලා ඒක තහවුරු කරන්න. මේ වෙන කොට එතකොට අපිට අපේ මගේ ඔළුවට එන්න ඕනේ හරිනම් මෙයාට මේක කරන්න පුළුවන්ද මොකක්ද මෙයාට තියෙන ශක්තිය මෙයා කොයි වගේ පුද්ගලයෙක්ද මෙන්න මේ කාරණා ඊළඟට මේ පුද්ගලයා ගැන කරුණු දැන් ජාතික බුද්ධි සේවය කියන්නේ එක බුද්ධි අංශයක් පමණයිනේ. තව කවුද මෙයා ගැන විස්තර දන්නේ ඒ දන්න පුද්ගලයින්ගෙනුත් අපි මේ තොරතුර ගැන ඒ අයගේ Input එකත් අනිවාර්යෙන් අපි ගන්න ඕනේ කියන එක ඔළුවට එන්න ඕනේ. පළමුවෙන්ම අපි ඇස්තමේන්තුවක් මම ඇති කර ගන්න ඕනේ සහරාන් කවුද මෙයාට මේක කරන්න පුළුවන්ද මෙයාගේ ඉතිහාසය මොකක්ද මෙයා මීට ඉස්සෙල්ලා මේ වගේ දේවල් කරලා තියෙනවද මෙයාට කණ්ඩායමක් තියෙනවද මෙයාට බෝම්බ තියෙනවද මේ සියළු දේවල් පට පට ගාලා ඔළුවට එන්න ඕනේ. ඊළඟට අර මෙයා ගැන විස්තර දන්න අනික් කණ්ඩායම් ඒ කියන්නේ දැන් මේ වෙන කොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙයා ගැන විභාග කරනවා. මාවනැල්ල සිද්ධිය සහ වනාත විල්ලුවේ recovery එක ගැන.

ප්‍ර : මම මදකට ඔබට බාධා කරනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යම් විමර්ශනයක් සිදු කරනවා නම් ඒ සඳහා ඔවුන්ට උපදෙස් ලැබෙන්නේ ඒ කියන්නේ නියෝග ලැබෙන්නේ කාගෙන්ද?

පි : පොලිස්පතිවරයාගෙන්.

ප්‍ර : පොලිස්පතිවරයාගෙන්. ඒ කියන්නේ මා කිව්වොතින් නිවැරදිද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එන්නේ පොලිස්පතිවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ කියලා?

පි : නිවැරදි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අනුව ඔවුන් විසින් සිදු කරන විමර්ශනවල ඕනෑම තොරතුරක් ඍජුව කැඳවීම් හැකියාව පොලිස්පතිවරයාට එහෙනම් තියෙනවා නේද?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : හොඳයි එහෙනම් පැහැදිලි කරන්න තවදුරටත්.

පි : එතකොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඒ විමර්ශනවලදී මේ සහරාන් සහ ඔවුන්ගේ කණ්ඩායම පිළිබඳව අනාවරණය වෙච්චි නවතම තත්ත්වය පිළිබඳ කරුණු තියෙන්න පුළුවන්. ඊළඟට TID එක. TID එක මේ අය ගැන දිගින් දිගට දිගින් දිගටම පස්සෙන් සොයා ගෙන යනවා. විමර්ශනය කරනවා. මම හිතන්නේ STF එකත් මේ අය ගැන හොයා බලමින් හිටියා. ඊළඟට පොලිස්පතිගේ බුද්ධි අංශය Special Branch එක මේ වගේ මේ සහරාන් සම්බන්ධයෙන් ඒ වන විට හොයා බලමින් හිටපු කණ්ඩායම් ටික සහ බුද්ධි තොරතුරු සැපයූ රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා මෙන්න මේ කණ්ඩායම වහාම කැඳවන්න ඕනේ කැඳවනවා. කැඳවලා මේ බුද්ධි තොරතුරු සාකච්ඡා කරනවා.

ප්‍ර : මොකක්ද ඒකේ පරමාර්ථය ඔවුන් කැඳවීමේ?

පි : පරමාර්ථය ස්වාමිනි මේ තොරතුර එක පුද්ගලයෙක්ගෙන් ආපු එකක්නේ පිටරටකින් ආපු තොරතුරක්නේ මේ. එතකොට මේක වෙන්න පුළුවන්ද බැරිද කියන එක පිළිබඳ වැඩිදුර තොරතුරු තියෙන්නේ අපි ළඟ. CID එක කියයි වනාතවිල්ලුවේ අල්ලපු බඩුවල විදිහට මේ ගොල්ලෝ ගාවත් බෝම්බ තියෙනවද නැද්ද බෝම්බ ගහන්න මෙයාට පුළුවන්කමක් තියෙනවද ඒ ගොල්ලන් එතකොට පැහැදිලිවම කියයි මේක වෙන්න පුළුවන්ද බැරිද කියන එක. TID එකත් කියයි ඒගොල්ලන්ගේ අදහස් මේක වෙන්න පුළුවන්ද බැරිද කියන එක. STF එකෙත් ඒ ගොල්ලො ගියානේ බෝම්බ හදපු තැන බලන්න වනාතවිල්ලුවට. එගොල්ලොත් කියයි එයාලගේ camp එකේ තිබ්බ දේවල් විදිහට මෙහෙම එකක් සහරාන්ට කරන්න පුළුවන්ද බැරිද කියන එක. මෙන්න මේ කාරණා සියල්ල එකට එකතු කළා නම් තමයි අපිට මේකේ road picture එක ගන්න පුළුවන් වෙන්නේ සහ අන්තරාය කොපමණද කියන එක පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගන්න පුළුවන් වෙන්නේ. අන්න ඒ එක්ක අපි තක්සේරු කර ගැනීම තමයි පළමුවෙන්ම කළ යුතුයි. කළ යුත්තේ සහ මම මගේ කාලයේ මම හිටියා නම් මම කරන්නේ. එතෙන්දී ඒ සියළු දෙනාගේ කාරණා ඊළඟට මේ බුද්ධි තොරතුර සපයපු රාජ්‍ය බුද්ධි ප්‍රධානියාගෙන් අපිට පැහැදිලි කර ගැනීම් තිබුනා නම් පැහැදිලිවම අහන්න

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පුළුවන් මොකක්ද මේකේ තොරතුරු ඔබ කියන්නේ මොකක්ද මේකට. ඔබේ වාර්තාවේ තියෙන දේවල් පැහැදිලි කරන්න අපිට. මේක වෙන්න පුළුවන්ද ඔබ කියන හැටියට. එතකොට එයත් එයාගේ අදහස් මේ සියළුම දේවල් දාලා විය හැකි posibility එක සම්භාවිතාවය අනිවාර්යෙන්ම අපිට තීරණය කරන්න පුළුවන්කම ලැබුණා. ඒ වගේ සාකච්ඡාවක් කැඳවලා වහාම කළා නම්. එතකොට එතෙන්දී අපිට පෙනී ගියා නම් මේ ප්‍රහාරය සිද්ධ වෙනවා. මේක positive information එක. Attack එක imminent මේ සියළු කාරණා වුණා නම් අපිට මම දැන් මොකක්ද කරන්නේ කියන එක අහන නිසා මම මේ කියන්නේ.

ප්‍ර : ඔබ තමයි ඔබ ගන්න තීරණ?

පි : මගේ ඊළඟ පියවර වෙන්නේ වහාම මගේ ලේකම්වරයා සහ අමාත්‍යවරයා දැනුවත් කිරීම. මෙන්න මෙහෙම ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන තත්ත්වයක් උදා වෙලා තියෙනවා මේ සම්බන්ධයෙන් ගත යුතු පියවර වහාම සාකඡා කරන්න කියන එක.

ප්‍ර : ඇයි ඒ ලේකම්වරයා සහ අමත්‍යවරයාව දැනුවත් කරන්න ඔබ තීරණය කළේ?

පි : මම මෙතනදී එකෙන් බලාපොරොත්තු වෙන්නේ නෑ මේකට මොකක්ද කරන්නේ කියන එක පිළිබඳව ඒ ගොල්ලොන්ගෙන් උපදෙස් ගන්න එක නෙවෙයි මම බලාපොරොත්තු වෙන්නේ. මොකද දැන් මේක අනිවාර්යෙන්ම මේක තහවුරු වුණාම අපි ක්‍රියාමාර්ගයකට යන්න ඕනේනේ මේක නවත්වන්න. මේක නවත්වන්න අනිවාර්යෙන්ම වැඩ පිළිවෙලකට යන්න ඕනේ action එකකට යන්න ඕනේ. ඒ action එකකට යන කොට අනිවාර්යෙන්ම මේක සමාජය ටිකක් කැළඹෙන ස්වභාවයක් වෙනවා. මේ වෙන කොට සමාජයේ තිබුණු තත්ත්වයනුයි මේ ජාතීන් අතර සංහිඳියාව කියන එක බොහොම බරපතල විදිහට තිබුණේ. මේ සියළුම ආගම් අතරේ ජාතීන් අතරේ සංහිඳියාව පවත්වාගෙන යා යුතුයි කියන සංකල්පය හුඟක් තදට තිබුණු වකවානුවක්නේ. ඉතින් ඒ වගේ අවස්ථාවක එක පාරට මේක නවත්වන්න පොලිසියෙන් STF එක දාලා මේකට town එකේ road block දාලා අරහේ දාලා මෙහේ දාලා හෝටල් ගාඩ් කරලා පල්ලි ගාඩ් කරලා පටන් ගත්තා නම් සමාජයේ විශාල කැළඹීමක් ඇති වෙන්න තිබුණා. මිනිස්සු බලනවා මොකක්ද මේ වෙන්නේ කියලා. ඒක නිසා තමයි මම කිව්වේ රජය දැනුවත් කරන්න කියලා. රජය දැනුවත් කිරීම තුළින් රජය හරහා මේක මහජනතාව

FAIR COMMENT BY JEZEEM

කැළඹිල්ලට පත් නොවෙන ආකාරයේ වැඩ පිළිවෙලක් රජය හරහා ක්‍රියාත්මක වෙන්න ඕනේ. මේක මහජනයා කැළඹෙනවා කියලා අපි වැඩපිළිවෙල් අපිට නවත්වන්න බෑ. ඒක අපි යන්න ඕනේ. නමුත් අර පැත්තෙන් අමාත්‍යාංශය හරහා අමාත්‍යාංශයේ ලේකම් හරහා අර මහජනතාව දැනුවත් කිරීමේ මහජනතාවට සංහිඳියාව නම් සංහිඳියාව කඩාකප්පල් නොවන ආකාරයේ යම් කිසි ක්‍රමවේදයකට තමයි සහ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් තියෙන අවශ්‍යතාවය කියන කාරණා දෙක නිසා තමයි ඒ දෙපළ වහාම දැනුවත් කිරීමේ අවශ්‍ය වෙන්නේ. ඊළඟ කාරණාව තමයි මේක තහවුරු වෙන ගමන් මේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් උතුරු සහ නැගෙනහිර අපිට ගෙන්වන්න බෑ අමාරුයි අනිත් සියළු හත් දෙනාම ගෙන්වන්න පුළුවන් මේ පැය ගාණක් ඇතුළත කොළඹට. ඊළඟට මේ තොරතුරේ හැටියට ආරක්ෂාව සැපයීමට සම්බන්ධ වන සියළුම ආයතන CID එක, විශේෂ කාර්ය බලකාය, TID එක අනිත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, කොළඹ ඉන්න නියෝජ්‍ය පොලිස්පතිවරුන් මේ ළඟ ඉන්න සියළුම දෙනා ගෙනල්ලා මේ තොරතුර සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තර්ජනය එල්ල විය හැකි ඒ ස්ථාන වලට අවශ්‍ය ආරක්ෂක වැඩ පිළිවෙලක් සකස් කිරීම. ඒක ක්‍රම දෙකක් එතෙන්දී අනුගමනය කරන්න ඕනේ. එකක් තමයි පළවෙනි කාරණාව තමයි මේ ප්‍රහාරය එල්ල කරනවයි කියලා මේකට සුදානම් වෙනවයි කියන කණ්ඩායම හැකි ඉක්මනින් අත්අඩංගුවට ගන්න එක සියළුම බුද්ධි අංශ යොදවලා. ඉස්සෙල්ලම අපි මේක neutralize කරන්න තියෙන ප්‍රධාන හොඳම ක්‍රමය තමයි මේ කට්ටිය අල්ලන එක. ආරක්ෂාව දාලා හැම තැනටම ගාඩ් කරන එකට වඩා වැදගත්ම සහ හොඳම ක්‍රමය තමයි අල්ලන එක. ඒකෙන් දෙකක් වෙනවා. එකක් අර මිනිස්සු කලබල වෙන එක නවතිනවා. දෙවෙනි එක ඒ අය පස්සෙන් පන්නන්න පටන් ගත්තාම ඒ අයට මේ සැලැස්ම අත්අරින්න සිද්ධ වෙනවා. ඒ අයට මින් ඉදිරියට සැලසුම් කර කර ඉන්න එකට වාඩි වෙලා ඉන්න අවස්ථාවක් එන්නේ නෑ On the run අපි පස්සෙන් පන්නන්න ගත්තාම. ඒක තමයි ඊළඟ කාරණාව. සියළුම නිලධාරීන් බුද්ධි අංශද අරවද මේවද CID ද, TID ද, හමුදා බුද්ධි අංශද මේ සියල්ලම යොදවලා මේ කියන සහරාන් සහ අනිත් මිනිස්සු පස්සෙන් පන්නා ගෙන යාමේ මෙහෙයුමක් ආරම්භ කරනවා ඒක තමයි විය යුතු පළවෙනි කාරණාව වුණේ. දෙවෙනි කාරණාව ඒ කියන්නේ අර අතරේ තර්ජනයට ළං වෙච්චි

Presidential Secretariat Copy
LEAK
COMMENT
BY JEZEEM

ස්ථානයට ආරක්ෂාව සැලසීම. ඒකට යම් කිසි නිශ්චිත වැඩ පිළිවෙලක් සකස් කිරීම. ඉතින් මේ වැඩ පිළිවෙල සම්බන්ධයෙන් ඒ සාකච්ඡා පවත්වලා ඒකට අවශ්‍ය minutes සකස් කරලා ඒ අදාළ නිලධාරීන්ට භාර දීලා ඒක ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීම සහ ක්‍රියාත්මක කරවීමේ ක්‍රමවේදයක් සකස් කරලා දියත් කිරීම සහ උතුරු නැගෙනහිර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් දෙදෙනා වහාම ගත්ත ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැනුවත් කරලා ඒ ගොල්ලොන්ගේ පළාත්වලටත් මේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම සහ අර minutes වල copy එකක් වහාම අපේ තියෙනවා VPN කියලා communication system එකක් එකෙන් තප්පර ගාණක් ඇතුළත යවලා minutes එකේ විදිහට වැඩ කරන්න කියලා උපදෙස් දෙනවා. මේ ටික තමයි මම සාමාන්‍යයෙන් ඊළඟට ඉතින් මේක monitor කරනවා තර්ජනය අවසන් වෙනකම් මේ ගත්ත තීන්දු තීරණ ක්‍රියාත්මක වෙනවා. එක්කොා සහරාන් අල්ලන කම් හරි එහෙම නැත්නම් මේ තර්ජනය ඉවරයි කියලා කොහොන් හරි වාර්තා වෙනකම් මේක නොකඩවා යනවා. මෙන්න මේ කාරණා ටික තමයි මට.

ප්‍ර : ඔබ කිව්වා ඔබට X 94 ලැබුණා නම් ඔබ කරන්නේ ඔබ සඳහන් කරන ලද සියළුම ආයතන වල නිලධාරීන්ව කැඳවලා ඔවුන් වෙතින් ඔවුන් සතුව තිබෙන තොරතුරු පිළිබඳව විමසිලිමත් වෙලා ඔවුන්ගෙන් ඒ අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සිදු කරනවා කියලා අර මේ ප්‍රශ්නය මැඩලීමේ ක්‍රමෝපාය හඳුනා ගැනීම සඳහා?

පි : නිවැරදි.

ප්‍ර : ඒ ඔබේ තනතුර අනුව ඒ වගේම ඔබ කිව්වා ඊට අමතරව ඔබ ලේකම්වරයා හරහා අදාළ අමාත්‍යවරයාව දැනුවත් කරනවා කියලා?

පි : කිව්වා.

ප්‍ර : එතකොට ඔය කරුණ පිළිබඳව ඔබ ඊට අමතරව කොයි වේලාවක හරි පියවරක් ඉදිරියට ගිහිල්ලා බුද්ධි සමාලෝචන රැස්වීමේදී MOD එකේ තියෙන බුද්ධි සමාලෝචන රැස්වීමේදී ඔබ ඒ පිළිබඳව අර ත්‍රිවිධ හමුදාවේ නිලධාරීනුත් ඉන්න අවස්ථාවේදී නැවත ඔය ගැන සාකච්ඡා කරනවද?

පි : අනිවාර්යෙන්ම මේ අතරතුර බුද්ධි සාකච්ඡාවක හරි ආරක්ෂක මණ්ඩලයේ රැස්වීමක් හරි තිබුණා නම් පළවෙනි මාතෘකාව වෙන්නේ අනිවාර්යෙන්ම ඒක.

ප්‍ර : ඔබ එහෙනම් ඔබ ස්වේච්ඡාවෙන්ම ඒ පිළිබඳව සාකච්ඡා කිරීම ආරම්භ කරනවද?

FAIR COMMENT
BY JEZEEM

පි : අනිවාර්යෙන්ම.

ස්වාමිනි 2019 අප්‍රේල් මාසේ දින දර්ශනය මා ඔබේ අවධානයට යොමු කරනවා.

ප්‍ර : මා ඔබේ අවධානයට යොමු කරපු X 94 ලේඛනයේ දාතම වෙන්නේ 2019/04/09 වෙනිදා. 09 වෙනිදානේ?

පි : ඔව් 09 වෙනිදා.

ප්‍ර : එතකොට 2019 අප්‍රේල් 09 කියලා කියන්නේ අඟහරුවාදා දවසක් නේද දින දර්ශනය අනුව?

පි : නිවැරදි.

ප්‍ර : එතකොට එහෙම නම් ඒ අඟහරුවාදා දවස්වල තමයි ඔබ කිව්වේ ඔය බුද්ධි සමාලෝචන රැස්වීම් තියෙනවා කියලා?

පි : මගේ මතකය හැටියට අඟහරුවාදා දිනයේ ස්වාමිනි.

ප්‍ර : අපිට සාක්ෂි ඉදිරිපත් වෙලා තියෙන්නේත් අඟහරුවාදා තමයි සාමාන්‍යයෙන් බුද්ධි සමාලෝචන රැස්වීම් තිබුණේ කියලා. නැවත උපකල්පිතයක් මත ඔබට ඔය X 94 ලේඛනය ලැබුණේ බුද්ධි සමාලෝචන රැස්වීමෙන් පසුව නම් එහෙම නම් ඔබ කොහොමද ඒ ත්‍රිවිධ හමුදාව සහ අනිකුත් නිලධාරීන්ව දැනුවත් කිරීම සඳහා අවස්ථාව ලබා ගන්නේ මොකද සුමානෙකට සැරයයිනේ තියෙන්නේ ඔය රැස්වීම. දැන් කෙටි කාලීනවනේ ප්‍රහාරය සිදු වෙනවයි කියලා දැනුම්දීලා තියෙන්නේ. එතකොටඔබ ඒ අයටත් දැනුවත් කිරීම ඔවුන්ගේ සහයෝගය ලබා ගැනීමත් සුදුසුයි කියලා හිතනවා නම් කොයි ආකාරයටද ඔබ ඒ දැනුවත් කිරීම කරන්නේ?

පි : මම හිතන්නේ ස්වාමිනි මම එයට පිළිතුර මගේ කලින් ප්‍රකාශයෙත් තිබුණා. මේ මම සඳහන් කළේ අර මූලික කණ්ඩායම ගෙනල්ලා සාකච්ඡා කරලා මේ බුද්ධි තොරතුරු තහවුරු කර ගත්තා වහාම මම කිව්වා මම ලේකම්වරයාට සහ අමාත්‍යවරයාට දැනුම් දෙනවා කියලා. ලේකම්වරයාට දැනුම් දීමේ එක පරමාර්ථයක් ඒක තමයි. ලේකම්වරයා යටතේ තමයි ත්‍රිවිධ හමුදාව තියෙන්නේ. එතකොට ලේකම්වරයාගෙන් බලාපොරොත්තු වෙන්නේ ඒ හා සමඟම අනිත් පැත්තට ඒ අදාළ අනිත් අයව දැනුවත් කිරීම. ඒ අය බලධාරීන්.

ප්‍ර : එතකොට ලිඛිතවත් ඒ දැනුවත් කිරීම කරන්න පුළුවන් නේද ඊළඟ දවස වෙනකම් ඉන්නේ නැතුව?

පි : ඉන්න අවශ්‍ය නෑ .

ප්‍ර : අවශ්‍ය නෑ?

පි : ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් නම් ආයේ ඊළඟ කමිටුව වෙනකම් ඉන්න අවශ්‍ය වෙන්නේ නෑ. ඒක ලේකම්වරයාගේ කාර්ය භාරය වෙන්න ඕනේ ත්‍රිවිධ හමුදාව දැනුවත් කරලා මගෙන්

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

එහාට එතනින් වෙන්න ඕනේ ටික අමාත්‍යාංශයෙන් කෙරෙන්න ඕනේ. ඒ දැනුවත් කිරීමේ ඒක පරමාර්ථයක් ඒක.

ප්‍ර : බොහොම ස්තූතියි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

කොමිෂන් සභාවේ කටයුතු පස්වරු 04.00 පසු වී විනාඩි 50 තෙක් කල් දමමි.

****

දැන් වේලාව : ප.ව.04.40 යි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව.05.15
පෙර සටහන්: මුතු මෙනවිය.
මෙතැන් සිට: සවිනි මෙනවිය.

සාක්ෂිකරු නැවත ප්‍රතිඥා දී කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: ඉලංගකෝන් මහත්මයා ඔබේ අවධානයට මම C 04 A වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන ලේඛනයක් දැන් යොමු කරලා තිබෙනවා. ඔබ පූජිත ජයසුන්දර මහත්මයාව දැනගෙන හිටියද?

උ: දැනගෙන හිටියා ස්වාමිනි.

ප්‍ර: මොන අවස්ථාවලදී ද ඔබට ඔහු ගැන දැනගන්නට ලැබුනේ?

උ: සේවයට බැඳුණ දවසේ මට පස්සේ සේවයට බැඳුනේ මං හිත්නේ 85 විතර වෙන්න ඕනේ එදා ඉදලාම වගේ රාජකාරී කටයුතු කරලා තියෙනවා එකට කටයුතු කරලා තියෙනවා මගේ යටතේ කටයුතු කරලා තියෙනවා.

ප්‍ර: ඒ රාජකාරී කටයුතුවලදී ඔබට ඔහුගේ අත් අකුරු දකින්න ලැබිලා තියෙනවද

උ: ලැබිලා තියෙනෝ ද ස්වාමිනි

ප්‍ර: ඒ රාජකාරී කටයුතු වලදී ඔබට ඔහුගේ දිගු අත්සන දකින්න ලැබිලා තියෙනවද?

උ: ලැබිලා තියෙනවා.

ප්‍ර: ඔහුගේ කෙටි අත්සන දකින්න ලැබිලා තියෙනවද?

උ: ලැබිලා තියෙනවා.

ප්‍ර: එහෙම නම් යම් ස්ථානයක ඔහුගේ අත් අකුරු ඔහුගේ කෙටි අත්සන ඔහුගේ දිගු අත්සන දැක්කොත් හඳුනා ගැනීමේ හැකියාව ඔබට තියෙනවද?

උ: සාමාන්‍ය වශයෙන් හැකියාවක් තියෙනවා.

ප්‍ර: ඒ ඔබ කියන්නේ අර ඔහු සමඟ රාජකාරී කරලා ලැබුණු හුරුපුරුද්ද අනුව?

උ: ඔව් දැන් නමුත් මම අවුරුදු 04 ක් විතර වෙනවා මගේ මතකය හැටියේ ප්‍රමාණයෙන් කියන්න පුළුවන්.

ප්‍ර: මා ඔබේ අවධානය යොමු කර සිටිනවා C4A ලේඛනය කෙරෙහි යොමු කරනවා. C4A ඒ ලේඛනයේ කුමන හෝ ස්ථානයක පූජිත ජයසුන්දර මහතාගේ අත් අකුරු තියෙනවද කියලා ඔබට මේ ගරු කොමිෂන් සභාවට කියන්න පුළුවන්ද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ: මේ ලේඛනයටම තියෙන WP කියලා තියෙනවා SPR කියලා තියෙනවා DC CTID කියලා තියෙනවා ඒ සටහනේ තියෙන අකුරු ටික නම් පූජිත ජයසුන්දර මහත්තයාගේ අකුරුවලට බොහෝ දුරට සමානයි කියන එක නම් මට කියන්න පුළුවන්.

ප්‍ර: ඔව් එතකොට මෙතන කෙටි අත්සනකුත් තිබෙනවා නේද?

උ: ඒ අත්සන අපහැදිලියි.

ප්‍ර: නමුත් ඒ අත්අකුරු ඔබට හඳුනා ගන්නට පුළුවන්කම තියෙනවා නේද?

උ: මේ අත් අකුරු ටික නම් මට බොහෝ දුරට කියන්න පුළුවන්

ප්‍ර: ජයසුන්දර මහතාගේ බවට හොඳයි. දැන් ඒ ඔබ හඳුනාගත්ත ඒ අත්අකුරු තිබෙන්නේ C4 ඒ ලේඛනයේ දකුණු පස පැත්තේ පහළ කෙලවරේ නේද?

උ: නිවැරදියි ස්වාමිනි.

ස්වාමිනි එම ස්ථානය C 4 A (i) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර: මා ඔබේ අවධානය C4A ලේඛනයේ අන්තර්ගතය කෙරෙහි යොමු කරන්නට කැමතයි. එම ලේඛනය ඔබට පේන ආකරයට ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතා විසින් පොලිස්පති පූජිත ජයසුන්දර මහතා වෙත එවා තිබෙන ලේඛනයක් නේද?

උ: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: **C**4A ලේඛනයේ දිනය කවදද මේ පොලිස්පති කාර්යාලයට ලැබිලා තියෙන ඔබ කිව්වානේ ඔබට ලිපි ලැබුණාමත් දින මුද්‍රාවක් යොදනවා කියලා?

උ: 2019 අප්‍රේල් 09

ප්‍ර: එතකොට මෙන්ඩිස් මහත්මයා නියෝජ්‍ය පොලිස්පතිතුමා පොලිස්පති පූජිත ජයසුන්දර මහතා වෙත මේ ලිපිය එවලා පොලිස්පති කාර්යාලයේ ඒක ලැබිලා තියෙන බවට තියෙන සටහන තමයි 2019 අප්‍රේල් 09 නේද? එහෙම කිව්වොත් නිවැරදියි ද?

උ: නිවැරදියි එය ස්වාමිනි පූජිත ජයසුන්දර මහත්මයා සටහන යොදලා දිනය ොලා තියෙන්නෙත් අප්‍රේල් 09 තමයි .

ප්‍ර: 4 වෙනි මාසේ 09 වෙනිදා. මම දැන් නැවතත් ඔබේ අවධානයට X 94 ලේඛනය යොමු කරනවා. X 94 හි රාජ්‍ය බුද්ධි ප්‍රධානීන් එම ලිපියේ දාතම යොදලා තියෙන්නේ කවදද?

උ: 2019.04.09 කියලා

ප්‍ර: එතකොට X 94 තියෙන අන්තර්ගතයයි. C4A ලේඛනයේ තියෙන අන්තර්ගතයයි අත්‍යවශ්‍ය කරුණු සම්බන්ධයෙන් සමානද?

උ: යම් යම් සමානකම් තියෙනවා නමුත් මේ රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානීයා විසින් පොලිස්පතිවරයාට කෙලින්ම යොමු කරලා තියෙන වාර්තාවේ

FAIR COMMENT BY JEZEEM

සිසිර මෙන්ඩිස් මහත්මයා යවපු වාර්තාවට වඩා විස්තර තියෙනවා . ඒ කියන්නේ ඒ ප්‍රහාරයට සම්බන්ධ වෙන පුද්ගලියන් ගැන . ඒ අය ගැවසෙන තැන් ගැන. ඒ ආදි වශයෙන් තව ටිකක් elaborate කරලා විස්තරාත්මකව වාර්තාවක් විදියටයි ඒක යොමුවෙලා තියෙන්නේ.

ප්‍ර: එතකොට ඔය C4A ලේඛනය Top secret යනුවෙන් එහි ශීර්ෂයේ සඳහන් වෙනවා නේද?

උ: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ඔබගේ ධුර කාලය තුලදී අර බාහිරෙන් ලැබෙන ලිපි ලැයිස්තුගත කරලා එවා පිළිබඳ වාර්තා පවත්වාගෙන යනකොට යම් අංශ තිබුණද X අක්ෂරයෙන් පටන් ගන්න X4, X 5, කියලා තිබුණා නම් තිබුණා කියන්න නැත්නම් නෑ ඒක නෑ කියලා කියන්න?

උ: මට ඒ ගැන හරියටම මතකයක් නෑ

ප්‍ර: හොඳයි කමක් නෑ. ඒකට කමක් නෑ දැන් Top secret කියන වචන යෙදිලා තියෙනවානේ මේ ශීර්ෂයේ ?

උ: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබට Top secret යනුවෙන් ලිපියක් ලැබුණා නම් ඔබ මොකද කරන්නේ?

උ: මේ ලිපිය අනිවාර්යෙන්ම විවෘත කරන්නේ මම. ඊළඟට මම තීරණය කරනවා ලියුම තවත් කාගේ හරි අවධානයට යොමුවෙනව ද මේකේ පිටපතක් ලැබෙනවද නැද්ද කියන එක යවනවා නම් යවන්නේ අනිවාර්යෙන්ම ඒ යවන නිලධාරියාගේ නමින් Top secret කියන ලේබලයත් එක්ක. එහෙම නැත්නම් මම කරන්නේ මෙකේ තියෙන අන්තර්ගතය අරගෙන අනිත් අයට වාර්තාවක් විදියට සකස් කරනවා මේක මගේ අතිශය රහස්‍ය ලියුම් වලට ෆයිල් කරනවා.

ප්‍ර: එතකොට රාජ්‍ය බුද්ධිසේවාව විසින් එවලා තියෙන X 94 ත් classification කියන ශීර්ෂය යටතේ අති රහසශ්‍යයි කියන වචනය යොදලා තියෙනවා අතිරහස්‍යයි කියන වචනය යොදලා තියෙනවා නේද?

උ: නිවැරදි ස්වාමිනි.

ප්‍ර: දැන් එතකොට අපිට කියන්න පුළුවනිද ඔබේ අවධානය මා දැන් යොමු කරන්නේ C 4A ලේඛනයට C 4A ලේඛනය ඔබ කිව්වා යම් වැදගත් තොරතුරු යම් තොරතුරු එහි අඩංගු වෙනවා කියලා ඒ තොරතුරු වැදගත්ද පොලිස්පතිවරයක් විදියට ඔබට එය ලැබුණ නම් ?

උ: වැදගත් වෙනවා ස්වාමිනි. කලින් ලියුමට හා සමානයි බොහෝ දුරට.

ප්‍ර: අපි අමතක කරමුකෝ කලින් ඔබට ඒ ලියුම ලැබුණායි කියලා ? ඔබට ලැබුණ බව දැන් ඒක ගැන යන්නේ නැහැ. අපි දැන් හිතනවා ඔබට මා පෙන්වන අවස්ථාව තමයි උදාහරණයකට C4A ලේඛනය පමණයි පොලිස්පතිවරවයා විදියට ඔබට ලැබෙන්නේ. මම ඉස්සෙල්ලා ඔබගෙන්

FAIR COMMENT BY JEZEEM

අහපු ප්‍රශ්නේ ගැන අමතක කරන්න. එතකොට C4A ලේඛනයේ අඩංගු කරුණු ඔබ කියෙව්වාම ඔබ මොකක් ද ගන්න පියවර ජාතික බුද්ධි ප්‍රධානීන්ගෙන් එන්නේ formation of and alleged plan of attack කියලා ශීර්ෂයක් තියෙනවා. Top secret , eyes Only , මොකක්ද ඔබ ගන්න පියවර?

උ: මේ සම්බන්ධයෙනුත් මම කලින් අර කියපු ක්‍රියාමාර්ගයම තමයි අනුගමනය කරන්නේ වෙන්නේ. මොකද මේ තොරතුරු සෑහෙන දුරට specific . ප්‍රහාරය එල්ල කරන ක්‍රමවේදත් තියෙනවා. එල්ල කරන්න යන අයවලුන්ගේ නම් පවා තියෙනවා. ප්‍රහාරය එල්ල වීම Shortly කියලත් තියෙනවා. ඒ මේ සියලු කාරණා ගත්තාම අපිට මේක නොසලකා හරින්න බැහැ, ප්‍රමාද කරන්නත් බැහැ. ඒක නිසා මං කිව්වේ ඒකයි ඒ තොරතුර තනිවම අපිට කියවන්න බැහැ. අර මං මුලින් කිව්ව විදියට මේකට අදාළ අනිකුත් මේ සම්බන්ධ තොරතුරු තියෙන අයත් එක්ක වහාම කැඳවලා සාකච්ඡා කරලා . මේක විය හැකියි සම්භාවිතාව පිළිබඳව තීන්දුවකට තීරණයකට ඒම තමයි වහාම කල යුතු කාරණාව

ප්‍ර: එතකොට ඔබ අනිත් අය කැඳවලා ඔවුන් මුණ ගැහිලා මේ ප්‍රශ්නය විසඳීම සඳහා වූ ක්‍රමවේදය ගැන සැලැසුම් කිරීම කොපමණ කාල සීමාවක් ඇතුලත පොලිස්පති වරයා විදියට එහෙම නම් කරනවද?

උ: මේක එහෙම කල්ගන්න බැහැ. මොකද Shortly කියලා තියෙන්නේ වහාම වෙන්න ඕනේ. පැය ගාණක් ඇතුළත වෙන්න ඕනේ ඒ අඩුගානේ ඒ දවසේ ඇතුලතවත් වෙන්න ඕන. දවසේ ඇතුලතවත් මේක සිද්ධ වෙන්න ඕනේ.

ප්‍ර: එසේ සිදුවන්නට ඕනේ? හොඳයි?

උ: මේකට අනිවාර්යෙන්ම මේ බුද්ධි ප්‍රධානියා SIS Director ඉන්න ඕනේ. මොකද එයා තමයි මේක සපයන්නේ .එයා තමයි මේකට මුලික වශයෙන් කරුණු ඉදිරිපත් කරන්න ඕනේ. එයත් සමඟ අනිත් කට්ටිය එන්න ඕනි .

ප්‍ර: එන්නට අවශ්‍ය වෙන්නේ ?

උ: නිවැරදියි.

ප්‍ර: එතකොට දැන් ඔබේ දැන් ලකුණු කරලා ඉදිරිපත් කෙරුවානේ C 4 A (i) කියලා ඔබ විසින් හඳුනා ගන්නට යෙදුණ එවකට පොලිස්පති පුජිත් ජයනසුන්දර මහතාගේ අත් අකුරු?

උ: එහෙමයි

ප්‍ර: එතන තියෙන්නේ ඒ නම් කරන ලද නිලධාරින්ට උපදෙස් දීලා තියෙන්නේ FNA කියලානේ ?

උ: එහෙමයි .

ප්‍ර: මා කිව්වොතින් නිවැරදියි ද එය for necessary action කියලා.

FAIR COMMENT BY JEZEEM

උ: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: දැන් 4 for necessary action අවශ්‍ය කටයුතු සඳහා කියලා එවැනි සටහනක් යෙදීම C4A ලේඛනයේ මේ අඩංගු කරුණු සමඟ සන්සන්දනය කරන කොට ප්‍රමාණවත්ද?

උ: මගේ මතකයේ හැටියට නම් ප්‍රමාණවත් නැහැ. මම රාජකාරි කරපු විදියට නම් මට නම් ප්‍රමාණවත් නැහැ.

ප්‍ර: එහෙම නම් ඔහු විසින් සිදුකළ යුතුව තිබුණෙත් ඔබතුමා විසින් සිදුකිරීමට ඉඩ තිබුණාය කියලා සඳහන් කරපු කරුණුමද ? ඒ ක්‍රමවේදය? නැත්නම් ඊට වෙනස් ක්‍රමවේදයක් ඔහුට අනුගමනය කරන්නට පුළුවන්ද

උ: මම හිත්නේ මීට වඩා බරපතල විදියට මේ බුද්ධි තොරතුරු ගැන අවධානය යොමු කරලා මේ තොරතුරු යොමු කරන නිලධාරීන්ට මේකේ බරපතලකම දැනෙන ආකාරයට කටයුතු කරානම් වැදගත් කියන එකයි මගේ අදහස. මේ FNA කියලා කියන්නේ සමාන්‍යයෙන් අපි ලිපි ලේඛනවලට යොදන සරලම සටහනක් දෛනික routing documents වලට.

ප්‍ර: එතකොට දැන් FNA යෙදීම මගින් ඒ වගකීම එහෙම නම් ඒ කියන්නේ මේ වගේ බරපතල තොරතුරක් ලැබුණාම ඒ සම්බන්ධවෙන් කටයුතු කිරීමේ වගකීම එවක පොලිස්පති පූජිත ජයසුන්දර මහතා විසින් මේ නම් කරලා තියෙන නිලධාරින් වෙත පැවරීමක් ද කරලා තියෙන්නේ?

උ: දැන් මේ FNA කියලා කිව්වාම ඔව් ඒ යොමු කරපු නිලධාරින්ව පුළුවන් ඒ ගොල්ලන්ගේ අභිමතය පරිදි කටයුතු කරන්න. මම අදහස් කරන්නේ මගේ දැනීම නම් එහෙම එක එක්කෙනාට අභිමත විදියට නම් මෙවැනි බුද්ධි තොරතුරක් සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සුදුසු වෙන්නේ නැහැ. ඒකට අපි speacific Guild line එකක් දියයුතු යි කියන එකයි.

ප්‍ර: ඔබගේ අදහස වන්නේ එසේ කණිෂ්ඨ නිලධාරීන්ට ඒ කියන්නේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමත් පොලිස්පතිතුමා එක්ක බලනකොට කණිෂ්ඨ නිලධාරියෙක්නේ. ඒ සියලුම නිලධාරින්ට පොලිස්පතිවරයා විසින් අවශ්‍ය මඟ පෙන්වීම මාර්ගෝපදේශය ලබා දිය තිබිය යුතු බවද, මේ සිද්ධිය සම්බන්ධයෙන්?

උ: අනිවාර්යෙන්ම මේ ජාතික ආරක්ෂාවට එල්ල වෙච්ච තර්ජනයක් පිළිබඳ තොරතුරක්. එවැනි තොරතුරක් එක එක එක්කෙනාගේ අභිමතය පරිදි හසුරවන්න මං හිතන්නේ නැහැ ඉඩදීම කිසිසේත්ම එසේ සිදුවිය යුතුයි කියලා.ඒකට අනිවාර්යෙන්ම පැහැදිලි උපදෙස් පොලිස්පතිගෙන් යා යුතුයි කියන එකයි මගේ අදහස.

ප්‍ර: ඔබේ මතය. හොඳයි එතකොට මේ එහෙම නම් පොලිස්පතිතුමා වූ පූජිත ජයසුන්දර මහත්මයා මේ ද for necessary action FNA කියලා ඒ

FAIR COMMENT BY JEZEEM

සටහනක් යෙදිමෙන් පමණක් ඔහුගේ රාජකාරිය ඔහු ඉටුකිරීමක් සිදුවන්නේ නැහැ කියන එකයි ඔබේ ස්ථාවරය. ප්‍රමාණවත් ආකාරයට සිදුවන්නේ නැහැ කියන එකයි ඔබේ ස්ථාවරය?

උ: මගේ ස්ථාවරය ඇත්ත වශයෙන්ම මට මේ Document එක ලැබුණා නම් මගේ කාලේ මම එහෙම කරන්නේ නැහැ කියන එකයි මගේ ස්ථාවරය.

ප්‍ර: ඔබ සිදු කරන දේ පිළිබඳවයි මේ ගරු කොමිෂන් සභාවට කලින් සඳහන් කරන්නේ?

උ: සඳහන් කරා.

ප්‍ර: ඊළඟට මා ඔබේ අවධානය යොමු කරන්නට කැමතියි ඔබ දුන්නු පිළිතුරකට ඒ තමයි ඔබ කිව්වා අර ප්‍රභූ ආරක්ෂාව සඳහා යොමු කරලා කියන අංශය විසින් ඒ ප්‍රභූන්ගේ ආරක්ෂාව විශේෂයෙන් ගරු ජනාධිපතිතුමාගේ ගරු අගමැතිතුමාගේ ආරක්ෂාව සම්බන්ධව අවශ්‍ය අවස්ථාවල්වලදී තක්සේරු වාර්තාවන් කැඳවනු ලබනවාය කියලා?

උ: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: එතකොට ඒ තක්සේරු වාර්තාවන් කැඳවනකොට එහෙම නම් ඒ වාර්තාව ලබා දෙන අවස්ථාව වන විට රාජ්‍ය බුද්ධි සේවය විසින් ලබාදෙන එම වාර්තාවේ ඒ වන විට තිබෙන තත්ත්වය දිවයිනේ තිබෙන තත්ත්වය යම් ප්‍රස්තුත කරුණක් සම්බන්ධයෙන් අවධානය යොමුවෙලා තියෙනවා නම් ඒ සම්බන්ධව එවැනි වාර්තාවක අඩංගු වෙන්නට ඕනේද සාමාන්‍යයෙන්?

උ: දැන් මේ බුද්ධි තොරතුර රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණාට පස්සේ රාජ්‍ය බුද්ධි සේවය විසින් ආරක්ෂක තත්ත්ව වාර්තාවක් ගරු ජනාධිපතිතුමාට හෝ අගමැතිතුමාට හෝ යවලා තිබුණා නම් ඒකට අනිවාර්යෙන් මේ කාරණාව ඇතුළත් වෙන්න ඕනා.

ප්‍ර: ඇතුළත් වෙන්න ඕනේ. මං ඔබේ අවධානයට මේ අවස්ථාවේදී යොමු කරනවා X 97 A කියන වාර්තාව මේකට හේතු වුණේ අති ගරු ජනාධිපතිතුමා එවකට මඩකලපුවේ සංචාරයක් කරන්ට නියමිතව තිබුණා. 2019 අප්‍රේල් 12 වෙනිදා. දැන් ප්‍රහාරය සිද්ධ වුණේ මා ඔබේ මතකය අලුත් කරොත් 2019 අප්‍රේල් 21 වෙනිදා. මේ X 97 A ලේඛනය තමයි එවකට ගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහත්මයා මැතිතුමා 2019 අප්‍රේල් 12 වෙනිදා මඩකලපුවේ සංචාරය කරන්නට පෙර යම් රැස්වීමකට රාජ්‍ය බුද්ධි සේවාව විසින් එතුමාගේ ආරක්ෂක අංශය ට ලබා දුන්න ආරක්ෂිත තත්ත්ව විස්තරය. තක්සේරු වාර්තාව. එය පොඩ්ඩක් කියවලා බලන්නකෝ? ඔය ලේඛනය අනුව සඳහන් වෙනවද මඩකලපුව ප්‍රදේශයේ සංචාරය කිරීමේ දී ඔය ලේඛනය ඒ කියන්නේ X 97 A ලේඛනය අනුව එහි සඳහන් වෙනවද මඩකලපුව සංචාරය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ නිරීක්ෂණය ජනාධිපතිතුමාගේ?

FAIR COMMENT BY JEZEEM

උ: සඳහන් වෙනවා ස්වාමිනි.

ප්‍ර: අපි සාරංශයක් විදියට ගත්තොත් රාජ්‍ය බුද්ධි සේවය විසින් එතුමාගේ මඩකලපු සංචාරය අනුමත කරනවාද?

උ: සංචාරය කරන්න එපයි කියලා විශේෂයෙන් කියලා නැහැ ඒකදී ගන්න ඕන precautions අවධානය යොමුකරන්න ඕන දේවල් ගැන කියලා තියෙනවා.

ප්‍ර: එතකොට මා ඔබේ අවධානය යොමු කරන්නට කැමතියි ඔය අවස්ථාව වන විට රාජ්‍ය බුද්ධි සේවය විසින් ඒ කියන්නේ නිලන්ත ජයවර්ධන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා විසින් ඔය ලිපිය ඒ කියන්නේ එම වාර්තාව තක්සේරු වාර්ථාව X 97 A එයලබා ගෙන තියෙන බව පරිගණකයෙන් දැක්වෙනවා නේද 2019 .04 වෙනි මාසේ 09 වෙනිදා ?

උ: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: උදෑසන 03.39 ට ?

උ: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: එම වාර්තාව ආවරණ ලිපියක් සමඟ නේද ඉදිරිපත් වෙන්නේ නියෝජ්‍ය පොලිස්පති ජනාධිපති ආරක්ෂක දිසාවට?

උ: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: එහි දාතමය වෙන්නේ 2019 අප්‍රේල් 10 වෙනිදා?

උ: අප්‍රේල් 10 වෙනිදා.

ප්‍ර: එතකොට ඒ වෙන කොට එහෙම නම් පූජිත් ජයසුන්දර මහත්මයාට ඒ කියන්නේ එවකට පොලිස්පතිතුමාට X 94 ලේඛනය නිලන්ත ජයවර්ධන මහත්මයා යැවීම සඳහා අත්සන් කරලා තියෙනවා 2019 අප්‍රේල් 09 ඒ කියන්නේ X97 A හි වාර්තාව ලබා ගත්තේ දවසමයි?

උ: නිවැරදියි.

ප්‍ර: ඊළඟට මේ ලේඛනය බලන්න X 113 එය යොමු කරලා තියෙනවා නිලන්ත ජයවර්ධන මහත්මයා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ජාතික බුද්ධි ප්‍රධානී වෙත, නේද ඒකේ එමගින් X113 සමඟ ඇමුණුමක් ඔහු යොමු කරනවා නේද ජාතික බුද්ධි ප්‍රධානීගේ අවධානයට ?

උ: නිවැරදියි.

ප්‍ර: එහෙම නම් මේ හැම ලේඛනයකම තියෙන්නේ තමන්ට ලැබුණ තොරතුර පිළිබඳව නිලන්ත ජයවර්ධන මහත්තයාට ලැබුණු තොරතුර පිළිබඳව?

උ: නිවැරදි.

ප්‍ර: ඔබ මේ ගරු කොමිෂන් සභාවට අද දින සාක්ෂි දෙන ගමන් සඳහන් කලා මේ තොරතුරුවල අඩංගු කරුණු වැදගත් කියලා?

උ: නිවැරදියි.

ප්‍ර: එය ජාතික රක්ෂාවට වැදගත්ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: වැදගත් ස්වාමිනි.

ප්‍ර: එය එවකට ගරු ජනාධිපති වුණ ඒ කියන්නේ ලංකාවේ පළවන පුරවැසියා වුණ මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාට වැදගත්වෙනව ද ඔහුගේ ආරක්ෂාව සම්බන්ධයෙන්?

උ: වැදගත් වෙනවා ස්වාමිනි.

ප්‍ර: එහෙම නම් ඔබේ අවධානයට මා යොමු කරලා තියෙනවා X 97 A ලේඛනය අනිවාර්යෙන්ම ඔය තොරතුර ඒ කියන්නේ විදේශයකින් තමන්ට ලැබුණාය කියලා X 113 ඒ වගේම X 94 හි සඳහන් කරලා තියෙන රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂවරයා විසින් සඳහන් කරලා තියෙන මේ තොරතුර අඩංගු විය යුතුව තිබුණා ද නැද්ද ?

උ: අඩංගු විය යුතුව තිබුණා.

ප්‍ර: ඒ තොරතුර එහි අඩංගු නොකිරීමෙන් යම් අකාරයකට එවකට ගරු ජනාධිපතිතුමාව හානියට පත්වීමේ අවධානමකට ඔහුට මුහුණ දීමට ඉඩහැරීමක් සිදුවෙනවද?

උ: ආරක්ෂක විධි විධානවල හිඩැසක් ඇති වෙන්න ඉඩ තිබුණා . මේ කාරණා දැනගත්තා නම් සමහර විට ඒ සංචාරය නතර කරන්නත් ඉඩ තිබුණා.

ප්‍ර: ඊළඟට මා ඔබෙන් දැන ගන්නට කැමතියි අර බුද්ධි සමාලෝචන රැස්වීම්වලදී ඔබ කිව්වා ගරු කොමිෂන් සභාවට හැම අවස්ථාවකදී එහි ප්‍රමුඛයන් කරුණු ඉදිරිපත් කිරීම සිදුකරනු ලබන්නේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයා කියලා. එතකොට ඔය කරුණු පිළිබඳව ඔබේ අවධානයට අපි යොමු කරපු විදේශයකින් ලැබුණා යැයි කියන ඔය කරුණු පිළිබඳව රාජ්‍ය බුද්ධි ඒ කියන්නේ SIS Director විසින් ඒ බුද්ධි සමාලෝචන මණ්ඩලයේදී හැමෝගේම අවධානයට යොමු කළ යුතුව තිබුණා ද?

උ: එහි මොහු මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළ යුතුව තිබුණා. යම් විදියකින් ඔහු ඒ කාර්ය සිද්ධ කරේ නැත්නම් ජාතික බුද්ධි ප්‍රධානියාටත් ඒ වගේම ආරක්ෂක ලේකම්වරයාටත් ඒ ගැන විමසිමට වගකීමක් තිබුණා. මොකද ඒ වෙන කොට මේ දෙන්නාත් මේ තොරතුර දැනගෙන හිටියා. ඒ දෙන්නාටත් වගකීමක් තිබුණා. මෙයාගෙන් මතු කරලා අහන්න ඔබ එවපු බුද්ධි තොරතුර ඇයි මේ අවස්ථාවේදී සාකච්ඡා කරන්නේ නැත්තේ කියන එක ගැන. මූලික වශයෙන් මේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාට දැනුම් දිය යුතුව තිබුණා ඔහුගෙන් ඒක ගිලිහුණා නම් අනික් දෙදෙනාටත් වගකීමක් තිබුණා ඒ ගැන ඉස්මතු කරලා සාකච්ඡාවට යොමු කරන්න.

ප්‍ර: ඔය සිද්ධිය සිදුවෙන අවස්ථාවේදී පොලිස්පතිවරයාව හිටියේ ඔබ නම් එහෙම නම් ඔබ කැමැත්තක් දක්වනව ද එවැනි තොරතුරක් පිළිබඳව තොරතුරු ජාතික එක්කෝ රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂවරයාගෙන් එහෙම

FAIR COMMENT BY JEZEEM

නැත්නම් ජාතික බුද්ධි ප්‍රධානීන් ගෙන් හෝ අවම වශයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් හෝ ලබා ගැනීමට ?

ඇ: ප්‍රශ්නය ටිකක් මට පැහැදිලි වුණේ නැහැ.

ප්‍ර: ඔය ඔබ ඔය සිද්ධිය වෙන අවස්ථාවේදී ආරක්ෂක සමාලෝචන රැස්වීමට සහභාගිවෙලා හිටියානම් දැන් ඔබ මේ ගැන දන්නේ නැත්නම් 09 වෙනිදා වෙනකොට ඔය ලියුම රැස්වීමට එනකොට හම්බ වෙලා තිබුණේ නැත්නම් එතකොට ඒ ගැන දන්නේ CNI සහ SIS Director පමණයි කියන මතය ගියෝතින් පොලිස්පතිවරයා විදියට ඔබ අපේක්ෂා කරනවද එවැනි තොරතුරු දන්නා වූ අය විසින් එතැන හිටපු හැමෝටම ඒ ගැන කියන්නට ඕනි විශේෂයෙන්ම විමර්ශන සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධානයා වූ පොලිස්පතිවරයා වූ ඔබට ඒ පිළිබඳව දැනුම් දෙන්නට ඕනේ කියලා ?

ඇ: අනිවාර්යෙන්ම ඒ සම්බන්ධයෙන් පොලිස්පතිවරයා දැනුවත් විය යුතුමයි.

ප්‍ර: ඒ වගේ රැස්වීමකදී දැනගන්නට අවශ්‍යය වෙනවා ඔබට?

ඇ: අනිවාර්යෙන්ම.

ප්‍ර: එතකොට එහෙම ඒ රැස්වීමේ දී ඒ ගැන සාකච්ඡා කලානම් ඔබ කිව්වා ඒ රැස්වීමට ත්‍රිවිධ හමුදාවේ අය සහභාගී වෙනවා කියලා බුද්ධි අංශ වල ?

ඇ: නිවැරදි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ අංශවලත් සහයෝගය අරගෙන පොලීසියට පුළුවන් ද පොලිස්පතිවරයාට පුළුවන් ද තමන්ගේ විමර්ශන වේගවත්ව සහ ක්‍රමානුකූලව අපේක්ෂිත අරමුණු කරා යා හැකි ආකාරයට සැලසුම් කරන්නට?

ඇ: මේ බුද්ධි තොරතුර යම් විදියකට එතැනදි එළියට ආවනම් සාකච්ඡා වුණානම් මේකට ඒ අවස්ථාවේ හිටපු අනිත් සියළු දෙනාම මේකට සම්බන්ධ වෙනවා. එතකොට ඒ අය අතරින් තිබුණ Input කියලා අපි කියන්නේ ඒ සියළු දේවල් මේකට වැටිලා මම අර මුලින් කියපු වගේ මේකේ තියෙන බැරෑරුම්කම ගැඹුරුකම බොහොම ගැඹුරට අධ්‍යයනය කරන්න පුළුවන්කම තිබුණා. එහෙම වුණානම් මේක වැළැක්වීමට ගත යුතුව තිබූ පියවරයන් ඉතා ඉක්මනින් සහ සාර්ථකව ගන්න පුළුවන් කම තිබුණු එකයි මගේ අදහස.

ප්‍ර: ඉලගකෝන් මහත්මයාණනි මේ විමර්ශනවලදී අපේ ජනාධිපති විමර්ශන සහ පරීක්ෂණ කොමිෂන් සභාවට හෙළිවෙලා තියෙනවා දිවයිනේ විවිධ පළාත් වල මේ සහරාන් විසින් මෙහෙයවන ලද වැඩමුළු පවත්වලා තියෙනවා ඒ වගේම ඒවට පුහුණු වීම් සඳහා තරුණයින් ගිහිල්ලා තියෙනවා. ඒ වගේම ආරක්ෂිත නිවාස දිවයිනේ යම් යම් ස්ථාන වල ඔවුන්ට තිබිලා තියෙනවා කියලා. ඔබ අර C 855 කියලා ලකුණු කරපු ඒ ලේඛනය අනුව යම් ක්‍රමවේදයක් සැලසුම් කෙරුවනේ. කොයි ආකාරයට ද බුද්ධි නිලධාරීන් කටයුතු කරන්නට ඕන කියලා. පොලීසියට අදාළව.

Presidential Secretariat Copy
LEAK COMMENT BY JEZEEM

එහෙම නම් ඔබේ ඒ පිළියළ කරන ලද ඒ උපදෙස් පත්‍රිකාව අනුව උපදෙස් මාලාව අනුව ඔබ විසින් හඳුන්වාදුන් ඒ ක්‍රමවේදය නිසි ආකාරව ක්‍රියාත්මක වුණා නම් ඔය තොරතුරු ඉතා පහසුවෙන්ම පොලීසියට ලබාගැනීමේ හැකියාව තිබුණ ද?

උ: ඇත්ත වශයෙන්ම ඒ ක්‍රමවේදය ක්‍රියාත්මක වුණා නම් මේ තොරතුරු ලැබෙන්නට ඕනා. ඒ ඒ නිලධාරීන්ට පැවරුණු කාර්ය භාර්ය හරියාකාරව ඉෂ්ඨ වුණානම්.

ප්‍ර: ඔබ 2019 අප්‍රේල් මාසේ 21 වැනිදා සිදුවුණ පාස්කු ප්‍රහාරයෙන් පසුව එවකට ගරු ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් පත්කරනු ලැබූ ත්‍රි පුද්ගල කමිටුවේ සමාජිකයෙක් වෙලා හිටිය නේද, මලල්ගොඩ කමිටුවේ?

උ: නිවැරදි ස්වාමීනි.

ප්‍ර: එම කමිටුව විසින් අදියර තුනකින් එවකට ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට වාර්තාවන් ඉදිරිපත් කරා කිව්වොත් නිවැරදිද?

උ: නිවැරදි ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ අන්තර් වාර්තා දෙකකුත් අවසාන වාර්තාවකුත්?

උ: නිවැරදි ස්වාමීනි.

ප්‍ර: ඔබේ ඒ කමිටුව කොපමණ කාලයක් පැවැත්වුණා ද?

උ: අපිට මූලික වශයෙන් සති දෙකයි ලබාදුන්නේ. ඊට පස්සේ අපි තව සති දෙකක කාලයක් ඉල්ල ගත්තා. මගේ මතකයේ හැටියට සති 05 කින් අපි වාර්තාව භාර දුන්නා.

ප්‍ර: ඇයි සති 05 කින් පමණක් විතරක් ඒ වාර්තාව ඉදිරිපත් කරන්න සිද්ධ වුණේ?

උ: අපේ කාල සීමාව ඉවර වුණා.

ප්‍ර: ගරු ජනාධිපතිතුමා විසින් ලබාදුන්න කාලසීමාව එපමණද එය ඉදිරිපත් කිරීම සඳහා ඔබේ වාර්තාව?

උ: සති දෙකයි ඇත්තටම මේ ස්වාමිනි අපිට ලැබුණේ. අපි වැඩිපුර තමයි තවත් සති දෙකක් හෝ තුනක් ලබාගෙන සති 05 ක වගේ කාලයක දී අපිට හැකි පමණින් ඒ කාලසීමාව තුළ කරන්න පුළුවන් වුණ ප්‍රමාණය කරලා අවසන් කරලා භාරදුන්නේ.

ප්‍ර: ඔබ සඳහන් කරා ඔබ ආරක්ෂක අමාත්‍යාංශයේ රැස්වීම වලට සහභාගි වුණයි කියලා.

උ: 2015 පස්සේ බුද්ධි සමාලෝචන රැස්වීමට සහභාගි වුණා.

ප්‍ර: ආරක්ෂක අමාත්‍යාංශයේ තිබුණ ඒ රැස්වීම් සඳහා සහභාගි වුණා කියලා ඔබ කිව්වනේ?

උ: නිවැරදි.

ප්‍ර: එතකොට ඒ රැස්වීම් වලට යන කොට ආරක්ෂක කවුන්සිලයේ කියලා සඳහන් වෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

උ: ආරක්ෂක කවුන්සලය කියන්නේ security council වෙන්න ඕන මං හිතන්නේ.

ප්‍ර: security council එක ගැන තමයි මං අහන්නේ. ඒ ආරක්ෂක කවුන්සිලයට රැස්වීම් වලට ගියාම ඔබේ පැමිණීම සලකුණු කරානේද?

උ: එහෙම ක්‍රමවේදයක් තිබුණේ නැහැ මා දන්නා තරමින්. අපේ කිසිම ලේඛනයක් අත්සන් කරේ නම් නැහැ.

ප්‍ර: මා කිව්වොතින් 2015 ජනවාරියේ සිට 2015 ඔක්තෝබර් මස දක්වා වූ කාලසීමාව තුළ ආරක්ෂක කවුන්සලයට සහභාගි වූ අයවලුන්ගේ නාමලේඛන ආරක්ෂක අමාත්‍යාංශය සතුව තිබිලා තිබෙනවයි කියලා ඒක නිවැරදිද?

උ: මේ ලේඛනය දිහා මට බැලුවාම පේන්නේ ඒ ගොල්ලෝ මේකේ minutes සකස් කරන කොට ඒ ආපු නිලධාරීන්ගේ නාම ලේඛනය ඒකට ඇතුළත් කරලා තියෙනවා. කවුරුහරි නිලධාරීයෙක් ඒ ආපු කට්ටියගේ නම් ටික සටහන් කරගෙන තියෙනවා. දින පොතක්. ඒ අනුව තමයි මං හිතන්නේ minutes එක හදලා තියෙන්නේ.

ප්‍ර: ඔබ කිව්වනේ ජනාධිපති ලේකම් ඒ රැස්වීමට සහභාගි වෙනවයි කියලා. ආරක්ෂක කවුන්සිලයේ.

උ: නිතිපතාම වගේ සහභාගි වුණා.

ප්‍ර: ඒ වගේම මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒකට සහභාගි වෙනවද?

උ: බොහෝ විට සහභාගි වුණා. නමුත් සහභාගි නොවුණ අවස්ථාවලුත් තිබ්බා.

ප්‍ර: නමුත් බුද්ධි සමාලෝචන රැස්වීමට ඔහු සහභාගි වෙන්නේ නැහැනේ?

උ: නැහැ. සහභාගි වෙන්නේ නැහැ.

ප්‍ර: එතකොට විදේශ සබඳතා අමාත්‍යාංශය ලේකමුත් සහභාගි වෙන්නේ නැහැනේ බුද්ධි සමාලෝචන රැස්වීම් වලට ?

උ: නැහැ.

උ: නැහැ සහභාගි වෙන්නේ නැහැ.

ප්‍ර: නමුත් ජාතික ආරක්ෂක කවුන්සලයේ රැස්වීම් වලට ඔහු සහභාගිවෙනවනේ? ඇතැම් අවස්ථාවන් වලදී?

උ: ඇතැම් අවස්ථාවන් වලදී සහභාගී වෙනවා හැමදාම නෙමේ. අවශ්‍යය අවස්ථා වලදී කැඳවනවා එතුමා.

ස්වාමීනි ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඒ කියන්නේ වර්තමාන ලේකම් මේජර් ජනරල් විශ්‍රාමික කමල් ගුණරත්න විසින් මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම් එච්.එම්.බී.පී. හේරත් මහතා වෙත 2020 ජූලි මස 08 වැනිදා දාතමින් එවා ඇති ලේඛනය C 856 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා. එහි මාතෘකාව වන්නේ 2015 ජනවාරි

FAIR COMMENT BY JEZEEM

මස සිට 2019 අප්‍රේල් මස දක්වා ආරක්ෂක කවුන්සලය සඳහා සහභාගී වූ අයවලුන් සබැඳිව විස්තර ඉදිරිපත් කිරීම.

ප්‍ර: මේ X 856 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරපු ලේඛණයේ දෙවැනි ඡේදය අනුව පැහැදිලි වෙනවද ඉලංගකෝන් මහත්මයාණනි කවදා ඉදලා කවදා දක්වා වූ තොරතුරු ද තියෙන්නේ මේ රැස්වීම් වලට සහභාගී වූ අය ගැන කියලා සහ තොරුතුරු නැත්නම් ඇයි ඒ නැත්තේ කියලා?

උ: මේ වාර්තාවේ විදියට 2015 ජනවාරී මාසයේ සිට 2015 ඔක්තෝබර් මස දක්වා වූ කාල සීමාව තුළ ආරක්ෂක කවුන්සිලය සඳහා සහභාගිවීමේ අයවලුන්ගේ නාම ලේඛනය මෙයට ඇමුණුම වශයෙන් ඉදිරිපත් කර ඇති අතර 2015 ඔක්තෝබර් මාසයේ 28 වන දිනෙන් පසු පැවති ආරක්ෂක කවුන්සිලය සඳහා සහභාගී වූ අයවලුන් පිළිබඳ ලේඛන ගත විස්තර නොමැති බව දන්වා සිටිමි.

ප්‍ර: එතකොට ඒ C 856 ලේඛනයට ඇමුණුමක් තියෙනවා නේද. ඒ ඇමුණුමේ සඳහන් වෙනව නම් 2015 ජනවාරී මස 21 පොලිස්පති එන්.කේ. ඉලංගකෝන්, 2015 පෙබරවාරී මස 11 පොලිස්පති එන්.කේ. ඉලජගකෝන්, 2015 පෙබරවාරී 25 පොලිස්පති එන්.කේ. ඉලංගකෝන් 2015 මාර්තු 18 පොලිස්පති එන්.කේ. ඉලංගකෝන්, 2015 අප්‍රේල් 01 වැනිදා පොලිස්පති එන්.කේ. ඉලංගකෝන්, 2015 අප්‍රේල් 08 පොලිස්පති එන්.කේ. ඉලගකෝන්, 2015 මැයි 13 , 2015 මැයි 27 ,2015 ජුනි 24, 2015 ජුනි 08, 2015 ජූලි 21 සහ 2015 අගෝස්තු 05 මේ යන හැම දිනකම ඔබ මේ ආරක්ෂික කවුන්සිල රැස්වීම් වලට සහභාගී වූ පුද්ගලයෙක් විදියට එය නිවැරදි වෙන්නට ඕනද?

උ: නිවැරදි ස්වාමීනි.

ස්වාමීනි එම ඇමුණුම C 856 A අක්ෂරයෙන් ලකුණු කරු ඉදිරිපත් කරනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: ඉලංගකෝන් මහත්මයා ඊයේ දින මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන්නා හිටපු ත්‍රස්ත විමර්ශන ඒකකයේ නියෝජ්‍යය පොලිස්පති නාලක ද සිල්වා මහතා. ඔහුගේ සාක්ෂියේ දී කියවුණා 2015 දී නව රජය පත්වෙන කොට ඔහු හිටියේ රාජ්‍යය බුද්ධි සේවාවේ නව රජය පත්වුණායින් පස්සේ ඔහුව ත්‍රස්ත විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂක වශයන් පත්වීමක් ලැබුණා. ඒක ඔබ ඔහු කෙරේ තිබූ විශ්වාසය මත ලබාදුන්න එකක් බවත් ඒ සම්බන්ධයෙන් ඔහු ඔබට ස්තූතිවන්ත වන බවත් සඳහන් කරලා ඔහු කිව්වා එනමුත් ඒ ඔහුව රාජ්‍යය බුද්ධි සේවයේ ඉඳලා ත්‍රස්ත විමර්ශන ඒකකයට දමනු ලැබුවේ දේශපාලන හේතු මත කියා. ඒ

FAIR COMMENT BY JEZEEM

චෝදනවා ඔහු ඔබට විරුද්ධව නෙවෙයි කෙරුවේ. ඒ සම්බන්ධයෙන් ඔබට මොනවද කියන්න තියෙන්නේ?

උ: නාලක සිල්වා මහත්මයා රාජ්‍යය බුද්ධි සේවයේ සිට පොලිස් මූලස්ථානයට මාරු කරන්න හේතු වුණු කාරණාව ස්වාමීනි මට මේ අවස්ථාවේ දී පැහැදිලිවම මතකයකට එන්නේ නැහැ. කොහොම නමුත් ආරක්ෂක අමාත්‍යාංශයේ නිර්දේශයක් නැතුව මට රාජ්‍යය බුද්ධි සේවයේ නිලධාරීන් මට සාමාන්‍යයෙන් මාරුකරන්නෙ නැහැ. මේක අනිවාර්යෙන්ම ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිර්දේශයක් හෝ නියෝගයක් වෙන්න ඇති. නිලධාරියාව පොලිස් මූලස්ථානයට මාරු කරන්න. එයට හේතුව මොකද්ද කියන එක සමහර විට මම නොදැන ඉන්නත් පුළුවන්. මොකද මේ අය මම මුලිනුත් කිව්වා වගේ මාරුවීම් සිදු කරන්න ආරක්ෂක අමාත්‍යාංශයේ නිර්දේශ මත තමයි බොහෝ විට, වෙන හේතුවක් නෙවෙයිනම්.

ප්‍ර: ඒ ඔබ කියන්නේ නාලක ද සිල්වා මහත්මයා 2015 නව රජය පත්වීමත් සමඟම ත්‍රස්ත විමර්ශන ඒකකයට රාජ්‍ය බුද්ධි සේවයෙන් යන්න ඇත්තේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් ආපු නියෝගයක් නැත්නම් නිර්දේශයක් මත?

උ: මම විශ්වාස කරනවා බොහෝ දුරට නෙවෙයි වෙන්න ඕන ඒ ආකාරයෙන් කියන එක තමයි මගේ විශ්වාසය.

ප්‍ර: ඔබ කියන්නේ එහෙම නැත්නම් ඒ නිලධාරියා මාරුකිරීමක් සිදු කරන්නේ නැහැ කියන එක?

උ: මට විශේෂයෙන්ම රාජ්‍යය බුද්ධි සේවයේ නිලධාරීන්ව තනි මතයට මාරු කිරීමක් සිද්ධ වෙන්නේ නැහැ ස්වාමීනි. අඩුම ගානේ රාජ්‍යය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකගෙන්වත් නිර්දේශයක් අවම වශයෙන් එන්න ඕන.

ප්‍ර: දැන් ඔබ කොමිෂන් සභාව ඉදිරියේ දී ප්‍රකාශ කෙරුවා සහරාන් හෂිම්ගේ අන්තවාදී දේශන සම්බන්ධයෙන් ඒ 2015 සහ 2016 වර්ෂයේ දී තොරතුරු ලැබුණ කියලා නේද?

උ: ස්වාමීනි 2014 සහ 2015 වර්ෂ වල. 2016 දී මගේ කාල වලදී ලැබිලා තිබුණේ නැහැ. 2014 සහ 2015 වර්ෂ වල තමයි 2 ක් හෝ 03 ක් හෝ 04 ක් ලැබිලා තිබුණා.

ප්‍ර: දැන් ඒ සම්බන්ධයෙන් 2014 වර්ෂයේ දී රාජ්‍යය බුද්ධි සේවාවේ වෙනම අංශයක් ඉස්ලාම් අන්තවාදී සම්බන්ධයෙන් විමර්ශන කිරීම සඳහා ස්ථාපනය කළ බවට ඔබට යම් මතකයක් තිබෙනව ද?

උ: එවැනි මතකයක් නම් ස්වාමීනි නැහැ. නමුත් රාජ්‍යය බුද්ධි සේවයේ ප්‍රධානියා නිලන්ත ජයවර්ධන මහත්මයත් කැඳවලා ඒ ගැන මම අවස්ථා කිහිපයක් සාකච්ඡා කරලා අපි දෙන්නම මේකෙ බැරුරුම්කම ගැන කතා කරලා ඒකට අවශ්‍යය කටයුතු සම්පාදනය කිරීම ගැන සාකච්ඡා කිරීම ගැන මට මතකයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් සහරාන් හෂීම්ගේ ඔය අන්තවාදී දේශන සම්බන්ධයෙන් 2015 වර්ෂයේ දී ආරක්ෂක කවුන්සලයේ දැනුවත් කිරීමක් සිදුවුණා ද?

උ: අවස්ථා කිහිපයකදීම මේ මේ සහරාන් හෂීම්ගේ සහ ඉස්ලාම් අන්තවාදය ගැන සාකච්ඡා වුණා ස්වාමීනි.

ප්‍ර: ආරක්ෂක කවුන්සලයේ ද?

උ: ආරක්ෂක කවුන්සිලයේ සාකච්ඡා වුණා ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ ආරක්ෂක කවුන්සිලයේ දී ඒ සහරාන් හෂීම්ගේ අන්තවාදී දේශන සම්බන්දයෙන් සාකච්ඡා කරන විට එවකට ජනාධිපති වශයෙන් හිටි ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හිටිය ද?

උ: ඒ ආරක්ෂක කවුන්සලයේ රැස්වීම් අනිවාර්යෙන්ම සර් පවත්වන්නේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්. නමුත් ස්වාමීනි ඒ ඒ වකවානුව වන කොට සහරාන් ගැන ඒ තරම්ම ඉස්මතුවීමක් තිබුණේ නැහැ. ඒ කාලේ වැඩිවශයෙන්ම සාකච්ඡා වුණේ ISIS ත්‍රස්තවාදය ගැන සහ ඒකෙන් ලංකාවට ඇතිවිය හැකි බලපෑම. ඒක ගැන තමයි ඔය වැඩි වශයෙන්ම සාකච්ඡා කළේ. විශේෂයෙන්ම ලංකාවේ ඒ ගොල්ලෝ IS සංවිධානයට බැඳිච්ච කට්ටිය කිහිපදෙනෙක් හිටියා. ඒ අය ගැන සොයා බැලුවා. ඊළඟට අර දඹුල්ල එක්කෙනෙක් ගිහිල්ලා සාතනයට ලක් වෙලා තිබුණා. එතකොට එයාගේ ඥාතීන් ගැන සොයා බැලුවා. ඊළඟට වෙන කවුද ගිහිල්ලා සම්බන්ධ වෙන්නේ කියන එක ගැන විමර්ශනය කළා. එතැන්දි ඔය සහරාන් කියන පුද්ගලයා ඒ වකවානුව වන විට ඒ තරම් ඉස්මතු වෙලා තිබුණේ නැහැ. සුළු වශයෙන් තමයි එයාගේ දේශන අන්තර් ජාලය තුළත් තිබුණේ. මං හිතන්නේ ඒක එයාගේ ආරම්භක අවස්ථාවක්. ඒක නිසා ඔය ආරක්ෂක මණ්ඩලය වුණත් ඔය සහරාන්ගේ සංවිධානය පිළිබඳ දිර්ඝ වශයෙන් එතරම් සාකච්ඡාවීමක් නෙවෙයි සිද්ධ වුණේ. මේ ජාත්‍යන්තර ත්‍රස්තවාදය . ISIS ත්‍රස්තවාදය ගැන තමයි 2015 සහ 2016 මම යන වකවනුව දක්වාම වැඩියෙන්ම සාකච්ඡා වුණේ.

ප්‍ර: නමුත් 2015 2016 වර්ෂ වලදී සහරාන් හෂීම්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් යම් හෝ සඳහනක් ආරක්ෂක කවුන්සලයේ සිදු වුණා ද?

උ: සාකච්ඡා වුණා මෙයාගේ වෛරී ප්‍රකාශයන් ඇතුළත් දේශන පැවැත්වෙන එක ගැන යම් යම් අවස්ථා වලදී බුද්ධි අංශ සඳහන් කරා. සාකච්ඡා වුණා.

ප්‍ර: බුද්ධි අංශ සඳහන් කෙරුවා. ඒ කියන්නේ රාජ්‍යය බුද්ධි සේවයේ සහ බුද්ධි ආරක්ෂක මණ්ඩලයේ?

උ: යුධ හමුදා බුද්ධි

ප්‍ර: DMI ඒක නිවැරදි ද?

උ: නිවැරදි.

ප්‍ර: එතකොට ඔබ ඉස්සෙල්ලා කිව්වා ආරක්ෂක කවුන්සලයේ රැස්වීමක් ජනාධිපතිතුමා නැතුව වෙන්නේ නැහැ කියන එක?

FAIR COMMENT BY JEZEEM

උ: අනිවාර්යෙන්ම ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් තමයි ආරක්ෂක මණ්ඩලය රැස්වෙන්නේ.

ප්‍ර: එතකොට ඔය සහරාන් හෂිම්ගේ අන්තවාදී දේශන සම්බන්ධයෙන් සඳහන් කරන්න යෙදුණු ආරක්ෂක කවුන්සිල රැස්වීම් වලට එවකට අග්‍රාමාත්‍යය වශයෙන් සිටි රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහභාගි වුණා ද?

උ: බොහෝ විට එතුමත් සහභාගි වුණා. සමහර දවස් වලට පැමිණියේ නැහැ. නමුත් බොහෝ විට එතුමත් සහභාගි වුණා.

ප්‍ර: දැන් ඔබ කියන හැටියට සහරාන් හෂිම්ගේ දේශන අන්තවාදී ඉස්ලාම් නොවන අන්‍යාගමිකයින් කෙරෙහි වෛරයක් ඇති කරන දේශන නේද?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ 2015 2016 වර්ෂ වන විට ඔබ කිව්වා මීට කලින් රජයේ අවධානය හුඟක් තිබ්බේ ජාතික සංහිදියාව සම්බන්ධයෙන් කියලා හරිද ඒක? ආගමික සංහිදියාව සම්බන්ධයෙන්?

උ: මම සඳහන් කළේ ස්වාමීනි මෙම බුද්ධි තොරතුර ලැබෙන කාලය වෙනකොට කියලා ස්වාමීනි. සංහිදියාව තමයි.

ප්‍ර: මොන බුද්ධි තොරතුර ද ?

උ: අප්‍රේල් 08 වැනිදා.

ප්‍ර: නැහැ මං අහන්නේ ඒ ගැන නෙවෙයි. මං අහන්නේ 2015 2016 වර්ෂවලදී එවකට රජයේ පැවති එක ප්‍රධාන මේ අරමුණක් වුණා ද ජාතික සංහිදියාවට නැත්නම් ආගමික සංහිදියාවට?

උ: ආගමික සංහිදියාව ගැන සාකච්ඡා වුණා. මොකද සර්වාගමික කමිටු කියලා අපි පිහිටෙවුවා. පළාත් මට්ටමේ සියළුම මොකද බෙරුවල සිද්ධියෙන් පස්සේ තමයි ජාතීන් අතර සංහිදියාව කියන මේ සංකල්පය ඇවිල්ලා ඒකට වැඩි අවධානයක් යොමු කරලා මේ සර්වාගමික කමිටු කියලා ඒ ඒ ක්‍රමවේදයක් සකස් කරලා ඒ සංහිදියාව පිළිබඳ වැඩසටහන ආරම්භ වුණේ. ඒක දිර්ඝ වශයෙන් කරගෙන ගියා. මේ කාලෙත් ඒ ගැන නිතරම සාකච්ඡා වුණා. මොකද සමහර තැන් වල මේ මුස්ලිම් සිංහල අය අතරේ අනෙන්‍යෝන්‍යය අවබෝධයට ගැටළු වෙන තැන් මතු වුණා. ඒක නිසා ඒ ගැන සාකච්ඡා වුණා.

ප්‍ර: එතකොට බෙරුවල සිද්ධිය වුණේ 2014 විතරනේ?

උ: 2014.

ප්‍ර: එතකොට මේ සහරාන් හෂිම්ගේ මේ ආගමික අන්තවාදී දේශන ඔය ඔබතුමා කියන ආගමික හා ජාතික සංහිදියාවට බාධාවක් නේද?

උ: ඒ වකවානුවේ දී සහරාන්ගේ ක්‍රියාකලාපය ප්‍රායෝගිකව මේ ජාතීන් දෙක අතරේ ගැටුමක් ඇති වෙන තත්ත්වයට එහෙම නැත්නම් භේද බින්න වෙන තරමටම බරපතල තත්ත්වයකට ඇවිල්ලා තිබුණේ නැහැ. මේ එයාගේ වෛරී ප්‍රකාශයන්. ඒක පැහැදිලි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: නැහැ මං අහන්නේ ඔහුගේ ප්‍රකාශයන් අන්‍යාගමිකයන් කෙරෙහි වෛරය ඇති කරන ප්‍රකාශ නේද?

උ: නිවැරදි ස්වාමීනි.

වේලාව:ප.ව.06.15
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව: ප.ව.6.15
පෙර සටහන් ල/ලේ: සචිනි මෙනවිය.
මෙතැන් සිට ල/ලේ: නිල්මිණි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: එතකොට ඒ 2014 , 15,16 වකවානුව තුල ලංකාවේ ඒ වන විටත් වලංගුව පැවතියා නේද ඒ 2007 දී සම්මත කරන ලද ICCPR පනත?

පි: පැහැදිලියි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ පනත යටතේ ජාතින් අතර නැත්නම් ආගම් අතර මේ යම්කිසි ගැටුම් ඇති කරන අන්දමේ ප්‍රකාශ කිරීම වරදක් කියලා ඔබ දැනගෙන හිටියද ඒ අවස්ථාවේ?

පි: දැනගෙන හිටියා ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ පසුබිම තුල සහරාන්ගේ මේ අන්තවාදී දේශන සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වුණේ නැත්තේ ඇයි?

පි: මම මුලින් සඳහන් කරපු ආකාරයට ස්වාමීනි සහරාන්ගේ මේ ආරම්භය පමණයි ස්වාමීනි මේ කාලයේ තිබුණේ. ඒ තරම් බරපතලම තර්ජනයක් ඒ කාලේ මෙයාගෙන් පෙන්න තිබුණේ නැහැ. 2016 අප්‍රේල් 12 මම විශ්‍රම ගියේ. ඒ වකවානුව දක්වා මෙයාගෙන් immediate තර්ජනයක සළකුණු අපිට දකින්නට ඒ තරම් තිබුණේ නැහැ.

ප්‍ර: හරි නමුත් ඔබ කියන හැටියටම ජාතික සංහිඳියාව සහ ආමික සංහිඳියාව ප්‍රධාන වශයෙන් අවධානය යොමු වුණා බෙරුවල සිද්ධියට පස්සේ. එතකොට ඒ පසුබිම තුළ මේ විදිහට එක් ආගමික දේශකවරයෙක් මවුලවිවරයෙක් කියන පුද්ගලයෙක් අනන්‍යාගමිකයන් සම්බන්ධයෙන් කරන වෛරී ප්‍රකාශ ඒ ඇති කරන්නට බලාපොරොත්තු වන ජාතික සංහිඳියාව සහ ආගමික සංහිඳියාව සම්බන්ධයෙන් තර්ජනයක් වෙනවා නේද?

පි: ඒ කටයුත්තට බාධාවක් වෙනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ පසුබිම තුල ඇයි බුද්ධි සමාලෝචන රැස්වීමේදී නැත්නම් ජාතික ආරක්ෂක කවුසිලයේදී සහරාන් හෂිම් සහ එවැනි අන්තවාදී දේශන සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට යම්කිසි තීරණ ගත්තේ නැත්තේ?

පි: මට හරියටම මේ අවස්ථාවේ දී කියන්න බැහැ ස්වාමීනි මොනවද ඒ ගත්ත ක්‍රියාමාර්ග කියන එක . නමුත් ඒ දේශන සම්බන්ධයෙන් අපි යම් යම් පියවරවල් ගත්තා. ඒ ගත්ත පියවරවල් හරියටම මොකක්ද කියන එක පැහැදිලිවම මේ අවස්ථාවේදී කියන්න බැහැ. සාකච්ඡා කිරීමත් සමඟම අපි එක් එක් ක්‍රියාමාර්ග ගත්තා. මුලින් සඳහන් කලේ අපි කමිටු පිහිටෙව්වා. අපි මේ ගැන Follow up කරා. ගත්ත නීතිමය ක්‍රියාමාර්ගය

Provisional Copy
FAIR COMMENT BY JEZEEM

මොනවද කියන එකනම් මට හරියටම පැහැදිලිවම මේ අවස්ථාවේදී කියන්න අමාරුයි.

ජ්ර: දැන් ඔබ අද දින සාක්ෂි දෙමින් කිව්වා ඔය ඉස්ලාම් අන්තවාදී ක්‍රියාසම්බන්ධයෙන් ඔබට දැනුවත් වුණාට පස්සේ ඔබ යම්කිසි ක්‍රමවේදයක් ඇතිකෙරුවා යම් කිසි කමිටුවක් ස්ථාපනය කෙරුවා කියලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න නේද?

පි: නිවැරදියි ස්වාමීනි.

ප්‍ර: ඒ කමිටුව ස්ථාපනය කෙරුවේ ඔබගේ මට්ටමෙන්?

පි: මගේ මට්ටමෙන් ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබ කිව්වා ඒ කමිටුව ප්‍රධාන අරමුණක් වුණේ පොලිසියේ බුද්ධි අංශ සහ අනිත් ත්‍රිවිධ හමුදා බුද්ධි අංශ සමඟ යම්කිසි යාන්ත්‍රණයක් ඇති කරන්න කියලානේද?

පි: ස්වාමීනි ත්‍රිවිධ හමුදාව සමඟ නෙවෙයි. පොලිසියේ තියෙන අංශ සමඟ සම්බන්ධීකරණයක් ඇති කරලා ඒ සියලු දෙනාගේ තියෙන තොරතුරු ඒකරාශි කරන්න.

ප්‍ර: එතකොට මගේ ප්‍රශ්නේ වෙන්නේ අර ඔබ කියන හැටියට බුද්ධි සමාලෝචන මණ්ඩලයේ ප්‍රධාන කාර්යයක් වෙන්නේ බුද්ධි අංශ අතර යම්කිසි සම්බන්ධීකරණයක් ඇති කරන්න නේද?

පි: නිවැරදියි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔය ආගමික ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් නිසි පරිදි බුද්ධි සමාලෝචන රැස්වීමේදී අවධානය යොමු වෙලා තීරණ ගත්තානම් ඔබ මේ කොමිෂමට ප්‍රකාශ කරපු පරිදි ඔබගේ යටතේ මේ කමිටුවක් වෙනම ස්ථාපනය කිරීම අවශ්‍ය නැහැ නේද?

පි: ස්වාමීනි ඒක මම හිතන්නේ ඒක කාරණා 2ක් . අතන මූලික වශයෙන් ස්වාමීනි සාකච්ඡා වෙන්නේ පොලිසිය, ආරක්ෂක අංශ, ඒවගේ ආයතන සිල්ලම සම්බන්ධීකරණය කිරීමක් තමයි ඒ රැස්වීමේ දී කෙරෙන්නේ. මෙතන මම මේ කමිටුව දැම්මේ අපේ දෙපාර්තමේන්තුව ඇතුලේ තියෙන. එතකොට දෙපාර්තමේන්තුව ඇතුලේ තියෙන ආයතන අතරත් සම්බන්ධීරණයක් අවශ්‍යයි. එතකොටයි මට අර බුද්ධි සම්බන්ධීකරණ සාකච්ඡාවට යනකොට පොලිසිය ඇතුලේ තියෙන තොරතුරු ටික හරියට සම්බන්ධීකරණය කරගෙන ගිහිල්ලා එතනට දෙන්න පුළුවන් වෙන්නේ. ඒ සඳහා තමයි මේ අනුකමිටුවක් වගේමේක පොලිසිය ඇතුලේ අභ්‍යන්තර කමිටුවක් මම පිහිටුවනු ලැබුවේ. ඒවගේම නැත්නම් මේ කණ්ඩායම් වෙන වෙනම එක එක්කනා තම තමන්ගේ කොටස් කරගෙන යනවා මේ අය අතරේ සම්බන්ධයක් නැතුව යනවා. ඒ අන්තර් සම්බන්ධය නැතිවුණොත් පොලිසියෙන් කරන කටයුත්තත් වෙන වෙනම Individual compartment කරගෙන යන්නේ. ඒ සම්බන්ධීකරණය ගොඩනැඟන්න තමයි මේ පොලිසියේ කමිටුව පිහිටුව්වේ.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

****

<u>**ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා**</u>

ප්‍ර: ඉලංගකෝන් මහත්මයා ඔබ ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලයක් පොලිස්පතිවරයා හැටියට වැඩ කරපු ජ්‍යෙෂ්ඨතම නිළධාරියෙක්නේ?

පි: නිවැරදියි ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම උප පොලිස්පරීක්ෂකවරයෙකු වශයෙන් බැඳිලා පොලිස්පති විදිහට අවසන් කරපු ඒවගේ දුර්ලභ අත්දැකීම් තියෙන නිලධාරියෙක් විදිහට හඳුන්වන්න පුළුවන්?

පි: නිවැරදියි ස්වාමීනි.

ප්‍ර: ඔබගේ කාලය තුල පොලිස්පති ලෙස කටයුතු කරන ලද එනම් 2011 සිට 2016 දක්වා වරින් වර මේ ඉස්ලාම් අන්තවාදීන්ගේ ක්‍රියාකලාපයන් පිළිබඳව ඔබවෙත තොරතුරු වාර්තා වී තිබුණා නේද?

පි: ස්වාමිනි මම මුලිනුත් සඳහන් කරා වගේ මගේ ඒ අවුරුදු 5හේ කාලය ඇතුලත 2014 සහ 2015 කියන වර්ෂ 2ක ඇතුලත මං හිතන්නේ වාර්තා 3ක් වගේ තමයි මට රාජ්‍ය බුද්ධි සේවයෙන් ලැබිලා තිබුණේ. ඊට අමතරව පොලිස් විශේෂ කාර්යාංශයෙන් යම් යම් තොරතුරු ලැබිලා තිබුණා. ඒ ටික තමයි මට බුද්ධි තොරතුරු විදිහට ලැබිලා තිබුණේ.

ප්‍ර: එතකොට ඒ වන විට ISIS සංවිධානය පිළිබඳවත් ඔබ දැනගෙන හිටියා?

පි: මූලික වශයෙන් ඒ ලැබුණු බුද්ධි තොරතුරු විශේෂයෙන්ම රාජ්‍ය බුද්ධි සේවයෙන් ලැබිච්ච බුද්ධි තොරතුරු වල ප්‍රධාන වශයෙන්ම වැඩි වශයෙන්ම සඳහන් වෙලා තිබුණේ ISIS සංවිධානය පිළිබඳව

ප්‍ර: එතකොට ඔබ දැනන් හිටියා නේද ISIS ත්‍රස්තවාදීන් මේ හා සමානව අන්තවාදී ඉස්ලාමික් ත්‍රස්තවාදී ගණයට වැටෙන අය කියලා දැනගෙන හිටියා නේද?

පි: දැනන් හිටියා.

ප්‍ර: ඔබට ඔබේ සේවා කාලය තුල ඔබ 2016 තුල අප්‍රේල් මාසේ විශ්‍රාම යනකොට ඊට පෙර ඔබට කොහොමටවත් නිකමටවත් හිතුණේ නැද්ද මේ ඉස්ලාමික් අන්තවාදීන්ගෙන් ලංකාවට මෙපමණ විනාශයක් වෙයි කියලා?

පි: මේ ප්‍රශ්නය ඉදිරියට ගැටලුවක් වෙයි කියන එක පිළිබඳව අවබෝධයක් තිබුණා. ඒක නිසා තමයි අපි අර කමිටුවක් එහෙම දාලා මේ පිළිබඳව දැඩි විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කළේ. ඒ කාලයේ තිබුණ තර්ජනයේ ප්‍රමාණයට ගැළපෙන ආකාරයට අපි කටයුතු කරගෙන ගියා. තර්ජනය වැඩිවෙනකොට අපි ඒ ක්‍රමවේදය වැඩි කරන්න තිබුණා. ඒ මගේ කාලයේ තිබුණ ක්‍රමවේදය ප්‍රමාණවත් වුණේ නැහැ මම දන්න තරමින් ඉදිරියට මේගොල්ලෝ වර්ධනය වෙනකොට අපේ ක්‍රමවේදත් වැඩි කරන්න ඕනි. මම දන්නේ නැහැ ඒක කොයිතරම් දුරට ඉදිරියට

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ගියාද කියන එක. නමුත් ඒ කාලේ තිබුණ තර්ජනයට ගැළපෙන ප්‍රමාණයේ ක්‍රමවේදයක් අනුගමනය කරා මොකද මේක වර්ධනය වුණොත් අපිට ප්‍රශ්නයක් කියන කාරණාව අපිට තේරුණා.

ප්‍ර: දැන් ඔබ විශ්‍රාම ගියත් ඔබ රටේ තොටේ සිදුවෙන දේවල් දැනගෙන හිටියා නේද සාමාන්‍යයෙන්?

පි: නිවැරදියි.

ප්‍ර: ඔබට කියන්න පුළුවන්ද මේ 2019 අප්‍රේල් මාසේ 08 වෙනිදා 9 දා ලැබුණු තොරතුර ලිපි කට්ටලය සම්බන්ධයෙන් හිටපු පොලිස්පති ජයසුන්දර මහත්මයා ගත් ක්‍රියාමාර්ගය නිවැරදි ක්‍රියාමාර්ගයක් නෙවෙයි කියලා කියන්න පුළුවන්ද?

පි: එතුමාගේ රාජකාරි කටයුතු සම්න්ධයෙන් මම මතයක් පළ කිරීම සුදුසුද කියන එක ගරු ඔබතුමන්ලාගේ

ප්‍ර: අතිරේක සොලිසිටර් ජනරාල්තුමිය ඔබතුමාගෙන් ඇහුව්වා ඔබ පොලිස්පති වෙලා හිටියානම් ගන්න ක්‍රියාමාර්ගය එතකොට ඔබ ඒක විස්තර කරා ඒ කියන්නේ දීර්ඝ පළපුරුද්දක් ඇති ඒවගේම පොලිස්පතිවරයෙක් හැටියට අවුරුදු 5ක් සේවය කරපු ඔබ වැනි නිලධාරියෙක් මේ මේ වගේ ක්‍රියාමාර්ග ගන්නවා කියලා මේ කොමිෂම හමුවේ තොරතුරු දැක්වුවාම පූජිත් ජයසුන්දර මහත්මයාගත් ක්‍රියාමර්ග පිළිබඳව ඔබට තක්සේරුවක් කරන්න පුළුවන්ද? කරන්න බැරිද ඇත්තටම?

පි: එතුමා ඇත්තටම මේ FNA කියන සටහන ගැහුවේ ඇයි කියන එක පිළිබඳව මට හිතා ගන්න අමාරුයි.

ප්‍ර: ඒකම තමයි මමත් අහන්නේ එවැනි සරල විදිහට ඒ තොරතුරේ තිබිච්චි භායනක බව සාමාන්‍ය භාෂාවෙන් කියනවානම් අර දියාරු කරලා ඇරලා තිබුණානම් ඒ ක්‍රියාමර්ගය නිවැරදි ක්‍රියාමර්ගයක් හැටියට දකින්න බැහැ නේද?

පි: ස්වාමීනි මට නම් කියන්න තියෙන්නේ මම නම් ඒක කරන්නේ නැහැ කියන එක තමයි.

ප්‍ර: හොඳයි. ඔබට මතක ද දැන් 2016 අප්‍රේල් මාසය දක්වාම ඔබ මේ ආරක්ෂක කවුන්සලයේ රැස්වීම් වලට සහභාගී වුණානේ?

පි: නිවැරදියි ස්වාමීනි.

ප්‍ර: ඒ කාලේ ඒ කියන්නේ 2015 ජනවාරි මාසයේ ඉඳලා 2016 අප්‍රේල් දක්වාම එවකට හිටපු ගරු ජනාධිපති සිරිසේන මැතිතුමාත් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමත් ඒ රැස්වීම් වලට සහභාගී වුණානේ ?

පි: ගරු අග්‍රමාත්‍යතුමා මම දන්න තරමින් සෑම රැස්වීමකට වගේ සහභාගී වුණේ නැහැ.

ප්‍ර: සෑම නොවෙන්න පුළුවන්. ඉඳහිට හෝ ?

FAIR COMMENT BY JEZEEM

පි: බොහෝ රැස්වීම් වලට ආවා.

ප්‍ර: ඔබට කියන්න පුළුවන්ද ඒ කාලේ ඔබේ පොලිස්පති ධූරය අවසන් වීමට පෙර 2016 අප්‍රේල් වලට පෙර ඔවුන් දෙදෙනා ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම් වලදී සුහදව කටයුතු කරාද සුහදතාවයක් නොමැතිව කටයුතු කරාද?

පි: එහෙම ගැටුම්කාරී තත්වයක් මං නිරීක්ෂණය කළේ නැහැ.

ප්‍ර: තිබුණේ නැහැ?

පි: නැහැ.

ප්‍ර: එහෙනම් ඔබේ කාලයෙන් පස්සේ තමයි එවැනි තත්වයක් වර්ධනය වුණානම් වෙන්න ඇත්තේ කියලා ඔබ හිතනවා?

පි: මට ඒ ගැන හරියට අවබෝධයක් හරියට නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබට මතක ද ඔබ සමහර අවස්ථාවන් වල දී ආරක්ෂක ලේකම්වරයා හමුවීමට ආරක්ෂක අමාත්‍යාංශයට ගිහිල්ලා තියෙනවා?

පි: ගිහිල්ලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ අවස්ථාවන් වල දී ඔබට ආරක්ෂක ලේකම්වරයා හම්බ වෙන්න අපහසුතාවයන් ඇති වුණාද?

පි: නැහැ ස්වාමීනි මම සෑම විටම ආරක්ෂක ලේකම්වරයා හම්බ වෙන්න ගියේ appointment එකක් අරගෙන. කළින් කතාකරගෙන එතන ඉන්න නිලධාරින්

ප්‍ර: ගියානම් කතා කරා හම්බ වුණා විස්තර කිව්වා ආවා. එතකොට ඒ හා සමානව direct access එකක් ඒ කියන්නේ සෘජුව ඔහු හා සම්බන්ධවීමේ ක්‍රියාදාමයක් තිබුණා ඔබේ කාලයේ?

පි: අනිවාර්යයෙන්ම තිබුණා. ඕනෑම වේලාවක දුරකථනයෙන් සම්බන්ධවීමේ හැකියාවක් තිබුණා. කිසිම අවස්ථාවක එහෙම ගැටලුවක් තිබුණේ නැහැ. යම් කිසි අවස්ථාවක සම්බන්ධ වෙන්න බැරි තත්වයක් තිබුණානම් එහෙම පණිවිඩයක් තිබුණානම් මම කතා කරා කියලා. ගොඩක් වේලාවට එතුමා Answer කරේ නැත්නම් PSO තමයි Answer කරන්නේ. PSOට පණිවිඩය තිබ්බා නම් බොහෝ විට අනිත්පැත්තට මට ඇමතුම එනවා.

ප්‍ර: ඒ කියන්නේ තීරණ ගන්න සහ රටේ යථාපරිදි මේ ආරක්ෂක තත්වය පවත්වාගෙන යාම සඳහා ආරක්ෂක ලේකම්වරයා සහ පොලිස්පතිවරයා අතර කිට්ටු සම්බන්ධතාවයක් ඒවගේම බැඳීමක් තියෙන්න ඕනි කියන එක ඔබ පිළිගන්නවද?

පි: අනිවාර්යයෙන්ම තිබුණා. කිසිම බාධාවක් තිබුණේ නැහැ. ලේකම්වරයා සහ අමාත්‍යවරයා අතරෙත් එහෙම ප්‍රශ්නයක් තිබුණේ නැහැ. අමාත්‍යවරයාට වුණත් ඕනෑම වේලාවක පොලිස්පතිවරයාට දුරකතනයෙන් කතා කිරීමේ පහසුව තිබුණා. අනිත් එක මම කියන්නේ මගේ අත්දැකීම්. මම කවදාහරි දවසක අමාත්‍යාවරයාට කතා කරලා සම්බන්ධ කර ගන්න බැරිවුණානම් මම පණිවිඩයක් තිබ්බානම්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අනිවාර්යයෙන්ම අනිත් එතුමාට නිදහස් වෙච්ච වහාම අනිත් පැත්තට කතා කරනවා. මොකද අපි හැම වේලේම කතා කරන්නේ නැතිබව දන්නවා. අවශ්‍යතාවයකට පමණයි කතා කරන්නේ කියලා දන්නවා. හදිස්සියක් කියලාත් දන්නවා. ඒ නිසා අනිත් පැත්තට අනිවාර්යයෙන්ම call back කරලා මොකද කියලා අහනවා. මම කියන්නේ මගේ අත්දැකීම් පමණයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒකාලේ ඒ පැවතිච්චි සම්බන්ධතාවය රටේ ආරක්ෂාව තහවුරු කරන්න යම් ප්‍රමාණයකට බොහෝ ප්‍රමාණයකට ඉඩකඩක් ලැබුණා කියලා කිව්වොත් ඒක හරිද?

පි: අනිවාර්යෙන්ම ඒ සම්බන්ධතාවය අවශ්‍යයි. මොකද යම් යම් කාරණා තිබෙනවා අපිට පොලිස්පතිවරයාට පමණක් තීන්දු තීරණ ගන්න බැරි දේවල් ඒ අවස්ථාවලදී අපිට ලේකම්වරයාගෙන් හෝ අමාත්‍යාවරයාගෙන් හෝ උපදෙස් ලබාගැනීම අවශ්‍යයි. එතනදී ඒ සම්බන්ධතාවය මේක පරක්කු කරන්න බැහැ සමහර වේලාවට.

ප්‍ර: ඔබට මතකද ඔබේ සේවා කාලය තුල පොලිස්පතිවරයා ලෙස සේවය කරද්දි තුර්කියේ යම්කිසි ත්‍රස්තවාදී සංවිධානයකට සම්බන්ධ පුද්ගලයන් සම්බන්ධව තොරතුරු ඔබට වාර්තා වුණාද?

පි: මට මතකයි එහෙම ලිපියක් ලැබුණා කියන එක.

ප්‍ර: එතකොට එවැනි ත්‍රස්තවාදී තර්ජනයක් ඒ අවස්ථාවේදී මතුවීම සම්බන්ධයෙන් ඔබ මොනවත් ක්‍රියාමාර්ග ඒ කාලේ ගත්ත බවක් මතකද?

පි: ඒ ලිපිය සම්බන්ධයෙන් අපි විමර්ශනයක් කරා ස්වාමීනි. විමර්ශනයක් කරා. ඒ කිව්වේ මං හිතන්නේ අවසාන ප්‍රතිඵලයකුත් ආවා මොකක් හරි නිර්දේශයකුත් ආවා. මට මතක නැහැ දැන් ඒක. මොකක්ද වුණේ කියලා. නමුත් ඒක සම්බන්ධයෙන් අපි අවසානය දක්වාම විමර්ශනයක් කරා. ඔය සාකච්ඡාත් වුණා මේක ඔය Security Coordinating Conference එකේදීත් ඕක කිහිපවාතවක් සාකච්ඡා වුණා. සාකච්ඡාවෙලා අවසානයක් දක්වා අපි ගියා මට මතක විදිහට.

ප්‍ර: ඒ කියන්නේ තොරතුරුක් ලැබුණාම ඒ සම්බන්ධයෙන් අර ඉක්මනින් තීරණ අරගෙන ඉක්මනින් පරීක්ෂණ පවත්වන ඉක්මනින් ඒ සම්න්ධයෙන් කටයුතු කිරීම ඔබේ කාලයේදී සිදු කරා කියන එක ඔබ මේ අවස්ථාවේදී කියනවද?

පි: මගේ කාලේ කොහොම නමුත් ඒ වගේ ලියුමක් ලැබුණාම ඒ හා සමානව අපි ඒ සම්බන්ධයෙන් පියවර ගත්තා කියන එක තමයි.

ප්‍ර: Quick Action එකක් ඒකයි අදහස් කළේ. ඒ කියන්නේ ඇඳ ඇඳ ඉන්නේ නැතුව ඉක්මන් තීරණ අරගෙන ඉක්මනින් වැඩ කරා කියන එක ඔබ කියනවද?

FAIR COMMENT BY JEZEEM

පි: ඒක ඇත්ත සර්. බාහිරින් බලන කෙනකුට තමයි හුඟාක් දුරට පේන්නේ. කොයිතරම් දුරට ක්‍රියාත්මක වුණාද කියන එක මටත් වඩා.

ප්‍ර: හොඳයි අවසාන වශයෙන් මම ඔබෙන් අහන්නේ දැන් ඔබ සහභාගී වෙච්ච ආරක්ෂක රැස්වීම් වලදී මේ ඉස්ලාමික් අන්තවාදීන් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අවස්ථාවල් වල 2015 සිට 2016 අප්‍රේල් දක්වා එවකට හිටපු ඒ දේශපාලනඥයන්ගෙන් කොයිවගේ reaction එකක් ද ඒ කියන්නේ කොයි වගේ ප්‍රතිචාරයක් ද ලැබුණේ? මේ දේශපාලන ඉස්ලාමික් අන්තවාදීන් සම්බන්ධයෙන් සාකච්ඡා කරනකොට?

පි: ස්වාමීනි ඔබතුමා අදහස් කරන්නේ සාකච්ඡාවට ආරක්ෂක මණ්ඩලයේ සාකච්ඡාවට සහභාගී වූ දේශපාලඥයින් ද

ප්‍ර: ඔව්

පි: දේශපාලඥයින් වශයෙන් බොහෝ දුරට සහභාගී වුණේ ජනාධිපතිතුමා සහ අගමැතිතුමා. සමහර අවස්ථාවල ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමාත් සහභාගී වුණා. ඒ අවස්ථාවලදී එතුමන්ලා ඒ අංශ වලට අවශ්‍ය උපදෙස් දුන්නා. මේ දේවල් සම්බන්ධයෙන් සොයා බලන්න කියන එක ගැන තමයි ලැබිච්ච උපදෙස වුණේ.

ප්‍ර: නමුත් ඒ සම්බන්ධයෙන්ඉක්මන් තීරණ අරන් ඉක්මනින් හොයලා ඉක්මනින් පියවර ගැනීම සම්බන්ධයෙන් උපදෙස් දුන්නාද කියලා ඔබට පැහැදිලි මතකයක් නැහැ?

පි: එහෙම ඉක්මනින් හෝ එහෙම නැත්නම් ඒ ගැන හෙමින් සොයන්න හෝ කියලා විශේෂත්වයක් ගැන මතකයක් නැහැ ස්වාමීනි. නමුත් පොදුවේ සාකච්ඡා වුණා. නමුත් මේ දේවල් ගැන ගතයුතු අවශ්‍ය පියවර ගන්න කියන එක ඒ ඒ අංශ වලට සාකච්ඡා වෙලා උපදෙස් දුන්නා. ඒ තීන්දු ගත්තා ඒ අවස්ථාවේදී.

ප්‍ර: අප්‍රේල් 21 වෙනිදා මේ වගේ ප්‍රහාරයක් වෙලා මෙවැනි විනාශයක් වෙන්න වුණේ ඇයි කියන එක ඔබට අවසාන වශයෙන් කියන්න පුළුවන්ද මේ කොමිසමට? එක්කෝ වෙන විදිහකට කියනවානම් කොහෙද වැරැද්ද මොකද වුණේ ඇයි මෙහෙම වුණේ ?

පි: එකක් ප්‍රධාන හේතුවක් මම දකින්නේ සහරාන් කියන පුද්ගලයා ආරම්භ වුණේ දේශන වලින් වෙරී ප්‍රකාශ මත. නමුත් ක්‍රමානුකූලව මෙයා මේ මතවාදය ප්‍රයෝගික ක්‍රියාකාරකමක් බවට පරිවර්තනය වුණා. මං හිතන්නේ මේකේ සංධිස්ථානය වුණේ අන්න එතනයි. එතෙක් අපි මම හිතන්නේ හුඟ දෙනෙක් හිතුවේ මේක මතවාදයක් පමණයි කියන එක. නමුත් මේ මතවාදය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කරලා පෙන්නුවා මාවනැල්ලේ සිද්ධියත් එක්ක. මේක තමයි මම දකින්නේ මේ සියල්ලේම ආරම්භක අවස්ථාව. අපේ කියන්නේ eye opener කියලා. අපේ අවධානය දැඩිලෙස යොමු කළ යුතුව තිබුණු මූලිකම මේකේ

FAIR COMMENT BY JEZEEM

turning point එක ආරම්භ වෙන්නේ එතන මගේ අදහස විදිහට. මොකද මේ මතවාදය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කරේ එදා. ඉතින් එයා පෙන්නුවා මේක මතවාදයක් පමණක් නෙවෙයි ඉස්ලාම් ධර්මයට විරුද්ධව යන සියලු දෙනා ඝාතනය කළ යුතුයි කියන එක එයාලාගේ මතවාදය. ඒක ක්‍රියාත්මක කරනවා කියන එක මාවනැල්ල සිද්ධියෙන් එයා ඔප්පු කරලා පෙන්නුවා. ඒ කියන්නේ බුදු පිළිම විතරක් නෙවෙයිනේ එතන කැඩුවේ. පල්ලි වල කුරුස වගයක් කැඩුවා. මට මතක විදිහට කෝවිලකටත් මම හිතුවා ගැහුවා කියලා. ඒ කියන්නේ අර මතවාදය තමයි. ඉස්ලාම් දහමට විරුද්ධ සියලු ආගම් විනාශ විය යුතුයි කියන එක තමා. ඒත් එක්කම ඒකෙන් පෙන්වනවා එයාගේ මතවාදය ක්‍රියාත්මක කරන්න ඉදිරිපත් වෙන කණ්ඩායමකුත් ඉන්නවා කියන එක. එයා තනියෙන් නෙවෙයිනේ කරේ කණ්ඩායමකුත් එක්ක. එතකොට මෙන්න මේක තමයි අපිට මේ කණ්ඩායම පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්න තිබුණු පළවෙනි අවස්ථාව. ඒ අවස්ථාවේ ඉඳලා අපි සියලුම අපට තියෙන සම්පත් යොදවලා මේ අය නීතියේ රැහැනට ගෙනවානම් ඔය සංවිධානයට ඔතනින් එහාට ගමන් නොකරන්නට කටයුතු කරානම් එකක් අපිට නවත්ත ගන්න තිබුණා අවස්ථාවක්. ඒක ගිලිහුණා කියමුකෝ. දෙවැනි අවස්ථාව තමයි වනාතවිල්ලුවේ recovery එක. ඒක අති භයානකයි. මොකද එතන පැහැදිලිවම තර්ජනයක් ජාතික ආරක්ෂාව පැහැදිලි තර්ජනයක් එකෙන් පෙන්නුම් කරා. ඒ කියන්නේ සහරාන්ගේ ගැන කියන මේ සියලු දේවල් විශ්‍රාමික සහ සිවිල් පුරවැසියෙක් විදිහට මම ඒ කාලේ දැකපු දේවල්. එහෙම නැතුව මෙහෙම කිසිම දෙයක් පරිශීලනය කරලාවත් මට ආපු වාර්තාවක්වත් මොකක්වත් නෙවෙයි. සිවිල් පුරවැසියෙක් විදිහට මම මේ දැකපු දේවල් උඩ තමයි ඔබතුමන්ලා අහපු නිසා මම මේ කාරණාව පැහැදිලි කරන්නේ මගේ මතය හැටියට. ඒක අතිභායනක අවස්ථාවක්. මොකද එතන බෝම්බ හදන්න ඕනෑ කරන අමුද්‍රව්‍ය තිබුණා. බෝම්බ හදන හැටි පුහුණු වෙලා තිබුණා. බෝම්බ හදන හැටි Training කරන Diagrams තිබුණා. ඊළඟට සංග්‍රාමික උපකරණ මම දැක්ක විදිහට media එකේ ගිය විදිහට 75ක් ද කොහොදෝ තිබුණා. මේ ආදී වශයෙන් විශාල වගේ කාමරයක් වගේ භාණ්ඩ රාශියක් තිබුණා. පුහුණු කඳවුරක් කියලා තිබුණා. ඒ කට්ටිය පුහුණු වෙලා තියනවා කියලා තිබුණා. ඉතින් මේ සියල්ල දිහා බැලුවාම පැහැදිලිවම අන්තරාදායක අනතුරක් අතළඟයි කියන එක මං හිතන්නේ සාමාන්‍ය දැනීමේ තියෙන විදිහට වුණත් තේරුම් ගතහැකි අවස්ථාවක් විදිහටයි මටනම් ඒවෙලාවේ පෙනුනේ. ඉතින් මේ අවස්ථාවේදී මේක නවත්වන්න ක්‍රියාකල යුතු කණ්ඩායම් A , B, C, කියලා මම නම් කරන්න කැමැති නැහැ. ඒ සියලු දෙනා එක්කහු වෙලා මේ සහරාන් ඒ සහරාන්ට

FAIR COMMENT
BY JEZEEM

මං හිතන්නේ ඒ වෙනකොට වරෙන්තුත් තිබුණා. මේ සියලුම දෙනා එක්කහු වෙලා මේ කණ්ඩායම පසුපස පන්නගෙන ගියානම් අත්අඩංගුවට ගත්තානම් මේ ලංකාවේ ඇතලෙනේ හිටියේ. මේගොල්ලෝ කොහොවක්වත් පිටරට ගියේ නැහැ. මේ වර්ග සැතපුම් 25 දහස ඇතුලේ හිටියේ. අපේ ආරක්ෂක අංශ තියෙනවා, පොලිසිය තියෙනවා. ලක්ෂ ගණන් අපිගාව ඉන්නවා. අපි මේ සම්පූර්ණ සත්‍ය දැනගෙන හිටියේ මේ කණ්ඩායම අපි දන්නවා මොකක් හරි ඉස්සරාහ වෙනවා කියන එක. බෝම්බ හදන්නේ සෙල්ලම් කරන්න නෙවෙයිනේ. බෝම්බ හදන්නේ පුහුණු වෙන්නේ සෙල්ලම් කරන්න නෙවෙයිනේ. ඒක අපිට අවබෝධ වෙන්න තිබුණා. අන්න එතන තමයි අපිට වැරදිච්ච තැන. අපි ඒක බැරෑරුම් විදිහට අරගෙන ඒ අවස්ථාවේ ක්‍රියාත්මක වුණානම් මෙතෙන්න එන්න ඉස්සර වෙලා අප්‍රේල් 21ට එන්න කළින් එහෙම නැත්නම් අප්‍රේල් 9 වෙනිදා ඒ ලියුම විදේශ රටකින් එන්නේ නැහැ. එන්න ඉඩ තියන්නේ නැහැ. ඊට ඉස්සෙල්ලා මේක අපිට අවසන් කර ගන්න තිබුණා. ඒ ලියුම ලැබුණාට පස්සේ ක්‍රියාත්මක නොවීම වෙනම කාරණාවක්. නමුත් එතෙන්ට එන්න ඉස්සර වෙලා අපිට මේක ඉවර කර ගන්න තිබුණා.

ප්‍ර: ඒකට කියන්නේ නොසැළකිල්ල එහෙම නැත්නම් තමන්ගේ රාජකාරිය පැහැර හැරීම හැටියට සළකන්න පුළුවන්ද?

පි: මට ඇත්තට මේකට උත්තරයක් දෙන්න අපහසුයි ස්වාමීනි.

ප්‍ර: ඇයි ඒ?

පි: ඇයි මේක නොකෙරුණේ කියන එක තමයි අපිටත් සිවිල් පුරවැසියෙක් විදිහට මටත් අහන්න තියෙන ප්‍රශ්නේ.

ප්‍ර: කෙටියෙන්ම කියනවානම් හෙට ප්‍රහාරයක් එල්ල වෙනවා කියලා අප්‍රේල් 20 වෙනිදා රෝ වෙනකොටත් දැන ගන්න ලැබුණානම් ඒකත් වළක්වාගන්න බැරි වුණේ ඒ කියන්නේ නොසැළකිල්ල සහ ඒ සම්බන්ධයෙන් තිබිච්ච උනන්දුවක් නැති කම කියලා කිව්වොත් ඔබ ඒක පිළිගන්නවද? හෙට ගහනවා කියලා අද දැන ගත්තාම?

පි: ඔව් ඇත්ත වශයෙන්ම ඒත් අපට නවත්වා ගන්න තිබුණා. පොඩි කාලයයි ඒත් අපි උනන්දු වුණානම් නවත්වගන්න තිබුණා. ඒක වෙන මොකුත් නැත්නම් අපිට media ලොකු ප්‍රසිද්ධියක් දෙන්න තිබුණා. මෙන්න හෙට ගහනවා. වෙන මොකුත්ම කරගන්න වේලාවක් නැත්නම් මේ Information එක Expose කරන්න තිබුණා ඒ වෙලාවේ. එහෙම කරානම් ත්‍රස්තවාදී දෙසැරයක් හිතනවා. එදා හවසනේ ඔක්කෝම ආවේ හෝටල් වලට. ඒ වෙනකොට ඔය හෝටල් වල කට්ටිය ලෑස්ති වෙනවානේ. ඒගොල්ලෝ Alert වෙනවානේ. මම දැක්කා කොහේ හරි තිබ්බා ස්වාමීනි. අර මඩකලපුවට ආපු බෝම්බකාරයා එතන හිටපු ඒගොල්ලෝ සැකකරා. එයා ඇතුළු වෙන්න එනකොට එතන හිටපු ඒ

FAIR COMMENT BY JEZEEM

පල්ලියේ කට්ටිය මෙයා සැකකරලා ගේට්ටුවෙන් එළියට දැම්මා. දැම්මට පස්සේ තමයි එයා කාටවත් නොදැනෙන්න තව සැරයක් ඇවිල්ලා තියෙන්නේ මං හිතන්නේ මං දැක්කා කොහේ හරි තියෙනවා. එතකොට ඒ කට්ටියට කොහෙන් හරි අර වගේ Information පිළිබඳව පොඩි හරි අවබෝධයක් තිබුණානම් අර මිනිහා කීයටවත් අත අරින්නේ නැහැනේ. දැක්ක ගමන් ආරක්ෂක අංශ වලට එන්න කියනවානේ බෝම්බ ගහනවා කියලා. එයාට කළින් Information එකක් අපි Expose කරලා තිබුණානන් හෙට බෝම්බ ගහනවා කියලා. බෝම්බ ගහන දවසේ උදේ මෙහෙම සැකකටයුතු මිනිහෙක් දැක්කානම් ඔය විදිහට ගේට්ටුවෙන් එළියට දාලා ඒගොලේලෝ නිකන් ඉන්නේ නැහැනේ. එහෙනම් නවත්ත ගන්න තිබුණා උදාහරණයක් මම කිව්වේ.

ප්‍ර: ඔබ කියන හැටියට නවත්වගන්න තිබුණා අල්ල ගන්න තිබුණා ඔක්කොමත් ඇත්ත. ඒ කියන්නේ එවකට හිටපු ආරක්ෂක අංශයේ ප්‍රධානීන් නිසි ක්‍රියාමාර්ග ගත්තේ නැහැ කියන එක නම් වශයෙන් නොකිව්වත් නැහැ කියන එක ඔබ පිළිගන්නව ද ඉලංකෝන් මහත්මයා?

පි: මම කියන්නේ මේ නිශ්චිත තොරතුරක් තිබියදීත් මේක නතර කර ගන්න අපිට නිශ්චිත තොරතුරුක් තිබුණ නිසා අපිට මේක නතර කර ගන්න අවස්ථාවක් තිබුණා කියන එකයි මම කිව්වේ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කිව්වා මඩකලපුවේ Information එකක් තිබුණානම් ඒ සැකකාරයා අල්ලගෙන ඒ ඝාතනය නවත්වන්න තිබ්බා කියලා? ඒකියන්නේ මඩකලපුවේ රතු පල්ලිය අතර ඒ සැකකරු මිනිසුන් විසින් අල්ල ගන්න තිබ්බා කියලා කළින් දැනගත්තානම් ඔබ කිව්වේ ඒක නේද?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ පිළිබඳව අදාළව අහන්නේ දැන් ඔබ පොලිස් දෙපාර්තමේන්තුවේ තියෙනවානේ මිරිහාන සන්නිවේදන මූලස්ථානයක්?

පි: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එය භාරව ඉන්නේ කවුද?

පි: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් ඉන්නවා. ඒ කොට්ඨාශය භාරව.

ප්‍ර: කොළඹ හෝ ලංකාවේ යම් ස්ථානකය විශාල අපරාධයක් සිදු වුණොත් එම අපරාධය පිළිබඳව ලංකාවේම පොලිස් ස්ථාන වෙත ක්ෂණිකව දැනුම්දීමේ හැකියාවක් මිරිහාන සන්නිවේදන මූලස්ථානයට තිබෙනවානේ?

FAIR COMMENT
BY JEZEEM

පි: තියෙනවා ස්වාමීනි.

ප්‍ර: විනාඩි කීයක් ඇතුලත දැනුම් දෙන්න පුළුවන්ද අපරාධයක් ලංකාවේ හැම පොලිස් ස්ථාන වලට?

පි: මිනිත්තු 5ක් 6ක් වගේ ඇතුලත.

ප්‍ර: 5ක් 6ක් ඇතුලත දැනුම් දෙන්න පුළුවන්?

පි: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: එසේනම් මුලින්ම මේ කොළඹ කොච්චිකඩේ පල්ලියේ සහ කටුවාපිටිය පල්ලියේ බෝම්බ පිපිරුම සිදුවුණ අවස්ථාවේදී ම එම ප්‍රහාරයන් සිදු වූ බව සියලු පොලිස් ස්ථාන දැනුවත් කරානම් මඩකලපුව පොලිස් ස්ථාන මඟින් සියෝන් දේවස්ථානයට වහාම ආරක්ෂාව සපයලා එම ප්‍රහාරයෙන් බේරා ගැනීමට තිබුණානේද? මෙයට හේතුව 9.10ට පමණ තමයි සියෝන් දේවස්ථානයේ ප්‍රහරය සිදු වුණේ. 8.40ට පමණ කොච්චිකඩේ සිදුවීම එතකොට ඒ විනාඩි 25ක වගේ කාලයක් තිබ්බා. ඒ ක්ෂණිකවම ඒ Information එක ගියානම් ඔබ කිව්ව විදිහට එය නවත්වා ගැනීමට තිබුණා නේද පොලිසියට ?

පි: ස්වාමීනි ඒ Information මෙහේ බෝම්බ ගියා කියන ඒ ආරංචිය එහෙට දැනුම් දීමේ හැකියාවක් තිබුණා. නමුත් දැන් මඩකලපුවේ දේවස්ථාන රාශියක්ම තියෙනවානේ. ඒක නිසා ඒ තරම් ක්ෂණිකව ඔය සියලුම ස්ථානවලට ආරක්ෂාව සැපයෙයිද කියන එක ප්‍රයෝගිකව පොඩ්ඩක් ගැටලු සහගතයි. නමුත් මම කිව්වේ ඊට වඩා වෙනස් කාරණාවක් ස්වාමිනි.

ප්‍ර: මම කිව්වේ එහෙම නෙවේ. කොමිෂමෙන් අහන්නේ. ඒ මගේ ප්‍රශ්නය මම අහන්නේ. එවැනි කරන්න තිබුණු කියන එකයි මම අහන්නේ. දැනුම් දීමක් කළ බවට සාක්ෂි නැති නිසා ක්ෂණිකව දැනුම් දීමේ හැකියාවක් තිබුණා ද?

පි: ක්ෂණිකව දැනුම් දීමේ හැකියාවක් තිබුණා. මිනිත්තු 5ක් 6ක් ඇතුලත

ප්‍ර: එහෙම දැනුම් දීමක් කරාද කියලා? නවත්වගන්න බැරි වුණ එක වෙනම කාරණයක්. තමන්ලාගේ වගකීම ඉටු කරාද කියන එක පොලිස් මූලස්ථානයේ?

පි: දැනුම් දීමේ හැකියාවක් අනිවාර්යයෙන්ම තියෙනවා. ඒ ඔබතුමා සඳහන් කරන විදිහට ඒ වගේ දැනුම් දීමක් ආවාම පොලිසියට හැකියාවකුත් තියෙන්න ඕනි එහෙනම් අර දේවස්ථාන වලට ගිහිල්ලා අවශ්‍ය ආරක්ෂාව ක්ෂණිකව සපයන්න.

ප්‍ර: එය කරන්න සොයා ගැනීම් කරගන්න බැරිවුණ එක වෙනම දෙයක්. මේ දැනුම් දීම කරාද කියලා ඉස්සෙල්ලා කරන්න ඕනි දැනුම් දීමනේ?

පි: ඔබ හරි ස්වාමිනි.

ප්‍ර: වගකීම පොලිස් මූලස්ථානයේ තියෙන්නේ ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඒ වගකීම අතන කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවයාගේ තමයි ප්‍රධාන වශයෙන් එයාට තමයි මේ වගකීම යන්නේ. මේ වගේ ක්ෂණික කාරණාවකදී.

ප්‍ර: එවැනි දෙයක් නොකරන්න නම් එයට හේතු වෙන්නේ කුමක් ද කියලා ඔබට කියන්න පුළුවන්ද?

පි: මේ සිද්ධියේ දී එහෙනම් එහෙම සම්න්ධීකරණයක් හරියට වෙලා නැතුව ඇති මුලස්ථාන මට්ටමින්.

ප්‍ර: ඊළඟට සාක්ෂිකරු ඔබ 2015 පස්සේ ඔබ විශ්‍රාම යනතෙක් .. 2016 විශ්‍රාම යනතෙක් 2015 රජය පත්වුණාට පස්සේ ජනාධිපතිවරයා යටතේ ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම් වලට මාසෙකට කී සැරයක් යනවද ඒ කියන්නේ කෙළින්ම අහන්නේ මාසිකව රැස්වීම් කීයක් තියෙනවද ආරක්ෂක කවුසිලයේ?

පි: ස්වාමීනි ඒක නිශ්චිත වශයෙන් සාමාන්‍යයෙන් සතියට වතාවක් පැවැත්වෙන්න ඕනි. නමුත් සමහර අවස්ථාවල සතිපතා පැවැත්වුණේ නැහැ. නමුත් පැවතුණ හැම රැස්වීමකට වගේ මම කොළඹින් බැහැර කොහොම හරි රාජකාරියකට ගිහිල්ලා හිටියේ නැත්නම් මම අනිවාර්යයෙන්ම සහභාගී වෙනවා කොළඹ හිටියොත්.

ප්‍ර: නැහැ දැන් ඔබගේ යෑමක් අපි අහන්නේ නැහැ. අපි ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම් මසකට කී සැරයක් තිබුණද කියලා දැන ගන්න ?

පි: සංඛ්‍යාත්මක වශයෙන් කියන්න ටිකක් අපහසුයි ස්වාමීනි. ඒකේ සාමාන්‍ය සිරිත වුණේනම් සතිපතා පවත්වන එකයි. නමුත් සමහර අවස්ථාවල සතිපතා පැවැත්වුණේ නැහැ.

ප්‍ර: එතකොට 2015 පෙර වෙනසක් තියෙනවද ඒකේ?

පි: ඒ කියන්නේ 2009 යුද්ධය අවසන් කරන තෙක් නම් හැමදාම නොවරදවාම පැවැත්වුණා. මම ඒ කාලේ පොලිස්පති නෙවෙයි. නමුත් මම දන්නවා. මූලස්ථානයට කටයුතු කරපු නිසා. ඒ කාලේනම් නිතිපතාම වගේ සතිපතාම වගේ පැවැත්වුණා. යුද්ධයෙන් පස්සෙත් මුල් කාලේ බොහෝ දුරට කෙරුණා. නමුත් පසුකාලීන වෙනකොට ටිකක් ඒ සතිපතා පැවැත්වීම පොඩ්ඩක් අඩු වුණා. අඩු වෙලා කොහොමත් මාසෙට වතාවක් ද තුන්සැරයක් අනිවාර්යයෙන්ම ඒ රැස්වීම් කෙරුණා.

ප්‍ර: දැන් රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂකවරයාට කෙළින්ම සෘජුව වාර්තා කරන්නේ ආරක්ෂක අමාත්‍යවරයාටද ජනාධිපතිවරයාටද දෙදෙනාටමද ආරක්ෂක ලේකම්ටද?

පි: මගේ දැනුමේ හැටියට ස්වාමීනි එයා වාර්තා කරන්නේ ආරක්ෂක ලේකම්වරයාට.

ප්‍ර: නමුත් ජනාධිපතිවරයාටත් වාර්තා කරන අවස්ථා තියෙනවද?

FAIR COMMENT
BY JEZEEM

පි: ඒ පිළිබඳව මට පැහැදිලිවම අවබෝධයක් නැහැ. ඒගොල්ලන්ගේ යාන්ත්‍රණය පිළිබඳව. ලේකම්වරයාට නම් වාර්තා කරන බව ඒගොල්ලන්ගේ ලිපිලේඛන වලින් දැනගෙන තියෙනවා.

ප්‍ර: දැන් ඔබ සිටින කාලයේ නාලක සිල්වා මහතා රාජ්‍ය බුද්ධි සේවයෙන් ඉවත් කරලා ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයට මාරුකරා. ඔබ කිව්වා ඒක යම්කිසි නිර්දේශයක් වෙන්න ඇතියි කියලා නියෝගයක් ආරක්ෂක අමාත්‍යාංශයෙන් හෝ නිර්දේශයක් බුද්ධි ප්‍රධානියාගෙන් හෝ ඒ දැන් එම අවස්ථාවේදී ඔහුගේ සේවා ස්ථාන මාරු කරන අවස්ථාවේදී ඔහු රාජ්‍ය බුද්ධි සේවයේ අන්තවාදී කල්ලි පිළිබඳව විමර්ශන කටයුතු පවත්වාගෙන ගියා නේද?

පි: ස්වාමීනි මට ඒ පිළිබඳව අවබෝධයක් නැහැ. මොකද රාජ්‍ය බුද්ධි සේවයේ ඒ ව්‍යුහය පිළිබඳව පොලිස්පතිවරයාට ඒ තරම් දැනුමක් නැහැ.

ප්‍ර: ත්‍රස්ත විමර්ශන අංශයේ ඒ සේවය කරන කාලයේ ඔබගේ උපදෙස් පරිදි වෙනම අන්තවාදී කල්ලි පිළිබඳව විමර්ශන සහ පරීක්ෂණ කිරීමට ඒකකයක් පිහිටුවන්න කටයුතු කරානේද?

පි: ස්වාමීනි මම අර මුලින් සඳහන් කරපු කමිටුවක් තමයි අර විශේෂ කමිටුවක් විදිහට ගියේ.

ප්‍ර: ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයෙත් වෙනම?

පි: මගේ දැනුමේ විදිහට එහෙම අන්තවාදී කණ්ඩායම් පිළිබඳව එහෙම විමර්ශන කරන්න වෙනම කණ්ඩායමක් තිබුණු බව එහෙම මතකයක් නැහැ. නමුත් මේ අන්තවාදී කණ්ඩායම් අපි සැළකුවේ ත්‍රස්තවාදී කණ්ඩායම් විදිහට. ඒක නිසා මේක තවත් ත්‍රස්තවාදී කණ්ඩායමක් විදිහට තමයි ඒගොල්ලෝ වෙනත් විමර්ශන කටයුතු කරේ.

ප්‍ර: දැන් ඔබ විශේෂයෙන්ම නාලක සිල්වාට කිව්වානේ මේක හොඳින් කරගෙන යන්න ඔබට පුළුවන්. රාජ්‍ය බුද්ධි සේවයෙත් ඔබ මේ අන්තවාදී කණ්ඩායම් පිළිබඳව මේ විමර්ශන කළ නිසා මේ ත්‍රස්වාදී විමර්ශන කොට්ඨාශයෙත් මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න කියලා?

පි: එහෙම විශේෂ මතකයක් නම් නැහැ ස්වාමීනි.

ප්‍ර: තමන්ට විශේෂ මතකයන් නැහැ?

පි: මට විශේෂ මතකයක් නැහැ.

ප්‍ර: දැන් ඔබ පොලිස්පතිවරයා වශයෙන් ඔබට කියන්න පුළුවන්ද දැන් මෙම රාජ්‍ය බුද්ධි සේවයට ලැබුණු විදේශීය බුද්ධි තොරතුරුත් ලැබුණාම පොලිස්පතිවරයා වශයෙන් එම තොරතුර සියලුම නියෝජ්‍ය පොලිස්පතිවරයාට ලංකාවේ යැවිය යුතුද?

පි: අනිවාර්යයෙන්ම සියලුම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට ඊළඟට ප්‍රභූ ආරක්ෂක දිසාවන් භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට මේ කණ්ඩායම අනිවාර්යයෙන්ම දැනුවත් විය යුතුයි. මොකද මේ ප්‍රහාරයේ තැනක් කියලා නැහැ. ඒ නිසා ලංකාවේ ඕනෑම

FAIR COMMENT BY JEZEEM

තැනක වෙන්න පුළුවන්. දැන් කොළඹත් ගැහුවා මඩකලපුවෙත් ගැහුවා. ඒක නිසා පළාත් 9යේම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් 9දෙනා අනිවාර්යයෙන්ම දැනුවත් විය යුතුයි. ඊළඟට ප්‍රභූ ආරක්ෂක අංශ භාර නියෝජ්‍ය පොලිස්පතිවරු. ඒ අය තමයි ජනාධිපතිවරයා, අගමැතිතුමා, අමාත්‍යවරු ඊළඟට ගරු විනිසුරුතුමන්ලා ඒ සියලු දෙනාගේම ආරක්ෂාව භාරව ඉන්නේ. අනිවාර්යයෙන්ම ඒ බුද්ධි තොරතුරු ලැබුණු වහාම දැනුවත් විය යුතුයි.

ප්‍ර: අවසාන වශයෙන් ප්‍රශ්නය ඔබ ජනාධිපති ආරක්ෂක අමාත්‍යාංශයේ ජනාධිපතිවරයෙක් ද ඒයාගේ උපදේශකයෙක් වශයෙන්ද 2019 පත්වුණාද?

පි: ස්වාමීනි

ප්‍ර: ආරක්ෂක අමාත්‍යාංශයේ ද ජනාධිපතිවරයාගේ ආරක්ෂක උපදේශකවරයක් වශයෙන්?

පි: ජනාධිපතිවරයාගේ ආරක්ෂක උපදේශකයෙක් විදිහට.ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශකයෙක් විදිහට.

ප්‍ර: ඒ කවදාද?

පි: මේ ප්‍රහාරයෙන් පස්සේ 2019 අප්‍රේල් 29 මට මතක විදිහට. මාසයක් වගේ කාලයක් මම හිටියේ.

ප්‍ර: ඊට පසු තමයි තමාලා මේ ප්‍රහාරය පිළිබඳව විමර්ශනය කරන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් පත්කළේ?

පි: නැහැ ස්වාමීනි. ඒ කාලය ඇතුලතම තමයි මේ දෙකම එකට කරගෙන ගියේ.

ප්‍ර: ඒ කියන්නේ ආරක්ෂක උපදේශක පත්කරලා ඊට පස්සේ කමිටුවේ සාමාජිකයෙකු වශයෙනුත් ඉදිරිපත් කරා?

පි: නිවැරදියි ස්වාමීනි. ඒ අතරම තමයි මේ කමිටුවත් පත්වුණේ.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර: ඉලංගකෝන් මහත්මයා දැන් ඔබගේ කාලයේදී නැගෙනහිර පළාතේ ආගමික අන්තවාදයක් එහෙම ක්‍රියාත්මක වුණා කියලා ඔබ දන්නවද?

පි: එහෙම අන්තවාදී කටයුතු පිළිබඳ විශේෂ තත්වයක් වාර්තා වුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් වහාබ්වාදය කියලා එකක් එහෙම ?

පි: නැහැ මම අර මුලින් කිව්වා වගේ අර SIS එකෙන් ආපු වාර්තා 3ට අතිරේකව වෙන විශේෂ තත්වයක් නැගෙනහිරින් වාර්තා වුණේ නැහැ. නමුත් සාමාන්‍යයෙන් කාත්තන්කුඩි ප්‍රදේශය කොහොමත් අද ඊයේ නෙවේ ඒ කාලේ ඉඳලාම ඒගොල්ලන් ඒක මුස්ලිම් ප්‍රජාව වැඩිපුර ජීවත්

FAIR COMMENT — BY JEZEEM —

වෙන ප්‍රදේශයක්. ඒ ප්‍රදේශය ටිකක් ඒ ජනතාව ටිකක් නීතියට එහෙම නැඹුරු නොවන අන්න එහෙම ගතියක් දැන් ..

ප්‍ර: ඒ කියන්නේ අර හෙල්මට් දාන්නේ නැතිව ?

පි: හෙල්මට් දාන්නේ නැතිව යන අන්න ඒ වගේ තත්වයක් ඇරෙන්න වෙන විශේෂ තත්වයක් ..

ප්‍ර: ඉතින් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ හැකියාවක් තිබුණේ නැතිව ගියාද නැත්නම් දේශපාලන බලපෑමක් වගේ ආවාද?

පි: ඒ කියන්නේ නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන්ද ස්වාමීනි

ප්‍ර: ඔව්

පි: එහෙම විශේෂ දේශපාලන බලපෑමක් තිබුණේ නැහැ. නමුත් මේගොල්ලන් හරිම අර ඒ පළාතේ තියෙන population එක. පොඩි දෙයක් වෙනකොට දහස්ගාණක් ඇවිල්ලා එකතු වෙලා මේ පොලිසියත් එක්ක obstructions අමාත්‍යාංශ වලට එනවා.ඒ තත්වය මැද තමයි සමහර වේලාවට STF එක දාලා සමහර වේලාවට army එකත් කැඳවලා අන්න ඒ වගේ තත්වයක් තිබුණා. ඒක පාලනය කරගෙන තමයි ඒ කාත්තන්කුඩි කියන එක ..

ප්‍ර: ඒ විදිහකට වුණත් පොලිසියට පහරදීමට වගේ තැන් කිරීමක් තිබ්බද?

පි: සමහර අවස්ථාවල එහෙම තත්වයක් තිබුණා. නමුත් ඒවාට අපි ඉඩදුන්නේ නැහැ. මේ මර්දනය කරගෙන තමයි අනිත් පළාත් වල තිබුණු ඒ පහසුව එහෙම නැත්නම් නීතිය හා සාමය ක්‍රියාත්මක කිරීමේ තත්වය තිබුණේ නැහැ එතන.

හොඳයි බොහොම ස්තුතියි.

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: Mr. ඉලංගකෝන් ඔබ ප්‍රකාශ කරා 2019 අප්‍රේල් 09 වෙනි දින ලැබුණු බුද්ධි තොරතුර පිළිබඳව කිසිම දෙයක් කර ගැනීමට නොහැකි වුණානම් අඩුම තරමේ මේ මාධ්‍යට හෝ Exppose කරන්නට තිබුණා කියලා ඔබ කිව්වා නේද එහෙම?

පි: මම කිව්වේ ස්වාමිනි 20 වෙනිදා.

ප්‍ර: ඔව් ඒක තමයි ඒ 20 වෙනිදා ඔබ හිතන්නේ මෙම කොමිෂම හමුවෙත් ප්‍රකාශ කරා මෙම බුද්ධි තොරතුර ඉතාම ආරක්ෂාව පිළිබඳව බරපතල තර්ජනයක් තියෙන බුද්ධි තොරතුරක් වුණා වගේම මේ politically , socially හරිම Sensitive කියලා දැන් එක පාරටම දැන් මේ තොරතුරෙන් මිනිස්සු කලබලයට පත්වෙයි කියලා. දැන් අර මාධ්‍ය ප්‍රකාශයක් හරි දීලා මේ තොරතුරු එළියට දුන්නානම් හොඳයි කියලා ඔබ ප්‍රකාශ කළේ . ඔබ

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කියන්නේ එවැනි දෙයක් පොලිස්පතිවරයාට කරන්නට පුළුවන්ද? එවකට සිටි පොලිස්පතිවරයාට මේක මාධ්‍යට දෙන එක?

පි: පොලිස්පති දැන් මේ වගේ කාරණාවක් සම්බන්ධයෙන් පොලිස්පතිවරයා තනි තීරණයක් අරන් කටයුතු කරන්න බැහැ. මොකද ඒ කාලේ තිබුණු වාතාවරණය යටතේ. බොහොම සාමකාමී වාතාවරණයක්නේ. දැන් අපි මෙතන දෙපැත්තක් ගැන සිතන්න වෙනවා ස්වාමීනි. දැන් පළවෙනි එක තමයි අපි මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා ක්‍රියාත්මක වුණානම් අනිවාර්යයෙන්ම මේක වෙන්නේ නැහැ. ඊළඟට ඒක නොවුණායින් පස්සේ ඊළඟට ලොකු චෝදනාවක් එන්න තිබුණා පොලිසියට. අනිවාර්යයෙන්ම ඒක එනවා මම දන්නවා මගේ අත්දැකීම් මම කියන්නේ. මොකද්ද එන චෝදනාව. මේ පාස්කු ඉරිදා දේව මෙහෙය තියාගන්න ඉඩ දුන්නේ නැහැ. පොලිසිය බොරු Information එකක් දීලා මේවා කඩාකප්පල් කරා. එය සිද්ධිය වුණේ නැහැනේ. කවුරුත් දන්නේ නැහැනේ මේක වුණේ නැත්තේ කොහොමද කියලා. වුණේ නැත්තේ Precautions ගත්ත නිසා. නමුත් ඒක කවුරුත් කියන්නේ නැහැ. කවුරුත් ඒ ගැන දන්නෙත් නැහැ. ඒක දැන ගන්න හම්බවෙන්නේ මේ ගහන්න හිටපු මිනිහා කවදාහරි දවසක අල්ලපු දවසට තමයි ඒක දැනගන්න හම්වෙන්නේ අහවල් දවසට ගහන්න හිටියා. මේ පොලිසියෙන් එහෙම නැත්නම් ආරක්ෂක අංශ මේක වැළැක්වුවා කියන එක දැන ගන්න හම්බ වෙන්නේ අල්ලපු දවසෙන්. මට ඒකට උදාහරණ දෙන්න ඕනි නැහැ. උදාහරණ සිද්ධීන් ඕන්නම් කියන්න පුළුවන්. ඒක නිසා ඒ වගේ අවස්ථාවක ස්වාමීනි පොලිස්පතිවරයා මේක තනියම මාධ්‍යට ගිහිල්ලා මේක කියලා ප්‍රචාරය කරලා මේක කරන එක කිසිසේත් සුදුසු නැහැ. ඒකයි මම කිව්වේ. අර බුද්ධි තොරතුරු තහවුරු වෙච්චි ගමන්ම අමාත්‍යවරයා ලේකම්වරයා දැනුවත් කරන්නේ කියලා. ඒ අය හරහා කියන්න යන්න ඕනි ඒ අයගේ කාර්ය භාරය තමයි ඒක ජනාධාවට දැනුම් දීලා ජනතාව ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීම. ඊළඟට අර වගේ තත්වයක් මතුවුණත් ඒක ට රජය දන්නවා මොකද වුණේ කියලා. කොහොමද මේක නැවතුණේ කියන එක. ඊළඟට එහෙම ජනතාව කලබලයට පත්වෙනවානම් ඒකට යම්කිසි හේතුවක් තිබුණානම් ඒක රජයේ අනුදැනුම අනුව එහෙම නැතුව පොලිස්පතිවරයා තනි තීන්දුවක් අරගෙන මේක කරානම් අන්තිමට සිද්ධිය වුණේ නැත්නම්. වෙන්නේනැහැ ඇත්තටම අපි Precautions ගත්තාම වෙන්නේ නැහැ. නොවුණානම් ඊළඟට එන තත්වය තමයි අරක. එහෙම වෙලා තිබෙනවා අපිට අනන්ත අපි මුහුණ දීලා තියෙනවා. අපි Precautions ගත්තාම සිද්ධිය වෙන්නේ නැහැ. ඊට පස්සේ කියන්නේ මේක බොරුවක්. ඊට පස්සේ blame ඒක වෙනවා. ඒ සියලු

FAIR COMMENT
BY JEZEEM

දේ කල්පනා කරලා තමයි ඒ කොටස රජයට භාර දෙන්නේ. මේක රජයේ ඉන්න ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුක් තියෙනවා. අමාත්‍යාංශයක් තියෙනවා. ඒගොල්ලෝ හරහා ජනතාව දැනුවත් කරලා ඒ neutralize කරන procedure එක අපිට ඒකට උදව් කරන්න පුළුවන්.

ප්‍ර: දැන් Mr. ඉලංගකෝන් මෙම සිදුවීම පිළිබඳ තොරතුරු ලැබෙන අවස්ථාව වෙනකොට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තමයි පොලිසිය කියන දෙපාර්තමේන්තුවත් තිබුණේ. නීතිය හා සාමයත් 2019 වෙනකොට තිබුණේ එකම අමාත්‍යාංශයක්. එතකොට ඔබ ඔය සඳහන් කරන ලේකම්වරයාට සහ ඇමැතිවරයාට මේතොරතුර වහාම කිව්යුත්තක් කියන පුද්ගලයා පොලිස්පතිතුමාද එහෙම නැත්නම් රාජ්‍ය බුද්ධි ප්‍රධානියාද?

පි: මම මුලිනුත් සඳහන් කළේ රාජ්‍ය බුද්ධි ප්‍රධානියාගේ reporting system හරියටම මට හරියටම දන්නේ නැහැ අවබෝධයක්. නමුත් මම දන්නවා ලේකම්වරයාටනම් මේ වාර්තා කරන්න එයා බැඳිලා ඉන්නවා. නමුත් පොලිස්පතිවරයා විදිහට දැන් අර මම සඳහන් කළේ බුද්ධි තොරතුරු ලැබුණාම ඒ බුද්ධි තොරතුරුට අදාළ අනිත් කණ්ඩායමත් එක්ක වහාම සාකච්ඡා පවත්වලා මේක විය හැකි possibility එක ගැන තීන්දුවකට එන්න කියලා. ඒ තීන්දුවේ දී අපිට අනාවරණය වුණානම් මේක විය හැකියි කියලා අන්න එතනදී පොලිස්පතිවරයාට වගකීමක් වෙනවා. මොකද පොලිස්පතිවරයාගේ නීතිය හා සාමය සම්බන්ධයෙන් වගකියන්න ඕනි රජයට. එතන දී පොලිස්පතිට වගකීමක් එනවා. වහාම ලේකම්වරයා සහ අමාත්‍යවරයා දැනුම් දීලා ඒ පාර්ශවයෙන් අර වගේ ජනතාව දැනුවත් කිරීම ආදී ඒ කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ඒ අයට දැනුම් දීමට. මේ පැත්තෙන් වළක්වා ගැනීමට අවශ්‍ය ක්‍රමවේද පොලිස්පති අනුගමනය කරන අතරේ අර පැත්තෙන් තමන්ගේ ලේකම්වරයා සහ අමාත්‍යවරයා දැනුවත් කරලා ඒ පැත්තෙන් ජනතාවට මේක බලනොපාන විදිහට අවශ්‍ය කටයුතු කරා.

ප්‍ර: ඔබ සඳහන් කරා ඔබ රජයන් 2ක් යටතේ ම පොලිසිය භාර ප්‍රධානියා ලෙස හිටියා පොලිස්පති ලෙස. ඔබ සඳහන් කරා 2005 වසරේ සිට 2014 වසරේ කිසියම් කාලයක් දක්වාම පොලිස් දෙපාර්තමේන්තුව තිබුණේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේයි. හැබැයි 2014 වසරේදී කිසියම් අවස්ථාවක election එකකට ආසන්න වගේ කාලයක දී පොලිසිය වෙනමම අමාත්‍යාංශයක් නීතිය හා සාමය කියලා ඇති කරා කියලා. වෙනම අමාත්‍යාංශයක් හැටියට දීර්ඝ කාලයක් පොලිසිය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබුණා වුණත් 2014 වසරේ දී 2015 මැතිවරණයට පෙර අවස්ථාවකදී පොලිස් දෙපාර්තමේන්තුව නීතිය හා සාමය කියලා

FAIR COMMENT BY JEZEEM

වෙනම අමාත්‍යාංශයක් හැටියට ස්ථාපිත කරා කියලා. ඒක එහෙම මම හරියට අවබෝධ කරගෙන ද කියපු දේ ? එහෙම දෙයක් වුණා නේද?

පි: ස්වාමීනි මම හිතන්නේ නිවැරදියි මං හිතන්නේ.

ප්‍ර: එතකොට ඔබට කියන්නට පුළුවන් ද ඔබ පොලිසියේ ප්‍රධානියා ලෙස හෝ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පොලිසිය තිබුණු නිසා මෙවැනි තීරණයක් ගැනීමට කිසියම් වූ හේතු සාධක තිබුණාද යම් ජාත්‍යන්තර සංවිධානයක කිසියම් ඉල්ලීමක් මත හෝ මේ පොලිසිය මිලිටරි අමාත්‍යාංශයක් සමඟ තිබිය යුතු නැත කියලා වගේ මතකයක් ඇතිවුණාද ඒ කාලයේදී ?

පි: මේ අවස්ථාවේ දී 2014 මේ අමාත්‍යාංශය වෙන අමාත්‍යාංශයකට ගෙන යයි කියන එක රජයේ තීන්දුවක්. ඒ තීන්දුව ගත්තේ ඇයි කියන එක ගැන මටත් පැහැදිලිව අවබෝධයක් නැහැ ස්වාමීනි. නමුත් ඔබතුමිය ගරු විනිශ්චය තුමිය සඳහන් කරන ආකාරයට මේ කාරණාව කාලෙන් කාලේට තර්ක කරා. මීට ප්‍රථමත් 2002 නීතිය හා සාමය මට මතක විදිහට. නීතිය හා සාමය අමාත්‍යාංශයට පොලිසිය ඒ කාලෙත් ටිකක් අනුයුක්ත වෙලා තිබුණා. එතන දී ප්‍රධාන තර්කය වුණේ ස්වාමීනි පොලිසිය කියන්නේ සිවිල් දෙපාර්තමේන්තුවක් ඒ නිසා මේක ආරක්ෂක අමාත්‍යාංශය යටතේ නොපැවැත්විය යුතුයි කියන එක යටතේ ඒ තර්කය වුණේ. ඒකට උදාරහණ වශයෙන් ගෙනාවේ ලෝකයේ බොහෝ රටවල් වල මං හිතන්නේ ආසියාවේ රටවල් කිහිපය හැර අනිත් බොහෝ රට වල පොලිසිය පවතින්නේ නීතිය හා සාමය හරි එහෙම නැත්නම් internal affairs හරි ඒවගේ සිවිල් ආයතනයක් විදිහට වෙනම ආයතනයක් විදිහට. ඊළඟට අපිට ජාත්‍යන්තරයෙන් සංවිධාන වලින් ආධාර training විශේෂයෙන්ම, පුහුණු වලට ආධාර ලබා ගැනීමේදී අපි පොලිසිය Defence එකේ ඉන්නවා කියලා කිව්වාම අපි Law and Oder වලට ඒගොල්ලෝ ඒ ආධාර දීමට ටිකක් මැලි වෙනවා. මොකද Law and Oder , Defence කියන්නේ 2ක්. Law and Oder වලට ආධාර දෙන්න කැමැති නැහැ, Defence එකේ ඉන්නකොට. අන්න එහෙම ප්‍රායෝගික ඒවගේ ගැටලුවක් තිබුණා. මෙන්න මේ සියලු කාරණා මං හිතන්න වෙන්න ඕනි හේතු වෙන්න ඕනි මේ Defenceඑකෙන් වෙන් වෙලා නීතිය හා සාමය කියලා අමාත්‍යාංශක් පිහිටුවන්නට හේතු වුණේ.

ප්‍ර: ඒක නිසා තමයි මං හිතන්නේ 2015 බලයට පත් වූ රජය ආරම්භයේ සිටම නීතිය හා සාමය කියලා පොලිසිය වෙනමම අමාත්‍යාංශයක් යටතට දාන්නට ඇත්තේ.

පි: මං හිතන්නේ ඒ කාරණාව වෙන්න ඕනි. මොකද 2002ත් ඔය තත්වය මතුවුණා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: ඔබ 2015 නව රජයේ පොලිස්පතිතුමා ලෙස සේවය කරා. ඒවගේම 2014 කාලයේදී ඔබ සඳහන් කලා ඉස්ලාම් ආගමික අන්තවාදය සහ මේ සහරාන් කියන පුද්ගලයා සම්බන්ධව ඔබටත් තොරතුරු වාර්තා වුණා කියලා. දැන් මේ මැතිවරණයක් ආසන්න කාලයකදී මේ සහරාන් කියන පුද්ගලයාගේ ආගමික අන්තවාදය පිළිබඳව කතා කරන්නට හෝ රැස්වීමකදී හෝ සාකච්ඡාවන් වලදී වෙන අවස්ථාවන් වලදී ඔබට නිරීක්ෂණය වුණාද ඉස්ලාම් ආගමික සංවිධාන හෝ ඉස්ලාම් ආගමික දේශපානඥයන් විසින් යම් යම් කරුණු කාරණා ඔවුන් ගැන ඉදිරිපත් කරන්නට උත්සාහ කළබව සහරාන් හෝ IS සංවිධානයට සම්බන්ධ ශ්‍රී ලංකාවේ යම් පිරිස් සිටීම පිළිබඳව ?

පි: ඒ වකවානුව තුළ එහෙම තත්වයක් සමාජය තුල දක්නට ලැබුනේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔබට මෙම කොමිෂමේ ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් තුමිය ලිපි 2ක් පෙන්නුවා. එම ලිපියට ඔබ යවන ලද ලිපියක් පිළිබඳවත් සඳහන් වෙනවා. නමුත් එම ලිපිය මෙතන නැහැ. 2015.11.17 දින රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතා විසින් N.K. ඉලංගකෝන් පොලිස්පති කියලා එවනවා. අන්තර් ආගමික සමුළුව විසින් මං මේ ප්‍රශ්නය ඔබගෙන් අසන්න, අන්තර් ආගමික සමුළුව විසින් IS සංවිධානය සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡා කියලා ඒකට ඇමුණුමකුත් තියෙනවා. එයත් ඔබට තමයි ආමන්ත්‍රණය කරන්නේ. 2015.10.16 ඒකේ තමයි අර අන්තර් ආගමික සමුළුවට IS සංවිධානය සම්බන්ධයෙන් ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරනවා අන්තර් ආගමික සමුළුවේ සිටින කණ්ඩාම. ඔබට කියන්න පුළුවන්ද මේ කොමිෂමට කවුද මේ අන්තර් ආගමික සමුළුවේ සාමාජිකයෝ කියලා?

පි: මට ඒ පිළිබඳව අවබෝධයක් නැහැ.

ප්‍ර: මේ අන්තර් ආගමික සමුළුව මම ඒකයි ඔබට මේ ප්‍රශ්නය යොමු කළේ කිසියම් සංවිධාන මැදිහත් වෙනවද ඉස්ලාම් ආගමික අන්තවාදීන් පිළිබඳව යම් යම් බෙරා ගැනීම හෝ ඔවුන් මෙහෙම අය නෙවෙයි අහිංසක මිනිස්සුන්. එවැනි දේවල් එත්තු ගැන්වීමට සංවිධාන ඉදිරිපත් වෙනව ද කියන එක තමයි මම ඔබගෙන් ඇහුවේ. විශේෂයෙන්ම මේ ලියුම මත මේ ලියුමේ සඳහන් වෙන කරුණු රාජ්‍ය බුද්ධි සේවාව ඔබට එවන 2015.10.16 ලිපියේ මම ඔබට කාලය ටිකත් ගියත් මේ ප්‍රශ්න ටික කියන්නම්. පළමු ප්‍රශ්නය ශ්‍රී ලාංකික මුස්ලිම් ජාතිකයන් 7 දෙනෙකු මෙම සංවිධානය සම්බන්ධවී සිටින බවට මාධ්‍ය හරහා ප්‍රචාරය වීම හා එහි සත්‍ය අසත්‍යතාවය. දැන් මේ ජමෙයිතුල් උලමා සංවිධානය උත්තරයක් දෙනවා. මියගිය නිලාම්ගේ පවුලේ දරුවන්ද ඇතුළුව පවුලේ සාමාජිකයන් 20 දෙනෙකු ඇතුළුව මෙම සංවිධානයට සම්බන්ධ වී ඇත. අපගේ දැනීමේ හැටියට වෙනත් කිසිවෙකු සම්බන්ධ වී නැත. මේ

FAIR COMMENT BY JEZEEM

නිලාම් කියන පුද්ගලයාගේ පවුලේ දරුවන් 20ක් ඉන්නවද කියන්නට මෙම කොමිෂමට කරුණු ඉදිරිපත් වෙච්ච හැටියට නම් ඔහු තරුණයෙක් ඒ පිළිතුර. ඊළඟට ප්‍රශ්නයක් අහනවා මුස්ලිම් කාන්තාවන් පෙරට වඩා කළු පැහැති අබායා ඇඳුම භාවිතා කිරීමට පෙළඹීම අන්තවාදය හෝ මෙවැනි ත්‍රස්තවාදී සංවිධාන වල පෙළඹීමක්ද . එතකොට ජමෙයිතු උලමා සංවිධානය දෙනවා උත්තරයක් මුස්ලිම් කාන්තාවන්ට කළු පැහැති ඇඳුමක් අර අබායා කියන එක කියන එක ඒ උත්තරයේ නැහැ. කළු පැහැති ඇඳුමක් ආගමේ දක්වා නොමැති අතර මැද පෙරදිග ආභාෂයෙන් මුස්ලිම් කාන්තාවන් මෙවැනි ඇඳුම් වලට හුරු වී සිටී. පල්ලි විසින් හෝ තම සංවිධානය විසින් කිසිදු පෙළඹවීමක් සිදු කර නොමැති බව.ඊළඟට ප්‍රශ්නයක් අහනවා. මුස්ලිම් මද්‍රාසා සහ අනෙකුත් විශ්වවිද්‍යාල තුල විදේශ IS සාමාජිකයන් අධ්‍යාපනය ලබන බව. ඊට පස්සේ ජමෙයිතුල් උලමා සංවිධානය කියනවා. මෙතෙක් මෙවැනි පුවතක් අනාවරණය වී නොමැති අතර මේ සම්බන්ධව සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සභාව විසින් මුස්ලිම් සියලු අධ්‍යාපනික ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන බවත් එවැනි ප්‍රවර්ධනයක් සිදු නොවන බවට සහතිකයක් තම සංවිධානයට දිය හැකි බව. ඊළඟට තව ප්‍රශ්නයක් අහනවා මේ අන්තර් ආගමික සමුළුවේ ඉන්න කවුරුන් හෝ මුස්ලිම් සාමාජයක් IS සංවිධානය අනුමත කරන්නේ ද හා මේ සඳහා සමස්ත ලංකා ජමෙයිතු උලමා සංවිධානය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවද. එතකොට ජමෙයිතුල් උලමා දෙනවා පිළිතුරක් IS සංවිධානය ඉස්ලාම් නොවන සංවිධානයක් නිසා සමස්ත ලංකා ජමෙයිතුල් උලමා සභාව විසින් 2014 වර්ෂයේදී ප්‍රකාශක් නිකුත් කර ඇත. 2015 වර්ෂයේ නිලාම් මිය ගිය පසුවත් නැවතත් ප්‍රකාශක් නිකුත් කරමින් තම ස්ථාවරය සමාජයට ඉදිරිපත් කළ අතර ඉදිරියටත් එම ස්ථාවරය ගෙන යෑම සහ තම සමාජය ආරක්ෂා කිරීම සංවිධානයේ වගකීම බව. දැන් මේ තම සමාජය ආරක්ෂා කිරීම IS සංවිධානයේ බලපෑමෙන් ජමෙයිතුල් උලමා වැනි සංවිධානයක වැඩක් ද එහෙම නැත්නම් රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව කාර්ය භාරයක් ද හිටපු පොලිස්පතිතුමා. ඔබ මොකද කියන්නේ. මොකද මේ ලියුම එවලා තියෙන්නේ ඔබ පොලිස්පති ලෙස රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතාගෙන් අහනවා. මෙතන නැහැ ඔබගේ ලිපිය. ඔහු reference එකක් දානවා. උතුමාණෙනි 2015. 10.19 දිනැති අංක SDIG කියන්නේ මං හිතන්නේ IGනේ?

පි: නැහැ SDIG කියන්නේ මම නෙවේ ස්වාමීනි. Senior DIG

ප්‍ර: නැහැ /ක් දාලා IG, Senior DIG ද එතකොට?

ප්‍ර: මේ ලියුමෙන් අදහස් වෙනවා මේ ලියුමට නිලන්ත ජයවර්ධන මහත්මයා දෙන උත්තරය තමයි අන්තර් ආගමික සමුළුව හරහා ප්‍රභූවරුන්ට හෝ

FAIR COMMENT BY JEZEEM

රජයට හෝ තර්ජනය එල්ල වීම ඉඩ ප්‍රස්ථාවක් එල්ල වීම නොමැති අතර හුදෙක් මෙය ආගමික සහජීවනය සඳහා පිහිටුවා ගත්තා ඇති සංවිධානයක් කියලා. නමුත් මේ දැන් ආගමික සහජීවනය සඳහා පිහිටුවාගන්නා සංවිධානයකින් මේ IS සංවිධානය පිළිබඳව කරුණු කාරණා ගැන උත්තර ලබා ගැනීමද නිවැරදි ක්‍රමය ඔබ හිටපු පොලිස්පති ලෙස මම කැමැතියි ඔබගෙන් මේකට පිළිතුරු ලැබෙනවට මේක රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව බරපතල ප්‍රශ්නයක් නිසා මේ ජමෙයිතුල් උලමා සංවිධානය හෝ වෙනත් ආගමික පුද්ගලයන් රැස්වෙන සංවිධානයකට යොමු කරනවාට වඩා රහසිගතව ආරක්ෂක අංශ විසින් තොරතුරු සොයා බැලිය යුතු කාර්යක් නෙවෙයි ද මේ?

පි: මං හිතන්නේ ස්වාමීනි මේක මේ වෙලා තියෙන්නේ මේ සාකච්ඡාවේදී යම්කිසි කෙනෙක් ඒ සාකච්ඡාවට සම්බන්ධ වෙච්චි යම්කිසි කෙනෙක් අහපු ප්‍රශ්න වලට ජමෙයිතුල් උලමා සංවිධානයෙන් දීපු උත්තර තමයි මේ මං හිතන්නේ. ඒ ඇරෙන්න අපි කවුරුත් දීපු උත්තර නෙවෙයි කියන එක මගේ අදහස.

ප්‍ර: නැහැ ඒක තමයි මමත් කියන්නේ මේක මේ පොලිසිය හෝ ආරක්ෂක අංශ දීපු උත්තර නෙවෙයි. මේ සර්ව ආගමික කථිකාවත නේද? අන්තර් ආගමික සමුළුවනේ මේ. අන්තර් ආගමික කිව්වම මම හිතනවා මේ ලංකාවේ සිටින සියලුම ආගම් වලට අයත් විද්වතුන් වෙන්න ඇති. ජමෙයිතුල් උලමා සංවිධානය කියන්නේ ඉස්ලාම් ආගමික විද්වතුන්ගේ සංගමය. එතකොට අනිත් ආගම්වලත් ඉතින් එහෙම කණ්ඩායමක් යන්නට ඇතිනේ මෙකේ ඇතිනේ. එතකොට තවත් මේකේ තියෙනවා ජමෙයිතු උලමාවරුන්ගේ කවුද එක්කෙනෙක් Presentation එකක් දෙන්න තියෙනවා. මේකට ඇවිල්ලා එයා කියනවා IS සංවිධානය සහ ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව යන මැයෙන් සාකච්ඡාවක් පවත්වපුවාම ඒකේ හිටපු අශ්ශෙයික් මොහොමඩ් දහ්ලාන් මන්සූර් මහතා Presentation එකක් කරලා කියනවා. IS සංවිධානයේ නායකයා යුදෙව් ජාතිකයෙකු වන බව හා ඇමරිකාවට අවශ්‍ය ආකාරයට සංවිධානයේ කටයුතු ක්‍රියාත්මක කරනවා. ඇමරිකාව අල්කයිඩා සංවිධානය බිහි කල ආකාරයටම මෙම සංවිධානයත් ආරම්භ කරමින් සිරියාවේ ජනාධිපති බසීර් අල්අසාර්ගේ පාලනය පෙරලා දැමීමට කටයුතු කරනවා. බටහිර අධිරාජ්‍යවාදීන් තම බලය ව්‍යාප්ත කිරීමට හා මුස්ලිම් සමාජය විනාශ කිරීමට මෙම සංවිධානය ආරම්භ කර ඇතිබව. IS සංවිධානයේ සිටින සාමාජිකයන් සුන්නි මුස්ලිම්වරුන් වන්නේ නම් ඔවුන් බහුතර සුන්නි මුස්ලිම් ජාතියන් සිටින රටවලට ප්‍රහාර එල්ල කිරීම හා යුදෙව් ජාතිකයන් සිටින ප්‍රදේශ වලට ප්‍රහාර එල්ල නොකිරීම ගැටලු සහගත බව. රුසියාව විසින් IS සංවිධානයට ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධව ඇමරිකාව

FAIR COMMENT BY JEZEEM

කනස්සල්ලෙන් පසුවන බව හා රුසියාව විසින් තමන්ට හිතවත් බසිර් අල්හාසාද් බේරා ගැනීමට කටයුතු කරන බව. ශ්‍රී ලාංකිකයා ද තම සහෝදරයාගේ මඟපෙන්වීම යටතේ IS සංවිධානයට සම්බන්ධ වී ඇති බව හා ඔහු බටහිර රටවලට සම්බන්ධ රාජ්‍ය නොවන සංවිධානයක ක්‍රියාකරී පුද්ගලයෙකු බව. දැන් මම ඔබතුමාට මේ පිළිබඳව වගකීමක් පවරන්නේ නැහැ. එහෙම අදහසකින් අහනවා නෙවෙයි නමුත් රාජ්‍ය බුද්ධි සේවාව වැනි ආයතනක් ඔබතුමාට පොලිස්පතිට එවනවා. මේ අන්තර් ආගමික සමූළුවෙන් රජයට තර්ජනයක් එල්ල වෙන්නේ නැහැ. ඇත්තටම මේ තර්ජනය IS සංවිධානයට සම්බන්ධව ශ්‍රී ලාංකික තරුණයන් පිටරට යෑම සහ එහි ක්‍රියාකාරීත්වය ලංකාවේ ඇතිවීම පිළිබඳ එතකොට මේ පිළිබඳව මීටත් වඩා කටයුතු කිරීම නෙවෙයිද රාජ්‍ය බුද්ධි සේවාවක හෝ ශ්‍රී ලාංකික පොලිසියේ හෝ කාර්ය භාරය විය යුත්තේ. මොකද මේ කියන දේවල් මේ කොමිෂම හමුවේ ඉදිරිපත් වෙලා තිබෙන කරුණු අනුව සත්‍ය නෙවෙයි හුඟාක් දේවල්. මේ

පි: ස්වාමීනි මේ ලිපිය මම මුලිනුත් කිව්වා වගේ මම විශ්‍රාම ගිහිල්ලාත් අවුරුදු 4ක් 5ක් කිට්ටු වෙන්න ආවා. ඇත්තට ඒ ලිපිලේඛනය බලන්න නැතුව මට කියන්න අමාරුයි. මොකක්ද මම ගත්ත ක්‍රියාමාර්ගය කියන එකත් ඊළඟ මෙහෙම ලියුමක් එව්වාම මම දන්න තරමින් SIS එක මේ සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියාමාර්ගක් ගන්නවා. ගන්න ඕනි සහ මගේ දැනීමේ හැටියට ගන්නවා. ඉතින් මම දන්නේ නැහැ මේ ලියුමත් එක්ක ගත්ත Follow up Action එක පිළිබඳව හරියටම මම මට මේ අවස්ථාවේදී කියන්න අපහසුයි.

ප්‍ර: ඒවගේම ඔබ මෙම කොමිෂම හමුවේ ප්‍රකාශ කරලා තියෙනවා කිසියම් පිරිසක් හෝ කණ්ඩායමක් අන්තවාදී ත්‍රස්තවාදී ක්‍රියා සඳහා පෙළඹී ඇත්නම් හෝ පෙළඹීමට සූදානම් වී ඇත්තේනම් හෝ එයට වස්තු බීජය වූ කාරණාව හොඳින් හඳුනාගෙන එස මේ හේතුව ඉවත් කිරීමට තත්වය පාලනය කිරීමට ගත හැකි වඩා සාර්ථක ක්‍රිමාර්ගය වෙනු ඇත කියලා. ඔබට කියන්න පුළුවන් ද මේ කොමිෂමට අප්‍රේල් 21 ත්‍රස්ත ප්‍රහාරයට සම්බන්ධ සහරාන් සහ ඔහුගේ කණ්ඩායම ඔවුන්ගේ ඉස්ලාම් ආගමික අන්තවාදී හා ත්‍රස්තවාදී ක්‍රියා කිරීමට වස්තු බීජය ලෙස හඳුනාගෙන තියෙන්නේ මොකක් ද කියලා? මොකක් ද ඔවුන්ට මෙවැනි දෙයක් කිරීම සඳහා තිබූ වස්තු බීජය ?

පි: එක හේතුවක් විදිහට ප්‍රධාන හේතුවක් විදිහට මම දකින්නේ මේ ලෝකය පුරාම ඒ ISIS මතවාදය. ඒ මතවාදයට සමාන්තරවනේ මේගොල්ලොත් යන්නේ. IS සංවිධානය කියන්නේ තියෙන්න පුළුවන් ඉස්ලාම් දහම විතරයි කියන එකනේ. ඊට විරුද්ධව යන සියලුම දෙනා ඝාතනය කළ යුතුයි කියන එක තමයි. ඒක තමයි මේගොල්ලන්ගේ

FAIR COMMENT BY JEZEEM

මතවාදය මං හිතන්නේ. ඒ මතවාදය හරහා තමයි මේ ගොල්ලන්ගේ මනස සකස් වෙන්න ඇත්තේ කියන එක.

දැන් වේලාව: ප.ව.7.15
මෙතැන් සිට ල/ලේ: චන්දිමා මෙනවිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව: ප.ව.7.15
පෙර සටහන්: ල/ලේ නිල්මිණි කුමාරි
මෙතැන් සිට: ල/ලේ චන්දිමා දිල්හානි.

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: එතකොට ඔබට දැන් පෙනී යනවානේද මේ 2015.11 වෙනි මාසේ 17 නෑ 2015.10.17 සහ මා ඔබට දැන් කියවූ ලිපි වල IS සංවිධානයට බය විය යුතු නැති බවට ඔබට එවා ඇති මේ ලිපි නිලන්ත ජයවර්ධන මහතා මේ අන්තර් ආගමික සමුළුව දිපූ උත්තරය මතනේ මේ ඔහු ඔබට ලියුම් එවන්නේ මේ IS සංවිධානය පිළිබඳ ප්‍රශ්නයක් නෙමේ මේ තියෙන්නේ එහෙම කියලා ඒකෙනුත් පේනවා නේද මේ ඇත්තටම ඔවුන් කියපු දේ නෙමේ ඇත්තටම අවසානයේදී අපේ රටේ සිද්ධ වුනේ මේ ඔබ දැන් කියපු විදියට IS සංවිධානයේ මතවාද ඔස්සේ යන පිරිසක් විසින් ලංකාවේ ප්‍රහාරයක් එල්ල කරා අප්‍රේල් 21 ?

පි: මේ ස්වාමිනි මං දන්නේ නැහැ මේ වාර්තාව කොහොම වුනත් අපි මුල ඉදලම අපේ අවධානය යොමුවෙලා තිබුණා IS සංවිධානය ලංකාවට කොයි විදයටද බලපාන්නේ කියලා ඒක තමයි අපේ මූලික විමර්ශනය වුනේ මුල ඉදලම අපි හෙව්වේ මේ යන රැල්ල අපිට කොයි විදියට බලපායිද කියන එක මං දන්නෑ මේ වාර්තාවෙන් මොන විදියට අදහස් කරාද කියන එක. අපි නම් ඒක අත ඇරියේ නැහැ.

ප්‍ර: පොලීසියේ කරුණක් නෙමේ මේක පුදුම සහගත වුනේ බුද්ධි ආයතනයක් විසින් ඒවා පොලිසිය වෙත එවා ඇති ලිපියක් නිසා?

පි: අපි දිගටම හෙව්වේ IS සංවිධානය හා ලංකාවේ පවතින සම්බන්ධතාවය මොකක්ද කියන එක මොකද දරුණුම වෙන්නේ ඒ අයට සම්බන්ධ වුනොත්.

ප්‍ර: හිටපු පොලිස්පති ලෙස මම කැමති මගේ අවසාන ප්‍රශ්නය ඔබගෙන් අසන්නට Mr ඉලංගකෝන් ඔබ ඉතා දීර්ඝ කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරි කරලා තියෙනවා දිර්ඝකාලයක් පොලිස්පතිවරයෙක් ලෙසත් සේවය කරලා තියෙනවා ඒ වගේම නීතිය හා සාමය මහජන ආරක්ෂාව පිලිබඳ රාජ්‍යයේ ප්‍රමුඛතම ආයතනය තමයි ශ්‍රී ලංකා පොලීසිය දැන් ජාතික ආරක්ෂාව පිළිබඳ වගකීමක් ඔබලාට තියෙනවා ජාතික ආරක්ෂාව ඇතිකිරීම සඳහා මහජන ආරක්ෂාව පැවතිය යුතුයිනේ දැන් මේ ඉස්ලාම් ආගමේ අන්තවාදය නිසා මේ රටේ ජනවර්ග අතර අපි බහු ආගමික,බහු ජාතික බහු සංස්කෘතියක් තියෙන රටක්නේ ශ්‍රී ලංකාව ඒ කියන්නේ එතකොට අපේ රටේ මේ ජන වර්ග සහ සියලු ආගම්වලට අයත් මිනිසුන් සමගියෙන් සහ සහජීවනයෙන් ජීවත් වීමට මේ ඉස්ලාම් ආගමික අන්තවාදීන් බලපෑම කොයිතරම් බරපතල ලෙස තියෙනවාද

FAIR COMMENT — BY JEZEEM

සහ එයින් මිදීම සඳහා ඒ කියන්නේ තිරසාර ලෙස ජාතීන් අතර සහ ආගම් අතර සමගිය සහ සහජීවනය ඇති කිරීම සඳහා ඔබට කිසියම් යෝජනාවක් කරන්නට පුළුවන්ද මේ කොමිෂමට?

පි: ස්වාමිනි මට ඒකට බොහොම සරල පිළිතුරක් දෙන්න පුළුවන් මේක මේ ඉස්ලාම් ධර්මය ඉස්ලාම් සිංහල කණ්ඩායම් අතර සහජීවනය විතරක් නෙමේ අපිට අත්දැකීම් තියෙනවා ද්‍රවිඩ සිංහල සහජීවනයට කොහොමද පළුදුවුනේ කියන එක. එතකොට ඒ තිස් අවුරුද්දක් යුද්දේ දිග් ගැස්සුනේ ත්‍රස්තවාදීන් ද්‍රවිඩ ත්‍රස්තවාදීන් සුළු පිරිසක් මේ සහජීවනය කඩාකප්පල් කරපු නිසා ඊට ප්‍රථම දෙමළ සහ සිංහල පුද්ගලයෝ බොහෝම සුහදව ජීවත් වුනා. වරින් වර පොඩි පොඩි කලබලවල් ඇති වුනාට ඒවා දුර දිග ගියේ නැහැ. සිංහල මිනිස්සු ගිහිල්ලා යාපනයෙන් කසාඳ බැන්දා යාපනයේ අය මෙහේ ඇවිල්ලා පදංචි වුනා. ඒ වගේ හොඳ අන්තර් සම්බන්ධතාවයකින් අපි ජීවත් වුණා. ඒක විනාශ වුනේ ත්‍රස්තවාදයත් එක්ක එතකොට ත්‍රස්තවාදයට සම්බන්ධ වුනේ සම්පූර්ණ දෙමළ ජනතාව නෙමේනේ මේ රටේ ඉතාමත් අල්පමාත්‍ර කොටසක් ඒවා තමයි මේ සහජීවනය කැඩුවේ ඒ න්‍යාය තමයි මෙතනත් තියෙන්නේ. මේ ඉස්ලාම් අන්තවාදය හරහා මුස්ලිම් සහ සිංහල ප්‍රජාව අතරේ සහජීවනයේ කඩාකප්පල් කරන්නේ මේ අන්තවාදී සුළු පිරිසක් බහුතර මුස්ලිම් ප්‍රජාව දිහා බැලුවොත් ඒ අය එක්ක කථා කෙරුවොත් එයා මේකට විරුද්ධයි සහ සමහරු යයි ඒකට විරුද්ධව කථා කරන්න බයයි. LTTE එකට විරුද්ධව කතා කරන්න බය වුනානේ දෙමළ ජනතාව ඒයාට විරුද්ධව නීතිය හරියට ක්‍රියාත්මක වෙනකම් එයා ඒ විදියට අය ඉදිරියට ආවේ නැහැ. යටපත් කර ගෙන හිටියා. මේ දෙයටත් එහෙම වෙන්න පුළුවන් මේ තත්ත්වය පාලනය කරේ නැත්නම් මේකට ඔබතුමිය ස්වාමිනි ඔබගේ ප්‍රශ්නයට පිළිතුර වෙන්නේ හැකි ඉක්මනින් මේ අන්තවාදීය දැඩි මතදාරි පිරිස අපි අවසන් කරන්න ඕනේ අවසන් කරනවා කියන්නේ ඝාතනය කරනවා කියන එක නෙමේ මේක මර්ධනය කරන්න ඕනේ. නීතිය හමුවට ගේන්න ඕනේ නීති මදි නම් නීති ගෙන්න ඕනේ ගෙනල්ලා මේ දැඩි මතධාරීන් ඒ සංවිධාන අපි අවසන් කරන්න ඕනේ. කරලා ඒකට තිත තියන්න ඕනේ. ඒ තුලින් තමයි මේ අන්තර් සම්බන්ධතාවය බිඳියාම තවදුරටත් නතර කරගන්න පුළුවන් වෙන්නේ එහෙම නැතිව තව කොහේ කොහේ හරි බෝම්බයක් දෙකක් පිපිපුරුවොත් පන්සලකට දෙකකට බෝම්බයක් ගැහුවොත් ඔය අන්තර් සම්බන්ධතාවය ගැන කථා කරලා වැඩක් නැහැ. කළයුතු දේ තමයි මේ අන්තවාදීන් ටික අපි ඒ ගොල්ලන්ව අත්අඩංගුවට අරගෙන පුරුනුත්තාපනය කරලා එහෙම නැත්නම් නීතිය අනුව කටයුතු කරලා බන්ධනාගාරගත කරලා ඒ ඒ කටයුතු ක්‍රියාමාර්ග ටික අරගෙන මේ ප්‍රශ්නයට මුල අපි අවසන් කරන්න ඕනේ.

FAIR COMMENT
BY JEZEEM

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු අවසාන වශයෙන් කෙටි ප්‍රශ්නයක් තියෙනවා දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් යම් කිසි විමර්ශනයක් කරන්න පොලිස්පතිගේ නියෝගයක් තියෙන්න ඕනනේ?

පි; නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ත්‍රස්ථවිමර්ශන අංශය යම් කිසි විමර්ශනයක් කරන්න පොලිස්පතිගේ නියෝගයක් තියෙන්න ඕනේද?

පි: ත්‍රස්ත විමර්ශන අංශය සාමාන්‍ය ත්‍රස්ත විමර්ශන අංශය කෙලින්ම විමර්ශන භාර ගන්නේ නැහැ. ස්වාමිනි ඒක පොලිස්පති දැනුවත්කරලා සාමන්‍යයෙන් ඒක පොලිස්පති දැනුවත් කරලා හරි තමයි භාර ගන්නේ.

ප්‍ර: මෙම කොමිෂන් සභාව ඉදිරියේ තිබෙන සාක්ෂිවලට අනුව එක්තරා අවස්ථාවක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් ත්‍රස්ථවිමර්ශන ඒකකයත් සහරාන් හෂීම් සම්බන්ධයෙන් විමර්ශන පවත්වනවා. දැනට පෙනී යන අන්දමට ත්‍රස්ත විමර්ශන ඒකකයත් ඒ විමර්ශන පවත්වන්නේ ඒ පොලිස්පතිගේ ලැබුණු නියෝගයක් අනුවයි. ඒ එක් අවස්ථාවකදි ත්‍රස්ත විමර්ශන ඒකකයේ නිලධාරීන් ආවේක්ෂණ රාජකාරියක් සිදු කරන'' එක්තරා ස්ථානයක සහරාන් හෂීම් සෙවීම සඳහා එම අවස්ථාවේ දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියෙක් ප්‍රකාශ කරනවා ත්‍රස්ත විමර්ශන ඒකකයේ නිලධාරින්ට එම ආවේක්ෂණයෙන් ඉවත්වෙන්න කියලා එවැනි තීරණයක් ගන්වානම් ඒක ගන්න පුළුවන් කාටද?

පි: පොලිස්පතිවරයාට.

ප්‍ර: පොලිස්පතිවරයාට පමණයි?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: අපරාධ පරික්ෂණ දෙපාර්තමෙන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හෝ අපරාධ පරීක්ෂණ දෙපර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ ඉන් පහළට ඉන්න නිලධාරියෙකුට ඒ තීරණ ගන්න බලයක් තියෙනවද?

පි: ස්වාමිනි ඔතන ප්‍රධාන ගැටලුව තියෙන්නේ ඒ නියෝගය ක්‍රියාත්මක කරපු එක ගැනයි. එයා වෙන කවුරුහරි එයාට ඒවගේ නියෝගයක් ආවනම් එයා ඒවා ක්‍රියාත්මක කරන්න බැඳිලා නැහැ.

ප්‍ර: හරි ක්‍රියාත්මක කරන්න බැඳිලා නැහැ එතනත් ඔබ කියන්නේ ඒක නිවැරදි නෙවේ කියලානේ?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: අර විදියේ නියෝගයක් දීම හරිද වැරදිද ?

පි; නියෝග දෙන්න බැහැ ස්වාමිනි. එහෙම නියෝගයක් දෙනවානම් අවම වශයෙන් අපරාධපරික්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාත් TID එකේ අධ්‍යක්ෂකවරයාත් සාකච්ඡා කරලා තමයි එකඟතාවයකට එන්න

FAIR COMMENT
BY JEZEEM

ඕනේ. නිලධාරින්ට පල්ලෙහායින් නිලධාරින්ට එක එක්කෙනාට නියෝගයක් දී ගන්න ක්‍රමයක් නැහැ. දීගන්නත් බැහැ නියෝග භාර ගන්නත් අයිතියක් නැහැ.

ප්‍ර: අපි උපකල්පනය කරමු එම විමර්ශන දෙකම කරන්නේ පොලිස්පතිවරයාගේ නියෝග අනුව යම් අවස්ථාවක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් ත්‍රස්ත විමර්ශන ඒකකයත් එක ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් යටතේ තියෙනවා කියලා අපි උපකල්පනය කරමු . ඒ අවස්ථාවේදී ඒ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට පුළුවන්ද එවැනි නියෝගයක් දෙන්න පොලිස්පති විමසන්නෙ නැතිව?

පි; පුළුවන් ස්වාමිනි.

ප්‍ර පුළුවන්?

පි: එයාට පුළුවන් මේ කණ්ඩායම් දෙකෙන් කාට හරි එක කණ්ඩායමකට අයින් වෙන්න කියලා කියන්න එයානේ අවසාන වශයෙන් පොලිස්පතිට වග කියෙන්නේ.

ප්‍ර: විමර්ශන කටයුතු අංශ දෙකම විමර්ශන කටයුතු කරන්නේ පොලිස්පතිගේ නියෝග මත?

පි; නමුත් අවසාන වශයෙන් ඒ විමර්ශන දෙක සම්බන්ධයෙන්ම ස්වාමිනි පොලිස්පතිට වගකියන්නේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඒක නිසා එයාට පුළුවන් ඒ ගැන තීන්දුවක් අරගෙන පොලිස්පතිවරයාට..

ප්‍ර: හරි එතකොට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දැනුවත් කිරීමක් නැතිව ඊට පහළ නිලධාරියෙකුට ඒක කරන්න පුළුවන්ද ?

පි: කරන්න බැහැ ස්වාමිනි මම මුලින් සඳහන් කරා වගේ අඩු ගානේ අධ්‍යක්ෂකවරු දෙදෙනා යටතේවත් එකඟතාවයක් තියෙන්න ඕනේ. ඒ එකඟතාවයකින් ඒක සාමාන්‍යයෙන් ප්‍රායෝගික කරන දෙයක් ඒක කලාට එකේ දෝෂයක් දකින්නේ නැහැ. එහෙම වෙනවා සාමන්‍යයෙන් ප්‍රයෝගිකව කරන කොට ආයතන දෙකකින් පරීක්ෂණය කරන කොට සමහර විට එක කණ්ඩායමක් අයින් වෙනවා මොකද ඒක විමර්ශනයට බාධාවක් නිසා ඒක ගැටලුවක් ඇති නොවන විදියට කරන්න පුළුවන් නම් ගැටලුවක් නැහැ. ගැටලුවක් තියෙනවා නම් ඊළඟට දැන් TID එකට එකේදී ගැටලුවක් තිබුණා නම් ඒ ගොල්ලෝ අනිවාර්යෙන්ම ගිහිල්ලා වාර්තා කරන්න ඕනි. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට අපිට මෙහෙම CID එකෙන් මේක කරන්න දෙන් නැහැ අපිට මේක කරගෙන යන්න අවශ්‍යයි. අපිට මේක withdraw වෙන්න බැහැ. ඒ අකාරයෙන් අපිට ඒ ප්‍රශ්නය විසඳ ගන්න තිබුණා.

ප්‍ර: දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීයකුට පුළුවන්ද තොරතුරු කරුවෙක් පවත්වාගෙන යන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හෝ අධ්‍යක්ෂක දැනුවත් කිරීමකින් තොරව ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි: තොරතුරුකරුවන් කිව්වාම ස්වාමිනි මෙහෙමයි ඒ අය දැනුවත් කිරීමට අවශ්‍ය වෙන්නේ දැන් සමහර අවස්ථාවලදී විවිධ පුද්ගලයෝ මේ අයට තොරතුරු කරුවන් විදියට පාවිච්චි කරන්න සිද්ධ වෙනවා එතනදී Adverse Characteries කියලා අන්න ඒ වගේ පුද්ගලයෙක් පාවිච්චි කරනවා නම් තමන්ගේ ඉහල නිලධාරින් දැනුවත් කරන්න ඕනේ.

ප්‍ර: Adverse කියන්නේ අපරාධ පරීක්ෂණ?

පි: අපරාධ දැන් අපරාධ මොනවාහරි දේකට සම්බන්ධ වෙච්ච පුද්ගලයෙක් මොනවහරි නරක චරිතයකට සම්බන්ධ වෙච්ච එක්කෙනෙක් ඒ අයත් සමහර විට අපිට පාවිච්චි කරන්න සිද්ධ වෙනවා අපරාධ කල්ලි පිළිබඳ මේ තොරතුරු ලබා ගැනීමේදී අන්න ඒ වගේ එක්කෙනෙක් develop කරනවා නම් තොරතුරුකාරයෙක් විදියට ඒක ගැන අනිවාර්යෙන්ම තමන්ගේ උසස් නිලධාරියා හරි director හරි තමන්ගේ සහකාර පොලිස් අධිකාරිවරයා හරි කවුරු හරි දැනුවත් කරන්න ඕනේ අනිවාර්යෙන්ම එහෙම නැතිව අනිත් සියලුම තොරතුරු කාරයෝ පිළිබඳව තමන්ගේ උසස් නිලධාරියා දැනුවත් කරලා මේ අවසර ලබා ගැනීමේ ක්‍රමවේදයක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. අවශ්‍යතාවයකුත් නැහැ.

ප්‍ර: යම් පුද්ගලයකුට විරුද්ධව වරෙන්තුවක් තියෙන බව දැනගෙන අපරාධ පරීක්ෂ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුට පුළුවන්ද ඒ තැනැත්තාව තොරතුරුකරු වශයෙන් තියාගන්න?

පි: බැහැ ස්වාමිනි. බැහැ නීතියටත් පටහැනියි වරෙන්තුකරුවන් අත්අඩංගුවට අරගෙන ඉදිරිපත් කිරීම අපි නීතියෙන් බැඳිලා තියෙන කාරණාවක්

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනි සිටින උගත් නීතිඥවරයාට අවශ්‍ය දැයි විමසමි අවශ්‍ය බව ප්‍රකාශ කරයි අවස්ථාව ලබා දෙමි.

****

<u>පල්ලිය වෙනුවෙන් නීතිඥ දුනික පෙරේරා මහතා</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු තමුන්ගේ ස්ථාවරය තමයි තමුන් පොලිස්පති වශයෙන් 2011 ජූනි 29 වෙනිදා සිට 2016 අප්‍රේල් 12 වෙනිදා දක්වා සේවය කල බව?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: තමුන් තවත් සාක්ෂි ලබා දුන්නා මේ සේවය කල මුළු කාලය තුළ දීම තමුන් ජාතික ආරක්ෂක කවුන්සලයේ රැස්වීම්වලට පොලිස්පති වශයෙන් සහභාගි වුණා ?

පි: මම කොළඹින් පිටගිහින් හිටියේ නැත්නම් නිවාඩු ලබා පිට ගිහින් නැත්නම් සහභාගි වුණා අනිවාර්යෙන්ම.

ප්‍ර: දැන් මේ රැස්වීම් සතිපතාම පැවැතුවද?

FAIR COMMENT BY JEZEEM

පි: ඔව් මුලිනුත් මම ඒකට පිළිතුරු දුන්නා සතිපතා පැවැත්වීම තමා සාමන්‍යය සම්ප්‍රදාය වුනේ නමුත් සමහර අවස්ථාවලදී සති පතාම පැවැත්වුයේ නැති වුන අවස්ථාත් තිබුණා ස්වාමිනි.

ප්‍ර: සතිපතාම බදදා දිනවල පැවැත්වීමේ පුරුද්දක් තිබ්බද? යම්කිසි අවදියක?

පි: සාමාන්‍යයෙන් සිරිතක් වශයෙන් බදදා තමයි තිබුණේ නමුත් බදදාට පෝය දවසක් හරි රජයේ නිවාඩු දවසක් වගේ යෙදුනොත් ඊට වෙනත් දවසකුත් පවත්වපු අවස්ථා තිබුණා ස්වාමිනි.

ප්‍ර: සාක්ෂිකරු කෙටියෙන් තමුන්ට පැහැදිලි කරන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට මෙම ජාතික ආරක්ෂක කවුන්සලයේ රැස්වීම් වල ප්‍රධාන කාර්යභාර්ය වුනේ කුමක්ද කියලා?

පි: ප්‍රධාන වශයෙන් සාකච්ඡා වෙන්නේ රටේ පවතින ආරක්ෂක තත්ත්වය තමයි ප්‍රධාන වශයෙන් සාකච්ඡා වෙන්නේ ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ රටේ ජාතික ආරක්ෂාව පිළිබඳව ප්‍රමුඛතාවයක් තමයි මේ රැස්වීම් වල දුන්නේ ?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ඉතින් මේ රැස්වීම් වලට අමරතව බුද්ධි සමාලෝචන රැස්වීමුතුත් පැවැත්තුවා ?

පි: බුද්ධි සමාලෝචන රැස්වීම් පැවැත්වුනේ ආරක්ෂක අමාත්‍යාංශයේ ස්වාමිනි.

ප්‍ර: සාක්ෂිකරු මේ රැස්වීම් දෙක අතර තියෙන වෙනස් කම කෙටියෙන් මෙම කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන්ද?

පි: මගේ අදහස මගේ දැනීමේ හැටියට බුද්ධි සමාලෝචන රැස්වීම ආරක්ෂක අමාත්‍යාංශයේ පවත්වන්නේ අඟහරුවාදා. ආරක්ෂක කවුන්සිලයේ නැත්නම් ආරක්ෂක මණ්ඩලය රැස්වෙන්නේ බදාදා එතකොට බොහෝ දුරට ආරක්ෂක මණ්ඩල රැස්වීමට පෙර සුදානමක් වශයෙන් තමයි අඟහරුවාදා ලේකම්වරයා මේ ආරක්ෂක මේ බුද්ධි සමාලෝචන රැස්වීම පවත්වන්නේ එතනදී ඒ අදාල කණ්ඩායම් සමඟ සාකච්ඡා කරලා සුදානම් වෙලා ආරක්ෂක මණ්ඩලයේදී කථා කරන්න අවශ්‍ය දේවල් මොනවද කියන එකම පෙර සුදානමක් වශයෙන් තමයි බොහෝ දුරට මේ බුද්ධි සමාලෝචන රැස්වීමට පවත්වන්නේ එකම නෙමේ අරමුණ ඒකටත් සහෝයගයක් වශයෙන් support එකක් වශයෙන් තමයි මේ බුද්ධි සමාලෝචන රැස්වීම් පවත්වන්නේ.

ප්‍ර: දැන් සාක්ෂිකරු ජාතික ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම්වල බුද්ධි තොරතුරු බෙදා ගැනීමේ හුවමාරු කර ගැනීමේ පුරුද්දක් තිබුණාද වැදගත් ජාතික ආරක්ෂාවට වැදගත් බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීමේ පුරුද්දක් තිබුණද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: හුවමාරු කර ගැනීම සිද්ධ වෙන්නේ මේ විදියටයි දැන් මෙතන දි මම මුලින් සඳහන් කරා වගේ රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා ඊළඟට යුද හමුදාවේ බුද්ධි අංශයේ ප්‍රධානියා මේ දෙන්නා තමයි ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කිරීම් කරන්නේ බුද්ධි තොරතුරු ගැන ඊට අමරතව හමුදාපතිවරුන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානීන් පොලිස්පතිවරයා ඒ අයවලුන්ට තියෙන කාරණා සාකච්ඡා කරනවා එතන දී ඉදිරිපත් වෙන කාරණා එතන ඉන්න සියලුම දෙනා ඒවා සටහන් කර ගෙන බෙදා හදා ගන්න ඕනේ. ඒ ක්‍රමයට තමයි ඒ බුද්ධි තොරතුරුත් අනෙකුත් කාරණා බෙදා හදා ගැනීම සිද්ධ වුනේ.

ප්‍ර: දැන් සාක්ෂිකරු තමුන්ගේ සාක්ෂියේ තමුන් ලබා දුන්නා මෙම රැස්වීම්වල මුල සුන ගරු ජනාධිපතිතුමා බවට?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ඊට අමරතව ගරු අගමැති සහ ආරක්ෂක ලේකම් සහ නීතිය හා සාමය ඇමතිතුමාත් සහභාගි වෙලා තියෙනවා මේ රැස්වීම්වලට?

පි: නීතිය හා සාමය පිළිබඳ ඇමතිතුමා සහභාගි වුනාද කියන එක මට හරියටම කියන්න මතකයක් නැහැ. ඒ අමාත්‍යාංශයේ ලේකම්තුමා නම් සහභාගි වුනා. දැන් ආරක්ෂක ආමාත්‍යාංශයේ වෙන් වුනාට පස්සේ පොලීසියේ නීතිය හා සාමය අමාත්‍යාංශයට ගියාට පස්සේ නීතිය හා සාමය අමාත්‍යාංශයේ ලේකම්තුමා නම් සහභාගි වුනා පොලිස්පතිතුමන් සමඟ මේ රැස්වීම්වලට අමාත්‍යතුමා ආවද කියන එක මට හරියටම නිශ්චිතව කියන්න අමාරුයි මේ වෙලාවේ.

ප්‍ර: දැන් තමුන්ගේ පළපුරුද්ධ අනුව මෙම ආරක්ෂක රැස්වීම් කැඳවන්නේ කවුද?

පි; ඒ පරිපාලන යාන්ත්‍රණය මං හරියටම දන්නේ නැහැ නමුත් මගේ දැනිමේ හැටියට ආරක්ෂක ලේකම්වරයා තමයි මේ සඳහා මුලිකව බව ගෙන කටයුතු කරන්නේ කියලා.

ප්‍ර තමන් පොලිස්පති වශයෙන් කටයුතු කරන?

පි: මට දැනුම් දෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයෙන් සහභාගි වෙන්නයි කියලා.

ප්‍ර; තමුන් එලෙස සහභාගි වෙලා තිබෙන අවස්ථාවලදී කිසිම අවස්ථාවක මුස්ලිම් අන්තවාදී ගැන බුද්ධි තොරතුරු ගැන මේ රැස්වීම්වල සාකච්ඡා වුනාද?

පි: මම මුලිනුත් සඳහන් කරා කීප අවස්ථාවකදීම මේ ඉස්ලාම් අන්තවාදය ගැන සහ ISIS සංවිධානයේ ක්‍රියාකාරකම් ගැන අවස්ථා ගණනාවකදී සාකච්ඡා වුණා මාගේ කාල පරිච්ඡේදය තුල .

ප්‍ර: ලංකාවේ ක්‍රියාකාරීව සිටින මුස්ලිම් අන්තවාදීන් පිළිබඳව සාකච්ඡා කරාද?

FAIR COMMENT
BY JEZEEM

පි: එතනදී විශේෂයෙන්ම මේ සහරාන්ගේ කණ්ඩායම ගැන තමයි අන්තවාදී විදියට ඒ කාලවකවානුව තුල ඉස්මතු වෙලා තිබුණේ ඒ අය ගැන කථා වුනා. සාකච්ඡා වුනා.

ප්‍ර: මෙම රැස්වීම්වලදි කොයි අවස්ථාවක හරි මෙම මුස්ලිම් අන්තවාදී කණ්ඩායම විසින් කතෝලික පල්ලිවලට යම් කිසි ත්‍රස්තවාදී ප්‍රහාරයක් එල්ලකිරීම ගැන තර්ජනයක් ගැන වාර්ථා වෙලා තියෙනවාද?

පි: මගේ කාලයතුල එහෙම නිශ්චිත තොරතුරක් සාකච්ඡා වුනේ නැහැ.

ප්‍ර; තමුන්ට එලෙස වාර්තා වෙච්ච බුද්ධි තොරතුරක් ගැනවත් ආරංචියක් ඇවිල්ලා තිබෙනවාද?

පි: නැහැ. මගේ ඒකාල සීමාව තුල ස්වාමිනි නිශ්චිත තොරතුරක් තිබුන් නැහැ ඒ පිළිබඳ

ප්‍ර: සාක්ෂිකරු තමුන්ගේ පළපුරුද්ද සහ දැනුම අනුව අපරටේ කොයි අවස්ථාවක මාස ගණනාවක ට මෙම ජාතික ආරක්ෂක කවුන්සිල් රැස්වීම් පැවැත්වුනේ නැත්නම් එය ජාතික ආරක්ෂාවට කොයි විදියේ බලපෑමක්ද තිබෙන්නේ තමුන්ගේ බලපෑම අනුව?

පි: මට ඒ ගැන කියන්න තරම් විශේෂඥ දැනුමක් නැහැ.මම දන්නේ නැහැ ආරක්ෂක මණ්ඩලය රැස් නොවෙන කොට ඒ වෙනුවට විකල්පය මාර්ග අනුගමනය කරා ද කියන එක ගැන මම හරියට නොදැන ඒ ගැන පිළිතුරක් දෙන්න අපහසුයි ස්වාමිනි.

ප්‍ර: තමුන් සේවය කරපු පොලිස්පති ලෙස සේවය කරපු කාලයේදී එලෙස මාස ගණනාවක්ම කොයි අවස්ථාවක හරි ජාතික ආරක්ෂා කවුන්සලය රැස්නොවී තිබුණු අවස්ථා තිබුණද?

පි: මාස ගණනාවක් නම් රැස් නොවී තිබුණේ නැහැ.

ප්‍ර; දැන් සාක්ෂිකරු ඊට අමරතව තමුන් සාක්ෂි දෙද්දි කිව්වා 2019.අප්‍රේල් 21 වෙනි දින පිළිබඳ ලැබිච්ච බුද්ධි තොරතුරු ඉන් පසුව ලැබිච්ච අනාවරණවලින් හෙලි වුනේ ඒ ප්‍රහාරය ත්‍රස්වාදී ප්‍රහාරයක් ලෙසට?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර; ඇයි තමුන් එය ත්‍රස්වාදී ප්‍රහාරයක් ලෙසට විතරක් නම් කරන්නේ සාමාන්‍ය ප්‍රහාරයක් නොමැතිව?

පි: මේ වගේ ප්‍රහාරයක් වෙන කොයි විදියටද නම් කරන්න ඕනේ කියන එක මට නම් අවබෝධයක් නැහැ මම දන්න වචනයක් නැහැ ඒකට.

ප්‍ර; එමනිසා තමුන්ට යෝජනවා කරනවා සාක්ෂිකරු මෙවැනි ප්‍රහාරයක් පිළිබඳව විශේෂ සැලකිල්ලක් දැක්වීමට රජය විසින් කටයුතු කරන්න තිබුණා කියලා?(ප්‍රශ්නය ඉල්ලා අස් කර ගනීයි)

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි කොමිෂන් සභාවේ ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්යට දැක්වූ දායකත්ව සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ ස්තූතිය සාක්ෂිකරුට පලකරනවා.

සාක්ෂිකරු මුදා හරිනවා.

දැන් වේලාව: 7.45

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.07.17 වේලාව :- ප.ව. 8.00

සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධිනීතීඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධි නීතිඥ අරින්ද්‍ර ජයසිංහ පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ දූතික පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

FAIR COMMENT BY JEZEEM

විවේකයෙන් පසු කොමිෂන් සභාව නැවත රැස්වෙයි.
වැඩිදුර සාක්ෂි සඳහා කැඳවනවා.

සාක්ෂිකරු ගේ නම: වරුණ සංජීව ඒකනායක ජයසුන්දර.
ප්‍රතිඥා පිට.

<u>අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර; ජයසුන්දර මහත්මයා ඔබ පසු ගිය අවස්ථාවේදී මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කෙරුවා ඔබ ත්‍රස්ත විමර්ශන අංශයේ අධ්‍යක්ෂක ඒකකයේ අධ්‍යක්ෂක විදියට කොට්ඨාශයේ අධ්‍යක්ෂක විදියට 2018 .12. 15 වෙනි මාසේ පත් වීම ලැබුවායි කියලා?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර; ඒ වගේම ඔබ සඳහන් කරනු ලැබුවා නොයෙකුත් අවස්තාවලදි සහරාන් හෂිම්ව අත්අඩංගුවට ගැනීම සඳහා ඔබ ගේ කොට්ඨාශය උත්සහ දරනු ලැබුවාය කියලා?

පි; එහෙමයි ස්වාමිනි.

ප්‍ර; ඔබ එතකොට දන්නවා නේද සහරාන් හෂිම් අත්අඩංගුවට ගැනීම සඳහා ඔබේ කොට්ඨාශය විසින් වරෙන්තුවක් විවෘත වරෙන්තුවක් කොළඹ මහෙස් ත්‍රාත් අධිකරණයෙන් ලබා ගත්තා කියලා?

පි; එහෙමයි උතුමාණනි.

ප්‍ර: ඒ විවෘත වරෙන්තුව ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරපු අධ්‍යක්ෂකවරයා කවුද?

පි: එවකට නියෝජ්‍ය පොලිස්පති විදියට රාජකාරි කරේ නාලක සිල්වා මහත්තයා ,ජගත් ක්‍රිෂාන්ත මහත්මයා හිටියා වැඩබලන අධ්‍යක්ෂකවරයෙක් විදියට..

ප්‍ර: ඔබ රාජකාරි ආරම්භ කරාට පස්සේ කොට්ඨාශයේ අධ්‍යක්ෂකවරයා විදියට මේ ලේඛණ දකින්න හම්බුනාද?

පි: ලේඛන දකින්න හම්බුනා .

ප්‍ර එතකොට මා ඔබේ අවධානය දැන් යොමු කරන මේ විවෘත වරෙන්තුව දකින්නට ලැබුණාද ?

පි: එහෙමයි.

ප්‍ර: ඒ අනුව ඔය විවෘත වරෙන්තුව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ ඔබේ නිලධාරීන් ට උපදෙස් දුන්නාද?

පි: එහෙමයි උතුමාණනි මේ වරෙන්තුව නිකුත් කරලා තිබ්බේ ජූලි 09 වෙනිදා මං අධ්‍යක්ෂක තනතුරට පත් වුනේ දෙසැම්බර් මාසේ ඊට පස්සේ අවස්ථා කීපයකම මේ වරෙන්තුව ක්‍රියාත්මක කිරීම සඳහා මගේ නිළධාරීන් ක්‍රියාත්මක වෙලා තිබ්බා. විශේෂයෙන්ම මම රාජකාරි භාර ගත්තාට පස්සේ 2019 ජනවාරි 15 වෙනිදා උප පොලිස් පරික්ෂක

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

රත්නායක ඇතුලු කණ්ඩායමක් කාත්තන්කුඩි ප්‍රදේශයට ගිහිල්ලා තිබ්බා මේ වරෙන්තුව ක්‍රියාත්මක කරන්න.

ප්‍ර: ඔව් ඔබ කිව්වා පසුගිය අවස්ථාවේදී එහෙම ගිහිල්ලා ඒ වරෙන්තුව ක්‍රියාත්මක කරන්නට ගියා කියලා?

පි; ගියා.

ප්‍ර: එතකොට මොකද වුනේ?

පි: අවස්ථා මෙතන සඳහන් වෙනවා 2009 ජනවාරි 15 උප පොලිස් පරීක්ෂක රත්නායක ඇතුලු කණ්ඩායමක් කාත්තන්කුඩි අක්කර පත්තු ප්‍රදේශවලට ගිහින් තිබ්බා.

ප්‍ර: වරෙන්තු ලබා ගත්තාට පස්සේ වෙන්න ඇති?

පි; පස්සේ. එහෙමයි උතුමාණනි.ඒ වගේම කැකුණගොල්ල ප්‍රදේශයට සහරාන්ගේ බිරිඳ ඉන්න ප්‍රදේශයට 2019 පෙබරවාරි 28 වෙනිදා කණ්ඩායමක් පිටව ගොස් තිබ්බා අපිට තොරතුරු ලැබිලා සහරාන් සැඟව ඉන්නවා කියලා බිරිඳගේ ගම් ප්‍රදේශයේ.

ප්‍ර: ඔව් අත්අඩංගුවට ගන්න පුළුවන් වුනාද?

පි: බැරි වුනා.

ප්‍ර: යම් අවස්ථාවකදී ඔබේ නිලධාරීන් ඒ සහරාන්ව සොයාගෙන ගියපු අවස්ථාවේදී යම් වෙනත් විමර්ශන අංශයක් විසින් ඔබේ නිලධාරීන් ඒ සම්බන්ධයෙන් තවදුරටත් පියවර ගැනීම වලක්වාලනු ලැබුවාද?

පි; ඒ කැකුණගොල්ලගොල්ල ප්‍රදේශයට ගිය කණ්ඩායම ඒ ගිහින් තිබ්බා සහරාන්ගේ නෝනාගේ ගෙදරට ගිය වෙලේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිලධාරී කණ්ඩායමක් දන්නලා තිබ්බා මේ ඒ ගොල්ලෝ විමර්ශනය කරනවා මේක ඒ ගොල්ලෝ ඉන්නේ සහරාන් ගැන මේවා කරන්න එ නිසා අපිට ඉවත් වෙන්න කියලා

ප්‍ර: ඔව් එතකොට මොකද කලේ?

පි: වෙලා තිබ්බේ ඇත්තටම මේක මට එතන හිටපු භූමියට ගිය නිලධාරියා කතා කරේ නැහැ. මං හිතන්නේ මේක මගේ දෙවනියා හිටියා ජගත් ක්‍රිෂාන්ත දැනට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් එතකොට වුනේ කැකුණගොල්ලේ ගිහින් ඒ ගෙදර බලද්දි පිරිමි පුද්ගලයෙක් ඇවිල්ලා තිබ්බා මං හිතන්නේ සහරාන්ගේ brother-in-law, wife ගේ මල්ලි කියලා තිබ්බා මෙහෙමයි අපිට CID එකෙන් number එකක් දිලා ගියා මොනවාහරි තොරතුරක් තියෙනවා නම් කියන්න ඇයි ඔය ගොල්ලෝ ආවේ කියලා. අහලා තිබ්බා මගේ නිලධාරින්ගෙන්. පස්සේ එයාම call එකක් අරන් තිබ්බා CID නිලධාරීන්ට පස්සේ phone එක දීලා කතා කරද්දි මෙතන සහකාර පොලිස් අධිකාරි වරයෙක් හරි එතන හිටපු පරීක්ෂක ශ්‍රේණියක නිලධාරියෙක් ඇවිල්ලා කියලා තිබ්බා මගේ නිලධාරීන්ට CID එක මෙම inquiry එක කරනවා. ඒ නිසා ඒකට

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

disturb වෙන්න පුළුවන් මගේ කණ්ඩායමට ඉවත් වෙන්න කියලා. ඊට පස්සේ එතන හිටපු නිලධාරියා OIC ටත් කතා කරලා මේ මගේ number 2 හිටපු එස්.පි ජගත් ක්‍රිෂාන්තටත් කතා කරලා ඒ තැනින් ඉවත් කරලා තිබ්බා.

ප්‍ර: ඒ කියන්නේ ඔබ තමයි අධ්‍යක්ෂක විදියට ඒ අවස්ථාව වන විට කොට්ඨාශයේ වැඩ බැලුවේ?

පි: ඔව්.

ප්‍ර: රාජකාරි කලේ?

පි: එහෙමයි .

ප්‍ර: එතකොට එදින ඔබ කියන්නේ ඔබ හිටියේ නැහැ ඒ නිසා ඔබේ දෙවනියා වුන ජගත් ක්‍රිෂාන්ත මහත්මයාට කතා කරා කරනු ලැබුවා ඔබේ නිලධාරියා කියලා?

පි: මම හිටියා ඒ ගිය කණ්ඩායම මාව Contact කර ගත්තේ නැහැ. මම එතකොට මම අනිවාර්යෙන්ම හිටියා . පස්සේ මොකද මෙම සිද්ධියත් එක්ක බලද්දි ජගත් ක්‍රිෂාන්තට තමයි කතා කරලා තිබ්බේ.

ප්‍ර: දැන් ඔහු එතකොට දරපු තනතුර මොකක්ද?

පි: පොලිස් අධිකාරි තනතුරේ නියෝජ්‍ය අධ්‍යක්ෂක විදියට හිටියේ.

ප්‍ර නියෝජ්‍ය අධ්‍යක්ෂක ඒ කියන්නේ ඔබ ළඟට ඉන්න ජ්‍යෙෂ්ඨතම පුද්ගලයානේ ඔබට පසුව ජ්‍යෙෂ්ඨතම පුද්ගලයානේ?

පි; ජ්‍යෙෂ්ඨ නිලධාරියා.

ප්‍ර: හොඳයි ඒ අනුව තමයි ඔවුන්ව හම්බෙලා තිබුණේ? ඒ ආකාරයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔබේ නිලධාරීන්ට ඒ ගැන සඳහන් කරන අවස්ථාව වන විට ඔබේ කොට්ඨාශය සහරාන් අත්අඩංගුවට ගැනීම සහ ඒ සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම සිදු කරනු ලැබුවේ කාගේ නියෝගයක් මතද? දැන් ඔබ කිව්වානේ ඔබ කියෙව්වා කියලා ඔබ ඔය තනතුරේ රාජකාරි ගත්තාට පස්සේ මේ අදාල ගොනුව?

පි; ඔව්

ප්‍ර; කාගේ නියෝගයක් මතද මොන කරුණු නිසාද ඔබේ කොට්ඨාශයේ ඔය විමර්ශන ආරම්භ කරේ?

පි: පොදුවේ ගත්තොත් උතුමාණනි මේ මොහොමඩ් සහරාන් කියන පුද්ගලයා සම්බන්ධව නිරන්තරයෙන් විශේෂයෙන්ම පොලිස්පතිවරයා වෙත යොමු කරන ලද විමර්ශන වාර්ථා මට පෙර සිටපු අධ්‍යක්ෂකවරුන්,නියෝජ්‍ය පොලිස්පති නාලක සිල්වා මහත්මයාගේ කාලේ ඉදන්ම මෙයාව trail කරා. එතකොට මගේ පිරියඩ් එකෙත් මේ සම්බන්ධව නිලධාරීන් ක්‍රියාත්මක වුනා files මා ගාවට ආපු නිසා එතැනදි අනිවාර්යෙන්ම මාගේ නියෝගය යනවා පල්ලෙහාට. මොකද

FAIR COMMENT BY JEZEEM

මේ හැම විමර්ශන ගොනුවකටම සමහර වෙලාවට අපි ලිත් දින දෙනවා සති තුනකින් වාර්තා කරන්න කියලා. ඉතින් ඒ අනුව තමයි නිලධාරින් නිරන්තරයෙන්ම මේක ක්‍රියාත්මක වුනේ ඒ වගේම දැන් මෙයාව අපි හොය හොය ඉද්දි ඒ කැකුණගොල්ලට ආවා කියන තොරතුරට තමයි නිලධාරීන් ගිහින් තිබ්බේ එතකොට නමුත් අර තොරතුර සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉවත් වෙනන්න කියන කියපු දේ මගේ අවධානයට යොමු වුන් නැහැ ඒ දවසේ.

ප්‍ර: ඔව් දැන් මා ඔබෙන් ඇහුවේ ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශය සහරාන් හසීන්ට අදාලව විමර්ශන ආරම්භ කෙරුවේ කාගේ උපදෙස් මතද මොන හේතුවක් නිසාද කියලානේ? ඔබ දන්නවා ඒ ඇයි කියලා ආරම්භ කෙරුවේ ඔබ දන්නවාද රාජ්‍ය බුද්ධි සේවය විසින් විවිධ අවස්ථාවල් වලදී එහෙම නැත්නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සමහර අවස්ථාවල් වලදී පොලිස්පතිවරයාට යොමු කරන ලද ඇතැම් තොරතුරු සම්බන්ධයෙන් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයට විමර්ශන කරන්නට කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට වැඩියෙන් ඇත්තටම රාජ්‍ය බුද්ධි අංශයෙන් ලැබුණු තොරතුරු සම්බන්ධයෙන් විමර්ශනය කරන්නට කියලා පොලිස්පතිවරයා වරින් වර ඔබේ කොට්ඨාශයට උපදෙස් දීලා තිබුණා?

පි: පොලිස්පතිවරයා දීලා තිබ්බා ඒ වගේම මගේ පාලන කාලය තුල මේ කියන ගොනු 15 ක් සංසරණය වෙද්දි ඒක අපි 11ට අඩු කරලා තිබ්බා. මගේ මතකය හැටිය විශේෂයෙන් පොලිස්පතිවරයා මගේ කාලය තුල දී එවලා තිබ්බේ නැහැ මගේ මතකය හරිනම් හැබැයි මේවා උතුමාණනි මේ සර්කියුලේට් වුනා.

ප්‍ර: හැබැයි මේ ඔබ රාජකාරි පටන් ගන්නට ඉස්සරවෙලා මේ විමර්ශනය ආරම්භවෙලා තිබුණානේ ?

පි: ආරම්භවෙලා තිබුණා විශේෂයෙන්ම 2017 අර කාත්තන්කුඩි සිද්ධියත් එක්ක

ප්‍ර: එතකොට දැන් ඔබලා සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යන මේ ආයතන දෙකම එහෙනම් අපිට පේන විදියට සහරාන් සම්බන්ධයෙන් විමර්ශන පවත්වනවා?

පි; එහෙමයි.

ප්‍ර; ඒ වෙනකොට එතකොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඔබේ නිලධාරීන්ට දැනුම් දුන්නාට පස්සේ ඔබ කිව්වා ඔබේ නිලධාරීන් ඔබේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාව සම්බන්ධ කරගෙන ඔවුන්ට ඒ භූමියෙන් ඉවත් වෙන්නට කියලා දුන්න ඒ උපදෙස සම්බන්ධයෙන් ඔබේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාව දැනුවත් කරා කියලා?

පි; ඔව්.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර; ඒ අවස්ථාවේදී ඔබේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයා මොකක්ද දීලා තිබුණ උපදෙස?

පි: මේක උතුමාණනි ඇත්තටම මේ මම ටී.අයි.ඩී. එකේ නැති වුනත් මං පොලිස් පරීක්ෂක ප්‍රධාන පොලිස් පරික්ෂක පතිරණ නිලධාරියාගෙන් ඇහුවා මේ 28 වෙනිදා මේ ඉවත්වීම වුනේ මේ ගොල්ලෝ කාටද කතා කරලා තිබ්බේ කියලා පස්සේ කිව්වා සර් කතා කරලා ජගත් ක්‍රිෂාන්ත සර් ට කතා කරලා තිබ්බේ සර්ට නෙමේ කතා කරලා තිබ්බේ. ඒ අනුව ඒ ගෝල්ලෝ එතැනින් ජගත් ක්‍රිෂාන්තව දැනුවත් කරලා ඉවත් වුනා කියලා.

ප්‍ර: එතකොට එහෙමනම් අනිවාර්යෙන්ම ජගත් ක්‍රිෂාන්ත මහත්මයා ඒ සම්බන්ධයෙන් ඒ ඉවත් වීමට උපදෙස් දෙන්නට ඇතිනේ?

පි; එහෙමයි.

ප්‍ර: දැන් ඒ වගේ අවස්ථාවල් වලදී ඔබේ කොට්ඨාශයේ යම් ක්‍රමවේදයක් තිබුණේ නැද්ද අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාත් සමඟ සම්බන්ධ වෙලා ඒක ගැන සාකච්ඡා කරලා ඒ පැවතුණ තත්ත්වය සලකලා බලලා යම් තිරණයකට පැමිණිමෙන් පසුව පමණක් ඒ ස්ථානයෙන් ඉවත් වන්නට?

පි; ඒ වෙච්ච සංසිද්ධිය ගද්දි උදාහරණයක් විදියට මගෙන් ඇහුවා නම් මං අනිවාර් යෙන්ම ඔබ තුමියත් එක්ක එකඟ වෙනවා. මම ඩිරෙක්ටර්ට CID ට කතා කරනවා. මං ඒක මං කතා කරලා අහනවා මෙහෙම ඉවත් වීම අපි ඉවත් වීමක් කරනවා කියලා. ඒ වගේම අපි සාමාන්‍යයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අපේ ශ්‍රී ලංකා පොලිසියේ ඉන්න ප්‍රමුඛතම විමර්ශන ඒකකය ඉතින් ඒ ගොල්ලෝ විමර්ශනයක් කරනවා කියලා එතන වගකිව යුතු පුද්ගලයෙක් විශේෂයෙන්ම නියෝජ්‍ය අධ්‍යක්ෂක වරයෙක් වෙනවා සහකාර පොලිස් අධිකාරිවරයෙකුත් කිව්වොත් අපි අනිවාර්යෙන් අපි priority එක දෙනවා CID එකට

ප්‍ර: ඇයි ඒ ?

පි ඒ කියන්නේ මෙතන කන්ඩායම් දෙකක් surveillance උදාහරණයක් විදියට ආවේෂණයක් දාලා තියෙන එකත්. සමහර විට හැප්පෙන්න පුළුවන් ඒ කියන්නේ අපි දැන් අපි එකම පුද්ගලයෙක් අත්අඩංගුවට ගන්න යද්දි ඒ තැන අපිට secure කරලා දැන් එතන මම හිටපු නැති නිසා මැඩම් මට කියන්න අමාරුයි නමුත් අපි හිතුවොත් ඒ ගොල්ලෝ දැනටමත් එතන ඉන්නවා විමර්ශනයක් කරනවා විශේෂයෙන්ම වනාතවිල්ලුවේ සිද්ධියත් එක්ක එතැනදී අපි priority එක දෙනවා CID එකට උදාහරණයක් විදියට දැන් දෙසැම්බර් 26 බුද්ධ පිළිම කඩපු වෙලේ මම යැව්වා ටීම් එකක් මාවනැල්ලට. මාවනැල්ලට යවලා . මම කිව්වා මේක ගිහින් බලන්න කියලා. ඊට පස්සේ ඒ වාර්තාවකුත්

FAIR COMMENT — BY JEZEEM

තියෙනවා මං ගත්ත පස්සේ අපේ කට්ටිය තොරතුර සොයද්දි මට කිව්වා CID එක inquiry එක take over කරා කියලා එතකොට මැඩම් සාමාන්‍යයෙන් CID එක take over කරොත් අපේ tradition එකක් තමයි අපි අපේ අය තමයි පොලිස්පති යටතේ ක්‍රියාත්මක වෙන්නේ Independent Organization එකක් අපේ අය ඒක මැදට ගිහින් ආයේ inquiry කරන්න යන්නේ නැහැ. පස්සේ එදා සිද්ධිය බුදු පිළිම සිද්ධිය දවසේ පහුවදා මගේ ටීම් එකට කතා කරද්දි කිව්වා සර් CID එක take over කරා මං කිව්වා හරි CID කරනවානම් ඔයගොල්ලෝ අයින්වෙලා එන්න කියලා. පස්සේ සරල උදාහරණයක් මං කියන්නේ මැඩම් එහෙම custom එකක් තමයි පොලිසි අතේ තියෙන්නේ.

ප්‍ර; ඒ අනුවද එහෙම නම් මේ අවස්ථාවේදීත් ජගත් ක්‍රිෂාන්ත මහත්මයා අර කැකුණගොල්ලේ දී සහරාන්ව සොයන්නට ගිය අවස්ථාවේ ඔබේ නිලධාරින් විවෘත වරෙන්තුව ක්‍රියාත්මක කරන්නට ඔවුනට ඒ ස්ථානයෙන් ඉවත් වෙන්නට කියලා එහෙනම් උපදෙස් දීලා තියෙන්නේ?

පි; ඔව් ඒක විශේෂයෙන්ම මැඩම් මේ clarify කර ගන්න ඕනේ ගිය officers ලා ගෙන් ඒ කියන්නේ මට ප්‍රධාන පොලිස් පරික්ෂක පතිරණ කිව්වේ ජගත්ට කතා කරා කියලා පොඩ්ඩක් confirm කර ගන්න ඔනේ ජගත්ට ද එහෙම නැත්නම් ASP ටද කතා කලේ කියලා.

ප්‍ර: හොඳයි නමුත් දැන් මට ඇත්තටම දැන ගන්න අවශ්‍ය දේ තමයි ඔබට නම් කතා කරේ ඒ නිලධාරීන් ඔබ ගන්න පියවර ඔබ කියන විදියට අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවෙන්තුවේ අධ්‍යක්ෂකවරයාත් එක්ක කතා කරලා ඊට පස්සේ තමයි ඒ වගේ තීරණය කර එන්නේ කියලා?

පි: ඔව් උදාහරණයක් විදියට එතකොට හිටියේ Director ශානී ඉතින් මම අහනවා ශානිගෙන් මෙහෙම දෙයක් තියෙනවා අපි withdraw වෙනවා. මොකද අපිටත් වරෙන්තුවක් නිකුත් කරලා තිබ්බා අත්අඩංගුවට ගන්න කියලා සහරාන්ව එතකොට වරෙන්තුව ක්‍රියාත්මක කිරීමේ බලය තියෙනවා

ප්‍ර: තියෙනවානේ නීත්‍යානුකූලව ඔව් ?

පි: ඔව් එහෙමයි එතකොට නමුත් CID එකත් ඉද්දි එතන ඒගොල්ලෝත් දන්නවා සහරාන්ට වරෙන්තුවක් ක්‍රියාත්මක වෙනවා කියලා. වරෙන්තු දෙකක් ඇත්තටම කාත්තන්කුඩි සිද්ධියටයි අපි කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයට කරපු කරුණු දැක්වීම. ඉතින් ඒ වෙලේ මගේ අවධානට යොමු වුනා නම් මම අනිවාර්යෙන්ම චෙක් කරනවා

ප්‍ර: හොඳයි දැන් ඊලඟට මට දැනගන්නට ඕනේ ඔබෙන් 2019 අප්‍රේල් මාසේ 09 වෙනිදා එවකට පොලිස්පතිව හිටි පුජිත ජයසුන්දර මහත්මයා ගෙන් ඔබට ලිපියක් ලැබුනාද?

FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි උතුමාණනි .

ප්‍ර: ඒ ලිපිය ඔබ ලග තිබෙනවාද?

පි: එහෙමයි.

එය ස්වාමිනි දැනටමත් C 768 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙනවා.

ප්‍ර; දැන් ඒ ලිපිය ලැබුණාට පස්සේ ඔබ මොකද කරේ?

පි; මේ ලිපිය ලැබුණාට පස්සේ මා කලින් සඳහන් කරපු ආකාරයට මම ඇත්තටම ඒ ලියුම කියෙව්වා මේ අප්‍රේල් 10 වෙනිදා මට ලැබිලා තිබ්බේ මේකේ content එක සමානයි top secret eyes only කියලා තිබ්බා. ඒ වගේම top priority කියලා ඒ කියන්නේ content එක යටින් ඒක ඇත්තම ලියුම අපේ සි.එන්.අයි. හිටපු සිසිර මෙන්ඩිස් මහත්මයා ලියලා තිබ්බේ හිටපු පොලිස්පතිවරයාට එතකොට පොලිස්පතිවරයා secret top priority කියලා පොලිස් නිලධාරීන් 4 දෙනෙක් වෙත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත යොමු කරලා තිබ්බා එතන යටින් Director CTID කියලා මටත් යොමු කරලා තිබ්බා මැඩම් මේක යට FNA කියලා දාලා sign කරලා තිබ්බා. එතකොට තොරතුරේ සඳහන් වුනේ ඇත්තටම information එකක් මේ සහරාන් හසීම් කියන Sri Lankan Based ලංකාවේ ස්ථාන ගත වෙච්ච ක්‍රියාත්මක වන අහවලා මරාගෙන මැරෙන ත්‍රස්තවාදී ප්‍රහාරයක් කරන්න සැලසුම් කරලා තියෙනවා මේ සඳහා possible targets කියලා විය හැකියි හිතන්න පුළුවන් ඉලක්ක වෙත Churches පල්ලි සහ ඒ වගේම probable target එකක් විදියට ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය නම් කරලා තිබ්බා ඒ වගේම recognizance conduct කරලා තිබ්බා කියලා තිබ්බා ඒ වගේම මාදලි 4 කින් ප්‍රහාරය එල්ල කරන්න සමාජිකයන් 6 දෙනෙක් ගැනත් සඳහන් වෙලා තිබ්බා. ඒක තමයි ලියුම මම දැකපු content එක

ප්‍ර: ඒ ලිපියට අමතරව ඇමුණුමකුත් ඔබට ලැබුණාද?

පි: ඇමුණුම් දෙකක් තිබ්බා .

ප්‍ර; මොනවාද ඒ ඇමුණුම්?

පි: එක ඇමුණුමක් තිබ්බා සිංහලයෙන් ටයිප් කරලා ඒකේ තිබ්බා මේ මොහොමඩ් සහරාන් ඇතුලු සමාජිකයන් හතර දෙනෙක්ගේ එයා ඇතුලු හතර දෙනෙක්ගේ විස්තර තිබ්බා. ඔව් ඊට පස්සේ ඉංග්‍රීසියෙන් තිබ්බා attachment එකක් ඒක තිබ්බෙත් අර mode of attack සහ ඒ කියන්නේ ප්‍රහාරය එල්ල කරන්න පුළුවන් ක්‍රම හතර සහ සාමාජිකයන් පස්දෙනාගේ නම්.

ප්‍ර: එම තොරතුරු C 768 හිත් ගැබ්ව තියෙනවා?

පි: ඔව් උතුමාණනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ස්වාමිනි සිංහල භාෂාවෙන් මේ C 768 දරණ ලෙස ලකුණු කරන ලද ලේඛණය සමඟ සාක්ෂිකරු වෙත එවා තිබුණාය කියා ඔහු විසින් හඳුනා ගන්නා ලද ලේඛණය C 768 A වශයෙනුත් ඉංග්‍රිසි භාෂාවෙන් ඔහු වෙත එවා තිබූ ඇමුණුම C 768 B වශයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

ප්‍ර: ඔබ මේ ලේඛන කියවලා දැන් ගරු කොමිෂන් සභාවට සඳහන් කරන ලද කරුණු උකහා ගත්තාට පස්සේ ඊළඟට මොකක්ද ඔබ ගත්ත පියවර?

පි: මම උතුමාණනි මගේ ස්ථානාධිපතිවරයාටත් මට මතක හැටියට සහකාර පොලිස් අදිකාරිවරයාටත් එන්න කිව්වා මගේ office එකට ආවට පස්සේ එදා අප්‍රේල් 10 වෙනිදා මං දෙන්නාටම මං මේ document එක පෙන්නුවා කියවන්න දීලා මං කිව්වා .

ප්‍ර; දැන් ඔබට ලේඛණ තුනක් ලැබුණායි කිවානේ?

පි: තුනම පෙන්නුවා.

ප්‍ර; තුනම පෙන්නුවා.

ප්‍ර; තුනම පෙන්නලා කිව්වා top secret eyes only මේක පොටෝ කොපි ගහන්නවත් out word කරන්නවත් එපා මේ අනිවාර්යෙන්ම මේ ගහන්න යන්නේ සහරාන්ලා ඒ නිසා මේකට ගන්න ඕන පියවර කියලා මං verbally දුන්නා instructions දීලා මගේ අත්අකුරෙන් මං මෙතන ලිව්වා රහසිගතයි කියලා මං ලකුණු කරා මොහොමඩ් සහරාන් හෂිම් X කියලා ඒ වගේම ඔහුගේ මල්ලි රිල්වාන් X1 කියලා ඒ වගේම මිල්හාන් කියන පුද්ගලයා X2 සහ ආමි මොහිදීන් X3 කියන විදියට නම් කරලා මං ලිව්වා මගේ අත් අකුරින්ම X සිට X3 සඳහන් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට ක්‍රියා කරන ප්‍රගතිය 2019.05.01 වන දිනට වාර්තා කරන්න කියලා මං සයින් කරා.ඒ කරලා මං අර දුන්නා කල්මුනේ unit එකක් තිබ්බා මගේ නිලධාරින් 6,07 දෙනෙක් ඉන්න සාජන් කෙනෙක්ගේ මං කිව්වා එතැන්ට කියන්න orders යවන්න මේ හතර දෙනාම වහාම අත්අඩංගුව ගන්න කියලා.

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඔහුගේ අත්අකුරෙන් ඔහුගේ කණිෂ්ඨ නිලධාන්ට ලබාදී ඇති රහසිගතයි යන මාතෘකාව යටතේ ලබා දී ඇති එම උපදෙස C 768 A (i) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර: ඔබ කිව්වා කල්මුනේ ඔබේ ඒකකයේ නිලධාරියාට කතා කරා කියලා?

පි; එහෙමයි .මම කතා කරේ මගේ ASP,OIC උපදෙස් දුන්නා අපේ ළඟම unit එකත් තිබ්බේ කල්මුනේ මේ සහ පොදුවේ සහ අපේ unit 2 එකෙන් තමයි මේ Subject එක කරේ

ප්‍ර: මොකක්ද Subject එක ?

FAIR COMMENT BY JEZEEM

පි: ඒක අපි ..extremism Subject desk එක තමයි unit 2.

ප්‍ර; Religious extremism ද එහෙම නැත්නම් නිකම් extremism ද?

පි; සිංහලයෙන් පාරිභාෂියක් තියෙනවා මේ .

ප්‍ර: ආගමික අන්තවාදයද එහෙම නැත්නම් නිකම්ම අන්තවාදය?

පි: අන්තවාදි

ප්‍ර; හොදයි?

පි: ඊට පස්සේ මම මේක discuss කරා ඒ දෙන්නත් එක්කම ගොඩාක් විශේෂයෙන්ම මේ ඔතන මට මතක හැටියට ASP පෙරේරා ඒයා කාත්තන්කුඩි OIC ඉදලා තියෙනවා පස්සේ එයත් මට කිව්වා මගෙත් contact තියෙනවා informers ලා ඉන්නවා මං මේක උත්සහ කරන්න නම් කියලා.

ප්‍ර: ඇයි මේ කාත්තන්කුඩි කල්මුණේ කියන ප්‍රදේශ කෙරෙහි ඔබ අවධානය යොමු කරේ?

පි: මේකේ සදහන් වුනා ඒ කියන්නේ මේ ගොල්ලෝ possible එනවා යනවා කියන adressess තිබ්බා මේ 4 දෙනා එතකොට මෙතන අර එක්කෙනෙක් හිටියා මේ

ප්‍ර: ඔය කියන කරුණු C768**A** ලේඛණයේ සඳහන් වෙනවා නේද?ඔවුන් හැසිරෙන්නේ කොහේද ඔවුන්ගේ තොරතුරු පිළිබඳව?

පි: දැන් මෙහෙමයි උතුමාණනි C **768A** **ලිපියේ** තියෙනවා දැන් සහරාන් හෂිම් ඔලුවිල් ප්‍රදේශයේ සැඟව ඉන්නවා කියලා රිල්වාන් සහරාන්ගේ මල්ලි පලාගොස් ඉදලා එතකොට රැට එනවා කියලා තියෙනවා ආර්යම්පති නැගෙන හිර ආර්යම්පති address එකට එතකොට මිල්හාන් මම X2 කියලා arrest කරන්න කියපු කෙනාගේ ටෙලිපෝන් නම්බර් එකක් තියෙනවා මෙයා web base මේ දෙයක් තමයි කරන්නේ කියලා තියෙනවා. එ වගේම ආමි මොහොමදීන්ගේ address එකක් දාල තිබ්බා එකයි උතුමාණනි මම මේ 4 දෙනා ලකුණු කරලා දැන් out ward මොනවත් කලේ නැහැ අර දෙන්නාට දුන්නා මේ ගොල්ලෝ වහාම අත්අඩංගුවට ගෙන මේක සාමාන්‍යයෙන් සති තුනකින් ප්‍රගතිය මේවා කරන්නේ ප්‍රගතිය වාර්තා කරන්න කියලා ඒ දිනයට පෙර..

ප්‍ර: 4 දෙනා නෙමේ තුන්දෙනා.

පි 4 දෙනෙක් ඉන්නවා X is සහරාන්,

ප්‍ර: X is සහරාන් yes හරි?

පි: ඒ අනුව මම පසුව පරීක්ෂා කරද්දි ඒවගේම unit 2 එකේ OIC ඇවිල්ලා තියෙනවා මන් පතිරණට පස්සේ කතා කරා ඒයා ඇවිල්ලා මගෙන් මේක ඉල්ලගෙන තියෙනවා. ඊට පස්සේ එයා ගිහිල් orders දාලා

FAIR COMMENT BY JEZEEM
Presidential Secretary's Copy

තියෙනවා උප පොලිස් පරීක්ෂක රත්නායකට ඒත් අර අත් අකුරෙන්ම පිටු එක හමාරක් මම අර දුන්නා instructions ලියාලා තියෙනවා.

ප්‍ර; ඔබ ඒ නිලධාරියාගේ නම මොකක්ද?

පි; දැනට ප්‍රධාන පොලිස් පරීක්ෂක පතිරණ එවකට පොලිස් පරීක්ෂක නිලයේ හිටියේ.

ප්‍ර; එතකොට ඔහු ස්ථානාධිපති නේද ඒ අවස්ථාවේදී?

පි: ස්ථානාධිපති ඒකක දෙකේ.

ප්‍ර: ඔබ කිව්වා එතකොට රත්නායකට තමයි ඔහු උපදෙස් දීලා තියෙන්නේ කියලා?

පි: ඔව් එයා මොකද එයා මං හිතන්නේ නිවාඩු යන්න හරි තිබ්බලා තියෙනවා.

ප්‍ර: එතකොට ඔය පොලිස් පරීක්ෂක පතිරණ මහතාගේ අත්අකුරු ඔබ හඳුනනවාද?

පි; දැන් නම් උතුමාණනි කියන්න අමාරුයි ස්ථානාධිපති.

ප්‍ර; දැක්කොත් මතක් වෙයිද?

පි: එහෙමම මේවා එකක්.

ප්‍ර; දැක්කොත් දැන් ඉතින් වැඩ කෙරුවානේ එකට?

පි: ස්ථානාධිපති විමර්ශන අංශ දෙක කියලා තියෙන්නේ.

ප්‍ර: ඔය තියෙන්නේ?

පි: කියන්න අමාරුයි.

ප්‍ර: හරි නමුත් දැන් ඔබ කියන්නේ ඔබේ දැනුම තුල වෙනවායි කියලා ඔබ විසින් පොලිස් පරීක්ෂක පතිරණට උපදෙස් දුන්නාට පස්සේ මේ **C 768 සහ ඊට අදාල ඇමුණුම්** ලබලා කරන්නට ඕනේ මොකක්ද කියලා ඒ පොලිස් පරීක්ෂක පතිරණ විමර්ශන අංශ දෙකේ ස්ථානාධිපතිවරයා විදියට රත්නායක කියන නිලධාරියාට ලිඛිතව උපදෙස් ලබා දුන්නා කියලා?

පි; ඔව් ඒක මට communicate වුනේ නැහැ. මැඩම්' පස්සේ මේ පතිරණ මගේ orders අරන් ගිහින් රත්නායකට දාලා ඊට පස්සේ වෙන වෙනම individually යවලා තිබ්බා. රත්නායක අර ස්ථානාධිපති වෙනුවට අත්සන් කලා දැන් උදාහරණයක් විදියට අපි ගත්තොත් එහෙම. ගත්ත පියවර මැඩම් ඊට පස්සේ මට තව දෙයක් මතක් වුනා මේ අර වනාතවිල්ලුවේ සිද්ධිය ඒ පැත්තේ unit එකක් නැහැ. මගේත් එක්ක STF එකේ වැඩකරපු නිලධාරියෙක් ඉන්නවා රෝෂාන් කියලා SIS එකේ මේ නිලධාරියා වරින් වර මං මේ Subject එකේ එයා තරුණ knowledge එකක් තිබුණ constable කෙනෙක් නමුත් දැන් Sargent කෙනෙක් මට මෙයාව මතක් වුනා. මෙයා හිටියා හලාවත SIS unit එකේ පස්සේ දැන් මේ අර දෙන්නාම ඉද්දි මං කිව්වා මගේ ගෝලයෙක් ඉන්නවා හලාවත

Prosecutor's Copy
FAIR COMMENT BY JEZEEM

unit එකේ මං එයාට කතා කරලා බලන්නම් මොකද වනාතවිල්ලුවට මැඩම් ළඟයිනේ මේ නිලධාරියාට හොඳ දැනුමක් තිබ්බා මේ subject එක ගැන ඊට පස්සේ මම මේ රෝෂාන්ට කතා කරද්දි Cut කරලා කිව්වා පස්සේ කෝල් එකක් ගන්නම් කියලාමට මතක හැටියට කතා කරා මං එතකොට රොෂාන්ට කිව්වා රෝෂාන් මම කතා කරලා ඇත්තටම මේක මේ මම off the hand කරේ එස්.අයි.එස් නිලධාරියෙකුට කතා කරන්න බැහැ මම ඩිරෙක්ටර් ටි.අයි.ඩි හැටියට නමුත් මං බැලුවා මොනවාහරි.

ප්‍ර: පෞද්ගලික හැදුනුම්කම මත රාජකාරි ?

පි: මත මොකද මගේ ගාව වැඩකලේ STF Intelligence Unit එකේ වැඩකරපු නිලධාරියෙක් එතකොට SIS එකට ගිහින් හිටියා මොකද මට හලාවතට access නෑ මැඩම් මොකද ටි.අයි.ඩි යුනිට් එකක් නැහැ ඒ පැත්තේ . පස්සේ මං එදාම 10 වෙනිදා මගේ text එකකුත් තියෙනවා රෝෂාන්ගේ නම්බර් එක එවලා මට මේ STF එකට මං කතා කරලා ගෙන්න ගත්තේ ඊට පස්සේ මං රෝෂාන්ට කතා කරලා කිව්වා රෝෂාන්ට ඔයාගේ Subject එකේ මේ පුද්ගලයා ඉන්නවා මට මෙයාව හොයලා දෙන්න කියලා ඉන්න තැනක් පස්සේ

ප්‍ර: දැන් මේ ඔබ හොයන්නට උත්සහ කරන්නේ කාවද?

පි: සහරාන්.

ප්‍ර: සහරාන්ව?

පි: මේ අප්‍රේල් 10 කතාවම පෝන් එකෙන් මං රෝෂාන් ට කිව්වා ඒ වගේම අප්‍රේල් 16 හරි රෝෂාන් මට කතා කරා අර ඉඩමට ගිහින් ඔය මේ .

ප්‍ර: ලැක්ටොස් වත්තට?

පි: ලැක්ටොස් වත්තට ගිහින් හවස ,6,7 විතර කතා කරලා මට කතා කරලා කිව්වා සර් මං හෙව්වා හැම තැනම මිනිහා මෙහේ නැහැ හැබැයි මං ඉඩමට ආවා sure එකට බඩු නම් අනිවාර්යෙන් මෙතන එන්න ඇත්තේ කලපුවෙන් ඒ කියන්නේ CID එකට recover කරපු explosives ටික ඉතින් මං එහෙමත් උත්සහ කරා මැඩම් ඒ පැත්තෙන් යවලා මේ කොහොම හරි සහරාන්ව හොයා ගන්න

ප්‍ර; දැන් මදකට මං ඔබට බාදා කරනවා මට පොඩි ප්‍රශ්නයක් ඇතිවුන හින්දා දැන් ඔබ අර රෝෂාන්ට කාථා කරා කිව්වානේ ඔහු එස්.අයි.එස් ඒ කියන්නේ රාජ්‍ය බුද්ධිසේවයේ නිලධාරීයෙක්නේ ඔහු හලාවත තමයි ඔබ කිව්වේ ඉන්නවා කියලා?

පි: ඒගොල්ලෝ base වෙලා හිටියේ තිබ්බේ හලාවත.

ප්‍ර; එතකොට ඔහු පුත්තලමට යාමක් ඒමක් එන්නේ නැද්ද?

පි; මං හිතන්නේ cover කරන්න පුළුවන් වෙන්න ඇති මට ඒක පොඩ්ඩක්

ප්‍ර; ඔබ දන්නවාද කියන්න පුත්තලමේ රාජ්‍ය බුද්ධිසේවයේ නිලධාරින් හිටියාද කියලා?

FAIR COMMENT BY JEZEEM

පි: මට කියන්න දන්නේ නැහැ මැඩම්. හැබැයි අනිවාර්යෙන්ම පුත්තලමේත් යුනිට් එකක් ඇති මගේ අර contact එක තිබ්බේ හලාවතනේ

ප්‍ර: ඔබ මේ දැන් මේ ගරු අපේ ගරු කොමිෂන් සභාවට කියන්නේ ඔබේ රාජකාරි කටයුතු තුලදි ඇති කරගත්ත සම්බන්ධතාවයන් පාවිච්චි කරලා තව දුරටත් රාජකාරියක් ඉෂ්ඨ කිරීමට ඔබ උත්සහ කරපු ආකාරය?

පි: ඔව් ඊට පස්සේ මොකද ඇත්තටම රෝෂාන්ට හොද දැනුමක් තිබ්බා මේ Subject එක ගැන මේ extremism ගැන පස්සේ එහෙම උත්සහ කරලා මැඩම් මම අප්‍රේල් 10 ම Face book ආයතනය මම ලියනවා මොකද මෙයා ගොඩාක් සහරාන් කියන පුද්ගලයා මුහුණු පොත ඒ කියන්නේ .Web based propaganda එකක් තමයි කරේ ඒ නිසා මම අප්‍රෙල් 10 Face book වලට ලියනවා කැලිෆෝනියා වලට මෙයා ගේ මෙහෙම Face book link එක මම පතිරණලාගෙන් අරගෙන අපේ විශ්ලේෂණ අංශයෙන් යොමු කලා USA වලට මේ මෙයා මෙහෙම extremism ideologist මේවා කරනවා ඒ නිසා වහාම මෙක block කරන්න කියලා ඒක මං ගාව ඒකේ කොපියක් තියෙනවා what it says 2019.අප්‍රේල් 10 වෙනිදා මේ ලියුම ලැබිච්ච දවසේ මං අත්සන් කරේ Director ටි.අයි.ඩි, CID විදියට Face Book California, United State ඒක මං කියවන්න ඕනිද

ප්‍ර; මොකක්ද ඔබ කරපු ඉල්ලිම කියලා කියන්නකෝ?

පි: Requesting for ban a face book account.

ප්‍ර: ඔව්.

පි: The counter terrorism and investigation division of Sri Lanka is conducting investigation into face book account name Asheek Zaharan Hasheem then investigation has reviled that said account is publishing extremist ideology's and sharing videos, photos supporting ISIS.

ප්‍ර: ඔව්.

පි: Hence I kindly suggest you to ban the said face book account and I have added the face book user information and end I said your cooperation in this regard is highly appreciated. Director/CTID – April 10th

ප්‍ර: ඔව්.

පි: For this on 12th April I got a reply.

ප්‍ර: ඔව්. මොකක්ද ලැබුණේ?

පි; Face book ආයතනයේ.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ ලියවන ලද ලිපියට මට Face book ආයතනයෙන් 12 වෙනිදා ඒ ලිපිය පිළිඅරගෙන ලිපියක් ලැබුණා පිළිතුරු ලිපියක්?

පි: Acknowledgment ඔව්.එකේ it says automated response එකක් ඇවිල්ලා තිබ්බෙ Face book ආයතනයෙන් case number එකක් ඒ ගොල්ලෝ register කරලා තිබ්බා.

ප්‍ර: ඔව්. ආ..

පි: It's 2658680.

ප්‍ර: ඔව්.

පි: පස්සේ අප්‍රේල් 15 වෙද්දි ඇත්තටම මේ සහරාන්ගේ Face book එක Block කරා.

ප්‍ර: අප්‍රේල් 15 වෙනකොට?

පි; වෙද්දි ඔව් ඒ කියන්නේ එයාට Web base propaganda එකක් කරන්න අපි කලිනුත් මට මතක හැටියට මම එන්නත් කලින් අවස්ථා දෙකකදි මෙයාගේ Web base propaganda එකට ගැහුවා. නැවැත්තුවා එතකොට අප්‍රේල් 10 වෙනිදා ලියුම ලැබීමත් එක්ක මම සාරංශගත කරනවා නම් උතුමාණනි මගේ සහකාර පොලිස් අධිකාරිවරයා ස්ථානාධිපති ගෙන්නලා අවශ්‍ය උපදෙස් දුන්නා කරන්න ඕනේ මොකක්ද විශේෂයෙන්ම මේ තොරතුරු පාදක කරගෙන වහාම මේ සඳහන් පුද්ගලයෝ 4 දෙනා අත්අඩංගුවට ගන්න කියලා ඊට පස්සේ මම additionally effort එකක් ගත්තා අර රෝෂාන් ට කතා කරලා උත්සහ කරපු එකට ඒ වගේම Face book එකට ලිව්වා අප්‍රේල් 10 ම මෙයාගේ අර propaganda එක Block කරන්න.

දැන් වේලාව.ප.ව.8.35
මෙතැන් සිට: මුතුමාලි මෙනවිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.08.35 යි.
පෙර සටහන් ල/ලේ : චන්දිමා මෙය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : ඒ සඳහා ඔබට ප්‍රතිචාරයකුත් ලැබිලා
පි : ආවා.
ප්‍ර : 15 වෙනිදා වෙනකොට ඔබ කියන්නේ සහරාන්ගේ Face book account එක මුහුණු පොත් ගිණුම
පි : අක්‍රීය කරනු ලැබුවා.
ප්‍ර : තහනම් කරනු ලැබුවා?
පි : Block කරනු ලැබුවා.
ප්‍ර : අවහිර කරනු ලැබුවා?
පි : අවහිර කළා.
ප්‍ර : දැන් එහෙම නම් ඔබ පුළුවන්ද ඔබ විසින් මුහුණු පොත් සමාගමට ලියපු එම ලිපිය ඉදිරිපත් කරන්න මේ ගරු කොමිෂන් සභාවට?
පි : එහෙමයි ස්වාමිනි.

ස්වාමිනි එම ලිපිය C 857 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා. ඒ වගේම සාක්ෂිකරුට මුහුණු පොත් සමාගම වෙතින් ලැබුණාය කියන පිළිතුරු ලිපිය C 858 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර : ජයසුන්දර මහත්මයා එතකොට ඔබ කියන්නේ මේ 09 වෙනිදා පොලිස්පතිතුමාගේ වෙතින් ලැබුණු ලිපිය බලලා තමයි ඔබ මේ සියළුම දේවල් කරලා 15 වෙනිදා වෙනකොට සහරාන් හෂීම්ගේ මුහුණු පොත් ගිණුම අවහිර කරවා ගත්තේ කියලා ඒ සමාගමට කියලා?
පි : එහෙමයි උතුමාණනි.
ප්‍ර : එහෙම නම් ඔබ ඔය කරන ලද දේ ඒ කියන්නේ මුහුණු පොතෙහි සහරාන් එය භාවිතා කිරීම නවත්වා ගන්නට ඔබට වගේම වෙනත් කෙනෙකුට වුනත් මුහුණු පොත් සමාගමට ලියලා හැකියාව තිබුණා නේද?
පි : එහෙම හැකියාවක් නෑ මම දන්න තරමට.
ප්‍ර : ඇයි ඒ?
පි : මේකේ procedure එකක් තියෙනවා දැන් උදාහරණයක් විදිහට මම as the director for counter terrorism in Sri Lanka police මම letter head එකකින් තමයි
ප්‍ර : අපි සිංහලෙන් තමයි සාක්ෂිය ගන්නේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් එතකොට මේකේ ඉංග්‍රීසියෙන් ලියලා තියෙන්නේ

ප්‍ර : මම ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂකවරයා ලෙස

පි : ලෙස තමයි මේ ආයතනයට ඉල්ලීමක් කරන්නේ.

ප්‍ර : ඔව් මුහුණු පොත් සමාගමට ඉල්ලීම කරන්නේ?

පි : මුහුණු පොත් සමාගමට.

ප්‍ර : ඉල්ලීමක් කරන්නේ?

පි : ඉල්ලීමක් කරන්නේ. ඒ වගේම ඒ අනුව තමයි මම විශ්වාස කරන විදිහට ඒ ගොල්ලෝ ඒක valid request එකක් නිත්‍යානුකූල

ප්‍ර : වලංගු ඉල්ලීමක් ලෙසට

පි : වලංගු ඉල්ලීමක් ලෙසට සලකන්නේ.

ප්‍ර : ඉතින් මම අහන්නේ ඒක පොලිස්පතිවරයාට සිදු කිරීමට හැකියාව තිබුණ් නැද්ද?

පි : ඔව් පොලිස්පතිවරයාටත්

ප්‍ර : හැකියාව තිබුණා?

පි : හැකියාව තියෙනවා.

ප්‍ර : තියෙනවා ?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් තොරතුරු විවෘත මාධ්‍යවලින් එකතු කරන ආයතයක් විදිහට රාජ්‍ය බුද්ධි සේවයට ඔබ කරපු දේම කිරීමේ හැකියාව තිබුණ් නැද්ද?

පි : එහෙමයි උතුමාණනි.

ප්‍ර : ඒ කියන්නේ?

පි : කරන්න හැකියාවක් තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ නීතිය බලගන්වන ඒ බලගැන්වීම සඳහා තොරතුරු රැස් කරන රාජ්‍ය ආයතනවලට එම ආයතනයක් විසින් ඔබ කරන ලද්දාවු මේ ඉල්ලීමම මුහුණු පොතට කෙරුවා නම් ඔවුන් විසින් ඒ ඉල්ලීම සලකලා බලලා සහරාන් හෂීම්ගේ මුහුණු පොත් ගිණුම අවහිර කිරීමේ අවස්ථාව තිබුණාය කියලයි ඔබ කියන්නේ?

පි : එහෙමයි.

****

<u>**ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා**</u>

ප්‍ර : සාක්ෂිකරු 2017 වර්ෂයෙත් ඔබ මුහුණු පොත ගිණුම Block කරන්න ඉල්ලීමක් කළානේ ඊට පස්සේත් කිහිප වතාවක්?

පි : එහෙමයි උතුමාණනි. ඒ කියන්නේ අර පරිගණක CERT එකට අපි ඉස්සෙල්ලම දන්නනවා 2018 මට මතක හැටියට ඒක ලියුම

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තියෙනවා පස්සේ official කෙනෙක් ඇවිල්ලා තියෙනවා TID එකට.

ප්‍ර : ඒක තමයි ඒ ඉල්ලීම් කළා කිහිපයක්

පි : කළා.

ප්‍ර : කලින් සාක්ෂිවලත් තියෙනවා. නෑ ඊට පසු ඒ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්කුවේ නෑ ඒ ගොල්ලො?

පි : තිබ්බා දැන් මම කලිනුත් දැන් උදාරහණයක් විදිහට පෙබරවාරි මාසේත් කරලා තියෙනවා ගොඩක් විට ඒ ගොල්ලො අපේ request පිළිගන්නවා . වෙන්නේ උතුමාණනි මේ අලුතෙන් මේ Yahoo account එකක් හැදුවා නම් face book account එකක් නිර්මාණය කළ හැකියි. එතකොට එයා එහෙම තමයි දැන් අපි අවස්ථා තුන හතරකම මෙයා Block කළත් තාක්ෂණය අනුව එයාට පුළුවන් අලුත් account එකක් හදලා මේ ප්‍රචාරණය කරන්න.

ප්‍ර : ඒ කියන්නේ කලින් අවස්ථාවේ Block වුණාද?

පි : Block කරලා තියෙනවා .

ප්‍ර : Block කරලා තියෙනවා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : එතකොට දැන් ඔබගේ උපදෙස් පරිදි කල්මුණේ ඒකකයේ ස්ථානාධිපතිවරයාට ඔබේ ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශයේ ස්ථානාධිපතිවරයා මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන් යන තැනැත්තාව ඔහු ඉන්න ස්ථාන සොයා බලා වාර්තා කරන ලෙසට උපදෙස් ලබා දීමක් සිදු වුණාද?

පි : ලේඛන පරීක්ෂා කිරීමේදී එහෙම වෙලා තියෙනවා මම කලින් සඳහන් කරපු ආකාරයට .

ප්‍ර : ඒ කවදද ඒ සිද්ධිය සිදු වෙලා තියෙන්නේ?

පි : මම ස්වාමිනි අප්‍රේල් 10 උපදෙස් දුන්නට පස්සේ අප්‍රේල් 11 ස්ථානාධිපති විමර්ශන අංශ දෙක විසින් උප පොලිස් පරීක්ෂක රත්නායකට උපදෙස් මාලාවක් නිකුත් කරනවා මේ මුල තොරතුරට අදාළව. ඒ අනුව ස්ථානාධිපති පරීක්ෂණ හා විශ්ලේෂණයට වෙනම කොළයක් යනවා අර මිල්හාන් කියන පුද්ගලයා මේ අන්තර්ජාලය හරහා ක්‍රියාකාරකම් කරන නිසා මෙයාව identify කරන්න. මොකද මෙයා අපේ records වල ඉඳලා නෑ මිල්හාන් කියන නම. ඒ නිසා ඉල්ලීමක් කරනවා. ස්ථානාධිපති විමර්ශන

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මිල්හාන්ද රිල්වාන්ද?

පි : මිල්හාන්ව. මොහොමඩ් මිල්හාන්

ප්‍ර : හා හා

පි : ඒ කියන්නේ මුල් තොරතුරේ සඳහන් වන පුද්ගලයෝ පස් දෙනාගෙන් එක්කෙනෙක් සඳහන් වෙනවා මොහොමඩ් මිල්හාන් කියලා.

ප්‍ර : ඔව්.

පි : එතකොට ස්ථානාධිපති පර්යේෂණ හා විශ්ලේෂණ අංශයට අප්‍රේල් 11 වෙනිදා ස්ථානාධිපති විමර්ශන අංශ 2 ක විසින් ලියනවා මෙහෙම. මාගේ අංශය මඟින් විමර්ශනය කරනු ලබන විමර්ශන ගොනුවකට අදාළව පහත නම් සඳහන් face book ගිණුම් හෝ වෙනත් සමාජ ජාල ගිණුම් පවත්වාගෙන යන්නේද සම්බන්ධව හා එම face book ගිණුම තුළ අන්තවාදී වෛරීය හෝ ජාතීන් අතර අසමඟියක් ඇති කරනු ලබන ඡායාරූප හෝ අදහස් පළ කර ඇත්දැයි පරීක්ෂා කර යම් තොරුතුරක් අනාවරණය වන්නේ නම් අප්‍රේල් 20 වෙනි දිනට පෙර වාර්තාවක් ලබා දෙන්න කියලා.

ප්‍ර : කවදද ඒක ලියන්නේ?

පි : අප්‍රේල් 11 වෙනිදා.

ප්‍ර : අප්‍රේල් 11 වෙනිදා?

පි : ඔව්. හේතුව මැඩම් අර මුල් තොරතුරේ

ප්‍ර : ඔව්

පි : මිල්හාන් ගැන කියනවා මේ

ප්‍ර : ඒ කියන්නේ ඔබ දැන් C 768 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරපු ලේඛනය.

පි : නෑ 768 (A) කියන එකේ සිංහලෙන්.

ප්‍ර : ආ... 768 (A) කියන එකේ තව පැහැලිව

පි : තියෙනවා

ප්‍ර : අර ඇමුණුමේ කියනවා

පි : මිල්හාන් ලෙස සඳහන් පුද්ගලයා මොහොමඩ් මිල්හාන් නමින් සමාජ ජාල ගිණුමක් පවත්වාගෙන යමින් සහරාන් සමාජ ජාල ගිණුම් සමඟ සම්බන්ධතා පවත්වන බවත් 2019 මාර්තු 15 වෙනි දින නවසිලන්තයේ කතෝලික ලබ්දිකයෙකු විසින් මුස්ලිම් පල්ලියක් වෙත එල්ල කරන ප්‍රහාරයෙන් පසු සිය සමාජ ජාල ගිණුම් නිරන්තරයෙක් යාවත්කාලීන කරමින් අන්‍ය ආගමිකයින් පිළිබඳව ද්වේශ සහගත ලෙස අදහස් දක්වා ඇති බවටත් නිරීක්ෂණය වී ඇත. එතකොට මේ තොරතුරේ තියෙන්නේ එයා

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මුහුණු පොත ආශ්‍රයෙන් කටයුත් කරනේනෙක් කියලා. මම මේක පස්සේ අයි.පී.පතිරණගෙන් ඇහුවා.

ප්‍ර : ඔව්.

පි : පස්සේ ඒ නිසාත් ස්ථානාධිපති විමර්ශන අංශ 2 පරීක්ෂණ හා විශේල්ෂණ අංශයෙන් අහන්නේ මෙයා ගැන face book එකේ බලන්න මොනවා හරි තොරතුරක් අපිට ගන්න identity එකක්. ඊට පස්සේ කල්මුණේ.

ප්‍ර : දැන් ඒ ලිපිය ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : පුළුවන්.

ස්වාමිනි එම ලිපිය C 859 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර : එතකොට ඊට පස්සේ මොකද වුණේ?

පි : ඒ වගේම මගේ උපදෙස් ප්‍රකාරව වෙච්ච process එක නැත්නම් ක්‍රියාවලිය පරීක්ෂා කරද්දී ස්ථානාධිපති කල්මුණේ ඒකකටත් වෙනම උපදෙස් ගිහින් තියෙනවා. ඒ අනුව මේ කියන කණ්ඩායම අත්අඩංගුවට ගන්න කියලා මං එක ලියුමක් කියන්නම් ස්ථානාධිපති කල්මුණේ ඒකකය විමර්ශන කටයුක්තකට අදාළව සහාය ලබා ගැනීම සම්බන්ධව. මේක date කරන්නෙත් අප්‍රේල් 11 ස්ථානාධිපති ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය වෙනුවට ස්ථානාධිපති විමර්ශන අංශ 2. ඌ.පොෙ.ප.රත්නායක. විමර්ශන අංශ 2 මඟින් සිදු කරන විමර්ශනකට අදාළව පහත විස්තර සඳහන් පුද්ගලයන් සම්බන්ධව තොරතුරු සොයා බලා ඔහු අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන ලෙස පොලිස්පතිතුමා හා අධ්‍යක්ෂක ත්‍රස්ත මර්දන විමර්ශන කොට්ඨාශය විසින් නියෝග ලබා දී ඇත. ඒ කියන්නේ IG ගෙන් ආපු order යක් මම දුන්න වාචික නියෝග. පහත පුද්ගලයා NTJ සංවිධානයේ හිටපු සභාපති වන මොහොමඩ් කාෂිම් මොහොමඩ් සහරාන් යන අය සමඟ සම්බන්ධ වී රට තුළ ජාතීවාදී හා අන්තවාදී ක්‍රියාකාරකම් ඇති කර ජාතික සමගිය සහ ආරක්ෂාව බිඳ දැමීමට කටයුතු කරමින් සිටින බවත් NTJ සංවිධානයට හිතවත් ආගමික සංවිධානයක් සමඟ ඇති වූ ගැටුමෙන් පසු ප්‍රදේශයෙන් පලා ගොස් මේ දක්වා සැඟවී සිටින බවටත් තොරතුරු අනාවරණය වී ඇත. තවද කියලා මෙයා අර මුල් තොරතුරේ තිබ්බනේ මැඩම් 309/B ෆරීනාස් පාර, දෙවන හරස් වීදිය, ආරියම්පති, නැගෙනහිර ආරියම්පති ලිපිනය වෙත රාත්‍රී කාලයේ පැය 23 ත් පාන්දර 04 ත් අතර කාල සීමාවේ පැමිණ බිරිඳ හා දරුවන් හමුවන බවටත් තොරතුරු ලැබී ඇත. මේ කියන්නේ රිල්වාන් ගැන.

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : රිල්වාන් ගැන මොහොමඩ් කාසීම් මොහොමඩ් රිල්වාන් ගැන?

පි : ඔව් නම දාලා තියෙනවා මොහොමඩ් කාසීම් මොහොමඩ් රිල්වාන් ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය. අවසානයේ කියනවා මගේ ස්ථානාධිපතිවරයා කරුණු එසේ හෙයින් ඉහත පුද්ගලයා ආරියම්පති ලිපිනයේ හෝ වෙනත් ලිපිනයක රැදී සිටින්නේද යන්න රහසිගතව පරීක්ෂා කර බලා තොරතුරු කඩිනමින් මා වෙත අප්‍රේල් 25 වෙනි දිනට ප්‍රථම ලබා දීමට කටයුතු කරන ලෙසට දන්වා සිටින අතර මෙය අධ්‍යක්ෂකතුමා විසින් ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරන ලෙස දන්වා ඇති බැවින් ඔබගේ පුද්ගලික අවධානය යොමු කරන ලෙසට දන්වා සිටිමි. මේ ඇවිල්ලා අර පතිරණට දුන්න උපදෙස්වලට පස්සේ මැඩම් ඒ ස්ථානාධිපති ලියනවා ස්ථානාධිපති කල්මුණේ ඒකකයට මගේ සහ පොලිස්පතිගේ orders පිට ආවාත් මම ඒක priority කරලා තියෙන නිසා මේ ගැන කොහොම හරි මෙයාව අත්අඩංගුවට ගන්න කියලා.

ප්‍ර : ඔව් 2019/04/11 වෙනිදා වෙන කොට ස්ථානාධිපති ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශය විදිහට කවුද කටයුතු කළේ?

පි : OIC විදිහට හිටියේ කෙනෝ. කෙනෝ පෙරේරා හිටියේ.

ප්‍ර : ඔහුගේ අත්සන ඔබ අඳුරනවද?

පි : එතන දැන් මට මතකයක් නෑ අත්සන් කරලා තියෙනවා හැබැයි අර UNIT 2 එකේ පතිරණ නැති නිසා රත්නායක අත්සන් කරලා තියෙන්නේ එතන යට ස්වාමිනි.

ප්‍ර : ඔබ රත්නායකගේ අත්සන අඳුරනවා?

පි : දැන් නම් එහෙම අඳුරන්නේනෑ.

ප්‍ර : නමුත් යම් අවස්ථාවකදී ඔබේ අවධානයට මේ 09 වෙනිදා ඔබට ලැබුණේ 10 වෙනිදා කියලා කිව්වනේ C 768 සහ එයට අදාළ ඇමුණුම්?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ දුන්න උපදෙස් අනුව ඔබේ කණිෂ්ඨ නිලධාරීන් එය ක්‍රියාත්මක කරලා මේ ආකාරයට හුවමාරු කරන ලද ලිපි ලේඛන ඔබට දකින්නට ලැබුණද?

පි : දැන් මැඩම් මේ මෙහෙම ඒ කියන්නේ personally ගෙනල්ලා මේක බැලුවේ නෑ. නමුත් අපි සාමාන්‍යයෙන් අහනවනේ.

ප්‍ර : ඕක දැකලා නැද්ද ඔය ලියුම? දැන් ඔය කියවපු ලියුම කොයි වේලාවක හරි දැක්කද මිස්ටර් ජයසුන්දර?

FAIR COMMENT BY JEZEEM

පි : නෑ ඒ වේලේ දැක්කේ නෑ මැඩම් මට මතකයක් නෑ ඒ කියන්නේ මැඩම් දැන් මං එන්නේ ගොඩක් විට මගේ OIC ලා ASP ලා ගෙන්වලා අපි instructions දෙනවා. මෙන්න මේක කරන්න කියලා නමුත් මට මේක මතකයක් නෑ කවදා

ප්‍ර : දැන් ඔය කටයුතු සම්බන්ධයෙන් ගොනුවක් නඩත්තු කළාද?

පි : ගොනුවක් මගේ භාරයේ තිබ්බේ නෑ. මගේ ගාව මුල් ලේඛනය තිබ්බා. ඒ කියන්නේ මේ මේක මුල් ලේඛනයත් මම දුන්නා. ඇත්තටම මේ ලියුම් SET එක Photo copy ගහන්න බෑනේ මැඩම්. ගැහුවෙත් නෑ out word කළෙත් නෑ මං මුලින් හිතුවේ පතිරණ OIC ට හරි ASP ට දුන්නා කියලා. නමුත් පතිරණ අතට තමයි දීලා තියෙන්නේ මැඩම් මේක. පස්සේ ඒ අනුව තමයි පතිරණ ගිහින් අර process එකේ ගිහින් තියෙන්නේ.

ප්‍ර : දැන් ඔබේ ඒ ගොනුවේ ඔය දැන් සඳහන් කරපු රිල්වාන් මොහොමඩ් කාසීම් මොහොමඩ් රිල්වාන් සම්බන්ධයෙන් සොයලා බලලා වාර්තා කරන්න කියලා ස්ථානාධිපති කල්මුණේ ඒකකය වෙත ස්ථානාධිපති ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශය විසින් යවපු ලිපිය තියෙනවද?

පි : තියෙනවා.

ස්වාමිනි එම ලිපිය C 860 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

C 860 වශයෙන් ලකුණු කරන ලද ලේඛනයේ ඡායා පිටපතක් ලබා ගෙන එය සහතික කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසටත් ඉන් පසු මුල් ලේඛනය සාක්ෂිකරුට මුදා හරින ලෙසටත් කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

****

<u>**අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය**</u>

ප්‍ර : දැන් ඔය ආකාරයට අර C 768 (A) කියන ඇමුණුමේ ඔබ විසින් X 3 වශයෙන් හඳුන්වා අත්අඩංගුවට ගැනීම සඳහා සහ විමර්ශන කිරීමට ඔබේ නිලධාරීන්ට උපදෙස් දුන්න බදුර්දීන් මොහොමඩ් මොහිදීන් හෙවත් ආමී මොහෙදීන් සම්බන්ධයෙන් ඔබේ නිලධාරීන් ලිපියක් පිළියෙල කරලා තිබුණද කාට හරි උපදෙස් දීලා?

පි : ඔව් එහෙම ලියුමකුත් අර content එක සහිත ගිහිල්ලා තියෙනවා.

FAIR COMMENT BY JEZEEM
President's Secretariat Copy

ප : ඒක කවුරු විසින් කා වෙත යවලා තියෙනවද කවදද යවලා තියෙන්නේ?

පි : ඒකේ තියෙන්නේ අප්‍රේල් 12 කියලා. රත්නායක අත්සන් කරලා තියෙන්නේ. ස්ථානාධිපති කල්මුණේ ඒකකයට.

ප : එයත් ඔබේ ඔය මුල් ගොනුවේ තියෙනවද?

පි : එහෙමයි උතුමාණනි.

ස්වාමිනි එම ලිපිය C 861 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.

ප : ඊළඟට අප්‍රේල් මාසේ 20 වෙනිදා මුහුණු පොතින් යම් පණිවිඩයක් ඔබට ලැබුණද නැත්නම් ඔබ යම් ඉල්ලීමක් මුහුණු පොතෙන් කෙරුවද?

පි : අප්‍රේල් 20 නම් කළේ නෑ උතුමාණනි.

ප : 20 කළේ නෑ මිල්හාන් ගැන?

පි : ඒ අප්‍රේල් 11 මැඩම් අර මේ පර්යේෂණ හා විශ්ලේෂණ අංශයට නම් ලියුමක් දාලා තියෙනවා බලන්න කියලා අප්‍රේල් 11.

ප : අප්‍රේල් 11 මිල්හාන් සම්බන්ධයෙන් මුහුණු පොත face book report එකක් call කළේ නැද්ද?

පි : එහෙම එකක් හම්බ වුණේ නෑ. ඒ කියන්නේ විශ්ලේෂණය අංශයට දාලා තිබ්බා දැන් මොහොමඩ් මිල්හාන් කියන අර web link එක දාලා මේ ගැන තොරතුරු තියෙනවද බලන්න කියලා. හැබැයි මට දැන් ඊට පස්සේ මම report එකක් අරන් තියෙනවා මේ ඒ කියන්නේ තොරතුරු බලද්දී මට මතකයේ හැටියට face book එකේ trace වෙලත් නෑ.

ප : ඔබ ස්ථානාධිපති පර්යේෂණ හා විශ්ලේෂණ අංශය වෙත දන්වලා තිබුණා අප්‍රේල් 20 ට ඉස්සෙල්ලා වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා?

පි : එහෙමයි .

ප : එහෙමද කළේ?

පි : එහෙමයි.

ප : ඒ ඔබ ගන්නා ලද එක් පියවරක් නේද?

පි : ඔව්.

ප : එහෙම නම් ඔබ කියනනේ අර C 768 ලිපිය සහ ඊට අදාළ ඇමුණුම් පොලිස්පතිවරයා වෙතින් ලැබුණට පස්සේ ඔබ අද දින මේ ගරු කොමිෂන් සභාවට සවිස්තරව විස්තර කරන ලද ඒ සියළුම පියවරයන් ඔබේ කොට්ඨාශය වෙනුවෙන් ඔබ විසින් ගන්නා ලද බවයි?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ඒක ඊට පස්සේත් feed back එකක් දෙනවා නම් මැඩම් අපේ නිලධාරීන් කල්මුණේ මට නිලධාරීන්ගේ විස්තරත් තියෙනවා මේ ගොල්ලො ගිහිල්ලා තිබ්බා මේ කියන address වලට. ඊට පස්සේ ග්‍රාම සේවකලා දීලා තිබ්බා සහතිකත් ඒවා දීලා තියෙනවා මේ පදිංචිය අතහැර ගොස් කියලා. මේ ඒ dates මං ගාව තියෙනවා.

ප : සොයා ගන්න බැරි වුණා කියලා ඒ ගොල්ලන් දීලා තියෙනවා ?

පි : දීලා තියෙනවා. දැන් ගත්තොත් වෙන වෙනම

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප : සාක්ෂිකරු දැන් ඔබගේ සාක්ෂිය අනුව ඔබ 09 වෙනිදා ලිපිය ලැබුණයින් පස්සේ මේ තොරතුර මෙම සහරාන් රිල්වාන් මිල්හාන් ඇතුළු පිරිස සොයා ගන්න කල්මුණේ කාත්තන්කුඩි යන ප්‍රදේශවල උත්සාහ ගෙන තියෙනවා ග්‍රාම සේවක පියවර අරගෙන තියෙනවා?

පි : එහෙමයි.

ප : දැන් කොමිෂන් සභාව අහන ප්‍රශ්නේ තමයි දැන් ඔය බුද්ධි තොරතුරේ තියෙනවා ප්‍රසිද්ධ පල්ලිවලට සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයට ප්‍රහාරයක් එල්ල කිරීමේ හැකියාවක් තියෙන බව අවධානමක් තියෙනවා කියලා. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහ ප්‍රසිද්ධ හෝටල් සාමාන්‍යයෙන් බුද්ධි අංශය විසින් බැලුවොත් කොළඹ ප්‍රදේශයේ තිබෙන්නේ පිළිගන්නවද?

පි : එහෙමයි.

ප : එතකොට ඔබලාගේ TID unit එකක් තියෙනවද දැන් LTTE කාලෙත් හිටියනේ මේ කොළඹ ප්‍රදේශය ආවේෂණය කිරීමේ?

පි : ඇත්තටම උතුමාණනි මේ පර්යේෂණ අංශ 2 කියන එක ක්‍රියාත්මක වෙනවා ඒ කියන්නේ දැන්

ප : කොළඹ ප්‍රදේශයේ?

පි : කොළඹ ප්‍රදේශයෙත් බලන්නේ. ඇත්තටම අර මගේ orders in writing ඒ කියන්නේ ලිඛිතව පතිරණ ලියපු ඒකේ ඒ ගැන සඳහන් වෙනවා.

ප : ඒක තමයි ඉන්න මම ඒ ප්‍රශ්නේ අහලා ඉන්න. ඒ කොළඹ ආවේෂණය කිරීමේ තමන්ලා කොළඹ ප්‍රදේශය ආවේෂණය කරලා මෙම පිරිස කොළඹ ප්‍රදේශයේ කොයිතැන්වල හරි ස්ථාන ගත වෙලා ඉන්නවද කියලා සෙව්වද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් දැන් මම නියෝග දුන්නා OIC ට ASPට පතිරණලටත් මේ ගොල්ලො දැන් මේ content එක කියලා උතුමාණනි කොහොමහරි arrest කරන්න කියලා. එතකොට ඒ අනුව මේ ඒක ක්‍රියාත්මක වෙලා තියෙනවා මොකද පතිරණ ලියලා තියෙනවා ඒ ගැනත් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ තොරතුරු බලන්න. ඊට පස්සේ මේ පල්ලිවලට ප්‍රහාර එල්ල කරන්න කියන එකත් මං දැක්කා එයා දාපු orders වල සඳහන් වෙනවා.

ප්‍ර : ඔව් මම අහන්නේ ප්‍රහාර එල්ල කිරීමට සම්බන්ධවම නෙවෙයි. මෙම සොයා ගන්න ඕන මෙම පිරිස නම් සඳහන් පිරිස කොළඹ සහ කොළඹ අවට සැරිසරනවද කියලා සොයලා බැලුවද එයට හේතුව තමයි දැන් ඔවුන් සෙව්වේ කාත්තන්කුඩි කල්මුණේ වගේ ගෙවල්වලනේ. දැන් ප්‍රහාර සිදු වෙන්න බොහෝ දුරට අවධානම තියෙන්නේ කොළඹ අවට ප්‍රදේශයක කියලා හිතන්න පුළුවන්නේ?

පි : එහෙමයි .

ප්‍ර : ඒ අනුව ඔබලාගේ බුද්ධි අංශවලට කල්පනා වුණේ නැද්ද මොවුන් මේ කොළඹ ප්‍රදේශයේ ඉන්නවද කියලා safe house තියෙනවද කියලා සොයලා බලන්න

පි : නෑ බැලීමක් කරලා තියෙනවා.

ප්‍ර : කොහොමද බලලා තියනේනේ?

පි : බලලා තියෙන්නේ දැන් මම කිව්වා පල්ලි කතාව කිව්වා ආපු මගේ තුන් දෙනාටම. එතකොට ඉන්දියානු මහ කොමසාරිස් කතාවත් කිව්වා මොකද අපේ informers ලා ඉන්නවනේ උතුමාණනි. ඒ කියන්නේ මේ තොරතුරත් බලන්න කියලා. මේ ගොල්ලොගේ origination එක වෙනවා අර කියන areas වලින්. එතකොට මේ කියන possible task එකෙත් මම මට මතකයි මං කිව්වා ඒ අනුව තමයි මේ පතිරණගේ සටහනෙත් ඒ දෙක සඳහන් වෙනවා. මේ මෙහෙම තොරතුරුත් කියවෙනවා කියලා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : ඒ සටහන තියෙනවා නේද?

පි : ඔව් මැඩම්.

ස්වාමිනි එම සාක්ෂිකරු පතිරණ විසින් යොදන ලද බවට හඳුනා ගනු ලැබූ එම සටහන C 862 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනු ලබනවා.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : ඒ සටහන කියවන්න බලන්න.

පි : ඒ 08 වෙනි කරුණේ සඳහන් වෙනවා මෙරට ප්‍රධාන කතෝලික පල්ලි හා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය වෙත ප්‍රහාරයක් එල්ල කිරීමට මොවුන්ගේ සම්බන්ධතාවයක් ඇත්ද හා ඔවුන් සැලසුම් කරනවාද යන්න පරීක්ෂා කරන්න කියලා උප පොලිස් පරීක්ෂක රත්නායකට නියෝගයක් දාලා තියෙනවා. සාර්ථක තොරතුරු ලබා ගෙන මෙම සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන්න. ප්‍රගතිය ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන්න කියනවා මේ කොළඹ තොරතුරු දෙක සම්බන්ධව.

ප්‍ර : නමුත් ඔබලාට ඒ තොරතුරක් ලබා ගන්න බැරි වුණා?

පි : බැරි වුණා උතුමාණනි.

ප්‍ර : මොකද ඒ ප්‍රශ්නේ ඇහුවේ සහරාන් ඇතුළු දෙදෙනෙක් මෙම බෝම්බ ප්‍රහාරයට පෙර 20 වෙනිදා පවා 17 ඒ දින කිහිපය තුළ ෂැංග්‍රීලා හෝටලයට හෝ ඒ gall face එක අවට සැරිසරලා තියෙනවා. හෝටලයටත් ගිහිල්ලා තියෙනවා. 19 ඔහුගේ මුහුණ අඳුරගන්න පුළුවන් රූවුල වවලා ඒ විදිහටම ඉන්නේ. ඉතින් ඒ ආවේෂණය කිරීම නිවැරදිව කළා නම් බුද්ධි අංශය විසින් ඔහු සොයා ගන්න තිබ්බා කියලා ඒ ප්‍රශ්නේ ඒ ගැටලුව තමයි අහන්නේ.

පි : උතුමාණනි මේ තොරතුරේ හෝටල් ගැන කෙසේ වෙතත් පල්ලි සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය කියලා සඳහන් වෙන්නේ. එතකොට පල්ලි කියලා සමහර විට අපි කොච්චිකඩේ සහ කටුවාපිටිය පල්ලිය අරගෙන අපි surveillance එකක් mount කළා නම් හැබැයි මේ ගොල්ලො ඒ තැන් දෙකට ගියාද කියලා තොරතුරු නෑ. මේ තොරතුරේ හෝටල් ගැන උතුමාණනි සඳහනක් නෑ.

ප්‍ර : නෑ හරි ඒක වෙන්න පුළුවන් හෝටල් ගැන අහන්නේ නෑ. මම අහන්නේ අර කොළඹ ප්‍රදේශයේ

පි : surveillance කළා නම්

ප්‍ර : surveillance කළා නම් සමහර විට

පි : අනිවාර්යෙන්ම

ප්‍ර : අනිවාර්යෙන්ම හරියට නිවැරදිව තිබ්බා නම් ඔවුන් අත්අඩංගුවට ගැනීමේ හැකියාවකුත් තියෙන්න ඇති කියන එක?

පි : ඒ කියන්නේ ඇත්තටම ගොඩක් intelligence operative ලා දාලා අපි civil close දාලා surveillance කළා නම් possibility එකක්

FAIR COMMENT BY JEZEEM

තියෙනවා. ඒ කියන්නේ අවස්ථාවක් තිබ්බා මේ ඇත්තටම මේක ඒ කියන්නේ මේ පුද්ගලයා අදුර ගන්න.

ප්‍ර : මොකද සහරාන් වෙස් මාරු කරන් ඇවිල්ලා නැනේ. ඒ විදිහටම සහරාන් වශයෙන්මයි ඇවිදලා තියෙන්නේ?

පි : ඒ කියන්නේ ෂැංග්‍රීලා එකට එතන මම ඇත්තටම උතුමාණනි investigation එකටත් සම්බන්ධ වුණා. ඒ කියන්නේ CID එකත් එක්ක. දැන් Tropical Inn එක attack එක investigation එක මං කළේ. එතකොට ඔය කියන කරුණු මං දැක්කා අර ලිෆ්ට් එකෙන් එහෙම සහරාන් එද්දී ඒ ගතිය තිබ්බා හැබැයි හෝටල් bookings දැම්මේ අර දෙමටගොඩ family එකේ ළමයා තමයි දැම්මේ. සහරාන් expose වෙන්නේ එක තැනක bookings දාන්නේ එක ID card එකකින් සහරාන් යන්නේ නෑ. යන්නේ අර මට මතක හැටියට දෙමටගොඩ family එකේ තමයි යන්නේ payments කරන්නේ.

ප්‍ර : වෙන්න පුළුවන්. නමුත් CCTV කැමරාවලටත් ඔහුගේ ඡායාරූපත් ඇතුළත් වෙනවා?

පි : සහරාන් මතු වෙන්නේ මට මතක හැටියට කලින් දවසේ ෂැංග්‍රීලා හෝටෙල් එකට

ප්‍ර : උදේ ඇවිල්ලා තියෙනවා?

පි : ඇවිල්ලා ඒ කියන්නේ checking වෙනවා. ඊට පස්සේ මේ ගොල්ලො ඔක්කොම යනවා පානදුරේට. පානදුරේ safe house එකේ ඉඳලා ඊට පස්සේ ඒ කියන්නේ සෙනසුරාදා මේ ගොල්ලො dispose වෙනවා.

ප්‍ර : ඒ තොරතුරු අනුව තමයි ඇහුවේ අර මේ කොළඹ ප්‍රදේශය ආවරණය කළා නම් ඔහු අත්අඩංගුවට ගැනීමට හැකියාවක් තිබුණද කියලා?

පි : හැබැයි උතුමාණනි මේ මොහොමඩ් සහරාන් expose වෙන්නේ නෑ මට මතක හැටියට investigation සහ අපිට හම්බ වෙච්ච CCTV වල මේකේ තනිකර financial part එක කළේ අර දෙමටගොඩ brothers ලා දෙන්නා. ඒ ගොල්ලො තමයි මේකට fund කළේ. සහරාන් තමයි මේකේ ideologist ඉතින් සහරාන් මම හරි නම් expose වුණේ CCTV වලට කලින් දවසේ සෙනසුරාදා ෂැංග්‍රීලා එකට checking වෙද්දී check out වෙද්දී ආයේ තමයි attack එකට ලිෆ්ට් එකෙන් පල්ලෙහාට බහිද්දී.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

FAIR COMMENT BY JEZEEM

ප : ඔබ කිව්වනේ දැන් ඔබේ නිලධාරීන් ගිහිල්ලා කල්මුණේ ප්‍රදේශයේ එහෙම සොයලා බැලුවයි කියලා උපදෙස් පරිදි ග්‍රාම නිලධාරීන්ගෙන් මේ අදාළ පුද්ගලයින් ඉන්නවද කියලා. ඒවාට අදාළව ඔබට වාර්තා ලැබිලා තියෙනවද?

පි : ඔව් ඒ කියන්නේ එහෙන් ඉදිරිපත් කරලා තිබ්බා වාර්තාවක් මම මේ සිද්ධියෙන් පස්සේ සහකාර පොලිස් අධිකාරිවරයාගෙන් වාර්තාවක් කැඳෙව්වා. එහි සඳහන් වෙනවා මේ අධ්‍යක්ෂතුමා තස්ත්‍ර මර්දන විමර්ශන අංශ කොට්ඨාශය කියලා මට සහකාර පොලිස් අධිකාරිවරයා වාර්තාවක් ඉදිරිපත් කරනවා. එකේ මම කියන්වන්නද ඒ ගත්ත පියවර සම්බන්ධයෙන්.

ප : කෙටියෙන් අපිට summarize කරලා කිව්වනම් හොඳයි නේද?

පි : එතකොට විමර්ශන කටයුතු විමර්ශන අංශ 2 න් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව මෙම තොරතුරේ සඳහන් පරිදි සහරාන් හෂීම් සහ මාවනැල්ල සිදුවීමට අදාළ ප්‍රධාන සැකකරුවෙකු වන සාහීඩ් යන අයවලුන් ඔළුවිල් ප්‍රදේශයේ සැඟව සිටින බවට තොරතුරේ සඳහන් කරුණු පරීක්ෂා කිරීමට ස්ථානාධිපති විමර්ශන අංශ 2 ක විසින් ක්‍රියා කර ඇති අතර මෙම සැකකරුවන් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය වී නොමැත. තවද මෙම තොරතුරේ සඳහන් රිල්වාන් යන අය ආරියම්පති ප්‍රදේශය වෙත පැමිණෙන බවට සඳහන්ව ඇති ලිපිනය වෙත ගොස් පරීක්ෂා කිරීමට මෙම කොට්ඨාශයේ කල්මුණේ උප ඒකකයේ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති අතර එහිදී තොරතුරේ සඳහන් කර ඇති තුඩෙයිකාරන් වීදිය, මොහිදීන් පල්ලිය පාර, නව කාත්තන්කුඩි 6 ලිපිනයේ හෝ අංක 309/B , ෆරිනාස් පාර, දෙවන හරස් වීදිය, ආරියම්පති, නැගෙනහිර ආරියම්පති ලිපිනයේ සැකකරු වාසය නොකරන බවට නිරීක්ෂණය වී ඇත. ඒ කියන්නේ රිල්වාන් ගැන. මොහොමඩ් මිල්හාන් යන අය සම්බන්ධව තොරතුරේ සඳහන් වූ සමාජ ජාලා ගිණුම පිළිබඳව මෙම කොට්ඨාශයේ පර්යේෂණ හා විශ්ලේෂණ අංශය මඟින් පරීක්ෂාවට ලක් කරන ලද අතර එහිදී එවැනි ගිණුමක් පවතින බවට අනාවරණය වී නොමැත. හිටපු යුධ හමුදා සෙබළෙකු වන ආමී මොහිදීන් යන අය රාත්‍රී කාලයේදී පැමිණෙන බවට සඳහන් කර ඇති අන්නර් පල්ලිය අසල කාත්තන්කුඩි තුන ලිපිනයේ සම්බන්ධයෙන් හා ඔහු එම ස්ථානයට පැමිණෙනවාද යන්න පරීක්ෂණ සම්බන්ධයෙන් මෙම කොට්ඨාශයේ කල්මුණේ උප ඒකකයේ නිලධාරීන් පරීක්ෂාවට ලක් කර ඇත. එහිදී මෙම පුද්ගලයා සඳහන් කර ඇති ලිපිනයේ වාසය කරන බවට හෝ රාත්‍රී කාලයේ මෙම නිවසට පැමිණෙන බවට තොරතුරු අනාවරණය වී නොමැති ඇති අතර උප ඒකකය

Presidential Commission of Inquiry
FAIR COMMENT BY JEZEEM

විසින් අප්‍රේල් 21 එක එවන ලද වාර්තාවට අනුව මොහු කපු සංස්ථාව, කිරාන් ලිපිනයේ රැඳී සිටින බවට තොරතුරු ඇති අතර මොහුව subsequently ඒ කියන්නේ ඒ අනුව මෙම ආමී මොහිදීන් යන අය අත්අඩංගුවට ගැනීම සඳහා පරීක්ෂා කිරීමේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ඔවුන්ගේ භාරයට අරන් තිබ්බා මං හිතන්නේ 22 නැත්නම් 23 ඒ ටික තමයි මැඩම්.

ප : තියෙන්නේ ඒ වාර්තාවේ දිනය කවදද සහ කවුද ඒක ඉදිරිපත් කරලා තියෙන්නේ?

පි : අප්‍රේල් 28 වෙනිදා T 03 ත්‍රස්ත මර්ධන විමර්ශන කොට්ඨාශය. ඒ.ඩබ්.එස්.පී.පෙරේරා සහකාර පොලිස් අධිකාරි .

ප : ඒ මේ ප්‍රහාරයට පසුව නේද?

පි : ඔව් පසුව.

ස්වාමිනි එම වාර්තාව C 863 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

දැනටමත් මේ කොමිෂන් සභාවට ඉදිරියේ ලකුණු කර ලද C 860 සිට C 862 දරණ ලේඛනවල ඡායා පිටපත් ලබා ගෙන එය සහතික කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරන අතර ඉන් පසු එකී ලේඛනවල මුල් ලේඛනය සාක්ෂිකරුට මුදා හරින ලෙසටද නියෝග කරමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප : ජයසුන්දර මහත්මයා ඔබ ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂකවරයා ලෙස බුද්ධි සමාලෝචන රැස්වීම්වලට සහභාගි වෙලා තියෙනවද ඒ තනතුරේ?

පි : අප්‍රේල් 09 වෙනිදා මතක හැටියට.

ප : මොන අවුරුද්දෙද?

පි : 2019 අප්‍රේල් 09 මගේ මතක හැටියට එක රැස්වීමට සහභාගි වුණා.

ප : ඇයි ඔබට ඒ රැස්වීමට සහභාගි වන්නට හේතු වුණේ. ඒ කියන්නේ ඔබ සාමාන්‍යයෙන් සහභාගි වෙන්නේ නෑ කියලනේ ඔය කියන්නේ ?

පි : ඔව් ඒ බුද්ධි සමාලෝචන රැස්වීමට මට එන්න කියන්නේ නෑ. එන්න කියලා තිබ්බේ නෑ.

ප : සාමාන්‍යයෙන් ඒ රැස්වීමට යන්නේ කවුද?

FAIR COMMENT BY JEZEEM

පි : මම 09 වෙනිදා යද්දී දැක්කා උතුමාණනි ඒකට ඇවිල්ලා හිටියා ආරක්ෂක ලේකම්තුමා, ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහත්මයා ඒ වගේම අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහත්මයා, යුධ හමුදා බුද්ධි අංශයේ අධ්‍යක්ෂක එවකට බ්‍රිගේඩියර් කොඩිතුවක්කු මහත්මයා ඒ වගේම ත්‍රිවිධ හමුදාපතිවරු සහ CDS ඒ කියන්නේ ඒකාබද්ධ මෙහෙයුම් ආඥාපතිවරයා හිටියා ඒ වගේම පොලිස්පතිවරයා හිටියා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා සහ අධ්‍යක්ෂකවරයා හිටියා වගේ මතකයි ශානි senior DIG මිස්ටර් රවී සෙනෙවිරත්නයි. හැබැයි ඒ ගොල්ලො කලින් ගියා excuse කරලා.

ප්‍ර : ඔබ කිව්වනේ ඔබ එදා තමයි ගියේ කියලා මේ රැස්වීමට?

පි : එහෙමයි.

ප්‍ර : යන්නට හේතු වුණේ හේතු වුණ කරුණ මොකක්ද?

පි : එදින මම අමාත්‍යාංශයේ රාජකාරියකට ගිහිල්ලා

ප්‍ර : මොන අමාත්‍යාංශයේද?

පි : ආරක්ෂක අමාත්‍යාංශයේ රාජකාරියකට ගිහින් ඉද්දී මට පොලිස්පතිවරයා හම්බ වුණා පුජිත් ජයසුන්දර මහත්මයා මේ අමාත්‍යාංශයට ඇවිල්ලා එතකොට මාව එක්කගෙන කිව්වා අද Conference එකක් තියෙනවා යං කියලා.

ප්‍ර : මොන Conference එකක්ද?

පි : Int Conference එකක්.

ප්‍ර : Int Conference එකක් කියන්නේ?

පි : මේ බුද්ධි සාකච්ඡාවක් තියෙනවා යං කියලා මාව එක්කං ගියා ඒ floor එකේම ඒ මහලේමයි තිබ්බේ 03 වෙනි තට්ටුවේ. අර Mini Conference room එකට එක්කන් ගියා.

ප්‍ර : ඔබ යන කොට ඒ රැස්වීම පටන් අරගෙන තිබුණද?

පි : නෑ ගියාට පස්සේ පටන් ගත්තේ.

ප්‍ර : එහෙම නම් එතන සිදු වුණ දේවල් ඔබට දකින්නට ඇහෙන්නට ඇති?

පි : එහෙමයි උතුමාණනි.

ප්‍ර : ඉස්සරවෙලාම ඒ සහභාගි වෙලා හිටපු අයගෙන් යම් ඉදිරිපත් කිරීමක් කවුරු හරි කළාද?

පි : මුලින්ම මට මතක හැටියට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා ඉදිරිපත් කිරීමක් කළා.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ නිලන්ත ජයවර්ධන මහත්මයා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා?

පි : එහෙමයි.

ප්‍ර : ඔහු මොනවා ගැනද කතා කළේ?

පි : මට මතක හැටියට මේ අන්තවාදී මේ ISIS මේ concept එක ගැන තමයි කතා කළේ. මොහොමඩ් සහරාන් ගැන කතා කළා. ඒ වගේම ISIS සංවිධානයේ විශේෂයෙන්ම සිරියාවේ සහ ලිබියාවේ ඒ තියෙන තත්ත්වය සහ මේ කියන සංකල්පය කතා බහට ලක් වුණා.

ප්‍ර : ISIS ගැන කතා කෙරුවා. සහරාන් ගැන කතා කෙරුවා?

පි : ඒ concept එක ගැන තමයි මැඩම් කතා කළේ. සහරාන් ගැනත් කතා කළා. ඒ වගේම මට මතක හැටියට ඔය ශ්‍රී ලාංකිකයන් පිරිසක් ගිහින් හිටියා ISIS සංවිධානයට.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඔබ කියන අප්‍රේල් 09 වෙනිදා බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීමේදී නිලන්තර ජයවර්ධන අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි සේවයේ ඔහුගේ කතාවේදී මේ ප්‍රහාරයක් විය හැකි බවට ලැබිලා තිබෙන තොරතුරු ගැන කතා කෙරුවද?

පි : උතුමාණනි මගේ මතකේ හැටියට සඳහන් කළේ නෑ.

ප්‍ර : සඳහන් කෙරුවේ නෑ?

පි : නෑ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : එහෙම ප්‍රහාරයක් ගැන මතකේ නෙවෙයි එහෙම ප්‍රහාරයක් ගැන එදා කතා කළා නම් තමන්ට විශේෂයෙන් ඒක හිතේ තියෙන්න එපැයි?

පි : එහෙම කතා කළේ නෑ ඒ ගැන.

ප්‍ර : කතා කළේ නෑ?

පි : කතා කළේ නෑ.

ප්‍ර : මතකයක් නෑ නෙවෙයි ඒක හරියට කියන්න?

පි : ඔව් කතා කළේ නෑ එදා.

ප්‍ර : කතා කළේ නෑ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අර්ෂා ජිනසේන මෙනෙවිය</u>

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට දැන් ඔබ කිව්වා අර C 768 වශයෙන් ලකුණු කරපු ලේඛනය ඔබට පොලිස්පතිතුමාගෙන් ලැබුණේ 2019 අප්‍රේල් 10 වෙනිදා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඒ අප්‍රේල් 10 වෙනිදා ලැබුණ ඒ ලේඛනයේ තිබුණු තොරතුරු ඔබ කියන්නේ කොයිම වෙලාවකවත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහත්මයා මේ 2019 අප්‍රේල් 09 වෙනිදා පැවති බුද්ධි සමාලෝචන රැස්වීමේදී වචනයක්වත් කතා කළේ නෑ කියලා?

පි : කතා කළේ නෑ උතුමාණනි හැබැයි සහරාන් ගැන කතා කළා මතකයි.

ප්‍ර : සහරාන් ගැන කතා කළා. ඔබටත් යම් අදහස් ප්‍රකාශ කිරීමක් ඒ අවස්ථාවේදී කරන්නට ලැබුණද?

පි : නෑ වැඩිපුර අදහස් කතාබහ වුණේ නිලන්ත ජයවර්ධන මහත්මයා ඊට පස්සේ යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ නියෝජිතයා කතා කළා අධ්‍යක්ෂකවරයා. ත්‍රිවිධ හමුදාපතිවරු කතා කළා. අවසානයේ මට පොඩි වෙලාවක් ලැබුණා මේ ගැන කතා කරන්න මම එතකොට ඔය සහරාන් කරන විමර්ශන ගොනු ගැන සඳහනක් කළා. ගොනු 15 ක් තිබ්බා ඒක 11 කට අඩුවෙලා ඒ ගැන සඳහනක් කළා මං.

ප්‍ර : දැන් ඒ වේලාවේවත් අවසානයෙන් අඩුම වශයෙන් නිලන්ත ජයවර්ධන මහත්මයා මේ තිබෙන තොරතුර ගැන ඒ ස්ථානයේදී ඒ රැස්වීමේදී කතා කළේ නැද්ද?

පි : නෑ කතා කළේ නෑ.

ප්‍ර : කතා කළේ නෑ. දැන් ඔබ සඳහන් කළා මේ ගරු කොමිෂන් සභාවට එම රැස්වීමේදී ඒ රැස්වීමට සහභාගි වෙලා හිටියාය කියලා ත්‍රිවිධ හමුදාවේ බුද්ධි සමාජිකයින්?

පි : යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ අධ්‍යක්ෂකවරයා that is directorate of Military Intelligence.

ප්‍ර : DMI සහ

පි : CDS හිටියා.

ප්‍ර : එතකොට

පි : ත්‍රිවිධ හමුදාපතිවරු හිටියා.

ප්‍ර : ත්‍රිවිධ හමුදාපතිවරු හිටියා. එතකොට ඒ වගේ නිලධාරීන් ඉන්න ස්ථානයක SIS Director ඔහුට ලැබිලා තිබුණ මේ තොරතුර පිළිබඳව ඔබත් විමර්ශනය කරන ඊට අදාළ පුද්ගලයෙක් ඉන්න මේ තොරතුර ඒ වේලාවේ කිව්වා නම් ඒක ඔබට වැදගත් වෙනවද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අනිවාර්යෙන්ම වැදගත් වෙනවා.

ප්‍ර : මේ සියළුම නිලධාරීන් ඉන්න ස්ථානයක එවැනි තොරතුරක් ඔබට ලැබුණා නම් ඔබ මොකද කරන්නේ ඒ අවස්ථාවේදී?

පි : ඒ තොරතුර එතන ලැබුණා නම් මම හිතනවා විශේෂයෙන්ම ත්‍රිවිධ හමුදාවේ ත්‍රිවිධ හමුදාපතිවරු හිටියා. ඒ වගේම කණ්ඩායමක් විදිහට ගත හැකි ක්‍රියාමාර්ගයකට යන්න තිබ්බා.

ප්‍ර : ඇයි ඔබ එහෙම කියන්නේ?

පි : මොකද උතුමාණනි මේ සිද්ධිය දෙස බැලීමේදී මම අධ්‍යක්ෂකවරයා විදිහට මම ගත්ත පියවර ගැන මම දැන් කරුණු ඉදිරිපත් කළා. නමුත් මේ ප්‍රහාරය ගැන පසු විපරමක් කරද්දී එක එක ආරක්ෂක අංශ ප්‍රධානීන් අපි පියවර අරගෙන තිබ්බත් මේකේ collective නැත්නම් කණ්ඩායම් පියවර ගැනීමක් සිදු වීමක් දකින්නේ නෑ.

ප්‍ර : ඒ කියන්නේ සාමුහිකව සියළු දෙනා එකතු වෙලා මේ පියවර ගත්තා නම්

පි : ගත්තා නම් මේ ප්‍රහාරය වළක්වා ගන්න තිබ්බා.

ප්‍ර : ඒ තමයි ඔබේ මතය?

පි : මගේ මතය.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : ඔබ 2019 අප්‍රේල් 09 වෙනිදා පැවැත්වූ මේ බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීම අවසන් වන තෙක් හිටියද?

පි : එහෙමයි උතුමාණනි.

ප්‍ර : ඒ රැස්වීමේදී කිසිම අවස්ථාවක ඔය C 4 සහ C 4 (A),(B),(C) දරන ලේඛන වලින් ලැබී තිබෙන මේ ප්‍රහාරයක් පිළිබඳ තොරතුරු සාකච්ඡා වුණාද?

පි : සාකච්ඡා වුණේ නෑ.

ප්‍ර : සාකච්ඡා වුණේ නෑ?

පි : වුණේ නෑ.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු 09 වෙනිදා තමන්ට ලිපිය ලැබුණයින් පස්සේ බුද්ධි තොරතුර තමන්ලාගේ තමන්ලා ප්‍රභූ ආරක්ෂක සේවයේ හෝ වෙනත් කොහේ කුමන ස්ථානයක හෝ ආරක්ෂාව තර කළාද?

FAIR COMMENT BY JEZEEM

පි : අධ්‍යක්ෂක තුස්ත විමර්ශන කොට්ඨාශය විදිහට 10 වෙනිදා අපි ඇත්තටම ප්‍රභූ ආරක්ෂක රාජකාරී කරන්නේ නෑ.

ප්‍ර : sorry. නෑ දැන් STF commander නේ දැන් ඉන්නේ?

පි : එහෙමයි.

ප්‍ර : දැන් තමන්ලා ඒ ලිපි ගොනු බැලුවාම තමන්ට දැන ගන්න ලැබුණද එම 10 වෙනිදා පමණ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂාව තර කළාද කියලා?

පි : උතුමාණනි ඇත්තටම විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරියා ගත්ත පියවර සම්බන්ධව මම මේ පසු විපරමක් කළේ නෑ. නමුත් විශේෂ කාර්ය බලකායේ නිලධාරියෙක් විදිහට මට අද මේ තොරතුර ලැබුණා නම් අනිවාර්යෙන්ම එතන ඉන්නවා ආරක්ෂක උපදේශකයෝ ඉන්නවා. ඉතින් එහෙම BSF එක Indian boarder security force. එක තමයි secure කරන්නේ Indian high commission එක. අපි අනිවාර්යෙන්ම ඒ ගොල්ලොත් එක්ක සම්බන්ධ වීමක් වෙනවා. ඒ වගේම අපේ තියෙනවා diplomatic security division කියලා ඒක තමයි මේ ලියුම යොමු කරලා තිබ්බේ ඒකේ නියෝජ්‍ය පොලිස්පතිවරයාට. ඔහු අනිවාර්යෙන්ම සම්බන්ධ වෙන්න ඕනේ ඉන්දියානු ආරක්ෂක අංශ එක්ක.

ප්‍ර : දැන ගන්න අවශ්‍යයි කොමිෂන් සභාවට එදා ආරක්ෂාව තර කිරීමක් කරලා තියෙනවද කියන එක එදා කියන්න පුළුවන්ද ඒ ගැන?

පි : ඒ ගැන මට අදහසක් ප්‍රකාශ කරන්න බෑ.

ප්‍ර : තමන්ගෙන් ඒ ප්‍රශ්නය ඇහුවේ ආරක්ෂාව තර කරන්න තමන්ලා ගත්ත ආරක්ෂක ක්‍රියාමාර්ග ගැන මේ කරුණු සැලකීමට තමයි ඒ ප්‍රශ්නේ ඇහුවේ මම?

පි : එහෙමයි.

ප්‍ර : ඒකත් ආරක්ෂක ක්‍රියාමාර්ග ආරක්ෂක අංශවලින්?

පි : උතුමාණනි දැන් මේ මට ආපු ලියුමේ අර DIG SPR කියලා තිබ්බනේ. එතකොට අපිට අනිවාර්යෙන්ම තේරෙනවා එයා යටතට මේක වැටෙන නිසා දැන් TID එක කියන්නේ අපි විමර්ශකයෝ. ඒ නිසා ඒ ගැන මං සොයා කටයුතු කිරීමක් කළේ නෑ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : 2019 අප්‍රේල් මාසේ 09 වෙනිදා බුද්ධි සමාලෝචන රැස්වීමට ඔබ සහභාගි වුණාට පස්සේ ඔබට මතකද කාත්තන්කුඩියේ පාලමුණෙයි බයිසිකල් බෝම්බයක් පිපිරුවා?

පි : එහෙමයි මම ඒක දැන ගත්තේ අප්‍රේල් 19 වෙනිදයි. ඒ කියන්නේ මහ සිකුරාදා මට උදේ කතා කළා නිලන්ත ජයවර්ධන මහත්මයා. කතා කරලා ඇත්තටම මගෙන් ඇහුවා මේ සිද්ධියක් වෙලා තියෙනවා දන්නවද කියලා මං දැනන් හිටියේ නෑ ඒක. පස්සේ මට කිව්වා මෙහෙම සිද්ධියක් වෙලා තියෙනවා කියලා මං ඒ ගමන්ම කතා කළා මගේ කල්මුණේ ඒකකයට. ඒ ගොල්ලො දැන ගෙන හිටියෙත් නෑ. පස්සේ මේක නිලන්ත ජයවර්ධන මහත්මයා කිව්වේ පොලිසිය කියන්නේ මේක අකුණක් වැදුනා කියලා නමුත් ඇත්තටම මල්ලි මේක මෙතන blast එකක් වෙලා තියෙන්නේ කියලා. පස්සේ situation report එක බලද්දී මට මතක හැටියට මේ අකුණක් වැදුනා කියලා තමයි 17 හරි අපේ daily situation sitrep එක එනවා ඒකෙත් සඳහන් වෙලා තියෙන්නේ. ඒ ගමන්ම මම මගේ කල්මුණේ නිලධාරීන්ට මම පොඩ්ඩක් කෑ ගැහුවා මේ කිව්වා ගිහින් immidiately මේ තැන බලන්න කියලා. පස්සේ කල්මුණේ නිලධාරීන් 19 වෙනිදා මේ පාලමුණේ ස්ථානයට ගියා. ගිහින් මං කිව්වා මට call එකක් ගන්න කියලා. ඒ නිලධාරීන් කතා කළා. කතා කරලා කිව්වා සර් මෙතන පොලිසිය කියන්නේ නම් මේක අකුණක් ගැහුවා කියලා පස්සේ මම ඇහුවා මොකක්ද වටේ මම STF එකේ නිලධාරියෙක් මොකක්ද වෙලා තියෙන්නේ මේ ගොල්ලො කිව්වා මේ වටේ අර බෙලෙක් හිල් වෙලා තියෙනවා . මං කිව්වා ඕක අනිවාර්යෙන් අකුණක් ගහන්න බෑ. අකුණක් ගැහුවා නම් ගිනි ගන්නවා. explosion එකක් තියෙනවා. ඒකයි damage වෙලා තියෙන්නේ. හැබැයි මට ඒ වෙලාවේ කිව්වා STF Teams ඇවිල්ලා ඉන්නවා කියලා BD teams . ඒ කියන්නේ STF එකේ නිලධාරීන් මම කිව්වා හරි ඒ ගොල්ලො අනිවාර්යෙන්ම ඕක හොයා ගයි ඒ වගේම සොකෝ අපරාධ ස්ථාන පරීක්ෂක කණ්ඩායමුත් ආවා කිව්වා මඩකලපු පොලිසියේ හරි කාත්තන්කුඩි. ඉතින් ඉන් පස්සේ අපි විමර්ශකයෝ හැටියට post blast investigation නැත්නම් පශ්චාත් පිපුරුම් විමර්ශන කරන්නේ නෑ. මං කිව්වා මේක හොයන්න මොකක්ද මේ පසුබිම කියන එක හොයන්න කියලා මං දැනුවත් කළා ඒ නිලධාරීන්ට.

ප්‍ර : දැනුවත් කළා ඒ නිලධාරීන්ට. එතකොට ඔබට ඒ පිළිබඳ ඔබේ අවධානයට යොමු කෙරුවේ එහෙම නම්

පි : නිලන්ත ජයවර්ධන

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : SIS Director?

පි : Director.

ප්‍ර : ඒ කියන්නේ නිලන්ත ජයවර්ධන මහත්මයා?

පි : නිලන්ත ජයවර්ධන මහත්මයා.

ප්‍ර : ඔබ ඒ තොරතුරු දැන ගත්තට පස්සේ ඔබ කිව්වා පසු විපරම් කිරීමක් කෙරුවාය කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ඒ අවස්ථාවේදී දැන් ඒ අවස්ථාවේදී මොකක්ද නිලන්ත ජයවර්ධන මහත්මයා කිව්වේ මේක මල්ලි

පි : explosion එකක්

ප්‍ර : අකුණක් නෙවෙයි

පි : නෙවෙයි

ප්‍ර : මේක explosion එකක් කියලා?

පි : ඔව්. එයා සැක කරනවා කියලා ඇත්තටම කිව්වේ මේ වරුණ මේක මේ පොලිසිය කියන්නේ අකුණක් ගැහුවා කියලා නමුත් මේක අනිවාර්යෙන්ම අකුණක් ගහපු එකක් නෙවෙයි කියලා එයා කිව්වා.

ප්‍ර : දැන් සාමාන්‍යයෙන් SIS Director ඔබට ඒ වගේ පෞද්ගලිකව නිතර කතා කරනවද?

පි : නිරන්තරයෙන් කතා කරන්නේ නෑ. ඉඳලා හිටලා කතා කරනවා.

ප්‍ර : ඒ කතා කරන අවස්ථාවල් වලදී යම් වැදගත් කරුණක් තිබ්බොත්ද කතා කරන්නේ?

පි : මොනවා හරි ඊට කලින් කතා කරපු අවස්ථාවක් මට මතක නෑ. නමුත් මේ අවස්ථාවේ කතා කළා ඒ වගේම

ප්‍ර : ඔය අවස්ථාවේදී කතා කළාම ඔය සිද්ධිය ගැන ඇර වෙන පෞද්ගලික තොරතුරු හුවමාරු කර ගැනීමක් කතා කිරීමක් ඔහු කළාද?

පි : ඔව් ඒ කියන්නේ මැඩම් ඒ කියන්නේ එයා he was worried. මට තේරෙනවා එයා ගොඩක් හිතේ යම් කිසි මේකකින් හිටියේ. මට කතා කරලා

ප්‍ර : ඒ කියන්නේ තැතිගැන්මක්ද, කලබලවීමක්ද?

පි : එහෙම යම් කිසි එයාගේ ටෝන් එකෙන් මට තේරුණා මොකද එයත් මං වගේම සහකාර පොලිස් අධිකාරිවරයෙක් විදිහට මට අවුරුදු දෙකකට කලින් පොලිසියට ආවේ. ඉතින් අපි දෙන්නා අතර හොඳ සම්බන්ධතාවයක් තිබ්බා. එයා මතක් කළා අර 09 වෙනිදා meeting එකේ කතා වෙච්ච දේත් එක්ක කිව්වා මල්ලි

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ලොකු ප්‍රශ්නයක් මේක. ඒ කියන්නේ මේ ගොල්ලො attack එකක් කරන්න යන්නේ.

ප්‍ර : 16 වෙනිදා ඔබට කිව්වද ඒක?

පි : 19 වෙනිදා එයා මතක් කළා.

ප්‍ර : 19 වෙනිදා?

පි : ඔව්. 09 වෙනිදා අපේ discussion එකයි. මේ එයා කතා වුණා.

ප්‍ර : ඔව්.

පි : කතා කරලා ඇත්තටම මගේ අවධානයට යොමු කළේ ඔය පාලමුණෙයි බයිසිකලේ සිද්ධිය දන්නවද කියලා ඇහුවා. මම කිව්වා සර් මම ඇත්තටම දන්නේ නෑ කියලා මේ පස්සේ මං කිව්වා මට unit එකෙන්වත් කල්මුණේ කිව්වේ නෑ කියලා. පස්සේ කිව්වා බලන්න මේක explosion එකක් කියලා මහත්මයා මට කිව්වා. පස්සේ තමයි මං අර පියවර ටික ගත්තේ.

ප්‍ර : දැන් ඒ අවස්ථාවේදී ඔබට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහත්මයා කිව්වද මට තොරතුරක් ලැබිලා තියෙනවා නැත්නම් රාජ්‍ය බුද්ධි සේවයට තොරතුරක් ලැබිලා තියෙනවා විදේශයකින් මේ වගේ ප්‍රහාරයක් සඳහා කෙටි කාලයක් තුළදී ඉඩ තියෙනවයි කියලා?

පි : එහෙම දෙයක් කිව්වේ නෑ.

ප්‍ර : එහෙම දෙයක් කිව්වේ නෑ?

පි : එහෙමයි.

ප්‍ර : නමුත් ඔබ කියන්නේ මේ 19 වෙනිදා ඔබට නිලන්ත ජයවර්ධන මහත්මයා කතා කළාම මේ බයිසිකල් බෝම්බය පිළිබඳව නැත්නම් පාලමුණෙයි සිදු වුණ පිපිරීම පිළිබඳව කතා කෙරුවා කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ඔබ කියනවා නිලන්ත ජයවර්ධන මහත්මයාව ඔබට වඩා වසර දෙකක් සේවයේ ජ්‍යෙෂ්ඨ වූ සහකාර පොලිස් අධිකාරිවරයෙක් විදිහට ජ්‍යෙෂ්ඨ වූ මේ නිලධාරියා ඔබ හොඳින් හඳුනා ගෙන හිටියා කියලා?

පි : ඔව් අවුරුදු 3 ක් senior ඒ කියන්නේ අපි සම්බන්ධයක් තිබ්බා ඒ කියන්නේ දෙනිකව කතා බහා කළේ නැති වුණාට.

ප්‍ර : ඒ කියන්නේ ඔහු කතා කරන විදිහ, ඔහු හැසිරෙන විදිහ, ඔහු හැඟීම් පාලනය කරන විදිහ ඒ පිළිබඳව ඔබට ඔහු ඔබ ඉදිරියේ ඉඳගෙන කතා නොකළත් දුරකථනයෙන් කතා කෙරුවත් වටහා ගන්නට පුළුවන් තරම් ආකාරයේ ළඟ කිට්ටු මිත්‍ර සංතවයක් තිබුණා නේද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : තිබ්බා සහ උතුමාණනි විශේෂයෙන්ම 09 වෙනිදා මට මතකයි මහත්මයා සෑහෙන්න උත්සාහ කළා මේ සහරාන්ගේ මේ ප්‍රශ්නේ ගැන convince කරන්න. ඒ කියන්නේ

ප්‍ර : කාවද ?

පි : එතන හිටපු මණ්ඩලය මහත්මයා සෑහෙන්න මේ උත්සාහ කළා අවබෝධ කරලා දෙන්න මේ සහරාන්ගේ threat එක අර attack එක ගැන කිව්වේ නැති වුණාට ඒ ගැන සෑහෙන කරුණු ඉදිරිපත් කිරීමක් කරලා ඒ කියන්නේ එතන හිටපු කට්ටියව දැනුවත් කරන්න උත්සාහ කළා මේ ලොකු threat එකක් මේ මිනිහා කියන එක.

ප්‍ර : නමුත් ඒ තර්ජනය ගැන කිව්වා වුණාට ඔබ කිව්වා ඔබත් සහභාගි වුණ ඒ රැස්වීමේදී විමර්ශකයෙක් විදිහට මේ සහරාන්ව අත්අඩංගුවට ගන්නට කටයුතු කරපු මේ ලැබුණු තොරතුර SIS එකෙන් ඒ රැස්වීම වේලාවේදී කිව්වා නම් ඔබගේ රාජකාරීවලට එකෙන් මහත් පිටු බලයක් ලැබෙනවා කියලා?

පි : මට වඩා උතුමාණනි එතන මම දැක්කා ත්‍රිවිධ හමුදාව හිටියා, යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව එතකොට ඒගොල්ලොන්ගේ සහාය අපිට ගන්න තිබ්බා. ඒ වගේම විශේෂයෙන්ම මම මෙතන අඩුවක් දකිනවා විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරීවරයා ඇත්තටම එතන ඉන්න තිබුණා.

ප්‍ර : ඔහු හිටියේ නැද්ද?

පි : හිටියේ නෑ.

ප්‍ර : ඒ කියන්නේ ඒ අවස්ථාව වෙන කොට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලතිෆ් මහතා?

පි : හිටියේ නෑ ඒ වගේම දැන් මේ සහරාන්ගේ සිද්ධිය අපි ආරක්ෂක මණ්ඩලය ගත්තත් මට දැන ගන්න තිබ්බ ආකාරයට විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරීවරයාට එන්න කියන්නේ නෑ. නමුත් මම විශේෂ කාර්ය බලකායේ හැකියාව හොඳට අඳුරන නිලධාරියෙක්. මේ තොරතුර 2018 ජූලි මාසේවත් විශේෂ කාර්ය බලකායට ලබා දුන්නා නම් අනිවාර්යෙන්ම මේ සහරාන්ව අඩපණ කරන්න හැකියාවක් විශේෂ කාර්ය බලකායට තිබ්බා. මොකද සාමාන්‍යය පොලිස් සේවය සහ යුධ හමුදාව අතර රැඳී ඉන්න අතුරු ඒ කියන්නේ විශේෂ ඒකකයක් විශේෂ කාර්ය බලකාය කියන්නේ දැනට සංවිධානාත්මක අපරාධ අපි මර්දනය කරනවා වගේ මේ සහරාන්ගේ මේ තොරතුරු ඇත්තටම STF එකට දීලා තිබ්බා නම් මීට වඩා දෙයක් අනිවාර්යෙන්ම කරන්න තිබ්බා. විශේෂයෙන්ම

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

මේ සාකච්ඡාවෙත් STF එක හිටියා නම් ඒ වගේම මේ තොරතුර දුන්නා නම් එතෙන්දී යුධ හමුදාවේ ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන් හිටපු නිසා අනිවාර්යෙන්ම කණ්ඩායම් collective effort එකක් අපිට ගන්න තිබ්බා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ බුද්ධි සමාලෝචන රැස්වීමේදී යන අවස්ථාවේදී තමන්ට මෙම බුද්ධි තොරතුර ලැබිලද තිබ්බේ?

පි : නෑ උතුමාණනි.

ප්‍ර : එතකොට ලැබිලා තිබුණේ නෑ?

පි : ලැබිලා තිබ්බේ නෑ.

ප්‍ර : එතකොට එදින තමන්ට කියන්න පුළුවන්ද කෙටියෙන් කියන්න මෙම ප්‍රහාරය ගැන තමන්ලා දැනුවත් කළාද?

පි : නෑ දැනුවත් කළේ නෑ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ කිව්වා ඔය අප්‍රේල් 09 වෙනිදා තිබ්බ බුද්ධි සමාලෝචන රැස්වීමේදී මේ ප්‍රහාරය සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් කෙරුවේ නෑ කියන එක ඔබ කිව්වනේ?

පි : එහෙමයි.

ප්‍ර : ඒත් සමඟම ඔබ කිව්වා සහරාන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් යම් කිසි අවබෝධයක් ඇති කිරීමට නිලන්ත ජයවර්ධන හුඟක් ප්‍රයත්නයක් දැරුවා කියලා?

පි : උත්සාහ කළා.

ප්‍ර : එවැනි ප්‍රයන්තයක් නිලන්ත ජයවර්ධනට ඔය රැස්වීමේදී කරන්න වුණේ මොකක්ද හේතුව ඒ වගේ ප්‍රයත්නයක් දරන්න හේතු වුණේ?

පි : ඒ කියන්නේ උතුමාණනි ජයවර්ධන මහත්මයාට මේක තේරිලා තිබුණේ මට තේරෙන්නේ මේකේ තියෙන මේ තර්ජනය මේ සහරාන්ගේ මේ ප්‍රශ්නය තුළ එයා මට තේරෙන දේ පෞද්ගලිකව එයා යම් දෙයක් දැක්කා මේ ලොකු threat එකක්. ඒ නිසා එයා සෑහෙන්න එතන උත්සාහයක් ගත්තා අර possible attack එක ගැන කිව්වේ නැති වුණාට මේ සහරාන් කියන කෙනා ලොකු තර්ජනයක් කියන එක එතෙන්දී අවබෝධ කර දෙන්න උත්සාහ කළා.

FAIR COMMENT BY JEZEEM

ප : ඔහුට ඒ වගේ උත්සාහයක් ගන්න හේතු වුණේ මොකක්ද කියලා මම අහන්නේ ?

පි : මම හිතනවා අනිවාර්යෙන් ඔහු මේ අනිවාර්යෙන්ම ඔහු මේ තොරතුර දැන ගෙන හිටියා ඒ වේලේ. ඒ කියන්නේ මේ අප්‍රේල් 09 වෙද්දී මේ

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප : තොරතුරු ලැබිලා තිබුණා ඔහුට?

පි : තිබ්බා එතන ප්‍රකාශයේ මම හිතන්නේ ඒ නිසා සහ ඒ වගේම රාජ්‍ය බුද්ධි සේවයත් මොහුගේ ක්‍රියාකාරකම් දිගටම ආවේෂණය කරන්න ඇති. ඒ හේතුවෙන් උතුමාණනි අර තොරතුරක් පසුතලයේ තියෙද්දී මෙයා ගැන මේ කරන්න යන දේ එයා ප්‍රකාශ කිරීමක් කළා කියලා තමයි මට හැඟෙන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප : නෑ මම ඔබෙන් අහන ප්‍රශ්නේ ඔබට තේරුණේ නෑ තාම? දැන් ගුරුවරයෙක් ළමයෙකුට උගන්වනවා නම් ළමයා ඉක්මනට ඉගෙන ගන්නවා නම් ගුරුවරයාට එච්චර ප්‍රයත්නයක් දරන්න ඕනේද ළමයාට උගන්වන්න? ගුරුවරයා හදනවා ළමයාට උගන්වන්න ළමයාට කියන දේ ඉක්මනට අවබෝධයක් වෙනවා නම් ගුරුවරයාට ඒ ළමයාට උගන්වන දේ කරන්න එච්චර ප්‍රයත්නයක් දරන්න ඕනේද?

පි : එහෙම අවශ්‍ය වෙන්නේ නෑ.

ප : එතකොට එහෙම නම් නිලන්ත ජයවර්ධනට මේ බුද්ධි සමාලෝචන රැස්වීමේදී ඔබ කියන පරිදි ඔච්චර ප්‍රයත්නයක් දරන්න ඕනේ වුණේ ඇයි සහරාන් හෂීම්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීමට?

පි : එතන ඒ සභාව තුළ මම පළවෙනි වතාවට ඒ ගියේ ඒ forum එකට. මට හිතෙන්නේ උතුමාණනි ඒ කියන්නේ මේකේ seriousness එක සමහර විට එතන කථිකාවක් විදිහට නිලන්ත ජයවර්ධන උත්සාහ කළාට එතන ඒ රැස්වෙන පිරිසට අවබෝධයක් තිබ්බේ නැති නිසා විය හැකියි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

FAIR COMMENT BY JEZEEM

ප : ඔබගේ ඒ ප්‍රකාශය ඔබ කියන්නේ එහෙම අවබෝධයක් නෑ කියලා එතකොට බුද්ධි අංශවලට හමුදා බුද්ධි අංශවලට තොරතුරු ලැබිලා තිබුණා සහරාන් සම්බන්ධව විශේෂයෙන් නේද?

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප : මං ඔබෙන් ඇහුවා ඒ රැස්වීමේදී නිලන්ත ජයවර්ධනට එච්චර ප්‍රයත්නයක් දරන්න වුණේ ඇයි කියන එක. එතකොට ඔබ කිව්වා එතන හිටපු කට්ටියට ඒ සම්බන්ධයෙන් අවබෝධයක් තිබ්බේ නෑ කියන එක?

පි : මට එහෙම හිතන්න වෙනවා.

ප : එයින් ඔබ අදහස් කෙරුවේ එතන හිටපු තීරණ ගත හැකි නිලධාරීන් ඔය තර්ජනයේ ස්වරූපය අවබෝධ කර ගැනීමට නොහැකිව තිබ්බා කියන එකද?

පි : මම හිතන්නේ උතුමාණනි ඒ කියන්නේ මම එකඟ වෙනවා. අපි ඒ ගොල්ලොන්ට ඒ වෙද්දී එතන අපි එහෙම අවබෝධයක් උදා කර ගෙන තිබිලා නෑ ඒ වෙද්දී.

ප : කියන්න.

පි : මම එකඟ වෙනවා උතුමාණන් කියපු දේට. ඒ කියන්නේ මට තේරුණේ මගේ පළවෙනි සාකච්ඡාව වුනත් ඇයි මෙයා මෙච්චර effort ගත්තේ කියලා ඒ කියන්නේ එයාට තේරිච්ච දේ එතන forum එකේ කට්ටියට සමඟර විට අවබෝධයක් නැතිව තියෙන්න ඇති කියලා එයාට

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප : සහරාන් ගැන එච්චර කියන්න දෙයක් නැනේ මේ තොරතුර කිව්වා නම් කෙළින්ම අවබෝධ වෙන්න ඕන නේ ප්‍රහාරයක් කරන්න

පි : අනිවාර්යෙන්ම.

ප : මේ විදේශීය තොරතුරක් මෙහි තියෙනවා ඒක විශේෂ තොරතුරක් බුද්ධි තොරතුරක්. එය බුද්ධි සමාලෝචන රැස්වීමේදී කිව්වා නම් ඔය සහරාන් ගැන අනිත් විස්තර ඕනේ නෑ ඒ කරුණ පමණක් ඇති

පි : අනිවාර්යෙන්ම.

ප : අනිවාර්යෙන්ම මේ බුද්ධි සමාලෝචන මණ්ඩලයට යම් කිසි ක්‍රියාත්මක වෙන්න?

පි : අපිට එකතු වෙලා ත්‍රිවිධ හමුදාවත් එක්ක කණ්ඩායම් ප්‍රයත්නයක් collective effort එකක් ගන්න තිබුණා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට නිලන්ත ජයවර්ධනට ඇයි තමන්ට කියන්න පුළුවන්ද ඇයි ඒ තොරතුර කියන්න බැරිකමක් තිබ්බේ කියලා?

පි : උතුමාණනි ඒක මට කියන්න අමාරුයි. මේ සහරාන් ගැන ගොඩක් කතා කළා නමුත් attack එක ගැන කිව්වේ නෑ.

****

දැන් වේලාව : ප.ව.09.35 යි.
මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙය.

වේලාව: ප.ව. 09.35
පෙර සටහන් : මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සවිනි මෙනවිය.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: Mr. ජයසුන්දර දැන් ඔබ කියනවනේ සහරාන් ගැන 09 වැනි දින බුද්ධි සමාලෝචන රැස්වීමේ දී නිලන්ත ජයවර්ධන මහතා ගෙඩාක් දේවල් කිව්ව කියලා. ඔබට පුළුවන් ද මේ කොමිෂමට කියන්න ඒ කියපු ගොඩක් දේවල් වලින් කොටසක් ටිකක් හෝ මොනවද ඔහු කිව්වේ සහරාන් ගැන?

උ: උතුමාණනි දැන් සහරාන්ගේ ක්‍රියාකාරීත්වය මට දැන් අවුරුදු 02 කට එහා නිසා මට හැමදේම මතක නැහැ. නමුත් සහරාන්ගේ පසුබිම දැන් සහරාන් කාත්තන්කුඩි ප්‍රදේශයේ ඉපදිලා ඊට පස්සේ මේ ඉස්ලාම් ආගමේ අන්තවාදී පැත්තට ගිහින් ඊට පස්සේ ඔය ප්‍රශ්න ඇති කරගෙන ඔය කාත්තන්කුඩිය ප්‍රදේශයේ එයාගේ විකාශනය ගැන කතා කරා. ඒ වගේම මට මතක හැටියට ඔය ISIS වලට ගියා ගලේවෙල පැත්තේ විදුහල්පති කෙනෙක් හිටපු ශ්‍රී ලාංකිකයන් ISIS එකට යන එක ගැන කතා කරා. ඒ වගේම මුහුණු පොත ආශ්‍රයෙන් මෙයා මේ නිකුත් කරන දේවල් ජාතීන් අතර ආගමික සංහිඳියාවට කරන ලද බලපෑම. එතකොට ඒ වගේම තමයි මෙයාව ඒ වෙද්දිත් අත්අඩංගුවට ගන්න බැරි වෙලා තිබ්බා. එසේම විමර්ශන කටයුතු වල ප්‍රගතිය ඒ වගේ දේවල් කතා වුණා.

ප්‍ර: දැන් ඔබ ඒ අවස්ථාවේ දී කතා කළේ නැද්ද නිලන්ත ජයවර්ධන මහත්මයා සහරාන් සහ කොළඹ ප්‍රදේශයේ ක්‍රියාත්මක වන ඉස්ලාම් ආගමික අන්තවාදී පිරිසක් IS සංවිධානයත් එක්ක සම්බන්ධතා පවත්වන සහ ඔවුන් සහ සහරාන් අතර සම්බන්ධතාවයක් තිබෙන බව නිලන්ත ජයවර්ධන මහතා කිව්වේ නැද්ද අඩුගානේ ඒකවත් කිව්වේ නැද්ද?

උ: කිව්වේ නැහැ උතුමානණි. දැන් ලංකාවේ පිරිසක් ISIS සංවිධානයට බැඳෙන්න ගිය ගැන කිව්වා. නමුත් සහරාන් තියෙන තොරතුරු අනුව සිරියාවට හෝ ඉරාකයට, ලිබියාවට ගිහින් තිබ්බේ නැහැ.

ප්‍ර: නැහැ කියලා නිලන්ත ජයවර්ධන මහතා කිව්ව ද එදා ?

උ: ඒ කියන්නේ දැන් ඒ කාලේ මට එදා කිව්ව ද කියලා මතක නැහැ. නමුත් විමර්ශකයෙක් විදියට මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් එක්ක විමර්ශන වලට සහභාගි වුණාට පස්සේ දැක්කේ එයා දැන් මෙතැන හැබැයි උතුමාණනි අර එක ප්‍රහාරකයෙක් හිටියා එයා සිරියාවට යන්න උත්සාහ කරා.

ප්‍ර: නැහැ ඔබ මං හිතන්නේ M.r. ජයසුන්දර එතැන්ට යන්න එපා. මං ප්‍රශ්නය අහන්නේ එදා ඔය කියන 09 වැනිදා රැස්වීමේ දී නිලන්ත ජයවර්ධන මහතා ගොඩක් උත්සහා ගත්තනේ විස්තර කියලා කියලා මේ සහරාන් ගැන අවබෝධ කරන්න අනිත් නිලධාරීන්ට. එතැන්දි තමයි ඔය IS සංවිධානයට සම්බන්ධකම් පවත්වන කොළඹ ක්‍රියාත්මක වන ඉස්ලාම් ආගමික අන්තවාදී තරුණ පිරිසක් ඉන්නවා සහ ඔවුන් සහ සහරාන් අතර

FAIR COMMENT
BY JEZEEM

සබඳතාවයක් තියෙනවා කියන එක නිලන්ත ජයවර්ධන මහතා එදින කතා කරාද කියලා තමයි මං ඇහුවේ?

උ: ඒක ගැන උතුමාණනි මට මතකයක් නැහැ. එහෙම කිව්ව ද කියලා. ඔය කියන්නේ කොළඹ සංවිධානය වෙච්ව Colombo Chapter එක ගැන මං හිතන්නේ. ඒ කියන්නේ කොළඹ හිටපු පිරිස සහරාන්ගේ චරිතය සහ ඔහුගේ ආගමනය ගැන කතා වුණා. ඒ වගේම සිරියාවට සහ ලිබියාවට යන්න ගිය Sri Lankanලා ඒ ගැන කතා වුණා. ඒ වගේම දැනට කරන විමර්ශන ගැන කතා වුණා.

ප්‍ර: ඔබ දැන් එක අවස්ථාවක දී කිව්වා නිලන්ත ජයවර්ධන මහතා කිව්වා කියලා අප්‍රේල් 16 වැනි දින පුපුරාගිය මෝටර්සයිකල් බෝම්බය පොලීසිය ඔහුට වාර්තා කරන්නේ අකුණක් වැදීමක් කියලා කියලා. නමුත් ඔහු ඔබට කිව්වා කියලා නැහැ නැහැ එහෙම වෙන්න බැහැ කියලා ඔබට හිතන්නට පුළුවන් ද නිලන්ත ජයවර්ධන මහතා දැන් පොලීසිය කියන දේට වඩා මෙහෙ ඉඳලා කොහොමද කියන්නේ කියලා එතැන අකුණක් වැදිලා නෙවෙයි වෙන පිපිරීමක් කියලා. ඒ කොහොමද නිලන්ත ජයවර්ධන මහතා ඔබට කියන්නේ මෙහෙ ඉඳලා?

උ: උතුමාණනි එයාගේ ඒකක නිලධාරීන් ඉන්නවා. මඩකලපුවේ unites තියෙනවා. SIS එකේ. මං හිතනවා එයාට මේ ගැන තොරුතුරු වාර්තා වෙන්න ඇති.

ප්‍ර: ඒකක නිලධාරීන්ගෙන්?

උ: උප ඒකක තිබෙනවා මඩකලපුවේ .

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: 19 වැනිදා බයිසිකල් බෝම්බය ගැන කතා කරන වෙලාවේ ඔබ කිව්ව ද නිලන්ත ජයවර්ධනට ඔබලට භාර දෙන්න අපි බලාගන්නම් කියලා කිව්ව ද?

උ: ඒක එහෙම කතාවක් නෙවෙයි උතුමාණනි.

ප්‍ර: මොකද්ද කිව්වේ තමන් ?

උ: ඒ කියන්නේ මම දැන්නුවා එක දෙයක් මම විශේෂ කාර්ය බලකාය නිලධාරීයෙක් මම කිව්වා මම දැන් බලාපොරොත්තු වෙනවා STF එකෙන් පොලීසියට ආපු Team එකක් TID එකට ගන්න. මම ඇත්තටම පොලිස්පතිවරයාගෙන් ඉල්ලීමක් කරලා තිබ්බා මොකද TID එකේ ඉන්නේ Investigators ලා. නමුත් මම විශේෂකාර්ය බලකාය නිලධාරීයෙක් කියන්නේ ඔපරේෂන් හැකියාවක් තියෙන කෙනෙක්. ඒ නිසා මම 20 ක කණ්ඩායමක් බඳවා ගන්න සැලසුම් කරලා තිබ්බා. TID

LEAK COMMENT BY JEZEEM

එකට STF එකෙන් පොලීසියට ආපු. මං කිව්වා සර් පුළුවන් නම් මට permission අරන් දෙන්න මං සහරාන්ට ගහන්නම් කියලා.

ප්‍ර: ඒ කවදද කිව්වේ?

උ: 19 ය.

ප්‍ර: 19 වැනිදා එහෙම කිව්වා තමා

උ: කිව්වා. මං කිව්වා ජනාධිපතිතුමාට කියන්න මට ඒක කරලා permission අරන් දෙන්න. මං සහරාන්ට ගහන්නම් කියලා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: ඔබ ගරු කොමසාරිස්වරු විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් ජයසුන්දර මහත්මයා සඳහන් කෙරුවා 2019 අප්‍රේල් මාසයේ 09 වැනිදා පැවති රැස්වීමට ඔබ සහභාගි වුණ වෙලාවෙ දී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍යය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහත්මයා එතැන රැස්ව සිටි අයට සහරාන් පිළිබඳව මේ ප්‍රශ්නයේ තියෙන අන්තවාදී අදහස් ප්‍රකාශ කිරීමේ ප්‍රශ්නයේ තිබෙන බරපතලකම පිළිබඳව ඒත්තු ගන්නන්නට උත්සාහ කරාය කියලා.

උ: එහෙමයි.

ප්‍ර: ඒ උත්සාහයේ දී ඔබ කිව්වා සහරාන්ගේ පසුබිම සහරාන් හැසිරෙන විදිය ඔහු කරන කටයුතු මේ සියළුම දේවල් පිළිබඳව ඔවුන්ව දැනුවත් කරාය කියලා?

උ: එහෙමයි.

ප්‍ර: එහෙම නම් ඔබ හිතනව ද එවැනි කරුණු කීමෙන් පසුව තමන්ට ලැබිලා තියෙන ප්‍රහාරයකටට බොහෝ සෙයින් ඉඩකඩ තිබෙන බවට හඟවන ඒ තොරතුර එතැන රැස්ව සිටි අයට දැනුම් දුන්න නම් ඔවුන් ඔයිට වඩා ඒ කරුණෙ තිබෙන බරපතලකම පිළිබඳව අවබෝධ කරගන්නවා කියලා ඒ රැස්වීමට සහභාගී වූ නිලධාරියෙක් විදියට?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: ඊළඟට මා ඔබෙන් අහන්නේ යම් හෙයකින් නිලන්ත ජයවර්ධන මහත්මයා සහරාන් පිළිබඳව ඔය 09 වැනිදා කිව්වා සියළුම කරුණු කියලා ඔහු කිව්ව නම් මට තොරතුරක් ලැබිලා තිබෙනවා විදේශයකින් මේ වගේ ප්‍රහාරයක් සිදු වන්නට ඉඩ තියෙනවයි කියලා. හැබැයි අපි තාම ඒ කියන්නේ රාජ්‍යය බුද්ධි සේවයට තාම ඒ පිළිබඳව ස්ථිරව දැන ගැනීමට අවස්ථාවක් ලැබිලා නැහැ. ඒ අනුව අපි වැඩිදුර විමර්ශන පවත්වගෙන යනවා කියලා එතැන හිටපු නිලධාරීන්ට එහෙම කිව්ව නම් ඔබ ඒ රැස්වීමට සහභාගී වූ නිලධාරියෙක් විදියටත් සහරාන් හෂීම් පිළිබඳව ඔහුව අත්අඩංගුවට ගැනීමට උනන්දුවන නිලධාරියෙක් විදියටත් ඒ අවස්ථාවේ දී එම තොරතුර සම්බන්ධයෙන් ඔබ මොකද කරන්නේ?

FAIR COMMENT BY JEZEEM

උ: අනිවාර්යෙන්ම එතැන හිටියා යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂකවරයා. එහෙම නම් මම යෝජනා කරනවා ත්‍රිවිධ හමුදාපතිවරු හිටියා ඔක්කොමලා එකතුවෙලා මේ තියෙන threat එකට අපි කණ්ඩායම් හැඟීමෙන් අපි සැලසුමක් යටතේ ක්‍රියාත්මක වීමක් සාකච්ඡා කරගන්න තිබ්බා.

ප්‍ර: ඔබ ඒක අනිවාර්යෙන්ම කරනවා ඒ කියන්නේ?

උ: අනිවාර්යෙන්ම කරනවා.

ප්‍ර: එතකොට දැන් අර 19 වැනිදා ඔබ සමඟ කතා කරා කියලා කිව්වනේ නිලන්ත ජයවර්ධන මහතා?

උ: එහෙමයි.

ප්‍ර: ඒ කතා කරේ දුරකථනයෙන් නේද?

උ: එහෙමයි.

ප්‍ර: ඒ අවස්ථාවේ දී නේද ඔබට ඔහුගේ හැඟීම් ඔහු කලබල වෙලා තිබුණු බව ඔහු යම් කරුණක් නිසා මානසික වශයෙන් කැලඹිලා තිබුණු බව ඒත්තු ගියා කියලා කිව්වේ?

උ: එහෙමයි.

ප්‍ර: දැන් ඒ අවස්ථාවේදීවත් ඔබට නිලන්ත ජයවර්ධන මහත්මයා ඔය තමන්ට ලැබිලා තිබ්බ තොරුතුර පිළිබඳව ඔබත් එක්ක කතා කරා ද?

උ: ඒ ගැන කතා කළේ නැහැ. නමුත් මේ සහරාන්ගේ threat එක ඒ කියන්නේ මේ සහරාන් මොනව හරි දෙයක් කරන්න යනවා. දැන් මෙතන පාලමුනෙයි සිද්ධියක් වෙලා තියෙනවා කියලා දන්නව ද. ඒක මේ පොලීසිය කියනවා අකුණක් ගැහුවා කියලා. අකුණක් නොමේ වරුණ ඒක explosion එකක් කරලා තියෙන්නේ. ඔයා ඒ ගැන දන්නවද. ඒ Tone එකෙන් තමයි කිව්වේ. ඊට පස්සේ මං කිව්වා සර් මම දන්නේ නැහැ කියලා තමයි මම කිව්වේ. නැහැ මට තේරෙනවා සහරාන්ගේ තියෙන threat එක මොකද මම සහරාන් ගැන දැන එතකොට මාස 04 යි. මොකද මං TID යන කාලේ මං සහරාන් ගැන දැනගෙන හිටියේ නැහැ. නමුත් මගේ අත්දැකීම් එක්ක ත්‍රස්තවාදය එක්ක හැප්පිලා මම ඒකයි අර විදියේ කතාවක් කිව්වේ. මේ විදියට තර්ජනයක් තියෙනව නම් මොකද මේක Investigators ලට විමර්ශකයන්ට කරන්න පුළුවන් තත්ත්වයක් නෙවෙයි. අනිවාර්යෙන්ම මෙහෙයුම් ඔපරේෂන් Strength එකක් දාන්න වෙනවා කියන එක. ඒ නිසා තමයි මං අර වගේ කතාවක් කිව්වේ . මේ විමර්ශනයක් සහ ඊට අදාළ මෙහයුමක් කරන්න ඕන කියලා. සහරාන්ව neutralized කරන්න. ඉතිං මම හිතනවා නමුත් ලැබුණේ දවස් දෙකයි. සහරාන් ක්‍රියාත්මක වුණා.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරියා වශයෙන් පත් වෙන්නේ කොයි කාලෙද?

උ: ජූනි 11 වැනිදා උතුමාණනි.

ප්‍ර: 2020 ජූනි 11 වැනිදා?

උ: එහෙමයි.

ප්‍ර: ඔබට 2020 ජූලි මාසයේ 14 වැනි දින මෙම කොමිෂන් සභාවේ ලේකම් වෙතින් ලිවුමක් ලැබෙනව ද කොමිෂන් සභා පනතේ අංක 07 වැනි වගන්තිය යටතේ 2018/10/01 දින සිට 2019 මැයි 01 වැනි දින දක්වා නැගෙනහිර පළාතේ විශේෂ කාර්ය බලකා කඳවුරු මඟින් යොමු කළ සති බුද්ධි වාර්තා සහතික පිටපත් මෙම කොමිෂන් සභාවට යොමු කරන්න කියලා?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: ලැබෙනවා?

උ: එහෙමයි.

ප්‍ර: ඔබ ඊට පිළිතුරක් යොමු කරනවා නේද 2020/07/15 වැනි දින?

උ: එහෙමයි උතුමාණනි.

ප්‍ර: එම ලිපිය නැවත දැක්කොත් හඳුනාගන්න පුළුවන් ද?

උ: පුළුවන් ස්වාමීනි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ස්වාමිනි සාක්ෂිකරු විසින් 2020.07.15 වැනි දින මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම් එච්.එම්.බී.පී. හේරත් මහතා ආමන්ත්‍රණය කරමින් පරික්ෂණ කොමිෂන් සභා පනතේ 07 වන වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත සහතික පිටපත් ඉදිරිපත් කරන ලෙස කරනු ලබන නියමය යන ශීර්ෂය යටතේ එවා ඇති මෙම ලිපිය C 864 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා.

ප්‍ර: මේ ඔබේ අත්සන යටතේනේ තියෙන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: ඔබ එවලා තිබෙන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: ඒ කියන්නේ 11 වැනිදා ඔබ කමඩාන් විදියට අණදෙන නිලධාරී විදියට රාජකාරී භාර ගත්තා. 15 වැනිදා තමයි ජූනි 11 වැඩ භාර ගත්තා. ජූලි 15 තමයි ඔබ මේ ලිපිය එවලා තියෙන්නේ?

උ: එහෙමයි.

President Secretary Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට එම ලිපිය මගින් ඔබ දැනුම් දීලා තිබෙනව නේද නැගෙනහිර පළාතේ විශේෂ කාර්ය බලකාය කඳවුරු මඟින් සති බුද්ධි වාර්තාව යොමු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීමේ දී විශේෂ කාර්ය බලකාය කලවන්චිකුඩි සහ ආරුගම්බේ කඳවුරු වල ස්ථාපිත කර තිබූ ප්‍රාදේශීය බුද්ධි ඒකක වල නිලධාරීන් රාජකාරී අවශ්‍යතාවයන් හේතු කොට ගෙන වෙනත් ප්‍රදේශවල රාජකාරී සඳහා අනුයුක්ත කර තියෙනවයි කියලා ?

උ: එහෙමයි.

ප්‍ර: ඒකෙන් අදහස් වෙනවා ද එසේ අනුයුක්ත කරාට පස්සේ කලවන්චි කුඩි සහ ආරුගම්බේ කියන කඳවුරු වල ඔබේ නිලධාරීන් දකින්නට හම්බු වුණේ නැහැ කියලා?

උ: බුද්ධි අංශ නිලධාරීන් ඉවත් වෙලා තිබ්බා.

ප්‍ර: දැන් බුද්ධි අංශ නිලධාරීන් ඒ යම් යම් ස්ථාන වල ඔබේ කඳවුරු වල ස්ථාන ගත කරන්නේ මොකට ද?

උ: ඇත්තටම ඒ කණ්ඩායම් පිහිටුවේ මම. මම අධ්‍යක්ෂක බුද්ධි විදියට ඉද්දි විශේෂ කාර්යේ බලකායේ යුද්ධ ඉවර වෙලා යම් කාලයක් ගත වෙලා තිබ්බත් එවකට අණ දෙන නිලධාරීවරයා හිටියේ රංජිත් පෙරේරා මහත්මයා. මම මහත්මයට කිව්වා සර් මේ ඇත්තටම LTTE තර්ජනයත් එක්ක අපි දැන් ගොඩක් වැටිලීම් වලට යනවා නමුත් බුද්ධි තොරතුරු ජාතික ආරක්ෂාවට වැදගත් වන හොයන්න අපි Units පටන් ගමු කියලා නිලධාරී 34 දෙනෙක් ගෙනැල්ලා. Training කරලා ඒකක 07 ක් පිහිටෙවුවා. මං අධ්‍යක්ෂක බුද්ධි විදියට විශේෂ කාර්ය බලකායේ ඉන්දැද්දී ඒකක 02 කක් තමයි කලවන්චිකුඩි , පොතුවිල් වලයි ස්ථාන ගත කරලා තිබ්බේ. තව 05 ක් තිබ්බා . ඒ වගේම මම අණදෙන නිලධාරියාගේ අත්සනින් යවලා තිබ්බාබ කරුණු 14 ක් යටතේ බුද්ධි වාර්තාවක් සෑම ඉරිදා දිනකම දහවල් 12 වෙද්දී මට පිටපතක් සහිතව අණදෙන නිලධාරියාට එවන්න කියලා. ඒ කණ්ඩායම 2018/05 වැනි මාසේ 14 මං විශේෂ කාර්ය බලකායෙන් ඉවත් වුණා. 2018 ඔක්තෝම්බර් මාසේ වෙද්දී කණ්ඩායම ඉවත් කරලා තිබුණා.

ප්‍ර: දැන් ඒ වගේ සාමාන්‍යයෙන් රාජකාරී අවශ්‍යතාවයන් හේතු කරගෙන නිලධාරීන්ව කඳවුර වලින් වෙනත් ස්ථාන වලට මාරු කරන අවස්ථා තියෙනවනේ?

උ: එහෙමයි.

ප්‍ර: නමුත් සියළුම නිලධාරීන් කඳවුරු වලින් ඉවත් කරගන්නා අවස්ථා තියෙනව ද?

උ: නැහැ මගේ පෞද්ගලික මතය තමයි බුද්ධි අංශ නිලධාරින් ඔක්කොම අයින් කිරීම හිත කර වෙන්නේ නැහැ. බුද්ධි අංශ අතර නිලධාරීන් මාරු කරන්න පුළුවන් වුණත් ඒ ඒකකය පවත්වාගෙන යා යුතුව තිබුණා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබේ මේ C 864 ලේඛනයේ 3 වැනි ඡේදය අනුව එයින් ගම්‍ය වන්නේ 2018.10. 01 යන දින සිට 2019.05.01 වන දින දක්වා වූ කාලය තුල දී ඔබ විසින් ඊට අදාළ සති බුද්ධි වාර්තා යොමු කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීමේ දී කලවන්චිකුඩි සහ ආරුගම්බේ කඳවුරු වල ස්ථාපිත කර තිබූ ප්‍රාදේශීය බුද්ධි ඒකක වල නිලධාරින් එයින් ඉවත් කර තිබෙන බව නේද?

උ: එහෙමයි. සේවයේ අවශ්‍යතාවය කියලා අයින් කරලා තියෙනවා.

ප්‍ර: ඔව්. එතකොට ඒකට දීලා තියෙන හේතුව තමයි රාජකාරීය අවශ්‍යතාවයන් කියලා?

උ: එහෙමයි.

ප්‍ර: එහෙම වුණාම ඒ කඳවුරු වහනව ද?

උ: කඳවුරු තියෙනවා බුද්ධි අංශ වහනවා.

ප්‍ර: කඳවුරු තියෙනවා බුද්ධි අංශ වහනවා. ඒ වගේම ඔබ තව දුරටත් කියනවා ඉන් අනතුරුව එම ප්‍රදේශ වල විශේෂ තොරතුරු අදාළ කඳවුරු අණදෙන නිලධාරීවරුන් විසින් වාර්තා කර නොමැත කියලා?

උ: එහෙමයි.

ප්‍ර: ඇයි එහෙම වෙන්නේ?

උ: එහෙම වුණේ මොකද බුද්ධි තොරතුරු හොයන නිලධාරීන් ඒ කඳවුරු වලින් ස්ථාන මාරු විම් සේවයේ අවශ්‍යතාවය කියලා ඉවත් කරලා තිබුණා.

ප්‍ර: දැන් ඒ ඉවත් කිරීම සිදුකරලා තියෙන කලවන්චිකුඩි සහ ආරුගම්බේ කියන කඳවුරු ඔබ කිව්වා ඔබේ ඉල්ලීම මත පිහිටවන ලද කඳවුරු කියලා?

උ: නැහැ කඳවුරු නෙවෙයි උතුමාණනි .

ප්‍ර: බුද්ධි අංශ?

උ: බුද්ධි අංශ මට මතක හැටියට 2017 මුල කාලයේ මං අධ්‍යක්ෂක බුද්ධි විදියට ඉද්දී ඒකක 07 පිහිටුවීම යටතේ කලවන්චිකුඩි වල නිලධාරීන් 04 ක් පොතුවිල් වල 05 ක් ස්ථාන ගත වෙලා හිටියා. ඒක මම STF එකෙන් යනකන්ම හැම සති අන්තයකම සති බුද්ධි වාර්තාවක් ආවා කරුණු 14 ක් යටතේ. ඇත්තෙන්ම මම ඉද්දී ඔය ප්‍රශ්න ආවා ඒ කියන්නේ මේ ඉස්සර හිටපු නිලධාරී මාරු කරලා තිබ්බා. Strength එක අඩු කරලා තිබ්බා. ඒ කියන්නේ වැටලීම් වලට මේ නිලධාරීන් යොදවලා තිබ්බා. මං අණදෙන නිලධාරීවරයාව දැනුවත් කරලා තිබ්බා. වරින් වර ඒක කරන්න එපා කියලා. කොහොම හරි මම 2018/05 වැනි මාසේ ඉවත් වෙලා ගියාට පස්සේත් මේ ඒකක තිබ්බා. හැබැයි 2018 ඔක්තෝම්බර් වෙද්දී මේ නිලධාරීන් සේවය අවශ්‍යතාවය මත කියලා අයින් කරලා ඒ units එක වහලා තියෙනවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට ඒ බුද්ධි ඒකක වැහුවාම ඒ වගේ භූමියෙන් ලබා ගන්නට තියෙන තොරතුරු ලබා ගැනීමේ අවස්ථාව STF එකට කලවන්විකුඩි සහ ආරුගම්බේ කඳවුරු ආශ්‍රිතව නැති වෙනවා නේද?

උ: එහෙමයි.

ප්‍ර: එතකොට විශේෂ කාර්ය බලකායට වැදගත් වන කඳවුරු දෙකක් නේද නැගෙනහිර පළාතේ තියෙන මේ කලවන්විකුඩි සහ ආරුගම්බේ ?

උ: ඔව් ඇත්තටම ඒ ස්ථානගත කිරීමත් මම තීරණය කරපු දෙයක්. ඒ කියන්නේ අපේ අම්පාර දකුණු ප්‍රදේශයේ ප්‍රධානම කඳවුරක් පොතුවිල් එතකොට සහ කලවන්විකුඩි කියන්නෙත් විශේෂයෙන්ම කාත්තන්කුඩි වලට එච්චර දුරක් නැහැ සහ LTTE ක්‍රියාකාරකම් දැඩිව තිබ්බ ප්‍රදේශයක් තමයි කලවන්විකුඩි කියන්නේ. එතැන පදියිරිප්පු පාලම එහා පැත්තට ගියාපුවාහම ප්‍රධානම සහල්නැලිය කියන LTTE ප්‍රධානම බල ප්‍රදේශය පිහිටලා තියෙනවා. ඒ නිසා තමයි ඔය බුද්ධි ඒකක දෙක ඔය දෙකේ ස්ථාන ගත කළේ. එතකොට මේ ගරු කොමිෂන් සභාව ඉල්ලපු ඒ කරුණු ඒ කියන්නේ 2018 ඔක්තෝම්බර් සහ 2019 මැයි 01 වැනිදා දක්වා බුද්ධි වාර්තා ඉදිරිපත් කර තිබේ ද කියන එක ඉදිරිපත් කරලා නැහැ. හේතුව වශයෙන් සඳහන් වෙන්නේ මං දැනට ඉන්න අණදෙන නිලධාරියා හැටියට විස්තර හොයද්දී ඒ වෙද්දී මේ බුද්ධි අංශ වල නිලධාරීන් සේවා අවශ්‍යතාවය කියලා ස්ථාන මාරුවක් කරලා තිබෙනවා. ඒ නිසා ඒ කඳවුරු වල අණදෙන නිලධාරීවරුනුත් මේ බුද්ධි වාර්තා ඉදිරිපත් කරලා නැහැ.

ප්‍ර: ඒ නිසා ද ඔබ සඳහන් කරලා තියෙන්නේ 2018 .10 වැනි මස 01 වැනි දින සිට 2019/05 වැනි මස 01 වැනි දින දක්වා සති බුද්ධි වාර්තා කලාප අණදෙන නිලධාරී අම්පාර විසින් නියෝජ්‍යය අණදෙන නිලධාරී වෙත හෝ අණදෙන නිලධාරී විශේෂ කාර්ය බලකාය වෙත ඉදිරිපත් කරන නොමැත කියලා?

උ: නොමැත. එහෙමයි. මොකද උතුමාණනි මම ස්ථාවර නියෝගයක් යවලා තිබ්බා ඒකක හදද්දී 2017 අණදෙන නිලධාරීවරයාගේ අත්සනින් ඒක අති විශේෂ කාර්ය බලකායේ. එකේ තිබ්බා කලාප අණදෙන නිලධාරීවරුන් විසින් සතියකට සැරයක් ඉරිදා 12 ට කලින් අධ්‍යක්ෂක බුද්ධි කියන තනතුරේ කෙනාට පිටපතක් සහිතව මේ කරුණු 14 ක් යටතේ බුද්ධි වාර්තාවක් එවන්න කියලා. ඒක මේ අවස්ථාවේ දී අකර්මන්‍ය වෙලා තියෙනවා. මොකද බුද්ධි තොරතුරු එවන්න බුද්ධි අංශයක් තිබිලා නැහැ ඒක නිලධාරී ස්ථාන මාරු කරලා යවලා තියෙනවා ඒ වෙද්දී.

ප්‍ර: ජයසුන්දර මහත්මයා දැන් ඔබ විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරී තනතුර දරනවනේ.

උ: එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ වගේම ඔබේ අවධානයට මේ කොමිෂන් සභාව මගින් වගේ ඔබේ රාජකාරී කටයුතු තුලදීත් මේ නැගෙනහිර පළාතේ බුද්ධි අංශ ඔබේ විශේෂ කාර්ය බලකාය මගින් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම ඔබට වැටහිලා තිබිලා තිබෙනවනේ?

උ: එහෙමයි.

ප්‍ර: ඒ අනුව මේ බුද්ධි අංශ නැවත නැගෙනහිර පළාතේ වගේම රටේ අනෙක් පළාත් වලත් යථාපරිදි යාතාවත් කරලා ස්ථාපිත කරන්න ඔබ කටයුතු කරනව ද?

උ: එහෙමයි මම දැනට මාසයක් වැනි විශේෂයෙන්ම දකුණු පළාතේ ඒකක 05 පිහිටුවන්න මම දැන් කටයුතු කරලා ආරම්භ කරලා තිබෙනවා. ඒ වගේම මට දැනට පැවරිච්ච කාරණය තමයි සංවිධානාත්මක අපරාධ සහ මත්ද්‍රව්‍ය ජාවාරම මැඩ පවත්වන්න. ඒ යටතේ ඇත්තටම ලංකාවේ සංවිධානාත්මක අපරාධ කණ්ඩායම තිබ්බ ලොකුම ආයුධ තොගය හොයා ගත්තා හෝමාගමින්. ඒ වගේම කොළඹ බස්නාහිර පළාතේ ඒ සංවිධානාත්මක අපරාධ මර්දන ක්‍රියාකාරකම් වෙනවා. දකුණු පළාතේ දැනට ඒකක 05 පිහිටුවන්න කටයුතු කරලා තියෙනවා. ඔබතුමිය මතක් කරපු එක හොඳයි උතුරේ විශේෂයෙන්ම අර ආවා කණ්ඩායම් මර්දනය කරන්න ඒ හැම කැම්ප් එකකම විශේෂයෙන් මේ දූෂණ වැරදි යන එක මං නැවැත්තුවා. නවත්වලා උතුරු පළාතේ අවධානය යොමු කරලා තියෙනවා තරුණ කොටස් වෙත. ඒ වගේම නැගෙනහිරත් ඒ කටයුතු කරනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු දැන් C 867 දක්වලා තියෙන පරිදි ඔය ඒකක දෙක වහලා ඒ බුද්ධි නිලධාරීන් රටේ වෙන ස්ථාන වලට යවලා තියෙන්නේ සේවා අවශ්‍යතාවය මත කියලා නේද තියෙන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: එවැනි සේවා අවශ්‍යතාවයක් ඇත්තටම තිබ්බද කියන එක ඔබ පරීක්ෂා කෙරුව ද?

උ: වෙන්නේ උතුමාණනි, අපේ විශේෂ කාර්ය බලකාය ඇතුළත ස්ථාන මාරුවීම් කරන්නේ අණදෙන නිලධාරීවරයා. එතැන සඳහන් වෙන්නේ නැහැ කිසිම ලිව්මක මොකද්ද හේතුව කියලා. සේවය අවශ්‍යතාවය මත යවනවා කියලා විතරයි ස්ථාන මාරුවීමේ සඳහන් වෙන්නේ.

ප්‍ර: නමුත් මොකද්ද හේතුව කියලා නැහැ?

උ: හේතුව සඳහන් කරන්නේ නැහැ.

ප්‍ර: ඒ හිටපු නිලධාරීන් කී දෙනෙක් සිටිය ද ඒ ස්ථානයේ?

FAIR COMMENT BY JEZEEM

උ: මට මතක හැටියට කලවන්චිකුඩි ඒකකයේ සැරයන්වරයෙකු සහ කොස්තාපල්වරු 03 දෙනෙක් මුලින්ම ස්ථාන ගත කරා. පොතුවිල් වල නිලධාරීන් ඒත් 05 දෙනෙක් ස්ථාන ගත කරා.

ප්‍ර: එතකොට ඔක්කොම නිලධාරීන් 08 දෙනෙක් ඉඳලා තියෙනවා නේද?

උ: 09 දෙනෙක් ඉඳලා තියෙනවා.

ප්‍ර: බුද්ධි නිලධාරී 09 දෙනෙක්?

උ: 09 දෙනෙක්.

ප්‍ර: ඔබගේ පරීක්ෂණ වලට අනුව ඒ නිලධාරීන් 09 දෙනා රටේ වෙනත් ස්ථාන වලට ඇරියේ එකම ස්ථානයකටය ද නැත්නම් 09 දෙනා ස්ථාන 09 කට යැවුව ද?

උ: ස්වාමීනි මට බලන්න වෙනවා. හැබැයි එකම අවස්ථා දෙකක යවලා තිබ්බා. කලවන්චකුඩිවල අන්තිමට නිලධාරීන් දෙන්නෙක් ඉතුරු වෙන්න තියලා ඒ දෙන්නවත් අයින් කරලා තිබ්බා. ඒ වගේම පොතුවිල් එක මට බලන්න වෙනවා කොහොම ද එක පාරටම 04 දෙනෙක් අයින් කරාද කියලා. ඒක මට දැනුවත් කරන්න පුළුවන් කොමිෂන් සභාවට.

ගිහිල්ලා පරීක්ෂා කරලා බලලා අපිට ලිඛිතව දැනුම් දෙන්න ඒ නිලධාරීන් සේවා අවශ්‍යතාවය මත යවපු ස්ථාන මොකද්ද කියලා. එකම ස්ථානයකට ද නැත්නම් ස්ථාන වෙන් වෙන් ස්ථාන වලට ද කියලා.

උ: එහෙමයි.

ප්‍ර: දැන් ඔබ කිව්වා නේද ඔබ විශේෂ කාර්ය බලකායේ බුද්ධි අංශය භාරව හිටියා කියලා?

උ: එහෙමයි.

ප්‍ර: නැගෙනහිර පළාතේ?

උ: එහෙමයි.

ප්‍ර: කොයි කාලේ ද ඒක භාරව හිටියේ?

උ: නැගෙනහිර පළාත නෙවෙයි STF එකේම අධ්‍යක්ෂක බුද්ධි විදියට කටයුතු කරා.

ප්‍ර: ඔබ කොයි කාලෙද?

උ: ඒ මගේ මම ඇත්තටම බුද්ධි අංශ නිලධාරියෙක්. එතකොට මේ අධ්‍යක්ෂක බුද්ධි විදියට හිටියේ 2015 පෙබරවාරි 12 ඉඳන් STF එකෙන් ඉවත් වෙනකන්ම 2018 /05 වැනි මාසේ 14 වෙනකන්.

ප්‍ර: බුද්ධි අංශය භාරව හිටියා ?

උ: අධ්‍යක්ෂක බුද්ධි විදියට හිටියා.

ප්‍ර: අධ්‍යක්ෂක බුද්ධි විශේෂ කාර්ය බලකාය විදියට?

උ: අධ්‍යක්ෂක බුද්ධි විශේෂ කාර්ය බලකාය විදියට රාජකාරී කරා.

ප්‍ර: එම කාල සීමාව තුළ ඔය සහරාන් හෂීම්ගේ සහ වෙනත් ඉස්ලාම් අන්තවාදී කණ්ඩායම් වල තොරතුරු බුද්ධි බලකායට ලැබුණ ද ඔබගේ පළාත් වල සිටින බුද්ධි නිලධාරින්ගෙන්?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: උතුමාණනි මට එහෙම මතකයක් නැහැ.හැබැයි සහරාන් ගැන විශේෂයෙන් සඳහන් වෙලා තිබ්බේ නැහැ. මොකද මම TID එකට ගියාට පස්සේ තමයි සහරාන් ගැන විශේෂයෙන්ම දැන ගත්තේ. හැබැයි ඔය එක එක කරුණක් දාලා තිබ්බා අන්තවාදී ක්‍රියාකාරකම් පිළිබඳව කරුණු 14 න් එකක් වාර්තා ගත කළ යුතුව තිබුණා. මට පුළුවන් මං ඉන්න කාලේ ආපු බුද්ධි වාර්තා බලලා ඒ ගැන වාර්තාවක් ඉදිරිපත් කරන්න.

ඔව් හැකි ඉක්මනින් ඒ වාර්තාව කොමිෂන් සභාවට ලැබෙන්න සලස්වන්න. අපිට අවශ්‍ය වන්නේ ඒ නැගෙනහිර පළාතේ ඉස්ලාම් අන්තවාදී කණ්ඩායම් සම්බන්ධයෙන් සහරාන් හෂිම් හෝ වෙනත් කණ්ඩායම් සම්බන්ධයෙන් තොරතුරු විශේෂ කාර්ය බලකායට ලැබුණ ද කියලා. විශේෂයෙන්ම නැගෙනහිර පළාත නැත්නම් ඔබ ඔය කියන අධ්‍යක්ෂක බුද්ධි වශයෙන් සිටි කාල සිමාවේ රටේ වෙන කොහෙන් හරි ඒ වගේ තොරතුරු තිබ්බ නම් කරුණාකර කොමිෂන් සභාවට ලිඛිතව වාර්තා කරන්න.

උ: මට දැන ගන්න තියෙනවා නිලධාරින් ඉදිරිපත් කරලා තිබෙනවා වාර්තාවක් 2018 සැප්තැම්බර් වල. ඒ නිලධාරින් දැම්මා කියලා කියනවා report එකක් සහරාන් ගැන. අණදෙන නිලධාරීවරයාට.

දාලා තියෙනව නම් හොයලා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න. මොකද අපි විශේෂ කාර්ය බලකායට දන්වලා ඇරියා එවැනි වාර්තා තියෙනව නම් ඉදිරිපත් කරන්න කියලා. නමුත් අපිට ලැබුණු ලේඛන වල එවැනි වාර්තාවක් නැහැ.

උ: පස්සේ මම ඔය ගැන මගෙන් ප්‍රකාශයක් ගත්තා. ඒ වේලේ ඒ නිලධාරියෙක් හිටපු කෙනෙක් කියනවා එයා එයාගේ මැෂින් එකේ එයා type කරා කියලා සහරාන් ගැන. ඒ වගේම report එකක් එතකොට මං STF එකේ නැහැ උතුමාණනි. එව්වා කියනවා පස්සේ එක් නිලධාරියෙක් කියනවා එයා report එකක් ගැහුවා කියලා.

ප්‍ර: ඒ නිලධාරියා ඔබ අඳුරාගෙන තියෙනව ද? නම කියන්න ඕනේ නැහැ. ඔබ දන්නව ද?

උ: මට එයාව සම්බන්ධ කරගන්න පුළුවන්.

නිලධාරියාව හඳුනාගෙන කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ලැබීමට සලස්වන්න තොරතුර.

උ: එහෙමයි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: එක් කාරණයක් කියන්න ඕන මට හිතෙනවා ජයසුන්දර මහත්මයා ඔබ වැනි නිලධාරියෙන් 2019 අප්‍රේල් 20 වැනිදා මේ තොරතුර දැනගෙන

FAIR COMMENT BY JEZEEM

හිටියා නම් අර අහිංසක ජීවිත 300 අදත් ජීවත් වෙනවා කියලා. ඔබ මොකද ඒ ගැන කියන්නේ?

ඇ: ඔව් මට ඒ කියන්නේ අප්‍රේල් 16 වත් ආපු warning letter ආවනම් යමක් කරන්න තිබ්බා ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: ඔබ මං අර කලින් අහපු ප්‍රශ්නයට උත්තර දීලා කිව්වා ඔබ නිලන්ත ජයවර්ධනට කිව්වා කියලා මේ, ජනාධිපතිතුමාට කියලා 20 දෙනෙක් ලබලා දෙන්න මම සහරාන්ව ඉවර කරන්නම් කියලා කිව්ව නේද?

ඇ: කිව්වා.

ප්‍ර: එතකොට ඔබ කිව්වේ ජනාධිපතිතුමාට කියලා මට අරන් දෙන්න කියලා?

ඇ: අරන් දෙන්න කිව්වා.

ප්‍ර: 20 Units එකක් වගේ අරන් දෙන්න කිව්වා. එතකොට ජනාධිපතිතුමා සහ තමන් එසේ ජනාධිපතිතුමාට කියලා අරන් දෙන්න කිව්වේ නිලන්ත ජයවර්ධන හා ජනාධිපතිතුමා අතර ඇති සම්බන්ධතාවය හොඳ සම්බන්ධතාවයක් තිබ්බ නිසාද?

ඇ: ඔව් මං කිව්වා මට ජනාධිපතිතුමා එක්ක සම්බන්ධයක් නැහැ. ඔබතුමා පුළුවන් නම් මට authority එකක් අරන් දෙන්න මං STF එකේ නිලධාරී කණ්ඩායමක් ඉල්ලලා තියෙනවා මම සහරාන්ව neutralized කරන්නම් කියලා.

ප්‍ර: ඒ කියන්නේ දැන් නිලන්ත ජයවර්ධනටයි ජනාධිපතිතුමාගෙන් ඉල්ලලා අරන් දෙන්න හැකියාවක් තියෙන්න ඇති?

ඇ: ඔව් මොකද බුද්ධි අංශ ප්‍රධානියා හැටියට රටේ අනිවාර්යෙන්ම අතිගරු ජනාධිපතිතුමා එක්ක සම්බන්ධ වෙන කෙනෙක්. මට හැකියාවක් නැහැ ජනාධිපතිතුමත් එකක් Communicate කරන්න.

ප්‍ර: එයාට පුළුවන් නිසා ඉල්ලුවේ?

ඇ: ඉල්ලුවා මං.

ප්‍ර: ඒ ගැන මොකද කිව්වේ ?

ඇ: එයා කිව්වා මෙහෙමයි මේ මල්ලී නමුත් මේක අමාරුවේ වැටෙයි. ඒ කියන්නේ දැන් මම හිතන්නේ STF මයින්ඩ් සෙට් එකෙන්.

ප්‍ර: අමාරුවේ වැටෙයි කිව්වේ?

ඇ: නැහැ ඒ කියන්නේ එයා කිව්වේ එයින් අදහස් කළේ මම දැක්කේ ඒ විදියට. ඒ කියන්නේ මම දැක්කේ සහරාන් කියන කෙනා neutralized

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කරනන් ඕන කියන එක. ඒ කියන්නේ මම ත්‍රස්තවාදය දැකපු නිලධාරීයෙක්.

ප්‍ර: ඇයි අමාරුවේ වැටෙයි කිව්වේ?

උ: නැහැ කිව්වේ මේකයි දැන් මම කතා කරන්නේ උතුමාණනි ඒ භාෂාවෙන්නේ. ඒ මං කියන්නේ මේ මම STF එකේ දකින්නේ අපි ත්‍රස්තවාදයත් එක්ක හැප්පෙන්නේ අපේ negotiatios නැහැ අපි ත්‍රස්තවාදය කියන කෙනා eliminate කරන එක තමයි අපි විශ්වාස කරන්නේ. ඉතිං ඒ නිසා කිව්වේ නිකන් මං මේක කිව්වේ Officialy කරපු ඉල්ලීමක් නෙවෙයි නමුත් මගේ හැකියාව සහ මම දකින දේ තමයි මම ප්‍රකාශ කළේ.

ප්‍ර: ඔබ ඒ ප්‍රකාශ කළේ. ඊට පස්සේ ඒ කතාව එතැනින් නැවතුණා?

උ: නැවතුණා කියන්නේ එයාට ඉදිරිපත් කරන්න අවශ්‍ය වුණේ ඇත්තටම මේ අර පාලමුනෙයි සිද්ධිය. එතකොට මට තේරුණේ ඇයි එයා ඒ වෙලේ Call එකක් ගත්තේ කියලා මේ මට තේරුණා එයා ඒ ගැන ගොඩක් අපහසුතාවයට පත් වෙලා හරි නැත්නම් පීඩාවට ලක් වෙලා හරි එයා ඒක තමයි මට කතා කරන්නේ ඇත්තේ. මොකද දැන් පොලීසියෙන් කියනවා අකුණක් ගැහුවා කියලා. නමුත් එයා දැනගෙන හිටියා මේක අනිවාර්යෙන්ම මේ එහෙම දෙයක් නෙවෙයි කියලා. ඒ වගේම එයා දැනන් හිටියා මං STF එකේ නිලධාරීයෙක් සහ මම හිතන විදිය වෙනස් නිසා තමයි එයා කිව්වේ මගෙනුත් Confirmation එකක් ගන්න මේක බලන්න කියලා.

ප්‍ර: සාක්ෂිකරු දැන් අර ඔබ ත්‍රස්තවාදී විමර්ශන අංශයට ජපානයෙන් වාහනයක් හම්බ වුණා නේද?

උ: ලැබිලා තියෙනවා.

ප්‍ර: දැන් ඒ වාහනේ මොකද කරන්නේ?

උ: මම අධ්‍යක්ෂක තනතුරෙන් අයින් වෙද්දීත් ඒ වාහනේ තිබ්බා. ඒ වගේම ඒක ගොඩක් Surveillance Vehicle එකක්. ඒ කියන්නේ ඒකෙන් පුළුවන් ඇන්ටනා එකක් මවුන්ට කරලා සැහෙන්න දුර ප්‍රදේශයක් ආවේක්ෂණය කරන්න. ඒ වගේම එතැන ඩ්‍රෝන් එකක් තියෙනවා. ඒ ඩ්‍රෝන් එක යවලා මට මතක හැටියට අපිට මීටර් 300 ක් විතර අපිට පුළුවන් ප්‍රදේශයක් ගුවනේ සිට නිරීක්ෂණය කරන්න .

ප්‍ර: ඇයි එච්චර හොඳ තාක්ෂණයක් ලැබිලත් එය රජය විසින් ප්‍රයෝජනයට ගන්නේ නැත්තේ?

උ: ඒක ඒ වෙද්දී මමත් අර ඒ වෙද්දී TID එකට විරුද්ධව පරීක්ෂණයක් පැවැත්තුවා. මගේ නියෝජ්‍යය පොලිස්පතිවරයා අත්අඩංගුවේ හිටියේ. ජනාධිපති ඝාතන ප්‍රයත්නයක් සඳහන් කරලා . ඒ වෙද්දී CID එකේ කස්ටඩි එකේ මේ නඩු භාණ්ඩයක් විදියට අරන් තිබ්බේ ඒ Vehicle එක.

FAIR COMMENT BY JEZEEM

පස්සේ ඕකේ රේපයාර් වගයක් තිබ්බා උතුමාණනි. ඒක නිසා මං ඒක ඉල්ල ගත්තා. ඒ කියන්නේ ඒ ගොල්ලෝ පරීක්ෂා කරලා තිබ්බා. මේකෙත් ඒ විමර්ශනයට අදාළව මොනව හරි දේකට යොදා ගත්තා ද කියලා. ඔය නාලක සිල්වා මහත්තයගේ කතාවත් එක්ක. නමුත් මම කිව්වා ඒක ඇත්තටම දෙන්න මට. මං ඊට පස්සේ කිව්වා මේක නිකන් නවත්වලා තියන්න එපා මේක වටිනාකමකින් යුත් නිසා මේකේ බැටරියේ පොඩි ප්‍රශ්නයක් තිබ්බා. Toyota එකට යවලා මං ඒ රේපයාර් එකත් කරා. ඊට පස්සේ මට මතක හැටියට මම VIP Security හරි ඒ කියන්නේ අපේ ප්‍රයෝජනයට ගන්නේ නැත්නම් unit එකකට දෙන්නත් හදලා නමුත් මං TID එකේ හිටියේ මාස 07 ක් 08 ක් වගේ කාලයක්.

ප්‍ර: මොකද VIP Security එකට වැඩිය දැන් අනිත් කාරණාවලට යොදා ගන්න එක වැඩියේ හොඳයිනේ?

උ: ඒක ඇත්තටම හොඳ Surveillance Vehicle එකක්. ඒ කියන්නේ හැබැයි ඒක එකක් තියෙනවා අර ඇන්ටනා එක මවුන්ට් කරද්දී උඩට ඒ කියන්නේ නිරීක්ෂණය වෙනවා. ඊට වඩා cover Vehicle එකක් ඒ කියන්නේ සැගවුණු වාහනයක් යෝග්‍යයි. නමුත් අර අපි open Surveillance එකක් කරනව නම් හොඳ වාහනයක් ඒක විශේෂයෙන්ම නාලක සිල්වා මහත්තයා හිටපු නියෝජ්‍යය පොලිස්පති මහත්තයගේ මහත්තයා තමයි ඕක ඩිසයින් කරලා මහන්සි වෙලා ඕක අරගෙන තිබ්බේ.

ප්‍ර: එකේ Software එක හම්බවුණා ද?

උ: ඒක උතුමාණනි Operators ලා දෙන්නෙක් Training කරලා තිබ්බා. ඒ වාහනේ ඇතුළේ ඉදන්ම laptop එකකින් Open කරලා ඒක මවුන්ට් කරපුවහම අපිට සෑහෙන්න දුරක් අපිට visuals ගන්න පුළුවන්. ඒ වගේම ඩ්‍රෝන් එක උඩට යවලා ඡායාරූප ගැනීමේ හැකියාවක් තියෙනවා.

ප්‍ර: ඒක මුදල් ගෙවා ගත්තු එකක් නෙවෙයි?

උ: ඒක ජපානයෙන් පරිත්‍යාගයක් විදියට හම්බුවෙලා තිබ්බේ. ඒ කියන්නේ මොඩිෆයි කරපු වාහනයක්. ඒ කියන්නේ සාමන්‍යය වෑන් එකකට අර Surveillance Vehicle සෙට් කරලා තමයි.

ප්‍ර: මේ සම්බන්ධව ඉහළ නිලධාරීන් දැනුවත් කරලා මෙය භාවිතයට ගැනීමට යම් ක්‍රියාමාර්ගයක් ගන්නේ නැද්ද?

උ: ඒක උතුමාණනි ඒ වෙද්දී විමර්ශන වල කොටසක් මං පළවෙනි දේ කළේ මං ඒක park කරලා නඩු භාණ්ඩයක් විදියට තියෙන එක මං ගත්තා. ඊට පස්සේ කිව්වා maintain කරන් යන්න කියලා. ඒකයි මං Toyota එකට යවලා repair වගයකුත් කෙරුව්වා ඒක. ඒ වෙද්දී අවශ්‍යතාවයක් ආවෙත් නැහැ අපිට ඒ කාලය තුළ Surveillance එකකට ඒක යොදවන්න.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔය සහරාන් ඇතුළු කණ්ඩායම් ගැන කරන පරීක්ෂණ වලට එහි විමර්ශන අංශයේ හිටිය අධ්‍යක්ෂකවරයා සේවයෙන් ඉවත් වීම යම් බලපෑමකට ලක් වුණා ද?

උ: නියෝජ්‍යය පොලිස්පති නාලක සිල්වා කියන්නේ දක්ෂ නිලධාරීයෙක්. ඇත්තටම මම TID එක භාර ගනිද්දීත් අනික් ඒකක එක්ක බලද්දී සෑහෙන උත්සාහයක් දරලා තිබ්බා මොහොමඩ් සහරාන්ට විරුද්ධව. වරෙන්තු අරන් තිබ්බා. ඒ වගේම ගුවන් ගමන් තහනම් ඒ වගේම ෆේස්බුක් එක එයාගේ මුහුණු පොත හරහා යන ඒ ප්‍රචාරනයන් නවත්වන්න සෑහෙන්න උත්සාහයක් නාලක සිල්වා මහත්මයා අරන් තිබ්බා. මට ඒක ලේසි වුණා භාර ගද්දී ඉතිරි ටික කරගෙන යද්දී විශේෂයෙන්ම මේ සංකල්පයට අදාළ ඒකක පිහිටුවලා ඒ වගේ මේ ගැන හොඳ අවබෝධයක් තිබිලා තියෙනවා නාලක සිල්වා මහත්තයට. හැබැයි මහත්තයා අත්අඩංගුවට පත්වීම තුළ මාස දෙක තුනක් නැවත මං භාර ගද්දී කාලයක් තිබිලා තියෙනවා අධ්‍යක්ෂවරයෙක් නැතුව වැඩ බලන අධ්‍යක්ෂකවරයෙක් ඉඳලා තියෙනවා. හැබැයි මං හිතනවා ඒත් එක්ක මේකේ තියෙන පරිණාමය බලද්දී අපි ඒක කරපු දේවල් ඉස්සරහට කරගෙන ආවා. හැබැයි නාලක සිල්වා මහත්තයා තුළ තිබ්බ සැලසුම් මොනව ද කියලා මම දන්නේ නැහැ. හැබැයි TID ට මහත්තය දුන්න නායකත්වය යටතේ ඉස්සරහට ගියා.

****

<u>**ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා.**</u>

ප්‍ර: ජයසුන්දර මහත්මයා දැන් ඔබ කිව්වා මේ ෆෙටෝ සංවිධානය සම්බන්ධයෙන් ඔබ සොයා බැලුවා කියලා ?

උ: උතුමාණනි ෆෙටෝ සංවිධානය ගැන සොයා බැලීමක් වුණේ නැහැ. ඒක වුණේ අර අමාත්‍යාංශයට ආපු ලිවිමක් සම්බන්ධ තැනකදී කතා බහක් වෙලා තිබ්බා. අර Turkish සංවිධානය සම්බන්ධව නේද උතුමාණනි.

ප්‍ර: දැන් නැවතත් ඒ පිළිබඳ තවත් දැන් මේ ආරංචි යනවා නේද ඒ සංවිධානය සම්බන්ධයෙන්?

උ: මේකේ තිබ්බේ ඇත්තටම මේකේ ප්‍රධානියා ඉන්නේ පෙන්සිල්වේනියාවල. ඒ කියන්නේ එක්සත් ජනපදයේ තමා ජීවත් වෙන්නේ. නමුත් දැනට තියෙන තුර්කි රජය කියන්නේ මේ ෆෙටෝ කියන සංවිධානයේ සාමාජිකයන් ත්‍රස්තවාදීන් විදියට තමයි මේ ගොල්ලෝ සලකන්නේ. එතකොට නමුත් ඒක මම දකින්නේ movement එකක් විදියට. ඒ කියන්නේ ඒකට ගොඩක් පිරිසක් ඉන්නවා. දැනට ඒ කියන්නේ ඔය ශ්‍රී ලංකාවේ ඒ තිබ්බ ආයතන සම්බන්ධව තමයි විරෝධතාවයක් ඒ කාලේ යොමු කරලා තිබිලා තියෙන්නේ තුර්කි තානාපති කාර්යාලයෙන්.ඒ කියන්නේ මේ ආයතන ඒ

FAIR COMMENT BY JEZEEM

රටේ මිනුම් දඬු අනුව රාජ්‍යය විරෝධී ක්‍රියාකාරකම් වල යෙදෙනවා කියලා. නමුත් මෑතක නම් මම දැනට STF එකට ඇවිල්ලා මාසයයි. එහෙම මේ සංවිධානය ගැන තොරතුරු වාර්තා වීමක් වෙලා නැහැ.

ප්‍ර: දැන් ඒ පුද්ගලයෝ ලංකාවේ හිටියා නේද 30 ක් විතර ඇවිල්ලා හිටියා නේද මේ දවස් වල?

උ: එකේ අර කලින් උතුමාණනි තිබ්බා 50 හරි ආපු එකක්. නමුත් දැනට වර්තමානය මොකද්ද මේ සම්බන්ධව පරීක්ෂා කරලා බලන්න වෙනවා. මේ දැනට මොකද්ද මේ ක්‍රියාකාරකම් ලංකාව තුළ සිද්ධ වෙනව ද කියලා.

ප්‍ර: කිසිම ආයතනයකින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ සිද්ධ වෙන්නේ නැද්ද?

උ: විශේෂ කාර්ය බලකායෙන් අපි කරන්නේ නැහැ. බුද්ධි අංශ වලින් පරීක්ෂා කරන්න වෙනවා විශේෂයෙන්ම රාජ්‍යය බුද්ධි සේවයෙන් මේ සංවිධාන පිළිබඳ තව දුරටත් තොරතුරු බලනව ද කියලා.

****

<u>ගරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර: M.r. ජයසුන්දර ඔබ ප්‍රකාශ කළා ඔබ STF එකේ ඔබ බුද්ධි අධ්‍යක්ෂක ලෙස සිටි කාලයේ දී නැගෙනහිර පළාතේ ආරුගම්බේ සහ කලවන්චිකුඩි කියන ස්ථාන දෙකේ ස්ථාපිත කරපු බුද්ධි ඒකක වල කටයුතු කිසියම් අවස්ථාවකදී අඩපණ වුණා කියලා සම්පූර්ණයෙන්ම ඒ ඒකක වසා දැම්මා කියලා?

උ: එහෙමයි.

ප්‍ර: දැන් ඔබ දැනට කමඩාන් හැටියට ඉන්නවනේ STF එකේ?

උ: එහෙමයි.

ප්‍ර: ඔබ පත් වූ වහාම සොයා බැලුවද එම කලවන්චිකුඩි සහ අරුගම්බේ ඒකක දෙක නැවත බුද්ධි නිලධාරීන් යොදවලා ඒ කාර්ය ඉෂ්ඨ කර ගැනීම ගැන?

උ: ඒ උතුමාණනි ඒ කියන්නේ ඒකයි මම දැන් මට දිලා තියෙන දේ තමයි සංවිධානාත්මක අපරාධ මර්ධනය කරන එක මම දැන් මාසයයි වැඩ භාරගෙන ඒ නිසා තමයි දකුණු පළාතේ ඒකක 05 ක් මම දැන් ස්ථාපිත කරන්න කටයුතු කරලා තියෙනවා. ඒ වගේම බස්නාහිර පළාතේ මම ඒකක දැනට 04 ක් ක්‍රියාත්මක කරනවා නමුත් නැගෙනහිර පළාතේ ඔය කඳවුරු වල දැනට බුද්ධි අංශ පටන් ගත්තේ නැහැ මොකද දැනට මගෙන් ආපු සේවය අවශ්‍යතාවය තමයි මේ සංවිධානාත්මක අපරාධ මර්ධනය කරන්න කියලා. ඒක දීර්ඝ වැඩක් උතුමාණනි. ඊට හේතුව අපි නිලධාරීන් තෝරගන්න ඕන. දැනට කලවන්චකුඩි සහ පොතුවිල් අපේ කඳවුරු වල ඒ කඳවුරු මට්ටමෙන් හදාගත්ත ඒකකයක් තියෙනවා. ඒ

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කියන්නේ වැටලීම් කරන්න. නමුත් නිලධාරීන් තෝරාගෙන පුහුණුවක් දීලා තමයි අපිට නැවත මේ ඒකක ස්ථාපිත කරන්න වෙන්නේ.

ප්‍ර: දැන් ඔබ මේ කොමිෂමට කිව්වා කරුණු 14 ක් යටතේ තමයි ඔබ බුද්ධි ඒකක විසින් තොරුතුරු වාර්තා කළේ කියලා. ඒ කරුණු 14 එකක් තමයි ඔබ කිව්වේ ආගමික අන්තවාදය

උ: අන්තවාදී අදහස් ක්‍රියාකාරකම්.

ප්‍ර: ආගමික අන්තවාදය නෙවෙයි ද?

උ: නැහැ අන්තවාදී අදහස් වගේ උප මාතෘකාවක් යටතේ තමයි හැබැයි අදහස් කළේ ඔය extremism පැත්ත.

ප්‍ර: එතකොට ඔබ දැන් දන්නවානේ මේ 2019 අප්‍රේල් 21 සිදු වීමෙන් පසුව නැගෙනහිර පළාතේ කාත්තන්කුඩි ප්‍රදේශයේ සහ මුස්ලිම් සහ නැගෙනහිර පළාතේ මුස්ලිම් ජනගහනය බහුතරව සිටින ප්‍රදේශවල මේ ඉස්ලාම් ආගමික අන්තවාදයක් ක්‍රියාත්මක වෙනවා කියලා.

උ: එහෙමයි.

ප්‍ර: එතකොට ඇයි ඔබ ප්‍රමාද වෙන්නේ ඒ නිලධාරින් සොයලා පුහුණු කරලා යැවීමට මේ නැගෙනහිර පළාතේ ඉස්ලාම් ආගමික අන්තවාදය නතර වුණේ නැහැනේ අප්‍රේල් 21 ප්‍රහාරයෙන් නතර වුණා කියලා වාර්තා වුණා ද?

උ: නැහැ.

ප්‍ර: ඒක තමයි ඒ නිසා මේ ඉස්ලාම් ආගමික අන්තවාදය ස්වරූපය ඉතාම වෙනස් දෙයක්නේ නේද?

උ: එහෙමයි.

ප්‍ර: දැන් ඔබට ත්‍රස්තවාදය ගැන අත්දැකීම් තිබෙන කෙනෙක් හැටියට ඉස්ලාම් ආගමික අන්තවාදයයි LTTE ත්‍රස්තවාදයයි එක සමාන දෙයක් නෙවෙයි ?

උ: එහෙමයි.

ප්‍ර: එතකොට කොයි වෙලාවක හෝ නැගෙනහිර පළාතේ ඔය කියන ප්‍රදේශවල නැවත ඔය ඉස්ලාම් ආගමික අන්තවාදියෙකු ආගමේ දෙවියන්ගේ නාමයෙන් ජිහාඩ් කරන්න පුළුවන් නේ?

උ: එහෙමයි.

ප්‍ර: ඉතිං ඔබ දැන්වත් හිතනව ද මේක ඉක්මනින්ම කළ යුතුයි කියලා?

උ: විශේෂයෙන්ම මම එකඟ වෙනවා. අනිවාර්යෙන්ම පියවර ගන්නම් ඔය නැගෙනහිර කඳවුරු දෙකේ විශේෂයෙන්ම පොතුවිල් සහ කලවන්චකුඩි වල ඒ ඒකක ස්ථාපිත කරන එක. විශේෂයෙන් මං අදත් වාර්තාවක් ඉදිරිපත් කරන්න කටයුතු කරා. හෙට ඉදිරිපත් කරනවා පොලිස්පතිවරයාට එහෙම අපි හඳුනාගත්ත ක්‍රියාකාරියෙක් ගැන.

ප්‍ර: එහෙම නැත්නම් ඔය STF එකේ විෂය පථය තුළ නැතිද ඔය බුද්ධි ඒකක වලට වුණත් ඔබ දැන් සඳහන් කළේ දකුණු පළාතේ ඔය සංවිධානාත්මක

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අපරාධ මත්ද්‍රව්‍ය වගේ දේවල්නේ. දැන් STF එකේ බුද්ධි තොරතුරු ඒකකයට විෂය පථය ඇතුළේ නැද්ද මේ ආගමික අන්තවාදය පිළිබඳ සෙවීම?

උ: තියෙනවා උතුමාණනි. ඒ නිසා තමයි අපි දැන් මම අධ්‍යක්ෂක බුද්ධි වෙලා ඉන්දැද්දි ඒ පැත්ත බැලුවේ . අර කරුණු 14 න් එකක් විදියට. දැනුත් අපි ඉන්නවා නිලධාරීන් මේ පිළිබඳ පුහුණු වෙච්ච පාඨමාලාවට ගිය කට්ටිය. නමුත් මං ඔබතුමිය කියපු දේ පිළිගන්නවා. අනිවාර්යෙන්ම පියවර ගන්නම්. අර අයින් කරපු දේ නැවත ඇති කරන්න.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍ය ද යන්න අති උතුම් මැල්කන් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයාගෙන් අසමි. අවශ්‍ය බව ප්‍රකාශ කරයි.

****

<u>පල්ලිය වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහතා</u> .

ප්‍ර: දැන් සාක්ෂිකරු තමුන්ට අවබෝධයක් තිබෙනව ද 2018 ජූලි 09 වැනි දින කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයෙන් සහරාන් හෂීම්ව අත්අඩංගුවට ගැනීමට විවෘත වරෙන්තුවක් ත්‍රස්ත විමර්ශන ඒකකයෙන් ලබා ගත් බවට?

උ: එහෙමයි.

ප්‍ර: දැන් මේ වරෙන්තු ලබාගෙන මොහුව අත්අඩංගුවට ගැනීමට අප්‍රේල් 21 2019 වෙනකන්ම නොහැකි වීමට අපහසු වීමට හේතුව කුමක්ද?

උ: දැන් එදා ඉඳන් TID එකේ ගත්ත පියවර බලද්දී ඇත්තටම අවංකවම TID එක උත්සහා කරලා තියෙනවා මේ සහරාන්ව අත්අඩංගුවට ගන්න. මට දිනත් එක්ක කියන්න පුළුවන් මේ මගේ නිලධාරී ඒ සහරාන්ව ඒ වරෙන්තු ක්‍රියාත්මක කරන්න අවස්ථාව 07, 08කම කොළඹින් කණ්ඩායම් ගිහින් තියෙනවා කාත්තන්කුඩි,අක්කර පත්තු කියන ප්‍රදේශ වලට. කැකුනුගොල්ලටත් ගිහින් තියෙනවා. මම ආවට පස්සේ අවස්ථා දෙකක විශේෂයෙන්ම පෙබරවාරි 28 කැකුණුගොල්ල ප්‍රදේශයට ජනවාරී 15 කාත්තන්කුඩි සහ අක්කර පත්තු ප්‍රදේශයන්ට කණ්ඩායම් ගිහිල්ලා තිබෙනවා. ඒ වගේම කල්මුණේ ඒකකයෙන් නිරන්තරයෙන්ම ඒ තොරතුරු උපදෙස් සටහන් පොතේ තොරතුරු තියෙනවා මෙයා ඉන්න ඒරියා එකට හැමදාම වගේ ගිහින් තියෙනවා. මෙයාව හොයන්න. එතකොට අර වරෙන්තුව ක්‍රියාත්මක කිරීම කියන එකට මට සාධාරණව

FAIR COMMENT BY JEZEEM

පේනවා අවංක උත්සාහයක් ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය අරන් තියෙනවා කියලා.

ප්‍ර: ඊට අමතරව ඔහුට එරෙහිව travel banned එකක් ඒ කියන්නේ ගමන් අවහිර කිරීමකුත් ලබා ගත්තා?

උ: ඔව් ඒ කියන්නේ 2018.06 මාසේ වගේ අපි travel banned එකක් අරන් තියෙනවා. ඒ වගේම මට දෙන්න පුළුවන් අපි 2018.09 වැනි මාසේ විතර වෙද්දී ඔය Cert එකට හදිසි ප්‍රතිචාර ඒකකය දන්වලා නිලධාරියෙක් ගෙන්නලා එයාගේ advices එක අරන් තමයි අපි ෆේස්බුක් එකට ලියන්නේ මේ මෙයාගේ වෙබ් කැම්පේන් එක නවත්වන්න. ඒ වගේම මම ආවට පස්සේ අප්‍රේල් 03 අපි බැංකු ඔක්කොටම ලියනවා මෙයාගේ money trail එක හොයන්න accounts මොනව හරි තියෙනව ද කියලා. හැම බැංකුවකින්ම අහනවා අපි ලියපු එවලා තියනවා මෙයාට කිසිම bank account එකක් නැහැ . 2019 අප්‍රේල් 03 ලියලා තියෙනවා. ඒ වගෙම mobile providers dialog , mobitel ඒ වගේ ආයතන වලටත් ලියලා මෙයාගේ Communication network එකත් හඳුනගන්න ක්‍රියා කරලා තියෙනවා.

ප්‍ර: මීට අමතරව සාක්ෂිකරු ඔබ පැවසුවා 2019 වර්ෂයේ අප්‍රේල් 09 වැනි දින බුද්ධි සමාලෝචන රැස්වීමකට තමුන් සහභාගි වූ බවට. ඒ රැස්වීමේ දී සහරාන් හෂීම් පිළිබඳව සාකච්ඡා කළ ලෙසට?

උ: කතා කළා. එහෙමයි.

ප්‍ර: ඒ රැස්වීම පැවැත්වුයේ තමුන්ගේ මතකය අනුව කියට විතරද එදා?

උ: උදේ වරුවේ ආරක්ෂක අමාත්‍යාංශයේ දී පැවැත්වුයේ.

ප්‍ර: පැය කියක් විතර තිබ්බ කියලා මතක ද?

උ: පැය 10.00 ට විතර කියලා මං මගේ මතකය හරිනම් සාමාන්‍යයෙන් පැය 02 ක් විතර තිබ්බා සාකච්ඡාව.

ප්‍ර: දැන් මෙදින තමුන් සාක්ෂි දුන්නා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රාජ්‍යය බුද්ධි සේවයේ නිලන්ත ජයවර්ධන මහතා තමයි සහරාන් හෂීම් පිළිබඳව එදින ඒ රැස්වීමේ සාකච්ඡා කළේ?

උ: ඔව් කරුණු ඉදිරිපත් කළා.

ප්‍ර: ඔහු එම කරුණු ඉදිරිපත් කරද්දී සහරාන් හෂීම්ගෙන් මෙරටට තර්ජනයක් ඇති බව සඳහන් කරාද?

උ: ඒක සඳහන් කරා එයාගෙන් තිබුණු තර්ජනය ගැන.

ප්‍ර: දැන් ඒ තර්ජනය ගැන සඳහන් කරලා මොහු සම්බන්ධයෙන් ඉදිරි පියවර යමක් මෙම රැස්වීමේ දී ගත යුතු බවට එම මහතා සඳහන් කරාද?

උ: ඒ කියන්නේ යන Investigation විමර්ශන ගැන කතා වුණා. ඒ වගේම මෙයාව නවත්වන එක ගැන කතා වුණා ඇත්තටම.

ප්‍ර: කොයි වගේ පියවරක් ද ගන්න කියලා කතා කළේ?

FAIR COMMENT BY JEZEEM

උ: මට හරියටම මතක නැහැ පළවෙනි දේ කතා වුණේ මෙයාව කොහොම හරි arrest කරන එක. එතකොට මේ එයා සැරිසරන ප්‍රදේශ ගැනත් කතා වුණා. ඒ වගේම ඔය විශේෂයෙන්ම ISIS එක ගැන ශ්‍රී ලංකීකයන් ගිය එක ගැන ඒ ගොල්ලෝ ආපු එක ඒ ගොල්ලොන්ගේ ලින්ක එකක් මේ ගොල්ලොන්ට තියෙනව ද කියන ඒක ඒකත් කතා වුණා. මට හරියටම මතක නැහැ. Minute එකක්වත් මං ළඟ නැහැ දැන්.

ප්‍ර: ඔබට මතකයක් තිබෙනව ද එම නිලන්ත ජයවර්ධන මහතා මොහුගෙන් සිදුවිය හැකි තර්ජන පිළිබඳව කතා කරද්දී ප්‍රසිද්ධ කතෝලික පල්ලි වලට මොහුගෙන් ප්‍රහාරයක් එල්ල විය හැකි බවට කොයි වෙලාවකවත් සඳහන් කරාද?

උ: සඳහන් කළේ නැහැ.

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.**</u>

ප්‍ර: 2019 අප්‍රේල් මාසේ 09 වැනිදා පැවති බුද්ධි සමාලෝචන රැස්වීමේ දී කොයියම්ම හෝ අවස්ථාවක සඳහන් වුණා ද වනාතවිල්ලුවෙන් සොයාගත්තු අවි ගබඩාවෙන් විමර්ශන වලදී සහරාන් හෂීම්ගේ නම මතුවෙනවා කියලා?

උ: බුදු පිළිම සිද්ධියේ දී මාවනැල්ලේ එයා ගැන සම්බන්ධයක් ගැන කතා වුණා නමුත් CID මට මතක හැටියට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාත් අධ්‍යක්ෂකවරයාත් හිටියා වගේ මට මතකයි. ඒ කියන්නේ අනිවාර්යෙන්ම වානතවිල්ලුවේ මේ සම්බන්ධව ඒ ගොල්ලෝ තමයි විමර්ශන කළේ. නමුත් උතුමාණනි මට හරියටම කියන්න බැහැ වනාතවිල්ලුවේ explosive හොයා ගත්ත එකට සහරාන්ගේ සම්බන්ධය එයා ඒ වේලේ කතා වුණා ද කියලා. හැබැයි සමස්තයක් විදියට බුදු පිළිම සිද්ධිය සහ මේ සහරාන්ගේ ක්‍රියාකාරකම් ගැන කතා වුණා.

කොමිෂම ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්යට දැක්වූ සහයෝගය සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තූතිය පළ කරනවා.

සාක්ෂිකරු මුදා හරිනවා.
වේලාව: ප.ව. 10.30

කොමිෂන් සභාව හෙට උදෑසන පෙ.ව 10.00 ට රැස් වේ.

****

FAIR COMMENT
BY JEZEEM
President Secretary's Copy

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදුවූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනයකර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය - 2020-07-20 වේලාව- ප.ව. 01.30
සටහන් කලේ යමුනා දසනායක විසිනි.

ගරු විනිසුරු මඩුල්ල -

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති.

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා. සාමාජික

03. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා. සාමාජික

04. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා සාමාජික

05 හිටපු අමාත්‍යංශ ලේකම් ඩබ්ලිව් . එම්. එම්. ආර් අදිකාරි මහත්මිය සාමාජික

පෙනි සිටීම

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ට රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය , රජයේ අධිනීතිඥ නිමේෂාද අල්විස් මෙනවිය , රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර , රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ පෙනි සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීම සලකා බැලු මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නිති නියෝජිත වශයෙන් ජනාධිපති නීතීඥ ෂමිල් පෙරේරා මහතා සහ නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනි සිටීමට අවසර ලබා දෙන ලදි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම - සාමන්ත දීපාල් විජේසේකර .
වයස - අවු 50යි.
ජාතිය- සිංහල
ආගම-බුද්ධාගම
තනතුර - ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී. මොනරාගල කොට්ඨාශ භාර පොලිස් අධිකාරී.
ප්‍රතිඥා වෙයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විජෙසේකර මහත්මයා ඔබ පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය සඳහා බැඳුනේ කවදාද?

උ ස්වාමීනි 1992.11.01

ප්‍ර ඒ මොන තනතුරටද?

උ ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන්.

ප්‍ර ඔබ එතැන් පටන් පොලිස් දෙපාර්තමේන්තුවේ මේ දක්වා ලබා තිබෙන උසස්වීම් මොනවාද?

උ 1999 වසරේ තරග විභාගය සමත්ව පොලිස් අධිකාරිවරයෙක් වුණා. 2006 කුසලතාවය මත ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙක් වුණා. 2008.01.01 දින සීමිත තරග විභාගය සමත්ව සහකාර පොලිස් අධිකාරිවරයෙක් වශයෙන් උසස්වීම් ලැබුවා. 2014.01.01 පොලිස් අධිකාරිවරයෙක් ලෙස උසස්වීම් ලැබුවා. 2018.01.01 ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙකු ලෙස උසස්වීම් ලැබුවා.

****

<u>ගරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර 1999 IP

උ පොලිස් පරික්ෂක

ප්‍ර CIP?

උ 2006.01.01 ඉඳලා ප්‍රධාන පොලිස් පරික්ෂකයෙකු වශයෙන් උසස්වීම් ලැබුවා

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර 1992 පටන් ඔබ මේ පොලිස් දෙපාර්තමේන්තුව තුළ කරන ලද සේවය මේ ලංකාවේ ලබාදීලා තියෙන්නේ මොන මොන ප්‍රදේශවල ඉදලද?

උ. ස්වාමීනි මගේ පළවෙනි රාජකාරී ස්ථානය වන්නේ නුවරඑළිය කොට්ඨාශයේ හැටන් පොලිස් ස්ථානය, ඊට පස්සේ 94ඉඳලා 95 මැයි මාසේ වෙනකම් මඩකලපු කොට්ඨාශයේ කාත්තන්කුඩි , 96 සිට 2000

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දක්වා හැටන් කොට්ඨාශයට අනුයුක්තව බුද්ධි රාජකාරි, විශේෂ කාර්යාංශයට අනුයුක්තව සහ අපරාධ අංශයේ ස්ථානාධිපති, 2000 සිට 2001 දක්වා කල්මුණ බුද්ධි අංශ භාර රාජකාරි, 2001 සිට 2004 දක්වා බණ්ඩාරවෙල අපරාධ අංශයේ ස්ථානාධිපති, 2004 ජනවාරි සිට 2004 ජුනි මාසය දක්වා ස්ථානාධිපති ඇල්ල, 2004 ජුනි මාසයේ 2008.01.01 දක්වා ස්ථානාධිපති දියතලාව. ඉන් අනතුරුව සහකාර පොලිස් අධිකාරිවරයෙකු වශයෙන් උසස්වීම් ලබලා ස්වාමීනි, ඉස්සෙල්ලාම ආපහු නුවරඑළිය කොට්ඨාශයේ සහකාර පොලිස් අධිකාරි 2 වශයෙන් . ඉන් අනතුරුව සහකාර පොලිස් අධිකාරි 1 වශයෙන් රාජකාරි කළා. ආපහු 2010 වසරේ අම්පාර කොට්ඨාශයට ස්ථාන මාරුවක් ලබලා ගිහිල්ලා ස්වාමීනි, අම්පාර 1, අම්පාර 2 භාරව කටයුතු කළා. 2013 වසරේ ස්ථාන මාරුවීමක් ලබලා, 2016 .08 වෙනි මාසය දක්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කලා. 2016ඉඳලා 2017 ජනවාරි දක්වා ගම්පොළ කොට්ඨාශභාරනිලධාරි, 2017.01.12 සිට 2019.07.24 දක්වා අම්පාර කොට්ඨාශ භාරනිලධාරි ඉන් අනතුරුව කොළඹ දකුණු කොට්ඨාශ භාර නිළධාරි වශයෙන් රාජකාරි කළා. ඉන්පසුව 2019.12 මාසේ 01 වෙනිදා සිට මොණරාගල කොට්ඨාශ භාර නිළධාරි.

ප්‍ර ඔබ විසින් කරන ලද ඒ පැහැදිලි කිරීමේදී ඔබ සඳහන් කරන්නට යෙදුනා අවස්ථා කිහිපයකදී නැගෙනහිර පළාතේ සේවය කරනු ලැබූ බව.

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එතකොට මා කිව්වොතින් නිවැරදිද? එම සේවා කාලය තුලදී, ඔබ සිවිල් යුද්ධය පවතින කාලයේදී ත් නැගෙනහිර කොට්ඨාශයේ සේවය කරන ලද බව?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එහෙමනම් ඔබ දන්නවාද? පුපුරණ ද්‍රව්‍ය වල තියෙන පීඩාකාරීභාවය?

උ මමස්වාමීනි, විශේෂ පුහුණුවක් ලබා නොතිබුණත්, මූලික පුහුණුවේදී අපට යම් යම් හැදීන්වීම් කරනවා, ඒ වගේම ප්‍රහාරයන් කිහිපයකට එල්ලවෙලා , ඒ වගේම ප්‍රහාරයන් කිහිපයකදී සහෝදර නිලධාරීන් තුවාල වීම් සහ පිපිරීම් දැකලා ඒ වගේ සිදුවෙන විපාක හොඳ අවබෝධයක් තිබෙනවා.

ප්‍ර ඔබ ඔය සඳහන්කරපු කාල සීමාව තුලදී ඒ කියන්නේ 1992 පටන් මේ වනතුරු ඔබ යම් යම් පුහුණුවීම් ලබලා ඇතිනේ?

උ ලබලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර ඒ මොනවගේ පුහුණුවීම්ද?

උ දේශීය වශයෙන් මූලික පුහුණුවට අමතරව කණිෂ්ඨ අපරාධ විමර්ශණ පාඨමාලාව, ජීවිතාරක්ෂක පාඨමාලාව, සහ අපරාධ විමර්ශනය සම්බන්ධයෙන් තවත් පොලිස් අධ්‍යාපන ආයතනය පත්වන පාඨමාලාව, ඊට අමතරව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මානව හිමිකම්පිළිබඳ

FAIR COMMENT BY JEZEEM

ඩිප්ලෝමාධාරි ස්වාමීනි. ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයේ අපරාධ විද්‍යාවපිළිබඳව ඩිප්ලෝමාධාරි ස්වාමීනි. කැළණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ පීඨයේ ඩිප්ලෝමාව හදාරමින් ඉන්නවා.

ප්‍ර ඔබ හයිද්‍රාබාද්වලදී පුහුණු පාඨමාලාවකට ගියා නේද? හයිද්‍රාබාද්වලට ඉන්දියාවේ?

උ එහෙමයි ස්වාමීනි.

උ ඒ මොනවටද?

උ. 2006 වසරේ පුහුණු පාඨමාලාව තිබුණේ හයිද්‍රාබාද් සී .ඩී.ටී.එස් කියන විද්‍යාලයේ. ඒකේ දී ස්ථානාධිපතිවරුන් පාඨමාලාවට හැඩගැස්වීම සහ ඊට අමතරව එහි රස පරීක්ෂක කාර්යාලයක් ආශ්‍රිතව තමයි ඒ පුහුණු මධ්‍යස්ථානය තියෙන්නේ. රස පරීක්ෂක කාර්යාලය ආශ්‍රිතව කෙරෙන කටයුතු සියල්ල සම්බන්ධයෙන් දින 28ක පුහුණුවක් ලැබුවා.

ප්‍ර එතකොට ඕස්ට්‍රේලියාවේ කැන්බරා නුවර ඔබ ලබන ලද පුහුණුව මොකක්ද?

උ ඕස්ට්‍රේලියාවේ කැන්බරා නුවර දින 30ක පුහුණුවක් ලැබුවා, ස්වාමීනි මොස් 56 කියලා Management of Serious Crime , මොස් 56 කියන්නේ ඒ පාඨමාලාව. ලංකාවේ හදාරපු තුන්දෙනාගෙන් අවස්ථා තුනකදී එක්කෙනෙක් මම.

ප්‍ර එතකොට ඔබ දකුණු කොරියාවේ මොකක්ද ඉගෙන ගත්ත දේ?

උ දකුණු කොරියාවේ ජේජු වලදී තැනැත්තන් වෙළඳාම, කුට්ඨනය කිරීම සම්බන්ධයෙන් පාඨමාලාවක් හැදෑරුවා.

ප්‍ර බාර්ලි දූපත්වලදී මොනවද හැදෑරුවේ?

උ නීතිවිරෝධි ලෙස බෝට්ටුවලින් ඕස්ට්‍රේලියාවට යාම පිළිබඳව සහ එය වැළැක්වීම සම්බන්ධයෙන් දවස් 05ක පුහුණුවක් ලැබුවා.

ප්‍ර ඔබ 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා වෙනකොට සේවය කළේ එහෙමනම් අම්පාර කොට්ඨාශය භාරව කියලා මා කිව්වොතින් නිවැරදිද?

උ නිවැරදියිස්වාමීනි.

ප්‍ර 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා ඔබ දන්නවනේ, බස්නාහිර පළාතේ යම් යම් ස්ථානවල බෝම්බ පුපුරලා අහිංසක ජීවිත බොහොමයක් අහිමි වුනා.

උ දන්නවාස්වාමීනි.

ප්‍ර නැගෙනහිරපළාතේ අම්පාර කොට්ඨාශය භාරව හිටපු ඔබට ඒ පිලිබඳව තොරතුරක් ලැබුණද යම් වෙලාවක?

උ මෙම සිදුවීමට පෙරස්වාමීනි, කිසිම අවස්ථාවක එහෙම තොරතුරක් ලැබුණේ නැහැ. නමුත් ස්වාමීනි අපි නිරන්තර විමසිලිමත්විම්වල හිටියා. මොකද මම කල්මුණ සහ ඔය ප්‍රදේශයේ සේවය කරලා තිබෙන විට අත්දැකිමෙන් දන්නවා බොහෝ අවස්ථාවල ඒ ප්‍රදේශයේ නාඳුනන තුවක්කුකරුවන් පොලිසියට වෙඩි ප්‍රහාර එල්ල කරලා තිබුණා. ඒ වගේම සිවිල් යුද්ධය කාලයේ පුද්ගලිකව මාගේ අත්දැකිමක් තියෙනවා. යම් යම්

FAIR COMMENT BY JEZEEM

ගිණි අවි මායිම් ගම්මානවල කට්ටියට බෙදා දුන්නා. නමුත් ඒ ගිණි අවි නැවත හරි හැටියට නැවත බාර ගැනීමක් කිරීමට හැකියාවක් වුනේ නැහැ. එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති එඩිසන් ගුණතිලක මහත්තයා ඒවා භාරගෙන උත්සාහයක් කළා. නමුත් ඒ වනවිටත් මන් හිතන්නේ ඒ සියල්ලම අපිට හරියට බාරගන්න බැරිවුනා.

ප්‍ර ඒ කියන්නේ LTTE ප්‍රහාරවලින් වැලකීම සඳහා සිවිල් වැසියන්ට ලබාදීලා තිබුණ ඇතැම් අවි නියෝජ්‍ය පොලිස්පති එඩිසන් ගුණතිලක මහතා විසින් රැස්කරගන්නට නැවත උත්සාහ ගත්තත් එය සාර්ථකව ඉෂ්ඨ කරගන්නට බැරිවුන බවයි, ඔබ කියන්නේ.

උ එහෙමයිස්වාමීනි.

ප්‍ර ඔබ කොහොමද ඒ ගැන දන්නේ?

උ මාත් මහත්තයත් එක්ක ටික කාලයක් වැඩ කලා. මොකද මහත්තයා එවකට නැගෙනහිර පළාතභාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් ඉන්නකොට අපිටත් උපදෙස් ආවා යුද්ධය කාලයේ බාරදුන් අවි ආපහු භාරගන්න කියලා. සමහර ඒවාගේ නම් ලිස්ට් තිබුණ. අපි ගිහිල්ලා ඒවා පරීක්ෂා කරලා කරලා කිහිපයක් විතරක් භාරගත්තා. නමුත් නිකුත් කල සියල්ල අපිට භාර ගැනීමට අපිට හැකියාවක් ලැබුනේ නැහැ. ඒ නිකුත් කළ අවි බහුතරයක් තනි කාණු අවි. ඒ කියන්නේ ෂොට්ගන් කියන මොඩල් එකේ සහ 30380 ඒකියන්නේ රයිෆල්.

ප්‍ර එතකොට එහෙම නම් ඔබ දන්නවනේ නේද ගිණි අවි පරිහරනය මඟින් කෙනෙකුට මරණාසන්න තුවාල වගේම බරපතල තුවාලත් සිදුකරන්නට පුලුවන්නේ?

උ දන්නවාස්වාමීනි.

ප්‍ර දැන් 2019 අප්‍රේල් 21 සිදුවුන බෝම්බ ප්‍රහාර වලට පස්සේ ඔබේ ඔය ගිණි අවි නැගෙනහිර පළාතේ තවතමත් සිවිල් ජනතාව අතර අත ගැවසෙන බව තිබුණ ඒ දැනුම අනුව මේ පළාතේ පුද්ගලයින්ගේ ජන ජීවිත ආරක්ෂා කිරීම සඳහා යම් පියවර ගත යුතුයි කියලා ඔබට හිතුනද?

උ හිතුන ස්වාමීනි.

ප්‍ර මොකද ඔබ කළේ?

උ මම පළමුවෙන්ම දෙමටගොඩ මහතලවින්න ඒ සිදුවෙච්ච සිදුවීම හින්දා මම ඉස්සෙල්ලාම මගේ නිලධාරීන්ට මම උපදෙස් දුන්නා, යම් ස්ථානයක් සෝදිසි කරන්න තියෙනවා නම් ඒකට හදිසි වෙන්න එපා. නියමිත ක්‍රියාමාර්ග අරගෙන, නිසි ආරක්ෂක ක්‍රමවේද අරගෙන යුධ හමුදාවේ හෝ

ප්‍ර මහවිල නේ?

උ ඔව්. මහවිලවත්ත. ඒ හින්දා මම කිව්වා යුධ හමුදාවේ හෝ විශේෂ කාර්ය බලකායේ හරි සහාය අරගෙන ඒ ස්ථාන සෝදිසි කරන එක තමයි වඩා හොඳ කියලා. ඊට අමතරව ඒ කාලය වෙනකොට සිවිල් ආරක්ෂක කමිටු

FAIR COMMENT BY JEZEEM

හොදින් ක්‍රියාත්මක වුණා. මොකද මේ කාලය වෙනකොට විශේෂයෙන්ම සයින්දමරුදු ප්‍රදේශයේ සයින්දමුරුදු සහ කල්මුණේ ප්‍රදේශයේ විශේෂයෙන්ම ගැටුම්කාරී තත්ව කිහිපයක් ඇතිවෙලා තිබුණා. ඡන්දයේදී ප්‍රාදේශීය සභාවක් ඉල්ලා ගැනීම සඳහා. සයින්දමරුදු ජනයා මං හිතන්නේ දොඩම් ගෙඩියක වෙනම ලකුණක් යටතේ තමයි මේකට තරඟ කලේ. මේ හින්දා පාන්දිරිප්පු , මරදමුණ, කල්මුණ, සයින්දමරුදු මේ සියල්ලම සයින්දමරුදු කියන ගමේ කට්ටියත් එක්ක දැඩි විරෝධතාවයක සිටියේ මොකද ඒගොල්ලේ ස්වාධීනව තරග කරලා ප්‍රාදේශිය සභාවක් ඉල්ලීම සහ ඒ කට්ටිය අයත්වන්නේ ස්වාමීනි, කල්මුණ නගර සභාවට කල්මුණ නගර සභාවේ බහුතර ආසන ගණනක් දිනාගත්ත හින්දා ඇතුලේ ගැටුම් තිබුණා කල්මුණ ප්‍රදේශයේ. ඒ හින්දා මම ස්වාමීනි දින කිහිපයක් පුද්ගලිකවම අක්කෙරෙයිපත්තුව, නින්දවුර් , සයින්දමරුදු ප්‍රදේශවල සංචාරය කරලා ස්ථානාධිපතිවරුන්ටත් දැනුම් දුන්නා පිටස්තරින් එන පුද්ගලයන් සම්බන්ධයෙන් විමසිලිමත්වන්න ක්‍රමවේදයක් හදන්න කියලා.

මම ඒ අනුව අට්ටාලච්චේන, නින්දවුර් , සයින්දමරුදු ජුම්මා පල්ලිය, ඒ පල්ලිවල ඉන්න සභාපතිතුමන්ලා සහ රැස්වීම් බෝඩ් එක විධායක කමිටුවේ කට්ටියට පැහැදිලිව කිව්වා යම් කෙනෙක් පිටින් එනවානම් පල්ලිය දැනුවත් කරලා පල්ලියේ ලියාපදිංචිවීමක් කරන්න. එහෙම පල්ලියේ ලියාපදිංචි කිරීමක් කළාට පස්සේ ඒ දවස්වල ඒ පල්ලි සඳහා ආරක්ෂාවටත් පොලිස් නිලධාරින් අපි යොදලා හිටියා. ඒගොල්ලේ දැනුවත් කරන්න පිටින් කවුරුහරි ඇවිල්ලා ඉන්නවානම් අපිට ඉක්මණට මේ ගොල්ලෝ පරීක්ෂා කර ගැනීමේ අවශ්‍යතාවයට කියලා.

ප්‍ර එහෙම ඔබ ජනතාවට උපදෙස් දෙනු ලැබුණ අතරේදී යම් තොරතුරක් ඔබට ලැබුණද 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදාට පසුව? ඔය ජනජීවිතයට යම් ආකාරයක හානිදායි තත්වයක් ඇතිවෙන්නට පුලුවන් ආකාරයේ?

උ මේ දින වනවිට ස්වාමීනි අම්පාර කොට්ඨාශයේ රාජ්‍ය බුද්ධි සේවය භාරව සිටියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක හේරත් මහතා. ඒ වගේම අම්පාර විශේෂ කාර්ය බලකාය භාරව සිටියේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අතුල රත්නායක. 24 වෙනි බල සේනාංකය තමයි ඒ පැත්ත භාරව සිටියේ ආරක්ෂාව සම්බන්ධයෙන්. ඒ හිටියේ මේජර් ජෙනරාල් මහින්ද මුදලිගේ. අපි නිතරම දුරකථනයෙන් සහ සම්බන්ධවෙලා යම් ඔපරේෂන් එකක් කළත්, මෙහෙයුමක් කළත් අපි සියල්ල එකතුවෙලා කරන තත්වයක් තිබුණා. මොකද අපි එක ටීම් එකක් විදියට වැඩ කරන එක පෙන්නුවොත් අපිට පුලුවන් මේක ඉක්මනින් මහහරවා ගන්න. ඒ අනුව

ප්‍ර විජේසේකර මහත්මයා මම ඔබට මදක් බාධා කරනවා, දැන් ඔබ කීවා මේ විවිධ අංශ නීතිය බලගැන්වීම සඳහා මේ රටේ තිබෙන විවිධ අංශ

FAIR COMMENT BY JEZEEM

ඒකරාශිවීමක් වුනාය කියලා ඔය අම්පාර දිස්ත්‍රික්කයේ. නමුත් අපි මේ ගරු කොමිෂන් සභාව ඉදිරියට ආපු ඇතැම් නිලධාරින් දීලා තියෙන සාක්ෂි අනුව මේ ආකාරයේ මේ එස්.ටී.එෆ් එක, එස්.අයි.එස් .එක, සාමාන්‍ය පොලිසිය, යුධ හමුදාව, ඔබ කියන ආකාරයට ඒවගේ සාමුහිකව එකතුවෙලා මෙහෙයුම් කිරීමක්, කරුණු බෙදාහදා ගැනීමක් තොරතුරු හුවමාරු කරගැනීමක් ගැන අනාවරනය වෙලා නැහැ අපිට. එහෙමනම් ඔබට කියන්න පුලුවන්ද ඇයි මේ අම්පාර දිස්ත්‍රික්කයේ ඔබ මේ සඳහන්කරන ඔය ආකාරයේ වෙනසක් තියෙන්නේ කියලා?

උ සාමාන්‍යයෙන් ස්වාමීනි, යුද්ධය ආශ්‍රිතව වසර ගණනාවක් සිටි ප්‍රදේශයක් විශේෂයෙන්ම රජයේ නිලධාරීන් ආවත්, ඒ නිලධාරීන් බොහෝ කාලයක් ඒ ප්‍ර දේශයේ රැඳෙන්නේ නැහැ. යම් සේවා කාලයකට එන්නේ. ඒ නිසා ඉන්න සියලුම රජයේ නිලධාරීන් අතර පුදුමාකාර සහෝදර බැඳීමක් තියෙනවා. අම්පාර දිස්ත්‍රික්කයේ. ඒක දැනටත් තියෙනවා. ඒ කියන්නේ අපි ස්ථාන මාරුවීම් ලබලා අපි එහෙන් පිටවෙලා හිටියත්, අපිට අදටත් ඒ නිලධාරින් කතාකරනවා. එතකොට ආරක්ෂක අංශවල බැඳීම වැඩියි. එහෙම එකමුතුවක් තිබුණ නම් ස්වාමීනි ඇත්තටම ඒ එකමුතුව තිබිය යුතුයි. අපි කණ්ඩායමක් වශයෙන් ඔක්කොම එකතුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි අපිට මේ සාර්ථක මෙහෙයුමක් කරගන්න හැකියාව ලැබුණේ.

ප්‍ර ඔබ කිවා දැන් ඔබලා සියලුදෙනා අතරම හොඳ සාමුහිකව එකඟතාවයක් තිබුණා මෙහෙයුමක් කරනකොටත් ඔබලා ඔක්කොමලා එකතුවෙලා තමයි මේ මෙහෙයුම් කරන්නේ කියලා? තව මොනවද ඔබට ඒ ගැන කියන්න පුලුවන්?

උ 04 මාසේ 25 වෙනිදාස්වාමීනි, මට රාජය බුද්ධි සේවයේ නිලධාරි මහත්මයා දැනුවත් කළා.

ප්‍ර 25ද ඊට ඉස්සරවෙලාද?

උ 24 වගේ තමයි මගේ මතකයේ තියෙන්නේ. අට්ටාලච්චේන ප්‍රදේශයේ පුද්ගලයෙක් දැනුම් දුන්නා කියලා, දුරකථනයෙන් සැකකටයුතු කට්ටියක් ඇවිල්ලා ගෙදරක ඉන්නවා කියලා. ඊට පස්සේ මම ඒ අවස්ථාවේම සී.අයි හේරත්ට කිව්වා ටීම් එකක් අරගෙන අට්ටාලච්චේනට යන්න කියලා. සී.අයි. බණ්ඩාර. එවකට ස්ථානාධිපති අක්කෙරෙයිපත්තු 666හිටියේ සී.අයි. බණ්ඩාර. සී.අයි. බණ්ඩාරට කිව්වා ටීම් එකක් එතනට යවන්න යවලා ඉවරවෙලා මේ ස්ථානය පරීක්ෂා කිරීමකට ලක්කරන්න. විශේෂ කාර්ය බලකායේ සහාය ලබාගන්න කියලා.

ප්‍ර එතකොට අට්ටාලච්චේනේ මේ කට්ටියක් පදිංචිවෙලා ඉන්නවා කියලා දැනගන්න හම්බවුනේ. එතකොට ඇයි ඔබ අක්කරෙයිපත්තුවට කීවේ ඒ කියන්නේ අක්කරෙයිපත්තුව පොලිස් වසමටද අට්ටලාච්චේනෙයි එන්නේ.

FAIR COMMENT BY JEZEEM

උ කොටසක් අක්කෙරෙයිපත්තුවට අයිති වෙනවා. කොටසක් සමන්තුරේට අයිතිවෙනවා. අක්කෙරෙයිපත්තුව ස්ථානාධිපති වශයෙන් සීඅයි බණ්ඩාර කියලා විශේෂ කාර්ය බලකායේ වැඩකළ දක්ෂ නිලධාරියෙක් මාත් එක්කත් විමර්ශන කිහිපයකට සහභාගිවුනා. මට විශ්වාසයක් තිබුණා ඒ නිලධාරි මහත්මයා මේක හොදට handle කරයි කියලා.

ප ඒ අනුව ඔබ කීවා විශේෂ කාර්ය බලකාය ඔවුන්ගේ සහාය අරගෙන එතනට යන්න කියලා?

උ ඔව්. ඊට පස්සේ මට සි.අයි. හේරත් දුරකථනයෙන් දැනුම් දුන්නා එතන ගෙදර වහලා තියෙන්නේ. ගේ අපි search කළා. ගේ ඇතුලේ තිබිලා සෝනි වර්ගයේ 64 ජී.බී mammary card එකක්, 08 ජී.බී pendrive එකක්, external hard disk එකක්, යන දේපල හොයාගත්තා කියලා.

ප එතකොට ඒ වගේම කාගේ හරි උප්පැන්න සහතිකයක්, විවාහ සහතිකයක් එහෙමත් හොයාගන්නට පුලුවන් වෙලා තියෙනවාද? ඔය කණ්ඩායමට?

උ. මේවා ඊට පස්සේ ස්වාමීනි මේ පරික්ෂාකිරීමේදි සි.අයි. හේරත් දැනුම් දුන්නා ෂයිනිගේ උප්පැන්න හෝ විවාහ සහතිකය හෝ ඒ දෙකම මේක ඇතුලේ ෆෝල්ඩර් එහෙක තියෙනවා කියලා.

ප දැන් ඔබ ඔය ෂයිනි කිව්වහම ෂයිනිලා ගොඩක් ඉන්න පුලුවන්නේ . මොන ෂයිනිද ඔබ කියන්නේ?

උ. පාස්කු ප්‍රහාරයේ ප්‍රධාන සැකකරු වන සහරාන්ගේ සහෝදරයා.

ප එහෙනම් මම කිව්වොත් හරිද? මොහොමඩ් කාසිම් මොහොමඩ් ෂයිනි කියලා.

උ එහෙමයි ස්වාමීනි.

ප ඔහුගේ උප්පැන්න සහතිකය සහ ඔහුගේ විවාහ සහතිකය තමයි ඔබ කියන්නේ මේ කම්පියුටර් එක සෝදිසි කරනකොට එහි තිබිලා ලැබුණා කියලා.?

උ ඔව්. ඊට අමතරව සහරාන්ගේ දේශණ කිහිපයක් තිබුණා.

ප එතකොට කාගේද මේ කම්පියුටර් එක කියලා හොයාගන්න ලැබුණේ?

උ නැහැ කම්පියුටර් එකක් තිබුණේ නැහැ මැඩම්. ඒ ගෙදර තිබුණේ pendrive එකයි, mammary card එකයි, hard disk එකකුයි පමණයි.

ප ඒ කියන්නේ දෘඪ තැටිය කාගේද කියන එක අනාවරණය වුනාද?

උ නැහැ ඊට පස්සේ ඒ පහසුකම් අපි ළග නැති හින්දා අපි 05 වෙනි මාසේ 02 වෙනිදා ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයට මේ දේපල ටික බාරදීමක් කරනවා, කඩිනමින් විමර්ශනයක් කරලා අපව දැනුවත් කරන්න කියලා.

ප දැන් ඔබ කිව්වනේ මේ මොහොමඩ් කාසින් මොහොමඩ් ෂෙයිනිගේ උප්පැන්න සහතිකය ඒ වගේම විවාහ සහතිකය , ඒක මේකේ තිබුනා සහ සී.අයි. හේරත් ඇතුලු කණ්ඩායම ඒක හොයාගත්තා. ඔහු සහරාන්ගේ සහෝදරයෙක් කියලා?

FAIR COMMENT BY JEZEEM

උ ෂෙයිනි කියන එක්කෙනා.

ප ෂෙයින් කියන එක්කනා සහරාන්ගේ සහෝදරයෙක් කියලා ඒ කරුණු ඔබේ අවධානයට ආවම ඔබට මොකද හිතුනේ?

උ ඒ ප්‍රදේශයේ පුද්ගලයන්ට ඇතිවූ සැකයත්, මේ ස්ථානයේ නිවස කඩිනමින් අරගෙන යාමත්. හොයගත්ත දේපළත් අනුව මට සිතුණා මීට පෙර පාස්කු ප්‍රහාරයට සම්බන්ධ ප්‍රධාන සැකකරුවන්ගේ පවුලේ කට්ටිය අක්කරෙයිපත්තුව, සමන්තුරේ ආශ්‍රිත ප්‍රදේශයේ වල ගැවසෙනවා කියන එක.

ප ඒ අනුව ඔබ තව ඉදිරි පියවර ගත්තාද?

උ නැවත වරක් පල්ලිත් දැනුවත් කළා. ඊට අමතරව මාර්ග බාධක වැඩිකළා. චෙක්කරන්න. ඊට අමතරව පල්ලිවල ආරක්ෂාවට දාන පොලිස් නිලධාරින්ටත් කීවා නාඳුනන කිසිකෙනෙකුට සාමාන්‍යය පල්ලිවලට එන්න දෙන්න එපා කියලා. මොකද සාමාන්‍ය මතවාදය ස්වාමීනි, සාමාන්‍ය මුස්ලිම් ජාතික පල්ලියකට සහරාන් වගේ අන්තවාදී මත දරණ කට්ටිය යන්නේ නෑ. ඒ නිසා අපිට ඒ මුස්ලිම් ජනයා සෑහෙන උදව් කළා. විශේෂයෙන් පල්ලිවලින්. නාඳුනන කාටවත් ඒ දවස්වල පල්ලිවලට එන්න අවස්ථාවක් ඒ ගොල්ලෝ දුන්නෑ.

ප ඔබට 2019 අප්‍රේල් 26 වෙනිදා යම් තොරතුරක් ලැබුණද?

උ ලැබුණා ස්වාමීනි.

ප ඒ තොරතුර ලැබුණේ කාගෙන්ද කියන එක ඔබට සංවේදී කරුණක් නම් ඒක ලියලා දෙන්ට පුලුවන් කොළයක?

උ මට රාජ්‍ය බුද්ධි අංශයෙන් තමයි තොරතුර ලැබුණේ ස්වාමීනි,

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප ලබා දුන් නිළධාරියාගේ නම ලේඛණයක ලියා දෙන්න ?

සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්ණයට ලබා දුන් පිළිතුර ඔහු ලේඛණයක සටහන් කර කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. එය ලසුලේඛිකාවට ලබාදෙන අතර සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිලිතුරක් ලෙස සටහන් කරගන්නා ලෙස නියෝග කරමි. සාක්ෂිකරුට ප්‍රකාශ කර සිටින්නේ මින් පසුව ඔහුගේ සාක්ෂිය අතරතුරදී මෙම නිලධාරියාට ඔහු යම් සඳහන් කිරීමක් කරන්නේ නම් මුලින් කී රාජ්‍ය බුද්ධි අංශයේ නිලධාරියා වශයෙන් සඳහන්කරන ලෙසට දන්වයි.)

උ පොලිස් පරීක්ෂක හේරත් .
O.I.C SIS
අම්පාර

****

President's Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර මොකක්ද ඔබට ලැබුණ තොරතුර?

උ ඒ දිනවල වන විට මම මීට පෙර දැනුම් දුන් නිලධාරි මහත්මයා දෛනිකව කිහිපවතාවක් මට දුරකථනයෙන් කතා කරනවා. ඒ වගේමස්වාමීනි මගේ කාර්යාලයට පැමිණ තොරතුරු දැනුම් දෙනවා. මගේ මතක හැටියට දුරකථනයෙන් පළමුව කතාකරලා, සර් තොරතුරක් තියෙනවා හම්බවෙන්න පුලුවන්ද ඇහුවා. මම කීවා මම office එකේ ඉන්නේ එන්ට කියලා. ඊට පස්සේ office එකට ආසන්න වශයෙන් මී.100 ක පමණ දුරක තමයි මගේ කාර්යාලයත් , මම මීට පෙර දැනුම් දුන් නිලධාරියාගේ කාර්යාලයත් තියෙන්නේ. සර් පාස්කු ප්‍රහාරයේ පානදුර සහ මීගමුවේ ගෙවල්වල තිබිච්ච බඩු ගෙනාපු ආරංචිකරුවකු අපිට හමුවෙනවා. ඒ ආරංචිකරු දැන් මඟ එනවා. මීට පෙර දැනුම් දුන් නිලධාරි මහත්මයා දැනුම් දුන්නා. යම් තොරතුරු කාරයෙක් පැමිණෙනවා. ඒ තොරතුරු කාරයා ඒ නිලධාරි මහත්මයා හමුවුණාට පස්සේ ස්ථාන කිහිපයක් පරික්ෂාවට යාමට තියෙනවා. සාර්ථක භාවයක් තියෙන්න පුලුවන් හින්දා මට කීවා සර් මේකට නිලධාරි කණ්ඩායමක් තෝරලා තියාගන්න කියලා.

ප්‍ර දැන් ඔබ කීව්වානේ දැන් යම් ස්ථානවලින් ගේන බඩු වගයක් ගැන තමයි මේ තොරතුර ලැබුණේ කියලා. ඒ තොරතුර පොඩ්ඩක් පැහැදිලිව කියන්න?

උ ඒ දින වන විට අපිටත් තොරතුරු ලැබිලා තිබුණා. මාධ්‍යය මගිනුත් දැනගත්තා. සහරාන් ඇතුලු ඒ අන්තවාදී මරාගෙන මැරෙන කණ්ඩායමක් පානදුරේ ආරක්ෂක නිවාසයක් සහ මීගමුවේ ආරක්ෂක නිවාසයක නතරවෙලා ඉඳලා තියනවා. කියලා ඔවුන්ගේ අනිත් සමාජිකයන් එක්ක. ඒ නිසා ගෙවල් දෙකෙන් ගෙනාපු බඩු කියලා තමයි මම පෙර කී නිලධාරියා මාව දැනුවත් කළේ.

ප්‍ර. එතකොට ඔබ කීවා ඔබෙන් ඉල්ලීමක් කලා කියලා , කණ්ඩායම් සුදානම් කරලා තියාගන්න කියලා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එතකොට ඔබ කණ්ඩායමක් සුදානම් කරගත්තද?

උ පෙර කී නිලධාරියා මට දැනුම් දුන්නා මේ තොරතුර තියෙන්නේ බොහෝ වේලාවට කල්මුණ, සයින්දමරුදු, නින්දවූර් සමන්තුර ප්‍රදේශ ආශ්‍රිතව. ඒ කියන ඒ තැනැත්තටත් මීට පෙර ඇවිල්ලා නැහැ. නිශ්චිත දැනුමක් නැහැ. ඉස්සෙල්ලා ඒ තැනැත්තත් එක්ක ගිහිල්ලා මේ ප්‍රදේශය පරීක්ෂා කරලා බැලීමෙන් පස්සේ තමයි මේ තොරතුර සනාථ කරගන්න වෙන්නේ කියලා. ඒ අනුව මම පෙර කී නිලධාරියාට දැනුම්දුන්නා මේ ප්‍රදේශයට ගිහිල්ලා තොරතුරෙහි සාර්ථකභාවය බලලා මට ආපහු දුරකථන ඇමතුමක් දෙන්න කියලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට ඔබ අර සුදානම් කරගත්ත කණ්ඩායම, ඒක කොහොමද සුදානම් කරගත්තේ?

උ ඒ කණ්ඩායම මගේ සමීප අධික්ෂණය සිදු කළයුතු නිසාත්, මමත් කාලයක් අපරාධ පරීක්ෂණයේ සේවය කළ හින්දත්, මට අධීක්ෂණයට පහසු ස්ථානයකින් ගන්න ඕන නිසාත්, ඒ වගේම රටේ ඇතිවෙලා තිබුණ තත්වය අනුව, සමන්තුර , කල්මුණ සහ අක්කෙරෙයිපත්තු පොලිස් ස්ථානවල බහුතර මුස්ලිම් සහ ද්‍රවිඩ ජාතික නිලධාරීන් හිටියා. ඒ නිසා මම අම්පාර මූලස්ථානයෙන් මේ නිලධාරී කණ්ඩායම පත්කරන්න තීරණය කළා.

ප්‍ර ඒ කණ්ඩායමේ ප්‍රධානියා විදියට කවුද කටයුතු කළේ?

උ අම්පාර මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්ත දඩල්ලගේ. මේ සඳහා නම් කළා. ඔහු මාත් එක්කම එක කාලයේම සේවයට බැඳුන නිලධාරියෙක්. ඔහු මීට පෙරත් විමර්ශණ ගණනාවක් කරලා තියෙනවා. මීට පෙර අම්පාර ප්‍රදේශයේ 2018.02.26 වෙනි දින පල්ලියකට මුස්ලිම් කඩ දෙකකට ප්‍රහාර දීලා ඇතිවෙච්ච සිද්ධියෙත්, මාත් එක්කම විමර්ශණ කටයුතු කළ නිලධාරියෙක් හින්දා. ඊට අමතරව මේ නිළධාරියාත්, නැගෙනහිර පළාත් වසර ගණනාවක් සේවය කළ හින්දාත්, ඔහුට හොඳ අත්දැකීමක් තිබුණා. ප්‍රදේශයේ ජනතාවගේ හැසිරීම්, භූ විෂමතා ගැන.

ප්‍ර ඔබ මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කෙරුවා අර පෙර කී නිලධාරියා විසින් ඔබ වෙත දැනුම් දුන්නාය කියලා ඒ ලැබුණ තොරතුරපිළිබඳව සොයා බැලුවාට පස්සේ නැවත ඔබව අමතනු ලබන බව. මේ අදාළ ස්ථාන හඳුනාගත්තහම?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඒ අනුව ඔබව ඔහු විසින් අමතනු ලැබුවාද?

උ ඔව්. ඒ පෙරකී නිලධාරියා එදිනම දහවල් පැය 14.00ට ඒ කියන්නේ සවස 2.00ට විතර මට කතාකරලා පෙර කි නිලධාරියා කීවා සර් තැන් දෙකක් අපි identify කරගත්තා , team එක එවන්න කියලා.

ප්‍ර. ඔබ මොකද කළේ?

උ. මම ඒ වන විට ප්‍ර.පො.ප. ලසන්ත දඩල්ලගේට උපදෙස් දුන්නා නිළධාරීන් කණ්ඩායමක් ඒ සඳහා යැවීමට ක්‍රියා කරන්න කියලා. ඊට අමතරව මීට පෙර තිබුණ සිදුවිම්වල සංවේදීභාවයත් අනුව මම ඒ වෙලාවේ විශේෂ කාර්ය බලකායේ අතුල රත්නායක මහත්මයා දැනුවත් කළා. බෝම්බ නිෂ්ක්‍රිය කණ්ඩායමක් අපිට ලබාදෙන්න කියලා. ඒ වගේම ස්ථානයක් සෝදිසි කළයුතු නිසා නිළ සුනඛ කණ්ඩායමක් ඒ ස්ථානයට යවන්න මම අම්පාර මූලස්ථානයේ හිටපු නිල සුනඛ කණ්ඩායම දැනුවත් කළා. අම්පාර මූලස්ථාන පොලිසියේ සොකො නිලධාරීන් ලෑස්තිකරගත්තා. ඊට අමතරව ඇගිලි සටහන් නිලධාරීන් සහ කොට්ඨාශ ඡායාරූප ශිල්පින් ලෑස්ති කළා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට ඒ ස්ථානයට ඔවුන් ගිහිල්ලා තිබුණද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර කුමන ස්ථානයකටද? ප්‍රථමයෙන්ම ගිහිල්ලා තිබ්බේ?

උ මට ලසන්ත දඩල්ලගේ කෝල් එකක් දීලා කීවා සමන්තුරේ සෙන්නල් ග්‍රාමයේ තැනකට අපි ආවා. ගෙදර වහලා තියෙන්නේ කියලා. එතකොට මම දැනුවත් කළා මමත් දැන් එතනට එන ගමන් ඉන්නේ, ඒ වෙනකොට මට දැනුම් දුන්නා මේ ගෙදර කුලියට ගත්ත කට්ටියක් ඉන්නේ, ඒ කුලියට ගත්ත කෙනාට කෝල් එකක් දුන්නා එයා එනවා කීවා අපි එනකම් ඉන්නවා කියලා. නමුත් මම ඒ ස්ථානයට යනකොටත් ඒ කුලියට ගත්ත පුද්ගලයා ඒ ස්ථානයට ඇවිල්ලා සිටියේ නැහැ.

ප්‍ර ඒ අවස්ථාවේදී ඔබ යම් උපදෙසක් දුන්නාද?

උ ඔව්. මම දැනුවත් කළා දොර කඩලා පරීක්ෂාවට ලක්කරමු කියලා.

ප්‍ර ඔබ කීවා මේ ස්ථානය කුලියට ගන්නා ලද තැනැත්තාට දුරකථන ඇමතුමක් දීලා තිබුණා නමුත්, ඔබ ඒ ස්ථානයට යනකම්, මේ සෙන්ග්‍රල් ගම්මානයේ මේ ස්ථානයට යනතුරු ඔහු එතනට ඇවිල්ලා හිටියේ නැහැ කියලා.

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඉස්සරවෙලා කියන්ඩ ඔය නිශ්චිත ස්ථානය අංකයක් ඇතිනේ?

උ මේ ස්ථානය ස්වාමීනි, අම්පාර සමන්තුර ප්‍රධාන මාර්ගයෙන් ඇවිල්ලා, කාර්ගිල්ස් ආයතනය ඉස්සරහින් තියෙනවා සෙන්ග්‍රල් ග්‍රාමයට යන මාර්ගය ඒ ග්‍රාමයේ අංක 77/A, ෆවුස් මාවත තමයි ඒ නිවස පිහිටලා තියෙන්නේ. ප්‍රධාන මාර්ගයෙන් මීටර් 20ක් පමණ ඇතුලට වන්නට පිහිටි ස්ථානයක්. ඒ ස්ථානයේදී මා මීට පෙර කී නිලධාරියාත් , ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්තත් මට දැනුම් දුන්නා, නියාස් කියලා පුද්ගලයෙක් තමයි මේ ගෙය රෙන්ට් එකට අරන් තියෙන්නේ. එයාට කෝල් එකක් දුන්නහම එයා කිවා එන්නම් කියලා. නමුත් දැන් එයාගේ ෆෝන් එක වැඩකරන්නේ නැහැ කියලා.

ප්‍ර ඒ කියන්නේ ඔබ යවන ලද නිලධාරීන් විසින් මේ නියාස් කියන තැනැත්තා, ඒ කියන්නේ කුලියට මේ ස්ථානය අරගෙන තිබුණු එක්කෙනාට දුරකථන ඇමතුමක් දුන්නහම දීලා මෙතෙන්ට එන්නෙයි කියලා කිව්වහම ඔහු එන්නම් කියලා තිබුණට. නමුත් පසුව එම දුරකථනයට අමතන විට එය ක්‍රියා විරහිත කරලා තිබ්බා. ඒකද ඔබ කියන්නේ?

උ ඒ ස්ථානයට ගිහිල්ලා ස්වාමීනි, ඒ ස්ථානයේ ඒ ගෙදර හිමිකරුගේ දුව අබ්දුල් රහීම් ෆාතිමා ෂෙහාන්ස් ඒ තැනැත්තිය මාර්ගයෙන් තමයි දුරකථන ඇමතුම අපේ නිලධාරීන් දීලා තිබුණේ නියාස් කියන කෙනාට. නමුත් ඒ දුරකථන ඇමතුම අනුවත් ආවේ නැහැ. ඊට පසුව ගේ කඩන්න

FAIR COMMENT BY JEZEEM

කීවාට පස්සේ අපේ විශේෂ කාර්යා බලකායේ නිලධාරිනුත්, පොලිස් නිලධාරිනුත් එකතුවෙලා ප්‍රධාන දොරේ තිබ්බ ඉබ්බ කඩලා විවෘත කළා.

ප්‍ර දැන් ඔබ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න ඕන ඔය නියාස් කියන තැනැත්තා කුලියට අරගෙන තිබුණේ මේ ෆවුස් මාවතේ පිහිටි මේ නිවසේ මුලු නිවසමද? නැත්නම් නිවසේ කොටසක්ද? කියන එක.

උ ස්වාමීනි මේ ගෙදර අයිති ස්මයිල් ලෙබ්බේ අබ්දුල් රහීම් කියන තැනැත්තාට. ඒ ගෙදර එයාගේ බිරිඳගේ නම මොහොමඩ් තම්බි කජීදා උම්මා, එතකොට ඒ කජීදා උම්මා කියන එක්කෙනා ස්වාමීනි මේ නිවසට මදක් ඉදිරියෙන් වෙළඳසැලක් පවත්වාගෙන යන තැනැත්තියක්. මේ ස්වාමිපුරුෂයා බිරිඳ තමන්ගේ දියණියට තමා ගෙයක් හදලා තිබුණේ. ඒ ගේ කඩයට ආසන්නයේ. පාර පැත්තට වන්නට සාමාන්‍ය යෙන් වාහනයක් පාර්ක් කරන්න පුලුවන් විදියට ඉදිරියට ඉහළට සහ පහළට හැකිළිය හැකි දොරක් ආකාරයට තමයි, සාමාන්‍යයෙන් ගරාජයක් කීවොත් නිවැරදියි. රෝලර් ගේට් එකක් දාලා තිබුණා.

ප්‍ර ඒ කියන්නේ වාහන නවත්වන්න පුලුවන් ගරාජ් එකක්?

උ ඔව්. ගරාජ් එකක්.

ප්‍ර ඒ ගරාජ් එකයි, නිවසයි අතර සම්බන්ධතාවය කොහොමද ඇතිවෙන්නේ ඒ කියන්නේ නිවස ඇතුලේද මේ ගරාජ් එක තියෙන්නේ? නැත්නම් ඒ නිවසේ වෙනම කොටසක් හැටියටද ඒ ගරාජ් එක තියෙන්නේ?

උ නිවසින් පිට තියෙන්නේ. නමුත් ගරාජය ඇතුලින් නිවස පිහිටි ඉඩමට යන්න දොරක් තියෙනවා.

ප්‍ර ඔබත් එතනට ගියා නේද?

උ ගියා ස්වාමීනි.

ප්‍ර එතනට ගියාට පස්සේ ඔබ කීවා ඒ වනවිටත් නියාස් කියන තැනැත්තා ඇවිල්ලා හිටියේ නැහැ. ඔබට දැනගන්නට ලැබුණා කියලා. ඒ වනවිට ඔහුගේ දුරකථනය, නියාස්ගේ දුරකථනය ක්‍රියා විරහිත කරලා කියලා.?

උ එහෙමයි.

ප්‍ර ඒ අවස්ථාවේ ඔබ මොකක්ද දුන්න උපදෙස?

උ මම කීවා දොර කඩලා අපි ආරක්ෂාකාරීව බලමු මොනවද තියෙන්නේ කියලා.

ප්‍ර මොකේ දොර කඩන්නද කිවේ?

උ මීට පෙර ගරාජය වශයෙන් සඳහන්කළ ස්ථානයේ.

ප්‍ර ඒ කියන්නේ මේ ගරාජ් එක තමයි නියාස් විසින් කුලියට ලබාගෙන තිබුණේ?

උ ගේ තියෙන අනිත් ටික සියල්ල විශේෂ කාර්ය බලකායේ නිලධාරිනුත්, අපේ නිලධාරිනුත් පරීක්ෂා කළා. නිල සුනඛයෝ දාලා. නමුත් ඒවයි අපට සැකකටයුතු දේවල් තිබුණේ නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප ඔබට ඔබේ සටහන් පරීක්ෂා කරලා මේ ගරු කොමිෂන් සභාවට කියන්න පුලුවන්ද ඔය ෆවුස් මාවතේ සෙන්ග්‍රල් ග්‍රාමයේ මේ කියන නිවසේ assessment number එක හරියටම මොකක්ද කියලා?

උ 77 A.

ප statement එකේ තියෙනවා නම් 170 K කියලා ඒක හරිද?

උ නැහැ. මේ ස්ථානයේස්වාමීනි ළඟ ළඟ ගෙවල් කිහිපයක් තියෙනවා. සටහන් දාලා තියෙන්නේ 77 A කියලා.

ප ඔබ සටහන් බලලා කියන්නේ නිවැරදි අංකය වන්නේ 77 A කියලා?

උ නිවැරදියි ස්වාමීනි.

ප එතකොට මේ ගෙදර ලිපිනය වන්නේ 77 A, ෆවුස් මාවත, සෙන්නල් ග්‍රාමය. දැන් ඔබ කිව්වනේ උපදෙස් දුන්නය කියලා ඔය ගරාජයට දාලා තිබෙන ඉබ්බ කඩන්න?

උ එහෙමයි ස්වාමීනි

ප එක ඉබ්බෙක්ද දාලා තිබුණේ. ඊට වැඩි සංඛ්‍යාවක්ද?

උ මට නිවැරදි මතකයක් නැහැ. බොහෝ විට එක ඉබ්බෙක් දාලා තිබුණේ.

ප මොකක් හරි ලොක් කරලා තිබුණ එක ඉවත් කරන්න කියලා උපදෙස් දුන්නා?

උ ඔව්.

ප ඔබේ නිලධාරින් ඒ උපදෙස් ක්‍රියාත්මක කළාද?

උ ඔව්. විශේෂ කාර්ය බළකායේ නිලධාරින් අදාළ ගරාජයේ දොර විවෘත කිරීමට කටයුතු කළා.

ප එතකොට දොර විවෘත කරන අවස්ථාවේ ඔබ කොතනද සිටියේ?

උ මම ගෙදර හිමිකරුත් එක්ක එතන ඉස්සරහම කතා කර කර හිටියේ.

ප. ඒ ගරාජය ඉදිරියේ දැන් ඔබ ඉන්නවා?

උ. ඉන්නවා.

ප ඔතන හිටිය අනිත් නිලධාරින් කවුද?

උ මා පෙර කී බුද්ධි නිලධාරියා CI ලසන්ත දඩල්ලගේ. සොකෝ නිලධාරින්, නිල සුනඛ නිලධාරින්, කොට්ඨාශ ඡායාරූප ශිල්පින්.

ප එතකොට විශේෂ කාර්ය බලකාය?

උ විශේෂ කාර්ය බලකායේ සී .අයි. සිල්වා , බෝම්බ නිෂ්ක්‍රිය අංශයේ සි.අයි. සිල්වා ප්‍රමුඛ අනිකුත් නිලධාරින් සිටියා.

ප. ඔය අවස්ථාව වන විට ඔය ස්ථානයට යුධ හමුදාවෙන් ඇවිල්ලා හිටියාද?

උ නැහැ ස්වාමීනි.

ප දැන් ගරාජයේ දොර විවෘත කළහම ඔබ මොනවද දැක්කේ?

උ එහි ස්වාමීනි, කිසිම පිලිවෙලක් නැතිව අපිලිවෙලකට භාණ්ඩ ගොඩක් ගබඩා කරලා තිබුණා. කෑන් වගයක් තිබුණා. කාඩ්බෝඩ් පෙට්ටි කිහිපයක් තිබුණා. ප්ලාස්ටික් ට්‍රේ කිහිපයක් තිබුණා. ඒ වගේ බොහෝ භාණ්ඩ තිබුණා. ඊට පසුව අපි බෝම්බ නිෂ්ක්‍රිය අංශයේ විශේෂ කාර්ය

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

බලකායේ සී.අයි. සිල්වා ඇතුලට ගිහිල්ලා ඇතුලේ යම් තැනක තිබිලා කලුපාට රෙදි දෙකක් ගත්තා. රෙදි දෙක අරගෙන පෙන්නලා කිව්වා සර් මේ බලන්න කියලා. එතකොට ස්වාමීනි එකක් මීට පෙර සහරාන් ඇතුලු ඒ ත්‍රස්තවාදි කණ්ඩායම දිවුරුම් දෙන අවස්ථාවේ ඇඳ සිටි කලුපාට ඇඳුමක් වගේ එකක්. ඊට අමතරව අනික් එක තිබුණේ ඒ දිවුරුම් දෙන අවස්ථාවේ පිටුපස පසුබිම් තිරය වශයෙන් පාවිච්චි කළ තිරය. ඒ අවස්ථාවේදිම අපිට වැටහුනා මේ ඒ ප්‍රධාන සැකකරුවන්ගේ දේපල තමයි මේ ස්ථානයේ තියෙන්නේ කියලා. සී.අයි සිල්වා කිවා සර් මේ බඩු ටික අපිට එක පාර සර්ච් කරගන්න අමාරුයි. බොහෝම ප්‍රවේශමෙන් ගමු මොනවහරි මෙතන දෙයක් වෙන්න පුලුවන් කියලා. එතකොට මටත් සාධාරණ සැකයක් ආවා. මෙතන තියෙන්නේ මේ වගේ දේවල් කියලා. ඒ එක්කම මම ජෙනරාල් මහින්ද මුදලිගේට කතා කරලා කිව්වා.

ප්‍ර ඒ කියන්නේ ඔබ හිතුවාද පුපුරණ ද්‍රව්‍ය මෙතන තියෙනවා කියලා?

උ පුපුරණ ද්‍රව්‍යත් තියෙයි කියලා මට සැකයක් ඇතිවුනා. ඒ වගේම මෙවැනි අවස්ථාවල සමහර වෙලාවට ප්‍රදේශවාසින් විශාල වශයෙන් එක්රොක් වෙනවා. එතකොට අපිට පාලනයක් කරගැනීම අපහසුතාවයක් වෙනවා. ඒ හින්දා තමයි මොකද සාමාන්‍යයෙන් මගේ තියෙන අත්දැකීම්වලටත්, යුධ හමුදාවට ටිකක් බියක් දක්වනවා ඒ මුස්ලිම් ප්‍රදේශවල ජනයා. මම ජෙනරාල් මුදලිගේ සර්ට කතා කරලා කිව්වා සර් මෙහෙම සිදුවීමක් තියෙනවා. බඩු ටිකක් recoverවෙනවා පුලුවන් තරම් ඉක්මනට මෙතනට කණ්ඩායමක් එවන්න කියලා.

ප්‍ර ඒ අනුව යුධ හමුදාවෙන් කණ්ඩායමක් ආවාද?

උ ඒ අනුව යුධ හමුදාවෙන් ජෙනරාල් මුදලිගේ මහත්තයත් ආවා. ට්‍රක් එහෙක කණ්ඩායමක් ආවා.

ප්‍ර දැන් ඔබ කීවානේ යම් යම් භාණ්ඩ එතන අපිලිවෙලට දාලා තිබුණයි කියලා. ඒ ගරාජය ඇතුලේ.

උ ඔව්. ස්වාමීනි.

ප්‍ර ඒ තිබුණ භාණ්ඩවලින් ඔබ කීවා එකක් තමයි තිරයක් කියලා. ඒ තිරය ඔබ මීට පෙර දැකලා තිබුණ තිරයක්ද?

උ මීට පෙර ජනමාධ්‍යය මගින් ප්‍රචාරය කරලා තිබුනා සහරාන්ලා දිවුරුම් දෙන අවස්ථාවේ පසුබිම තිබුණ තිරය. ඒ හින්දා තමයි මම හඳුනාගත්තේ ඒ තිරය කියලා.

ප්‍ර ඔබ එතන තිබුණ දේවල් නිරීක්ෂණය කළහම ඔබට මොකක්ද වැටහුනේ?

උ ස්වාමිනි, බඩු බොහෝම ප්‍රවේශමෙන් ටිකින් ටික එලියට ගත්තේ. ගන්නකොට එතන නිල්පාට වෝටර් ජෙල් තිබුණා. සයිකල් බෝල තිබුණා. ප්ලාස්ටික් ට්‍රෙස් තිබුණා. ප්‍රථමාධාර කට්ටලයක් තිබුණා. සාමාන්‍යයෙන් බෙල්වලට පාවිච්චි කරන ප්‍රෙස් කරන්න පුලුවන් බට්ටින්

FAIR COMMENT BY JEZEEM

විශාල සංඛ්‍යාවක් තිබුණා. ඊට අමතරව කෑන් කිහිපයක් තිබුණා. ඊට පසුව පරික්ෂා කිරීමේදී ඒ ගේ ඇතුලේ තිබිලා අපි 119ක භාණ්ඩ ලැයිස්තුවක් ගත්තා. මේක තුල ජංගම දුරකථන 7 ක්, සිම් කාඩ්පත් 01ක්, ලැප්ටොප් පරිගණකයක්, එක්ස්ටනල් හාඩ් ඩිස්ක් එකක්, ඊට අමතරව භාවිතා නොකළ පෙන්ඩ්‍රයිව් 95ක්, වගේ බඩු තොගයක් හොයාගත්තා. ඒ භාණ්ඩ ටික ඒ අවස්ථාවේදි අපිට මුද්‍ර තැබීමට හැකියාවක් ලැබුණේ නැහැ. මොකද මෙතන බහුතරයක් දේපලස්වාමීනි, විශේෂ කාර්ය බලකායේ නිලධාරින් හරියට හඳුනා ගැනිමක් කරලා තිබුණේ නැහැ. දියරමය ඒ කියන්නේ කෑන්වල liquid වගේ තිබුණේ සමහර ඒවාගේ නමක්වත් සඳහන්වෙලා තිබුණේ නැහැ. ඒක හින්දා මම තීරණය කළා. මෙතන මුද්‍රා කිරීමක් කරන්න එපා. මොකද ගිණිගන්නා වගේ දෙයක් බොහෝ විට තියෙන්නෙ පුලුවන් හින්දා ආරක්ෂාකාරිව මෙතනින් ඉවත්කරගෙන ඒ දේවල් ටික අපි පසුව මුද්‍රා කිරීමක් කරමු කියලා.

ප්‍ර දැන් ඔය ස්ථානයේ තිබිලා සොයාගන්නා ලද ද්‍රව්‍ය අතර සී.සි.ටී.වී කැමරා තිබුණාද?

උ කැමරා 4ක් තිබුණා ස්වාමීනි.

ප්‍ර එතකොට ගෑස් මුහුණු තිබුණද?

උ ඔව්. පාවිච්චි නොකල ගෑස් මුහුණු 08ක් තිබුණා ස්වාමීනි.

ප්‍ර මොනවාද ඒ ගෑස් මුහුණු කියන්නේ? මොනාවටද පාවිච්චි කරන්නේ?

උ ස්වාමීනි ගෑස් මුහුණු සාමාන්‍ය යෙන් අපි නම් කැරලි මර්ධන අවස්ථාවලදි පාවිච්චි කරනවා. එහෙම නැත්නම් යුධමය අවස්ථාවකදි නම් යම්කිසි ගෑස් ප්‍රහාරයක් හරි වෙනත් ප්‍රහාරයක් එල්ල කිරිමේදි අපි සැඟවිමට හෝ අපි ආරක්ෂාවිමට යොදා ගන්න පුලුවන් විදියට තමයි අපි සාමාන්‍යයෙන් මේක පාවිච්චි කරන්නේ.

ප්‍ර ඒවාට ෆිල්ටර්ස් තියෙනවාද?

උ. ෆිල්ටර්සුත් තිබුනා.

ප්‍ර. ඒ ෆලිටර්ස්වලින් කරන්නේ මොකක්ද?

උ ආශ්වාස ප්‍රාශ්වාස කිරිමේදී ඒක පෙරිමක් තමයි එතනින් කෙරෙන්නේ.

ප්‍ර ෆිල්ටර්ස් කීයක් තිබ්බද?

උ 10 ක්

ප්‍ර එතකොට සැකසූ විදුලි පරිපථ තිබුණද?

උ වොට් 6 ගානේ දාලා විදුලි පරිපථ දෙකක් තිබුණා.

ප්‍ර. අර්ධව සැකසූ විදුලි පරිපථ තිබුණාද?

උ 11ක් තිබුණා

ප්‍ර සකස් නොකළ විදුලි පරිපථ පෙට්ටි තිබුණාද?

උ ඔව්. සකස් නොකළ පරිපථ පෙට්ටිත් තිබුණා. 11ක්.

ප්‍ර ඔය තිබුණ ද්‍රව්‍ය අතර අත්වැසුම් තිබුණාද?

FAIR COMMENT BY JEZEEM

උ අත්වැසුම් කිහිපයක් තිබුණා. කලු සහ කහ මිශ්‍ර අත්වැසුම් 11ක් තිබුණා.

ප්‍ර එතකොට ප්ලාස්ටික් ට්‍රේ තිබුණාද?

උ 19 ක් තිබුණාස්වාමීනි.

ප්‍ර යුරියා තිබුණාද?

උ යුරියා කිලෝ ග්‍රෑම් 50 මිටි 5ක් තිබුණා. පාවිච්චි කළ භාගේ මිටි 02ක් තිබුණා.

ප්‍ර මල් පොහොර තිබුණාද?

උ මල් පොහොර කිලෝ ග්‍රෑම් 5 මිටි 5ක් තිබුණා.

ප්‍ර නයිට්‍රේට් ඇසිඩ් කියලා සඳහන් කරපු දියර තිබුන බුලි තිබුණද?

උ ඉස්සරහින් නයිට්‍රේට් ඒ කියන්නේ ඉංග්‍රිසියෙන් සාමාන්‍ය ක්‍රමයට ඒක ලියලා තිබුනේ ඒකට භාවිතා කරන අකුරු වලින් ඒකෙන් තමයි අපි අදුනාගත්තේ ඇතුලේ නයිට්‍රේට්ද කියලා කියන්න බැහැ නමුත් ඒ බූලි වල ප්‍රදර්ශනය වෙලා තිබුනේස්වාමීනි නයිට්‍රේට් ඇසිට් කියන බුලි 4ක්.

ප්‍ර සල්පියුරික් ඇසිඩ් තියෙන බව සඳහන්වෙච්ච බුලි තිබුණද?

උ ඔව්. 11ක් HCSO 4 කියලා ගහලා බූලි.

ප්‍ර එතකොට ආවරන දියර සහිත සුදු කෑන් තිබුණාද?

උ සුදු පාට කෑන් 4 ක් තිබුණාස්වාමීනි, ඒකේ කිසිම නමක් සඳහන් වෙලා තිබුනේ 6නැහැ. අපිට ඒවා හඳුනා ගැනීමක් කිරීමටත් හැකියාවක් තිබුණේ නැහැ. මොනවාද මේකේ තියෙන ද්‍රාවණය කියලා.

ප්‍ර ඒ කියන්නේ ඒ අවස්ථාවේ ඔබට හඳුනාගන්න බැරිවුනා?

උ බැරිවුනා.

ප්‍ර නිකල් අත් ආධාරක තියෙන කල්දේරම් තිබුණාද?

උ කල්දේරම් 12ක් තිබුණාස්වාමීනි.

ප්‍ර ප්ලාස්ටික් බේසම් තිබුනාද?

උ ප්ලාස්ටික් බේසම් 09ක් තිබුණා.

ප්‍ර ප්ලාස්ටික් බැරල් තිබුණාද?

උ ප්ලාස්ටික් බැරල් 04ක් තිබුණා.

ප්‍ර රිජීෆෝම් පෙට්ටි තිබ්බාද?

උ රිජීෆෝම් පෙට්ටි 9ක් තිබුණා.

ප්‍ර ප්ලාස්ටික් බකට් තිබුණාද?

උ බකට් 2ක් තිබුණා.

ප්‍ර ටෙන්ට් රෙදි තිබ්බද?

උ ටෙන්ට් රෙදි 2ක් තිබ්බා.

ප්‍ර ඕවර් රෝල් කිට්ස් තිබ්බද ඒ කියන්නේ මුලු ශරීරයම වැහෙන විදියට අඳින ?

උ නිල්පාට ඕවර් රෝල් කිට් 2ක් තිබුණා.

ප්‍ර විවිධ ප්‍රමාණයේ විදුරු බඳුන් තිබ්බාද?

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ විවිධ ප්‍රමාණයේ විදුරු බඳුන් 9ක් තිබුණා.

ප්‍ර පුනීල හැඩයේ බීකර්ස් තිබ්බද?

උ බීකර්ස් 3ක් තිබුණා.

ප්‍ර ජංගම වීඩියෝ කැමරාවක් තිබ්බද?

උ. තිබුණා.

ප්‍ර මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් එකක් තිබ්බද?

උ එකක් තිබුණා ස්වාමීනි.

ප්‍ර ඒ කියන්නේ අනෙකුත් ද්‍රව්‍ය ඇතුලත ඔබ කීවා මේ ද්‍රව්‍යයත් තිබුණා කියලා. ඒ කියන්නේ සමස්ත ද්‍රව්‍යයන් සංඛ්‍යාව එතන තිබිලා ඔබලා සොයාගත්තේ ද්‍රව්‍ය 119 ක්?

උ 119 යිස්වාමීනි.

ප්‍ර එම ද්‍රව්‍යයන් කාගේ හරි භාරයට ගත්තද?

උ එම ද්‍රව්‍යයන් ස්වාමීනි, මම ප්‍ර.පො.ප. ලසන්තට දැනුම් දුන්නා සොකෝ නිලධාරින්ගේ භාරයේ මේක වෙන් කිරිමක් කරලා, මෙතැන්දි කිසිම මුද්‍රා තැබිමක් මුකුත් කරන්ට එපා මේ භාණ්ඩ අපි ගොඩක් හදුනාගත්තේ නැති හින්දා. පොලිස් ස්ථානයෙන් පිටත ක්‍රීඩාංගනයේ කෙළවරක ආරක්ෂාකාරිව භාණ්ඩ හදුනාගැනීමක් කරන තෙක් ගබඩා කරලා තබලා පසුව ලැයිස්තු ගතකරන්න කියලා.

ප්‍ර ඒ කියන්නේ යම් නිලධාරියකුගේ භාරයට පත්කරනු ලැබුවාද එසේ සොයාගන්නා ලද භාණ්ඩ. කාගේ භාරයටද පත්කලේ?

උ මම ඒක ලසන්තට දැනුම් දුන්නා. ලසන්ත ඊට පස්සේ සොකෝ නිලධාරිවරයාට තමයි දැනුම් දිලා තියෙන්නේ.

ප්‍ර එහෙමනම් ඔබට දැන් කියන්න පුලුවන්ද දැන් ඔය ස්ථානය අලලා ඡායාරූප ලබාගැනීමක් සිදුකළාද කියලා?

උ සොකෝ නිලධාරිනුත් ලබා ගැනීමක් කළාස්වාමීනි. ඊට අමතරව කොට්ඨාශ ඡායාරූප ශිල්පියත් ලබා ගැනීමක් කළා.

ප්‍ර එයින් සමහර ඡායාරූප ඔබට මේ අවස්ථාවේදී පෙන්වා සිටියොත් හදුනා ගැනීමට පුලුවන්ද?

උ පුලුවන්ස්වාමීනි.

(ස්වාමිනි ඡායාරූපයක් සාක්ෂිකරුගේ අවධානයට පෙන්නුම්කර සිටිනවා.)

ප්‍ර මේ තිරයෙහි දක්වන ඡායාරූපයෙහි පෙනෙන ස්ථානය ඔබට හදුනා ගන්නට පුලුවන්ද?

උ. පුලුවන්ස්වාමීනි. 2019.04.26 වෙනි දින සමන්තුර පොලිස් වසමේ සෙන්ග්‍රල් ග්‍රාමයේ අපි වැටලීම කළ නිවස තමයි ස්වාමීනි. මේ නිවසේ මෙන්න මේ ස්ථානය තමයි ස්වාමීනි අදාළ භාණ්ඩ ගබඩා කිරීමට උපයෝගි කර ගත්තේ.

ප්‍ර ඔබ කිව්ව ගරාජය එය ?

උ ඔව් ගරාජය.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ස්වාමීනි මේ අවස්ථාවේදි ගරු කොමිෂන් සභාවේ අවධානයට යොමු කරන්නට බලාපොරොත්තු වෙනවා. නැත්නම් කැමතියිස්වාමීනි, 2020 ජුලි මස 11 වෙනි දින මේ ගරු කොමිෂන් සභාව විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සඳහා මෙම ස්ථානයට යන ලද අවස්ථාවේදී අපිට දකින්නට තිබුණේස්වාමීනි අර එහා පැත්තේ යුධ හමුදා නිලධාරියෙක් ඉන්න ස්ථානයේ තිබෙන දොරක් තිබෙන්නේස්වාමීනි. ඒවාගේ ඒ පැහැයෙන් මේ ගරාජයේ දොර වසා තිබෙනවා ඒ වෙලාවේ. සාක්ෂිකරු පෙන්නුම් කලාස්වාමීනි. දැන් මේ ඡායාරූපයෙන් පේන්නේ ඒක විවෘත කරලා. එය තමයි අදාළ ගරාජය තිබෙන ස්ථානය කියලා. ඒ අනුව මම අවසර පතනවා මෙම ඡායාරූපය C.867 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන්නට .

ප්‍ර මිළඟට ඔබට සමීප දසුනක් පෙන්වනවා එම ස්ථානයේ. ඔබට විස්තර කරන්න පුලුවන්ද? මෙම අවස්ථාව ඡායාරූපයේ දක්වන?

උ ස්වාමීනි, මේ ඇතුලේ තිබුණ භාණ්ඩ සියල්ලම එළියට විශේෂ කාර්ය බලකාය ගත්ත අවස්ථාවේ ගත්ත ඡායාරූපයක්. මේ මම පෙර පැවසු ගරාජය. මේ තමයි අයිතිකරුගේ දුවට හදපු ගෙදර තියෙන්නේ මේ ඡායාරූපය තියෙන ස්ථානය අනුවස්වාමීනි. ඡායාරූපය ගන්න අවස්ථාවේ නම් මම හිතන්නේ මේ ස්ථානයේ අනික් විමර්ශන කටයුතු සඳහා පිටව ගිය අවස්ථාවේ මේක අරන් තියෙන්නේ.

ප්‍ර නමුත් ඔබ මෙම ස්ථානයෙන් පිටත්වන්නට පෙර එතන තිබුණ දේවල් දැක්ක කිව්වනේ?

උ ඒ භාණ්ඩ සියල්ලම තමයි මේ ආකාරයෙන් තියෙන්නේ.

ප්‍ර එතකොට එහෙමනම් කියනවාද pointer එක කියලා

උ ස්වාමීනි මේ තියෙන්නේ මා මීට පෙර පැවසු රිජිෆෝම් පෙට්ටි ටික. මේ තියෙන්නේ ප්ලාස්ටික් බුලිය. මේ තියෙන්නේ ප්ලාස්ටික් ට්‍රේ, මේ තියෙන්නේ ස්වාමීනි කල්දේරම් කියලා මා පැවසු දේ. නිකල් කල්දේරම් ටික. මේ තියෙන්නේ මීට පෙර බෙසම් කියලා මා හඳුන්වා දුන් දේ. මේ ටිකස්වාමීනි විවිධ ප්‍රමාණයේ සයිකල් බෝල.

ස්වාමීනි මෙම ඡායාරූපය C.868 වශයෙන් ලකුණුකොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

මිළඟට සාක්ෂිකරු විසින් විස්තර කරන්නට යෙදුනු මෙම ගරාජය ඇතුලේ තිබිලා එළියට ගන්නා ලද භාණ්ඩවල මීටත් වඩා සමීප දසුනක් සාක්ෂිකරුගේ අවධානයට යොමු කරන්නට අවසර පතනවා ස්වාමීනි.

ප්‍ර දැන් ඔබට මේ පේන ඡායාරූපයේ තියෙන දේවලුත් එහෙමනම් මා කිව්වොත් නිවැරදිද 2019.04.26 වෙනිදා ඔබලා සෙන්ග්‍රල් ග්‍රාමයට ගියපු අවස්ථාවේ ඒ නිවසේ ගරාජය තුළ තිබිල එළියට ගත්ත දේවල් කියලා. ?

FAIR COMMENT BY JEZEEM

උ නිවැරදියිස්වාමීනි. මෙතන සි.සි.ටි.වි කැමරා 4 තියෙනවා. මේ යකඩ බෝල ටික තියෙනවා. ටෙප්ස් වර්ග ටික තියෙනවා. ප්‍රොජෙක්ටර් එක තියෙනවා, ගෑස් සිලින්ඩර් මාස්ක් තියෙනවා.

ස්වාමීනි ගෑස් සිලින්ඩර් මාස්ක්, සීසිටීවි කැමරා, ඒ වගේම ප්‍රොජෙක්ටරය, ෆිල්ටර්ස්, අනෙකුත් භාණ්ඩ සමග ඒ සියල්ල අඩංගු වන මෙම ඡායාරූපය C.869 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර ඔබ කිවා ඔබේ සාක්ෂියේදී ජෙලට්නයිට් කූරු තිබුණා කියලා කීවානේ.

උ ස්වාමීනි මාගේ ලැයිස්තුවේ අංක 15 යටතේ ජෙලට්නයිට් කූරු 181 ක් එම ස්ථානයේ තිබිලා සොයාගැනිමක් කරනවා.

ස්වාමීනි ජෙලට්නයිට් කූරු පෙන්වන එම ඡායාරූපය C.870 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර ඡායාරූපයේ පෙනෙන ජෙලට්නයිට් කූරු ඔබ කිවා 181 ක් තියෙනවා කියලා? ඔය පොලිස් දෙපාර්තමේන්තුවේ ඔබ ලබලා තියෙන පුහුණුවත් එක්ක ඔබට කියන්න පුලුවන්ද ජෙලට්නයිට් කූරු සාමාන්‍යයෙන් භාවිතා කරන්නේ මොනවාටද කියලා?

උ පිපිරීම් කටයුතු සඳහා.

මෙතැන් පටන් සටහන් ගැනිම ල/ලේ ඉන්ද්‍රාණි .

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 2.30 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : එතකොට ඔබලා විමර්ශනය කෙරුවද ජෙලට්නයිට් කූරු 181 ක් මේ ආකාරයට ලබාගෙන තියෙන්නේ කොහොමද කියලා මේ ස්ථානයට?

පි : ස්වාමීනි ඉන්පසුව 04.26 වෙනිදායින් පසුව මේ ජෙලට්නයිට් අපි අවස්ථා කිහිපයකදී අපි අත් අඩංගුවට ගැනීම් කරනවා. මේ සියල්ල සම්බන්ධයෙන් අම්පාර පුපරණ ද්‍රව්‍ය පාලකවරයාගෙන් මම ලිඛිතව ඉල්ලීමක් කරනවා මේවායේ බාණ්ඩ අංකත් එක්ක කාගෙන්ද මේවා නිකුත් කරලා තියෙන්නේ කියලා වාර්තාවක් දෙන්න කියලා.

ප්‍ර : ඔබ සඳහන් කළානේ බාණ්ඩ අංක කියලා. මොකද්ද ඒ බාණ්ඩ අංක කියලා කියන්නේ?

පි : මේ කූරුවල තියෙනවා ස්වාමීනි ඉංග්‍රීසි අකුරක් සහිතව ඉලක්කම් හතරක් හෝ පහක අංකයක්. ඒකෙන් හොයා ගන්න පුළුවන් මේක කවද්ද ලංකාවට ආවේ, කාටද නිකුත් කළේ කියන එක. ඒ අනුව මේ බාණ්ඩ අංක ඉල්ලීමේදී එක් බාණ්ඩයක් සමන්තුරේ ප්‍රදේශයට නිකුත් වෙලා තිබුණා කියලා වාර්තාව ලැබුණා.

ප්‍ර : කවුද නිකුත් කරලා තියෙන්නේ?

පි : සමන්තුර ඒ පැත්තට ඉන්න වෙළඳ ව්‍යාපාරිකයා. හැබැයි ඒ මේ සිද්ධියට අදාළව ගත්ත ජෙලට්නයිට් නෙමෙයි. නමුත් මේ සිද්ධියට අදාළව ගත්ත ජෙලට්නයිට් කුරුණෑගල ප්‍රදේශයෙන් තමයි නිකුත් වෙන්නේ. අපිට ඒකේ තොරතුරු ගන්න කියලා කිව්වා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ පුපුරණ අංශ පාලකගෙන්. ඊට පසු විමර්ශනයේදී ඒ බාණ්ඩ අංක හඳුනාගෙන ඒ ගල් වලවල් හිමිකරුවන් හතර දෙනෙක් හෝ පස් දෙනෙක්ගේ ප්‍රකාශත් අපි සටහන් කළා.

ප්‍ර : ඔවුන්ගෙන්ද මේ ආකාරයට කුරුණෑගල ප්‍රදේශයෙන් ජෙලට්නයිට් ලබාගෙන තියෙන බවට අනාවරණය වුණේ?

පි : ඔවුනුත්, ඔවුන්ගේ ඒ විමර්ශනයේදී අනාවරණය වුණේ ස්වාමීනි මේකත් නිසි ක්‍රමවේදයකට සිද්ධවීමක් වෙන්නේ නැහැ කියන එක. මොකද ඔවුන්ගේ තියෙන ලේඛන අනුව යම් තැනැත්තෙකුට නිකුත් කළොත් ඒ සියල්ලම ඒ තැනැත්තා භාවිතා කළා කියලා හිතලා තමයි ඒගොල්ලෝ ලේඛන අපට ...,

Proofread Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ ඒවා අත ඉතිරියක් තියෙනවද කියන එක නැවත පරීක්ෂා කිරීමක් සිදු වන්නේ නැහැ කියන එක ඔබ කියන්නේ?

පි : අත ඉතිරියක් තියෙනවා කියලා නැවත පරීක්ෂා කිරීමෙන් වෙන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : නිකතුව ගැන පමණයි ඔවුන් ගණුදෙනු තබන්නේ. ලේඛනගත කරන්නේ?

පි : නිකුතුව ගැන පමණයි.

ප්‍ර : ඊළඟට ඔබ කිව්වා මේ ස්ථානයේ තිබිලා බැනර් එකක් ඔබලා දැක්කා. එය මීට පෙර රූපවාහිනියෙත් ඔබ විසින් දැක තිබෙන බැනර් එකක් කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එය නැවත දැක්කොත් හඳුනන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි.

(ස්වාමීනි ඡායාරූපයක් පෙන්වා සිටිනවා සාක්ෂිකරුට)

ප්‍ර : මේ ඡායාරූපය?

පි : මේ බැනරය තමයි ස්වාමීනි අපි එදින සෙන්ග්‍රල් ග්‍රාමයේදී අත් අඩංගුවට ගත්තේ. මීට පෙර මේ බැනර් එක මම දැකලා තිබුණේ සහරාන් ඇතුළු ඒ අන්තවාදී කණ්ඩායම දිවුරුම් දෙන අවස්ථාවේ ඔවුන්ගේ පිටුපස පසුබිම තිරය ලෙස තමයි මේක පාවිච්චි කරලා තිබුණේ.

(ස්වාමීනි එම බැනරය නිරූපනය කරන ඡායාරූපය C-871 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්නට අවසර පතනවා)

ප්‍ර : ඒ වගේම ඔබ කිව්වා මේ ස්ථානයේ ඇඳුමකුත් තිබුණයි කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ ඇඳුමේ ඡායාරූපයක් දැක්කොත් ඔබට නැවත හඳුනන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි. ඒක කළු පාට දිග ඇඳුමක්. බටින් වෙනුවට මෙහෙම කතිර වගේ දාලා තියෙන්නේ.

(ස්වාමීනි තවත් ඡායාරූපයක් පෙන්වා සිටීම සඳහා අවසර අයදිනවා සාක්ෂිකරුට)

පි : මා එය හඳුනා ගන්නවා ස්වාමීනි ඡායාරූපය මාත්, විමර්ශනයට සහභාගී වුණ නිලධාරීන් සියල්ලත් ඒකේ ඉන්න හින්දා.

ප්‍ර : ඔබ ඉන්නේ කොයි ස්ථානයේද?

පි : ස්වාමීනි මේ ඉන්නේ මම.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ ඉන්නේ ඒ ඇඳුමටම පිටිපස්සේ.

පි : පිටිපස්සේ ස්වාමීනි. මේ ප්‍රධාන පොලිස් පරීක්ෂක දඩල්ලගේ. මේ විශේෂ කාර්ය බලකායේ ප්‍රධාන පොලිස් පරීක්ෂක සිල්වා, ජෙනරල් මහින්ද මුදලිගේ, STF එකේ සහකාර පොලිස් අධිකාරී කේසර.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගනු ලැබූ ඡායාරූපය C-872 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා)

(ඒ වගේම මේ අවස්ථාවේ ඔබතුමන්ලාගේ ගරු කොමිෂන් සභාවේ මතකය අළුත් කිරීම සඳහා ස්වාමීනි දැනටමත් C-149 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කොට තිබෙන CD තැටියේ සහරාන් ඇතුළු පිරිස දිවුරුම ගන්න අවස්ථාව දක්වන එම වීඩියෝ පටය පෙන්වීම සඳහාත් අවසර අයැද සිටිනවා)

(ස්වාමීනි ඔවුන් ඇඳලා තිබෙන ඇඳුම් කෙරෙහි ඔබතුමන්ලාගේ ගරු අවධානය යොමු කරනවා. ඒ ඇඳුම්වලත් C-872 ඇඳුමේ තිබුණ එම මෝස්තරයමයි තිබෙන්නේ. ඒ වගේම C-871 හි දක්වන ලද මේ සාක්ෂිකරුවන් විසින් සොයා ගන්නා ලද බැනරය පසුබිමේ තිබෙන බවත් ගරු අවධානය වෙත යොමු කරනවා)

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු එම ඇඳුම් ගත්තහම ඒ ඇඳුම් භාවිතා කරලාද කියලා සොයා බැලීමට යැව්වද?

පි : ස්වාමීනි එම අවස්ථාවෙම SOCO නිලධාරීන්ට කිව්වා ඒකේ සාම්පල්ස් තියෙනවා නම් ගන්න කියලා. ඉන් අනතුරුව ස්වාමීනි සාම්පල් තිබුණද කියන එක ගැන මට හරිහැටි වැටහීමක් නැහැ. මොකද SOCO නිලධාරීන් තමයි ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු කළේ.

ප්‍ර : මට දැන ගන්න අවශ්‍ය පාවිච්චි කරපු ඇඳුම්ද නැත්නම් අළුත් ඇඳුම්ද කියලා. ඒක සොයා බැලීමක් කළේ නැහැ?

පි : නැහැ. එහෙම ස්වාමීනි මොකද මේක බොහොම කෙටි කාලයකට ඇදපු ඇඳුමක් හින්දා අපිට කියන්න හැකියාවක් තිබුණේ නැහැ මේක අවස්ථා කිහිපයක් භාවිතා කළාද අළුත් එකක්ද කියන එක.

ප්‍ර : පරීක්ෂණ කටයුතුවලට ඒක කරන්න පුළුවන් නේද?

පි : පුළුවන් ස්වාමීනි.

****

FAIR COMMENT BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : කෙසේ වුවත් ස්වාමීනි ඔබතුමාන් විසින් අසන ලද ඒ ප්‍රශ්නයට මා ගෞරවයෙන් අවධානය යොමු කරන්නට කැමතියි යම් කුමන්ත්‍රණයක කොටස්කරුවන් වෙනවා නම් මේ ස්ථානයට සම්බන්ධ අය එහෙමනම් අපිට බලන්නට පුළුවන් මේ අතර සමානත්වයක්. සහරාන් ඇතුළු කණ්ඩායම විසින් දිවුරුම් ගන්න අවස්ථාවේදී ඇඳ සිටින ඇඳුමත්, මේ ස්ථානයේදී සොයා ගන්නා ලද ඇඳුමත්, සහරාන් ඇතුළු පුද්ගලයින් පුපුරණ ද්‍රව්‍ය පාවිච්චි කරලා පිපිරීම සිදු කිරීම පිළිබඳවත්, ඒ වගේම මේ ස්ථානයෙන් සොයා ගන්නා ලද පුපුරණ ද්‍රව්‍ය සහ ඊට අදාළ විදුලි පරිපථ, පාවිච්චි කරන්නට අවශ්‍ය අනෙක් ආනුශාංගික උපකරණ තිබුණ බවත් ස්වාමීනි ඒවා අදාළ සහ අනුකූල කරුණු වෙනවා.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ඒ ප්‍රශ්නය ඇසුවේ මේවා අළුත්, තවත් පහරදීමකට අළුතෙන් ලැහැස්ති වුණාද නැත්නම් පාවිච්චි කරපු ඒවා ගෙනාවද කියන ප්‍රශ්නය.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : දැන් ඔබ කිව්වනේ අයිතම 119 ක් මේ ස්ථානයේ තිබිලා සොයා ගත්තා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප : ඒවායේ ලැයිස්තුවක් ඔබට මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්නට පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් 2019 අප්‍රේල් මාසේ 26 වෙනිදා අංක 77ඒ, ෆවුස් මාවත පාර, සෙන්ගල් ග්‍රාමය, සමන්තුර ලිපිනයේ නිවස පරීක්ෂා කරලා ඔවුන්ගේ භාරයට ගන්නා ලද අයිතම 119 ලැයිස්තු කොට ඇති මෙම ලේඛනය C-873 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා)

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප : සාක්ෂිකරු ඔබ සොයා ගත් භාණ්ඩ මෙම ස්ථානයේ තිබී එම භාණ්ඩවල ස්වභාවය අනුව මෙම ද්‍රව්‍ය උපයෝගී කරගෙන කොපමණ විශාල විනාශයක් කරන්න පුළුවන් කියලා ඔබේ අත්දැකීම් අනුව කියන්න පුළුවන්ද?

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමීනි විශේෂ කීමට හැකියාවක් නැහැ. එහි තිබුණු ඇතැම් ද්‍රව්‍යවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන්, අපිට උසස් පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් යම් වැටහීමක් දෙන්න පුළුවන්. නමුත් මෙතන මේ සියල්ල එකතු කරලා ඒගොල්ලෝ හදන මිශ්‍රණයකින් තමයි මේක මේවා කරලා තියෙන්නේ. ඒ හින්දා අපිට ඊට පෙර මෙහෙම අත්දැකීමක් තිබුණේ නැහැ. නමුත් පාස්ක්‍ර ප්‍රහාරයට 2019.04.21 වෙනිදා ඒ සිදුවීම්වලට මේ ද්‍රව්‍ය සම්බන්ධ නම් විශාල ප්‍රමාණයේ හානියක් කරන්න හැකියාව තියෙනවා කියලා නිගමනය කරන්න පුළුවන්.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : මෙම ස්ථානයේ තිබිලා පොලීසිය භාරයට ගන්නා ලද මෙම අයිතමයන් ඔබ කිව්වා අම්පාර පොලීසිය භාරයට පත් කරනු ලැබුවාය කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ දන්නවද අදාළ භාණ්ඩ රජයේ රස පරීක්ෂක වෙත යවා තිබෙනවද කියලා?

පි : ස්වාමීනි මෙතන තිබුණු භාණ්ඩවලින් ඇතැම් දේපළ සමන්තුර අධිකරණය මගින් රජයේ රස පරීක්ෂක කාර්යාලය වෙත යැව්වා. මම අම්පාරේ සේවය කරන කාලය තුළමයි. නමුත් මම 07 වෙනි මාසේ 20 වෙනිදා මම ස්ථාන මාරුවීමක් ලබලා ගිය හින්දා මට ඊට පස්සේ තියෙන දේපළ ගැන නම් කීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ.

ප්‍ර : ඒ වගේම එහෙමනම් ඔබ දන්නේ නැතුව ඇති අදාළ රස පරීක්ෂක වාර්තාව මේ වනවිට ලැබිලා තියෙනවද කියන කරුණ පිළිබඳව නේද?

පි : එහෙම කියන්න ස්වාමීනි හැකියාවක් නැහැ. මේ විමර්ශන කටයුතුත් සියල්ල, ඉන් අනතුරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර මහතාගේ අත්සනින් මේක භාර ගැනීමක් කළා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ මේ විමර්ශන කටයුතු කරනවා කියලා.

ප්‍ර : මේ සමන්තුරේ නිවසේ තිබිලා මේ භාණ්ඩ සොයා ගැනීමට අදාළව යම් පුද්ගලයෙක් හෝ පුද්ගලයින්ව අත් අඩංගුවට ගැනීමක් සිදු වුණාද?

FAIR COMMENT BY JEZEEM

පි : මේ නිවසේ අයිතිකරුත්, නිවසේ අයිතිකරුගේ බිරිඳත්, ඒ වගේම ස්වාමීනි දුවත්, බෑණත් ඒ අවස්ථාවේ අපි අත් අඩංගුවට ගැනීමක් කළා.

ප්‍ර : සැක මත?

පි : ඔව්. සැකමත. මේ ත්‍රස්තවාදී කටයුතු සහ ඊට අනුබල දීම මත අත් අඩංගුවට ගැනීමක් කළා. ඔවුන්ගේ සියළු විස්තර මම ඉදිරිපත් කළ වාර්තාවෙම පහළින් සඳහන් කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඔවුන් කුමන චෝදනාවන් යටතේද සැක මත අත් අඩංගුවට ගනු ලැබුවේ?

පි : ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ තමයි පළමුව අත් අඩංගුවට ගැනීමක් කළේ. ඉන් අනතුරුව රඳවා ගැනීමේ නියෝග මත රඳවා ගැනීම් ලබා ගත්තා.

ප්‍ර : ඔබ දන්නවද මේ වනවිට ඔවුන් විෂයයෙහි නිකුත් කොට තිබූ රඳවා ගැනීමේ නියෝග අවලංගු කරලා තිබෙනවද කියලා?

පි : දන්නවා ස්වාමිනි. පසුගිය දවසෙත් ඒ තැනැත්තන් හමු වුණා. ඔබතුමන්ලත් සමඟ ඒ අවස්ථාවේ ඒ අත් අඩංගුවට ගත් තැනැත්තන් ටික ඒ කියන්නේ...,

ප්‍ර : ඒ කියන්නේ ඒගොල්ලන්ගේ .....?

පි : නිදහස් කරලා තිබුණා. ප්‍රමාණවත් සාක්ෂි නැහැ කියලා ගරු නීතිපතිතුමා විසින් ඔවුන් නිදහස් කිරීමක් කරලා තියෙනවා.

ජ්‍ර : හරි. ස්තූතියි. සමන්තුරේ නිවසෙන් සොයා ගන්නා ලද එම භාණ්ඩ ඔබ කිව්වනේ ඒ අයිතමයන් 119 ක් සොයා ගත්තා, ඒවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දුන්නා කියලා යම් අවස්ථාවකදී. ඒ භාර දුන්නේ කවදද කියලා කියන්න ඔබ දන්නවද?

පි : ස්ථිරයෙන් මට කියන්න බැහැ ස්වාමීනි. අවස්ථා කිහිපයකදී එක එක විදියට භාණ්ඩ භාර ගැනීමක් කළා.

ප්‍ර : ඔබ සමන්තුරේ මේ නිවසේ ඉන්න අවස්ථාවේදී විමර්ශන කටයුතු සිදු කරමින් ඔබට තවත් තොරතුරක් ලැබුණද?

පි : මේ දේපළ අදාළ ගරාජයෙන් එළියට ගන්න අවස්ථාවේ මම මීට පෙර කියන ලද නිලධාරියා කිව්වා සර් තවත් තැනක් අපි දැන් බලාගෙන ඉන්නේ. මම එතනට ගිහිල්ලා Call එකක් දෙන්නම්. සර් Team එකත් අරන් එතනටත් එන්න කියලා. ඒ අනුව ඒ පෙර කී නිලධාරියා ඒ නිලධාරියාගේ කණ්ඩායමත් එක්ක නින්දවුර්, පරණ තියටර් පාර ප්‍රදේශයට යනවා කියලා ගියා.

ප්‍ර : ඒ අනුව ඔබත් එහි ගියාද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඊට පස්සේ තමයි මට පෙර කී නිලධාරියා දැනුම් දුන්නේ කණ්ඩායමක් අරගෙන අදාළ නින්දවූර්, පරණ තියටර් පාර ළඟට එන්න කියලා. එතනදී ඒ පෙර කී නිලධාරියා හමුවීමක් කරන්නම් කියලා.

ප්‍ර : ඔබ කිව්වා සමන්තුරේ මේ අදාළ නිවස සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරන්නට යන අවස්ථාවේදී අම්පාර පොලිසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක මහතාව කණ්ඩායමක් විදියට ඔහු සහ ඔහුගේ කණ්ඩායම රැගෙන ගියා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට මේ නින්දවූර් යන අවස්ථාවේදී ඔබ ඊට සමාන සංවිධාන කටයුතු කෙරුවද?

පි : මම සමන්තුර ස්ථානයට පැමිණි අවස්ථාවේදීම කල්මුණ ප්‍රදේශය භාර පොලිස් අධිකාරී හේරත් මහතාටත්, ඒ වගේම එවකට මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක හිටියේ ජයනෙත්තිටත් දැනුම් දුන්නා නිලධාරී කණ්ඩායමක් සූදානම් කරගෙන කාර්තිව් හන්දියට එන්න කියලා.

ප්‍ර : ඔබ ගියාද කාර්තිව් හන්දියට?

පි : ඉන් අනතුරුව ස්වාමීනි මම කාර්තිව් හන්දියට ඒ අවස්ථාවේ මමත් මගේ නිල රථයේ ගියේ නිලධාරීන් දෙන්නෙකු පමණයි. ආරක්ෂාවක් අවශ්‍ය හින්දා එතන හිටපු CI දඩල්ලගේටත් කිව්වා එයත් එක්ක ආපු නිලධාරී කණ්ඩායමත් එක්ක මේ ස්ථානයටත් යමු කියලා.

ප්‍ර : ඒ අනුව මොකද කළේ?

පි : SOCO නිලධාරීන්ට අදාළ ස්ථානයේ දේපළ භාර දීලා CI දඩල්ලගේත්, මමත්, විශේෂ කාර්ය බලකායේ එක් නිලධාරියෙකුත් බෝම්බ නිශ්ක්‍රීය අංශයේ, ජෙනරල් මහින්ද මුදලිගේත්, විශේෂ කාර්ය බලකායේ සහකාර පොලිස් අධිකාරී කේසරත් කාර්තිව් හන්දියට ගිහිල්ලා එතනින් නින්දවුර් අදාළ ස්ථානයට ගමන් කළා.

ප්‍ර : ඔබ කියන ඔය අදාළ ස්ථානයේ ලිපිනය මොකද්ද?

පි : අංක 48 , දෙවනි හරස් විදිය, නින්දවූර් 7 ලිපිනය ස්වාමීනි. මේ ස්ථානයට කාර්තිව් අක්කරෙයිපත්තු ප්‍රධාන මාර්ගයෙන් ඇවිල්ලා පරණ තියටර් පාරේ මීටර් 500 ක් විතර ගියාට පස්සේ, මුහුදු දෙසට යන පාරක් තියෙනවා ඒකේ ගිහින් තමයි මේ නිවස හම්බ වෙන්නේ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ කිව්වනේ අර සමන්තුරේ ස්ථානයට යනකොට එතනට අදාළව ඡායාරූප ගැනීම සඳහාත් ඔබ කටයුතු සැළසුම් කරාය කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව SOCO නිලධාරීනුත්, ඒ වගේම ඔබේ කොට්ඨාශයේ නිලධාරිනුත් ඡායාරූප ලබා ගත්තා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට මේ නින්දවූර් යන අවස්ථාවේදී ඒ ආකාරයට ඡායාරූප ගන්නට ඔබ කටයුතු පිළියෙල කළාද?

පි : කොට්ඨාශයේ ඡායාරූප ශිල්පියෝ දෙන්නෙක් ඉන්නවා ස්වාමීනි. මගේ මතකයේ හැටියට මේ අවස්ථාවට දෙන්නම ගිහිල්ලා හිටියා. SOCO එකෙත් එක් නිලධාරියෙක් මේ ස්ථානයට අපිත් එක්ක ගියා. නිල සුනඛ නිලධාරීන් අපිට එතකොට එම අවස්ථාවේදීම කැඳවාගන්න හැකියාවක් ලැබුණේ නැහැ ස්වාමීනි. අර භූමිය හා අවට අපි එතකොට පරීක්ෂා කරමින් සිටියේ.

ප්‍ර : එතකොට නින්දවූර් ස්ථානයට ඔබ කියන්නේ ඡායාරූප ශිල්පීන් ගෙනිව්වයි කියලා?

පි : ගෙනිව්වා.

ප්‍ර : දැන් මේ ඔබලා ගිය නින්දවූර් අංක 48, දෙවන හරස් විදිය, නින්දවූර් 7 කියන ස්ථානයේ පිහිටීම කොයි වගේද? නිවස කොයි වගේ තැනකද තිබුණේ? ඊට ආසන්නයේ තව නිවෙස් තිබ්බද?

පි : ස්වාමීනි මේක අවට නිවාස බොහොමයක් පිහිටි ස්ථානයක්. එක ස්ථානයකින් තමයි ඇතුල්වීමට තිබුණේ. ඒ ඇතුල් වෙනකොටම වම් පැත්තෙන් ගෙවල් හිමිකරුවාගේ නිවස තිබුණා. දකුණු පසින් නිවසට ගේට්ටුවෙන් ඇතුල් වෙනකොට දකුණු පසින් තනි තට්ටුවේ දොරවල් විවෘත කරලා තිබුණ නිවසක් තිබුණා.

ප්‍ර : දැන් අර ඉස්සරලා ඡායාරූප ගත්තා වගේ එහෙනම් මේ ස්ථානයේත් ඡායාරූප ගන්නට ඇතිනේ?

පි : ගත්තා ස්වාමීනි.

ප්‍ර : ඔබට ඒ ඡායාරූපයක් දැක්කොත් හඳුනනන්න පුළුවන්ද?

(ස්වාමීනි සාක්ෂිකරුට ඡායාරූපයක් පෙන්වීම සඳහා අවසර අයදිනවා)

ප්‍ර : මේ ඡායාරූපය ඔබට හඳුනන්නට පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි.

ප්‍ර : කුමන ස්ථානයක් දක්වන ඡායාරූපයක් විදියටද ඔබ...?

පි : ස්වාමීනි මෙය 2019.04.26 වෙනි දින පෙර කී නිලධාරියා විසින් ලබාදෙන ලද තොරතුර අනුව මා ඇතුළු නිලධාරී කණ්ඩායම අංක

Personal Copy
FAIR COMMENT BY JEZEEM

48, පරණ තියටර් පාර, නින්දවූර් ලිපිනයේ ඒ ගෙදර මේ නිවසේ ස්වාමීනි ...,

ප්‍ර : එතකොට ඔබ කිව්වා ඒ ස්ථානයට පාරෙන් ඇවිල්ලා ඇතුල් වුණහම වම් අත පැත්තේ තියෙන්නේ අයිතිකාරයාගේ ගෙදර. දකුණු පැත්තේ තමයි මේ අදාළ නිවස තියෙන්නේ කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඡායාරූපයේ එහෙනම් ගෙවල් දෙකක් පේනවා නේද?

පි : පේනවා ස්වාමීනි.

ප්‍ර : වම් අත පැත්තේ තියෙන්නේ ඔබ කිව්ව මොන ගෙදරද?

පි : මේ සුදු පාට තීන්ත ආලේප කරලා තියෙන්නේ ස්වාමීනි අයිතිකරුගේ ගෙදර.

ප්‍ර : ඔව්. එතකොට දකුණු අත පැත්තේ?

පි : මේ කොළ පාට වගේ තීන්ත ආලේප කරලා තියෙන්නේ සැක කටයුතු දේපළ අපි සොයා ගත්ත ගෙදර.

(ස්වාමීනි මේ අවස්ථාවේදී ගෞරවයෙන් ගරු කොමිෂන් සභාවේ අවධානය වෙත යොමු කරන්නට කැමතියි 2020 ජූලි මාසේ 11 වෙනිදා මෙම ගරු කොමිෂන් සභාව විසින් ක්ෂේත්‍ර පරීක්ෂණයක් සඳහා මෙම ස්ථානයට ගිය අවස්ථාවේ ඒ අවස්ථාවේදීත් ස්වාමීනි මේ පිහිටීමෙම ගරු කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලද බව. ඒ අනුව මෙම ඡායාරූපය C-874 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)

ප්‍ර : දැන් ඔබලා සොයාගෙන ගිය ගෙදර එහෙමනම් ඔය ඔබ කියන විදියට දකුණු අත පැත්තේ තියෙන ගෙදර?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඉතිං ඒ නිවසට යන්නට පුළුවන්ද? ඇතුල් වෙන්න පුළුවන් වුණාද?

පි : ඔව්. මේ ගෙදර ස්වාමීනි ප්‍රධාන දොර තියෙන්නේ මේ ඡායාරූපයේ පෙනෙන පැත්තෙන් නෙමෙයි අනිත් පැත්තෙන්. නමුත් අපි ඒ අවස්ථාවේ, ස්වාමිනි මේ නිවසේ ප්‍රධාන දොරට ඇතුල් වීමට තියෙන්නේ මේ පැත්තෙන් නෙමෙයි. මේ ගෙවල් දෙකටම ඇතුල් වෙන්න තමයි ස්වාමීනි මේ මැදින් පාරක් තියෙන්නේ. නමුත් මේ ගෙදරට ඇතුල් වෙන්න ප්‍රධාන දොරටුව තියෙන්නේ පාර අනිත් පැත්තේ. නමුත් ඒ ගේට්ටුව...,

ප්‍ර : ඒ පැත්තෙත් පාරක් තියෙනවා?

පි : ඒ පැත්තෙත් පාරක් තියෙනවා.

ප්‍ර : ඒ පැත්තේ පාරට කියන්නේ මොකද්ද නම්?

පි : විශේෂ මතකයක් නැහැ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : හරි කමක් නැහැ. නමුත් ඔබ කියන්නේ එහෙනුත් මාර්ගයක් තියෙනවා?

පි : තියෙනවා.

ප්‍ර : ඒ වගේම ඔබලා ඇතුල් වුණෙත් මහා මාර්ගයකින්?

පි : අපි ඇතුල් වුණේ එතනින් තමයි ස්වාමීනි.

ප්‍ර : ඔබට මතකයි නේද 2020 ජූලි මාසේ 11 වෙනිදා මේ ගරු කොමිෂන් සභාවේ ගරු කොමසාරිස්වරුන්ලා ඔය ස්ථානය නරඹන්නට ගියා?

පි : මතකයි ස්වාමීනි.

ප්‍ර : ඒ අවස්ථාවේදී එතුමන්ලා ඔය ස්ථානයට ඇතුල් වනවිට ඔබ හිටියා නේද?

පි : හිටියා ස්වාමීනි.

ප්‍ර : ඔබට මතකද එතුමන්ලා ඇතුල් වුණේ ඔය නිවසට ඒ කියන්නේ දකුණු පැත්තේ පේන කොළ පැහැති සායමෙන් පාට කරලා තියෙන ඒ නිවසට ඇතුල් වුණේ කොයි පැත්තෙන්ද කියලා?

පි : ස්වාමීනි මම මීට පෙර දැනුම් දුන්නු මෙන්න මේ නිවසේ අනිත් පැත්තක තියෙන පාරෙන් තියෙන ගේට්ටුව සහිත එතනින් තමයි ඇතුල් වුණේ?

ප්‍ර : එතනින් තමයි ඇතුල් වුණේ. හොඳයි.

පි : මේ ස්ථානය ස්වාමිනි ඊට අමතරව අළු පැහැති ලියාපදිංචි නොකළ වාහනයක් තිබුණා.

(අපි මීළඟට ස්වාමිනි සමීප දසුනක් සාක්ෂිකරුගේ අවධානයට යොමු කරන්නට අවසර අයැද ඉන්නවා)

ප්‍ර : ඔබ කිව්වනේ මේ අළු පැහැති වාහනයක් ගැන?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඔය අපි නැවත පෙර ඡායාරූපයට යනවා. ඒ පෙර ඡායාරූපයේ අර දුරින් පේනවා නේද වාහනයක්?

පි : ඔව් ස්වාමීනි. එතන තියෙනවා වාහනයක්.

ප්‍ර : මේක මොකද්ද?

පි : මේක තමයි ස්වාමීනි අළු පැහැති ඇවරි වර්ගයේ කුඩා වෑන් රථයක්.

ප්‍ර : කුඩා වෑන් රථයක්?

පි : ඔව්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඊළඟට අපි පෙන්වන ඡායාරූපය ඒ ස්ථානයේ තියෙන එම වාහනයේ සමීප දසුනක්ද කියලා මේ ගරු කොමිෂන් සභාවට කියන්න?

පි : ඔව් ස්වාමීනි. සමීප දසුනක්.

(ස්වාමීනි එම ඡායාරූපය C-875 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : වාහනයේ අංකය?

පි : ස්වාමීනි මෙහි අංකයක් තිබුනේ නැහැ. G.N. Autosoan කියලා තිබුණේ. ඉන් අනතුරුව මේ සම්බන්ධයෙන් අපි විමර්ශන කටයුතු කළා ස්වාමීනි. අක්කරපත්තුව ප්‍රදේශයෙන් තමයි නියාස් කියලා පුද්ගලයෙක් පළමුව මේක මුදල් දීලා අරගෙන තිබුණේ.

ප්‍ර : ලියාපදිංචි නොකළ වාහනයක්ද?

පි : ලියාපදිංචි නොකළ වාහනයක් ස්වාමීනි

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : එතකොට එහෙමනම් ඔබගේ විමර්ශනවලදී හෙළි වුණාද ඔය වාහනය මේ ගෙවල් අයිතිකාරයින්ට අයිති එකක් නෙමෙයි කියලා?

පි : හෙළි වුණා ස්වාමීනි.

ප්‍ර : එහෙමනම් මේ වාහනය ඔබ කිව්වා පරීක්ෂණවලදී හෙළි වුණා කියලා නියාස් කියලා කෙනෙක් තමයි මිලදී අරගෙන තියෙන්නේ කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : අර සමන්තුරේ නිවසේ ගරාජය කුලියට අරගෙන තිබුණු පුද්ගලයා ගැන ඔබ කිව්වනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔහුගේ නමත් ඔබ කිව්වේ නියාස් කියලා නේද?

පි : ඔව්. ඒ පුද්ගලයාගේ නමත් නියාස් ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ නියාසුයි, මේ වාහනය මිලදී අරගෙන තියෙන නියාසුයි එක්කෙනෙක්ද, දෙන්නෙක්ද කියන එක ඔබේ විමර්ශනයේදී අනාවරණය වුණාද?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : පසුව කළ විමර්ශනවලදී ස්වාමීනි අනාවරණය වුණා. එකම පුද්ගලයා තමයි මේ අවස්ථා දෙකේම ඉන්නේ කියලා.

ප්‍ර : හරි. තව මොනවද මේ වාහනය ගැන දැන ගන්න ලැබුණේ. ඒක මොන වර්ගයේ වාහනයක්ද? කවදාද මිලදීගෙන තියෙන්නේ ඒ කරුණු අනාවරණය වුණාද?

පි : ස්වාමීනි මේ සඳහා මම වෙනම නිලධාරී කණ්ඩායමක් යොදවාගෙන විමර්ශනය කළේ. නිශාන් වර්ගයේ වාහනයක්. NV100 Clipper කියලා තියෙන්නේ. මේකේ පිටි පස්සේ ෂීට් එකක් තිබුණා වැඩි ඒ කියන්නේ හුඟක් භාවිතා කරපු වාහනයක් නෙමෙයි අළුත් තත්ත්වයේ. ඊට පස්සේ අපි වෙනම විමර්ශන කණ්ඩායමයක් දාලා ඉවර වෙලා මේ වාහනය මිලදී ගැනීමට අදාළ පුද්ගලයා සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමක් කළා. එහිදී ඒ නිලධාරීන්ට අනාවරණය වුණා ඒ නිලධාරීන්ගේ වැඩිදුර විමර්ශනයේදී දැනුවත් වුණේ නියාස් කියන පුද්ගලයා ඇවිල්ලා අදාළ ස්ථානයෙන් මේ වාහනය මිලදීගෙන තියෙනවා. ඒ අවස්ථාවේ ලියාපදිංචිය සඳහා ඔහුගේ ඡායාරූපයක් අවශ්‍ය බවත් ඒ කඩ හිමියා දැනුවත් කරලා තියෙනවා. ඒ අවස්ථාවේ ...,

ප්‍ර : කවුද ඒ කඩ හිමියාගේ නම කියන එක ඔබට කියන්න පුළුවන්ද?

පි : ස්වාමීනි මේ වාහනය වැසි අංකය DR/17V/800383. එන්ජින් No. එක RO6A/1685045

(ගරු කොමිෂන් සභාවේ අවධානය ස්වාමීනි මේ සමීප දසුනේ තියෙන එම අංක කෙරෙහි යොමු කරනවා. ඒ ඡායාරූපය දැනටමත් C-875 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කොට තිබෙනවා)

(තවදුරටත් ගරු කොමිෂන් සභාවට ආධාරවීම සඳහා එහි සමීප ඡායාරූපයක් ලකුණු කර ඉදිරිපත් කරන්නට අවසර පතනවා C-875(a) අක්ෂරයෙන්)

පි : ස්වාමීනි මෙම G.N. Autosoan ආයතනය අක්කරෙයිපත්තුව, ප්‍රධාන වීදියේ පිහිටා ඇති ස්ථානයක් ස්වාමීනි. මෙම G.N. Autosoan අක්කරපත්තු ප්‍රධාන වීදියේ පිහිටා ඇති ස්ථානයක් ස්වාමීනි. මෙහි අයිතිකරු අහමදු ලෙබ්බේ සතාර්. අහමදු ලෙබ්බේ සතාර් කියන පුද්ගලයාට තමයි ස්වාමීනි මේකේ අයිතිය තියෙන්නේ. මේ තැනැත්තා ස්වාමීනි නියාස් යන අය මේ වාහනය මිලදී ගැනීමට පැමිණ පළවෙනි අවස්ථාවේ විසි හත් ලක්ෂ විසි පන් දාහකට තමයි මේක ඉල්ලලා තියෙන්නේ. නමුත් විසි හය දාහකට මේක ගැනීමට හැකියාවක් තියෙයිද කියලා අහලා තමයි අඩු කිරීමක් කරලා අරගෙන තියෙන්නේ. ඉන් අනතුරුව ...,

****

FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

ප : කවද්ද.....

පි : ඉස්සෙල්ලාම වාහනය බලන්න ඇවිල්ලා තියෙන්නේ ස්වාමීනි 04.17 වෙනි දින තමයි ඇවිල්ලා තියෙන්නේ 2019.04.17 දින.

ප : වාහනය බලන්න ඇවිල්ලා තියෙන්නේ?

පි : වාහනය බලන්න ඇවිල්ලා තියෙන්නේ. ඊට පස්සේ එදාම හවස එයා ඇවිල්ලා ආපහු මේකේ ගාණ කථා කරලා ගිහිල්ලා මේක ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරලා තියෙනවා.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : ඒකේ වටිනාකම කීයද?

පි : වටිනාකම ...,

ප : ඔහු එකඟ වෙලා තියෙනවද මුල් අවස්ථාවේදී ...?

පි : ලක්ෂ විසි පහකට ලියාපදිංචිය සමඟ දෙන්න එකඟ වෙලා තියෙනවා. ලියාපදිංචි ගාස්තුව තිස් දාහකුත්, පහලොස් දහසක් වෙන ගාස්තු සඳහාත් කියලා ලක්ෂ විසි හත් ලක්ෂයකට තමයි දෙන්න පොරොන්දු වෙලා තියෙන්නේ.

ප : ඔබේ විමර්ශනයේදී අනාවරණය වුණාද නියාස් කියන තැනැත්තා යම් උපදෙසක් දීලා තිබුණාද කියලා මෙම සාක්ෂිකරුට කාගේ නමින්ද ඔය වාහනය ලියාපදිංචි කරන්නට ඕනෑය කියලා?

පි : පළවෙනි අවස්ථාවේ නියාස් ඔහුගේ නමින් මෙම වාහනය ලියාපදිංචි කිරීමක් අවශ්‍යයි කියලා, කියලා තිබුණා. ඒ අවස්ථාවේ ඒ හැඳුනුම්පතත් මේ සඳහා ඡායාරූප අවශ්‍ය වෙනවා. මේ ස්ථානයේ ස්වාමීනි ඉදිරියේ තියෙනවා Studio එකක්. ඒ Studio එකට ගිහිල්ලා ඡායාරූප ගැනීමක් කරන්න කියලා තිබුණා. ඊට පස්සේ ලේඛන ටික සියල්ල සැකසීම් කරාට පස්සේ මේ ආයතනයේ හිමිකරු ඒ තමන්ගේ ඉස්සරහා තියෙන කඩයට ගිහිල්ලා නියාස් ගත්ත Photo එක බලලා තියෙනවා. ඒ Photo එක බලනකොට එයා ඒ අවස්ථාවේ ඇඳගෙන ආපු ඇඳුම්වලින් නෙමෙයි Photo එකට පෙනී ඉඳලා තියෙන්නේ. ඒ Photo එකට වෙනත් යුරෝපීය ඇඳුම් කට්ටලයක් Add කරලා තමයි Photo එකක් ගහලා ලියාපදිංචියට Studio එකට ලබා දීලා තියෙන්නේ. ඒ කියන්නේ තමන්ගේ මුහුණ. නමුත් ඇඳුම් කට්ටලය වෙන විදියක් කියලා. ඊට පස්සේ ස්වාමීනි 18 වෙනි දින නියාස් Call කරලා කියලා තියෙනවා මේක මගේ නමට Register කරන්න එපා. මගේ මස්සිනා ඉන්නවා. මේක මගේ මස්සිනාගේ නමට

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Register කරන්න 19 වෙනිදා ලියකියවිලි ගෙනත් දෙන්නම් කියලා.

ප්‍ර : මස්සිනාගේ නම අනාවරණය වුණාද?

පි : නැහැ ස්වාමීනි. මෙයා දැනුම් දීලා තිබුණේ මෙයා රට යනවා. ඒ නිසා මස්සිනා එයි. මස්සිනාගේ නමට ලියාපදිංචිය කරලා දෙන්න කියලා.

ප්‍ර : සහ ඒ තොරතුරු ඔහුට සපයන බවටත් නියාස් කිව්වා කියලා ඔබ කිව්වා?

පි : නියාස් කිව්වා.

ප්‍ර : හොඳයි. එතකොට දැන් ඔය ඔතන ඔය ස්ථානයට යාමේ නින්දවූර් පිහිටි මේ නිවසට යාමේ ඔබේ පරමාර්ථය වුණේ ඒ නිවස පරීක්ෂා කරන්නටනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඉතිං ඔය නිවස පරීක්ෂා කළාද? ඒක වහලද තිබ්බේ? ඇරලද තිබ්බේ?

පි : පිටිපස්සේ දොර අරලා තිබුණේ ස්වාමීනි. දොර ළඟට ගිහිල්ලා ඇතුළට යනකොට ඇතුළේ තියෙන දේවල් නිරීක්ෂණය වුණා ස්වාමීනි.

ප්‍ර : මොනවද ඔබ නිරීක්ෂණය කළේ?

පි : අධි ශීතකරණයක්, වොෂින් මැෂින් එකක්, ඊට අමතරව ඇඳුම් බෑග් කිහිපයක්, තව මීට පෙර ගෙර තිබුණා වගේ කිසිම පිළිවෙලක් නැතුව ප්ලාස්ටික් ට්‍රේ සහ වෙනත් භාණ්ඩ ගොඩක් ප්‍රධාන සාලය තුළත්, වම්පස කාමරයේත්, සාලය තුළ තියෙන වම් පස සහ දකුණු පස කාමර දෙක තුළත් ඒ දේපළ තිබුණා.

ප්‍ර : ඔව්. වෙනත් බඩු කියලා කිව්වහම ඔබට කියන්නට පුළුවන්ද ඔය නින්දවූර් නිවසේ තිබිලා කිලෝ 12.5 ක ධාරිතාවයෙන් යුත් ගෑස් සිලින්ඩරයක් සොයා ගත්තද කියලා?

පි : ස්වාමීනි එම අවස්ථාවේ අපිට ඇතුළට යාමට හැකියාවක් ලැබුණේ නැහැ.

ප්‍ර : ඔව්. කමක් නැහැ පස්සේ හොයා ගත්තද කියලා කියන්නකෝ?

පි : පසුව ඊට පස්සේ හොයා ගත්ත දේපළ අතර කිලෝ 12.5 ගෑස් සිලින්ඩර් එකක්, ඒ වගේම කිලෝ 4.5 ගෑස් සිලින්ඩර් එකක් වශයෙන් දෙකක් හදුනා ගන්නවා.

ප්‍ර : බයිසිකල් බෝල ඔතන තිබිලා හොයාගෙන තිබුණද?

පි : බයිසිකල් බෝල ස්වාමීනි විවිධ ප්‍රමාණයේ බයිසිකල් බෝල විශාල ප්‍රමාණයක් එතන තිබුණා.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ගාණ කියමු අපි කමක් නැහැ?

පි : 23,880 ක්.

ප්‍ර : ලැප්ටොප් පරිගණකයක් තිබ්බද?

පි : ඔව්. HP වර්ගයේ ලැප්ටොප් පරිගණක එකක් තිබුණා ස්වාමීනි.

ප්‍ර : ජෙනරේටර් එකක් තිබ්බද?

පි : ඔව්. පෙල්කන් වර්ගයේ ජෙනරේටරයක් තිබ්බා ස්වාමීනි.

ප්‍ර : ඔතන තිබුණු අනෙකුත් දේවල් අතර ජංගම දුරකථන තිබුණද?

පි : ජංගම දුරකථන 07 ක් තිබුණා ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම දෘඩ තැටි තිබුණද? External Hard Disk?

පි : Hard Disk 04 ක් තිබුණා ස්වාමීනි.

ප්‍ර : Suicide Kits සඳහා සවි කරන ස්විච් තිබුණද?

පි : එතන ස්වාමීනි Suicide Kits සඳහා භාවිතා කරන එකෙන් අදහස් කරලා තියෙන්නේ අර Press කරහම Bell එක වදිනවා වගේ ස්විච් තමයි එතනින් ඒක අදහස් කරලා තියෙන්නේ. ඒ හින්දා තමයි මේ Suicide Kits සඳහා කියලා ඒ වචනය යොදලා තියෙන්නේ.

ප්‍ර : ඒවා කීයක් තිබ්බද?

පි : ඒවා 09 ක් තිබ්බා ස්වාමීනි.

ප්‍ර : ඔබ කිව්වනේ සමන්තුරෙත් අර Bell වගේ දේවල් තිබුණා කියලා. Bell කිහිපයක් තිබුණා කියලා?

පි : ඔව්. ඒ එකම වර්ගයේ ඒවා.

ප්‍ර : ස්විච් සකසන පෙට්ටි තිබුණද?

පි : ඔව්.

ප්‍ර : කීයක්ද?

පි : ස්වාමීනි යම් ස්විච් සැකසීමේදී ඒ ඇතුළට දාන පෙට්ටි තියෙනවා ප්ලාස්ටික්. ඒ වගේ පෙට්ටි තිබුණා ස්වාමීනි.

ප්‍ර : 18 ක්?

පි : 18 ක්.

ප්‍ර : ස්විච් තිබ්බද?

පි : ස්විච් 06 තිබ්බා ස්වාමීනි.

ප්‍ර : Head Cover තිබුණද?

පි : Head Cover 03 ක් තිබුණා.

ප්‍ර : මොනවටද Head Cover පාවිච්චි කරන්නේ?

පි : මට ඒකනම් හරියට මතකයක් නැහැ ස්වාමීනි. Head Cover කියලා එතන ස්වාමීනි ඒ වචනයෙන් අදහස් කරන්නේ මම

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

හිතන්නේ අර මුහුණු ආවරණ කියන එක තමයි මට මතක හැටියට.

ප්‍ර : ලංකාවේ වගේම විදේශවලත් පාවිච්චි කරන සිම් තිබ්බද?

පි : මොබිටෙල් එක සිම් එකකුත්, වෙනත් රටවල් සිම් 04 කුත් තිබුණා ස්වාමීනි.

ප්‍ර : රම්බෝ පිහි තිබ්බද?

පි : තිබුණා ස්වාමීනි.

ප්‍ර : ඇස් ආවරණ තිබ්බද?

පි : ඇස් ආවරණත් තිබ්බා ස්වාමීනි.

ප්‍ර : ඇස් ආවරණ මොකටද පාවිච්චි කරන්නේ?

පි : ස්වාමීනි ඒක අර ගුවන් යානාවල යනකොට ආලෝකය වැටෙනකොට පාවිච්චි කරන දෙයක් වෙන්න පුළුවන්. නැත්නම් මෙතන ඉතිං රසායනික ද්‍රව්‍ය අනුව යම් යම් දේවල් සැකසීමේදී ඇස් ආවරණය සඳහා යොදා ගන්න දෙයකුත් වෙන්න පුළුවන්.

ප්‍ර : කටුව සමඟ සිලින්ජර් තිබුණද?

පි : තිබුණා ස්වාමීනි.

ප්‍ර : ප්ලාස්ටික් හතරැස් ට්‍රේ තිබ්බද?

පි : රතු පාට ප්ලාස්ටික් හතරැස් ට්‍රේ 02 ක් තිබ්බා ස්වාමීනි.

ප්‍ර : Grassing Industries Limited chemical Bleaching Powder කියලා සඳහන් වුණු යම් ද්‍රව්‍යයක් තිබ්බද?

පි : කිලෝ ග්‍රෑම් 10 ක් පමණ අඩංගු පොලිතින් බෑග් එකක් තිබුණා ස්වාමීනි.

ප්‍ර : මොකක්ද ඒ?

පි : ඒක ස්වාමීනි අපිට හඳුනා ගැනීමට හැකියාවක් ලැබුණේ නැහැ ඒ දවස් වෙනකොටත්. අපි ඒ භාණ්ඩත් පසුව රජයේ රස පරීක්ෂකවරයාට යොමු කිරීමක් කළා ස්වාමීනි.

ප්‍ර : යූරියා පොහොර තිබ්බද?

පි : යූරියා කිලෝ 50 පොහොර බෑග් එකක් තිබුණා ස්වාමීනි.

ප්‍ර : නයිට්‍රික් ඇසිඩ් කෑන් එකක් තිබ්බද?

පි : කෑන් එකක් තිබුණා ස්වාමීනි.

ප්‍ර : මරාගෙන මැරෙන ඇඳුම් කට්ටල සඳහා නිපදවන ලද බයිසිකල් බෝල අඩංගු ලේයර්ස් තිබ්බද?

පි : ඔව් ස්වාමීනි. මෙතන තිබුණා විෂ්කම්භය අඩියක පමණ, අඟල් 6 යි සාමාන්‍යයෙන් ඒ කියන්නේ ඒකේ එක පැත්තක තිබුණේ සයිකල් බෝල. අනිත් පැත්තේ නිකම් ගම් වගේ දෙයක් දාලා සැකසීමක් කරලා තිබුණේ. සාමාන්‍යයෙන් ඒක අපේ ඇඟකට

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වුණත් තියලා ඒ හැඩයට, මේක ස්වාමීනි වෙනත් රටක නිෂ්පාදනයක් කියලා බැලූ බැල්මට පේන්නේ නැහැ. මේක සාමාන්‍යයෙන් මෙරට නිෂ්පාදනයක් කියලා තමයි තියෙන්නේ. මේ ස්ථානයේ තිබුණු ට්‍රේ එහෙක තිබුණා මේ වගේ සයිකල් බෝල කිහිපයක් ගැවිලා. ඉතිං ට්‍රේ එකක් තුළට සයිකල් බෝල ක්‍රමවත්ව අතුරලා යම් ගම් සහ වෙනත් ද්‍රව්‍යයක් ඊට උඩින් දාලා සැකසීමක් තමයි කරලා තිබුණේ. මොකද ඒ Plate දැක්ක ගමන් පැහැදිලි වුණා මේක විදේශික හදපු එකක් නෙමෙයි. මේක මේ තැනැත්තන් විසින් ඒ කියන්නේ හදන දෙයක් කියන එක.

(ස්වාමීනි එම ඡායාරූපය C-876 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා)

ප්‍ර : නොයෙකුත් වර්ගයේ බයිසිකල් බෝල තිබ්බද?

පි : පෙර කියපු ප්‍රමාණයට අමතරව ස්වාමීනි තව 6940 ක් තිබිලා අපි හොයා ගත්තා එතන.

ප්‍ර : යූරියා සහ ඇසිඩ් සමඟ කලවම් කරපු පොහොර තිබ්බද?

පි : ඔව්. පොහොර කිලෝ ග්‍රෑම් 04 ක් තිබ්බා.

ප්‍ර : ඔබ කිව්වා අධි ශීතකරණයකුත් තිබ්බා කියලා නේද?

පි : අධි ශීතකරණයක් තිබ්බා.

ප්‍ර : දැන් ඔබ සඳහන් කරපු ඔය දේවල්වලට අමතරව තවත් භාණ්ඩ ඔතන තිබුණද?

පි : සියළු දේපළ 91 ක්.

ප්‍ර : 91 ක් තිබ්බා. එහි ලැයිස්තුවක් ඔබට ඉදිරිපත් කරන්න පුළුවන්ද ගරු කොමිෂන් සභාවට?

පි : පුළුවන් ස්වාමීනි.

(ස්වාමීනි එම ලැයිස්තුව C-877 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා)

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු විදේශීය සිම්පත් කොහේ සිම්පත්ද?

පි : ස්වාමීනි මේ සියල්ල ඊට පස්සේ අපි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අපි භාර දුන්නා. ඊට පස්සේ අපට ඒ තොරතුරු පැමිණියේ නැහැ ස්වාමීනි.

ප්‍ර : ඒ සිම්පත්වල නම් සටහන් වුණාද ඒ ...?

පි : ඒ ගැන ස්වාමීනි මට ස්ථිරවම පවසන්න අමාරුයි.

****

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

එකක විතරක් IMEI Number එකක් තියෙනවා සර්.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ඔබ විදේශීය සිම්පත් කියලා නිගමනය කළේ කොහොමද?

පි : ස්වාමීනි සාමාන්‍යයෙන් අපි පාවිච්චි කළොත් ලංකාවේ Dialog හරි Hutch, Etisalat, Mobitel ඒවායේ Colours සහ ඒ වගේ තියෙන බාහිර ලක්ෂණවලින් අපි හඳුනා ගන්නවා මේවා අපේ රටේ භාවිතා කරන ඒවා කියලා. නමුත් එහෙම ස්ථිර ලක්ෂණ මොකුත් තිබුණේ නැති නිසා තමයි විමර්ශන නිලධාරීන් හඳුනා ගැනීමක් කළේ මේවා ලංකාවේ ඒවා නෙමෙයි කියලා.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඔබගේ කණ්ඩායම මේ නිවස ඇතුළට යන්නට පෙර බෝම්බ නිශ්ක්‍රීය අංශය නිලධාරීන් කැඳවනු ලැබුවද?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඔවුන් මේ ස්ථානය පරීක්ෂා කළාට පස්සෙද නිලධාරීන් ඇතුළට ගියේ?

පි : ස්වාමීනි මේ ස්ථානයෙන් ඇතුල් වෙනකොටම අපිට මේ ස්ථානයේ යම් ප්‍රහාරාත්මක ද්‍රව්‍ය සහ පුපුරණ ද්‍රව්‍ය තියෙනවයි කියලා හැඟීමක් ආවා. ඒ වනවිටම ආපහු CI සිල්වාට කථා කරලා කිව්වා මෙතනටත් Team එකක් එවන්න කියලා. ඒ වෙනකොට අපිත් එක්කත් විශේෂ කාර්ය බලකායේ එක සාජන්ට් කෙනෙක් ගිහිල්ලා හිටියා. එයා කිව්වා සර් Team එකක් එනකම් ඉන්න කියලා. ඒ ඉන්න කියන අතරතුරේ තමයි ස්වාමීනි මට කල්මුණෙන් තොරතුරක් එන්නේ පොලිස් නිලධාරියෙකුට වෙඩි තියලා කියලා. ඒ නිසා මටත්, ඒ ගිය මගේ අනිත් නිලධාරී කණ්ඩායමටත් එතනින් ඇතුළට ඒ ගේ පරීක්ෂා කරන්න යන්න බැරි වෙනවා. අපි වෙනත් නිලධාරී කණ්ඩායමක් එතන ආරක්ෂාවට යොදවලා සිද්ධිය වෙච්ච කල්මුණේ දක්වා ඊට පස්සේ ගමන් කරනවා.

ප්‍ර : එතකොට ඔබ කිව්වනේ අර නිවස බැලුවහම ඒක ඇතුළේ බඩු අපිළිවෙලට දාලා තිබුණයි කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔය නිවසේ කවුරු හරි හිටපු බවක්, නිවස පාවිච්චි කරපු බවට යම් සළකුණු එහෙම දකින්න තිබ්බද? ඔබේ නිරීක්ෂණයට භාජනය වුණාද?

පි : බාහිරින් බලනකොට ස්වාමීනි ඒ භාණ්ඩ අතරේ බිම පැළුරු කිහිපයක් එලලා තිබුණා. ඒ පැළුරු පොඩ්ඩක් ඇකිලිලා වගේ තිබුණා. සාමාන්‍යයෙන් ඒ ප්‍රදේශවල ස්වාමීනි මුස්ලිම් ජනයා ගොඩක් වෙලාවට බිම හෙම තමයි නිදා ගැනීම සහ වාඩි වෙලා කථා කිරීම කරන්නේ. ඒ වගේ ස්වරූපයක් තිබ්බා. ඒ කියන්නේ කණ්ඩායමක් එතන ඉඳලා, පිටවෙලා ගිහිල්ලා තියෙන ස්වරූපයක් දැක්කා. ඊට අමතරව ස්වාමීනි අපි එතනින් ඇතුල් වෙනකොටම තිබුණේ කෑම උයපු හට්ටි ටිකක් දැක්කා. කෑම කාලාත් තිබුණේ නැති ස්වරූපයක් තමයි තිබුණේ.

ප්‍ර : නමුත් ඔබ කිව්වා ඔබලා යන අවස්ථාවේ මේ නිවසේ කවුරුත් හිටියේ නැහැ කියලා?

පි : කවුරුත් හිටියේ නැහැ ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔය නිවස ඇතුළේ තිබුණ තවත් ඒ භාණ්ඩවලින් කොටසක් පෙන්නුම් කරන තවත් ඡායාරූප දැක්කොත් ඔබට හඳුනන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරුගේ අවධානයට ඡායාරූපයක් යොමු කොට තිබෙනවා)

ප්‍ර : මේ කුමන ස්ථානයක ඡායාරූපයක්ද?

පි : ඔය ස්වාමීනි සාලයේ.

ප්‍ර : ඔබ කිව්වනේ අර පැළුරු අතුරලා තිබුණයි කියලා?

පි : මේ යට තියෙන්නේ ස්වාමීනි රතු සහ කළු ඒ පැළුරු.

ප්‍ර : සහ කොට්ට කිහිපයකුත් එතන තියෙනවා නේද?

පි : කොට්ට තියෙනවා.

(ස්වාමීනි එම ඡායාරූපය C-878 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා)

ප්‍ර : ඒ වගේම ඔබ සඳහන් කෙරුවා මේ නිවසේ ගෑස් සිලින්ඩර් එහෙම දකින්නට ලැබුණයි කියලා නේද?

පි : එහෙමයි ස්වාමීනි. මේ තියෙන්නේ කිලෝ 12.5 ගෑස් සිලින්ඩරය ස්වාමීනි. මේ තියෙන්නේ ඊට වඩා කුඩා එක ස්වාමීනි. පෙර සඳහන් කළ ජෙනරේටරය මෙතන තියෙනවා ස්වාමීනි. මේ බෙසම් හැටියට සඳහන් කළේ ස්වාමීනි. මෙතන පරිගණකය තියෙනවා ස්වාමීනි. මේ ටේප් පටි සියල්ල තියෙනවා ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබේ ලැයිස්තුවේ සඳහන් වෙනවා ඒ භාණ්ඩ නේද?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

(ස්වාමීනි එම ඡායාරූපය C-879 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා)

ප්‍ර : ඔබ කිව්වනේ ජෙනරේටරයකුත් ඔතන තිබුණයි කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එහි ඡායාරූපයක් නැවත දැක්කොත් හඳුනන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි. මේ ජෙනරේටරය තමයි අර පෙර කියූ පැඳුර මත තමයි ඒක තියෙන්නේ ස්වාමීනි.

(ස්වාමීනි එම ඡායාරූපය C-880 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා)

ප්‍ර : ඔබේ අවධානයට මේ Back packs වගයක් තියෙන ඡායාරූපයක් යොමු කරලා සිටිනවා. මේ කොහේදීද ඒ ඡායාරූපය ගත්තේ? 84 ඉඳලා 88 වෙනකම්?

පි : ස්වාමීනි I Phone නිල් පැහැති බෑග් එකක්. ඊට අමතරව ස්වාමීනි I Phone කොළ පැහැති බෑග් එකක්. Under Arm බෑග් එකක්.

ප්‍ර : මොකද්ද Under Arm කියන්නේ? ඒ සන්නාමයද?

පි : ඒ ගැන ස්වාමීනි මට හරියට කියන්න අමාරුයි. මොකද මේක ඉදිරිපත් කරන නිලධාරීන්ගෙන් තමයි එම වචනය.

ප්‍ර : හරි. ඊළඟට?

පි : ස්විස් ගිය නිල් පාට බෑග් එකක්. ඒක අනිවාර්යයෙන්ම මෙතන ලකුණින්ම ඒක පේනවා. ඊට පස්සේ කුංචුවා කළු පැහැති බෑග් එකක්. ඒක මේක. ස්වාමීනි Under Arm බෑග් එකක් කියලා මට දැන් මතකයට එන්නේ අතට යටින් දාන පැත්තට දාන බෑග් එකක් කියලා තමයි ඒක බොහෝ වෙලාවට මෙන්න මෙහෙම බෑග් එක.

(ස්වාමීනි එම ඡායාරූපය C-881 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)

ප්‍ර : ඒ බෑග් ඇතුළේ මොනවත් තිබුණද?

පි : පරීක්ෂා කිරීමේදී බෑග් තුළ මොකුත් තිබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර : මෙම නින්දවූර් නිවස ඔබ කිව්වා ඒ අයිතිකරුවන් විසින් ලබා දීලා තිබුණයි කියලා ඒ නිවස අරගෙන තිබුණ අයට. කවුද මේක අරන් තියෙන්නේ?

පි : ස්වාමීනි පසුව කළ විමර්ශනවලින් අනාවරණය වුණේ ස්වාමීනි නියාස් කියන පුද්ගලයා තමයි මේක ගන්නත් ප්‍රධානත්වය අරන්

FAIR COMMENT BY JEZEEM

තියෙන්නේ. මම මීට පෙර සිදුවීම ගත්ත නිවසේ සහ වාහනය ගත්ත....,

ප්‍ර : සමන්තුරේ නිවස කුලියට අරන් තියෙන්නේ නියාස්, වාහනය අර Unregistered වාහනය අරන් තියෙන්නේ නියාස්, එතකොට මේ නිවසත් කුලියට අරන් තියෙන්නේ නියාස්?

පි : නියාස්. ඔව්. නියාස් මේ සඳහා ස්වාමීනි මුල් අවස්ථාවේ ජමාල් විථිර් රිෂාද් අලී කියන කෙනෙක්ට තමයි කියලා තියෙන්නේ ගෙයක් හොයලා දෙන්න කියලා. ඔහුගේ මඟපෙන්වීම යටතේ තමයි ස්වාමීනි මේ නිවස අරන් තියෙන්නේ. මේ නිවස අයිතිකරුගේ නම ස්වාමීනි පිව්වේයි මොහිදීන් ෆසාලීන්. එයාගේ පුතාගේ නම ෆසාලීන් මොහොමඩ් රියාස්. එතකොට පිව්වේයි මොහිදීන් ෆසාලීන්, ෆසාලීන් මොහිදීන් රියාස්, ජමාල්ඩීන් රිෂාද් අලී කියන තුන් දෙනත් අපි අත් අඩංගුවට ගැනීමක් කළා. මේ ත්‍රස්තවාදී ප්‍රහාර සහ ඊට අදාළ දේපළ සන්තකයේ ලබා ගැනීම සහ ඊට යම් ආධාර අනුබලයක් දීමේ කටයුතු සිදු කරලා තියෙනවද කියලා වැඩිදුර විමර්ශනය සඳහා.

ප්‍ර : ඔබ දන්නවද එම පුද්ගලයින් මේ වනවිට තවමත් අත් අඩංගුවේ ඉන්නවද නැත්නම් ඔවුන්ව මුදාහැරලා තියෙනවද කියලා.

පි : මුදාහැරලා තියෙන්නේ ස්වාමීනි.

එපමණයි ස්වාමීනි. ඊළඟට අපි එන්නේ සයින්දමරුදුවලට.

****

ගරු සභාපතිතුමා :

කොමිෂන් සභාවේ කටයුතු ප.ව. 4.00 තෙක් කල් තබනවා.

දැන් වේලාව : ප.ව. 3.25 යි.
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කෙටි විවේකයකින් පසුව කොමිෂන් සභාව නැවත රැස්වේ.

දැන් වේලාව ප.ව. 4.30

සටහන් කරන්නේ ධම්මිකා පෙරේරා විසින්ය.

<u>පෙර කැඳවූ සාක්ෂිකරු නැවත කැඳවා ප්‍රතිඥා දෙයි.</u>

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප : විජේසේකර මහත්මයා ඔබ කෙටි විවේකයට පෙර ගරු කොමිෂන් සභාවට සඳහන් කෙරුවා නින්දවුර් ආරක්ෂිත නිවස්නයේ තිබිලා ඔබලාගේ භාරයට ගන්නා ලද අයිතමයන් 91 ක් පිළිබඳව?

පි : එහෙමයි ස්වාමිණි.

ප : දැන් එම ද්‍රව්‍ය ඔබ දන්නවද අම්පාර පොලිසියට භාර දුන්නට පස්සේ යම් අවස්ථාවකදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට එහෙම භාර දුන්නද කියලා කියන්න?

පි : ඇතැම් දේපල මම රාජකාරී කරන කාලය තුළම භාරදීමක් කළා. ඉන්පසුව අනිත් දේපලත් වරින්වර අධිකරණයට භාර දීලා අධිකරණයෙන් තමයි ඊට පස්සේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ගත්තේ.

ප : අධිකරණයට හරහා තමයි ඒවා භාර දීලා තියෙන්නේ. ඔබ දන්නවද එම භාණ්ඩ රජයේ රස පරීක්ෂක වෙත යවා තිබෙනවද නැද්ද කියලා කියන්න?

පි : ඒ ගැන ස්වාමිණි මට කියන්න හැකියාවක් නැහැ.

ප : කමක් නැහැ, දැන් ඔබ නින්දවුර් ඉන්න අවස්ථාවේදී ඔබට තවත් ස්ථානයකට මේ 26 වන දිනම යන්නට සිදු වුණාද?

පි : එහෙමයි ස්වාමිණි.

ප : කොහොමද ඒක සිද්ධ වුණේ?

පි : ස්වාමිණි නින්දවුර් නිවස අපි ඒ ස්ථානයට ගිහිල්ලා මේ සිදුවීම සම්බන්ධයෙන් විමර්ශනය කරන අවස්ථාවේ එතන කල්මුණේ මූලස්ථාන පොලිස් පරීක්ෂක ජයනෙත්ති හිටියා, දුරකථනයකින් ජයනෙත්තිටත් කතා කරලා මටත් පොලිස් නිලධාරියෙක් කිව්වා සයින්දමර්දුවල රාලහාමි කෙනෙකුට වෙඩි තියලා කියලා. සයින්දමර්දු ප්‍රදේශයේදී රථ වාහන අංශයේ පොලිස් නිලධාරියෙකුට වෙඩි තැබීමක් වෙලා තියෙනවා කියලා.

ප : කියලා දැන ගන්න ලැබුණා. ඒ අවස්ථාවේදී ඔබ මොකද කළේ?

පි : ස්වාමිණි එතන ආරක්ෂාවට නිලධාරී කණ්ඩායමක් යොදවලා මමත්, ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්තත්, එතන හිටපු ජනරාල් මහින්ද මුදලිගේ මහත්තයාගේ කණ්ඩායමත් එක්ක සයින්දමර්දු ප්‍රදේශයට එන්න ආවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඒ එන අවස්ථාවේ සයින්දමර්දු ප්‍රදේශයේ තත්ත්වය පිළිබඳව ඔබ නිරීක්ෂණය කළාද?

පි : සයින්දමර්දු කියන්නේ කාර්තිව් හන්දිය පහුකරලා මීටර් 150 ක් 200 ක් යන කොට තියෙනවා මාළිගාකඩු - හන්දිය එතන තමයි ලොකු තොරණක් තියෙනවා ස්වාමීණි, එතනින් ඇතුලේ තමයි සාමාන්‍යයෙන් සයින්දමර්දු කියලා අදහස් කරන්නේ. ඒ හරියේ සාමාන්‍ය වෙලාවටත් මිනිස්සු නිතරම ගැවසෙනවා ඒ වෙලාවට. නමුත් එදින ඒ හිටපු මිනිස්සුන්ගේ ටිකක් කළබලකාරී ස්වරූපයක් තිබුණා.

ප්‍ර : ඔව් ඉතින් කියන්නකෝ?

පි : කළබලකාරී ස්වරූපයක් තිබුණා ස්වාමීණි. නමුත් එහෙම සයින්දමර්දු තියෙන ප්‍රධාන තොරණත් පහුකරලා ඉස්සරහාට යනකොට දකුණු පැත්තෙන් ෂෙඩ් එකක් තියෙනවා කල්මුණ පැත්තට යන කොට වම් පැත්තෙන් තියෙනවා වොලිවේරියන් ග්‍රාමයට යන්න තියෙන පාර. එතන රථ වාහන අංශයේ නිලධාරීන් දෙදෙනෙක් හිටියා. එතන හිටපු මං එවෙලේ නම දැන ගත්තේ නැහැ පස්සේ නම දැන ගත්ත පොලිස් කොස්තාපල් කෙනෙක් හිටියා වීරසිංහ කියලා. මම ඇහුවා වීරසිංහ මොකද වුණේ කියලා. වීරසිංහ කිව්වා එතකොට සර් අපි රථ වාහන රාජකාරී යෙදිලා හිටියා ප්‍රධාන මාර්ගයේ සිවිල් පුද්ගලයෙක් ඇවිල්ලා කිව්වා සැක කටයුතු කට්ටියක් ඉන්නවා ගෙයක් ඇතුලේ එතන check කරන්න යමු කියලා. ඊට පස්සේ වීරසිංහ නිලධාරියා ඒ ස්ථානයට යන කොට ඔහුට වෙඩි තැබීමක් සිද්ධ කළා කිව්වා. ඊට පස්සේ ආපහු ඒ නිලධාරියා ආරක්ෂාව සඳහා ආපසු අනිත් නිලධාරීන් ඉන්න තැනට ආවයි කිව්වා. ඒ එන අතරේ පිපිරීම් හඬකුත් ඇහුණා කිව්වා. ඒ අවස්ථාවේ ස්වාමීණි මමත්, ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්තත්, කල්මුණ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයත් ඒ මාර්ගයේ එතන රැඳිලා හිටියේ. අපි සතුව ඒවේලේ ප්‍රමාණවත් අවි ආයුධ තිබුණේ නැහැ, අපි එතන වොලිවේරියන් ග්‍රාමයට යන්න තියෙන පාළම පැත්තට යමු කියලා ඉස්සරහාට ගියා.

ප්‍ර : ඔබ හැබැයි කිව්වා නේද අර හමුදාවේ මුදලිගේ මහත්මයත් හිටියා කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔවුන් සතුව ආයුධ තිබුණේ නැද්ද?

පි : මුදලිගේ මහත්තයත් එක්ක ආපු කණ්ඩායමේ මහත්තයාගේ ආරක්ෂක නිලධාරීන් විතරයි හිටියේ. ඒ එන අතරතුරදී මුදලිගේ මහත්තයා අපිට වඩා පොඩ්ඩක් පරක්කුවීමක් වුණා ස්වාමීණි ජනයා ගැවසීම හින්දා අපිට මුදලිගේ මහත්තයා දැකීමට හම්බ

FAIR COMMENT BY JEZEEM

වුණේ නැහැ එතන මුල් අවස්ථාවේ. නමුත් ඊට පස්සේ සාමාන්‍යයෙන් පිපිරුම් හඬක් ආවා. පිපිරුම් හඬ එනකොට අපි වොලිවේරියන් ග්‍රාමයට ඇතුල් වෙන්න තියෙන යකඩ පාළමක් තියෙනවා. ඒ පාළමෙන් ඇතුලට යන්න සුදානම් වෙන කොට තමයි පිපිරුම් හඬක් ආවේ.

ප : ඔව් දැන් ඔබ සඳහන් කෙරුවා නින්දවුර් ඉන්න කොට ඔබට දැන ගන්නට ලැබුණයි කියලා පොලිස් නිලධාරියෙක් හරහා සයින්දමර්දු ප්‍රදේශයේ තවත් පොලිස් නිලධාරියෙක් වෙඩි ප්‍රහාරයකට ලක් වෙලා තියෙනවා කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප : ලක් වෙලා කියන්නේ ඔහුට.

පි : වෙඩි ප්‍රහාරයක් එල්ල වෙලා තියෙනවා කියලා.

ප : එල්ල වෙලා තියෙනවා කියලා දැන ගන්නට ලැබුණා?

පි : එහෙමයි ස්වාමිණි.

ප : එතකොට වෙලාව දළ වශයෙන් කීයට විතර ඇතිද?

පි : 6.40 ට, 45 ට වගේ.

ප : ඔබ එය දැන ගත්ත ක්ෂණයෙන්ම ඒ ස්ථානයෙන් පිටත් වුණාද?

පි : නින්දවුර් ඉදලා සයින්දමර්දුවලට පිටත් වුණා ස්වාමිණි.

ප : නින්දවුර් ඉඳලා සයින්දමර්දුවලට දළ වශයෙන් කොච්චර දුරක් තියෙනවද?

පි : කිලෝ මීටර් 4 ක්, 3 ක් 4 ක් වගේ ගානක් තියෙන්නේ.

ප : දැන් මේ වෙලාව වෙන කොට කළුවර වැටිලද?

පි : වැටිලා ස්වාමිණි.

ප : ඔබ සයින්දමර්දුවලට එන කොට දළ වශයෙන් වෙලාව මතකද?

පි : 19.10 ඒ කියන්නේ ස්වාමිණි 7.10 වගේ ඊ.

ප : රාත්‍රී 7.10 පමණ වෙනවා, දැන් ඔබ කිව්වානේ ඔබලා යම් ස්ථානයකට ඇවිල්ලා යකඩ පාළමක් ගාවට ආවා කියලා?

පි : ඔව් ස්වාමිණි.

ප : යකඩ පාළමයි ඔබලා මේ යන ස්ථානයයි අතර වැදගත්කම මොකක්ද?

පි : ඒ යකඩ පාළම හරහා තමයි ඒ වොලිවේරියන් ග්‍රාමයට ඇතුල් වෙන්න තියෙන්නේ.

ප : වොලිවේරියන් ග්‍රාමයට ඇතුළු වෙන්න තියෙන්නේ මේ යකඩ පාළම හරහා. එතකොට ඔය ස්ථානයේ ඔබ දන්නවද යම් අවස්ථාවක ඡායාරූප ගැනීමක් සිද්ධ වුණාද කියලා, ඔබ දැන් සමන්තුරේට ඡායාරූප ශිල්පීන් ගෙනිච්චා, නින්දවුර්වලට ගෙනිච්චා, එතකොට සමන්තුරේ මේ සිද්ධියට අදාලව එක්කෝ

Project at Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඔය සිද්ධිය සිදු වුණ දවසේ එහෙම නැත්නම් ඊට පස්සේ ඡායාරූප ගැනීමක් සිද්ධ වුණාද?

පි : ස්වාමිණි මට පැහැදිලි මදි, අප විසින් ගැනීමක්ද නැත්නම් වෙනත් කවුරු හරි විසින්...

ප්‍ර : ඔව් නිලධාරීන් විසින්?

පි : ස්වාමිණි මගේ නිළධාරීන් ඡායාරූප ගැනීමක් වෙනවා නම් අනිවාර්යයෙන් මම ගියාට පස්සේ තමයි ඒ ඡායාරූපය ගැනීම වෙන්නට ඕනේ.

ප්‍ර : දැන් අපි ඔබට පෙන්නුවොත් ඡායාරූපයක් ඔබ ඔය කියන යකඩ පාළම අප මේ ඡායාරූපයේ පෙන්වන යකඩ පාළමද කියලා කියන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමිණි.

(මේ අවස්ථාවේ ඡායාරූපයක් තිරයේ දිස්වීමට සලස්වයි)

ප්‍ර : මේ ඡායාරූපය යම් කරුණක් සඳහා පිළියෙල කරන ලද ඡායාරූපයක් නේද?

පි : එහෙමයි ස්වාමිණි. මේ ස්ථානය තමයි ස්වාමිණි

ප්‍ර : ඔබට මතකයක් තියෙනවද කොයි වෙලාවේද ඔය ඡායාරූපය පිළියෙල කරලා තියෙන්නේ කියලා, මේ සිද්ධියට අදාලවද ඒක පිළියෙල කරලා තියෙන්නේ?

පි : ස්වාමිණි මේක ඊට පසුව පිළියෙල කිරීමක් වෙන්න පුළුවන්.

ප්‍ර : ඔව් පසුව වෙන්න පුළුවන්. නමුත් මේ වොලිවේරියන් ග්‍රාමයේ සිදු වූ මේ සිද්ධියට අදාලවද පිළියෙල කරලා තියෙන්නේ?

පි : ඔව් ස්වාමිණි මොකද මෙතන මේ පල්ලිය මට හොඳට මතකයක් තියෙනවා.

ප්‍ර : ඒ කියන්නේ පල්ලිය කියලා කියන්නේ මුස්ලිම් පල්ලිය?

පි : මුස්ලිම් පල්ලියක් ස්වාමිණි තියෙන්නේ. ඊට අමතරව මෙතන මේ පාසැල් ගොඩනැගිල්ල. මේ මෙතන ක්‍රීඩාංගනය.

ප්‍ර : එතකොට ඔබ කියන යකඩ පාලම මෙතන තියෙනවා ගම්මානයට ප්‍රවිශ්ට වීමට ඇති යකඩ පාළම කියලා. ඒකද?

පි : ඔව් ස්වාමිණි මෙන්න මේ පාළම.

ප්‍ර : එතකොට ඊට පස්සේ දකුණු පැත්තට තියෙන ඊතලය මගින් පෙන්වනවා ත්‍රස්තවාදීන් රැදී සිටි නිවස දෙසට යාමට ඇති මාර්ගය කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒක පැහැදිලි කරන්න පුළුවන්ද ඔබට?

පි : ස්වාමිණි මෙතනින් ගියාම මේ පැති තුනටම මෙහෙම සාමාන්‍යයෙන් හතරමං හන්දියක් වගේ පේන්නේ. මේ කෙලින් ගියත් මේ ගෙවල් පේලිය පිටිපස්සෙන් පාසැල හරහා යන්න

FAIR COMMENT BY JEZEEM

හැකියාව තියෙනවා. මේ පැත්තෙන් ගියාම. සාමාන්‍යයෙන් නිවෙස්වලට යාමට මේ කෙලින් තියෙන පාරේ ස්වාමිණි නිවෙස් නැහැ, නමුත් මෙතනින් මේ දකුණට ආපු පාරෙන් ගියාම මේක සුනාමි ගම්මානය කියලා කියන්නේ, දෙපසටම ගෙවල් තියෙනවා මැදින් වීදියක් වගේ තියෙන්නේ. සාමාන්‍ය ක්‍රියාවලියේදි මේ පාර දිගේ තමයි ඇතුල්වීම බහුතරයක් මිනිස්සු කරන්නේ.

ප : එතකොට දැන් ඔබලා රැදී සිටියානේ යම් ස්ථානයක යකඩ පාළම ආශ්‍රිතව?

පි : එහෙමයි ස්වාමිණි.

ප : ඒ සිද්ධිය සිදු වුණේ මේ ඡායාරූපයේ දක්වන යකඩ පාළම ආශ්‍රිතවද?

පි : ඔව් මේ පාලමෙන් ස්වාමිණි තව මේ පැත්තට වෙන්නට පාළමෙන් පාර පැත්තට වෙන්න කෙලවරේ තමයි අපි රැදී සිටියේ.

ප : මහපාර පැත්තට වෙන්නට තමයි ඔබලා රැදී සිටියේ?

පි : එහෙමයි ස්වාමිණි.

<u>ස්වාමිණි මෙම ඡායාරූපය C882 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.</u>

ස්වාමිණි **C882 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනු ලැබුවා මේ අවස්ථාවේදි ගරු කොමිෂන් සභාවේ ගෞරවණිය අවධානයට යොමු කරන්නට කැමතියි 2020 ජූලි මාසේ 11 වෙනිදා ක්ෂේත්‍ර පරීක්ෂණයක් සඳහා කොමිෂන් සභාව මෙම ස්ථානයට යන විට මේ සාක්ෂිකරු විසින් ඔවුන් භාවිතා කළාය කියලා පෙන්නුම් කරන ලද මේ යකඩ පාලම හරහා තමයි ඔබතුමන්ලා ගමන් කලේ. එහෙම කරලා දකුණු පැත්තට ත්‍රස්තවාදීන් රැදී සිටි නිවස දෙසට යාමට ඇති මාර්ගය දිගේ තමයි ඔබතුමන්ලා ගමන් කෙරුවේ කියන කරුණ මතක් කරන්නට කැමතියි.**

(මීළඟට තවත් ඡායාරූපයක් සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා ස්වාමිණි)

ප : දැන් ඔබේ අවධානයට තවත් ඡායාරූපයක් යොමු කරනවා

පි : එහෙමයි ස්වාමිණි.

ප : මේ ඡායාරූපයේ තිබෙන ස්ථානය ගැන ඔබට මතකයක් තියෙනවද?

පි : ස්වාමිණි ඔය මම පෙර පැවසූ ගෙවල් අතරින් යන්න තියෙන පාරක්. ඔය වගේ පාරවල් 3 ක් හෝ 4 ක් තිබුණා ඒ ස්ථානයේ.

ප : දැන් එතන පොලිස් නිලධාරීන් කිහිප දෙනෙක් රැදී ඉන්න බවක් පේනවා?

පි : පේනවා ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : හැබැයි මේක ඇවිල්ලා ගත්ත වෙලාවක් ගැන සඳහනක් නැහැ නේද, සොකෝ ඇවිල්ලා ඉන්නේ.

පි : මෙය ස්වාමිණි ඉදිරිපසින් ගත්ත ඡායාරූපයක් වෙන්න බැහැ. මේක පිටිපස්සේ තියෙන කළපුව දෙස ඉඳලා ගත්ත ඡායාරූපයක් විය යුතුයි.

(ස්වාමිණි නිවාස මැද්දෙන් පාර යනවා කියන එක පෙන්නුම් කිරීම සඳහායි මේ ඡායාරූපය ගරු අවධානය වෙත යොමු කර සිටින්නේ කොමිෂන් සභාවේ)

<u>ස්වාමිණි මෙම ඡායාරූපය C883 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීම සඳහා අවසර අයැදිනවා</u>.

ප්‍ර : ඔබ කිව්වා ඔබට ලැබුණු පණිවිඩයේ සඳහන් වුණාය කියලා පොලිස් නිලධාරියා වෙත වෙඩි පහර එල්ල වන අවස්ථාවේදි පිපුරුම් හඬකුත් ඇහුණාය කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඊට පස්සේ ඔබලා ගියානේ මේ ස්ථානයට, ඒ යන අවස්ථාවේදි වෙලාව නැවත කියන්න කීයට ඇද්ද කියා?

පි : 7.10 විතර රාත්‍රී.

ප්‍ර : ඒ වෙලාවේ නැවත පිපිරීමක සද්දයක් ඇහුණද?

පි : ඇහුණා ස්වාමිණි.

ප්‍ර : එතකොට වෙලාව කීයට විතර ඇත්ද?

පි : අපි එතන ගිහිල්ලා විනාඩි 5 ත් වුනේ නැහැ අපි ඇතුලට යන්න සුදානම් වනවාත් එක්කම තමයි පිපිරීමක් එක්ක වෙඩි පහර කිහිපයක් උඩින් එල්ල වුණා.

ප්‍ර : කොයි පැත්තටද?

පි : එල්ල වුණේ ස්වාමිණි අපි ඉන්න දෙසට අර යුද්දේ දී භාවිතා කරනවා ට්‍රේස බුලට් කියලා, ඒ බුලට් එකක් පත්තුවීමේදී වර්ණ ආලෝකයක් යනවා. එතකොට ඒ ආලෝකයෙන් තමයි අපි දැන ගත්තේ ඒ ට්‍රේසර් බුලට් කිහිපයක් උඩට පත්තු වුණ එකෙන් උඩට තමයි අපි සිටින දෙසට උඩට තමයි වෙඩි කෝණය තියෙන්නේ.

ප්‍ර : එල්ලය ගන්නේ ඔබලා ඉන්න ප්‍රදේශයේ උඩ පැත්තට?

පි : උඩ පැත්තට.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : ට්‍රේසර් බුලට්වල විශේෂය මොකක්ද?

පි : ඒ ට්‍රේස බුලට්ස් ස්වාමිණි සාමාන්‍යයෙන් අපි යුද්ධ කටයුතු කරද්දි රාත්‍රී කාලයේ ඒ වෙඩි මේවා එක ගන්නේ සාමාන්‍යයෙන් අපි යම් ඉලක්කයක් ගත්තොත් ඒ ඉන්න කණ්ඩායමේ නායකයා අණක්

FAIR COMMENT BY JEZEEM

දෙනවා සීමයිට් ට්‍රෙසර් කියලා ඒ කියන්නේ ට්‍රේස් එක ගිහිල්ලා යම්කිසි ටාගට් එකට වැදුනොත් එතන යන රූට් එක සහ උණ්ඩය ගමන් කළ දිශාව ස්ථානය අපිට ලුමිනස් කලර්ස්වලින් පොඩි මේවා එකකින් පේනවා. එතකොට ඒකේ අදහස තමයි අනිත් අයගෙත් වෙඩි කෝණය ඒ ආසන්නයට ගන්න කියන එක.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : එතකොට දැන් මේ ඔබ කියන ආකාරයට මෙය සිදු වන්නේ රාත්‍රියේ?

පි : රාත්‍රියේ.

ප්‍ර : එතකොට වෙඩි ප්‍රහාර ඔබ වෙත එල්ල වෙන්නේ අර වොලිවේරියන් ග්‍රාමයේ නිවසක ඉඳලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් ඔබ කිව්වානේ ඔබලා එතනට යන කොට රාත්‍රී 7.10 ට විතර ඇති ඒ ආසන්නයේ තමයි ඔබලා ගියාට පස්සේ පිපුරුමක් ඇහුනේ?

පි : ඇහුනේ.

ප්‍ර : ඒ වගේම දැන් මේ ලුමිනස් කලර්ස්වලින් වෙඩි ප්‍රහාරයක් දැන් එල්ල වෙනවා ට්‍රෙස බුලට්ස්?

පි : ඔව්.

ප්‍ර : ඔබලා කොපමණ පමණ වෙලාවක් ඔතන රැඳිලා හිටියද?

පි : අපි ස්වාමිණි එතනින්ම පාළමෙන් ඇතුල් වෙන්න උත්සහා කලේ නැහැ මොකද අපිට භූමිය ගැන වැටහීමක් නැති නිසාත් විශාල blast එකක් ආපහු හින්දත් අපි ප්‍රධාන පාරට ආවා. ප්‍රධාන පාරට එනකොට ස්වාමිණි ප්‍රධාන පාරේ යුධ හමුදා ට්‍රක් රථයක් ආවා. ඊට පස්සේ මම නවත්තලා ට්‍රක් රථයේ කට්ටියට කිව්වා මෙතන බහින්න මෙතන දැන් attack එකක් එනවා අපේ ලඟ ප්‍රමාණවත් අවි ආයුධ නැහැ කියලා.

ප්‍ර : ඔවුන්ගේ ප්‍රතිචාරය වුණේ මොකක්ද?

පි : ඒගොල්ලෝ කිව්වා බහින්න බැහැ අපි යන්නේ ජනරල් අපිට කියලා තියෙනවා නින්දවුර්වලට එන්න කියලා, එතන ලොකු incident එකක් කියලා, නැහැ මම කිව්වා මම එතන ඉන්නේ කියලා මම කිව්වා ඉන්න මම ජනරල් සර්ට කතා කරන්නම් කියලා ස්වාමිණි.

ප්‍ර : ඒ ජනරල්වරයාගේ නම නැවත කියන්න?

පි : ජනරල් මහින්ද මුදලිගේ ස්වාමිණි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මහන්ද මුදලිගේ මහත්තයා, ඔහු තමයි සමන්තුරේට ආවේ, නින්දවුර්වලට ආවේ ඔබ සමඟ. දැන් ඔබ කිව්වා ඔබට මඟහැරුණා සෙනඟ නිසා ඔහු සයින්දමර්දුවලටත් ආපු වෙලාවේ කියලා?

පි : ඒ එක්කම ජනරල් මහින්ද මුදලිගේ මහත්තයා මට කිව්වා සාමන්ත මම පිටිපස්සේ ඉන්නේ සෙනඟ හින්දා මට ඉස්සරහාට එන්න බැහැ, ඉන්න මම එනවා කියලා. ඊට පස්සේ විනාඩි 3, 4 ක් තුළ සෙනඟ අතරෙන් ජනරල් මහින්ද මහත්මයා ඉදිරියට ආවා ස්වාමිණි. එතකොටත් සර්ටත් දෙවෙනි හඬ ඇහිලා තිබුණා. සර් එතකොට මොකද කරන්නේ කියලා ඇහුවා. මම කිව්වා සර් blast එකක් යනවා suicide attack එකක් වෙන්න පුළුවන්. ඒ හින්දා සර් අපි ආරක්ෂා වෙලා වැඩක්, මොනවා හරි ක්‍රියාන්විතයක් කරමු කියලා. එතකොට සර් කිව්වා අපි ඉස්සෙල්ලා cordon කර ගමු. මම මගේ කණ්ඩායම ගෙනල්ලා ඇතුලට දාන්නම්, ඔයාලගේ කට්ටිය එතකල් වටේ cordon එකට දාන්න කියලා.

ප්‍ර : ඒ කියන්නේ ආරක්ෂාව සපයන්න වටේ?

පි : ඉන්න අයට පැනලා යන්න බැරි වෙන්න වටේට වළල්ලක් විදියට සීල් කරන්න කිව්වා.

ප්‍ර : එතකොට ඔබ මොකද කළේ ඒ උපදෙස් අනුව?

පි : ඒ අනුව STF එකේ හිටිය SP කේසර එයාට කිව්වා ප්‍රධාන මාර්ගයේ ආශ්‍රිතව cordon එක දාන්න කියලා. එතකොට ඒ එක්කම මම සමන්තුරේ පොලිසියට කිව්වා කාර්තිව් හන්දියේ ඉඳලා සමන්තුරේ දක්වා cordon කරන්න කියලා. නමුත් මේ සිද්ධිය වෙන තැන එතනට කිලෝ මීටර් 1 ½ ක විතර දුරක් තියෙනවා, චවලකඩේ පොලිසියට කිව්වා මේ සිද්ධිය වෙනකොට වොලිවේරියන් ග්‍රාමට එහා පැත්තෙන් කිත්තන්ගේ හරහා පාරක් තියෙනවා පාර cover කරන්න කියලා. කල්මුණේ පොලිසියට කිව්වා එක team එකක් අරගෙන සයින්දමර්දු පැත්තට ඇවිල්ලා සයින්දමර්දු පල්ලියට එහා පැත්තෙන් තියෙනවා පාරක්, ඒ පාරෙන් ඇතුලට යන්න කියලා එතකොට ඒ ප්‍රදේශයම අපිට සීල් කර ගන්න හැකියාව තියෙනවා.

ප්‍ර : එතකොට කවුරු හරි පැනලා යනවා නම් පැනලා යන්න බැරි වෙන්නයි ඔබ මේ පියවර ගත්තේ?

පි : පියවර ගත්තේ.

ප්‍ර : ඊලඟට ජනරල් මුදලිගේ එතනට ආවට පස්සේ ඔහුගේ කණ්ඩායමත් දෙන්නම් කිව්වට පස්සේ ඊලඟට මොකද කළේ?

පි : මුදලිගේ සර් ඊට පස්සේ ස්වාමිණි මට දැනුම් දුන්නා මම assault එක කරන්නම් අපේ team එක දාලා, crossfire කර ගන්න එපා,

FAIR COMMENT BY JEZEEM

STF යි, පොලිසියටයි කියන්න ඇතුල් වෙන්න එපා, මම ආමි එක දාලා area එක clear කරලා දෙන්නම් කියලා. ඒ අනුව මුදලිගේ සර් ඔහු යටතේ හිටියේ නිලධාරීන් 2 ක් හෝ 3 ක් කැඳවලා කිව්වා ඒගොල්ලොන්ට ඇතුලට ගිහිල්ලා ක්‍රියාන්විතය සිදු කරන්න කියලා.

ප : ඔබලා කොහේද රැඳී සිටියේ?

පි : අපි එතකොට ඒ යකඩ පාළමයි මහ පාරයි අතරේ.

ප : දැන් ජනරල් මුදලිගේ කිව්වාම ඒ ක්‍රියාන්විතය සඳහා ඔහුගේ නිලධාරීන් සහභාගී කර ගන්නම් කියලා එතකොට ඒ අවස්ථාව වන විටත් අර වොලිවේරියන් ග්‍රාමයේ නිවසකින් කලින් විදියටම ට්‍රෙසර් බුලට්ස් එනවද?

පි : ඉදහිට වේගවත්ව ප්‍රහාර එල්ල වෙන්නේ නැහැ ස්වාමිණි. ඉදහිට එනවා එක ස්ථානයකින් නෙමෙයි නිකුත් වෙන්නේ, ස්ථාන කිහිපයකින් තමයි නිකුත් වෙන ස්වරූපයක් අපි දැක්කේ.

ප : ඔබලා නිරීක්ෂණය කලේ?

පි : නිරීක්ෂණය කලේ.

ප : එතකොට යුධ හමුදා නිලධාරීන් මොකද කලේ?

පි : එතකොට අපි ඇත්තටම හිතුවේ ස්වාමිණි ත්‍රස්තවාදීන් කිහිප දෙනෙක් ඉදලා ස්ථාන කිහිපයක ඉඳලා ප්‍රහාර එල්ල කරනවා කියලා. අපි cordon එක, ඒ කියන්නේ අපි වටලා සෝදිසි කිරීම සවිමත් කරනවට අමතරව ඊට පස්සේ ආරක්ෂාව සඳහා අපේ නිලධාරිනුත් වෙඩි තැබීම් ඒ පැත්තට සිදු වුණා.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප : සාක්ෂිකරු ස්ථාන කිහිපයක් කිව්වේ එකම නිවසේ ස්ථාන කිහිපයක්ද?

පි : නැහැ ස්වාමිණි ඉස්සරහා පැත්තෙන් අපේ පැත්තට එක වෙඩි උණ්ඩයක් දකින කොට අනිත් එක පිටිපස්සට යනවා. එතකොට අපි හිතන්නේ කිහිප දෙනෙක් එකතුවෙලා ප්‍රහාර එල්ල කරනවා කියන ස්වරූපයක් තමයි අපිට දැනුනේ.

ප : ඒ කියන්නේ එකම ස්ථානයකින්?

පි : ගෙවල් ඇතුලෙන් ස්වාමිණි. අපිට ස්ථානය හරියටම නිරීක්ෂණය වෙන්නේ නැහැ ස්වාමිණි ඒ අවස්ථාවේ. අපිට වහලෙට උඩින් යන අර වෙඩි හඬ සහ අර ට්‍රෙසර් බුලට්වල එළියෙන් තමයි අපි මේක හඳුන ගන්නේ.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : දැන් එතකොට වෙඩි හුවමාරුවක් වුණාද දෙපාර්ශවය අතර?

පි : හුවමාරුවක් වුණා ස්වාමිණි.

ප්‍ර : crossfire එකක් වුණා?

පි : ඔව්.

ප්‍ර : කොච්චර පමණ වේලාවක් ඔය වෙඩි හුවමාරුව දෙපාර්ශවය අතර පැවතුනාද?

පි : විනාඩි 40 ට ආසන්න කාලයක් වෙඩි හුවමාරුවක් සිදු වුණා ස්වාමිණි.

ප්‍ර : ඔබලා මේ සයින්දමර්දු වොලිවේරියන් ග්‍රාමයට පිවිසෙන්නට එන අවස්ථාවේදී ඔබ කිව්වා ඇහුනයි කියලා පිපිරීමක්?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ වගේම වෙඩි හඬවල් සහ අර ට්‍රෙසර් බුලට්ස් එනවා දැක්කා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ නිසා ඔබලා ඒ නිවස දෙසට යන්නේ නැතුව මදක් පසුබෑවා කියලා කිව්වනේ?

පි : එහෙමයි ස්වාමිණි පාලමෙන් එහා පැත්තට ගියේ නැහැ.

ප්‍ර : යකඩ පාලමෙන් එහා පැත්තට ඔබලා ගියේ නැහැ?

පි : ගියේ නැහැ ස්වාමිණි.

ප්‍ර : දැන් යම් වෙලාවකදී, ඒ වෙලාවට පස්සේ වෙඩි හඬවල් දිගටම ඇහුනද?

පි : ස්වාමිණි ඇහුනා නමුත් සමහරවිට අපේ නිලධාරීන් යුද හමුදා, පොලිසිය සහ විශේෂ කාර්ය බලකායේ අපේ නිලධාරිගෙනුත් වෙඩි තැබීම් කරලා තිබුණා. මොකද අපිට නිශ්චිතව හඳුනා ගැනීමට අවස්ථාව නැති එකයි, මොකද cordon එකේ ඉන්න නිලධාරීන් සමහර කට්ටිය fire කරලා තිබුණා උඩට.

ප්‍ර : එතකොට අර නිවස දෙසින් කලින් විදියටම ට්‍රෙසර් බුලට්ස් ආවද?

පි : ස්වාමිණි සාමාන්‍යයෙන් අපි පසුව සොයා ගත්තා T56 අවියක්. ඒකට උණ්ඩ 30 ක් දාන්න පුළුවන් වුණාට සාමාන්‍යයෙන් ට්‍රෙසර් බුලට්ස් 30 ක්ම දාන්නේ නැහැ. සාමාන්‍යයෙන් 4 ක් දාලා එකක් ට්‍රෙසර් එකක් දානවා, එහෙම නැත්නම් 3 ක් දාලා ට්‍රෙසයක් දානවා ඒ වගේ තමයි කරන්නේ. ඒක සාමාන්‍යයෙන් ඔය රාත්‍රී සටන් සඳහා පාවිච්චි කරන එකක්. වරින්වර තමයි අපිට ඒ ට්‍රෙසස් දැක්කේ අපි.

****

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : ට්‍රෙසර් බුලට් කොහෙන්ද..?

පි : ඒක ස්වාමිණි සාමාන්‍යයෙන් දැනට හමුදාව, පොලිසිය, විශේෂ කාර්ය බලකාය ඒක පාවිච්චි කරන උණ්ඩ වර්ගයක්.

ප්‍ර : පිටත් තියෙනවද? හමුදාව පාවිච්චි කරන බුලට්ස් වර්ගයක්ද?

පි : ඔව් ස්වාමිණි T56 තුවක්කුවට යොදන ට්‍රෙසර් බුලට් එක කියන්නේ ඒකටම යොදන රාත්‍රී කාලයේ ප්‍රහාරයන් සඳහා ඒ කියන්නේ ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම සඳහා පෙන්වන උණ්ඩ වගයක්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : එතකොට සාමාන්‍යයෙන් ඔය ගිණිඅවි පාවිච්චි කිරීම සඳහා යම් පුහුණුවක් තියෙන්න ඕන නේද?

පි : අනිවාර්යයෙන්ම ස්වාමිණි මොකද සාමාන්‍යයෙන් අපේ පුහුණුවේදීත් ට්‍රෙසර් බුලට්ස් එච්චර අපි පාවිච්චි කරන්නේ නැහැ.

ප්‍ර : දැන් ඔබ කියන ආකාරයට ට්‍රෙසර් බුලට් එකක් මාර්ගයෙන් කරන්නේ රාත්‍රියේදී නිශ්චිත ස්ථානයක් හඳුනා ගැනීමක් වෙනවා ඒ ස්ථානයට ඒ පහර දෙන්නා සමඟ තව කණ්ඩායමක් හෝ කිහිප දෙනෙකන් ඉන්නවා නම් ඒ අයටත් ඒ ස්ථානය දැක බලා ගැනීම සඳහා?

පි : ට්‍රෙසර් බුලට් එක යන පාර සහ ඒ ස්ථානය තුලින් පේනවා මේ තැනට තමයි target එක ගන්න කියන්නේ.

ප්‍ර : එතකොට ඒ සඳහා පුහුණුවක් නැත්නම් ඔය වගේ වෙඩි තැබීමක් කරන්න අපහසුයිනේද?

පි : එහෙමයි ස්වාමිණි, සාමාන්‍යයෙන් කණ්ඩායමේ නායකයා තමයි ට්‍රෙස් එකක් දාලා fire කරන්නේ, See My Tracer and Fire කියලා කියන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි, ඔබ ඉස්සෙල්ලාම කිව්වා නේද ඔය වොලිවේරියන් ගම්මානය අසල තියෙන ඔය පාලමට ගියායින් පස්සේ තමයි ඔබට පිපිරීම ඇහෙන්නේ කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ ඔබ ගිහිල්ලා එතනට විනාඩි 5 ක් විතර ඉන්න කොටද ඔය පිපිරීම ඇහෙන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ස්වාමිණි ගිහිල්ලා වීරසිංහත් එක්ක මම කතා කරනවා. කතා කරලා තමයි අපි ඉස්සරහාට යන්නේ.

ප්‍ර : එතකොට වීරසිංහත් එක්ක කතා කරන වෙලාවේ වෙඩි ආවේ නැද්ද?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : ඔබලා පාලමෙන් යන්න හදන කොටද වෙඩි ආවේ?

පි : පාලමට ඇතුල් වෙන්න මෙහා පැත්තේ ස්වාමිණි තව පාරක් තියෙනවා. ඊට මෙහා පැත්තේ තියෙන්නේ තට්ටු දෙකේ බිල්ඩිං එකක්. අපිව පේන්නේ නැහැ කාටවත්. අපි පාරේ ඉන්න කට්ටිය. ඒ තට්ටු දෙකේ බිල්ඩිං එක සහ පාලම අතරින් අපි ඉස්සරහාට යන කොට තමයි වෙඩි හඬවල් එක්ක blast එක ඇහුනේ.

ප්‍ර : blast එක ඇහුනේ ඒ වෙඩි හඬවල්වලට පස්සේද?

පි : ඒක නම් මට නිශ්චිතව කියන්න අමාරුයි ස්වාමිණි.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු ඔය ට්‍රෙසර් බුලට්ස් සාමාන්‍යයෙන් පාතාල කණ්ඩායම් අතරත් පාවිච්චි වෙන්නේ නැති බුලට් වර්ගයක්?

පි : ස්වාමිණි ට්‍රෙසර් බුලට් එක කියන එක විශේෂයෙන් හඳුනා ගැනීමට කියන්නේ සාමාන්‍ය බුලට් එකක්මයි, නමුත් ඒකේ පිටිපස්සේ දැන් අපි Training School එකේ පාවිච්චි කලේ පිටිපස්සේ අර ටිකක් ගිහිල්ලා වදින තැන කොළපාට හරි රතුපාට හරි පොඩි තීන්ත ටිකක් ආලේප කරලා තියෙනවා පුහුණුවක් තියෙන කෙනෙක් දන්නවා මේක ට්‍රෙසර් බුලට් එකක් කියලා.

ප්‍ර : මම අහන අදහස වෙන්නේ පාතාල කණ්ඩායමක් ලංකාවේ ට්‍රෙසර් බුලට් සාමාන්‍යයෙන් පාවිච්චි කළ බවක් ඔබගේ අත්දැකීම් වලින් තියෙනවද කියලා?

පි : එහෙමයි ස්වාමිණි කියන්න හැකියාවක් නැහැ නමුත් සාමාන්‍ය මේක ගොඩක් වෙලාවට රාත්‍රී කාලයේ තමයි ගන්නේ.

ප්‍ර : ඒ කියන්නේ?

පි : තියෙන්න පුළුවන් ස්වාමිණි.

ප්‍ර : ප්‍රශ්නේ අහන තේරුම මෙම විශේෂ පුහුණුවක් මේ ට්‍රෙසර් බුලට් සම්බන්ධව දැනුමක් තියෙන්න ඕනේ යම් විශේෂ අවි පුහුණුවක් ඔවුන් ලබාගෙන තියෙනවද කියන එක ඔබට කියන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමිණි. ස්වාමිණි සාමාන්‍ය වෙඩි තැබීමේ ක්‍රමවේදයම තමයි මේකේදී කරන්න තියෙන්නේ. නමුත් එකම වෙනස තියෙන්නේ target එක පෙන්නනවා. ඒ බුලට් එක ගිය area එක

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පෙන්නලා තමයි. ඒ කියන්නේ නිශ්චිව target එක හඳුනා ගන්න පුළුවන්.

ප : ඔවුන්ට විශේෂ පුහුණුවක් ලැබිලා තියෙනවද?

පි : අනිවාර්යයෙන් ස්වාමිණී. සාමාන්‍යයෙන් ඒක use කරනවා නම් විශේෂ පුහුණුවක් ලබන්න ඕන.

ප : එවැනි පුහුණුවක් ලබා දෙන්න පුළුවන් කොයි විදියේ පුද්ගලයින්ටද? හමුදාවේ ඉන්න කට්ටිය?

පි : යුද හමුදාවේ, පොලිසියේ, විශේෂ කාර්ය බලකායේ කට්ටියට අනිවාර්යයෙන්ම ස්වාමිණී රාත්‍රී සටන් පුහුණුවේදී මෙක ලබා දෙනවා.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප : විජේසේකර මහත්මයා ඔබ දන්නවද අර ඔබ කලින් කිව්වනේ ඔබේ උපදෙස් දීමක් කෙරුවා කියලා මේ ප්‍රදේශයේ ජනතාව, අම්පාර ප්‍රදේශයේ ජනතාවට කවුරු හරි අළුතෙන් ආවොත් ඒ පැත්තට පල්ලියේ ලියාපදිංචි වෙන්න කියලා?

පි : එහෙමයි.

ප : ඔබ දන්නවද මේ වොලිවේරියන් ග්‍රාමයට අදාලව එවැනි සිද්ධියක් ඔය 26 වෙනිදා වෙඩි තැබීම සිදු වෙන්න ඉස්සරවෙලා සිදු වෙලා තිබුණද කියලා කියන්න. දන්නවා නම් විතරක් කියන්න?

පි : දන්නවා ස්වාමිණී. මේ පුද්ගලයෝ, ඒ කියන්නේ සැක කටයුතු පුද්ගලයෝ කණ්ඩායමක් මේ වොලිවේරියන් ග්‍රාමයේ නිවසකට ඇවිල්ලා ඉන්නවා කියලා ඒ ප්‍රදේශයේ ඉන්න කාන්තාවෝ දෙන්නෙකුට තමයි ඉස්සෙල්ලා ම සැකය ඇති වෙලා තියෙන්නේ. ඊට පස්සේ ඒ කාන්තාවෝ ඒ ප්‍රදේශවාසී කිහිප දෙනෙකුටත් කතා කරලා ඊට පස්සේ පල්ලියේ එක්කෙනෙකුටත් කතා කරලා මේගොල්ලන් check කරන්න හදලා තියෙනවා. check කරන්න හදන කොට ඒ කට්ටිය කියලා තියෙනවා ගෑණු අය ඉන්නවා ගේ ඇතුලේ කාන්තා පාර්ශවය ඉන්න හින්දා check කරන්න දෙන්න බැහැ කියලා.

ප : කවුද මෙහෙම කියලා තියෙන්නේ?

පි : ඒ ගේ ඇතුලේ ඉන්න කට්ටිය.

ප : කවුරු හරි ගියා මෙතන පරීක්ෂා කරන්න ඒ ගෙදරට?

පි : ඔව් ඒ පල්ලියේ කමිටුවේ කෙනෙකුත් ප්‍රදේශවාසී 3 දෙනෙකුත් තමයි ඉස්සෙල්ලම ඒ ස්ථානයට ගියේ.

ප : ඒ අය ගිහිල්ලා පරීක්ෂා කරන්න හැදුවේ ඔය පසු අවස්ථාවකදි වෙඩි තිබ්බායි කියලා ඔබලා සොයා ගත්ත ඒ ගෙදරද?

FAIR COMMENT BY JEZEEM

පි : ඒ ගෙදර ස්වාමිණි.

ප්‍ර : ඊට පස්සේ?

පි : ඊට පස්සේ ඒගොල්ලන් පරීක්ෂා කරන්න දෙන්න බැහැ කිව්වාට පස්සේ ඊට පස්සේ කල විමර්ශනවලදී අනාවරණය වුනේ ගේ ඇතුලෙන් එක්කෙනෙක් තුවක්කුවක් අරගෙන ඇවිල්ලා ඊට අමතරව සැමන් ටින් එකක් වගේ මොකක්ද එකක් පෙන්නලා අපි උඹලා වෙනුවෙන් තමයි ජීවිත පුදන්න හදන්නේ. ඒ හින්දා අපිට යන්න දීපල්ලා කියලා ඉල්ලීමක් කරලා තියෙනවා. ඒක ඊට පස්සේ මං හිතන්නේ ඒ ගෙදර ගෙහිමියා සහ ඊට අනතුරුව ස්වාමිණි මේ සම්බන්ධයෙන් තැගි ලබා ගත්ත පුද්ගලයන්ගෙන් අනාවරණය වුණා. ඊට පස්සේ එක පුද්ගලයෙක් මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න බයික් එකේ හන්දියට එනවා. ඒ පුද්ගලයා තමයි පොලිස් කොස්තාපල් වීරසිංහ දැනුවත් කරන්නේ.

ප්‍ර : ඒ අනුව තමයි මේ දැනුවත් කිරීම සිද්ධ වෙන්නේ?

පි : එහෙමයි.

ප්‍ර : බොහොම ස්තූතියි, ඊට පස්සේ මම නැවත ඔබේ අවධානය යොමු කරනවා අර දෙපාර්ශවය අතර සිදු වූ වෙඩි හුවමාරුවට.
දැන් ඔබ මේ වන කොට ගරු කොමිෂන් සභාවට පිපිරීම් 2 ක් ගැන කිව්වනේ,

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔය 2 වන පිපිරීමට පස්සේ නැවත පිපිරීමක් ඇති වුණාද?

පි : ඇති වුණා ස්වාමිණි.

ප්‍ර : ඒ වෙලාවට ඒ පිපිරීම සිදුවන විට වෙලාව කීයට විතර ඇත්ද?

පි : දෙවෙනි පිපිරීමෙන් විනාඩි 45 ට විතර පස්සේ.

ප්‍ර : 3 වන පිපිරීම සිද්ධ වුණේ?

පි : 3 වන පිපිරීම සිද්ධ වුණේ.

ප්‍ර : එතකොට ඔබලා කොහේද හිටියේ?

පි : ඒත් ස්වාමිණි අපි ඒ ස්ථානවලමයි. මොකද ..

ප්‍ර : ඔබලා ඉදිරියට ආවේ නැහැ?

පි : අපි ඉදිරියට ආවේ නැහැ ස්වාමිණි .

ප්‍ර : යුද හමුදා නිලධාරීන් තමයි ඉදිරියට ගිහිල්ලා දැන් මේ වොලිවේරියන් ග්‍රාමයේ අර අදාල නිවසෙන් නිකුත් වන වෙඩි උණ්ඩවලට ප්‍රතිචාර දක්වන්නේ?

පි : යුද හමුදා නිලධාරීන් තිදෙනෙක් තමයි ස්වාමිණි ඇතුලට ගිහිල්ලා ප්‍රතිචාර දැක්වුයේ.

ප්‍ර : ඊට පස්සේ?

පි : අපි ඒ අවස්ථාවේ එතන ඉන්න කොට ස්වාමිණි ඇතුලෙන් අර මීට පෙර මම ඡායාරූපයේ පෙන්නූ ඉස්සරහාට කෙලින්ම තියෙන පාර

Presidential Secretariat Commission
FAIR COMMENT BY JEZEEM

දිගේ ත්‍රීවිල් එකක් එකපාර ආවා. ඉන් අනතුරුව ස්වාමිණි අපි එතන රැඳී සිටියා. රැඳී ඉදලා ඉවර වෙලා 2 වන පිපිරීමෙන් විනාඩි 40 ට පස්සේ විතර එක යුද හමුදා නිලධාරියෙක් ඇවිල්ලා කිව්වා ජනරාල් මුදලිගේට එතකොට මමත් එතනමයි හිටියේ, සර් එක්කෙනෙක් out එළියේ, දැන් නම් සර් මුකුත් ප්‍රශ්නයක් නැහැ වගේ කිව්වා. ඒත් ජනරාල් මුදලිගේ කිව්වා යන්න එපා ඇතුලට. අපි තව ටිකක් වෙලා sure කරගෙන ඉදිමුයි කියලා.

ප : දැන් ඔය පණිවිඩය ඔබට යුද හමුදා නිලධාරීන් කියන වෙලාව වෙන කොට ඒක දවසේ කීයට විතර ඇත්ද? 26 වෙනිදා කීයට විතරද?

පි : 26 වෙනිදා 9 ත් 9 ¼ ත් විතර ඇති.

ප : රාත්‍රී 9 ත් 9 ¼ ත් විතර ඇති. එතකොට ඒ යුද හමුදා නිලධාරියා ඇවිල්ලා ඔබලාට දැනුම් දුන්නේ එක්කෙනෙක් out එළියේ දැන් නම් ප්‍රශ්නයක් නැහැ වගේ.

පි : සද්ද මුකුත් නැහැ සර් දැන් නම් ප්‍රශ්නයක් නැහැ වගේ කිව්වා.

ප : එතකොට ඔබලා අර ඉන්න ස්ථානයේ ඉදලා නිරීක්ෂණය කරන කොට පෙනුනද ප්‍රහාර එල්ල වෙනවා, වෙඩි ප්‍රහාර එල්ල වෙනවා වොලිවේරියන් ග්‍රාමයේ ඉදලා?

පි : නැහැ ඒ අවස්ථාව වෙන කොට නැහැ, 3 වෙනි වෙඩි ප්‍රහාරයෙන් පස්සේ කිසිම වෙඩි ප්‍රහාරයක් එල්ල වුනේ නැහැ.

ප : ඉතින් අර පණිවිඩය යුද හමුදා නිලධාරියා ගෙනාවට පස්සේ ඔබලා මොකද කලේ?

පි : ඒත් ඇතුලට යන්න එපා කියලා කිව්වා මොකද

ප : කාගෙන්ද උපදෙස් ලැබුණේ?

පි : ජනරාල් මුදලිගේත් කිව්වා, මමත් කිව්වා පොලිසියේ කට්ටිය. මොකද එතනින් තමා ඇතුලට යන්න ප්‍රධාන පාර තියෙන්නේ ඊට පස්සේ අපි කොහොමත් පැයක් විතර එළියේ ඉදිමු කිව්වා. මොකද ඊට ඉස්සෙල්ලා වෙච්ච සිදුවීම්වල අත්දැකීම් තියෙන හින්දා, කලුවරේ එතකොට අපිට පේන්නෙත් නැහැ, කාටවත් එළියට එන්න දෙන්න එපා කිව්වා cordon එක තියෙන හින්දා. අපිටත් ඉන්න කියලා ඊට පස්සේ 10 ½ , 11 විතර වෙන කොට තමයි ඇතුලට යන්න සුදානම් වුණේ.

ප : ඔබලා කොහාටද ගියේ?

පි : අපි අර පෙර පෙන්නු ඡායාරූපයේ පාලමෙන් එගොඩ වෙලා දකුණු පැත්ත පාර දිගේම ගිහිල්ලා 3 වෙනි හරස් වීදියෙන් එතනින් වමට හැරුණා. වමට හැරිලා ටිකක් දුර යන කොට ඒ ස්ථානයේ රුපියල් 5000 කොල එහෙම ගොඩක් විසිකරලා දාලා තිබුණා

FAIR COMMENT BY JEZEEM

මහපාරේ. කාණුවේ. ඒ පාර එයින් ලක්ෂ 9 යි 80 ක් අපි එවේලේ අපි අරගෙන කල්මුණේ HQI ට කිව්වා ඒක ඉදිරිපත් කරන්න කියලා.

ප්‍ර : ඒ කියන්නේ මේ රාත්‍රියේමද ඔබලා ඒ මුදල් එකතු කළේ?

පි : එකතු කලේ. ඊට පස්සේ තව පොඩ්ඩක් ඉස්සරහාට යන කොට

ප්‍ර : ඔබ කියන්නේ පාරේ එහෙම කාණුවල විසිරිලා තිබුණා මේ මුදල්?

පි : කිසිම පිළිවෙලක් නැතුව

ප්‍ර : රුපියල් 5000 කොල?

පි : 5000 කොල. අපි 9,80,000 ක් එතන තිබිලා එවේලේ හොයාගෙන ඉදිරිපත් කළා. තව ටිකක් ඉස්සරහාට යන කොට අළුපාට වගේ ඉරි තියෙන ෂර්ට් එකක් දික් කලිසමක් ඇඳ හිටිය පුද්ගලයෙක් හිටියා T56 weapon එකත් එක්ක වැටිලා.

ප්‍ර : ඒවා ඡායාරූප ගත කෙරුවද?

පි : ඊට පහුවෙනිදා උදේ තමයි ඡායාරූප ගත කලේ.

ප්‍ර : ඒවා නැවත දැක්කොත් හඳුනන්න පුළුවන්ද?

පි : පුළුවන්. ඊට පස්සේ ස්වාමිණි එතන අපි ගෙදරින් ගේට්ටුව ලඟට ගිහිල්ලා ඇතුලේ බලන කොට ඇතුලේත් තව ..

ප්‍ර : අපි එක එක යමු දැන්. එතකොට මේ ඡායාරූප පෙන්නන ගමන් අපිට ...

(ඡායාරූපයක් තිරයේ දිස්වීමට සලස්වයි)

ප්‍ර : මේ පේන්නේ?

පි : රුපියල් 5000 නෝට්ටු.

ප්‍ර : රුපියල් 5000 කොල, ඔබ කිව්වේ මේ ආකාරයට තමයි ඒවා විසිකරලා තිබ්බේ කියාල?

පි : කානුවල වටේම තිබ්බා ස්වාමිණි.

(තවත් ඡායාරූපයක් පෙන්වයි)

ප්‍ර : ඒ කියන්නේ bundle පිටින් විසිකරලා තියෙන්නේ නේද, දකුණු අත පැත්තේ?

පි : ලොකු bundle නම් තියෙන්න විදියක් නැහැ ස්වාමිණි. සාමාන්‍යයෙන් විසිකරලා දාපු ස්වරූපයක් තමයි තිබුණේ.

(තවත් ඡායාරූපයක් පෙන්වයි)

<u>ස්වාමිණි රුපියල් 5000 කොල තැන තැන විසිරී ඇති බව දක්වන එම ඡායාරූප 3 පිළිවෙලින් C884(A), C884(B), සහ C884(C) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.</u>

ප්‍ර : ඒ වගේම ඔබ කිව්වා අර යුද හමුදා නිලධාරියෙක් කිව්වයි කියලා සර් එක්කෙනෙක් outට එයා පාරේ ඉන්නවා කියලා. ඒ වගේම

Prosecution Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඔබලා ඒ ස්ථානයට ගියාම කෙනෙක් පාරේ වැටිලා ඉන්නවා දැක්කයි කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔහුව පරීක්ෂා කරලා බැලුවද ඔබලා?

පි : නැහැ ඒ අවස්ථාව වෙන කොට ස්වාමිණි යුද හමුදාවෙන් එයාගේ ශරීර පරීක්ෂාවක් කළා වෙන මුකුත් තියෙනවද කියලා බලන්න.. අපි ඊට අමතරව රාත්‍රී කාලයේ හින්දා වෙන පරීක්ෂා කිරීමක් මුකුත් කලේ නැහැ.

ප්‍ර : ඔහු ජීවතුන් අතර හිටියද ඒ වෙලාවේ?

පි : නැහැ.

ප්‍ර : ඔහු මැරිලා, මියගිහිල්ලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔහු ගාව මොනවා හරි අවි ආයුධ තිබුණද?

පි : ඔව්. T56 වර්ගයේ ආයුධයක් තිබුණා.

ප්‍ර : එම ඡායාරූපය දැක්කොත් ඔබට හඳුනා ගන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමිණි.

(ස්වාමිණි ඡායාරූපයක් සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා)

ප්‍ර : මේ ඡායාරූපයෙන් පෙනෙන තැනැත්තා පිළිබඳවද ඔබ සඳහන් කෙරුවේ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ නිවස ඉදිරිපිට වැටිලා හිටියේ මේ ආකාරයටද?

පි : එහෙමයි ස්වාමිණි.

<u>ඔබතුමන්ලාගේ ගරු අවධානය අර තුවක්කුවේ ස්වාමිණි කොකා තිබෙන තැන ඔහුගේ අත තිබෙන බව අවධානයට යොමු කරනවා ස්වාමිණි.</u>

පි : ඒ වගේම ස්වාමිණි ඒ මැගසීන් එකේ ස්ප්‍රින් එක ගැලවීම තුලින් අදහස් වෙන්නේ මේක ක්‍රියාකාරිත්වයේ මොනවා හරි දුර්වලතාවයක් වෙලා තියෙනවා කියන එක. මැගසීන් එකේ ස්ප්‍රින් එක ස්වාමිණි ඔහොම එළියට ආවට පස්සේ ආපහු වෙඩි තැබීමට හැකියාවක් නැහැ උඩට පතොරම දෙන්නේ නැති හින්දා. ඒ හින්දා මේක අනිවාර්යයෙන්ම එක්කෝ weapon එකේ කාර්මික දෝශයක් හින්දා මෙයා ෆයර් කරන එක නවතින්න ඕනේ, මොකද මැගසින් එකට, ඕක සාමාන්‍ය ක්‍රමයට ගැලවෙන්නේ නැහැ අපේ වෙඩි ප්‍රහාරයක් ඕකට එල්ල වෙලා නැති හින්දා. ඒ හින්දා කාර්මික දෝශයක් හින්දා මැගසින් එකේ යට තියෙනවා කොටසක් ඒක ගැලවිම හින්දා තමයි එයාගේ වෙඩි තැබීම බොහෝ දුරට නවතින්න ඇත්තේ.

ප්‍ර : ඔබට තියෙන අත්දැකීම් අනුව ඔබ හිතනවා

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ස්වාමිණි මෙම ඡායාරූපය C885 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : ඒ වෙඩි පහර ඔහු මියගියේ හමුදාව විසින් තබපු වෙඩි පහරවලින්ද, තමන් විසින් වෙඩි පහර එල්ල කර ගෙනද?

පි : ස්වාමිණි මට ස්ථීර වශයෙන් කියන්න බැහැ, නමුත් වැටිලා තිබුණ තුවාල අනුව ඔහුගේ පාදයේ එකක් තිබුණා සාමාන්‍යයෙන් ඒ වගේ තැනක තමන්ට තියාගන්න හැකියාවක් නැහැ. පාදයේ මෙතන තියෙන වෙඩි සලකුණු අනුව ස්වාමිණි සාමාන්‍යයෙන් තමන්ට තියාගන්න අමාරුයි එතෙන්ට.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔබේ විමර්ශනවලදි මේ ඡායාරූපයේ ඒ කියන්නේ C885 ඡායාරූපයේ ඉන්න පුද්ගලයා කවුද කියන එක හඳුනා ගන්න පුළුවන් වුණාද?

පි : පුළුවන් වුණා ස්වාමිණි. ඊට පසුවෙනිදා මහේස්ත්‍රාත්තුමාගේ මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසුව රස පරීක්ෂක කාර්යාලයේ නිලධාරීන් පැමිණි පසුව අධිකරණ වෛද්‍ය නිලධාරී රුවිර නදීර මහත්මයත් ඇවිල්ලා මේ මෘත ශරීර සියල්ල මාගේ උපදෙස් පරිදි ස්වාමිනි අම්පාර රෝහලට තමයි අපි යැව්වේ. මොකද අනෙක් ප්‍රදේශ ඔක්කොම කල්මුණ, සමන්තුර, අක්කරපත්තු ඉන්න consultant JMO කෙනෙක් හිටියේ නැහැ, අපි දැනුවත් කළාම අධිකරණ විශේෂඥ වෛද්‍ය රුවිර මහත්මයා තමයි ස්ථානයට ආවේ. ඊට පසු දින මේ තැනැත්තාගේ බිරිඳ කැඳවලා හඳුනා ගැනීමක් කලා.

ප්‍ර : ඇගේ නම මොකක්ද?

පි : මට ඒ ගැන ස්ථීරවම මතකයක් නැහැ ස්වාමිණි. මොකද ඒක සොකෝ එකෙන් තමයි කරලා තිබුනේ.

ප්‍ර : කැඳවලා තිබුනේ. නමුත් ඔබ දන්නවා අධීක්ෂණ නිලධාරියා විදියට 27 වෙනිදා මේ තැනැත්තාව හඳුනා ගැනීමක් ඔහුගේ බිරිඳ විසින් කෙරුවා කියලා?

පි : කෙරුවා. 28 වෙනිදා ස්වාමිණි.

ප්‍ර : එහෙනම් ඒ අනාවරණය වූ කරුණු මේ තැනැත්තා කවුද?

පි : මොහොමඩ් නියාස්.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් විජේසේකර මහත්මයා ඔබ ගරු කොමිෂන් සභාවට කිව්වා සමන්තුරේ ගෙදර අර ගරාජ් එක කුළියට ගත්ත එක්කෙනාගේ නම නියාස් කියලා?

පි : නියාස් කියලා.

ප්‍ර : ඒ වගේම ඔබ කිව්වා නින්දවුර් ගෙදර කුළියට ගත්ත එක්කෙනාගේ නමත් නියාස් කියලා?

පි : එහෙමයි.

ප්‍ර : තුන්වෙනුව ඔබ කිව්වා නින්දවුර් ගෙදර ලඟ තිබුණ ලියාපදිංචි නොකල අළු පැහැති වෑන් රථය මිළදී ගත්ත පුද්ගලයාගේ නමත් නියාස් කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ නියාස් කියන තැනැත්තයි, නියාස් බවට ඔහුගේ බිරිඳ හඳුනා ගත්ත මේ වොලිවේරියන් ග්‍රාමයේ නිවස ඉදිරිපිට වැටිලා හිටිය මේ පුද්ගලයයි වෙඩි තැබීමකට ලක්ව එක්කෙනෙක්ද? නැත්නම් දෙන්නෙක්ද?

පි : එක්කෙනෙක් ස්වාමිණි.

ප්‍ර : එතකොට මේ නිවසේ හඳුනා ගැනීමේ අංකයක් තියෙනවද? ලිපිනය මොකක්ද? නියාස් වැටිලා හිටිය

පි : අංක B 183, 3 වන හරස් වීදිය,

ප්‍ර : අංක ?

පි : 183, 3 වන හරස් වීදිය

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : ආයෙත් කියන්න B එකක් නැහැ, සටහන් බලලා ප්‍රවේශමෙන් කියන්න?

පි : ස්වාමිණි මේක යුගල නිවාසයක්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : B 183, 3 වන හරස් වීදිය නෙමෙයිද?

පි : ස්වාමිණි යුගල නිවාසයක් හින්දා අනිත් නිවාසවල A, B කියලා සටහන් කර තියෙනවා.

ප්‍ර : එතකොට එහෙම නම් නිවැරදි අංකය මොකක්ද?

පි : 183 B, 3 වන හරස් වීදිය.

ප්‍ර : 3 වන හරස් වීදිය, වොලිවේරියන්, සයින්දමර්දු.

පි : සයින්දමර්දු.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් එදා රාත්‍රියේදී මේ නියාස්ව අංක 183 B, 3 වන හරස් වීදිය, වොලිවේරියන්, සයින්දමර්දු කියන ඒ ලිපිනයට ඉදිරියෙන් බිම වැටිලා ඉන්නා දැක්කට පස්සේ ඔබලා මොකද කළේ?

පි : ස්වාමිණි එතනට ගිහිල්ලා වැටිලා තිබුණ මෘත ශරීරයට ඉස්සරහා ගෙදර තමයි පිපිරීම වෙලා තිබුණේ. 3 වන හරස් වීදියේ ඒ ගෙදර ගේට්ටුව වහලා තිබුණේ. ගේට්ටුවට උඩින් අපි විදුලි පන්දමක් දල්වා බලන කොට ඉස්සරහා මෙතන පිරිමි කෙනෙක්ගේ මෘත ශරීරයක් තිබුණා.

ප්‍ර : මොන අතටද හිටියේ ඔහු?

පි : මුනින් අතට.

ප්‍ර : ඒකේ ඡායාරූපයක් නැවත දැක්කොත් ඔබට හඳුනන්න පුළුවන්ද?

(තවත් ඡායාරූපයක් තිරසේ දිස්වීමට සලස්වයි)

පි : ස්වාමිණි මේ ඡායාරූපය මම පෙර කියූ පාලමට මෙහා අපි රැදී සිටි ස්ථානය.

<u>ස්වාමිණි එම ඡායාරූපය ඒ කියන්නේ නිළධාරීන් යකඩ පාලමට එහා රැදී සිටි ස්ථානය බවට සාක්ෂිකරු හඳුනා ගනු ලැබූ ඒ ඡායාරූපය C886 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.</u>

(තවත් ඡායාරූපයක් තිරයේ දිස්වීමට සලස්වයි)

ප්‍ර : දැන් මේ ඡායාරූපය බලන්නකෝ ඔබ. මේ තිරයේ දිස්වන ඡායාරූපය බලන්න. ඔබ කිව්වනේ ඉස්සරහා කෙනෙක් වැටිලා හිටියා කියලා?

පි : එහෙමයි ස්වාමිණි. මෙය ඊට පසුදින ලබා ගත් ඡායාරූපයක්. මේ ඡායාරූපයේ මම ඉන්නවා ස්වාමිණි.

ප්‍ර : නමුත් ඔබ අර කිව්ව මිදුලේ වැටිලා හිටිය පුද්ගලයාද ඔය පෙන්නන්නේ ඡායාරූපයෙන්?

පි : ඔව් ස්වාමිණි. ඔහුගේ කකුලක සුදු මේකේ නිල්පාට කොටු තියෙන සරමක කොටසක් තිබුණා.

ප්‍ර : සරමක කොටසක් තිබ්බා.

පි : ඔව් ස්වාමිණි

<u>ස්වාමිණි එම ඡායාරූපය C887 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.</u>

ප්‍ර : ඔබ කිව්වා ගේට්ටුවෙන් බැලුව වෙලාවේදී ඒ රාත්‍රියේ විදුලි පන්දම් දල්වලාද බැලුවේ?

පි : ඔව් විදුලි පන්දම් එළියෙන් තමයි බැලුවේ.

ප්‍ර : ඒ එළියෙන් තමයි ඔබලා කෙනෙක් මුණින් අතට වැටිලා ඉන්නවා දැක්කේ?

පි : දැක්කේ ස්වාමිණි.

ප්‍ර : ඊට පස්සේ මොකද කළේ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඊට පස්සේ ස්වාමිණි ඇතුලේ ඒ අවස්ථාව වෙන කොටත් ගිණි ගැනීම් කටයුතු සිද්ධ වෙනවා. ඊට පස්සේ අපි තීරණය කළා මේ අවස්ථාවේ මෙතන මුකුත් කරන්නේ නැතුව සමීප ආරක්ෂාවක් යොදවන්න කියලා ඒ ගෙවල් කිට්ටුවට කරලා ඒ අවස්ථාව වෙන කොට ස්වාමිණි ගෙවල්වල කවුරුත් කට්ටිය එළියට එන්නේ නැහැ, ඒගොල්ලෝ එහෙමම හිටියා. අපි ආපහු ප්‍රධාන පාරට ඇවිල්ලා යුද හමුදාවත්, පොලිසියත් අර 3 වන හරස් වීදියේ ආරම්භයේ සහ අවසන් වන ස්ථානවල ඒගොල්ලන්ට කිව්වා ආරක්ෂාකාරීව රැඳී ඉන්න, එළියට පේන්නේ නැතුව කියලා.

ප්‍ර : දැන් ඔබ කිව්වානේ මේ නිවාසවල තමයි මේ නිවැසියෝ හිටියේ කියලා අසල්වැසියෝ?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එතකොට කොයි වෙලාවක හරි ඔබලා උපදෙස් දුන්නද ඒ ග්‍රාමයේ ඉන්න නිවැසියන්ට ඒ ග්‍රාමවාසීන්ට තමන්ගේ නිවෙස්වලට වෙලා ඉන්නට කියලා?

පි : අපි උපදෙස් දීමක් කළා ස්වාමිණි අර මම පෙර පෙන්නපු ඡායාරූපයේ ඒ ග්‍රාමයේ පල්ලිය තිබුණා. ඒ පල්ලියේ තිබුණු ස්පීකරයෙන් එතන ඉන්න නිලධාරියෙක් ලව්වා කියෙව්වා කිසි කෙනෙකුට එළියට බහින්න එපා අපි දැනුම් දීමක් කරන කල් කියලා. ඊට පස්සේ අපේ ආරක්ෂාව සලසලා අපි වොලිවේරියන් ග්‍රාමයෙන් එළියට ආවා.

ප්‍ර : දැන් ඔබලා එදින ඔය ස්ථානයෙන් බැහැර වෙන්නට පෙර ඔබටත් ඉන්නවානේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්?

පි : එහෙමයි.

ප්‍ර : ඒ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඔය ස්ථානයට පැමිණියාද?

පි : පැමිණියා.

ප්‍ර : ඒ කීයට විතරද? සහ කවුද ඒ ආපු නිලධාරීන්?

පි : නියෝජ්‍ය පොලිස්පති ආයාෂ කරුණාරත්න මහත්මයා ආවා. මම හිතන්නේ තුන්වන පිපිරීම සිද්ධ වෙන්න පෙර තමයි මහත්තයා එතනට ආවේ. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කපිල ජයසේකර මහත්තයා ආවා. මහත්තයා ටිකක් පරක්කු වෙලා ආවේ. මහත්තයා හැබැයි අපිත් එක්ක ස්වාමිණි අර නියාස් වැටිලා ඉන්න තැන බලන්න යන අවස්ථාවේ ගියා. ඒ අවස්ථාවේ නැගෙනහිර පළාත් ආඥාපති මේජර් ජනරාල් අරුණ ජයසේකර මහත්මයා එයත් ආවා. අපි ඔක්කොම ගියා එතනට.

ප්‍ර : එතකොට දැන් ඔබලා කිව්වා නිලධාරීන්ට උපදෙස් දුන්නා දෙපැත්තෙන් ඒගොල්ලන්ට එන්න දෙන්න එපා කාටවත් කියලා,

FAIR COMMENT BY JEZEEM

ඒ වගේම පේන්නේ නැති වෙන්න ඉන්නෙයි කියලා. එහෙම සැලසුම් කරලා ආරක්ෂාව සඳහා ඔබලා මොකද කළේ නිලධාරීන්?

පි : නිලධාරීන් කණ්ඩායම කැඳවලා ඊට පස්සේ මේකේ විමර්ශන කටයුතු කිරීමට අවශ්‍ය හින්දා මම එවේලෙම පොලිස්පතිතුමාටත් අවශ්‍ය ස්ථානවලටත් දැනුවත් කරලා මම අම්පාරට ආවා රෑ 12 ට විතර. මේ සිදුවීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු දැනුවත් කරන්න අවශ්‍ය හින්දා. ඒ ඇවිල්ලා මම අම්පාරට එන ගමන්ම ස්ථානාධිපතිවරුන් දැනුවත් කළා. මා යටතේ එතකොට පොලිස්ථාන 17 ක් තියෙනවා. 17 න් යම් නිලධාරී කණ්ඩායමක් රැගෙන උදේට සයින්දමර්දුවලට එන්න කියලා. ඒ අනුව උදේ 5 වෙන කොට මම ආපහු සයින්දමර්දුවලට ආවා.

ප්‍ර : දැන් ඔබ ඔය කියන්නේ 27 වෙනිදා ගැන?

පි : 27 වෙනිදා උදේ.

ප්‍ර : 26 වෙනිදානේ මේ ඔක්කොම සිද්ධීන් සිද්ධ වුනේ. සිද්ධීන් ප්‍රධාන වශයෙන් 3 ක් සිද්ධ වුණා. එතකොට 27 වෙනිදා දැන් ඔබ නැවත සයින්දමර්දුවලට එනවා.

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : කොහේ ඉදන්ද එන්නේ?

පි : මම අම්පාර මගේ කාර්යාලයේ නිළ නිවසේ ඉදන්.

ප්‍ර : එතකොට ඔබ කිව්වා ඒ වගේම පියවර ගත්තයි කියලා ඔබේ වසමේ ඉන්න පොලිසි 17 ට කතා කරලා නිලධාරීන්ව ඔය සයින්දමර්දු ප්‍රදේශයට ගෙන්වා ගන්නට.?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : මොකක්ද ඒකේ අරමුණ වුණේ?

පි : ස්වාමිණි අරමුණ වුනේ මෙතන ගෙවල් 200 ට ආසන්න සංඛ්‍යාවක් තියෙනවා. මේ සිදුවීම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කරන්න අවශ්‍යතාවය තිබුණා සිදුවීම් මාලාවක් තියෙන හින්දා. ඊට පස්සේ අපි අදහස් කරන් තිබුනේ අපි උදේ පාන්දර 5 ට ඇවිල්ලා annousment එකක් කරනවා සියළුම කට්ටියට එක් තැනැත්තෙක් විතරක් ගෙදර තුළ ඉන්දලා අනෙක් සියළුම කට්ටිය කිසිම භාණ්ඩයක් ගේන්නේ නැතුව ඇඳන් ඉන්න ඇදුම් පිටින් එළියට ඇවිල්ලා අර පෙර ඡායාරූපයේ පෙන්නපු පාසලේ ground එකට එන්න කියලා. එතනදී අදහස් කළේ ස්වාමිණි යම් කෙනෙක් සැඟවිලා ඉන්නවා නම් ඒ ග්‍රාමයෙන් අපිට ගොඩක් උදව් ලැබුණ හින්දා ඒගොල්ලෝ අනිවාර්යයෙන් කියනවා මෙයා අපේ ගමේ කෙනෙක් නෙමෙයි කියලා. ඒ අවස්ථාවේ වවලකඩේ ස්ථානාධිපති හිටියේ මුස්ලිම් ජාතික නිලධාරියෙක් මම එයාට තව අපේ නිලධාරී කණ්ඩායම දීලා කිව්වා මේ ස්ථානයට එන හැම

Presidential Secretariat
FAIR COMMENT
BY JEZEEM

එක්කෙනාගේම තොරතුරු හොයාගෙන පොඩි ස්ටේට්මන්ට් එකක් ගන්න, මොකක්ද වුනේ කියන එක. ඒ අතරේ ඉන්න කට්ටිය ඔක්කොම ඡායාරූප ගත කරන්න කියලා කිව්වා. ගමේ ඉන්න අපිට හිතවත් තොරතුරු ලබා දුන්න කට්ටියක් ඉන්නවා, ඒගොල්ලන්ට කිව්වා බලන්න අඳුරන්නේ නැති කවුරු හරි මේ අතර ඉන්නවද කියලා. නමුත් දවල් වෙන කල්ම

ප : සැක කටයුතු කෙනෙක්ව හොයා ගන්න බැරි වුණාද?

පි : හොයා ගන්න බැරි වුණා.

ප : එතකොට මේ ග්‍රාමයේ තියෙන නිවාස පරීක්ෂා කිරීමක් සිද්ධ වුණාද?

පි : ඔව් ඒ අතරේ ස්වාමිණි අර ගෙදරක එක්කෙනෙක් තියලා එන්න කිව්වට පස්සේ හැම යුද හමුදා STF කණ්ඩායමකට එක් පොලිස් නිලධාරියෙක් ගානේ තියලා හැම ගෙයක්ම search කරගෙන ගියා. සමහර ගෙවල් වහලා කට්ටිය කවුරුත් හිටියේ නැහැ. ඒ ගෙවල් අපි ඇරලා search කළා.

ප : එතකොට ඔය පරීක්ෂාවේදි කිසිම සැක කටයුතු දෙයක් සොයා ගන්නට පුළුවන් වුණාද?

පි : අනෙක් තැනැත්තන්ගේ ගෙවල්වලින් කිසි දෙයක් හම්බ වුණේ නැහැ.

ප : හොයා ගන්න බැරි වුණා, මම අහන්නේ මේ අනෙක් ඒගොල්ලන්ගේ ගෙවල්වලින්. එතකොට වෙන ඒ ගෙවල්වල සැක කටයුතු පුද්ගලයින් එතනවත් එහෙම නැත්නම් අර ක්‍රීඩා භූමියේවත් කොහේවත් හිටියේ නැහැ?

පි : හම්බ වුණේ නැහැ ස්වාමිණි.

ප : ඊට පස්සේ දැන් ඔබ ඔය උපදෙස් දීලා ඊලඟට මොකද කලේ?

පි : ඊට පස්සේ ස්වාමිණි කණ්ඩායමක් යොදවලා ඒ ඉන්න කට්ටියට අවශ්‍ය ආහාර තිබුනේ නැහැ එදා. එතකොට කල්මුණේ HQI ට කිව්වා ඒ කට්ටියගේ සුබසාධන කටයුතු බලන්න කියලා. ඒ එන අතරේ පොලිස්පතිතුමා දැනුවත් කරලා රජයේ රස පරීක්ෂක නිලධාරී කණ්ඩායමක් ගෙන්වා ගැනීමට අවශ්‍යයි කිව්වට පස්සේ චොපර් එකක උහනට එනවා ඒක සුදානම් කරගන්න කිව්වා. ඊට පස්සේ අධිකරණ වෛද්‍ය නිලධාරී රුවිර නදීර මහත්තයට මම කතා කළා. මහත්තයා එතකොට කොළඹ යන ගමන්. සර්රුත් එන්නම් කිව්වා.

ප : ඒ කියන්නේ විශේෂඥ අධිකරණ වෛද්‍ය නිලධාරී, අම්පාර?

පි : අම්පාර. ඒ අතර කල්මුණ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකට කිව්වා මහේස්ත්‍රාත්තුමා දැනුවත් කරලා මහේස්ත්‍රාත් පරීක්ෂණය පවත්වන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට මහේස්ත්‍රාත් පරීක්ෂණය සඳහා එතුමා මේ අංක 183B, 3 වන හරස් වීදිය, වොලිවේරියන්, සයින්දමර්දු කියන ස්ථානයට පැමිණියාද?

පි : පැමිණියා ස්වාමිණි.

ප්‍ර : 27 වෙනිදා ද ආවේ?

පි : ඔව්.

ප්‍ර : 27 වෙනිදා කීයට විතරද ආවේ?

පි : 27 වෙනිදා උදේ 8.30 ට කල්මුණ ගරු මහේස්ත්‍රාත් අයි.එන්. රිස්වාන් මහතා.

ප්‍ර : ඒ අවස්ථාවේදි එතුමා ඒ නිවස ඇතුලට ගියාද?

පි : ඔව් එතුමා ඒ නිවස ඇතුළට ගියා. මමත් ලඟ ඉදගෙනම පෙන්නුවා ඇතුලේ තියෙන තත්ත්වය.

ප්‍ර : එතකොට දැන් මොනවද ඔබලා ඇතුලට යනකොට දැක්කේ?

පි : ප්‍රධාන ගේට්ටුව පිටින් මම මීට පෙර සඳහන් කල නියාස් කියන පුද්ගලයාගේ මෘත ශරීරය තිබුණා අවියත් එක්ක. ගේට්ටුවෙන් ඇතුල් වෙන කොටම තිබුණා ඉස්සරහා පැත්තේ මා මීට පෙර හඳුනා ගත්ත තැනැත්තාගේ මෘත ශරීරය.

ප්‍ර : ඔබ හඳුනා ගත්තා කියලා කිව්වට ..

පි : නමින් හඳුනා ගැනීමක් කලේ නැහැනේ තාම. අපි ඔක්කොම හඳුනා ගැනීම් එක සැරේට කරමු.

ප්‍ර : ඊට පස්සේ ප්‍රධාන...

පි : නැත්නම් මෙහෙම මම අහන්නම්කෝ, ඔබ 26 වෙනිදා නැවත ගියානේ ඔබේ කාර්යාලයට?

ප්‍ර : ගියා.

පි : නැවත 27 ඔබ මේ ස්ථානයට එන්න ඉස්සෙල්ලා මොනවා හරි නැරඹුවද?

ප්‍ර : මම මීට පෙර මට තොරතුරු ලබා දුන් නම සඳහන් කල නිලධාරියා මට දැනුවත් කරලා තිබුණා සර් අන්තර්ජාලයේ යනවා හඬ පටයක් වගේ එකක්, ඒක පොඩ්ඩක් බලන්න. ඒකේ කියන අදහස එන්නේ විරුද්ධවාදීන් අපි වටකරලා ඉන්නවා. අද අපි ඒගොල්ලොන්ට හොඳ පාඩමක් උගන්වනවා කියලා. එතකොට ඒ මට පෙර කී නිලධාරියා කිව්වා එතන ඉන්න කෙනෙක් සහරාන්ගේ මල්ලී වන ෂයිනි, අනිත් එක්කෙනා සහරාන්ගේ තාත්තා, අනිත් එක්කෙනා සහරාන්ගේ අනිත් සහෝදරයා වන රිල්වාන් කියලා. ඊට පස්සේ ඒ හඬපටය නරඹලා ඉවරවෙලා මම ඒ මට පෙර කිව්ව නිලධාරියාගේ විස්තර අනුව කොටු සරමක් ඇඳගෙන ඉන්න කෙනෙක් හඳුනා ගත්තා

ප්‍ර : ඔබ ඒ හඬපටය හොඳින් නැරඹුවා නේද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නැරඹුවා.

ප්‍ර : එය නැවත දැක්කොත් ඔබට හඳුනන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමිණි.

ස්වාමිණි C435 ලෙස ලකුණු කරන ලද CD තැටිය ස්වාමිණි මේ අදාල කොටස තියෙන්නේ.

(එය මේ අවස්ථාවේ තිරයේ දර්ශනය වීමට සලස්වයි)

ප්‍ර : මේ ඒ වීඩියෝ පටයනේ?

පි : ඔව්. මේ තැනැත්තා ස්වාමිණි රිල්වාන්. මොහු හඳුනා ගැනීමක් වශයෙන් කරන්නේ මෙයාගේ අතේ ඇඟිලි නැහැ කියන එක මට පෙර කී නිලධාරියා දැනුම් දුන්නා. ඊට අමතරව මෙයා ඩෙනින් කලිසමක් තමයි නිල්පාට එකක් තමයි ඇඳලා තියෙන්නේ. ටීෂර්ට් එකේ කොටසකුත් ඇහේ තියෙනවා.

ප්‍ර : ඊලඟට මේ තැනැත්තා?

පි : මට අර පෙර කී නිලධාරියා දැනුම් දුන්නා මේ සහරාන්ගේ පියා කියලා.

ප්‍ර : එතකොට ඔහුගේ ඇඳුම්?

පි : සුදුපාට අත් සහිත බැනියමක් සහ අර මුස්ලිම් ජාතිකයන් අඳින වර්ගයේ සරමක්.

ප්‍ර : ඒ ඇඳන් හිටියේ පියා සහරාන්ගේ?

පි : සහරාන්ගේ පියා.

දැන් වේලාව : ප.ව. 5.30 යි.

මෙතැන් සිට ල/ලේ :-යමුනා දසනායක මිය විසින්ය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව ප.ව. 5.30.
පෙර සටහන්ගැනීම ල/ලේ දම්මිකා.
සටහන්ගැනීම ල/ලේ යමුනා දසනායක විසිනි.

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය.

උ මේ TShirt එකත්, කොටු කොටු සරමත් ඇදගෙන ඉන්නේ ෂෙයිනි කියලා කිවුවා. මම කොටු කොටු සරමින් තමයි අඳුනාගත්තේ අර එළියේ තියෙන මෘත ශරීරය ෂෙයිනි කියන පුද්ගලයා කියලා. එතකොට මේ අවස්ථාවේ එක ගිණි අවියක් අතේ දරාගෙන ඉන්නවා. ඒක වෙඩි තැබීමේ ඉරියව්වට සකස් නොකරන ලද එකක්. ඒකට අපි කියන්නේ බට් එක නමලා කියලා කියන්නේ. අර වෙඩි තැබිමේදී ඔය කියන කොටස දිග ඇරලා තමයි. කවල් බට් එක.

ප්‍ර දැන් ඔබ දැක්ක ඒ වීඩියෝ පටය තමයි එහෙනම් අන්තර්ජාලයේ දැක්කේ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එහෙමනම් අපි දැන් නැවත යමුකෝ අර මිදුලේ වැටිලා හිටපු මෘත ශරීරය ඒ කියන්නේ C.887.

ඒ C.435 හේ විනාඩි 49 තත්පර 43ට පෙන්වන ඡායාරූපයේ ඉන්නේ සාක්ෂිකරු අඳුනාගන්නා විදියට රිල්වාන් ස්වාමීනි.

උ මොහොමඩ් කාසිම් මොහොමඩ් රිල්වාන්.

ප්‍ර ස්වාමීනි විනාඩි 49 තත්පර 31ට පෙන්වන ඡායාරූපයේ ඉන්නේ ෂෙයිනි.සාක්ෂිකරු හඳුනා ගන්නවා .

උ එහෙමයි. ෂෙයිනි.

(සාක්ෂිකරු හඳුනාගනී.)

ස්වාමිනි මේ වීඩියෝ පටයේ පිටිපස්සේ බිත්තියේ තියෙනවා පටි දෙකක් මේ පටි දෙක ඒ නිවස තුල තිබුණ පටි දෙකක් හන්දා, මේ නිවස තුළදීම තමයි මේක පටිගත කළේ. මේ ප්‍රහාරය එල්ලවන අවස්ථාවේ කයන එක ඊට පහුවෙනිදා අපි නිරීක්ෂණය කළා. ෂෙයිනිගේ පුතා කියලා. ස්වාමිනි අපිට හරියට හඳුනා ගැනීමක් කරන්න බැහැ ඒ පොඩි අය ගැන. නමුත් ඊට පස්සේ විමර්ශණයේදී ෂෙයිනිගේ දරුවා තමයි ඉන්නේ කියලා. එයා ගාව ඉන්නවා කියලා.

ප්‍ර එතකොට ෂෙයිනිගේ උකුලේ ඉන්න කුඩා දරුවා?

උ විමර්ශණයේදී අනාවරණය වුනේ ෂෙයිනිගේ දරුවා කියලා.

ප්‍ර පුත්‍රයා නේද?

උ පුත්‍රයා.

ප්‍ර දැන් නැවත ඔබේ අවධානය C.887ට යොමු කරනවා. එළියේ වැටිලා ඉන්න මේ තැනැත්තාව ඔබට හඳුනා ගන්නට පුලුවන් වුනා කියලා කීවා

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ එහෙමයි ස්වාමීනි.

.ප්‍ර ඔහු කවුරු විදියටද හඳුනාගත්තේ?

උ සහරාන් හෂීන්ගේ සහෝදරයෙක් වන කාසිම් මොහොමඩ් ෂෙයිනි කියලා.

ප්‍ර මේ මෘත ශරීරය පසු අවස්ථාවක දී උඩුබැලි අතට හැරෙව්වද?

උ මහෙස්ත්‍රාත්තුමාත් ස්වාමිනි, මේ අවස්ථාවේදි මේ ස්ථානයේ රැදි ඉන්නවා. මහෙස්ත්‍රාත්තුමාගේ නියෝග පරිදි අනෙක් පැත්තට හරවලා හඳුනා ගැනීමක් කළා.

ප්‍ර මේ උඩු බැලි අතට දැන් හරවලා තියෙන්නේ ඒ ෂෙයිනිගේ මළසිරුර ද?

උ එහෙමයි ස්වාමිනී. ෂෙයිනිගේ මළ සිරුර

. (ස්වාමීනි. එම ඡායාරූපය C.888 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.)

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර ඔහු මිය ගොස් සිටියේ වෙඩි වැදීමකින්ද ?

උ ස්වාමීනි ඒක ස්ථිරව කියන්න බැහැ දරුණු තුවාල කැළල් තිබුණා එයාගේ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර ඊට පස්සේ. දැන් ඔහු තමයි හිටියේ වැටිලා.

උ ඔව්.

ප්‍ර එතකොට ඔබලා දැන් මේ නිවසට ඇතුලු වුනාද? ගරු මහෙස්ත්‍රාත්තුමා සමග?

උ ස්වාමීනි අපි ඔය ගෙට ඇතුල් වෙන්න ඉස්සෙල්ලා ඔය නියාෂ්ගේ සහ ෂෙයිනිගේ මෘත ශරීරය දැක්කාට පස්සේ යුධ හමුදා නිලධාරින් ඇතුලේ පොඩි ළමයෙක්ගේ හඬක් ඇහෙනවා කියනවා. එතකොට මමත් ඒ පිටිපස්සේ යනවා. යනකොට අපේ ජීවිතාරක්ෂක අංශයේ ඉන්න නිලධාරීන් ඇතුලේ ඉඳලා පොඩි ළමයෙක් අරගෙන ජනේලයෙන් එළියට ඇවිල්ලා යුධ හමුදා නිලධාරියෙකුට භාරදීමක් කරනවා. ඒ අවස්ථාවේ ඒ කුඩා දියණියක් , දියණිය කවුද කියන එක අපි දන්නේ නැහැ. ඒ වෙලාවේ දැනන් හිටියේ නැහැ. අපි අර ගෙට ඇතුල් වෙච්ච මාර්ගයෙන්ම එළියට ඇවිල්ලා , අපි ඒ ප්‍රධාන මාර්ගයට ඇවිල්ලා එතෙන්ට ඇම්බියුලන්ස් එකක් ගෙනල්ලා අපි ඒ කුඩා දියණිය , ඒ ඇම්බියුලන්ස් එකේ රෝහලට යවන්න කටයුතු කරනවා. මේ ඡායාරූපයේ දැක්වෙන්නේ ඒ කුඩා දියණිය ස්වාමීනි, ඇය වතුර ඉල්ලුවාට කට අරින්න බැහැ. දුවට වතුර පොවන්න බැරි වුනා. ඊට

FAIR COMMENT BY JEZEEM

පස්සේ පුලුන් කැල්ලකින් ඒ යුධ හමුදා නිලධාරින් තොල්දෙක පොහවනවා.

ස්වාමිනි කෙටි වීඩියෝ පටියක් පෙන්වීමට අවසර ඉල්ලනවා .

ප්‍ර මේ තමයි ඒ නිවස ට ඇතුලු වන ස්ථානය නේද?

ප්‍ර ඔබත් ඉන්නවා නේද මේ ඡායාරූපයේ?

උ ඉන්නවා ස්වාමීනි.

ප්‍ර මේ ඉන්න බබා කවුද එතකොට?

උ පසුව හඳුනාගැනීමක් කළා ස්වාමිනි. සහරාන්ගේ කුඩා දියණිය කියලා.

ප්‍ර දැන් ඔබ කීවා මේ දරුවා ඔබලා හොයා ගන්නා අවස්ථාවේ මොන මානසික තත්වයකද හිටියේ?

උ ඉතාමත් බියට පත්ව හිටියේ ස්වාමීනි. කැළඹීමකට වගේ පත්වෙලා හිටියේ. කතාකරන්නවත් මොකුත් බෑ.

ප්‍ර දැන් ඔබලා ගිලන්රථයක් ගෙන්වා ගත්තා කීවානේ? මේ ඒ ගිලන් රථයද?

උ ඔව්. අපි ඊට ඉස්සරවෙලා දවසේම ඒ තීරණය කළා ස්වාමීනි ගිලන් රථයක් ගෙනල්ලා, අපේ මෙහෙයුමේ හදිසි තුවාලකරුවෝ සිටියෝත් එසේ ක්‍රියාත්මක කරන්න ඕන කියන අවශ්‍යතාවයේ තමයි හිටියේ. අර මුල් අවස්ථාවේ කිව්වේ ස්වාමීනි, එහෙම කතා කරන්න හැකියාවක් තිබුණේ නැහැ , ඒ තොලේ තෙමුවට පස්සේ තමයි බාප්පා බාප්පා කියලා ස්වාමීනි එම කෙටි වීඩියෝ පටය දරුවාට අදාළව අද දෙරණ නාළිකාවේ මෙය ප්‍රකාශයට පත්වෙලා තියෙන්නේ 2019 අප්‍රේල් 27 වෙනිදා යූ. ටියුබ් එකේ . එහි මාතෘකව වන්නේ ස්වාමිනි ත්‍රස්තවාදීන් මරු තුරුලට යැවූ සයින්දමරුදු මෙහෙයුම. එය C.889 ලෙස ලකුණු කිරීමට අවසර අයදිනවා.

ප්‍ර ඔබ කීවා ඔබලා එතනට ගිහිල්ලා, මේ කුඩා දරුවාගේ කටහඬ ඇහෙනවා කියලා? ඒ දරුවා සොයාගෙන ගිහිල්ලා, දරුවාට අවශ්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා ගිලන් රථයක් මාර්ගයෙන් අම්පාර රෝහලට යැව්වා කියලා. එතකොට ඔබලා කීවා ඒ දරුවව මුල් අවස්ථාවේදී කවුද කියලා දැනගෙන හිටියේ නැහැ කියලා. නමුත් පසු අවස්ථාවකදී අනාවරණය වුනා කියලා කීවා. මේ සහරාන් හෂිම්ගේ දියණිය කියලා?

උ ඔව්. දියණිය වන මොහොමඩ් සහරාන් රුදෙනා.

ප්‍ර ඇයගේ නම මොහොමඩ් සහරාන් රුදෙනා ඒ දැරියව දැන් රෝහලට යවන්නට ඔබලා ගෙනාවනේ ගිලන් රථයට. ඒ දැරියට අමතරව තවත් කවුරු හරි ඔය අවස්ථාවේම රෝහලට යවන්නට කටයුතු කළාද?

උ ඔව්. ස්වාමීනි.

ප්‍ර ඒ කවුද? කොහෙද ඒ තැනැත්තා හෝ තැනැත්තිය හිටියේ?

උ අපි මේ අවස්ථාවේ ස්වාමිනි, අර කුඩා දැරිය ගැන අවධානය යොමු කරගෙන මම එතන හිටියේ. එතකොට පිටිපස්සෙන් මට ඇහුනා තවත්

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කාන්තාවක් ඉන්නවා කියලා. එතකොට අපේ ජීවිතාරක්ෂක නිලධාරිනුත්, යුද හමුදා නිලධාරිනුත් ට්‍රොලියක් අරගෙන ටිකක් වැඩිහිටි කාන්තාවක් ට්‍රොලියක ගෙනාවා. අපි ඒ අවස්ථාවේ ඒ තැනැත්තිය කවුද කියලා හඳුනා ගැනීමක් කළේ නැහැ. ඒ තැනැත්තියත් බියට පත්වෙලා තමයි හිටියේ.

ප්‍ර. මේ වීඩියෝ පටය දැක්කොත් ඔබට ඇය හඳුනන්න පුලුවන්ද? ඒ අවස්ථාවේ නිවස තුළ තිබිල හම්බවෙලා ගෙනාපු තැනැත්තියද කියලා කියන්න?

ස්වාමීනි C.889 ලෙස ලකුණු කරන ලද එම වීඩියෝ පටය තවදුරටටත් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අවසර අයදිනවා.

ප්‍ර ඔබ ළඟ තියෙනවාද? ඒ කාන්තාවගේ පැහැදිලි ඡායාරූපයක්.

උ තියෙනවා. ඔව්.

ප්‍ර එතකොට ගරු මහෙස්ත්‍රාත්තුමා ආවාට පස්සේ, මේ නිවස ඇතුළට ඔබලා ගියාද? විමර්ශණ සිදුකරන්න?

උ එහෙමයි ගියා ස්වාමීනි. ඒ කාන්තාව ගේන අවස්ථාවේදී ස්වාමිනි, ඒ කාන්තාව නිකන් බයවෙලා වගේ කතා කරන්න හැකියාවක් තිබුණේ නැහැ. අත් දෙක නිකම් ගල්වෙලා වගේ හිටියේ. එහෙම තත්වයක තමයි. කතා කරන්නවත් බැහැ. ඊට පස්සේ හමුදාවේ නිලධාරින් තමයි පල්ලෙහාට ගන්නෙත්, නමුත් මුල් ඡායාරූපවල පැහැදිලිව තියෙනවා, ගේන්නේ ස්වාමිනි අත්දෙක මෙහෙම කෙලින් කරගන්න බැරි තත්වයෙන් පල්ලෙහාට ගන්නේ.

ප්‍ර ස්වාමිනි ඡායාරූපයක් පෙන්වනවා සාක්ෂිකරුට. මේ ඡායාරූපයෙන් පේන්නේ ඔය නිවසද?

උ එහෙමයි ස්වාමීනි. ඔය නිවසේ ප්‍රධාන දොර.

ප්‍ර. දැන් ඔබලා මේ නිවස වෙත යනකොට පෙනුන ආකාරයද ඔය?

උ. එහෙමයි ස්වාමීනි.

ප්‍ර. එළියේ තියෙන්නේ මොකක්ද?

උ මෙතෙන තියෙන්නේ ස්වාමීනි, රෙදි සෝදන මැෂිමක්.

ස්වාමිනි, ඉතා ගෞරවයෙන් ගරු කොමිෂන් සභාවේ අවධානයට යොමුකරනවා, 2020 ජූලි මාසේ 11 වෙනිදා, ගරු කොමසාරිස්තුමන්ලා සහ කොමසාරිස්තුමිය මේ ස්ථානය නැරඹීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණය සඳහා ගියපු වේලාවේදි ඔබතුමන්ලා මෙම නිවසට ඇතුල්වුනේ මෙන්න මේ ප්‍රධාන දොරෙන් බව.

ප්‍ර. එතකොට දැන් ඇතුල ගිණි අරගෙන ඇති බව තමයි පේන්නේ?

උ. ස්වාමිනි මෙන්න මේකේ මෙන්න මෙතන තියෙන්නේ ස්වාමීනි, අර පොඩි වෑන් එකක ෂීට් එකක්. ඒක ස්වාමීනි ඊට පසුව අපිට අනාවරණය වෙනවා. ඒක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තමයි, ඒක භාරයට ගත්තේ, නමුත් 04/21 පාස්කු ප්‍රහාරය සිද්ධ වෙච්ච ප්‍රධාන

FAIR COMMENT BY JEZEEM

ස්ථානවලින් එක් ස්ථානයක තිබිච්ච වැන් එහෙක කියලා. බෙහෝ වෙලාවට ස්වාමීනි අර කොච්චිකඩේ පාස්කු ප්‍රහාරයෙන් පසුව පසුදින පුපුරන ලද වාහනයේ ෂීට් එක විය යුතුයි මෙක .

ප්‍ර ඒ සඳහා යොදාගන්නා ලද වාහනවලින් එක වාහනයක තිබූ ෂීට් එකක් බවයි?

උ ෂීට් එකක් තමයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් දැනුවත් කළේ.

ස්වාමීනි මෙම ඡායාරූපය C.890 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

ප්‍ර දැන් ඔය නිවසේ ඔය ප්‍රධාන දොරටුවෙන් ඇතුල්වෙලා ඔබලා කොහෙටද ගියේ?

උ ස්වාමිනි ප්‍රධාන දොරටුවෙන් ඇතුල්වෙනවාත් එක්කම තියෙන්නේ ස්වාමීනි සාලයක්. ඒ සාලයට අපි ඇතුල්වුනා.

ප්‍ර මොකක්ද දැක්කේ?

උ දැක්කේ ස්වාමිනි යතුරුපැදියක් තිබුණා පිලිස්සිලා වගේ ගිහිල්ලා. ගෑස් සිලින්ඩර කිහිපයක් තිබුණා බිම. යතුරුපැදියක් තිබුණා ස්වාමීනි, සම්පූර්ණයෙන් දැවී ගිහිල්ලා තිබුණේ නැහැ. ඊට පස්සේ දැඩි ලෙස පිලිස්සුනු ස්වරූපයක් තිබුණා. මෘත ශරීරවල කොටස් වල නිකම් කැබලි කැබලි කොට වගේ ඉතිරිවෙලා තිබුනා.

ප්‍ර දැවී ගිය මෘත ශරීරද?

උ ඔව්. දැඩි ලෙස දැවී ගිය මෘත ශරීර. ඒකෙන් එකක් දෙකක් අපිට පිරිමි අයවළුන්ගේ කියලා ශරීරයේ තිබුණ අවයවවලින් හඳුනාගැනීමට හැකියාව ලැබුණා. ඒ කිහිපයම තිබුණේ ප්‍රධාන දොරන් ඇතුලුවනවාත් එක්කම තමයි ඒ ටික තිබුනේ.

ප්‍ර එතකොට ඔබ අද දින මේ ගරු කොමිෂන් සභාවට කීවා අර අන්තර්ජාලයේ ඔබ දුටුව අපි C 435 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරලා තියෙන එම වීඩියෝ පටයේ දක්නට ලැබෙන පසුබිමේ යම් ඉරි දෙකක් තියෙනවා කියලා?

උ රෝසපාට පසුබිමේ රතු ඉරි දෙකක් තිබුණා.

ප්‍ර දැන් මේ ඔබට පෙන්වන ඡායාරූපය බලන්න. මෙය ඔබ කියන සාලයේ ඡායාරූපයක්ද?

උ ඔව්. සාලයේ ඡායාරූපයක්.

ප්‍ර එතකොට ඔබ කියන අර ඉරි දෙක මේ ?

උ මෙන්න මේ ඉරි දෙක ගැන තමයි ස්වාමිනි, මම මීට පෙර කිව්වේ, ඒ අන්තර්ජාලයට මුදාහැරපු පටයේ දැක්වෙන්නේ මේ ඉරි දෙක.

ස්වාමීනි එම ඡායාරූපය C.891 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ සාලයේ වෙන මොනවාද ඔබලා දැක්කේ, ඔබ කීවා මදක් පිළිස්සී ගිය මෝටර් සයිකලයක් දැක්කා.?

උ ගෑස් සිලින්ඩර කිහිපයක් තිබුණා පිලිස්සුන. නමුත් ඒවා පුපුරලා තිබුණේ නැහැ ස්වාමීනි, නමුත් ඒවායේ පිටපැත්ත ආවරණයට පොඩි සිදුරුවගේ වැදිලා තිබුණා මොනවා හරි එකකින්. එයට අමතරව ගෙට ඇතුලුවන කොටම ඉදිරිපස බිත්තියත් එක්ක තිබුණු, ඒ ටිකේ මොකුත් අදුරගන්න බැහැ බොඩීස් තිබුනු මෘත දේහ . ඊට පස්සේ තව රෝද පුටුවක් තිබුණා.

ප්‍ර මේ ඇතුලුවුනාම තියන ස්ථානයද?

උ ඔව්. ස්වාමීනි, මේ ඇතුලුවුනාම තියෙන ස්ථානය.

ප්‍ර එතකොට දැන් මේ සමීප දසුනක් පෙන්වන්නේ මොකක්ද එතන?

උ මේ මේක බයිසිකලය.

ස්වාමීනි එම ඡායාරූපය C.892 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

ප්‍ර ඊ ළඟට වෙන මොනවද සාලයේ දැක්කේ?

උ රෝද පුටුවක් තිබුණා.

ප්‍ර. රෝද පුටුවක් තියෙනවා ඒකත් පිළිස්සීමට භාජනය වෙලා නේද?

උ ඔව්.

ස්වාමීනි එම ඡායාරූපය C.893 වශයෙන් ලකුණුකොට ඉදිරිපත් කරනවා

ප්‍ර ගෑස් සිලින්ඩරුත් ඔබ දැක්කයි කිවුවනේ මේ සාලයේ තියෙනවා?

උ ඔව්.

ප්‍ර මේ දැවී ගිය ගැස් සිලින්ඩරය ඔබ කියන්නේ සාලයේද තිබ්බේ?

උ සාලයේ.

ස්වාමීනි එම ඡායාරූපය C.894 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර දැන් ඊට පස්සේ ඔබලා දැන් ඔන්න බැලුවා ප්‍රධාන ශාලාවේ මේ වගේ පිලිස්සුම් සිදුවෙලා තිබ්බා. ඒ වගේම මෘත ශරීරවල කොට විදියට ඒ කියන්නේ සම්පුර්ණයෙන්සෑහෙන දහනය විමට ඔවුන් භාජනය වෙලා තිබුණා කියලා. එම මිනිස් ශරීර ඔබලා නිරීක්ෂණය කළාද?

උ නිරීක්ෂණය කළා. එහෙමයි ස්වාමීනි

ප්‍ර එතකොට තව ඔතන මියගිය පුද්ගලයින් සිටියාද කියලා ඔබ නිරීක්ෂණය කළාද? හඳුනාගන්න පුලුවන් වුනාද?

උ ස්වාමීනි ප්‍රධාන සාලයේම පිටුපසට වෙන්නට

ප්‍ර පිටුපසද නැත්නම් එහා පැත්තටද?

උ ඒ කියන්නේ ප්‍රධාන සාලයේ දොරෙන් ඇතුලුවෙලා දකුණු පැත්තට හැරුණම ඉදිරියෙන්ම තිබුණා නිල්පාට ඇඳුමක් ඇඳගත්ත කුඩා දරුවකුගේ මාත ශරීරයකුත් එයට එහා පැත්තේ රතුපාට වගේ වැඩිහිටි කාන්තාවකගේ ශරීරයකුත් එතන වැටිලා තිබුණා. මේ දෙන්නා සම්පුර්ණ වශයෙන් දහනය වෙලා තිබුණේ නැහැ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඔබ ඔය කියන අවස්ථාවද මේ ඡායාරූපයෙන් නිරූපනය වෙන්නේ?

උ ඔව්. කුඩා පිරිමි දරුවෙක් ස්වාමීනි. පසුව අපිඅනාවරණය කරගත්තා මේ ඇවිල්ලා සහරාන් හෂීන්ගේ වැඩිමහල් පුත්‍රයා කියලා.

ප්‍ර ඔහුගේ නම මොකක්ද?

උ මොහොමඩ් සහරාන් වාසික් තමයි මේ දරුවා. සහරාන්ගේ පුතා.

ප්‍ර එතකොට ඒ දරුවාට එහා පැත්තේ වැටිලා ඉන්න කාන්තාව?

උ එහා පැත්තේ වැටිලා ඉන්න කෙනා ස්වාමීනි, සහරාන් හෂීන්ගේ නංගි වන මොහොමඩ් කාෂිම් හිදායා. ඒ දෙන්නගේ මෘත ශරීර අම්පාර මෘත ශරීරාගාරයේදී දැනට ජීවතුන් අතර ඉන්න , සහරාන් හෂීන්ගේ එක සහෝදරියක් ඉන්නවා. ඇය විසින් මේ අය හඳුනාගත්තා.

ප්‍ර මේ හිදායාගේ ස්වාමිපුරුෂයා කවුද?

උ ඉබ්‍රාහිම් ලෙබ්බේ මොහොමඩ් රිසාක්. පසුව ස්වාමීනි රෝහලේදි පරීක්ෂාවට ලක්කරන කොට මේ හිදායා කියන කාන්තාව ගැබිනි මවක් කියලාඅනාවරණය වුනා.

ස්වාමීනි මේ ඡායාරූපය C.895 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරන්නට අවසර පතනවා.

ප්‍ර එතකොට ඔය නිවසට ඇතුල්වෙලා ඒ දරුවයි , හිදායයි ඉන්න තැනට යන්න ඉස්සරවෙලා දකුණු අත පැත්තේ කාමරයක් තියෙනවාද?

උ දකුණු අත පැත්තේ කාමරයක් තියෙනවා.

ප්‍ර ඒ කාමරයේ කවුරුහරි මියගිහිල්ලා හිටියද?

උ මෘත ශරීරයක් තිබුණා ස්වාමීනි. නිරුවත් කාන්තා මෘත ශරීරයක්. දැඩිලෙස තුවාල වෙලා තිබුණේ. අපි පසුවඅනාවරණය කරගත්තා මේ තැනැත්තිය සහරාන් හසීන්ගේ අම්මා වන අබ්දුල් සතාෆ් සිත්ති උම්මා කියලා.

ස්වාමීනි එම ඡායාරූපය C.896 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර අර ඉස්සෙල්ලා ඡායාරූපයේ ගැබිණි කාන්තාවක් කියලා හඳුනා ගත්නේද? කාන්තාවක්

උ ස්වාමීනි රෝහලට ගිහිල්ලා රෝහලේදි පසුව තමයි වෛද්‍යවරයා පෙන්වාදීම මත හඳුනාගත්තේ.

ප්‍ර එම තැනැත්තියද අර ආරක්ෂිත නිවාසයක් කුලියට ලබා ගැනීමට ගිය තැනැත්තිය?

උ එසේය ස්වාමීනි. සෙන්ග්‍රල් ග්‍රාමයේ නිවස සඳහා ගිහින් තියෙන්නේ ඒ තැනැත්තිය.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ තැනැත්තිය ආරක්ෂිත නිවාසය ලබාගන්නට ගිහිල්ලා තමාට ළමයෙක් හම්බවෙන්න ඉන්නවය කතාව කියලා තමන් හඳුනාගෙන තියෙනවා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර දැන් ඔය හිදායා ගැන මම ඔබෙන් ප්‍රශ්න කෙරුවොත් හිදායා ඔබේ විමර්ශණවලදිඅනාවරණය වුනාද කොයි වෙලාවක හරි ඔබලා අර 26 වෙනිදා පරීක්ෂා කරපු ආරක්ෂක නිවස්න කිසිවක් ලබාගැනීමේදී ඊට ක්‍රියාකාරී විදියට සහභාගිවෙලා සිටිනවා කියලා?

උ ඔව් ස්වාමීනි. අනාවරණය වුනා සෙන්ග්‍රල් ග්‍රාමයේ පිහිටි නිවස ඒ කියන්නේ ගබඩාව, ගරාජය ලබාගැනිමට ගිය අවස්ථාවේ එහි අයිතිකරු විරුද්ධ වුනත්, පසුව මෙම ගැබිණි කාන්තාවගේ ඉල්ලීම මත තමයි ඒ නිවෙස් හිමි කාන්තාව කැමැත්ත ලබාදී තිබුණේ ඒ ගරාජය ලබාදීමට?

ප්‍ර ඔබ දැන් කීවානේ ඉස්සරවෙලා අර සහරාන්ගේ බිරිඳ නිවසේ ඉදලා යුධ හමුදා නිලධාරින් විසින් ගෙනැල්ලා ගිලන් රථයට දැම්මා කියලා ඒ අවස්ථාවේ ඇයට තුවාලවෙලා තිබුණාද?

උ තිබුණා. ස්වාමීනි. දුඹුරු පාට සහ කළුපාට පුල්ලි වගේ ඇගටම ඇලුන කලිසමක් තමයි තිබුණේ. සමහර තැන්වල පිච්චුන තුවාල තිබුණා. ඇය තරබාරු සුදුපැහැති තැනැත්තියක්. බරපතල තුවාල මුකුත් තිබුණේ නැහැ. නමුත් තැතිගැන්මකින් සහ කම්පනයකට ලක්වෙලා තිබුණා.

ප්‍ර ඇයගේ ඡායාරූපයක් දැක්කොත් ඔබට හඳුනාගන්න පුලුවන්ද?

උ පුලුවන් ස්වාමීනි.

ස්වාමීනි ඡායාරූපයක් සාක්ෂිකරුගේ අවධානයට යොමුකරනවා.

ප්‍ර මේ ඡායාරූපයේ පෙනෙන තැනැත්තිය ඔබට හඳුනාගන්න පුලුවන්ද?

උ ඔව්. ස්වාමීනි මෙය කුඩා දරුවාට පස්සේ ඇම්බියුලන්ස් එකට ගෙනාව අපි හඳුනාගත් සහරාන් හසීන්ගේ බිරිඳ. ඇයගේ නම අබ්දුල් කාදර් ෆාතිමා හාදියා .

ස්වාමීනි එම ඡායාරූපය C.897 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

ප්‍ර ඔබ කිව්වනේ අම්මාවත් හඳුනාගත්තාය කියලා.

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඊට පස්සේ තව වෙන මෘත ශරීර තිබුණද මේ නිවස ඇතුලේ?

උ තවත් ස්වාමීනි හඳුනාගැනීමට හැකි මෘත ශරීර එකක් තිබුණේ. ඒක ටිකක් ප්‍රමාද වෙලා හොයා ගත්තේ වහලය උඩ එකක් තිබුණා.

ප්‍ර වහලය උඩ එකක් තිබුණා. ඒ කාගේ මෘත ශරීරයද කියලා අනාවරණය වුනාද විමර්ශනවලදී?

උ අපි ඊට පස්සේ ස්වාමිනි. නිළධාරි කණ්ඩායමක් විසින් එම මෘතශරීරය පල්ලෙහාට අරගෙන හඳුනාගැනීමට කටයුතු කළා. නමුත් ඉතා අපහසු වුනා හඳුනාගන්න. නමුත් නිල්පාට ඩෙනිම් කලිසමක කොටස් තිබුණා කකුල්වල. ශරීර ස්වරූපය සහ මෘත දේහයේ ශරීරය අනුව පෙර මා සඳහන් කල නිලධාරියා මට කිව්වා සර් ඔය ඉන්නේ සි.ඩී එකේ ඉන්න

FAIR COMMENT BY JEZEEM

අනික් පුද්ගලයා. මොහොමඩ් හසින්ගේ සහෝදරයා වන රිල්වාන් කියලා.

ප්‍ර. ඔබලා විසින් හඳුනාගත්තේ මෙම තැනැත්තා රිල්වාන් බවට?

ස්වාමිනි එම ඡායාරූපය C.898 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

උ. ස්වාමිනි මේ ස්ථානයේ තියෙන ස්වරූපය අනුව කොන්ක්‍රීට් පටි වගේ තියෙන්නේ සාමාන්‍යයෙන් පල්ලෙහා ඉදලා පිපිරිමත් එක්ක, සාමාන්‍ය මේ තැනැත්තාගේ ශරීර ප්‍රමාණයත් එක්ක උඩ ඔයවගේ තැනකට යන්න

ප්‍ර පල්ලෙහා ඉඳලා විසිවෙන්න බැහැ.

උ විසි වෙන්න බැහැ ළඟ ළඟ පටි තියෙන්නේ. කොන්ක්‍රීට් පටි වගේ.

ප්‍ර එහෙමනම් මොනවගේ අවස්ථානුගත කරුණු යටතේද මේ වගේ වහලය උඩ මළ සිරුර තියෙන්ට පුලුවන්?

උ ස්වාමිනි බොහෝ විට මෙම තැනැත්තා පලායාමට හෝ එහෙම නැත්නම් ප්‍රහාරයක් එල්ල කරන්නට වහලය උඩට නැගීමට හැකියාව තියෙනවා.

ප්‍ර ඒ අවස්ථාවකදි තමයිමේ වගේ වෙන්නට පුලුවන් කියලද ඔබ කියන්නේ

උ එහෙමයි ස්වාමිනි මම නිරීක්ෂණය කරන්නේ එහෙම දෙයක් විමට හැකියාව වැඩියි කියලා. ළඟ ළඟ කොන්ක්‍රීට් වගේ පටි තමයි තියෙන්නේ ස්වාමිනි, සාමාන්‍යයෙන් ඒ වගේ ඇගක් තියෙන කෙනකුට එතනින් ඉහලට එසවීමක් වීමට අමාරුයි කියන එක තමයි අපි නිරීක්ෂණය කළේ.

ප්‍ර දැන් එතකොට ඔබ කීවා මේ නිවස 183 B කියලා. එතකොට එයිට එහා පැත්තෙත් නිවසක් තියෙනවද?

උ ස්වාමිනි මේවා යුගළ නිවාස.

ප්‍ර ඒ යුගළ නිවාසවලින් 183 B කියන එකේ තමයි මේ පිපිරීම සිද්ද වෙලා තිබුණේ.

උ එහෙමයි ස්වාමිනි

ස්වාමිනි මෙම ඡායාරූපය C.899 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා

ප්‍ර 183/ B කියන නිවාසයේ සිදුවෙලා තිබුන මේ පිපිරීම නිසා එහෙම නම් යුගල නිවාසයට අයත්වන 183/A නිවාසයට යම් හානියක් සිදුවෙලා තිබුණද එමඟින්?

උ මේනිවාස දෙක මැදින් සම්බන්ධකරන සාලයේ බිත්තියේ කුහරයක් හැදිලා තිබුණා ස්වාමිනි

ප්‍ර. ඔබලා ඒ නිවසට ගිහිල්ලා ඒ කුහරය නැරඹුවාද?

උ නැරඹුවා ස්වාමිනි

ප්‍ර එහි ඡායාරූපයක් දැක්කොත් හඳුනන්න පුලුවන්ද?

උ පුලුවන් ස්වාමීනි. පිපිරිම සිදුවු නිවසේ ඉදලා ස්වාමිනි 183/ A කියන නිවස දෙස බලන විට ඔය ආකාරයට තමයි තියෙන්නේ.

FAIR COMMENT BY JEZEEM

ප ඒ කියන්නේ එතන කුහරයක් ඇතිවෙලා තියෙනවා නේද?

උ කුහරයක් ඇතිවෙලා තියෙනවා ස්වාමිනි, ඒ වැටිලා තියෙන දේපලවල හැටියට නිශ්චිත කරන්න පුලුවන් වෙන්නේ 183/ B කියන නිවස තුල තමයි මේ පිපිරීම වුණා කියලා.

ස්වාමීනි එම කුහරයතිබෙන ස්ථානය පෙන්වන මෙම ඡායාරූපය C.900 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා .

ප ඒ හැරෙන්නට මේ යම් යම් මෘත ශරීර මේ නිවසේ සාලයේ තැන් තැන්වල තිබුණා කියලා ඔබ ?

උ එහෙමයි ස්වාමීනි.

ප එහෙමනම් අපි දැන් ඔබේ අවධානයට ඒ ඡායාරූප යොමුකරන්නට කටයුතු කරනවා.

ස්වාමිනි තවත් නියාස්ගේ ඡායාරූපයක් C.885 A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා.

ප මහෙස්ත්‍රාත්තුමා ඇවිල්ලා ස්ථානය පරීක්ෂා කරනවා නේද?

උ එහෙමයි ස්වාමීනි. මහෙස්ත්‍රාත් තුමා ඇවිල්ලා ස්ථානය පරීක්ෂා කරනවා

දැවී පිළිස්සී ගිය මෘත ශරීරවල කොටස් පෙන්වන එම ඡායාරූපය C.901 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

ස්වාමීනි වහළය පෙනෙන ආකාරය පිපිරීමෙන් පස්සේ.

එය C.902 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

ස්වාමීනි මෙම ඡායාරූපයත් දැවී ගිය මළ සිරුරක කොටස් එය C.903 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

එතන ස්වාමීනි එක වැඩිහිටි පිරිමි පුද්ගලයෙක් කියලා අපි හඳුනා ගැනීමක් කරනවා එතන ස්නාමිනි ඔහුගේ මුත්‍ර ලිංග පද්ධතිය ආශ්‍රිතව දර්ශණය වෙන්නේ. තමයි මෙය වැඩිහිටි පිරිමි පුද්ගලයෙකුගේ කියන එක තමයි අපි එතෙන්දි . නිගමනය කළේ. මෙතනත් තැනින් තැන තියෙන්නේ කුඩා දරුවන්ගේ වගේ මෘත ශරීර කොටස්. ඒවා විශාල ප්‍රමාණයක් නැහැ ස්වාමීනි. ස්වාමීනි ඔන්න ඔතන ඒ මව මියගොස් සිටි කාමරය උඩ සිමෙන්ති පොඩි ස්ලැබ් කෑල්ලක් තියෙනවා. මෙතන තිබ්ලා ස්වාමිනි. විශේෂ කාර්ය බලකාය විසින් ජෙලටිනයිට් කූරු ප්‍රමාණයක්, ඒ වගේම ඩෙටනේටර්ස් යම් ප්‍රමාණයක් අපි හොයා ගැනීමක් කරනවා. නමුත් ස්වාමීනි ඒ දේපල අපිට අධිකරණයට ඉදිරිපත් කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. මොකද විශේෂ කාර්ය බලකායෙනුත්, රජයේ රස පරීක්ෂකතුමාත් පැවසුවා, මේවා ගින්නට අසුවෙලා හින්දා මේවායේ අන්තරාදායක බව වැඩියි කියලා. ඒ අවස්ථාවේම උසාවි නියෝගයක් අරගෙන විශේෂ කාර්ය බලකාය මඟින් මේ දේපල සියල්ල විනාශයට පත්කළා.

ස්වාමීනි එම ඡායාරූපය C.904 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනවා.

FAIR COMMENT BY JEZEEM

මේ පිටුපස කාමරය ස්වාමීනි, මේ කාමරය තුල තමයි ස්වාමිනි සහරාන්ගේ බිරිඳවන අබ්දුල් කාදර් ෆාතිමා හාදියාත්, දියණිය වන මොහොමඩ් සහරාන් රුදෙනා කියන කුඩා දියණියත් රැඳී සිටියේ.

ප්‍ර දැන් ඒ කාමරයේ තියෙන යම් බෑගයක් ඔස්සේ අනතුරුව වැඩිදුර අනාවරණය පැවැත්තුවාද පසුව?

උ ඔව්. ස්වාමිනි මේ ඉදිරියෙන්ම තියෙන, මේක ගිරිඵල්ලේ ජයසුන්දර ටෙක්ස්ටයිල් කියලා වගේ තිබුණේ. ඒ බෑග් එකේ තිබුණ රෙදි සම්බන්ධයෙන් ඒ වනවිටත් විමර්ශණ කටයුතු කරමින් තිබුණේ.

ස්වාමිනි මෙම ඡායරූපය C.905 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන්නට අවසර පතනවා.

ප්‍ර එම ඡායාරූපයේ තිබ්ලා ඔබ මුදල් පසුම්බියක් එහෙම නිරීක්ෂණය කෙරුවද?

උ. නැහැ. ස්වාමිනි, ඔය බෑග් එක තුළ මුදල් පසුම්බියක් තිබුණේ නැහැ.

ප්‍ර නැහැ. මම ඇහැව්වේ ඔය කාමරයේ තිබ්ලා. ?

උ ඔව් කාමරයේ තිබ්ලා මුදල් පසුම්බියක් සොයා ගත්තා.

ප්‍ර ඔය කාමරයේ තිබ්ලා මුදල් පසුම්බියක් එහෙම ඔබ නිරීක්ෂණය කළාද?

උ ඔව් ස්වාමීනි 27 වෙනි දින නිරීක්ෂණය කලා. මෙතන තිබුන කලු පැහැති මුදල් පසුම්බියක්. මෙන්න මේ දේපල අතර.

ප්‍ර එතකොට අපිට පෙන්වන්නකෝ ඔතන තිබුණේ කියලා ඔය මුදල් පසුම්බියද කියලා?

උ මෙන්න මෙතන මේ රෙදි බෑග් සහ වෙන රෙදි තියෙන අතරේ තමයි ස්වාමිනි තිබුණේ.

ප්‍ර මොකක්ද ඒ පසුම්බිය එය කාට අයත් පසුම්බියක්ද කියලා ඔබට හොයාගන්න පුලුවන් වුනාද?

උ ඒ පසුම්බිය ස්වාමිනි මම ලබාගත්තාට පස්සේ ඒ පසුම්බිය ඇතුලේ තිබුණා ජාතික හැඳුනුම්පතක්.ඒ ජාතික හැඳුනුම්පතේ තිබුණේ පුලස්තිනි මහේන්ද්‍රන් කියලා.

ප්‍ර ජාතික හැඳුනුම්පතේ එහි විස්තර ඔබ සටහන් කරගත්තාද?

උ ස්වාමිනි ඒ අවස්ථාවේදි මගේ සහායට සිටි පොලිස් සැරයන් 28585 කරුණාරත්න මගේ ආරක්ෂක නිලධාරියා ලෙස සිටියේ. මම ඒක එයාගේ අතට දීලා කිව්වා මේකේ අයිඩී එකක් තියෙනවා .සල්ලි වගයකුත් තියෙනවා. මේක තියාගන්න. මේක ඉන්ක්වයිර් එකක් කරන්න අවශ්‍ය වෙනවා කියලා. ඊට පස්සේ ස්වාමිනි ඒ අවස්ථාවනවිටත් අනෙක් සොකෝ නිළධාරින් අනිත් බඩු මාර්ක් කරලා සමහර දේවල් සාම්පල අරන් තිබුණා. ඊට පසු මේ අයිඩින්ටි කාඩ් එක අපි වෙක් කරලා බැලුවා. එතකොට මගේ පෙර කී නිලධාරියා කිව්වා සර් ඔය තැනැත්තියගේ ඕක නෙමෙයි නම. මේ තැනැත්තිය පෙනී ඉන්නේ සාරා ජෙස්මින් කියලා. එයා ද්‍රවිඩ ආගමේ ඉඳලා මුස්ලිම් ආගමට ඇවිල්ලා

FAIR COMMENT BY JEZEEM

තියෙන්නේ. හින්දු ආගමේ ඉඳලා මුස්ලිම් ආගමට ඇවිල්ලා තියෙන්නේ. දැනට භාවිතා කරන නම මේක කියලා. ඊට අමතරව කීවා හස්තුන් කියන බෝම්බ ප්‍රහාරයෙන් මියගිය ප්‍රාහාරකයාගේ බිරිඳ කියලා අනාවරණය වුනා.

ප එච්චරයිද එතකොට ඔබ සොයාගත්තේ?

උ ඒකේ තිබිලා ස්වාමිනි Indenty card එකට අමතරව රු.1000 නෝට්ටු 02ක්. රු. 500 නෝට්ටුවක්. 100 නෝට්ටුවක්, 50 නෝට්ටු 02ක් . 20 නෝට්ටු 01ක් රු. 5 කාසි එකක්, සම්පත් බැංකුවේ බැංකු කාඩ් පත් එකක් කොමර්ෂල් බැංකුවේ බැංකු කාඩ්පත් 01ක්, සුදුපැහැති කඩදාසියක ඔතන ලද metlin නම් බෙහෙත් කරල්, 18 ක් අඩංගු කාඩ් පත් එකක්. සුදු පැහැති කුඩා ගල් අල්ලන ලද අඟල් දෙකක් පමණ දිග රන් පැහැති ටසල් කරාබු ජෝඩුවක්, සුදු පැහැති නම සඳහන් key tag එකක් , රන් භාණ්ඩ පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් වූ ලදුපතක්, ද්‍රවිඩ භාෂාවෙන් ආහාර ඇණවුම් තොරතුරු ඇතුලත් ආහාර ඇනවුමක්.. නිල්පාට කාබන් පෑනකින් දුරකතන අංකයන් 04ක් සටහන් කර ඇති කුඩා කඩදාසි කැබැල්ලක් හමුවුනා. ඒ දේපල ස්වාමිනි ඊට පසුදින අම්පාර මුලස්ථාන මොකද ප්‍රධාන පොලිස් පරීක්ෂක කණ්ඩායම අම්පාරේ සිට ක්‍රියාත්මක වන හින්දා, අම්පාර මුලස්ථාන පොලීසියට දේපල කුවිතාන්සි අංක 510/19 යටතේ ඉදිරිපත් කළා.

ස්වාමිනි ඔබ තුමන්ලාගේ ගරු අවධානය යොමුකරන්න කැමැතියි අර ඉරි සහිත ඇඳුම කියන ස්ථානය මෙතන කොනේ ඒ වගේ ඇඳුමක් තමයි හාදියා ඇඳගෙන හිටියේ. එතකොට මේ කාමරයට ඇතුල්වන ස්ථානයේ තමයි සහරාන්ගේ දරුවාත්, ඒ වගේම හිදායාත් ඉන්නේ ස්වාමිනි.ඒ ස්ථානයේම

ස්වාමිනි මෙතන තියෙන්නේ වෙනත් මෘත ශරීරයක කොටසක්. අධිකරණ වෛද්‍ය නිලධාරිතුමා කකුලක වගේ කොටසක් තමයි . ස්වාමිනි එතන ඉදලා හොයා ගත්තේ. එය කුඩා දරුවෙක්ගේ කකුලක කොටසක් කියලා තමයි දැනුවත් කලේ වෛද්‍ය නිලධාරිතුමා.

ස්වාමිනි එම ඡායාරූපය C.895/ A අක්ෂරයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර පතනවා

ස්වාමිනි මේ ඡායාරූපය C.906 ලෙසත්,ඊලඟට මේ ඡායාරූපය C.906 A ලෙසත් ලකුණුකර ඉදිරිපත් කිරීමට අවසර පතනවා

මින්පසු සටහන් ගැනීම ල/ලේ ඉන්ද්‍රාණි.

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ යමුනා මිය
දැන් වේලාව : ප.ව. 6.30 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

(ස්වාමීනි පතොරම් කොපුවක් තිබෙන බව පේනවා මෙම ඡායාරූපයේ. එය C-907 ලෙස ලකුණු කිරීමට අවසර අයැද සිටිනවා)

(ඒ වගේම පතොරම මෙම ඡායාරූපය C-907(a) ලෙස ලකුණු කිරීමට අවසර අයැද සිටිනවා)

පි : ඒක ස්වාමීනි ජීව පතොරමක්. ඒ කියන්නේ වෙඩි තැබීමට භාවිතා කරන්න හැකි ජීව පතොරමක්.

ප්‍ර : කොහොමද ඔබ කියන්නේ?

පි : ඒකේ ඉදිරිපස මේ කොටස තියෙන්නේ.

ප්‍ර : ස්වාමීනි ඒ දෙකේ වෙනස සාක්ෂිකරු කියනවා. ඊළඟ එකට ...?

පි : මේකත් ස්වාමීනි ජීව පතොරමක්.

(ස්වාමින් එම ඡායාරූපය C-907(b) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා)

ප්‍ර : මේක මොකද්ද?

පි : ස්වාමීනි මේ ඡායාරූපයේ තියෙන මෙන්න මේ කළු සුදු දේ තමයි ස්වාමීනි සහරාන් හෂීම් සමඟ පාස්කු ප්‍රහාරය 04.21වෙනිදා එල්ල කළ අයවළුන් දිවුරුම් දෙන අවස්ථාවේදී ඔවුන්ගේ හිස ආවරණය කිරීමට, සහරාන් හෂීම් හැර අනිත් අය හිස ආවරණය කරන්න යොදා තිබුණු ඊට සමාන දෙයක් තමයි මේ ස්වාමීනි.

(ස්වාමීනි එම ඡායාරූපය C-908 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා)

ප්‍ර : ඔය කාමරයද?

පි : නැහැ ස්වාමීනි කාමරය නෙමෙයි. ජෙලටිනයිට් ටික අපි ඊට පසුවෙනිදා උදේ තමයි ස්වාමීනි අතන උඩ තිබිලා හොයා ගන්නේ. ඉන් අනතුරුව බිමට අරගෙන ගත්ත Photos වගයක් තියෙන්නේ.

ප්‍ර : මේ ඡායාරූපය ඔබට කියන්න පුළුවන්ද කොහේ එකක්ද කියලා?

පි : පිපිරීම සිදු වුණ ගෙදරට යුගල නිවාසේ අනිත් පැත්තේ ගෙදර.

ප්‍ර : ඒ කියන්නේ 183 ඒ?

පි : 183 ඒ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM
President's Secretary's Copy

(ස්වාමීනි මෙම ඡායාරූපය C-909 ලෙස ලකුණු කොට ඉදිරිපත් කරනවා)

(එහි ස්වාමීනි අර 183(b) නිවස පැත්තෙන් ඇති වෙච්ච ඒ හිල ස්වාමීනි පිපිරීම නිසා එය මනාව ප්‍රදර්ශනය වෙනවා මේ 183(a) ස්ථානයේ තියෙන නිවසේ)

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : මිස්ටර් විජේසේකර දැන් මෙම ප්‍රහාරය සිදු වෙච්ච ගෙදරටම යාබඳ නිවසනේ මේ ගෙදර. මෙම සිදුවීම වෙනකොට මේ ගෙදර මිනිසුන් ඉඳලා තියෙනවද නැත්නම් ඔවුන් ගෙදරින් අයින් වෙලා ගිහිල්ලා තිබුණද? මේ ගෙදර හිටියද තුවාල වෙච්ච අය කවුරු හරි?

පි : ස්වාමීනි මට ඒ ගැන නම් නිශ්චිතවම කීමට හැකියාවක් නැහැ. මොකද ඊට පහුවෙනිදා තමයි අපිට ඔය ගෙවල්වල කවුද හිටියේ කියන එක ඊට පහුවෙනිදා තමයි විමර්ශනයේදී අනාවරණය කර ගන්නේ. එදා රෑ සියළුම නිවෙස් වහලා කට්ටිය ගෙවල් ඇතුළෙම තමයි හිටියේ. නමුත් මේ ගෙදර හිටියද කියන එක අපිට, රෑ අපි ඇතුළට නොගිය හින්දා අපිට හරියට පැහැදිලිව කියන්න හැකියාවක් නැහැ ස්වාමීනි.

ප්‍ර : දැන් මේ ගෙදරට පිටිපස්සෙනුත් අර පොඩි තාප්පයකින් එහා පැත්තෙත් ගෙදරක් තිබුණනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : පිටිපස්ස පැත්තෙන්. ඒ ගෙවල්වල තොරතුරු ඔබලාගේ විමර්ශනවලදී සොයා ගත්තාද ඒ වෙලාවේ මිනිසුන් හිටියද, ඒගොල්ලෝ ගිහිල්ලද?

පි : ඒ සම්බන්ධයෙන් කල්මුණ මූලස්ථාන පොලීසියෙන් තමයි ස්වාමීනි සියළුම, ඒ ප්‍රදේශය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ටික කළේ.

ප්‍ර : එහෙමනම් මේ ගෙදරත් ඔය සිදුවීම වෙන්න ඉස්සරලා මිනිසුන් ගියාද ඒ තොරතුරු ඇති නේද ඒ විමර්ශනයේ?

පි : විමර්ශනයේදී ස්වාමීනි හිටපු කට්ටිය සියළු දෙනාගෙන් අපි ප්‍රකාශ ගත්ත හින්දා අනිවාර්යයෙන්ම මේ ගෙදර කවුරු හරි, ඒ කියන්නේ සිදුවීමෙන් පසු දින හිටියානම් අපි ප්‍රකාශයක් ගන්නවා ඒගොල්ලොන්ගෙන්.

ප්‍ර : ඒ පිළිබඳ තොරතුරු කිසිවක් ඔබ දන්නේ නැතුව ඇති. මොකද මේ ගෙදර විශාල පිරිසක්නේ. පොඩි ගෙදරක ලොකු සංඛ්‍යාවක් ඇවිල්ලා අර එහෙම මෙව්වා වෙලා තිබුණා වුණත් අර සද්ද බද්ද හරි ඇහෙන්න ඕනනේ එහා ගෙදරට. එකට බිත්ති දෙක යා වුණත්

FAIR COMMENT BY JEZEEM

පිටිපස්ස පැත්තෙන් මම හිතන්නේ පොඩි ඉඩක් තිබුණානේ අර පිටිපස්සේ ජනේලයෙන්?

පි : ස්වාමීනි මේ පුද්ගලයන් පැමිණ දින ගණනාවක් ඒ ස්ථානයේ රැඳී හිටියා කියලා අපට අනාවරණය වෙන්නේ නැහැ. වරින්වර ඇවිල්ලා තියෙන්නේ. නමුත් සියළු කට්ටිය ඇවිල්ලා තියෙන්නේ 26 වෙනිදා හවස කියන එක තමයි විමර්ශනයේදී අපට අනාවරණය වුණේ.

හොඳයි. බොහොම ස්තුතියි.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : දැන් ඔය නිවසේ ඇතුළත පිළිබඳවනේ ඔබ කිව්වේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ සිදු වුණු හානිය, මිය ගිහින් සිටි අය පිළිබඳව ඔබ විස්තර කෙරුවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ වගේම ඔබ කිව්වා නියාස් කියන තැනැත්තා මේ නිවස ඉදිරිපස වෙඩි වැදී වැටිලා හිටියා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතන යම් වාහනයක් නවත්වලා තිබුණාද?

පි : ගේට්ටුවට ඉදිරියෙන් ස්වාමීනි අළු පැහැති අර මීට පෙර අපි නින්දවූර් ගෙදර තිබුණු ප්‍රමාණයේම වාහනයක් නවත්වලා තිබුණා. හැබැයි ඒක රෙජිස්ටර් කරපු වාහනයක්.

ප්‍ර : ඔව්. එයට යම් හානි සිදු වීමක් වෙලා තිබුණද මේ සිද්ධියෙන්?

පි : ඔව්. පිපිරීම හින්දා වුණාද කියන්න අමාරුයි ස්වාමීනි. නමුත් වෙඩි ප්‍රහාර කිහිපයක් එල්ල වෙලා තිබුණා. මොකද රාත්‍රියේම මේ වාහනය ගැන සැකය ඇතිවෙන හින්දා යුධ හමුදාවෙනුත් වෙඩි තැබීම් කිහිපයක් මේ වාහනය වෙත එල්ල කරලා තිබුණා.

ප්‍ර : හරි. ඒ ඡායාරූපය නැවත දැක්කොත් ඔබට අඳුරන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමීනි.

(ස්වාමීනි ඡායාරූපයක් සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා)

ප්‍ර : මේ ඡායාරූපයේ නිවසක් පේනවා. එය ඉදිරියේ වාහනයක් පේනවා නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ නිවස මොකද්ද? ඒ වාහනය මොකද්ද?

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමීනි මේ නිවස 183 බී, පිපිරීම සිදු වූ නිවස. ඊට එහා පැත්තේ 183 ඒ. ඒ දෙක අතර තියෙන වාහනය තමයි මේගොල්ලෝ, මේ පිරිස මෙම ස්ථානයට පැමිණියේ යැයි කියන වාහනය.

(ස්වාමීනි එම ඡායාරූපය C-910 ලෙස ලකුණු කොට ඉදිරිපත් කරනවා)

ප්‍ර : මේ වාහනයේ ලියාපදිංචි අංකය මොකද්ද?

පි : ස්වාමීනි PJ-4138 වගේ මතකයක් තමයි තියෙන්නේ.

ප්‍ර : ඔය EP PJ-4138 දරන ඔය වාහනයේ ලියාපදිංචි අයිතිකාරයා කවුද කියලා ඔබේ විමර්ශනවලදී අනාවරණය වුණාද?

පි : ස්වාමීනි අපේ විමර්ශන කණ්ඩායම් කිහිපයක් පත් කරලා තමයි ඒක කළේ. නමුත් මට පැහැදිලිව මතකයක් තියෙනවා කල්මුණේ ප්‍රදේශයේ, කල්මුණේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක මේක අනාවරණයක් කර ගත්තා කල්මුණේ ප්‍රදේශයේ පදිංචි කෙනෙක්ගේ කියන එක. දැනට මගේ ළඟ නම් සටහන් එහෙම මොකුත් නැහැ මේ සම්බන්ධයෙන්. මම උපදෙස් දීමක් පමණයි කළේ.

ප්‍ර : හරි. දැන් එහෙනම් ඔබට ඊළඟට කියන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට ....?

පි : ස්වාමීනි මේ නිවස තුළ තිබිලා මහා බැංකුවෙන් අර මුදල් නිකුත් කරනකොට ඒ සල්ලි මිටි වශයෙන් තියෙනකොට උඩින් දාන කොළ දෙකක් අපට හම්බ වෙනවා.

ප්‍ර : ඔබ කිව්වා අර ගෑස් ටැංකියේ යම් යම් ස්ථානවල හිල් තිබුණා කියලා?

පි : එහෙමයි ස්වාමීනි. ඒ සමහර සිදුරු තුළ සයිකල් බෝල, මෙන්න මෙතන සයිකල් බෝලයක් ස්වාමිනි. මෙතන සයිකල් බෝලයක්. සයිකල් බෝල තමයි තිබෙන්නේ.

(ස්වාමීනි එම ඡායාරූපය C-911 ලෙස ලකුණු කොට ඉදිරිපත් කරනවා)

ප්‍ර : මේ Bags කොහෙන්ද හොයා ගත්තේ Back packs?

පි : අර පිටිපස්සේ කාමරයේ දෙකක් තිබුණා. අනිත් එක සහරාන්ගේ මව හිටිය කාමරයේ තමයි තිබුණේ.

(ස්වාමීනි එම බෑගයන් පෙන්නුම් කරන ඡායාරූපය C-912 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)

ප්‍ර : Central Bank of Sri Lanka මේ තියෙන්නේ. Five Thousand. Value Five Thousand?

පි : Five Thousand Notes 1000 ක්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මෙතන යට තියෙනවා Number එක මොකද්ද?

පි : ඒ සම්බන්ධයෙන් ස්වාමීනි එම අවස්ථාවේම අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව දැනුවත් කරලා මේ වගේ තවත් කොළයක් තිබුණා ඒ මුදල් කාටද නිකුත් කිරීම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කරන්න කියලා උපදෙස් CID එකට අපි කිව්වා ඒ සම්බන්ධයෙන්, CID එකේ Unit එකක් මහ බැංකුවේ තියෙන හින්දා.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඒ සම්බන්ධයෙන් තොරතුරු ඔබට ලැබුණේ නැද්ද?

පි : නැහැ ස්වාමීනි.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

(ස්වාමීනි එම ඡායාරූපය C-913 ලෙස ලකුණු කිරීමට අවසර අයැද සිටිනවා)

(ස්වාමීනි Central Bank of Sri Lanka කියලා සටහන් වෙලා, මුද්‍රාවක් සහිතව, ඒ වගේම LKR5000 Notes 1000 යි. Value Million 05 යි වශයෙන් දැක්වෙන ඒ ඡායාරූපය තමයි C-913(a) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා)

පි : ස්වාමීනි මේ අර බෑග්වල තිබුණු Tag එකක්.

ප්‍ර : ඒකේ යම් වැදගත්කමක් තියෙනවද?

පි : ස්වාමීනි ඒ බෑග්වල මම හිතන්නේ ඒක භාවිතා කරලා නැති හින්දා ඒක හයි කරලා තිබුණේ. අපි උත්සාහ කළේ ඔය ටිකක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර ගත්තේ. ලංකාවට ගෙනාපු කවුරු හරි ඉන්නවද. කොහෙන්ද මේ බෑග් ටික එක ස්ථානයකින් මිලදි ගැනීමක් සිද්ධ වෙලා තියෙනවා නම් ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරන්න තමයි කටයුතු කළේ.

(ස්වාමීනි මේ Back Pack එකට අදාළ මේ ලේබලය එහි Reference Pack කියලා තියෙනවා ස්වාමීනි. එය 707.804, එම ලේබලය C-914 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා)

ප්‍ර : මේ ඔක්කොම සියළුම දේවල් ඔබ කළේ එතකොට 27 වෙනිදා අප්‍රේල් මාසේ නේද. එතකොට ඔබ කිව්වා එදින මෙම ස්ථානයට ඒ කියන්නේ අංක 183 බී කියන මේ පිපිරුම් සිදු වූ ස්ථානයට ගරු

FAIR COMMENT BY JEZEEM

මහේස්ත්‍රාත්තුමාත්, ඒ වගේම රජයේ රස පරීක්ෂකතුමාත් පැමිණියාය කියලා?

පි : එහෙමයි ස්වාමීනි. ඊට අමතරව විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා රුවිර මහත්මයාත් පැමිණියා ස්වාමීනි.

ප්‍ර : එතකොට මේ මෘත ශරීරවලට මොකද කළේ?

පි : මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් අනතුරුව රජයේ රස පරීක්ෂක මහත්වරු අදාළ මෘත ශරීර නිරීක්ෂණය කරලා පිපිරුම් ස්ථානවලින් සාම්පල් ගත්තා. ඊට පස්සේ ස්වාමීනි විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාගේ මහපෙන්වීම යටතේ ඒ සියළුම මෘත ශරීර අපි ඉටි කවරවල දාලා අම්පාර මහ රෝහලට යැව්වා පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු කරන්න.

ප්‍ර : එතකොට මෘත ශරීර කීයක් මෙතන තිබිලා සොයා ගනු ලැබුවද ඔබේ විමර්ශන සටහන් අනුව?

පි : ස්වාමීනි ගේට්ටුව ඉස්සරහා හිටපු නියාස්ගේ මෘත ශරීරය, ගේට්ටුවෙන් ඇතුළේ ෂයිනිගේ, වහලේ උඩ හිටපු රිල්වාන්ගේ, ඊට අමතරව පුතාගේ.

ප්‍ර : ඒ කියන්නේ සහරාන්ගේ පුතා?

පි : සහරාන්ගේ පුතාගේ. ඊට අමතරව සහරාන්ගේ අම්මාගේ හාදියාගේ. සහරාන්ගේ සහෝදරියගේ.

ප්‍ර : සහරාන්ගේ අම්මා කියලා කියන්නේ අබ්දුල් සතා සිත්ති උම්මා?

පි : සහෝදරිය.

ප්‍ර : මොහොමඩ් කාසිම් හිදායා?

පි : ඔව්.

ප්‍ර : එතකොට හිදායාගේ පුරුෂයා?

පි : අනිත් අයගේ මෘත ශරීර ස්වාමීනි හඳුනා ගැනීමට බැරි වුණා කාගේවත්.

ප්‍ර : ඊබ්‍රාහිම් ලෙබ්බේ මොහොමඩ් රිෂාඩ් කියන මේ හිදායාගේ ස්වාමි පුරුෂයාගේ මෘත ශරීරය හඳුනා ගත්තේ නැද්ද?

පි : නැහැ ස්වාමීනි. හඳුනා ගැනීමක් කළේ නැහැ.

ප්‍ර : ෆෙරෝසගේ?

පි : ෆෙරෝසගේත් හඳුනා ගැනීමක් කළේ නැහැ ස්වාමීනි.

ප්‍ර : දැන් ඔක්කොම මෘත ශරීර, එතකොට ළමුන් කී දෙනෙක් හිටියද?

පි : ස්වාමීනි එතන ඒ ඇතිවෙලා තිබුණු තත්ත්වය අනුව අපට නිශ්චිතව කියන්න බැරි වුණා. නමුත් වෛද්‍යවරයා අපිට දැනුවත් කළ ප්‍රමාණයට ස්වාමීනි වැඩිහිටි පිරිමි 05 යි, වැඩිහිටි කාන්තා 05 යි, පිරිමි ළමුන් 02 යි, ගැහැණු ළමුන් 03 යි, හඳුනා ගැනීමට

FAIR COMMENT BY JEZEEM

නොහැකි 01 ක් කියලා තමයි. එතකොට ඔක්කොම 16 ක් කියලා තමයි කිව්වේ.

ප : දැන් ඔබ කිව්වා අර කාමරයේ තිබිලා මහේන්ද්‍රන් පුලස්තිනීගේ පර්ස් එකක්, මුදල් පසුම්බියක් සොයා ගනු ලැබුවාය කියලා ඔබ විසින්?

පි : එහෙමයි ස්වාමීනි.

ප : එතකොට ඔය ගෙදර ඇය මිය ගිහිල්ලා තිබුණද නැද්ද කියන කරුණ අනාවරණය වුණාද විමර්ශනයේදී?

පි : විමර්ශනයේදී ස්වාමීනි මොහොමඩ් ...,

ප : ඔය සිද්ධියෙන්?

පි : සහරාන්ගේ බිරිඳ වන අබ්දුල් කාදර් ෆාතිමා හාදියාගේ ප්‍රකාශය ලබා ගැනීමේදී ඒ තැනැත්තිය ප්‍රකාශය ලබා දීමේදී පොලිස් නිලධාරීන්ට පවසා සිටලා තියෙනවා සාරා මේ ගේ ඇතුළේ සිටියා කියන එක. ඊට අමතරව පසු විමර්ශනවලදී අපි අත් අඩංගුවට ගත්තා ස්වාමීනි කල්මුණේ සියාම් කියලා සහරාන් සමඟ සම්බන්ධතාවයක් පවත්වලා, ඒ වගේම පුහුණුව ලබපු එක්කෙනෙක්. ඒ තැනැත්තා තමයි ස්වාමීනි 04.26 වෙනි දින නින්දවූර් ගෙදර හවස 2.00 ට විතර, සමාවෙන්න ස්වාමීනි හවස නියාස් කියන පුද්ගලයා Call එකක් දීලා කියලා තියෙනවා කල්මුණේ සියාම්ට. පාලමුනේ ආයුර්වේද ඉස්පිරිතාලය ළඟට එන්න. පොඩි ප්‍රශ්නයක් වෙලා තියෙනවා. ප්‍රධාන පාරේ අපට යන්න බැහැ. අපි ඇතුළේ පාරෙන් යන්න ඕන එන්න කියලා. එතකොට කල්මුණේ සියාම් යනවා පාලමුණේ ආයුර්වේද රෝහල ළඟට. කල්මුණේ සියාම් ඉස්සරහා බයිසිකලයෙන් එනකොට මීට පෙර ඡායාරූපයෙන් මම හඳුනා ගත්තේ අළු පැහැති කුඩා වාහනයෙන් තමයි එන්නේ. කට්ටිය එන්නේ. එතනදී කල්මුණේ සියාම්ගෙන් ප්‍රකාශ ගැනීමේදී සියාම් කියනවා කාන්තාවෝ තිදෙනෙක් හිටියා. එක්කෙනෙක් හඳුනා ගත්තා සාරා කියලා. සාරා මීට ඉස්සරලා හඳුනන්නේ නැහැ. නමුත් රූපවාහිණියේ ගිය ඡායාරූපවලදී එයාගේ ඡායාරූපය හඳුනා ගත්තා. ඒ තැනැත්තිය මේ ඇතුළේ හිටියා කියන එක. ඒ සාක්ෂි දෙක තමයි ස්වාමීනි ප්‍රධාන වශයෙන් මේ තැනැත්තිය මෙතන හිටියා කියන එක අනාවරණය වුණේ.

ප : ඒ කියන්නේ ඇය මේ ගෙදරට ඇවිල්ලා හිටිය බව අනාවරණය වුණේ?

පි : අනාවරණය වුණේ. ඊට අමතරව ස්වාමීනි නින්දවූර් ගෙදර ගේ අයිතිකරු හවස 2.30 ට 3.00 ට විතර ගෙදරට ඇවිල්ලා

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

බලනකොට මේ නින්දවූර් ගෙදර හිටපු කට්ටිය හදිසියේම මෙතන පිටවෙලා ගිහින් තිබුණා. ඒ යන්නත් හේතුව වුණේ මේ ගෙදර පදිංචි අයවළුන්ට කියලා තිබුණා පල්ලියේ ලියාපදිංචි වෙන්න එහෙම නැත්නම් මෙහෙන් යන්න කියලා.

ප්‍ර : නින්දවූර් ගෙදර?

පි : නින්දවූර් ගෙදර.

ප්‍ර : ඒ අනුව දැන් ඔවුන් ඔබලා යන අවස්ථාව වෙනකොට ඒ ගෙදර හිටියේ නැහැ?

පි : හිටියේ නැහැ ස්වාමීනි. ඒ ගෙදර ඉන්න අනිත් තැනැත්තන් බොහෝ අවස්ථාවල කාන්තා කට්ටිය මුහුණු ආවරණය කරගෙන ඉඳලා තියෙන්නේ. ඒ නිසා ඒ ගෙදර අයිති පුරුෂයාටවත් එයාගේ පුතාටවත් ඒගොල්ලෝ මුහුණ නිරාවරණය කරලා නැහැ. ඒ හින්දා තමයි කවුද කියන එක හරියාකාරව හඳුනා ගැනීමට බැරි වුණේ. ඒක පසුව විමර්ශනයේදී ස්වාමීනි සාමාන්‍යයෙන් මුස්ලිම් ආගමේ පුරුෂයා මිය ගියාට පස්සේ කාන්තාව වෙනත් පිරිමි මුණ ගැහෙන්නේ නැත්නම් බැහැරට යාමක් කරන්නේ නැහැ. අන්න ඒ ආගමික සංකල්පය හින්දා අනෙක් පිරිමි අය කාටවත් මේ කට්ටියගේ මුහුණවල් නිරාවරණය කරගෙන තිබුණේ නැහැ.

ප්‍ර : එතකොට මේ නිවසේ ඉඳලා ඒ කියන්නේ අංක 183 බී මේ නිවසේ ඉඳලා මිය ගිය බවට කරුණු ඉදිරිපත් වුණ අයට අදාළව DNA පරීක්ෂාවන් සිදු කෙරුවද කියන්න ඔබ දන්නවද?

පි : ඔව් ස්වාමීනි. 28 වෙනි දිනම මෘත ශරීරවලින් පළමු අවස්ථාවේ සාම්පල් ලබා ගැනීමක් කරලා අධිකරණ වෛද්‍ය නිලධාරී රුවිර මහත්මයා පොලිස් නිලධාරීන් භාරයේ ඒක රජයේ රස පරීක්ෂක කාර්යාලයට එව්වා. ඊට පස්සේ ඒ මෘත ශරීර ටික භූමිදානය කරන්න ස්ථානයක් නැතුව කල්මුණේ ප්‍රදේශයේ කට්ටිය කල්මුණේට ගේන්න එපා කිව්වා, කාත්තන්කුඩි කට්ටිය කිව්වා ඒ පැත්තට ගේන්න එපා කියලා. ඊට පස්සේ ගැටළුකාරී තත්ත්වයක් වුණා මේ ටික රඳවා තබා ගැනීම. මොකද ප්‍රමාණවත් ශීතකරණ තිබුණේ නැති හින්දා. ඊට පස්සේ අපි අම්පාර බුද්ධංගල පාරේ පොදු සුසාන භූමියේ සිංහල කට්ටියගේ දැඩි විරෝධතාවය මැද අපිට ඉදිරි විමර්ශන සඳහා අවශ්‍ය වෙනවා කියලා ඒ කට්ටිය දැනුවත් කරලා අපි භූමිදාන කිරීමක් කළා. ස්ථිර දින කියන්න බැහැ ස්වාමීනි. ඊට පස්සේ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවෙන් අධිකරණ විශේෂඥ වෛද්‍ය රුවිර මහත්මයා දැනුවත් කරලා තිබ්බා සමහර එවපු සාම්පල්වලින් සාම්පල් ගන්න හැකියාවක් නැහැ. ආපහු මෘත ශරීරවලින් ඇට

Proof Not Certified Copy
FAIR COMMENT BY JEZEEM

කොටස්, දත් ඒ වගේ ස්ථිර වශයෙන් ගන්න පුළුවන් සාම්පල් එවන්න කියලා. ඒ අනුව අපි බුද්ධංගල සුසාන භූමියේ වළ දමා තිබුණු මෘත ශරීර ආයෙත් දවසක අම්පාර මහේස්ත්‍රාත් දිසා විනිසුරුතුමියගේ නියෝගයක් පරිදි සාම්පල් පුද්ගලිකව අධිකරණ විශේෂඥ වෛද්‍ය රුචිර මහත්මයා විසින් ලබාගෙන රජයේ රස පරීක්ෂක කාර්යාලවලට යැව්වා. පළවෙනි අවස්ථාවේදී අපි ඒ මෘත ශරීර තැන්පත් කරනකොටම කුඩා දරුවන්ගේ ටික වෙනම තැන්පත් කළා. ඊට පස්සේ අපි කුඩා දරුවෝ හින්දා ආගමික පූජකයෙක් ගෙනල්ලා ආගමානුකූලව තමයි ඒගොල්ලොන්ගේ ටික භූමිදාන කටයුතු කළේ. නමුත් අනිත් අයගේ ඒවාට අපි එහෙම භූමිදාන කටයුත්තක් කරන්න, ඒ ආගමික වතාවත් කරන්න දුන්නේ නැහැ. ඒගොල්ලෝ වෙනම තමයි කළේ. ඉතිං ඒ මෘත ශරීර තියෙනකොටත් අපි හදුනා ගැනීමේ සළකුණු සහිතව ස්ථිර ඒ වළ ඇතුළ වෙනම ගඩොල් පේළි තියලා යම් අවස්ථාවක මෘත ශරීර එකතු වීමක්වත් වෙන්න බැරි විදියට තමයි ඉටි කොළවල දවටලා නිසි ක්‍රමානුකූලව මේ දේ කළේ.

ප්‍ර : මිහිදන් කිරීම කළේ?

පි : මිහිදන් කිරීම කළේ. ඉන් අනතුරුව ඒ ලබාගත් සාම්පල් සියල්ල අධිකරණ විශේෂ නිලධාරීතුමා විසින් රජයේ රස පරීක්ෂකතුමා වෙත යොමු කළා. ඒ අතර ස්වාමීනි මේ විමර්ශන කටයුතුවලට මම සහාය වෙමින් හිටියා. කල්මුණ සියාම් කියන සැකකරු භාරයේ තිබ්ලා අපි මගේ උපදෙස් පරිදි ලැප්ටොප් පරිගණකයක්, ඒ වගේම ලක්ෂ 58 කට ආසන්න මුදලක් අපි අත් අඩංගුවට ගැනීමක් කරනවා ස්වාමීනි.

ප්‍ර : කලපුවේදී තිබ්ලා යම් CD තැටි, ඒ වගේම ලැප්ටොප් එහෙම සොයා ගත්තවද?

පි : පොලිස් පරීක්ෂක ඉද්දගොඩ නිලධාරියා තමයි ස්වාමීනි ඒ වැටලීම කරන්නේ. මම මීට පෙර සඳහන් කළ බුද්ධි නිලධාරියා තමයි ප්‍රධාන වශයෙන් දායකත්වය දක්වන්නේ. ඊට අමතරව ස්වාමීනි මම මීට පෙර සඳහන් කළ බුද්ධි නිලධාරියා අපිට තොරතුරක් ලබා දෙනවා ස්වාමීනි මොහොමඩ් රිල්වාන් කියන 2018 වසරේ ඔහුගේ අත තුවාල වෙන අවස්ථාවේ ඒ ස්ථානයේ තිබුණු යම් යම් දේපළවල කොටසක් කාත්තන්කුඩි යම් ස්ථානයක වළ දාලා තියෙනවා. ඒ ස්ථානයේ පරීක්ෂාවට නිලධාරීන් කණ්ඩායමක් ඉල්ලනවා. ඒ අනුව ස්වාමීනි මම ..,

ප්‍ර : එම ස්ථානයට ගිහිල්ලා පරීක්ෂා කරලා බැලුවද?

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමීනි මම එම ස්ථානයට ගියේ නැහැ. මොකද ඒක මඩකලපු කොට්ඨාශයට අයත් ස්ථානයක් හින්දා. නමුත් පෙර දැනුම් දුන් නිලධාරියාත්, ඊට අමතරව අම්පාර කොට්ඨාශයේ පොලිස්. ගුණසේකරත් ගිහිල්ලා ඒ ස්ථානයේ ස්වාමීනි එම පිපිරීම වන අවස්ථාවට සහභාගී වෙලා හිටිය, සක්‍රීයව යම් යම් ක්‍රියාවලට දායකත්වය වෙච්ච කෙනෙක් මාර්ගයෙන් ඒ දේපළ හොයා ගත්තා. ඒ දේපළ අතර ස්වාමීනි කුඩා යකඩ බට කෑල්ලකට දෙපැත්තෙන් Thread දාලා සවි කරන ලද යම් උපකරණයක් තිබුණා. වයර් ටිකක්, LED බල්බ් කිහිපයක්, පුපුරණ ද්‍රව්‍ය සැක කටයුතු දෙයක්, අත් අඩංගුවට ගත්ත භාණ්ඩ වැඩිදුර පරීක්ෂා කිරීමේදී පෙර මේකට සක්‍රීයව දායකත්වය වූ නිලධාරියා දැනුම් දුන්නා රිල්වාන්ගේ අත Blast වෙලා ඉතිරි බඩු ටික තමයි මේ ටික කියන එක. ඒ දේපළත් අපි ගෙනල්ලා අම්පාර පොලිස් ස්ථානයට ඉදිරිපත් කිරීමක් කළා.

ප්‍ර : කොයි ප්‍රදේශයේ තිබිලද මේවා ඔබේ භාරයට ගත්තේ?

පි : ස්වාමීනි ඒක පොලිස්. ගුණසේකර ගත්තේ, කාත්තන්කුඩි ප්‍රදේශයෙන් තමයි ගත්තේ. මේ ඡායාරූපයේ ස්වාමීනි මම ඒක විශේෂයෙන්ම මෙතන සඳහන් කරන්න හේතු වුණේ අර බොලිවෙරියන් ග්‍රාමයේ ගෙදර සිවිල් ජනතාව ඉන්නකොට තුවක්කුවට අමතරව සැමන් ටින් එකක් වගේ එකක් පෙන්නුවා කියලා කියනවා.

ප්‍ර : විමර්ශනයේදී අනාවරණය වුණා?

පි : ඉස්සරලාම ගිය කට්ටිය කියනු ලැබුවා. මේ සකසන ලද පුපුරණ ද්‍රව්‍ය අඩංගු දෙයක් බොහෝ දුරට නිරීක්ෂණය කිරීමේදී එවැනි ස්වරූපයක් ගන්නවා.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් එයට අදාළව ඉදිරිපත් කරනු ලබන එම ඡායාරූප වගේම එහි අඩංගු දෑ ලැයිස්තුගත කොට තිබෙන මෙම ලේඛනය C-915 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා)

ප්‍ර : එතකොට දැන් ඔබ කිව්වා මේ මෘත ශරීරවලට අදාළව DNA පරීක්ෂාවක් සිදු කිරීම සඳහා කටයුතු කරනු ලැබුවාය කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ දන්නවද ඒවායේ ප්‍රතිඵල ලැබිලා තියෙනවද කියලා? කවුද ඒ පරීක්ෂාව කළේ. Geentech ආයතනයද නැත්නම් රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවද?

පි : ස්වාමීනි දැනුවත්ව නම් රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව. නමුත් ස්වාමීනි මේ සිද්ධිය වෙන්නේ 04.26 වෙනි දින. 07.22

FAIR COMMENT BY JEZEEM

වෙනි දින මට ස්ථාන මාරුවීමක් එනවා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට. හැබැයි මම කොට්ඨාශ භාර නිලධාරී වශයෙන් ඉන්නේ. මට එතන තනතුරක් නැතුව තමයි ස්ථාන මාරුවීම ලැබෙන්නේ. ඒ වෙනකොට ...,

ප්‍ර : ඔබ ඒ වෙනකොට මේ විමර්ශනයේ ඉතා ගැඹුරට ගිහිල්ලා මේ සියළුම පැතිකඩවල් බලමින් විමර්ශනය සිදු කරනවා නේද?

පි : මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරලා තියෙන හින්දා ස්වාමීනි හැම එකටම POI එකක් එහෙම නැත්නම් විමර්ශන සැලැස්මක් හදලා Inquiry කළේ. ඒ Inquiryවල ප්‍රතිඵලයක් වශයෙන් අපට හඳුනා ගන්න හම්බ වුණා හම්බන්තොට මොවුන්ගේ කඳවුර. ඊට පස්සේ නුවරඑළියේ බිලැක්ෆුල්වල කඳවුර හඳුනා ගන්න ලැබුණා. ඒ අතර තමයි මට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට ස්ථාන මාරුව ලැබෙන්නේ. ඊට පස්සේ ...,

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔබ අම්පාර කොට්ඨාශය භාර නිලධාරියා ලෙස පත්වීම ලබන්නේ 2017 ජනවාරී මාසයේ නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : සාමාන්‍යයෙන් ස්ථානයක පොලිස් නිලධාරියෙක් අවම වශයෙන් අවුරුදු තුනක් ඉන්නවද?

පි : අවුරුදු තුනක් ඉන්නවා.

ප්‍ර : එතකොට ඔබට මේ හදිසි ස්ථාන මාරුව ලැබෙන්නේ ඔබට ඒ අවුරුදු තුන නිම කරන්න ඉස්සරලා නේද?

පි : නිම කරන්න ඉස්සරලා ලැබෙන්නේ. නමුත් ත්‍රස්ත විමර්ශන අංශයට ලැබෙනවා කියන්නේ මාත් කැමැත්තෙන් හිටියා මොකද ඒකේ අධ්‍යක්ෂ තනතුර නැත්නම් මට Inquiryය දිගටම කරන්න පුළුවන් කියලා. නමුත් මට මේ ස්ථාන මාරුවීම එන්නේ අධ්‍යක්ෂ වශයෙන් නෙමෙයි. එවකට අධ්‍යක්ෂවරයා වශයෙන් ඉන්නේ ස්වාමීනි දැනට නියෝජ්‍ය පොලිස්පති වරුණ ජයසුන්දර මහත්මයා. ඊට පස්සේ මම විමසීමක් කළා ඇයි සර් මට මෙහෙම දෙයක් කළේ. ඊට පස්සේ කිව්වා නැහැ වරුණ ජයසුන්දර මහත්මයා ....,

****

FAIR COMMENT BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : කාගෙන්ද ඔබ ඒ ඇහුවේ?

පි : මම පොලිස් මූලස්ථානයෙන් ඇහුවේ ස්වාමීනි. එතකොට කිව්වා වරුණ ජයසුන්දර මහත්මයා Promote වුණාට පස්සේ අපි ඔයාව එතන Director තමයි කටයුතු කරන්නේ කියලා. එතකොට ස්වාමීනි මාතර කොට්ඨාශය භාරව හිටියේ මගේම බැච් එකේ නිලධාරියෙක් තමයි ගයංග මාරපන. ඒ නිලධාරියා මාතර ඉඳලා අම්පාරට එනවා 07.24 වන දින. ඒ වනවිට ස්වාමීනි මම සැකකරුවන් 19 දෙනෙක් අත් අඩංගුවට අරගෙන තිබුණා. විමර්ශන කටයුතු කරමින් තිබුණා. ගයංග හසන්ත මාරපන නිලධාරියාත්, JMI ජමාතේ ඉස්ලාම් මිල්ලතු ඊබ්‍රාහිම් ඒ සංවිධානයේ සැකකරුවන් විශාල ප්‍රමාණයක් අත් අඩංගුවට ගත්තා. ඒ කටයුතු කරගෙන ඉන්නකොට මම කොළඹ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයට නැත්නම් කොළඹ දකුණ කොට්ඨාශය භාරව අන්තිමේ මගේ ඉල්ලීම මත ආවේ. ඇවිල්ලා මම මාස හයක් වගේ කාලයක් තමයි කොළඹ දකුණේ හිටියේ. අහපවු මොණරාගලට ගියා. ඒ අතරේ Inquiry කරපු මාරපන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාත් මේ Inquiryයෙන් අයින් කරලා දැනට අශ්වාරෝහක අංශය භාරව ඉන්නවා.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : ඒ තොරතුරු දුන්න පුද්ගලයින්ව ඇගයීමට ලක් කළාද?

පි : ඒ පුද්ගලික තැනැත්තන් අපි ඇගයීමට ලක් කළා. ඊට පස්සේ පොලිස් කොස්තාපල් වීරසිංහ පොලිස් සැරයන් තනතුරටත්, අනිත් කට්ටිය ඇගයීමට ලක් කළා. ඊට පස්සේ මෙම සිද්ධියෙන් ඒ කියන්නේ සෙන්ග්‍රල් ග්‍රාමයේ සිදුවීම, නින්දවූර් සිදුවීම, සයින්දමර්දු සිදුවීම සහ ඊට පසු විමර්ශන කටයුතු සඳහා තෑගි ඉල්ලුම්පත්‍ර හතරක් ඉදිරිපත් කළා. ඊට පස්සේ තෑගි ඉල්ලුම්පත්‍ර හතරට නියෝජ්‍ය පොලිස්පති සංජීව මැදවත්ත මහතාගේ ප්‍රමුඛත්වයෙන් අම්පාර කොට්ඨාශයේ තෑගී ඉල්ලුම්පත් සඳහා මමත්, විශේෂ කාර්ය බලකායත්, රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරී ඇවිල්ලා කමිටුවක් පත් කළා. කමිටුවක් පත් කරලා මේ තෑගි ඉල්ලුම්පත් ඔක්කොම එකම තෑගි ඉල්ලුම්පතක් වශයෙන් ඉදිරිපත් කරන්න කියලා කිව්වා. ඒ අනුව අපි ඒකත් ඉදිරිපත් කළා. නමුත් අද වනතුරු කිසිම ඇගයීමකට ලක් වුණේ නැහැ. ඊට පස්සේ අපි ඇහුවම කිව්වේ මේ ගරු කොමිසම යටතේ සාක්ෂි දෙන සමහර

FAIR COMMENT BY JEZEEM

නිලධාරීන් මේ සිද්ධිවලට යම් යම් සම්බන්ධතා තියෙන්න පුළුවන්. ඒ හින්දා මේ තැගි කිසිවක් එවන්න බැහැ කියලා. හැබැයි අපි කිව්වා අපි කළේ විශාල ක්‍රියාවක්. අපිට තැගි නොදී ඉන්න එපා කියලා. නමුත් අද වෙනකම් විශේෂයෙන්ම මේ සිද්ධියට සෘජුව දායකත්වය දක්වපු පෙර මම නම කියපු නිලධාරියාටවත් කිසිම ඇගයීමකට ලක් කළේ නැහැ.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : බුද්ධි නිලධාරියාටවත් ඒ ඇගයීමක් නැහැ කියලා ඔබ කියන්නේ?

පි : ඔව්.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔබ අර ඉස්සරලා කරපු ප්‍රකාශය ආයිත් පැහැදිලි කරන්න. මොකද්ද මෙම කොමිසම ඉදිරියේ සාක්ෂි දෙන පුද්ගලයින් ගැන මොකද්ද කිව්වේ?

පි : ස්වාමීනි ඒ එතනදි හැම කොට්ඨාශවලින්ම ඒ කියන්නේ අපේ තැගි වවුචර් ඉදිරිපත් කරලා තිබුණා. ඒ සමහර ඉදිරිපත් කරන නිලධාරීන් මේ විශේෂයෙන්ම කොළඹ කොට්ඨාශයේ සමහර සිද්ධීන්වලට වගකිව යුතු නිලධාරින්. යම් යම් සිද්ධීන්වලට වගකිව යුතු නිලධාරින්. ඒ නිසා ඒ සමහර නිලධාරින් මෙතන සාක්ෂි දෙනකොටත් ඔබතුමන්ලාගේ දැඩි දෝෂාරෝපනයට ලක් වෙලා තියෙනවා කිව්වා. ඒ හින්දා ඒ නිලධාරීන් හඳුනා ගැනීමක් කරනතෙක් අනිත් ඔක්කොටම ගෙවන්න බැහැ කිව්වා. ඉතිං අපි ඉල්ලීමක් කළා අපි එහෙම කිසිම දෙයකට සම්බන්ධ නැහැ. අපි මේ ඉතාමත් හොඳ ක්‍රියාවක් කරලා තියෙන්නේ. අපි ඒකට විශේෂයෙන් කණිෂ්ඨ නිලධාරීන් මේක බලාපොරොත්තු වෙනවා කරන්න කියලා. නමුත් අද වෙනකම් මැඩම් ඇගයීමක් වුණේ නැහැ.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : කවුද ඒ නියෝගය දුන්නේ?

පි : ඒක නියෝගයක් වශයෙන් නෙමෙයි ස්වාමීනි ලැබුණේ. අපි විමසනකොට මෙච්චර හොඳ ක්‍රියාවක් කරලා, ඒ කියන්නේ සත්‍ය වශයෙන්ම මේ දෙවැනි ප්‍රහාරය වළක්වා ගැනීම තමයි මෙතන වුණේ. ඉතිං අපට ...,

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නැහැ. මම ඇහැව්වේ අනිත් අය මේ සම්බන්ධයෙන් Clear වෙනකම් ඕගොල්ලොන්ටත් ගෙවන්නේ නැහැයි කියන...?

පි : ඔව්. ඒ කමිටුවේ මම හිටපු හින්දා ස්වාමීනි මෙතන සාක්ෂි දුන්න සමහර නිලධාරීනුත් යම් යම් Reword ඉල්ලලා තිබුණා. අපි ඒ අයව එතන ප්‍රතික්ෂේප කළා.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබ දැන් මේ පරීක්ෂණ කටයුතු කරගෙන යන අවස්ථාවේදී ඔබලාගේ සේවා ස්ථාන මාරු කිරීම් සිදු කිරිමට යම් හේතුවක් තිබුණාද? තමන්ට කියන්න පුළුවන්ද...?

පි : එහෙමනම් විශේෂ දෙයක් දන්නේ නැහැ. හැබැයි ස්වාමීනි මේ වගේ සංකීර්ණ විමර්ශනයක් කරනකොට ඒක නොවිය යුතුයි කියන එක තමයි මගේ අදහස තිබුණේ. හැබැයි ඒ වගේම ස්වාමීනි මේ විමර්ශනය මීට වඩා හොඳට කරන්න තිබුණා මමත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කාලයක් සේවයේ කළේ. යම් විමර්ශනයක් අපි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දුන්නාට පස්සේ ඒ විමර්ශන අංශය අපිව දැනුවත් කිරීමක් කරන්නේ නැහැ ස්වාමීනි. එතකොට ඒ විමර්ශනය ....,

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : ඔබලා පමණක් නෙමෙයි?

පි : වෙනමම ඒ අපරාධ විමර්ශනය. එතකොට ස්වාමීනි අපි අතරේ හරියට තොරතුරු ටික බෙදා හැරීමක් වුණා නම් ඒ විමර්ශනය මීට වඩා අපට සාර්ථකව කරන්න තිබුණා කියන එක තමයි මගේ අදහස.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු අර විදේශීය සිම්පත් තමන්ගේ පරීක්ෂණ කටයුතු අනුව විදේශීය සිම්පත් ඔබලාට හමුවීමෙන් මෙම පුද්ගලයින්ට විදේශීය යම්කිසි සහයෝගයක් ලැබිලා තියෙනවා කියලා පරීක්ෂණවලදී හෙළිවීමක් තියෙනවද?

පි : ස්වාමීනි ඒ සිම්පත් සියල්ලම අපිට පරීක්ෂා කිරීමට හැකියාවක් නැති නිසා අපි ඒවා ඔක්කොම අපරාධ පරීක්ෂණ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දෙපාර්තමේන්තුවට තමයි ස්වාමීනි භාර දීමක් කරන්නේ පොලිස් අධිකාරී රංජිත් වෙදසිංහ. එතුමා තමයි .....,

ප්‍ර : රංජිත් වෙදසිංහ කියන්නේ කවුද?

පි : ස්වාමීනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඒ භාණ්ඩ භාර ගත්ත වාර්තාවේ පිටපතක් මට ඉදිරිපත් කිරීමට හැකියාව තියෙනවා සහ මෙතන ඒ සිම්පත් ඊට පස්සේ IMEI අංක කිහිපයක්, ඒ අදාළ භාණ්ඩ කිහිපයක් භාර ගැනීම සම්බන්ධයෙන් සටහන් තියෙනවා ස්වාමීනි.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : මූලස්ථාන පොලිස් පරීක්ෂක කියලා මේක ....?

පි : අත්සන් කරලා තියෙන්නේ ස්වාමීනි මූලස්ථාන පොලිස් පරීක්ෂක අම්පාර. නමුත් ඒක යොමු කරලා තියෙන්නේ රංජිත් වෙදසිංහ, පොලිස් අධිකාරී, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට. ලියුමේ පිටුපසින් භාර ගැනීම සහ භාර දීමේ සටහනුත් තියෙනවා ස්වාමීනි.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු දැන් ඔබව මාරු කරා ඒ පරීක්ෂණ කටයුතු කරගෙන යන අතරතුර?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඉන් පරීක්ෂණ කටයුතුවලට කිසියම් බාධාවක් සිද්ධ වුණාද?

පි : ස්වාමීනි පරීක්ෂණ කටයුතුවලට දැන් මගේ විමර්ශන රටාව අනුව විමර්ශන රටාව මට පස්සේ භාර ගත්ත නිලධාරියා කළාද කියන එක මට හරි හැටි කියන්න බැහැ. නමුත් මට පස්සේ ආපු නිලධාරියා JMI එක ගැන තමයි විශේෂයෙන්ම විමර්ශන කටයුතු කළේ. හැබැයි ඒත් මම පෙර නම සඳහන් කළ නිලධාරියා දිගින් දිගටම මමත් එක්කත් සම්බන්ධතා තියාගෙන, මට පසුව ආපු නිලධාරියාත් එක්කත් සම්බන්ධතා තියාගෙන, ඒ වගේම මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයාත් එක්කත් සම්බන්ධතා තියාගෙන විමර්ශන කටයුතු කළා. නමුත් අපේ අර කණ්ඩායමේ ප්‍රධාන පුරුකක් ගැළවෙනකොට අනිත් නිලධාරීන් ඇතිවන කනස්සල්ල හින්දා මම හිතනවා අනිවාර්යයෙන් මේකට බාධාවක් වුණා කියන එක.

ප්‍ර : ඔබට පස්සේ ආපු නිලධාරියාත් ඊට පස්සේ ඉක්මණින් මාරු කළානේ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒකත් මොකක් හරි හේතුවක් ඇතුව ඒ කියන්නේ මේ පරීක්ෂණ කටයුතු අඩාල කිරීමේ බලාපොරොත්තුවෙන් කළා කියලා හිතන්න පුළුවන්ද?

පි : මම නම් ස්වාමීනි අවුරුදු දෙකකට ආසන්න කාලයක් හිටියා. මට පස්සේ ආපු නිලධාරියා මාස හයක්වත් හිටියේ නැහැ ස්වාමීනි. ඒ වගේම ස්වාමීනි ....,

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

(ස්වාමීනි සාක්ෂිකරු විසින් එස අදාළ නඩු භාණ්ඩ එනම් ජංගම දුරකථන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රංජිත් වෙදසිංහ පොලිස් අධිකාරීවරයාට භාර දුන් බවට මෙම ගරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම ලේඛනය C-916 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබගේ මට්ටමින් ස්ථාන මාරු ලබා දෙන්නේ ජාතික පොලිස් කොමිසමෙන්ද නැත්නම් වෙන උසස් නිලධාරීන්ද?

පි : පොලිස්පතිතුමාගේ නිර්දේශය මත ස්වාමීනි ජාතික පොලිස් කොමිසමෙන්.

ප්‍ර : ඔබට ස්ථාන මාරුව දෙනවිට පොලිස්පතිවරයා හැටියට හිටියේ කවුද?

පි : දැනට වැඩ බලන පොලිස්පති සී.ඩී. වික්‍රමසිංහ මහත්මයා.

ප්‍ර : ජූලි මාසය වනවිට?

පි : එතකොට අපි කථා කළෙත් සී.ඩී. වික්‍රමසිංහ මහත්මයත් එක්ක තමයි ස්වාමීනි.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : මිස්ටර් විජේසේකර දැන් ඔබ පරීක්ෂණ කටයුතු කිසියම් ප්‍රමාණයක් කරගෙන ගියානේ. ඔබට කියන්නට පුළුවන්ද මෙම කොමිසමට ඔය සියළුම මෙම කොමිසම හමුවේ ඉදිරිපත් කරපු විවිධ ස්ථාන සියල්ලේම පරීක්ෂණ කටයුතුවල කොපමණ දුරකට ඔබ ගිහින් තිබුණාද?

පි : ස්වාමීනි මේ 04.21 පළමු ප්‍රහාරයෙන් පසුව මේ කණ්ඩායම දෙවන ප්‍රහාරයක් අනිවාර්යයෙන්ම එල්ල කිරීමට විශේෂ තොරතුරු

FAIR COMMENT BY JEZEEM

තිබුණා. ඒ දෙවන ප්‍රහාරය එල්ල කිරීමේදී මේකේ ආගමික පැත්ත දාලා තිබුණේ ෂයිනි කියන එක්කෙනාට. අනිත් කටයුතු භාර දීලා තිබුණේ රිල්වාන්ට. එතකොට ඒ වගේම අර ගිරිඋල්ලේ වෙළඳ සැලෙන් සුදු රෙදි ගැනීමේ සිද්ධියෙන් පවා අනාවරණය වුණා ඉදිරියේ යම්කිසි ආගමික ස්ථානයකට නැත්නම් ආගමික උත්සවයකට යම් ප්‍රහාරයක් එල්ල වෙන්න පුළුවන් කියලා. නමුත් 04.26 අපේ සිදුවීමත් එක්කම ඒ දෙවෙනි ප්‍රහාරයක් එල්ල විය හැකි යැයි සිතන සියළු දෙනා එතනදී ඝාතනයකට ලක් වුණා. නමුත් මේ සම්බන්ධයෙන් පුහුණුව ලබපු, ඒ මතවාදයට නැඹුරු වෙච්ච කට්ටිය තමයි අපි Inquiry කරගෙන අපි දිගින් දිගටම ගන්න ගියේ. නමුත් මම හිතන්නේ නැහැ අපිට ඔක්කොම ගන්න පුළුවන් වුණා කියලා මට හැකියාව ලැබුණේ ඒ ගෙවල්වල කට්ටිය පමණක් 19 දෙනෙක්, තව අන්තවාදයට නැඹුරු වෙච්ච බොහෝ කට්ටිය ඉන්න පුළුවන් සමාජය තුළ.

ප්‍ර : මිස්ටර් විජේසේකර ඔබත් සමඟ ඔබ වගේම ඔය සිදුවීම සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු කරපු තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුත් මාරු කළාද, ස්ථාන මාරු කළාද? අම්පාරට?

පි : ඔව්. මගෙන් පස්සේ Inquiry, කොට්ඨාශය භාර ගත්තේ ගයංග මාරපන. ඔහු මාස හයකට ආසන්න කාලයක් ඉන්නේ ඒ නිලධාරියා. පොලිස් විද්‍යාලයට අධ්‍යක්ෂ වශයෙන් පත් කරලා කියනවා. නමුත් පොලිස් විද්‍යාලයට අධ්‍යක්ෂ වශයෙන් නෙමෙයි එන්නේ. පොලිස් විද්‍යාලයට සාමාන්‍ය Transferයක්. ඊට පස්සේ ඒ නිලධාරියා ඒකට විරුද්ධව මම හිතන්නේ මානව හිමිකම් නඩුවකුත් පැවැත්වුවා. දැනට අධ්‍යක්ෂ, අශ්වාරෝහක අංශය ලෙස ඒ නිලධාරියා කටයුතු කරනවා.

ප්‍ර : නැහැ. දැනට අම්පාරේ SSP හේරත් කියලා ඉන්න මහත්මයාත් ඔබලා වගේ පරීක්ෂණ කළාද මේ කටයුතු සම්බන්ධයෙන්?

පි : ඔව්. ස්වාමීනි එතකොට හේරත් මම යටතේ හිටිය නිලධාරී මහත්මයෙක්.

ප්‍ර : ඔබත් එක්කද මේ වැඩ කටයුතු කළේ?

පි : ඔව්. මේ කටයුතුවලට මාත් එක්කම සක්‍රීයවම දායකත්වය දැක්වුවා.

ප්‍ර : එතකොට පළවෙනියවත් මාරු කළා, දෙවෙනියවත් මාරු කළා එහෙමද ඔබගේ සහායට හිටි නිලධාරියා?

පි : හේරත් ස්වාමීනි ඒ අවස්ථාව වෙනකොට සාමාන්‍යයෙන් කොට්ඨාශ බාර නිලධාරීන් ඉන්නේ කොට්ඨාශයට එක්කෙනයි. මගේ යටතේ සහකාර පොලිස් අධිකාරී දිස්ත්‍රික්ක හයක් තිබුණා.

FAIR COMMENT BY JEZEEM

අම්පාර 1, අම්පාර 2, කල්මුණ, අක්කරෙයිපත්තු, පොතුවිල්, මහඔය. මේ කාලය වෙනකොට හේරත් කල්මුණේ භාරව තමයි හිටියේ. හැබැයි හේරත් මගේ ස්ථාන මාරුවීමත් සමඟ කල්මුණෙන් අම්පාරට ස්ථාන මාරුවීමක් ලබනවා.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : ඔබ මේ ගරු කොමසාරිස්තුමිය අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් මේ ගිරිඋල්ලෙන් සුදු ඇඳුම් මිලදී ගැනීම පිළිබඳව සඳහන් කරනු ලැබුවා නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප : එතකොට ඒ ගිරිඋල්ලේ ඔය සුදු ඇඳුම් මිලදී ගැනීමේ අවස්ථාවට අදාළව ඔබ කවුරු හරි අත් අඩංගුවට ගත්තද?

පි : මා අර පෙර කී නිලධාරියාගේ දැනුම් දීම මත අම්පාර කොට්ඨාශ නිලධාරියා විසින් රිෆාස් නමින් හඳුන්වන පුද්ගලයෙක් අත් අඩංගුවට ගත්තා.

ප : මොන හේතුවක් නිසාද රිෆාස්ව අත් අඩංගුවට ගන්න හේතු වුණේ?

පි : ස්වාමීනි රිෆාස් කියන පුද්ගලයා තමයි අවස්ථා කිහිපයකදී 2019.04.09 වෙනි දින, 12 වෙනි දින, ඒ වගේම 18 වෙනි දින සහරාන්ගේ පවුලේ අය මඩකලපුවේ සිට කොළඹ දක්වාත්, කොළඹදී මීගමුවේ ගෙදරට, පානදුරේ ගෙදරට, ඊට අමතරව කල්මුණේට ප්‍රවාහනය කරලා තිබුණු වාහනය. 19 වෙනිදා හවස ගිරිඋල්ලේ ජයසුන්දර කඩේ සුදු පැහැති රෙදි ගන්න 29,020.00 ක වගේ බිලක් තියෙන්නේ. ඒකට මුදල් ගෙවන තැනැත්තත් ඔහු. එතකොට ඒ අවස්ථාවේ සහරාන්ගේ බිරිඳ, කුඩා දියණිය ඉන්නවා. දියණිය වඩාගෙන ඉන්න තැනැත්තා වශයෙන් හඳුනා ගන්නේ රිෆාස්. ඒ රිෆාස් තමයි ඒ අවස්ථාවේ වාහනයේ රියදුරු වශයෙන් කටයුතු කරලා තියෙන්නේ කොළඹ හිටපු කට්ටිය සයින්දමර්දු සහ නින්දවූර්වලට ගෙනියන්න.

ප : ඔබ ඒ තැනැත්තාව අත් අඩංගුවට ගත්තට පස්සේ ඔහුව දැක්කද?

පි : එක් අවස්ථාවක දැක්කා වගේ මට මතකයක් තියෙනවා ස්වාමීනි.

ප : එහෙමනම් CCTV දර්ශන ඔබට පෙන්නුවොතින් ඔබට කියන්න පුළුවන්ද එතන ඔය කියන රිෆාස් ඉන්නවද කියලා?

පි : පුළුවන් ස්වාමීනි.

(ස්වාමීනි CCTV දර්ශන C-822 වශයෙන් දැනටමත් ලකුණු කොට ඇති එම දර්ශන සාක්ෂිකරුගේ අවධානයට යොමු කිරීමට අවසර පතනවා)

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මා ඔබේ අවධානය මේ වාහනයෙන් බහින පුද්ගලයා කෙරෙහි යොමු කරනවා. ඒ වගේම මේ පඩි පෙළෙන් දැන් උඩට පුද්ගලයෙක් පැමිණෙනවා. අන්න ඔහු කෙරෙහිත් යොමු කරනවා?

පි : හැඩ රුවේ හැටියට නම් ස්වාමීනි ඒ තැනැත්තා තමයි. මුහුණ තව පොඩ්ඩක් මට .....,

ප්‍ර : ඔබ කියන්නේ මේ පුද්ගලයාගේ හැඩ රුව අනුව ඔබ කියන්නේ රිෆාස් වගේ කියලා?

පි : රිෆාස්.

ප්‍ර : හොඳයි. දැන් මා නැවත ඔබේ අවධානය C-822. මා නැවත ඔබේ අවධානය යොමු කරනවා අර DNA පරීක්ෂාව කෙරෙහි. DNA පරීක්ෂාව ඔබ කිව්වා රජයේ රස පරීක්ෂක වෙත යවනු ලැබුවාය කියලා නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ සාම්පල, ආදර්ශකයන්. එහි වාර්තාව ලැබිලා තියෙනවද කියලා, කියන්න ඔබ දන්නවද?

පි : ස්වාමීනි ඊට පසුව මේ අවුරුද්දේ, 2020 වගේ මට තොරතුරක් ලැබුණා මේ වාර්තාව ලැබිලා තියෙනවා කියලා.

ප්‍ර : එතකොට ඒ සම්බන්ධයෙන් දැන් වර්තමානයේ කටයුතු කරන්නේ කවුද?

පි : දැනට ස්වාමීනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් තමයි මේ විමර්ශනය කරන්නේ.

දැන් වේලාව : ප.ව. 7.30 යි
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව රාත්‍රී 7.30 යි.
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : ඔබ මේ ගරු විනිශ්චය සභාවට සඳහන් කෙරුවානේ කරපු විමර්ශනවලදී ආකාර දෙකකින් අනාවරණය වුණා කියලා පුලස්තිනී එහෙම නැත්නම් සාරා යන තැනැත්තිය 2019 අප්‍රේල් මාසේ 26 වෙනිදා අංක: 183B, වොලිවේරියන් ග්‍රාමයට පැමිණිලා තිබුණයි කියලා, ඒ ලිපිනයට?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එතකොට ඔය තැනැත්තිය සැබවින්ම මේ සිදු වූ වෙඩි ප්‍රහාරයෙන් හෝ, 26 වෙනිදා සිදු වන වෙඩි ප්‍රහාරයෙන් හෝ පිපිරීමෙන් මියගිහිල්ලා හිටියද නැද්ද කියන කරුණ වැඩිදුර කරුනු විමර්ශනයේදී අනාවරණය වුණාද?

පි : ඔව් ස්වාමිණි මම මීට පෙර සඳහන් කළ ඒ බුද්ධි නිලධාරියත් මට මේ වසරේ මුල වගේ දැනුම් දීමක් කළා. පරීක්ෂා කරලා තියෙන DNA සාම්පල්වල සාරා ජෙස්මින් කියන තැනැත්තිය නැහැ කියලා. ඒ වගේම මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයත් කිව්වා සාම්පල්ස් නැහැ කියලා. ඊට පස්සේ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයත් මාත් එක්ක හිටපු නිලධාරියා..

ප්‍ර : ඔබ සඳහන් කරන්නේ අර අංක: 183B කියන ස්ථානයේ තිබුණු මළ සිරුරු වලින් ලබා ගත්ත ආදර්ශක ඒ පුද්ගලයින්ගේ DNA සාම්පල් සමඟ සැසඳීමක් වන්නේ නැහැ කියලද? ඒ මෘත ශරීර එකක්වත් සාරා ජෙස්මින් එහෙම නැත්නම් පුලස්තිනීගේ බවට?

පි : ඔව් ස්වාමිණි පුලස්තිනීගේ මවගේ මම එහේ ඉන්න කොටම තමයි අපි ගිහිල්ලා ලේ සාම්පලයක් ගත්තේ කල්මුණේ අධිකරණ නියෝගයක් මත.

ප්‍ර : DNA පරීක්ෂාව සඳහාද?

පි : DNA පරීක්ෂාව සඳහා යොමු කලා. සම්පූර්ණ වාර්තාව මම ඇස් දෙකෙන් දැක්කේ නැහැ නමුත් මට කිව්වා මේක මේවා වෙන්නේ නැහැ කියලා. සැසඳෙන්නේ නැහැ කියලා.

ප්‍ර : ඔබ කොහොමද දැන ගත්තේ ඒක සැසඳෙන්නේ නැති බව?

පි : මම පෙර කිව්ව නිලධාරියා මට කිව්වා මෙහෙම ප්‍රශ්නයක් තියෙනවා කියලා. ඊට අමතරව මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා දැනුම් දුන්නා. ඒ අවස්ථාවේ මම පෙර කිව්ව නිලධාරියා කිව්වා පොඩ්ඩක් බලන්න ඊට පස්සේ මොනවා හරි

Proceedings Secretary's Copy
FAIR COMMENT — BY JEZEEM —

තොරතුරු තියෙනවද එහෙම නැත්නම් මම කිව්වා මේක මීට කලකට පෙර රූපවාහිනියේ ගියා චිත්‍රපටයක මම නැරඹුවා යම් සිදුවීමකට වෙන කෙනෙක් දාලා එයා එතනින් අයින් කරනවා, මම කිව්වා මේකත් එහෙමද දන්නේ නැහැ, මේ තොරතුර ආපු තැනින් පොඩ්ඩක් අහලා බලන්න ඊට පස්සෙත් මේ තොරතුරු දිගටම ආවද එහෙම නැත්නම් මේ තැනැත්තිය මෙතනින් මඟ හැරීමක් වෙලා තියේද කියලා. ඊට පස්සේ සඳහන් කළ නිලධාරියා කිව්වා අපි ඒ ගැන බලනවා සර්, තාම ඒ ගැන අපිට confirmation එකක් දෙන්න බැහැ කියලා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍රශ්න එපමණ බව අතිරේක සොලිසිටර් ජනරාල්වරිය දන්වයි.

ප්‍ර : සාක්ෂිකරු ඔබ ඔබගේ සාක්ෂියේදි ප්‍රකාශ කෙරුවා 2018 පෙබරවාරී 26 වෙනිදා අම්පාර නගරයේ සිදු වූ සිදුවීමක් සම්බන්ධව?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඔබට විස්තර කරන්න පුළුවන්ද කුමක්ද සිදු වුණේ කියලා?

පි : ස්වාමිණි අම්පාර නගරයේ කාසිම් කියලා හෝටලයක් තියෙනවා අම්පාර නගරය සාමාන්‍යයෙන් මුස්ලිම් ජනයාට අයිති වෙළඳසැල් එකක්වත් නැහැ, ඒක සිංහල බෞද්ධ තමයි වෙසෙන්නේ. නමුත් මේ හෝටලයේ කාලෙක ඉදන් ද්‍රවිඩ ජාතිකයෙකුට අයත්ව තිබිලා මුස්ලිම් ජාතිකයෙක් අරගෙන තමයි මේ හෝටලය කලේ. එතකොට ඒ දවස්වල අම්පාර නගරය ආශ්‍රිතව මානික්කමඩු බුද්ධ රූපය ආශ්‍රිතව ඇති වෙච්ච ප්‍රශ්නවලදිත් ඒ බුද්ධ රූපය එතන තැන්පත් කරන්න දෙන්නේ නෑ කියලත් සිංහල සහ මුස්ලිම් ජනයා නිතර ගැටුම්කාරී තත්ත්වයක් ඇති වුණා. මමත් ඒ කාලේ සේවය කලේ. ඊට පස්සේ 2.26 වෙනිදා රාත්‍රී නගරයේ පුද්ගලයෙකු පැමිණ ඒ කඩෙන් කොත්තු රොටියක් අරන් තිබුණා ආහාරය සඳහා. ඒ කොත්තු රොටියේ යම් ශරීරයට විෂ ද්‍රව්‍යයක් තියෙනවා කියලා ඒ කාලේ ප්‍රසිද්ධ වුනේ වඳපෙති තියෙනවා කියලා තමයි ඒ ගැටුම ඇති වෙලා තිබුණේ. එතැන් දී මේ සිංහල පුද්ගලයා දුරකථන ඇමතුමක් දීලා තව කට්ටියට ගෙන්න ගෙන ඒ කඩේට පහරදීමක් වුණා. එතකොටත් ඒ ස්ථානයට මම සක්‍රීයව ගිහිල්ලා මැඩ පැවැත්තුවා. නමුත් ඒ කැරැල්ල එහෙම වර්ධනය වෙලා දිසාපති කාර්යාලය ඉස්සරහා තිබුණු මුස්ලිම් ජාතිකයෙකුගේ කඩේටත් ගැහුවා. ඒ වගේම අම්පාර නගරයේ තියෙන මුස්ලිම් පල්ලියටත් දැඩි ලෙස අලාභ හානි කලා පහර දීලා. ඒ වෙන

FAIR COMMENT BY JEZEEM

කොටත් මම කොට්ඨාශ භාර නිලධාරී වශයෙන් හිටියේ. ජනරාල් මහින්ද මුදලිගේ මහත්මයා තමයි 24 වෙනි බලසේනාංකය භාරව හිටියේ. අපිට හැකි වුණා එතනින් එහාට ඒ සිදුවීම යන්නේ නැතුව ඊට පහුවෙනිදා වෙන කොටම යථා තත්ත්වයට පත් කර ගන්න. ඒ inquiry යෙත් මේ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් ගණනාවක් ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්තගේ ප්‍රධානත්වයෙන් අත් අඩංගුවට ගත්තා. දැනටත් ඒක අධිකරණයේ නඩු කටයුතු තියෙනවා. නමුත් අවසානයේ රජයේ රස පරීක්ෂක වාර්තාවේ ආවේ මේක පිටි කුට්ටියක් කියලා.

ප : සාක්ෂිකරු ඔබ 1995 සහ 96 වර්ෂවලදී කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ සේවය කරනවද?

පි : 94 සහ 95 ස්වාමිණි.

ප : 94 සහ 95 වර්ෂවලදි කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ සේවය කරනවද?

පි : එහෙමයි ස්වාමිණි.

ප : ස්ථානාධිපති වශයෙන්ද

පි : නැහැ මම එතකොට ස්වාමිණි ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙක්. මම අපරාධ අංශයේ කටයුතු තමයි ඒ කියන්නේ ස්ථීර අංශයක් දෙන්නේ නැහැ අවුරුදු 3 ක් අපි විවිධ විවිධ අංශවල ඉන්න ඕන. විවිධ පැමිණිලි අංශය සහ සෑම රාජකාරියක්ම පුහුණු වන කාලේ මගේ.

ප : එතකොට ඔබ ඒ සිටිය කාලය සහ වර්තමාන කාත්තන්කුඩිය අතර යම් වෙනස්කම් තියෙනවද? තියෙනවා නම් මොකක්ද?

පි : ඔව් මා සේවය කල කාලයේ ස්වාමිණි ඉතාමත් දුෂ්කර කාලපරිච්ඡේදයක් තිබුනේ මොකද පොලිසිය තියෙන්නෙත් එක පැත්තකින් දෙමල ගම්මානයත් එක්ක කාර්මික විද්‍යාලය පැත්තේ. අනික් පැත්තේ මුස්ලිම් ජනයාත් එක්ක තියෙන්නේ. නිතරම ත්‍රස්තවාදී ප්‍රහාරවලට කාත්තන්කුඩි පොලිසිය භාජනය නොවුනත්, ඒ කාත්තන්කුඩි ගම්මානය අවට තියෙන මුර පොලවල් භාජනය වුණා. නගරය තුල ලොකු දියුණුවක් තිබුණේ නැහැ, නමුත් මේ මෑත කාලීනව නගරය විශාල සංවර්ධනයක් වෙලා තියෙනවා. සෙසු නගරත් එක්ක බලන කොට ඒ නගරය වෙනස්වීම් බොහොමයක් තියෙනවා. නගරය මැද රටඉදි ගස් හදලා මල්ගස් වවලා අමුතුම ක්‍රමවේදයකට තමයි තියෙන්නේ. ඒ කියන්නේ මම 2010 ඉදලා 2013 වෙන කොටත් අම්පාරේ ඉන්නේ, ඒ කාලෙත් මම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ සාකච්ඡාවලට කාත්තන්කුඩි හරහා තමයි මඩකලපු යන්නේ. නමුත් සුවිශේෂී දියුණුවක් කඩින් කඩ දැක්ක නගරයක් ඒක.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ 2000 ඉදලා 2001 දක්වා කල්මුණේ බුද්ධි අංශයෙත් සේවය කරනවා?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් 1994, 95 සහ 2000, 2001 දරන කාලසීමාවලදී ඔබගේ පළපුරුද්ද අනුව එම කාත්තන්කුඩි සහ කල්මුණේ ප්‍රදේශවල ඉස්ලාම් අන්තවාදයක් තිබ්බද?

පි : ස්වාමිණි සාමාන්‍යයෙන් ගත්තම අන්තවාදයක් කියන්නේ නිතරම කලහාකාරී ලෙස හැසිරෙන පිරිසක් හිටියේ. ඒ තරුණ කොටස් වුනත් යම් යම් ගැටුම්වලදී වෙනත් ප්‍රදේශවලට වැඩිය අප සමඟ ගැටීම් ඇති කර ගත් අවස්ථා බොහොමයක් තිබුණා. හැබැයි බොහෝ අවස්ථාවල මුල් කාලීනව පල්ලිය දැනුවත් කරලා හැකියා තිබුණා ඒ තරුණ කොටස් අපිට සාමකාමී තත්ත්වයට ගන්න. නමුත් මෑත කාලීනව ඒ බොහෝ තරුණ කොටස් ප්‍රධාන පල්ලියෙන් ඈත් වීමක් සහ ප්‍රධාන පල්ලිවල පූජකවරුන් කියන දේ ක්‍රියාකාරීව ඇහුම්කන් දීමක් නොකෙරෙන බවක් අපිට නිරීක්ෂණය වුණා.

ප්‍ර : ඔබ කියන විදියට ඒ තරුණ පිරිස් ප්‍රධාන පල්ලිවලින් ඈත් වෙලා වෙනත් පල්ලි හා සම්බන්ධවීමක් ඔබ දුටුවද?

පි : ඔව් සමහර පල්ලිවලට සම්බන්ධවීමක් තිබුණා ස්වාමිණි.

ප්‍ර : මොන පල්ලි සමඟද ඒ තරුණ කොටස් සම්බන්ධ වන්නේ?

පි : විශේෂයෙන්ම NTJ ජාතික තවුහිත් ජමාත්, සහරාන් හෂීම් ගිය පල්ලියට තරුණ කොටස් ගොඩක් එකතුවීමක් වුණා. එතකොට නමුත් අපිට සාමාන්‍ය පල්ලිවල පූජකවරුන් සමඟර අවස්ථාවල අපිට දැනුවත් කරා අපේ පල්ලියට එන සමහරක් කට්ටිය මේ පල්ලිවලින් ඈත් වෙනවා. පොඩ්ඩක් සොයා බැලීම් කරන්න කියලා. නමුත් ඒ එන පුද්ගලයෝ හරියට අපිට විස්තරය පල්ලිවලින් දෙන්නෙත් නැහැ, මොකද පල්ලි විශාල ප්‍රමාණයක් තියෙන හින්දා සමඟර වෙලාවට අද මේ පල්ලියට ඇවිල්ලා සිකුරාදට ජුම්මා කරන්න ප්‍රධාන පල්ලියට ගියත් අනික් දවස්වලට ඕන තරම් පල්ලි තියෙනවා යන්න. නමුත් ප්‍රධාන පූජකවරු අපිට දැනුම් දීමක් කලා තරුණ කොටස්වල වෙනසක් තියෙනවා කියලා.

ප්‍ර : ඔබගේ ඒ රාජකාරී කාලසීමාව තුළ මේ අන්තවාදී දේශන පැවැත්වීමක් සිදු වුණාද?

පි : නැහැ මම දැනුවත්ව එහෙම දෙයක් තිබුණේ නැහැ.

ප්‍ර : ඒ කියන්නේ 94,95, 2000, 2001 වර්ෂවලදී එහෙම අන්තවාදී දේශන සම්බන්ධයෙන් ..

පි : ඒ කාලය වෙන කොට ස්වාමිණි යුද්දේ හොඳටම තිබුණු කාලය හින්දා එහෙම දේකට ඒගොල්ලෝ එහෙම දේකට නැඹුරුතාවයක්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

නිබුණේ නැහැ. ඒගොල්ලොත් අනිත් අයත් එක්කම බොහොම බිය සුළු ජීවිතයක් තමා ගත කලේ,

ප : ඔබ කිව්වා ඔබගේ විමර්ශනවලින් තමයි නුවරඑළිය බ්ලැක්ෆුල් පුහුණු කඳවුර සහ හම්බන්තොට පුහුණු කඳවුර පිළිබඳ මුල් තොරතුරු ලබා ගත්තේ කියලා?

පි : එහෙමයි ස්වාමිණි.

ප : එම ඔබ විසින් ලබා ගත්තු ඒ තොරතුරු ඔබ වෙනත් ආයතන සමඟ බෙදා ගත්තද?

පි : එහෙමයි ස්වාමිණි මේ තොරතුරුත් මට ද්‍රවිඩ භාෂාවේ හැකියාව බොහොම අඩුයි. නමුත් මම පෙර කී නිලධාරියා භාරයේ හිටියා දක්ෂ මුස්ලිම් ජාතික නිලධාරියෙක්, ඒ නිලධාරියා තමයි ප්‍රශ්න කරලා විස්තර ගන්නේ. ඒ තොරතුරු ලැබුණු මුල් අවස්ථාවේම හම්බන්තොට කඳවුර ගැන මම ඉස්සෙල්ලම ඇහුවේ එතකොට තංගල්ල කොට්ඨාශ භාර නිලධාරී ලක්සිරි ගීතාල්. එයා මාත් එක්කම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ හිටියා. මම ඒ නිලධාරියාට දැනුම් දුන්නා මෙන්න මෙහෙම තැනක් ආරංචි වෙලා තියෙනවා Identify කර ගන්න කියලා. ඊට පහුවෙනිදා එයා මට දැනුම් දුන්නා අපි එතන Identify කලා කියලා. ඒ වගේම නුවරඑළිය කඳවුර ගැන තොරතුර ආවට පස්සේ නුවරඑළිය කොට්ඨාශ භාර නිලධාරී වශයෙන් කටයුතු කලේ මගේම බැජ් එකේ නිලධාරියෙක්. අයි.බි.ටි සුගතපාල. එයාට මං කතා කරලා කිව්වා නමුත් ඒගොල්ලන්ට ඒ තැන හඳුනා ගැනීමට බැරිවුණා. ඊට පස්සේ මේ තොරතුරේ අපිට ශක්තිය දෙන ප්‍රධාන බුද්ධි නිලධාරියා අපි අම්පාරේ අත් අඩංගුවට අරන් ඉන්න සැකකාරයෙක් රැගෙන ගොස් තමයි මේ ස්ථානය හඳුනා ගැනීමක් කලේ.

ප : ඔබ විසින් ඒ තොරතුරු වෙනත් විමර්ශන ආයතනවලට ලබා දීමක් සිදු කෙරුවද?

පි : ඔව් ස්වාමිණි ඊට පසුව මේ තොරතුරු මා හරහාත්, ඒ වගේම රාජ්‍ය බුද්ධි සේවය හරහාත් අදාල ස්ථාන දැනුවත් වුණා.

ප : මොන ආයතනද ඔබ දැනුවත් කළේ?

පි : මා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත් කලා. අපි මේ සමහර තැන් සොයා ගන්න කොට අපේ විමර්ශනයේ යම් යම් කොටස් සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ වෙලා හිටියා.

ප : එතකොට ඔබ විසින් සපයලා දුන්න තොරතුර මත කරන ලද විමර්ශනය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔබව දැනුවත් කිරීමක් සිදු වුණාද?

President's Counsel's Copy
FAIR COMMENT BY JEZEEM

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : සිදු වුනේ නැහැ?

පි : නැහැ ස්වාමිණි.

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:</u>

ප්‍ර : විජේසේකර මහත්මයා දැන් ඔබ මේ පරීක්ෂණ කටයුතු සිදු කලානේ අප්‍රේල් 21 ට පස්සේ, ඔබට වැටහුණු ආකාරයට මේ ඉස්ලාම් අන්තවාදී කොටස් අප්‍රේල් 21 න් පස්සෙත් යම් ආකාරයකට ක්‍රියාකාරීව හැසිරෙන බව තේරෙනවද?

පි : දැනට නම් ස්වාමිණි එහෙම දැනට මම මොණරාගල කොට්ඨාශයේ ඉන්නේ. නමුත් දැනටත් අම්පාර සහ ඒ ප්‍රදේශයේ බුද්ධි නිලධාරීන් සහ අනිත් මාත් එක්ක දැනට නැහැ, නමුත් ස්වාමිණි ක්ෂණිකව මේක මර්ධනයවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේගොල්ලෝ දැනට යට ගැහිලා ඉන්න පුළුවන්. මොකද අපි රඳවා ගැනීමේ නියෝග මත තමයි ස්වාමිණි ප්‍රශ්න කිරීම් කලේ. විශේෂයෙන්ම මඩකලපුවේ දී අත්අඩංගුවට ගත්ත නිලධාරීන් එහෙම රඳවා තබා ගැනීමක් කරලා එහෙම ප්‍රශ්න කිරීමකට ලක්කර ගන්න අවස්ථාවක් ලැබුනෙත් නැහැ. මට මතක හැටියට ඒගොල්ලෝ ක්ෂණිකව අධිකරණයට ඉදිරිපත් කිරීමක් කලා.

ප්‍ර : එතකොට ඒ අය දැනට ඔබ හිතන විදියට නිදැල්ලේ ඉන්නවද සමහර අය?

පි : ස්වාමිණි ප්‍රධාන වශයෙන් සම්බන්ධ වූ කියන කට්ටිය මම හිතන්නේ අපේ අත් අඩංගුවට පත් වුණා. නමුත් ස්වාමිණි මේ බොහෝ අය එක්කෙනාට එක්කෙනා අඳුරන්නේ නැහැ. එයාට වෙනත් නම් තමයි භාවිතා කරලා තිබුණේ. පෙර නම සඳහන් කළ බුද්ධි නිලධාරියා මට එක අවස්ථාවක පෙන්වා සිටියා පරිගණකයක තිබිලා ගත්ත හැටක වගේ නාමලේඛනයක් ඒකෙත් අෂ්රොෆ්, සියාම්, නලීම් අන්න ඒ වගේ නම් තමයි තිබුණේ. එතකොට ස්වාමිණි අපිට ස්ථිරව කියන්න බැහැ මේ සියළු නම්වලින් හැඳින්වෙන පුද්ගලයෝ අපේ අත්අඩංගුවට පත් වුණා කියන එක.

ප්‍ර : ඒ අනුව බලන කොට ඔබට හිතෙනවද අපි තවමත් අනාරක්ෂිතයි කියලා?

පි : ස්වාමිණි ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයත්, ඒ වගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවත් මේ විමර්ශනයේ භූමිය සහ ප්‍රදේශය හොඳින් දන්න අම්පාර කොට්ඨාශය මඩකලපුව

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කොට්ඨාශය සමඟ මනා සම්බන්ධීරණයක් සහ රාජ්‍ය බුද්ධි සේවයත් එක්ක සම්බන්ධතාවයෙන් කලොත් මීට වඩා ප්‍රතිඵලයක් ගන්න පුළුවන් වෙයි කියලා හිතනවා.

ප්‍ර : අවසන් ප්‍රශ්නේ මගේ, ඔබ හිතනවද ඔබගේ හදිසි ස්ථාන මාරුවත්, ඔබගෙන් පසුව ආ මාරපන නිලධාරියාගේ හදිසි ස්ථාන මාරුවත් කිසියම් වූ දේශපාලන හේතූන් මත බලපෑමක් නිසා සිදු වූවක් කියලා?

පි : ස්වාමිණි මට මුල් අවස්ථාවේ ත්‍රස්ත විමර්ශන අංශය තමයි භාර දෙනවා කිව්වේ මම ඒක කැමැත්තෙන්ම භාර ගන්නවා, මොකද විමර්ශන කටයුතු මගේ ප්‍රධානත්වයෙන් කරන්න පුළුවන් හින්දා. නමුත් මට එතන නෙමෙයි මට කොළඹ දකුණ කොට්ඨාශය තමයි ලැබුණේ. මට වඩා මං හිතනවා මාරපන නිලධාරියාට එතන දැඩි අසාධාරණයක් වුණා. මොකද ඒ නිලධාරියත් හොඳ inquiry කරන් ඉදලා කෙටි කාලෙක, මොකද මම වසර 2 ½ ක් වගේ රාජකාරී කරලා තව මාස කිහිපයකින් යන්න තමයි සිටියේ. මාරපන නිලධාරියට එහෙම කාලයක් එතන සේවය කරන්න හම්බ වුනේ නැහැ.

ප්‍ර : ඔව් ඉතින් මගේ ප්‍රශ්නෙට උත්තරයක් දෙන්න කෝ? ඔබ හිතනවද?

පි : බොහෝ විට ස්වාමිණි ඒක වෙන්න පුළුවන්.

ප්‍ර : ඒකට හේතුවක් තියෙනවද?

පි : ස්වාමිණි සමහර විමර්ශන සිද්ධ වෙන ආකාරය යම් යම් පාර්ශවයන්ට අපහසුතාවයකට ලක් වෙන්න පුළුවන්. එතකොට ඒ දක්ෂ කණ්ඩායම් මෙහෙයවලා හරි විමර්ශනයක් කලොත් ඒ විමර්ශනයේ ප්‍රතිඵල යම් යම් කණ්ඩායම්වලට අත්වෙන්න පුළුවන්. ඒක මේකට බලපෑවා වෙන්න පුළුවන්.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබලා බෝම්බ පිපිරවූ ස්ථානයේ සහින්දමර්දුවල ඉස්සරහා T56 ආයුධයක් සහිත එක්කෙනෙක් වැටිලා හිටියා නේද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : ඒ T56 අංකය සටහන් වුණාද?

පි : ස්වාමිණි ඒකේ අංකය මකලා තිබුණේ. ඒ ගිනිඅවියත් අපි රජයේ රස පරීක්ෂකට යොමු කළා. මැකී ගිය අංකය හොයන්න කියලා. මම ස්ථාන මාරු වී ගිය නිසා මට ඒ ගැන ස්ථිරවම කියන්න බැහැ.

ප්‍ර : ඒ මැකී ගිය අංකය මොකක්ද කියලා තාම දන්නේ නැහැ තමන්ලා? සොයා ගත්තද කියලා දන්නේ නෑ?

FAIR COMMENT BY JEZEEM

පි : නැහැ ස්වාමිණි ඉන් අනතරුව මේ සියළු විමර්ශන අපරාධ පරීක්ෂණ දෙපාර්ත්තමේන්තුව සහ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය භාර ගැනීමෙන් පසු අම්පාර කොට්ඨාශයෙන් සිදු කරන විමර්ශන ටික නතර වුණා.

ප්‍ර : දැන් මැකී ගිය අංකයක් තිබ්බා නම් ඒ අංකය අනුව එම T56 කුමන ස්ථානයකින්ද ලබා ගෙන තිබෙන්නේ කියලා...

පි : පුළුවන් ස්වාමිණි. අනිවාර්යයෙන් ශ්‍රී ලංකා පොලිසියෙන් නම් පොලිසියෙන්, යුද, ගුවන්, නාවික හමුදාවලින් වාර්තා කැඳවලා බලා ගන්න පුළුවන් අපිට අයිති එකක්ද, එහෙම නැති වුනොත් වෙනත් සංවිධානයකට අයිති එකක් ද කියලා ගන්න පුළුවන්.

ප්‍ර : එතකොට තමන්ගේ සේවා කාලය තුලදී හෝ තමන් 1996 ඉදන් ඒ පළාතේ නේ හිටියේ, නැගෙනහිර පළාතේ , ආමි මොහිදීන් සහ පොලිස් ෆාරිස් වැනි පුද්ගලයින් දැනගෙන හිටියද?

පි : නැහැ ස්වාමිනි.

ප්‍ර : ආමි මොහිදීන් ගැන..

පි : අවසානයේ මේ සිදුවීමෙන් පස්සේ තමයි ඒ තැනැත්තා ගැන මට තොරතුරු ලැබුනේ.

ප්‍ර : එතකොට තමන්ගේ සේවා කාලය තුලදි නැගෙනහිර පළාතේ බලගතු දේශපාලඥයන්ගෙන් මෙම ආගමික අන්තවාදී සම්බන්ධ කටයුතු වලට ඔවුන් යම් යම් බලපෑම් කලාද කියලා කියන්න පුළුවන්ද?

පි : ඔව් ස්වාමිණි අම්පාර කල්මුණ කොට්ඨාශය ගත්තොත් මේ මගේ සේවා කාලය තුළ විවිධ දේශපාලන නායකයින් බිහිවෙලා තිබුණා. නමුත් කාත්තන්කුඩිය ගත්තොත් එහෙම බිහිවීමක් නැහැ, එදා හිටියෙත් එක නායකවරයෙක්, දැනට ඉන්නෙත් එයා තමයි.

ප්‍ර : කවුද?

පි : හිස්බුල්ලා.

ප්‍ර : එතකොට යම් බලපෑම් ඇති වී තිබෙනවද පොලීසිවලට?

පි : මගේ කාත්තන්කුඩි ඉන්න කොට නම් මට එහෙම බලපෑමක් ආවේ නැහැ ස්වාමිණි. නමුත් සාමාන්‍ය ජන්ද විමසීමකදී මහජනයාගේ ජන්දය ප්‍රකාශ කිරීමේදී විශේෂයෙන් කල්මුණේ හින්දා අහන්නේ කාලෙකදී එම්.එච්. අෂ්රොප් මහත්තයාට ආවා, ඊට පස්සේ එතුමාගේ නෝනට ජන්දෙ වැටුනා. දැන් ඒ කියන්නේ එක එක පාර්ශවය ප්‍රදේශවලින් නැගී සිටීමක් වුණා. නමුත් දැන් කාත්තන්කුඩි ආශ්‍රිතව එහෙම වෙනත් දේශපාලන නායෙකුගේ බිහිවීමක් දැක්කේ නැහැ.

ප්‍ර : නැගෙනහිර පළාත සම්ස්ථයක් වශයෙන් ගත්තාම එහෙම දේශපාලන බලපෑම් තිබෙනවද යම් යම් විමර්ශනවලට?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඇතැම් අවස්ථාවල තිබුණා. නමුත් ස්වාමිණි මට නම් එහෙම බලපෑමක් කලේ නැහැ මොකද මම සාමාන්‍යයෙන් දැඩි ස්ථාවරවල හිටපු නිසා.

ප්‍ර : තමන්ට තිබෙන්නේ නැහැ නමුත් සමහර නිලධාරීන්ට තිබුණා කියලා තමන් කියනවා?

පි : සමහර ස්ථානාධිපතිවරුන්ටත් යම් යම් බලපෑම් තිබ්ලා තිබුණා.

****

<u>ගරු බන්දුල අතපත්තු මැතිතුමා:</u>

ප්‍ර : විජේසේකර මහතා ඔබට ඔය මාරුවීම ලැබෙන කොට නීතිය හා සාමය අමාත්‍යාංශයේ කවුද හිටියේ ඇමතිතුමා?

පි : එතකොට ආරක්ෂක අමාත්‍යාංශයට පවරා ගෙන තිබුනේ මට මතක හැටියට.

ප්‍ර : ජනාධිපතිතුමා?

පි : ඔව්.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : ඔබ සඳහන් කලා සහින්දමර්දු අර 16 දෙනෙකු මියගිය ස්ථානයේ තිබ්ලා මිලියනක ආසන්න රුපියල් 5000 නෝට්ටු එකතු කර ගත්තා කියලා. ඒ වගේම ඔබ සුළු මොහොතකට පෙර කිව්වා තවත් මිලියන 5 ක පමණ මුදල් වගයක් සම්බන්ධව.

පි : එහෙමයි.

ප්‍ර : ඔබලා පරික්ෂා කලාද ඔබ 7 වෙනි මාසය වෙන කල් හිටියානේ ඔබගේ ස්ථාන මාරුව ලැබෙන කල්. මෙම මුදල් නෝට්ටුවල තිබෙන අංක අනුව අර තුවක්කුව සමඟ මියගිය පුද්ගලයා නියාස් එම ප්‍රදේශයෙන් අරගත්තානේ වැන් රථයක් මිලදී ගත්තා කිව්වානේ ගිහිල්ලා, ඒකටත් ගෙවලා තිබුණානේ ලක්ෂ 25 ක පමණ මුදල් ප්‍රමාණයක්?

පි : 27 ක් ස්වාමිනි.

ප්‍ර : ඒ මුදල්වල ඒ තියෙන අනුක්‍රමික අංක අනුව මේ සියළුම මුදල් එකම අවස්ථාවක කිසියම් බැංකුවකින් ලබාගෙන තිබෙන මුදල්ද කියලා, එවැනි තොරතුරු සොයා ගත්තද?

පි : ස්වාමිණි එහෙම සොයා ගැනීමට අවස්ථාවක් වුනේ නැහැ මොකද මේ සිද්ධියෙන් පස්සේ තමයි අපි අවස්ථා කිහිපයකදී මේ මුදල් නෝට්ටු හොයා ගන්නේ. අපි එකම ස්ථානයක තියලා සිද්ධියෙන් පස්සේ ලක්ෂ 9 යි 80 ක් සොයා ගන්නවා සහින්දමර්දු වොලිවේරියන් ග්‍රාමයේ. නමුත් ඉන් පසුව අපි අත්අඩංගුවට

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගත්තා කල්මුණ සියාම් විසින් ඔහුගේ ගෙදර සඟවලා තිබිලා TV එකක් ඇතුලේ ලක්ෂ 35 ක් හොයා ගන්නවා. ඊට අමතරව ඒ තැනැත්තා ඔහු වැඩ කරන කඩේ මුදලාලිට දීලා ලක්ෂ 5 ක් හොයා ගන්නවා. එතකොට ඒ මුදල් ඒ අවස්ථාවේ භාවිතා වන මුදල් වලින් තමයි අපිට ගෙනත් දුන්නේ, එතකොට හඳුනා ගැනීමක් කරන්න අමාරුයි. නමුත් 980,000 ක් සහ TV එක ඇතුලේ තිබුණ සල්ලිවල අංකයන් සම්බන්ධයෙන් මට ස්ථිරව කියන්න බැහැ නමුත් විමර්ශනයක් අනිවාර්යයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සිදු කරන්න ඕන.

ප්‍ර : කවුද සිද්ධ කරන්නේ කියලා ඔබ කියන්න දන්නේ නැහැ නේද අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ එම මුදල් නෝට්ටුවල..

පි : විමර්ශන කණ්ඩායම් කිහිපයක්ම ආවා. දැනට කරන්නේ කවුද කියලා ස්ථිරව කියන්න අමාරුයි.

ප්‍ර : ඔබ මෙම කොමිෂම හමුවේ ප්‍රකාශ කලා අර නින්දවුර් නිවසේ අයිතිකරුවන් කිව්වා කියලා ඔබලා පල්ලියේ ගිහිල්ලා ලියාපදිංචි වෙන්න එහෙම නැත්නම් එම නිවසින් යන්නට කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහෙම නීතියක් තියෙනවද ප්‍රදේශයකට කවුරු හරි ආවොත් පල්ලියට ලියාපදිංචි වෙන්න ඕන කියලා?

පි : පල්ලියේ ලියාපදිංචි වෙන්න ඕන කියලා ස්වාමිණි නීතියක් නැහැ. නමුත් පොලිස් 76 ෆෝම් එකෙන් අපිට දැනුවත් කිරීමක් කරන්න තියෙනවා . නමුත් අපි කාලයක් ඉද, යුද්දේ පවතින කාලේ ඉඳන් සාමාන්‍යයෙන් පල්ලියේ තමයි අපි කියන්නේ මොකද ඒ සෑම තැනැත්තෙක්ම දවසට පස් වතාවක්, තුන්වතාවක්, දෙවතාවක් පල්ලියට එන හින්දා පිටස්තර කෙනෙක් එනවා නම් අනිවාර්යයෙන්ම 1 වෙනි හඳුනා ගැනීම කරන්න පුළුවන් පල්ලියට.

ප්‍ර : එතකොට අර වොලිවේරියන් නිවසේ කට්ටියටත් එහෙම කියලා තිබුනේ නැද්ද කවුරු හරි ගිහිල්ලා පල්ලියේ ලියාපදිංචි වෙලා එන්න කියලා එහෙම?

පි : තිබුණා ස්වාමිනි. ඒ ගැන විමසන්න යන අවස්ථාවේ තමයි තුවක්කුව අරගෙන සැමන් ටින් එකක් වගේ එකක් අරගෙන අපි උඹලා වෙනුවෙන් තමයි මැරෙන්න හදන්නේ කියලා අරගොල්ලෝ ප්‍රකාශ කරලා තිබුනේ.

ප්‍ර : ආ..ඒ කියන්නේ පොලිසිය ගිහිං සෙව්වද ?

පි : නැහැ, නැහැ ස්වාමිණි ඉස්සෙල්ලාම ගමේ කට්ටියයි, පල්ලියේ කමිටු සාමාජිකයින්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : පල්ලියේ කමිටි සාමාජිකයින් ගිහිං සොයා බැලුවා මේගොල්ලෝ පල්ලියේ ලියාපදිංචි වෙලාද කියලා?

පි : ලියාපදිංචි වෙලාද ඉන්නේ කියලා.

ප්‍ර : සාමාන්‍යයෙන් පුරුද්දක් හැටියට ඒ ගම්වල මිනිස්සුන් කවුරු හරි අළුතින් කවුරු හරි කට්ටියක් ආවොත් පල්ලියේ ලියාපදිංචි වෙන්න කියලා කියනවද?

පි : ඊට ඉස්සෙල්ලා නම් ඒක ස්වාමිණි විශාල වශයෙන් පැවතුනේ නැහැ, නමුත් 21 න් පස්සේ, පස්සේ අනිවාර්යයෙන්ම announce කරලා කිව්වා පල්ලිත් දැනුවත් කළා ඒ සම්බන්ධයෙන්.

ප්‍ර : දැන් ඔබ සඳහන් කලා වොලිවේරියන් නිවාස යෝජනා ක්‍රමය සුනාමියෙන් අවතැන් වූවන්ට හදලා දීපු නිවාස යෝජනා ක්‍රමයක් කියලා. ඒ එක්කම ඔබ කිව්වා කළපුවට ආසන්නේ තිබෙන්නේ කියලා. කළපුවට ගොඩක් ලඟයිද ඒ නිවාස යෝජනා ක්‍රමය? කොච්චරක් වෙලාවකින් කළපුවට යන්න පුළුවන්ද?

පි : ස්වාමිණි කළපුව කිව්වට ඒ හරියේ දැනට ගොඩ වෙලා තියෙන්නේ. ගොඩාක් සාමාන්‍යයෙන් ඇවිදගෙන යන්න බැහැ මඩ ගතිය තියෙන්නේ. මං මීට පෙර ඉන්න කාලේ දැකලා තියෙනවා මීටර් 50 ක් පිටිපස්සට ගියාට පසු ජලය තියෙන්නේ. දැන් එහෙම ජලය නැහැ ගොඩක් තැන්වල දැන් ඒවා ඔක්කොම ගොඩ වෙලා කුඩා ගස් වර්ග වැවිලා තියෙන්නේ. ඉදිරියෙන් කළපුව ගලා බසින පාලම තියෙන තැන තියෙනවා කළපුව ගලා බසින ජල පහර.

ප්‍ර : කළපුවත් එක්ක මුහුදටත් ලඟයිද, ඒ කියන්නේ වොලිවේරියන් නිවාසවලට?

පි : නැහැ ස්වාමිණි මුහුද තියෙන්නේ පාරෙන් අනික් පැත්තේ.

ප්‍ර : ඒ කියන්නේ මේ ගෙදර ඉඳලා කෙනෙක් පැනලා යනවා නම් මේ ගෙදරින් එයාට ගිහිල්ලා මුහුදෙන් කොහාට හරි යන්න ඉක්මණින් කරන්න බැහැ නේද?

පි : ඒ කිට්ටුව හැටියට ස්වාමිණි මුහුදටත් කිලෝ මීටර් 1 ½ ක් විතර තියෙනවා. නමුත් ඒ අවස්ථාවේ හැටියට එහෙම යන්න අමාරුයි එතනින්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාගෙන් අසමි.

අවශ්‍ය බව ප්‍රකාශ කරයි.

****

FAIR COMMENT BY JEZEEM

<u>ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මැතිතුමා:</u>

ප්‍ර : දැන් ඔබගේ සාක්ෂියේ ඔබ කිව්වා මේ පුලස්තිනී කියලා තැනැත්තියක් ගැන, කිව්වා නේද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : දැන් ඒ පුලස්තිනී කියන්නේ හස්තුන් කියන අර කටුවපිටිය බෝම්බකරුගේ බිරිඳ කිව්වොත් හරිද?

පි : නිවැරදියි ස්වාමිණි.

ප්‍ර : දැන් මේ පුලස්තිනී කියන තැනැත්තිය ජීවතුන් අතර ඉන්න බවට තමාට නිශ්චිතව කියන්න පුළුවන්ද?

පි : මට එහෙම නිශ්චිතව කියන්න බැහැ ස්වාමිණි. නමුත් අර වොලිවේරියන් ග්‍රාමයේ සිදු වෙච්ච සිද්ධිමය කරුණු හේතුකොට ගෙන එතෙන්දි වුණු DNA වාර්තා අනුව තමයි ඒ තැනැත්තිය ඒ ස්ථානයේ සිටියා කියලා අපිට වෙනත් පාර්ශ්වවලින් තොරතුරු තියෙනවා. නමුත් DNA සාම්පල පරීක්ෂාවේදී ගැලපීම නොවීම නිසා තමයි ඒ ස්ථානයේ මේ තැනැත්තිය නොහිටියා කියලා අපි තීරණය කරන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.

****

<u>ගරු අදිකාරී මැතිනිය:</u>

ප්‍ර : මිස්ටර් විජේසේකර ඔබ 2019.07 වන මාසේ වෙන කල් වැඩ කලානේ, ඔබ එතකොට හිටියේ කවුරු හැටියටද?

පි : කොට්ඨාශ භාර පොලිස් අධිකාරී.

ප්‍ර : මොන කොට්ඨාශයේද?

පි : අම්පාර කොට්ඨාශ භාර පොලිස් අධිකාරී වශයෙන්.

ප්‍ර : නැහැ ඔබට පාලමුණෙයි කියන ප්‍රදේශය ඔබගේ අම්පාරට අයිති එකක්ද?

පි : ස්වාමිණි පාලමුණෙයි කියන area එක පාලමුණෙයි කියන අදහසක් එනවා කාත්තන්කුඩි පොලිස් වසමෙත් තියෙනවා තැනක්.

ප්‍ර : අර ආරයන්පති කියලා?

පි : නැහැ ඒක ඇවිල්ලා කාත්තන්කුඩි පොලිස් වසමේ තියෙන තැනක්. අනිත් පාලමුණෙයි තියෙන්නේ නින්දවුර් සහ අට්ටාලච්චේන අතර. ඒ පාලමුණෙයි සිදුවීමක් අපේ වුණේ නැහැ.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අර මෝටර් බයිසිකල් බෝම්බයක් පුපුරපු එක?

පි : නැහැ ඒ වුණේ කාත්තන්කුඩි පාලම ලඟ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

සාක්ෂිකරුගෙන් වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි. කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවේ කාර්යය සම්බන්ධයෙන් දැක් වූ දායකත්වය සම්බන්ධයෙන් සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තූතිය පල කරමි.

එසේම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබාදීම හේතුවෙන් සාක්ෂිකරුට 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 25(4) උප වගන්තිය ප්‍රකාරව සාක්ෂිකරුට හිමිවිය යුතු සියළු වරප්‍රසාද සහ අයිතීන් ලබා දෙන ලෙසට අපරාධයක වින්දියන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය වෙත කොමිෂන් සභාව නියෝග කරමි.

සාක්ෂිකරු මුදා හරමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරැදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි.

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය: 2020.07.20 **වෙලාව:- රාත්‍රී 8 යි**

සටහන් කළේ:- ධම්මිකා පෙරේරා විසිනි

ගරු විනිසුරු මඩුල්ල:-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - **සභාපති**

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - **සාමාජික**

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - **සාමාජික**

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - **සාමාජික**

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - **සාමාජික**

<u>පෙනී සිටීම:</u>

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතිඥතුමිය සමඟ ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස්, චතුරංග බණ්ඩාර, දිලන්ත එස්.කළුදුරුවගේ සහ අරින්ද්‍ර ජයසිංහ යන මහත්ම මහත්මීන් පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අඟරදගරු අතිටතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම : **වීරසිංහ දවුන්දයලාගේ සුමින්ද නිහාල් වීරසිංහ,**
වයස : **අවුරුදු 36 යි,**
ජාතිය : **සිංහල,**
ආගම : **බෞද්ධ,**
තනතුර : **පොලිස් සැරයන් 83225**
දැනට සේවා ස්ථානය: **සියඹලාණ්ඩු පොලිස් ස්ථානය**
ප්‍රතිඥා දී කැඳවයි.

රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:

ප්‍ර : වීරසිංහ මහත්මයා ඔබ මේ වන කොට රාජකාරී කරන්නේ කුමන පොලිස් ස්ථානයකට අනුයුක්තවද?
පි : සියඹලාණ්ඩු පොලිස් ස්ථානයේ.
ප්‍ර : ඔබ මීට ප්‍රථම යම්කිසි මහේස්ත්‍රාත් අධිකරණයක හෝ මහාධිකරණයක සාක්ෂි ලබාදීමක් සිද්ධ කරලා තියෙනවද?
පි : නැහැ ස්වාමිණි.
ප්‍ර : මේ ඔබේ පළවන අවස්ථාව කිව්වොත් නිවැරදි ද?
පි : එසේය ස්වාමිණි.
ප්‍ර : වීරසිංහ මහත්මයා ඔබ මුලින්ම ශ්‍රී ලංකා පොලිසිය සමඟ සම්බන්ධ වෙන්නේ කුමන වකවානුවේද?
පි : 2009.02.28 වන දින.
ප්‍ර : කුමන තනතුරකින්ද?
පි : ආධුනික පොලිස් කොස්තාපල්වරයෙක් විදියට.
ප්‍ර : ඉන් පසුව ඔබ කුමන පොලිස් ස්ථානවලට අනුයුක්තව රාජකාරී කරලා තියෙනවද?
පි : යාපනේ කොට්ඨාශයේ වඩුක්කෝඩෙයි පොලිස්ථානයෙත්, පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාශයේ නාරාහේන්පිට පොලිස් රෝහලෙත්.
ප්‍ර : ඔබ 2015 සිට 2020 දක්වා යම්කිසි කොට්ඨාශයකට අනුයුක්තව පොලිස් රාජකාරී සිද්ධ කළාද?
පි : අම්පාර කොට්ඨාශයේ කල්මුණ පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරී කළා.
ප්‍ර : ඔබ ඒ අවුරුදු 5 ම රාජකාරී කලේ කල්මුණේ පොලිස් ස්ථානයේ කිව්වොත් නිවැරදි ද?
පි : නිවැරදියි ස්වාමිණි.
ප්‍ර : කල්මුණේ පොලිස් ස්ථානයට අනුයුක්තව ඔබ කලේ කුමන ආකාරයේ රාජකාරියක් ද?
පි : රථවාහන අංශයට අනුයුක්තව තමයි රාජකාරී කලේ.

President secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් මහත්මයා කල්මුණේ කියන ප්‍රදේශයේ මුස්ලිම් සහ දමිළ ජනතාව ජීවත් වෙනවා කිව්වොත් හරිනේ?

පි : නිවැරදියි ස්වාමිනි.

ප්‍ර : ඔබට දමිල භාෂාව කතා කිරීමේ හැකියාවක් තියෙනවද?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : මහත්මයා ඔබට ඊලඟ උසස්වීම ලැබෙන්නේ කොයි වකවානුවේද?

පි : 2019.04.26 වෙනි දින පාස්කු ප්‍රහාරයට පසුදින, පසුප්‍රහාරය සහින්දමර්දු ප්‍රහාරයෙන් පසුව විශේෂ උසස්වීමක් වශයෙන් පොලිස්පතිතුමාගේ.

ප්‍ර : විශේෂ උසස්වීමක් වශයෙන් පසු දාතම කරලා තමයි ඔබට උසස්වීම ලැබෙන්නේ කිව්වොත් හරිනේ?

පි : නිවැරදියි ස්වාමිණි.

ප්‍ර : දැන් මහත්මයා 2019.04.26 වෙනි දින ඔබ රාජකාරී කලේ කුමන ස්ථානයේද?

පි : මට රාජකාරී පැවරිලා තිබුණේ පැය 18 ඉදලා පසුදින උදෑසන 6 දක්වා රථ වාහන පාලන හා මාර්ග ආරක්ෂාව වශයෙන් එදින තිබුණා අපිට මා සමඟ තව නිලධාරීන් දෙදෙනෙක් සිටියා.

ප්‍ර : ඒ අනුව ඔබට නියෝග දුන්නේ කවුද රථ වාහන අංශයේ ස්ථානාධිපතිවරයාද?

පි : රථ වාහන අංශයේ ස්ථානාධිපතිතුමා.

ප්‍ර : ඒ කියන්නේ හවස 6 ඉදලා උදේ 6 වෙන කල් shift එක නැත්නම් ඒ වැඩ මුරය තමයි ඔබට කරන්න පැවරිලා තිබ්බේ?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඒ අනුව ඔබ කල්මුණේ පොලිස් ස්ථානයෙන් පිටවීමේ සටහන් යොදලා නීලධාරීන් කී දෙනෙක් ගියාද?

පි : තිදෙනෙක්. මා සමඟ තව දෙන්නෙක්.

ප්‍ර : කවුද නිලධාරීන්?

පි : පොලිස් සැරයන් 7773 සේනාරත්නයි, පොලිස් කොස්තාපල් 51134 බණ්ඩාර.

ප්‍ර : සහ ඔබත් ගියා?

පි : මාත් ගියා.

ප්‍ර : දැන් ඔබලා මේ පිටවීම් සටහන් යොදලා කොහොමද පිටත්ව ගියේ?

පි : තුන්දෙනෙක් යන නිසා සාමාන්‍යයෙන් අපි යන්නේ වෙනදා අපිට රථ වාහන අංශයෙන් බයිසිකල් තියෙනවා. නමුත් එදින අපිට බයිසිකල් මුකුත් තිබුන් නෑ පුද්ගලික යතුරුපැදිවලින් තමයි ගමන් කලේ.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප : පුද්ගලික යතුරුපැදිවලින්?

පි : ඔව්.

ප : එතකොට ඔබ තනිවම යතුරුපැදියක ගියාද කොහොමද ගියේ කියලා කියන්න?

පි : එසේය ස්වාමිණි. මා ..

ප : ඒ කියන්නේ තුන්දෙනාම යතුරුපැදි 3 ක ගියාද?

පි : නැහැ,

ප : කොහොමද ගියේ?

පි : පොලිස් සැරයන් සේනාරත්න මහත්තයත් එක්ක බණ්ඩාර මහත්මා ඒ දෙන්නා එක බයිසිකලයක, මා එක බයිසිකලයක.

ප : ඔබලා කුමන ස්ථානයටද ගියේ රාජකාරී කරන්න?

පි : අපිට නියෝග යෙදිලා තිබුණා පැය 18.30 ඉදලා පැය 2 ක කාලසීමාවක් සහින්දමර්දු ප්‍රදේශයේ සංචාරය කරන ලෙසට?

ප : ඒ අනුව ඔබලා කොයි පැත්තේද සංචාරය කළේ 6.30 ට විතර එදා?

පි : අපි පොලිස් ස්ථානයේ සිට යන ගමන්ම රථ වාහන පාලනය කර ගනිමින් බොහෝදුරට සිකුරාදා දිනවල මහජනතාව ගැවසෙන ප්‍රදේශයක් තමයි ඔය සහින්දමර්දු ප්‍රදේශයේ ඔය වොලිවේරියන් ගම්මානය ඒ අවට ප්‍රදේශය.

ප : ඒ සිකුරාදා ඒ පළාතේ නිවාඩු දිනයක්ද?

පි : නිවාඩු දිනයක් ගරු ස්වාමිණි.

ප : එතකොට ඔබලා මොකක්ද කළේ?

පි : එදින රථ වාහන බහුල නිසා එතන මාර්ග, ප්‍රධාන මාර්ගය පටු නිසා රාජකාරී අපි තුන්දෙනා තුන්පැත්තට වී රාජකාරියේ යෙදී සිටියා ස්වාමිණි.

ප : ඔබලා රාජකාරියේ යෙදි සිටි ස්ථානය නැවත කියන්න?

පි : වොලිවේරියන් ගම්මානයට හැරෙන හංදියේ.

ප : වොලිවේරියන් ගම්මානයට හැරෙන හංදිය ගාව?

පි : එසේයි ස්වාමිණි.

ප : ඒ හංදිය තියෙන්නේ කල්මුණේ- මඩකලපු ප්‍රධාන පාරෙන්ද?

පි : එසේය ස්වාමිණි.

ප : එතකොට වොලිවේරියන් ගම්මානයට හැරෙන්න ඕන මුහුදු පැත්තටද නැත්නම් ගොඩබිම පැත්තටද?

පි : ගොඩබිම පැත්තට ස්වාමිණි.

ප : ඔබ එසේ රාජකාරී කරමින් ඉන්න කොට, රථ වාහන රාජකාරී කරමින් ඉන්න කොට යම්කිසි පුද්ගලයෙක් ආවද?

පි : එසේය ස්වාමිණි.

ප : ඇවිල්ලා ඔබට මොනවා හරි කිව්වද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : මොනවද කිව්වේ?

පි : වොලිවේරියන් ගම්මානයේ එක්තරා නිවසකට නාඳුනන පිරිසක් ඇවිල්ලා ඉන්නවා කියලා එයාලට සැකයි, ඒ පිළිබඳව එයාල පල්ලියේ පූජකතුමා සමඟ ගිහිල්ලා කතා කළා නමුත් එයාලා උත්තර දෙන්නේ නැහැ, ඒ හින්දා සැකයි, පොඩ්ඩක් බලන්න යන් කියලා තමයි මුලින්ම කිව්වේ.

ප්‍ර : මේ කතාබහ ඇති වෙන කොට කීයට විතර ඇද්ද වෙලාව?

පි : වෙලාව 18.35 විතර.

ප්‍ර : ඒ කියන්නේ හවස 6.35 වගේ?

පි : ඒ වගේ වෙලා ඇති.

ප්‍ර : කතාබහෙන් පස්සේ මහත්මයා ඔබ මොකක්ද කළේ?

පි : ඒ දුන්නු, එයා කතා කරලා කියපු කතාව මම මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරියාට ගිහිල්ලා කිව්වා ඒ කතාව.

ප්‍ර : ජ්‍යෙෂ්ඨ නිලධාරියා කියන්නේ කවුද?

පි : පොලිස් සැරයන් 7773 සේනාරත්න නිලධාරියාට.

ප්‍ර : ඒ කියන්නේ ඔබත් සමඟ රාජකාරියට ආපු නිලධාරීන්ගෙන් ජ්‍යෙෂ්ඨ නිලධාරියාට තමයි කිව්වේ?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඉන්පස්සේ මොකක්ද සිද්ධ වුණේ?

පි : එතුමා අර කතාව නැවත ඇහුවා. අහලා ස්වාමිණි මම කිව්වා සාජන් මහත්තයා අපි ස්ථානාධිපතිතුමාට දුරකතන ඇමතුමක් අරගෙන අහලා බලමු මේ කතාවට මොනවද කරන්න ඕන කියලා.

ප්‍ර : ඒ අනුව දුරකථන ඇමතුමක් ලබා ගත්තද?

පි : ලබා ගත්තා ස්වාමිණි.

ප්‍ර : කාටද ලබා ගත්තේ?

පි : රථ වාහන අංශයේ ස්ථානාධිපති උ.පොෙ.ප. නිහාල් සිරිවර්ධන මහත්මාට.

ප්‍ර : ඉන් පසුව මොකක්ද සිද්ධ වුණේ?

පි : ඉන්පසුව එතුමා විශේෂ වැඩක ඉන්නවා කියලා සේනාරත්න මහත්මා ගත්ත දුරකථන ඇමතුමට නිසි පිළිතුරක් දුන්නේ නැහැ. ඊට පස්සේ සේනාරත්න මහත්මයා මට කිව්වා ෆෝන් එක, මහත්මයා වැඩක ඉන්නේ බං කියලා ෆෝන් එක තිබ්බා කියලා.

ප්‍ර : ඒ අනුව යම්කිසි අවස්ථාවක නැවත ඔබලා ඔය රථ වාහන අංශයේ ස්ථානාධිපති වන නිහාල් මහතාව සම්බන්ධ කර ගන්නවද?

පි : ඊට පස්සේ මගේ පුද්ගලික දුරකථනයෙන් මම ඇමතුමක් ගන්නවා එතුමාට.

ප්‍ර : නැවත නිහාල් මහතාට ඔබ ගන්නවා?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : මොකක්ද සිද්ධ වෙන්නේ ඒ කතාබහෙන්?

පි : එතුමා ඊට පස්සේ මම ලබාදෙන දුරකථනයට සවන් දෙනවා. මම කියනවා...

ප්‍ර : ඔබ මොකක්ද කියන්නේ?

පි : සර් අපි ඉන්නේ අහවල් වොලිවේරියන් හංදියේ. පුද්ගලයෙක් ඇවිල්ලා සැක සහිත කට්ටියක් ඉන්නවා කියලා කියනවා, සර් මොකක්ද කරන්න ඕන කියලා මම ඇහුවේ.

ප්‍ර : ඉන් පසුව උ.පොා.ප. නිහාල් මහතාගෙන් ඔබට ලැබුණු උපදෙස් මොනවද?

පි : එතුමා කිව්වා මම ඉන්නේ HQI මහත්තයත් එක්ක නින්දවුර්වලට ඇවිල්ලා. මම HQI මහත්තයාගෙන් අහලා පණිවිඩයක් දෙන්නම් ඔහොම ඉන්න කියලා.

ප්‍ර : ඔබ HQI කියන්නේ කල්මුණේ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඒ අනුව මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගෙන් ඔබ ඇතුළු රථ වාහන අංශයේ කණ්ඩායමට උපදෙසක් ලැබෙනවද?

පි : ඊට පස්සේ නැවත එතුමා මට දුරකථන ඇමතුමක් ලබා දී කියනවා ඔයාලා යන්න එපා, යන්නේ නැතුව මොබයිල් එක ගෙන්න ගෙන මොබයිල් එකත් එක්ක සම්බන්ධ වෙලා ස්ථානයට යන්න කියලා?

ප්‍ර : දැන් මේ ඔබට උපදෙස දුන්නේ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමාද නැත්නම් උ.පොා.ප. නිහාල් මහතාද?

පි : නිහාල් සිරිවර්ධන මහතා HQI මහත්තය, ඒ කියන්නේ මු.පොා.ප.තුමාගේ පණිවිඩය එතුමා තමයි කියන්නේ.

ප්‍ර : හරි ඒ අනුව ඔබලා මොකක්ද කරන්නේ දැන්?

පි : ඊට පස්සේ මොබයිල් එකේ දහවල් රාජකාරියේ යෙදී සිටි උ.පොා.ප. අරුණ මහත්මාට ..

ප්‍ර : දැන් මෙහෙම කියන්න කෝ සරලවම මොබයිල් එක ඒ වෙන කොටම ආවද?

පි : නැහැ.

ප්‍ර : ඒ මොබයිල් එක ආවේ නැති වුණයින් පස්සේ ඊලඟට ඔබලා මොකක්ද කළේ?

පි : මොබයිල් එක එන්නේ නැහැ කියලා නෙමෙයි කිව්වේ මොබයිල් එක වෙනත් රාජකාරී යොදවලා තියෙනවා කියලා ස්ථානෙන් කිව්වා. ස්ථානයට දුරකථන ඇමතුම් ගත්තාට පස්සේ. ඊට පස්සේ දැන් මම ගන්නවා අපේ රථ වාහන අංශයේ නිලධාරියෙකුට ඇමතුමක්. එතුමා කිව්වා අපි එන්නම් කියලා. ඒ කියලා ඉවර

FAIR COMMENT BY JEZEEM

වෙලා පණිවිඩය දැනෙන කොටම හඬක් ඇසුණා. ගම්මානේ පැත්තෙන්.

ප : මොන වගේ හඬක්ද ඇසුණේ?

පි : යම්කිසි පිපිරීමක් සිදු වෙනවා වාගේ.

ප : මේ මුලින්ම හඬ ඇහෙන කොට ඔබ කොහේද හිටියේ?

පි : එතකොට මාත් එක්ක අර ගම්වාසීන් එක්ක අපි අර පිළිබඳව කියපු කතාව පිළිබඳව අසමින් සිටින අවස්ථාවක තමයි කිව්වේ.

ප : ඔබ හිටියේ කල්මුණේ - මඩකලපු ප්‍රධාන මාර්ගයේද නැත්නම් එයින් ඔබ කිව්ව ආකාරයට වොලිවේරියන් ගම්මානයට එන අතුරු පාරේද හිටියේ? පළවන සද්දය ඇහෙන කොට ඔබ හිටිය ස්ථානය ගැන තමයි මම අහන්නේ?

පි : ප්‍රධාන මාර්ගයේ තමයි අපි ඒ වෙන කොට සිටියේ.

ප : ඒ ප්‍රධාන මාර්ගයට පැහැදිලිව ඇහුණා මේ සද්දේ?

පි : සද්දේ ඇහුණා.

ප : ඊට පස්සේ ඒ සද්දේ ඇහෙන කොට ඔබට මතක විදියට වෙලාව කීයට විතර ඇද්ද?

පි : 18.40 ත් 50 ත් වගේ අතර කාලසීමාවේ.

ප : ඒ ආසන්න කාලයේ?

පි : ඔව්.

ප : සද්දේ ඇහුණයින් පස්සේ ඔබ කුමක්ද සිද්ධ කළේ?

පි : එතකොට එතන හිටිය අපිට තොරතුරු දෙන්න කියලා ඇවිල්ලා හිටිය ප්‍රජාව ගොඩක් පිරිසක් හිටියා. ඒ පිරිස එක්වරම කෑ ගසන්නට ගත්තා අපේ ළමයි දරුවෝ ඉන්නවා ඒ කට්ටිය බේරගන්න යන්නේ නැද්ද කියලා.

ප : ඒ කියන්නේ මේ වොලිවේරියන් ගම්මානයේ ඉන්න මිනිස්සු එළියට ආවද ඒ වෙන කොට?

පි : ඒ කට්ටිය එළියට ඇවිල්ලා කියන්නේ ස්වාමිණී එදා අර සිකුරාදා දවසක සාමාන්‍යයෙන් එයාලගේ සිරිතක් නිරන්තරයෙන් මහා මාර්ගයේ තමයි ගැවසෙන්නේ. ප්‍රධාන වශයෙන් එක්රැස් වෙනවා ගොඩක් කට්ටිය හැමවෙලේම.

ප : ඒ කියන්නේ කොහොමත් ඉන්නේ පාරේ ඇවිදිමින් එහෙමද?

පි : නිකම් එක්රැස් වෙලා එකමුතුකමින් තමයි නිතරම ඉන්නේ.

ප : ඒ අනුව ඔවුන්ද ඔබට යමක් ගැන ප්‍රකාශ කළේ අපේ දරුවන්ට ප්‍රශ්නයක් වෙයි කියලා?

පි : එසේය ස්වාමිණී.

ප : ඊට පස්සේ ඒ මහජනතාවගේ ප්‍රකාශයෙන් පස්සේ ඔබ මොකක්ද සිද්ධ කළේ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මට එතන හැඟීමක් ආවා දැන් දරුවන්ට කෑ ගහනවා කට්ටිය. මේ කට්ටිය එතන ලොකු භීෂණයක් වගේ දැනුනා. මට දැනුන දේ තමයි එක්කෙනෙක් හරි බෙරා ගන්න ඕන කියන පරමාර්ථය මට හැඟිච්ච දේ නිසා මම බයිසිකලය ගත්තා මම ඉදිරියට ගියා.

ප්‍ර : ඒ කියන්නේ ඔබගේ යතුරුපැදිය?

පි : යතුරුපැදිය ස්වාමිණි.

ප්‍ර : අරන් කොයි පැත්තටද යන්නේ?

පි : වොලිවේරියන් ගම්මානේ පැත්තට. පිපිරුම් හඬ ඇසුණු පැත්තට ස්වාමිණි.

ප්‍ර : ඔබ එතකොට යන කොට මොනවා හරි පාලමක් එහෙම පහු කරනවද?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඔබ එතකොට මොන වගේ පාලමක්ද පහු කළේ?

පි : යකඩ පාලමක් තියෙනවා යකඩ පාලම පහු වෙලා දකුණු පැත්තට තියෙනවා අතුරු මාර්ගය.

ප්‍ර : ඔබ ඒ කියන්නේ දැන් මේ ඒ පැත්තට හරවලා යනවා?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : යන කොට මොකක්ද නිරීක්ෂණය වුණේ?

පි : යන කොට ස්වාමිණි පාර දිගේ ළමයි වඩාගත්තු ගෑණු කට්ටිය, පිරිමි කට්ටිය කෑ ගසමින් දුවගෙන එනවා ගම්මානෙන් එළියට.

ප්‍ර : ගම්මානෙන් එළියට දැන් පුද්ගලයින් දුවගෙන එනවා?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : මේ වෙලාව කීයට විතර ඇද්ද?

පි : 18.50 ඒ ආසන්න වෙලාවක්.

ප්‍ර : දැන් යතුරුපැදිය අරන් ඔබ තනියමද යන්නේ, නැත්නම් ඔබත් සමඟ තව කවුරු හරි යනවද දැන් මේ සිද්ධිය වෙච්ච ස්ථානයට?

පි : මට මතක විදියට මගේ යතුරුපැදියේ පිටිපස්සේ සිවිල් පුද්ගලයෙක් වාඩි වුණා වගේ දැනුනා. මම එයත් දාගෙන තමයි මාත් එක්ක මම බයිසිකලය පැදගෙන ගියේ.

ප්‍ර : ඊට පස්සේ ඔබ කොතෙන්ට වෙන කල් ගියාද?

ස්වාමිනි සාක්ෂිකරුට C882 වශයෙන් ලකුණු කරන ලද ලේඛනය පෙන්වයි.

(ඡායාරූපයක් තිරයේ දිස්වීමට සලස්වයි)

ප්‍ර : මහත්මයා මෙම තිරයේ දැක්වෙන ඡායාරූපය පරීක්ෂා කරලා බලන්න. මහත්තයට මේ ඡායාරූපයේ දැක්වෙන ස්ථානය සහ ප්‍රදේශය හඳුනා ගන්න පුළුවන්ද කියලා පරීක්ෂා කරලා බලන්න?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : මේ කොහේද?

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

පි : වොලිවේරියන් ගම්මානයට ඇතුල් වෙන ප්‍රධාන මාර්ගයේ ඉදන් යන යකඩ පාලම තමයි ඔය දිස්වෙන්නේ. දකුණු අත පැත්තට තියෙන්නේ ඉස්සෙල්ලාම ඔතන මම දැකලා තියෙන විදියට මාළු දැල් වියනවා, මිනිස්සු ටිකක් ගැවසෙන තැනක් ඔය ස්ථානය.

ස්වාමිණි සාක්ෂිකරු විසින් දැනටමත් ලකුණු කර ඇති C882 ඡායාරූපය වොලිවේරියන් ගම්මානයේ ඡායාරූපයක් බවට හඳුනා ගන්නවා.

ප්‍ර : මහත්මයා ඔබ කිව්වා පළවෙනි පිපිරුම් සද්දය ඇහුණයින් පස්සේ ඔබ යතුරුපැදියකින් තවත් සිවිල් පුද්ගලයෙක් නග්ගවාගෙන මේ සිද්ධිය ඇසුණ ස්ථානයට යනවා කියලා?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඔබ දැන් යන්න පටන් ගත්තේ මේ පාලමෙන් ගිහිල්ලද?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඉන්පසු කොච්චර දුර පාලමෙන් දකුණට හැරිලා ඔබ ගමන් කළාද, මතක හැටියට දළ වශයෙන්?

පි : තව අතුරු මාර්ග 2 ක් ඉස්සරහාට තියෙනවා.

ප්‍ර : අතුරු මාර්ග කියන්නේ වම් පැත්තට හැරෙන්නද දකුණු පැත්තටද?

පි : වම් පැත්තට හැරෙන්න. ගම්මානය පැත්තට හැරෙන්න.

ප්‍ර : ඒ අතුරු මාර්ග දෙකෙන් ඔබ හැරුණද කෙලින්ම ගියාද?

පි : කෙලින්ම ගියා.

ප්‍ර : ඒ අතුරු මාර්ග දෙකම පාස් කරන් ගියා?

පි : පාස් වුණා.

ප්‍ර : ඊට පස්සේ?

පි : 3 වන අතුරු මාර්ගයේ තමයි මා බයිසිකලය නවත්වන්නේ.

ප්‍ර : ඔබ 3 වන අතුරු මාර්ගයෙන් වමට හැරෙනවද නැත්නම් ඔබ හරවන්නේ නැතුව හංදියේ බලා ඉන්නවද?

පි : ඒ හැරෙන හංදියේම බයිසිකලය නවත්වනවා. නවත්වලා මම බයිසිකලයෙන් බහිනවා. බැස්සට පස්සේ මාත් එක්ක විශාල පිරිසක් පිටිපස්සෙන් ඇවිල්ලා තියෙනවා කියලා දැන ගත්තේ මම එතකොට. ඒ වෙන කොටත් අර ප්‍රදේශයේ ජනතාව ගොඩක් ඒ හංදියේ හිටියා. ඊට පස්සේ ..

ප්‍ර : දැන් ඔබ බැලුවද ඒ පාරේ ඉදන් මේ සිද්ධිය වෙච්ච ස්ථානය ඒ පැත්ත බැලුවාම පෙනුනද, මොනවා හරි නිරීක්ෂණය වුණාද ඔබට?

පි : ඔව් මම හංදියේ නැවතුනාට පස්සේ නිවසක් පිටිපස්සෙන් දුමක් යනවා දැක්කා ස්වාමිණි.

ප්‍ර : ඔබ එම ස්ථානය නිරීක්ෂණය කරන කොට ඔබ සඳහන් කළා යම්කිසි දුමක් වගේ දැක්කා කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඒ කියන්නේ සම්පූර්ණම නිවස ගිණිගෙන වගේ දුමක්ද දැක්කේ නැත්නම් පොඩි දුමාරයක් වගේද?

පි : ගේ පිටිපස්සකින් වගේ දුමක් එනවා වගේ දැනුනේ.

ප්‍ර : ඔබ ගින්දර දැක්කද දුමක්ද දැක්කේ?

පි : දුමක් දැක්කේ.

ප්‍ර : ඊට පස්සේ ඔබ මොකක්ද කළේ?

පි : ගෙදරක පිටිපස්සෙන් වගේ දුමක් නැගෙනවා දැක්කා. ගේ ඉදිරිපිට තිබුණා මම දැක්කා වෑන් එකක්. පොඩි වෑන් එකක් වගේ නවත්තලා තියෙනවා.

ප්‍ර : කුමන වර්ගයේ වෑන් එකක්ද?

පි : ඒ වෙන කොට නම් වර්ගය මට මතක නැහැ, පස්සේ මම දන්නවා ඒක සුසුකි එවරියක් කියලා.

ප්‍ර : ඔබ ඊට පස්සේ ඒ නිවස දෙසට ගමන් කරන්න උත්සාහ කළාද මොකක්ද ඔබ සිද්ධ කළේ?

පි : උත්සාහ කළේ නැහැ, මම එතන නැවතිලා ඉන්න කොට ඊට පස්සේ මාත් එක්ක හිටපු කට්ටිය කිව්වා මේ නවත්වා තියෙන වාහනෙන් තමයි ඒ සැක සහිත කට්ටිය ආවේ, ඒ කියන කොටම නිවස ඇතුලෙන් සුදුපාටට හුරු ටී ෂර්ට් එකක් ඇඳපු පුද්ගලයෙක් එළියට එනවා මම දැක්කා.

ප්‍ර : දැන් මේ නිවස ඇතුලෙන් කියන්නේ අර දුම් දාන නිවස ඇතුලෙන්ද?

පි : දුම දාන්නේ නිවසේ පිටිපස්ස කියලා තේරුනේ මට පස්සේ. ඉස්සරහා පැත්තෙ තමයි වාහනය නවත්වලා තිබුණේ. වාහනය අසලින් පුද්ගලයෙක් නිවස ඇතුලෙන් එළියට එනවා මම දැක්කා. ඒ දකින කොටම පිටිපස්සේ හිටිය කට්ටිය කිව්වා අන්න අන්න අරයා තමයි සැක සහිත පුද්ගලයා කියලා.

ප්‍ර : දැන් මේ එළියට ආපු පුද්ගලයා මොන වගේද මහත්මයා? ඔබට මතකද ඔහු මොකක්ද ඇඳ සිටියේ කියලවත්?

පි : සුදුපාටට වගේ හුරු ටීෂර්ට් එකක්. කොට කලිසමක් තමයි ඇඳලා හිටියේ නිකම් ත්‍රීකෝටක් වගේ.

ප්‍ර : ඊට පස්සේ දැන් මේ වෙන කොට ඒ නිවසේ වහලේ උඩ කවුරු හරි ඉන්නවා ඔබ නිරීක්ෂණය කලාද?

පි : මා දුටුවේ නැහැ ස්වාමිණි.

ප්‍ර : දැන් මේ වෙන කොට වෙලාව කීයට විතර ඇතිද, 6.50 විතරද?

පි : ඒ වෙන කොට 6.50, 7 වගේ වෙලා ඇති ස්වාමිණි.

ප්‍ර : මේ වෙන කොට ඔබට කිසිදු වෙඩි ශබ්දයක් ඔබට මීට ප්‍රථම ඇහිලා නැහැ? මේ පුද්ගලයා ඇවිල්ලා කොට කලිසමක් ඇඳගත්ත

FAIR COMMENT BY JEZEEM

පුද්ගලයා ඇවිල්ලා බලන කොට කිසිදු වෙන වෙඩි සද්දයක් ඔබට ඇහුනේ නැද්ද?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : එතකොට ඒ පුද්ගලයා බලලා ගියායින් පස්සේ ඊට පස්සේ ඔබ මොකද කළේ?

පි : ඒ පුද්ගලයා ආපු ගමන් අපි ඉන්න දිහා බැලුවා. බලලා ක්ෂණිකව ගේ ඇතුලට ගියා.

ප්‍ර : නැවතත් නිවස ඇතුලට ගියා?

පි : නිවස ඇතුලට ගියා.

ප්‍ර : ඊට පස්සේ මොකක්ද සිද්ධ වුනේ මහත්තයා ඉන් අනතුරුව?

පි : නිවස ඇතුලට ගියාට පස්සේ වෙනත් පුද්ගලයෙක් ආවා නිවසින් එළියට ආපහු අර තැනැත්තා ආපු ආකාරයටම.

ප්‍ර : ඒ කියන්නේ අර ඔබ ගැන තොරතුරු බලන් ගිය පුද්ගලයා නෙමෙයි තවත් පුද්ගලයෙක්?

පි : තවත් පුද්ගලයෙක්.

ප්‍ර : ඔහු මොකක්ද කලේ?

පි : දොරෙන් එළියට බහින කොටම මං දැක්කා weapon එකක් තියෙනවා වගේ.

ප්‍ර : දැන් අර මුලින් ආපු පුද්ගලයා අතේ weapon එකක් තිබුණේ නැද්ද?

පි : තිබුණේ නැහැ ස්වාමිණි.

ප්‍ර : දෙවෙනියාට ආපු පුද්ගලයාගේ අතේ මොන වගේ weapon එකක්ද තිබුණේ?

පි : T56 වර්ගයේ ගිනිඅවියක් වගේ

ප්‍ර : ඊට පස්සේ ඔබ නිරීක්ෂණය කලාද මේ පුද්ගලයා මොනවද ඇඳන් ඉන්නේ ඒ වගේ එකක් කියලා බලා ගන්න පුළුවන් වුණාද?

පි : අඳුරු ගතියත් එක්ක පැහැදිලිව දක්නට, ඉරි වගේ ටී ෂර්ට් එකක් වගේ නම් දැක්කා. එයා දිග කලිසමක් වගේ, බොටම් එකක් වගේ ඇඳලා හිටියේ.

ප්‍ර : එතකොට තුවක්කුවක් T56 වගේ ගිනිඅවියක් ඇගෙන ආපු පුද්ගලයා මොකක්ද සිද්ධ කලේ?

පි : අපි ඉන්න පැත්තට එල්ල කරලා වෙඩි ප්‍රහාර කිහිපයක් එල්ල කලා. 3 ක්, 4 ක් වගේ ප්‍රමාණයක්. ඒ වෙන කොට..

ප්‍ර : ඒ කියන්නේ ඒවා පුද්ගලයින් ඉලක්ක කරලා එල්ල කරපුවද කොහාටද එල්ල කලේ?

පි : මට හැඟී ගියේ නම් අපි බය ගස්වන ආකාරයට. අපිට එල්ල කරලා වගේ නෙමෙයි අපි..

Prosecution Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ අනතුරු ඇඟවීමක් වගේද?

පි : අනතුරු ඇඟවීමක් වගේ තමයි.

ප්‍ර : ඒ කියන්නේ ඔබත් සමඟ තව කවුද හිටියේ එතන බලාගෙන?

පි : සිවිල් ජනතාව හිටියා.

ප්‍ර : සිවිල් ජනතාව විශාල ප්‍රමාණයක් හිටියද?

පි : විශාල ප්‍රමාණයක් හිටියා.

ප්‍ර : ඒ එක්කෙනෙක්ටවත් මේ එක වෙඩි පහරක්වත් වැදුනේ නැද්ද?

පි : නැහැ ස්වාමිණි.

ප්‍ර : ඒ වෙඩි තැබුවායින් පස්සේ, වෙඩි පහරවල් කිහිපයක් තැබුවා කියලා ඔබ කියනවා, ඊට පස්සේ ඔබ මොකක්ද කලේ?

පි : එතන තිබුණු ආවරණයක් විදියට මට ගන්න තිබුණු බැම්ම තිබුණා. ආරක්ෂිත විදියට මම ආවරණය වුණා. එතන ඉඳන් මම කෑ ගහලා කිව්වා කට්ටියට වෙඩි තියනවා ඉක්මනට අයින් වෙන්න කියලා. ඒ කියනවත් එක්කම මම බයිසිකලය අරගෙන නැවත ප්‍රධාන මාර්ගය පැත්තට බයිසිකලයත් අරන් එනවා මම.

ප්‍ර : දැන් මහත්මයා මේ වෙඩි තැබීම, වෙඩි rounds කිහිපයක් තිබ්බා කිව්වානේ, මේ වෙඩි තැබීම සිද්ධ වෙන කොට වේලාව කීයට විතර ඇද්ද ඔබට මතක විදියට?

පි : 7.05 වගේ.

ප්‍ර : 7, 7.05 කිව්වොත් හරි?

පි : ඔව් ස්වාමිණි.

ප්‍ර : මේ වෙන කොට ඔබට පිපිරීම් සද්දයක් ඇහිලා තියෙනවා, වෙඩි සද්ද කිහිපයක් ඇහිලා තියෙනවා?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : දැන් මේ වෙඩි තිබ්බයින් පස්සේ ඔබ යතුරුපැදියේ නැග්ගා කිව්වානේ,?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඊට පස්සේ ඔබ මොකද කලේ ඔබ?

පි : මම ඊට පස්සේ කෑ ගහගෙන එනවා වෙඩි තියෙනවා. කට්ටිය අයින් වෙන්න කියාගෙන එන ගමන් පාලම ආසන්නයට වගේ එන කොට ..

ප්‍ර : ඒ කියන්නේ මේ C882 කේ දැක්වෙන මේ පාර දිගේ ආයි ඔබ නැවත එනවා?

පි : නැවත එනවා ස්වාමිණි .

ප්‍ර : පාලම දෙසටද එන්නේ?

පි : පාලම දෙසට.

ප්‍ර : දැන් ඔබ පාලම දෙසට එන කොට මොකක්ද සිද්ධ වුණේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒ එනකොට මගේ අනික් නිලධාරීන් දෙන්නා මඟ සිටියා. ඒ කට්ටියට ඔක්කොම කෑ ගහගෙන අපි මෙහේට එනකොට මට නැවත වතාවක් ඇහුනා පිපිරීම් හඬක්.

ප්‍ර : තව පිපිරීම් සද්දයක් ඇහුණු?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඒ පිපිරීම් සද්දය අර මුල් වතාවේ ඇහිච්ච එක වගේමද නැත්නම් ඊට විශාල පිපිරීම් සද්දයක්ද ඔබට ඇහිච්ච විදියට?

පි : මුල් එකට වඩා ප්‍රබලත්වයක් තිබුණා වගේ, සද්දය වැඩි ගතියක් තිබුණා වගේ ස්වාමිණි.

ප්‍ර : දැන් මේ දෙවන පිපිරීම් සද්දේ ඇහෙන කොට වෙලාව කීයට විතර ඇත්ද මහත්තයා?

පි : 7.10 පමණ. 10, 20 අතර ඇති.

ප්‍ර : මේ දෙවන පිපිරීම වෙන කොට?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : ඒ 2 වන පිපිරීම් සද්දේ ඇහෙන කොට ඔබ කොතනද හිටියේ මේ C882 ඡායාරූපයට අනුව?

පි : නිශ්චිත වශයෙන් නම් මතක නැහැ.

ප්‍ර : දළ වශයෙන්?

පි : දළ වශයෙන් පාලමේ මැද කොටස වගේ.

ප්‍ර : යනකල් ඔබ යතුරුපැදියෙන් ඇවිල්ලා?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : දැන් මේ වෙන කොට පොලිස් නිලධාරීන් මේ ස්ථානයට ඇවිල්ලා හිටියද?

පි : දැනුවත් වෙලා හිටියේ නැහැ. අපේ නිලධාරීන් දෙදෙනා හැරෙන්න මම, ඒ හඬක් එක්කම මම ප්‍රධාන මාර්ගය පැත්තට එන කොට අපේ පොලිස් අධිකාරීතුමා කොට්ඨාශ භාර එතුමා සමඟ නිලධාරීන් කිහිප දෙනෙක් හිටියා.

ප්‍ර : ඔවුන් මේ ස්ථානයට එන ගමන්ද හිටියේ?

පි : ඇවිල්ලා හිටියේ මම හිතන විදියට.

ප්‍ර : ඒ කියන්නේ දෙවන පිපිරීම් වෙන කොට පොලිස් අධිකාරීතුමා ඇවිල්ලා?

පි : ඇවිල්ලා හිටියේ ස්වාමිණි.

ප්‍ර : පොලිස් අධිකාරීතුමාගේ නම කියන්න?

පි : සාමන්ත විජේසේකර.

ප්‍ර : ඔහු ඒ කියන්නේ 2 වන පිපිරීම ඇහෙන මානයේ තමයි හිටියේ?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : දෙවෙනි පිපිරීමෙන් පස්සේ ඔබ සිද්ධ කලේ මොකක්ද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : දෙවෙනි පිපිරීම වෙන කොට මා එන කොට සාමන්ත සර් හිටියා. එතුමා ඇහුවා මොකක්ද වුණේ කියලා. ඊට පස්සේ මම ඔය මුලින් කිව්ව කතාව කිව්වා. සිද්ධිය. එතකොට යුද හමුදාවත් ඇවිල්ලා හිටියා මම හිතන්නේ කල්මුණේ නිලධාරීන් වෙන්න ඇති. එතුමා කතාව ඇහුවා. කතාව අහගෙන ඉන්න ගමන් වටා ආරක්ෂාවට නිලධාරීන් යොදා ගත්තා ඒ ආසන්නයේ ලඟටම.

ප්‍ර : හරි?

පි : ඊට පස්සේ තව යුද හමුදා ට්‍රක් රථයක් එතනින් ගියා. ඒ කට්ටියත් නවත්වා ගත්තා.

ප්‍ර : ඒ කියන්නේ මේ වට ආරක්ෂාව යොදන්න ගත්තේ ඔබ කියන දෙවන පිපිරීමට පස්සේ. ඒ කියන්නේ 7.10 විතර පැනලා තමයි වට ආරක්ෂාව යොදන්න පටන් ගත්තේ?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : එතකල් ඔබ නීතිය බලාත්මක කරන නිලධාරියෙක් විදියට එම ස්ථානයේ හිටියේ පළවෙනි පිපිරීමේ ඉදලා 2 වන පිපිරීම දක්වා ඔබ පමණයි?

පි : මා සමඟ මගේ සහායක නිලධාරීන් දෙදෙනා මා දන්න හැටියට.

ප්‍ර : ඔබ ඒ අනුව පොලිස් අධිකාරීතුමත් සමඟ එකතු වෙලා ඉතුරු මෙහෙයුම්වලට සහභාගී වුණා කිව්වොත් නිවැරදි ද?

පි : අනෙකුත් හැම, රාජකාරී මට්ටමින් හැම දේකටම සහභාගී වුණා.

ප්‍ර : ඔබ එතකොට එදින විවේකය වාර්තා කලේ කීයටද?

පි : රාත්‍රී 1 ට පමණ මූලස්ථාන පොලිස් පරීක්ෂකතුමා කිව්වා දැන් ගිහිං විවේක ගන්න හෙට උදේට ආයේ නැවත ඔයාලා එන්න ඕනේ, ඒ නිසා දැනට ගිහිල්ලා විවේක අරගෙන උදෙන්ම පාන්දරින් එන්න කියලා.

ප්‍ර : ඔබ අර කිව්වානේ ඔබට වෙඩි තැබුවා කියලා යම්කිසි පුද්ගලයෙක් ඉරි ඉරි ෂර්ට් එකක් ඇඳගෙන සහ බොටම් එකක් ඇඳගෙන?

පි : එසේය ස්වාමිණි.

ප්‍ර : එම පුද්ගලයාගේ ඡායාරූපයක් දැක්කොත් ඔබට නැවත හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි : මුහුණ නම් ඒතරම් එහෙම මතකයක් නැහැ,

ප්‍ර : ඇඳුම?

පි : ඇඳුම මතකයි මට.

ප්‍ර : හඳුනා ගන්න පුළුවන්?

පි : එසේය ස්වාමිණි.

දැන් වේලාව : රාත්‍රී 8.30 යි.

මෙතැන් සිට ල/ලේ :- යමුනා දසනායක මිය විසින්ය.

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් දම්මිකා.
සටහන් ගැනිම ල/ලේ යමුනා දසනායක.
වේලාව ප. ව. 8. 30

<u>රජයේ අධිනීතිඥ චතුරංග බංඩාර මහතා</u>

ස්වාමිනි සාක්ෂිකරුට C.885 A වශයෙන් දැනටමත් ලකුණු කර ඡායාරූපය ඇති පෙන්වා සිටිනවා.

ප්‍ර මහත්මයා මෙම ඡායරූපය පරීක්ෂා කරන්න? මේ ඡායාරූපයේ ඉන්න පුද්ගලයා ඇද සිටින ඇදුම ඔබට හඳුනාගන්න පුලුවන්ද?

උ මෙයා තමයි අර අපිට මං ඒ අර ස්ථානයේ ඉන්නකොට වෙඩි තියන්න කියලා වෙපන් එක අරන් ආවේ මට හිතන විදියට මෙයා තමයි.

ප්‍ර එවැනි ආකාරයේ ඇදුම්ද තියෙන්නේ?

උ මේ විදියට තමයි එයා හිටියේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u> .

ඔබ නිර්භීතව ඔබගේ රාජකාරි කටයුතු කිරීම සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව ඔබට ප්‍රසංශා කරනවා.

උ ස්තුතියි ස්වාමීනි

ප්‍ර ප්‍රශ්නය තියෙන්නේ ඔබ කරපු මේ ක්‍රියාවලියට ඒ බොලිවියන් ගම්මානයේ සිටපු අනෙකුත් ජනතාවගෙන් කොයිවිදියේ සහයෝගයක්ද ලැබුණේ ඒකට?

උ ඒ අවස්ථාවේදි එයාලා තිගැස්සිලා ඉන්න ඇත්තේ මට හැඟෙන විදියට නම් මම දැක්කට පස්සේ එයාලට ලොකු හයියක් ඇතිවුනා වගේ දැනුනා. එයාලා මට කීවා එකපාරක් මට වෙඩිතියන්න කියලත්, නමුත් මම ඒ ක්‍රියා මාර්ගවලට යොමුවුනේ නැහැ. මගේ අවිය පොඩි අවියක් තිබුණේ ඒකෙන් ප්‍රහාරයක් දියත් කරන්න තරම් දුරක නෙවෙයි මම හිටියේ. ඊට වඩා දුරයි . ඊට වඩා මට වුවමනාව තිබුනේ එතන ආරක්ෂාකාරීව ජනතාව බේරාගැනීම එතනින්. මම ඒ අරමුණින් ඒ ජනතාව මම බේරාගත්තා හැකි අයුරින්.

ප්‍ර නමුත් ඔබට ඒ ක්‍රියාදාමය කිරීමට එම බොලිවියන් ගම්මානයේ හිටපු ජනතාවගෙන් ලැබුණු සහයෝගය හුගක් උපයෝගී වුනා කියලා කිව්වොතින් නිවැරදිද?

උ එසේය ස්වාමීනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවශ්‍යතාවක් ඇත්ද යන්න අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතීඥවරයාගෙන් අසමි. නැත යනුවෙන් ප්‍රකාශ කරයි.

සාක්ෂිකරු කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් දැක්වූ දායකත්වයට කොමිෂන් සභාවේ ස්තුතිය සාක්ෂිකරුට පළකරනවා.

සාක්ෂිකරු මුදාහරිනවා.

කොමිෂන් සභාව නැවත ජූලි මස 21 වෙනි දින ප.ව.12.30ට රැස්වන බව සදහන් කරනවා.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා තේරුම් ගෙන මෙම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාතේ අත්සනතබන ලදි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදුවූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශණය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය - 2020-07-21 වේලාව .ප.ව. 2.15

සටහන් කලේ යමුනා දසනායක විසිනි.

ගරු විනිසුරු මඩුල්ල -

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති.

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා. සාමාජික

03. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා. සාමාජික

04. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා සාමාජික

05 හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් . එම්. එම්. ආර් අදිකාරි මහත්මිය සාමාජික

පෙනී සිටීම

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ට රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය , රජයේ අධිනීතිඥ නිමේෂාද අල්විස් මෙනවිය , රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර , රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීම සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නිති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර ලබා දෙන ලදි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම - .යෝගේෂ්වරන් අරුණන්.
වයස - .අවු 29 යි.
ජාතිය- ද්‍රවිඩ
ආගම - හින්දු
රැකියාව- උප පොලිස් පරීක්ෂක ස්ථානය කල්මුණේ.

දෙමළ භාෂාවෙන් ප්‍රතිඥා දෙයි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බංඩාර මහතා</u>

ප්‍ර මහත්මයා ඔබට සිංහල භාෂාව කතා කිරීමට හා තේරුම් ගැනීමට හැකියාවක් තියෙනවාද?

උ තේරුම් ගන්න හැකියාවක් තියෙනවා.

ප්‍ර කතා කරන්නත් පුලුවන්?

උ පුලුවන්.

ප්‍ර ඔබ මුලින්ම ශ්‍රී ලංකා පොලීසිය සමඟ සම්බන්ධ වෙන්නේ කොයි කාලෙද?

උ 2012/01/25 වෙනි දින.

ප්‍ර කුමන නිලයකටද ඔබ සම්බන්ද වෙන්නේ ?

අ ආදුනික උප පොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන් ශ්‍රී ලංකා පොලිස් විදයාලයට මං බැඳෙනවා.

ප්‍ර ඒ අනුව ඔබ ආධුනික පොලිස් පරීක්ෂක වරයෙක් වශයෙන් දිවයිනේ කුමන ස්ථාන වල රාජකාරි කරනවාද ?

උ ආධුනික උප පොලිස් පරීක්ෂක වශයෙන් අවුරුදු එක හමාරක් කාලයක් පමණ පුහුණුව ලැබුවායින් පසුව ත්‍රිකුණාමල මුලස්ථාන පොලීසියට අනුයුක්තව රාජකාරි කරමින් පසුව 2017 අවුරුද්දට කල්මුණේ පොලිස් ස්ථානය පැමිණෙනවා රාජකාරි කරන්න.

ප්‍ර 2017 වර්ෂයේදි ඔබ කුමන පොලිස් ස්ථානයටද එන්නේ ?

උ කල්මුණේ පොලිස් ස්ථානයට.

ප්‍ර කල්මුණේ පොලිස් ස්ථානයේද ඔබ මේ වෙනකොටත් රාජකාරි කරන්නේ ?

උ කල්මුණේ පොලිස් ස්ථානයේ.

ප්‍ර කල්මුණේ පොලිස් ස්ථානයට අනුයුක්තව ඔබට කරන්න පැවරිලා තිබුනු රාජකාරි මොනවාද ?

උ කලින් මම ස්ථානාධිපති වශයෙන් අපරාධ විමර්ශන අංශයට මං ස්ථානාධිපති වශයෙන් කටයුතු කරා. රාජකාරි කරා.

ප්‍ර කල්මුණේ පොලිස් ස්ථානයේ අපරාධ පරීක්ෂණ අංශයේ ?

උ ස්ථානාධිපති ලෙස.

ප්‍ර ඊට අමතරව තව මොනවද ඔබට කරන්න පුලුවන් රාජකාරි ?

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

උ නොවිසිඳු අපරාධ අංශයෙත් මම රාජකාරි කලා.

ප්‍ර 2019/04/21 වන දින වෙන කොටඔබ රාජකාරි කලේ කුමන නතුරේද කල්මුණේ පොලිස් ස්ථානයේ කුමන අංශයේද?

උ නොවිසුඳු අපරාධ ඒකකයේ මම ස්ථානාධිපති ලෙසින් කටයුතු කලා.

ප්‍ර ඒ අනුව 2019/04/26 දින යම්කිසි සිද්ධියක් සිදුවුනා දන්නවාද ඔබගේ පොලිස් බල ප්‍ර දේශයේ?

උ ඔව්.

ප්‍ර මොකක්ද ඒ සිදුවීම ?

උ හවස පහ හමාර හය වෙන කාලය ඇතුල බෝම්බ ශද්ධයක් ඇහුනා එතකොට මම .

ප්‍ර සවස තමයි සිදුවීම සිද්ධ වුනේ?

උ එව්.

ප්‍ර ඊට පස්සේ ඔබ ඒ ස්ථානයේ හිටියේ නැද්ද ඒ වෙලාවේ?

උ නැහැ.

ප්‍ර හිටියේ නැහැ. ඔබ රාජකාරි කලේ කොහෙද ඒ වෙන කොට?

උ මම ඒ කාලේ.

ප්‍ර 2019/04/26 ඔබ හවස් වරුවේ කොහේද රාජකාරි කරමින් සිටියේ ?

උ 2019/04/26 වෙනි දින උදේ 6 සිට සවස 6 දක්වා මම mobile duty ඩියුටි හිටියේ. ජංගම ඩියුටි

ප්‍ර දැන් මෙම පිපිරීමට පස්සේ 4/27 වෙනිදා ඔබ මෙම පිපිරුම් ස්ථානයට යනවාද ?

උ මං ගියා.

ප්‍ර ඔබට පැවරිලා තිබුණු රාජකාරි තමන් ඉෂ්ට කලා කිව්වොත් නිවැරදිද ?

උ ඉෂ්ඨ කලා.

ප්‍ර මේ සිදුවීම් දෙකට පස්සේ 21 දිවයිනේ විවිධ ප්‍රදේශවල බෝම්බ පිපිරෙනවා 26 ඔබලාගේ පොලිස් බල ප්‍රදේශයේම බෝම්බයකුත් පිපිරෙනවා ඒ සිදුවීම් දෙකට පස්සේ එනම් 2019/05/03 වෙනි දින ඔබට යම්කිසි තොරතුරක් ලැබෙනවාද ?

උ ඔව්.

ප්‍ර ඒ වෙලාවේ මට දුරකථනයකින් මට යම්කිසි තොරතුරක් ලැබුනා සිතාපේඩු ගම්මානයේ ?

ප්‍ර සාමාන්‍යයෙන් කීයට විතරද මේ තොරතුර ලැබුනේ ?

උ සාමාන්‍යයෙන් මතකේ හැටියට 12 , 2,1 වෙද්දී හරියටම මතක නැහැ මට.

ප්‍ර සටහන් දාලා තියෙනවාද ?

උ පිටවීමේ සටහන දාලා තියෙනවා තොරතුරු ආව වෙලාව ඒ කියන්නේ හරි වෙලාව මට මතකනැහැ.

ප්‍ර මතක වෙලාව කීයට විතරද සාමාන්‍යයෙන්?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ මතකේ හැටියට එක හමාර දෙක වෙද්දි.

ප ඒ අනුව ඔබට ලැබිච්ච තොරතුරු කරුගෙන් මොනවද ඔබට ලැබුනු තොරතුරු ?

උ 105/ 106 ගෙදර ශ්‍රාස්ත්‍රිය පාර, තේතාතිව් , මාන්වඩු ගම්මානයේ මුස්ලිම් ගැහැණු ඒ ගොල්ලන් අඳින ඇදුම් සමඟ ඇවිල්ලා ඉන්නවා කියලා ඒක පොඩ්ඩක් ඇවිල්ලා පරීක්ෂා කරන්න කියලා තොරතුරක් ලැබුනා.

ප නැවත පිළිතුර පැහැදිලිව කියන්න මම අහන්නේ ඔබගෙන් ඔබ කිව්වානේ 2019/05/03 වෙනි දින ඔබට යම්කිසි තොරතුරක් ලැබුනා තොරතුරු කරුවෙක් මාර්ගයෙන්?

උ ඔව්.

ප මම අහන්නේ ලැබිච්ච තොරතුර මොකක්ද කියලා ?

උ ලැබිච්ච තොරතුර 105 , 106 ගෙදර.

ප 105/106 කියන්නේ ගෙවල් දෙකක්ද?

උ ගෙවල් දෙකක්.

ප ඒ ගෙදර ඉන්න අයගෙන් ගෙදර මුස්ලිම් කාන්තාවන් මුස්ලිම් ඇදුම් සැරසි ඉන්නවා තියලා තොරතුරක් ලැබුනා.

ප මේ 105/106 කියන්නේ කොහේ ගම්මානයක්ද?

උ ඒක තේතාතිව් ගම්මානය.ඒක tamil ගම්මානයක්.

ප තේතාතිව් කියන්නෙ දමිළ මිනිසුන් පමණක් වාසය කරන ගමක්?

උ ගමක්.

ප එතකොට ඔබ මොකක්ද කරේ ඒ සම්බ න්ධයෙන් ?

උ එතකොට මේ ලැබිච්ච තොරතුර අපි මුලස්තාන පොලිස් පරීක්ෂක තුමාට දැනුම් දුන්නා ඉන්පසුව මහත්මයාගේ අවසරය පරිදි මා සමඟ පොලිස් සැරයන් කෙනෙකුයි පොලිස් කොස්තාපල් කෙනකුයි ඒ නිවසට ගිහින් පරීක්ෂා කලා.

ප දැන් ලැබුනු තොරතුර මුස්ලිම් කාන්තාවක් ඉන්නවා කියලා ද නැත්නම් යම්කිසි විශේෂ පුද්ගලයෙක් ඉන්නවා කියලාද?

උ මුස්ලිම් කාන්තාවක් ඉන්නවා කියලා තමයි තොරතුරක් ලැබුනේ.
එතකොට මම SIS කට්ටියත් සමඟ රාජකාරි කරමින් සිටියදී මම දන්නවා ඒ තේතාතිව් ගම්මානය මෙහෙම මුස්ලිම් Tamil convert වෙලා ගියපු Tamil කාන්තාවක් ඉන්නවා කියලා මං දන්නවා ඒක. මම රාජ්‍ය බුද්ධි අංශයේ නිළධාරි සමඟ duty කරමින් සිටියදී දන්නවා Tamil lady කෙනෙක් convert වෙලා මුස්ලිම් ආගමට ගිහින් මෙහෙම ඉන්නවා කියලා දන්නවා සමහර වෙලාවට එයා වෙන්න පුලුවන් කියලා සාධාරණ සැකයක් මට ඇති වුනා .

ප ඒ කියන්නේ ඔබ ඒ තොරතුර දැන ගත්තේ රාජ්‍ය බුද්ධි අංශයේ නිළධාරීන් මාර්ගයෙන්?

FAIR COMMENT BY JEZEEM

උ ඒ ගොල්ලන් එක්ක මම සමහර ඒ ගොල්ලන් අත්අඩංගුවට ගත්ත පුද්ගලයින් කතා කරන්න translate කරන්න මම ඉන්නවා . ඒ ගොල්ලන්ගෙත් එක්ක ඩියුටි කරමින් සිටියදී දන්නවා යම්කිසි මොකක් හරි inquiry එකක් .

ප ඔබ ඒ දැන ගත්ත ඒ දැන් ඔබ කිව්වානේ convert වෙලා ආගමට වෙනත් ආගමකින් මාරු වෙච්ච දමිළ කාන්තාවක් ගැන ඒකාන්තාව කව්රු විදියටද ඔබට දැන ගන්න ලැබුනේ ?

උ සාරා කියලා කාන්තාවක් ඉන්නවා කියලා මුස්ලිම් නම සාරා .

ප දමිළ නමක් තිබුනානේ ?

උ පුලස්තිනි.

ප දැන් ඔබ ඊට පස්සේ ඔබට ලැබිච්ච තොරතුරයි ඔබ බුද්ධි අංශයේ නිළධාරීන් සමග කටයුතු කිරිමේදී ලැබුනු දැනුමයි අනුව ඔබ ඊලගට මොකක්ද සිද්ධ කලේ?

උ ඒ අනුව මම මුලස්ථාන පොලිස් පරීක්ෂකතුමාගෙන් අවසර අරගෙන මා සමඟ පොලිස් සාජන් 63188 රවුප්. පොලිස් කොස්තාපල් 43404 නවාස් සමඟ මම ඒ ස්ථානයට ගියා .

ප ඔබ යන්න පිටත් වුනේ කවද්ද?

උ 2019/05/03 වෙනි දින සවස 16.20ට. ඒ කියන්නේ 4.20ට පමණ.

ප ඒ කියන්නේ මේ තොරතුර ලැබිලා ඉතා සුළු වේලාවකින් තමයි ඔබ පිටත් වෙලා යන්නේ?

උ මහත්මයාගෙන් අවසර අරගෙන පිටත් වෙලා ගියා ?

උ දැන් ඔබ මේ හොයන්න යනවානේ පුද්ගලයෙක්ව?

උ ඔව්.

ප ඒ පුද්ගලයා ඔබ කලින් දැකලා තියෙනවාද ?

උ නැහැ.

ප එතකොට කොහොමද ගිහිල්ලා ඔබ දැකලා අඳුනාගන්නේ ?

උ දැකලා තියෙනවා කියන්නේ මම මාධ්‍ය වලින් දැකලා තියෙනවා මාධ්‍ය වල පින්තූර ගොඩක් දාලා තිබුනා ඒ ගැහැණිය සම්බන්ධව BBC Tamil news වලින් දාලා තිබුනා ඒවගේම මීඩියා වලින් කලබල වෙච්චි නිසා ගොඩක් පින්තූර දැක්කාම නෝට් වුනා ඒ කාන්තාගේ පිනතූර මම screen shot ඇරගෙන මගේ දුරකථනය තියාගෙන තිබ්බා.

ප ඔබ මේ කියපු සාරා ලෙස මුස්ලිම් නමින් හඳුන්වන පුලස්තිනි යන දමිළ නමින් හඳුන්වන කාන්තාවගේ පින්තූර ඔබ ජංගම දුරකථනයටත් ලබා ගෙන තිබුනා?

උ තිබුනා.

ප ඒ ලැබිච්ච පින්තූර වල පින්තූර නැවත දැක්කොත් ඔබට හඳුනාගන්න හැකියාවක් තියෙනවාද ?

උ ඔව්.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ස්වාමිණි සාක්ෂිකරුට යම්කිසි ඡායාරූප කිහිපයක් පෙන්වා සිටීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර මෙම ඡායාරූපය පරීක්ෂා කරලා බලන්න මහත්මයා ඔබට මෙම ඡායාරූපය හඳුනාගැනිමේ හැකියාවක් තියෙනවාද ?

උ ඔව්.

ප්‍ර මේ මොකක්ද මේ ඡායාරූපය ?

උ මෙයා තමයි අර දෙමළ කාන්තාව convert වෙලා ගියා කියපු සාරා කියන lady.

ප්‍ර ඔබට ඔබගේ ජංගම දුරකථනයටත් මෙම ඡායා රූපය ලැබුනා කිව්වොත් හරිද?

උ ඔව් ස්ක්‍රින් ෂොට් ගත්තේ මේක.

ප්‍ර ඔබට මෙය සාරා හැටියට හඳුනාගන්න පුලුවන් මේ ඡායාරූපය?

උ ඔව්.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද මෙම ඡායා රූපය C 918 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

තවත් ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්විමට අවසර පතනවා.

ප්‍ර මෙම ඡායා රූපය පරීක්ෂා කරලා බලන්න මහත්මයා ?
මෙම ඡායාරූපය තමාට අඳුනාගන්න පුලුවන්ද?

උ ඔව් පුලුවන් එදා .

ප්‍ර මේ ඡායාරූපයේ ඉන්නේ කව්ද?

උ පුලස්තිනි කියන සාරා කියන lady තමයි.

ප්‍ර ඔබ මෙයත් අර කියපු මාධ්‍ය ආයතනයේ

උ IBC Tamil එකෙන් ගියපු news එකෙන් screen shot මං ගත්තා. මේ photo එක.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හදනාගන්නා ලද මෙම ඡායාරූපය C 919 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

තවත් ඡායාරූපයක් පෙන්විමට අවසර පතනවා ස්වාමිනි

.ප්‍ර මෙම ඡායාරූපය පරීක්ෂා කරලා බලන්න මහත්මයා මෙය ඔබට හඳුනා ගැනිමේ හැකියාවක් තියෙනවාද

උ ඔව්.

ප්‍ර මෙම ඡායාරූපයේ කව්ද ඉන්නේ ?

උ මේකේ ඉන්නේ සාරා කියන ලේඩි තමයි.

ස්වාමිනි සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද මෙම ඡායාරූපය C 920 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා

ප්‍ර දැන් මෙම සාරා කියන කාන්තාව සෙවීමට පිටව යනවානේ 2019/05/03 වෙනිදා සවස 4 ට පමණ 4.20ට පමණ?

උ ඔව්.

ප්‍ර ගිහිල්ලා ඔබලා කොහාටද ඔබලා යන්නේ ?

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

උ ගිහිල්ලා මං ගියේ ඒ 105 /106 ගෙදර නිවසට ගියා.

ප කොහේ තියෙන නිවසටද ගියේ?

උ ඒක තියෙන්නේ තේතාතිව් ගම්මානයේ මාන්වඩු ප්‍රදේශයේ සාස්ත්‍රිය යන පාරේ පිහිටි නිවසට ගියා.

ප ස්ථානය නැවත කියන්න ?

උ. නො. 105,සාස්ත්‍රිය පාර, මාන්කාඩු, නො 106 සාස්ත්‍රිය පාර මාන්කාඩු නිවසට ගියා

ප ඒ නිවෙස් දෙකටම ගියා ?

උ ඔව්.

ප ඔබලා ඒ නිවෙස් දෙකටම ගිහිල්ලා පරීක්ෂා කරාද?

උ පරීක්ෂා කරා.

ප පරීක්ෂා කරන කොට ඒ ගෙදර තැනැත්තිය හිටියාද?

උ ඔව් ඒ නිවස කීප දෙනෙක් කට්ටිය හිටියා.

ප මම අහන්නේ ඒ නිවසේ පුද්ගලයෝ හිටියා කියලා නෙමේ මම දැන් අහන්නේ ඔබ මේ කලින් හඳුනාගත්ත සාරා කියන මහේන්ද්‍රන් පුලස්තිනි කියන අය හැටියාද?

උ හිටියේ නැහැ.

ප ඔබ එතකොට ඒ නිවෙස් හිමියන් ගෙන් විමසීමක් කරලා බැලුවාද මේ සාරා කියන තැනැත්තිය ගැන?

උ නිවසේ සිටපු පුද්ගලයින් ගෙන් මම විමසිමක් කලා .

ප එතතොට ඔබට මොනවද අනාවරණ කලේ ?

උ අම්මා කොහේද ගියේ කියලා දන්නේ නැහැ සාරාගේ අම්මා සාරාත් දැන් බැඳලා ගියා මුස්ලිම් පුද්ගලයෙක් බඳලා ගියපු කෙල්ල තවමත් නිවසට ආවේ නැහැ කියලා කිව්වේ.

ප ඒ කියන්නේ ඔබ මේ ගියපු නිවෙස් දෙක සාරාගේ උපන් ගමද?

උ උපන් ගම.

ප ඔබ මේ ගියපු නිවෙස් දෙක සාරාගේ නෑදෑයොද කොහොමද සාරාත් එක්ක තියෙන නෑදෑකම සම්බන්ධය කියන එක ගැන ඔබ හොයලා බැලීමක් කලාද?

උ හොයලා බැලීමක් කලේ නැහැ මොකක්ද මට ලැබිච්ච තොරතුරු නො. 105/106 ගෙදර තියෙන හින්දා ඒ නිවස විතරයි මම ගිහිල්ලා පරීක්ෂා කරේ.

ප ඒ අනුව ඔබම පරික්ෂා කරලා සාරා හිටියේ නැති වුනායින් පස්සේ ඊට පස්සේවත් මේ සාරා ගැන තොරතුරක් සොයා ගන්න උත්සාහ කලේ නැද්ද?

උ උත්සාහ කලා.

ප මොනවද හොයා ගත්තේ?

FAIR COMMENT BY JEZEEM

උ මම ඒ ප්‍රදේශයේ අවට ඉන්න සම්පූර්ණම මගේ පුද්ගලික ඔත්තු කරුවන් මගේ සම්බන්ධිකරන නිළධාරින් මාත් එක්ක තොරතුරු දෙන අයට මගේ නොම්මරය දිලා තිබුනා එාහම තොරතුරක් ලැබුනොත් කියන්න කියලා කිව්වා.

ප්‍ර පුද්ගලික තොරතුරු කරුවන්දැනුවත් කලා ?

උ දැනුවත් කලා.

ප්‍ර ඔබට සාරාගේ මව හමුවෙලා ඔබ ප්‍රශ්ණ කිරීමක් කරාද?

උ හම්බ වුනේ නැහැ.

ප්‍ර සාරාගේ මවගේ නම මොකක්ද?

උ කවිදා.

ප්‍ර ඇයට ඔබ හමුවුනාද?

උ හමුවුනේ නැහැ.

ප්‍ර එදා ගෙදර වත් හිටියේ නැද්ද ඔබ පරික්ෂා කරපු ගෙවල්?

උ හිටියේ නැහැ.

ප්‍ර ඔබ දැන් කිව්වානේ පුද්ගලික තොරතුරු කරුවන් ඔබ දැනුවත් කලා කියලා ඔබට හැකි පමණින්?

උ ඔව්.

ප්‍ර ඔවුන්ගෙන් යම්කිසි තොරතුරක් ලැබුනද සාරා ගැන?

උ පසුව එහෙම කිසි තොරතුරක් ලැබුනේ නැහැ .

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර සාක්ෂිකරු ඔබ මාන්කාඩු කියන ප්‍ර දේශය සාරාගේ ගමනේ නේද ?

උ ඔව්.

ප්‍ර ඒ ප්‍ර දේශය අර 102/105 ගෙවල්ද පරීක්ෂා කලේ?

උ 105/ 106 ගෙදර.

ප්‍ර අංක 2 Boder Road , මාන්කාණ්ඩු , සිත්තිෆලායම් කියන්නේ සාරාගේම ගෙදර නේද ?

උ එහෙමද දන්නේ නැහැ.

ප්‍ර සාරායි සාරාගේ අම්මයි ඉන්න ගෙදර කොහේද කියන්න දන්නේ නැද්ද ඔත්තු කරුවන් මාර්ගයෙන් දැන ගන්න ලැබුනේ නැද්ද ඔබට ?

උ ඔත්තු කරුවන්ගේ මාර්ගයෙන් දැනුමක් කියන්නේ ඒ ගමට ඉන්න කාලේ මට ගොඩක් තොරතුරු ආවා හැම තොරතුරක්ම ගිහිල්ලා අපි පරික්ෂා කලා. ඒ වෙලාවේ තොරතුරු දිපු එක්කනා කිව්වේ 105/106 ගෙදර කියලා ඒ වෙලාවේ මම ගිහිල්ලා check කරේ 105/106 ගෙදර එතකොට ගමේ අනිත් කට්ටිය කිව්වා ඒ ගොල්ලන්ගේ ගෙදර කිව්වා.

ප්‍ර 105/106 කියලා ලඟ ඉන්න කට්ටිය ගෙන් මම ඇහුවා ටැමිල් කතා කරන්න පුලුවන් කට්ටිය නිසා ඒ ගොල්ලන්ගෙන් මම ඇහුවා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඔත්තු කරු කිව්වේ නැද්ද මේ අංක 2 බෝඩර් රෝඩ් මාවත, මන්කඩු සිත්තිෆලායම් කියන ගෙදර තමයි සාරා ගේ ගෙදර කියලා කිව්වේ නැද්ද ඔත්තු කාරයෝ ?

උ කිව්වේ නැහැ

ප්‍ර මොනවද ඔත්තු කාරයෝකිව්වේ ?

උ 105/106 ගෙදර .

ප්‍ර ඔත්තුකාරයෝ වෙන මොනවද කිව්වේ ?

උ ඔත්තු කාරයො කියපු කතාව මුස්ලිම් කාන්තාවන් දෙන්නෙක් ඇවිල්ලා ඉන්නවා කියලා සැකයක් තියෙනවා ඒ ගෙදර. ඇවිල්ලා චෙක් කරන්න කියලා තමයි කිව්වේ.

ප්‍ර කවදාද කිව්වේ ඔත්තු කරුවෝ?

උ මම ඒ කිව්ව 2019/05/03 වෙනිදා.

ප්‍ර ඔබ එදාමද ගියේ පරික්ෂා කරන්න ?

උ ඒ වෙලාවම ගියා අපි මුලස්ථාන පොලිස් පරීක්ෂක තුමාට දැන්වත් කරලා මහත්මයත් අවසර දුන්නා අපේ area එකේ පිට area නමුත් හදිසියට යන්න කියලා කිව්වා ඒ වෙලාවේම අපි ඒ වෙලාවේම ගියා.

ප්‍ර දැන් ඔබ ගිය ගෙදර කාන්තාවෝ දෙන්නෙක් හිටියාද ඒගෙදර ?

උ නැහැ ඒ කාන්තාවේ දෙන්නෙක් හිටියේ නැහැ. කාන්තාවෝ හිටියා හොයලා ගිය කාන්තාව හිටියේ නැහැ. සැකකටයුතු කාන්තාවෝ හිටියේ නැහැ.

ප්‍ර මුස්ලිම් කාන්තාවෝ හිටියාද ඒ ගෙදර ?

උ නැහැ

ප්‍ර දෙමල ජාතිකයන්ගේ ගෙවල්නේද?

උ ඔව්.

ප්‍ර ඉතින් ඔබට අර ඔත්තුව දිපු ඔත්තු කරුවට ඔබ එවේලේම කතා කරලා ඇහුවේ නැද්ද මම මේ ගෙදරට දැන් ආවා මෙම ගෙදර මේ ඔබ කියන අය නැහැ කියාල ඔබගේ ඕත්තුකරුවට කිව්වේ නැද්ද ?

උ මම ඇහුවා

ප්‍ර මොකද එතකොට ඔත්තුකරු කිව්වේ ?

උ අපි ඇවිල්ලා දැන් හොයලා තියෙනවා මේ ගෙදර කව්රුවත් හිටියේ නැහැ ඔයා කවද්ද දැක්කේ මොනවද දැක්කේ ඒ වෙලාවේ දැකලාද මට කෝල් එකක් ගත්තේ මම ඇහුවා එතකොට කිව්වා හවස ඊට කලින් දවසේ හවස තමයි මෙයා දැකලා තියෙන්නේ ඉන්පසු කතාවක් ඇති වෙලා තමයි මට කියලා තියෙන්නේ.

ප්‍ර එයා දැකපු දවසේම නෙවේ මේ ඔත්තු කරුවා විස්තරය කිව්වේ?

උ ඔව්.

ප්‍ර දවසකට පස්සේ ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ ඔව්. මේ ගම්මනයි මම පදිංචි වෙලා ඉන්න ගම්මනයටයි කිලෝ මීටර් 6 ක් පමණ දුර තමයි තියෙන්නේ එතකොට මම එහේ වැඩ කරනවා කියලා දැනගෙන මගේ නම හොයලා තමයි මට කෝල් එකක් දීලා තියෙන්නේ .

ප ඔත්තුකරුවා කිව්වේ convert කරපු අර Tamil එක්කෙනෙක් මුස්ලිම් වලට කොන්වර්ට් කරපු එක්කනා මේ ගෙදර ඉන්නවා කියලාද ඔය ඔබ සඳහන් කරපු නමෙන්ම කිව්වාද ?

උ නැහැ කාන්තාවන් දෙන්නෙක් මුස්ලිම් ඇඳගත්ත ඇදුමෙන් ඉන්නවා ඒ ගොල්ලෝ මේ නිවසේ ඉන්නවා දැකලා තියෙනවා ඇවිල්ලා චෙක් කරන්න සර් කියලා කිව්වා.

ප ඊට පස්සේ ඔබ අසල්වැසි නිවෙස් වලින් වත් මේ තොරතුරේ සත්‍යතාවය හොයන්නට විමර්ශනය කලේනැද්ද ?ලඟ තියෙන ගෙවල් වලින් ඇහුවේ නැද්ද මෙහෙම කාන්තාවෝ දෙන්නෙක් මේ ගෙදර හිටියාද කියලා ?

උ මේ ගෙදරට පැමිණියායින් පසුව අල්ලපු ගෙදරට ගිහිල්ලා මම ඇහුවා මේ කාගෙද ගෙදර කියලා එතකොට තමයි ඒ ගොල්ලෝ දැනුවත්ව කිව්වේ මේක සාරා කියලා මුස්ලිම් lady ගේ ගෙදර කියලා කිව්වා .

ප අසල්වැසියෝ කිව්වා?

උ කිව්වා.

ප එතකොට ඒ අම්මා කොහේ ඉන්නවාද කියලාද කිව්වේ සාරාගේ අම්මා?

උ අම්මා කොහේ ගිහිල්ලද දන්නේ නැහැ මේ සිද්ධියෙන් පසුව මෙහේ නැහැ කියලා නිවස105 න්?

ප සිද්ධිය වෙන වෙලාව වෙනකොට අම්මා මේ ගෙදර හිටියා කියලාකිව්වාද ඔබටඒ ගමේ අය?

උ අම්මා හිටියේ නැහැ කියලා ඒ සම්බන්ධව කිසි දෙයක් කිව්වේ නැහැ

ප ඔබ ඇහුවෙත් නැද්ද අර සායින්ද මරුන්දු ගෙදර අප්‍රෙල් 26 බෝම්බ පිපිරීම වෙනකොට මේ සාරා ගේ අම්මා මේ කියන ගමේ හිටියාද කියලා ඔබ ඇහුවාද?

උ අම්මා ඒ සම්බන්ධව ඇහුවේ නැහැ.

ප ඔබගේ පොලිස් ස්ථානාධිපතිට කිව්වාද මෙහෙම තොරතුරක් මට ලැබිලා මම මෙහෙම පරික්ෂණයක් කලා කියලා ?

උ කිව්වා එයාගේ අවසර අරගෙන තමයි මගේ කණ්ඩායම සමඟ weapon අරගෙන සම්පූර්ණ මේවා අරගෙන out එකක් දාලා මං ගියේ.

ප එදින සිදුවීමෙන් පස්සේ ඔබ මේ ඒ තොරතුර ඔස්සේ ගිහිල්ලා තවදුරටත් පරික්ෂණ කලේ නැද්ද ඒ දෙමළ මාන්කාඩු කියන ගම කොච්චරක් මිනිස්සු ඉන්න ගමක්ද ? කොච්චර සෙනඟ ඉන්නවාද ඒ ගමේ?

උ මිනිස්සු වශයෙන් 1500ක්

ප පවුල් වශයෙන්?

FAIR COMMENT BY JEZEEM

උ පවුල් වශයෙන් නෙමේ පොඩි ගම්මානයක්.

ප පොඩි ගම්මානයක් නේ ඉතින් ඔබට පරික්ෂා කරන්නත් තිබුනානේ ?

උ සම්පුර්ණයෙන්ම ඒ අවට ඉන්න මිනිස්සු ඒ area කල්මුණේ ප්‍රදේශය කල්මුණේ පොලිස් ස්ථානයට අයිති එකක් නෙමේ මඩකලපුව පොලිස් ස්ථානයට අයිති area එකක්මම සම්පුර්ණයෙන්ම මගේ පුද්ගලික ඔත්තු කාරයෝ සේරම මේ වගේ සැකකටයුතු පුද්ගලයෙක් ආවොත් මට දැනුවත් කරන්න ඒ සම්බන්ධව මොකක්හරි පණිවිඩයක් තිබ්බොත් කියන්න කියලා මගේ නොම්මරය මං පස්සේ දිලා තිබුනා.

ප ඔබට මේ ඕත්තුව ලැබුනේ 5 වෙනි මාසේ නේද?

උ 5 වෙනි මාසේ 3 වෙනිදා

ප ඔබ කොච්චර කාලයක් මේ කාන්තාව මේ ප්‍රෙද්ශයේ ඉන්නවාද කියලා සොයා බැලුවාද එම ඔත්තුවදුන්න පුද්ගලයා දැන් ඔබ කියපු ගෙදරම නැති වුනත් කාන්තාව ඒ කොහේ හරිලගක ඉන්නවාද කියන එක කොච්චර කාලයක් ඔබ ඔත්තු කරුවන් දමලා සොයා බැලුවාද ?

උ ඔත්තු කරුවන් දමලා කියා සිටියා ඒ ගොල්ලන් සම්පුර්ණ මිනිස්සු ඒ නිවස ගැන අවදානයෙන් හිටියා මොකද බෝම්බ පිපිරුනාට පස්සේ මිනිස්සු ඔක්කෝම කලබල වෙලා හිටපු හින්දා මිනිස්සු අවදානයෙන් හිටියා ඒ සම්බන්ධව තොරතුරු පසුව මට ලැබුනේ නැහැ.

ප ඔත්තුකරුවන් ගෙන් ලැබුනෙත් නැහැ ගමේ මිනිසුන්ගෙනුත් ලැබුනේ නැහැ ?

උ ලැබුනේ නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්ණ ඇසීමේ අවස්ථාවක් අතිඋතුම් මැල්කම් රන්ජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනි සිටින උගත් ජනාධිපති නීතිඥ වරයාට ලබා දෙමි. අවශ්‍ය නොවන බව දන්වයි.

සාක්ෂිකරු මුදාහරිමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා තේරුම් ගෙන මෙම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදි

President Secretariat
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදුවූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශණය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය - 2020-07-21 වේලාව- ප.ව. 02.38

සටහන් කලේ යමුනා දසනායක විසිනි.

ගරු විනිසුරු මඩුල්ල -

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති.

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා. සාමාජික

03. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා. සාමාජික

04. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා සාමාජික

05 හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් . එම්. එම්. ආර් අදිකාරි මහත්මිය සාමාජික

පෙනී සිටීම

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේඅධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය රජයේ අධිනීතිඥ නිමේෂාද අල්විස් මෙනවිය , රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීම සලකා බැලු මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර ලබා දෙන ලදී.

FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම - ගම්ලද්දලාගේ මිහිපල් අර්ජුන මාහින්කන්ද.
වයස - අවු 57 යි.
ජාතිය- සිංහල.
ආගම -බුද්ධාගම.
රැකියාව- ප්‍රධාන පොලිස් පරීක්ෂක, දැනට ජනාධිපති විමර්ශන කොමිෂමට අදාළව කටයුතු කරනවා.

ප්‍රතිඥා දී කැඳවයි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බංඩාර මහතා</u>

ප්‍ර. මාහින්කන්ද මහත්මයා ඔබ මුලින්ම ශ්‍රී ලංකා පොලිසිය සමග සම්බන්ධ වෙන්නේ කොයි වකවානුවේද?
උ. 1988.12.01 වෙනි දින.
ප්‍ර. කුමන නිලයකින්ද ඔබ සම්බන්ධ වෙන්නේ?
උ. උප පොලිස් පරීක්ෂක ලෙස.
ප්‍ර. ඉන්පසු ඔබට ඊළඟ උසස්වීම ලැබෙන්නේ කොයි වකවානුවේද?
උ. 1996.09 මාසේ 02 වෙනි දින පොලිස් පරීක්ෂක තනතුර ලැබෙනවා.
ප්‍ර. ඔබ ප්‍රධාන පොලිස් පරීක්ෂක ධුරයට උසස්වීම ලැබෙන්නේ කොයි වකවානුවේද?
උ. 2006.01.01 දින.
ප්‍ර. මේ වෙන කොටත් ඔබ ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒ ධුරයේම ඒ තනතුරෙහිම රාජකාරි කරනවා කීවොත් නිවැරදිද?
උ. එහෙමයි ස්වාමීනි.
ප්‍ර. ඔබගේ මේ දීර්ඝ පොලිස් රාජකාරි කාලය තුළ ඔබ සාමාන්‍යයෙන් දිවයිනේ කුමන ප්‍රදේශවල රාජකාරි කරලා තියෙනවාද?
උ. දිවයිනේ බස්නාහිර පළාත, නැගෙනහිර පළාත, උතුරු පළාත, දකුණු පළාත කියන ප්‍රදේශවල පළාත් හැටියට රාජකාරි කරලා තියෙනවා.
ප්‍ර ඔබ විමර්ශන මෙහෙයවීම් කරලා තියෙනවාද ඔබගේ මෙම පොලිස් රාජකාරි තුළ?
උ එහෙමයි ස්වාමීනි.
ප්‍ර ඒ අනුව ඔබ ඒ විමර්ශණවලට අදාලව අධිකරණවල සාක්ෂි ලබාදීම් කරලා තිබෙනවා කීවොත් නිවැරදිද?
උ. එහෙමයි ස්වාමීනි.
ප්‍ර ඔබ 2019.04.21 වන දින සිදුවූ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශණය කරන කොමිෂන් සභාවට අනුයුක්ත වෙනවාද?
උ එහෙමයි ස්වාමීනි.
ප්‍ර කවද්ද අනුයුක්ත වෙන්නේ?
උ 2019.10.11 වෙනි දින ස්වාමිනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර එසේ අනුයුක්ත වීමෙන් අනතුරුව මාහින්කන්ද මහත්මයාට පැවරෙන විමර්ශණ රාජකාරිය මොකක්ද?

උ ස්වාමීනි නැගෙනහිර පළාත 2019.04.21 වෙනි දින සිදුවූ බෝම්බ , මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයන්ට අදාළව නැගෙනහිර පළාතේ සිදුවූ සිදුවීම් සම්බන්ධව විමර්ශණ කටයුතු මා විසින් සිදුකළා ස්වාමිනි.

ප්‍ර ඒ අනුව නැගෙනහිර පළාතේ කුමන විමර්ශණද ඔබ සිද්ධ කලේ මුලිකවම?

උ ස්වාමීනි මා සියෝන් දේවස්ථානය සම්බන්ධිත විමර්ශණ කටයුතු , වවුනතිව් පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරින් දෙදෙනෙකු ඝාතනය කිරීම සම්බන්ධව විමර්ශණ කටයුතු, කාත්තන්කුඩි පොලිස් වසමේ යතුරුපැදියක් පිපිරවීම සම්බන්ධයෙන් විමර්ශණ කටයුතු, ඒ වගේම ස්වාමීනි, සමන්තුර පොලිස් වසමේ තිබූ , පුපුරන ද්‍රව්‍ය තිබූ නිවස සොයාගැනීම සම්බන්ධයෙන්, ඒ වගේම නින්දවුර් නිවසක සැක කටයුතු පිරිසක් සිටි ස්ථානය සම්බන්ධයෙන් සහ සයින්දමරුදු බොලිවීරියන් නිවාසයක සිදුවූ බෝම්බ පිපිරීම සම්බන්ධයෙන්.

ප්‍ර. මූලිකවම ඔබ කළේ ඔයිට අදාළ විමර්ශණ කටයුතු කීවාත් නිවැරදියිද?

උ. එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔබ ඒ අනුව එම ස්ථානවලට ඔය නැගෙනහිර පළාතේ ගියාද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඊට අදාළව ඔබ ප්‍රකාශ විශාල ප්‍රමානයක් සටහන් කරගත්තා කීවොත් නිවැරදිද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර. ඉන් අනතුරුව ඔබට යම්කිසි තොරතුරුකරුවෙක්ගෙන් යම් දිනයක තොරතුරක් ලැබෙනවාද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර කවද්ද මේ ලැබෙන තොරතුර? මේ තොරතුර ලැබෙන්නේ කවද්ද?

උ. 2020.07.06 වන දින මට තොරතුර ලැබෙනවා. ස්වාමීනි.

ප්‍ර ඒ තොරතුරු ගෙන් ලැබුණු තොරතුර මොකක්ද? තොරතුරුකරගේ නම කියන්න අවශ්‍ය නැහැ. තොරතුර පමණක් සදහන් කරන්න.

උ ස්වාමීනි මම විමර්ශනය කරපු සයින්දමරුදු බොලිවිරියන් ගම්මානයේ නිවසක බෝම්බ පිපිරීම සම්බන්ධයෙන් එම නිවාසයේ බෝම්බ පිපිරීම සිදුවන අවස්ථාවේ සිටි බවට සැකකරන යම් කාන්තාවක් එම ස්ථානයෙන් අතුරුදහන්වි ඇති බවත්, එම කාන්තාව , මෙම බෝම්බ පිපිරවීමෙන් පසුවත් යම් ප්‍රදේශයක සැගවි සිටින බවට සහ ඒ කාන්තාව දුටු බවට තොරතුරු මා වෙත ලැබෙනවා ස්වාමීනි. දුටු පුද්ගලයෙක් සම්බන්ධ තොරතුරු ලැබුණා.

ස්වාමීනි මෙතැන් පටන් තොරතුරුකරුවන්ගේ නම් විශාල ප්‍රමාණයක් භාවිතා වන බැවින්, මාහින්කන්ද මහතාට 2020.07.06 වෙනි දින

FAIR COMMENT BY JEZEEM

මුලින්ම තොරතුරු සැපයූ තොරතුරුකරු A නැමැති පුද්ගලයා වශයෙන් හැඳින්වීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර. දැන් A නැමැති තොරතුරුකරු ඔබට මුලින්ම කීවා, කීවේ සාරා නැමැති කාන්තාවක් ගැන සඳහන් කළාද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර මොකක්ද ඒ කිවුවේ මේ සාරා ගැන.

උ ස්වාමීනි මේ සාරා කියන කාන්තාව , මෙම බෝම්බ පිපිරීම් මාලාවට සම්බන්ධිත සහරාන් ඇතුලු තවුහිද් ජමාද් සංවිධානයේ ඉතා ක්‍රියාකාරී සාමාජිකාවක් ලෙස තමයි ඔහු මට තොරතුරු ලබා දුන්නේ. මෙම කාන්තාව බොලිවීරියන් ගම්මානයේ සිදුවූ බෝම්බ පිපිරීම අවස්ථාවේදී එම පිපිරීමට අදාලව එම ස්ථානයේ සිටි බවටත්. නමුත් මෙම කාන්තාව එම බෝම්බ පිපිරීමෙන් හානියක් නොවී දැනට කලවංචිකුඩි පොලිස් බල ප්‍රදේශයේ මාන්කාඩු සහ එම මාන්කාඩු කියන ගම්මානය ආශ්‍රිතව සැඟවී සිටින බවත්, එම කාන්තාව යම් පුද්ගලයෙකු විසින් දැක ඇති බවත්, එසේම මෙම කාන්තාව ඉන්දියාවට යාමට අවශ්‍ය සහයෝගය ලබාදුන් පුද්ගලයින් සම්බන්ධයෙන්ද මට තොරතුරු ලබාදුන්නා ස්වාමීනි.

ප්‍ර ඊට අමතරව මේ මුල් තොරතුරු කරු නැතිනම් A නම් තොරතුරුකරු ඔබට ලබාදුන්නද ඇය සැඟවී සිටීමට භාවිතා කරපු නිවෙස් සම්බන්ධයෙන් තොරතුරු?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර කීයක් පමණ ලබාදුන්නාද?

උ 3ක් ලබා දුන්නා ස්වාමීනි. මෙන්න මේ මේ නිවෙස්වල සිටි බවට. නිවෙස් 03ක් සම්බන්ධයෙන් මා වෙත දැනුවත් කළා.

ප්‍ර A ගෙන් ලැබුන තොරතුරත් සමග මාහින්කන්ද මහත්මයා කරපු ඊළඟ පියවර මොකක්ද?

උ ස්වාමීනි මගේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමාගේ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා මේ සම්බන්ධයෙන් මම දැනුවත් කළා. එතුමන්ලාගේ නියෝග හා උපදෙස් පරිදි මම 2020.07.08 වෙනි දින මෙම විමර්ශණ කටයුතු සඳහා මඩකලපු ප්‍රදේශයට පිටව ගියා ස්වාමීනි. නැගෙනහිර පළාතට පිටව ගියා.

ප්‍ර ඔබ පිටව යන්නේ තනිවමද නැතිනම් ඔබ සමග යම්කිසි කණ්ඩායමක් යනවාද?

උ ස්වාමීනි මා සමග පො.සැ.34908 සහ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ස්ටැනිස්ලෝස් මහත්මයා මෙම කොමිසමේ ජනාධිපති ලේකම් කාර්යලයට අයත් වාහනයකින් එම වාහනයේ රියදුරු සමග පිටව ගියා ස්වාමීනි.

ප්‍ර එසේ පිටව ගිහිල්ලා ඔබ කරපු මුල්ම විමර්ශණය මොකක්ද?

FAIR COMMENT BY JEZEEM

උ ස්වාමිනි මුලින්ම මට A නැමැති තොරතුරු කරු විසින් ලබාදුන් තොරතුර අනුව මම මෙම ඇසින් දුටු සාක්ෂිකරු වන

ප්‍ර දැන් A නැමැති තොරතුරුකරු කීවානේ සහරා ජෙස්මින් යන තැනැත්තියව දැක්ක කෙනෙක් ඉන්නවා කියලා,

උ. එහෙමයි ස්වාමීනි

එම පුද්ගලයා මින් ඉදිරියට B වශයෙන් හැඳින්වීමට ගෞරවයෙන් අවසර පතනවා

ප්‍ර දැන් ඊට පස්සේ ඔබ විමර්ශණයට ගියා කීවානේ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඔබට විමර්ශණයේදී යම්කිසි පුද්ගලයෙක් හමුවුණාද මුලින්ම?

උ. ස්වාමිනි B නැමැති 2වන තොරතුරුකරු මට හමුවුණා ස්වාමීනි.

ප්‍ර. B නැමැති පුද්ගලයාව හමුවන්න ගියා?

උ. එහෙමයි.

ප්‍ර ඉන් අනතුරුව ඔබ ඒ අනුව අනාවරනය කරගත්තේ මොනවාද ඒ විමර්ශණයෙන්?

උ ස්වාමිනි මෙම B නැමැති තොරතුරුකරු දෙනිකව ඔහුගේ රැකියාව සදහා පිටව යන අවස්ථාවේදී වේලාව පාන්දර 3.00 ට.

ප්‍ර. කොයි වකවානුවේදීද?

උ. 2019 සැප්තැම්බර් මාසයේ කියලා තමයි ස්වාමිනි දැනුවත් වෙන්නේ. ඔහුට දිනය සහ හරි දිනය මතක නැහැ. දිනක මෙම තොරතුරුකරු යනවා ඔහුගේ දෛනික රාජකාරි සදහා .

ප්‍ර ඔහු මොනවා කරන පුද්ගලයෙක්ද? B රාජකාරි සදහා යනකොට

උ මෙම මාන්කාඩු යන ප්‍රදේශයේ යම් ස්ථානයක කැබ් රථයක් පිකප් රථයක් නවතා තිබෙන බවට මොහුට නිරීක්ෂණය වෙනවා ස්වාමීනි. එම පිකප් රථය ගැන මොහුට එම වේලාවත් එක්ක මොහුට සැක සිති , ඒ ගැන බලන කොට ඔහු දකිනවා, මෙම පිකප් රථය බටර් පැහැති අංකය 250 යොදා ඇති පිකප් රථයක් බවට.

ප්‍ර. මහත්මයාට කියන්න පුලුවන්ද ඔහු දැන් ඔබ කීවානේ මේ රාත්‍රී 3.00ට පමණ යනවා කියලා. මේ කොයි මාර්ගයේ යන කොටද මේ කැබ් රථයක් දකින්නේ බටර් පැහැති කැබ් රථයක්?

උ. ස්වාමීනි, මඩකලපුව කල්මුණේ ප්‍රධාන මාර්ගයේ මෙම පුද්ගලයා යන්නේ මඩකලපුව දෙසට යනකොට තමයි මෙම කැබ් රථය බීච් පාර කියලා තියෙනවා ස්වාමීනි ඒ හරියේ පාරක්. ඒ බීච් පාර තියෙන්නේ දකුණු පසට වන්නට , දකුණු පසට වන්නට තිබෙන බීච් පාරට මුහුණලා ඒ එක්කම අනික් පැත්තේ වම් පැත්තේ නවතා තිබෙනවා මෙම කැබ් රථය. ඒ කියන්නේ කල්මුණේ සිට මඩකලපුව මාර්ගයේ මඩකලපුව දෙසට මුහුණ ලා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර. මඩකලපුව දෙසට මුහුණලා තමයි මේ කැබ් රථය තියෙන්නේ. මේ B නැමැති පුද්ගලයා යන්නේ පයින්ද? නැත්නම් වාහනයකින්ද?

උ. ඔහුටත් අයත් ඔහුගේ කැබ් රථයෙන්.

ප්‍ර. ඔහුටත් අයත් රථයකින් යනවා. යනකොට මේ නවතා තිබෙන 250 බටර් පාට වාහනය තියෙන්නේ ඔහුගේ වම් අත පැත්තෙන්ද? දකුණු අත පැත්තෙන්ද?

උ වම් අත පැත්තෙන්.

ප්‍ර පාර අයිනේද නවතා තිබෙන්නේ මහත්තයා?

උ පාර අයිනේ නවතා තිබෙන්නේ.

ප්‍ර ඒ කියන්නේ දැන් ඔහු කල්මුණ සිට මඩකලපුදෙසට යනකොට මුහුද පැත්තේද මේ වාහනය නවත්වා තිබෙන්නේ, ඒ කියන්නේ Sea side එකේද? නැතිනම් opposite side එකේද?

උ විරුද්ධ පැත්තේ. වම් අත පැත්තේ. මුහුද තියෙන්නේ දකුණු අත පැත්තේ.

ප්‍ර එතකොට මේ අවස්ථාවේදී මේ B කුමක්ද නිරීක්ෂණය කරලා තිබෙන්නේ?

උ B ට මේ සම්බන්ධයෙන් සැකයක් ඇතිවෙනවා ස්වාමීනි, ඇත්ත වශයෙන්ම B මේ කැබ් රථය තියෙන තැනට දකුණු පසින් තියෙනවා බීච් පාර කියලා ස්වාමීනි, ඒ බීච් පාරට හරවන්න තමයි මේ පුද්ගලයා යන්නේ , නමුත් මේ ගැන සැක සිතී ඔහු ඉදිරියට යනවා ස්වාමීනි, මේ පිකප් රථය පසුකරමින් යනකොට , යනවා. ඒ කියන්නේ ඔහු ඉදිරියට යනවා. හරවන්නේ නැතිව ඉදිරියට යනවා.

ප්‍ර ඒ කියන්නේ ඔහු බීච් පාරට හැරෙන්නේ නැහැ. කල්මුණේ මඩකලපු ප්‍රධාන පාරෙම ගමන් කරනවා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර. මේ කැබ් රථය පාස්කරගනෙ යනවාද?

උ. එහෙමයි.

ප්‍ර දැන් මොහු මෙසේ පාස්කරගෙන ගියායින් පස්සේ ඊට පස්සේ මොකක්ද වෙලා තියෙන්නේ?

උ කැබ් රථය පාස්කරන් යනවත් එක්කම ස්වාමීනි , අර බීච් පාරේ සිට මොහු මීට පෙර හඳුනන සාරා නැමැති කාන්තාව , ඒ අසලින්, බීච් පාර දිගේ ප්‍රධාන මාර්ගය දෙසට එන බව පේනවා.

ප්‍ර ඒ කියන්නේ මේ බීච් පාර කියලා කියන්නේ කල්මුණේ මඩකලපු ප්‍රධාන මාර්ගයට සම්බන්ධවන අතුරු මාර්ගයක් කීවොත් හරි?

උ එහෙමයි.

ප්‍ර එතකොට මොහුට පේන්නේ මේ බීච් පාරේ ඉදලා , යම්කිසි කාන්තාවක් ඇවිදගෙන එන එකක්ද?

උ එහෙමයි ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර කාන්තාව පමණද ඇවිදගෙන එන්නේ ඔහුට පේන්ට?

උ. ඒ එක්කම තව පිටිපසින් තව පුද්ගලයෝ දෙදෙනෙක් පැමිණ සිටිනවා ස්වාමීනි. නමුත්, ඔවුන්ව හඳුනාගැනීමක් සිදුවෙන්නේ නැහැ.

ප්‍ර දැන් මේ වෙනකොට වේලාව කීයට විතර ඇත්ද?

උ ඔහු පාන්දර 3.00ට පිටත්වෙන්නේ ස්වාමීනි, පාන්දර 3.10ත් 3.15ත් අතර කාලයක් තමයි කියන්නේ.

ප්‍ර ඒ කියන්නේ මහත්මයා මේ වේලාව ටිකක් කලුවරයිනේ, එතකොට ඔහු කොහොමද මේ පුද්ගලයාව හඳුනාගෙන තියෙන්නේ?

උ මගේ පසුව ප්‍රශ්න කිරීම්වලදී ඔහු කියා සිටියේ ස්වාමීනි, එතනම අර කැබ රථය නවතා තිබූ තැනම විදුලි පහන් කණුවක් තියෙනවා. ඒ විදුලි පහන් කනුවෙන් තමයි මොහු එම දර්ශනය දැක ඇත්තේ. සහ ඔහුගේ වාහනයේ එළියෙන් කියලා තමයි කියන්නේ.

ප්‍ර ඔබ එම ස්ථානයේ විමර්ශණය කරලා බලනකොට එසේ විදුලි පහන් කණුවක් තිබුනාද?

උ එහෙමයි ස්වාමීනි. මා නිරීක්ෂණය කළා.

ප්‍ර ඔබ එම ස්ථානයට ගිහිල්ලා ඔබ විසින් බැලුවා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර බලනකොට විදුලි පහන් කණුවකුත් තිබුණා?

උ තිබුණා.

ප්‍ර මහත්මයා දැන් ඔහු කියනවනේ ඔහු ඔහුගේ රථයෙන් යනකොට මේ කාන්තාවකුයි තව පුද්ගලයෝ දෙන්නෙකුයි දැක්කා කියලා.

උ එහෙමයි.

ප්‍ර ඒ කාන්තාව කවුරු වශයෙන්ද ඔහු හඳුනාගෙන තියෙන්නේ?

උ ඔහු හඳුනාගෙන තියෙනවා ස්වාමීනි, මීට පෙර මාධ්‍යය මගින් ඔහු දැක ඇති සහ ප්‍රසිද්ධියට පත්වෙමින් සිටි සාරා යන කාන්තාව ලෙස. ඇය ෆර්දා ඇදුමින් සැරසිලා තිබෙන්නේ කලුපාට. නමුත් මුහුණ ආවරනයක් කරගෙන තිබි නැහැ ස්වාමීනි. ඒකෙන් ඇයව ඔහු හඳුනාගෙන තිබෙනවා.

ප්‍ර දැන් මහත්මයා විමර්ශණය කරලා බැලුවාද, මේ B නැමැති තොරතුරුකරු කොහොමද , සාරාව මීට කලින් දැකලා තියෙනවාද, ඊට සම්බන්ධයිද කියලා හොයලා බැලුවද?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඒ අනුව ඔබට මොකක්ද අනාවරනය වුනේ?

උ. ස්වාමීනි මෙම B නැමැති තොරතුරුකරුගේ නිවස තියෙන්නේත් ඔය කියන ප්‍ර දේශය ආසන්නයේමයි.

ප්‍ර. ඒ කියන්නේ කොහේද?

උ. මාණ්කාඩු මෙම සිද්ධිය වුන ස්ථානයට ආසන්නයේ. එම නිවසට නිවාස කිහිපයකට ඉදිරියෙන් තමයි මෙම කාන්තාව කුඩා කළ සිට , අවුරුදු 10

FAIR COMMENT BY JEZEEM

ක පමණ සිට, කාන්තාවට අවුරුදු 10 ක පමණ කාලයක සිට පදිංචි වෙලා ඉදලා තියෙන්නේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර. කාන්තාව කියන්නේ කවුද?

උ. මේ සාරා කියන කාන්තාව.

උ එතකොට මේ කාන්තාව නමින් දන්නේ නැහැ ස්වාමීනි කවුද කියලා, නමුත් ඔහු අර නිවස ඉදිරිපිට හිටපු ගැහැණු ළමයෙකු හැටියට හදුනාගෙන තියෙනවා. අවුරුදු ගාණක් ඔහු ඒ නිවස දෙකේ පදිංචි වෙලා ඉදලා තිබෙනවා , මේ කාන්තාව සහ මගේ තොරතුරුකරු.

****

<u>රජයේ අධිනිතිඥ චතුරංග බංඩාර මහතා</u>

ප්‍ර. ඊට අමතරව මාධ්‍යය මගින් නිකුත් කළ නිවේදනත් ඔය B නැමැති පුද්ගලයා දැකලා තිබෙනවාද?

උ. එහෙමයි ස්වාමීනි.

ප්‍ර. දැන් ඔබ සඳහන් කරා B ගෙන් සිදුකරන ලද විමර්ශණයේදි අනාවරනය වුනා කියලා, කාන්තාවත්, ඒ කියන්නේ සාරාත්, තවත් පුද්ගලයෝ දෙදෙනෙකුත් මුහුදු පාරේ සිට ප්‍රධාන මාර්ගයට ඇවිදිමින් එනවා දැක්කා කියලා.

උ එහෙමයි.

ප්‍ර ඒ දැක්ක දිනය විදියට ඔබ සඳහන් කළේ කවද්ද?

උ 2019 සැප්තැම්බර් මාසයේ දිනක ස්වාමීනි.

ප්‍ර ඒ කියන්නේ 2019.04.26 සයින්දමරුදු බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ?

උ පසුව ස්වාමීනි.

ප්‍ර එතකොට ඉන්පස්සේ, දැන් මොහු දැක්කනේ මේ වාහනයේ යන ගමන් අර මාධ්‍ය මගින් ප්‍රචාරණය කරපු පුද්ගලයා ඇවිදගෙන එනවා.

උ එහෙමයි.

ප්‍ර ඉන් අනතුරුව මේ B නැමැති පුද්ගලයා මොනවද කරලා තියෙන්නේ?

උ ස්වාමිනි මේ කාන්තාව හදුනාගැනීමෙන් පසු ඔහුට හැඟීමක් ඇතිවෙලා තියෙනවා, මේ කාන්තාව සම්බන්ධයෙන් යම් සැක කටයුතු ,මාධ්‍යය මගින් ප්‍රකාශ වී ඇති බව. ඔහුට මේ සැකයත් එක්ක ඔහු බලනවා ඔහු මේ යන රථයේ පැති කණ්ණාඩිවලින් කුමක්ද සිද්ධ වෙන්නේ කියලා, හිමින් යන ගමන්.

ප්‍ර. මොකක්ද ඔහු නිරීක්ෂණය කරලා තියෙන්නේ?

Presidents Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ. ඒ අවස්ථාවේදී ඔහුට නිරීක්ෂණය වෙනවා ස්වාමීනි, මෙම කියන කාන්තාව පාර හරහා ගිහිල්ලා අර පාරේ වම්පස නවතා තිබූ බටර් පැහැති පිකප් රථයට නගිනවා. ඒ පිකප් රථයේ පිටුපස ආසනයට නගිනවා.

ප්‍ර ඔහුට හඳුනා ගන්න පුලුවන් වෙලා තියෙනවාද අර සාරාත් එක්ක පිටුපසින් ආපු පුද්ගලයින් දෙදෙනා කවුද කියලා?

උ හඳුනාගෙන නැහැ ස්වාමීනි.

ප්‍ර ඉන්පසුව ඔහු මොකක්ද කරලා තියෙන්නේ, දැන් ඔහු සයිඩ් කණ්ණාඩියෙන් තමයි දැක්කේ සාරා පිකප් රථයට නගිනවා. ඉන්පසුව ඔහු මොකක්ද කරලා තියෙන්නේ?

උ ඔහුට ඉන්පසුව තවත් මේ සම්බන්ධයෙන් සැක සිතී ස්වාමීනි, මොහු ඉදිරියට ගිහිල්ලා, මීටර් 100 ක් පමණ කියලා කියන්නේ, ආපහු නැවත යූ හැඩයේ, යූ ටර්න් එකකින් හරවාගෙන ආපසු එනවා ස්වාමීනි.

ප්‍ර කොයි පැත්තටද එන්නේ?

උ එනකොට ආපසු මඩකලපුව දෙසට ගිය පුද්ගලයා නැවත කල්මුණේ දෙසට ආපහු හරවාගෙන එනවා.

ප්‍ර ඒ කියන්නේ ?

උ ප්‍රධාන මාර්ගයේ.

ප්‍ර ඒ කියන්නේ නවතා තිබූ කැබ් රථයට මුහුණලා

උ ආයේ ආපහු ඉදිරියට එනවා.?

ප්‍ර ඉන්පසුව මොකක්ද වෙලා තියෙන්නේ?

උ ඒ ඉදිරියට එනකොට දකිනවා ස්වාමීනි ඔහුගේ , දැන් නවතා තිබූ පිකප් රථයේ ඉදිරි වම්පස අසුනේ, පුද්ගලයෙකු ඉන්නවා.

ප්‍ර ඒ කියන්නේ රියදුරු අසුනේද? අනෙක් අසුනේද?

උ අනිත් අසුනේ. වම්පස අසුනේ. ඒ පුද්ගලයා හඳුනාගන්නවා ස්වාමීනි, මෙම මගේ B යන තොරතුරුකරු.

ප්‍ර B යන තොරතුරුකරු හඳුනාගන්නේ අර රියදුරු අසුනට එහාපැත්තේ වාඩිවෙලා ඉන්න පුද්ගලයා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර කවුරු විදියටද හඳුනාගන්නේ?

උ ඔහු හඳුනාගන්නවා ස්වාමීනි, ඔහු හඳුනන මීට පෙර කලවංචිකුඩි පොලිස් ස්ථානයේ රථවාහන අංශයේ සේවය කරපු , රථවාහන අංශයේ ස්ථානාධිපති හැටියට සේවය කරපු පොලිස් පරීක්ෂක අබුබකර් ලෙසට.

ප්‍ර පොලිස් පරීක්ෂක අබුබකර් ලෙසට ඔහු හඳුනාගන්නවා?

උ. එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඉන්පසුව මේ ඔබගේ B නැමැති පුද්ගලයා තොරතුරුකරු ඔහු මොකක්ද සිද්ධ කරලා තියෙන්නේ?

උ ඔහු ස්වාමීනි, මේ අබුබකර් කියන පුද්ගලයාව හොඳින් හඳුනනවා මීට පෙර ඒ නිසා මේ සම්බන්ධයෙන් විමසීමට , ඇයි මොකද කියලා අහන්ඩ,

FAIR COMMENT BY JEZEEM

ඔහු පාරේ බීච් පාර අයිනේ නවත්වනවා වාහනය, ඔහුගේ වාහනය නවත්වලා බහින්ඩ හදනකොටම , මේ මුලින් සදහන් කළ පිකප් රථය මඩකලපුව දෙසට වේගයෙන් ඇදිලා යනවා කියලා තමයි මට තොරතුරු ලැබෙන්නේ ස්වාමීනි.

මින්පසු සටහන් ගැනීම ල/ලේ මුතුමාලි.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව : ප.ව.03.00 යි.
පෙර සටහන් ල/ලේ : යමුනා මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර : ඉන් පසුව ඔබ ඒ අනාවරණය කර ගත් කරුණු අනුව ඔබ මොකක්ද සිද්ධ කළේ?

පි : මේ සම්බන්ධයෙන් ඔහුගේ මා විසින් ඔහුගේ මෙම තොරතුරු සම්බන්ධයෙන් ප්‍රකාශයක් සටහන් කළා ස්වාමිනි.

ප්‍ර : ඊට අමතරව?

පි : ඊට අමතරව ස්වාමිනි මට A නැමැති තොරතුරුකරු විසින් තවත් තොරතුරු කිහිපයක් දුන්නා. ඒ තමයි ස්වාමිනි මෙම කාන්තාව ඉන්දියාවට මට ලැබුණු තොරතුරු අනුව ඉන්දියාවට රැගෙන යාමට උදව් උපකාර කළ පුද්ගලයින් දෙදෙනෙක් සම්බන්ධයෙන් සහ මෙම කාන්තාව සැඟවී සිටි නිවෙස් තුනක් සම්බන්ධයෙන් මට තොරතුරු ලැබුණා ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔය ඔබ කිව්වනේ තව කාන්තාවට ඉන්දියාවට යාමට උදව් කරපු පුද්ගලයින් සම්බන්ධයෙන් තොරතුරු හම්බ වුණා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ විමර්ශනය කළාද එතකොට මේ සාරාට බෝට්ටුවෙන් යන්න උදව් කළා කියලා ඔබගේ A තොරතුරුකරු කියන පුද්ගලයින් සම්බන්ධයෙන්?

පි : මා සොයා බැලුවා ස්වාමිනි.

ප්‍ර : ඒ පුද්ගලයින් ගැන ඔබට යම්කිසි විස්තරයක් කරන්න පුළුවන්ද මේ කොමිෂන් සභාවට නම් අවශ්‍ය නැහැ ?

පි : මෙම පුද්ගලයින් දෙදෙනා ස්වාමිනි මෙම සාරා යන අයගේ මවගේ

ප්‍ර : එක් පුද්ගලයෙක් තමයි මවගේ

පි : මවගේ නංගීගේ ස්වාමි පුරුෂයා හැටියට හිටියේ ස්වාමිනි සහ ඔහුගේ අයියා.

ප්‍ර : එක පුද්ගලයෙක් මවගේ

පි : මවගේ නංගීගේ ස්වාමි පුරුෂයා.

ප්‍ර : අනිත් පුද්ගලයා කවුද?

පි : අනිත් පුද්ගලයා ඔහුගේ සහෝදරයා.

ප්‍ර : අර පළවෙනි පුද්ගලයගේ සහෝදරයා?

පි : පළවෙනි පුද්ගලයගේ සහෝදරයා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඔවුන් කුමක්ද කරලා තියෙන්නේ කියලා ඔබට අනාවරණය වුණාද කොහොමද මේ සාරාට යන්න ලංකාවෙන් එළියට යන්න උදව් කළේ කියන එක සම්බන්ධයෙන් අනාවරණය වුණාද?

පි : ස්වාමිනි බෝට්ටුවක් මඟින් යාමට උදව් කළා කියලා තමයි මට තොරතුරු ලැබුණේ.

ප : කවදා කොහොම ගියාද කියලා ඔබට හොයා ගන්න හම්බ වුණාද?

පි : නෑ ස්වාමිනි ඒ සම්බන්ධයෙන් දැන් විමර්ශනය සිදු වෙමින් පවතිනවා.

ප : ඊට අමතරව ඔබට A තොරතුරුකරුගෙන් A වශයෙන් ලකුණු කරන අපි නම් කරපු තොරතුරුකරුගෙන් තවත් කාරණා අනාවරණය වුණාද?

පි : එහෙමයි ස්වාමිනි. මෙම කාන්තාව නැවති සිටි නිවාස තුනක් සම්බන්ධයෙන් තොරතුරු ලැබුණා.

ප : ඒ සම්බන්ධව ඔබ මොකද කළේ විමර්ශනයේදී?

පි : ඒ සම්බන්ධයෙන් මං නිවාසවලට ගිහිල්ලා නිවාස මම මගේ මට්ටමෙන් එම නිවාස කුමන නිවාසද කියලා මම සොය ගත්තා ස්වාමිනි.

ප : ඔබ නිවාස පරීක්ෂා කරලා බැලුවද?

පි : පරීක්ෂා කරන්න ගියේ නෑ ස්වාමිනි ඒ සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන කටයුතු සිදු වෙනවා ස්වාමිනි.

ප : ඒ අනුව මේ තොරතුරු අනුව ඔබ වැඩිදුරටත් මේ විමර්ශන කරනවද නැත්නම් විමර්ශනය වෙනත් අංශයකට භාර දීලා තියෙනවද?

පි : ස්වාමිනි මේ සම්බන්ධයෙන් මෙම තොරතුරු ලැබෙනවාත් සමඟම මම මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් කළා ස්වාමිනි. එතුමන්ලා විසින් එදිනට පසු දින කොළඹ අපරාධ කොට්ඨාශයේ සහකාර පොලිස් අධිකාරිවරයෙක් ඇතුළු ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් දෙදෙනෙක් ඇතුළු කණ්ඩායමක් මඩකලපුව ප්‍රදේශයට එව්වා ස්වාමිනි.

ප : කියන්න?

පි : ඒ අනුව ස්වාමිනි මගේ තොරතුරු සහ මඟ පෙන්වීම යටතේ මෙම කාන්තාවට ඉන්දියාවට යාමට අනුබල සහ ආධාර දුන්නා යැයි කියන පුද්ගලයෙකු අත්අඩංගුවට ගත්තා ස්වාමිනි. තව පුද්ගලයෙකු අනිත් පුද්ගලයා විදේශ ගතව ඇති බවට තමයි තොරතුරු ලැබුණේ. ඒ වගේම මෙම සිද්ධියට සම්බන්ධ නිවාස මම අදාළ විමර්ශන නිලධාරීන්ට දැනුවත් කළා ස්වාමිනි. දැනට කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් විසින් අදාළ විමර්ශන කටයුතු සිදු කරමින් පවතිනවා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : වැඩිදුර විමර්ශන කොළඹ අපරාධ කොට්ඨාශය විසින් සිදු කරනවා කිව්වොත් හරි?

පි : එහෙමයි ස්වාමිනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සහරාන්ගේ මව සම්බන්ධයෙන් ඔබ මොනවත් තොරතුරු දැන ගත්තද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මොනවද?

පි : වැඩිදුර තොරතුරු නෑ ස්වාමිනි සාරාගේ මවගේ නිවස සම්බන්ධයෙන් මම විමර්ශනය කර ඒ සම්බන්ධයෙන් සටහන් යොදා ගත්තා ස්වාමිනි.

ප්‍ර : මවත් හිටියේ ඒ ප්‍රදේශයේමද?

පි : ඒ ප්‍රදේශයේමයි ඉන්නේ ඉතා කිට්ටු ප්‍රදේශයේ.

ප්‍ර : මව ගෙදර හිටියද?

පි : එම අවස්ථාවේ හිටියේ නෑ ස්වාමිනි අපි සොයන බලන අපි ඒ යන නමුත් ඒ කාන්තාව ඒ නිවසේ සිටින බවට තොරතුරු ලැබුණා අපි යන දිනයේ හිටියේ නෑ ස්වාමිනි.

ප්‍ර : මව නැවත සොයලා ගිහිල්ලා මවගෙන් යම් කිසි තොරතුරක් ලබා ගැනීමට උත්සාහ කළාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : එය ඉදිරියට කළ යුතුයි නේද?

පි : ඒ සම්බන්ධයෙන් සියළුම ඉදිරි විමර්ශන කටයුතු කොළඹ අපරාධ කොට්ඨාශය මඟින් සිදු වෙනවා ස්වාමිනි.

ප්‍ර : මව ඒ ගෙදර මේ දිනවල හිටියා කියලා

පි : තොරතුරු ලැබුණා ස්වාමිනි.

ප්‍ර : අවට වාසීන්ගෙන් තොරතුරු ලැබුණද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මව සමඟ තව කවුද ගෙදර ඉන්නේ දැන් මේ?

පි : ස්වාමිනි මම කියන්නේ මම යන දිනයේ තමයි එම කාන්තාව එම නිවසේ සිටි බවත් නමුත් එදින සිටියේ නෑ ස්වාමිනි.

ප්‍ර : තමන් යන දිනයේ හිටියේ නෑ?

පි : නෑ.

ප්‍ර : නමුත් ඒ ආසන්න දිනවල හිටියා?

පි : දිනවල සිටි බවට තොරතුරු ලැබුණා ස්වාමිනි.

ප්‍ර : ඒ ගෙදර වහලද තිබ්බේ?

පි : වහලා තිබුණේ ඉතා කුඩා නිවසක් ස්වාමිනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ගෙදර පරීක්ෂා කරන්න බැනේ මේ වහල තිබ්බේ ඒ අවට වට පිටාවේ කට්ටිය කිව්වද විස්තර මොකක්වත් මේ සම්බන්ධව?

පි : එහෙම කිව්වේ නෑ ස්වාමිනි අපි ඉතා රහසිගතව තමයි මෙම කටයුත්ත සිද්ධ කළේ අපි පොලිස් නිලධාරීන් හැටියට ගිහිල්ලා නෙමෙයි වෙනත් ආකාරයකින් තමයි ඒ තොරතුරු ලබා ගත්තේ.

ප : මෙම තොරතුරු ඔබලා සොයා ගත්තයින් පස්සේ ඔබලා කෙළින්ම කොහේටද පැමිණිලි කළේ ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කර ගෙන යන්න?

පි : ස්වාමිනි මගේ උසස් නිලධාරීන්ගේ උපදෙස් සහ නියෝග මත කොළඹ අපරාධ කොට්ඨාශයෙන් මට සහාය සඳහා වෙනම කණ්ඩායමක් පැමිණියා ස්වාමිනි.

ප : මේ අනුව ඔබට කියන්න පුළුවන්ද මෙම සොයා ගැනීම ඔබලද මුලින්ම කළේ කවුද කළේ?

පි : ඒ සොයා ගැනීම මෙම තොරතුරු සම්බන්ධයෙන් සොයා ගැනීම සිදු කළේ ස්වාමිනි මම විසින් මට ලැබුණු තොරතුරක් අනුව.

ප : තමන් කොමිෂන් සභාවේ විමර්ශන අංශය මඟින්?

පි : එහෙමයි ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් ඕමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාගෙන් අසමි. ප්‍රශ්න නොමැති බව දන්වයි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප : සාක්ෂිකරු

පි : ස්වාමිනි

ප : මෙම සාරා නැමැති තැනැත්තිය දිවයිනෙන් වෙනත් රටකට ගියා කියලා තමාට තොරතුරක් ලැබුණද?

පි : ඒ සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරක් නෑ ස්වාමිනි. 100% ක නිශ්චිත තොරතුරක් නෑ ස්වාමිනි.

ප : නමුත් 100% ක් නෑ නමුත් තමන්ට යම් කිසි තොරතුරක් ලැබුණනේ?

පි : ගිය බවට තමයි ස්වාමිනි තොරතුරු ලැබුණේ. යන්න යාමට අවශ්‍ය සහයෝගය ලබා දුන්නා කියලා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කවුද ඒ සහයෝගය ලබා දුන්නා කියලා තමන්ලට නිශ්චිත තාම පරීක්ෂණ කරනවා නමුත් තොරතුරු ලැබුණේ කවුරු සහයෝගය දුන්නා කියලද?

පි : ස්වාමිනි මෙම සාරා නැමැති කාන්තාවගේ මවගේ නංගීගේ පුරුෂයා සහ ඔහුගේ සහෝදරයා හැටියට. නම් තියෙනවා ස්වාමිනි නම් කියන්න ද

ප්‍ර : ඕනේ නෑ. ඒ දෙදෙනාට අමතරව තවත් වෙනත් තවත් බලවත්

පි : එහෙමයි ස්වාමිනි ඊට පසුව මම යම් විමර්ශනයේ යෙදෙන කොට තවත් පුද්ගලයෙකු මේ බෝට්ටුව ලබා දුන් බවට තොරතුරු ලැබුණා ස්වාමිනි ඒවා නිශ්චිත තොරතුරු නෙවෙයි. නමුත් ඒ සම්බන්ධයෙන් මම සියළුම ඒ කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු මගේ තොරතුරු මම දැනටත් තවදුරටත් කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන්ට ලබා දෙමින් එහි විමර්ශන කටයුතු වලට සහාය වෙනවා ස්වාමිනි.

ප්‍ර : ඒ බෝට්ටුව ලබා දුන් පුද්ගලයා සාමාන්‍යයෙන් බලවත් යම් කිසි දේශපාලනයට සම්බන්ධ පුද්ගයෙක්ද?

පි : නෑ එහෙම තොරතුරු අනාවරණය වෙන්නේ නෑ ස්වාමිනි. සාමාන්‍ය ධීවර

ප්‍ර : ධීවර බෝට්ටු?

පි : ධීවර බෝට්ටු.

ප්‍ර : සාමාන්‍යයෙන් දැන් මෙයා හිටියේ කලවංචිකුඩිනේ සාරා කොයි ප්‍රදේශයෙන්ද යන්න ගිහිල්ලා තියෙන්නේ?

පි : තොරතුරු හැටියට ස්වාමිනි මන්නාරම ප්‍රදේශයෙන් තමයි.

ප්‍ර : මන්නාරම?

පි : ඔව්.

ප්‍ර : මන්නාරමෙන් තමයි ඔය බෝට්ටුව සකස් කරලා යන්න සුදානම් කරලා තියෙන්නේ?

පි : කරලා තියෙනවයි කියලා ආරංචියි.

ප්‍ර : මන්නාරමට මේක සම්බන්ධ වුණේ කොහොමද කියලා තමාට තොරතුරු ලැබුණද?

පි : එහෙම දන්නේ නෑ ස්වාමිනි.

****

<u>**ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා**</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ මෙම කොමිෂමේ සේවය කරන කාලය අතරතුර ඔය කරන ලද පරීක්ෂණවලට අමතරව දැනටත් සේවයේ යෙදී සිටින පොලිස් නිලධාරීන්ගෙන් යම් ප්‍රකාශ සටහන් කර ගැනීමේ රාජකාරී කටයුතු කෙරුවද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිනි.

සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂිය සහ ඔහු විසින් මෙම කොමිෂමේ සිදුකෙරු කාර්යයන් හේතුවෙන් මේ සාක්ෂිකරුහට 2015 අංක 4 දරන සාක්ෂිකරුවන් හා වින්දිතයන් හට සහය ලබා දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 25 (4) උප වගන්තිය ප්‍රකාරව හිමි විය යුතු සියළු අයිතීන් සහ වරප්‍රසාද ලැබිය යුතු බවට සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමේ සහ සහාය දීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරනවා.

****

මේ අවස්ථාවේදී මේ තොරතුරු ලබා ගැනීම සම්බන්ධයෙන් මූලිකව ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් සාක්ෂිකරු හට කොමිෂන් සභාවේ ප්‍රශංසාව පල කරනවා.

සාක්ෂිකරු මුදා හරිනු ලැබේ.

මීට පසුව කොමිෂන් සභාව නැවත සාක්ෂිකරුවෙක් කැඳවනවා. එම සාක්ෂිකරුගේ සාක්ෂි මාධ්‍යය නොමැතිව ලබා ගන්නා බව සටහන් කරනවා.

දැන් වේලාව : 03.15 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.7.23 වේලාව :- පෙ.ව. 10.15

සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා (පැමිණ නැත) - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධී නිතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නිතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නිතීඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතීඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් කෞෂි සෙල්වනායගම් කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම : වාහල තන්ත්‍රිගේ ඩයස් පද්මසිරි
වයස : අවුරුදු 57
ජාතිය : සිංහල.
ආගම : බෞද්ධ
රැකියාව : ජාතික ජලසම්පාදන මණ්ඩලයේ විමර්ශන නිලධාරියෙකු ලෙස සේවය කරනවා. විශ්‍රාමික පොලිස් පරීක්ෂක.

ප්‍රතිඥා පිට සාක්ෂි කැඳවයි.

<u>ජ්‍යෂ්ඨ රජයේ අධි නීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබට මෙම කොමිෂන් සභාවට එනම් සහරාන් ප්‍රමුඛ මරාගෙන මැරෙන පුද්ගලයන් බෝම්බකරුවන් විසින් සිදුකරන ලද බෝම්බ ප්‍රහාරය සහ ඊට සම්බන්ධිත කරුණු සම්බන්ධව පවත්වනු ලබන විමර්ශනය කරනු ලබන ජනාධිපති කොමිෂන් සභාවේ ඉරියේ සාක්ෂි දීම සඳහා ඔබට සිතාසියක් ලැබුණද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මෙම සිතාසිය සමඟ ඔබට ලේඛනයක් ලැබුණද අද දින මේ දෙනු ලබන සාක්ෂිය සඳහා ඔබ වෙනුවෙන් අවශ්‍ය නම් නීතිඥ නියෝජනයක් ලබා ගත හැකි බවට?

පි එහෙමයි උතුමාණෙනි

ප්‍ර: ඒ අනුව ඔබ අද නීතිඥ සහයක් ලබාගෙන තියෙනවද ?

පි: ගරු උතුමාණෙනි අද දින මට නීතිඥ සහයක් අවශ්‍ය නැහැ උතුමාණෙනි.

ප්‍ර: සහයක් අවශ්‍ය නැහැ?

පි: නැහැ උතුමාණෙනි

ප්‍ර: දැන් ඔබ කියා සිටියා ඔබ විශ්‍රාමික පොලිස් නිලධාරිවරයෙක් බව

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඔබ ශ්‍රී ලංකා පොලිසියට සම්බන්ධ වුනේ මොන කාලේද ?

පි: ගරු උතුමාණෙනි මා පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස 1985.10.20 දින සේවය බැදුනා ස්වාමිනි.

ප්‍ර: අංකය?

පි: 5114

ප්‍ර: එසේ පොලිස් සේවයට බැඳුනු ඔබ මොනවද ලබපු උසස් වීම් ?

පි: ගරු උතුමාණෙනි පොලිස් සැරයන් ලෙස 93.12 .12 වෙනි දින පොලිස් සැරයන් තනතුරට උසස් වුනා උතුමාණෙනි. ඉන් පසු උප පොලිස් පරීක්ෂක 2006.01.01 දින උසස් වීමක් ලැබුවා උතුමාණෙනි ඉන් පසු 2019 .01.01 දින සිට පොලිස් තනතුරුට උසස්වීමක් ලැබුවා උතුමාණෙනි.

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් සාක්ෂිකරු මෙම උසස් වීම් ලැබීමේදී ඔබට විශේෂ උසස් වීමක් එහෙම ලැබුණද?

පි: නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඔබ 1985 අවුරුද්දේ පොලිස් සේවයට බැඳිලා මොන ප්‍රදේශයේද කොහේද සේවය කරේ?

පි: ගරු උතුමාණෙනි මුලින්ම මඩකලපුව පොලිස් කොට්ඨාශයේ සේවය කරා උතුමාණෙනි.

ප්‍ර: කොහේද?

පි: මඩකලපුව.

ප්‍ර: හරි?

පි: ඉන්පසු අනුරාධපුර පොලිස් මුලස්ථානය, ගල්ගමුව ප්‍රදේශවල සේවය කරා උතුමාණෙනි.

ප්‍ර: මඩකලපුව කොට්ඨාශයේ කිසියම් පොලිස් ස්ථානයකට අනුයුක්තවද සේවය කරේ?

පි ගරු උතුමාණෙනි මූලස්ථාන පොලීසියට අනුයුක්ත සේවය කරා ඉන් පසු කරදියනාරු STF කෑම් එකකට අනුයුක්තව සේවය කරා ටික කාලයක්.

ප්‍ර: දැන් ඔබ ඒ කියන්නේ විශේෂ කාර්ය බලකායට කඳවුරකට අනුයුක්තවද සේවය කරේ විශේෂ කාර්ය බලකායේ සෙබළකු වශයෙන්ද නැත්නම් සාමන්‍ය පොලිස් නිලධාරියෙක් වශයෙන්ද?

පි: සාමාන්‍ය පොලිස් නිලධාරියෙක් වශයෙන් උතුමාණෙනි.

ප්‍ර: දැන් ඔබ මෙසේ සේවය කරේ පොලිසියේ කිසියම් විශේෂ අංශවලට සම්බන්ධ වෙලා ද?

පි: නැහැ ස්වාමිනි සාමාන්‍ය රාජකාරි කරේ ස්වාමිනි.

ප්‍ර: මා විමසන්නේ පොලීසියේ තියෙනවානේ අපරාධ විමර්ශන අංශය සුළු පැමිණිලි අංශය රථවාහන වැනි අංශ දැන් ඒවායින් ඔබට මතකයක් තියෙනවද දැන් මේ අවුරුදු 35කට විතර පස්සේ සාක්ෂි දෙන කොට කුමන වගේ අංශයකට ඔබ සම්බන්ධවෙලාද ඔබ සේවය කරේ කියන්න ?

පි: ගරු උතුමාණෙනි මාහට මූලික පුහුණුව ලබා දුන්නේ අතුරන්බොඩ යුදහමුදා මධ්‍යස්ථානයේ පුහුණු උතුමාණෙනි ඒ අනුව අපේ රාජකාරියක් තිබුණේ උතුමාණෙනි එම ප්‍රදේශවල ආරක්ෂක රාජකාරි සහ ජංගම රාජකාරි උතුමාණෙනි.

ප්‍ර: ඔබ සිදු කරේ ආරක්ෂක සහ ජංගම රාජකාරි?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: හරි දැන් ඔබ කිසියම් කාලයක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සම්බන්ධ වුණාද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: කවද්ද ඒ ?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ගරු උතුමාණෙනි 1990.05.17 වන දින මා අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවට ස්ථානමාරුවීමක් ලබා පැමිණියා උතුමාණෙනි.

ප්‍ර: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඔබ සම්බන්ධ වෙන්නේ කුමන අංශයකටද අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවේ?

පි: මුලින්ම උතුමාණෙනි කටුනායක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඒකකයට තමයි උතුමාණෙනි අනුයුක්ත කලේ.

ප්‍ර: මුලින්ම කටුනායක තිබෙන අපරාධ පරික්ෂණ දෙපාර්ත මේන්තුවේ ඒකකයට ඔබ සම්බන්ධ වුනා?

පි: එහෙමයි ගරු උතුමාණෙනි.

ප්‍ර: ඊට පසුව ?

පි: ඊට පසුව පාලන අංශයට අනුයුක්තව සේවය කරා ටික කාලයක් ඉන් පසුව උතුමාණෙනි මතකයේ හැටියට 1999 ඉදලා වාණිජ අපරාධ විමර්ශන අංශයට 01 අනුයුක්තව සේවය කරා උතුමාණෙනි.

ප්‍ර: වාණිජ අපරාධ විමර්ශන අංශ 01 ට අනුයුක්ත වුනාට පසුව ඔබ එහි කොපමණ කායලයක් එම අංශයේ සේවය කරාද?

පි ගරු උතුමාණෙනි විශ්‍රාම යන තෙක් එම අංශයේ තමයි සේවය කරේ.

ප්‍ර: කවද්ද ඔබ විශ්‍රාම ගියේ?

පි: ගරු උතුමාණෙනි මා 2019 .10.07 වෙනි දින අනුව විශ්‍රාම පූර්ව නිවාඩු ලබා ගත්තා 2020.01.05 වෙනි දින විශ්‍රාම ගියා උතුමාණෙනි.

ප්‍ර: ඒ කියන්නේ 2020.01.05 වන දින ?

පි: .01.05 වන දින.

ප්‍ර: ඔබ ආසන්න වශයෙන් වසර 20 ක් හෝ ඊට වැඩි ප්‍රමාණ කාලයක් වාණිජ විමර්ශන අංශ 01 හි සේවය කරා කිව්වොත් හරිද?

පි: හරි උතුමාණෙනි.

ප්‍ර: ඔබ ඔබගේ මෙම පොලිස් ජීවිතයේ මං එහෙ කිව්වොත් මේ පොලීසියේ සේවය කල කාලවකවානුවේ අපරාධ නඩු සම්බන්ධයෙන් වන පරීක්ෂණ වලට ඔබ ප්‍රථමයෙන්ම සභාභාගි වෙන්න ගත්තේ කවද වගේ ඉදලද?

පි ගරු උතුමාණෙනි අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට පැමිණිමෙන් පසු එම විමර්ශන කිරීමට මේ පැවරුවා උතුමාණෙනි ඊට පෙර පොලීසි විසින් සිටි නිලධාරීන් උතුමාණෙනි සාමාන්‍ය රාජකාරීවලට අමතරව සමහර අවස්ථාවලදී විවිධ අවස්ථාවලදී විවිධ රාජකාරි පැවැරුවා උතුමාණෙනි.

ප්‍ර: එතකොට ඔබ අපරාධ පරීක්ෂණ කටයුතු පමණද සිදු කරේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සම්බන්ධ වුනාට පස්සේ?

පි: එහෙමයි ස්වාමිනි විමර්ශන රාජකාරිවල තමයි යෙදී සිටියේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබගේ දිගු මේ සේවා කාලය තුල ආසන්න වශයෙන් අවුරුදු 30 ක් පමණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඔබ සේවය කරා ඒ කාලය තුල ඔබ අපරාධ විමර්ශනයන් කීයකට වගේ සම්බන්ධ වුනාද?

පි: එහෙම මතකයෙන් කීමට හැකියාවක් නැහැ නමුත් විශාල ප්‍රමාණයකට සහාගී වුනා උතුමාණෙනි. මා විශ්‍රාම යන කොට ලිපි ගොනු 40 කට අසන්න ප්‍රමාණයක් මා භාරයේ තිබුණා විමර්ශනය කරන්න

ප්‍ර: එතකොට ඒ කියන්නේ විමර්ශනය අවසන් කරලද ?

පි: අවසන් කරපු ඒවායි උසාවියේ ඒවායි විමර්ශනය කරන්න තියෙන ඒවයි සේරම 39 වගේ තිබුණා .

ප්‍ර: දැන් මේ ඔබට විශේෂ මතකයක් එහෙම තියෙනවද ඔබ සහය දෙන්නට යෙදුනු හෝ ඔබ විමර්ශනය කරන්නට යෙදුනු මේ ආන්දෝලනාත්මක එහෙම නැත්නම් සුවිශේෂී වූ අපරාධයන් සම්බන්ධයෙන්?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මොකක්ද මොනවද ඒ ?

පි: උතුමාණෙනි මාවනැල්ලේ බුදු පිළිමවලට හානී කිරීම සම්බන්ධයෙන් විමර්ශනයට සම්බන්ධ වුනා උතුමාණෙනි

ප්‍ර: ඊට අමතරව? ඊට අමතරව විශේෂ විමර්ශනයන් ඔබ සිදු කරලා තියෙනවද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මතකයක් තියෙනවද නම් කරන්න පුළුවන්ද?

පි එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මොනවද ?

පි: ගරු උතුමාණෙනි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වැට් බදු වංචාව සම්බන්ධයෙන් විමර්ශනවලට සම්බන්ධ වී තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ විශාල ප්‍රමාණයේ මුදල් වංචාවක්?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ වැට් බදු වංචාවේදී සිදුවුනේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මිලියන හෝ බිලියන ගණන් වලින්?

පි: බිලියන 3.99 ක්

ප්‍ර: දැන් ඔබ මේ ඔබ ඔබගේ සේවා කාලය පොලිස් සැරයන් වරයෙක් උපපොලිස් පරීක්ෂකවරෙයෙක් සහ වසරක් පමණ පොලිස් පරික්ෂකවරයෙක් වශයෙන් ඔබ අපරාධ විමර්ශන රාජකාරියේ සිදු කරා?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මේ කාල වකවානුවේදී ඔබට සිතාසි ලබාගැනීම වරෙන්තු ලබා ගැනීම ඒ කියන්නේ නොතිසි ලබා ගැනීම සම්බන්ධයෙන් ඔබට දැනුමක් ලැබුණද?

පි: එහෙමයි ස්වාමිනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මා ඔබට කිවහොත් සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත් කරනවා ඒ සිතාසි භාර දීම සම්බන්ධයෙන් ක්‍රියාවලිය ගැන ඔබ දැනුවත්ද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ වගේම සාක්ෂිකරුවන්ට නිකුත් කරනු ලබන වරෙන්තු ක්‍රියාත්ම කිරීම ගැන ඔබ දැනුවත්ද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ වගේම සැකකරු හෝ චිත්තිකරුවන් අපරාධයක සැකකරුවකු හෝ චිත්තිකරුවෙකු හෝ චිත්තිකරුවන්ට එරෙහිව අධිකරණයන් වලින් නිකුත් කරන ලද වරෙන්තු ගැන ඔබ දැනුවත්ද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඔබට දැනීමක් තියෙනවද චිත්තිකරුවෙකුට නිකුත් කරන ලබන වරෙන්තු වර්ග තියෙනවද නැද්ද කියන්න? ප්‍රශ්නය පැහැදිලි නැත්නම් මට කියන්න?

පි: ප්‍රශ්නය පැහැදිලි නැහැ

ප්‍ර ඔබට දැනීමක් තියෙනවාද දින වරෙන්තු සහ විවෘත් වරෙන්තු කියලා කොටස් දෙකක් තියෙනවා කියලා?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: පැහැදිලි කරන්න මේ දින වරෙන්තුවක් කියන්නේ මොකක්ද කියලා ඔබට පැහැදිලි කරන්න දැනීමක් තියෙනවද?

පි: ගරු උතුමාණෙනි මගේ දැනීමේ හැටියට එම වරෙන්තුවට ගරු අධිකරණය මගින් දිනයක් යොදා තිබුණ ද ඒ දිනය ඇතුළත වරෙන්තුව ක්‍රියාත්මක කරලා අදාල දිනයට අධිකරණයට වාර්තාවක් ලබා දිය යුතුයි කියලා උතුමාණෙනි.

ප්‍ර: දැන් නැවත කියන්න මේ දින වරෙන්තුවක් කියලා කියන්නේ මොකක්ද කියලා?

පි: ගරු උතුමාණෙනි දින වරෙන්තු ගරු අධිකරණය මගින් නිකුත් කරාම උතුමාණෙනි එම වරෙන්තුව සම්බන්ධයෙන් ක්‍රියා කරලා ඒ දිනයට හෝ පෙර දිනයට හෝ ගරු අධිකරණයට වාර්තාවක් ලබා දෙන්න ඕනේ උතුමාණෙනි.

ප්‍ර: ඒක තමයි ඔබේ දැනීමේ හැටියට දින වරෙන්තුව එතකොට මේ දින වරෙන්තුව අදාල දිනයට ලබා දීමේ දී වරෙන්තුව ක්‍රියාත්මක කරගන්න බැරි වුනොත් ඊට පස්සේ දින දීර්ඝ කිරීමක්ද මොකක්ද වෙන්නේ ?

පි: ගරු අධිකරණයට ඉදිරිපත් කරලා ඒ සම්බන්ධයෙන් නැවත වරෙන්තුවක් ලබා ගන්න ඕනේ.

ප්‍ර: එතකොට ඔබා කියා සිටි විවෘත වරෙන්තු ගැන ඔබට අවබෝධයක් තියෙනවාද?

පි: එහෙමයි ස්වාමිනි විවෘත වරෙන්තු වල දිනයක් නැහැ උතුමාණෙනි.

ප්‍ර: විවෘත වරෙන්තුවල දිනයක් නැහැ ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එය ක්‍රියාත්මක කරලා ගරු අධිකරණයට වාර්තාවක් විදියට යන්න ඕනේ ක්‍රියාත්මක කරොත්.

ප්‍ර: එය ක්‍රියාත්මක කරලා ගරු අධිකරණයට ?

පි: වාර්තා කරන්න තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර: දැන් මේ දින වරෙන්තුවක් නිකුත් කරන්නේ පොලිස් ස්ථානයටකද ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ දින වරෙන්තුව නිකුත් කරන පොලිස් ස්ථානයට අමරතව එය වෙනත් පොලිස් ස්ථානයටක ක්‍රියාත්මක කරන්න හැකියාවක් තියෙනවද නැද්ද කියලා ඔබට දැනීමක් තියෙනවද?

පි: සාමන්‍යයෙන් ඒ ගැන දැන දැනීමක් තිබුණානම් උතුමාණෙනි ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් තියෙනවා උතුමාණෙනි.

ප්‍ර: දැන් දින වරෙන්තුවක පිටපතක් නැතිව වෙනත් පොලිස් ස්ථානයක නිලධාරිවරයෙකුට එය ක්‍රියාත්මක කරන්න පුළුවන්ද?

පි: මගේ දැනීමේ හැටියට උතුමාණෙනි ඒ පිළිබඳ ස්ථිරවම මේ අවබෝධයක් තියෙනවනම් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් තියෙනවා වරෙන්තුකරුවන් අල්ලලා පොලීසියට අල්ලලා දීමේ හැකියාවක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: එතකොට විවෘත් වරෙන්තු?

පි: එතකොට විවෘත වරෙන්තුත් ඒ ආකාරයි උතුමාණෙනි.

ප්‍ර: දැන් සාක්ෂිකරු මේ ඔබගේ සේවා කාලය තුල විමර්ශනයන් කිරීමේදී විමර්ශනයන් සම්බන්ධ සැකකරුවන්ගේ ප්‍රකාශ සටහන් කරගෙන තියෙනවද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: සාක්ෂිකරුවන්ගේ ?

පි: සටහන් කර ගෙන තියෙනවා උතුමාණෙනි.

ප්‍ර: ඔබ මේ ඔබගේ විමර්ශන කාල සීමාව තුල තොරතුරුකරුවන් හැසිරිවීම සම්බන්ධයෙන් තොරතුරු කරුවන් හසුරවලා තියෙනවද? දැන් ඔබ එක් එක් විමර්ශනයන් විවිධ විමර්ශනයන් කරන කොට ඒ විමර්ශනයන්ට අදාල තොතරුතුරු කරුවන් ඔබ විසින් යොදා ගත්තද විමර්ශනයන් සාර්ථක කර ගන්නට?

පි: සමහර අවස්ථාවලදී යොදලා තියෙනවා උතුමාණෙනි

ප්‍ර: එතකොට ඔබ දැනීමක් තියෙනවද මේ තොරතුරු කරුවෙකු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ගය ඒ කියන්නේ තමන්ගේ ඉහල නිලධාරීන්ට දන්වන්න ඕනේද? ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පොලිසියේ රෙගුලාසි තියෙනවද කියලා ?

පි: සාමාන්‍යයෙන් එහෙම අපි කටයුතු කරනවා රෙගුලාසි සම්බන්ධයෙන් මන් දන්නෑ උතුමාණෙනි. නමුත් කටයුතු කරනවා නම් ඒ සම්බන්ධයෙන්

FAIR COMMENT BY JEZEEM

ස්ථානාධිපතිතුමාට හෝ මේ අධික්ෂණ නිලධාරීට දැනුම් දෙන්න ඕනේ උතුමාණෙනි

ප්‍ර: ඒ කියන්නේ යම් විමර්ශනයදී ඔබ තොරතුරු කරුවෙකු පාවිච්චි කරනවා නම් ඒ සම්බන්ධයෙන් ඒ ස්ථානාධිපතිවරයාට හරි ඒ විමර්ශනය අධීක්ෂණය කරන නිලධාරියාට හරි දැනුම් දෙන්න ඕනේ කියලා ඔබ කියන්නේ?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර: එය ශ්‍රී ලංකා පොලීසියේ අනුගමනය කරන ක්‍රියා පිලිවෙතක්ද?

පි: බොහෝ දුරට උතුමාණෙනි විමර්ශන නිලධාරින්ට එහෙම හම්බුනා නම් ස්ථානාධිපතිටතුමාට තමයි දැනුම් දෙන්න ඕනේ

ප්‍ර: පොඩ්ඩක් ඉන්න මං අහන ප්‍රශ්නයට උත්තරයක් දුන්නොත් ඩයස් මහත්මයා අපිට හරි ලේසි මේ ඔබගේ සාක්ෂි මට අවසන් කරන්න ඉතින් මං කියන්නේ ශ්‍රී ලංකා පොලිසිය අනුගමනය කරන ක්‍රියා පිළිවෙතක්ද

පි: ඒ සම්බන්ධයෙන් මා දන්නේ නැහැ උතුමාණනි.

ප්‍ර: අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව එය අනුගමනය කරාද ? තොරතුරු කරුවන් සම්බන්ධයෙන්?

පි: මගේ සේවා කාලය තුල මං කරලා නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඔබ කරලා නැහැ?

පි: නැහැ උතුමාණෙනි.

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ ඔබගේ සේවා කාලය තුල කරපු විමර්ශනයන් සම්බන්ධයෙන් සටහන් ඇතුලත් කිරීම් කරලා තියේද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මෙම සටහන් ඔබ ඇතුලත් කරන්නේ කොහේද ?

පි: ඒ අදාල ස්ථානවලදී උතුමාණෙනි.

ප්‍ර: අදාල ස්ථානය අපි හිතමුකෝ ගල්පවුරක මේක දාන්න බැහැනේ කොහේද ලියන්නේ?

පි: සාමාන්‍යයෙන් උතුමාණෙනි අපරාධයක් වුනා නම් ඒ ස්ථානයේ පහසුකම් තියෙනවා නම් එ අපරාධ ස්ථානයේ යොදනවා එහෙම නැත්නම් පොලීසියට ආවට පස්සේ ලියනවා නම් ඒ පොලිස් ස්ථානයේ දී සටහන් යොදන විදියට තමයි සටහන් යොදන්නේ.

ප්‍ර: පොලිස් පැඩය යොදන්නේ කොහේද මොකකද පොතකද කොහෙද ,කොලයකද පත්තරයකද පත්තර පිටුවකද කියලා මං අහන්නේ?

පි: ගරු උතුමාණෙනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අපරාධ සටහන් පොත් තියෙනවා උතුමාණෙනි පොත් .

ප්‍ර: එම පොත් තමයි ඔබ භාවිතා කරන්නේ කියලා ද කියන්නේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: අපරාධය සටහන් එහෙම නැත්නම් සාක්කු සටහන් පොත් කියන්නේ එකමද දෙකක්ද?

FAIR COMMENT BY JEZEEM

පි: සාක්කු සටහන් පොත එකක් ස්වාමිනි අපරාධ සටහන් පොත නිලධාරින් ඒ සමඟ කටඋත්තර ලියන කොට භාවිතා කරන කොට අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවේ භාවිතා කරන පොතක් උතුමාණෙනි.

ප්‍ර: ඒ කියන්නේ අපරාධ සටහන් පොත කියන්නේ මේ විමර්ශනයන් කිරීමේදී කරනු ලබන විමර්ශන්ට අදාළ තබන සටහනක් ද ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මේ සාක්කු සටහන් පොත කියන්නේ ?

පි: සාක්කු සටහන් පොත උතුමාණෙනි එදිනදා මේ රාජකාරි වාර්තා කරාම සටහනක් දානවා අපි දවසේ රාජකාරි සිදු කරා කියලා ස්වාමිනි.

ප්‍ර: එච්චරයිද?

පි: අපරාධ සිදු කරන එහෙම නැත්නම් රාජකාරිත් සම්බන්ධායෙනුත් ඒක සටහන් විය යුතුයි ස්වාමිනි.

ප්‍ර: සටහන් විය යුතුයි?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: දැන් මේ සාක්කු සටහන් පොත සෑම නිලධාරිවරයෙකුටම ලබා දෙන ලේඛනයක් ද ?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර: ඒ සාක්කු සටහන් පොතක් අවුරුද්දකට සැරයක් ද මාසයකට සැරයක්ද ඔබට ලැබෙන්නේ?

පි: නෑ පොත උතුමාණෙනි පොතක් පාවිච්චි කරලා ඉවර වුනාම ඒ පොත භාර දුන්නාම නැවත පොතක් භාර දෙනවා ස්වාමිනි.

ප්‍ර: අන්න හරි ඒ පොත ඔබ කාට ද භාර දෙන්නේ?

පි ඒ උතුමාණෙනි කාර්යාලයට භාර දෙන්න ඕනේ .

ප්‍ර: කාර්යාලයේ ලේඛනාගාරයටද නැත්නම් OIC මහත්මයාටද කාටද ඕක භාරදෙන්නේ?

පි: අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවේ ස්ථානාධිපති කාර්යාලයට ස්වාමිනි.

ප්‍ර: මම ඔබට කිව්වොත් මේ සාක්කු සටහන් පොත පොලිස් නිලධාරියෙකු සම්බන්ධයෙන් අර ගුවන් යානා වල තියෙන Black box එක වගේ කියලා කිව්වොත් හරදි වැරිද?

පි: ප්‍රශ්නය පැහැදිලි නැහැ උතුමාණෙනි .

ප්‍ර: ඒ කියන්නේ සියළු තොරතුරු තමා කරන ලද රාජකාරි වලට අදාල සියලුම තොරතුරු සහ එදිනෙදා සිදුවෙන මුහුණ දෙන විශේෂ සිද්ධීන් ඔබ මේ සාක්කු සටහන් පොතේ කලයුතුද?

පි: සටහන් කල යුතුයි උතුමාණෙනි.

ප්‍ර: සාක්ෂිකරු මා දැන් ඔබව ඔබගේ මතකය අවදි කරන්න යන්නේ 2018.12.21 වෙනි දින කල රාජකාරි සම්බන්ධයෙන්?

පි: එහෙමයි උතුමාණෙනි .

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඊට ප්‍රථමයෙන් මං ඔබගෙන් පැහැදිලි කිරීමක් මට අවශ්‍යයි මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවේ තියෙනවද පොරොත්තු වාර්තා රාජකාරි කියලා රාජකාරියක්?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: පැහැදිලි කරන්න මේ පොරොත්තු රාජකාරිය කියන්නේ කුමක්ද කියලා? කෙටියෙන්?

පි: මොකක්ද මේ පොරොත්තු රාජකාරිය කියන්නේ?

ප්‍ර ගරු උතුමාණෙනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවේ යම් කිසි විශේෂ පරීක්ෂණයක් දෙනික පැමිණියොත් කණ්ඩායමක් ඒ සඳහා යොමු කරන්න අවශ්‍ය වුනොත් අපරාධ පරීක්ෂණ දෙපාර්ත මෙන්තුවේ එක් එක් අංශවලින් නිලධාරි කණ්ඩායමක් රාජකාරි සඳහා යොදවනවා උතුමාණෙනි.

ප්‍ර: පැහැදිලි නෑ ඒ කියන්නේ යම් දිනක හදිසියේ යම් හදිසි විමර්ශනයක් පැමිණියහොත් ඒ සඳහා යොමු කිරීම සඳහා සුදානම්ව සිටින නිලධාරින් කණ්ඩායම කරන රාජකාරියටද පොරොත්තු රාජකාරි කියලා ඔබ කියන්නේ?

පි: එහෙමයි උතුමාණෙනි යම්කිසි රාජකාරියක් හදිසියේ පැමිණිනොත් ඒ නිලධාරීන් ඒ සඳහා පිටව යන්න සුදානමින් සිටිය යුතුයි උතුමාණෙනි.

ප්‍ර: කවුද ඔය රාජකාරිය තීරණය කරලා නිලධාරීන් යොමු කරන්නේ ?

පි: ගරු උතුමාණෙනි මාසේ මුල එක් එක් අංශවලට අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවේ ස්ථානාධිපතිතුමා විසින් එවනවා ඒ අංශවලින් ඒ රාජකාරියේ යෙදවිය යුතු නිලධාරීන් සම්බන්ධයෙන් වාර්තාවක් ඒ අනුව අංශයේ ස්ථානාධිපතිතුමා විසින් ඒ සඳහා රාජකාරි නිලධාරීන් යොදවනවා උතුමාණෙනි.

ප්‍ර: 26.12 .2018 දිනයට දැනට මං ඔබව රැගෙන යනවා මෙම දිනයේ ඔබ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු රාජකාරියට වාර්තා කරාද?

පි ගරු උතුමාණෙනි දිනය

ප්‍ර: 26.12.2018?

පි එහෙමයි උතුමාණෙනි

ප්‍ර: වේලාව කීයද ඒ රාජකාරියට වාර්තා කරපු?

පි: එදින පොරොත්තු සේවා රාජකාරිය තිබුණෙ උතුමාණෙනි

ප්‍ර: ඔබට තිබුණේ එදා පොරෙත්තු සේවා රාජකාරිය.

පි: එහෙමයි උතුමාණෙනි 8.30 ට පෙර වර්තා කරන්න ඕනේ උතුමාණෙනි උදේ.

ප්‍ර: ඒ අනුව ඔබ වාර්තා කරාද?

පි: එහෙමයි උතුමාණෙනි

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් පොරොත්තු සේවය එදා සේවයට වාර්තා කරන කොට ඒ පොරොත්තු සේවයේ රාජකාරිය භාර නිලධාරියා එහෙම නැත්නම් ඒ පොරොත්තුකරු වශයෙන් සේවයේ හිටියේ කවුරු වශයෙන්ද?

පි ගරු උතුමාණෙනි පොරොත්තු සේවා නිලධාරී කණ්ඩායමේ පොලිස් පරීක්ෂකවරයෙක් පොලිස් සැරයන් පොලිස් කොස්තාපල්වරුන්ගෙන් සමන්විතයි උතුමාණෙනි. එතකොට පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ මං වාර්තා කලේ උතුමාණෙනි තවත් පොලිස් සැරයන්වරයෙකුත් පොලිස් කොස්තාපලුත් වාර්තා කරලා තිබ්බා උතුමාණෙනි.

ප්‍ර: මතකද ඔවුන්ගේ නම්?

පි මතකයි උතුමාණෙනි.

ප්‍ර: කවුද?

පි: පොලිස් සැරයන් විජේරත්න වාර්තා කරලා තිබ්බා උතුමාණෙනි. පරිගණක අංශයේ යොදවපු නිලධාරියා නොමැති හින්දා ඒ සඳහා පොලිස් කොස්තාපල් දිසානායකව ඒ සඳහා යොමු කරලා තිබුණා උතුමාණෙනි.

ප්‍ර: දැන් ඔබ එදා පොරොත්තු රාජකාරියට වාර්තා කල විට ඔබලාට යම් නියෝගයක් ලැබුණද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: කාගෙන්ද ලැබුණු නියෝගය?

පි: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානාධිපතිතුමාගෙන් උතුමාණෙනි.

ප්‍ර: අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානාධිපතිතුමාගෙන්?

පි: ස්ථානාධිපති තුමාගෙන් උතුමාණෙනි

ප්‍ර: මතකද ස්ථානාධිපතිගේ නම?

පි: එහෙමයි උතුමාණෙනි ප්‍රධාන පොලිස් පරීක්ෂක අබේසිංහ මහතා.

ප්‍ර: ප්‍රධාන පොලිස් පරීක්ෂක අබේසිංහ වෙතින් ඔබලාට මොකක්ද ලැබුණු නියෝගය?

පි: පොරොත්තු සේවා නිලධාරීන් කණ්ඩායමට

ප්‍ර: පොරොත්තු සේවා නිලධාරී කණ්ඩායමට

පි: විශේෂ විමර්ශන අංශ දෙකෙහි ස්ථානාධිපති පොලිස් පරීක්ෂක මාරසිංහ මහතාට වාර්තා කරන්න කියලා කිව්වා.

ප්‍ර: කුමන කාරණයක් සඳහාද වාර්තා කරන්න දැන්වූයේ?

පි: හේතුවක් කිව්වේ නැහැ උතුමාණෙනි වාර්තා කරන්න පමණයි කිව්වේ.

ප්‍ර: ඒ අනුව මේ පොරොත්තු රාජකාරි කරපු ඔබ කණ්ඩායම වාර්තා කරාද? පොලිස් පරීක්ෂක මාරසිංහ වෙත?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: කවද්ද කීයට විතරද?

FAIR COMMENT BY JEZEEM

පි: මගේ මතකය හැටියට 2018.12.26 වෙනිදා පොරොත්තු සේවාව වාර්තා කිරීමෙන් පසු නවය හමාරට විතර

ප්‍ර: ඔබ වේලාව කියන්නේ ඔබ කරපු සටහනක් මතද මතකයෙන්ද?

පි: මතකයෙන් කියන්නේ.

ප්‍ර: එසේ පොලිස් පරීක්ෂක මාරසිංහ මහතාට වාර්තා කරාම ඔබ විසින් කල යුතු රාජකාරිය සම්බන්ධයෙන් ඔබ දැනුවත් කරාද?

පි: වාර්තා කරාට පස්සේ පොලිස් පරීක්ෂක මාරසිංහ මහත්මයා දැනුම් දුන්නා කෑගල්ලට යන්න තියෙනවා මේ කියලා අධ්‍යක්ෂකතුමා දැනුම් දීලා තියෙනවා ඒ අනුව අධ්‍යක්ෂකතුමා හමුවෙලා එන්නම් කියලා ඔහුත් හරියටම රාජකාරි දැන ගෙන හිටියේ නැහැ ඒ වෙන කොට.

ප්‍ර: ඒ අනුව පොලිස් පරීක්ෂක මාරසිංහ අධ්‍යක්ෂකවරයාත් හමුවී පැමිණියාට පසුව හරි ඔබ දැනුවත් කරාද සිදු කල යුතු රාජකාරිය මොකක්ද කියලා?

පි: ගරු උතුමාණෙනි කෑගල්ලට ප්‍රදේශයට විමර්ශනයක් සඳහා යනවා කියලා තමයි කිව්වේ.

ප්‍ර: ඒ අනුව ඔබලා පිටත් වුණාද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ 2018.12.26 වෙනිදාද ?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර: කීයටද?

පි: එදා උදේ වරුවේ පිටත් වුණා උතුමාණෙනි.

ප්‍ර: ඒ අනුව ඔබලා පිටත් වෙලා කොහාටද ගියේ?

පි: කෑගල්ල පොලිස් අධිකාරි කාර්යාලයට එතනම තියෙනවා උතුමාණෙනි කොටියාශ විමර්ශන අංශයක් තියෙනවා උතුමාණෙනි.

ප්‍ර: ඒ යනවිට ඔබ දැනන් හිටියද කරන්න යන විමර්ශනයේ ස්වභාය මොකක්ද කියලා?

පි: එතැන්ට ගියාට පස්සේ දැන ගත්තා උතුමාණෙනි.

ප්‍ර: මොකක්ද ඒ මා ඔබට යෝජනා කරොත් මාවනැල්ල ප්‍රදේශයේ සිදු වූ බෞද්ධ ප්‍රතිමා වලට කරපු හානිය සම්බන්ධයෙන් කරපු විමර්ශනය කියලා කිව්වොත් හරිද?

පි: හරි උතුමාණෙනි.

ප්‍ර: ඔබ කෑගල්ලට ගියාට පස්සේ කිසියම් අවස්ථාවක ඔබලා ගියාද කෑගල්ල මූලස්ථාන පොලිස් ස්ථානයට?

පි: මූලස්ථාන පොලිස් ස්ථානයට ගියා උතුමාණෙනි.

ප්‍ර: ඒ යන අවස්ථාවේදී කිසියම් සැකකරුවෙකු හෝ සැකකරුවන් පොලිස් ස්ථානයේ හිටියද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඔබලා මේ කෑගල්ල මුලස්ථාන පොලිසියට යන කොට වේලාව කීයට විතර වගේ ඇද්ද?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: සාමාන්‍යයෙන් මතක විදියට හැටියට උතුමාණෙනි දවල් 12ට 12 හමාරට වගේ ඇති උතුමාණෙනි.

ප්‍ර: ඒ ඔබ මතකයෙන් කියන්නේ?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර: සටහන් බලලා නෙමේ? ඔබලා දැන් කෑගල්ල පොලීසියට ගියාට පස්සේ ඒ වෙලාවේ මොකක්ද කෑගල්ල පොලිස් ස්ථානයේ වෙමින් තිබුණේ?

පි: ගරු උතුමාණෙනි මාවනැල්ල ඒ පොලිස් වසම්වල බුදු පිළිමවලට හානී කිරීමට සම්බන්ධයෙන් පුද්ගලයෙක් අත්අඩංගුවට ගෙනත්ලා ඒ පුද්ගලයාගෙන් ප්‍රශ්න කරමින් හිටියේ උතුමාණෙනි නිලධාරීන්.

ප්‍ර: ඔබලා මොකද කරේ මේ ප්‍රශ්න කිරීම් කරද්දි?

පි: අපිත් පොලිස් පරීක්ෂක මාරසිංහ මහතායි මාත් එවාට සම්බන්ධ පොලිස් පරීක්ෂ මාරසිංහ මහතා පොලිස් අධිකාරි කාර්යාලයට ගියා උතුමාණෙනි එදින මායි කෑගල්ල පොලිස් ස්ථානය ඒ සම්බන්ධයෙන් සොයා බැලීම් කරා උතුමාණෙනි.

ප්‍ර: දැන් ඔබලා 2018.12.26 කෑගල්ල ගියාට පස්සේ මෙම විමර්ශනයන් ඒ කියන්නේ මේ බුද්ධ ප්‍රතිමාවලට හානී කිරීම් සම්බන්ධයෙන් වන විමර්ශනයන් වලට ඒ දවසේ සහභාගි වුනාද?

පි සහභාගි වුනා කියන්නේ උතුමාණෙනි ඒ සැකකරුවන්ගෙන් පොලිසිය විමර්ශන කටයුතු කරා ඒ වටා අපි සහය වුනා උතුමාණෙනි.

ප්‍ර: සහය වුණා?

පි: ඔව්

ප්‍ර: දැන් ඔබලා ඒ අවස්ථාවේදී සමාවෙන්න ඔබ කෑගල්ල පොලිස් ස්ථානයේ කිසියම් පොලිස් නිලධාරිවරයෙකු හෝ නිලධාරීන් මුන ගැසී මේ සිද්ධිය සම්බන්ධයෙන් සාකච්ඡා කරාද?

පි: නෑ උතුමාණෙනි

ප්‍ර: කෑගල්ල කොට්ඨාශයට සම්බන්ධිත නිලධාරීන් හෝ නිලධාරිවරුන් සමඟ සාකච්ඡා කරාද ඔබ ?

පි: නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබලා මේ කෑගල්ල පොලිස් ස්ථානයේ සිටින විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා එම ස්ථානයට ආවාද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: කවුද ඒ අධ්‍යක්ෂක වශයෙන් හිටියේ?

පි: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකර මහතා උතුමාණෙනි.

ප්‍ර: ශානි අබේසේකර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකර?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: අධ්‍යක්ෂකවරයා කෑගල්ල පොලිස් ස්ථානයට ආවාම ඔහු ඔබ සමඟ හෝ ඔබලා සියලු දෙනා සමඟ කථා කරාද?

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා සමඟ කථා කරා උතුමාණෙනි අපි සමඟ විශේෂයෙන් කථා කරේ නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඔබට දැනගන්නට ලැබුණාද මෙම මාවනැල්ලේ සිදු වූ බුද්ධ ප්‍රතිමාවලට හානී කිරීමේ සිද්ධීන් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තු කණ්ඩායම විසින් කලයුතු රාජකාරිය කුමක්ද කියලා?

පි ගරු උතුමාණෙනි පොලිස් පරික්ෂක මාරසිංහ මහතා තමයි කිව්වේ උතුමාණෙනි ඒ සිද්ධියට සම්බන්ධ සැකකරුවන් දෙන්නෙක් ඉන්නවා ඔවුන් එම සැකකරුවන් දෙදෙනා සම්බන්ධයෙන් විමර්ශනය කරන්න අවශ්‍යයි කියලා තමයි එහිදි දැන ගන්න හම්බණේ උතුමාණෙනි.

ප්‍ර: ඒක ඔබට දැනුම් දුන්නේ පොලිස් පරීක්ෂක මාරසිංහ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: හරි නමුත් ඔබලා ඔබට හෝ ඔබට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකර පොලිස් පරීක්ෂක මාරසිංහට කියපු දේ ඔබට ඇහුනද ?

පි: නෑ උතුමාණෙනි .

ප්‍ර: ඔබට ඇහුන් නැහැ හරි මෙම දිනය තුල ඔබලා කිසියම් හෝ රාජකාරියක් සිදු කරාද?

පි: ගරු උතුමාණෙනි මගේ මතකයේ හැටියට යුතුව තිබු බුදු පිළිම තිබු ප්‍රදේශවලට ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් සොයා බැලීම් කරා උතුමාණෙනි අපිට අපරාධ දෙපාර්තමේන්තුවෙන් වාහනයක් සපයලා තිබුණා ඒ වාහනයෙන් අපි කණ්ඩායම ගොස් ඒ සම්බන්ධයෙන් සොයා බැලීම් කරා උතුමාණෙනි

ප්‍ර: හරි ඔබ දැන් කියා සිටියා මේ පුද්ගලයෝ දෙදෙනෙක් අත්අඩංගුවට ගැනීමට තිබුණා කියලා?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර: ඔහුගේ නම් දන්නවද ඔබ ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මොනවද ඔවුන්ගේ නම් ?

පි: සාහිඩ් සහ සාදික්

ප්‍ර: ඔවුන් ඥාතීන්ද?

පි: ඔවුන් සහෝදරයෝ දෙන්නෙක්.

ප්‍ර: මේ සාහිද් සහ සාහිඩ් මෙම මාවනැල්ල බුදුපිළිම වලට හානි කිරීමේ සිද්ධියට සෘජුවම සම්බන්ධ වෙලා කියලා ඔබට කවුරු හරි කියා සිටියද?

පි: එතෙන කරෙන විමර්ශන අනුව කෑගල්ල පොලිසියේ කරෙන විමර්ශන අනුව ඒ කරන ප්‍රශ්න කිරීමේදී පැහැදිලි වුනා ඔවුන්ගේ යම් සම්බන්ධතාවයක් තියෙන බව

ප්‍ර: දැන් ඔබලා ඒ අනුව සාහිඩ් සහ සාදික් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කරාද?

පි: එහෙමයි උතුමාණෙනි.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එම විමර්ශනයන් කවුද කරේ? ඔබද නැත් නම් වෙනත් නිලධාරියෙක්ද?

පි: ප්‍රශ්නය පැහැදිලි නැහැ උතුමාණෙනි.

ප්‍ර: එම සාදික් සහ සාහිඩ් අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් කර විමර්ශනයන් සිදුකරේ ඔබද නැත්නම් වෙනත් නිලධාරියෙක්ද?

පි: පොලිස්පති පරීක්ෂක මාරසිංහ මහතා සමඟ අපි ඇතුලු නිලධාරීන් කණ්ඩායමක් ඒ විමර්ශනවල යෙදී සිටියා උතුමාණෙනි.

ප්‍ර: ඔබ ප්‍රධාන පොලිස් පරීක්ෂක අමරබන්දු කියලා නිලධාරිවරයෙක් දන්නවද?

පි: එහෙමයි උතුමාණෙනි ඔහු තමයි මෙම විමර්ශනය ඒ වෙන කොට භාරව කොට්ඨාශ අපරාධ අංශය මේ මෙම විමර්ශනය සසම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කලේ ස්වාමිනි.

ප්‍ර: මේ ප්‍රධාන පොලිස් පරීක්ෂක අමරබන්දු එම විමර්ශන කටයුතු සිදු කරා නම් ඔහු සමඟ ඔබ සාකච්ඡා කරාද?

පි: උතුමාණෙනි බොහෝදුරට අපි කණ්ඩායම ගියාම පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා තමයි ඔහුත් සමඟ සාකච්ඡා කරන්නේ මාත් ඒ සමඟර අවස්ථාවලදී හිටියොත් ඒවාට සහ සම්බන්ධ වෙනවා. ප්‍රධාන පොලිස් පරීක්ෂක අමර බන්දු මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවෙන් ගියපු කණ්ඩායමට ලබා දීපු උපදෙස මොකක්ද කියලා?

පි: ඒ සම්බන්ධයෙන් නම් දැනීමක් නැහැ උතුමාණනි නමුත් පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා තමයි කිව්වේ උතුමාණෙනි මේ පුද්ගලයෝ දෙන්න හොයලා අත්අඩංගුවට ගන්න ඕනේ කියලා උතුමාණෙනි.

ප්‍ර: සාහිඩ් සහ සාදික් සොයලා අත්අඩංගුවට ගන්න කියලා කිව්වේ ප්‍රධාන පොලිස් පරීක්ෂක අමර බන්දු?

පි: අමර බන්දු මහත්මයා ඒ සම්බන්ධයෙන් මාරසිංහ මහතා සමඟ කිව්වා ස්වාමිනි මමත් ඒ ස්ථානවල හිටියා ස්වාමිනි. ඒසේම උතුමාණෙනි නමුත් මාරසිංහ මහතාත් තමයි අපි විමර්ශනය ඒ සම්බන්ධයෙන් පැවැත්වුයේ උතුමාණෙනි.

ප්‍ර: ඒ කියන්නේ අමර බන්දු මහත්මයා කියා සිටියා සාහිඩ් සහ සාදික් අත්අඩංගුවට ගන්න ඕනේ අවශ්‍යයි කියලා ?

පි: ඔව් ස්වාමිනි

ප්‍ර: ඒ අනුව පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා ඔබලා විමර්ශනය සිදුකරා කියලද ඔබ කියන්නේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: දැන් සාහිඩ් සහ සාදික් සම්බන්ධයෙන් කරන අත්අඩංගුවට ගැනීම සඳහා කරන ලද විමර්ශනයේදී ඔබලා ඔවුන් පදිංචි ලිපිනය සොයා ගත්තද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ ලිපියනයට ඔබලා ගියාද?

පි: එහෙමයි උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: හරි මොනවද ඔබ නිරීක්ෂණය කරේ සාදික් සහ සාහිඩ් පදිංචි නිවසට ගියාම ?

පි: ගරු උතුමාණෙනි අපි යන කොට නිවස වහලා තිබුණේ උතුමාණෙනි කිසිවකු හිටියේ නැහැ උතුමාණෙනි.

ප්‍ර: කිසිවකු හිටියේ නැහැ?

පි: නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඔබට කීමට හැකියාවක් තියේද මොන මොන දිනවලද ඔබ මෙම සාදික් සහ සාහිඩ් සම්බන්ධයෙන් සොයා බැලුවේ කියා?

පි: ගරු උතුමාණෙනි 2018.12.26 වන දින සිට 2019.01.15 වන දින දක්වා අපි උතුමාණෙනි මාවනැල්ල ප්‍රදේශයේ තමයි හිටියේ උතුමාණෙනි ඒ හිටපු කාලය තුල අවස්ථා කීපයකදී ගියා කියලා කියන්න පුළුවන් උතුමාණෙනි මේ සම්බන්ධයෙන් විමර්ශනය කරන්නට උතුමාණෙනි.

ප්‍ර: දැන් 2018.12.26 ඉදලා 2019.01.15 දින දක්වා මාවනැල්ල ප්‍රදේශයේ සිට කරපු රාජකාරි සම්බන්ධයෙන් ඔබ සටහන් යොදලා තියෙනවද නැද්ද?

පි: සටහන් යොදලා නැහැ උතුමාණෙනි.

ප්‍ර: අවම වශයෙන් ඔබ ඔබගේ සාක්කු සටහන් පොතේ හෝ සටහනක් යොදලා තියෙනවද?

පි: නෑ උතුමාණෙනි.

ප්‍ර: මාවනැල්ල පිටත්ව සමාවෙන්න කෑගල්ලට පිටත්ව යෑම සම්බන්ධයෙන් ඔබ සාක්කු සටහන් පොතේ සටහනක් යෙදුවාද ඔබ?

පි: නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඒ කියන්නේ 2018.12.26 සිට 2019.01.15 දින දක්වා පොලිස් පරීක්ෂක මාරසිංහගේ ප්‍රධානත්වයෙන් මේ කෑගල්ලට ගිය කන්ඩායම කරපු රාජකාරි වලට අදාලව එහි සමාජිකයකු වූ ඔබ කිසිදු හෝ සටහනක් ඇතුලත් කර නැහැ?

පි: නෑ උතුමාණෙනි විමර්ශන රාජකාරි කෑගල්ල කොට්ඨාශ අපරාධ කරේ උතුමාණෙනි. අපිට පැවරිලා තිබුණේ මේ සැකකරුවන් දෙදෙනා සම්බන්ධයෙවන් විමර්ශනය කිරීමට උතුමාණෙනි අපි ඒ නිසා ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරමින් ගියා උතුමාණෙනි.

ප්‍ර: ඒ විමර්ශනයේදී ගත් පියවර පිළිබඳව ඔබ සටහනක් යොදලා නැහැ?

පි: නැහැ.

ප්‍ර: නැහැ කියලා තමයි ඔබ කියන්නේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ සැකකරුවන් දෙදෙනා සොයා ගැනීමේ ක්‍රියාවලියේදී ඒ කියන්නේ ජනවාරි මාසේ 15 වෙනිදා දක්වා ඔබ තනිවම හෝ කණ්ඩායමක් සමඟ ඔබගේ ප්‍රධානත්වයෙන් විමර්ශනයක් කරාද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: මාගේ ප්‍රධානත්වයෙන් නෙමේ ස්වාමිනි පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා තමයි උතුමාණෙනි ජ්‍යෙෂ්ඨ නිලධාරියා ඔහුගේ ප්‍රධානත්වයෙන් තමයි විමර්ශන රාජකාරි සිදු කරේ.

ප්‍ර: දැන් එතෙක් කරපු රාජකාරි ගැන කවුද සටහන් තැබුවේ ?

පි: උතුමාණෙනි පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා තමයි සටහන් යෙදිය යුත්තේ.

ප්‍ර: ඔබට ඒ ගැන දැනීමක් තියෙනවද ඔහුට සටහන් යෙදුවද නැද්ද කියා?

පි: මා දන්නේ නැහැ උතුමාණෙනි.

ප්‍ර: දැන් මෙම රාජකාරිය සිදු කරන අවස්ථාවේදී ඔබ පොළොන්නරුව ප්‍රදේශයට ගියාද?

පි: නෑ උතුමාණෙනි.

ප්‍ර: ඔබ ගියේ නැහැ?

පි: නැහැ උතුමාණෙනි.

ප්‍ර: මොහොමඩ් පයාස් කියලා තැනැත්තෙකු පිළිබඳව මේ 26 ඉදලා ජනවාරි 15 දක්වා කරපු රාජකාරි විමර්ශනයේදී හෙලි දරව් වුනාද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මේ මොහොඩ් පයාස් සිටින පදංචි ස්ථානය සොයා බැලීම සඳහා ඔබ ගියාද?

පි: නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඔබ ගියේ නැහැ? හරි මේ මොහොමඩ් පායාස් කියන පුද්ගලයාව ප්‍රධාන පොලිස් පරීක්ෂක අමර බන්දු ප්‍රමුඛ කණ්ඩායම් විසින් ප්‍රශ්න කරාද නැද්ද කියලා ඔබට දැනීමක් තියෙනවද?

පි: ගරු උතුමාණෙනි ඔහු ප්‍රශ්න කරා අත්අඩංගුවට අධිකරණයටත් ඉදිරිපත් කරලාත් තියෙනවා.

ප්‍ර: මෙම මොහොමඩ් පායස්ගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුවේ කණ්ඩායම ඔබ පොලිස් පරීක්ෂක මාරසිංහ සහ ඔබ ප්‍රමුඛ කණ්ඩායම කට උත්තරයක් ඒ කියන්නේ ප්‍රකාශයක් සටහන් කරන්නට යෙදුනද?

පි: ගරු උතුමාණෙනි මා නම් සටහන් කලේ නැහැ උතුමාණෙනි. නමුත් උතුමාණෙනි මේ සිද්ධියට සම්බන්ධ ප්‍රධාන සැකකරුවන් සම්බන්ධයෙන් සොයා බලන කොට ඔවුන් ඒ ප්‍රදේශයේ හිටියේ නැහැ උතුමාණෙනි ඒ අනුව උතුමාණෙනි අපි ගම්පොල, නුවර ,එ වගේ ප්‍රදේශවල සංචාරය කරලා සොයා බැලීම් කරා උතුමාණෙනි.පොල්වතුරේ තමයි උතුමාණෙනි මෙයාගේ පියා රැඳී සිටියේ එහේ ගිහින් හිටන් විමර්ශනය කරා උතුමාණෙනි ඊට පසුව සොයා ගන්න බැරි වුනාම අපේ නිලධාරින් කණ්ඩායමක් උතුමාණෙනි මේ සැකකරුවන් දෙදෙනා අවසන් වරට කාත් සමඟ ද සිටියේ කියන එක එක් එක් ඔවුන් ආශ්‍රය කරපු පුද්ගලයින්ගෙන් සොයා බැලීම් කරා උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ සාක්ෂි දෙන්න ඔබ කරපු විමර්ශනයන් සහ ඔබ සටහන් යොදා තිබෙන විමර්ශනයන් සම්බන්ධයෙන් ?

පි: ඔව් උතුමාණෙනි.

ප්‍ර: මා අහන ප්‍රශ්නවලට ?

පි එහෙමයි.

ප්‍ර: දැන් සාක්ෂිකරු දැන් මොහොමඩ් පායාස් කියන පුද්ගලයන්ගෙන් තමන් ප්‍රශ්න කරාද නැද්ද ?

පි: උතුමාණෙනි ප්‍රශ්න කිරීම සිදුවුනේ 2019.01.15 වෙනි දින රාත්‍රියේ උතුමාණෙනි ඔය පයාස් කියන පුද්ගලයාව පොළොන්නරුවේ පයාස් කියන පුද්ගලයා ඒ අංශයට රැගෙන විත් තිබුණා උතුමාණෙනි.

ප්‍ර: මොන අංශයටද

ප්‍ර: කෑගල්ල ප්‍රදේශයට?

පි: කොට්ඨාශ විමර්ශන අංශයට උතුමාණෙනි. එතනදි ස්වාමිනි පොලිස් නිලධාරීනුත් සමඟ ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම් කරන කොට මාරසිංහ මහතා ඇතුලු අපි කණ්ඩායමත් ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම් කරා උතුමාණෙනි ඒ ප්‍රශ්න කිරීම් සිදු කරන විට තමයි ඔය සාහිඩ් කියන පුද්ගලයා ඔහුට දුරකථනයට මැසේජ් එකක් දමා තියෙනවා කියලා අනාවරණය වීමක් වුනේ උතුමාණෙනි.

ප්‍ර: ඒ අනාවරණය වූ කරුණු අනුව තමන්ලා කිසියම් ප්‍රදේශයකට ගියාද?

පි: එහෙමයි උතුමාණෙනි. ඊට පහුවෙනිදාම ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුනා උතුමාණෙනි

ප්‍ර: එසේ ඔබලා ගියේ පුත්තලම ප්‍රදේශයට ගියා කිව්වොත් හරිද?

පි: ඒක නිවැරදියි උතුමාණෙනි

ප්‍ර: දැන් මේ පුත්තලම ප්‍රදේශයට ගිහිල්ලා පුත්තලම ප්‍රදේශයට ගියපු කණ්ඩායමට ඔබ ඇතුලත්ද?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර: එමෙ කණ්ඩායම මෙහෙයුවේ කවුද?

පි: පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා උතුමාණෙනි.

ප්‍ර: දැන් මේ පුත්තලම ප්‍රදේශයට විමර්ශනය සඳහා පුත්තලම ප්‍රදේශයට ගියපු කාරණය සම්බන්ධයෙන් ඔබ විමර්ශන සටහන් යෙදුවද?

පි: නෑ උතුමාණෙනි.

ප්‍ර: ඒ අනුව ඔබලා පුත්ලම ප්‍රදේශයට ගිය දිනය ඔබ අද ප්‍රකාශ කරන්නේ මතකයෙන්ද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ මතකයට අනුව කවද්ද ගියේ?

පි: 2019.01.16 වෙනිදා පාන්දර 6 ටපමණ තමයි උතුමාණෙනි කෑගල්ලෙන් පිටත් වුණේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එසේ ගිය ඔබ සමාවෙන්න ඔබ ඇතුලු ප්‍රධාන පොලිස් පරීක්ෂක මාරසිංහ ප්‍රමුඛ කණ්ඩායම වනාතවිල්ලුව ප්‍රදේශයේ පොල්වත්තකට ගියාද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එම පොල්වත්තට යාම සම්බන්ධයෙන් ඔබ සටහන් යෙදුවද?

පි: නෑ උතුමාණෙනි.

ප්‍ර: ඔබ යෙදුවේ නැහැ?

පි: නැහැ.

ප්‍ර: දැන් මේ පොල්වත්තට යන කාරණයත් අද ඔබ මතකයෙන්ද සාක්ෂි දෙන්නේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එම පොල්වත්තට යාම ඔබලා විසින් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් අත්අඩංගුවට ගන්නට යෙදුනද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: කීදෙනෙක්ද?

පි: 4 දෙනෙක් අත්අඩංගුවට ගත්තා උතුමාණෙනි

ප්‍ර: මෙම අත්අඩංගුවට ගැනීම ගැන ඔබ සටහන් යෙදුවද?

පි: නැහැ උතුමාණෙනි එහි අත්අඩංගුවට ගැනීම පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා සිදු කෙරේ ස්වාමිනි.

ප්‍ර: මෙම පුද්ගලයන් 4 දෙනා අත් අඩංගුවට ගත්තාම එම භූමියේ තිබිලා යම් යම් දේපල සමාවෙන්න එම එම ඉඩමේ තිබිලා පුපුරන ද්‍රව්‍ය සහ ගිනි අවි සොයා ගැනීමක් කරාද?

පි: එහෙමයි උතුමාණෙනි. පුපුරන ද්‍රව්‍ය සැකකර හැකි.

ප්‍ර: පුපුරන ද්‍රව්‍යය ලෙස සැකකර හැකි ද්‍රව්‍ය?

පි: ද්‍රව්‍ය හොයා ගත්තා උතුමාණෙනි

ප්‍ර: එම සොයා ගැනීම් වලට අදාව ඒ කියන්නේ සොයා ගත්තේ කොහොමද තොරතුරු ලැබුණේ කොහොමද එම සොයා ගැනීම සිදු කරපු ස්ථානය ගැන ඔබ සටහන් යෙදුවද?

පි: නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඔබ දැන් 2019.01.16 තමයි මේ ස්ථානයට ගියේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එදින රාත්‍රියේ කොහේද හිටියේ?

පි: එම ස්ථානයේමයි හිටියේ උතුමාණෙනි

ප්‍ර: මොන ස්ථානයේද?

පි: වනාත්විල්ලුව පොල්වත්තේ හිටියේ ස්වාමිනි

ප්‍ර: වනාතවිල්ලුව පොල්වත්තේ හිටියේ?

පි: වනාත විල්ලුව පොල්වත්තේ නිවසක හිටියේ

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ සටහන් යොදලා නැහැනේ මං කිව්වොත් ඒ වත්ත ලැක්ටොක්ස් වත්ත කියලා කිව්වොත් හරිද?

පි: නිවැරදියි උතුමාණෙනි

ප්‍ර: ඇයි සාක්ෂිකරු ඔබ සැකකරුවන් අත්අඩංගුවට ගත්තා පුපුර ද්‍රව්‍යයැයි සැකකරන පුළුවන් නඩු භාණ්ඩ අත්අඩංගුවට ගත්තා ගිනි අවි අත්අඩංගුවට ගත්තා මෙවැනි ඉතාමත් අපරාධයක සඳහා පසු සුදානමක් සිදුවී තිබෙන්නා වූ ලක්ෂන මේ දේවල් සොයා ගැනීම අත් අඩංගුවට ගෙන ඇයි ඔබ සටහන් යෙදුවේ නැත්තේ?

පි: ගරු උතුමාණෙනි එම ස්ථානයේදී උතුමාණෙනි පොලිස් පරීක්ෂක මාරසිංහ මහත්මයා කිව්වා එතැනදි අත්අඩංගුවට ගත් මුෆිස් ගේ ප්‍රකාශයක් සටහන් කරන්න කියලා එදා හවස උතුමාණෙනි.

ප්‍ර: එතනදි අත්අඩංගුවට ගත්ත මුෆිස් කියන පුද්ගලයෙක්ගෙන්?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එම තැනැත්තාගේ කටඋත්තරයක් සටහන් කරන්න කියලා කිව්වා?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර: කාටද කිව්වේ?

පි: මට කිව්වේ උතුමාණෙනි

ප්‍ර: ඒ අනුව ඔබ මූසීස්ගේ කට උත්තරය සඳහන් කරාද?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර: කවද්ද කීයටද ඔබ ඒ කටඋත්තරය සටහන් කරේ? ඔබට සටහන් බැලීමට අවශ්‍යද?

පි: එහෙමයි උතුමාණෙනි ගරු උතුමාණෙනි 2019.01.16 දින පැය 17.40 ට ප්‍රකාශය සටහන් කරලා තියෙන්නේ උතුමාණෙනි.

ප්‍ර: පැය 17. යි?

පි: 40 උතුමාණෙනි

ප්‍ර: ඒ කියන්නේ සවස 5.40 ට තමයි ඔබ ප්‍රකාශය සටහන් කරේ?

පි: ප්‍රකාශය සටහන් කරේ.

ප්‍ර: මේ මූෆිස්ගේ සම්පූර්ණ නම කුමක්ද?

පි: අබුහනිපා මොහොමඩ් මූසීස්

ප්‍ර: දැන් ඔබ ප්‍රකාශය සටහන් කරන කොට මූසීස්ගේ ඔහුව අත්අඩංගුවට අරගෙන තිබ්බේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මූසීස් සමඟ අත්අඩංගුවට ගත් අනෙක් පුද්ගලයන් තුන්දෙනාගේ නම් ඔබට මේ අවස්ථාවේදී කියන්න පුළුවන්ද?

පි: පුළුවන් උතුමාණෙනි.

ප්‍ර: මොනවද නම්?

පි: එක් පුද්ගලයෙක් හමාස් .

ප්‍ර: හමාස්?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව් අනිත් පුද්ගලයන් දෙදෙනා නවීස් නප්‍රීඩ්

ප්‍ර: නැවත කියන්න?

පි: නවිඩ් සහ නෆිඩ්

ප්‍ර: නවිඩ් සහ නිෆිඩ් ?

පි: නිවිඩ් සහ නෆිඩ්.

ප්‍ර: නවිඩුයි නපිඩුයි?

පි: ඔව්.

ප්‍ර: නප්‍රිඩ්?

පි: නප්‍රිඩ්.

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ මෙම මූපිස් කියන පුද්ගලයාගේ ප්‍රකාශය සටහන් කිරීමක් කරා කිව්වානේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර ඒ සටහන් කිරීම සිදු කරන අවස්ථාවේදී මෙම ලැකේටෝස් වත්ත තුල තිබුණු නිවසක් ඔබලා විසින් පරීක්ෂා කිරීමට ලක් කරාද නැද්ද කියලා ඔබට මතකයක් තියෙනවද ?

පි: පරීක්ෂාවට ලක් කරා උතුමාණෙනි

ප්‍ර: එහිදි ඩෙටර්නේටර්ස් සොයා ගැනීමක් සිදු කරාද නැද්ද කියලා ඔබට මතකයක් තියෙනවද?

පි: මතකයි ස්වාමිනි ඩෙටර්නේටර්ස් සොයා ගැනීමක් සිදු කරා ස්වාමිනි.

ප්‍ර: මෙම නිවසේ තිබිලා ඇදුම් පැළදුම් සොයා ගත්තද නැද්ද කියන්න ඔබට මතකයක් තියෙනවද?

පි: ඇදුම් පැළදුම් සොයා ගත්තා උතුමාණෙනි.

ප්‍ර: දැන් මේ ඇදුම් පැළදුම් ඔබලා විසින් ඔබලාගේ භාරයට ගත් සැකකරුවන්ගේද නැද්ද කියලා ඔබලා පරීක්ෂා කරාද නැද්ද කියන්න ඔබට මතකයක් තියෙනවද?

පි: පරීක්ෂා කරා උතුමාණෙනි

ප්‍ර: දැන් මේ ඇදුම් ඔතන හිටපු ඔබලා අත්අඩංගුවට ගත් සැකකරුවන්ට අන්දලා බැලුවද කාට හරී?

පි: එහෙමයි උතුමාණෙනි. ඒ ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීමේදී ඇහුවාම ඒ ඔවුන්ගේ ඇඳුම් කිව්වා උතුමාණෙනි ඒ අනවු අපි ඔවුන්ට කිව්වා එහෙම නම් ඇඳලා පෙන්වන්න කියලා

ප්‍ර: මොකක්ද එහිදි අනාවරණය වුණේ?

පි: එහිදි අනාවරණය වුනේ අත්අඩංගුවට ගත් පුද්ගලයින් සාමන්‍යයෙන් උසින් අඩුයි උතුමාණෙනි .

ප්‍ර: මොකක්ද අත්අඩංගුවට ගත් පුද්ගලයන් ?

පි: උසින් අඩුයි උතුමාණෙනි.

ප්‍ර: උසින් අඩුයි?

Prosecution Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: උසින් අඩුයි කලිසන් උතුමාණෙනි උසින් වැඩි පුද්ගලයින්ගේ එවා බවට තමයි උතමාණෙනි පෙනී ගියේ.

ප්‍ර: ඔබ උසින් අඩු පුද්ගලියන් ගැන කියනවානේ? ඒ කියන්නේ මොකක්ද ඔබ අදහස් කරන්නේ?

පි: එතනින් අදහස් කරේ උතුමාණෙනි තිබුණ ඇදුම් උතුමාණෙනි මේ එම පුද්ගලයින්ගෙ නෙමේ උතුමාණෙනි ඊට වඩා උසින් වැඩි පුද්ගලයින්ගේ උතුමාණෙනි.

ප්‍ර: උසින් වැඩි පුද්ගලයින්ගේ? එතකොට කමිස එහෙම තිබ්බද ?

පි: එහෙමයි උතුමාණෙනි කමිස , ටී ෂර්ට් වගයක් තිබුණා උතුමාණෙනි

ප්‍ර: ඒවා ගැන මොනවද ඔබලාගේ නිරීක්ෂණය?

පි: ඒවා නිරීක්ෂණය කිරීම උතුමාණෙනි ඔවුන්ගේ නොවන බවට තමයි පෙනී ගියේ උතුමාණෙනි.

ප්‍ර: ඇයි?

පි: එයට හේතුව උතුමාණෙනි එවා උතුමාණෙනි ඇන්දාම ටීෂර්ට් වුනත් ඇන්දාම ගොඩාක් පල්ලෙහාට තියෙනවා උතුමාණෙනි.

ප්‍ර: පල්ලෙහාට ඒ කියන්නේ කොට් එක්ක ඇන්දහමත් පල්ලෙහාට තියෙනවා මොකක්ද ඔබ කියන්නේ?

පි: ඒක සාමාන්‍යයෙන් නොවන ආකාරයට තියෙන්නේ උතුමාණෙනි.

ප්‍ර: ඒ කියන්නේ උසින් අඩු පුද්ගලයන් ඇන්දාම ලොකු වගේද?

පි: ඔව් ලොකු වගේ උතුමාණෙනි.

ප්‍ර: දැන් මෙන්න මෙම කරුණු ඔබ මුෆීස්ගේ කටඋත්තරේ ලියන කොට විමසා සිටියද ?

පි: ඒ වෙලාවේ මේ ඒවා සම්බන්ධයෙනුත් විමර්ශන කරලා සටහන් කරලා නැහැ උතුමාණෙනි නමුත් එතැනදී ඔහු විසින් පෙන්වා සිටින භාණ්ඩ සම්බන්ධයෙන් තමයි උතුමාණෙනි මගේ ප්‍රකාශයේත් ඇතුලත් කරේ උතුමාණෙනි.

ප්‍ර: මොනවද ඔහු විසින් පෙන්වා සිටි භාණ්ඩ?

පි: ගරු උතුමාණෙනි මිදුලේ වළලා තිබුණා බැරල් වගයක් ඒක පෙන්වන්න පුළුවන් කිව්වා උතුමාණෙනි. ඊට අමතරව කලු පාට කෑන් වගයක් ගෙයි පැත්තේ දාලා තිබුණා ඒ ටික පෙන්වා සිටියා උතුමාණෙනි එහෙම දේවල් තමයි ඇතුලත් කරේ.

ප්‍ර: හරි දැන් එම ඒ අනුව දැන් ඒ බැරල් හොයාගත්තද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මොනවද ඒවා ඇතුලේ තිබ්බේ කියලා ඔබට කීමට හැකියාවක් තියෙනවද?

පි: සුදු පාට කුඩු වගයක් තිබුණේ උතුමාණෙනි.

ප්‍ර: සුදු කුඩු කිව්වාම හෙරොයින් වෙන්නත් පුළුවන්නේ ?

පි නෑ උතුමාණෙනි කැට සීනි කැට වගේ යූරියා කැට වගේ

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ලුණු කැටද?

පි: යූරියා කැට වගේ .

ප්‍ර: ආ යූරියා කැට එතකොට අනිත බැරල් වගයක් හොයා ගත්තානේ ?

පි: කෑන් වගයක් උතුමාණෙනි.

ප්‍ර: සමාවෙන්න කලු පාට කෑන්?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එවායේ මොනවද තිබ්බේ?

පි: ඒවායේ තිබ්බේ ඇසිඩ් එකක් උතුමාණෙනි

ප්‍ර: මේ ඔබ දන්නවද ඒ මොනවද තිබ්බ ඇසිඩ් කියලා?

පි: නයිට්‍රික් ඇසිඩ් උතුමාණෙනි

ප්‍ර: කොහොමද කියන්නේ? නයිට්‍රික් ඇසිඩ් කියලා?

පි: එකේ මොකක් හරි කෑන් එකේ .

ප්‍ර: ගහලා තිබ්බද?

පි: පොඩි කොලයක් අලවලා තිබ්බා උතුමාණෙනි.

ප්‍ර: H2NO3 කියලාද ගහලා තිබ්බේ?

පි: මට මතක විදියට නයිට්‍රික් ඇසිඩ් කියලා තමයි ගහලා තිබ්බේ උතුමාණෙනි.

ප්‍ර: මේ මූසිප්ගෙන් ඔබ 2019.01.16 පැය 17. 40 ට ලියපු වාර්තා කරපු කටඋත්තරය ඒ දීර්ඝ ප්‍රකාශය නැත්නම් ?

පි: කෙටි ප්‍රකාශයක් උතුමාණෙනි

ප්‍ර: කෙටි ප්‍රකාශයක් හරි දැන් ඔබට මතකයක් තියෙනවද ඔබ සටහන් යෙදුවද මෙම ලැක්ටෝස් වත්ත තුල මොනවද තිබ්බේ කියලා

පි: නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඔබට මතකයක් තියෙනවද මෙම ලැක්ටෝස් වත්තේ පොල් ගස් තිබ්බද නැත්නම් මාරගස් තිබ්බද නැත්නම් රට ඉදි ගස් තිබ්බද මොනවද තිබ්බේ කියලා මතකයක් තිබ්බද?

පි: මතකයක් තියෙනවා උතුමාණෙනි

ප්‍ර: මොනවද තිබ්බේ?

පි: ඒක පොල්වත්තක් ඒකේ පොල් තිබුණා ඒ වගේම උතුමාණෙනි පොල් වගේම විශාල කැලයකුත් තිබුණා පොල් ගස් අතර

ප්‍ර: පොල් ගස් අතර ද නැත්නම් කැලේ තිබ්බ පොල්ගස්ද මොකක්ද මට තෙරේන්නේ නැහැ?

පි: පොල් ගස් තිබුණේ වත්තේ. ඒ එක්කම උතුමාණෙනි ඒවා පොල්වත්ත සුද්ධ කරලා අරෙහේ මෙහේ නැහැ කැලෙත් තිබ්බා.

ප්‍ර: වල් බිහි වූ පොල් වත්තක් ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එතකොට මේ පොල්වත්ත මායිම් වුණේ කොහාටද?

FAIR COMMENT BY JEZEEM

පි: මේක විශාල පොල්වත්තක් උතුමාණෙනි මේ සම්බන්ධයෙන් මට කිව්වා විශාල පොල්වත්තක් මේ ඊට පස්සේ කජු වත්තක් තියෙනවා උතුමාණෙනි ඒ කජුවත්ත පැත්තෙන් තමයි ඇතුලුවන ගේට්ටුව තිබ්බේ උතුමාණෙනි.

ප්‍ර: ඔබ දැන් මතකයෙන් කියන්නේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ආ.....

පි: මායිම් බලන්න විදියක් නැහැ උතුමාණෙනි විශාල වත්තක් වුනාට කැලෑ උතුමාණෙනි

ප්‍ර: දැන් කලපුවක් එහෙම තිබ්බාද ඒ ආශ්‍රිතව?

පි: පිටිපස්සට වෙන්න කලපුවක් තිබ්බා උතුමාණෙනි

ප්‍ර: මොකේ පිටිපස්සේද?

පි: ඒ පොල් වත්ත පිටිපස්සේ උතුමාණෙනි.

ප්‍ර: ඒ වත්ත පිටිපස්සේ කලපුවක් තිබ්බා?

පි එහෙමයි උතුමාණෙනි.

ප්‍ර; දැන් මේ මෙච්චර විශාල පොල්වත්තේ ගොඩනැගිලි තිබුණද?

පි: එම අපි ගිය ගොඩනැගිල්ල සහ ඊට එයා උතුමාණෙනි පොඩි නිවසක් තිබුණා උතුමාණෙනි

ප්‍ර; මෙම ගොඩනැගිල්ල ඒ කියන්නේ පළවෙනි එක වශයෙන් ඔබ හැදින්වුයේ ?

පි; අපි මේ භාණ්ඩ සොයා ගත් නිවස ස්වාමිනි.

ප්‍ර: එතකොට අනික් නිවස ?

පි: එතන ඉදලා ටික දුරකින් තව නිවසක් තිබෙනවා උතුමාණෙනි කුකුල් පාම් එකක්

ප්‍ර; කුකුල් ෆාම් එක ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: කාගේද කුකුල් ෆාම් එක ?

පි: මූෂීස්ගේ උතුමාණෙනි.

ප්‍ර: එතකොට මේ කුකුල් ෆාම් එක ගාව තිබ්බ නිවස පරීක්ෂා කරාද ?

පි: මායිම ස්ථානයට ගියේ උතුමාණෙනි 17 වෙනිදා වගේ ඊට පසු වෙනිදා වගේ උතුමාණෙනි.

ප්‍ර; 16 වෙනිදා ඔබ ගියේ නැහැ?

පි: නැහැ උතුමාණෙනි.

ප්‍ර: 2016 වෙනිදා ඔබ වෙනත් නිලධාරියකු හෝ ගියාද නැද්ද කිවන්න ඔබ සටහන් ඇතුලත් කරා තියෙනවද?

පි: නැහැ උතුමාණෙනි.

දැන් වේලාව: පෙ.ව 11.15

මෙතැන් සිට: ඉන්ද්‍රානි මහත්මිය

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ චන්දිමා මෙය
දැන් වේලාව : පෙ.ව. 11.15 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : ඔබ ඇයි මේ 2019.01.17 මේ කුකුල් ෆාම් ගෙදරට, ඒ කියන්නේ කුකුල් ෆාම් එක ගාව ගෙදරට ගියේ?

පි : ගරු උතුමාණෙනි එතන 17 වෙනිදා උදේ රස පරීක්ෂක පැමිණියා. රස පරීක්ෂක යන අවස්ථාවේදී මාත් ඔහු සමඟ ඒ නිවසට ගියා උතුමාණෙනි.

ප්‍ර : ඇයි ඒ නිවසට ගියේ රස පරීක්ෂක?

පි : රස පරීක්ෂක එම නිවසටත් ගිහිල්ලා ඊට මෙහා පැත්තේ මඩුවේ යූරියා වගයක් දාලා තිබ්බා. ඒවා පරීක්ෂා කළා උතුමාණෙනි.

ප්‍ර : එහා පැත්තේ මඩුවේ යූරියා වගයක් දාලා ...?

පි : ඔව්. ඒ කුකුල් ෆාම් එක තියෙන නිවස අසළ මඩුවක් තිබ්බා. ඒකේ යූරියා මිටි නමයක්ද කොහේද තිබ්බා. ඒක පරීක්ෂා කළා උතුමාණෙනි.

ප්‍ර : ඊට අමතරව මෙම කුකුල් ෆාම් එක තියෙන ගෙදරින් ඔබ විසින් යම් නඩු භාණ්ඩයක් හෝ භාණ්ඩ හොයා ගත්තාද?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : වෙනත් නිලධාරීවරයෙකු හෝ වරුන් සොයා ගත්තාද කියලා ඔබට දැනීමක් තියෙනවද?

පි : දැනීමක් නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් මෙම නිවස්න දෙකෙන් පරීක්ෂා කළා කියලා ඔබ කියා සිටියා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් මේ ලැක්ටෝස් වත්තට ගිහිල්ලා ඔබ ඇතුළත්ව සිටි ඒ ප්‍රධාන පොලිස් පරීක්ෂක මාරසිංහගේ ප්‍රධානත්වයෙන් තිබුණු ඒ කණ්ඩායම සොයා ගත්ත ගිණි අවි හෝ පුපුරණ ද්‍රව්‍ය හෝ වෙනයම් අපරාධයකට යොදා ගතහැකි අවි ආයුධ හෝ ද්‍රව්‍ය ඔබ දැක්කද?

පි : 17 වෙනිදා උදේ මම දැක්කා උතුමාණෙනි.

ප්‍ර : ආ?

පි : 17 වෙනිදා උදේ මේ සියළුම භාණ්ඩ ඉස්තෝප්පුවට ගත්තා නිවසේ.

ප්‍ර : මොන නිවසේද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එම නිවසේම උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔබ කියා සිටියා නිවෙස් දෙකක් තියෙනවා කියලා?

පි : උතුමාණෙනි මේ භාණ්ඩ තිබුණු නිවසේ.

ප්‍ර : මොනවද ඔබ දුටුවේ කියලා නිවැරදි මතකයක් තියෙනවා නම් කියන්න. නැත්නම් කියන්න එපා?

පි : සාමාන්‍ය මතකයක් තියෙනවා උතුමාණෙනි.

ප්‍ර : සාමාන්‍ය මතකයක්. එහෙනම් ගිණි අවි තිබ්බද?

පි : මෙරට නිෂ්පාදිත තුවක්කුවක් තිබුණා උතුමාණෙනි. තව පතොරම් වගයක් තිබුණා. ඩෙටනේටරයක් තිබුණා. ඔය බැරල් ටික තිබුණා. කෑන් තිබුණා උතුමාණෙනි.

ප්‍ර : ඒ කියන්නේ මේ සොයා ගත්ත භාණ්ඩ ගැන ඔබ කියන්නේ?

පි : ඔව්. එහෙමයි උතුමාණෙනි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : දැන් ඔබ මෙච්චර වෙලා විස්තර කෙරුවේ ලැක්ටොස් වත්තට ඇතුල් වෙලා ඔබලා සිටපු නිවසක් ගැණනේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ නිවස කොච්චර ලොකුද කියලා ඔබට මතකයක් තියෙනවද?

පි : මතකයක් තියෙනවා උතුමාණෙනි.

ප්‍ර : පැහැදිලි කරන්න කොච්චර ලොකුද කියලා?

පි : ගරු උතුමාණෙනි, ඇතුල් වෙන තැනම පොඩි ඉස්තෝප්පුවක් තියෙනවා. ඒ ඉස්තෝප්පුවෙන් ඇතුල් වුණහම, දොරෙන් ඇතුල් වුණහම පොඩි මැද සාලයක් තියෙනවා. මේ පැත්තෙන් කුස්සිය තියෙනවා. මේ පැත්තෙන් පොඩි කාමරයක් තියෙනවා උතුමාණෙනි.

ප්‍ර : අර ඉස්සරලා කියපු ඉස්තෝප්පුව විවෘතව ...?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඇතුළේ තියෙන්නේ එතකොට කාමර දෙකයි?

පි : කාමර එකයි, මේ පැත්තෙන් කුස්සියයි, මැද සාලේ කෑල්ලක් තියෙනවා පොඩියට උතුමාණෙනි.

ප්‍ර : එතකොට ඒක කුඩා ප්‍රමාණයක්නේ?

පි : කුඩා ප්‍රමාණයක් උතුමාණෙනි.

ප්‍ර : එතකොට 16 වෙනිදා මුළු රාත්‍රියම ඔබ කණ්ඩායම ඔතන, ඔය ස්ථානයේනේ හිටියේ?

පි : එහෙමයි උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අවස්ථාවේදී පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් රාත්‍රියේ පැමිණියා නේද?

පි : හවස ආවා උතුමාණෙනි.

ප්‍ර : ඔවුන් ඊට පස්සේ ඔබ හිටපු, ඔබ දැන් විස්තර කරපු නිවස පරීක්ෂා කෙරුවද?

පි : එම නිවසත් බැලුවා. ඒ අවටත් ඔවුන් මම දැක්කා ටෝච් ගගහා බලනවා උතුමාණෙනි.

ප්‍ර : එතකොට අර එහා පැත්තේ නිවසටත් ගියා නේද?

පි : මම දැක්කේ නැහැ. යන්න ඇති උතුමාණෙනි. ඔවුන් හැමතැනම ඇවිද්දා උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔය ඔක්කොම සිදු වනවිට ඔබ ගේ ඇතුළෙද හිටියේ එළියෙද හිටියේ?

පි : එළියේ හිටියේ. එතනට, ඒ ගෙදරට ගියාද කියන එක මම හරියටම දුටුවේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : ඒ කියන්නේ එළියට ගිහිල්ලා ඔය ටෝච් ගහලා එළියට ගිහිල්ලා ආවම පස්සේ ඔවුන් යම් අවි ආයුධ රැගෙන ආවද?

පි : එහෙම මම දැක්කේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : ඇවිල්ලා ඔබට යමක් කිව්වේ නැද්ද?

පි : නැහැ. මට මොකුත් කිව්වේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔබ මීට ඉස්සරලා කිව්වා අර කුකුල් ෆාම් එක ගාව තිබ්බ මඩුවෙන් මොනවද හොයා ගත්තේ?

පි : එතන උතුමාණෙනි අපි 17 වෙනිදා දවල් යනකොට එතන යූරියා මිටි වගයක් තිබුණා උතුමාණෙනි.

ප්‍ර : එතකොට ඔබ හිටපු ප්‍රධාන නිවස ආසන්නයෙනුත් යම් යූරියා හොයා ගැනීමක් සිදු වුණාද?

පි : ඒ යූරියායි කියන්නේ උතුමාණෙනි බැරල්වල තිබුණ ඒවා.

ප්‍ර : ඔව්. ඒකයි මම අහන්නේ?

පි : එහෙමයි උතුමාණෙනි. ඒ බැරල් තුනක දාලා වළලලා තිබුණා යූරියා වගේ දෙයක් උතුමාණෙනි. හරියටම කියන්න බැහැ මොකද්ද කියන එක.

ප්‍ර : හරි. එතකොට කුකුල් ෆාම් එක ගාව මඩුවෙන් හොයා ගත්තේ යූරියානේ?

පි : ඒ යූරියා බෑග් උතුමාණෙනි. ඒවා ගස්වලට දානවා පොහොර බෑග් එහෙමයි උතුමාණෙනි.

****

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා :

ප්‍ර : දැන් මෙම 2019.01.16 ඔබලා මේ ලැක්ටොස් වත්තේ සිටිනවිට වෙනත් අංශවල නිලධාරීන් ඒ වත්තට ආවද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කවුද ආවේ කියලා ඔබට නිවැරදිව කියන්න පුළුවන්ද?

පි : මතකයෙන් කියන්න පුළුවන් උතුමාණෙනි. මුලින්ම ආවේ විශේෂ කාර්ය බලකාය. ඉන්පසු එම ස්ථානයට වනාතවිල්ලුව පොලිස් නිලධාරීන් පැමිණියා. නියෝජ්‍ය පොලිස්පතිතුමාත් පැමිණියා. බුද්ධි අංශ නිලධාරීනුත් පැමිණියා උතුමාණෙනි.

ප්‍ර : හරි. දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර මෙම වනාතවිල්ලුව මේ ලැක්ටෝස් වත්තට ආවද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ කවද්ද ආවේ?

පි : 2019.01.17 වෙනි දින උතුමාණෙනි.

ප්‍ර : නැවත කියන්න කරුණාකරලා?

පි : 2019.01.17 අපි ගියදාට පහුවෙනිදා. සහකාර පොලිස් අධිකාරීතුමාත් ඊට පෙර උදේ ආවා එදිනම උතුමාණෙනි.

ප්‍ර : 2019.01.17 උදේ සහකාර පොලිස් අධිකාරිවරයා ආවා?

පි : විකුමසේකර මහත්මයත් ආවා.

ප්‍ර : සහකාර පොලිස් අධිකාරී වික්‍රමසේකර?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඊට පස්සේ තමයි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර මේ ස්ථානයට ආවේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් සාක්ෂිකරු ඔබලා මෙම ලැක්ටොස් වත්තේදී සිදු කරපු ඒ සොයා ගැනීම් සහ අත් අඩංගුවට ගැනීම්වලදී විමර්ශන නිලධාරීවරයෙකු වශයෙන් ඔබට වැටහුණාද මෙම ස්ථානයේ ඔබලා අත් අඩංගුවට ගත් පුද්ගලයන්ට අමතරව වෙනත් පුද්ගලයන් ගැවසී තිබුණාද නැද්ද කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මොකද්ද?

පි : ඒ සම්බන්ධයෙන් සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම් කළා මේ ස්ථානයේදීම උතුමාණෙනි.

ප්‍ර : ඔව්. එය සටහන් කර ගත්තාද?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සටහන් කළේ නැහැ උතුමාණෙනි. ප්‍රශ්න කිරීම් කළා උතුමාණෙනි.

ප්‍ර : එසේ ප්‍රශ්න කිරීම්වලදී මොකද්ද අනාවරණය වුණේ?

පි : එම ස්ථානයට බාහිර පුද්ගලයින් පැමිණි බවට තොරතුරු ලැබුණා උතුමාණෙනි.

ප්‍ර : ඒ පැමිණි පුද්ගලයන් අතර මාවනැල්ල බුදු පිළිමවලට හානි කිරීම සම්බන්ධයෙන් වන සැකකරුවන් වන සාහිඩ් සහ සාදික් සිටියාද නැද්ද කියලා අනාවරණය වුණාද?

පි : සාහිඩ් හිටිය බව අනාවරණය වුණා උතුමාණෙනි.

ප්‍ර : සාහිඩ්?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔවුන් මෙම ලැක්ටෝස් වත්තට පැමිණිලා තිබ්බේ කුමන ආකාරයෙන්ද? ඒ කියන්නේ වාහනයකින්ද කොයි ආකාරයටද ආවේ කියලා කරුණු අනාවරණය වුණාද විමර්ශන කණ්ඩායමට?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔවුන් ඇවිල්ලා තිබ්බේ කොහොමද?

පි : ගරු උතුමාණෙනි සමහර අය බස් එකෙන් ඇවිල්ලා මුෆිස් එම ස්ථානයට බයිසිකලයෙන් එක්කන් ඇවිල්ලා තිබුණා උතුමාණෙනි. සමහර අය සුදු පාට වෑන් රථයකින් ඇවිල්ලා තිබ්බා උතුමාණෙනි.

ජ්ර : සුදු පාට වෑන් රථයකින් ඇවිල්ලා තිබ්බා. දැන් ඔබලාගේ කණ්ඩායම මෙම වෑන් රථය සම්බන්ධයෙන් විමර්ශනය කළාද?

පි : සැකකරුවන් රැගෙන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණියට පස්සේ උතුමාණෙනි...,

ප්‍ර : මම අහන ප්‍රශ්නයට උත්තර දෙන්න මහත්මයා. ඔබලා මෙම ස්ථානයට පැමිණි මෙම වෑන් රථය ගැන ඔබලා විමර්ශනය කළාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මේ වෑන් රථය සම්බන්ධයෙන් වන විමර්ශනය කළේ ඔබද එහෙම නැත්නම් වෙනත් නිලධාරීවරුන්ද?

පි : ගරු උතුමාණෙනි මෙම සිද්ධියට සම්බන්ධ සැකකරුවන්ගෙන් ප්‍රශ්න කිරීම්වලදී මෙම වෑන් රථය සම්බන්ධයෙන් විමසීම් කරනකොට මෙම වෑන් රථයේ අංකය දන්නේ නැති බව කියා සිටියා. නමුත් දීර්ඝ වශයෙන් ප්‍රශ්න කරනකොට මුෆිස් සැකකරු ප්‍රකාශ කර සිටියා මෙම වෑන් රථයෙන් කල්පිටිය නාවික හමුදා කඳවුරට එක් දිනක් ගිය බවත්, ඒ ගිය අවස්ථාවේදී එම වෑන්

FAIR COMMENT BY JEZEEM

රථයේ අංකය සහ ඔහුගේ නම එම නාවික හමුදාවේ නිලධාරීන් විසින් සටහන් කරගත් බව උතුමාණෙනි.

ප්‍ර : පොඩ්ඩක් ඉන්න. දැන් මෙම මුෆීස් කිව්වේ ඔවුන් නාවික හමුදා කඳවුරට ගියාද ඒ කියන්නේ මේ අපරාධය කරන්න ඉස්සරලා නැත්නම් වෙනත් තැනකට ගියා කියලද?

පි : උතුමාණෙනි ඔවුන් නිවසක් කුලියට බලන්න තමයි ගිහිල්ලා තියෙන්නේ.

ප්‍ර : කොහේද? කල්පිටියටද?

පි : කල්පිටියේ ඒත්තාල කියන ප්‍රදේශයට.

ප්‍ර : මේ නාවික හමුදා කඳවුර කොහේද පිහිටලා තියෙන්නේ?

පි : එතන උතුමාණෙනි කල්පිටිය කොටුවේ උතුමාණෙනි.

ප්‍ර : කල්පිටිය කොටුව?

පි : ඔව්.

ප්‍ර : මේ කල්පිටිය කොටුවට මේ මුෆීස් ගිහිල්ලා තිබ්බද මේ වැන් රථයෙන්?

පි : ඒත්තාලයට ගිහිල්ලා, නිවස පරීක්ෂා...,

ප්‍ර : දැන් තමා සාක්ෂි දෙන්නේ සැකකරුවන්ගෙන් ලැබුණු තොරතුරු මතනේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ තොරතුරු ඔබ සාක්ෂි නීතියට අනුව එය අධිකරණයකදී භාවිතා කරන්න බැහැ කියන්න ඔබට දැනීමක් තියෙනවද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මෙම කොමිෂන් සභාවේදී ඔබට ඒ තොරතුරු හෙළි කිරීමට හැකියාව තියෙනවා. නමුත් මා ප්‍රශ්නය අසනවිට ඒ ප්‍රශ්නයට උත්තරයක් ලබා දුන්නොත් ඔබට පහසුයි ඒ තොරතුරු ඉදිරිපත් කරන්න?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔබලා මේ මූෆීස්, හමාස්ද මූෆිස්ද කට උත්තරය ලිව්වේ?

පි : මුෆීස්.

ප්‍ර : මුෆීස්?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කට උත්තරය ලියනකොට අනාවරණය වුණා ඔවුන් කල්පිටියේ ගියහම නාවික හමුදාවෙන් මේ වාහනයේ අංකය සටහන් කර ගත්ත බව?

පි : එහෙමයි උතුමාණෙනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නමුත් මේ මුෆීස්ට එම වෑන් රථයේ අංකය මතකයේ තිබ්බෙ නැහැ?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : මුෆීස් කිව්වද ඒ කවුද වෑන් රථයේ රියදුරු වශයෙන් හිටියේ කියලා?

පි : එහෙම නමක් කිව්වේ නැහැ උතුමාණෙනි මතකයේ හැටියට. ඔහු ගියා කියලා තමයි කිව්වේ තව පුද්ගලයෙකුත් එක්ක.

ප්‍ර : ඒ අනුව ඔබ හෝ කිසියම් හෝ නිලධාරියෙකු මේ කල්පිටිය නාවික හමුදා කඳවුරට ගියාද මේ වෑන් රථය ගැන අංකය සොයා ගන්න?

පි : මා ගියා උතුමාණෙනි ඒ නිලධාරී කණ්ඩායමත් එක්ක.

ප්‍ර : ඒ ගියහම ඒ අංකය ඔබලාට ලබා ගන්න හැකි වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් ඔබ සටහන් යෙදුවද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එහෙනම් කියන්න මොකද්ද එම වෑන් රථයේ අංකය?

පි : PA-2855.

ප්‍ර : කවද්ද ඔබ මේ කල්පිටියට ගිහිල්ලා මේ වෑන් රථයේ අංකය සොයා ගත්තේ?

පි : 2019.02.15 වෙනි දින ගියේ උතුමාණෙනි.

ප්‍ර : ඒ ගියේ වෑන් රථයේ අංකය ලබා ගැනීමට?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් මේ වෑන් රථය කුමන වර්ගයට අයත් වෑන් රථයක්ද?

පි : සුදු පාට වැනට් වර්ගයේ රථයක්.

ප්‍ර : PA-2855 කියන්නේ වැනට් වර්ගයේ වාහනයක්?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : 2019 ජනවාරී මාසේ 16 වෙනිදා ඔබ හෝ වෙනත් නිලධාරීන් ඩොල්ෆින් කියන වර්ගයේ වෑන් රථයක් සම්බන්ධව විමර්ශනය කළාද නැද්ද?

පි : ඩොල්ෆින් කියන වෑන් රථයක් සම්බන්ධව විමර්ශනය කළා උතුමාණෙනි.

ප්‍ර : එම විමර්ශනය ඔබද කළේ නැත්නම් වෙනත් නිලධාරියෙක්ද?

පි : මමයි කළේ උතුමාණෙනි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් ඔබ සටහන් යෙදුවද?

පි : එහෙමයි උතුමාණෙනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මෙම වෑන් රථය සොයා ගැනීම සඳහා, මෙම ඩොල්ෆින් වර්ගයේ වෑන් රථය සොයා ගැනීම සඳහා ඔබලා මාවනැල්ල ප්‍රදේශයට ගිහිල්ලා තියෙනවද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ මා පෙර සඳහන් කළ 2019.01.26 ද?

පි : ගරු උතුමාණෙනි 01.26 දින ගියේ. 2019.01.26 වන දින.

ප්‍ර : 2019 ජනවාරී 26 වන දින?

පි : එහෙමයි ගරු උතුමාණෙනි.

ප්‍ර : ඔබ මෙම වෑන් රථය සොයා ගැනීමට මාවනැල්ලටනේ ගියා කිව්වේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එහිදී ඔබ සාදික් සහ සාහිඩ් ගැන සොයා බැලුවද?

පි : එහෙමයි උතුමාණෙනි. තොරතුරක් ලැබිලා තිබුණා සාදික් කියන නැනැත්තා ඔහුගේ බිරිඳගේ නිවසට පැමිණිලා තියෙනවා කියලා උතුමාණෙනි තොරතුරක් ලැබිලා තිබුණා. එම තොරතුරු පරීක්ෂා කරන්න තමයි ගියේ උතුමාණෙනි.

ප්‍ර : එම තොරතුරු පරීක්ෂා කරන්න තමයි ගියේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ අනුව කොහාටද ඔවුන් පැමිණිලා හිටියා කියලා කිව්වේ?

පි : ඔහුගේ බිරිඳගේ නිවසට උතුමාණෙනි.

ප්‍ර : බිරිඳගේ නිවසට ගියාද?

පි : ගියා උතුමාණෙනි.

ප්‍ර : සාදික්ගේ බිරිඳගේ නිවසට ගියාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : සාදික් හෝ සාදික්ගේ බිරිඳ මේ නිවසේ හිටියද?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : කවුද හිටියේ?

පි : බිරිඳගේ පියා සහ මව හිටියේ උතුමාණෙනි.

ප්‍ර : ඔබ ප්‍රශ්න කර බැලුවද සාදික් කෝ, ඔහුගේ බිරිඳ කෝ කියලා බිරිඳගේ පියාගෙන්?

පි : එහෙමයි උතුමාණෙනි. ඔහුගෙන් ප්‍රශ්න කළා. ප්‍රශ්න කරලා ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයකුත් සටහන් කළා උතුමාණෙනි මා සමඟ ගිය පොලිස් කොස්තාපල් දිසානායක උතුමාණෙනි.

ප්‍ර : ඒ කියන්නේ මොකද්ද එහිදී අනාවරණය වුණේ?

පි : එහිදී අනාවරණය වුණේ 2018.02.26 න් පසු කිසිම තොරතුරක් නැහැ කියලා තමයි ඔවුන් ...,

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නැවත කියන්න දිනය?

පි : 2018.02.26 න් පසු...,

ප්‍ර : 02.26 ද? 12.26 ද?

පි : 12.26 උතුමාණෙනි. සමාවන්න. 2018.12.26 දිනයෙන් පසු කිසිම තොරතුරක් නැති බවට තමයි අනාවරණය වුණේ?

ප්‍ර : එම සාදික්කේ බිරිඳගේ නිවස ඔබලා පරීක්ෂා කළාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එහිදී මේ සාදික් හෝ බිරිඳ මෙම නිවසේ සිටින බවට කිසියම් තොරතුරක් අනාවරණය වුණාද ඔබලට?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : ඔබ ඒ ගැන සටහන් යෙදුවද?

පි : සටහන් යොදලා තියෙන්නේ උතුමාණෙනි.

ප්‍ර : නිවස පරීක්ෂා කිරීම ගැනත්?

පි : නිවස පරීක්ෂා කිරීම ගැන නෙමෙයි උතුමාණෙනි එම ස්ථානයට ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් පියාගෙන් ප්‍රශ්න කරලා ප්‍රකාශ සටහන් කිරීම සම්බන්ධයෙන් සටහන් යොදලා තියෙන්නේ උතුමාණෙනි.

ප්‍ර : 2019 ජනවාරී 26 වෙනිදා ඔබ ඉන්පසුව මොකද්ද කරපු රාජකාරිය?

පි : ඉන්පසුව උතුමාණෙනි මෙම සැකකරුවන් භාවිතා කරපු වෑන් රථය සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වුවා.

ප්‍ර : කවද්ද?

පි : අපි ගිය අවස්ථාවේදීම උතුමාණෙනි.

ප්‍ර : වෑන් රථය ඒ කියන්නේ මොන වෑන් රථයද?

පි : ඩොල්ෆින් වෑන් රථය.

ප්‍ර : ඩොල්ෆින් වෑන් රථය ඔබ ඒ අනුව 2019.01.26 හොයා ගත්තද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කවද්ද හොයා ගත්තේ? සාක්ෂිකරු එහෙමයි කියන්න ඉස්සරලා කියවයි කියලා දිනය කියන්න?

පි : 2019.01.27 වන දින උතුමාණෙනි.

ප්‍ර : ඒකනේ. කරුණාකර ඔබ පිළිතුරු දෙන්න ඉස්සලා ඔබගේ සටහන් බලන්න මහත්මයා. පළපුරුදු නිලධාරියෙක්නේ. එම වෑන් රථය හොයා ගත්තේ කවද්ද?

පි : 2019.01.27

ප්‍ර : හරි. කොහේදිද හොයා ගත්තේ?

පි : උතුමාණෙනි ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරනකොට වෑන් රථය ...,

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මම ඇහුවේ කොහේදිද හොයා ගත්තේ?

පි : මුර්තවෙල, සමිති පාර, යූසුෆ් මාවත, අංක ඒ/27/3

ප්‍ර : ප්‍රදේශය විතරක් කියන්න කොහේද කියලා?

පි : මුර්තවෙල.

ප්‍ර : මුර්තවෙල?

පි : ඔව්.

ප්‍ර : කොහේද ඒ මුර්තවෙල තියෙන්නේ?

පි : මාවනැල්ල ප්‍රදේශයේමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ වෑන් රථය සොයා ගත්තේ කාගේ හරි නිවසකින්ද නැත්නම් කාගේ හරි භාරයෙන්ද?

පි : අමීර් රිස්වාන් යන තැනැත්තාගේ නිවසේ තිබිලා උතුමාණෙනි.

ප්‍ර : මේ වෑන් රථය රිස්වාන්ටද අයිති?

පි : නැහැ උතුමාණෙනි. මේ වෑන් රථය අයිති වෙනත් පුද්ගලයෙකුට උතුමාණෙනි.

ප්‍ර : නම?

පි : සේතු මොහොමඩ් මොහොමඩ් ෆයිසාර්.

ප්‍ර : ෆයිසාර්ගේ තමයි මෙම වෑන් රථය. එය සුදු පාට ඩොල්ෆින් වෑන් එකක්ද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : අංකය මොකද්ද?

පි : 250-0154.

ප්‍ර : දැන් මේ වෑන් රථය තිබ්බේ රිස්වාන්ගේ ගෙදර?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඇයි ඒ වෑන් රථය රිස්වාන්ගේ ගෙදර තිබ්බේ කියලා ඔබ පරීක්ෂා කළාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මොකද්ද අනාවරණය වුණේ?

පි : ගරු උතුමාණෙනි මෙම වෑන් රථය මාවනැල්ලේ බුදු පිළිම, 2018.12.26 දිනයෙන් පසු එම නිවසට ගිහින් තිබුණු බව තමයි අනාවරණය වුණේ.

ප්‍ර : ඇයි ඒ?

පි : ඔහුගේ පුතාව උතුමාණෙනි මේ සිද්ධිය සම්බන්ධයෙන් අත් අඩංගුවට ගෙන තිබුණා. මෙම රථයේ රියදුරු ඔහුගේ පුතා උතුමාණෙනි.

ප්‍ර : පැහැදිලි නැහැ. නැවත කියන්න?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මෙම වෑන් රථයේ අයිතිකරුගේ පුතා තමයි උතුමාණෙනි මෙම වෑන් රථයේ රියදුරු වශයෙන් කටයුතු කළේ. ඒ වෙනකොට ඔහුව මාවනැල්ල පොලීසියෙන් අත් අඩංගුවට ගෙන තිබුණේ උතුමාණෙනි.

ප්‍ර : ඇයි?

පි : මේ සිද්ධියට සම්බන්ධව.

ප්‍ර : කොයි?

පි : බුදු පිළිමවලට අලාභහානි කිරීමේ සිද්ධිය සම්බන්ධව.

ප්‍ර : අත් අඩංගුවට ගෙන තිබ්බෙ. එමනිසා ඇයි මේ රිස්වාන්ගේ ගෙදර වාහනය නතර කරලා තිබ්බේ?

පි : උතුමාණෙනි මේ පියා මේ වෑන් රථය එම නිවසට ගිහිල්ලා දාලා උතුමාණෙනි.

ප්‍ර : හේතුව සොයා බැලුවද ඇයි එහෙම දාන්න හේතුවක්? සමාවෙන්න. රිස්වාන්ගේ ගෙදර ගිහිල්ලා දාන්න හේතුව මොකද්ද?

පි : හේතුව වශයෙන් කිව්වේ මේ සිද්ධියෙන් පස්සේ ගිහින් දැම්මා කියලා තමයි කිව්වේ.

ප්‍ර : මොන සිද්ධියද?

පි : 2018.12.26 දින මාවනැල්ලේ බුදු පිළිමවලට අලාභහානි කිරීමේ සිද්ධියෙන් පසු ඔහුගේ පුතාව අත් අඩංගුවට ගත්තා. එයින් පසුව මෙම වෑන් රථය ගිහින් දැම්මා කියලා තමයි කිව්වේ.

ප්‍ර : දැන් මේ මොහොමඩ් ෆයිසාර් කියපු ඒ පිළිතුර ඔබ බාර ගත්තද?

පි : උතුමාණෙනි ඔහු සමඟ ගිහිල්ලා මෙම වෑන් රථය පරීක්ෂා කළා.

ප්‍ර : නැහැ මම අහන්නේ මොහොමඩ් ෆයිසාර් කිව්වා මේ සිද්ධියෙන් පස්සේ වෑන් එක රිස්වාන්ගේ ගෙදර දැම්මා කියලා?

පි : ඔව්.

ප්‍ර : එසේ දැමීමට හේතුව ගැන ඔබලා විමර්ශනය කළාද නැද්ද?

පි : හේතුව විමර්ශනය කළේ නැහැ.

ප්‍ර : ඉන් අනතුරුව ඔබ කිව්වා මේ ෆයිසාර් සමඟ ගිහිල්ලා තමයි මේ වාහනය පරීක්ෂා කළේ කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එය ඔබලාගේ බාරයට ගත්තද නැතනම් තියලා ආවද?

පි : එහෙමම තිබ්බා උතුමාණෙනි.

ප්‍ර : නැහැ නැහැ. සුදු පාට වෑන් රථය. මේ ඩොල්ෆින් එක ඔබලාගේ බාරයට ගත්තද නැද්ද?

පි : නැහැ උතුමාණෙනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : සටහන් බලන්න?

පි : එදින සොයා ගත්තා උතුමාණෙනි. එදින බාරයට ගත්තේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : කවද්ද බාරයට ගත්තේ?

පි : ඊට පස්සේ උතුමාණෙනි පසුව මේක ස්ථානාධිපතිතුමා පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා විසින් තමයි බාර අරගෙන අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙන්නේ උතුමාණෙනි.

ප්‍ර : ඔබ මේ කියා සිටින්නේ ෆයිසාර් පෙන්වා දෙන්නට යෙදුණු වැන් රථයේ අංකය මොකද්ද?

පි : 250-0154 ඩොල්ෆින් වැන් රථය.

ප්‍ර : ඔබට පෙන්වා සිටින මෙය ඔබගේ බාරයට ගත්තේ නැහැ?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔබ මීට ප්‍රථමයෙන් 250-0154 ට පෙර PA-2855 දරන වැනට් වර්ගයේ වැන් රථය ගැන කියා සිටියා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : සහ 2019.02.15 වන දින ඔබ ගිහිල්ලා එම වැන් රථයේ අංකය සොයා ගැනීමත් ඔබ කියා සිටියා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔබගේ විමර්ශනවලදී අනාවරණය වුණාද PA-2855 දරන වැන් රථයද නැත්නම් 250-0154 දරන වැන් රථයද මේ ලැක්ටෝස් වත්තට පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා යොදාගෙන තිබුණේ කියලා?

පි : උතුමාණෙනි ලැක්ටෝස් වත්තට ඇවිල්ලා තිබුණේ PA-2855 වැන් රථය.

ප්‍ර : PA-2855 දරන වැන් රථය?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එතකොට මගේ ප්‍රශ්නය, පුපුරණ ද්‍රව්‍ය හෝ රසායනික ද්‍රව්‍ය ලැක්ටෝස් වත්තට අරගෙන ඇවිල්ලා තිබ්බේ මොන වැන් රථයද?

පි : එම වැන් රථයේ උතුමාණෙනි.

ප්‍ර : අංකය කියන්න?

පි : ගරු උතුමාණෙනි PA-2855

ප්‍ර : දැන් 2019.02.15 වන දින කල්පිටියට ගිහිල්ලා අර මූෆිස්ගෙන් ලැබිච්ච තොරතුරුවලට අනුව මේ වැන් රථයේ අංකය සොයා ගත්තා?

පි : එහෙමයි උතුමාණෙනි.

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : 2019.02.15 වන දින වනවිට දැන් මාවනැල්ලේ බුදු පිළිමවලට හානි සිදු කිරීම ගැන කරන විමර්ශනය සහ ඉන්පසු ඔබලා වනාතවිල්ලුවේදී සොයා ගත්ත මේ පුපුරණ ද්‍රව්‍ය යන මේ සිද්ධි දෙක එකිනෙකට සම්බන්ධද නැද්ද කියලා 2019.02.15 වෙනිදා වෙනකොට අනාවරණය වෙලා තිබ්බද නැද්ද?

පි : ගරු උතුමාණෙනි එකිනෙකට සම්බන්ධතාවයක් තිබුණ එක තමයි පෙනීමට තිබුණේ.

ප්‍ර : එසේ පෙනීමට තිබුණා නම් මෙම බුදු පිළිම හානි කිරීම, මේ වනාතවිල්ලුවේ ඒ පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම යන කාරණාවල ප්‍රධාන සැකකරුවෙකු හෝ සැකකරුවන්ගේ නම් හෙළිදරව් වෙලා තිබ්බද?

පි : එහෙමයි උතුමාණෙනි. ප්‍රධාන වශයෙන් ....,

ප්‍ර : මම අහන ප්‍රශ්නයට ඔව්ද නැද්ද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එම සැකකරුවන් සාහිඩ් සහ සාදික් කියන සහෝදරයන් දෙදෙනා ඇතුළත්ව සිටියද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මෙම සාහිඩ් සහ සාදික් සහෝදරයන්ට අමතරව වෙනත් පුද්ගලයෙක්ගේ නමක් සැකකරුවෙකු වශයෙන් පුද්ගලයෙක් හෝ පුද්ගලයින්ගේ නම් ඔබලා අනාවරණය කරගෙන තිබුණද?

පි : වනාතවිල්ලුවේ සිද්ධියෙන් පස්සේ අනාවරණය වුණා උතුමාණෙනි.

ප්‍ර : කවුද ඒ? මොකද්ද නම?

පි : ගරු උතුමාණෙනි සහරාන් කියන පුද්ගලයෙක් සම්බන්ධයෙන් කරුණු අනාවරණය වීමක් වුණා උතුමාණෙනි.

ප්‍ර : ඔබලාගේ විමර්ශනයන්ට 2019.02.15 වෙනිදා වෙනකොට අනාවරණය වෙලා තිබුණද මේ සහරාන් මොන ආකාරයටද මෙම සිද්ධි දාමයට සම්බන්ධ වෙලා හිටියේ කියලා? ඔහු ප්‍රධාන සැකකරුවෙක්ද නැත්නම් නිකම් සහභාගී වූ සැකකරුවෙක්ද? මොන තත්ත්වයක සිටි සැකකරුවෙක් කියලද අනාවරණය වෙලා තිබුණේ?

පි : ගරු උතුමාණෙනි වනාතවිල්ලුවේ සිද්ධියෙන් පස්සේ ඔහුගේ නම අනාවරණය වුණේ ප්‍රධාන සැකකරුවෙක් වශයෙන්.

ප්‍ර : 2019.02.15 වන දින මේ වැන් රථයේ අංකය ඔබලා සොයා ගත්තට පසුව එම වැන් රථයේ අයිතිකරු සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගත්තද?

පි : එහෙමයි උතුමාණෙනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඒ කියන්නේ මෙම වෑන් රථයේ ලියාපදිංචි අයිතිකරු කවුද? PA-2855 දරන වෑන් රථයේ ලියාපදිංචි අයිතිකරු කවුද කියලා අනාවරණය වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප : කවුද? අබ්දුල් කාදර් ජබීර් කියලා කිව්වොත් හරිද?

පි : එය නිවැරදියි උතුමාණෙනි.

ප : දැන් මේ අබ්දුල් කාදර් ජබීර් කියන පුද්ගලයා කුමන ප්‍රදේශයක සිටිනවා කියලා අනාවරණය වෙලා තිබ්බද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප : කොහේද?

පි : ඔහු අලහිටියාව, ගාලේගම ප්‍රදේශයේ උතුමාණෙනි.

ප : කොහේද?

පි : අලහිටියාව, ගාලේගම.

ප : කොයි ...?

පි : කුලියාපිටිය.

ප : කුලියාපිටිය ප්‍රදේශයේ අලහිටියාව, ගාලේගම. කැකුණුගොල්ල කියන ප්‍රදේශය පිහිටලා තියෙන්නේ කුලියාපිටියේද?

පි : කුලියාපිටියේ නාරම්මල අතර තමයි උතුමාණෙනි කැකුණුගොල්ල ප්‍රදේශය.

ප : කැකුණගොල්ල තියෙන්නේ. ඒ කියන්නේ මේ කැකුණුගොල්ල සහ අලහිටියාව කියන්නේ ...?

පි : කිට්ටුව.

ප : මොකද්ද?

පි : සාමාන්‍යයෙන් ඒ ප්‍රදේශයේ තමයි උතුමාණෙනි.

ප : එකම ප්‍රදේශයේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප : ඔබ දන්නවා නම් කියන්න. මේ අලහිටියාව සහ කැකුණගොල්ල කියන මේ ප්‍රදේශවල ජන සංයුතිය එහෙම නැත්නම් බහුතරයක් කුමන ජන කොට්ඨාශයට අයත් පුද්ගලයෝ වාසය කරනවද කියලා ඔබට දැනීමක් තියෙනවද?

පි : එහෙමයි උතුමාණෙනි. ඒ ප්‍රදේශයේ මම සංචාරය කළ නිසා මුස්ලිම් ජනතාවත් සිටි බව ...,

ප : මුස්ලිම් ජනතාවත් ඉන්නවා කියලා ඔබ නිරීක්ෂණය කළා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප : දැන් ඔබලා ඒ අනුව මේ අබ්දුල් කාදර් ජබීර්ව සොයා ගන්න නැත්නම් හමුවන්න ඔබ අර අලහිටියාවට ගියාද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කවුද ගියේ?

පි : මා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක්.

ප්‍ර : සටහන් යෙදුවද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කවද්ද ගියේ?

පි : 2019.02.19 වන දින උතුමාණෙනි.

ප්‍ර : බලන්න. වෑන් එක හොයන්න ගිය දවස මම අහන්නේ?

පි : උතුමාණෙනි වෑන් එක සෙවීමට 2019.02.18 පිටත් වුණේ. මේ ලිපිනයට ගියේ 2019.02.19

ප්‍ර : මොන ලිපිනයටද?

පි : අලහිටියාව, ගාලේගම.

ප්‍ර : එසේ ගිහිල්ලා මේ ජබීර් කියන පුද්ගලයාව මුණ ගැසුණද?

පි : යනකොට ඔහු නිවසේ හිටියේ නැහැ උතුමාණෙනි. ඔහු කෑගල්ල ප්‍රදේශයේ වෙළඳ ව්‍යාපාරයක් කරනවා කියලා දැන ගත්තා. ඒ අනුව අපි නැවත කෑගල්ලට ගියා උතුමාණෙනි. කෑගල්ලට ගිහිල්ලා එහේදී ඔහුව හමු වුණා උතුමාණෙනි.

ප්‍ර : ඒ හමු වෙලා PA-2855 දරන වෑන් රථය සම්බන්ධයෙන් ඔහුගෙන් ඒ කියන්නේ ජබීර් කියන ලියාපදිංචි අයිතිකරුගෙන් විමසා සිටියද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එහිදී කුමක්ද අනාවරණය වුණේ?

පි : එහිදී අනාවරණය වුණේ මෙම වෑන් රථය ඔහු විසින් විකුණූ බව තමයි අනාවරණය වුණේ.

ප්‍ර : අනාවරණය වුණාද ජබීර් කියන මෙම පුද්ගලයා PA-2855 දරන වෑන් රථය එයා විකුණලා තිබුණු දිනය හෝ කාල වකවානුව?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : අනාවරණය වුණේ නැහැ?

පි : ඒ අවස්ථාවේ අනාවරණය වුණේ නැහැ උතුමාණෙනි. මොකද වෑන් රථය ඔහුගේ නමටම තමයි ලියාපදිංචිය තිබුණේ.

ප්‍ර : දැන් ජබීර් කිව්වා ඔහු වෑන් රථය විකුන්න කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කාටද විකුන්නේ කියලා කිව්වද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කාටද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : කැකුණගොල්ල ප්‍රදේශයේ පදිංචි කුංචි මොහිදීන් නැමැති අයට විකුණූ බව තමයි අනාවරණය වුණේ.

ප්‍ර : දැන් 19.02.19 ඔබලා PA-2855 දරන එහි ලියාපදිංචි අයිතිකරු වන ජබීර්ගෙන් විමසා සිටිනවිට ඔබ දැනගෙන සිටියද PA-2855 පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට යොදාගෙන තිබුණා කියලා?

පි : වනාතවිල්ලුව ප්‍රදේශයට පැමිණ එය රසායනික ද්‍රව්‍ය ගෙනාව බවට අනාවරණය වෙලා තිබුණා උතුමාණෙනි.

ප්‍ර : ඒ කියන්නේ වනාතවිල්ලුව සිද්ධියේ ප්‍රධාන නඩු භාණ්ඩයක් වශයෙන්ද ඔබ එය සැළකුවේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් ජබීර් කියා සිටියා කුංචි මොහිදීන්ට විකුන්නා කියලා. දැන් ඔබ ඒ අනුව ගිහිල්ලා කුංචි මොහිදීන්ව හමු වුණාද? කුංචි මොහිදීන්ගේ සම්පූර්ණ නම ඔබ සටහන් කරගෙන තිබේද?

පි : කුංචි මොහිදීන් කියලා විතරයි සටහන් කරගෙන තියෙන්නේ.

ප්‍ර : දැන් ඔබ ඒ අනුව කුංචි මොහිදීන්ව මුණ ගැසුණද?

පි : එහෙමයි උතුමාණෙනි. ජබීර් කිව්වා ඔහුගේ නිවස පෙන්වන්නම් කියලා. ජබීර් එක්ක කැකුණගොල්ලට ආවා උතුමාණෙනි.

ප්‍ර : කුංචි මොහිදීන්ව මුණ ගැසුණද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ලිව්වේ නැද්ද ඔහුගේ කට උත්තරයක් කුංචි මොහිදීන්ගේ?

පි : කුංචි මොහිදීන්ගේ කට උත්තරයක් ලිව්වා උතුමාණෙනි.

ප්‍ර : කවුද ලිව්වේ?

පි : එතනට පැමිණියාට පසුව උතුමාණෙනි එම වෑන් රථය කුංචි මොහිදීන්ගේ නිවසේ තිබුණේ උතුමාණෙනි.

ප්‍ර : ඒ අවස්ථාවේදී වෑන් රථය කුංචි මොහිදීන්ගේ ....?

පි : ගරාජයේ තිබුණේ උතුමාණෙනි.

ප්‍ර : කුංචි මොහිදීන්ගේ ලිපිනය කියන්න?

පි : කැකුණගොල්ල, චිත්‍රා මාවත.

ප්‍ර : දැන් කුංචි මොහිදීන්ව මුණ ගැසුණම කුමක්ද ඔබලා, කිසියම් කරුණක් අනාවරණය කර ගත්තද වෑන් රථය සම්බන්ධයෙන්?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කුමක්ද අනාවරණය කර ගත්තේ?

පි : මෙම වෑන් රථය ඔහු අතට පත්වීම සම්බන්ධයෙන් ප්‍රශ්න කළා.

ප්‍ර : දැන් PA-2855 දරන වෑන් රථය තමයි ඒ වනවිට අනාවරණය වෙලා තිබ්බේ මේ පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනය කරා කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබලා කුංචි මොහිදීන්ගේ නිවසට යනකොට දැන් වෑන් රථය කුංචි මොහිදීන්ගේ නිවසේ තිබ්බා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔබ ගත්තද වෑන් රථය ඒ වෙලාවේ ඔබලාගේ බාරයට?

පි : ඒ වෙලාවේ ගත්තේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් කුංචි මොහිදීන්ගෙන් මෙම වෑන් රථය පාවිච්චි කරපු විදිය සම්බන්ධයෙන් ඔබ විමසා සිටියද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔබද ඇහුවේ නැත්නම් වෙන කවුරු හරිද?

පි : මමත් ඇහුවා. අනිත් නිලධාරිනුත් එයට සහාය වුණා උතුමාණෙනි.

ප්‍ර : හරි. එහිදී කුමක් හරි අනාවරණය වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි. මෙම වෑන් රථය ඔහුගේ අතට පත් වුණේ කොහාමද කියලා තමයි අපි විමසුවේ?

ප්‍ර : වෑන් රථය ඔහුගේ අතට පත් වුණේ කොහොමද කියලා තමයි විමසුවේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : නමුත් ජබීර් කියා සිටියනේ මේ වෑන් රථය ඔහු විසින් කුංචි මොහිදීන්ට විකුණූ බව?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඉතිං ඇයි ඔබ තවදුරටත් ඒ ගැන විමසා සිටියේ?

පි : ගරු උතුමාණෙනි ජබීර් මේ වෑන් රථය විකුණලා තියෙන්නේ මීට බොහෝ කාලයකට පෙර උතුමාණෙනි.

ප්‍ර : ඒක තමයි මම ඉස්සරලා ඇහුවේ. බොහෝ කාලයකට පෙර කියන්නේ කොයි කාල වකවානුවේද?

පි : එහි දිනය සඳහන් වෙලා නැහැ උතුමාණෙනි. කුංචි මොහිදීන් විසින් මෙම වෑන් රථය ජබීර්ගෙන් මිලදී ගැනීමෙන් පසු අරණායක ප්‍රදේශයේ රාජා නැමැති අයෙකුට තමයි කුංචි මොහිදීන් විකුණලා තියෙන්නේ.

ප්‍ර : ඔබ කියා සිටින්නේ ජබීර්ගෙන් අරගෙන කුංචි මොහිදීන් එය අරණායක පදිංචි රාජට විකුණලා තියෙනවා කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් රාජාට විකණපු වෑන් රථය නැවත කුංචි මොහිදීන්ගේ භාරයට පත් වුණේ කොහොමද කියලා අනාවරණය වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මොකද්ද ඔබලා අනාවරණය කර ගත්තේ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අන්සාර් නැමැති පුද්ගලයෙකු නැවත කුංචි මොහිදීන්ට මෙම වෑන් රථය 2019.01.20 දින ගෙනත් දුන්න බව තමයි අනාවරණය වුණේ.

ප්‍ර : 2019.01.20 අන්සාර් කියලා පුද්ගලයෙක් කුංචි මොහිදීන්ට වෑන් එක ගෙනත් දුන්නා කියලා අනාවරණය වුණා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ කියන්නේ ත්‍යාගයක් වශයෙන්ද?

පි : නැහැ උතුමාණෙනි. ඔහු විකුණලා උතුමාණෙනි.

ප්‍ර : මුදල අනාවරණය වුණාද?

පි : ලක්ෂ විසි හත හමාරකට.

ප්‍ර : ඇයි කුංචි මොහිදීන් මෙම වෑන් රථය මිලදී ගෙන තියෙන්නේ?

පි : ඔහු වාහන ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තෙක්.

ප්‍ර : කුංචි මොහිදීන් ඇවිල්ලා වාහන විකිණීමේ ව්‍යාපාරයේ යෙදී සිටින තැනැත්තෙක්.

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එතකොට අන්සාර් මෙම PA-2855, 2019.01.20 කුංචි මොහිදීන් වෙත ගෙන ඒමට හේතුව ඔබලා බැලුවද?

පි : ප්‍රශ්නය පැහැදිලි නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් 2019.01.20 නේ නැවත කුංචි මොහිදීන් ලක් විසි හත හමාරකට PA-2855 මිලදී ගෙන තිබ්බේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මේ අන්සාර් කියන තැනැත්තා ඇයි මේ වෑන් රථය කුංචි මොහිදීන්ටම රැගෙන ඇවිත් විකුණුවේ කියන එක ඔබට අනාවරණය වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඇයි?

පි : අන්සාර්ට උතුමාණෙනි කලූර් නානා කියලා පුද්ගලයෙක් ගෙනත් දුන්නා කියලා තමයි අනාවරණය වුණේ ඔහුගෙන් ප්‍රශ්න කිරීමේදී.

ප්‍ර : මම දැන් මෙහෙම අහන්නම්. දැන් කුංචි මොහිදීන් මෙම වාහනය මිලදී ගන්නකොට ඒ මුදල්වලට, මිලදී ගැනීමේ මුදල් කොහොමද භාර දුන්නේ කියලා අනාවරණය වුණාද?

පි : එහෙම රිසිට්පතක් මොකුත් ඉදිරිපත් වුණේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : එතකොට සල්ලි ගෙව්වද නැද්ද කියලා අනාවරණය වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒක මුදල් වශයෙන්ද නැත්නම් චෙක්පතක් මගින්ද?

පි : මුදල් වශයෙන් ගෙව්වා කියලා.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අන්සාර් මෙම වැන් රථය කුංචි මොහිදීන්ට විකුණූ බව කිව්වහම මේ අන්සාර් කියන පුද්ගලයා මුණ ගැස්සවීමට ඔබ කටයුතු කළාද?

පි : කුංචි මොහිදීන්ම කිව්වා උතුමාණෙනි ඔහු මේ කිට්ටුව ඉන්නේ. එයාවත් ගෙන්නලා දෙන්න පුළුවන් කියලා.

ප්‍ර : ඒ අනුව මොකද වුණේ.

පි : ඊට පස්සේ ඔහු ලවාම උතුමාණෙනි මේ අන්සාර්වව එම ස්ථානයට ගෙන්න ගත්තා උතුමාණෙනි.

ප්‍ර : ඒ කියන්නේ 2019.02.19 වෙනිදද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් අන්සාර් එම ස්ථානයට ආවම ඔහු සමඟ විමර්ශන නිලධාරීන් කවුරු හරි කථා කළාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කවුද?

පි : මමත් ඒ සම්බන්ධයෙන් කථා කළා. ඔහුට සිංහල භාෂාව පොඩ්ඩක් අමාරුයි උතුමාණෙනි. මා සමඟ ගිය පොලිස් සැරයන් නන්දලාල්ට දෙමළ භාෂාව කථා කිරීමේ හැකියාව තිබුණා. ඔහුගෙන් ඒ සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීම් කළා උතුමාණෙනි.

ප්‍ර : දැන් මේ නන්දලාල් සහ ඔබ ඇතුළු කණ්ඩායම මේ අන්සාර් යන අයගෙන් ප්‍රශ්න කළේ මොකද්ද?

පි : මෙම වැන් රථය ඔහුට පත් වුණේ කොහොමද කියලා තමයි අපි ප්‍රශ්න කළේ උතුමාණෙනි.

ප්‍ර : ඔහු මොකද්ද කියා සිටියේ?

පි : ඔහු මුලින් කිව්වා මේ මාවනැල්ල ප්‍රදේශයේ එක්කෙනෙක් ගෙනත් දුන්නා කියලා. නමුත් අපි ...,

ප්‍ර : මාවනැල්ල ප්‍රදේශයේ පුද්ගලයෙක් ගෙනත් දුන්නා කියලා කිව්වා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එතකොට අන්සාර් කරන රැකියාව ගැන ඔබලට වැටහීමක් තිබ්බද?

පි : එහෙමයි උතුමාණෙනි. ඔහු එම ප්‍රදේශයේ පාසලක කැන්ටීමක් කරනවා.

ප්‍ර : එතකොට පාසලක කැන්ටීම කරන මනුස්සයා කිව්වා එයාට එම ප්‍රදේශයේම, මාවනැල්ලේ එක්කෙනෙක් වැන් එක ගෙනල්ලා දුන්නා කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මොකටද?

FAIR COMMENT BY JEZEEM

පි : වැන් එක විකුණලා දෙන්න කියලා.

ප්‍ර : ඇයි කියලා ඇහුවද?

පි : ඒ නිසා තමයි උතුමාණෙනි දිගින් දිගටම ප්‍රශ්න කළේ.

ප්‍ර : දිගින් දිගටම ප්‍රශ්න කළා?

පි : ඔව්.

ප්‍ර : දැන් කොහේදිද ඔය ප්‍රශ්න කිරීම කළේ?

පි : කුංචි මොහිදීන්ගේ නිවස ඉදිරිපිට සහ ඒ ඉදිරිපිට ඇති පාරේදී උතුමාණෙනි.

ප්‍ර : ඇයි ඔබලා එහෙම ප්‍රශ්න කළේ?

පි : ඔහු සැරෙන් සැරේ ඒ සම්බන්ධයෙන් විමසීම් කරනකොට මොහු නිකම් තැති ගැන්මෙන් හිටියා වගේ තේරුණා. ඒ නිසා දිගින් දිගටම ප්‍රශ්න කිරීම් කළා උතුමාණෙනි.

ප්‍ර : PA-2855 වනාතවිල්ලුවට පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනය කරපු වැන් එක. මේ වැන් එක මේ වෙනකොට අරගෙන ආපු ඒ කියන්නේ කුංචි මොහිදීන් වෙත නැවත පත් වෙනකම් ඔබලා මුණ ගැසුණු පුද්ගලයන් නිසි පිළිතුරු ඔබලාට ලබා දී තිබුණා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : නමුත් මේ අන්සාර් කියන තැනැත්තා ඒ අවස්ථාවේදී තැති ගැන්මකින් සිටියා සහ නොමඟ යවන සුළු, ඔබ එහෙම නේද කිව්වේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : නොමඟ යවන සුළු ආකාරයේ පිළිතුරු ලබා දෙමින් සිටියා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මෙම තැනැත්තා එසේ ඔබව නොමඟ යවන ආකාරයට ඔබ කියනා විදියට තොරතුරු ලබාදෙන විට මොකද්ද ඔබලා කළේ?

පි : ඔහුගෙන් දිගින් දිගටම ප්‍රශ්න කිරීම් කළා උතුමාණෙනි.

ප්‍ර : ඒ ප්‍රශ්න කළේ කට උත්තරයක් ලියමින්ද නැත්නම් ඒ ලියන්න ඉස්සරලද?

පි : ලියන්න පෙර උතුමාණෙනි.

ප්‍ර : ආ?

පි : ප්‍රකාශය සටහන් කර ගන්න පෙර උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔහුගෙන් දිගින් දිගටම දිගින් දිගටම ප්‍රශ්න අහනකොට ඔබලා යම් දෙයක් අනාවරණය කර ගත්තාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මොකද්ද අනාවරණය කර ගත්තේ? නැහැ මම මෙහෙම අහන්නම්. දැන් එසේ දිගින් දිගටම ප්‍රශ්න කරනකොට ඔහු ඔබ අර

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පෙර සඳහන් කරපු සාදික්, සාහිඩ් සහ සහරාන් යන පුද්ගලයන් අතර සම්බන්ධතාවයක් තියෙනවා කියලා අනාවරණය වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කුමක්ද අනාවරණය වුණේ?

පි : ගරු උතුමාණෙනි සහරාන් විවාහ වෙලා ඉන්නේ මෙම අන්සාර් යන අයගේ සහෝදරියක් සමඟ බවට අනාවරණය වුණා උතුමාණෙනි.

ප්‍ර : එක කුසේ උපන් සහෝදරියක්?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : PA-2855 පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනය කරපු වෑන් රථය එය කුංචි මොහිදීන් වෙත ගෙනල්ලා විකුණන්නේ අන්සාර්. අන්සාර් කියන්නේ සහරාන්ගේ මස්සිනා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ කියන්නේ මෙම සිද්ධියට සම්බන්ධයෙන් ඉතා වටිනා තොරතුරු ඔබලා සතුව ඒ අවස්ථාවේදී ඔබලා රැස් කරමින් සිටියේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් මේ තොරතුරුවලට අමතරව වෙනත් තොරතුරක් ඒ අවස්ථාවේදී අනාවරණය කර ගත්තාද?

පි : මාගේ මතකයක් නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් සාක්ෂිකරු අන්සාර් ඔබට කියා සිටියා මේ සහරාන්ගේ මස්සිනා මේ වෑන් එක මාවනැල්ලෙන් හම්බ වුණා කියලා. දැන් ඔබලට ඒ ගැන සැකයක් ඇති වුණා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ ගැන තව ප්‍රශ්න කළා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ සැකය නිරවුල් කර ගන්න පුළුවන් වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි. ඊට පස්සේ ඔහු කිව්වා මේ කත්තර් නානාගේ නමක් කිව්වා උතුමාණෙනි.

ප්‍ර : මොන නානාද?

පි : කත්තර් නානා.

ප්‍ර : කවුද මේ කත්තර් නානා කියන්නේ?

පි : එහෙම දන්නේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් මේ ඔබ මේ කත්තර් කියලා කියන්නේ එය ද්‍රවිඩ භාෂාවෙන් ලියන ආකාරයටමද ඔබ එය ප්‍රකාශ කරන්නේ? කියන්නයි ගයන්නයි මාරු ...,

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මගේ සටහනේ තියෙන්නේ උතුමාණෙනි ....,

ප්‍ර : ඔව්. සටහන බලන්න.

පි : කත්තර්.

ප්‍ර : මම ලියාගෙන තියෙන්නේ කත්තර්. මේ කත්තර් කියන නම ඔබට දන්වා සිටියේ කවුද?

පි : අන්සාර් උතුමාණෙනි.

ප්‍ර : අන්සාර් එය ඔබ වෙත සිංහල භාෂාවෙන් කියා සිටියද නැත්නම් නන්දලාල් ඔබ වෙත පරිවර්තනය කරලා දීපු නමක්ද?

පි : නන්දලාල් තමයි ඔහුගෙන් ප්‍රශ්න කිරීම් කළේ උතුමාණෙනි.

ප්‍ර : දැන් සාක්ෂිකරු අන්සාර් මේ කත්තර් නානා කියන තැනැත්තාගෙන් මේ වැන් රථය ගෙනාවා කිව්වම ඔබලාට ඊට වඩා වැඩි යමක් ඒ අවස්ථාවේදී අනාවරණය වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි. සහරාන් සම්බන්ධයෙන් අනාවරණය වීමක් වුණා උතුමාණෙනි.

ප්‍ර : දැන් මේ වැන් රථය සාදික් හෝ සාහිඩ් සම්බන්ධයෙන් භාවිතා කළාද නැද්ද යන්න ඒ අවස්ථාවේදී අනාවරණය වුණාද?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් සාක්ෂිකරු අන්සාර් මෙම තොරතුරු ඔබ වෙත ඉදිරිපත් කරහම මොකද්ද ඔබ ගත් පියවර?

පි : ගරු උතුමාණෙනි මම ඒ අවස්ථවෙම ස්ථානාධිපතිතුමාට සහ සහකාර පොලිස් අධිකරීතුමාට දැනුම් දුන්නා උතුමාණෙනි. මා නිලධාරීන් කණ්ඩායමක් සමඟ වහාම එම නිවස වැටලුවා ගිහිල්ලා.

ප්‍ර : මොන නිවසද? කාගේ නිවසද?

පි : අන්සාර්ගේ නිවස.

ප්‍ර : අන්සාර්ගේ නිවස එවෙලෙම ...?

පි : ඒ මොහොතෙම ගියා අන්සාර්ගේ නිවසට.

ප්‍ර : කොහොමද ගියේ අන්සාර්ගේ නිවසට ඔබලා?

පි : ඔහුවත් දාගෙන ගියේ උතුමාණෙනි.

ප්‍ර : ආ?

පි : අන්සාර්වත් දාගෙන ගියේ උතුමාණෙනි.

ප්‍ර : දැන් අන්සාර්ගේ නිවසට ඔබලා ගියහම ඒ නිවස ඇතුළට ඔබලා ගියාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කවුද හිටියේ නිවසේ?

පි : තාත්තා හිටියා උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කාගේ තාත්තද?

පි : අන්සාර්ගේ තාත්තා හිටියා. මව හිටියා. සහරාන්ගේ බිරිඳ හිටියා.

ප්‍ර : එපමණයි?

පි : තව පොඩි ළමයි දෙන්නෙක්ද කොහේද හිටියා මගේ මතකයේ හැටියට.

ප්‍ර : දැන් සහරාන්ගේ බිරිඳත් එම නිවසේ හිටියා. හරි නේද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔවුන්ගෙන් ප්‍රශ්න කළාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ ප්‍රශ්න කිරීම්වලදී සහරාන් ගැන කරුණු අනාවරණය වුණාද?

පි : නැහැ උතුමාණෙනි. සහරාන් අවුරුදු තුනකින් පමණ නිවසට පැමිණ නැති බව තමයි ප්‍රකාශ කළේ.

ප්‍ර : සහරාන්ගේ බිරිඳ එම නිවසේ හිටියා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : අම්මයි, තාත්තයි හිටියා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : අන්සාර් විවාහකද නැද්ද කියලා ඒ වෙනකොට අනාවරණය වෙලා තිබ්බද?

පි : අන්සාර් විවාහකයි කියලා අනාවරණය වෙලා තිබ්බා උතුමාණෙනි.

ප්‍ර : එතකොට අන්සාර්ගේ බිරිඳ එම ස්ථානයේ, එම නිවසේ හිටියද?

පි : ඒ අවස්ථාවේ නම් මම දුටුවේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : ඒ නිවසේ කවුද පදිංචි වෙලා ඉන්නේ කියලා ඔබ විමසා හිටියද ග්‍රාමසේවා නිලධාරීවරයාගෙන්?

පි : නැහැ. ඒ සම්බන්ධව විමසීමක් කරලා නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔබ මෙම බිරිඳ සහ ඇයගේ දෙමව්පියන් සහරාන්ව වසර තුනකින් දැක්කේ නැහැ කියලා කිව්වහම එම පිළිතුර බාර ගත්තාද ඔබලා?

පි : ගරු උතුමාණෙන් ඒ අවස්ථාවේ හැටියට ඒක සටහන් කර ගත්තා උතුමාණෙනි. නමුත් මේ සම්බන්ධව තවදුරටත් ප්‍රශ්න කරන්න අන්සාර්වයි, මෙම වැන් රථය මේ සංවිධානයට ලැබුණේ කෙසේද, කුමන ආකාරයටද පත් වුණේ කියලා හොයන්නයි මාවනැල්ල ප්‍රදේශයට ආවා එම පුද්ගලයින් සමඟ උතුමාණෙනි.

ප්‍ර : මාවනැල්ලට ආවා එම පුද්ගලයින් සමඟ. කවුද ඒ එම පුද්ගලයින් කිව්වේ?

පි : අන්සාර් ආවා උතුමාණෙනි. කුංචි මොහිදීන් ආවා උතුමාණෙනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කුංචි මොහිදීන්?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මාවනැල්ලට ඇවිල්ලා ඔබලා කවුරු හරි මුණ ගැහුණද?

පි : එහෙමයි උතුමාණෙනි. කුංචි මොහිදින් ප්‍රකාශ කර සිටියානේ, ඔහුගේ ප්‍රකාශයෙන් අනාවරණය වෙලා තිබ්බනේ රාජා කියලා පුද්ගලයෙක් සම්බන්ධයෙන් අරණායක.

ප්‍ර : ඔව්?

පි : ඔහුව සොයා ගියා උතුමාණෙනි.

ප්‍ර : මාවනැල්ලට ඇවිල්ලා රාජාව සොයාගෙන ගියා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : හමු වුණාද රාජාව?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් රාජගෙන් ප්‍රශ්න කිරීමක් හෝ කට උත්තර ලිවීමක් ඔබලා කළාද?

පි : ඒ අවස්ථාවේ ප්‍රශ්න කිරීමක් විතරයි කළේ. ඒ වෙලාවේ රාජා කියන එක්කෙනා කිව්වා උතුමාණෙනි මාවනැල්ල ප්‍රදේශයේ පුද්ගලයෙක්, රිස්වාන් මාර්ගයෙන් මෙම වාහනය විකුණපු බව තමයි රාජා කියා සිටියේ.

දැන් වේලාව : ප.ව. 12.15 යි.
මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව. 12.15 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්ය.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>:

ප්‍ර : රාජා කිව්වේ රිස්වාන් මාර්ගයෙන් විකුණ්නා කියලා?
පි : එහෙමයි උතුමාණෙනි.
ප්‍ර : රිස්වාන් මුණගැසුනද?
පි : රිස්වාන්වත් මුණගැසුනා උතුමාණෙනි.
ප්‍ර : කවද්ද?
පි : එදාම උතුමාණෙනි.
ප්‍ර : 2019.02.19 ද?
පි : එහෙමයි උතුමාණෙනි.
ප්‍ර : රිස්වාන්ගෙන් ප්‍රශ්න කළාද?
පි : ප්‍රශ්න කරලා මේ සියළුදෙනාම මාවනැල්ල පොලිසියට එක්කන් ගියා උතුමාණෙනි.
ප්‍ර : සියළුදෙනාම කිව්වේ අන්සාර්, කුන්ඳු මොහිදීන්, රාජා සහ රිස්වාන් කියන බ්‍රෝකර්වරයා?
පි : එහෙමයි උතුමාණෙනි.
ප්‍ර : මාවනැල්ල පොලිසියට අරන් ගියා?
පි : එහෙමයි උතුමාණෙනි.
ප්‍ර : ගිහිල්ලා?
පි : මාවනැල්ල පොලිසියට අන්සාර් අපි හාරයේ හිටියේ අනෙක් පුද්ගලයින් තිදෙනා ඔවුන් පැමිණියා උතුමාණෙනි මාවනැල්ල පොලිසියට.
ප්‍ර : රිස්වාන් කටයුතු කරලා තිබ්බේ රාජට ඒ වාහන විකුණන්න අතරමැදියෙකු වශයෙන්?
පි : එහෙමයි උතුමාණෙනි.
ප්‍ර : අනාවරණය වුණාද ඒ රාජා ඒ වැන් රථය කාටද විකුණලා තිබ්බේ කියලා?
පි : එහෙමයි උතුමාණෙනි.
ප්‍ර : කවුද මිලදී ගත් තැනැත්තාගේ නම කුමක්ද?
පි : ගරු උතුමාණෙනි සාදික් කියන පුද්ගලයාට තමයි මෙම වැන් රථය විකුණලා තියෙන්නේ.
ප්‍ර : කවුද ඒක කිව්වේ? රිස්වාන්ගෙන්ද ඒක අනාවරණය වුණේ?
පි : රිස්වාන්ගෙන් උතුමාණෙනි අනාවරණය වුණේ.
ප්‍ර : ඒ සාදික්ගේ සම්පූර්ණ නම ඔහු කියා සිටියද? PA 2855 මිලදී ගත්ත සාදික් කියන පුද්ගලයාගේ සම්පූර්ණ නම කියා සිටියද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : සාදික් කියලා තමයි උතුමාණෙනි කිව්වේ.

ප්‍ර : මේ PA 2855 මිලදී ගත් සාදික් කොහේ පදිංචිකරුවෙක් කියලද අනාවරණය වුනේ ඒ වෙලාවේ?

පි : මාවනැල්ල පදිංචි උතුමාණෙනි මේ අපි සිද්ධියට හොයන.

ප්‍ර : ඒ කියන්නේ මාවනැල්ල බුදු පිළිම හානි කිරීමේ සිද්ධියේ ප්‍රධාන සැකකරුවෙක් වන සාදික්?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : සාදික්ට තමයි මේ රිස්වාන් මාර්ගයෙන් මේ වෑන් රථය විකුණලා තිබ්බේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : විකුණපු මිළ අනාවරණය වුණාද?

පි : එහෙම අනාවරණයක් වුණේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : කොයි කාල වකවානුවේද ඔය වෑන් එක විකුණලා තිබ්බේ කියලා අනාවරණය වුණාද?

පි : එහෙම දින වකවානු.. .

ප්‍ර : ඔබ මේ රිස්වාන්ගේ ප්‍රකාශය සටහන් කරන්නට යෙදුනද?

පි : මා සමඟ ගිය අනෙක් නිලධාරී තමයි උතුමාණෙනි.මේ ප්‍රකාශය සටහන් කළේ

ප්‍ර : පරීක්ෂා කරලා බලන්න ඔබට හැකියාවක් තියෙනවද සාදික් කියන සැකකරු PA 2855 දරන රථය මිලදී ගෙන තිබෙන කාල වකවානුව හෝ දිනය අනාවරණය වෙලා තියෙනවද කියලා? අනාවරණය වෙලා තියෙනවා නම් කවද්ද?

පි : ගරු උතුමාණෙනි 2018 මැයි මාසේ තමයි විකුණලා තියෙන්නේ. නිස්ලක්ෂ පනස්දහසකට.

ප්‍ර : දැන් සාක්ෂිකරු මේ තොරතුරු සාදික් විසින් මේ වෑන් රථය මිලදී ගත් බවටත් තොරතුරු තියෙන මේ අවස්ථාවේදී ඔබලා PA 2855 දරන වෑන් රථය ඔබගේ භාරයට ගැනීමට කටයුතු කළාද ඒ වෙලාවේ?

පි : ඒ අවස්ථාවේ කලේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : ඇයි ඒ?

පි : ගරු උතුමාණෙනි මේ වන කොට අපි මේ විමර්ශනයට අදාල ප්‍රධාන සැකකරුවන් පස්සේ තමයි අපි දිගින් දිගට පරීක්ෂණ පවත්වාගෙන ගියේ. ඒ අනුව ලැබෙන තොරතුරු ඔස්සේ ඒ විමර්ශනය තමයි මූලික කරගෙන සිදු කළේ.

ප්‍ර : මෙම සැකකරුවන්ගේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධිත නඩු භාණ්ඩයක් වන වෑන් රථය ඒ අවස්ථාවේදී වෑන් රථය ඔබගේ අතට පත්වෙලා තියෙද්දි සහ එම වෑන් රථය සාදික් කියන මාවනැල්ල සිද්ධියේ ප්‍රධාන සැකකරු මිලදී ගත් සහ ඔහුගේ

FAIR COMMENT BY JEZEEM

සන්තකයේ තිබුණු බවට කරුණු අනාවරණය වෙලා තියෙද්දී සහ අන්සාර් කියන සහරාන්ගේ මස්සිනා මෙම වෑන් රථය සාදික් කියන පුද්ගලයාගේ සන්තකයෙන් වෙනත් තැනැත්තෙකුගේ සන්තකයට පත් කිරීමට කටයුතු කර ඇති අවස්ථාවක ඇයි මෙච්චර වටිනාකමක් තිබෙන නඩු භාණ්ඩයක් වන මෙම වෑන් රථය ඔබලාගේ භාරයට ගැනීමට කටයුතු නොකලේ?

පි : ඒ වන විට උතුමාණෙනි මෙම වෑන් රථය 3 වන පාර්ශවයක් වෙත විකුණලා තිබුණේ. කෙසේ වුවත් එදින භාරයට ගැනීමක් වුනේ නැහැ ඊට දින 2 ට හෝ 3 ට පසුව භාර ගැනීමක් සිදු වුණා උතුමාණෙනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : දින 2 ට හෝ 3 ට පසුව නෙමෙයිනේ, දින කීයකට පස්සේද?

පි : 02.25 වෙනිදා උතුමාණෙනි භාරයට ගත්තේ වාහනය.

ප්‍ර : භාරයට ගත්තෙත් නැහැනේ නේද? භාරයට ගත්තද නැත්නම් ගෙනල්ලා භාර දුන්නද?

පි : ගෙනල්ලා භාර දුන්නා උතුමාණෙනි. එතනදී භාරයට අරගෙන.

ප්‍ර : දැන් අපරාධයක් සම්බන්ධයෙන් එහෙමද සාමාන්‍යයෙන් ක්‍රියා කරන්නේ?

පි : ගරු උතුමාණෙනි ඒ අවස්ථාවේ දී තිබුණු කරුණු කාරණා මත තමයි එවැනි තීරණයක් ගත්තේ. අපි මේ සිද්ධියේ ප්‍රධාන සැකකරුවන් පස්සේ මේ වන කොට කිසිම සැකකරුවකු අත්අඩංගුවට ගැනීමට නොහැකි තත්ත්වක තිබුණේ. ඒ ලැබෙන තොරතුරු ඔස්සේ හඹාගෙන ගියේ උතුමාණෙනි.

ප්‍ර : හරි එතකොට 2019 පෙබරවාරි 19 වෙනිදා වෙන කොට ඔබට තොරතුරු ලැබුණා මෙම PA 2855 දරන වාහනය තමා වනාතවිල්ලුවට මේ පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට යොදාගෙන තිබ්බේ කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එතකොට ඒක වැදගත්ම නඩු භාණ්ඩයක් වෙනවා නේද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඉතින් ඇයි ඒ නිසියාකාරව විමර්ශනය කරනවා නම් වාහනය හොයා ගත්තු දිනයේම අත්අඩංගුවට ගැනීමක් සිදු කරන්න ඕන නේද?

පි : එහෙමයි උතුමාණෙනි එදින ඔය අන්සාර්ගේ ප්‍රකාශයෙන් අනාවරණය වූ තොරතුරු ඔස්සේ පරීක්ෂණ පවත්වන්න ගිය හින්දා ඒක ප්‍රමාදවීමක් සිදු වුණා

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් අන්සාර් සමඟ කැකුණගොල්ලට යනවා නම් අර වාහනෙත් අත්අඩංගුවට අරගෙන ගෙනියන්න තිබ්බා නේද?

පි : නමුත් උතුමාණෙනි එතනදී අපි ප්‍රධාන ඉලක්කය වුණේ සහරාන් යන අය සොයා ගන්න. ඒක ඒ නිසා ඒ වාහනය තබලා විමර්ශනවලට ගියා.

ප්‍ර : එතකොට දවස් 6 ක් යන කල් වාහනය අත්අඩංගුවට පත් වෙන්නේ නැහැ?

පි : ඊට පස්සේ උතුමාණෙනි අපි මාවනැල්ලෙන් ආපහු පූනාණි ප්‍රදේශයට ගියා උතුමාණෙනි. තවත් සහරාන් සමඟ තිබුණු දුරකථන විශ්ලේෂණයකට අනුව තවත් පුද්ගලයෙක් සම්බන්ධයෙන් හොයන්න. ඊට පස්සේ ස්ථානයට පැමිණිලා සඳුදා දිනම ඒ වාහනයයි ඒ පුද්ගලයොයි නැවත ස්ථානයට කැඳෙව්වා.

ප්‍ර : අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හුඟක් ඉන්නවානේ?

පි : උතුමානෙනි මේ විමර්ශනයට මා ඇතුළු නිලධාරීන් 4, 5 දෙනෙක් තමයි හිටියේ.

ප්‍ර : හරි නමුත් අවශ්‍ය නම් ඔබට ඔබගේ ඉහළ නිලධාරියාට දන්වලා වෙනම කණ්ඩායමක් ගෙනල්ලා ඒ වාහනය ඒ වෙලාවේ අත්අඩංගුවට ගැනීමට හැකියාවක් තිබ්බා නේද?

පි : උතුමාණෙනි මම ඒ අවස්ථාවේදි මේ සම්බන්ධයෙන් ස්ථානාධිපතිතුමාට දැනුම් දුන්නා.

ප්‍ර : කාවද දැනුවත් කළේ?

පි : ස්ථානාධිපතිතුමාවත් දැනුවත් කළා උතුමාණෙනි සහකාර පොලිස් අධිකාරීතුමාවත් දැනුවත් කළා.

ප්‍ර : නම් කරන්න ඒ නිලධාරීන්ව?

පි : පොලිස් පරීක්ෂක මාරසිංහ මහතායි උතුමාණෙනි, සහකාර පොලිස් අධිකාරී වික්‍රමසේකර මහතායි.

ප්‍ර : ඔවුන් දෙදෙනාව දැනුවත් කළාද මේ වාහයනය තියෙනවා කියලා මෙතන?

පි : එහෙමයි උතුමාණෙනි වාහනය සම්බන්ධයෙන් දැනුවත් කළා.

ප්‍ර : ඔවුන්ට දැනුවත් කලාද මේ වාහනය පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනයට පාවිච්චි කරලා තියෙනවා කියලා?

පි : එහෙමයි උතුමාණෙනි වනාතවිල්ලුවේ පාවිච්චි කරපු වාහනය කියලා දැනුවත් කළා උතුමාණෙනි.

ප්‍ර : ඔහුට දැනුම් දුන්නද මේ වාහනය එක්තරා අවස්ථාවක අන්සාර්ගේ භාරයට පත් වෙනවා කියන එක?

පි : එහෙමයි උතුමාණෙනි, ඒ අන්සාර්ගේ ප්‍රශ්නෙත් දැනුම් දුන්නා, ඒ අන්සාර්ගේ ..

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : අහන ප්‍රශ්නෙට උත්තර දෙන්න, පොලිස් පරීක්ෂක මාරසිංහ සහ සහකාර පොලිස් අධිකාරී කවුද?

පි : වික්‍රමසේකර.

ප්‍ර : වික්‍රමසේකර දැනුවත් කරනවද මේ අන්සාර් කියන්නේ සහරාන්ගේ මස්සිනා කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ ඔක්කොම දැනුම් දීලත් ඔවුන්ගෙන් ඔබට උපදෙස් ලැබුන් නැද්ද වාහනය අත්අඩංගුවට ගන්නා කියලා?

පි : වාහනය අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මුකුත් දැනුම් දීමක් වුනේ නැහැ උතුමාණෙනි. මා තමයි එතනින් සහරාන් හොයන්න ගියේ.

ප්‍ර : හරි වාහනය අත්අඩංගුවට ගන්න කියලා ඔබගේ උසස් නිලධාරීන් දෙදෙනා ඔබට දැනුවත් කිරීමක් කලේ නැහැ?

පි : එහෙම දැනුවත් කිරීමක් කලේ නැහැ උතුමාණෙනි, නමුත් මා දන්නවා මේ වාහනය භාරයට ගතයුතුයි කියලා.

ප්‍ර : ඔය වාහනය අපරාධ පරීක්ෂක දෙපාර්තමේන්තුව අත් අඩංගුවට ගන්නේ 2019 පෙබරවාරී 25 වෙනිදා නේද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් යම්කිසි පුපුරණ ද්‍රව්‍යයක් යම් වාහනයක නැත්නම් ස්ථානයක තිබ්බොත් ඒක යම් අවස්ථාවක පිරිසිදු කිරීමක් සිදු වුනොත් රජයේ රස පරීක්ෂකවරයා මාර්ගයෙන් වුනත් ඒ පිළිබඳව තොරතුරු ගැනීමේ අපහසුතාවයක් තිබෙන බව ඔබ දන්නවද?

පි : දන්නවා උතුමාණෙනි.

ප්‍ර : එතකොට මේ වාහනය පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනයට පාවිච්චි කෙරුවා කියලා තොරතුර තිබ්බත් ඒ වාහනය අත්අඩංගුවට ගැනීමක් සිදු වෙන්නේ ඊට දවස් 6 ට පස්සේ නේද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඊට පසුව කරන විමර්ශනවලදි අනාවරණය වෙනවද ඒ වාහනයේ වැසි අංක සම්බන්ධයෙන් යම් තොරතුරක්?

පි : උතුමාණෙනි රස පරීක්ෂකවරයාට යොමු කලාට පස්සේ තමයි වැසි අංකය සම්බන්ධයෙන් අනාවරණය වීමක් වෙන්නේ.

ප්‍ර : මොකක්ද ඒ රස පරික්ෂක ඉදිරිපත් කරපු වාර්තාව?

පි : මගේ මතයේ හැටියට උතුමාණෙනි වැසි අංකය වෙනස් කිරීමක් හරි මොකක් හරි සිදු කිරීමක් කියලා තමයි.

ප්‍ර : වැසි අංකය වෙනස් කිරීමක් සිදු වෙලා තියෙනවා කියලා රජයේ රස පරීක්ෂක වාර්තා කරනවා නේද මේ වාහනය සම්බන්ධයෙන්?

පි : එහෙමයි උතුමානෙනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : එතකොට ඒ වෙනස් කිරීම සිදු වුනේ කොයි වකවානුවේද කියලා හොයාගන්න පුළුවන් වුණාද ඔබට?

පි : ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් කලේ නැහැ උතුමාණෙනි.

ප : ඒ වැසි අංකය වෙනස් කිරීම අර දවස් 6 ඇතුලත වෙන්න පුළුවන් නේද?

පි : කියන්න බැහැ උතුමාණෙනි හරියට.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>

ප : ඔබ කියා සිටියා පූණානි ප්‍රදේශයට ඔබ ගියා කියා?

පි : පූණානි ප්‍රදේශයට ගියා.

ප : ඒ කවද්ද පූණානි ප්‍රදේශයට ඔබ පිටත් වුණේ?

පි : උතුමාණෙනි මාවනැල්ල ප්‍රදේශයේ ඉදලා උතුමාණෙනි එදින මේ වැඩ කටයුතු මාවනැල්ල පොලිසියෙන් අවසන් කරන විට රෑ බෝ වුණා උතුමාණෙනි එදින මාවනැල්ල පොලිසියේ ඉදලා ඊට පහුවදා තමයි පූණිනි ප්‍රදේශයට පිටත් වුනේ.

ප : පූණානි ප්‍රදේශයට ගියේ ඇයි?

පි : උතුමාණෙනි මේ සිද්ධියට සම්බන්ධ දුරකථන විශ්ලේෂණය කිරීමේදී කාදර් නැමැති පුද්ගලයෙකු සම්බන්ධයෙන් පූණානි ප්‍රදේශයේ රිදීතැන්න ප්‍රදේශයේ ලිපිනයක් අනාවරණය වී තිබුණා. ඒ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට තමයි ගියේ.

ප : ඒ කාදර් කියන පුද්ගලයා ඔබලාට පූණානි ප්‍රදේශයේදී අත්අඩංගුවට ගන්න හැකියාව ලැබුණද?

පි : නැහැ උතුමාණෙනි.

ප : ඊට පසුව ඔබලා කුමක්ද සිදු කළේ?

පි : ඒ සම්බන්ධයෙන් උතුමාණෙනි පූණානි පොලිස් මුරපොලටත් ගියා. ගිහිල්ලා ස්ථානාධිපතිතුමාව දැනුවත් කරලා ඊට පස්සේ ග්‍රාම සේවකත් හමු වුණා. ග්‍රාමසේවකටත් දැනුම් දීලා ඊට පස්සේ අපි පැමිණියා ආපහු. ඔහුව හමුවීමට නොහැකි වුණා උතුමාණෙනි.

ප : ඊට පසුව ඔබ මොකද කළේ?

පි : ඊට පස්සේ ග්‍රාමසේවකගේ දැනුම්දීම මත ඒ පුද්ගලයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණියා උතුමාණෙනි.

ප : කවද්ද ඒ?

පි : මගේ මතකයේ හැටියට 2019.02.25 උතුමාණෙනි.

ප : දැන් සාක්ෂිකරු මෙම විමර්ශනයේදී රිස්කාන් කියලා පුද්ගලයෙක් සම්බන්ධයෙන් අනාවරණය වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප : ඒ ඔබද අනාවරණය කර ගත්තේ?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : අපේ විමර්ශන කණ්ඩායම තමයි උතුමානෙනි අනාවරණය කර ගැනීමක් සිදු කළේ.

ප්‍ර : ඒ රික්සාන් සෙවීමට ඔබලා ඔහු පදිංචි ප්‍රදේශයට ගියාද කුළියාපිටියේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ රික්සාන්ව අත්අඩංගුවට ගැනීමට හැකියාවක් ලැබුණද?

පි : රිස්කාන් ඒ වනවිට නිවසේ හිටියේ නැහැ උතුමාණෙනි. ඔහු ලැබුණු තොරතුරු මත ඔය සහරාන් ඇතුළු කණ්ඩායම සමඟ සිටින බව තමයි ලැබුනේ. නමුත් එම ප්‍රදේශයේ ප්‍රචාරය කර තිබුණා ඔහු විදේශගත වුණා කියලා. නමුත් අපි ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කළා විදේශගතවීමක් වුන් නැහැ.

ප්‍ර : සහරාන් සමඟ ඉන්නවා කියලා?

පි : සහරාන් සමඟ ඉන්නවා කියලා තමයි උතුමාණෙනි අනාවරණය වුනේ.

ප්‍ර : මෙම රිස්කාන් සොයා ගැනීමේදි අනාවරණය වුණාද සහරාන් මේ රිස්කාන් සමඟ ඉතා සමීප සම්බන්ධතාවයක් පවත්වලා ඔහුගේ නිවසට පැමිණි බවට?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : සාක්ෂිකරු දැන් ඔබලා මේ සහරාන් ගැන සොයා බැලීමේදී ආමි මොහිදීන් කියලා පුද්ගලයෙකු සම්බන්ධයෙන් සෙවීමට ඔබලා පාසිකුඩා ප්‍රදේශයට ගියාද?

පි : එහෙමයි උතුමාණෙනි ගියා.

ප්‍ර : ඒ පාසිකුඩා ප්‍රදේශයට ඔබලා ගියේ 2019.03.07 වෙනිදා තමයි පාසිකුඩාවට ගියේ කියලා කිව්වොත් හරිද?

පි : හරි උතුමාණෙනි.

ප්‍ර : ඔබට මේ පාසිකුඩා ප්‍රදේශයට ආමි මොහිදීන් හමුවීමට යාමට ඉහළ නිලධාරියෙක් උපදෙස් දුන්නද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කවුද ඒ?

පි : සහකාර පොලිස් අධිකාරී වික්‍රමසේකර මහතා.

ප්‍ර : ඒ සහකාර පොලිස් අධිකාරී වික්‍රමසේකර මහතා ඔබ වෙත ඒ උපදෙස් ලබා දුන්නේ ඔහු වෙත ලැබුණු යම් වාර්තාවක් මතද කියන්න ඔබ දන්නවද?

පි : එහෙම දන්නේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : මොකක්ද ඒ ලැබුණු උපදෙස සහකාර පොලිස් අධිකාරී වික්‍රමසේකර මහතාගෙන්?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : උතුමාණෙනි අපිට පාසිකුඩා ප්‍රදේශයට යන්න කියලා කිව්වා එහිදී රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් හමුවෙයි ඒගොල්ලන් එක්ක සම්බන්ධ වෙන්න කිව්වා.

ප්‍ර : 2019.03.07 ඒ අනුව ඔබ රාජ්‍ය බුද්ධි සේවා නිලධාරීන් හම්බ වුණාද පාසිකුඩා ප්‍රදේශයේදී?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කොහේදී ද හම්බ වුනේ?

පි : පාසිකුඩා ප්‍රදේශයේ මුහුදු තීරයේ. එතන අයිනේ ගස් වගයක් තියෙනවා එතන තමයි එම ස්ථානයේ තමයි උතුමාණෙනි හම්බ වුනේ.

ප්‍ර : ඔබත් සමඟ දැන් මෙම නිලධාරීන් හම්බ වෙන්න ඔබ තනිවමද ගියේ නැත්නම් තවත් නිලධාරීවරයෙක් ගියාද?

පි : නිලධාරීන් කණ්ඩායමක් ගියා උතුමාණෙනි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරීවරුන් හමු වුනේ ඔබ පමණද නැත්නම් ඔබේ නිලධාරී කණ්ඩායම සමඟද?

පි : සියළුම දෙනා උතුමාණෙනි.

ප්‍ර : මෙම නිලධාරී කණ්ඩායමට පොලිස් සැරයන් නන්දලාල් සම්බන්ධ වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔහුගේ අංකය කුමක්ද? පොලිස් සැරයන්, පො.සැ?

පි : 4679

ප්‍ර : ඔබ පෙර කියා සිටියා පො.සැ. 4679 නන්දලාල්ට ද්‍රවිඩ භාෂාව කතා කිරීමේ හැකියාවක් තියෙනවා කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔබ සමඟ ගියපු අනික් නිලධාරීවරුන් කවුද මේ නන්දලාල් යන නිලධාරීවරයාට අමතරව?

පි : ගරු උතුමාණෙනි මා සමඟ පො.සැ.4679 නන්දලාල්, පො.සැ.34836 විජේරත්න, පො.කො. 92170 දිසානායක යන නිලධාරීන් සමඟ ගියේ උතුමාණෙනි

ප්‍ර ; දැන් මේ රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරීන් පාසිකුඩා මුහුදු තීරයේදී හමු වුණාට පසුව යම් තොරතුරක් ලැබුනාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මොකක්ද ඔබලාට දන්වා සිටියේ? ඔබට මුණ ගැසිච්ච රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරීන්වරුන් දෙදෙනා කවුද කියන්න නම් වශයෙන් කියන්න ඔබ දන්නවද? ඔව් ද නැද්ද?

පි : නම් වශයෙන් දන්නේ නැහැ උතුමාණෙනි, නමුත් මගේ මතකයේ තියෙනවා බණ්ඩාර කියලා මහත්මයෙක් හිටියා කියලා.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ මෙම ආමි මොහිදීන් සොයා ගැනීමට පාසිකුඩා ගිය අවස්ථාවේදි ඒ කරපු රාජකාරිය ගැන සටහන් යෙදුවද ඔබ?

පි : සටහන් යෙදුවා උතුමාණෙනි.

ප්‍ර : එම සටහන්වල ඔබ මුණ ගැසුනු රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරිවරයා හෝ වරුන් කවුද කියලා ඔවුන් නම් හෝ අංකයක් සඳහන් කළාද?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් මේ නිලධාරීවරුන් කුමක්ද ඔබට දන්වා සිටියේ?

පි : උතුමාණෙනි ආමි මොහිදීන් කියන පුද්ගලයෙක් ඒ පාසිකුඩා ප්‍රදේශයේ තියෙන පොල්වත්තක කණ්ඩායම් පුහුණු කිරීමක් සිදු කරන බවත්. අවි ආයුධ සම්බන්ධයෙන් කටයුතු කරන බවත් තමයි දැනුම් දුන්නේ. ඊට අමතරව රාජ්‍ය බුද්ධි සේවාවේ මහත්තයා මගේ ජංගම දුරකථනයට කතා කලා. ඔහුත් මට විස්තර ලබා දුන්නා.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවාවේ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙක් ඔබට කතා කළා කිව්වානේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔහු කුමක්ද ඔබට දන්වා සිටියේ?

පි : ඔහුත් පවසා සිටියේ උතුමාණෙනි අර අපිට හමු වුන නිලධාරීන්ගේ විස්තර ලබා ගන්න කිව්වා. ඒ ස්ථානයත් ඔහු පෙන්වා සිටියි කිව්වා උතුමානෙනි.

ප්‍ර : මොන ස්ථානයක්ද?

පි : ආමි මොහිදීන් සිටින පොල්වත්ත උතුමාණෙනි.

ප්‍ර : තව මොනවද කිව්වේ?

පි : ප්‍රධාන පොලිස් පරීක්ෂක හේරත් මහත්තයා කිව්වා ආමි මොහිදීන් පුද්ගලයට වරෙන්තුවක් තියෙනවා කියලා උතුමාණෙනි.

ප්‍ර : දැන් මේ තොරතුරු ඔබලාට ලැබුණාම ආමි මොහිදීන් පදිංචි වෙලා හිටපු පොල් වත්ත රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරීන් ඔබ හට පෙන්වා සිටියද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔබ ඒ අනුව එම පොල්වත්ත තුල තිබෙන ඒ නිවසට ගියාද?

පි : ගියා උතුමාණෙනි.

ප්‍ර : දැන් ඒ පෙන්වා සිටි පොල්වත්ත පිහිටලා තිබ්බේ කොහේද? පාසිකුඩා ප්‍රදේශයේද?

පි : පාසිකුඩා ප්‍රදේශයෙන් තාරපාර දිගේ තව පොඩ්ඩක් ඉදිරියට යන්න ඕන, මගේ මතකයේ හැටියට කිලෝ මීටර් 2 ක් පමණ යන්න ඇති. ඒ තාර පාරෙන් පොල්වත්තේ එක පැත්තක් තාර

FAIR COMMENT BY JEZEEM

පාරටත් අනික් පැත්ත මුහුදු වෙරළටයි තමයි මායිම් වෙලා තිබුණේ උතුමානෙනි.

ප්‍ර : ඒ කියන්නේ මේ පොල්වත්ත මුහුදු වෙරළට මායිම් වූ

පි : පොල්වත්තක් ගරු උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔය ප්‍රදේශයේ සාමාන්‍යයෙන් සංචාරක නිකේතන, හෝටල් තිබෙන බව ඔබ දන්නවද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : යුද හමුදාව විසින් පවත්වාගෙන යන සංචාරක හෝටලයක් ඒ ආසන්නයේ තියෙනවද?

පි : එහෙම නම් දන්නේ නැහැ.

ප්‍ර : දැන් සාක්ෂිකරු දැන් එම පොල්වත්ත තුළ මොකක්ද පිහිටලා තිබ්බේ?

පි : උතුමාණෙනි එම පොල්වත්ත තුළ කුඩා නිවසක් තිබුණා උතුමාණෙනි.

ප්‍ර : ඔබලා ඒ නිවසට ගියාද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : 2019.03.07 ද ඒ ගියේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කීයටද ගියේ?

පි : මගේ මතකයේ හැටියට උතුමාණෙනි 12.45 ට 1 ට වගේ තමයි ගියේ.

ප්‍ර : දහවල්?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එම නිවසේ කවුද හිටියේ?

පි : ඒ නිවසේ හිටියා උතුමාණෙනි වයසක විශ්‍රාමික ජෝඩුවක් හිටියා උතුමාණෙනි.

ප්‍ර : මොන ජාතිකයන්ද?

පි : මුස්ලිම් ජාතිකයන් උතුමාණෙනි.

ප්‍ර : ඔබ ඔවුන්ට කතා කලාද?

පි : කතා කලා උතුමාණෙනි.

ප්‍ර : කුමක්ද ඔබ විමසා සිටියේ?

පි : අපි මුලින්ම අනන්‍යතාවය පැහැදිලි කළා උතුමාණෙනි අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ කියලා. ඉන්පස්සේ ආමි මොහිදීන් සම්බන්ධයෙන් විමසීම් කලා.

ප්‍ර : එම නිවසේ එම අවස්ථාවේදී ආමි මොහිදීන් හිටියද?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : ඒ ප්‍රශ්න කිරීමේදි ආමි මොහිදීන් එම නිවසේ සිටින බව අනාවරණය වුණාද පදිංචි වෙලා ඉන්නවා කියලා?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔබලා දැන් ඒ ආමි මොහිදීන් එම නිවසේ සිටියේ නැහැ නේ ඔබලා යන කොට. ඔහු යම් අවස්ථාවක එම නිවසට ආවද?

පි : එහෙමයි උතුමාණෙනි. පැය 1 ½ ට 2 ට විතර පස්සේ යතුරුපැදියකින් පැමිණියා.

ප්‍ර : කොහොමද ඔහු පැමිණියේ කවුරු හරි දැනුම් දුන්නද?

පි : ගෙදර හිටපු පුද්ගලයෝ කිව්වා මෙහෙම ඇවිල්ලා ඉන්නවා කියලා

ප්‍ර : කවුරු ඇවිල්ලා ඉන්නවද කිව්වේ?

පි : CID එකෙන් ඇවිල්ලා ඉන්නවා කිව්වා.

ප්‍ර : CID එකෙන් ඇවිල්ලා ඉන්නවා කිව්වාම එතකොට ආවා?

පි : එහෙමයි උතුමානෙනි.

ප්‍ර : ඔබ මෙම ආමි මොහිදීන් පදිංචි නිවසට යනවිට ඔබ හෝ ඔබගේ කණ්ඩායමේ ගිය කිසියම් හෝ නිලධාරීවරයෙකුට මේ ආමි මොහිදීන් සමඟ සම්බන්ධතාවයක් තිබුණාද නැද්ද කියලා ඔබට කියන්න පුළුවන්ද?

පි : එහෙම මම දන්නේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් ආමි මොහිදීන් ඔබලා හමුවට පැමිණි බව කියා සිටියා පැය 2 ට විතර පස්සේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ ආමි මොහිදීන් මෙම ස්ථානයට ආවට පසුව ඔබ ඔහු සමඟ කතා කලාද?

පි : කතා කළා උතුමාණෙනි.

ප්‍ර : මොන භාෂාවෙන්ද කතා කලේ?

පි : ඔහුට උතුමාණෙනි සිංහල කතා කරන්න පුළුවන්. ද්‍රවිඩ භාෂාවත් පුළුවන් උතුමාණෙනි.

ප්‍ර : ඔබ ඔහුගෙන් ප්‍රශ්න කරමින් සිටියද?

පි : මාත් කතා කලා උතුමාණෙනි.

ප්‍ර : විමසා සිටියේ කුමක්ද ඔබ ඔහුගෙන්?

පි : උතුමාණෙනි අපි රාජ්‍ය බුද්ධි සේවයෙන් ලබාදුන් තොරතුරු සම්බන්ධයෙන් තමයි ඔහුගෙන් ප්‍රශ්න කර සිටියේ උතුමාණෙනි.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවාවෙන් මොකක් ද ලැබුණ තොරතුර?

පි : උතුමාණෙනි ඔහු කණ්ඩායම් පුහුණු කරනවා කියන තොරතුරුයි, ඔහු භාරයේ weapon තියෙනවා කියන තොරතුරකුයි ලබා දුන්නා උතුමාණෙනි ඒ සම්බන්ධයෙන් තමයි අපි පරීක්ෂා කලේ.

ප්‍ර : ඊට අමතරව ඔහු සහරාන් කියන පුද්ගලයා සමඟ තිබෙන සම්බන්ධතාවය ගැන රාජ්‍ය බුද්ධි සේවයෙන් ඔබලාට අනාවරණය කරලා තිබ්බද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සහරාන් සමඟ තමයි ඔහු මේ කණ්ඩායම් පුහුණුවීම් කරනවා කියලා තමයි බුද්ධි සේවයෙන් අපට තොරතුරු දුන්නේ ස්වාමිනි. නමුත් ඒ සම්බන්ධයෙන් අපි ප්‍රශ්න කිරීම් කලා උතුමාණෙනි.

ප්‍ර : වරෙන්තුවක් තියෙනවා මේ තැනැත්තාට විරුද්ධව ඊට අමතරව සහරාන් සමඟ පුහුණුවීම් යුධ පුහුණුවීම් සිදු කරන බව තමයි ඔබලට තොරතුරු ආවේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : සහ මෙම තැනැත්තා ගාව අවි ආයුධ තියෙන බවටත් තොරතුරේ සඳහන්ව තිබුණා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ අනුව ඒ පුද්ගලයෝ අත්අඩංගුවට ගත්තද?

පි : නැහැ උතුමාණෙනි ඔහුගේ නිවසයි වත්තයි පරික්ෂා කළා. කිසිම සැක කටයුතු දෙයක් හමු වුණේ නැහැ.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු එවැනි තොරතුරක් ලැබුණායින් පස්සේ තමන්ලා පරීක්ෂා කරලා බැලුවත් වැඩිදුර පරීක්ෂණ සඳහා එවැනි පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම කරනවා නේද?

පි : ගරු උතුමාණෙනි සාක්ෂි නොමැති නම් අත්අඩංගුවට ගැනීමට හැකියාක් නැහැ උතුමාණෙනි.

ප්‍ර : සාක්ෂි එවේලාවේම හම්බ වෙන්නේ නැහැනේ සමහර අවස්ථාවල. සාමාන්‍යයෙන් පරීක්ෂණවලදි, අපරාධ පරීක්ෂණවලදි එම අවස්ථාවේදි නැති වුණත් වැඩිදුර පරීක්ෂණ සඳහා කියලා ඔහුව රැගෙන ගොස් ඒ ගැන තවදුරටත් තමන්ගේ ස්ථානයේ තියාගෙන පරීක්ෂණ කරනවානේද? ප්‍රශ්න කරනවානේ, ඔහුගේ ස්ථානයේ නෙමෙයි තමන්ගේ ස්ථානවලට ගෙන ගොස් ප්‍රශ්න කරනවානේ අපරාධ පරීක්ෂණවලදී?

පි : ගරු උතුමාණෙනි අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් සාක්ෂි තිබුණ අවස්ථාවලදි ඒ ආකාරයට කටයුතු කරනවා.

ප්‍ර : ඒ වුණාට බුද්ධි තොරතුරක් බුද්ධි අංශවලින් ලැබුණු තොරතුරක් මතනේ තොරතුරක්නේ ලැබුනේ තමන්ලට, එවැනි අවස්ථාවකදි ඒ බුද්ධි තොරතුර ගැන විශ්වාසයක් තබලා වැඩිදුර පරීක්ෂණ කරන්නේ නැද්ද?

පි : බුද්ධි තොරතුර උතුමාණෙනි පරික්ෂා කරලා ඒක නිවැරදි නම් ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවා. නමුත් ඒ සම්බන්ධයෙන් සාක්ෂි නොමැති නම් අත්අඩංගුවට ගැනීමක් කරන්නේ නැහැ උතුමාණෙනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : තමන් ඒ පරීක්ෂා කලේ එතනට ගිහිල්ලා ඒ අවස්ථාවේදී ඔහුගෙන් ප්‍රශ්න කරලා නිවස සෝදිසි කිරීම පමණයිනේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඊට වැඩිය වැඩිදුර පරීක්ෂණයක් කලේ නැහැනේ?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : එහෙම නෙමෙයිනේ හැම අපරාධයකදීම සිදු වෙන්නේ. අපරාධ පරීක්ෂණවලදි සිදු වෙන්නේ සමහර අවස්ථාවලදි. සමහර අවස්ථාවලදි තමන්ලගේ ස්ථානයට ගෙන ගොස් වැඩිදුර හරස් ප්‍රශ්න අහලා, ඊලඟට දින කිහිපයක් තබාගෙන පරීක්ෂා කරලා තමයි ඔහුව එහෙම සාක්ෂි නැත්නම් මුදා හරින්නේ, එහෙම නේ සාමාන්‍යයෙන් පරීක්ෂණවලදි අපරාධවලදි තමන්ලගේ පොලිසිවල කෙරෙන්නේ ඒකයි ඇහුවේ. නමුත් ඒ අවස්ථාවේදි මුදා හැරියා ඔහු අත්අඩංගුවට ගත්තේ නැහැ සාක්ෂි නැහැයි කියලා?

පි : අත්අඩංගුවට ගත්තේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : ඒ අවස්ථාවේදීම තමන්ලා තීරණය කළා සාක්ෂි නැහැයි කියලා?

පි : ඒ අවස්ථාවේ කිසිම සාක්ෂියක් නොමැති නිසා අත්අඩංගුවට ගැනීමක් කලේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : වරෙන්තුවක් තිබෙන බවක් තමාලා දැනගෙන හිටියානේ?

පි : වරෙන්තුවක් තිබෙන බවට තොරතුරු තිබුණා උතුමාණෙනි, නමුත් අත්අඩංගුවට ගැනීමක් සිදු කලේ නැහැ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>

ප්‍ර : ඔබ ආමි මොහිදීන්ව අත්අඩංගුවට ගැනීමට ක්‍රියා කලේ නැහැ කියලා කියා සිටියා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔහුගෙන් ප්‍රශ්න කිරීමේදී ඔහු සම්බන්ධයෙන් සැකයක් ඔබට ඒ අවස්ථාවේදී ඇති වුණාද අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 31 වගන්තිය යටතේ ඔහු අත් අඩංගුවට ගැනීමට සාධාරණ සැකයක් ඔබට ඇති වුණාද?

පි : අපි සිදු කරන විමර්ශනයට අදාලව සැකයක් ඇති වුණේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් මේ රාජ්‍ය බුද්ධි සේවාවෙන් මේ තැනැත්තාට විරුද්ධව වරෙන්තුවක් තිබෙන බව ඔබට දැනුම් දුන්නා කිව්වානේ. දැන් ඒ වරෙන්තුව ගැන ආමි මොහිදීන් හමුවන අවස්ථාවේදි ඒ වරෙන්තුව කුමන පොලිස් ස්ථානයකින් ලබාගෙන තිබ්බද කියලා දැනුමක් තිබ්බද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : මගේ මතකයේ හැටියට උතුමාණෙනි කාත්තන්කුඩි පොලිසියෙන් විය යුතුයි.

ප්‍ර : ඒ වරෙන්තුවේ පිටපතක් ඔබ භාරයේ තිබුණද ඒ වෙලාවේ?

පි : නැහැ උතුමාණෙනි

ප්‍ර : එය දින වරෙන්තුවක්ද, විවෘත වරෙන්තුවක්ද කියන්න ඔබට දැනීමක් තිබ්බද?

පි : මම දන්නේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් මෙවැනි වරෙන්තුවක් දැන් පොලිස් නිලධාරිවරයෙක් ඔබ වෙත දන්වා සිටියොත් එහි සත්‍ය අසත්‍යතාවය පරීක්ෂා කිරීමට ඔබ කටයුතු කලාද?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : අවම වශයෙන් ඔබ පියවර ගත්තද ඒ ගැන කාත්තන්කුඩිය පොලිස් ස්ථානයට දැනුම් දෙන්න?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : කටයුතු කලේ නැහැ, එයට හේතුවක් තියෙනවද?

පි : හේතුවක් නැහැ උතුමාණෙනි, මේ විමර්ශන රාජකාරියෙක්දි දිගටම යෙදී සිටිය බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න බැරි වුණා උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔබලා මෙම ආමි මොහිදීන්ගෙන් ප්‍රශ්න කලානේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ අවස්ථාවේදි විමසා සිටියද ඔහුගෙන් මේ සහරාන් කියන පුද්ගලයා කොහේද ඉන්නේ, මොනවද කරන්නේ යන කාරණය ගැන?

පි : එහෙමයි උතුමාණෙනි දීර්ඝ වශයෙන් ඒ සම්බන්ධයෙන් තමයි විමසීම් කලේ උතුමාණෙනි.

ප්‍ර : ප්‍රකාශයක් සටහන් කලාද?

පි : ප්‍රකාශයක් මුලින් සටහන් කළා උතුමාණෙනි මා සමඟ ගිය නිලධාරියෙක්.

ප්‍ර : දීර්ඝ ප්‍රකාශයක්ද, කෙටි ප්‍රකාශයක්ද?

පි : ඒක ඔහු ලබා දුන්නේ කට උත්තරයට කෙටි ප්‍රකාශයක් උතුමාණෙනි මෙම සිද්ධිය සම්බන්ධයෙන්.

ප්‍ර : මොන සිද්ධියද?

පි : සහරාන් සම්බන්ධයෙන් තමයි උතුමාණෙනි ප්‍රකාශය සටහන් කලේ.

ප්‍ර : එතකොට දැන් මේ සහරාන් කියන පුද්ගලයා තමන් දන්න බව කියා සිටියද ආමි මොහිදීන්?

පි : උතුමාණෙනි 2017 ට පෙර ඔහු සමඟ සිටිය බවත්, 2017 න් පසු ඔහුට මුණගැසුනේ නැති බව තමයි කියා සිටියේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : දැන් ආමි මොහිදීන්ගෙන් ඔබලා ඉල්ලා සිටියද සහරාන් සම්බන්ධයෙන් යම් තොරතුරක් තියෙනවා නම් ඔබලා වෙත ඉදිරිපත් කරන්න?

පි : එහෙමයි උතුමාණෙනි ඔහු යුද හමුදාවේ සේවය කරපු පුද්ගලයෙක් බවට අනාවරණය වුණා. ඔහු කියා සිටියා සහරාන් සම්බන්ධයෙන් ඔහු කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙක්, බොහෝ තොරතුරු සොයලා බලලා ලබාදීමේ හැකියාව ඔහුට තියෙනවා කියලා උතුමාණෙනි.

ප : එවැනි තොරතුරක් ලැබුනොත් ඔබලා වෙත දන්වන්න කියා ඔබලා කියා සිටියද?

පි : එහෙමයි උතුමාණෙනි මගේ ජංගම දුරකථන අංකයත්, නන්දලාල්ගේ ජංගම දුරකථන අංකයත් ලබා දුන්නා උතුමාණෙනි.

ප : ඔබේ මොන දුරකථන අංකයද ලබා දුන්නේ?

පි : ගරු උතුමාණෙනි මේ විමර්ශනය පුරාවටම මට එක ජංගම දුකථනයයි තියෙන්නේ.071 ...

ප : අවශ්‍ය නැහැ, ඔබේ ජංගම දුරකථන අංකයක්ද නැත්නම් ලෑන්ඩ් ලයින් කියන්නේ ස්ථාවර දුරකථන අංකයක්ද ලබා දුන්නේ?

පි : මගේ ජංගම දුරකථනය අංකය. පුද්ගලික ජංගම දුරකථන අංකය කුමක්ද?

ප : මොකක්ද ඔබේ දුරකථන අංකය?

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ඔහු ලේඛනයක ලියා ඉදිරිපත් කරයි. එය ඔහුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් වියයුතු බවට ලඝු ලේඛිකාවට නියෝග කරමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>

පි : 071- 6176057

ප : ඔබගේ ජංගම දුරකථන අංකයත්, පොලිස් සැරයන් නන්දලාල්ගේ ජංගම දුරකථන අංකයත් ලබා දුන්න බවයි ඔබ කියා සිටියේ?

පි : මගේ මතකය හැටියට ලබා දුන්නා උතුමාණෙනි.

ප එසේ ජංගම දුරකථන අංකයන් ලබා දුන්නට පසුව ඔබලා එම ස්ථානයෙන් පිටත් වුණාද?

පි : එහෙමයි උතුමාණෙනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ 2019.03.07 වෙනිදායින් පසුව කිසියම් අවස්ථාවක මේ ආමි මොහිදීන් ඔබ වෙත දුරකථන ඇමතුමක් ලබා දුන්නද නැද්ද කියලා මතකයක් තියෙනවද?

පි ; එහෙම නම් මතකයක් නැහැ ස්වාමිණි.

ප්‍ර : ඔහු සහරාන් සම්බන්ධ කිසියම් හෝ තොරතුරක් ඔබලා වෙත ලබා දුන්නද?

පි : නැහැ උතුමාණෙනි ලබා දුන්නේ නැහැ.

ප්‍ර : ඔබට දැනීමක් තියේද ආමි මොහිදීන් අවම වශයෙන් පොලිස් සැරයන් නන්දලාල් සමඟ සම්බන්ධ වුණාද නැද්ද කියන්න?

පි : එහෙම නම් මට කිසිම අවස්ථාවක දැනුම්දීමක් කලේ නැහැ.

ප්‍ර : ඔබ වෙත දැනුම්දීලා නැහැ

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : සාක්ෂිකරු ඔබට සහකාර පොලිස් අධිකාරී වික්‍රමසේකර තමයි මේ ආමි මොහිදීන් සම්බන්ධයෙන් වන තොරතුර ලබා දුන්නේ ප්‍රථමයෙන්?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔබ මෙම ආමි මොහිදීන් සමඟ කතා කරලා ඒ සම්බන්ධයෙන් නැවත වාර්තා කලාද සහකාර පොලිස් අධිකාරීතුමාට?

පි : එහෙමයි උතුමාණෙනි. ASP වික්‍රමසිංහ මහත්තයට මම දැනුම් දුන්නා.

ප්‍ර : ඔබ දැනුම් දුන්නද මේ වරෙන්තුවක් තියෙන මේ පුද්ගලයාව ඇයි අත්අඩංගුවට ගත්තේ නැත්තේ කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : මොකක්ද ඔබ දැනුම් දුන්නේ?

පි : මෙහෙම වරෙන්තුවක් තියෙන තොරතුරු තියෙනවා. ඒක කාත්තන්කුඩි පොලිසියෙන් බවට තමයි තොරතුරු තියෙන්නේ. නමුත් මෙයා සහරාන් සම්බන්ධයෙන් සොයලා මෙහෙම විස්තර ලබා දෙන්නම් කියලා කිව්වා. ඔහුට යම්කිසි හැකියාවක් තියෙන බව පේනවා, ඔහු කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙක් බවට තමයි කිව්වේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

සාක්ෂිකරු ඔබ සාක්ෂි ලබා දෙන්නේ දිවුරුම් පිට. ඔබ මේ කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට මීට පෙර මේ සම්බන්ධයෙන් ප්‍රකාශ ලබා දීලා තියෙනවා. ඔබ දන්නවා ඔබ එතන මොනවද කියලා තිබෙන්නේ කියා. ඒක හින්දා නිවැරදි කරුණු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න.

පි එහෙමයි උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා:</u>

ප්‍ර : ඔබ ඔබගේ ඉහළ නිලධාරීවරයා වන සහකාර පොලිස් අධිකාරී වික්‍රමසේකර මහතාට ආමි මොහිදීන් මුණගැසුණ බව සහ ඔහුව තොරතුරුකරුවෙක් වශයෙන් පාවිච්චි කරන්න යන බව සහ ඔහු අත්අඩංගුවට ගත්තේ නැති බව වාර්තා කළාද නැද්ද?

පි : ගරු උතුමාණෙනි ඒ සම්බන්ධයෙන් දැනුම්දීමක් කළා උතුමාණෙනි.

ප්‍ර : සාක්ෂිකරු දැන් ඔබ සාක්ෂි දෙමින් කිව්වේ සහකාර පොලිස් අධිකාරි වික්‍රමසේකර තමයි ආමි මොහිදීන් සම්බන්ධයෙන් වන තොරතුර ඔබට දීලා ඒ ගැන පරීක්ෂා කිරීමට ඔබව යොමු කලේ කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔබ එම විමර්ශනය සිදු කරලා නැවත ඒ ගැන නිලධාරීවරයෙකුට වාර්තා කළාද?

පි : එහෙමයි උතුමාණෙනි අපි එහෙන් පිටත් වෙන කොටත් අපි ASP වික්‍රමසේකර මහත්තයා හමුවෙලා පිටත් වුනේ. එසේම අපි විශේෂ විමර්ශන අංශ 2 තමයි පිටවීමේ සටහන් දාන්නේ. එතකොට පොලිස් පරීක්ෂක මාරසිංහ මහතාත් දැනුවත්ව හිටියා උතුමාණෙනි.

ප්‍ර : දැන් නැවත කොළඹට ආවට පස්සේ ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීමක් කලාද ලිඛිතව?

පි : ලිඛිතව වාර්තා කිරීමක් කලේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : ආමි මොහිදීන් තොරතුරුකරුවෙක් වශයෙන් ඔබ පාවිච්චි කරන්න යනවා කියන කාරණය පොලිස් පරීක්ෂක මාරසිංහට දැනුම් දුන්නද වහාම?

පි : උතුමාණෙනි වාචිකව දැනුම් දුන්නා.

ප්‍ර : ලිඛිතව දැනුම් දුන්නේ නැහැ?

පි : නැහැ උතුමානෙනි.

ප්‍ර : සහකාර පොලිස් අධිකාරී වික්‍රමසේකර මහත්තයට දැනුම් දුන්නද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කොහොමද ලිඛිතවද වාචිකවද?

පි : ඒකත් වාචිකව කිව්වේ උතුමාණෙනි.

ප්‍ර : දැන් වරෙන්තුකරුවෙකු, වරෙන්තුවක් තියෙන පුද්ගලයෙකු තොරතුරුකරුවෙක් වශයෙන් පාවිච්චි කිරීමට හැකියාවක් තියෙනවද පොලිසියට?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ගරු උතුමාණෙනි මෙම විමර්ශනය ඉතා සංකීර්ණ විමර්ශනයක් උතුමාණෙනි. කොයි ආකාරයකින් හෝ මේ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම තමයි අපේ ඉලක්කය වුනේ.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු මෙම ආමි මොහිදීන් මීට පෙර තොරතුරුකරුවකු වශයෙන් යොදාගෙන තිබෙනවද කියලා ඔහු කිව්වද නැත්නම් තමන්ට විමර්ශනවලදී හෙළිවුණාද?

පි : මීට පෙර තොරතුරුකරුවෙක්ව හිටිය විච්චියක් මම දන්නේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : තොරතුරුකරුවෙක්ව හිටියාද කියලා තමන් දන්නේ නැහැ?

පි : දන්නේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : තමන්මයි තීරණය කලේ තොරතුරුකරුවෙක් වශයෙන් පුළුවන් කියලා?

පි : උතුමාණෙනි ඔහුගෙන් ප්‍රශ්න කිරීම්වලදි යම්කිසි කාත්තන්කුඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙක් නිසා මමයි උතුමාණෙනි තීරණය කලේ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>:

ප්‍ර : ඔබයි තීරණය කලේ?

පි : මම තීරණය කලේ උතුමාණෙනි මේ සම්බන්ධයෙන් ASP මහත්තයාටත් දැනුම් දුන්නා උතුමාණෙනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු විවෘත වරෙන්තුවක් නිකුත් කරන්නේ කවුද?

පි : මහේස්ත්‍රාත්වරයෙක් උතුමාණෙනි.

ප්‍ර : දින වරෙන්තුවක් නිකුත් කරන්නේ කවුද?

පි : මහේස්ත්‍රාත්වරයෙක්.

ප්‍ර : එතකොට ඒක අධිකරණ නියෝගයක්ද?

පි : එහෙමයි ස්වාමිණි.

ප්‍ර : එතකොට අධිකරණ නියෝගයක් ගැන දැනගෙන ඒ සම්බන්ධව ක්‍රියා කරන්නේ නැතුව පොලිස් නිලධාරියෙකුට ඉන්න පුළුවන්ද?

පි : ගරු උතුමාණෙනි ඒ අවස්ථාව වෙන කොට වරෙන්තු පිටපතක්වත් අපි ලඟ තිබුණේ නැහැ උතුමාණෙනි. තොරතුරක් පමණයි තිබුණේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : හරි අපි හිතමුකෝ 2019 මාර්තු 07 වෙනිදා වෙන කොට වරෙන්තුව තිබ්බේ නැහැ කියලා, රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් ඔබව දැනුවත් කෙරුවනේ කාත්තන්කුඩි පොලිස් ස්ථානයේදි වරෙන්තුව තියෙනවා කියලා?

පි : එහෙමයි ස්වාමීණි.

ප්‍ර : එතකොට මාර්තු 07 වෙනිදායින් පස්සේ ඒ වරෙන්තුවේ පිටපතක් ලබා ගන්න ක්‍රියා කෙරුවේ නැද්ද?

පි : ගරු උතුමාණෙනි දීර්ඝ වශයෙන් මේ විමර්ශන රාජකාරීවල යෙදී හිටියා උතුමාණෙනි. අපි මේක 4, 5 දෙනෙක් තමයි මේ සෑමදාම මේ විමර්ශන රාජකාරීවල යෙදී සිටියේ උතුමාණෙනි. ඒ වැඩ කොටසවත් කර ගන්න බැරි තත්ත්වයට පත්වෙලා තිබුනේ උතුමාණෙනි.

ප්‍ර : කාත්තන්කුඩි පොලිසියට දුරකථන ඇමතුමක් ලබලා දීලා ඕක ගන්න තිබ්බා නේද?

පි : ලබා ගන්න තිබුණා ස්වාමීණි. ඒ සම්බන්ධව අවධානයක් යොමු කරන්න බැරි වුණා ස්වාමිනි වැඩ රාජකාරී නිසා උතුමාණෙනි.

ප්‍ර : ඔබ පිළිගන්නවද දින වරෙන්තුවක් තිබෙන තැනැත්තෙක් සම්බන්ධයෙන් දැනුම ඇතුව ඒ සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීම නීතියට පටහැනියි කියලා?

පි : ගරු උතුමාණෙනි ඒක මට මේ අවස්ථාවේදී මට පැහැදිලි වෙනවා.

ප්‍ර : මේ අවස්ථාවේදී පැහැදිලි වෙනවා?

පි : එහෙමයි උතුමාණෙනි.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප්‍ර : තමන්ගේ විමර්ශනවලදි හෙළිවුණාද මෙම ආමි මොහිදීන් නැමැත්තා හමුදාවෙන් ගියායින් පසුව හමුදාවට සම්බන්ධවෙලා LTTE එක සම්බන්ධව තොරතුරු සැපෙව්වා කියලා?

පි : එහෙම දන්නේ නැහැ උතුමාණෙනි.

****

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:</u>

ප්‍ර : මහත්මයා තමුන්ට රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරීන්ගෙන් තොරතුර ලැබුණේ ඉස්ලාම් අන්තවාදී ක්‍රියාවන්ට සම්බන්ධ පුද්ගලයෙක් තමයි කියලා මේ ආමි මොහිදීන් එහෙම නේද? ඒ විදියට නේද ලැබුණේ?

පි : එහෙම වෙන්න ඇති උතුමාණෙනි. අන්තවාදියා සම්බන්ධයෙන් කතාවක් තිබුණා ස්වාමීණි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : කතාවක් තිබුණා කියන්න එපා තමුන්ට හරිට ලැබිච්ච තොරතුරු මොකක්ද මෙවැනි පුද්ගලයෙක් අත්අඩංගුවට ගැනීමට, තමන් කාත්තන්කුඩියේ ඉදලා නෙමෙයි ගියේ කොළඹ ඉදලා ගියේ, තමුන්ට නිසි තොරතුරක් ඇතුව නේද ගියේ තමුන් ඒහේට?

පි : මගේ මතකයේ හැටියට ඔවුන් weapon පරිහරණය කරන එකයි, කණ්ඩායම් පුහුණු කරන එකයි මා හට ප්‍රධාන වශයෙන් මතක තිබුණේ.

ප්‍ර : හරියටම හරි, එතකොට කණ්ඩායම් පුහුණු කරනවා, ඉස්ලාම් අන්තවාදී කටයුතුවල යෙදෙනවා, තුවක්කු වගේ පුපුරණ ආයුධ තියෙනවා එවැනි තොරතුරක් එක්ක තමුන් ඒ ගෙදරට ගිහිල්ලා ආමි මොහිදීන් සමඟ කතාබහ කරලා ඔහු අත්අඩංගුවට ගන්නේ නැතුව ඒ අවස්ථාවේදි තමුන් ආවේ තමුන් අතින් ලොකු වැරැද්දක් සිදු වෙලා තියෙන බව පේනවා නේද?

පි : ගරු උතුමාණෙනි, මා ඒ අවස්ථාවේදී අපි විමර්ශනය කලේ උතුමාණෙනි මාවනැල්ල බුදු පිළිමවලට හානී කිරීම සහ වනාතවිල්ලුව සම්බන්ධයෙන් උතුමාණෙනි. එතකොට එම සිද්ධි දෙකටම උතුමාණෙනි අපේ විමර්ශනවලදි ආමි මොහිදීන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් අනාවරණය වීමක් වුනේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : තමුන්ට අනාවරණය නොවුනත් තමුන් රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන්ගෙන් ලද තොරතුරක් නේද තමුන්ව තකහනියක් කොළඹ ඉදලා කැඳවලා තිබුණේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : එතකොට තමුන්ට යුතුකමක් තිබුණානේ අත්අඩංගුවට ගිය මනුස්සයා අත්අඩංගුවට නොගෙන ආපහු එන්නේ නැතුව අත්අඩංගුවට ගන්න තිබුණානේ එදා?

පි ගරු උතුමාණෙනි පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීමට නම් ඔහුට විරුද්ධව යම්කිසි ප්‍රමාණවත් සාක්ෂි තියෙන්න ඕන උතුමාණෙනි. එහෙම තොරතුරක් මත අත්අඩංගුවට ගැනීමට හැකියාවක් නැහැ උතුමාණෙනි.

ප්‍ර : තමුන් කියන්නේ නිති පොත්වල තියෙන දේ නේ, නමුත් මෙවැනි අපරාධකාරයෙක් සාක්ෂි ඔක්කොම හොයා ගෙන ගන්න ඉදලා නේද මේ අපරාධය සම්පූර්ණයෙන්ම සිද්ධ වෙලා අප්‍රේල් 21 මිනිස්සු 300 ට ජීවිත නැති වුණේ? මොකද තමුන් ඒ ගැන කියන්නේ? එදා තමුන් ආමි මොහිදීන්ව අත්අඩංගුවට ගත්තා නම් මේ ප්‍රහාරය යම් ආකාරයකට වළක්වා ගන්න හැකියාවක් තිබුණා කියලා දැන් තමුන්ට හිතෙන්නේ නැද්ද?

පි : ඒක මට කීමට හැකියාවක් නැහැ උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : තමුන් හිතනවාද තමුන් එදා කලේ හරි දෙයක් කියලා, ආමි මොහිදීන් අතටත් අහුවෙලා ඔහුත් එක්ක කතබහ කරලා ඔහු අතහැරපු එක හරියි කියලා අද හිතනවද?

පි : ගරු උතුමාණෙනි ඔහු මෙම සිද්ධිවලට සම්බන්ධ බවට තොරතුරු තිබුණේ නැති හින්දා මම අත්අඩංගුවට ගැනීමක් කලේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : මම ඒක නෙමෙයි අහන්නේ, එදා තමුන් අත්අඩංගුවට ගත්තේ නැති එක වරදක් හැටියට අද පේන්නේ නැද්ද? අද තමුන්ට දකින්න බැරිද?

පි : මට ඒ සම්බන්ධයෙන් කියන්න බැහැ උතුමාණෙනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

දිවා ආහාරය සදහා කොමිෂන් සභාවේ කටයුතු පස්වරු 2 තෙක් කල් තබනවා.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව.2.20
පෙර සටහන්: ල/ලේ දම්මිකා
මෙතැන් සිට: චන්දිමා දිල්හානි.

දිවා විවේකයෙන් පසු සාක්ෂිකරු ප්‍රතිඥා දී නැවත කැඳවනු ලැබේ.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ කියා සිටියා මේ ආමි මොහොදින් සම්බන්ධයෙන් ඔබ 2019 03.07 වෙනිදා ගිහිල්ලා ඔහු සම්බන්ධයෙන් විමසලා හිටියා කියලා?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: දැන් ඔබ කිසියම් හෝ අවස්ථාවකදී මේ තැනැත්තන් මේ ස්ථානයේ සිටිනවා බවට අර වරෙන්තුව ලබගන්නා ලද පොලිස් ස්ථානය වෙත දැනුම් දීමට කටයුතු කරාද?

පි: මං කටයුතු කරේ නෑ උතුමාණනි.

ප්‍ර: හේතුවක් තියෙනවා ඒකට?

පි: හේතුවක් නෑ උතුමාණෙනි මේ විමර්ශනයේ තිබිච්ච අධික වැඩ බාවය තමයි හේතුවභාවයෙන් තමයි උතුමාණෙනි එම වැඩකටයුතු කර ගැනීමට නොහැකි වුණේ උතුමාණෙනි.

ප්‍ර: එම ඔබ සහ නන්දලාල් කියන පොලිස් සැරයන්වරයා මෙම ආමි මොහිදීන් කියන පුද්ගලයාට ඔබලාගේ දුරකථන අංකයන් සපයා දුන් බව කියා සිටිය?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: දැන් මේ 2019.03.07 වෙනිදාට පසුව නැවත ඔබට ආමි මොහොදීන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් වාර්තාවක් ඔබගේ විශේෂ විමර්ශන අංක 02 ස්ථානාධිපති පොලිස් පරීක්ෂක මාරසිංහ වෙතින් ඔබ වෙත යොමු කරාද කියලා මතකයක් තියෙනවද ?

පි: කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් ප්‍රකාශ ලබා ගන්නා බව දුටුවා උතුමාණෙනි

මේ අවස්ථාවේදී ගරු අධිකරණයෙන් අවසර ඇතිව රාජ්‍ය බුද්ධි සේවාව විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2019.03.30 දරණ දාතමින් මොහොමඩ් කාසිම් මොහොමඩ් සහාරාන්ගේ සමීපතමයින් පිළිබඳව යන මැයෙන් නිකුත් කර ඇති වාර්තාව සාක්ෂිකරුට පෙන්වා සිටිනවා එසේම මෙය මෙම වාර්තාව සමාවෙන්න ස්වාමනි මෙම වාර්තාව පිටු දෙකකින් සමන් විත වන අතර එයට සම්බන්ධිතව තව එක් අතින් ලියන ලද සටහන් ඇතුලත් ඉංග්‍රිසි භාෂාවෙන් සහ සිංහල භාෂාවෙන් අතින් ලියන ලද සටහන් ඇතුලත්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කොලයක් සම්බන්ධ වෙලා තිබෙනවා මෙම ලේඛන කට්ටලය සාක්ෂිකරුට පෙන්වා සිටිනවා.

ප්‍ර: කියවලා බලන්න

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර: ඔබගේ අවධානය මෙම ලේඛනයේ නෑ ඊට ප්‍රථම මෙම ලේඛනය ඔබ වෙත ලැබී තිබේද?

පි: මා වෙත යොමු කරලා තියෙන්නේ උතුමාණෙනි

ප්‍ර: ලැබී තිබේද ඔය ලේඛණය ඔබට ලැබුණද?

පි: එහෙම ස්ථිරව මතකයක් නැහැ උතුමාණෙනි බොහෝ දුරට යොමු කරපු ලේඛන මා වෙත යොමු වෙනවා උතුමාණෙනි.

මෙම ලේඛනය X140 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.

ප්‍ර: මෙම X 140 දරණ ලේඛනයේ අවසානට ඡේද දෙක කෙරෙහි ඔබගේ අවධානය යොමු කර සිටිනවා මෙම ආමී මොහොදීන් කියන තැනැත්තා 2017.03.10 වෙනි දින කාත්තන්කුඩියේ සිදු වූ සහරාන් ඇතුලු පිරිස විසින් සිදු කරපු සිද්ධියෙන් පසුව සහරාන් සමඟ පැන ගිය පුද්ගලයකු බව සඳහන් කර තියෙනවද?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර: එසේම සහරාන් සැඟවී සිටින ස්ථානයන් සම්බන්ධයෙන් මෙම ආමී මොහොදීන් කියන පුද්ගලයාට තොරතුරු තියෙන බවටත් මේ X 140 සඳහන් වෙනවද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මෙම X 140 හි තුන්වන පිටුවේ අවසානයට සටහනක් තිබෙනවා SI අනිත් එක ඉංග්‍රිසි D අක්ෂරය විමර්ශන සිදු කරන්න B ගොනු ගත කරන්න ලෙස?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර; මෙම සටහන කාවෙත යොමු කරපු සටහනක්ද?

පි: ගරු උතුමාණෙනි ස්ථානාධිපති පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා විසින් මා වෙත යොමු කරන ලද සටහනක් උතුමාණනි

ප්‍ර: ඒ කියන්නේ ඔබට යොමු කළ සටහනක්?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ සටහන තබලා තියෙන්නේ 2019.04.08 වෙනිදා කියලා කිව්වොත් නිවැරදිද?

පි: එය නිවැරදියි උතුමාණෙනි.

ප්‍ර: මෙම ආමී මොහොදීන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් ඔබලා ඒ වන විට ඔබ සන්තකයේ තොරතුරු සහ දුරකථන අංකයන් තිබ්බා?

පි එහෙමයි උතුමාණෙනි

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මොහු මෙම තොරතුරු ඔබ වෙත ලැබුණාට පසුව ආමි මොහදීන් කියන පුද්ගලයාව අත්අඩංගුවට ගැනීම හෝ අවම වශයෙන් ඔහුගේ ප්‍රකාශයක් සටහන් කිරීමට ඔබ හෝ ඔබ යටතේ සිටි නිලධාරීවරයෙකු හෝ කටයුතු කරාද පියවර ගත්තද?

පි: මගේ මතකයේ හැටියට නැහැ උතුමාණෙනි.

ප්‍ර: එසේ නොගත්තා නම් එසේ නොගැනීමට හේතුව කුමක්ද?

පි: ගරු උතුමාණෙනි ඒ වන විට විමර්ශනයේ විශාල වැඩ ප්‍රමාණයක් මා වෙත පැවරිලා තිබුණා උතුමාණෙනි. මේ සැකකරුවන්ගේ ලැබෙන තොරතුරු මත විමර්ශනය සිදු කිරීම උතුමාණෙනි එසේම රස පරීක්ෂක වෙත අධිකරණය වෙත යෑම , රස පරීක්ෂක වෙත යෑම මේ ලැබෙන දුරකථන ඇමතුම් විශ්ලේෂණය කර ඒ ඔස්සේ පරීක්ෂණ පැවැත්වීම විශාල වැඩකොටසක් මා වෙත පැවරිලා තිබුණා උතුමාණෙනි. ඒ දෙනිකව ලැබෙන වැඩ ප්‍රමාණයත් එක්ක අපිට ලැබෙන තොරතුරු මත ලැබෙන මේ විමර්ශනය ලැබෙන තොරතුරු මත තමයි උතුමාණෙනි අපි ප්‍රමුඛතා දීලා කටයුතු කරේ උතුමාණෙනි. ඒ අනුව උතුමාණෙනි ලැබෙන මේ බුද්ධි වාර්තා සම්බන්ධයෙන් සමහරවිට විමර්ශනය කිරීම ප්‍රමාද වෙනවා උතුමාණෙනි.

ප්‍ර: මෙම X 140 කියන්නේ ඉතාමත් පැහැදිලි නිශ්චිත තොරතුරු වාර්තාවක් ඇතුලත් කියලා මා ඔබට කිවහොත් පිළිගන්නවද?

පි: උතුමාණෙනි ආමි මොහොදීන් සම්බන්ධයෙන් සහ තවත් තොරතුරු කීපයක් එකේ ඇතුලත් වෙලා තියෙනවා උතුමාණෙනි.

ප්‍ර: නමුත් ඔබ ඒ සම්බන්ධයෙන් කිසිදු හෝ පියවරක් ගනු ලැබුවේ නැහැ?

පි: නැහැ උතුමාණෙනි.

ප්‍ර: යම් හෙයකින් ඔබට දැන් දැන් සාක්ෂිකරු මෙම දිනය වන විට 2019.04.08 දිනය වන විට ඔබට දැනීමක් තිබ්බාද මේ සහරාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් විවෘත වරෙන්තුවක් ත්‍රස්ත මර්දන විමර්ශන කොට්ඨාශය විසින් ලබා ගෙන සිටි බව ?

පි: ඒ සම්බන්ධයෙන් තොරතුරක් තිබුණා උතුමාණෙනි.

ප්‍ර: ඒ කියන්නේ තොරතුරක් ද තිබ්බේ නිශ්චිත ඔබ ඒ සම්බන්ධයෙන් අවබෝධ කරගෙන දැන ගෙන හිටියද?

පි: ලිඛිතව වාර්තාවන් ලැබිලා තිබුණ් නෑ ස්වාමීනි. ඒ සම්බන්ධ තොරතුරු තමයි ලැබිලා තිබුණේ උතුමාණෙනි.

ප්‍ර: කවුරු විසින් ද එම තොරතුරු ඔබ වෙත සපයලා තිබුණේ?

පි: ඒ තොරතුරු සැපයුවේ උතුමාණෙනි එක් අවස්ථාවකදී ඒ අන්සාර් කියන පුද්ගලයා කථා කරා උතුමාණෙනි මේ CID නිලධාරීන් වගයක් ඇවිල්ලා ඉන්නවා. ඒ වෙලාවේ මං ඔහුට මං කිව්වා CID නිලධාරීන් ආවේ නැහැ කියලා උතුමාණෙනි විමර්ශනවලට ඒ අවස්ථාවේදී උතුමාණෙනි කිව්වා ඇවිල්ලා ඉන්නවා කියලා කිව්වාම පෝන් එක දුන්නාම ඒ TID

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

නිලධාරීන් කියලා කිව්වා උතුමාණෙනි. ඒ අවස්ථාවේදී SI රත්නායකද කොහේද කතා කරලා කිව්වා ඒ ගොල්න්ගෙත් වරෙන්තුවක් තියෙනවා කියලා. අපිටත් මේ මාවනැල්ල සිද්ධියටයි වනාත විල්ලුව සිද්ධියටයි අපිත් හොයනවා කියලා උතුමාණෙනි.

ප්‍ර: මෙම TID ඒ කියන්නේ ත්‍රස්ත මර්දන විමර්ශන කොටයාශයේ නිලධාරීවරුන් සහරන්ගේ බිරිඳගේ නිවසට ද ඒ ගොස් සිටියේ ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර දැන් මෙම නිලධාරීන් ඔබ වෙත ප්‍රකාශ කරාම විවෘත වරෙන්තුවක් තියෙනවා කියලා ඒකට පැමිණියේ කියලා ඔබ ඒ නිලධාරීන්ට දැන්නුවාද ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශනය කරන බව සහරාන් සම්බන්ධයෙන්?

පි: ඒ සම්බන්ධයෙන් මම කිව්වා ඒ සම්බන්ධයෙන් අපිත් විමර්ශනයක් සිදුකරනවා කියලා.

ප්‍ර: ඒසේ දන්නවලා ඔවුන්ට ඔබ කියා සිටියාද සහරාන් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශනය කරන බැවින් ඔවුන්ට ඒ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගන්න එපා කියලා මෙම කැකුණ ගොල්ල නිවසෙදී?

පි: නැහැ උතුමාණෙනි. එහෙම කියන්න කිසිම බලයකුත් නැහැ මට උතුමාණෙනි වෙනත් කොට්යාශයක කරන විමර්ශනයක් සම්බන්ධයෙන් උපදෙස් දෙන් මට හැකියාවක් නෑ උතුමාණෙනි.

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබට මෙම දුරකථන ඇමතුම ලැබුණේ කවද්ද?

පි: එහෙම දිනයක් මතක නැහැ උතුමාණෙනි.

ප්‍ර: කොයි කාලවකවානුවේද කියලා මතකයක් තියෙනවද?

පි: මතකයක් නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඔය 2019 .02.19 වන වෙනිදා ඔබ කැකුණ ගොල සහරාන්ගේ බිරිඳගේ නිවසට ගියා කිව්වානේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: දැන් එම නිවසට ගියාට පසුව එම දිනයට පසුව ඔබලා නැවත සහරාන් ගැන සොයා ගැනීමට ඔහුගේ නිවසට ගියාද එම නිවසට ගියාද ?

පි: ඊට පස්සේ උතුමාණෙනි ඔහු බිරිඳගේ නිවසේ සිට පත්තම් පිටිය ප්‍රදේශයට ගියා උතුමාණෙනි ඒ ගිය අවස්ථාවල ඔහුගෙන් ඒ සම්බන්ධයෙන් විමසීම් කරලා තියෙනවා උතුමාණෙනි.

ප්‍ර: කාගේන්ද?

පි: අන්සාර්ගෙන්.

ප්‍ර: හේතුව මට පැහැදිලි නැහැ ඔබේ පිළිතුර දැන් මං ඇහුවේ කැකුණගොල්ල නිවස?

පි: කැකුණුගොල්න නිවසට මං ගිහිල්ලා නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඊට පස්සේ ගියේ නැහැ?

FAIR COMMENT BY JEZEEM

පි: ගියේ නැහැ උතුමාණෙනි.

ප්‍ර: දැන් කැකුණුගොල්න නිවස ඔබ යනවිට ඔබ කියා සිටියා සහරාන්ගේ බිරිඳත් දෙමව්පියොත් සිටි බව?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර: දැන් ඔය මුස්ලිම් ජාතිකයන්ගේ වාරිත්‍ර වාරිත්‍ර අනුව දැන් ගැන ඔබට මේවන විට ඔබට අවබෝධයක් තිබ්බද?

පි; සාමාන්‍ය අවබෝධයක් තිබ්බා.

ප්‍ර: ඔබට අවබෝධයක් තිබ්බද සාමාන්‍යයෙන් විවාහයකින් පසු මුස්ලිම් පිරිමියකු තමාගේ බිරිඳගේ නිවසේ තමයි තමන් පදිංචිවෙලා ඒ පවලු ඇති කර ගෙන පවුලක් වශයෙන් ජීවත් වෙන්නේ කියලා ඔබට අවබෝධයක් තිබ්බද?

පි: මම දන්නේ නැහැ උතුමාණෙනි.

ප්‍ර: තබ්බේ නැහැ ඔබට හේතුවක් කියන් පුළුවන්ද ඇයි නැවත කැකුණගොල්න ගිහිල්ලා මේ සහරාන් ගැන පරීක්ෂා කරේ නැත්තේ ඇයි කියලා?

පි: කැකුණගොල්න ප්‍රදේශවලට ගියේ උතුමාණෙනි නිවසට ගියේ නෑ උතුමාණෙනි.

ප්‍ර: ප්‍රදේශයට ගියා ?

පි: අවස්ථා කිහිපයක් ඒ ප්‍රදේශයට ගිහින් සොයා බැලීම් කරලා තියෙනවා උතුමාණෙනි.

ප්‍ර: ඔබ සටහන් යෙදුවද?

පි: මතක විදියට සටහන් යෙදුවා උතුමාණෙනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කලින් කොමිෂමට ප්‍රකාශකල හැටියට ඔය අන්සාර් කියන සහරාන්ගේ මස්සිනා ඔබට පළවෙනියෙන්ම මුණ ගැහෙන්නේ 2019 පෙබරවාරි මාසේ 19 වෙනි දින ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඔබ දැන් කොමිෂමට විස්තර කරන මේ දුරකථනයකින් ඔබව අන්සාර් අමතන්නේ ඊට පසුද එහෙම නැත්නම් ඊට පෙරද?

පි; උතුමාණෙනි නිවසට ගියාට පස්සේ තමයි ඔහුව හඳුනා ගන්නේ උතුමාණෙනි.

ප්‍ර: හරි ඒ කියන්නේ ඔබ දැන් විස්තර කරන දුරකථන ඇමතුම ඔබට ලැබෙන්නේ 2019. පෙබරවාරි මාසේ 19 වෙනිදාට පසුව ?

පි: පසුව උතුමාණෙනි ඒක මට ලැබුණේ එකක්ද නිලධාරී කණ්ඩායමේ කාට හරි ලැබුණ එකක්ද කියන එක මට මතකයක් නැහැ උතුමාණෙනි නමුත් උතුමාණෙනි එහෙම කතා කිරීමක් වුනා කියන එක විතරක් මට

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මතකයි උතුමාණෙනි. දුරකථනය කාගේ කියන එක නිශ්චිතව කියන්න බැහැ උතුමාණෙනි.

ප්‍ර ඒ දුරකථන ඇමතුම ලැබෙන්නේ 2019 පෙබරවාරි මාසේ 19 වෙනිදාට පස්සේ පාස්කු දින ප්‍රහාරයට පෙර ද පසුද ?

පි: ඊට පෙර උතුමාණෙනි.

ප්‍ර; එතකොට 2019 පෙබරවාරි 19 සහ 2019 අප්‍රේල් 21 ට අතරතුර කාලයේ තමා මේ දුරකථන ඇමතුමක් ලැබෙන්නේ ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එතකොට අන්සාර්ට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් මාර්ගයෙන් ඔබට දුරකථන ඇමතුමක් ලැබී මට හැකියාව ලැබෙන්නේ කොහොමමද?

පි: උතුමාණෙනි ඔය විමර්ශන කණ්ඩායමේ කාට හරි හෝ කථා කරා නම් අන්සාර්ට බොහෝ දුරට සිංහල කථා කිරීමේ හැකියාවක් නැහැ උතුමාණෙනි එතකොට අපේ කණ්ඩායමේ පාලිත කියලා සාජන් මහත්මයෙක් හිටියා නන්දලාල් හිටියා උතුමාණෙනි. ඔවුන්ට දෙමළ භෂාවක් කතා කිරීමේ හැකියාවක් තියෙනවා උතුමාණෙනි ඒ දෙදෙනා හරහා සමහරවිට ලැබෙන්න ඇති උතුමාණෙනි මට ලැබුණද කියන එක නිශ්චිවම මතක නැහැ උතුමාණෙනි.

ප්‍ර: නැහැ මං අහන ප්‍රශ්නය ඔබට තේරුම් නැද්ද මන් දන්නැහැ නැත්නම් තේරුම් අරන් උත්තර දෙන්නැද්ද මං දන්නෙත් නැහැ අන්සාර් කියන සහරාන්ගේ මස්සිනාට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඔබගේ කණ්ඩායමේ නිලධාරියකුට කථා කිරීමේ හැකියාවක් ලැබෙන්නේ කොහොමද කියන එකයි මං අහන්නේ?

පි: උතුමාණෙනි අපි මේ විමර්ශනයට ගිය අවස්ථාවේදී ඔහුට දුරකථන අංක ලබා දීලා තියෙනවා උතුමාණෙනි .

ප්‍ර: ඒ ඇයි ලබා දුන්නේ?

පි: උතුමාණෙනි ඔහුගෙන් යම් යම් තොරතුරු අපි කීප අවස්ථාවකදී කැඳවලා මේ සහරාන් සම්බන්ධයෙන් විමසීම් කරා උතුමාණෙනි.

ප්‍ර: ඒ කියන්නේ ඔබ අන්සාර් කියන සහරාන්ගේ මස්සිනා තොරතුරුකරුවෙක් වශයෙන් තියාදගත්තද?

පි: ඔව් උතුමාණෙනි. ඔහුව එහිදි මාවනැල්ල පොලිසියේ ප්‍රකාශ පටන් ගත්තාට පස්සේ අප ඒ ස්ථානයට 2.25 වෙනිදා කැදෙව්වා උතුමාණෙනි. කැඳවලා ස්ථානාධිපතිතුමාට කථා කරලා එහිදි නැවත ප්‍රකාශ සටහන් කරා උතුමාණෙනි.

ප්‍ර: එතකොට අන්සාර් කියන තැනැත්තා තොරතුරුකරුවෙක් වශයෙන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ඔබගේ ආඥාන්තතම පොලිස්පරීක්ෂක ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පොලිස් පරීක්ෂක මාරිසිංහ ?

පි: එහෙමයි උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: නැත්නම් සහකාර පොලිස් අධිකාරි අබේසේකර දැනුවත් කරාද?

පි: වික්‍රමසේකර උතුමාණෙනි.

ප්‍ර: ඔව් වික්‍රමසේකර ?

පි: එහෙමයි උතුමාණෙනි. ඒ දෙදෙනාම දන්වා උතුමාණෙනි.

ප්‍ර: ඒ කියන්නේ සහරාන්ගේ මස්සිනාව තොරතුරුකරුවෙක් වශයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පවත්වාගෙන ගියා කියන එක ඒ නිලධාරින් දෙන්නා දන්නවා?

පි: එහෙමයි උතුමාණෙනි. ඔහුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවලා ඔහු විතරක් නොවේ උතුමාණෙනි ඔය කැකුණගොල්ලේ සිද්ධිය සම්බන්ධ පුද්ගලයන් උතුමාණෙනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට 25 වෙනිදා කැදෙව්වා උතුමාණෙනි. ඔවුන්ට ස්ථානාධිපතිතුමාට ඉදිරිපත් කරලා ඒ ප්‍රශ්න කරලා ප්‍රකාශ සටහන් කර ගත්තා උතුමාණෙනි ස්ථානාධිපතිතුමා විසින් නිලධාරින්ලව්ව උතුමාණෙනි.

ප්‍ර: තොරතුරුකරුවෙකු ලෙස පවත්වාගෙන ගියා කියලා මං එකයි අහන්නේ අන්සාර් තොරතුරු කරුවෙක් වශයෙන් පවත්වාගෙන ගිය බව පොලිස් පරීක්ෂක මාරසිංහ සහ සහකාර පොලිස් අධිකාරි වික්‍රමසේකර දන්නවද?

පි: එහෙමයි උතුමාණෙනි ඒ නිලධාරින් දැනුවත්ව තිබුණා උතුමාණෙනි.

ප්‍ර දැන් ඔබ ඊට ඉස්සෙල්ලා 2019 පෙබරවාරි 19 වනදා සිද්ධිය ගැන කොමිෂන් සභාවට විස්තර කරන කොට කිව්වා අන්සාර්ගෙන් ප්‍රශ්න කිරීමේදී යම් තැති ගැනීමකින් යුතුව තමයි ඔහු උත්තර දුන්නේ කියලා ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ කියන්නේ යම් කිසි දෙයක් හංගන්න බලාගෙන තමා නේද තමා උත්තර දුන්නේ?

පි: හංගන්න කියන්නේ උතුමාණෙනි ඔහු අර වාහනයේ ලබා දුන් පුද්ගලයා නැතිව වෙන පුද්ගලයෙක් කිව්වා උතුමාණෙනි එතනදි අපි එතනදි උතුමාණෙනි තේරුණා මොහු අසත්‍යයක් ප්‍රකාශ කරනවා කියලා ඒක නිසා තමයි අපි නියම තොරතුරු ලබා ගෙන තමයි උතුමාණෙනි ප්‍රකාශ කරේ ඔහු මුලින්ම කිව්වේ නැහැ සහරාන් ඔහුගේ මස්සිනා කියලා.

ප්‍ර: ඒක තමයි මං අහන්නේ ඒ කියන්නේ ඔබගේ විමර්ශන කටයුතු වලදී ඔබට අනවාරණය වුනා අන්සාර් කියන තැනැත්තා සත්‍යය ප්‍රකාශ කරන්නේ නැහැ කියන එක?

පි; ඒ මුල් අවස්ථාවේදී උතුමාණෙනි.

ප්‍ර: හරි යම් කිසි අවස්ථාවක එහෙම තේරුම් ගියානේ නේද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ තියෙද්දිත්ද ඔහුව තොරතුරු කරුවෙක් වශයෙන් තියා ගත්තේ?

FAIR COMMENT BY JEZEEM

පි: තොතුරුකරුවෙක් වශයෙන් තියා ගත්තේ ස්ථානයට අපරාධ පරීක්ෂණ දෙපාර්ත මෙන්තුවට කැඳවලා ස්ථානාධිපතිතුමා තමයි සාමාන්‍යයෙන් කටයුතු කරේ උතුමාණෙනි.

ප්‍ර: ඒ කියන්නේ තොරතුරු කරුවෙකු වශයෙන් තියාගෙන තීරණය කරේ කවුද ඔබ නෙමේ?

පි: නෑ උතුමාණෙනි.

ප්‍ර: කවුද තීරණය කෙරුවේ?

පි; ස්ථානාධිපතාමාට මං ඉදිරිපත් කෙරුවා සදුදා 25 වෙනිදා ඉදිරිපත් කෙරුවා උතුමාණෙනි.ස්ථානාධිපතිතුමා තමයි ඒ සම්බන්ධයෙන් කටයුතු කරේ උතුමාණෙනි

ප්‍ර: කවුද ස්ථානධිපති ?

පි: පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා.

ප්‍ර: ඔහු නිශ්චිව දැන හිටියා අන්සාර්ව තොරතුරුකරුවෙකු වශයෙන් තියාගෙන ඉන්නවා කියන එක?

පි: තොරතුරුකරුවෙකු වශයෙන් මම දන්නේ නැහැ ඔහු .

ප්‍ර: සාක්ෂිකරු අහන හරියට පැහිදිලිව උත්තර දෙන්න? දැන් ඔබ කිව්වා පොලිස් පරීක්ෂක මාරසිංහ දැනගෙන හිටියේ නැහැ කියලා අන්සාර් තොතුරුකරුවෙකු වශයෙන් දැනගෙන හිටියද කියන එක?

පි: ගරු උතුමාණෙනි .

ප්‍ර නිවැරදි තත්ත්වේ මොකක්ද?

පි: ගරු උතුමාණෙනි 2119 වන දින ප්‍රකාශ සටහන් කරාට පස්සේ උතුමාණෙනි ඒ පුද්ගලයාව අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවට ගෙනල්ලා ස්ථානාධිපතිතුමාට ඉදිරිපත් කරා උතුමාණෙනි.

ප්‍ර: ඒ ඔය කියන ක්‍රියාදාමය අතර වෙනසක් තියෙනවානේ මං අහන්නේ පැහැදිලිවම පොලිස් පරීක්ෂක මාරසිංහ දැන ගෙන හිටියද ඔබගේ කණ්ඩායම සහරාන්ගේ මස්සිනා අන්සාර් තොරතුරුකරුවෙක් වශයෙන් පවත්වාගෙන යන බව ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ප්‍රකාශිතව දැනගෙන හිටියා?

පි: ලිඛිතව කියලා නැහැ උතුමාණෙනි ඔහුට ගෙනත්ලා ඉදිරිපත් කරා උතුමාණෙනි ඔහු දන්වා ස්ථානාධිපතිතුමා.

ප්‍ර: ඉදිරිපත් කරන්නේ ප්‍රකාශයක් ලබා ගන්නනේ නේද තොරතුරුකරුවෙක් වශයෙන් ඉදිරිපත් කරන්නේ නැහැනේ?

පි; තොරතුරු කරුවෙක් වශයෙන් ඉදිරිපත් කරේ නැහැ උතුමාණෙනි. ස්ථානාධිපතිතුමාට ඉදිරිපත් කරා උතුමාණෙනි.

ප්‍ර: ඉදිරිපත් කරන්නේ ප්‍රකාශයක් ගන්නනේ? මං අහන්නේ අන්සාර්ව තොරතුරුකරුවෙක් වශයෙන් තියා ගන්න බව පොලිස් පරීක්ෂක මාරසිංහ දැනගෙන හිටියද?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: දැනගෙන හිටියා උතුමාණෙනි.

ප්‍ර; ඔහුට අමරතව වෙන කවුද දැනගෙන හිටියේ?

පි: වික්‍රමසේකර මහත්මයත් දන්නවා ASP .

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු දැන් ඔය TID එකට අයින් වෙන්න කියලා කිව්වේ වික්‍රමසිංහ මහත්මයාද? TID එකට පරීක්ෂණ වලින් ඉවත් වෙන්න කිව්වේ ඒ වික්‍රම සිංහ මහත්මයාද?

පි: ඒක මං දන්නේ නැහැ උතුමාණෙනි.

ප්‍ර: වික්‍රමසේකර මහත්මයා කිව්වාද ?

පි: මං ඒක දන්නේ නැහැ උතුමාණෙනි.

ප්‍ර: තමන්ලාගේ කණ්ඩායමේ කාට හරි කිව්වාද?

පි: මා දැනුවත්ව නැහැ ස්වාමිනි.

ප්‍ර: තමා දැනුවත්ව නැහැ ?

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු ඔබ කියා සිටියා මිට පෙර සාක්ෂි ලබාදීමේදී ඔහුගේ ප්‍රධානම අරමුණ වුයේ සහරාන් අත්අඩංගුවට ගැනීමට කියලා?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ අරමුණ කරා තමයි ඔබලා ළඟා වෙමින් සිටියේ කියලා?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මා ඔබට 2019.03.15 දිනැතිව රාජ්‍ය බුද්ධි සේවාව විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඩි.ඩබ්ලියුව්.ආර්.ඩි සෙනෙවිරත්න ආමන්ත්‍රණය කරන ලද එක් පිටුවක් යතුරු ලියනය කරන ලද පිටුවක් සහිත බුද්ධිතොරු ද එයට සම්බන්ධිත අතින් ලියන ලද සටහන් ඇතුලත් කොලකැබලි දෙකද ඔබට පෙන්වා සිටිනවා?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මෙය මා පෙර කී ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමෙන්තුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමා අමාන්ත්‍රණය කරලා සබරගමුව මධ්‍යම හා වයඹ පාලාත් වල ස්ථානය කීපයක බෞද්ධ හින්දු සහ කතෝලික ප්‍රතිමා වෙත ප්‍රහාර එල්ල කිරීම යන මැයෙන් තමයි යොමු කර තිබෙන්නේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මෙම බුද්ධි තොරතුර ඔබ වෙත පොලිස්පරීක්ෂක මාරසිංහ විසින් ඒ 2019.04.04 ඔබ වෙත යොමු කර තිබෙනවද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි:; එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මෙම බුද්ධි තොරතුර X 141 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා මාවනැල්ල බුද්ධ ප්‍රතිමාවන්වලට හානි කිරීමේ සැකකරුවෙකු වන සාහඩ් නැමැති පුද්ගලයාත් ඔබලා අත්අඩංගුවට ගැනීමට කටයුතු කරමින් සිටිය බවයි ඔබ කියා සිටියේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මෙම X 141 මගින් ඔබව සාහිඩ් කියන පුද්ගලයාව අත්අඩංගුවට ගත හැකි ආකාරයක් සම්බන්ධයෙන් ඔබව දැනුවත් කර තිබෙනවද?

පි: මෙහි තොරතුරු කීපයක් තියෙනවා උතුමාණෙනි. ඒමගින් අත්අඩංගුවට ගැනීමේ හැකියාවක් තියෙනවද කියලා කියන්න බැහැ උතුමාණෙනි පරීක්ෂා නොකොට

ප්‍ර: මෙම තොරතුරේ සටහන් වෙනවා සාහිඩ් විසින් ඉතා දිගු වේලාවක් දුරකථන ඇමතුමක් විනාඩි 21 ක පමණ දුරකථන ඇමතුමක් සම්බන්ධ වෙච්ච පුද්ගලයෙකු සම්බන්ධයෙන්?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එම පුද්ගලයා දුරකථන ඇමතුමට සම්බන්ධ වෙන විට විදේශයක සිටි බව සටහන් වුවත් 2019.03.15 වන දින වන විට ඔහු ලංකාවේ සිටි බවයි සඳහන් වන්නේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එසේම එම තනැත්තා මගින් සහිඩ් සම්බන්ධව සාර්ථක තොරතුරක් ලබා ගත හැකි බව මෙම X 141 මගින් ඔබව දැනුවත් කර තිබෙනවා?

පි: එය පරීක්ෂා නොකර නිසා කීමට හැකියාවක් නැහැ. උතුමාණෙනි.

ප්‍ර: සාර්තක තොරතුරක් ලබා ගත හැකි බව X141 න් ඔබව දැනුවත් කර තිබෙනවා කිව්වොත් හරිද?

පි: එහෙම සම්බන්ධ වී ත සිටි බවට සටහනක් තිබෙනවා.

ප්‍ර: හරි එම පුද්ගලයාගෙන් සාර්ථක තොරතුරක් ලබා ගත හැකි බව සටහන් කරලා තියෙනවද?

පි: එහෙමයි උතුමාණෙනි ලබා ගත හැකි බව පෙනි යයි කියලා සටහනක් තියෙනවා උතුමාණෙනි.

ප්‍ර: මෙම තොරතුර අනුව ඔබ සාහිඩ් සම්බන්ධයෙන් X 141 නම් සඳහන් තැනැත්තාගෙන් තොරතුරු ලබා ගැනීමට කටයුතු කරාද?

පි: නැහැ උතුමාණෙනි මේ බුද්ධි වාර්තා සම්බන්ධයන් විමර්ශනය කිරීමට අවස්ථාවක් ලැබුන් නැහැ උතුමාණෙනි.

ප්‍ර: බුද්ධි වාර්තා සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට අවස්ථාවක් ලැබුණේ නැහැ.ඇයි ඒ?

පි: උතුමාණෙනි මේ විමර්ශන ඉතා සංකීර්ණ විමර්ශනයක් උතුමාණෙනි මේ විමර්ශනයට අදාල සියලු කාර්යන් මා වෙත තමයි උතුමාණෙනි පැවරි

FAIR COMMENT BY JEZEEM

තිබුණේ උසාවි යන ඒවා රස පරීක්ෂක යන ඒවා, නඩු භාණ්ඩ භාර දෙන ඒවා,සැකකරුවන් ප්‍රශ්න එකන ඒවා සැකකරුවෙක් අසනීප වුනොත් හොස්පිටල් අරන් යන්නෙත් මම උතුමාණෙනි. තව අපිට විමර්ශනයේදී ලබෙන විමර්ශන කටයුතු සිදු කිරීමටත් භාහිර ප්‍රදේශවලට යන්න වෙන්නේ මා ඇතුලු නිලධාරීන් කන්ඩායමක් උතුමාණෙනි. විශාල වැඩකොටසක් පැවරීලා තිබුණා උතුමාණෙනි. මේවා සමහරවිට කියවන්නට ලැබෙන්නේත් නැහැ උතුමාණෙනි.

ප්‍ර: වැටි විමර්ශනය කරපු ඔබට මෙය ඊට වඩා සංකීර්ණයි කියලාද කියන්නේ ?

පි; එහෙමයි උතුමාණෙනි මේක ඉතාමත් සංකීර්ණ ජාලයක් උතුමාණෙනි. පුද්ගලයෙක් සම්බන්ධයෙන් යම් කිසි දුරකථනයක් ඔස්සේ විමර්ශනය කර ගෙන ගියාම උතුමාණෙනි එතැනින් එහාට යන්න විදියක් නැහැ ඒ දුරකථනය සම්බන්ධයෙන් ගමන් කිරීමට හැකියාවක් නැහැ උතුමාණෙනි ඒක සම්බන්ධයෙන් මම ඩයොලෝග් සමාගම ගිහිල්ලා ඒ සම්බන්ධයෙන් ඒ ගැන විමසුවා ඇයි මේ අංක ලබා ගන්න බැරි ඒ ගොල්ලෝ සැකකරුවන්ගේ ප්‍රකාශ මගින් අනාවරණය වී තිබුණේ උතුමාණෙනි මේ ත්‍රීමා ඇප් එකක් පාවිච්චි කරනවා කියලා එතකොට මම ඩයලොග් එකට ගිහිල්ලා ඇහුවා මේ සම්බන්ධයෙන් අපිට තොරුතුරු ලබා ගැනීමේ හැකියාවක් නැද්ද කියාල මම පුද්ගලිකවම ගිහිල්ලා මේ ASP වික්‍රමසේකර මහත්මයා තමයි අර සම්බන්ධීකරණය කරේ උතුමාණෙනි එතැන්ට ගිහින් කථා කරා අවස්ථා දෙකකදි ඔවුන් කියා සිටියේ මේ ත්‍රීමා ඇප් එක සම්බන්ධයෙන් එහි කිසිවක් රෙකෝඩ් සටහන් වෙන්නේ නැහැ කියලා උතුමාණෙනි ඒ අවස්ථාවේදී මම ඇහුවා එහෙනම් බ්ලොක් මේක කරන්නවත් බැරිද කියලා මේ විමර්ශන කටයුතු අවසන් වෙලා මේන්න මේ වගේ තත්ත්වයක් තියෙන්නේ කියලා ඩයලොග් සමාගමේ නිලධාරීන් කියා සිටියා එහෙම බ්ලොක් කිරීමේ හැකියාවක් නෑ ඔවුන්ට මේවා ජාත්‍යයන්තර නීති සමඟ සම්බන්ධ වෙන නිසා කියලා උතුමාණෙනි. ඉතින් මේ ආකාරයෙන් මේ සංකීර්ණ inquiry සියලුම විමර්ශන කටයුතුයි මේ බුද්ධි වාර්තාවෙන් මට දැම්මාම මට මේ සියල්ලම කරන්න බැහැ උතුමාණෙනි. ඊට වඩා මා මේ වැඩ කරේ උතුමාණෙනි වාණිජ අපරාධ විමර්ශන අංක 01 එකේ ලිපි ගොනුත් උතුමාණෙනි නිලධාරියෙකු භාර දීලා තිබුණේ නැහැ උතුමාණෙනි ඒවා සම්බන්ධයෙනුත් මම උසාවි යනවා නීතිපති දෙපාර්තමේන්තුවට යනවා ඒ සම්බන්ධයෙනුත් කටයුතු කරනවා උතුමාණෙනි. විශාල වැඩකොටසක් තිබුණා මේ බුද්ධි වාර්තා සම්බන්ධයෙන් අවධානයක් යොමු කරන්න කෙලින්ම ප්‍රමාද වුනා උතුමාණෙනි මා එය පිළිගන්නවා උතුමාණෙනි.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: දැන් ඔබ මේ දුරකථනයන් ගැන කථා කරා ඔබ යම් අවස්ථාවක හමාස් කියලා වනාතවිල්ලුවෙන් අල්ලපු සැකකරුවෙකුගෙන් ප්‍රකාශයක් සටහන් කරාද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර; එහිදි ඔබ දැන් ඔබ දුරකථනයන් ගැනනේ කථා කරේ ඒ හමාස් කියන පුද්ගලයා ලබා ගත් දුරකථන අංකයක් සම්බන්ධයෙන් අනාවරණය වුනාද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒ දුරකථන අංකය ඒ දුරකථනය පහසුකම හමාස් ලබාගෙන තිබෙන්නේ කා සඳහාද කියලා අනාවරණය වුනාද?

පි: ගරු උතුමාණෙනි විමර්ශනයේදී අනවාරණය වුනේ උතුමාණෙනි අහුලාගත් පර්ස් එකක තිබුණු හැදුනුම්පතකින් සිම් කාඩ් පතක් ලබා ගත් බව උතුමාණෙනි ඒ අනුව ඒ ලැබුණු තොරතුරු ඔස්සේ උතුමාණෙනි ඒ පරීක්ෂණ පැවැත්වුවා උතුමාණෙනි පරීක්ෂණ පැවැත්වීමේ දී මේ සිම්කාඩ් පත ලබා දුන්නේ වෙළඳ සැලට ගිහිල්ලා දින වලට අදාල දත්ත ලබාගෙන දුරකථ ලබාදුන්න දත්ත ලබාගෙන ඉන්පසු උතුමාණෙනි ඒ විස්තර ලබාගන්න ඩයලොග් සමාගමට ගිහිල්ලා එම විස්තර ලබා ගැනීමට කටයුතු කරා උතුමාණෙනි හැදුනුම් පත් කාර්යාලයට ගිහින් ඒ විස්තර ලබා ගෙන ඒවත් පරීක්ෂා කරා උතුමාණෙනි එතනදී දුරකථන ඇමතුමක් අංකයත් ලැබුණා උතුමාණෙනි.

ප්‍ර: මං අහන්නේ හමාස් විසින් මෙම දුරකථන සිම්පත ලබා ගෙන තිබ්බේ?

පි: එහෙමයි උතුමාණෙනි ඔහු විසින් ලබා ගෙන තිබුණේ වෙනත් පුද්ගලයකුගේ හැදුනුම්පතකට උතුමාණෙනි.

ප්‍ර: ඒ එසේ ලබා ගත් දුරකථන සම්බන්ධතාවය හාමාස් විසින් කාවෙත ද ලබාදී තිබුණේ?

පි: උතුමාණෙනි මේ සිම් කාඩ්පත වනාතවිල්ලුවේ ප්‍රධාන සැකකරුවන්ට සහයටලබා දුන්න බව තමයි අනාරවණය වුනේ උතුමාණෙනි.

ප්‍ර: සාහිඩ් කියන ප්‍රධාන මාවනැල්ල සිද්ධියේ ප්‍රධාන සැකකරුවෙකුට ලබා දුන්න බව තමයි අනාවරණය වුනේ?

පි; එහෙමයි උතුමාණෙනි.

ප්‍ර; මෙම සම්බන්ධතාවය ඩයලොග් දුරකථන සම්බන්ධතාවයක්ද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර; දැන් ඒ සම්බන්ධතාවය සම්බන්ධයෙන්ද පෙර කී විදියට ඩයලොග් ආයතනයෙන් තොරතුරු ලබා ගන්න උත්සහ කරේ?

පි: ඒකත් එක් අවස්ථාවක් උතුමාණෙනි.

ප්‍ර: මෙම වෙනත් පුද්ගලයකුගේ හැදුනුම් පතකින් ලබා ගත් ඒ දුරකථන සම්බන්ධතාවය ඒ අංකය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගන්න ලැබුණද?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඩයලොග් සමාගමේ සිම්කාඩ් පත නිකුතු කරා කියන එක අනාරවණය වුනා උතුමාණෙනි නමුත් ඒ රෙකෝඩ් ගත්තාම කිසිම දත්තයක් නෑ උතුමාණෙනි නෝ රෙකෝඩ් කියලා තියෙන්නේ උතුමාණෙනි. NO Record කියලා තියෙන්නේ උතුමාණෙනි.

ප්‍ර: පෝන් ඩීටේල්ස් ගත්තම කිසි දත්තයක් නැති බව තමයි ඔබට අනාවරණය වුනේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඔබ කියා සිටියා එම ත්‍රිමා වැනි ඇප් එකකින් පාවිච්චි කිරීමෙන් සිදු වන බව?

පි; එහෙමයි උතුමාණෙනි සැකකරුවන්ගේ ප්‍රකාශවලින් අනාවරණය වුණේ උතුමාණෙනි.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: ඔබ දිවා අහාරයට පෙර සාක්ෂි දෙන අවස්ථාවේදී සඳහන් කර සිටියා මෙම පරීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ඔබට මේ පරීක්ෂණ කටයුතුවලට සම්බන්ධ වෙන්න උපදෙස් දෙන්න කියලා කිව්වේ කවුද කියලා?

පි: ගරු උතුමාණෙනි මුල් අවස්ථාවේදී මං පොරොත්තු සේවා රාජකාරියේ ඉන්න කොට ස්ථානාධිපති තුමා තමයි මාවනැල්ල යන්න උපදෙස් ලබා දුන්නේ ඉන් පසු උතුමාණෙනි ඒ විමර්ශන කටයුතු අවසන් වෙලා අපි ස්ථානයට පැමිණියේ උතුමාණෙනි වනාතවිල්ලුවට ගිහිල්ලා ඒ සැකකරුවනුත් අත්අඩංගුවට ගෙන 2019 1.18 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණියා උතුමාණෙනි. ඉන් පසු පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා විසින් උතුමාණෙනි අධ්‍යක්ෂකතුමාගෙන් නියෝගයක් අරන් තිබුණා මේ සම්බන්ධයෙන් ඒ නිලධාරීන් ලබා දෙන්න කියලා ඒ අනුව උතුමාණෙනි අධ්‍යක්ෂතුමා මුලින්ම මාස දෙකකට මේ විමර්ශනයට සහය වෙන්න මේ එම අංශයට සහය දෙන්න අනුයුක්ත කිරීමක් කරා උතුමාණෙනි

ප්‍ර: දැන් වසර 30 කට අසන්න් කායලයක් CID එකේම වැඩකරලා පුරුදු ඔබව විශේෂයෙන් මේ සඳහා යොදවන්න හේතුව ඔබ මේ ක්‍රියාදාමයන් පිළිබඳව හොඳට දන්න නිසා වෙන්න ඇති නේද?

පි: උතුමාණෙනි මං එදා පොරොත්තු සේවයේ රාජකාරියේ යෙදී සිටිය නිසා තමයි උතුමාණෙනි මා මේ රාජකාරියට යොමු වුනේ උතුමාණෙනි .

ප්‍ර; එතකොට දැන් PA 2855 දරණ ඒ වැන් රථය පුපුරන ද්‍රව්‍ය සමඟ ඒවා ප්‍රවාහනය කිරීමට යොදා ගත්ත බවට ඔබට දැන ගන්න ලැබුනානේ මේ පරීක්ෂණ කටයුතු වලදී?

පි: එහෙමයි උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒත් ඒ වාහනය ඉක්මනින් අත්අඩංගුවට නොගැනීමට කිසියම් හේතුවක් තිබුණද? ඔබ කල් දදා හිටියේ ඇයි ඒ අවස්ථාවේදී?

පි: නැහැ උතුමාණෙනි විමර්ශනයත් එක්ක එතැනින් මාවනැල්ලෙන් අපි පූණානි ප්‍රදේශයට ගියා උතුමාණෙනි ඊට පස්සේ ඒ ඇවිල්ලා ඉවර වෙලා ඊ ළඟ සදුදා දිනම ඒ වාහනය අපරාධ විමර්ශන ඒකකයට පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙන්න ගත්තා උතුමාණෙනි. ඒ අනුව තමයි කටයුතු කරේ. එතකොට ඒ ගමන් ගිහින් එනකොට දවස් තුනක් 4 ක් ගිහිල්ලා උතුමාණෙනි.

ප්‍ර: ඒ වෙනකොට ඔබ දැනන් හිටියා නේද මේ පුපුරන ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීමට සහරාන් සම්බන්ධතාවයක් තියෙන බව ?

පි: එහෙමයි උතුමාණෙනි. ඒ ජනවාරි මාසේ වෙන කොට ඒ කරුණු අනාවරණය වෙලා තිබුණේ උතුමාණනි..

ප්‍ර: එතකොට එවැනි පසුබිමක් යටතේ මේ වාහනය ඉක්මනින් අත්අඩංගුවට නොගැනීමෙන් මේ වාහනය තිබිච්ච ඒ ස්භාවික තත්ත්වය යම් වෙනස් වීමකට ඔවුන් භාජනය කරන්න ඇති කියන එක ඔබට පැහැදිලි වෙනවද එන්ජින් නම්බර් වැසි නම්බර් එක වෙනස් කරන්න සිද්ධ වුනේ ඒ කාලය අතරතුර කියන එක තහවුරු වෙනවා නේද?

පි: එහෙම කරාද කියන එක ස්ථිරම කියන්නට හැකියාවක් නැහැ උතුමාණෙනි.

ප්‍ර: නමුත් ඔබ මුල් අවස්ථාවේදී ඒක අත්අඩංගුවට නොගැනීම වරදක් හැටියට ඔබට වරදක් හැටියට පැහැදිලිද?

පි: උතුමාණෙනි ඒ අවස්ථාවේදී උතුමාණෙනි මේ සැකකරුවන් තමයි අත්අඩංගුවට ගැනීමේ ප්‍රමුඛතාවය ලබා දුන්නේ උතුමාණෙනි ඒ අනුව ලැබෙන හැම තොරතුරක් පස්සේම අපි දවස් ගණන් පිටවෙලා ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරා උතුමාණෙනි.

ප්‍ර: දැන් ඔබ හැම තිස්සේම කියන්නේ ඔබ මේ සැකකරු අත්අඩංගුවට ගන්න කියලා අදහස් කරන්නේ මේ සහරාන්ව අත්අඩංගුවට ගන්න කියලද?

පි: එහෙමයි උතුමාණෙනි. එතකොට සහරාන් ඇතුලු ඒ කණ්ඩායම උතුමාණෙනි

ප්‍ර: සහරාන් ඇතුලු කණ්ඩයම අත්අඩංගුවට ගන්නවනාම් ඔබට ලැබෙන හැම අවස්ථාවකදීම සහරාන්ට එක් එක් එක්කෙනා අත්අඩංගුවට නේද අත් අඩංගුවට අරගෙන කටයුතු කරන්න තිබුණේ.?

පි: උතුමාණෙනි ඔවුන් අනුගමනය කර ක්‍රියාදාමය අනුව උතුමාණෙනි මේය ඉතා සංකීර්ණ ජාලයක් උතුමාණෙනි ඔවුන් සම්බන්ධ පුද්ගලයින් හරහාම ඔවුන් වෙත ළඟා විය හැක්කේ වෙනත් භාහිර මගක් පෙන්න තිබුන් නැහැ උතුමාණෙනි විමර්ශන නිලධාරියෙකු වශයෙන් මට ඒ නිසා මට හැම අවස්ථාවකම උතුමාණෙනි එයට සම්බන්ද පුද්ගලයින් ඒකට

FAIR COMMENT BY JEZEEM

යොදා ගෙන ඔවුන්ට ළඟා වෙන්න තමයි මා කටයුතු කලේ උතුමාණෙනි.

ප්‍ර: දැන් ඔබ අන්සාර් කියන තැනැත්තා සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන කොට ඔහු අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් කරුණු මුල් අවස්ථාවේ දී හෙලි දරව් වුනානේද?

පි; නමුත් උතුමාණෙනි ස්ථානාධිපතිතුමාට ඉදිරිපත් කරලා ඒ සම්බන්ධයෙන් අපිට ඔන මුලික ඉලක්කයට හමා යන්න තමයි උතුමාණෙනි එවැනි පියවරක් ගත්තේ උතමාණෙනි.

ප්‍ර: ඔබ කියන්නේ මේ 30 වසරක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවාකාලයේදී පුද්ගලයෙක් අත්අඩංගුවට ගන්න හදන කොට හැම තිස්සේම ස්ථානාධිපතිතුමාගේ අවසර ඇතිවද කරන්නේ?

පි; නෑ උතුමාණෙනි මෙම සිද්ධියේදී උතුමාණෙනි අපිට යම් කිසි ආකාරයක සංකීර්ණ ගැටලු මතු වුනා උතුමාණෙනි. ඒක තමයි මේ සැකකරුවන් යොමු විටි සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරක් නැතිවීම උතුමාණෙනි. එවැනි අවස්ථාවල උතුමාණෙනි ලැබෙන හැම පුද්ගලයෙක් මාර්ගයෙන්ම එතැන්ට ඒ ප්‍රධාන සැකකරුවන්ට තමයි උතුමාණෙනි කටයුතු කරේ එයට හේතුව උතුමාණෙනි මෙම විමර්ශනයේදී මාවනැල්ල බුදුපිළිමවලට අලාභ හානි සිදු කරලා ඒ වෙනකොට කෑගල්ල පොලිසියෙන් සැකකරුවන් හත් අට දෙනෙක් අත්අඩංගුවට අරගෙන තිබුණා උතුමාණෙනි නමුත් ඔවුන් උතුමාණෙනි මේ සහරාන් ඇතුලු කණ්ඩායම ඔවුන්ගේ ක්‍රියාදාමය නතර කරේ නැහැ උතුමාණෙනි ඔවුන් ඊට පස්සේ වනාතවිල්ලුවට ගිහිල්ලා එහි ඒ සම්බන්ධයෙන් අපරාධයක් කරන්නත් සැලසුම් කරා උතුමාණෙනි මේ පහල කට්ටිය අත්අඩංගුවට ගත්තට පස්සේ උතමාණෙනි මේ නවතින් නැති බව පැහැදිලි වෙනවා උතුමාණෙනි ඒ අනුව උතුමාණෙනි ඒ කරන ලද විමර්ශනවලින් තමයි වනාතවිල්ලුවට අපිට හොයා ගන්න හම්බුනේ එතැනින් පස්සේ උතුමාණෙනි මේ සහරාන් ඇතුලු කණ්ඩායම මේ රික්සාන්ගේ ගෙදරට ගිහිල්ලා තියෙනවා උතුමාණෙනි වනාතවිල්ලුවෙන් පස්සේ අපි එතනත් විමර්ශනයෙන් පස්සේ හොයා ගත්තා උතුමාණෙනි. ඊට පස්සේ හෙට්ටි පොලට ඇවිල්ලා තියෙනවා උතුමාණෙනි හෙට්ටිපොල ස්ථානයත් අපි හොයාගත්තා උතුමාණෙනි. එතැනින් පස්සේ තමයි අපිට මේ ඊළඟ ස්ථානය හොයා ගන්න බැරිවුනේ ඒක එහෙම කරගත්ත හින්දා තමයි උතුමාණෙනි සියලු විමර්ශන සිදු කරේ උතුමාණෙනි.

ප්‍ර; දැන් ඔබ මෙච්චර හොදට හැම දේම කර ගෙන ගියා නම් ඇයි ඉතුරු ටික හොයා ගන්න බැරිවුනේ ?

පි; උතුමාණෙනි මේ තියෙන සංකීර්ණ භාවය නිසා මේ කටයුතු කර ගැනීමට නොහැකි වුනේ උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ දැන් මෙම කොමිෂම ඉදිරියේ සංකීර්ණභාවය කියන වචනය 25 පාරකට වැඩිය පාවිච්චි කරා ඔබ හිතන තරම් ඒක සංකීර්ණ නම් ඔය වැඩිය උනන්දුවෙන් සහ උවමනාවෙන් තමුන්ට පරීක්ෂණ කටයුතු වල සහභාගිවෙලා තොරතුරු රැස්කරන්න තිබුණා නේද?

පි: උතුමාණෙනි දිනපතාම රාජකාරි කරලා උපරිම ශක්තියෙන් ඒ පිළිබඳ කටයුතු කරලා තිබුණෙ උතුමාණෙනි.

ප්‍ර; දැන් ඔබ සටහන් යෙදුවේ නැහැ කියලා මුල ඉදලම කිව්වානේ?

පි; වනාතවිල්ලුවට යනකම් සටහන් යොදලා නැහැ උතුමාණෙනි.

ප්‍ර; වනාතවිල්ලුවට නෙමේ ඔබ මාවනැල්ලේ බුදු පිළිම සම්බන්ධයෙන් සොයන්න යනකොටත් සටහන් යෙදුවේ නැහැනේ?

පි: මාවනැල්ල ඉදලා වනාතවිල්ලුවට යනකම් ඒ සම්බන්ධව .

ප්‍ර: මුකුත්ම සටහන් යෙදුවේ නැහැ ඒවා සම්බන්ධයෙන් ?

පි; නැහැ උතුමාණෙනි .

ප්‍ර; එතකොට ඔබ හිතන්නේ ඒ ක්‍රියාදාමය නිවැරදි ක්‍රියාදමකයක්ද?

පි: නෑ උතුමාණෙනි වනාතවිල්ලුවට වෙනකම් ඒ විමර්ශන කටයුතු උතුමාණෙනි මාවැන්ලේ තමයි සිදු කරේ ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපි එයට සහ වුනා මිසක් ඒ සම්බන්ධයෙන් සටහන් යෙදීමක් සිදු කරේ නෑ ස්වාමිනි.

ප්‍ර: කලේ නැති බව කිව්වා මම අහන්නේ ඒ කරේ නැති එක වැරැද්දක් හැටියට තමුන් පිළිගන් නැද්ද දැන්වත්?

පි: ඒක අතපසු වීමක් කියලා පිළිගන්නවා ස්වාමිනි.

ප්‍ර: දැන් මෙවැනි අතපසු වීම් තමුන්ට තේරේණවා නේද මේ මෙවැනි විමර්ශනයකදී කොතරම් ප්‍රභල විදියකට බලපානවද කියලා?

පි: දැන් තේරේණවා උතුමාණෙනි මේ අවස්ථාවේදී තේරෙණවා උතුමාණෙනි.

ප්‍ර: ඒ කාලේ තේරුණ් නැහැ ?

පි: ඒ කාලයේ දී ඒ සම්බන්ධයෙන් කටයුතු කරා මිසක් ඒ ගැන අවධානයක් යොමු කරේ නැහැ ස්වාමිනි. දැන් තමන් මේ වරින් වරින් නීතීපති දෙපාර්තමේන්තුවේ සහභ ලබා ගත්තානේ

පි: එහෙමයි ගරු උතුමාණෙනි.

ප්‍ර: මේ පරීක්ෂණ කටයුතු වලට? එතකොට නීතිපති දෙපාර්තමෙන්තුවෙන් ලබා ගත් උපදෙස් මොනවද?

පි: උතුමාණෙනි මේ සම්බන්ධයෙන් නිතිපති උපදෙස් ලබා ගත්තේ උතුමාණෙනි මේ නඩුව අධිකරණයේ විභාග වෙනවා උතුමාණෙනි විභාග වෙනවා කියන්නේ උතුමාණෙනි කැඳවනවා ඒ දිනවලට පෙනී සිටින නිලධාරීයෙක්ගේ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීයෙක්ගේ සහය ලබා ගැනීම තමයි කරේ උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: නීපති දෙපාර්තමේන්තුව සමඟ සකාච්ඡාවලට සහභාගි වුන් නැද්ද කොයිම වේලාවකවත්?

පි: මම ගියේ නැහැ උතුමාණෙනි ගියා නම් ස්ථානාධිපතිතුමා ගියාද දන්නේ නෑ මම සහභාගි වුන් නැහැ උතුමාණෙනි

ප්‍ර: සහභාගි වුන් නැහැ?

පි: නීතිපති දෙපාර්තමේන්තුවට ගිහිල්ලා උතුමාණෙනි උසාවි යන

ප්‍ර: වංගු ගහන්න හදන්න එපා සාක්ෂිකරු මං පැහැදිලි ප්‍රශ්නයක් ඇහුවේ තමුන් නීතිපති දෙපාර්තමේන්තුවේ සකාච්ඡාවලට සහභාගි වුනාද නැද්ද කියලා? මොකද මගේ අතේ කොලයක් තියෙනවා? මම තමුන්ගෙන් ප්‍රශ්න අහන්නේ යම් කිසි පදනමක් ඇතිව තමුන් තමුන් ඇත්ත කියන්න දිවුරලා තියෙන්නේ ඇත්ත නොකිව්වොත් තමුන්ට ඒකට අදාල මේ consequences වලට සිද්ධ වෙයි ඉදිරි කටයුතු වලට ඇත්ත කියන්න නීතිපති දෙපාර්තමේන්තුවේ සාකච්ඡාවලට තමුන් සහභාගි වුනේ නැද්ද?

පි: මේ අදාල පරීක්ෂණ කටයුතුවලට නීතිපති දෙපාර්තමේන්තුවට ගිහිල්ලා සාකච්ඡාවලට සහභාගිවෙලා තියෙනවා උතුමාණෙනි.

ප්‍ර: මොනද සාකච්ඡා වුනේ ?

පි: එතනදි උතුමාණෙනි.නඩු දිනයට පෙර දවසේ ගිහිල්ලා උතුමාණෙනි ඒ නඩුවට අදාල වාර්තා සමඟ සාකච්ඡා කරලා ඒ නඩුවට පෙනී සිටින රජයේ නීතිඥතුමා දැනුවත් කරලා තියෙන්නේ උතුමාණෙනි.

ප්‍ර: එතකොට ඒ අනුව තමුන් ඒ රජයේ නීතිඥ මහත්වරුන්ව දැනුවත් කරේ නැද්ද ඒ අවස්ථාවේදී මේ අත්අඩංගුවට ගැනීම් නිසි ආකාරයට කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම?

පි: උතුමාණෙනි ඒ සම්බන්ධයෙන් කටයුත් කරේ ස්ථානාධිපතිතුමා උතුමාණෙනි මං කරේ නැහැ උතුමාණෙනි.

ප්‍ර ඇයි තමන් නිතිපති දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඒ පිළිබඳ නිසි උපදෙස් ලබා ගත්තේ නැත්තේ?

පි: ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ ස්ථානාධිපතිතුමා විසින් ගරු උතුමාණෙනි මට පැවරිලා තියෙන්නේ අධිකරණ රාජකාරියි ඒ විමර්ශන රාජකාරියි තමයි මං සිදු කරේ උතුමාණෙනි.

ප්‍ර: දැන් මේ පරීක්ෂණ කටයුතු කර ගෙන යන අතරතුර වරින් වර තමුන්ට රාජ්‍ය බුද්ධි සේවයෙන් තොරතුරු ලැබිලා තියෙනවානේ මේ පරීක්ෂණ කටයුතු වලට උදව් කරන්න?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: මීට පෙර අවස්ථාවල්වලත් තමුන් රාජ්‍ය බුද්ධි සේවයෙන් ලබා දෙන තොරතුරුවල සත්‍ය අසත්‍යතාව ය විමසන්න ගිහිල්ලා තියෙනවද?

පි: නෑ උතුමාණෙනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එහෙනම් රාජ්‍ය බුද්ධි සේවයේ නිලධාරීන් තමන්ට වැඩිය උසස් නිලධාරීන් තමන් ට තොරතුරක් ලබා දුන්නොත් ඒ තොරතුරු අනුව ක්‍රියා කරන්න තමුන්ට තියෙන බාධාව මොකක්ද?

පි: බාධාවක් නැහැ උතුමාණෙනි ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරලා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට සාක්ෂි තියෙනවා නම් කටයුතු කිරීමේ හැකියාව තිබෙනවා උතුමාණෙනි.

ප්‍ර: එහෙම කරේ නැත්නම් තමුන් ඇයි එහෙම නොකරේ?

පි; මා එහෙම කටයුතු නොකර නැහැ උතුමාණෙනි.

ප්‍ර: තමුන් ඒ විදියටම කටයුතු කරාද රාජ්‍ය බුද්ධි සේවාවේ උසස් නිලධාරීන් තමුන්ව දැනුවත් කරලා මේ මේ විදියට තොරතුරක් තියෙනවා මේ විදියට කරන්න කියලා දැනුවත් කරලා තියෙද්දි තමුන් එහෙම නොකරානම් ඒ කියන්නේ තමුන් වැරැද්දක් කරලා තියෙන බව තමුන්ට හැගෙනවද?

පි: මට ඒ ගැන දැනීමක් නැහැ උතුමාණෙනි.

ප්‍ර: දැන් තමුන් හැම තිස්සේම සඳහන් කරපු දෙයක් තමයි තමුන්ට අධික රාජකාරි තිබුණා කියලා ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එතකොට වසර 30ක් CID එකේ සේවය කරපු තමුන්ට මෙච්චර අධික රාජකාරියක් තිබුණා නම් තමුන්ගේ ඉහල නිලධාන්ට ඒ පිළිබඳව දැනුම් දීලා මෙච්චර වැඩ ගොඩාක් තියෙන හින්දා මෙච්චර වැඩ ගොඩාක් කරන්න බැහැ නැත්නම් වෙන කෙනෙක් පවරන්න නැත්නම් වෙන එක්කෙනෙක්ට උදව්වට දෙන්න කියලා ඉල්ලීමක් කරන්න පුළුවන් කමක් නොතිබුණාද?

පි: මම ලිඛිතව කියලා නැහැ උතුමාණෙනි නමුත් ස්ථානාධිපතිතුමාට කියලා තියෙනවා උතුමාණෙනි මට පරීක්ෂක නිලධාරියෙක් විදියට මට දාන්න එපා කියලා මේවා මට කරන්න බැහැ කියලා උතුමාණෙනි?

ප්‍ර: ඒ අයගේ ඒ සඳහා ලැබිච්ච ප්‍රතිචාරය කුමක්ද?

පි: සාජන් පාලිතවයි, නන්දලාල්වයි ඒ විමර්ශන වලට තමයි ඊට පස්සේ තමයි විමර්ශනවලට යොමු කරේ උතුමාණෙනි. ඊට කලින් හිටියේ මේ සාජන් විජේරත්නයි පොලිස් කොස්තාපල් දිසානායකයි උතුමාණෙනි නමුත් පරීක්ෂණ නිලධාරියෙක් යොදවලා තිබුන් නැහැ උතුමාණෙනි. පරීක්ෂණ නිලධාරියෙකුට හිටියේ මම විතරයි උතුමාණෙනි.

ප්‍ර: ඇයි ඔබ යොදවලා නොතිබුණේ ඇයි හේතුව ඒකට?

පි; එයට හේතුව නම් මට කියන්න බැහැ උතුමාණෙනි. මං දන්නේ නැහැ උතුමාණෙනි

ප්‍ර: එතකොට තමුන්ගේ උසස් නිලධාරීන් තමුන්ගේ රාජකාරි කටයුතු සම්බන්ධයෙන් හරිහැටි දැනගෙන හිටියේ නැහැ කියන එකද තමුන් කියන්නේ?

FAIR COMMENT BY JEZEEM

පි; දැනගෙන හිටියා උතුමාණෙනි මේ ලැබෙන සියලුම ඒවා මා විසින් ඉටු කරනවා කියලා ASP මහත්තයත් ස්ථානාධිපතිතුමත් දැනගෙන හිටියේ උතුමාණෙනි.

ප්‍ර: මගේ අවසාන ප්‍රශ්නය තමුන්ට විශ්‍රාම යන්න කල් තියෙද්දි ඇයි වේලාසනින් විශ්‍රාම ගියේ?

පි: විශ්‍රාම ගියේ උතුමාණෙනි මට රැකියාවක් ලැබුණ හින්දා උතුමාණෙනි.

ප්‍ර: රාජ්‍ය සේවයේ වසර 30 ක් සේවය කරපු කෙනෙක් වෙන තැනක රස්සාවක් හම්බුනා කියලා එහෙම විශ්‍රාම යනවද එහෙම විශේෂ හේතුවක් නැතිව ?

පි: මං මීට පෙර විශ්‍රාම යන්න හිටියේ උතුමාණෙනි මේ විමර්ශන ප්‍රමාද වුනා ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ තමුන්ට රාජ්‍ය සේවයේ සේවය කරනවාට වැඩිය මේ පෞද්ගලික අංශයේ ලැබිච්ච තමුන් පෞද්ගලික අංශයේ නෙමේනේ තමුන් සේවය කරන්නේ? තමන් සේවය කරන්නේ water board ජලසම්පාදන මණ්ඩලයේ?

පි: එහෙමයි උතුමාණෙනි .

ප්‍ර: එතකොට ඒකත් අර්ධරාජ්‍ය ආයතනයක්?

පි: අර්ධරාජ්‍ය ආයතනයක් ස්වාමිනි.

ප්‍ර; එතකොට තමුන් CID එකේ වසර 30 ක් සේවය කරපු කෙනෙක් හැටියට එතැනින් ඉවත් වෙලා විශ්‍රාම ගිහිල්ලා ජලසම්පාදන මණ්ඩලයේ සේවය කරන්න එතැන තියෙන විශේෂත්වය මොකක්ද?

පි; අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ පොලිස් කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩකටයුතු තිබුණ හින්දා තමයි විමර්ශන

ප්‍ර: එහෙම නැතිව තමුන් වෙන විශේෂ හේතුවක් තිබුණ් නැද්ද ඉවත් වෙලා යන්න?

පි: නැහැ උතුමාණෙනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර; සාක්ෂිකරු ඔබට ආමි මොහොදින් සම්බන්ධව ගිහිල්ලා හම්බෙන්න පාසිකුඩා වල දැනුම් දීම කාගෙන්ද ලැබුණේ?

පි: ගරු උතුමාණෙනි මගේ මතකය හැටියට ASP වික්‍රමසේකර මහත්මයා තමයි දැනුම් දුන්නේ.

ප්‍ර: ASP වික්‍රමසේකර මහතාට කොහෙන්ද දැනුම් දීම ලැබිලා තියෙන්නේ?

පි: ඒකත් ස්ථිරවම කියන්න බැහැ උතුමාණෙනි බොහෝ දුරට රාජ්‍ය බුද්ධිසේවයේ වාර්තාවක් විය හැකියි උතුමාණෙනි.

ප්‍ර; එතකොට කොහේදීද හම්බෙන්නේ කියලා කිව්වේ?

පි: පාසිකුඩාවලට ගිහිල්ලා හමුවෙන්නේ කියලා කිව්වා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කොතනදීද?

පි: පලාසිකුඩා මුහුදු තීරයේ එතන ඉන්නවා කිව්වා ඒ ගොල්ලන් හමුවෙන්න කියලා රාජ්‍ය බුද්ධිසේවාවේ නිලධාරීන්ව.

ප්‍ර: රාජ්‍ය බුද්ධිසේවයේ නිලධාරීන්ව ගිහිල්ලා හම්බෙන්න කිව්වේ පාසිකුඩා මුහුදේදි?

පි; මුහුදු තීරයේදී

ප්‍ර: ඊළඟට ආමි මොහොමදීන් ඉන්න ස්ථානය කිව්වේ ඒ නිලධාරීන්?

පි: ඒ නිලධාරීන් උතුමාණෙනි. ඒ ගොල්ලෝ අපිත් එක්ක ගිහිල්ලා එතැනින් අපි පෙන්නලා ගියා මෙන්න මේ වත්තේ තමයි කියලා ඒ ගොල්ලෝ ගියා උතුමාණෙනි දිගටම .

ප්‍ර: එතකොට ආමි මොහොදින් කොහොමද නිවසට යන වෙලාවේ හිටියද?

පි: යනකොට හිටියේ නැහැ උතුමාණෙනි.

ප්‍ර; ඊළඟට එතැන්ට ආවේ කොහොමද?

පි: ඔහු යතුරු පැදියකින් පැමිණියා පැය එක හමාරක් දෙකක් ඇතුලතදි

ප්‍ර; එතැන්ට පැමිණියා?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: තමුන්ගේ පොලිසියේ තියෙන අත්දැකීම් අනුව කියන්න අපරාධකරුවෙකු වුවත් ඔත්තුකරුවෙකු වුවත් වශයෙන් යොදා ගැනීමේ හැකියාවක් තියෙනවද? අපරාධකරුවෙක් හෝ යම් චෝදනාවට ලක් වූ පුද්ගයෙක් ඔත්තුකරුවෙකු වශයෙන් යොදා ගැනීමට හැකියාවක් තියෙනවද?

පි: ඒක ගැන මට කීමට හැකියාවක් නැහැ උතුමාණෙනි.

ප්‍ර; නමුත් මේ අවස්ථාවේ හැටියට අපි ඒ ආකාරයට කටයුතු කරා උතුමාණෙනි.

ප්‍ර: ඒ අකාරයට කටයුතු කරා උතුමාණෙනි?

පි; එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: දැන් අවසාන ප්‍රශ්නේ ඔබ කිව්වා ඔබ වානිජ අංශයෙන් වානිජ කොට්ඨාශයේ මොකක්ද?

පි: වානිජ විමර්ශන අංශ 01.

ප්‍ර: තමයි මේ අපරාධ අංශයේ මේකට කටයුතු යෙදුවේ කියලා වාණිජ අංශයේ ඉන්න කොට ඔබ විසින් කරන ලද හොඳ පරීක්ෂණ මොනවද? පරීක්ෂණ කරලා නඩු පවරපු නඩු තියෙනවද?

පි: එහෙමයි දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ මුදල් වංචාවක් සම්බන්ධයෙන් විමර්ශනය කරලා නඩු පවරලා තියෙනවා උතුමාණෙනි.

ප්‍ර: වැට් වංචාව ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඒක මෙහෙවුවේ ඒක මෙහෙය වන්න අධිකරණ කටයුතු කරේත් තමාද?

පි: එහෙමයි උතුමාණෙනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා</u>

ප්‍ර: මහත්මයා දැන් ඔබ ආමි මොහොදීන් හම්බිලා කොච්චර වෙලා කතා කරාද?

පි: මගේ මතකය හැටිය පැය එකහමාරක් දෙකක් විතර කතා කරන්න ඇති උතුමාණෙනි.

ප්‍ර: කට උත්තරයක් ගත්තද?

පි: ආමි මොහදීනගේ කටඋත්තරයක් ලිව්වා උතුමාණෙනි මම නෙමේ ලිව්වේ ඒ ගිය නිලධාරීන් සටහන් කරා උතුමාණෙනි.

ප්‍ර: දැන් ඊට පස්සේ කටඋත්තරයක් අරගෙන ඒ ප්‍රදේශයේ අදාල ස්ථානයට ගිහිල්ලා ගියාද ඔබලා?

පි: නැහැ පොලිස් ස්ථානයට ගියේ නැහැ උතුමාණෙනි.

ප්‍ර: ගිහිල්ලා නිකමටවත් අහන්න හිතුන් නැද්ද මේ පුද්ගලයා කවුදවත් කියන එක?

පි: එහෙම පරීක්ෂා කිරීමක් කරේ නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඇයි ඒ?

පි: ඔහුගෙන් ඒ විස්තර ලබා ගෙන උතුමාණෙනි අපි ආපහු පැමිණියා උතුමානෙනි.

ප්‍ර; ඔහු මොන ජාතියේ මොන විදියේ පුද්ගලයෙක්ද ? ප්‍රදේශයේ කොහොම හැසිරෙනවද කියලා සොයලා බැලුවේ නැද්ද?

පි; එහෙම ස්ථානයට ගිහිල්ලා පරීක්ෂා කිරීමට ලක් කරේ නැහැ උතුමාණෙනි

ප්‍ර: දැන් සාමාන්‍යයෙන් එහෙමද ක්‍රමය දැන් නොදන්න පුද්ගලයෙක්ගේ කටඋත්තරයක් ගන්න ගියාම මේ කොළඹ ඉඳන් ඒ පුද්ලයා පිළිබඳ විමසීමක් කරන් නැද්ද වෙන ?

පි: ගරු උතුමාණෙනි අපි යන අවස්ථාවේ දී ඔහු හිටියේ නැහැ උතුමාණෙනි ඔහු දැනුම් දුන්නාම ඔහු ඒ ස්ථානයට පැමිණියා එසේම උතුමාණෙනි ඔහුගේ මේ අපි කරන විමර්ශනවලට ඔහුගේ සම්බන්ධතාවයක් අනාවරණය වෙලා තිබුන් නැහැ උතුමාණෙනි. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් පොලිසිවලට ගිහිල්ලා නැවතත් ඒ සම්බන්ධයෙන් සොයා බැලීමක් නෑ උතුමාණෙනි.

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ වනාතවිල්ලුව ලැක්ටෝස් වත්තේ අර මූපිස් කියන පුද්ගලයාව අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වාහනයක් පිළිබඳ තොරතුරු කිව්වා නේද?

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර; එම වාහනය කල්පිටිය නාවික හමුදා කඳවුරට ගිය නිසා තමයි එහි අංකය හොය ගත්තේ කියලත් කිව්වා නේද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඔබ සොයා බැලුවද ඒ වාහනය කල්පිටිය නාවික හමුදා කඳවුරට ගියේ කුමක් සඳහාද කියලා?

පි: එහෙමයි උතුමාණෙනි ඔවුන්ගේ ප්‍රකාශ මගින් අනාවරණය වුනේ ඔවුන් කුලියට නිවසක් හොයන්න තමයි උතුමාණෙනි කල්පිටියේ ඒත්තාල ප්‍රදේශයට ගියේ ඒ නිවස පෙන්වන කොට ඔහුගේ මාමා හිටියේ නැහැ ඒ නිසා ඒ තියෙන වෙලා තිබුණ නිසා ඔවුන් කොටුව බලන්න ගිහින් තිබුණා උතුමාණෙනි. කල්පිටිය කොටුව පාලමේ ඉන්නේ නාවික හමුදාව උතුමාණෙනි ඒ ගිය අවස්ථාවේදී තමයි නාවික හමුදාවෙන් ඒ අංකය සටහන් කර තිබෙන්නේ උතුමාණෙනි.

ප්‍ර: කවුද අර කල්පිටියේ නාවික හමුදාව තියෙන්නේ කොටුව ඇතුලේ තමයි ඒක බලන්න ගියේ කවුද මූපීසුයි?

පි: මූපීසුයි තව පුද්ගයෙකුයි ගියා කියලා කිව්වේ උතුමාණෙනි.

ප්‍ර; කවුද ඒ පුද්ගලයා?

පි: මොහොමඩ් කියන පුද්ගලයා කියලා කිව්වේ උතුමාණෙනි නිවැරදිව ඒක අණාවරණය වුන් නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඊට පස්සේ ඔබ සොයා බැලුවද තව මේ ගොල්ලෝ නිතරම මෙහෙම ඒ ස්ථානයේ බලන්න යනවද කියලා එහෙම සොයලා බැලුවද?

පි: නෑ උතුමාණෙනි එක් අවස්ථාවකයි ගිහිල්ලා තිබුණේ මගේ විමර්ශනවලදී අනාවරණය වුනේ. එක අවස්ථාවයි උතුමාණෙනි.

ප්‍ර; එක අවස්ථාවයි ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර; ඔබගේ විමර්ශනවලදී ආමි මොහොදීන් කියන පුද්ගලයා ඔත්තු කරුවෙකු කියන එක පිළිබඳව කරුණු හෙලි වුණානේ මේ කොමිෂම හමුවේදී ඔබ ප්‍රකාශ කරානේ නේද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඔබලාගේ විමර්ශනවලදී කිසියම් හෝ අවස්ථාවක මෙම විමර්ශනයේ වනාතවිල්ලුව ලැක්ටොස්වත්ත හෝ මාවනැල්ලේ බුදුපිළිම සිදුවීම අවස්ථාවේදී හෝ වෙනත් කිසිම අවස්ථාවකදී ඔය සහරාන් හසීම් කියන පුද්ගලයා ඔත්තුකරුවෙක් වශයෙන් හිටියා කියන තොරතුරු ඔබලා හමුවෙලා තිබෙනවද? ඔය සහරාන් හෂීම් කියන පුද්ගලයා?

පි: ප්‍රශ්නය පැහැදිලි නැහැ උතුමාණෙනි

ප්‍ර: ඔබලා රහස් පොලිසිය නිලධාරීන් ලෙස විමර්ශන කටයුතු වල යෙදෙන කිසියම් හෝ අවස්ථාවකදී මේ අප්‍රේල් 21 බෝම්බ ප්‍රහාරයට නායකත්වය දුන්න සහරාන් හසීම් කියන පුද්ගලයා LTTE ත්‍රස්තවාදී

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

සමයේදී රජයට ඔත්තු ලබා දීමේ බුද්ධි ආයතනයකට හෝ යුධ හමුදා බුද්ධි අංශයකට හෝ ඔත්තු ලබා දීමේ අයෙකු ලෙස කටයුතු කරපු බවට ඔබලාට තොරතුරු අනාවරණය වී තිබෙනවද?

පි: මා දැනුවත් අනාවරණය වීමක් වුනේ නැහැ උතුමාණෙනි. මා දැනුවත්ව දෙයක් ලැබුන් නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඔබගේ ආයතනයේ කිසිවකු හෝ දන්නවයි කියලා ඔබට හිතෙනවද එහෙම තිබුණා කියලා?

පි: එහෙම දන්නේ නැහැ උතුමාණෙනි මම?

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර; සාක්ෂිකරු ඔබ ප්‍රකාශ කෙරුවා ඔබ දැන් ආමි මොහොදින්ව තොරතුරුකරුවෙක් වශයෙන් තියාගත්තා කියාල නේද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එතකොට ඒ තොරතුරුකරු ආමි මොහොදින්ව පළවෙනියෙන්ම හම්බෙන්නේ 2019 මාර්තු 07 වෙනිදානේ නේද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර; එතකොට එවැනි පුද්ගලයකු තොරතුරුකරුවෙකු වශයෙන් තියා ගන්නවානම් ඔහු ඔබට සපයන තොරතුරු නිවැරදි තොරතුරුද නැද්ද යන්න එක පරීක්ෂා කිරීමට යම් ක්‍රමවේදයක් ඔබ හැදුවද?

පි; එහෙම ක්‍රමවේදයක් හැදුවේ නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඒ කියන්නේ පළමු වරට රාජ්‍ය බුද්ධි සේවයෙන් තොරතුරුක් ලැබෙනවා යම් කිසි පුද්ගලයෙකු ආමි මොහොදීන් සහරාන් සමඟ සම්බන්ධතාවයක් තිබෙන පුද්ගලයෙක් කියාල නේද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර; ඔබ ඔහුව ගිහිල්ලා හොයාගෙන ප්‍රශ්න කිරීමෙන් පසුව ඔහුව තොරතුරුකරුවෙක් වශයෙන් තියා ගන්නව ඔහු ඔබට ලබා දෙන තොරතුරු නිවැරදි තොරතුරුද නැත් නම් ඔබව නොමග යවන්න හදන තොරතුරුද නැත්නම් ඒ විදියට ක්‍රියාකරනවාද නැද්ද යන්න පරීක්ෂා කිරීම සඳහාවත් ඔබ යම් ක්‍රමවේදයක් හදලා නැහැ?

පි; නැහැ උතුමාණෙනි.

ප්‍ර: සමාන්‍යයෙන් තොරතුරුකරුවෙක් ඉස්සෙල්ලාම හම්බෙන තොරතුරුකරුවෙක තමන්ට දෙන තොරතුරු නිවැරදිද යන්න තීරණය කිරීම සඳහා සමහරක් අවස්ථාවලදී එම තොරතුරුකරුවත් අවේක්ෂණ රාජකාරියක් සිදු කරනවා නේද?

පි: සමහර අවස්ථාවලදී සිදු කරනවා උතුමාණෙනි.

ප්‍ර: කරනවා නේද?

පි: එහෙමයි උතුමාණෙනි

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඊට පස්සේනේ එම තොරතුරු කරු විශ්වාසද නැද්ද කියන බාවය තහවුරු කරන්නේ නේද?

පි; එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: නමුත් ආමි මොහොදීන් සම්බන්ධයෙන් ඒ විදියට ක්‍රියාමාර්ගයක් අනුගමනය කරේ නැහැ?

පි; නැහැ උතුමාණෙනි මෙතන අපි .

ප්‍ර: කෙරුවද නැද්ද කියන්න ?

පි: නැහැ උතුමාණෙනි

ප්‍ර; දැන් අන්සාර් කියන්නේ සහරාන්ගේ මස්සිනා ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඉස්සේල්ලා ප්‍රශ්න කිරීමේදී යම් කරුණු වසන් කිරීමක් සිදු කරන්න යන බව පෙනුනා?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: නමුත් ඔහුගේ ප්‍රකාශයක් සටහන් කිරීමෙන් පසුව ඔහුවත් තොරතුරුකරුවෙක් වශයෙන් පවත්වාගෙන යනවා ඔව්ද නැද්ද?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඔහු ඔබට සපයන තොරතුරු නිවැරදි තොරතුරුද නැත්නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නොමග යවන්නද හදන තොරතුරු සපයනවද නැද්ද කියන එක තීරණය කිරීම සඳහාවත් ඔහුව අවේක්ෂණ කිරිමක් කෙරුවද?

පි; නැහැ උතුමාණෙනි.

ප්‍ර: ඔබ කරලා තියෙන වැඩේ හරිද?

පි: ගරු උතුමාණෙනි මේ විමර්ශනයේදී එවැනි ක්‍රියාමාර්ග ගැනීමට සිදුවුනා උතුමාණෙනි හේතුව උතුමාණෙනි ප්‍රධාන සැකකරුවන් සම්බන්ධයෙන් දිගින් දිගටම විමර්ශනය කිරීමට නම් මේ සංවිධාන ජාලේ ඇතුලේ ඉන්න පුද්ගලයින්ව තමයි උතුමානෙනි තොරතුරු ලබා ගන්න ඕනේ. ඒ නිසා.

ප්‍ර: හරි හරි අපි ඔබ කියන දේ හරි කියලා කියමුකෝ ඒ තොරතුරුකරුවන්ම යොදා ගන්න ඕන වුනා කියලා කියමුකෝ ඔබ අඩු ගානේ ඔවුන්ගේ දුරකථන ඇමුතුම් ගැන ආවේක්ෂණයක් කරාද ඒ අවස්ථාවේ?

පි; මතක හැටියට දුරකථන ඇමතුම් ලබා ගැනීම සිදුවූ යැයි කියලා මතකයක් තියෙනවා උතුමාණෙනි ඒ මුල් අවස්ථාවේදී උතුමානෙනි.

ප්‍ර; එහෙනම් ඒක ආවේක්ෂණයක් නේද?

පි: ඒක මතකයක් නෑ උතුමාණෙනි.

ප්‍ර; නෑ දුරකථන ඇමතුම් මුල ඉදලා ලබා ගත්තානම් ඒක අවේක්ෂණ ක්‍රමවේදයක්නේ?

පි: එහෙමයි උතුමාණෙනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට නමුත් ඉස්සෙල්ලා කිව්වානේ සහරාන් හසිම්ගේ මස්සිනා ගැන අන්සාර් ගැන එහෙම කෙරුවේ නැහැ කියලා.?

පි: ඔහුගේ දුකරථන ඇමතුම් ලබා ගත්තා උතුමාණෙනි.

ප්‍ර: නෑ මං ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නෙට ඔබ කිව්වා අන්සාර් ගැන ආවේක්ෂණයක් කෙරුවේ නැහැ කියන එක?

පි: ආවේක්ෂණයක් යනුවෙන් මං අදහස් කෙරේ උතුමාණෙනි ඔහු සම්බන්ධයෙන් Surveillance එකක් දාලා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමක් කරාද කියන එකයි මං අදහස් කරේ උතුමාණෙනි. ඒ නිසයි Surveillance කිරීමක් කරේ නැහැ කියලා කිව්වේ උතුමාණෙනි.

ප්‍ර: එතකොට ආමී මොහොදින්ගේ දුරකථන ඇමතුම් ලබා ගත්තද?

පි: ඒක නම් දන්නේ නැහැ අන්සාර්ගේ අරගෙන ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කරේ?

පි; ආමී මොහොදීන්ගෙන් ගත්තද?

පි: ගත්තද කියලා මතකයක් නැහැ උතුමාණෙනි.

ප්‍ර: ගත්තා නම් ඒක තියෙනවාද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ?

පි: ගත්තානම් තිබිය යුතුයි උතුමාණෙනි.

ප්‍ර: තිබිය යුතුයිනේ ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර; එහෙම නැත්නම් ඒ ජංගම දුරකථන සේවා සැපයුම්කරුවන් ගැන ඒ යම් කිසි ලේඛනයක් තියෙන්න ඔනනේ මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා ගත්තා කියලා?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර; තියෙන්න ඔනනේ?

පි: එහෙමයි උතුමාණෙනි

ප්‍ර; එහෙම අවේක්ෂණ රාජකාරියක් එහෙම තොරතුරු ලබා ගන්නවානම් යම් ක්‍රමවේදයක් තියනවානේ?

පි: එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: ඔබගේ ඉහල නිලධාරියෙක් මාර්ගයෙන් ලිඛිතව ඉල්ලීමක් කරන්න ඕනේනේ?

පි; එහෙමයි උතුමාණෙනි.

ප්‍ර: එහෙම කෙරුවානම් එහෙම තියෙන්න ඕන නේ?

පි: තියෙන්න ඕනේ උතුමාණෙනි

දැන් වේලාව:ප.ව 3.20

මෙතැන් සිට:ල/ලේ ඉන්ද්‍රානි මිය

පෙර සටහන් කළේ චන්දිමා මෙය

දැන් වේලාව : ප.ව. 3.20 යි

මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

ප්‍ර : දැන් 2019 අප්‍රේල් 24 වෙනිදා ආමී මොහිදීන් අත් අඩංගුවට පත් වෙනවනේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔහුව බාර ගන්න යන්නේ කවුද කොළඹින්?

පි : මා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් යන්නේ උතුමාණෙනි.

ප්‍ර : අනිත් කවුද නන්දලාලුත් ඉන්නවා නේද?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : කොතෙන්ටද ඔබ යන්නේ?

පි : කල්කුඩා පොලීසියට උතුමාණෙනි.

ප්‍ර : කල්කුඩා පොලිසියට?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔබ එතනට යනකොට අර ඔබට 2019 මාර්තු 07 වෙනිදා දුරකථනයෙන් කථා කරපු රාජ්‍ය බුද්ධි සේවයේ ඉහළ නිලධාරියා ඉන්නවානේ?

පි : මතක හැටියට හේරත් මහත්මයා හිටියා උතුමාණෙනි.

ප්‍ර : හේරත් මහත්මයා ඔබව දැකලා කිව්වා නේද ආමී මොහිදින්ව ඒ කාලයේදී ඔබව අත් අඩංගුවට ගත්තා නම් මේ දේ වෙන්නේ නැහැ කියන එක?

පි : එහෙම කිව්වේ නැහැ උතුමාණෙනි. එහෙම මතකයක් නැහැ.

ප්‍ර : මොකුත් කිව්වේ නැද්ද?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : මොකුත්ම කිව්වේ නැද්ද?

පි : කිව්වේ උතුමාණෙනි ආමී මොහිදින්ව පොලිසිය මගින් අත් අඩංගුවට ගත්තා කියලා විතරයි උතුමාණෙනි.

ප්‍ර : මම මේ කථා කරන්නේ 2019 අප්‍රේල් මාසේ 24 වෙනිදා ගැන. ප්‍රහාරයෙන් පස්සේ ආමී මොහිදින් අත් අඩංගුවට ගත්තහම පස්සේ. ඔබ ගියානේ ඔහුව බාර ගන්න කාත්තන්කුඩි පොලීසියට.

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ අවස්ථාවේදී ප්‍රධාන පොලිස් පරීක්ෂක හේරත් මහත්මයා කිව්වේ නැද්ද ඔබලා මොහුව කලින් අවස්ථාවේදී අත් අඩංගුවට ගත්තා නම් මේක නවත්වන්න තිබ්බා කියන එක?

පි : එහෙම කිව්වා කියලා මට මතකයක් නැහැ උතුමාණෙනි.

ප්‍ර : මතකයක් නැහැ?

පි : නැහැ උතුමාණෙනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට යම්කිසි දෝෂාරෝපනයක් කෙරුවේ නැද්ද ඒ අවස්ථාවේදී?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : හොඳ වැඩක් කියලා කිව්වද?

පි : කිසිම දෙයක් කිව්වේ නැහැ උතුමාණෙනි. මේ ආමි මොහිදීන් අරන් ඉන්නවා. එයා OIC මහත්මයාත් එක්ක ඇතුළට ගියා. ඊට පස්සේ අපි ජීප් එකෙන් බැහැලා OIC මහත්මයාගේ කාර්යාලයට ගියා උතුමාණෙනි.

ප්‍ර : දැන් ආමි මොහිදීන්ව අත් අඩංගුවට ගත්තම පස්සේ ඔබලා යම්කිසි ප්‍රකාශ සටහන් කර ගත්තනේ?

පි : මම සටහන් කළේ නැහැ උතුමාණෙනි. පොලිස් පරීක්ෂක මාරසිංහ මහතා විසින් ඒ එක් එක් සැකකරුවන්ව නිලධාරින්ට භාර දීලා තියෙනවා උතුමාණෙනි ප්‍රකාශ සටහන් කර ගන්න.

ප්‍ර : එහිදී යම් තොරතුරු ලබා ගැනීමක් සිදු වුණා කියලා ඔබ දන්නවද?

පි : ඒක දන්නේ නැහැ උතුමාණෙනි මම.

ප්‍ර : ඔබ ඔව්වර ඔය විමර්ශනය කරලා ඒක දන්නේ නැද්ද අත් අඩංගුවට ගත්ත අයගෙන් විමර්ශනවලදී ලබා ගත්ත තොරතුරු මොකද්ද කියන එක?

පි : ආමි මොහිදීන්ගෙන් ලබා ගත්ත තොරතුරු මට දැනීමක් නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔබ මෙම කොමිසමට ප්‍රකාශ කෙරුවා අර ත්‍රස්ත විමර්ශන ඒකකයේ නිලධාරින් කැකුණගොල්ලට ආපු අවස්ථාවකදී ඔබට දුරකථන ඇමතුමක් ලැබුණා කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ අවස්ථාවේදී ඔබ කිව්වා ඔබ ත්‍රස්ත විමර්ශන ඒකකයේ නිලධාරින්ට එතනින් ඉවත් වෙන්න කියලා ඔබ කිව්වේ නැහැ කියලා?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඔබ මොකද්ද ඔවුන්ට කිව්වේ?

පි : ගරු උතුමාණෙනි මගේ ජංගම දුරකථනයට හෝ කාගේ හරි ඒ අංශයේ කණ්ඩායමේ කාට හරි කථා කරලා ඉවර වෙලා CID නිලධාරීන් ඇවිල්ලා ඉන්නවා කියලා තමයි කියලා තිබ්බේ. එතකොට අපි CID නිලධාරීන් කණ්ඩායමක් එම ප්‍රදේශයට ගියේ නැති හින්දා මම කිව්වා CID නිලධාරීන් ආවේ නැහැ කියලා. ඊට පස්සේ කිව්වා ඒ Phone එක දුන්නහම ඒ ආපු කට්ටිය කිව්වා අපි TID එකෙන් කියලා උතුමාණෙනි.

ප්‍ර : එතකොට ඔබ මොකද්ද කිව්වේ?

FAIR COMMENT BY JEZEEM

පි : එතකොට මම කිව්වා TID එකෙන් අපිත් මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කරනවා. එච්චරයි උතුමාණෙනි කිව්වේ. ඒගොල්ලෝ කරන විමර්ශනයක් සම්බන්ධයෙන්වත් මම විමසිමක් කළේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : දැන් ඔබත් සමඟ සාකච්ඡා කරපු TID නිලධාරියා කවුද කියලා දන්නවද?

පි : මගේ මතකයේ හැටියට SI රත්නායක හෝ කවුරු හරි විය යුතුයි මගේ මතකයේ හැටියට උතුමාණෙනි.

ප්‍ර : හරි. SI රත්නායක ඔබට ඒ අවස්ථාවේ මොකද්ද කිව්වේ?

පි : ඒ අවස්ථාවේ නෙමෙයි ඊට පස්සේ වෙනමම ආපහු කථා කරලා ඇහුවා මොකද්ද කරන අපි කරන විමර්ශනය කියලා. අපි කිව්වා මෙහෙම මාවනැල්ල බුදු පිළිමකැඩීමටයි, වනාතවිල්ලුවේ එකටයි අපිත් හොයනවා කියලා ඉවර වෙලා.

ප්‍ර : එච්චරයිද?

පි : එච්චරයි උතුමාණෙනි.

ප්‍ර : ඔවුන් එතනින් ඉවත් වීමේ කථාවක් සිදු වුණේ නැද්ද?

පි : නැහැ උතුමාණෙනි. මට එහෙම කීමේ හැකියාවකුත් නැහැ උතුමාණෙනි. එහෙම කියන්න බලයකුත් නැහැ.

ප්‍ර : හරි. එතකොට ඔබට ඔය ලැබුණ දුරකථන ඇමතුම ගැන ඔබ ඔබගේ ඉහළ නිලධාරියා දැනුවත් කෙරුවද?

පි : නැහැ උතුමාණෙනි. ඒක එච්චර සටහන් කිරීමක්වත්, දැනුවත් කිරීමක් වත් කළේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : ඒ කියන්නේ පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන බුද්ධි තොරතුරු සහ විමර්ශන කරන කණ්ඩායම් දෙකක් වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ත්‍රස්ත විමර්ශන ඒකකය එකම කරුණ සම්බන්ධයෙන් විමර්ශනය කරනවා කියලා ඔබ දැනගෙන ඔබගේ ඉහළ නිලධාරීන්ට ඔබ ඒ බව දැනුවත් කළේ නැද්ද?

පි : නැහැ උතුමාණෙනි. කියන්න අවශ්‍යතාවයක් වුණේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : ඒක කියන්න අවශ්‍යතාවයක් නොවෙන්නේ කොහොමද?

පි : උතුමාණෙනි මේ සිද්ධිය සම්බන්ධයෙන් විවිධ තැන්වලින් තොරතුරු එහෙම විමර්ශනය කරනවා. ඒ සම්බන්ධයෙන් උතුමාණෙනි විශේෂයෙන් ඉහළ නිලධාරීන්ට දැනුම් දීමේ අවශ්‍යතාවයක් පැන නැගුණේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : ඒ කියන්නේ එකම කාරණය සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුවේ අංශ දෙකක් විමර්ශනය කරන බව දැන ගත්තහම ඔබ ඔබගේ නිලධාරීන් දැනුවත් කළේ නැද්ද ඒක?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒක උතුමාණෙනි ඉහළ නිලධාරීන් සම්බන්ධ වෙලා කරනවා මිසක් අපි පහළ නිලධාරින් ඒ සම්බන්ධයෙන් දැනුම් දීමක් කරන්නේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : නැහැ ඔබටනේ මේ තොරතුරු එන්නේ. අපරාධ ත්‍රස්ත විමර්ශන ඒකකයෙන් කැකුණගොල්ලට ගිහිල්ලා සහරාන්ව හොයනවා කියලා?

පි : නැහැ උතුමාණෙනි. මා ඒ සම්බන්ධයෙන් දැනුම් දීමක් කළේ නැහැ. වැඩි අවධානයක් යොමු කළෙත් නැහැ.

ප්‍ර : ඔබ ඒක ඔබේ ඉහළ නිලධාරීන් දැනුවත් කළේ නැහැ?

පි : නැහැ උතුමාණෙනි.

ප්‍ර : අර වනාතවිල්ලුව පුපරණ ද්‍රව්‍ය හොයා ගැනීමේදී ඔබ සාක්ෂි දුන්නනේ කොමිෂන් සභාවට?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ අවස්ථාවේදී ඔබ කියපු හැටියට ඔය මුෆිස්ගේ ප්‍රකාශය සටහන් කරන්නේ 5.30 ට විතර නේද එදින?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඒ අවස්ථාවේදී ප්‍රකාශය සටහන් කර ගන්නේ කොතනද? අර විවෘතව තිබ්බ කොටසේද? ගෙදර ඇතුළෙද?

පි : විවෘතව තිබ්බ කොටසේ.

ප්‍ර : එතකොට විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් පැමිණෙන්නේ කියට විතරද?

පි : හවස 6.00 ට වගේ මගේ මතකයේ හැටියට.

ප්‍ර : එතකොට මුෆිස්ගේ ප්‍රකාශය සටහන් කිරීම කොච්චර වෙලා යනවද?

පි : උතුමාණෙනි ඔහුට සිංහල භාෂාව තේරුමක් නැහැ. ඒ නිසා පැය එක හමාරක් දෙකක් විතර ගියා ඒක සටහන් කරන්න උතුමාණෙනි.

ප්‍ර : ඊට පස්සේ මුෆිස්ගේ ප්‍රකාශයට පස්සේ තවත් ප්‍රකාශයක් සටහන් කර ගත්තද?

පි : නැහැ උතුමාණෙනි ඊට පස්සේ මම ප්‍රකාශ සටහන් කළේ නැහැ ඊට පස්සේ උතුමාණෙනි.

ප්‍ර : එතකොට ප්‍රකාශය සටහන් කර ගන්නකම් ඔබ අර ඉස්සරලා තිබ්බ ඉස්තෝප්පුවේ තමයි හිටියේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : ඊට පස්සේ ඔබ කොහේද හිටියේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එම ස්ථානයේම, ඒ නිවසේමය හිටියේ උතුමාණෙනි. කොහේවත් ගියේ නැහැ.

ප්‍ර : ඒ නිවසේ කියන්නේ ඉස්සරහා කෑල්ලෙද හිටියේ?

පි : ඉස්සරහා කෑල්ලේ හිටියේ උතුමාණෙනි. අපි උදේ පාන්දර පිටත් වන නිසා එක එක්කෙනා මාරුවෙන් මාරුවට අපේ අවශ්‍යතාවයල් වලට අපි .,

ප්‍ර : වැඩි වෙලාවක් හිටියේ ඉස්සරහා කෑල්ලෙනේ.

පි : ඉස්සරහා කැල්ලේ හිටියේ. ඇතුළේ හිටියේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : එතකොට ඔබ භූමියෙන් සොයා ගන්නා ලද නඩු භාණ්ඩ ගෙනල්ලා එතන තියන්නේ එතන ඉස්සරහා ඉස්තෝප්පුවේ නේද?

පි : එදා, එය එසේ ගෙනාවේ උතුමාණෙනි ඔය සේරම එක තැනකට ගත්තේ ඊට පසුවෙනිදා උතුමාණෙනි.

ප්‍ර : ඉස්සරහා ඉස්තෝප්පුවට ඒ වෙලාවේ ...?

පි : කලින් දවසේ ගත්තේ නැහැ උතුමාණෙනි.

ප්‍ර : කලින් දවසේ ගත්තේ නැහැ?

පි : නැහැ උතුමාණෙනි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතීඥවරියගෙන් අසමි.

අවශ්‍ය නොමැති බව දන්වමි.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : සාක්ෂිකරු අර ලැක්ටෝස් වත්තේදී අත් අඩංගුවට ගත්ත මුෆිස්ගේ බිරිඳගේ සහෝදරයන් දෙදෙනෙකු නෆ්රිත් සහ නවීත් ඒ දෙදෙනාව පසුව ආරක්ෂක අමාත්‍යවරයාගේ අනුමැතියකින් මුදා හැරීමට තීරණයක් ගත්තනේ නේද?

පි : මුදා හැරීමක් කළා උතුමාණෙනි.

ප්‍ර : එම මුදා හැරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් කිසියම් හෝ ඉල්ලීම් හෝ කරුණු කාරණා ඔබලා වෙත ඉදිරිපත් කිරීමක් සිද්ධ වුණාද?

පි : මා ඒ සම්බන්ධයෙන් දැනුවත් නැහැ උතුමාණෙනි. මට එහෙම ලිපි මොකුත් ලැබිලා නැහැ උතුමාණෙනි. ඒ සම්බන්ධයෙන් ලැබෙනවා නම් ස්ථානාධිපතිතුමාට තමයි ඒ සම්බන්ධව කටයුතු කරන්නේ.

ප්‍ර : කවුද ස්ථානාධිපති?

President Secretariat Copy

FAIR COMMENT BY JEZEEM

පි : පොලිස් පරීක්ෂක මාරසිංහ මහත්මයා.

ප්‍ර : එතුමාට තමයි ලැබෙන්නේ. ඔබට ලැබෙන්නේ නැහැ?

පි : නැහැ උතුමාණෙනි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : පොලිස් පරීක්ෂක මාරසිංහ ඔබට යම් අවස්ථාවක කිව්වද මානව හිමිකම් කොමිෂන් සභාව මේ අත් අඩංගුවට ගත් නවීත් සහ නෆ්රිත් සම්බන්ධයෙන් යම්කිසි කාරණා ඉදිරිපත් කරලා තිබෙනවා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට. ඒක හින්දා විමර්ශන ඉක්මන් කරන්න කියලා?

පි : නැහැ උතුමාණෙනි. මට එහෙම මම ඒ දෙන්නා සම්බන්ධයෙන් විමර්ශනය කළේ නැහැ. ඔවුන්ගේ ප්‍රකාශවත් මම සටහන් කළේ නැහැ. මම සටහන් කළේ හමාස්ගෙයි, මුෆිස්ගෙයි තමයි උතුමාණෙනි.

ප්‍ර : නවීත්ගෙයි, නෆ්රිත්ගෙයි කවුද සටහන් කර ගත්තේ?

පි : අනිත් නිලධාරීන් සටහන් කළා උතුමාණෙනි.

ප්‍ර : පොලිස් පරීක්ෂක මාරසිංහට පසුව ඔය කණ්ඩායමේ හිටපු භාරව හිටිය නිලධාරියා ඔබ නේද?

පි : උතුමාණෙනි මේ විමර්ශනය සම්බන්ධයෙන් මම තමයි හිටියේ.

ප්‍ර : ඔව්. වනාතවිල්ලුව, ලැක්ටෝස් වත්තෙන් සොයා ගත්තු පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන්?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : විමර්ශනය භාරව සිටියේ ඔබ?

පි : විමර්ශනය භාරව හිටියේ ස්ථානාධිපතිතමා උතුමාණෙනි. මාව වෙනත් අංශයක ඉඳලා මේකට සහායට යොමු කළේ උතුමාණෙනි.

ප්‍ර : ඔව්. නමුත් ඊට පස්සේ දිගටම විමර්ශන කටයුතුවලට ඔබ සහයෝගය දැක්වුවනේ?

පි : එහෙමයි උතුමාණෙනි.

ප්‍ර : පොලිස් පරීක්ෂක මාරසිංහ අර මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ලැබුණු යම්කිසි කරුණු ඉදිරිපත් කිරීම් ගැන ඔබව දැනුවත් කෙරුවේ නැහැ?

පි : මම දන්නේ නැහැ උතුමාණෙනි ඒ සම්බන්ධයෙන්.

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරු මුදා හරිමි.

වේලාව : ප.ව. 3.30 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.07.23 වේලාව :- ප.ව. 3.30

සටහන් කළේ :- එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිලතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතීඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

01. සම්පූර්ණ නම : හේරත් මුදියන්සේලාගේ බුවනෙක පද්මකුමාර හේරත්

02. වයස : අවුරුදු 53 යි

03. ජාතිය : සිංහල

04. ආගම : බෞද්ධ

05. දැනට දරන තනතුර : ලේකම්, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

(සාක්ෂිකරු ප්‍රතිඥාව ලබා දෙයි)

රජයේ අධිනීතීඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා :

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

ප : හේරත් මහතා ඔබ ප්‍රකාශ කර සිටියා 2019 අප්‍රේල් මස 21 වන දින සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට අනුයුක්ත කර සිටින ලේකම්වරයා ලෙස?

පි : එහෙමයි ස්වාමිනි.

ප : මහත්මයා 1948 අංක 17 දරන කොමිෂන් සභා පනතේ 7 වන වගන්තිය යටතේ කරන ලද නියෝගයක් අනුව ඔබට යම්කිසි ලේඛනයක් ලැබුණද?

පි : එහෙමයි ස්වාමීනි ලැබිලා තියෙනවා.

ප : එම ලේඛනය ලැබුණේ කොහෙන්ද?

පි : එම ලේඛනය ලැබිලා තියෙන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන්.

ප : කා හටද එම ලේඛනය එවන ලද්දේ?

පි : මේක එවලා තියෙන්නේ ලේකම්, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව නමින්.

ප : එහි දිනය ලෙස සඳහන් වෙන්නේ කවදද?

පි : 2020.07.07

ප : එම ලේඛන කට්ටලයේ ෆස්සුල් රහමන් මොහොමඩ් සහරාන් නැමැති පුද්ගලයා සම්බන්ධයෙන් තොරතුරු කිහිපයක් අන්තර්ගත වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි. අන්තර්ගත වෙනවා ස්වාමීනි.

ප : ඔහුගේ නම ලෙස සම්පූර්ණ නම මෙම ගරු කොමිෂන් සභාවට නැවත ඔබ ප්‍රකාශ කරන්න?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහි සඳහන් වෙන්නේ ස්වාමීනි ෆස්සුල් රහමන් මොහොමඩ් සහරාන්.

ප්‍ර : ඒ වාගේම එම පුද්ගලයාට වෙනත් නම් තියෙනවද කියලා ඔය ලේඛනයේ සඳහන් වෙනවාද?

පි : සඳහන් වෙනවා.

ප්‍ර : මොකක්ද තියෙන නම්?

පි : අබූ හදීෆා.

ප්‍ර : ඔය ලේඛනයේ මෙම පුද්ගලයා සම්බන්ධව සඳහන් වන්නේ කුමක්ද?

පි : මේ පුද්ගලයා ශ්‍රී ලංකාවේ සිදු වුණු ප්‍රහාර සම්බන්ධයෙන් තොරතුරු බෙදා හැරී ප්‍රධාන ප්‍රචාරකයා වශයෙන් කටයුතු කළා කියලා තමයි සඳහන් වෙන්නේ.

ප්‍ර : ඔහු යම්කිසි ආකාරයක සම්බන්ධීකරණයක් කර තිබෙනවාද?

පි : එහෙම සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : මොනවා පිළිබඳ සම්බන්ධයෙන්ද?.

පි : එහි සඳහන් වෙන්නේ Post Attack Publication කියලා තමයි සඳහන් වෙන්නේ.

ප්‍ර : Post Attack කියලා ඔබ අදහස් කරන්නේ?

පි : ප්‍රහාරයෙන් පසු.

ප්‍ර : 21 වෙනිදා සිදු වූ ප්‍රහාරය පිළිබඳව?

පි : ප්‍රහාරය පිළිබඳව.

ප්‍ර : මෙම පුද්ගලයා වෙනත් සමාජ මාධ්‍ය සමඟ සම්බන්ධ වූ බවට සඳහන් වෙනවාද?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : මොකද්ද ඒ සමාජ මාධ්‍යය?

පි : ඇමාක් නිව්ස් ඒජන්සි සමඟ සම්බන්ධ වුණා කියලා තමයි සඳහන් වෙන්නේ.

ප්‍ර : හේරත් මහතා පොඩ්ඩක් නැවත බලලා කියන්න ඔහු සම්බන්ධ වුණේ කුමන සමාජ මාධ්‍යය ඔස්සේද කියලා පළමුව?

පි : නසීර් නිව්ස් සමඟ තමයි සම්බන්ධ වෙලා තියෙන්නේ.

ප්‍ර : නසීර් නැමැති මාධ්‍යය සඳහා සම්බන්ධ වී ඇත්තේ කුමන සමාජ ජාලය භාවිතා කරගෙනද?

පි : Telegram කියන සමාජ ජාලය මාධ්‍යය ඔස්සේ තමයි සම්බන්ධ වෙලා තියෙන්නේ.

ප්‍ර : ඔබ ඔය සඳහන් කරන්නට යෙදුණු සමාජ මාධ්‍යය තුළින් ඔහු යම්කිසි විමසීමක් කර තිබෙනවාද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : තිබෙනවා නම් එය කුමක්ද යන්න මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න.

පි : ප්‍රහාරය පිළිබඳව ආවරණයක් ලබා දුන්නේ නැත්තේ ඒ කියන්නේ ප්‍රචාරයක් ලබා දුන්නේ නැත්තේ ඇයි කියලා තමයි සඳහන් කරලා තියෙන්නේ.

ප්‍ර : ඔහු එම විමසීම කිරීමෙන් පසු ඔහුට යම්කිසි ප්‍රතිචාරයක් ලැබී තිබෙනවාද යන්න ඔකේ සඳහන් වෙනවද?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : ප්‍රතිචාරය ලැබී තිබෙන්නේ කොහෙන්ද?

පි : ඇමාක් නිව්ස් ඒජන්සියෙන් තමයි ප්‍රතිචාරය ලැබිලා තියෙන්නේ. නමුත් ඒ පුද්ගලයා කවුද කියන එක සඳහනක් වෙන්නේ නැහැ.

ප්‍ර : නිර්නාමික පුද්ගලයෙක්...?

පි : නිර්නාමික පුද්ගලයෙක් කියලා තමයි සඳහන් වෙන්නේ.

ප්‍ර : මේ ඇමාක් නැමැති නිව්ස් ඒජන්සිය කුමක්ද යන්න ඔබට යම්කිසි අදහසක් තිබෙනවාද?

පි : ස්වාමීනි ඇමාක් නිව්ස් ඒජන්සිය කියලා කියන්නේ ISIS සංවිධානයේ නිල පුවත් ජාලය කියලා තමයි තොරතුරු දැන ගන්නට තියෙන්නේ.

ප්‍ර : මේ ඇමාක් නිව්ස් ඒජන්සිය මගින් කවර ආකාරයේ ප්‍රතිචාරයක්ද මෙම ෆස්සුල් රහමන් මොහොමඩ් සහරාන් හට ලබා දී තිබුණේ?

පි : එයත් ප්‍රකාශ කරලා තිබුණා මේ වනවිටත් මේ වීඩියෝ පටය නිල නොවන මාධ්‍යය ඔස්සේ ප්‍රචාරය කරලා තියෙනවා කියලා.

ප්‍ර : ඔබට මේ වීඩියෝ පටය ගැන යම්කිසි දැනුමක් තිබෙනවද?

පි : එතනින් මම හිතන්නේ අදහස් කරන්නේ පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන්, ප්‍රහාරයට පෙර මේගොලේලා දිවුරුමක් දුන්නා. ඒ දිවුරුම පිළිබඳව තමයි මේ සඳහන් වෙන්නේ කියන එක තමයි විශ්වාස කරනවා.

ප්‍ර : ඔය නිර්නාමික පුද්ගලයා විසින් ෆස්සුල් මොහොමඩ් රහමාන් හට යම්කිසි නියෝගයක් නැත්නම් කාර්යයක් කිරීමට උපදෙස් ලබා දී තිබෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොනවද ඔහු ලබා දී තිබෙන උපදෙස්?

පි : පෙර තිබුණු ඒ සඳහන් කරපු Unofficial මාධ්‍ය ජාලවලින් මේක ඉවත් කරන්න කියන එක තමයි සඳහන් වෙන්නේ.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔය වෙනත් සමාජ මාධ්‍යය ජාලයක් ඔස්සේ මෙය මුදා හැර තිබෙනවා කියලා සඳහන් වෙලා තියෙනවා?

පි : සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර : ඒ කුමන සමාජ ජාලයටද යන්න ඔය ලේඛනයේ සඳහන් වෙලා තියෙනවද?

පි : තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ සමාජ ජාලයේ නම සඳහන් කරන්න?

පි : අස්සාෆ් කියලා තමයි සඳහන් වෙන්නේ.

ප්‍ර : එය කුමන රටකින්, කුමන සමාජ ජාලය හරහාද මුදා හැර තිබෙන්නේ කියලා සඳහන් වෙනවද?

පි : මේක ඉන්දුනිසියාවේ Telegram channel ඔස්සේ තමයි ප්‍රචාරය වෙනවා කියලා සඳහන් වෙලා තියෙන්නේ.

ප්‍ර : ඔය සමාජ ජාලාවෙහි මුදා හැර ඇති වීඩියෝ පට ඉවත් කිරීම සඳහා ෆස්සුල් රහමාන් යම්කිසි පුද්ගලයන් සමඟ සම්බන්ධ වී තිබෙනවද?

පි : එහෙම සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : පුද්ගලයන් කී දෙනෙක් සමඟ සම්බන්ධ වී තිබෙනවාද?

පි : දෙදෙනෙක් සමඟ සම්බන්ධ වුණා කියලා තමයි සඳහන් වෙන්නේ.

ප්‍ර : එම සම්බන්ධ වූ පුද්ගලයන්ගේ නම් ඔය ලේඛනයේ සඳහන් වෙනවද?

පි : නැත ස්වාමීනි.

ප්‍ර : ඔය වීඩියෝ පට ඉවත් කිරීමෙන් පසු ඔය ඇමාක් නිව්ස් ඒජන්සිය විසින් යම්කිසි දෙයක් සිදු කරලා තිබෙනවද?

පි : එහි සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : මොනවද කරලා තියෙන්නේ?

පි : ඉන්පසු ඇමාක් වැනල් ඔස්සේ මේ වීඩියෝ පටය නිදහස් කරා කියලා, Release කරා කියලා තමයි සඳහන් වෙන්නේ.

ප්‍ර : ඔය ෆස්සුල් රහමාන් නැමැති පුද්ගලයා හා ඔහු සම්බන්ධව දුරකථන අංක, ඒ වගේම සමාජ ගිණුම් අංක මෙම ලේඛනයේ සඳහන් වෙනවද?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : සඳහන් වන දුරකථන අංක ටික පළමුව මෙම ගරු කොමිෂන් සභාවට පුකාශ කරන්න?

පි : ප්‍රකාශ කළ හැකියි ස්වාමීනි. ස්වාමීනි 9477496880 ඒ වගේම 94758459252 එමෙන්ම 97430603855 එමෙන්ම 94771658541

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : හේරත් මහතා ඒ වගේම ඔබ ඉහතින් සඳහන් කළා මෙම පුද්ගලයා Telegram නැමැති සමාජ ජාලය ඔස්සේ තමයි මේ ඇමාක් ඒජන්සිය හා සමඟ සම්බන්ධ වී තිබෙන්නේ. අන්න ඒ Telegram සම්බන්ධයෙන් ඔය ලේඛනයේ යම්කිසි User Name එකක් නැත්නම් ලියාපදිංචි නාමයක් සඳහන් වෙනවද?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : එහෙනම් මෙම ගරු කොමිෂන් සභාවට ප්‍රකාශ කර සිටින්න?

පි : muh_zah_jr

ප්‍ර : ඒකේ ID Numberයක් සඳහන් වෙනවද?

පි : සඳහන් වෙනවා.

ප්‍ර : ඒ මොකද්ද ඒ. ඒ ID Numberය මෙම ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න?

පි : 442566049

ප්‍ර : ඒ වගේම එම තිරයේම වෙනත් යම්කිසි අකුරු වගයක් පෙන්නුම් කරනවද?

පි : ස්වාමීනි අරාබි අකුරු කිහිපයක් සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර : මෙම ෆස්සුල් නැමැති පුද්ගලයා ISIS සංවිධානය සමඟ කුමන ආකාරයට සම්බන්ධතා පැවැත් වූ බවටද මෙම ලේඛනයේ සඳහන් වී තිබෙන්නේ?

පි : එහි සඳහන් වෙනවා ස්වාමීනි කටාර්වල පදිංචි ඔහුගේ මස්සිනා මාර්ගයෙන් සම්බන්ධ වුණා කියන එක තමයි සඳහන් වෙන්නේ.

ප්‍ර : ඔහුගේ මස්සිනාගේ නම මෙම ලේඛනයේ සඳහන් වෙනවා නම් ඒ නම මෙම ගරු කොමිෂන් සභාවට සඳහන් කර සිටින්න?

පි : සඳහන් වෙනවා. මොහොමඩ් අන්සාෆ්.

ප්‍ර : ඔහුට වෙනත් නම් තිබෙනවාද?

පි : තිබෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ නම් සඳහන් කරන්න?

පි : අන්සාෆ් මොහොමඩ් අන්වර්. ඒ වාගේම තවත් නමක් තියෙනවා මොහොමඩ් අන්වර් මොහොමඩ් ඉන්සාෆ්.

ප්‍ර : මේ පුද්ගලයා ඔබ දැන් සඳහන් කරන්න යෙදුණු මස්සිනා නැමැති පුද්ගලයා භාවිතා කරන ලද දුරකථන අංක ඔය ලේඛනයේ තිබෙනවා නම් ඒ දුරකථන අංකත් ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න?

පි : අංක දෙකක් තිබෙනවා ස්වාමිනි. 94772748475, අනිත් දුරකථන අංකය 97431129437

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ වගේම E-mail Address එකක්, ඊමේල් ලිපිනයක් තියෙනවා නම් එය සඳහන් කරන්න?

පි : තියෙනවා ස්වාමීනි. flux.saf@gmail.com

ප්‍ර : Telegram ගිණුමක User Name එකක් නැත්නම් ලියාපදිංචි නමක් තියෙනවා නම් ඒ ගැන, ඒ පිළිබඳවත් මේ ගරු කොමිෂන් සභාවට ප්‍රකාශ කරන්න?

පි : තියෙනවා ස්වාමීනි. මොහොමඩ් කියලා සඳහන් වෙනවා.

ප්‍ර : ID Numberයක් තියෙනවද?

පි : තියෙනවා. 270558892

ප්‍ර : තවත් සමාජ ජාලයක් වන Viber ගිණුමේ මොහු ගැන විස්තර තිබෙනවාද ඔය ලේඛනයේ?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : නම ලෙස සඳහන් වෙන්නේ කුමක්ද?

පි : අබු සහීඩ්.

ප්‍ර : එහි නොම්මරයක් සඳහන් වෙනවද?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : මොකද්ද ඒ නොම්මරය?

පි : 94772748475

ප්‍ර : ඒ වගේම හේරත් මහතා මෙම ෆස්සුල් රහමාන් මොහොමඩ් සහරාන් යන පුද්ගලයා සමඟ වෙනත් ලේඛන ඔය ලේඛන කට්ටලයේ තිබෙනවාද?

පි : තිබෙනවා ස්වාමීනි.

ප්‍ර : එම ලේඛන ඔබ දැන් කියන ලේඛනයේ මෙම පුද්ගලයා සමඟ සම්බන්ධ වූ වෙනත් පුද්ගලයෙකු සිටිනවාද? සිටිනවා නම් ඔහුගේ නම සඳහන් කරන්න.

පි : සිටිනවා ස්වාමීනි. අර්ෂඩ් නමින් හඳුන්වනවා.

ප්‍ර : ඔබ ඔය දැන් සඳහන් කරන්නට ලැබූ අර්ෂාඩ් නැමැති පුද්ගලයා කුමන රටක පුද්ගලයෙකු බවටද ඔය ලේඛනයේ සඳහන් වී තිබෙන්නේ?

පි : ශ්‍රී ලංකාව කියලා තමයි සඳහන් වෙන්නේ ස්වාමීනි.

ප්‍ර : අර්ෂාඩ් නැමැති පුද්ගලයා ෆස්සුල් රහමාන් සමඟ සම්බන්ධ වී ඇත්තේ කුමන ආකාරයටද?

පි : මොහු සම්බන්ධ වෙලා තියෙන්නේ Telegram ජාලය හරහා තමයි සම්බන්ධ වෙලා තියෙන්නේ.

ප්‍ර : Telegram ජාලයේ අර්ෂාඩ් භාවිතා කරන ලියාපදිංචි නමක් ඔය ලේඛනයේ සඳහන් වෙනවද?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : මොකද්ද ඒ නම.

පි : Sonic Sonic.

ප්‍ර : අර්ෂාඩ් හා ඔය ෆස්සුල් හමුවීමක් පිළිබඳව ඔය ලේඛනයේ සඳහන් වෙනවාද?

පි : මේකේ මේගොල්ලෝ හමුවෙලා නැහැ කියන එක තමයි සඳහන් වෙන්නේ.

ප්‍ර : ෆස්සුල් කියන පුද්ගලයා ලංකාවට පැමිණීමක් පිළිබඳව ඔය ලේඛනයේ සඳහන් වෙනවද?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ හමුවීමට බලාපොරොත්තුවක් තිබ්බ බවට සඳහන් වෙනවද?

පි : එහෙම සඳහනක් මේකේ තිබෙනවා ස්වාමිනි.

ප්‍ර : ෆස්සුල් සහ ඔය අර්ෂාඩ් නැත්නම් sonic sonic නැමැති පුද්ගලයා අතර වූ සංවාදවල ඔවුන් මොනවා පිළිබඳව අදහස් හුවමාරු කළ බවටද ඔය ලේඛනයේ සඳහන් වෙන්නේ?

පි : මෙතන සඳහන් වෙනවා ස්වාමීනි ප්‍රහාරයක් සිදු විය හැකියි කියලා ශ්‍රී ලංකාවේ Coastal Townවල සිදු විය හැකියි කියලා සඳහන් වෙනවා. විශේෂයෙන්ම සංචාරකයෝ සහ ක්‍රිස්තියානි ජනතාව ඉලක්ක විය හැකියි කියන එක තමයි එතන සඳහන් වෙන්නේ.

ප්‍ර : දැන් අර්ෂාඩ් නැමැති පුද්ගලයා Telegram මාධ්‍යය ජාලය sonic sonic නැමැති User Name එක නැත්නම් ලියාපදිංචි නම භාවිතා කරලා තිබෙනවා? නිවැරදියිනේ?

පි : නිවැරදියි ස්වාමීනි.

ප්‍ර : එම sonic sonic User Name එකට නැත්නම් ලියාපදිංචි නාමයට යම්කිසි නොම්මරයක් ලියාපදිංචි වී තිබෙන බවට ඔය ලේඛනයේ සඳහන් වෙලා තියෙනවද? ඒ ලියාපදිංචි වී ඇති නොම්මරය මොකද්ද?

පි : දුරකථන අංකයක් සඳහන් වෙලා තියෙනවා ස්වාමීනි.

(ගරු සභාපතිතුමනි මෙම සාක්ෂිකරුගෙන් ඇසූ ප්‍රශ්නයට පිළිතුර කොළයක ලියා ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා)

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට ලබා දුන් පිළිතුර ඔහුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් විය යුතු බවට ලඝුලේඛිකාවට නියෝග කරනවා.

පි : +94715344512

****

රජයේ අධිනීතීඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා :

ප්‍ර : හේරත් මහතා ඔබ දැන් ලියා ඉදිරිපත් කරන ලද දුරකථන අංකය යටතේ ලියාපදිංචි වී ඇති වෙනත් සමාජ ගිණුම් පිළිබඳව ඔය ලේඛනයේ සඳහන් වෙලා තියෙනවද?

පි : සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර : මොනවද ඒ සමාජ ගිණුම්?

පි : එහි සඳහන් වෙනවා Telegram සමාජ ගිණුම්. ඒ වගේම Twitter, Whatsapp, Skype ගිණුම් දෙකක් ගැන සඳහන් වෙනවා. Viber.

ප්‍ර : Telegram කියන සමාජ ජාලයේ ඔහු භාවිතා කරන්නට යෙදුණු User Name නැත්නම් ලියාපදිංචි නම කුමක් ලෙසද සඳහන් වෙන්නේ?

(ගරු සභාපතිතුමානි මෙම ලේඛනයේ නම් වර්ගයක් සඳහන් වෙනවා. එම සෑම නමක්ම මෙම සාක්ෂිකරු කොළයක ලියා ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : Telegram ගිණුමට අදාළ නම ඔබට සපයා දුන් කොළයේ ලියන්න?

****

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරු විසින් ලිඛිතව ලබාදුන් තොරතුරු සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් කළයුතු බව ලඝුලේඛිකාවට නියෝග කරනවා.

පි : Sonic Sonic

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා :

ප්‍ර : ඒ වගේම ඔබ සඳහන් කළා ඔහුට Twitter ගිණුමක් තියෙනවා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එම ගිණුමේ ඔහු භාවිතා කරන ලද නම නැවතත් ඔය ඔබට සපයා දී ඇති කොළයේ සඳහන් කර ඉදිරිපත් කරන්න?

****

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරු විසින් ලබාදෙන පිළිතුර සාක්ෂිකරුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් කළයුතු බව ලඝුලේඛිකාවට නියෝග කරමි.

පි : Menake7 Menake

****

රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා :

ප්‍ර : ඔබ සඳහන් කළා Whatsapp ගිණුමක් ඔහුට තියෙනවයි කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එහි ඔහුගේ යම්කිසි නමක් තියෙනවද?

පි : User Name එකක් සඳහන් වෙන්නේ නැහැ.

ප්‍ර : Skype ගිණුම් දෙකක් පිළිබඳව ඔබ සඳහන් කළා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔය Skype ගිණුමේ පළවෙනි Skype ගිණුමේ නම සඳහන් කරලා ඉදිරිපත් කරන්න?

****

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරු විසින් ලබාදෙන ලද පිළිතුර ඔහුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් විය යුතු බව ලඝුලේඛිකාවට නියෝග කරමි.

පි : Sonic 999

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා :

ප්‍ර : ඔහුට තවත් Skype ගිණුමක් තියෙනවා කියලා ඔබ සඳහන් කළා?

පි : සඳහන් කළා ස්වාමීනි.

ප්‍ර : එහි ඔහුගේ ලියාපදිංචි නම ලෙස සඳහන් වෙන්නේ කුමක්ද?

****

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරු විසින් ලබාදෙන ලද පිළිතුර ඔහුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් විය යුතු බවට ලඝුලේඛිකාවට නියෝග කරනවා.

පි : Menake Madhusanke

****

රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා :

ප්‍ර : ඔහුගේ Viber සමාජ ජාලයේ User Name එක නැත්නම් ලියාපදිංචි නම කුමක්ද යන්න සඳහන් කරලා ඉදිරිපත් කරන්න?

පි : එහෙමයි ස්වාමිනි.

****

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරු විසින් ලබාදෙන ලද පිළිතුර ඔහුගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් වශයෙන් සටහන් විය යුතු බව ලඝුලේඛිකාවට නියෝග කරනවා.

පි : Sonic

****

රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා :

ප්‍ර : ඔබ ඔය සඳහන් කරන්නට යෙදුණු සමාජ ජාලා තුළ මෙම පුද්ගලයාගේ ඡායාරූපයක් තිබෙනවද? සමාජ ජාලා සෑම එකේම හෝ එක් සමාජ ජාලයකට අනුයුක්තව යම්කිසි ඡායාරූපයක් තිබෙනවද?

පි : ඡායාරූපයක් තිබෙනවා ස්වාමීනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එය කුමන සමාජ ජාලය ඔස්සේ මොහු විසින් Upload කර ඇති ඡායාරූපයක්ද? කුමන ගිණුමටද?

පි : Skype සමාජ ජාලය.

(ඉංග්‍රීසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

(ගරු ස්වාමීනි මෙම සාක්ෂිකරු විසින් හඳුනා ගන්නට යෙදුණු ඡායාරූපය X-142 ලෙස ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා)

****

ගරු සභාපතිතුමා :

වෙනත් ප්‍රශ්න නොමැත. සාක්ෂිකරු මුදා හරියි.

වේලාව : ප.ව. 4.00 යි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.7.23 වේලාව :- ප.ව. 5.45

සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා (පැමිණෙනැත) - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධී නීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධි නීතීඥ චතුරංග බණ්ඩාර මහතා , රජයේ අධිනීතීඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අහරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතීඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී විවේකයට පෙර සාක්ෂි ලබා දෙමින් සිටි සාක්ෂිකරු වන රංජිත් සෙනරත් බණ්ඩාර යන අයගේ ඉතිරි සාක්ෂිය වෙනත් සාක්ෂිකරුවකුගේ සාක්ෂි ලබා ගැනීමෙන් පසු මෙහෙය වන බව සටහන් කර තබමි.

සම්පූර්ණ නම : ලොකු කංකානමලාගේ ජෝසප් ගැස්පාඩ් සරත් පිරීස්
වයස : අවුරුදු 60
ජාතිය : සිංහල.
ආගම : රෝමානු කතෝලික
රැකියාව : විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
පුද්ගලික ලිපිනය : අංක 596/පි/37,පත්තිනියා වත්ත ,පොරේ අතුරුගිරිය, ප්‍රතිඥා පිට.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ දැනට විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පොලිස්පතිවරයෙක්?
පි: එහෙමයි.
ප්‍ර: ඔබ ශ්‍රී ලංකා පොලිස් සේවයට සම්බන්ධවූයේ 1984 ජූනි මාසේ 15 වෙනිදා ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන් කිව්වෝත් හරිද?
පි: හරි .
ප්‍ර: ඔබ එසේ ආධුනික උප පොලිස් පරීක්ෂක වශයෙන් සම්බන්ධවෙලා 1984.12.22 වන දින පොලිස් සේවයට සම්බන්ධ වුනා කිව්වොත් හරිද නිත්‍ය සේවයට පුහුණු වීමෙන් පසුව?
පි: හරි
ප්‍ර: ඔබපොලිස් සේවයේදී උසස්වීම් වශයෙන් පොලිස් පරීක්ෂක ධුරයටත් සහකාර පොලිස් අධිකාරි ධුරයටත් පොලිස් අධිකාරි ධුරයටත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ධුරයටත් නියෝජ්‍ය පොලිස්පති ධුරයටත් පසුව උසස්වීම් ලැබුව බව කිව්වොත් හරිද?
පි: හරි
ප්‍ර; ඔබ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වශයෙන් උසස්වීම් ලැබුවේ කවද්ද?
පි: 2020 ජනවාරි මාසේ 05 වෙනිදා.
ප්‍ර: ඔබ එම උසස් වීම ලැබුවාට පසු ඔබ සේවයෙන් විශ්‍රාම ගියේ කවද්ද?
පි; 2020. ජනවාරි මාසේ 06 වෙනිදා.
ප්‍ර; ඔබ ඔබගේ සේවා කාලය තුල රාජ්‍ය බුද්ධි සේවාවට සම්බන්ධ වෙලා සේව කරාද?
පි: සේවය කලා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ කුමන කාලයක සිට කුමන කාලයක් දක්වා සේවය කලාද?

පි: 1984 දෙසැම්බර් 22 වෙනිදා ඉදලා 2016 ඔක්තෝම්බර් 25 වෙනිදා වෙනකම්.

ප්‍ර: රාජ්‍ය බුද්ධි සේවයේ ?

පි: රාජකාරි කලා.

ප්‍ර: 1984.12.22 සිට 2016 ඔක්තෝබර් මාසය වනතුරු රාජ්‍ය බුද්ධි සේවයේ සේවය කරා?

පි: සේවය කරා.

ප්‍ර: මා ඔබට කියා සිටියොත් ඔබ රාජ්‍ය බුද්ධි සේවයේ සේවය කිරීමේදී රාජ්‍ය බුද්ධි සේවයේ ව්‍යුහය සහ එය එහි පරිපාලන කටයුතු සම්බන්ධයෙනුත් ඔබට දැනුමක් තියෙනවා කියලා කිව්වොත් ඒක හරිද වැරදිද?

පි: අවසාන වශයෙන මම රාජ්‍ය බුද්ධි සේවයේ 2013 සැප්තැම්බර් මාසේ සිට නියෝජ්‍ය අධ්‍යක්ෂක පරිපාලනය ලෙස සේවය කරා.

ප්‍ර: 2016 ඔක්තෝම්බර් මාසයේ රාජ්‍ය බුද්ධි සේවයෙන් ඉවත් වෙලා ඔබ කොහාට ද ගියේ ?

පි: පොලිස් විශේෂකාර්යංශයට ගියා ඊට පස්සේ 2016 ඔක්තෝම්බර් මාසේ 28 වෙනිදා එවකට සිටි අධ්‍යක්ෂකතුමා නියෝජ්‍ය පොලිස්පති මාසා මහතා විශ්‍රාම යාමෙන් පසු විශේෂ කාර්යාංශයේ අධ්‍යක්ෂක ධුරය ලබා ගත්තා.

ප්‍ර: ඔබ පොලිස් විශේෂ කාර්යාංශයේ අධ්‍යක්ෂක ධුරය භාර ගන්නා විට ඔබ දරපු තනතුර මොකක්ද ?

පි: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුර.

ප්‍ර: එතකොට ඔබ විශ්‍රාම යන ඔබ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් උසස් වීම ලැබුවට පසුව ඔබ පොලිස් විශේෂ කාර්යාංශයේ අධ්‍යක්ෂක වශයෙන් තවදුරටත් කටයුතු කරාද?

පි: සේවය කලා.

ප්‍ර; ඔබ විශ්‍රාම යන අවස්ථාවේ දී පොලිස් දුක් ගැනවිලි දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති වශයෙන් ද කටයුතු කරේ?

පි: එහෙමයි.

ප්‍ර: ඒ කවද්ද ඔබ එම දිසාවට ඔබ ආවේ?

පි: 2019 අගෝස්තු මාසේ 18 වෙනි දින මට මතක හැටියට?

ප්‍ර: විශ්‍රාම යාමට මාස 05 ක් වගේ කාලයකට පෙර?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ශ්‍රී ලංකා පොලිසියේ පොලිස් විශේෂ කාර්යාංශය සිදුකරන රාජකාරිය මොකක්ද කියලා ඔබට කෙටියෙන් පැහැදිලි කරන්න පුළුවන්ද? ඔව් මොකක්ද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: ශ්‍රී ලංකාව තුල නීතිය හා සාමය පවත්වාගෙන යාම සඳහා පොලිසියට අවශ්‍ය තොරතුරු ලබා දීම

ප්‍ර: මොන වගේ තොරතුරුද ඔබ මේ පොලිස් විශේෂ කාර්යාංශය විසින් ලබා ගත්තේ?

පි: අපි වැඩි අවධානයක් යොමු කරන්නේ විශේෂ කාර්යාංශය අපරාධ සහ අපරාධකරුවන් සම්බන්ධයෙන් .

ප්‍ර: මෙම තොරතුරු ලබා ගැනීම බුද්ධි මෙහෙයුම් වශයෙන්ද නැත්නම් වෙන යම් අකාරයට ද විශේෂ කාර්යාංශය ක්‍රියාත්මක කරේ?

පි: බුද්ධි මෙහෙයුම් වශයෙන් ක්‍රියාත්මක කළේ.

ප්‍ර: දැන් මෙම තොරතුරු ලබා ගැනීම සඳහා පොලිස් විශේෂ කාර්යාංශය තුල පොලිස් නිලධාරීන්ගෙන් සැදුම්ලත් ජාලයක් තිබුණද ජාලයක් තියෙනවද?

පි: ජාලයක් තිබුණා ඒක විස්තර වශයෙන් කිව්වොත් ලංකාවේ තිබෙන විශේෂ කාර්යාංශ මූලස්ථානය තිබෙන්නේ අංක .32

ප්‍ර: කොළඹ?

පි: කොළඹ.එතකොට ඒක බොහොම සුළු පොඩි ඉඩ ප්‍රමාණයක පිහිටලා තියෙන මුලස්ථානයක් එහි නිලධාරීන් සයකට වඩා accommodate කරන්න

ප්‍ර: පහසුකම් නැහැ සියකට වඩා වැඩි නිලධාරීන් සංඛ්‍යාවකට සේවය කරන්න?

පි: සේවය කරන්න ඒ නිසා ලංකාවේ පවතින පොලිස් කොට්ඨාශ 42 තුල විශේෂ කාර්යාංශ ඒකක පිහිටා තිබුණා ඒ සෑම විශේෂ කොට්ඨාශ ඒකකම පොලිස් පරීක්ෂකවරයෙක් ඇතුළුව නිලධාරීන් දහදෙනෙක් ඒකකයකට අනුයුක්ත කරලා තිබුණා ඒ වගේම ලංකාවේ සියලුම පොලිස් ස්ථානවල නිලධාරීන් දෙදෙනෙක් විශේෂ කාර්යාංශයේ අනුයුක්ත කරලා තියෙනවා මේ කාර්යන් කර ගෙන යෑම සඳහා.

ප්‍ර: දැන් ඔබතුමා මේ අධ්‍යක්ෂක වශයෙන් පත්වුනාට පසුව පොලිස් විශේෂ කාර්යාංශය ප්‍රතිසංස්කරණයක් හරි ප්‍රති ව්‍යුහගත කිරීමක් හරි ඔබ කරාද?

පි: එවකට සිටි පොලිස්පතිතුමාට අවශ්‍යතාවයක් තිබුණා විශේෂ කාර්යංශය ප්‍රතිව්‍යුහ ගත කිරීමට ඒ අනුව මගෙන් ඉල්ලීමක් කරා රාජ්‍ය බුද්ධි සේවාවේ මට තියෙන දැනීම සහ අත්දැකීම් එක්ක පළපුරුද්ද එක්ක විශේෂ කාර්යාංශයත් බුද්ධි කටයුතු සම්බන්ධයෙන් කටයුතු කල හැකි ආයතනයක් ලෙස ප්‍රති ව්‍යුහ ගත කරන ලෙසට.

ප්‍ර: ඔබ ඒ කාර්ය සිදු කරාද?

පි: ඒ කාර්ය ඔබ සිදු කරා බොහොම අමාරුවෙන් මොකද බුද්ධි අංශයක් පවත්වාගෙන යාමට සාමන්‍යයෙන් ගොඩාක් දේවල් අවශ්‍යයි මම භාර ගන්න අවස්ථාව වෙනකොට වාහන පොලිස් වාහන දෙකක් පමණයි තිබුණේ මම වාහනවගයක් වාහන 06 විතර ගන්න කටයුතු කරා ඊට

FAIR COMMENT BY JEZEEM

පස්සේ ඒකක සඳහා පරීගණක යන්ත්‍ර තිබුණ් නැහැ නිලධාරීන් ඒ ගොල්ලන්ගේ තමන්ගේ මුදල් යොදවමින් තමයි පරිඝණක කටයුතු ආදිය කරලා තිබුනේ. ඉතින් ඒක නිසා පරිගණක ගන්න කටයුතු කරා. මට ලොකුම ගැටලුව සිද්ධ වුනේ නිලධාරීන්ගේ බුද්ධිමය දැනුම සම්බන්ධයෙන් මට පුහුණු කඳවුරු පවත්වන්න සිද්ධ වුනා මේ නිලධාරීන් සඳහා මොවුන්ව බුද්ධි නිලධාරීන් බවට පත්කරීම සඳහා ඒ සඳහා පෞද්ගලිකව මට ලංකාවේ සියලුම පළාත්වලට ගිහිල්ලා මේ නිලධාරීන්ට ආමන්ත්‍රණය කරන්න සිද්ධ වුනා.

ප්‍ර; දැන් මෙම සියලු කටයුතු ඔබ කොයි වගේ කාලයකද අවසන් කරන්න ඔබට ලැබුනේ?

පි: 2018 වන විට විතර සාමාන්‍යයෙන් මට මතක හැටියට අවසන් කරන්න කියන්නේ බුද්ධි කටයුතු කියන දේ.

ප්‍ර: පුහුණුවීම් සමාවෙන්න පුහුණුවීම් ද

පි: පුහුණුවීම් 2018 අවසාන මම අවසාන වන විට මට මතක හැටියට පුහුණු වීම් කඳවුර පැවැත්තුවේ ස්ථානාධිපතිවරුන් සඳහා.

ප්‍ර: කිසියම් පුද්ගලයකු හෝ සංවිධානයක් සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු හෝ බුද්ධි තොරතුරක් ලබා ගන්නා අවස්ථාවේදී පුද්ගලයා මිය යෑමෙන් පසුව හෝ නැත්නම් අදාල සංවිධානය නිෂ්ක්‍රීය ක්‍රියාත්මක වීම අවසන් වූ පසු ඒ බුද්ධි මෙහෙයුම් ඒ සමඟ අවසානයට පත් කරනවද?

පි: පත් කරන්නේ නැහැ.

ප්‍ර: ඔබට එය කෙටියෙන් පැහැදැලි කරන්න පුළුවන්ද මොකක්ද ඔබ එමගින් අදහස් කරන්නේ කියලා?

පි: සංවිධානයක නායකා මියගියොත් හෝ එහෙම නැත්නම් වෙනත් කරුණක් නිසා ඔහු ඒ සංවිධානය අතඇරලා ගියත් ඔහුගේ followers ලා ඔනතරම් ඉන්න පුළුවන් අනුගාමිකයෝ ඕනතරම් ඉන්න පුළුවන් සංවිධානය තුල ඒ වගේම ඔහුට සම්බන්ධ අය ඒ කියන්නේ ඥාති සම්බන්ධ කමක් හෝ වෙනත් සම්බන්ධකමක් තියෙන අය ඔහු වෙනුවෙන් නැත්නම් ඔහුගේ කැපකීරීම් වෙනුවෙන් ඕනතරම් කටයුතු කරන්න පුළුවන් ඒක නිසා එහෙම බුද්ධි මෙහෙයුම් නවත්වන්නේ නැහැ.

ප්‍ර: දැන් පොලිස් විශේෂ කාර්යාංශය විසින් මේ තොරතුරු එක් රැස් ක්‍රියා කිරීම නේ ඔබ කියා සිටියේ සිදු කරනවා කියලා?

පි: එහෙමයි.

ප්‍ර: දැන් ඒ සඳහා යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් හෝ සංවිධාන සම්බන්ධව තොරතුරු රැස් කිරීම සඳහා සමාවෙන්න පොලිස් විශේෂ කාර්යාංශයට නියෝග දෙනු ලබන්නේ කවුද ?

පි: පොලිස්පතිතුමා විසින්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: පොලිස්පතිතුමා විසින් දෙනු ලබන නියෝග සම්බන්ධයෙන් පමණක් ද පොලිස් විශේෂ කාර්යාංශය මේ බුද්ධි මෙහෙයුම් මේ බුද්ධි එක්රැස්කිරීම් සිදු කරන්නේ?

පි: අපි විශේෂ කාර්යාංශය පවත්වාගෙන යාමේදී සිදු කරලා තියෙන්නේ පොලිස්පතිතුමාගේ නියෝග ක්‍රියාත්මක කිරීම පමණයි.

ප්‍ර: පොලිස්පතිතුමාගේ නියෝග ක්‍රියාත්මක කිරීම පමණයි එසේ පොලිස්පතිතුමාගෙන් ලැබෙන නියෝග පමණක් ක්‍රියාත්මක කල යුතු බවට පොලිස් වක්‍රලේඛන හෝ පොලිස්පති නියෝග තිබෙනවද?

පි: තිබෙනවා.

ප්‍ර: සාක්ෂිකරු ඔබට ඔබ බුද්ධි නිලධාරියෙක් ඔබ දන්නවා 2019.04.21 ලංකාව තුල ස්ථාන බොහොමයක විශේෂයෙන් බස්නාහිර පළාතේ ස්ථාන බොහොමයක මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයන් සිදුවුනු බවට?

පි: එහෙමයි.

ප්‍ර: එම මරාගෙන මැරෙන ප්‍රහාරයන් දියත් කරේ මොහොමඩ් තාසිම් සහරාන් කියන පුද්ගලයා ප්‍රමුඛ බෝම්බකරුවන් විසින් කියන එකට සම්බන්ධයෙනුත් ඔබට ඔබට අවබෝධයක් තියෙනවද?

පි: තියෙනවද.

ප්‍ර: මෙම 2019 .04.21 දිනට පෙර කිසියම් අවස්ථාවක හෝ අවස්ථාවන්වල මේ මොහොමඩ් සහරාන් සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු එක් රැස් කිරීමක් එහෙම නැත්නම් තොරතුරු පොලිස්පතිවරයා වෙත ලබාදීමක් පොලිස් විශේෂ කාර්යාංශය මගින් සිදු කරාද?

පි: පොලිස්පතිතුමා විසින් මට මතක හැටියට දෙවරක් හෝ තුන්වරක් මේ සහරාන් සම්බන්ධයෙන් මගෙන් වාර්තාවන් ඉල්ලා තිබුණා . එහෙම වාර්තා වලට මම පිළිතුරු වාර්තා ඔහුට යැව්වා.

ප්‍ර: ඔබ විසින් යවන ලද ඒ පිළිතුරු වර්තාවන් මේ අවස්ථාවේදී ඔබට දුටුවොත් හඳුනා ගැනීමට හැකියාවක් තියෙනවද?

පි: තියෙනවා.

ප්‍ර: මේ අවස්ථාවේදී පොලිස් විශේෂ කාර්යාංශ ලිපි ශීර්ෂයක් යටතේ සහරාන් හෂිම් නැමැති මවුලවිවරයා විසින් තම මුහුණු පොත ගිණුමේ යාවත්කාලීන කර තිබූ වීඩියෝවක් සම්බන්ධයෙන් විස්තර ඉදිරිපත් කිරීම මැයෙන් 2018.06.12 වෙනි දින අධ්‍යක්ෂක පොලිස් විශේෂකාර්යාංශය සහ නියෝජ්‍ය පොලිස්පති තිලක් ධනපාල විසින් අත්සන් කර ඇති වාර්තාවක් සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා. මෙම වාර්තාවේ ඔබගේ අත්සන තිබේද?

පි: මගේ අත්සන තිබෙනවා.

ප්‍ර: මෙය ඔබගේ ඔබ විසින් පොලිස්පති පූජිත ජයසුන්දර වෙත ඉදිරිපත් කරන ලද රහසිගත වාර්තාවක් ද ?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි: මා විසින් එතුමා විසින් ඉල්ලන ලද ලිපි වාර්තාවකට යවන ලද පිළිතුරු වාර්තාවක්.

එම වාර්තාව X -143 ලෙස ලකුණු කොට ඉදිරිපත් කර සිටිනවා.

ප්‍ර: මෙම වාර්තාව උප ශීර්ෂ කිහිපයක් යටතේ තමයි ඉදිරිපත් කරලා තියෙන්නේ ?

පි: එහෙමයි.

ප්‍ර: පළමු උප මාතෘකාව වශයෙන් කාත්තන්කුඩි ප්‍රදේශය ඇති වූ ගැටුම යන්න සඳහන් කර තිබෙනවා?

පි: එහෙමයි.

ප්‍ර: එමඟින් ඔබ පොලිස්පතිවරයා දැනුවත් කර තිබෙන්නේ 2017.03.10 දින ජාතික තවුහිද් ජමාත් සංවිධානය සහ සුන්නතුල් වල් ජමාත් සංවිධානය සාමාජිකයන් අතර ඇති වූ ගැටුමක් සම්බන්ධයෙන් ද ?

පි: එහෙමයි.

ප්‍ර: එසේම එමඟින් ඔබ පොලිස්පතිවරයා දැනුවත් කරලා තිබේද 2018.06.12 වෙනිදා මෙම ගැටුමෙන් පසු ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ ලේකම්වරයා වන සහරාන් කාත්තන්කුඩි ප්‍රදේශයෙන් පළා ගොස් සිටින බව?

පි: එහෙමයි.

ප්‍ර: එහි දෙවන උප ශීර්ෂය ලෙසට ඔබ සඳහන් කරලා තියෙන්නේ මොකක්ද?

පි: ජාතික තවුහිද් ජමාත් සංවිධානය තහනම් කරන ලෙස ඉල්ලීම.

ප්‍ර: මෙම ජාතික තවුහිද් ජමාත් සංවිධානය තහනම් කරන්න කියලා කවුරු විසින් ඉල්ලීමක් කරා කියලා ඔබ සඳහන් කරලා තියෙන්නේ?

පි: කවුත්තන් කාත්තාන්කුඩි

ප්‍ර: කවුරු විසින් ද කියලා සටහන් කරලා නැහැ?

පි: සටහන් කරලා නැහැ.

ප්‍ර: නමුත් ඒ ඉල්ලීම කොයි ආකාරයට ද කරේ කියන්න සටහන් කරලා තියෙනවද ?

පි: එහෙමයි.

ප්‍ර: කොහොමද කරලා තියෙන්නේ ?

පි: ජාතික තවුහිද් ජමාත් සංවිධානය විසින් අනිකුත් ආගමික නිකායන්හි ක්‍රියාකාරකම් විවේචනයට ලක් කරමින් දුගී දුප්පත් මුස්ලිම් ජනතාවට ආධාර උපකාර කරන බවට ප්‍රදර්ශනය කරන ආකාරයේ වීඩියෝ සකස් කර විදේශ රටවල් වලට ඒවා යොමු කර විශාල වශයෙන් මුදල් ආධාර ලබා ගැනීම සිදු කරන බැවින් මෙම සංවිධානය ත්‍රස්වාදී සංවිධානයක් ලෙසත් එය තහනම් කරන බවත් ඉල්ලා 2017.03.11 වෙනි දින කාත්තන්කුඩියේ උරුම කෞතුගාරය අසලදී විරෝධතාවයක් සිදුකළ ඇති බව අනාවරණය වේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ 2017.03.10 වෙනිදා සිදු වූ අර ගැටුමෙන් පසු දිනම කාත්තන්කුඩි උරුම කෞතුගාරය අසල උද්ඝෝෂණයක් පවත්වලා තියෙනවා. ජාතික තවුහිද් ජමාත් සංවිධානය තහනම් කරන්න කියලා. එහිදී තව දුරටත් කියලා තිබෙන්නේ ජාතික තවුහිත් ජමාත් සංවිධානය ත්‍රස්තවාදී සංවිධානයක් සහ ඔවුන් විදේශ ආධාර යම් යම් නීති විරෝධී ලෙස ලබා ගන්නා බවයි?

පි: එහෙමයි.

ප්‍ර: ඔබට හැකියාවක් තිබේද කියන්න මෙම උද්ඝෝෂණය පවත්වන ලද පුද්ගලයන් කුමන ජාතිකයට අයත් පුද්ගලයන් කියලද ?

පි: මුස්ලිම් ජාතිකයන්.

ප්‍ර: ඊළඟ උප මාතෘකාව සහරාන් නැමැති මවුලවිවරයා යන්න ?

පි: එහෙමයි.

ප්‍ර: එහිදී මෙම සහරාන් කියන පුද්ගලයා සම්බන්ධවත් ඔහුගේ සහෝදරයන් දෙදෙනෙක් වෙන ෂෙයිනි සහ රිල්වාන් යන අය ගැන සඳහන් කරලා තියෙනවා?

පි: එහෙමයි .

ප්‍ර: ෂෙයිනි මෙම සංවිධානයේ ඒ කියන්නේ ජාතික තවුහිද් ජාමත් සංවිධානයේ උපලේකම්වරයෙකු වශයෙන් කටයුතු කරන බවත් ඔබ සඳහන් කර තියෙනවද ?

පි: කාත්තන්කුඩි සංවිධානයේ කාත්තන්කුඩි උපලේකම් ලෙස .

ප්‍ර: කාත්තන්කුඩි සංවිධානයේ කාත්තන්කුඩි උපලේකම් ලෙස සඳහන් කරලා තියෙනවා ඉන් පසුව තිබෙන උප මාතෘකාව ජාතික තවුහිද් ජමාත් සංවිධානයට එක්වීම?

පි: එහෙමයි.

ප්‍ර: කවුද ඒ එක්වෙලා තියෙන්නේ?

පි: සහරාන්

ප්‍ර: ඒ එක්වීමට හේතුව දක්වලා තියෙනවද ?

පි: 2009 වර්ෂයේ දී දාරුල් අදවියා නැමැති සංවිධානය සමඟ කටයුතු කර එම සංවිධානයේ සාමාජිකයන් සමඟ ඇති කර ගන්නා ලද ගැටුමක් හේතුවෙන් එම සංවිධානයෙන් ඉවත් කොට ජාතික තවුහිද් ජාමත් සංවිධානයට එක් වී ඇතිවී අනාවරණය වී ඇති. එසේම තවත් උප මාතෘකා 3ක් තිබෙනවා. සහරාන් මවුලවිවරයාට කෙරෙහි මුස්ලිම් ජාතිකයන්ගේ විශ්වාසය කඩ කිරීම?

පි: එහෙමයි.

ප්‍ර: එසේම මුහුණු පොතේ ගිණුම සම්බන්ධවත් සටහන් කරලා තිබෙනවා?

පි: එහෙමයි.

ප්‍ර: එසේම එම මුහුණු පොතේ ඇති ඡායාරූපය සහ වීඩියෝ පටයක් ගැනත් යමක් මෙම ලිපියෙන් සටහන් කර තිබෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි.

ප්‍ර: අවසානයට නිරීක්ෂණය කියන උපශීර්ෂයක් යටතේ කරුණු වාර්තා තිබෙනවා?

පි: එහෙමයි.

ප්‍ර: කුමක් ද මේ නිරීක්ෂණ යටතේ ඔබ පොලිස්පතිවරයා වෙත දන්වා තිබෙන්නේ?

පි: මෙම සහරාන් බිම් හෂීම් හෙවත් සහරාන් හෂිම් යන අය සහරාන් බිම් හෂිම් යන නාමයෙන් පෙනී යන බව නිරීක්ෂණය වේ. තවද සහරාන් හසින් වෙනුවෙන් පවත්වාගන යන මුහුණු පොතෙහි ගිණුමෙහි මොහු පදිංචි ප්‍රදේශය ලෙස කාත්තන්කුඩි වශයෙන් සඳහන් කර ඇති බව පමණක් නිරීක්ෂණය වේ. අසීක් සහරාන් හසිම් කියන නාමයෙන් මොහු මවුලවිවරයකු වශයෙන් ලියාපදිංචි වී සිටින නමුත් මොහුගේ නිවැරදි නාමය මොහොමඩ් හසිම් මොහොමඩ් සහරාන් බවට ඉහත ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමේදී නිගමනය වේ.

ප්‍ර: හරි ඒ කියන්නේ මෙම පුද්ගලයාගේ සහරාන් කියන අයගේ නම් නම් සහ ඔහුගේ අන්වර්ත නාමයන් සඳහන් කරලා තිබෙනවා ඔබ එහිදි මෙම පුද්ගලයා සම්බන්ධයෙන් මෙම සහරාන් නැමැති පුද්ගලයා සිටින ස්ථානයක් සම්බන්ධයෙන් ස්ථානයක තොරතුරු සොයාගෙන මොහු විසින් දිගින් දිගටම සිදු කරනු ලබන මුස්ලිම් අන්තවාදී හා ආගම් අතර වෛරය පැතිරවීමේ අදහස් සමාජ ගත කිරීමේ උත්සහය නවතා දැමීමට කටයුතු කළ හැකි බව නිරීක්ෂණය වෙනවා කියලා සඳහන් කරලා තියෙනවා?

පි: එහෙමයි .

ප්‍ර: ඒ කියන්නේ ඔබ කියලා තිබෙන්නේ මා කිව්වොත් හරිද මෙම සහරාන් සොයාගෙන ඔහු විසින් කරනු ලබන මේ අන්තවාදී ආගමික අන්තවාදී ප්‍රචාරයන් සහ ආගමික වෛරය ඇතිකිරීම් නවත්වන ලෙසට හරිද?

පි: එහෙමයි.

ප්‍ර: මීට අමතරව මා ඔබට යෝජනා කරොත් පොලිස්පතිවරයාගේ ඉල්ලීම මත සෙයිඩ් මුජහිඩ් ඉබ්නි ,රසීඩ් කියන පුද්ගලයා සම්බන්ධයෙනුත් බුද්ධි වර්තාවක් පොලිස් විශේෂ කාර්යාංශය ඉදිරිපත් කර තිබෙනවද?

පි: එහෙමයි.

ප්‍ර: එය 2018.06.11 වෙනි දින තමයි එයත් ඉදිරිපතත් කර තිබෙන්නේ ඔබ ඒ අත්සන ඉදිරිපත් කර තිබුණා කිව්වොත් හරිද?

පි: එහෙමයි.

ප්‍ර; **මෙම වාර්තාව X 144 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා .** එසේම මෙහොමඩ් අමීස් මොහොමඩ් ආදීල් නමැති පුද්ගලයා සම්බන්ධයෙන් බුද්ධි වර්තාවක් Did you know හා the thinking Islamic නැමැති සමාජ ජාලා ගිණුම් දෙකක් මගින් IS සහ අන්වාදී මත වාදයන් ප්‍රචාරය

Prasanna Secretary Copy
FAIR COMMENT BY JEZEEM

කිරීම සම්බන්ධයෙන් යන මැයෙන් ඔබගේ අත්සනින් වාර්තාවක් පොලිස්පති පූජිත ජයසුන්දර වෙත ඉදිරිපත් කරාද?

පි: ඉදිරිපත් කරා.

ප්‍ර: **එම වාර්තාව මේ අවස්ථාවේදී X 145 ලෙස ලකුණු කර සාක්ෂිකරු මාර්ගයෙන් ඉදිරිපත් කරනවා.** මෙම X 145 දරන වර්තාවේ ඔබගේ නිරීක්ෂණයන්වලදී මෙම අදිල් කියන පුද්ගලයා IS සහ අල්කයිඩා සංවිධානවලට හිතවාදී පුද්ලයෙකු බව විශ්වාස කර තිබෙනවා?

පි: එහෙමයි.

ප්‍ර; ඔහු ඒ සම්බන්ධයෙන් වැඩි දුර විමර්ශනය කිරීමටත් ඔබ යෝජනා කර තිබෙනවද?

පි: මේ සම්බන්ධයෙන් විවෘත පරීක්ෂණයක් සිදු කරන ලෙසට මා යෝජනා කරලා තියෙනවා.

ප්‍ර: මා තවදුරටත් ඔබගෙන් විමසා සිටියොත් මේ ආදීල් කියන පුද්ගලයා අලුත්ගම දර්ගා නරගයේ පදිංචිකරුවෙක්ද?

පි: මොහුගේ ලිපිනය අපි විමර්ශනය අනුව අනාවරණය කර ගෙන තිබෙන්නේ අංක 75, එස්.එම්.පාර දර්සා නරගය ලෙස.

ප්‍ර: මේ අවස්ථාවේදී 2019.04.19 දාතමින් පොලිස්පති පූජිත ජයසුන්දර ආමන්ත්‍රණය කර ඇති පොලිස් විශේෂ කාර්යංශයේ ලිපි ශීර්ෂයකින් පිපිරීමකින් යතුරු පැදියකට හානී සිදුවීම සම්බන්ධව යන මැයෙන් ඉදිරිපත් කර ඇති වාර්තාවක් සාක්ෂිකරුට පෙන්වා සිටිනවා මෙම වාර්තාව පොලිස් විශේෂ කාර්යාංශ මගින් ඔබගේ අත්සන යටතේ ඉදිරිපත් කරපු වාර්තාවක්ද ?

පි: එහෙමයි

ප්‍ර: **මෙම වාර්තාව මේ අවස්ථාවේදී X146 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා උතුමාණෙනි.** මෙම X 146 පොලිස්පතිවරයා වෙත ඔබ ඉදිරිපත් කරන්නට යෙදුනේ ඔහුගේ ඉල්ලීම මතද නොමැතිනම් වෙනත් හේතුවක් මතද?

පි: ලංකාව තුල සිදු වන එදිනෙදා සිදුවීම් සම්බන්ධයෙන් විශේෂ කාර්යාංශය විසින් එම සිදු වීම් සම්බන්ධයෙන් යම් විශ්ලේෂණයක් කරනවා එම විශ්ලේෂණ මෙම යතුරු පැදිය සම්බන්ධයෙන් කරන ලද විශ්ලේෂණයේදී නිගමනය වූ දෙයක් ලෙස මෙම යතුරු පැදිය යම් කිසි විනාශකාරී දෙයක් අපරාධයක් සිදු කිරීමට පෙර කරන ලද පෙරහුරුවක් ද යන්න සැකයක් මතුවුනා ඒ නිසා ඒ සම්බන්ධයෙන් පොලිස්පතිතුමාව දැනුවත් කිරීමට මා විසින් වාර්තාවක් එතුමාට යැව්වා.

ප්‍ර: දැන් මෙම වාර්තාව මගින් ඔබ පොලිස්පතිවරයාව දැනුවත් කර තිබෙනවානේ?

පි: එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කුමක්ද දැනුවත් කර තිබෙන්නේ කොයි ආකාරයට ද දැනුවත් කර තිබෙන්නේ? මේ X146 මගින් පොලිස්පතිවරයාව දැනුවත් කර තිබෙන්නේ 2019.4.17 මේ වර්තාවට අනුව යතුරු පැදියක් පුපුරවා හැරීම සම්බන්ධව කියලා කිව්වොත් හරිද?

පි: එහෙමයි.

ප්‍ර: එම යතුරු පැදිය පුද්ගලයකුගේ නැති වූ හැඳුනුම්පතක් භාවිතා කර ගෙන කදාන ප්‍රදේශයේ ස්ථානයකින් මිලදී ගත් යතුරු පැදියක් බව සටහන් කරලා තියෙනවද?

පි: එහෙමයි.

ප්‍ර: දැන් මෙම යතුරු පැදිය සමඟ එම හැඳුනුම්පතම භාවිතා කරලා තවත් යතුරු පැදියක් මිලදී අරගෙන තිබෙන බවත් ඔබ සටහන් කර ගෙන තිබෙනවද?

පි: එහෙමයි.

ප්‍ර: එසේම මේ පුපුරවා හැරීමට සහරාන් නැමැති සහරාන් ප්‍රමුඛ කණ්ඩායම විසින් සිදු කර ඇති බව ඔබ සඳහන් කර තිබෙනවා ද?

පි: එසේ සඳහන් කිරීමක් කරලා නැහැ නමුත් මම මෙහි සඳහන් කරලා තියෙනවා මෙම නැති වූ ජාතික හැඳුනුම්පත යොදා ගනිමින් සිම්කාඩ්පතක් ලබා ගෙන ඇති බවත් ඒ සිම් කාඩ්පත ලබා ගෙන කරන ලද අපරාධයක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණ පවත්වා ඇති බවත් එහිදි එම අපරාධය සහරාන් නැමැති කල්ලියක් විසින් හැඳුනුම්පත භාවිතා කරමින් සිදු කර ඇති බව සඳහන් කරනවා.

ප්‍ර: ඒ කියන්නේ ඒ මෙම පුපුරවා හැරීමට ඔහුගේ සම්බන්ධතාවයක් තිබෙන බවද සටහන් වෙන්නේ?

පි: එහෙමයි .

ප්‍ර: මෙම වාර්තාව පොලිස්පතිවරයා වෙත ඒ කියන්නේ X 146 පොලිස්පතිවරයා වෙත ඔබ ඉදිරිපත් කරාම පොලිස් විශේෂ කාර්යාංශය වෙත පොලිස්පතිවරයා නැවත එම ලිපිය එම වාර්තාව X 146 යොමු කර තියෙනවද?

පි: යොමු කර තියෙනවා.

ප්‍ර: කුමන කාරණයකට ද නැවත යොමු කරලා තියෙන්නේ?

පි: This mention progress report by 5590

ප්‍ර: කාට ද එහෙම

පි: DIG special branch මට එවලා තියෙනවා පොලිස්පතිතුමාට විසින් .

ප්‍ර: පොලිස් විශේෂ කාර්යාංශයේ නියෝජ්‍ය පොලිස්පති වෙත පොලිස්පති විසින් සටහනක් දමලා තිබෙනවා 2019.05.05 වන දිනට ප්‍රගතිය වාර්තා කරන්න කියලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එහෙමයි.

ප්‍ර: ප්‍රගතිය වාර්තා කරන්න කියලා සටහන් කරලා තියෙනවද මේ ප්‍රගතිය වාර්තා කරන්න කියලා පොලිස්පතිවරයා මේ සටහන යොදපු දිනය කවද්ද ?

පි: 2019.04.21 වෙනිදා

ප්‍ර: මෙම X 146 පොලිස්පතිවරයාගේ නියෝගය සමඟ ඔබට ලැබෙන්නේ කවද්ද කියලා මට කීමට හැකියිද?

පි: 2019.4.22 වෙනිදා.

ප්‍ර: වේලාව සටහන් වෙනවද?

පි: වේලාව සටහන් වෙලා නැහැ.

ප්‍ර: දැන් මේම X 146 මගින් ඔබ නිරීක්ෂණය කරලා තිබෙන කොටස අවසාන කොටස මෙම ගරු සභාවට ප්‍රකාශ කරන්න?

පි: මෙය යම් අපරාධයක් සිදු කිරීම සඳහා කරන ලද අත්හදා බැලීමක් ද යන්න ප්‍රශ්න සහගත බව නිරීක්ෂණය වේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: X 146 දරණ ලේඛනය සහරාන් හෂිම්ගේ නම් සඳහන් වෙනවා නේද?

පි: එහෙමයි.

ප්‍ර: X 146 පූජිත් ජයසුන්දර මහතාට යවලා ඔබ වෙත එම ලිපිය නැවතත් අප්‍රේල් මාසේ 22 වෙනිදා ලැබෙන තුරු පූජිත ජයසුන්දර මහතා දුරකථනයෙන් හෝ ඔබට කථා කරලා ඔය සම්බන්ධයෙන් වැඩි දුර විස්තර ලබා ගත්තාද?

පි: නැහැ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: ඔබ මෙම ලිපිය යොමු කිරීමෙන් පසුව තමයි 2019.04.21 දින පිපිරීම සිදුවන්නේ?

පි: එහෙමයි.

ප්‍ර; මරාගෙන මැරෙන පිපිරීම් සිදුවන්නේ?

පි: එහෙමයි.

ප්‍ර; දැන් ඔබ වෙත මෙම වැඩි දුර වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා පොලිස්පති පූජිත ජයසුන්දර දැනුවත් කරාට පසුව පොලිස් විශේෂ කාර්යාංශය විසින් වැඩිදුර වාර්තාවක් මෙම යතුරු පැදි පිපිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරලා තියෙනවද?

පි: ඉදිරිපත් කරලා තියෙනවා.

ප්‍ර; කවද්ද ඒ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: 2019 .05. මාසේ 06 වෙනිදා.

ප්‍ර: එම වාර්තාව ඔබ අත්සන් කර තිබෙනවද?

පි: අත්සන් කර තිබෙනවා.

ප්‍ර: එය මෙම 2019 .05.06 දිනැති සාක්ෂිකරු විසින් අත්සන් කර ඇති බට සඳහන් කරනු ලබන පිපිරීමකින් යතුරු පැදියකට හානි සිදුවීම සම්බන්ධව යන මැයෙන් වන වාර්තාව X 147 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා උතුමාණෙනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කිව්වා X 146 සම්බන්ධයෙන් අප්‍රේල් මාසේ 22 වෙනිදා ඔබට එම ලිපිය ලැබෙන තුරු පූජිත ජයසුන්දර මහතා දුරකථනයෙන් හෝ ඔබගෙන් විමසීමක් කෙරුවේ නැහැ කියලා?

පි: එහෙමයි.

ප්‍ර: වෙනත් යම් පොලිස් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් හෝ යම් රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක ඔබගෙන් ඔය යවපු ලිපිය ගැන විමසීමක් කෙරුවද?

පි: නැහැ.

ප්‍ර: ආරක්ෂක ලේකම් හෝ ?

පි: නැහැ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර: දැන් X 146 මගින් යතුරු පැදි දෙකක් ගත් බව සටහන් කර තිබෙනවද?

පි: එහෙමයි.

ප්‍ර: නිවැරදිද?

පි: එහෙමයි. නිවැරදියි.

ප්‍ර: X 147 ට අනුව මේ මිලදී ගත් එක් යතුරු පැදියක් තමයි කාත්තන්කුඩියේදී පුපුරවා හැර තිබුණේ ?

පි: එහෙමයි.

ප්‍ර: හරිද?

පි: හරි.

ප්‍ර: මේ අනෙක් මෝටර් සයිකලය සම්බන්ධයෙන් විස්තරයක් සඳහන්ව තියෙනවද?

පි: මගේ 2019.05.06 වෙනි දින . X 147 දරණ වාරතාවේ සඳහන් කර තිබෙනවා.

ප්‍ර: X 147 දරණ වාර්තාවේ කුමක්ද ඔබ සඳහන් කර තිබෙන්නේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: BCY 2183 දරණ යතුරු පැදිය අංක 152 – 2 ජුනයිඩ් මාවත නුවර පාර තිහාරිය යන ලිපිනයේ පදිංචි MHM නලීන් යන අයගේ නිවසේ පහත මහලේ කාමරයක් තුල සඟවා තිබයදී සොයාගෙන ඇති අතර එම අවස්ථාවේ යතුරු පැදියේ අංක තහඩු ගලවා ඉවත් කර රෙද්දකින් වසා තිබී ඇත.

ප්‍ර: එ කියන්නේ කාගේ නිවසේ තිබිලා ද සොයා ගෙන තිබිලා තියෙන්නේ?

පි: එම්.එච්. එමම් නලීන් නැමැති.

ප්‍ර: එය හොයාගෙන තිබෙන යතුරු පැදියේ අංක තහඩු ඉවත් කරලා තියෙන්නේ ?

පි: එහෙමයි.

ප්‍ර: ඒ අංක තහඩු සොයා ගැනීමත් සම්බන්ධයෙන් X 147 හි සඳහන් වෙනවද?

පි: සඳහන් වෙනවා.

ප්‍ර: කොහොමද සඳහන් වෙන්නේ?

පි: යතුරු පැදිය සඟවා තිබු නිවස වැඩිදුරටත් පරීක්ෂා කිරීමේදී මෙහි අංක තහඩුව කුඩා කොටස්වලට කපා ඉටි බෑගයක බහා ශීකරණයක යට කොටසේ දමා සඟවා තිබී පොලිස් නිලධාරීන් විසින් සොයා ගෙන ඇති අතර දැනට මාස තුනකට පමණ පෙර ඉහත දී මෙම නිවසේ පහල මහලේ කුලී පදනම මත රැදී සිටි අංක T 59 -1 මඩල්බෝව හෙම්මාතගම පදිංචි MHS හාබිදින් ජාතික හැඳුනුම්පත් අංකය 671372301 V යන අය විසින් එම යතුරු පැදිය පරිහරණය කර ඇති බවත් 2019.04.21 වන දින සිදු වූ බෝම්බ පිපිරීම්වලින් පසු මොහු එම නිවස අතහැර පලා ගොස් ඇති බවටත් අපිට තොරතුරු අනාවරණය වී ඇත.

ප්‍ර: කවුද ඒ මෝටර් සයිකලය පරිහරණය කරපු පුද්ගලයා?

පි: එම්.එච්.එස් ආබ්දීන් නැමැති අය.

ප්‍ර: ඔහු හෙම්මාතගම පදිංචි ?

පි: හෙම්මාතගම කියන්නේ මාවනැල්ල ප්‍රදේශයේ පිහිටි ගමක්ද?

පි: ගමක්.

ප්‍ර: සාක්ෂිකරු ඔබ වසර 32 ක් පමණ රාජ්‍ය බුද්ධි සේවාවේ සේවය කරපු නිලධාරිවරයෙක්

පි: එහෙමයි.

ප්‍ර: ඒ කියන්නේ ඔබගේ මුළු පොලිස් දිවියේ දිවියම රාජ්‍ය බුද්ධි සේවාව හා සම්බන්ධිත පුදගලයෙක්?

පි: එහෙමයි.

ප්‍ර: දැන් මෙම X 143 ,X 144,X145,X146 සහ X 147 දරණ ලේඛන මේ රහසිගතයි කියන මුද්‍රාව ප්‍රදර්ශනය වෙන්න තිබෙනවා?

පි: හරි තියෙනවා.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මෙම වර්තා පොලිස්පතිවරයා වෙත ඉදිරිපත් කිරීමේදී මේ රහසිගතයි කියන මුද්‍රාව තබලද ඔබ ඒ වාර්තාව ඉදිරිපත් කරේ?

පි: බුද්ධි අංශයක වාර්තා ඉදිරිපත් කිරීමේදී ආරක්ෂක පියවරවල් කීපයක් ගන්නවා those are security classifications

ප්‍ර: මොනවද ඒ ආරක්ෂක පියවරවල්?

පි: එකක් For your eyes is only දෙවනි එක ඉතා රහස්‍යයි. ඊළඟ එක රහස්‍යයි ,ඊළඟට රහසිගතයි.

ප්‍ර; දැන් ඔබ මෙම ලේඛන ඉදිරිපත් කර තිබෙන්නේ රහසිගතයි යන classifications එක යටතේ?

පි: එහෙමයි.

ප්‍ර: රහසිගතයි කියලා බුද්ධි විමර්ශයන්වලට අනුව මොකක්ද මේ රහසිගතයි කියන එකෙන් අදහස් කරන්නේ ?

පි: මෙම තොරතුරු පිටස්තර පුද්ගලයෙකු අතට ගියොත් මේ තොරතුරුවල වටිනාකමක් නැතිවෙන බවත් තමයි සඳහන් කරන්නේ

ප්‍ර: රහසිගතයි කියන එක?

පි: එහෙමයි .

ප්‍ර: ඉතා රහසිගතයි කියන Classification එකෙන් වර්ගකිරීමෙන් කුමක්ද අදහස් වෙන්නේ?

පි: එහිදි පිටස්තර ඉතා රහසිගතයි කියලා නැහැ රහස්‍යයයි කියලා තියෙන්නේ.

ප්‍ර; සමාවෙන්න රහස්‍යයි කියන එකේ ? රහස්‍යයි සික්‍රට්?

පි: එතනදී කියවෙන්නේ පිටස්තර පුද්ගලයෝ නෙමේ සමහර විට මේ ලිපිය ලැබෙන ස්ථානයේ උනත් සීමිත සංඛ්‍යාවකට මෙහි මේ ලිපියට access දියුතු බව.

ප්‍ර: රහසිගතයි කියන්නේ Confidential ද?

පි: Confidential

ප්‍ර: ඊළඟට රහස්‍යයි Secret?

පි: Secret

ප්‍ර: ඊළගට වර්ගීකරණය මොකක්ද?

පි: top secret ,ඉතා රහස්‍යයි.

ප්‍ර: ඉතා රහස්‍යයි කියන වර්ගීකරණය ලබා දෙන්නේ එමගින් අදහස් කරන්නේ මොකක්ද?

පි: එම තොරතුරු කොහොමවත් යම් කිසි සීමිත විශේෂයෙන්ම බුද්ධි තොරතුරු බොහෝ විට ඉතා රහස්‍ය වගේ තොරතුරු ඉදිරිපත් කරන්නේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හෝ රජයේ ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කරන ඉහලම අංශවලට දැන ගැනීම සඳහයි එතැනින් පිටතට නොයායුතුයි කියන එක තමයි අදහස් කරන්නේ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: For your eyes only එමගින් කුමක්ද අදහස් වෙන්නේ?

පි: මෙයින් අදහස් වෙන්නේ වාර්තාව ලබන පුද්ගලයාගේ දැන ගැනීම සඳහා පමණක් එම වාර්තාවක් ඉදිරිපත් කරන බවත් එම වාර්තාවේ අඩංගු දේ එතුමා විසින් පමණක් ක්‍රමානුකූලාකාරයට ආකාරයට භාවිතා කල යුතු බවත්.

X 94 සාක්ෂිකරු වෙත පෙන්වා සිටිනවා.

ප්‍ර: ඔබට 2019.04.21 දිනට පෙර මෙම X 94 හි තිබෙන තොරතුර ලැබී තිබුණද?

පි: නැහැ.

ප්‍ර: මෙම X 94 හි තිබෙන තොරතුර ඔබගේ කාර්යාංශයට ලැබුණා නම් ඔබලා විසින් එ සම්බන්ධයෙන් යම් පියවරක් ගන්නවද ?

පි: එහෙමයි.

ප්‍ර: මොන වගේ පියවරක්ද?

පි: මේ සම්බන්ධයෙන් මාගේ යටතේ සිටින අනෙකුත් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සහ සියලුම කොට්ඨාශවල සිටින ස්ථානාධිපතිවරුන් දැනුවත් කිරීමක් මා විසින් සිදුකරනු ලබනවා. මේ අනුව ඔවුන්ට මෙම අදාල ස්ථාන සම්බන්ධයෙන් ආවේක්ෂණ කටයුතු දියත් කරන ලෙස මා විසින් ඉල්ලීමක් කරනවා.

ප්‍ර: මෙම X 94 තිබෙන තොරතුරේ සඳහන් පරිදි විය හැකි මරාගෙන මැරෙන ප්‍රහාරය හෝ පිහි ප්‍රහාරය හෝ වලක්වා ගැනීමටද ?

පි: වලක්වා ගැනීමට.

ප්‍ර: සාක්ෂිකරුට C4 A දරණ ලේඛනය පෙන්වා සිටියි. මෙම C4 A දරණ ලේඛනයේ ජාතික බුද්ධි ප්‍රධානී විසින් පොලිස්පතිතුමා ආමන්ත්‍රණය කරපු බුද්ධි තොරතුරක්?

පි: එහෙමයි.

ප්‍ර: මෙහි top secret යන්න සඳහන් වෙනවද ?

පි: එහෙමයි.

ප්‍ර: එසේම eyes only කියන වර්ගීකරණයක් සඳහන් වෙනවද?

පි: සඳහන් වෙනවා නමුත් මෙතන වැරදීමක් තියෙනවා .

ප්‍ර: මොකක්ද ඒ වැරදිම?

පි: top secret and eyes only දෙකක් දාන්න බැහැ. එහෙම Classification කරන්න බැහැ එකක් top secret or for your eyes only.

ප්‍ර: ඇයි ඒ ඔබ එහෙම කියන්නේ?

පි: එතකොට ඒ classifications ටිකේ මං කිව්ව නිර්වචනය ආකාරයට වෙනසක් මෙකේ සිදු වෙනවා

ප්‍ර: ඒ කියන්නේ eyes only නම් එය ලැබෙන පුද්ගලයාට පමණයි?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: පමණක් ඒක අරගෙන එකෙන් යම් කිසි වැඩක් කරන්න ඕනේ ඒ කියන්නේ ක්‍රියාත්මක විය යුතුයි. නමුත් top secret නම් යම් කිසි කණ්ඩායමකට මේ සම්බන්ධයෙන් තීන්දු තීරණ ගත හැකි කණ්ඩායමක් තුල ඒදේ ගන්න පුළුවන් නමුත් Source of information as to be should not be disclosed.

දැන්වේලාව. ප.ව 6.45.
මෙතැන් සිට:ල/ලේ ඉන්ද්‍රානි මිය

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ චන්දිමා මෙය
දැන් වේලාව : ප.ව. 6.45 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබ පොලිස් විශේෂ කාර්යාංශයට Special Branch එකට පැමිණෙන්න පෙර රාජ්‍ය බුද්ධි සේවයේ හිටියා නේද 1990 වර්ෂයේ ඉඳලා නේද?

පි : 84 වර්ෂයේ දෙසැම්බර් මාසේ සිට.

ප්‍ර : මෙම කොමිෂන් සභාවේ දැන ගැනීම සඳහා ඔබට විස්තර කරන්න පුළුවන්ද මේ රාජ්‍ය බුද්ධි සේවයේ විකාශය ඔබ දන්න තැන ඉඳලා වර්තමානය වෙනකම් විකාශය කෙටියෙන් පැහැදිලි කරන්න?

පි : හරියටම මුලදී වර්ෂවල් නම් මට අමතකයි ස්වාමීනි. මුලදිම මෙය පොලිස් Special Branch කියලා තමයි ඒ කියන්නේ විශේෂ අංශය කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ තමයි 1943 මට මතක ආරම්භ කරලා තියෙන්නේ. ඊට පස්සේ මේක Public Service Division කියලා එක කාලයක නම් කරලා තිබ්බලා තියෙනවා. ඊට පස්සේ ආපසු ISD කියලා මේ Internal Security Division කියලා ඒත් CID එක යටතේම ක්‍රියාත්මක වෙලා තියෙනවා. 1984 ගැසට් නිවේදනයකින් තමයි ජාතික තොරතුරු කාර්යාංශය ලෙස NIB ලෙස නම් කරලා තිබෙන්නේ. ඉන්පසු 1997 මෙය ආපසු කොටස් දෙකකට බෙදුණා. DFI and DII කියලා.

ප්‍ර : ඒක විස්තර කරන්න ඉස්සරලා මට ඔබගේ මතකය අවදි කෙරුවොත් 1973 වර්ෂයේද මේක බුද්ධි සේවා කොට්ඨාශය, ISD වශයෙන් හඳුන්වනු ලබන්නේ?

පි : 73 පමණ ISD වශයෙන් නම් කරනවා.

ප්‍ර : දැන් කියන්න අර ඉස්සරලා 97 වර්ෂයේදී ...,

පි : 97 වර්ෂයේ DFI සහ DII වශයෙන් නම් කරනවා. Directorate of Foreign Intelligence and Directorate of Internal Intelligence කියලා. ඊට පස්සේ 2005 වර්ෂයේ නැවත SIS විදියට නම් කෙරෙනවා.

ප්‍ර : එතකොට 2005 වර්ෂයට පෙර ඔය අංශය පැවතියේ මොන අමාත්‍යාංශය යටතේද? යම් අමාත්‍යාංශයක් යටතේ තිබ්බද? මොන අමාත්‍යාංශය යටතේද?

පි : මෙය 1984 ජාතික තොරතුරු කාර්යාංශය NIB කියලා නම් කළාට පසුව පැවතුණේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ පොලිස් විශේෂ කාර්යාංශය වෙත ස්ථාන මාරු වෙනකම් ඒක රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතේද තිබ්බේ?

පි : එහෙමයි.

ප්‍ර : 2016 ත් ආරක්ෂක අමාත්‍යාංශය යටතේද තිබ්බේ?

පි : ආරක්ෂක අමාත්‍යාංශය යටතේ.

ප්‍ර : රාජ්‍ය බුද්ධි සේවය?

පි : රාජ්‍ය බුද්ධි සේවය.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : පීරිස් මහත්මයා ඔබ මේ අංශයේ දීර්ඝ කාලීනව සේවය කරලා තියෙන නිසා ඔබට හොඳ අත්දැකීම් තියෙනවා. ඒ වගේම මේ ක්‍රමයේ තියෙන්නා වූ අඩුපාඩු, දුර්වලකම් පිළිබඳව වැටහීමක් තියෙනවා. බුද්ධි සේවාව වර්තමානයේ පවතින තත්ත්වයෙන් ඔබ්බට දියුණු කරන්න ඔබ මොනවත් අදහස් යෝජනාවක් ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : ස්වාමීනි මේ බුද්ධි සේවාව අධ්‍යක්ෂ ධූර දරලා තිබෙන්නේ මම දන්නා පරිදි උප පොලිස් සේවයට බැඳිච්ච, උප පොලිස් පරීක්ෂක වශයෙන් පොලිස් සේවයට බැඳිලා, උසස්වීම් ලබලා, ඉහළ තනතුරුවලට ආපු නිලධාරීන් දිගින් දිගටම බුද්ධි සේවාවේ ඉඳලා තිබෙන්නේ එක්කෙනෙක් හෝ දෙදෙනෙක් හැර. ඒ කියන්නේ ඒ.ටී. ෆොන්සේකා සහ එම්.එම්. ගුණරත්න නැමැති නිලධාරීන් දෙදෙනා හැර ඉතුරු සියළුම අධ්‍යක්ෂවරු සහ උප පොලිස් පරීක්ෂකවරු වශයෙන් බැඳිලා අධ්‍යක්ෂ ධූරයට පත් වෙච්ච නිලධාරීන්. ඒ පත් වෙච්ච නිලධාරීන් බොහෝම අත්දැකීම් බහුලයි. ඉතිං බුද්ධි සේවයක් සාමාන්‍යයෙන් අත්දැකීම් Field Work කරපු නැති කෙනෙකුට කරගෙන යාම ටිකක් අමාරුයි. ස්වාමීනි මේකෙදී මේ බුද්ධි තොරතුරු ලැබෙන ආකාරය සම්බන්ධයෙන් ලොකු අවබෝධයක් බුද්ධි අංශ ප්‍රධානියාට තියෙන්න ඕන. එහෙම නැත්නම් අපේ බුද්ධි තොරතුරු විශ්ලේෂණයේදී සමහර වෙලාවට වැරදීම් සිදු වෙන්න පුළුවන් අත් වැරදීම්. ඒවා බුද්ධි අධ්‍යක්ෂවරයාට දැනෙන්න ඕන. ඒක නිසා බුද්ධි අංශයක පළපුරුදු සහ අත්දැකීම ඉතාමත් අත්‍යවශ්‍යයි. බුද්ධි අංශයක් දියුණු කරනවා නම් පළපුරුද්දෙන් සහ අත්දැකීමෙන්, පොලිස් සේවයේ පළපුරුද්ද සහ අත්දැකීම ගැන නෙමෙයි ස්වාමීනි මම කථා කරන්නේ, බුද්ධි අංශයේ පළපුරුද්ද සහ අත්දැකීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතුයි.

President's Copy
FAIR COMMENT BY JEZEEM

ප : විදේශ රටවල බුද්ධි අංශ සහ ඒ ආශ්‍රිත ආයතන ක්‍රියාත්මක වෙන ක්‍රමය පිළිබඳව ඔබ හදාරලා ඇතිනේ?

පි : එහෙමයි.

ප : ඒ අනුව ඔබට ශ්‍රී ලංකාවේ පවතින ක්‍රමය තව ටිකක් වැඩි දියුණු කරන්න මොනවා හරි පිටරට තියෙන දේවල්වලින් උකහා ගන්න පුළුවන් යමක් මතක් වෙනවද?

පි : ස්වාමීනි ජාත්‍යන්තර වශයෙන් ගත්තම ගොඩක් රටවල තියෙන බුද්ධි සේවාවන් එක්කෝ විශ්‍රාම ගිය ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් තමයි ඒ කියන්නේ Premature අයව තමයි බඳවගෙන කටයුතු කරන්නේ. අනිත් අය සියළුම දේ Layman ඒ කියන්නේ පොලීසියට හෝ ත්‍රිවිධ හමුදාවට සම්බන්ධ අය නෙමෙයි ගොඩක් අවස්ථාවල්වල. නමුත් දකුණු ආසියාතික රටවල්වල තමයි පොලිස් නිලධාරීන් හෝ හමුදා නිලධාරීන්ගෙන් සැදුම් ලත් බුද්ධි අංශ අපි දකින්නේ. ඉතිං බුද්ධි අංශයකට අද වර්තමානයේ තියෙන ව්‍යාකූලභාවයත් සමඟ මම කථා කරන්නේ ස්වාමීනි දැන් Social Media ඊළඟට Cyber Crimes ආදී දේවල් ගැන බලනකොට බුද්ධි අංශයකට අපේ රටේ වුණත් විද්වතුන්ගෙන් සැදුම් ලත් උපදේශක කණ්ඩායමක් සිටීම මම හිතන්නේ අද රටේ අවශ්‍යතාවය අනුව අත්‍යවශ්‍යයි.

ප : ඔබ ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ මොකද්ද?

පි : ලැබෙන තොරතුරු, අපිට ලැබෙන තොරතුරු සමහර තොරතුරු පොලිස් නිලධාරීන් වශයෙන් අපට විශ්ලේෂණය කර ගන්න අමාරුයි. සමාජ ජාලා වෙබ් අඩවි, Cyber Crimes තවත් නොයෙකුත් තාක්ෂණයෙන් ලැබෙන තොරතුරු. නමුත් විද්වත් මණ්ඩලයක් අපිට ඉන්නවා නම් වැඩි අය නෙමෙයි බොහොම කිහිප දෙනෙක්, විශේෂයෙන්ම විදේශ කටයුතු සම්බන්ධයෙන් වෙනත් රටවල්වල සිදුවන දේවල් සම්බන්ධයෙන් ආදිය ගැන කථා කරන්න මම හිතන්නේ අපිට යම්කිසි හොඳ ගමනක් යන්න පුළුවන් වෙයි.

ප : ඒ කියන්නේ විදේශ කටයුතු සම්බන්ධයෙන් අවබෝධයක් තියෙන ඒ පිළිබඳව Analyse කරන්න පුළුවන් අය?

පි : පුළුවන් අපි හිතමු කණ්ඩායමෙන් එක්කෙනෙක් ඒ විදේශ කටයුතු සම්බන්ධයෙන් පිටරටවල්වල සිදුවන දේවල්. අනිත් එක්කෙනා Computers හෝ ඊට අදාළ දේවල් සම්බන්ධයෙන්. අනිත් එක්කෙනා සමාජ ජාලා, වෙබ් අඩවි ඒ වගේ ඒ ආදී වශයෙන් කොටස් තුනකින් හතරකින් සමහර වෙලාවට Legal බුද්ධි අංශවල Legal background එකත් තියෙන ගොඩක් අය එන්නේ නැහැ

FAIR COMMENT
BY JEZEEM

නිලධාරීන් තමන්ගේ පෞද්ගලික ජීවිතයේ නීතිවේදියෙක් වී තිබුණොත් පමණයි ඒ හැකියාව එතනට ලබා ගන්න වෙන්නේ. නමුත් Officially එහෙම දෙයක් නැහැ. ඉතිං ඒ වගේ සමහර විෂයන් සම්බන්ධයෙන් ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් යම්කිසි මණ්ඩලයක් සතියකට වරක් හෝ ආයතනයට ලැබෙන බුද්ධි තොරතුරු විශ්ලේෂණයකට හෝ සාකච්ඡාවකට භාජනය කරනවා නම් වැදගත් කියලා මම හිතනවා.

ප : මේ මගේ අවසාන ප්‍රශ්නය. ඔබ දැන් විශ්‍රාම ගිහිල්ලා ඉන්නේ. ඔබට දැන් වසර තිස් ගාණක අත්දැකීම් තියෙනවා. ඔබ දැන් මේවා ප්‍රයෝජනයට ගන්නවද?

පි : කණගාටුයි ස්වාමීනි නැහැ.

Thank you.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප : සාක්ෂිකරු බුද්ධි අංශයකට තොරතුරක් ලැබුණයින් පසුව පොලිස්පතිවරයාට හෝ වෙනත් ඉහළ නිලධාරියෙකුට එම තොරතුර ලබා දීමෙන් පසු පසුවිපරමක් කරනවද ඒ බුද්ධි තොරතුර සම්බන්ධයෙන් ගත්ත පියවර සම්බන්ධව?

පි : ගත්ත පියවර සම්බන්ධයෙන් පසු විපරමක් කිරීමේ අවශ්‍යතාවයක් තියෙනවා බුද්ධි තොරතුරේ අඩංගු දේ, ඒ කියන්නේ බුද්ධි තොරතුරේ තියෙන එකක් බුද්ධි තොරතුරේ Credibility එක අපිට දැන ගැනීම සඳහා ඒ බුද්ධි තොරතුර සම්බන්ධයෙන් මොකද්ද වෙන්නේ කියන එක අනිවාර්යයෙන්ම අපි පසුවිපරමක් කරන්න ඕන. ඊළඟට අපි ලබා දුන්නා, බුද්ධි අංශය ලබා දුන්නා බුද්ධි තොරතුරට මොකද්ද වෙන්නේ කියන එක අනිවාර්යයෙන්ම බුද්ධි අංශය දැනගත යුතුයි. නැත්නම් අපිට බුද්ධි තොරතුරු ලබාදෙන අයගේ අධෛර්යමත්වීමක් සමහර විටෙක සිදු වෙන්න පුළුවන්.

ප : ඒ කියන්නේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වියහැකි බුද්ධි තොරතුරක් නම් එය පසු විපරමක් කිරීම වඩාත් සුදුසුයි කියලද ඔබ කියන්නේ?

පි : එහෙමයි.

ප : සාක්ෂිකරු ඔබට මේ පානදුර ප්‍රදේශයේදී මේ කාත්තන්කුඩියට භාණ්ඩ ගෙනියන ලොරියකින් බයිසිකල් බෝල පාර්සලයක් වැටීම සම්බන්ධයෙන් තොරතුරක් ලැබුණද?

පි : නැහැ.

ප : පානදුර පොලීසියෙන්වත්?

FAIR COMMENT BY JEZEEM

පි : නැහැ.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් තමන්ලා දැන ගැනීමට කිසිවක් ලැබුණේ නැහැ?

පි : නැහැ.

****

ගරු බන්දුල අතපත්තු මැතිතුමා :

ප්‍ර : පීරිස් මහත්මයා ඔබ හිතන හැටියට දැන් අපේ බුද්ධි අංශවල තාක්ෂණික දැනුම තත්ත්වය කොහොමද?

පි : තාක්ෂණික දැනුම මදි. ලෝකයත් එක්ක ජාත්‍යන්තරව අපි සංසන්දනය කරනකොට අපි තාක්ෂණික දැනුම ඉතාමත්ම අඩුයි.

ප්‍ර : ඒක දියුණු කර ගන්න කළ යුත්තේ මොකද්ද?

පි : අනිවාර්යයෙන්ම රජය ක්‍රියාත්මක වෙන්න ඕන. බුද්ධි අංශයේ තාක්ෂණික දැනුම, මම හිතන්නේ දැනටමත් ඉල්ලීම් කිහිපයක් කරලා ඇති. නමුත් යම්කිසි ආර්ථිකමය බාධාවන් නිසා තාක්ෂණික දැනුම සෑහෙන්න වියදම් සහගත දෙයක් ස්වාමිනි. ඒක නිසා ඒක ක්‍රමවත් ආකාරයෙන්, එක්කෝ ජාත්‍යන්තර විදේශ බුද්ධි අංශ මගින් අපිට ඉල්ලීමක් කරන්න පුළුවන් අපිට මේ උපකාරය කරන්න කියලා. ඒ වගේ අවස්ථා තියෙනවා.

ප්‍ර : තාක්ෂණික මෙවලම් අපිට හිඟකමක් තියෙනවද?

පි : මෙවලම් නැහැ. මෙවලම් නැති ප්‍රශ්නය තමයි තියෙන්නේ. ඊළඟට පුහුණුව නැහැ අපේ නිලධාරින්ට.

හොඳයි. බොහොම ස්තුතියි.

****

ගරු අදිකාරී මැතිණිය :

ප්‍ර : මිස්ට පීරිස් ඔබ පොලිස් විශේෂ කාර්යාංශයේ ප්‍රධානියා ලෙස පොලිස්පතිතුමාටනේ ඔබගේ රාජකාරිය පිළිබඳව වාර්තා කරන්නේ නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ කොතරම් කාලයක් හිටියද පොලිස් විශේෂ කාර්යාංශයේ ප්‍රධානියා හැටියට?

පි : අවුරුදු දෙකක් පමණ.

ප්‍ර : 2019 යි 18 යි.

පි : එහෙමයි. 19 අගෝස්තු මාසයේ මම ගියා. මම 2016 ඔක්තෝම්බර් මාසයේ ආවේ.

ප්‍ර : 2016 ඉඳලා. ඔබ සේවය කළ කාලය තුළදී ඔය IS සංවිධානය ගෝලීය ත්‍රස්තවාදයෙන් ශ්‍රී ලංකාවට සිදු වෙන බලපෑම පිළිබඳව

FAIR COMMENT BY JEZEEM

පොලිස් ස්ථානාධිපතිවරුන්ට ඔබ විසින් දැනුවත් කිරීමේ වැඩසටහන කරලා තිබ්බද?

පි : පොලිස් ස්ථානාධිපතිවරුන්ට.

ප්‍ර : ස්ථානාධිපතිවරුන්ට?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : ඇයි කළේ නැත්තේ?

පි : මට IS සංවිධානය සම්බන්ධයෙන් ජාත්‍යන්තර දේ ගැන විශේෂ කාර්යාංශය හොයන්නේ නැහැ. විශේෂ කාර්යාංශයට තියෙන්නේ ශ්‍රී ලංකාව තුළ නීතිය හා සාමය පවත්වාගෙන යාම සඳහා පොලීසියට අවශ්‍ය තොරතුරු ලබාදීම.

ප්‍ර : ශ්‍රී ලංකාව තුළ නීතිය හා සාමය පවත්වාගෙන යාම සඳහා IS සංවිධානය කියන ගෝලීය ත්‍රස්තවාදීය බලපෑම ලංකාවට එන්න පුළුවන්ද කියන එක පිළිබඳව ඔබලා හිතුවේ නැද්ද?

පි : ඒක පොලිස්පතිතුමා විසින් මට නියෝග දෙන්න ඕන ඒ වගේ පුහුණුවක් කරනවා නම්. මට තනියම තීරණයක් අරගෙන පුහුණුවක් කරන්න හැකියාවක් නැහැ.

ප්‍ර : නමුත් ඔබ මේ 2019 අප්‍රේල් 21 සිදුවීමෙන් පස්සේ දැන් ඔබ විශ්‍රාම ගියා වුණත් හිතනවාද ඒ දැනුම ඔබ පොලීසියේ තිබෙන බුද්ධි ඒකකයක ප්‍රධානියෙකු ලෙස පොලිස් ස්ථානාධිපතිවරුන්ට ලබා දී තිබුණා නම් විශේෂයෙන්ම දැන් ඔය කාත්තන්කුඩිය පැත්තේ සහරාන් කියන පුද්ගලයා 2015 විතර 16 විතර ඉඳලම ඔය දැඩි ආගමික අන්තවාදී මතධාරියෙකු ලෙස තමයි ඉඳලා තියෙන්නේ. ඔහු ඔය ඉස්ලාම් රාජ්‍යය, ජිහාඩ් කිරීම, ෂරියා නීතියක අවශ්‍යතාවය එවැනි දේවල් දේශනා කරලා තියෙනවා?

පි : එහෙමයි.

ප්‍ර : නමුත් මෙම කොමිෂන් සභාවට හුඟක් පොලිස් ස්ථානාධිපතිවරුන් කරුණු ඉදිරිපත් කරනකොට අපට නිරීක්ෂණය වුණා ඔවුන් මේ සුළු පැමිණිලි, සහරාන් සූෆි මුස්ලිම්වරුන් සමඟ ගැටුම ඇති කරගත්තහම මේවා මේ අන්තවාදී ත්‍රස්තවාදීවලට යන දේවල් නෙමෙයි. සුළු පැමිණිලි අංශයක් විසින් පරීක්ෂා කර බැලිය යුතු ඒවා නිසා ඔවුන් එතරම් සැළකිල්ලට ගත්තේ නැහැ කියලා වගේ?

පි : එහෙමයි.

ප්‍ර : ඔබ හිතනවාද ඔබ ප්‍රධානියා ලෙස පොලිස් ස්ථානාධිපතිවරුන්ට ඒ දැනුම ලබා දුන්නා නම් ඔවුන් මීට වඩා සැළකිල්ලකින් බලයි කියලා ඔය ආගමික අන්තවාදී කණ්ඩායම කොහාටද යන්නේ කියන එක ගැන?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමීනි මම දන්න ආකාරයට පොලීසිය තුළ ත්‍රස්තවාදය මර්ධනය සඳහා TID එක පවතිනවා. Terrorist Investigation Division එක. නමුත් Extremism ගැන හොයන්න පොලීසිය තුළ යම්කිසි ආයතනයක් නැහැ. බුද්ධි අංශ Extremism ගැන බලනවා මිසක් ඒගොල්ලන්ට හැකි ප්‍රමාණයෙන් වෙනම ආයතනයක් නැහැ Extremism ගැන බලන්න. ඒක නිසා මම හිතන්නේ ඔය ජාත්‍යන්තර ත්‍රස්තවාදය ආදිය සම්බන්ධයෙන් සියළු දේ දන්නේ රාජ්‍ය බුද්ධි සේවය. ඒගොල්ලෝ තමයි ජාත්‍යන්තරව, ඒ කියන්නේ ජාතික ආරක්ෂාවෙන් දේශීයව ඇති තර්ජනත්, විදේශීයව ඇති තර්ජනත් නැත්නම් බාහිර තර්ජනත්, අභ්‍යන්තර තර්ජනත් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ රාජ්‍ය බුද්ධි සේවය.

ප්‍ර : දැන් ඔය පොලිස් විශේෂ කාර්යාංශය කියන්නේ පොලිස්පතිතුමා යටතේ තියෙන පොලිසියේ තියෙන බුද්ධි ඒකකයක් නෙමෙයිද?

පි : බුද්ධි ඒකකයක්. නමුත් එහි කාර්යභාරය නීතිය හා සාමය, පොලීසියට නීතිය හා සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය තොරතුරු ලබා දීම. එහි ප්‍රධාන වශයෙන් අපි බලන්නේ අපරාධ සහ අපරාධකරුවන් සම්බන්ධයෙන්.

ප්‍ර : ඔය ආගමික අන්තවාදය වගේ දේවල් එතකොට ඔබලාගේ විෂය තුළ තිබුණේ නැහැ?

පි : විෂය තුළ තිබුණේ නැහැ.

ප්‍ර : ඔබ කියන්නේ පොලිස්පතිතුමා තමයි ඔබලාට එම විෂය ඇතුල් කර ගන්නවා නම් ඒ සඳහා උපදෙස් දිය යුත්තේ?

පි : දිය යුත්තේ.

ප්‍ර : එතකොට ඔබට කියන්නට පුළුවන්ද දැන් ඔබ කිව්වනේ ජාතික බුද්ධි සේවය SIS එක තමයි මේකේ ප්‍රධානම ආයතනය කියලා. මේ SIS එක 2002 වසරේ නීතිය සහ සාමය සඳහා වෙනමම අමාත්‍යාංශයක් තිබියදීත් සහ 2015 දීත් නිතිය හා සාමය වෙනම අමාත්‍යාංශයක් යටතට පොලීසිය දැම්මනේ?

පි : එහෙමයි.

ප්‍ර : ඒ අවස්ථා දෙකේදීම SIS එක තිබුණේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේද එහෙම නැතිනම් නිතිය හා සාමය කියන අර වෙනමම පොලීසිය ස්ථාපිත කරපු අමාත්‍යාංශය යටතේද?

පි : ආරක්ෂක අමාත්‍යාංශය යටතේ.

ප්‍ර : ඒ කියන්නේ NIB එක SIS වෙච්ච දවසේ ඉඳලා මේ දක්වාම තියෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ?

පි : එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : NIB එක තිබුණේ?

පි : ආරක්ෂක අමාත්‍යාංශය යටතේ.

ප්‍ර : ආරක්ෂක අමාත්‍යාංශය යටතේ.

පි : එහෙමයි.

ප්‍ර : එතකොට පොලීසිය වෙනමම අමාත්‍යාංශයක් යටතට ගියත් NIB එක තිබුණේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ?

පි : එහෙමයි. අපි ජාතික අද තියෙන SIS එක රාජ්‍ය බුද්ධි සේවය සාමාන්‍යයෙන් කියන්නේ නිලධාරීන් Secondment එකක් කරන්නේ. They are doing a Secondment. Their head is Secretary Defence. Secretary of Defence not the IGP only for administrative maters we refer correspondent to the IGP.

ප්‍ර : මිස්ට පීරිස් ඔබ සඳහන් කරනවා මේ Eyes Only කියලා වර්ගීකරණයක් යටතේ යම් බුද්ධි තොරතුරක් ලැබුණහම එම තොරතුර කියවා බලා ඉරා දැමීම තමයි ක්‍රමවේදය කියලා?

පි : Eyes Only.

ප්‍ර : ඔව්?

පි : Eyes Only කියන for your Eyes Only කියලා විතරක්ම තියෙනවා නම් වර්ගීකරණය ඒ කියන්නේ ඔබගේ දැන ගැනීම සඳහා පමණයි.

ප්‍ර : එතකොට අපි හිතමු දැන් SIS එකෙන් පොලිස්පතිතුමාට එවනවා For your Eyes Only කියලා Intelligence ගැන තොරතුරක්?

පි : එහෙමයි.

ප්‍ර : දැන් ඔබ කියන්නේ පොලිස්පතිතුමා ඒක කියවලා ඉරා දමනවද?

පි : ඉරා දැමීම කියලා කියන්නේ, ඉරා දැමීම කියන එක නෙමෙයි. නමුත් ස්වාමීනි ඒකෙන් එයා Action ගන්න ඕන කොයිම අවස්ථාවකවත් Saucer of Information එයාට එළියට දෙන්න බැහැ.

ප්‍ර : නමුත් ඉරා දමන එකක් රාජ්‍ය සේවයේ නැහැනේ නේද?

පි : නැහැ.

ප්‍ර : පොලිස්පතිතුමා අතිශයින්ම රහසිගත ගොනුවක හෝ මෙම තොරතුරු ගොනු කරන්න ඕන නේද?

පි : ගොනු කරන්න අවශ්‍යයි. සාමාන්‍යයෙන් මගේ දැනීම අනුව පොලිස්පතිතුමාට For your eyes Only කියන වර්ගීකරණයෙන් ලියුම් යනවා බොහෝම අඩුයි.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඔබ 2018 වර්ෂයේ මැද භාගයේදී පමණ එවකට ආරක්ෂක ලේකම් කපිල වෛද්‍යරත්න මහතාගේ ඉල්ලීම පරිදි සම්බන්ධීකරණ රැස්වීමට සහභාගී වුණානේ. අර ආරක්ෂක සම්බන්ධීකරණ රැස්වීම්වලට?

පි : එහෙමයි.

ප : ඒ කාලයේදී මොනවද මේ රැස්වීම්වලදී සාකච්ඡා කළේ. ඔබ කී දවසක් ගියාද? සෑම අඟහරුවාදාම තිබුණනේ ඒ රැස්වීම්?

පි : එහෙමයි.

ප : 2018 ඉඳලා ඔබ විශ්‍රාම යනකම්ම ඒ රැස්වීම්වලට ගියා නේද?

පි : නැහැ ස්වාමීනි මම 2019 අගෝස්තු මාසයේ විශේෂ කාර්යාංශයෙන් පිටතට යනවා.

ප : එතකොට 2019 අගෝස්තු වෙනකම් ?

පි : මම ගියා.

ප : ගියා නේද?

පි : එහෙමයි.

ප : එතකොට අර 2019 අප්‍රේල් මාසේ 09 වෙනිදා තිබිච්ච රැස්වීමටත් ඔබ ගියාද?

පි : එහෙමයි.

ප : ඒ රැස්වීමේදී ඔබට මෙම කොමිසමේදී පෙන්නුවානේ අර බුද්ධි තොරතුරක් ලැබුණා කියලා අප්‍රේල් 04 වෙනිදා?

පි : එහෙමයි.

ප : ඒ පිළිබඳව සාකච්ඡා කළාද?

පි : නැහැ.

ප : එතකොට අර වනාතවිල්ලුවේ අර 2019 ජනවාරි 16 සොයාගෙන තිබුණනේ අර සහරාන් ඇතුළු අර ත්‍රස්තවාදී කණ්ඩායමගේ අවි ආයුධ?

පි : එහෙමයි.

ප : ඒ පිළිබඳව සාකච්ඡා කළාද ඒ රැස්වීමේදී?

පි : මට මතක හැටියට කරුණු කිහිපයක් සාකච්ඡා කළා. ඒ කියන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යම්කිසි විමර්ශනයක් භාර දුන්නට පස්සේ කවුරුත් ඒ ගැන ප්‍රශ්න කරන්නේ නැහැ ස්වාමීනි. නමුත් සමහර අවස්ථාවක මොකද්ද වුණේ කියලා ඇහුවා වගේ මට මතකයි.

ප : ඒ කියන්නේ වනාතවිල්ලුව සිද්ධිය ගැන?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සිද්ධිය. මොනවද හම්බ වෙලා තියෙන්නේ මොනවද කියලා. ඒක එතකොට රස පරීක්ෂකට යවලා තියෙනවයි කිව්වා. Report එක ඇවිල්ලා නැහැ කිව්වා.

ප්‍ර : සාකච්ඡා කළා නේද? වැඩිය අවුස්සලා ඇහුවේ නැති වුණාට මේක මතුපිටින් සාකච්ඡා කළා?

පි : එහෙමයි.

ප්‍ර : එතකොට අර 2018 දෙසැම්බර් මාසේ 26 මාවනැල්ලේ බුදු පිළිමවලට ප්‍රහාර දීපු එක ගැනත් කථා කළාද?

පි : නැහැ මම හිතන්නේ ස්වාමීනි.

ප්‍ර : දැන් එම රැස්වීම්වලදී විශේෂ අවධානයක් යොමු කළාද මේ ඉස්ලාම් ආගමික අන්තවාදීන් පිළිබඳව. ඒකෙන් ඇති වෙන්න පුළුවන් නීතිය හා සාමය බිඳ වැටෙන්න පුළුවන් තත්ත්වයන් ගැන. මෙම රැස්වීම්වලදී, ඔබ සහභාගී වෙච්ච රැස්වීම්වලදී.

පි : මම සහභාගී වුණ රැස්වීම්වලදී මට මතකයක් නැහැ ස්වාමීනි එහෙම විශේෂයෙන් ඒ ගැන කථා කළයි කියන එක.

ප්‍ර : ඔබට තොරතුරු ලැබිලා තිබෙනවද ඔබ ප්‍රකාශ කරලා තියෙනවා ලංකාවේ ෂියා මුස්ලිම්වරුන් ඉතාම දශම පහක් වගේ ඉන්නේ සියයට. ඒගොල්ලොත් ඉන්නේ මඩකලපුවේ ඔට්ටමාවඩි කියන ප්‍රදේශයේ කියලා?

පි : එහෙමයි.

ප්‍ර : ඔබට තොරතුරු වාර්තා වෙලා තියෙනවා ශ්‍රී ලංකාවේ ඉරාන තානාපති කාර්යාලයේ මැදිහත්වීමෙන් සුන්නි මුස්ලිම්වරුන් ෂියා මුස්ලිම්වරුන් බවට පරිවර්තනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා කියලා ලංකාවේ? විශේෂයෙන්ම ඔබ සඳහන් කරපු මේ ප්‍රදේශයේ?

පි : තොරතුරක් ලැබිලා නැහැ ස්වාමීනි.

ප්‍ර : ඒ ආකාරයට සුන්නි මුස්ලිම්වරුන් ෂියා මුස්ලිම්වරුන් බවට පරිවර්තනය කිරීම තුළින් ලෝකයේ දැන් ඔය සිරියාව, ඉරාකය වගේ රටවල්වල සුන්නි මුස්ලිම්වරුන්නේ ගොඩක් මැදිහත් වෙලා තියෙන්නේ?

පි : එහෙමයි.

ප්‍ර : ලංකාවෙත් ඒ වගේ තත්ත්වයක් නිර්මාණය වෙන්න පුළුවන්ද?

පි : ඒක ටිකක් අමාරුයි ස්වාමීනි. මොකද ලංකාවේ ඉන්න සුන්නි මුස්ලිම්වරුන් ෂියා විශ්වාසය වැළඳ ගැනීම ඉතාමත්ම අඩුයි.

ප්‍ර : මොකද්ද ඔය දෙකේ තියෙන වෙනස? සුන්නි සහ ෂියා වරුන් දෙගොල්ලන්ගේ අතර තියෙන වෙනස? කෙටියෙන්

FAIR COMMENT BY JEZEEM

කියන්නකෝ වැඩිය විස්තර නැතුව. ඔබ කියනවනේ දැන් මේ සුන්නි වරුන් ෂියා වරුන් කර ගන්න අමාරුයි කියලා?

පි : සුන්නි වලදී සාමාන්‍යයෙන් Moderate තත්ත්වයෙන් ඒගොල්ලන්ට ඒ ආගම අදහන්න පුළුවන්.

ප්‍ර : කාටද සුන්නිවලට?

පි : සුන්නිවලට. ෂියාලා ඒ ආකාරයෙන් නෙමෙයි මම දන්න විදියට.

ප්‍ර : මම හිතන්නේ ඒක අනිත් පැත්ත. ෂියා තමයි Moderate මුස්ලිම්. සුන්නි කියන්නේ ලෝකයේම අන්තවාදී මුස්ලිම් ඔක්කෝම සුන්නි මුස්ලිම්ලා. ඒක නිසා වෙන්න ඇති නේද ෂියා වුණහම Moderate වෙනවනේ අර තවුහිද් කියන සංකල්පයට අමාරුයිනේ නේද?

පි : එහෙමයි.

ප්‍ර : ඔබ ඉස්ලාම් ආගමික අන්තවාදය පිළිබඳව ගොඩක් අධ්‍යයනය කරලා නැහැ නේද පොලිස් විමර්ශන ඒකකයේ හිටියට?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : ඔබට මේ අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පසුව හෝ මොකක් හෝ සිතුවිල්ලක් තිබෙනවද මේ ආකාරයට මේ ඉස්ලාම් ආගමික අන්තවාදය අපේ රටේ ව්‍යාප්තවීම නතර කර ගැනීමට උත්සාහ නොකළොත් අපේ රටේ අනාගතය කොහෙන් නතර වෙයිද කියන එක ගැන ඔබට අදහසක් කියන්න පුළුවන්ද මේ කොමිසමට. නීතිය හා සාමය ගැන ඔබ නිතරම කථා කළානේ?

පි : එහෙමයි.

ප්‍ර : ඒ අරමුණින්?

පි : විශේෂයෙන්ම මම ඉස්සරලා කිව්වා වගේ මේ අන්තවාදය ගැන අපි මීට වඩා සොයන්න ඕන. මොකද මේක ත්‍රස්තවාදයක් වෙන්නේ මම දන්නා තරමට, මම ඉගෙන ගෙන තියෙන තරමට අන්තවාදයට දේශපාලන අරමුණක් එකතු වුණොත් පමණයි. ඒ අන්තවාදයට දේශපාලන අරමුණක් එකතු වනතෙක් ඒක අන්තවාදය. ඉතිං අන්තවාදය සම්බන්ධයෙන් මම දන්නේ නැහැ නීති පද්ධතිය මොන ආකාරයටද ලංකාවේ තියෙන්නේ කියන එක. ඒ සම්බන්ධයෙන් නීතියේ යමක් සංශෝධනය කරන්න සිද්ධ වෙයි අන්තවාදය සම්බන්ධයෙන්. ඊට පසු බුද්ධි අංශ සහ අනෙකුත් අංශ මගින් අන්තවාදය ගැන දිගින් දිගටම සොයා බැලීමක් කළයුතුව තිබෙනවා.

ප්‍ර : අර සමස්ත ලංකා ජමෙයිතුල් උලමාවරුන් ඔබ විද්වතුන් ගැනත් පොඩ්ඩක් කියලා තියෙනවා විද්වතුන්ගේ සංගමය කියන එක ගැන. මොකද්ද ඒගොල්ලන්ගේ කාර්යභාරය මුස්ලිම් ජනතාව මේ

FAIR COMMENT BY JEZEEM

අන්තවාදී රැල්ලට ගසාගෙන යන එක වළක්වා ගැනීමට තියෙන ඔවුන්ගේ කාර්යභාරය කුමක්ද?

පි : ස්වාමීනි මම ඒ ගැන අදහසක් නැහැ.

ප්‍ර : ඔබ හිතනවාද දැන් මේක ආගමික සංකල්පනාවක් මුල් කරගෙන යන වැඩසටහනක්නේ ඔය ඉස්ලාම් ආගමික අන්තවාදය. එතකොට දැන් වෙනත් ජන වර්ගයක දේශපාලන නායකයින්ට හෝ ආගමික නායකයින්ට හෝ ගමේ නායකයෙකුට හෝ මේ ප්‍රශ්නයට මැදිහත් වෙලා මේ ආගමික සංහිඳියාව ඇති කිරීමට කටයුතු කරන්නට පුළුවන් වෙයිද? ඒ කියන්නේ වෙනත් ජන වර්ගයකට හෝ වෙනත් ආගමික කණ්ඩායමකට දේශපාලන නායකත්වයක් දීලා හෝ එහෙම නැත්නම් ආගමික නායකත්වයක් දීලා එහෙම නැත්නම් ගම් මට්ටමින් තියෙනවනේ විවිධ නායකත්ව. එවැනි වැඩසටහන් මගින් මේ ඉස්ලාම් ආගමික අන්තවාදයට ඉස්ලාම්වරුන් යාම වළක්වා ගැනීමේ වැඩසටහනක් ආරම්භ කරලා ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයිද? එහෙම නැත්නම් ඔය මුස්ලිම්වරුන් තුළින්මද එම තත්ත්වය නැති කර ගැනීමට වැඩසටහනක් ආරම්භ විය යුත්තේ?

පි : මම හිතන්නේ සර්වාගමික වැඩසටහනක් ක්‍රියාත්මක වීම වැදගත් වෙනවා. නමුත් මේ මුස්ලිම් අන්තවාදය සම්බන්ධයෙන් වැඩිදුරටත් දන්නේ මුස්ලිම් අයමයි. ඉස්ලාම් ආගම අදහන අය. ඒ නිසා ප්‍රමුඛත්වය දිය යුත්තේ ඉස්ලාම් ආගමික භක්තිකයින්ටම ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට. නමුත් සර්වාගමික වැඩසටහනක් ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වීම එතකොට Monitoring අර ඉස්ලාමික ආගමික කටයුතු ඒ අය මොනවද කරන්නේ කියන එක සර්වාගමික අයට බලන්න පුළුවන්කමක් ඇති වෙනවා.

හොඳයි. බොහොම ස්තුතියි.

****

ගරු සභාපතිතුමා :

ප්‍ර : සාක්ෂිකරු ඔබගේ දැනීම අනුව රාජ්‍ය බුද්ධි සේවයේ ඉස්ලාම් අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් නිරීක්ෂණය කිරීම සඳහා Desk Officer කෙනෙක් ඉස්සරලාම පත් කරන්නේ කොයි කාලයේද?

පි : එක් දහස් නමසිය අනූ ගණන්වල ස්වාමීනි.

ප්‍ර : ඒ කාලයේදී එවැනි Desk Officer කෙනෙක් පත් කිරීමට හේතුපාදක වුණ කරුණු මොනවද?

පි : ස්වාමීනි මේ ත්‍රස්තවාදයත් සමඟ අවුරුදු 30 ක් තිස්සේ තිබුණ ත්‍රස්තවාදයත් සමඟ නැගෙනහිර පළාත්වල විශේෂයෙන්ම එක

FAIR COMMENT — BY JEZEEM

එක මුස්ලිම් සංවිධාන බිහි වුණා. ඒ අවස්ථාවේ බුද්ධි අංශය හිතුවා මේ බිහිවන ඒ එක එක මුස්ලිම් සංවිධාන සහ ඒවායේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් යම්කිසි සොයා බැලීමක් කළ යුතුයි කියලා. ඒ අනුව තමයි මේක පටන් ගත්තේ.

ප්‍ර : එතකොට ඒ ඔබ ඔය කියන වකවානුව තුළම ඒ මුස්ලිම් සංවිධාන අන්තවාදී කටයුතුවලට නැඹුරුවීමක් පෙන්නුම් කෙරුවද?

පි : ඒ අවස්ථාවේ එහෙම නැඹුරුවීමක් පෙන්නුම් කෙරුවේ නැහැ. නමුත් පහු වෙනවිට තමයි ඒ වගේ නැඹුරුවීමක් මම හිතන්නේ දැන ගන්න ලැබුණේ.

ප්‍ර : එතකොට Desk Officer කෙනෙක් පත් කරනකොට එවැනි නැඹුරුතාවයක් අධ්‍යයනය කරලා තිබ්බේ නැද්ද?

පි : අන්තවාදය ගැන නැඹුරුතාවයක් මම හිතන්නේ දැකලා තිබුණේ නැහැ.

ප්‍ර : කොයි කාලසීමාවෙද ඔය අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් පළමුවරට නිරීක්ෂණය වෙන්නේ? මම කථා කරන්නේ අන්තවාදය ගැන. Violent Extremism ගැන නෙමෙයි මම කථා කරන්නේ?

පි : එක් දහස් නමසිය අනූ ගණන්වල අග භාගයේ මගේ දැනුමේ හැටියට.

ප්‍ර : මගේ දැන් ප්‍රශ්නය ඉස්ලාම් අන්තවාදය නෙමෙයි වෙනත් ආගමික අන්තවාදය සම්බන්ධයෙන්?

පි : එහෙමයි.

ප්‍ර : වෙනත් ආගමික අන්තවාදී කණ්ඩායම් සම්බන්ධයෙන් යම් නිරීක්ෂණයක් රාජ්‍ය බුද්ධි සේවය විසින් පළමු වරට කරන්නේ කොයි කාලයේද?

පි : ඒ ගැන මතකයක් මට නැහැ ස්වාමීනි.

ස්තුතියි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතීඥවරයාට ලබා දෙමි.

****

FAIR COMMENT BY JEZEEM

ජනාධිපති නීතීඥ ශාමිල් පෙරේරා මහතා :

ප්‍ර : සාක්ෂිකරු අර ඔබ විසින් ලියන ලද X-143, 44, 45, 46 සහ 47 ලේඛන පරීක්ෂා කරලා බලන්න. ඒකේ තියෙනවා Classification කියලා ඉංග්‍රීසියෙන් තියෙනවා.

පි : එහෙමයි.

ප්‍ර : ඒකෙන් කියන්නේ රහසිගතයි කියලා? එහෙම නේද?

පි : හරි. එහෙමයි.

ප්‍ර : දැන් C-4 ලේඛනය බලන්න. C-4(a)?

පි : එහෙමයි.

ප්‍ර : ඒකේ Classification එක Top Secret කියලා කිව්වොත් හරිද?

පි : හරි.

ප්‍ර : එතකොට රහසිගතයි කියලා සිංහලෙන් ලියලා තියෙන්නේ Secret කියලා කිව්වොත් හරිද?

පි : වැරදියි.

ප්‍ර : එහෙනම් මොකද්ද ඒකේ?

පි : Confidential.

ප්‍ර : මේ කිසිම ලේඛනයක X-43 සිට X-47 දක්වා කිසිම ලේඛනයක Eyes Only කියලා සඳහන් වෙලා තිබෙනවද?

පි : නැහැ.

ප්‍ර : 146 ලේඛනයේදී රහසිගත කියලා සඳහන් වෙලා නැහැ?

පි : මෙය ඡායා පිටපත් කිරීමේ සිදු වෙච්ච වරදක් වෙන්න ඕන. මේකේ රහසිගතයි කියලා සඳහන් වෙලා තියෙන්න ඕන මුල් පිටපතේ.

ප්‍ර : දැන් X-145 ලේඛනයේ 7 වෙනි පිටුව බලන්න, 7 වෙනි පිටුව.

පි : එහෙමයි.

ප්‍ර : ඒ 7 වෙනි පිටුවේ තිබෙනවා ෂීක් සුලෙයිමාන් කියලා මහත්මයෙක්ගේ දේශනයක්? X-145, 7 වෙනි පිටුව.

පි : එහෙමයි.

ප්‍ර : ඒකේ අන්තිමට තියෙනවා ඉංග්‍රීසියෙන් That's the usage of National Flags are completely prohibited Islam?

පි : එහෙමයි.

ප්‍ර : ඒකෙන් මොකද්ද අදහස් කරන්නේ?

පි : මේක ඒ අය මොකක් අදහස් කළාද කියන එක මම දන්නේ නැහැ ස්වාමීනි. නමුත්...,

ප්‍ර : ඔබතුමාගේ...?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මේකේ අදහස ජාතික කොඩිය භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කියන එක.

ප්‍ර : ඕනෑම ජාතික කොඩියක් භාවිතා කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරලා තියෙනවා ඉස්ලාම් දහම අනුව කිව්වොත් හරිද?

පි : එහෙමයි.

****

ගරු සභාපතිතුමා :

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දීමෙන් කොමිෂන් සභාවේ කාර්යය සම්බන්ධයෙන් දැක් වූ සහයෝගයට කොමිෂන් සභාවේ ස්තුතිය සාක්ෂිකරුට පළ කරනවා.

සාක්ෂිකරු මුදා හරිනවා.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretarys Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.07.24 වේලාව:ප.ව.01.15 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලු මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය	:	436
නම	:	**පල්ලේගෙදර බණ්ඩාර අබේකෝන්**
වයස	:	**අවුරුදු 68**
ආගම	:	**බෞද්ධ**
රැකියාව	:	**දැනට තනතුරක් දරන්නේ නැහැ. හිටපු ජනාධිපති ලේකම්**

සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : ඔබ රාජ්‍ය සේවයට බැඳුණේ මොන අවුරුද්දේදීද මොන තනතුරටද?

පි : මම 1982 උප දිසාපති තනතුරට තමයි මුලින්ම වැඩ කළේ.

ප්‍ර : ගෝමරන්කඩවල නේද ත්‍රිකුණාමලයේ?

පි : ගෝමරන්කඩවල ත්‍රිකුණාමලයේ.

ප්‍ර : කොපමණ කාලයක් ඒ තනතුරේ සේවය කළාද උප දිසාපතිවරයෙක් විදියට?

පි : අවුරුදු 3 ක් විතර.

ප්‍ර : ඊට පස්සේ කොහාටද ඔබට ලැබුණේ?

පි : ඊට පස්සේ ආගමන විගමන දෙපාර්තමේන්තුවට පැමිණියා.

ප්‍ර : ඒ සහකාර ?

පි : සහකාර පාලකවරයෙක් විදියට.

ප්‍ර : සහකාර පාලකවරයෙක් විදියට?

පි : ඔව්.

ප්‍ර : එතන කොපමණ කාලයක් ඔබ හිටියද?

පි : එතන සහකාර පාලකවරයෙක් විදියට අවුරුදු 6 ක් සහ නියෝජ්‍ය පාලකවරයෙක් විදියට අවුරුදු 2 ක් වගේ හිටියා.

ප්‍ර : එතකොට මා කිව්වොතින් නිවැරදිද 1996 වසර වන තුරු ඔබ ඒ තනතුර දැරුවා කියලා?

පි : හරි.

ප්‍ර : එතනින් ඔබ ගියේ කොතැනටද?

පි : මම එතනින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට ගියා.

ප්‍ර : ඒ මොන තනතුරක්ද දැරුවේ?

පි : මං නියෝජ්‍ය අධ්‍යක්ෂක ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂක අංශයේ.

ප්‍ර : 1996 ඉඳලා කවදා වෙනතුරු එතන හිටියද?

පි : මම 1999 වෙනකම් හිටියා.

ප්‍ර : එතනින් ඔබතුමා කොතැනටද ගියේ?

Project Secretary Copy
FAIR COMMENT BY JEZEEM

පි : මා විදේශ ගත වෙලා හිටියා අවුරුදු කීපයක්. ඊට පස්සේ නැවත හැඳුනුම්පත් දෙපාර්තමේන්තුවට පැමිණියා හැඳුනුම්පත් කොමසාරිස් විදියට.

ප්‍ර : මා කිව්වොතින් නිවැරදිද එසේ නැවත පැමිණියේ 2004 අගොස්තු මාසේ කියලා?

පි : ඔව් හරි.

ප්‍ර : එතකොට Commissioner General නැත්නම් කොමසාරිස් ජනරාල්තුමා විදියට ඔබ ඒ දෙපාර්තමේන්තුවේ කොපමණ කාලයක් සේවය කළාද?

පි : 2005 අප්‍රේල් මාසේ 01 වෙනිදා වෙනකම් වැඩ කළා.

ප්‍ර : එතනින් ඔබ ගියේ කොහේටද?

පි : මං ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පාලකවරයා විදියට පාලක ජනරාල් විදියට ගියා.

ප්‍ර : එතන ඔබ 2010 අප්‍රේල් මාසේ වෙනකම් සේවය කළා කිව්වොතින් නිවැරදිද?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : ඔබතුමා එතනින් කොහාටද ගියේ?

පි : මං එතනින් රාජ්‍ය කළමනාකරණ සහ ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විදියට වැඩ භාර ගත්තා.

ප්‍ර : එතන මාස කිහිපයයි නේද හිටියේ?

පි : ඔව් මාස 10 ක් විතර.

ප්‍ර : ඒ කියන්නේ නොවැම්බර් මාසේ වෙනකම්?

පි : ඔව්.

ප්‍ර : අනතුරුව කොහාටද ගියේ?

පි : මම රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විදියට

ප්‍ර : නැවතත් ගියා?

පි : ඔව්.

ප්‍ර : ඉස්සෙල්ලා හිටියේ සහකාර විදියට දැන් ගියා

පි : ආ.. නෑ නෑ ඉස්සරත් හිටියේ ලේකම්

ප්‍ර : ඉස්සෙල්ලත් හිටියේ ලේකම්.

පි : වෙන අමාත්‍යාංශයක් මේක අලුත් අමාත්‍යාංශයක්. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

ප්‍ර : ඉස්සෙල්ලා තිබුණේ එතකොට රාජ්‍ය කළමනාකරණ?

පි : රාජ්‍ය කළමනාකරණ සහ ප්‍රතිපත්ති අමාත්‍යාංශය. ඒ අමාත්‍යාංශයේ ලේකම්

ප්‍ර : එතකොට 2010 වෙන කොට ඒක වෙනස් වුණා එහෙමද?

පි : නෑ නෑ ඒ වෙන අමාත්‍යාංශ දෙකක් .

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මට එහෙනම් තේරුණා මම තේරුම් ගත්තා වැරදි.

පි : ඔව්.

ප්‍ර : 2010 නොවැම්බර් ගියේ කුමන තැනකටද සේවයට වාර්තා කළේ?

පි : රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විදියට.

ප්‍ර : ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ. එතන ඔබ කොපමණ කාලයක් හිටියද?

පි : මම 2015 ජනවාරි 08 වෙනිදා වෙනකම් හිටියා.

ප්‍ර : ඒ කියන්නේ 2015 ජනාධිපතිවරණ මැතිවරණය කාලය වන තුරු ඔබ එතන හිටියා?

පි : එසේය.

ප්‍ර : ජනාධිපති මැතිවරණයෙන් පස්සේ ඔබතුමාට මොකක්ද ලැබුණ තනතුර?

පි : මම ජනාධිපති ලේකම් විදියට පත් කළා.

ප්‍ර : කොපමණ කාලයක් ඒ තනතුර දැරුවද?

පි : 2017 ජුනි 30 වෙනකම්.

ප්‍ර : ඇයි එතනින් ඔබ කිව්වේ 2017 ජුනි 30 වෙනකම් කියලා. ඒ කියන්නේ ඔබ ඒක ආරම්භ කෙරුවේ මා කිව්වොත් නිවැරදිද 2015 ජනවාරි 09 වෙනිදා ඉඳලා කියලා?

පි : නිවැරදි.

ප්‍ර : එතකොට 2017 ජුනි 30 විතරක් වෙනකම් හිටියේ ඇයි?

පි : මම නොයෙකුත් හේතු නිසා ඉල්ලා අස්වීම් භාර දුන්නා.

ප්‍ර : ඒ හේතු කියන්න කැමති නැද්ද?

පි : පුද්ගලික හේතු.

ප්‍ර : කමක් නෑ. පුද්ගලික හේතු මත ඔබ ඉල්ලා අස්වුණා?

පි : ඉල්ලා අස්වුණා.

ප්‍ර : එහෙනම් අපිට කියන්න දැන් ඔබ ලේකම්වරයා විදියටනේ වැඩ කෙරුවේ ජනාධිපතිතුමාගේ?

පි : එසේය.

ප්‍ර : එතකොට අමාත්‍යාංශවලට ලේකම්වරු පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට යම් බලයක් තිබෙනවද?

පි : ඔව් සියළු අමාත්‍යාංශ ලේකම්වරු පත් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයා විසින්.

ප්‍ර : ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 (1) උප ව්‍යවස්ථාව අනුව තමයි ඒ පත් කිරීම කරන්නේ කියලා මා කිව්වොත් නිවැරදිද?

පි : එසේය ඔව් එසේය.

ප්‍ර : එතකොට දැන් එවැනි පත් කිරීම් කිරීමේදී ඔබට යම් රාජකාරියක් පැවරෙනවද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සාමාන්‍යයෙන් මූලිකවම ජනාධිපතිතුමත් එක්ක සාකච්ඡා කරලා පත් කරන්නේ ජනාධිපතිතුමාට නම් ඉදිරිපත් කරනවා. ජනාධිපතිතුමාගේ තමයි අවසාන තීරණය මෙයා පත් කිරීම කියලා.

ප්‍ර : එතකොට ඔබ ජනාධිපති ලේකම්වරයා විදියට 2015 ජනවාරි 09 වෙනිදා ඉඳලා 2017 ජුනි 30, මා ඔබෙන් විමසමින් සිටියේ ඔබට ඔබේ ධුර කාලය තුළදී පැවරිලා තිබුණු රාජකාරි මොනවද කියලා?

පි : ඔව්.

ප්‍ර : Can you please itemize that an explain to the commission?

පි : අමාත්‍යාංශ ලේකම්වරුන් පත් කිරීම, ඊට අමතරව එක එක අමාත්‍යාංශවල විෂය පථයන් ගැසට් කිරීම. නොයෙක් කොමිෂන් සභා එතනින් ගියාම ඒ වගේ පත් කිරීම, ඊට අමතරව පාර්ලිමේන්තුවට සම්බන්ධ ජනාධිපතිවරයාට අදාළ වගකීම් ඉටු කිරීම, ජනාධිපතිවරයා වෙනුවෙන් ජනාධිපතිතුමා විසින් නියම කරනු ලබන නොයෙකුත් රාජකාරි එතුමගේ ලේකම් විදියට එතුමා වෙනුවෙන් සමහර වෙලාවට ගැසට් නිවේදන නිකුත් කිරීම වගේ රාජකාරි තමයි කරන්නේ.

ප්‍ර : එතකොට ජනාධිපතිතුමා නියම කරනු ලබන රාජකාරිත් ඔයිට අමතරව ඔබ විසින් කරනු ලැබුවා?

පි : ඔව් ඒ අවස්ථාවලදී නියම කරන රාජකාරිත් මං විසින් ඉටු කරනු ලැබුවා .

ප්‍ර : අබේකෝන් මහත්මයා ඔබට මතකද ඔබ ඔය ධුරය දරන කාලයේදී ඒ කියන්නේ 2015 ජනවාරි 09 ඉඳලා 2017 ජුනි 30 වෙන දක්වා වූ කාලය තුළදී ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශය භාරව හිටිය අමාත්‍යවරයා කවුද කියලා?

පි : ආරක්ෂක අමාත්‍යවරයා වශයෙන් වැඩ කළේ ජනාධිපතිතුමා තමයි.

ප්‍ර : ජනාධිපතිතුමා. එතකොට ඔය වකවානුවේදී රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයෙක් හිටියද?

පි : ඔව් ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයෙක් හිටියා රුවන් විජේවර්ධන මැතිතුමා

ප්‍ර : රුවන් විජේවර්ධන මැතිතුමා එතකොට සාමාන්‍යයෙන් ඔය ගැසට් පත්‍රයක් මඟින් ඒ පවතින රජයේ අමාත්‍යවරුන්ට බෙදලා දෙන යම් නියමිත රාජකාරි ඒ කියන්නේ විෂයන් නැත්නම් Ministries අමාත්‍යාංශවල විෂය පථය ගැසට් කරනවා නේද?

පි : එසේය.

ප්‍ර : ඒ විෂයන් ගැසට් කරනවා වගේම ඒ අමාත්‍යවරු කවුද කියන එකත් එහෙම නම් ගැසට් පත්‍රය මඟින් හඳුනා ගන්නට පුළුවන්?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : නේද?

පි : එසේය.

ප්‍ර : මා ඔබේ අවධානයට 2015 ජනවාරි මස 18 වෙනි දින ප්‍රකාශයට පත් කොට තිබෙන ගැසට් පත්‍රයක් යොමු කරනවා මේ අවස්ථාවේදී. ඒකේ ගැසට් අංකය 1897/15.

පි : එසේය.

ප්‍ර : ඔබට කියන්නට පුළුවන්ද ඔය ගැසට් පත්‍රය බලලා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයාට සාමාන්‍යයෙන් පැවරිලා තිබුණ රාජකාරි මොනවද කියලා ඒ කියන්නේ ඔහුගේ විෂය පථයට වැටෙන රාජකාරි මොනවද?

පි : රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව විෂයන්ට සහ මෙහි දෙවන තිරුවේ දැක්වෙන දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථාවන් වැනි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති වැඩ සටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම. රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂයන්ට සහ දෙවැනි තිරුවේ දැක්වෙන දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා වැනි විෂයන්ට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම. (2) ආරක්ෂක සේවාවන්හි කාර්යයන් පහසු කරලීම තුළින් රටේ ආරක්ෂාව සැලසීම. (3) අභ්‍යන්තර ආරක්ෂාව පවත්වාගෙන යාම. (4) රාජ්‍ය හා අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධිත බුද්ධි සේවාවන් (5) ආගන්තුක හමුදාවන් සහ සබඳතා. (6) යුධ රණවිරුවන් හා ආබාධිත සොල්දාදුවන් පිළිබඳව කටයුතු. (7) පුපුරන ද්‍රව්‍ය සහ ගිනි අවි. (8) ප්‍රදීපාගාර නඩත්තුව වරයා අධිකාරිය සතු ප්‍රදීපාගාර හැර. (9) ආරක්ෂක සේවයේ පුද්ගලයන් සඳහා ආරක්ෂක අධ්‍යාපනය හා ප්‍රශ්වාත් සේවා අධ්‍යාපනය ලබා දීම. (10) ආරක්ෂක සේවා පිරිස් සඳහා උසස් අධ්‍යාපනය (11) පුද්ගලික ආරක්ෂක සේවා සම්බන්ධ කටයුතු. (12) ගලවා ගැනීමේ මෙහෙයුම් සහ වෙරළ ආරක්ෂක සේවයේ පරිපාලනය කිරීම. (13) දෙවැනි තීරුවේ දැක්වෙන ආයතනයට පැවරී ඇති අනිකුත් සියළුම විෂයන්. (14) දෙවැනි තීරුවේ දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම.

ප්‍ර : දැන් ඒ වගේ කරුණු 14 ක් යටතේ ආරක්ෂක අමාත්‍යවරයාගේ රාජකාරි යන ශීර්ෂය යටතේ ඒ කියන්නේ පළවෙනි කොලම යටතේ ඒවා දක්වලා තියෙනවා?

පි : එසේය.

ප්‍ර : ඔබ විසින් කියවන්නට යෙදුණු ඔය ආරක්ෂක අමාත්‍යවරයාගේ යුතුකම් බලන කොට එහෙම නම් ජාතික ආරක්ෂාව

FAIR COMMENT BY JEZEEM

ප්‍රමුඛත්වෙයලා නේද ඒ රාජකාරිය ඉෂ්ට කිරීම ජනතාව වෙනුවෙන් ඔහු වෙත පැවරිලා තියෙන්නේ?

පි : ඔව් පිළිගන්නවා.

ප්‍ර : එම රාජකාරිය ඉෂ්ට කරන කොට මොන වගේ නීති, අණපනත් සම්බන්ධයෙන්ද ඔහුගේ අවධානය යොමු වන්නට ඕනේ කියලා මේ ගැසට් පත්‍රය මඟින්ම තවදුරටත් දක්වලා තියෙනවා නේද?

පි : එසේය.

ප්‍ර : එහෙම නම් කරුණාකරලා ඔබට කියන්නට පුළුවන්ද ඒ ගැසට් පත්‍රයේ සඳහන් අණපනත් අතර මෙන්න මේ අණපනත් පිළිබඳව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයාගේ අවධානය යොමු වන්නට ලෙසට එහි සටහන් වෙලා තියෙනවද කියලා. එකක් තමයි ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත 2009 අංක 35 දරන ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත?

පි : ඔව් එසේය.

ප්‍ර : ඒ වගේම පුපුරන ද්‍රව්‍ය පනත 1956 අංක 21 දරන පුපුරන ද්‍රව්‍ය පනත?

පි : එසේය.

ප්‍ර : ඊළඟට 1916 අංක 33 දරන ගිනි අවි ආඥා පනත?

පි : එසේය.

ප්‍ර : ඒ වගේම 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත?

පි : එසේය.

ප්‍ර : තවදුරටත් 1999 අංක 11 දරන ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩ පැවැත්වීමේ පනත?

පි : එසේය .

ප්‍ර : අනෙකුත් පනත් අතර මේ පනතත් මේ පනත් සියල්ලත් ගරු අමාත්‍යවරයාගේ රාජකාරි ඉටු කිරීමේදී ඔහුගේ අවධානය යොමු විය යුතු පනත් විදියට සඳහන් වෙලා තියෙනවා?

පි : එසේය.

ප්‍ර : නේද?

පි : ඔව්.

ස්වාමිනි ඒ අනුව ගෞරවයෙන් අවසර පතා සිටිනවා 2015 ජනවාරි මස 18 වෙනිදා ප්‍රකාශයට පත් කොට ඇති අංක 1897/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය C 938 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට. එසේම එහි තුන්වන තිරුවේ ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී පනත ඇති ස්ථානය C 938 (A) වශයෙනුත්, පුපුරන ද්‍රව්‍ය පනත ඇති ස්ථානය C 938 (B) වශයෙනුත්, ගිනි අවි ආඥා පනත ඇති ස්ථානය C 938 (C) වශයෙනුත්, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇති ස්ථානය C 938 (D)

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

වශයෙනුත්, ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර මැඩ පැවැත්වීමේ පනත ඇති ස්ථානය C 938 (E) අක්ෂරයෙනුත් ලකුණු කොට ඉදිරිපත් කිරීමට වැඩිදුරටත් අවසර පතනවා.

ප : අබේකෝන් මහත්මයා මීළඟට මා ඔබෙන් විමසන්නේ ආරක්ෂක කවුන්සිලය පිළිබඳව. ඔබ රාජකාරි සිදු කළ වකවානුවේදී ජාතික ආරක්ෂක කවුන්සිලය පැවැත්වුණාද?

පි : පැවැත්වුණා ස්වාමිනි.

ප : ජාතික ආරක්ෂක කවුන්සිලය කොයි ආකාරයටද නෛතික වශයෙන් බලගැන්විලා තියෙන්නේ කියලා ඔබට කියන්නට පුළුවන්ද?

පි : මට නම් බෑ.

ප : ඒ කියන්නේ නෛතික ප්‍රතිපාදනයක් තියෙනවද ඒක?

පි : නෛතික ප්‍රතිපාදනයක් තියෙනවා ඒක මට

ප : තියෙනවා නම් මොකක්ද ඒ නෛතික ප්‍රතිපාදනය?

පි : The Public security ordinance යටතේ ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරලා තියෙනවා 1999 මැයි 27 වෙනි බ්‍රහස්පතින්දා අංක 1081/19 සහ දිනය 1999/05/27 දින දරන ගැසට් නිවේදනය අනුව. මේකේ පළවෙනි වගන්තියේ තියෙනවා මෙම These regulations maybe cited as emergency national security council regulation no: 01 of 1999

ඒ අනුව ස්වාමිනි අවසර පතනවා මහජන ආරක්ෂක පනතේ 05 වෙනි වගන්තිය යටතේ විධි විධාන සපයා ඇති 1999 මැයි මස 27 වෙනි දින අංක 1081/19 යටතේ ප්‍රකාශයට පත් කොට ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය C 939 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට.

ප : අබේකෝන් මහත්මයා ඔබ රජයේ සේවයට 1982 නේ බැඳුණේ?

පි : එසේය.

ප : ඔබට දීර්ඝ රජයේ නිලධාරියෙක් විදියට තියෙනවනේ අත්දැකීම්?

පි : එසේය.

ප : එතකොට ඔබ පාසල් යන කාලයේ ඉතිහාසය ගැනත් ඉගෙන ගෙන තියෙනවනේ. එතකොට ඉතිහාසයේ අපේ හිටපු අගමැතිවරු ඒ වගේම ආරක්ෂක ඇමතිවරු පිළිබඳවත් ඔබ දැන ගෙන තියෙනවනේ?

පි : එසේය.

ප : මා ඔබේ අවධානයට ලේඛනයක් යොමු කරනවා. ඒ ලේඛනය බලලා ඔබට කියන්නට පුළුවන්ද ඔබ දන්න දැනුම සහ ඔබ රාජ්‍ය සේවයේ ලබලා තියෙන අත්දැකීම් අනුව මා ඔය පෙන්වන

FAIR COMMENT BY JEZEEM

ලේඛනවල දක්වලා තියෙන එම මැතිඳුන් ඒ ඒ වකවානුවලදී ශ්‍රී ලංකාවේ ආරක්ෂ අමාත්‍ය ධුරය දරලා තියෙනවද කියලා?

පි : ඔව් දරලා තියෙනවා එසේය පිළිගන්නවා.

ප්‍ර : ඔබ 2015 ජනවාරි 09 වෙනිදා ජනාධිපති ලේකම් විදියට රාජකාරි ආරම්භ කරපු අවස්ථාවේදී අර කලින් අපි C 938 වශයෙන් ලකුණු කරලා ඉදිරිපත් කරපු ඒ ගැසට් පත්‍රයට පාදක වුණ විෂය තියෙනවනේ Defense එක ආරක්ෂක අමාත්‍යාංශය ඒ ආරක්ෂක ඇමති විදියට කවුද එතකොට කටයුතු කළේ?

පි : ජනාධිපතිවරයා වශයෙන් හිටිය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා.

ප්‍ර : එතකොට එහෙම නම් ඔබට මා දැන් මේ පෙන්වා සිටින ලේඛනයේ ගරු ආරක්ෂක අමාත්‍යවරයා විදියට 2015 ජනවාරි 12 වෙනිදා ඉඳලා 2019 නොවැම්බර් 18 වෙනිදා වනතුරු එතුමා අවුරුදු 04 යි දින 310 ක් සේවය කරලා තියෙනවා නේද?

පි : එසේය.

ප්‍ර : ස්තූතියි.

ස්වාමීනි ගෞරවයෙන් අවසර පතනවා 1947 සැප්තැම්බර් මස 24 වන දින සිට 2019 නොවැම්බර් මස 18 වෙනි දින දක්වා ශ්‍රී ලංකාද්වීපයේ ආරක්ෂක අමාත්‍ය ධුරය දරන ලද එම අමාත්‍යවරුන්ගේ විස්තර සහිත මෙම ලේඛනය C 940 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට.

ප්‍ර : මා නැවත කැමති ඔබේ අවධානය අර C 939 කියලා ලකුණු කරලා ජාතික ආරක්ෂක කවුන්සිලය පිහිටුවීම සම්බන්ධයෙන් ඔබ දුන්න පිළිතුර කෙරෙහි යොමු කරන්න. ඔබේ ධුර කාලය තුළදී ඔබ ජාතික ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම්වලට සහභාගි වෙලා තියෙනවද?

පි : තියෙනවා එසේය.

ප්‍ර : එහෙම නම් ඔබට මේ ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන්ද ආරක්ෂක කවුන්සිලයට සාමාන්‍යයෙන් සහභාගි වන නිත්‍ය සාමාජිකයෝ ඉන්නවද කියලා?

පි : සිටිනවා .

ප්‍ර : ඒ අය කවුද කියලා කියන්න?

පි : ජනාධිපතිතුමා, අගමැතිතුමා, ආරක්ෂක රාජ්‍ය ඇමතිතුමා, ජනාධිපති ලේකම්වරයා, ආරක්ෂක ලේකම්වරයා, මුදල් ලේකම්වරයා, විදේශ ලේකම්වරයා ඊට අමතරව ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී, ත්‍රිවිධ හමුදාපතිවරු ඊළඟට පොලිස්පතිවරයා ඊට අමරතව ජාතික බුද්ධි සේවා ප්‍රධානීන් ඊළඟට ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඉන්න සිසිර මෙන්ඩිස් මහතා මට මතක නෑ තනතුර

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : CNI ජාතික බුද්ධි ප්‍රධානී

පි : ජාතික බුද්ධි ප්‍රධානී ඊළඟට යුධ හමුදාවේ බුද්ධි

ප්‍ර : DMI

පි : ඔව් DMI

ප්‍ර : බුද්ධි ප්‍රධානී

පි : ඊට අමතරව පසුකාලීනව අපි නිත්‍ය සමාජිකයෝ විදියට ගෙන්ව ගත්තා පොලිසිය පිළිබඳව අමාත්‍යාංශය නීතිය හා සාමය අමාත්‍යාංශය හාර ඇමතිතුමා එතනින් ගියාම එම අමාත්‍යාංශ ලේකම්වරයා

ප්‍ර : ඔබ ඔබේ පිළිතුරේ සඳහන් කළා නේද ඔය නිත්‍ය සාමාජිකයෙක් වුණාය කියලා ආරක්ෂක කවුන්සිලයේ අගමැතිතුමා?

පි : ඔව් එසේය.

ප්‍ර : මා ඔබේ අවධානය යොමු කරන්නට කැමති මේ පැහැදිලි කර ගැනීමක් ලබා ගැනීමට අර C 939 කියලා ලකුණු කරපු මේ ජාතික ආරක්ෂක කවුන්සිලය පිහිටුවීමට පාදක වුණ ගැසට් පත්‍රය කෙරෙහි. එහි 04 වන වගන්තිය යටතේ සඳහන් වෙනවා නේද පහත නම් සඳහන් අයගෙන් මේ ජාතික කවුන්සිලය සමන්විත වෙනවා කියලා The national security council shall consist of the following members. එතන අගමැතිතුමා එහි සාමාජිකයෙක් විදියට සඳහන් වෙනවද?

පි : මේක අනුව නම් නැති බවයි පෙනි යන්නේ.

ප්‍ර : නමුත් ඔබේ මතකයේ තියෙනවනේ ගරු අගමැතිතුමා නිත්‍ය සාමාජිකයෙක් විදියට මේ ආරක්ෂික කවුන්සිලයට සහභාගි වුණා කියලා?

පි : මම හිටපු වසර දෙක හමාර තුළම ස්වාමිනි හැම රැස්වීමටම එවකට හිටපු අගමැතිතුමා සහභාගි වුණා නිත්‍ය සාමාජිකයෙක් විදියට.

ප්‍ර : එතකොට ඔබට මතකද ඔය ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම්වලදී ඒකට සහභාගි වෙන්නේ කවුද කියන එක පිළිබඳව යම් යම් ඒ සටහන් තබා ගත්තා attendance සඳහන් වෙනවා නේද කොහේ හරි?

පි : මම හිතන විදියට සාමාන්‍යයෙන් සිරිතක් විදියට ආරක්ෂක මණ්ඩලයට සහභාගි වෙන අයගේ ලේඛන හෝ එතනින් ගියාම minutes එහෙම තියා ගන්නේ නෑ.

ප්‍ර : නෑ minutes ගැන නෙවේ මම අහන්නේ.

පි : ඔව්.

ප්‍ර : මම දන්නවා ඔය minutes යන්නේ නෑ කියලා. Minutes ගැන නෙවෙයි අහන්නේ මම අහන්නේ සහභාගි

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : සහභාගි වෙන අයගේ ලේඛනයක්වත් පවත්වා ගෙන යන්නේ නෑ මම දැනුවත්ව.

ප්‍ර : ඔබට සමහර විට අමතක වෙලාද දන්නේ නැනේ ?

පි : ඔව්.

ප්‍ර : මම ඔබේ අවධානයට අපිට මේ ගරු කොමිෂන් සභාවට වර්තමාන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා විසින් එවලා අපි ලකුණු කරලා C 856 විදියට ඉදිරිපත් කරලා තියෙන ලේඛනය කෙරෙහි ඔබේ අවධානය යොමු කරනවා. බලන්නකෝ මේකේ මුල පිටුව බලන්න. ඇමුණුම බලන්න.

පි : ඔව් සහභාගි වූ නාම ලේඛනය මෙතන සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර : සඳහන් වෙනවා නේද?

පි : ඔව්.

ප්‍ර : එහෙම නම් ඔබට අමතක වුණාට ඒ පිළිබඳව තොරතුරු යම් ආකාරයකට රැස් කර ගෙන තියෙන්නg ඇති?

පි : මම ඇත්ත වශයෙන්ම අදහස් කළේ ස්වාමිනි අපි දැන් සහභාගි වුණා කියලා අත්සන් ලේඛනයක් පවත්වාගෙන යන්නේ නෑ කියලා.

ප්‍ර : ආ..... අත්සන් කරන්නේ නෑ. ඒකයි ඔබට මතක තිබ්බේ අත්සන් නොකරන බව?

පි : ඔව්.

ප්‍ර : එහෙම නම් මා කිව්වොතින් නිවැරදිද අපට ඒ කියන්නේ ගරු කොමිෂන් සභාවට ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඒවා ඇති මෙම ලේඛනය අනුව සඳහන් වෙනවා නම් ඒ කියන්නේ C 856 (A) තමයි එහි ඇමුණුම ඒ අනුව සඳහන් වෙනවා නම් ඔබ මෙන්ම එවකට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාත්, 2015 ජනවාරි මස 21 වෙනි දින, 2015 පෙබරවාරි මස 11 වන දින, 2015 පෙබරවාරි මස 25 වෙනි දින, 2015 මාර්තු 18, 2015 අප්‍රේල් 01 වෙනිදා, 2015 අප්‍රේල් 08 මේ ආරක්ෂක කවුන්සිල් රැස්වීම් වලට සහභාගි වෙලා තියෙනවා කියලා ඒක නිවැරදිද?

පි : නිවැරදි.

ප්‍ර : හැබැයි ඔබ සේවය කළා කිව්වනේ 2017 වනතුරු?

පි : ඔව්.

ප්‍ර : නමුත් ඊට පස්සේ අප වෙත ලැබිලා තියෙන 2015 මැයි 13, 2015 මැයි 27, 2015 ජුනි 24, 2015 ජුලි 08, 2015 ජුලි 21, 2015 අගොස්තු 05, 2015 අගොස්තු 13 කියන දිනවල ඔබේ නම නෑ නේද? නමුත් නැවත ඔබේ නම තියෙනවා ආරක්ෂක

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කවුන්සිලයේ රැස්වීම්වලට සහභාගි වුණා කියලා 2015 ඔක්තොම්බර් 28 වෙනිදා?

පි : මම නම් මගේ මතකේ හැටියට මම හැම සියළුම ආරක්ෂක කමිටුවට සහභාගි වුණා.

ප්‍ර : නෑ අපි ඔබ ගැන වැරැද්දක් හොයන්නේ නෑ .

පි : නෑ නෑ.

ප්‍ර : මම ඔබේ අවධානයට යොමු කරන්නේ මේ වාර්තා කර ගෙන තියෙන තොරතුරුවල යම් ප්‍රශ්නයක් තියෙනවද කියන එක තමයි අපිට දැනගන්නට ඕනේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ යම් අවස්ථාවලදී මා කී දවස්වල සඳහන් කරපු අවස්ථාවල් වලදී යම් දවස්වල ඔබ සහභාගි වූ බවත්, යම් දවස්වල සහභාගි නොවූ බවත් සඳහන් වෙනවනේ?

පි : ඔව් එසේය.

ප්‍ර : එතකොට අපිට කියන්න පුළුවන්ද ඔබේ ධුර කාලය තුළදී ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විදියට කවුද සේවය කළේ කියලා?

පි : මුලින් බී.එම්.යූ.ඩී. බස්නායක මහත්මයා ඊට පස්සේ කරුණාසේන හෙට්ටිආරච්චි මහත්මයා.

ප්‍ර : එම සඳහන් කරන ලේකම්වරු ඔබ එහෙම නම් ඔබේ රාජකාරී කටයුතු වලදී මුණ ගැහිලා ඇතිනේ?

පි : එසේය.

ප්‍ර : ඔවුන් සමඟ කතා බහ කරලා ඇතිනේ?

පි : එසේය.

ප්‍ර : එහෙම නම් ඔවුන්ගේ ඡායාරූප දැක්කොත් ඔබට හඳුනන්න පුළුවන්ද?

පි : පුළුවන්.

ස්වාමිනි C 838 ලේඛනය සාක්ෂිකරුගේ අවධානයට යොමු කරනවා.

පි : ඔව් මෙතන බස්නායක.

ප්‍ර : බස්නායක මහතා සහ හෙට්ටිආරච්චි මහතා?

පි : ඡායාරූප දෙකම මා හඳුන ගන්නවා.

ස්වාමිනි සාක්ෂිකරු විසින් එම නිලධාරීන් දෙදෙනාව C 838 හි හඳුනා ගන්නා ලද බවට ගෞරවයෙන් සැලකොට සිටිනවා.

ප්‍ර : ඔය වකවානුවේදී පොලිස්පති විදියට පොලිස්පතිවරු කී දෙනෙක් හිටියද?

පි : මුලින්ම ඉලංගකෝන් මහත්මයා ඊට පස්සේ පුජිත් ජයසුන්දර මහත්මයා.

ප්‍ර : ඒත් ඔබේ ධුර කාලය තුළදී?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : ඔබේ ධුර කාලය තුළදී අධ්‍යක්ෂක රාජ්‍ය බුද්ධි විදියට කවුද කටයුතු කෙරුවේ?

පි : නිලන්ත ජයවර්ධන මගේ හිතේ.

ප්‍ර : ඔබට මතකද හමුදාවේ යුධ හමුදාවේ බුද්ධි අධ්‍යක්ෂක විදියට ඔය කාලේ කටයුතු කළේ කියලා?

පි : මට නමින් නම් මතක නෑ ඇත්තටම නමින් මතක නෑ.

ප්‍ර : මා යෝජනා කළොත් ඔබට බ්‍රිගේඩියර් චූලා කොඩිතුවක්කු කියලා ඔබට එකඟ වෙන්න පුළුවන්ද මතක නම් විතරක් කියන්න නැත්නම් කමක් නෑ?

පි : ඇත්ත වශයෙන්ම මට මතක නෑ නමින් මතක නෑ.

ප්‍ර : නමුත් ඔබට මතකද දැන් ඔබ කිව්වනේ ඔබට මතක නෑ කියලා නේද?

පි : එසේය.

ප්‍ර : ඔබට කියන්න පුළුවන්ද ජාතික ආරක්ෂක කවුන්සිලයට යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක සහභාගි වෙනවද කියලා?

පි : ඔව්.

ප්‍ර : එහෙම නැත්නම් ත්‍රිවිධ හමුදාවේ හමුදාපතිවරු එතනට සහභාගි වෙනවද?

පි : යුධ හමුදාවේ බුද්ධි අධ්‍යක්ෂකවරයා සහභාගි වුවා.

ප්‍ර : වුවා?

පි : එසේය.

ප්‍ර : නමුත් ඔබට මතක නෑ නම නේ?

පි : නමින් මතක නෑ.

ප්‍ර : හරි කමක් නෑ. ඔබ ඒ රැස්වීම්වලට සහභාගි වුණ නිසා අඛේකෝන් මහත්මයා ඔබට කියන්න පුළුවන්ද ජාතික ආරක්ෂක කවුන්සිලය කාගේ ප්‍රධානත්වයෙන් ද හමු වුණේ කියලා?

පි : ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන්.

ප්‍ර : ඔබ දැනගෙන හිටියද ඔය ජාතික ආරක්ෂක කවුන්සිලය පවත්වන්නට පෙර සාමාන්‍යයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් හෝ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සතිපතා බුද්ධි සමාලෝචන රැස්වීම් පවත්වලා තිබුණා කියලා?

පි : මම දැන ගෙන හිටියා ස්වාමිනි.

ප්‍ර : මා කිව්වොතින් නිවැරදිද

පි : නිවැරදි .

ප්‍ර : හැම සුමානේම සාමාන්‍යයෙන් අඟහරුවාදා තමයි ඒ රැස්වීම් තිබ්බේ කියලා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මට දිනය නම් මට අහගරුවාදා කියලා මතක නෑ නමුත් ඒ ආකාරයෙන් රැස්වීමක් ආරක්ෂක ලේකම්වරයාගේ හෝ

ප්‍ර : රාජ්‍ය ආරක්ෂක

පි : රාජ්‍ය ආරක්ෂක ඇමතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති බව මතකයි.

ප්‍ර : ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයාගෙන්?

පි : ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයාගෙන්.

ප්‍ර : එතකොට දැන් ඔය ජාතික ආරක්ෂක කවුන්සිලයේ රැස්වීම් සාමාන්‍යයෙන් කොපමණ කාලයකට සැරයක්ද පැවැත්වුයේ?

පි : 2015 ජනවාරි 08 වෙනිදයින් ආණ්ඩුව කටයුතු ආරම්භ කළාට පස්සේ මුලින්ම සතියකට සැරයක් වගේ රැස් වුණා. ඊට පස්සේ මං අස් වෙන අවස්ථාව වෙන කොට ඒක මාසෙකට සැරයක් වගේ දක්වා රැස්වෙන්නට පටන් ගත්තා.

ප්‍ර : ඔබට ඒකට හේතුව කියන්නට පුළුවන්ද ඔබ දන්නවද හේතුව?

පි : සමහර වෙලාවට මම හිතන විදියට රටේ මුලින්ම සතියකට සැරයක් රැස් වුණා. ඊට පසු ඉතින් යම් කිසි රටේ ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් තියෙන බවක් නොපෙනෙන නිසා රැස්වීම් කල් යන්න ඇති කියලා මං හිතනවා සමහර වෙලාවට ජනාධිපතිවරයාගේ ලංකාවේ නොහිටි අවස්ථාවක් වෙන්න පුළුවන් කොහොම හරි මුලින්ම තිබ්බ සුමානේකට තිබ්බ රැස්වීම පැවැත්වීම පසුව මාසය දක්වා කල්ගියා. ඉතින් නොයෙක් නොයෙක් ඒ වගේ මේ ඒ කියන්නේ රටේ ආරක්ෂාව පිළිබඳව සාකච්ඡා කරලා ඊළඟට අපි දැන් රැස්වීමක් සාමාන්‍යයෙන් පවත්වලා ඊට පස්සේ කියනවා ඊළඟ රැස්වීම තියන්න කියලා මුලින්ම. නමුත් ඊට පස්සේ රැස්වීම එහෙම කිව්වෙත් නෑ කල් ගියා.

ප්‍ර : එතකොට ඒකට හේතුවක් විදියට ඔබ දැක්කේ රටේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් නැතිකමද එහෙම නැත්නම් ඒ අවස්ථාවේ ජාතික සංහිඳියාවට මුල්තැන දීමද?

පි : ඒ කරුණු කිහිපයම වෙන්න පුළුවන් මම කියන්නේ පැහැදිලිවම ස්වාමිනි මම කියන්නේ මුලින්ම රැස්වීමේ ආරක්ෂක කවුන්සිලයේ රැස්වීමෙන් පස්සේ අපි පසු ගිය රැස්වීම්වල වාර්තා බලන කොට නිතරම ඒ කියන්නේ රටේ ගැටලුවක් ආරක්ෂාවට තර්ජනයක් වගේ දෙයක් සාකච්ඡාවට යෙදුවේ නැති වෙන කොට ඒ වගේ තත්ත්වයක් තමයි මුලින්ම තිබුණේ. ඒ නිසා ආරක්ෂක මණ්ඩලයේ රැස්වීමක් සතිපතා පැවැත්වුයේ නෑ. හැබැයි ආරක්ෂක අංශවලින් මට මතකයි කිව්වා අපි සාමාන්‍යයෙන් පුරුද්දක් වශයෙන් මේක හැම සුමානේම ඉස්සෙල්ලා වගේ තියමු කියලා

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

කොහොම හරි ඒක යෙදුණේ නෑ ජනාධිපතිවරයාගේ සහ අනෙකුත් දැන් අගමැතිවරයා ඒ කට්ටිය සියළුදෙනාගේම එකඟත්වය මත ඒක සතිපතා පැවැත්වුයේ නෑ.

ප : එතකොට සාමාන්‍යයෙන් ඔය තිබුණු රැස්වීම් පැවැත්වීමේ ක්‍රමවේදය වුණේ කොහොමද සාමාන්‍යයෙන් ඔබ දන්නවනේ රාජ්‍ය සේවයේ දීර්ඝ පළපුරුද්දක් තිබෙන ඔබට යම් රැස්වීමක් පවත්වන කොට ඒ සම්බන්ධයෙන් වූ න්‍යාය පත්‍රයක් ප්‍රථමයෙන් පිළියෙල කරනවනේ ?

පි : එසේය.

ප : එතකොට ඒ න්‍යාය පත්‍රයක් ඒ ආකාරයට පිළියෙල කිරීමක් සිද්ධ වුණාද?

පි : ඔව්.

ප : කවුද ඒක කළේ?

පි : ආරක්ෂක මණ්ඩලයේ ජාතික ආරක්ෂක කවුන්සිලයේ රැස්වීමේදී ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයා තමයි න්‍යාය පත්‍රය සකස් කළේ.

ප : එහෙනම් එතුමා හෝ බොහෝ විට එතුමා මුල් වෙලා තමයි අර සතියකට වරක් පවත්වන බුද්ධි සමාලෝචන රැස්වීම් පවත්වන්නේ නේද?

පි : ඔව් එසේය.

ප : එහෙම කරන ඒ නිලධාරියාම තමයි ඔබ කියන්නේ ජාතික ආරක්ෂක කවුන්සිලයේ න්‍යාය පත්‍රයත් පිළියෙල කරනවා කියලා?

පි : එසේය ඔව්.

ප : එතකොට ඔය රැස්වීම පවත්වන්නේ කොහොමද දැන් ගරු ජනාධිපතිතුමා සාමාන්‍යයෙන් පැමිණෙන නිලධාරීන් පිළිඅරගෙන පිළිගන්නවා ඇති නේ පොඩි පිළිගැනීමේ කතාවක් කරනවා ඇතිනේ?

පි : එසේය.

ප : ඊට පස්සේ කොහොමද ඕක දිවෙන්නේ?

පි : ඉස්සෙල්ලාම ජාතික බුද්ධි ප්‍රධානී සාමාන්‍යයෙන් නිලන්ත ජයවර්ධන එයා තමයි ඉස්සෙල්ලාම එයාගේ ඉදිරිපත් කිරීමක් කරනවා.

ප : හැම තිස්සෙම ජාතික බුද්ධි ප්‍රධානීද ඔය ඉදිරිපත් කරන්නේ?

පි : මම හිටපු කාලේ තුළම හැම අවස්ථාවේදීම ජාතික බුද්ධි ප්‍රධානී තමයි මුලින්ම presentation එකක් ඒ කියන්නේ කරුණු පහුගිය කාලය තුළ ඒ කියන්නේ පසුගිය ආරක්ෂක මණ්ඩලයේ රැස්වීම් සිට මේ දක්වා රටේ සිදු වුණු සිදුවීම් පිළිබඳව වාර්තාවක් බුද්ධි ප්‍රධානී හැටියට අධ්‍යක්ෂකවරයා ලෙස.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔබ ඔය ජාතික බුද්ධි ප්‍රධානී කියලා කිව්ව එක්කෙනාට ඉංග්‍රීසියෙන් කියන්නේ මොකක්ද?

පි : SIS Director

ප්‍ර : ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි ප්‍රධානී?

පි : ඔව් .

ප්‍ර : ජාතික බුද්ධි ප්‍රධානී කියලා කියන්නේ CNI නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ ඇත්තටම ඔබේ පිළිතුරේ ඔබ අදහස් කළේ CNI නෙවේ?

පි : නෑ නෑ

ප්‍ර : Director SIS තමයි මේක තියන්නේ කියලා?

පි : Director SIS

ප්‍ර : දැන් ඔය Director SIS ට හැම අවස්ථාවකදීම මේ පළමුවෙනි කරුණු ඉදිරිපත් කිරීම ජාතික ආරක්ෂක මණ්ඩලයේ ලබා දීමේ හේතුව මොකක්ද?

පි : ඇත්ත වශයෙන්ම වැදගත්ම තොරතුරු සහ ජාතික ආරක්ෂාවට බලපාන ප්‍රශ්න ඔත්තු සේවා සියල්ලම පාලනය කරලා ඒ මඟින් තමයි අපිට වැදගත්ම තොරතුරු ඉදිරිපත් වෙන්නේ කියලා විශ්වාසයක් තිබුණා.

ප්‍ර : අනිත් එක මොකක්ද ඔය ජාතික ආරක්ෂක කවුන්සිලයේ රැස්වීමේ පරමාර්ථය වුණේ ඔබගේ අත්දැකීම අනුව?

පි : ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි අවස්ථාවක ඒ පිළිබඳව කටයුතු කරලා ඉවර වෙලා ඒ පිළිබඳව විසඳුම් මොනවද ගත යුතු ක්‍රියා මාර්ග මොනවද කියලා සාකච්ඡා කිරීම.

ප්‍ර : මොකද ජාතියේ ආරක්ෂාව අනතුරේ නම් මුළු රටම අනතුරේ?

පි : එසේය.

ප්‍ර : ඒක නිසා තමයි ඔය වැදගත්කම ඔබලා ඒ සම්බන්ධයෙන් ලබා දුන්නේ?

පි : එසේය.

ප්‍ර : ඒ අනුවයි ඔබ කියන්නේ මේ රාජ්‍ය බුද්ධි ප්‍රධානී ඒ කියන්නේ SIS අධ්‍යක්ෂකවරයාට පළමුවන කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව සැළසුනා කියලා?

පි : එසේය.

ප්‍ර : ඊට පස්සේ මොකද වුණේ? ඊළඟට කොහොමද ගලා ගෙන යන්නේ ඉදිරිපත් කිරීම?

පි : ඊට පස්සේ යුධ හමුදා අධ්‍යක්ෂකවරයා බුද්ධි අංශ ප්‍රධානියා ඊට පස්සේ අනෙකුත් හමුදාවල ප්‍රධානීන්. ඊට අමතරව ඊට පසුව මගේ

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

හිතේ CNI. ඊට පස්සේ ඔය අතරේ පොලිස්පතිතුමා කරුණු කියනවා ඒ පිළිවෙල ඒකයි .

ප : අපි දන්නේ නැති හින්දා අහන්නේ. ඒ නිසා ටිකක් කියන්නකෝ.

පි : SIS Director. ඊට පස්සේ හමුදා බුද්ධි අංශයේ Director. ඊට පස්සේ අනෙකුත් හමුදාවල දැන් නාවික හමුදාව, ගුවන් හමුදාව ඒ කරුණු

ප : එතකොට යුධ හමුදාව කොයි වෙලාවේද එයත් වැදගත්නේ?

පි : යුධ හමුදාපතිවරයා ඇත්ත වශයෙන්ම බුද්ධි අංශ ප්‍රධානී කරුණු කියන කොට යුධ හමුදාපතිවරයත් ඒ අයට අවශ්‍ය කරුණු කියනවා ඒ අවස්ථාවේ.

ප : එතකොට මා කිව්වොතින් නිවැරදිද රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂකවරයාගේ කරුණු ඉදිරිපත් කිරීමට පසුව තමයි යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂකගේ හරි හමුදාපතිගේ හරි කරුණු ඉදිරිපත් කිරීම සිද්ධ වෙන්නේ කියලා?

පි : නිවැරදි.

ප : එතකොට ඔබ කිව්වනේ ත්‍රිවිධ හමුදාවේ හමුදාපතිවරුනුත් කරුණු ඉදිරිපත් කිරීම කරනවා කියලා?

පි : ඔව්.

ප : ඒ එතකොට යුධ හමුදාවේ බුද්ධි අධ්‍යක්ෂකගේ කරුණු ඉදිරිපත් කිරීමට පස්සෙද නාවික සහ ගුවන්?

පි : ඔව් එසේය.

ප : ඊට පස්සේ. එතකොට ජාතික බුද්ධි ප්‍රධානී කරුණු ඉදිරිපත් කරන්නේ කොයි වෙලාවටද?

පි : ඇත්ත වශයෙන්ම ජාතික බුද්ධි ප්‍රධානී පත් වුණේ අපි ආණ්ඩුව පත් වෙලා යම් කිසි කාලේකට පස්සේ.

ප : මා කිව්වොතින් නිවැරදිද මාස 07 ක් විතර ගියාට පස්සේ කියලා?

පි : ඔව් වෙන්න පුළුවන්.

ප : ඒ කියන්නේ ගරු ජනාධිපතිතුමා ජනවාරි මාසේ 2015 ජනවාරි 08 වෙනිදා ජනතා වරමෙන් පත් වීම ලැබුවට පස්සේ මාස 07 ක පමණ කාලයක් ජාතික බුද්ධි ප්‍රධානී කෙනෙක් නැතුවද එහෙම නම් ජාතික බුද්ධි ප්‍රධානී ආයතනය තිබුණේ?

පි : එසේය.

ප : ඊට පස්සේ තමයි ඔබ කියන විදියට සිසිර මෙන්ඩිස් මහත්මයාට පත් වීම ලැබුණේ ජාතික බුද්ධි ප්‍රධානී ලෙසට?

පි : ඔව්.

ප : එතකොට ඔහු ඔය ධුරය භාර ගත්තට පස්සෙත් ඔබතුමා ඒ රැස්වීම්වලට ගියානේ 2017 වෙනකම්?

පි : ගියා.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඉතුරු ටික?

පි : එසේය.

ප්‍ර : එතකොට ඒ කාලයේදී ඔබේ අත්දැකීම තමයි එහෙම නම් ජාතික බුද්ධි ප්‍රධානීත් මේ ආරක්ෂක කවුන්සිලයේ ඉදිරිපත් කිරීම් කරනවා?

පි : කරනවා.

ප්‍ර : වෙන කවුද පොලිස්පති ඊට පස්සෙද කරන්නේ?

පි : නෑ දැන් පොලිස්පති ඉදිරිපත් කිරීම කරන්නේ දැන් SIS Director, හමුදාපතිවරු දෙන්නා දැන් පොලිස්පතිවරයා සමහර වෙලාවට CNI ට ඉස්සෙල්ලා සමහර වෙලාවට කතා කරනවා සමහර වෙලාවට පසුව මගේ හිතේ න්‍යාය පත්‍රය අනුව තමයි වැඩ කරන්නේ.

ප්‍ර : ඒ අනුව කතා බහ කරනවා?

පි : ඔව්.

ප්‍ර : කරුණු ඉදිරිපත් කිරීමක් කරනවා. දැන් එතකොට ඔබ කිව්වනේ මේ රටේ රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් තමයි වැඩි ප්‍රමුඛත්වයක් දීලා මෙතන සාකච්ඡා කරන්න නියමිත කියලා?

පි : එසේය.

ප්‍ර : එතකොට ඒ අවස්ථාවල් වලදී ඔබ කලින් පිළිතුරක් දෙන ගමන් කිව්වා සටහන් ගැනීමක් කෙරෙන්නේ නෑ කියලා minutes තියා ගන්නේ නෑ?

පි : සාමාන්‍යයෙන් වෙනම minutes තියා ගන්නේ නෑ. නමුත් දැන් අදාළ අංශවල යුධ හමුදාවට අදාළ minutes තියා ගන්නේ යුධ හමුදාපතිවරයා. නාවික හමුදාවට අදාළ සටහන් ලියා ගන්නේ අර සාකච්ඡා වෙච්චි කරුණු අනුව නාවික හමුදාපතිවරයා. ඒ වගේ ඒ අදාළ අංශවලින් ඒ තමාට අදාළ සටහන් සටහන් කර ගත්තා.

ප්‍ර : ඒ ඒ අදාළ නිලධාරීන් විසින් ඒවා නඩත්තු කර ගන්නවා?

පි : ඔව් .

ප්‍ර : එතකොට දැන් ඔය අවස්ථාවල් වලදී යම් වැදගත් ප්‍රශ්නයක් ඇවිල්ලා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නට පුළුවන්. ඒ සාකච්ඡා කරලා තීරණ ගැනීම එවැනි රැස්වීම් තුළදීම සිදු වුණාද?

පි : එසේය. ඒ අවස්ථාවේදීම තීරණ ගැනීම සිදු වුණා.

ප්‍ර : එතකොට ඒ තීරණ ගැනීමේදී එහෙම තීරණ ගන්න කොට ගරු අග්‍රාමාත්‍යතුමා කොයි වගේද ඒකට දායක වුණේ? එතකොට ගරු අග්‍රාමාත්‍යවරයා විදියට හිටියේ කවුද?

පි : ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අග්‍රාමාත්‍යවරයා කොයි වගේ දායකත්වයක්ද ඒ තීරණ ගැනීමේදී දැක්වුයේ ඔබේ ඔය ධුර කාලය තුළදී?

පි : මම මගේ ධුර කාලය තුළ නම් සාමාන්‍යයෙන් ඒ තීරණ ගැනීමේදී කිසිම අගමැතිතුමා හෝ වෙනකුත් ඇමතිවරුන්ගෙන් කිසි විරෝධයක් පළ වුණේ නෑ. සාකච්ඡා කරලා එකඟතාවයෙන් තමයි ඔක්කොම තීරණ වලට එළඹුණේ.

ප්‍ර : එතකොට ගරු ජනාධිපතිතුමා ඒ තීරණ ගැනීමට දැක්වූ දායකත්වය කොයි වගේද ඔබේ නිරීක්ෂණය අනුව?

පි : දායකත්වය ඒ කියන්නේ සියළු දෙනාම එකම ආකාරයෙන් සහභාගිත්වය දැරුවා තීරණ ගැනීමේදී දායකත්වය දැක්වුවා.

ප්‍ර : ඔබ මේ ගරු කොමිෂන් සභාවට කියන්න අබේකෝන් මහත්මයා ඔබේ ධුර කාලය තුළදී සියළුම අය ගරු ජනාධිපතිතුමා ගරු අගමැතිතුමා ඇතුළු මේ රැස්වීම්වලට සහභාගිවූ සියළුම සාමාජිකයින් එක ලෙස සාමූහිකව කටයුතු කරලා ඒ පැන නැඟුණු ප්‍රශ්න විසඳීම සඳහා කටයුතු කළා කියලද?

පි : එසේය.

ප්‍ර : ඒ ඔබේ අත්දැකීම?

පි : එසේය.

ප්‍ර : දැන් සමහර ප්‍රශ්න තියෙන්නට පුළුවන්නේ ඒ වෙලාවේම විසඳන්න බැරි ඉදිරියට ගෙන යන්නට ඕනේ ඒවා?

පි : ඔව්.

ප්‍ර : ඒවා සම්බන්ධයෙන් කොහොමද කටයුතු වුණේ?

පි : සාමාන්‍යයෙන් එහෙම ගැටලුවක් ආවොත් එහෙම ඊළඟ security council එකේදී කරුණු හොයලා සාකච්ඡා කරලා අපි කියමුකෝ SIS Director ගේ අදාළ දෙයක් නම් එයාට කියනවා තවදුරටත් හොයලා වාර්තා කරන්න ඊළඟ security council එකේ. නැත්නම් ඊට පස්සේ බුද්ධි අංශ අධ්‍යක්ෂකවරයාගෙන් හමුදා අංශයෙන් ආවොත් එහෙම ඔහුටත් කියනවා

ප්‍ර : යුධ හමුදා බුද්ධි එක ගැන ඔය කියන්නේ?

පි : යුධ හමුදාවේ. ඒ වගේ අදාළ අංශවලට කියනවා මේ පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරලා කරුණු ඉදිරිපත් කරන්න කියලා කියනවා.

ප්‍ර : එතකොට ඔය සාකච්ඡා කරපු ඔබේ ධුර කාලය තුළදී ආගමික අන්තවාදය පිළිබඳව කරුණු සාකච්ඡා වුණාද?

පි : සාකච්ඡා වුණා ස්වාමිනි.

ප්‍ර : ඔබට මතකද මොන වගේ කරුණු ද සාකච්ඡා වුණේ මොනවගේ ප්‍රශ්න ද මේ ජාතික ආරක්ෂාවට අදාළව සාකච්ඡා වුණේ කියලා?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : මුලින්ම සාකච්ඡාවට බඳුන් වුණේ සිරියාවට සිරියානු යුද්ධයට ගිහින් ඒ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ අන්තවාදී කොටස් යුද්ධයට සහභාගි වුණා ඒ ගිය යම් කිසි මගේ හිතේ 15 ක් හෝ 16 ක්ගේ ලැයිස්තුවකුත් එක්ක මෙන්න මේ කට්ටිය මේ පැත්තෙන් ගිහින් තියෙනවා මේ පැත්තෙන් ගිහින් තියෙනවා කියලා වාර්තාවක් ඉදිරිපත් කළා.

ප්‍ර : ඒ කියන්නේ ශ්‍රී ලාංකිකයෝ සිරියාවට ISIS සංවිධානයට බැඳීමට ගියපු අවස්ථාවක් ගැනද ඒ?

පි : ඔව් එසේය.

ප්‍ර : අවස්ථාවක් හෝ අවස්ථාවන් පිළිබඳව?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ කිව්වා ඒකේ ලැයිස්තුවක් සමඟ විස්තර සමඟ තමයි ඒ කරුණු ඉදිරිපත් වුණේ කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට එහෙම නම් දැන් මේ යන්නේ ISIS සංවිධානය කියන්නේ මොකක්ද කියන එක පිළිබඳව එතකොට ජාතික ආරක්ෂක කවුන්සිලයේ සාමාජිකයින්ට අවබෝධයක් තිබ්බද?

පි : එසේය තිබුණා.

ප්‍ර : එහෙම නම් එවැනි සංවිධානයකට බැඳෙන්නට ශ්‍රී ලංකා පුරවැසියෝ විගමණය වීම පිළිබඳවත් ප්‍රශ්නයක් තියෙනවනේ?

පි : ඔව් දැන් ඒ වගේ ගිය පුද්ගලයන් පිළිබඳව සොයලා කටයුතු කරන්න ඉවර වෙලා සියළුම අංශවලට දැන්නුවා. විශේෂයෙන්ම පොලිස්

ප්‍ර : කවුද දැන්වුයේ?

පි : ඒ කියන්නේ එතන හිටපු දැන් සමහර වේලාවට සාකච්ඡාවේදී සමහරක් ජනාධිපති වෙන්න පුළුවන් අගමැති වෙන්න පුළුවන් ඒ ඉදිරිපත් වෙන කරුණු අනුව තවදුරටත් හොයලා සාකච්ඡා කරන්න කියලා අදාළ පොලිස් ස්ථානවලින්, බුද්ධි අංශ වලින් හොයලා බලලා වාර්තා කරන්න කියලා තීරණවලට ආවා.

ප්‍ර : ඔබට නිශ්චිතව මතක නැති වුණාද කවුරුද මේක ගැන කිව්වේ මේ උපදෙස් දුන්නේ කියලා නමුත් ඔබ කියන්නේ එවැනි උපදෙස් දීමක් මේ ISIS සංවිධානයට ශ්‍රී ලංකා පුරවැසියන් යන එක පිළිබඳව සාකච්ඡා වූ අවස්ථාවේදී ලබා දුන්න බව?

පි : එසේය.

ප්‍ර : එතකොට ඔය ISIS සංවිධානය ගැන විතරද සාකච්ඡා වුණේ?

පි : සාමාන්‍යයෙන් රටේ දැන් අපි කියමු උතුරේ, නැගෙනහිර අනිත් තැන්වල පවත්වන රැස්වීම් පිළිබඳව. රැස්වීම්වලදී කලහාකාරී

FAIR COMMENT BY JEZEEM

ලෙස හැසිරීම්, ඊළඟට ඔය මේ ඊළඟට ඔය සමඟර වේලාවට ආගමික අන්තවාදී රැස්වීම් පිළිබඳවත් වාර්තා කළා.

ප : එතකොට ඒ සාකච්ඡාවල් වලදී මුස්ලිම් අන්තවාදය පිළිබඳව පමණක්ද සාකච්ඡා කළේ?

පි : නෑ නෑ සියළුම අංශ පිළිබඳව.

ප : ඒ කියන්නේ ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන සියළුම ජන කොට්ඨාශවල යම් ආකාරයක ආගමික අසංගතිතාවයක් ජාතික අසංගතිතාවයක් තියෙනවා නම් ඒ සියල්ල පිළිබඳවම ඔය රැස්වීම් වල කතා කළා කියලද ඔබ කියන්නේ?

පි : ඔව් සාකච්ඡා වුණා එසේය.

ප : සාකච්ඡා කළා. එතකොට ඔබ කියන ආකාරයට ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමක් සිද්ධ වුණා?

පි : සිදු වුණා.

ප : ඔය සාකච්ඡා වලදී ශ්‍රී ලංකාවේ මද්‍රසා ආරම්භ කිරීම ඒ කියන්නේ මේ මුස්ලිම් ජන කොට්ඨාශ ලංකාවේ බෞද්ධයන් විසින් දහම් පාසල් තියෙන ආකාරයට මුස්ලිම් ජනතාව ඔවුන්ගේ දහම් පාසල් පැවැත්වීම සම්බන්ධයෙන් යම් ප්‍රශ්න සහගත බවක් තිබෙන බවක් සාකච්ඡා වුණාද ඒ කියන්නේ වෙන වචනවලින් කියනවා නම් මද්‍රසා සම්බන්ධයෙන් ඔය රැස්වීම්වලදී අවධානය යොමු වුණාද?

පි : එසේය සාකච්ඡා වුණා.

ප : ඇයි මද්‍රාසා පිළිබඳව අවධානය යොමු වෙන්නට හේතුව?

පි : මේ මද්‍රාසා වලින් තමයි මේ තරුණ මේ මුස්ලිම් ආගමේ මුස්ලිම් ආගමේ තියෙන අන්තවාදී කොටස් අන්තවාදයට යොමු කිරීම කෙරෙන්නේ මද්‍රාසා පාසල්වලින් කියලා ඒ බුද්ධි අංශ වලින් වාර්තා කළා.

ප : වාර්තා කළා. එතකොට යම් උපදෙස් ලබා දීමක් සිද්ධ වුණාද?

පි : ඔව් මෙහෙමයි ඒ උපදෙස් දුන්නේ මේ පිළිබඳව හොයලා බලලා කටයුතු කරන්න තමයි උපදෙස් දුන්නේ ඒවා නවත්වන්න එහෙම කිසි තීරණය කළේ නෑ .

ප : නවත්වන්න තීරණය ගත්තේ නෑ.

පි : නෑ.

ප : එහෙනම් මොකක් කරන්නද?

පි : ඒ පිළිබඳව තවදුරටත් අවධානය යොමු කරලා ඉවර වෙලා දැනට ඒ ඒ කියන විදියට ඒ කියන කාලේ වෙන කොට ලොකු කලබල ලොකු අනතුරු කියලා බුද්ධි අංශවලින් වාර්තා කළේ නෑ. මම හිතන විදියට 2017 හෝ 2016 අග වගේ තමයි ඔය කතා වුණේ. ඒ වෙන කොට විශාල මට්ටමේ අනතුරු දායක තත්ත්වයක් වාර්තා

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කළේ. නමුත් මේ වගේ ඉගැන්වීම් වෙනවා මේ පිළිබඳව අවධානයෙන් ඉන්න ඕනේ කියලා තමයි සාකච්ඡා වුණේ.

ප : වොකා කියන ඇඳුම නැත්නම් බුර්කාව මුස්ලිම් ජන කොට්ඨාශයට අයත් කාන්තාවන් හැඳීම මඟින් යම් යම් ආරක්ෂක තත්ත්වයන් ජාතික ආරක්ෂාවට ඇති විය හැකි සහ ගැටලු පිළිබඳව සාකච්ඡා වුණාද?

පි : එසේය සාකච්ඡා වුණා.

ප : මොකක්ද ඒක ගැන වුණේ කියලා අපිට පොඩි පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්ද?

පි : බුද්ධි අංශවලින් වාර්තා කළා ආරක්ෂක අංශවලිනුත් වාර්තා කළා මේ වගේ මූණ සම්පූර්ණයෙන් අඳුර ගන්න බැරි ආකාරයට කාන්තාවන් පැමිණීමෙන් ජාතික ආරක්ෂාවට තර්ජනයක් නිසා මේ පිළිබඳව යම් කිසි පියවරක් ගන්න ඕනේ කියලා.

ප : ඉතින් මොකක්ද වුණේ?

පි : ඒක ඇත්ත වශයෙන්ම තීරණයක් ගත්තේ නෑ මේ පිළිබඳව ඒ නැවැත්වීමක් හෝ පිළිබඳව තීරණයක් ගත්තේ නෑ.

ප : අඹේකෝන් මහත්මයා ඔබ දැකලා තියෙනවද අහලා තියෙනවද ඇතැම් අවස්ථාවල් වලදී ඔය බර්ගා නැත්නම් ඔබ බුර්කාව කාන්තාවන් විසින් අඳිනවා වුණාට පිරිමින් ඒ ඇඳුම ඇඳලා ඒ ඇඳුම අවභාවිතා කරන ලද අවස්ථාවන් පිළිබඳව?

පි : ඒ පිළිබඳවත් සාකච්ඡා වුණා ඒ අවස්ථාවලදී. සාකච්ඡා වෙලා ඉතින් ඇත්ත වශයෙන්ම ඒ අවස්ථාවේ තිබ්බේ රටේ ඉතින් ආගමික සහජීවනය තිබුණා එතකොට මේ පිළිබඳව අනෙක් එක එක ආගම්වල එක එක කණ්ඩායම් වල මේ ඒ කියන්නේ යම් කිසි අසමඟියක් ඇති නොවන ආකාරයට මේ පිළිබඳව විමසිල්ලෙන් හිටිය යුතුයි කියලා වැරැද්දක් වෙනවා නම් ඒ පිළිබඳව කටයුතු කරන්න කියලා තමයි සාකච්ඡා වුණේ.

ප : විමසිල්ලෙන් ඉන්නට විතරද එතකොට තීරණය වුණේ?

පි : ඔව් ඊට එහා සාකච්ඡාවක් නම් මට මතක විදියට තීරණයක් ගත්තේ නෑ මේක නැවතිය යුතුයි ඒ වගේ දෙයක් සාකච්ඡාවක් තීරණයක් ගත්තේ නෑ.

ප : ඔබේ ධුර කාලය තුළදී සිද්ධ වුණේ නෑ?

පි : නෑ නෑ.

ප : දැන් ඇතැම් අවස්ථාවල් වලදී ජනාධිපතිතුමා දිවයිනෙන් බැහැර වෙන අවස්ථාවල් තියෙනවනේ?

පි : එසේය.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ කිව්වා අද දින මගේ මූලික ප්‍රශ්නයකට පිළිතුරු දෙන ගමන් මුල් අවස්ථාවේදී සතිපතා පවත්වන ලද ආරක්ෂක රැස්වීම් පසුව මාසයකට වරක් පැවැත්වීමට යෙදුණා කියලා?

පි : එසේය.

ප්‍ර : එතකොට ඔය කාලය තුළදී ඒ කියන්නේ පළවෙනි රැස්වීම තියලා ඊළඟ රැස්වීම පවත්වන්නට පෙර යම් වැදගත් බුද්ධි තොරතුරක් පිළිබඳව නැත්නම් යම් ජාතික ආරක්ෂාවට ඉවහල් වන යම් කරුණක් පිළිබඳව ගරු ජනාධිපතිතුමාගේ අවධානය යොමු කිරීමට බුද්ධි අංශවලට අවශ්‍යතා එහෙම නැත්නම් ඔය ජාතික ආරක්ෂක කවුන්සිලයට සහභාගි වන සාමාජිකයන්ගෙන් කාට හරි අවශ්‍යතාවය ඇති වුනොත් එතකොට ඒ පිළිබඳව ගරු ජනාධිපතිතුමා දැනුවත් කරන යම් ක්‍රමවේදයක් තිබුණද?

පි : මම මගේ ධුර කාලය තුළ සාමාන්‍යයෙන් SI Director හරි නැත්නම් ත්‍රිවිධ හමුදාපතිවරු, පොලිස්පතිවරයා ඒ වගේ තොරතුරක් ආවොත් එහෙම කෙළින්ම ජනාධිපතිවරයා හම්බ වෙලා සමහරක් දුරකථනයෙන් වේලාවක් ඉල්ල ගෙන එහෙම නැත්නම් මම හරහා හරි වේලාවක් ඉල්ල ගෙන සහභාගි වෙලා ඇවිල්ලා සාකච්ඡා කරපු අවස්ථා මට මතකයි මම දන්නවා.

ප්‍ර : ඔබ මේ ගරු කොමිෂන් සභාවට කියන්නේ පොලිස්පතිවරයා, ත්‍රිවිධ හමුදාවේ හමුදාපතිවරු, රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා එවැනි අවශ්‍යතාවල් ඇති වුණාම ආකාර දෙකකට ගරු ජනාධිපතිතුමා සමඟ සම්බන්ධ වීම කෙරුවා කියලා?

පි : ඔව්.

ප්‍ර : එකක් තමයි ගරු ජනාධිපතිතුමාගේ ලේකම්වරයා වූ ඔබ හරහා සම්බන්ධ වෙලා ගරු ජනාධිපතිතුමාට ඒ පණිවිඩය ලබා දීමට අවස්ථා ලබා ගැනීම.

පි : එසේය.

ප්‍ර : දෙවෙනි එක ඔබ කියන්නේ ගරු ජනාධිපතිතුමා සමඟ කෙළින්ම සෘජුව සම්බන්ධ වෙලා මේ අවශ්‍ය තොරතුරු ලබා දීම?

පි : ඔව් සෘජුව සම්බන්ධ වීම බැරි වෙයි. දුෂ්කරතාවයක් තිබෙනවා නම් තමයි මං හරහා ජනාධිපතිවරයා හම්බ වෙන්න අවස්ථාවක් අරන් දෙන්න කියලා මට දුරකථනයෙන් හෝ හම්බ වෙලා කියන්නේ. ඒ අවස්ථාවේදී මම ජනාධිපතිවරයා හම්බ වෙන්න හැකි ඉක්මනින්ම අවස්ථාව අරන් දීලා තියෙනවා.

ප්‍ර : ඇයි ඔබ පාවිච්චි කළා වචන හැකි ඉක්මනින්ම අවස්ථාව අරන් දෙනවා කියලා ඇයි ඔබ ඒ වචන පාවිච්චි කළේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සාමාන්‍යයෙන් බුද්ධි අංශ ප්‍රධානීන් හෝ හමුදා ප්‍රධානීන් එන්නේ රටේ ආරක්ෂාවට ඉතාමත් අත්‍යවශ්‍ය කරුණු. එතකොට මේ කරුණක් උඩ ඒ මෙම නිලධාරීන් ආව අවස්ථාවක ප්‍රමුඛත්වය දිය යුතුයි රටේ ආරක්ෂාවට. ඒ නිසා තමයි හැකි ඉක්මනින් ඒ අවස්ථාව මම අරන් දෙන්න කටයුතු කළේ.

****

දැන් වේලාව : ප.ව.02.15 යි.
මෙතැන් සිට ල/ලේ :- සවිනි මෙය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

වේලාව: ප.ව.02.15
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සවිනි මෙනවිය.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර: ඔබ දන්නවද යම් යම් අවස්ථාවල් වලදී රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා කෙළින්ම ගරු ජනාධිපතිතුමා මුණ ගැහිලා පෞද්ගලිකව යම් යම් කරුණු සාකච්ඡා කරන ලද අවස්ථාවන්?

උ: දන්නවා. එසේය. පිළිගන්නවා. එහෙම අවස්ථාවන් මං දැකලා තියෙනවා.

ප්‍ර: එතකොට ඔබේ ධුරකාලය තුළ දී එම ධුරයේ ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා විදියට කටයුතු කරපු නිලන්ත ජයවර්ධන මහත්මයා නේද සෘජුව ගරු ජනාධිපතිතුමාව තමන්ට යම් දෙයක් පිළිබඳව සැලකරන්නට අවශ්‍ය නම් ඇතැම් අවස්ථාවල් වලදී ඒ ආකාරයට ගිහිල්ලා එතුමා හමුවෙලා ඒ කරුණු ඉෂ්ඨ කරගත්තේ?

උ: ඔව්. එසේය.

ප්‍ර: එතකොට ඔය කාලය තුළදී ඔබ කිව්වනේ දෙදෙනෙක් හිටියා කියලා ආරක්ෂක ලේකම්වරු?

උ: ඔව්.

ප්‍ර: එක්කෙනෙක් ඔබ කිව්වා බස්නායක මහත්මයා. අනිත් එක්කෙනා කරුණාසේන හෙට්ටිආරච්චි මහත්මයා. එතකොට ඒ ආරක්ෂක ලේකම්වරුන්ටත් හැකියාව තිබුණ ද සෘජුව ගිහිල්ලා මුණ ගැහිලා ජනාධිපතිතුමාට ඒ අවශ්‍යය කරුණු පිළිබඳව දැනුම් දෙන්නට?

උ: හැකියාව තිබුණා.

ප්‍ර: දැන් ඒ හැරෙන්නට ජනාධිපතිතුමා සමඟ සෘජුව සම්බන්ධ වෙන්නට පුළුවන් දුරකථන පහසුකම් තිබෙනවා නේද ඔය ආරක්ෂක ලේකම්වරයාට ඒ වගේම රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාට?

උ: එසේ තිබුණා.

ප්‍ර: එතකොට අපි ඔබේ ධුරකාලය තුළ දී ඔබට එහෙම නම් කෙටි කාලයක් අවස්ථාව ලැබෙන්නට ඇත්තේ ජාතික බුද්ධි ප්‍රධානී සමඟ කටයුතු කරන්නට. ඒ කියන්නේ සිසිර මෙන්ඩිස් මහත්මයා සමඟ. ඔබ අර සඳහන් කරපු රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහත්මයා ඒ වගේම ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරු වුණ බස්නායක සහ හෙට්ටිආරච්චි මහත්වරුන්ට වගේම ජාතික බුද්ධි ප්‍රධානී ලෙස ඔබේ සේවා කාලය තුළදී ඔබ දැක්ක සිසිර මෙන්ඩිස් මහත්මයාටත් සෘජුව ගරු ජනාධිපතිතුමාව මුණ ගැහිලා කතා කිරීමේ යම් කරුණු දැනුම් දීමේ හැකියාව තිබුණ ද එසේ සිදු වුණා ද?

උ: තිබුණා . සිදු වුණා.

ප්‍ර: එවැනි රැස්වීම් වලට එවැනි මුණ ගැසීම් වලට ඔබ සහභාගි වුණා ද?

President's Secretariat Copy
LEAK COMMENT BY JEZEEM

උ: මම සහභාගි වුණේ නැහැ . මම සමහර විට ජනාධිපතිතුමාගේ කාමරයේ ඉන්න කොට මම දකිනවා මේ වාගේ එනවා ඒ සාකච්ඡා අතිශය පුද්ගලික නිසා මං ඒවට සහභාගි වුණේ නැහැ. ස්වාමිනි මං මෙතැනින් අදහස් කළේ සමහර වෙලාවට ඔය කියන දැන් බුද්ධි අංශ ප්‍රධානීන් හෝ ආරක්ෂක අංශ හමුදා ප්‍රධානීන් එහෙම ඒ සාකච්ඡා පවත්වලා ජනාධිපතිවරයා සමඟ සාකච්ඡා කරා යම් කිසි ගැටළුවක් එහෙම ආවොත් මට යොමු වුණා. මමත් ඒ අවස්ථාව ඉක්මනින් අරන් දුන්නා. එතකොට ඔය සිසිර මෙන්ඩිස් මහත්මයා වුණත් මගෙන් හම්බවෙලා ඒ අවස්ථාවක් ඉල්ලලා තියෙනවා මං ඒක අරන් දීලා තියෙනවා. ඒ වගේ අපි ක්‍රමවේදය හදලා තිබුණා ඒ කාලේ තුළ.

ප්‍ර: එතකොට ඔබ ඔය සඳහන් කරපු ආකාරයටම ත්‍රිවිධ හමුදාපතිවරුන්ටත් එහෙම නම් සෘජුව ගරු ජනාධිපතිතුමා මුණගැහිලා තමන්ට යම් ප්‍රශ්නයක් තිබුණ නම් රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් එය කතා බහ කරන්නට අවස්ථාව ලැබෙන්නට ඇති?

උ: එසේය. තිබුණා.

ප්‍ර: ඔවුන් එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් අවස්ථාවල් ඔබ දැකලා තියෙනව ද?

උ: ඔව් එසේය. මං දැකලා තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: අඛේකෝන් මහත්මයා ඔබ ජනාධිපති ලේකම් ධුරය දරණ කාල සීමා වලදී ඔබ ආරක්ෂක Council රැස්වීම් වලට සම්බන්ධ වුණා. ඔබ කියන පරිදි ඊට අමතරව වරින් වර බුද්ධි ප්‍රධානීන් නැත්නම් ආරක්ෂක ලේකම් යම් අවස්ථාවක් අවශ්‍ය වූ විට ජනාධිපතිවරයාව හමුවීමට ඔබ ඒ අවස්ථාව සලසලා දීමට දායක වුණා කියලා ඔබ කිව්වා?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: ඔබගේ මේ ප්‍රායෝගික දැනුම අනුව ඔබට මේ කොමිෂන් සභාවට කියන්න පුළුවන් ද ඔබ ජනාධිපති ලේකම් ධුරය දරපු කාලසීමාවේ රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමාගේ ආකල්පය වුණේ මොකද්ද?

උ: ජනාධිපතිතුමා දැන් security Council හෝ එතැනින් ගියාම නැත්නම් ඔය ආරක්ෂක ප්‍රධානීන් පැමිණෙන අවස්ථාවලදී මට කියලා තිබුණා ඒ ගොල්ලොන්ට හැකි ඉහළම අවස්ථාවෙන් මගේ කාමරේ කවුරු හිටියත් එක්කන් එන්න කියලා. ඒ අනුව තමයි මං කිව්වේ මං අවස්ථාව අරන් දුන්නා කියලා. ජනාධිපතිතුමත් මම ඒ කියපු අවස්ථාවල් බැහැ කිව්වේ නැහැ. ඉතිං ආරක්ෂාව පිළිබඳව ආරක්ෂක Council ත් ඊළඟට ඔය

FAIR COMMENT — BY JEZEEM

ආරක්ෂක අංශවල ප්‍රධානීන් හම්බවුණ අවස්ථාවේදීත් එතුමාගේ ඉහළම ප්‍රමුඛත්වය දුන්න කියන එක තමයි මගේ අවබෝධය.

ප්‍ර: දැන් ඔබ ආරක්ෂක Council රැස්වීම් වලට සහභාගි වුණානේ?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඔබ ප්‍රකාශ කෙරුවා ඒ රැස්වීම් වලට ගරු එවකට අග්‍රාමාත්‍යවරයාව සිටි රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් සහභාගි වුණා කියලා?

උ: එසේය.

ප්‍ර: ඔබගේ ප්‍රායෝගික අත්දැකීම්වලට අනුව එතුමා එවකට සිටි අග්‍රාමාත්‍යවරයාගේ ආකල්පය මොකද්ද රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන්?

උ: දැන් ඇත්ත වශයෙන්ම ස්වාමීනි ආරක්ෂක මණ්ඩල රැස්වීම් වලදී හෝ කිසිම තැනක සාමාන්‍යයෙන් ඒ යම් කිසි ජාතික ආරක්ෂාවට අදාළ කරුණු සාකච්ඡා වුණ අවස්ථාවක අගමැතිතුමත් ඒකට ක්‍රියාකාරීව සහභාගි වුණා. යම් කිසි ආරක්ෂක අංශ වලින් යම් කිසි ඉල්ලීමක් කරොත් එහෙම ඒකට විරුද්ධවීමක් වුණේ නැහැ. ඒ අනුව මං හිතන විදියට ඒවට හොඳට සාකච්ඡාවට සහභාගි වුණා තීරණ ගන්න එකඟ වුණා.

ප්‍ර: යම්කිසි අවස්ථාවක ආරක්ෂක Council යේ දී මතුවුණ කරුණු වලදී එනම් රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධ මතුවුණු කරුණු වලදී තීරණයක් ගැනීමේ දී එම තීරණය ගැනීමට ජාතික හා ආගමික සංහිදියාව යන සංකල්පය කොපමණ බලපෑමක් කෙරුවද?

උ: ඒක බොහෝ දුරට දැන් ඔය අපි අර උදාහරණයක් වශයෙන් මුණ වහන ඇඳුම් වගේ අවස්ථාවල මේවා කරන්න ඔන වෙන්නේ. දැන් අපි යහපාලනය ආගමික සියළුම සහයෝගයෙන් අපි කටයුතු කරන්නේ. ඒ නිසා ඒ සහයෝගයට බාධා නොවන ආකාරයට කටයුතු කළ යුතුයි කියන මතය තමයි මම හිතන්නේ රජයේ සියළු දෙනාම හිටියේ. ඒක අගමැතිතුමත් ජනාධිපතිතුමත් දේශපාලන වශයෙන් ඒ මතයේ තමයි හිටියේ.

ප්‍ර: එතකොට ඔබ කියන හැටියට රාජ්‍ය ආරක්ෂාව යන කාරණාව සම්බන්ධයෙන් යම්කිසි තීරණයක් ගැනීමේ දී වෙනත් කරුණු කෙසේ වෙතත් ආගමික සහ ජාතික සංහිදියාව ඒ තීරණ ගැනීමේ දී ලොකු දායකත්වයක් ලොකු බලපෑමක් කෙරුවාද ?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: කියන්න?

පි: මම පොඩ්ඩක් විස්තර කරන්න ද මම අදහස් කළේ ඒ කියන්නේ 2015 පිහිටුවට පස්සේ ඇත්ත වශයෙන් විශාල ආගමික සංහිදියාව පිළිබඳව වැඩපිළිවෙළක් අරන් ගියා. මේ වැඩපිළිවෙලට බාධා වෙන කිසිදෙයක් වගේ ඔය බුර්කාව පැළඳීම වුණත් මේකට බාධාවක් ආරක්ෂක කටයුතු වලදී බාධාවක් වුණොත් පරීක්ෂා කරන්න නමුත් මේක ආගමික

FAIR COMMENT BY JEZEEM

සහයෝගයට ආගමික සහජීවනයට බාධාවක් වෙනව නම් ඒ පිළිබඳව හිතලා කටයුතු කරන්න තමයි ආරක්ෂක අංශවලට සාකච්ඡාවලදී උපදෙස් දුන්නේ.

ප්‍ර: එතකොට ඒ විදියට බුර්කාව පමණක් සම්බන්ධයෙන් නෙවෙයි මද්‍රාස පිළිබඳව ඔබ කලින් කියපු කරුණ සම්බන්ධයෙනුත් තීරණ ගැනීමේ දී එම ආගමික සහ ජාතික සංහිදියාව යන සංකල්පය බලපෑවද?

උ: එසේය.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: අබේකෝන් මහත්මයා දැන් ඔබ ජනාධිපති ලේකම්වරයා වශයෙන් කටයුතු කරපු කාලය තුළ ඔබ නිරීක්ෂණය කරාද මේ ගරු ජනාධිපතිතුමයි ගරු අගමැතිතුමයි දෙන්න සහභාගි වෙච්ච ආරක්ෂක මණ්ඩල රැස්වීම්වලදී මේ දෙදෙනාගෙන් ආරක්ෂාව පිළිබඳව වැඩියෙන්ම උනන්දුවෙන් කටයුතු කළේ කවුද කියලා?

උ: ඒ ප්‍රශ්නයට මට ඉතිං එක එල්ලේම උත්තර දෙන්න බැහැ. සමාවෙන්න ස්වාමීනි සාකච්ඡාවක් පැමිණුනු අවස්ථාවක ඒකට දෙදෙනාම සාකච්ඡාවට සහභාගි වුණා. තීරණ ගැනීමේ දී විරුද්ධතාවයක් පත් කළේ නැහැ. ඒක තමයි මගේ මතය.

ප්‍ර: කිසියම් හෝ අවස්ථාවක දෙදෙනා අතර යම් එකගතාවයක් නොමැති බව ඔබ නිරීක්ෂණය කරාද?

උ: සාමාන්‍යයෙන් ආරක්ෂාව සම්බන්ධ ගැටළුවලදී ආරක්ෂක Council හෝ වෙන තැනකදී ඒ වගේ යම් යම් සාකච්ඡා කරාට අවසානයේ තීරණයක් ගන්න කොට තීරණයේ දී විරෝධතාවයක් ඒ කිසි කෙනෙක් දැක්වුයේ නැහැ.

ප්‍ර: හොඳයි ආරක්ෂාව අමතක කරමු. දැන් වෙනත් යම් කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා වන අවස්ථාල් වලදී දෙදෙනා අතර එකගතාවයක් නොමැතිව අවසන් වූ නිකන් ඒක දෙදෙනා අතර හොඳ හිත නොතිබුණු බවක් ඔබ නිරීක්ෂණය කරා ද?

උ: එවැනි අවස්ථා යම් කිසි ප්‍රමාණයකට තිබුණා. එහෙම අවස්ථා තිබුණා. එසේ ස්වාමීනි.

ප්‍ර: එවැනි අවස්ථාවකදී ආරක්ෂාව පිළිබඳව දෙදෙනා අතර එකගතාවයක් ඇති නොවූ මොහොතවල් ඔබට මතක ද?

උ: ආරක්ෂාවට සම්බන්ධ ගැටළුවකදී නම් මට සමහරක් වෙලාවට මට බාහිරව අවස්ථා තියෙන්න ඇති. එහෙම මට දැනගන්නම් එහෙම හැකියාවක් තිබුණේ නැහැ.

ප්‍ර: දැන් අබේකෝන් මහත්මයා ඔබ කිව්වා මුල් අවස්ථාවල් වලදී සතිපතා ආරක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්වුණා. ටික දවසක් යන කොට මාස්

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පතා පැවැත්වුණා. තව ටික දවසක් යන කොට ඕක මාස්පතාත් පැවතුණේ නැහැ නේද?

උ: ස්වාමීනි මම ඉන්න අවස්ථාවේ නම් සාමාන්‍යයෙන් ආරක්ෂක Council රැස්වීමේ දී ඇත්ත වශයෙන්ම හිටපු ආරක්ෂක ලේකම්වරු ඊළඟට මමත් ජනාධිපතිතුමාට මතක් කරනවා සර් රැස්වීම security Council එක තියන්න ඕන කියලා. ඒ අවස්ථාවට සෑම අවස්ථාවේදීම ආරක්ෂක ලේකම්වරයටත් මටත් සමහර වෙලාවට බුද්ධි අංශ ප්‍රධානීන් කතා කරලා කියන කොට රටේ යම් කිසි ප්‍රශ්නයක් ආවොත් එහෙම අපිට හැකියාව ලැබුණා මාසයක් ඇතුළත කොහොම හරි ජනාධිපතිවරයාගෙන් දිනයක් ගන්න. ඉතිං ඒක නිසා මාසයක් ඇතුළත තිබුණා කියලා තමයි මට මතක. සාමාන්‍යයෙන් දින වකවානු එහෙම වෙන්න පුළුවන්. බොහෝ දුරට මාසයක් වගේ ඇතුළත අපි 2017 ජූලි 30 වන කොට මාසයක් ඇතුළත රැස්වීමක් තියාගන්න අපිට පුළුවන් වුණා. මගේ මතකයේ හැටියට.

ප්‍ර: නමුත් නිශ්චිත වශයෙන්ම මාසෙකට පාරක් අහවල් දවසේ රැස්වීම තියෙනව කියලා පැවැත්තුවේ නැහැ නේද?

උ: නැහැ නැහැ. උදාහරණයක් වශයෙන් කියන්නේ දැන් මුලින්ම නම් අපි තීරණය කරා ආරක්ෂක Council හි දී ඊළඟ රැස්වීම් පවත්වන්නේ අහවල් දවස තීරණය කරා. ඒක ඊට පස්සේ නැති වුණා. ඊට පස්සේ පසුව තමයි ජනාධිපතිවරයගෙන් දිනයක් අරන් වෙලාවක් අරගෙන දැම්මේ.

ප්‍ර: දැන් ඔබ විශ්‍රාම ගිය නිලධාරියෙක් නිවසට වී බොහෝම විවේකව ඉන්නවා. දැන් ඔබ මේ අපේ කොමිෂමට ඇවිල්ලා මේ කොමිෂමේ දී ඔබ දිවුරලා සාක්ෂි දෙන්නේ. අබේකෝන් මහත්මයා අපිට කියන්න ඒ සමහර අවස්ථාල් වලදී ආරක්ෂක මණ්ඩල රැස්වීම් නොතියන්න ඒ කාලේ හිටපු ගරු ජනාධිපතිතුමා එහෙම ක්‍රියාකළේ මොකද ඔබ දැකපු විදියට ඔබට හිතිච්ච විදියට ?

උ: මං හිතන විදියට ජනාධිපතිවරයාට හිතෙන්න ඇති අපි දැන් කියන කොට වුණත් දැන් ඉතිං රටේ ප්‍රශ්නයක් නැහැනේ. ඒක නිසා මේ අපි ටිකක් කල්දාලා තිබ්බට කමක් නැහැ කියලා . ඒක වෙන්න ඕන හේතුව.

ප්‍ර: අබේකෝන් මහත්මයා ප්‍රසිද්ධ රහසක් නේද ගරු ජනාධිපතිතුමා සහ ගරු අගමැතිතුමා අතර ඒ කාලේ යම් යම් විරසක තිබුණ කියන එක?

උ: ස්වාමීනි මෙහෙමයි මම ඉන්නකන් ඔය ගැටළුව මං හිතන්නේ 2017 ජූනි වෙන කොට ඒ බරපතල ආකාරයේ ඇත්ත වශයෙන්ම දෙපාර්ශවය අතර මුල ඉඳන්ම ගැටුම් තිබ්බා තමයි. නමුත් ඔය ගැටළු කරලියට එන මට්ටමක තිබුණේ නැහැ. නමුත් ඇතුලේ ඉතිං ඔය පත් කිරීම් පිළිබඳව නොයෙක් නොයෙක් ගැටළු තිබුණා. නමුත් ඒවා මං ඉන්න කාලේ තුළ වෙනකන්ම යම්කිසි මට්ටමකින්ම මං හිතන විදියට විශාල වශයෙන් තිබුණේ නැහැ පොඩි සුළු සුළු අවුල් තමයි තිබුණේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබ කිව්වනේ යම් යම් පත්වීම් සම්බන්ධයෙනුත් විවිධ අවස්ථාවලදී ගැටළු තිබුණා කියලා?

උ: එසේ ස්වාමීනි.

ප්‍ර: ඔබ නිරීක්ෂණය කරපු ආකාරයට එවැනි ගැටළු ඇති වෙන්න හේතුව වුණේ මොකද්ද?

උ: මේක ඉතිං දේශපාලන මතය දෙපාර්ශවයක වෙන්න පුළුවන් ඉතිං.

ප්‍ර: පුළුවන් ?

උ: ඔව්.

ප්‍ර: ඔබ ඒ බව නිරීක්ෂණය කරාද?

උ: එසේ.

ප්‍ර: මං ඔබෙන් තව ප්‍රශ්නයක් අහන්නම් දැන් ගරු අගමැතිතුමා ලංකාවේ නැති අවස්ථාවල් වලදී ආරක්ෂක මණ්ඩල රැස්වීම් තියන්න බොහෝම උනන්දුවක් තිබුණ ද?

උ: එහෙම විශේෂයෙන්ම ඒ මට්ටමට ඒ ගැටළුව දැන් අපි කවුරුත් දන්නවා ස්වාමීනි රටේ අවසානයේ දී දෙගොල්ලෝ අතර ලොකු ගැටළුවක් තිබුණා. නමුත් 2017 ජුනි 30 වෙන කොට ඒ ගැටළුව උඩ දුවලා තිබුණේ නැහැ. ඒ මට්ටමට. ඒ තරම් security Council එකක් වුණත් අගමැතිවරයා නැති අවස්ථාවක තියමු කියන මට්ටමක වැටිලා තිබුණේ නැහැ. ඉතිං ඒකට ඇත්ත වශයෙන්ම දැන් ඒකට සම්බන්ධ පුළුවන් හිටපු ආරක්ෂක ලේකම්වරයා නැත්නම් මම හරි කොහොම හරි රටේ සමහර වෙලාවට අපි එකතුවෙලා හරි මේක මාසයකට සැරයක්වත් පවත්වගෙන යමු කියන මතයේ අපි හිටපු හින්දා වෙන්න පුළුවන්. කොහොම හරි ඒක ඒ මට්ටමට දෙගොල්ලෝ අතර ආරක්ෂාව සම්බන්ධයෙන් ලොකු ගැටළුවක් තිබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් ආරක්ෂක ඇමති හැටියට ඔබේ කාලයේ හිටියේ ගරු ජනාධිපතිවරයානේ?

උ: එසේය.

ප්‍ර: එතකොට ඔබට මතක විදියට ගරු ජනාධිපතිවරයා ජාතියේ ආරක්ෂාව ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සම්බන්ධයෙන් උනන්දුවෙන් කටයුතු කළ බවක් ඔබට වැටහුණා ද?

උ: දැන් මම කියන්නේ මුල් අවස්ථාවේ දී ආරක්ෂක Council වල ඒ රැස්වීම වලදී ඒ තියෙන දේවල් සියළු දේවල්ම උනන්දුවෙන් සහභාගි වුණා. ඉතිං ඊට එහා සමහර වෙලාවට ආරක්ෂාව සම්බන්ධයෙන් නම් ප්‍රශ්නකාරී බවක් නම් මගේ කාලය තුළ මට තේරුම්ගන්න බැරි වුණා.

ප්‍ර: තේරුම් ගන්න බැරිවුණා. ඒ හේතුව මොකද?

උ: ඒ කියන්නේ ජනාධිපතිවරයා ඒ වාගේ ඒ කියන්නේ ගැටළුකාරී තත්ත්වයක් ආවොත් එහෙම ආරක්ෂාව මං කියන්නේ ඒ ආරක්ෂාව පිළිබඳව පැත්තක දාලා වැඩකළ බවක් මට පෙනුනේ නැහැ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඔබට මතක විදියට අබේකෝන් මහත්මයා මේ ආරක්ෂක ලේකම්වරයා නිතර ජනාධිපති කාර්යාලයට ආවද ජනාධිපතිතුමාව හම්බ වෙන්න?

උ: ඇත්ත වශයෙන්ම අපේ බස්නායක මහත්මයාට වැඩිය ප්‍රශ්න තිබ්බේ අපේ කරුණාසේන හෙට්ටිආරච්චි මහත්මයා එන හෙට මං කියන්නේ ඒ කාලේ. එතකොට ඒ දෙන්න අතරේ මං හිතන්නේ සමීප දෙන්නෙක්. එක ගමේ ඉන්න දෙන්නෙක් හින්දා ඒ වගේ නිතරම ඇවිල්ලා ඉවර වෙලා නොයෙක් අවස්ථා වල හම්බුවෙලා මං දැකලා තියෙනවා. ඒ හින්දා එහෙම ගැටළුක් තිබුණේ නැහැ. සමහර විට ඒකටත් හේතුවක් වෙන්නත් පුළුවන් ඔය සාමාන්‍යයෙන් හොඳ සම්බන්ධතාවයක් තියෙන්න.

ප්‍ර: දැන් එතකොට ඔබට මතක ද CNI director , SIS director සහ ආරක්ෂක ලේකම් මේ තිදෙනා අතුරින් වැඩියෙන්ම ජනාධිපතිතුමාව මුණගැහෙන්න වැඩියෙන්ම ආවේ කවුද?

උ: ඒක නම් ඉතිං මට එක එල්ලේම කියන්න බැහැ. මොකක් හරි ගැටළුවක් තිබුණු වෙලාවට මේ කවුද අපේ director SIS එයා තමයි සාමාන්‍යයෙන් වැඩියෙන්ම එන්නේ. මොකද එයාට තමයි වැඩිපුර තොරතුරු ඇවිල්ලා එයා සමහර වෙලාවට ජනාධිපතිවරයාට කරුණු ඉදිරිපත් කරන්න බැරි වුණොත් එහෙම මට හරි සටහනක් එවනවා මේක ඉදිරිපත් කරන්න කියලා. ඒ වගේ තමයි කරුණු ඉදිරිපත් කළේ.

ප්‍ර: දැන් ඔබ මගේ ප්‍රශ්නයට උත්තර දුන්නා. කියන්නේ SIS Director තමයි වැඩියෙන්ම ආවේ කියලා?

උ: එසේය.

ප්‍ර: දැන් මගේ ඊළඟ ප්‍රශ්නය මේ තුන්දෙනා අතරින් අඩුවෙන්ම ජනාධිපතිතුමා හම්බවෙන්න ආවේ කවුද?

උ: මං හිතන්නේ සිසිර මෙන්ඩිස්.

ප්‍ර: CNI director?

උ: ඔව්.

ප්‍ර: දැන් මගේ අවසන් ප්‍රශ්නය අබේකෝන් මහත්මයා. මේ ඔබ ජනාධිපති ලේකම් වශයෙන් ඒ සේවය කරන ලද කෙටි කාලයේ දී ආගමික සහජීවනය සම්බන්ධයෙන් හුඟක් හැමෝම උනන්දුවක් දැක්වුවා කිව්වොත් ඒක හරි නේද?

උ: එසේය.

ප්‍ර: එතකොට ඒ ආගමික සහජීවනය මත යම් යම් තීරණ ගැනීම පස්සට තල්ලු වෙලා ගිය බවක් ඔබට හැඟුණ ද? අවංකව උත්තරයක් දෙන්නකෝ බලන්න.

උ: ඇත්ත වශයෙන්ම දැන් ඔය කියන්නේ බුර්කාව. බුර්කාව වගේ සමහර අවස්ථාවලදී නිලධාරින් විදියට අපිට තේරුණා මේකට තීරණයක් ගත්ත

FAIR COMMENT BY JEZEEM

නම් හොඳයි කියලා. නමුත් දේශපාලන වශයෙන් ඒ තීරණය ගන්න දේශපාලන අධිකාරීයේ කවුරුත් කැමති වුණේ නැහැ.

ප්‍ර: ඒ කියන්නේ යම් යම් අවස්ථාවල් වල තීරණ ගැනීමට මේ ආගමික සංහිදියාව බාධාවක් බව පෙනුණ නේ?

උ: එසේය.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු ජනාධිපතිතුමා විදේශගත වෙලා ඉන්න අවස්ථාවලදී ආරක්ෂක ඇමතිවරයෙක් පත් කරල ද යන්නේ වැඩ බැලීම සඳහා?

උ: ඔව්.

ප්‍ර: තමාගේ කාලය තුළ?

උ: මගේ කාලය තුළ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යයවරයා පත් කර තමයි ගියේ.

ප්‍ර: ජනාධිපතිවරයා විදේශගත වෙන අවස්ථාවේ දී හදිසි ආරක්ෂක තත්ත්වයන් පිළිබඳ තොරතුරු ජනාධිපතිවරයාට දන්වන්නේ කෙසේද?

උ: ජනාධිපතිවරයාගේ සාමාන්‍යයෙන් PSD director යනවා. කවුද මේ ඒ කාලේ හිටියා DIG වික්‍රමසිංහ හෝ එයාගේ personal Assistant යනවා ප්‍රියන්ත මං හිතේ ඒගොල්ලොන් හරහා ඕනම අවස්ථාවක සම්බන්ධ කරගැනිමට හැකියාවක් තිබුණා.

ප්‍ර: එතකොට බුද්ධි අංශ ප්‍රධානියාට සහ ආරක්ෂක ලේකම්වරයාට ජනාධිපතිවරයා විදේශගතව සිටින අවස්ථාවේ දී සෘජුව සම්බන්ධ කර ගන්න පුළුවන් ද?

උ: හැකියාව තිබුණා.

ප්‍ර: එසේ සම්බන්ධ කරගත්ත අවස්ථා තියෙනව ද?

උ: ඒ තරම් මං හිටපු කාලය තුළ සාමාන්‍යය තොරතුරු තමයි කතා වෙන්නේ. මට හැකියාව තිබුණා නමුත් මම දන්නවා ඒගොල්ලොත් ඒ තොරතුරු දීලා තිබුණා. මං දන්නේ නැහැ සාකච්ඡා කරාද සම්බන්ධ කර ගත්ත ද මං දන්නේ නැහැ. මම ආරක්ෂාවට සම්බන්ධව ප්‍රශ්න නෙවෙයි. වෙන සාමාන්‍ය දේවලදී මට ඕනම අවස්ථාවක ජනාධිපතිතුමා සම්බන්ධ කරගන්න හැකියාව තිබුණා.

ප්‍ර: ඒ කියන්නේ තමන් කියන්න කලින් ජනාධිපතිවරයා දැනගෙන තියෙනවා සමහර කරුණු බුද්ධි ප්‍රධානීන්ගෙන්?

උ: නැහැ නැහැ මම කියන්නේ මං ආරක්ෂාව සම්බන්ධව ප්‍රශ්න නෙවෙයි. සාමාන්‍යය කරුණු වලදී මං සම්බන්ධ කරගත්තේ. ඇත්ත වශයෙන්ම ඔය කාලය තුළ ඒ වගේ ලංකාවේ security බිදවැටීම් කිසිදෙයක් වුණේ නැහැ හදිසියෙන් කියන්න තරම් මං හිටපු කාලය තුළ. මම කියන්නේ සාමාන්‍යය තොරතුරක් වුණත් සාමාන්‍යයෙන් අපි කිව්වේ වෙන

FAIR COMMENT BY JEZEEM

ඇමතිවරයෙක්ගේ ප්‍රශ්නයක් වුණත් ඕන දෙයක් ජනාධිපතිවරයාට කියලා කතා කරලා ඕනම අවස්ථාවක කතා කරන්න හැකියාව තිබුණා මට.

ප්‍ර: රාජ්‍ය බුද්ධි ප්‍රධානී සහ ආරක්ෂක ලේකම්වරයා පත් කිරීමේ දී අනුගමනය කරන්නේ කුමන ක්‍රමවේදයක් ද?

උ: බුද්ධි ප්‍රධානියා කියන්නේ SIS director.

ප්‍ර: ඔව් පත් කරන්නේ කොහොම ද?

උ: ස්වාමීනි එයා ඇත්ත වශයෙන්ම අපි එන කොටම පත්කරා එතැන හිටපු ජ්‍යෙෂ්ඨම නිලධාරියා විදියට පත් කරන්න පත් කිරීම් පදනම මම දන්නේ නැහැ. නමුත් නිලන්ත ජයවර්ධන තමයි මුලින්ම පත් කළේ. මම ඇත්ත වශයෙන්ම ඒ පිළිබඳ මට අවබෝධයක් නැහැ.

ප්‍ර: ඒ පත්කිරීම කරන්නේ ජනාධිපතිවරයාගේ නිර්දේශ අනුව ද?

උ: මම ඉන්න කාලය තුළ පත්කිරීමක් කළේ නැහැ . ඒක හින්දා මට ඒක කියන්න අපහසුයි ස්වාමීනි.

ප්‍ර: තමාගේ සේවා කාලයේ දී අන්තවාදී කල්ලි පිළිබඳව යම් යම් ආගමික කොට්ඨාශ විසින් තමන්ලට ජනාධිපති ලේකම්වරයාට කරුණු ඉදිරිපත් කරලා තිබෙනව ද ජනාධිපතිවරයා දැනුවත් කිරීම සඳහා?

උ: නැහැ එහෙම සිද්ධියක් ජනාධිපති ලේකම් වශයෙන් මට ආවේ නැහැ. එහෙම තොරතුරක් මට ඉදිරිපත් කළේ නැහැ. හැබැයි මට SIS director සමඟර අවස්ථාවලදී ජනාධිපතිවරයාට යොමු කරන්න කියලා අර මොකද්ද සිරියාවේ කරුණු ගිය පිළිබඳව වාර්තා මටත් ඉදිරිපත් කරා මම ඒක ජනාධිපතිතුමාට සාකච්ඡා කරලා භාරදුන්නා.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා.</u>

ප්‍ර: අබේකෝන් මහත්මයා මේ බුර්කාව රටේ ආරක්ෂාවට තර්ජනයක් කියලා මුලින්ම 2017 වර්ෂයේ දී ආරංචි වුණේ මොන කරුණක් පදනම් කරගෙනද?

උ: නැහැ මේ සම්බන්ධය ආවේ දැන් අර සිරියාවට ශ්‍රී ලාංකික මුස්ලිම් කණ්ඩායම ගිහින් සහභාගී වන කොට බුර්කාව ඇඳගෙන ආවොත් එහෙම අපිට පිරිමියෙක් ද ගැහැණියක් ද කියන එක මං හිතන්නේ ස්වාමීනි ඔබතුමාලත් ඉස්සෙල්ලා කිව්වා ඒ වගේ අවස්ථාවක ආවොත් මොකද්ද කරන්නේ කියලා මේකට මොකද්ද ගත යුතු පියවර කියලා ඒ අනුව තමයි ඕක පැන නැග්ගේ.

ප්‍ර: ඒ කාලේදී ත්‍රස්තවාදී තර්ජනයක් පිළිබඳ යන්නන් හරි ඉවක් තිබ්බ ද? ඒ කියන්නේ මුස්ලිම් අන්තවාදය පිළිබඳ?

උ: මුස්ලිම් අන්තවාදයෙන් ලංකාවට ගැටළුවක් තියෙනව ද කියලා තොරතුරක් තිබුණේ නැහැ. නමුත් අර සිරියාවට ගිය නිසා ලංකාවේ

FAIR COMMENT BY JEZEEM

කොටස් මේ අන්තවාදයට යොමුවෙයි කියලා ඉවරවෙලා ආරක්ෂක විධිවිධාන හැදිය යුතුයි කියලා තමයි සාකච්ඡා වුණේ.

****

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: අබේකෝන් මහත්මයා ඔබ මෙම කොමිෂම හමුවේ ක්‍රියා සිටියා ආගමික සංහිඳියාව කියන පරමාර්ථය හෝ එම අදහස හේතු කොටගෙන තමයි ගොඩක් අවස්ථාවලදී ජාතික ආරක්ෂක Council දී යම් යම් කරුණු කාරණා පිළිබඳව තීරණ ගැනීමේ දී හේතුපාදක වුණේ කියලා?

උ: හැබැයි ස්වාමීනි ඒක ගොඩක් අවස්ථාවලදී නෙවෙයි සමහර අවස්ථාවලදී.

ප්‍ර: ඔබට මෙම කොමිෂමට පැහැදිලි කරන්නට පුළුවන් ද ඔය ආගමික සංහිඳියාව කියන එකෙන් අදහස් කළේ මොකද්ද කියලා එම වකවානුවේ දී ?

උ: ආගම් අතර ගැටළු සමනය පත්කරලා තවත් ආයි සැරයක් ආගම් අතර ගැටළුවක් ඇති වුණොත් එහෙම ඒක තවත් අපේ අර යුද්ධයක් දක්වා පරිවර්තනය වෙන්න පුළුවන්. ඒ නිසා ආගමික කොටස් අතර ආගම කියන එක සාමාන්‍යයෙන් හුහාක් දුරට ඉක්මනටම ගිනි ගන්න දෙයක් ඒ නිසා ආගම ඉස්සරහාට දාගෙන ආවොත් එහෙම අපිට ඒක පාලනය කරන්න බැරි වෙන අවස්ථාව දක්වා පත්වෙයි කියලා ඒ වගේ මතයක් තිබුණා.

ප්‍ර: විශේෂයෙන්ම අබේකෝන් මහත්මයා ඔය මැතිවරණයට පෙර පැවති බොදු බල සේනා සංවිධානය සහ ඉස්ලාම් ආගමිකයන් අතර තිබ්ච්ච මතවාදය ද එහෙම නැත්නම් සියළුම ආගම් අතර මතවාදයන් ද සාකච්ඡාවට භාජනය වුණේ?

උ: ඇත්ත වශයෙන්ම ආරක්ෂක මණ්ඩලයේ ඒ වගේ බරපතල දෙයක් සාකච්ඡා වුණේ නැහැ. මං ඉන්න කාලේ තුළ දී නම්. කතා වුණේ දැන් අපි ඔය මුස්ලිම් කොටස් මද්‍රසා පාසල් බුර්කාව දැන් මේවා එකපාරම තහනම් කරොත් එහෙම ඊට පස්සේ මුස්ලිම් කණ්ඩායම් මේක වෙනවා ඊළඟට තවත් ගැටුම් දැනට ලොකු ගැටුමක් නැතිව තවත් ගැටුමක් ඇති කරන්න මේක අවධානය යොමු වෙන්න ඕනේ නැහැ. ඒක නිසා මේ පිළිබඳව ප්‍රවේශමෙන් ඉඳලා ඉවර වෙලා ප්‍රශ්නයක් ආවොත් එහෙම අපි ඒ පිළිබඳ තවදුරටත් කටයුතු කරමු කියන මතයේ තමයි ඒ කාලේ හිටියේ.

ප්‍ර: ඔබතුමාගෙන් මම ඇහුවොත් 2015 මැතිවරණය අවස්ථාවේ දී එම බලයට පත් වූ රජයට විශාල වශයෙන් මුස්ලිම් ජනතාවගේ නියෝජිතයන්ගේ සහභාගීත්වය ලැබීම සහ ඔවුන් සමඟ සංහිඳියාවෙන් මෙම රාජ්‍ය පාලනය ගෙන යාමේ වැදගත්කම සලකා ආගමික සංහිඳියාව කියන එක ගැන වැඩියෙන් කතා කරාද?

FAIR COMMENT BY JEZEEM

උ: ඒක ඉතිං ඇත්ත වශයෙන්ම දේශපාලන ප්‍රශ්නයක්. දේශපාලන වශයෙන් එහෙම මතයක ඉන්න ඇති. නමුත් අපිට රාජ්‍ය පරිපාලනයේ දී නම් ඒ වගේ දේවල් වලට අපට සාමාන්‍යයෙන් අදාළ කාරණයක් වුණේ නැහැ ඒක.

ප්‍ර: තවත් එබඳු සිදුවීමක් නිසා මේ ජාතික ආරක්ෂාව හෝ මහජන ආරක්ෂාව කියන එකට දිය යුතු වැඩිම වැදගත්කමක් දීම ගිලිහි ගියා වගේ?

උ: ඒක වෙන්න පුළුවන්.මං එකඟ වෙනවා ස්වාමීනි.

ප්‍ර: අබේකෝන් මහත්මයා ඔබ ප්‍රකාශ කළා ජාතික බුද්ධි ප්‍රධානී නිලන්ත ජයවර්ධන මහතා ඔබ ජාතික ආරක්ෂක Council යේ රැස්වීම් වලට සහභාගි වන අවස්ථාවලදී IS සංවිධානයට බැඳී යුධ කිරීම සඳහා ශ්‍රී ලංකාවේ තරුණ මුස්ලිම්වරුන් ගිය බවට. ඒ අවස්ථාවේ දී නිලන්ත ජයවර්ධන මහතා විශේෂ ඉදිරිපත් කිරීමක් කරලා මේ IS සංවිධානයේ තියෙන භයානකකම සහ IS සංවිධානය ජාත්‍යන්තරව ක්‍රියාත්මක වන ආකාරය විශේෂයෙන්ම ආසියාවේ රටවල් වලත් විශේෂයෙන්ම ශ්‍රී ලංකාවට මේ සංවිධානයෙන් දැන් පිටරටත් යනව නම් ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් ලංකාව තුළත් ක්‍රියාත්මක වන මුස්ලිම් තරුණ පිරිස් ඉන්න පුළුවන් ඒක නිසා මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුයි කියලා ඔහු කරුණු ඉදිරිපත් කළේ නැද්ද?

උ: එක ඇත්ත වශයෙන්ම සියළුම ආරක්ෂක අංශ වලින් දැනුවත් කරා මේ පිළිබඳව දැඩි කටයුතු කළ යුතුයි කියලා. ඊටත් වැඩිය එතැනදී වැඩිම සාකච්ඡා වුණේ සිරියාවට ගිය කොටස් අන්තර්ජාලය හරහා ලංකාවේ මුස්ලිම් කණ්ඩායම් වල තරුණ කණ්ඩායම්වල අවධානය යොමු කරන්න පුළුවන්. අනිත් එක ඒක සම්ප්‍රදායික මුස්ලිම්වරුන්ට මේකෙන් හිරිහැරයක් වෙන්න පුළුවන්. අනිකුත් ආගම් අතර ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. ඒක නිසා මේ පිළිබඳව අවධානයක් යොමු කළ යුතුයි කියන මතයේ තමයි හිටියේ.

ප්‍ර: ඒ අවස්ථාවේ දී දැන් බිම් මට්ටමින් අබේකෝන් මහත්මයා මේ ක්‍රියාත්මක වීමේ බලය මේ හදිසි නීතියක් නැතිව අත්අඩංගුවට ගැනීම් නිවාස පරීක්ෂා කිරීම් සියළුම බලතල තියෙන්නේ ශ්‍රී ලංකා පොලීසියටනේ?

උ: එසේය.

ප්‍ර: අතිගරු ජනාධිපතිතුමා පොලිස්පතිතුමාට උපදෙස් නියෝග ලබා දුන්නා ද ඔහුගේ දෙපාර්තමේන්තුව විසින් කළ යුත්තේ මොන වැනි දේවල් ද මේ සම්බන්ධයෙන් කියලා හෝ එතැන සිටි වෙනත් ආරක්ෂක ප්‍රධානීන්?

උ: මං හිතන විදියට 2017 මුල 2016 අග තමයි ඔය තනු අපි සාකච්ඡාවේ දී security Council එකේ දී කතා කළේ. එතැනදී ඒ තරම් දුරට තියුණු බවක් වාර්තා වුණේ නැහැ. සිරියාවට ගිහිල්ලා තියෙනවා සිරියාවේ

FAIR COMMENT BY JEZEEM

කට්ටිය ලංකාවේ තරුණයන් පොළඹවා ගන්න පුළුවන් ඒ නිසා මේ පිළිබඳව අවධානයෙන් සිටිය යුතුයි කියලා තමයි සාමාන්‍යනේ ඔය බුද්ධි තොරතුරු වලිනුත් ඉදිරිපත් කළේ. ඒ නිසා ඒ වගේ පොලීසියෙන් ඇත්ත වශයෙන් සාමාන්‍යයෙන් පොලිසියට සාමාන්‍යයෙන් ඒ කාලයේ තිබ්බ පොලීසියට යමක් අත්අඩංගුවට ගැනීම් ඒ වගේ දේවල් කරන්න හැකියාව තියෙනවා කියලා මතේ තමයි security Council එකේදී කතා වුණේ.

ප්‍ර: මෙම රැස්වීම් වලදී කිසියම් අවස්ථාවක යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක මණ්ඩලයේ ප්‍රධානියා ඔබට නමක් සඳහන් කරා එම අවස්ථාවේ දි සිටියේ චුලා කොඩිතුවක්කු කියන මහත්මයා. එතුමා ඉදිරිපත් කරා ද IS සංවිධානයට සම්බන්ධව එම IS මතවාදයේ යමින් සිටින ශ්‍රී ලාංකික ඉස්ලාම් තරුණ පිරිසක් ලංකාවේ ක්‍රියාත්මක වීමක් ආරම්භ වෙලා තියෙනව කියලා?

උ: මගේ කාලේ නම් මට මතක නැහැ එහෙම වාර්තා වුණා කියලා. එකම දේ තිබුණේ මේ අන්තර්ජාලය හරහා ලංකාවේ ගොඩක් තරුණයන් එක එක ගම් වලින් කණ්ඩායම් ගිහිල්ලා හිටියා. ඒ ගිය ගම් සහ ගිය පුද්ගලයෝ නම් පවා ඉදිරිපත් කරා. ඒක නිසා තවත් කට්ටිය මේකට මේ රැඩිකල් අදහස් වලට එකඟ වෙන්න පුළුවන්. ඒ අනුව රැඩිකල්වාදය අනෙකුත් මුස්ලිම් කොටස් වලටත් යන්න පුළුවන් කියලා තමයි මෙතැනින් කිව්වේ. සිද්ධියක් කියලා මේ වගේ දෙයක් මේ වගේ කරුණක් ඉදිරිපත් කලා කියලා මට මතක නැහැ. මං හිතන විදියට මම ඒක මට මතක නැහැ එහෙම දෙයක්.

ප්‍ර: මෙම ආරක්ෂක Council රැස්වීමේ දී නැගෙනහිර පළාතේ ඉස්ලාම් අන්තවාදී ක්‍රියාකාරකම් විශේෂයෙන්ම මේ 2019 අප්‍රේල් 21 ප්‍රහාරයන් මෙහෙයවපු සහරාන් හෂීම් කියන පුද්ගලයා පිළිබඳව තොරතුරු වාර්තා වුණා ද ඔබ එම රැස්වීමට සහභාගි වෙන අවස්ථා වලදී?

උ: ඇත්ත වශයෙන්ම මට ඒ නම් ප්‍රකාශ වුණා. මේ එක එක කණ්ඩායම් වල නම් ප්‍රකාශ වුණා. ඉතිං දැන් අපි ඔළුවේ තියාගන්නේ නැති නිසා සහරාන් හෂීමිගේ නමත් සාකච්ඡා වුණා ද දන්නේ නැහැ. නමුත් ඒ මුස්ලිම් නම් සාකච්ඡා කරලා මේවා මෙහෙන් ගිහින් ඉන්නවා කියලා නම් ප්‍රදේශ සමහරු ගලේවෙල වෙන්න පුළුවන්. මුස්ලිම් area එක අකුරණ හරි නැගෙනහිර පළාතෙන් හරි ගියා කියලා මේ කරුණු කිව්වා. නමුත් කිව්වා. මේ කට්ටිය තමයි ගිහින් ඉන්නේ කියලා. සහරාන් හෂීමිගේ නම කියවුණා කියලා සමාවෙන්න මට ඒ ගැන මතකයක් නම් නැහැ.

ප්‍ර: ඔබතුමාට මතකයිද ආමී මොහිදීන් පොලිස් ෆායිස් කියන පුද්ගලයන්ගේ නම් කියවුණා ද කියලා?

උ: මට මතකයක් නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබට කියන්නට පුළුවන් ද මෙම නැගෙනහිර පළාතේ සිදු වෙච්ච මෙම සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සහ ඔය ජාතික තවුහිද් ජමාත් කියන අන්තවාදී මුස්ලිම් කණ්ඩායම් දෙක අතර ගැටුම් ඇති වුණාම මං හිතන්නේ ඔබ ජනාධිපතිතුමාගේ ලේකම්ව සිටින කාලේ 2017 මාර්තු 10 වැනිදාත් ලොකු කලබලයක් ඇති වෙලා. ඒ අවස්ථාවේ දී එහි සිටින සූෆි මුස්ලිම් කණ්ඩායමක් අතිගරු ජනාධිපතිතුමාටත් ඔවුන්ගේ දුක්ගැනවිල්ල ඉදිරිපත් කරපු බවට මෙම කොමිෂමට කරුණු ඉදිරිපත් වුණා. ඔබට මතකයක් තියෙනව ද එහෙම කණ්ඩායමක් ඇවිල්ලා ඔවුන්ගේ කරුණු කාරණා ඉදිරිපත් කරපු බව?

උ: ඇත්ත වශයෙන්ම මම නොහිටි අවස්ථාවක ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් security Council හරි මං දැනුවත්ව ඔය විශේෂ සිද්ධියක් මට මතක නැහැ.

ප්‍ර: මෙම කොමසාරිස්තුමා අහපු ප්‍රශ්නයකටම සම්බන්ධයි මං අහන්න යන මගේ අවසාන ප්‍රශ්නය ශ්‍රී ලංකා සමස්ථ ලංකා ජමතුල් උලමාවරුන්ගේ සංවිධානය කියලා තියෙනවා ඒක හඳුන්වනවා ඉස්ලාම් ආගමික විද්වතුන්ගේ සංසදය කියලා. එම සංවිධානය කිසියම් හෝ අවස්ථාවකදී ඔබ ලේකම්වරයා ලෙස කටයුතු කරන අවස්ථා වලදී අතිගරු ජනාධිපතිතුමා හෝ ඔබ හමු වී මේ මුස්ලිම් ජනතාවගේ පිළිබඳව හෝ ඔවුන්ගේ ආගමික මතවාදයන් පිළිබඳව රට තුළ තියෙන අදහස් හෝ වේවා වැරදි අදහස් හෝ එවැනි දේවල් පිළිබඳව සාකච්ඡා කිරීමට ජනාධිපති ලේකම් කාර්යාලයට පැමිණියාද?

උ: සාමාන්‍යයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේ රැස්වීම් තියන්න පුළුවන් මං නොදැනුවත්ව. සාමාන්‍යයෙන් ජනාධිපතිවරයා සාකච්ඡාවක් තිබ්බොත් එහෙම මං අදාළ නැත්නම් මට කතා කරන්නේ නැහැ security Council ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වගේ තමයි සහභාගි වෙලා කරන්නේ. ඉතිං ඒක මට කෙළින්ම උත්තරයක් දෙන්න බැහැ. ඉතිං සමහරක් විට වෙන්න පුළුවන්. නොවෙන්න පුළුවන්. මට දැන් සමාවෙන්න මට ඒක ගැන ලොකු අවධානයක් දැන් මට මතකයක් නැහැ.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා.</u>

ප්‍ර: අඛේකෝන් මහත්මයා සුළු ප්‍රශ්නයක් අහන්න තියෙනවා. ඔබගේ කාලයේ දී security Council meeting සාමාන්‍යයෙන් කොච්චර වෙලා විතර පවත්වනව ද?

උ: සාමාන්‍යයෙන් පැය 2, පැය එකමාරක්, පැය 2 ක වගේ පවත්වනවා. අපි සාමාන්‍යයෙන් හැමදාම වගේ දාගන්නේ හවසට. ඉතිං සමහරක් වෙලාවට රෑ 9.00 වගේ වෙනකුනුත් තියෙනවා ඉතින්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මෙතැන්දී කියවුණා ඊට වඩා අඩු කාලයක් කියලා ඒක මං ඔබතුමාගෙන් ඇහුවේ?

උ: වෙන්න පුළුවන් ස්වාමීනි. උපරිමය තමයි පැය 02 ක. සමහර අවස්ථා වලදී කෙටියෙනුත් යනවා කරුණු තිබුණේ නැත්නම්. කරුණු අනුව තමයි සාකච්ඡා වෙන්නේ. ඉතිං ඒක එහෙම සීමාවක් කරුණු පැය 02 දක්වා ගිය අවස්ථාත් තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: අබේකෝන් මහත්මයා එක ප්‍රශ්නයක් තිබෙනවා ජනාධිපති ලේකම් වශයෙන් ආරක්ෂක මණ්ඩල රැස්වීම් වලට සහභාගි වුණා අවස්ථාවලදී ඔබ කිව්වනේ මේ රාජ්‍ය බුද්ධි සේවාවේ අධ්‍යක්ෂක, බුද්ධි සේවා මණ්ඩල ඒ කියන්නේ DMI යුධ හමුදා ඒ වගේ බුද්ධි සේවා වලින් යම් කිසි presentations කරනවා කියලා?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: ඒ ඉදිරිපත් කිරීම් වලදී ඉස්මතු කරලා තිබ්බෙ නැද්ද මේ ඉස්ලාම් අන්තවාදය සහ ඒ අන්තවාදී කණ්ඩායම් වලින් ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බව?

උ: ස්වාමීනි මෙහෙමයි මේ වාගේ ඔය විශේෂයෙන්ම කරුණු මතු වුණේ සිරියාවට ගිය වාර්තා වීම් අනුව මේ පිළිබඳව ඉදිරියේ දී මේවා තර්ජනයක් වෙන්න පුළුවන් කියලා සියළුම බුද්ධි අංශ වලින් වාර්තා කරා. ඒ පිළිබඳව මුල් අවස්ථාවේ විශේෂ සිද්ධියක් වුණේ නැහැ. නමුත් මේ වගේ ඉදිරියේ දී මෙහෙම දෙයක් වෙන්න පුළුවන් කියලා කරුණු ඉදිරිපත් කරා.

ප්‍ර: ඒ කියන්නේ අනාගතයේ දී ජාතික ආරක්ෂාවට මේ ඉස්ලාම් අන්තවාදයේ සහ අන්තවාදී කණ්ඩායම් වලින් තර්ජනයක් විය හැකි බව ඒ ආරක්ෂක මණ්ඩල රැස්වීම් වලදී ඉදිරිපත් කිරීම් සිද්ධ කරා. ඔබගේ සේවා කාලය තුළදී?

උ: එසේ ස්වාමිනි.

ප්‍ර: එහෙම ඉදිරිපත් කරලා තියෙද්දීත් ඇයි ඊට පස්සේ ආරක්ෂක Council රැස්වෙන කාලසීමාව දිග් ගැහුණේ?

උ: ඒකට නම් ඇත්තටම මට හේතුවක් කියන්න බැහැ. කොහොම හරි ඔය කියන කාලය තුළ මාසයකට වගේ ඇතුළත අපි රැස්වීමක් තිබ්බා ජනාධිපතිතුමාගේ සමහර අවස්ථාවලදී කොහොම හරි වෙලාවක් ගත්තා. ඉතිං ඒකට පැවැත්වීම මගේ දැනුම Security Council එක සුමානයකට වතාවක් පැවැත්විය යුතුයි කියලා මගේ පුද්ගලික මතය. නමුත් ඒක දේශපාලන වශයෙන් ඒ මතයට එකඟ වුණේ නැහැ. ජනාධිපතිවරයා හෝ අගමැතිවරයා.

FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අතිඋතුම් මැල්කන් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසයි. අවශ්‍ය බව ප්‍රකාශ කරයි.
අවස්ථාව ලබා දෙමි.

****

<u>නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ පැවසුවා දැන් නිලන්ත ජයවර්ධන මහත්මයා SIS director ජනාධිපතිතුමා හමුවීමට මේ ආරක්ෂාව සම්බන්ධ කටයුතු වලදී බොහෝ අවස්ථාවලදී පැමිණියා කියලා. මට දැනගන්න ඕන දැන් ආරක්ෂක කවුන්සලයේ දැන් ඔවුන් ජනාධිපතිතුමාට යම්කිසි ආරක්ෂාව සමබන්ධව යම් කරුණක් ඉදිරිපත් කරාට පසුව ඔවුන් පිට වුණේ සතුටින් ද ඔවුන් ඔබට යම් කිසි කනස්සළු දැයක දෙයක් කියලා තියෙනව ද? අපි කිව්වට වැඩක් නැහැ වගේ අදහසක් ?

උ: ඇත්ත වශයෙන්ම හම්බුවෙන සියළුම අවස්ථාවලදී මං හමුවෙලා යන්නේ නැහැ. සමහර වෙලාවට මම නොදැනුවත්වම එන්න පුළුවන්. හම්බවුණ අවස්ථාවලදී එහෙම ඉතිං මේක කිව්ව කරුණක් කියලා වැඩක් නැහැ කියලා . මාත් එක්ක නම් එහෙම කියන එකකුත් නැහැ. මොකද ඒක මමත් සමහරක් වෙලාවට ජනාධිපතිතුමාට කියන හින්දා. එහෙම අවස්ථාවක නම් මාත් එක්ක ප්‍රකාශ කළේ නැහැ.

ප්‍ර: ආරක්ෂක කවුන්සලයේ දී ඔබට මතකයක් තියෙනව ද මුස්ලිම් තරුණ කොටස් අන්තවාදී දේශන පැවැත්වීම සම්බන්ධව සාකච්ඡා වුණා ද ?

උ: ඔව්. දේශනා පැවැත්වීම් කියන්නේ අර සිරියන් යුද්ධයට සහභාගී වෙලා ලංකාවේ මේ කොටස් මොකද්ද කළේ. දැන් සිරියාවට යන්න තරම් ගියත් ඊට ඉස්සෙල්ලත් මේ ගොල්ලෝ කොහොමද මේකට ගියේ. ඒක හින්දා යම් යම් ලංකාවේ මේ පිළිබඳව සාකච්ඡා වෙන්න ඇති දේශන පවත්වන්න කියලා මේ පිළිබඳව අවධානයෙන් ඉන්න ඇති කියලා ඉල්ලීම කරා.

ප්‍ර: පවත්වන්න ඇති කියලද පැවැත්වුවා කියලා සාක්ෂි සාධක සටහන්?

උ: සාක්ෂි සාධක සහිතව මං හිතන විදියට මං ඉන්න කාලේ ඉදිරිපත් වුණේ නැහැ. ඒක ඒ කාලේ මාධ්‍යයකවත් තිබුණේ නෑ මං හිතන විදියට මං ඉන්නවත්ම ඒකෙන් සාක්ෂි තිබ්බා කියලා නමුත් ඒක මෙහෙම දෙයක් වෙන්න පුළුවන් මේ නිසා අවධානයෙන් සිටිය යුතුයි කියල තමයි සාකච්ඡා කළෙත් ඉදිරිපත් කළෙත්.

ප්‍ර: එතකොට ඔබ දැන් මේ ගරු කොමිෂන් සභාවට පවසා සිටි පරිදි ඒ පිළිබඳව නිශ්චිත තීරණයක් ගන්න වගකිව යුතු අය පැකිලීමක් තිබිලා තියෙනවා මේ ආගමික සංහිදියාව කියන සංකල්පය නිසා. එතකොට

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ඔබට පෞද්ගලිකව හැගෙන පරිදි දැන් මේ ආරක්ෂක කවුන්සලයේ රැස්වීමේ දී ඔවුන් බලාපොරොත්තු වන්නේ මේ නිසි බලධාරීන්ට ඒ ගැන දැනුවත් වීමක් ලබා දීලා නිසි පරිදි එයාලට ක්‍රියාත්මක වන්න නියෝග ලබා ගැනීමක් සඳහානේ. එතකොට දැන් එවැනි නියෝගයක් ලබාදීමක් සිදුවෙලා නැති නිසා ඔවුන් අතරත් යම්කිසි පසුබැස්මක් තිබුණ ද කියලා ඔබට දැනගන්න තිබුණ ද පසුකාලීනව ඔවුන් ඒ පිළිබඳව දැනුම්දීමක් මේ කාර්ය පටිපාටියේ පසුබැස්මක් තිබුණ ද?

උ: ඇත්ත වශයෙන්ම ඒකට මම හිතන විදියට ස්වාමීනි මම උත්තරයක් මොන ආකාරයෙන් දියයුතුද කියන්න බැහැ. මම මට අදහස් වන විදියට නම් ඒ වගේ කරුණු කිව්වා ඒ කරුණු සාකච්ඡා කරලා ඒ කරුණු වලට අදාළව සොයා ඇත්ත වශයෙන්ම Security Council එකේදී කිසිම සහ සාමාජිකයෙක් කිව්වේ නැහැ මෙතැන මෙතැන මේ වගේ දෙයක් අර තියෙනවා එකම දෙය තිබ්බේ ලංකාවේ මද්‍රසා පාසල් සහ බුර්කා පිළිබඳ විතරයි. වෙන සිද්ධියක් ඉස්මතු කරලා සාකච්ඡා කරපු බවක් මට මතක නැහැ. ඒක නිසා ඔය කියන කරුණට මට කරුණු ඉදිරිපත් කිරීමට අපහසුයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔය කියන විදියට දැන් ඔය ආරක්ෂක Council දී ඔවුන් ඉදිරිපත් කරපු කරුණු සම්බන්ධව තීරණ ගත්ත අවස්ථා තියෙනව ද? සෘජුව තීරණ දීපු අවස්ථා මේ වගේ මෙහෙම කරන්න කරන්න කියලා. නැත්නම් හැම තිස්සෙම කිව්වේ ඒ ගැන සොයා බලන්න සලකා බලන්න කියලා විතරම ද?

උ: දැන් ආරක්ෂක Council එකකට එන්නේ සාමාන්‍යයෙන් පොඩි හැම දේකටම තීරණ ගැනීමේ දේකට නෙමේ. Policy decision ගන්න තමයි සාමාන්‍යයෙන් ව්‍යුහයක් වශයෙන් තමයි සාමාන්‍යයෙන් ආරක්ෂක Council දී සාකච්ඡා කරන්නේ. ඒ මේ මේ එක එක දේවල් වලට තීරණය ගන්න මයේ හිතේ ආරක්ෂක අංශ ප්‍රධානීන්ට කරුණු තියෙනවා. එතැන්දී ඇවිල්ලා ඒ වගේ අතන දෙයක් වෙලා තියෙනවා මෙතන දෙයක් වෙලා තියෙනවා. මේකට මොකද්ද කරන්නේ කියලා මං ඉන්න කාලේ තුළ නම් ස්වාමීනි සාකච්ඡා වුණේ නැහැ. ඒක හින්දා ඒකට උපදෙසක් දුන්නෙත් නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි.

කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවේ කාර්යය සම්බන්ධයෙන් දැක්වූ දායකත්වයට සාක්ෂිකරුට කොමිෂන් සභාවේ ස්තූතිය පල කරනවා.

FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරු මුදා හරී.

උ: ස්වාමීනි මමත් ස්තූතිවන්ත වෙනවා මටත් කරුණු කියන්න අවස්ථාව ලබාදීම පිළිබඳව. බොහෝම ස්තූති.

වේලාව: පෙ.ව. 03.00

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.07.24 වේලාව:ප.ව.05.55 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා -සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය -සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, චතුරංග බණ්ඩාර මහතා, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලු මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සාක්ෂි අංකය : 215
නම : **මොහොමඩ් මාරුෂ් මොහොමඩ් රිෂාම්**
වයස : **අවුරුදු 39 යි**
ආගම : **ඉස්ලාම්**
රැකියාව : **ව්‍යාපාරික**

සාක්ෂිකරු සිංහල බසින් ප්‍රතිඥා දෙයි.

(මම මේ කියන සාක්ෂිය, සැබෑය, සම්පූර්ණ සැබෑය, සැබෑවක් මිස අන් කිසිවක් නොකියන බවට ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.)

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප : මහත්මයා ඔබ මූලික අධ්‍යාපනය ලැබුවේ කුමන පළාතේද?
පි : කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ 12 හමීරි රූසෙනි විද්‍යාලයේ.
ප : කොළඹ 12 කියන්නේ අලුත්කඩේ?
පි : අලුත්කඩේ.
ප : කුමක්ද විද්‍යාලයද?
පි : හමීරා රූසෙනියා විද්‍යාලය.
ප : ඔබ සාමාන්‍ය පෙළ වෙනකම් එම විද්‍යාලයේම අධ්‍යාපනය හැදෑරුවා කිව්වොත් හරිද?
පි : ඔව් ඔබ හරි.
ප : ඔබ සාමාන්‍ය පෙළ වෙනකම් අධ්‍යාපනය හදාරලා ඉන් අනතුරුව මොකක්ද කළේ?
පි : ඉන් අනතුරුව මම හෝටල් ක්ෂේත්‍රයට යොමු වුණා. හෝටල් ක්ෂෙත්‍රයට යොමු වෙලා ඉන් පස්සේ එතනිනුත් විවිධ ඒ කියන්නේ ගබඩා සහයක තවත් එක එක රැකියාවල් කළා. දැනට යතුරු පැදි පාවිච්චි කළ යතුරු පැදි විකිණීම ඒ වගේ ව්‍යාපාරයක් කර ගෙන යනවා.
ප : ව්‍යාපාර කටයුතු කර ගෙන යනවා?
පි : ඔව්.
ප : ඔබ වර්තමානයේ පාවිච්චි වෙලා ඉන්න ප්‍රදේශය කියන්න?
පි : වර්තමානයේ පදිංචි වෙලා ඉන්නේ කැකිරාව ප්‍රදේශයේ බණ්ඩාරපතාන පුප්බෝගම.
ප : ඔබ ඉස්ලාම් භක්තිකයෙක්ද?
පි : ඔව් ඉස්ලාම් භක්තිකයෙක්.
ප : ඉස්ලාම් භක්තිකයෙක් වශයෙන් ඔබ යම් කිසි ආගමික නිකායක් නැත්නම් ආගමික මතවාදයක් නියෝජනය කරනවද?
පි : නෑ ආගමික මතවාදයක් කියලා නෑ මම සාම්ප්‍රදායික මුස්ලිම්වරයෙක් වශයෙන් සුන්නත් ජමාත් එකට අයිති කෙනෙක්.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : සුන්නත් වල් ජමාත් මතවාදය නියෝජනය කරනවා?

පි : අනිවාර්යෙන්ම ඔව්.

ස්වාමිනි ඉතා ගෞරවයෙන් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය ආරම්භ කිරීමට පෙර සැලකරන්නට අපේක්ෂා කරනවා පහත කරුණු. ඒ තමයි සාක්ෂිකරුට අප විසින් පැහැදිලි කර දී තිබෙනවා ඔහු විසින් අද දින මේ ගරු කොමිෂන් සභාව ඉදිරියේ දෙනු ලබන සාක්ෂිය අතර තුර යම් පුද්ගලයෙක් හෝ පුද්ගලයින් පිළිබඳව සඳහන් කරනු ලබන්නේ නම් මෙම ගරු කොමිෂන් සභාව විසින් මෙතෙක් සිදු කොට ඇති ආකාරයට එකී සාක්ෂියෙහි සඳහන් වනු ලබන පුද්ගලයා හෝ පුද්ගලයින් විෂයෙහි දැනුම් දී ඔවුන් වෙනුවෙන් නීති නියෝජනයක් මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ සිදු කරමින් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේ අයිතිය ඔවුන්ට ලබා දෙනු ලබන බව. ඒ අනුව අද දින වෙනත් බාහිර නීති නියෝජනයක් නොමැති හෙයිනුත් එවැනි අවස්ථාවක් උදා වුවහොත් මෙම සාක්ෂිකරුට හරස් ප්‍රශ්න වලට භාජනය වීම සඳහා නැවත දිනයක මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියට පැමිණීමට සිදු වන බවත් අප විසින් පැහැදිලි කර දෙනු ලැබූ බව ගෞරවයෙන් සැලකොට සිටිනවා. ස්තූතියි ස්වාමිනි

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප : මහත්මයා සඳහන් කළා දැන් මේ ගරු කොමිෂන් සභාවට ඔබ සුන්නතු වල් ජමාත් නැත්නම් සාම්ප්‍රදායික සුෆි මුස්ලිම් නිකාය අනුගමනය කරන මුස්ලිම් වරයෙක් බවට?

පි : ඔව් ස්වාමිනි.

ප : ඔබට සඳහන් කරන්න පුළුවන්ද ශ්‍රී ලංකාව තුළ මේ සුෆි මතවාදයට අමතරව තවුහිද් මතවාදය අනුගමනය කරන මුස්ලිම් සංවිධාන ක්‍රියාත්මක වෙනවද නැද්ද කියලා?

පි : අනිවාර්යෙන්ම ක්‍රියාත්මක වෙනවා ශ්‍රී ලංකාව තුළ තවුහිද් මතවාදය අනුගමනය කරන ශ්‍රී ලංකා තවුහිද් ජමාත්, සිලෝන් තවුහිද් ජමාත්, ඕල් සිලෝන් තවුහිද් ජමාත්, දාවූතේ ඉස්ලාමීයා, ජමාතේ අන්සාරිස් සුන්නති මොහොම්මදීයා කියලා විවිධ නම් වලින් විවිධ සංවිධාන ලංකාවේ තියෙනවා.

ප : ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද සරලව මේ ඔබ අදහන සුෆි මතවාදයත්, තවුහිද් මතවාදය අදහන පිරිසත් අතර තියෙන ප්‍රධාන වෙනස්කම් මොනවද කියලා?

පි : සුෆි මතවාදය අදහන අපේ සාමාන්‍යයෙන් මම ආගමික විද්වතෙක් නෙවෙයි. මම දන්නා හැටියට මං කියන්නම් සාමාන්‍ය විදිහට අපි ස්වාමිනි සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් වශයෙන් අනිත් සමාජයට බහුතර සමාජයට කිසිදු කරදරයක් වෙන්නවත් එහෙම නැන්නම් ඒ බහුතර සමාජයේ තිබෙන ඒ ගොල්ලොන්ගේ ආගමික කටයුතු

FAIR COMMENT BY JEZEEM

වලට අපෙන් කිසිදු බාහිර බලපෑමක්වත් වෙන්නවත් නොදී අපි අපේ අදහන ක්‍රමය ස්වයං ඇදහීම එවැනි දේවල් අපි කර ගෙන යනවා. අපිත් සම්පූර්ණයෙන්ම නබි මොහොමඩ් නබිතුමාගේ ඒ එතුමාගේ ඇදහිලි එතුමා කළ දේවල් එතුමාගේ සුන්නතයන් පිළිපදින එතුමාගේ වර්ණනාවන් කරගෙන එතුමාගේ ඒ අනුගාමිකයන් ලෙස යන පිරිසක්.

ප : දැන් ඊට සාපේක්ෂව තවුහිද් මතවාදය දරන පිරිස මොකක්ද වෙනස?

පි : ඔව් ස්වාමිනි තවුහිද් මතවාදය ඊට පරස්පර ඒ කියන්නේ වෙනම මේකක් ඒ ගොල්ලන් සාමාන්‍යයෙන් ඔය සුන්නත් මතවාදය අදහන කට්ටියට ස්වාමිනි ඒ ගොල්ලන් බලන්නේ සාමාන්‍යයෙන් කාෆිර්වරුන් හැටියට. ඒ කියන්නේ ඒක ඒ ගොල්ලන් කියනේනේ නබිතුමා එහෙම පිළිවෙතක් ඇදහුවේ නැහැයි කියන එකයි ඒ ගොල්ලොන්ගේ මතය. දැන් මම ඔය තරම් ඒ ගොල්ලන් අන්තවාදී කියලා කියන්න හේතුව ස්වාමිනි දැන් ඒ ගොල්ලන් සොහොන් කොත් වැඳීම සම්පූර්ණයෙන්ම ඒ ගොල්ලන් ප්‍රතික්ෂේප කරනවා ස්වාමිනි.

ප : ඔබ අන්තවාදී කියන තැනට ආවේ කවුරු අන්තවාදී කියලද ඔබ කියන්නේ මොන ආගමික නිකායන්වල කට්ටිය අන්තවාදී කියලද ඔබ සඳහන් කරන්නේ?

පි : තවුහිද් ජමාත් සංවිධානය.

ප : තවුහිද් ජමාත් සංවිධානය නැත්නම් තවුහිද් මතවාදය අදහන සියළුම සංවිධාන අන්තවාදීද?

පි : නෑ තවුහිද් ජමාත් සංවිධානය.

ප : ඔවුන් ඇයි අන්තවාදී කියලා ඔබ කියන්නේ?

පි : ඒ ගොල්ලන් ස්වාමිනි කෙළින්ම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනවා ඒ කියන්නේ තවත් ආගමක් සම්බන්ධව නිකරු කරලා කතා කරනවා තවත් ආගමික දේවල් සම්බන්ධව ඒ ගොල්ලන් විවේචනය කරනවා. ඒ වගේම සොහොන් කොත් වැඳීම ප්‍රතික්ෂේප කරනවා. සොහොන් කොතක් කියලා කියන්නේ යම් ආගමික නායකයෙක් විද්වතෙක් එතන භූමදානය වෙලා ඉන්නවා නම් ඒක වත් පිළිවෙත් කරන එක පරණ කාලේ ඉඳලා සිදු වෙන දෙයක් ස්වාමිනි. එතකොට එතන ඒක වැදුම් පිදුම් කරන එක වැරදි නම් ස්වාමිනි එතකොට මේ ගොල්ලන්ගේ ඊළඟ පිම්ම කොහේද එහෙනම් ඒ සොහොන් කොතත් බැඳලා තියෙන්නේ ගල් වලින් නම් ඊළඟ පිම්ම බුදු පිළිම වැඳීමත් වැරදිද. ඉතින් ඒක හන්දා අපි කියන්නේ ඒ ගොල්ලන් අන්තවාදී මතවාදයක් ව්‍යාප්ත කරමින් යනවා අනිත් එක ලක්ෂ 22 ක් හෝ 24 ක් මුස්ලිම්

FAIR COMMENT BY JEZEEM

ජනතාව ශ්‍රී ලංකාවේ ඉන්නවා නම් ස්වාමිනි දැනට ලක්ෂ 8 ක පිරිසක් ඒ සංවිධානයට අයත්. ඒ තරමට ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙනවා ඒක. ඒ කියන්නේ ඒ තරම් කටීකයින් ඉන්නවා සාමාන්‍ය පෙළ විභාගයෙන් out වෙන කෙනෙක් සාමාන්‍යයෙන් ස්වාමිනි ඒ ගොල්ලන්ට හරියට පැහැදිලි කර ගන්න බෑ මොකටද මොන මඟේද යන්නේ කියලා. ඒ ගොල්ලන් කෙළින්ම ඒ වගේ උදවියව අල්ල ගෙන තමයි ඒ ගොල්ලන් ඒ ගොල්ලන්ගේ ඒ ආගම්වාදය ඒ එහෙම ව්‍යාප්ත කරන්නේ.

ප : දැන් ඔබ සඳහන් කළානේ මේ තවුහිද් ජමාත් සංවිධානය අන්තවාදී සංවිධානයක් කියලා. දැන් ඔබට තවදුරටත් සඳහන් කරන්න පුළුවන්ද මේ ෂෆායි සබාබා නැමැති සංවිධානයක් තියෙනවද කියලා?

පි : ෂෆායි සබාබා කියලා කියන්නේ සහබාවරුන්ට ආදරය කරන පිරිස. සෙෆායි කියලා කියන්නේ ඒ ගොල්ලන් උර්දු භාෂාවෙන් ෂෆායි සහාබා කියලා කියන්නේ ස්වාමිනි. ඒක දෙමළෙන් කියනවා නම් සහබාකරෙයි නේසි පෝර් දම්ටම් කියලා කියන්නේ. ඒ ගොල්ලන් දැනට ක්‍රියාත්මකයි. කාත්තන්කුඩිවල දැනට ක්‍රියාත්මකයි. සුළු කණ්ඩායමක්.

ප : මේ සහබාකරෙයි නේසි පෝර් දම්ටම් කියන සංවිධානය දැනට ලංකාවේ තියෙනවද?

පි : ලංකාවේ තියෙනවා ස්වාමිනි.

ප : කොහේද තියෙන්නේ ඒක?

පි : කාත්තන්කුඩිවල තියෙනවා ස්වාමිනි.

ප : ඔබට කියන්න පුළුවන්ද හරියට කොහේද තියෙන්නේ කියලා ලිපිනයක් එහෙම කාර්යාලයක්?

පි : කාර්යාලයක් කියලා කියන්න බෑ. ඒ ගොල්ලන් කුඩා කණ්ඩායම් වශයෙන් ක්‍රියාත්මක වෙනවා.

ප : ඔබට සඳහන් කරන්න පුළුවන්ද ඔවුන් මොන වගේ ආගමික මතවාදයක්ද දරන්නේ කියලා?

පි : නෑ මෙහෙමයි ස්වාමිනි ඒ ගොල්ලන් ඔය තවුහිද් මතවාදයමයි ඒ ගොල්ලන් දරන්නේ. ඒ කියන්නේ ඒ ගොල්ලන්ගේ ඔය වෙනසක් නැහැ අන්තවාදී මතයමයි ඒ කියන්නේ extreme ගිය කට්ටිය තමයි දැන් ඒක ස්වාමිනි කියනවා නම් දැන් ඕක.

ප : මහත්මයාට පැහැදිලි කරන්න පුළුවන්ද මේ ෂෆායි සබාබා සංවිධානය ඔබ ඔය කියනනේ දැඩි අන්තවාදී කියලා?

පි : ඔව්.

ප : මොනවද ඒ ඔවුන් අන්තවාදී ලෙස කරන ක්‍රියාකාරකම් මොනවද කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : මේ ගොල්ලන් දැනට ස්වාමිනි මේ ගොල්ලන් ආත්ම ආරක්ෂක සටන් කලාව සම්බන්ධව මේ ගොල්ලන් වෙනම Team එකක් arrange කර ගෙන යනවා. ඒ කියන්නේ දැන් අවුරුදු 4 ක් තිස්සේ ඕක සිදු වෙනවා. සහරාන් සමඟත් මේ ගොල්ලන්ගේ සම්බන්ධතා තිබුණා. මට දැන් මම මේ කියන දේවල් ස්වාමිනි ඇත්තටම මම දන්නවා මට මේ දේවල් සනාථ කර ගන්න තියෙන සාක්ෂි අඩුයි. ඒ වුණාට මං විවිධ අවස්ථාවලදී බුද්ධි අංශ නිලධාරීන්ට මේවා දැනුවත් කරලා තියෙනවා මගෙන් තොරතුරු අරන් තියෙනවා. ඒ ගොල්ලන් ගිහින් ස්වාමිනි මේ සම්බන්ධව හොයලා බලලා ඒ ගොල්ලන් ඕක තියෙනවයි කියලා සනාථ කරලා තියෙනවා. ඒත් ඉතින් මම මෙතනදී අසරණයි ඒ කියන්නේ මම මේ තියෙන සාක්ෂි විතරයි තියාගෙන කියන්න වෙන්නේ ස්වාමිනි. මම ඒ සම්බන්ධව බුද්ධි අංශ වාර්තාවකුත් තියෙනවා.

ප්‍ර : හරි අපි ඉස්සෙල්ලම ඔබ පැහැදිලි කරන්න මහත්මයා මේ ෂෆායි සබාබා සංවිධානය ඔබ අන්තවාදී කියලා කියනවනේ. ඔවුන්ගේ මොනවද මේ සාමාන්‍යයෙන් ඔවුන්ගේ අන්තවාදී ක්‍රියා කලාපය මොකක්ද කියන එක මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්නකෝ.

පි : ෂෆායි සබාබා කියන්නේ වෙනම සංවිධානයක් කියලා මම කියන්නේ නෑ. ඒකත් ඔය තවුහිද් සංවිධානයට අයත් එකක්මයි. ඒ අන්තවාදී මතධරන සංවිධානයක් කියන්නේ ඒ ගොල්ලන් දැනට ක්‍රියාත්මක වෙන්නේ සහරාන්ගෙන් පස්සේ ඒ ගොල්ලන් වෙනම කුඩා කුඩා කණ්ඩායම් වශයෙන් අරගෙන ආත්ම ආරක්ෂක සටන් කලාව උගන්වන පංති පවත්වාගෙන ඒකේ සාමාන්‍යයෙන් ඒකේ ඉස්සෙල්ලා නායකයෙක් හිටියේ අල්වුඩින් බීන්නොයි කියලා. එයා පකිස්ථානයෙන් ආපු පුද්ගලයෙක්. එයා දැනට නැහැ. දැනට කරන් යන්නේ තවත් පුද්ගලයෙක්.

ප්‍ර : කවුද ඒ පුද්ගලයාගේ නම කියන්නකෝ මේ සංවිධානය දැනට ලංකාවේ කරන් යන්නේ ?

පි : එදිරිස් කියලා පුද්ගලයෙක්.

ප්‍ර : එදිරිස් කියලා පුද්ගලයෙක්?

පි : ඔව්.

ප්‍ර : ඔවුන් මොනවද එකතු වෙලා මේ සංවිධානයේ නාමයෙන් කරන්නේ?

පි : නෑ ඒ ගොල්ලන් සාමාන්‍යයෙන් දැන් ඒ ඒ සංවිධානයේ අදාළව ඒ ඉන්න team එක 40 කට වැඩි ආසන්න පිරිසක් ඉන්නවා. ඒ team එක අරගෙන ඒ ගොල්ලන් ගොඩක් මේ සහරාන්ට ගැනිකම්

FAIR COMMENT BY JEZEEM

කරලා තියෙනවා. ඒ වගේම හාරුන් සහවි කියලා පුද්ගලයෙක් නිදහස් පක්ෂයේ කල්කුඩා සංවිධායක හිටපු මහත්මයෙක් ස්වාමිනි. එයා සම්බන්ධයෙන් තමයි වැඩියෙන් මම හෙළිදරව් කළේ. ඒ පුද්ගලයාටත් ඒ වගේම ආණ්ඩුකාට හිස්බුල්ලා කියන ඒ ආණ්ඩුකාරවරයාටත් මේ ගොල්ලන් තමා ගැතිකම් කරන්නේ ඒ අවශ්‍ය වෙලාවට ඒ අවශ්‍ය ක්‍රියාවන් කරන්නට යොදව ගන්නේ මේ කට්ටියව තමයි.

ප්‍ර : දැන් ඔබ සඳහන් කළා මේ සංවිධානය විසින් සහරාන් යන පුද්ගලයාට ගැතිකම් කළා කියලා? මොන වගේ ක්‍රියාකාරකමක් කළාද කියලා ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද ඔබට තොරතුරු තියෙනවද ඒ සම්බන්ධයෙන් කුමන ආකාරයටද ඔවුන්ට ?

පි : සහරාන් අන්තවාදී ඒ අන්තවාදී අදහස් ව්‍යාප්ත කරන වෙලාවේ ස්වාමිනි ඒ අවස්ථාවල මේ ගොල්ලන් සෑහෙන ඔවුන්ට උදව් කරලා තියෙනවා ඒ කියන්නේ ඔවුන්ගේ කණ්ඩායම් වශයෙන් බෙදිලා දැන් ඔතනදී මට හරියට දැක්කා වගේ කියන්න බෑ ස්වාමිනි. මට ලැබෙන තොරතුරු අනුව මට ලැබෙන තොරතුරු මට ලබා දුන්නේ ෂියා සංවිධානය ඔට්ටමාවඩිවල නජීම් කියලා මහත්මයෙක් ඒ වගේම තවත් පුද්ගලයෝ.

ප්‍ර : ඒ ලැබෙන තොරතුරු අනුව කොහොමද මේ සංවිධානය මේ ෂෆායි සබාබා කියන සංවිධානයේ පුද්ගලයින් සහරාන්ට උපකාර කරලා තියෙන්නේ ඔබට ලැබුණු තොරතුරු අනුව කොහොමද?

පි : ලැබුණු තොරතුරු අනුව කියන්නේ දැන් ඔය බුද්ධි අංශ වාර්තාව දුන්නෙත් එතුමමයි. ඒහේ ඉඳලා යැව්වා. බුද්ධි අංශ වාර්තා යැව්වෙත් මං උදාහරණයක් කියන්නම් ස්වාමිනි බුද්ධි අංශ වාර්තා යැව්වේ මට බස් එකක Transport එකක. ඒක කොහොමහරි ආරංචි වෙලා ඊට පස්සේ එදිරිස් කියන පුද්ගලයා මෙතුමට පහර දීලා තිබුණා ඒ සම්බන්ධව පොලිසියේ පැමිණිල්ලක් තියෙනවා. ඒ කියන්නේ ඔය බුද්ධි අංශ වාර්තාව යවපු එක දැන ගත්තයින් පස්සේ.

ප්‍ර : එතකොට ඔබට පැහැදිලි කරන්න පුළුවන්ද මේ සංවිධානයට මේ සංවිධානය ශ්‍රී ලංකාව තුළ මොනවගේ අන්තවාදී ක්‍රියාද කරලා තියෙන්නේ කියලා?

පි : ශ්‍රී ලංකාව තුළ ඒ ගොල්ලන් ඒ කියන්නේ අන්තවාදී කියන්නේ ආගමික වශයෙන් බැලුවොත් ස්වාමිනි ඒ ගොල්ලන් ෂියා මුස්ලිම් දේවස්ථානයට 2016 සමයේදී පහර දීලා තියෙනවා. පහර දීලා එහි CCTV records එහෙම අරන් ගිහිල්ලා තියෙනවා. ඒ කියන්නේ ඒ ගොල්ලන් අන්තවාදී මතධරන හන්දා. ෂියා කියන්නේ සුන්නි ඒ

FAIR COMMENT BY JEZEEM

ගොල්ලන් ඒ ඒ ගොල්ලන්ගේ මාර්ගය වෙනම මාර්ගයක් හන්දා ඒ ගොල්ලන් එක්ක තියෙන මේවා එකට මේක කරලා තියෙනවා. ඒ වගේම ඒ සම්බන්ධව බී වාර්තාවක් තියෙනවා.

ප්‍ර : හරි ඔබට කියන්න පුළුවන්ද දැන් ඔය පහර දීම සිද්ධ වුණේ කවද්ද කියලා ඔබගේ තියෙන තොරතුරු අනුව?

පි : ඔව් 2017 ජූලි 13 කියලා සඳහන් වෙන්නේ එතන බී වාර්තාව.

ප්‍ර : බී වාර්තාව ?

පි : 2017 ජූලි 13.

ප්‍ර : කුමන අධිකරණයේ බී වාර්තාවක්ද ඕක?

පි : ඕක වාලච්චේනයේ.

ප්‍ර : වාලච්චේන මහේස්ත්‍රාත් අධිකරණයේ බී වාර්තාවක්ද?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : එහි නඩු අංකය පැහැදිලි කරන්න පුළුවන්ද මහත්මයාට මේ ගරු කොමිෂන් සභාවට?

පි : B/179/17 ස්වාමිනි.

ප්‍ර : වාලච්චේන මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක B/179/17 කිව්වොත් හරි?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : දැන් මේ නඩුව ගොනු කරලා තියෙන්නේ මොකක් හින්දද මොකක්ද කාරණේ?

පි : මේ ගොල්ලන් අන්තවාදී සංවිධානයක් මෙහි සංවිධානය ඔය එදිරිස් ඇතුළේ තවත් අට දෙනෙක්ගේ පිරිසක් ඇවිල්ලා ෂියා මුස්ලිම් දේවස්ථානයට පහර දුන්නා කියලා තමා.

ප්‍ර : මේ කොහේ තියෙන දේවස්ථානයකටද පහර දීලා තියෙන්නේ?

පි : ඔට්ටමාවඩිවල.

ප්‍ර : ඔට්ටමාවඩිවල?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව මොකක්ද නීත්‍යානුකූලව ඔවුන්ට විරුද්ධව යම් පියවරක් අරගෙන තියෙනවද?

පි : ඔව් ඒ සම්බන්ධව නඩුවක් තාම අධිකරණයේ තියෙනවා ස්වාමිනි.

ප්‍ර : ඔබට සඳහන් කරන්න පුළුවන්ද මේ ෂෆායි සබාබා යන සංවිධානය තලෙයිබාන් සහ අල්කයිඩා සංවිධානය සමඟ සම්බන්ධතා තියෙනවද නැද්ද කියන එක සම්බන්ධයෙන්?

පි : තලෙයිබාන් සහ අල්කයිඩා සමඟ සම්බන්ධතා තියෙනවයි කියලා තොරුතුරු ලැබුණේ ඒ ගොල්ලන් අර අලවුඩීන් බීන්නුර් කියන පුද්ගලයා පාකිස්ථානයේ එහේ පුහුණුවීම් කරලා ආපු කෙනෙක් බවට ඒ නජීම් මවුලවි කියන පුද්ගලයා දුන්න තොරතුරකට අනුව ඒ කියන්නේ ඒ ගොල්ලන්මයි පහර කෑමට

FAIR COMMENT BY JEZEEM

ලක් වුණේ මොවුන්ගෙන්. ඉතින් ස්වාමිනි ඒ ගොල්ලන් දුන්න තොරතුරු තමයි ඇත්තටම තියෙන්නේ ඔතන. හැමදේම ඒගොල්ලන් දුන්න තොරතුරු නෙවෙයි අපි රැස් කරපු ඒවාත් තියෙනවා. ඔය ෂෆායි සබාබා කියන සම්බන්ධව ස්වාමිනි ඒ ගොල්ලන් දුන්න තොරතුරු තියෙන්නේ.

ප්‍ර : තමයි ඔබට ඉදිරිපත් කරන්න තියෙන්නේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ තොරතුරු අනුව ඔබට කියන්න පුළුවන්ද මේ සංවිධානයේ ශාඛාවන් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට ප්‍රහාරයක් එල්ල කෙරුණේ පකිස්ථානයේ ලාහුර් නුවර?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : ඊට සම්බන්ධයක් තියෙනවද කියලා?

පි : නෑ මේ සංවිධානයේ ශාඛාවක් කියන්නේ පකිස්ථානයේ තියෙනවා ලක්සරි ජන්ගුයි කියලා සංවිධානයක්. ඒ සංවිධානය ඒ සංවිධානයේ අනු කොටසක් කියලා තමයි මේක කියන්නේ. එතුමා එහෙමයි පැහැදිලි කළේ. ඒකේ එයා පැහැදිලි කරන කොට කිව්වේ එහි ලංකාවේ ක්‍රිකට් කණ්ඩායමට පහර දුන්නෙත් ඒ අදාළ පුද්ගලයා. මම ඕනේම තැනක ඇවිල්ලා ඔය සම්බන්ධව සාක්ෂි දෙන්නත් කැමති කියලා

ප්‍ර : තමයි ඒ පුද්ගලයා කිව්වේ?

පි : ඒ පුද්ගලයා කිව්වේ.

ප්‍ර : ඒ පුද්ගලයාගේ නම පැහැදිලිව සඳහන් කරන්න මේ කොමිෂන් සභාවට?

පි : නජීම් මවුලවිතුමා ෂියා සංවිධානයේ.

ප්‍ර : නජීම් මවුලවිතුමා මාර්ගයෙන් තමයි ඔබ මේ සම්බන්ධයෙන් දැනුවත් වුණේ කිව්වොත් නිවැරදිද?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව මොවුන්ගේ මෙම ෂෆායි සබාබා සංවිධානය ක්‍රියාත්මක වෙන්නේ යම් කිසි කල්ලියක් විදිහටද?

පි : ඔව් පතාල කල්ලියක් හා සමානව ක්‍රියාත්මක වෙනවා.

ප්‍ර : කොහොමද ඒ ගොල්ලො මේ පතාල කල්ලිය සංවිධානය කර ගෙන තියෙන්නේ?

පි : සංවිධානය කරන්න ඒ ගොල්ලන්ට පිටරටින් මුදල් ආධාර කරනවා රෙෆායිඩීන් සලෆි කියලා මවුලවිවරයෙක් කටාර් වලින්. ඒ බුද්ධි අංශ වාර්තාවේ සම්පූර්ණයෙන්ම සඳහන් වෙන්නේ ඒ මවුලවිතුමා සම්බන්ධවයි ඒ පල්ලියට මුස්ලිම් දේවස්ථානවලට පහර දුන්නයින් පස්සේ ස්වාමිනි ඒ ගොල්ලන් එය සමරන්න

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

උත්සවයක් පවත්වලා තියෙනවා ඒ සම්බන්ධව තමයි බුද්ධි අංශ ඒ බුද්ධි නිලධාරියාගේ වාර්තාවේ සඳහන් වෙන්නේ.

ප්‍ර : ඒ බුද්ධි අංශ බුද්ධි නිලධාරියා ඔබට ලබා දුන් වාර්තාව ඔබ මේ ගරු කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ලබා දුන්නද?

පි : ඔව් මම ලබා දීලා තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර : එය නැවත දැක්කොත් ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි : ඔව් ස්වාමිනි.

ස්වාමිනි සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටිනවා.

ප්‍ර : මහත්මයා මෙම ලේඛනය පරීක්ෂා කරන්න. මෙම ලේඛනය කුමක්ද ඔබට කුමක් හැටියටද හඳුනා ගන්න පුළුවන්ද?

පි : ඔව් ඕක ස්වාමිනි සෙෆායි සබාබා සංවිධානය සම්බන්ධව එහි දුන්න බුද්ධි අංශ වාර්තාව ඔය තියෙන්නේ නජීෆ් කියලා තියෙන්නේ ඒ තොරතුරු මාර්ගය එයා දුන්න වාර්තාව සම්බන්ධයෙනුයි ඒ වගේම ඒ අදාළ බුද්ධි අංශ නිලධාරියාගේ අංකය සඳහන් වෙනවා. ඔය සම්බන්ධව ස්වාමිනි මම මීට කලින්

ප්‍ර : ඔබට හඳුනා ගන්න පුළුවන්?

පි : පුළුවන්.

ස්වාමිනි සාක්ෂිකරු විසින් ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන 2017/06/16 දිනැති බුද්ධි අංශ වාර්තාවක් X 169 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර : දැන් මේ බුද්ධි අංශ වාර්තාව මහත්මයාට ලැබුණේ කාගෙන්ද කියලද කිව්වේ?

පි : නජීෆ් මවුලවිතුමා ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ ඔය කිව්වනේ නජීෆ් මවුලවිතුමා. මේ නජීෆ් මවුලවිතුමා කොහේද ඉන්නේ?

පි : එයා ඉන්නේ ඔට්ටමාවඩිවල ස්වාමිනි දැන් එයා සම්බන්ධව තොරතුරු ඒ අදාළ දුරකථන අංක හැමදේම තියෙන මගේ දුරකථනය දැනට උසාවිය භාරයේ තියෙන්නේ ස්වාමිනි.

ප්‍ර : දැන් මෙම බුද්ධි අංශ වාර්තාවේ මොකක්ද තියෙන මාතෘකාව මහත්මයා?

පි : වාලච්චේනයේ ඔටමාරිවල ක්‍රියාත්මක කල්කුඩා ෂෙයික් උල්ලා මාර්ෂල් ආර්ට් ඇකඩමිය සම්බන්ධව. ඔතන ඒ සම්පූර්ණයෙන්ම කල්කුඩා ෂෙයින් උල්ලා මාර්ෂල් ආර්ට් ඇකඩමිය නමින් ජීවිත ආරක්ෂක සටන් පුහුණු පාසලක් අංක 10, මාකට්පාර, මීරාගොඩ යන ලිපිනයේ පිහිටි අමීර් අලී ශාලාව තුළ පවත්වාගෙන යන තරුණ සංවිධානයක් ප්‍රදේශයේ ක්‍රියාත්මක වන අතර මේ සඳහා

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අල්කිම්මා සවුදි රාජ්‍ය නොවන සංවිධානයෙන් ශ්‍රී ලංකා නියෝජිත මවුලවි හාරූන් විසින් දායකත්වය ලබා දෙයි.

ප : ඒ කියන්නේ ඔවුන් සඳහන් කරලා තියෙනවා මෙයට අල්කිම්මා යන සවුදි N.G.O එකෙන් නැත්නම් රාජ්‍ය නොවන සංවිධානයෙන් මුදල් ලැබෙනවා කියලා?

පි : ඔව් ස්වාමිනි.

ප : සහ මවුලවි හාරූන් යන නමක් සඳහන් වෙනවා. මේ මවුලවි හාරූන් කියන්නේ කවුද මහත්මයා?

පි : මවුලවි හාරූන් කියලා කියන්නේ එහේ ඔටමාරිවල සාමාන්‍ය මවුලවි කෙනෙක්. ඒ කියන්නේ අඩු සාමාන්‍ය රුපියල් 5500 ක වැටුපට එතුමාගේ ජීවිතය ආගම උගන්වන කෙනෙක් හැටියට පටන් අරගෙන දැන් ප්‍රකෝටිපතියෙක් ඒ අල්කිම්මා කියන සංවිධානය එතුමා නියෝජනය කරන්නේ ඉතින් එතුමා ලංකාවෙත් ඒ ශාඛාවන් පිහිටුවලා දැනට අල්කිම්මා Hospital, අල්කිම්මා Travels හැමදේම කරගෙන යනවා ස්වාමිනි.

ප : ඊට අමතරව ඔහු යම් කිසි දේශපාලන පක්ෂයක සාමාජිකත්වය ලබනවද?

පි : අනිවාර්යෙන් නිදහස් පක්ෂයේ කල්කුඩාවල සංවිධායක ධුරයක් හිස්බුල්ලා මහත්මාගේ අනුග්‍රහයෙන් අරන් දුන්නා කියලා එතුමම එතුමාගේ මුහුණු පොතේ පිටුවේ සඳහන් කරලා තියෙනවා ස්වාමිනි.

ප : ඉන් අනතුරුව මහත්මයා මෙම X 169 සඳහන් වෙනවද මෙහි සාමාජිකත්වය මේ කෑල්ල කියනවන්න.

පි : මෙහි සාමාජිකත්වය උසුලන තරුණයින් අති බහුතරයක් දැඩි වහබ්වාදීන් වන අතර IS ත්‍රස්තවාදී සංවිධානයේ ක්‍රියාකාරකම් සම්බන්ධව ප්‍රසාදයෙන් අදහස් ප්‍රකාශ කරන අයවලුන් බවට පැවසේ.

ප : ඒ කියන්නේ මේ බුද්ධි අංශ වාර්තාවෙන් සඳහන් වෙනවා ඔවුන් ISIS සංවිධානයට පක්ෂපාතිව අදහස් දරන කණ්ඩායමක් කියලා?

පි : ඔව් ස්වාමිනි.

ප : එහෙම කිව්වොත් හරිද?

පි : ඔව් ස්වාමිනි.

ප : මහත්මයා මෙහි මෙම ලේඛනයේ ඉහළ තියෙනව නේද විශ්වාසවන්ත භාවය කියලා එකක්?

පි : ඔව් ස්වාමිනි.

ප : එහි මොකක්ද මේ සඳහන් වෙන්නේ B2?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : B2 එතන බුද්ධි අංශ නිලධාරීයෙක් කියූ දේ මම එතන ඔය ලේඛනය SIS එකේ අදාළ මහත්වරුන්ටත් ඉදිරිපත් කළා. ඒ ගොල්ලන් කිව්වේ ඒක ඒ අදාළ ඔය තොරතුරේ තියෙන මට ඒක ඒ ගොල්ලන් කිව්වා එක එක තරාතිරම් තියෙනවා මේ තොරතුරුවල සත්‍ය අසත්‍යභාවය සම්බන්ධව. ඕක B2 කියන Rank එකට අදාළ එකක් කියලා කිව්වා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : තමන්ට මේ ලේඛනය කොහෙන්ද හම්බ වුණේ?

පි : ඕක නජීම් මවුලවිතුමා මට යවපු එකක් ස්වාමිනි. එයාට බුද්ධි අංශ නිලධාරීයෙක් ලබා දුන් වාර්තාවක් කියලා කිව්වා. එයා ලබා දුන්නු තොරතුරුවල වාර්තාවක්මයි ඔය. නජීෆ් කියලා කියන්නේ එයාමයි ස්වාමිනි තොරතුරු නජීෆ්.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර : දැන් එහි තොරතුරුකරුගේ නිරීක්ෂණය යන මාතෘකාව යටතේ ඇති දෙවන වාක්‍ය කියවන්නකෝ මහත්මයා මවුලවි හරුන් කියන තැන?

පි : තොරතුරුකරුගේ නිරීක්ෂණය 2017/06/08 වන දින සිදුව ඇත්තේ සටන්කාමී තරුණ සංවිධානයක සාමාජිකයින් විසින් ෂියා මුස්ලිම්වරුන් හට එල්ල කරන ලද ප්‍රහාරයක් වන අතර ප්‍රදේශවාසී සුන්නි මුස්ලිම්වරුන් බොහොමයක් සමඟ ෂියා මුස්ලිම්වරුන්ට කිසිදු එදිරිවාදිකමක් නොමැත. මවුලවි හාරූන්, මවුලවි ෆිර් මොහොම්මත්, මවුලිව හබී මොහොමත්, මවුලවි ඉස්මයිල් මදනි යන අයගේ මෙහෙයවීමෙන් සිදු කරන ලද මෙම ප්‍රහාරය ෂියාවරුන්ගේ අසල්වැසියන් ලෙස කටයුතු කරනු ලබන සුන්නි මුස්ලිම් බහුතරයකගේද දැඩි පිළිකුලට භාජනය වී ඇත.

ප්‍ර : දැන් මහත්මයා මෙහිත් සඳහන් වෙනවා මවුලවි හරුන්ගේ නම නේද?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබට කියන්න පුළුවන්ද මේ කල්කුඩා ෂෙයික් උල්ලා මාර්ෂල් ආර්මිස් ඇකඩමි කියන එක මේ මෙම ෂෆායි සබාබා සංවිධානයේ ආයතනයක්ද ෂයින් උල්ලා මාර්ෂල් ආර්ට් ඇකඩමි කියන එක ඔය ෂෆායි සබාබා කියන සංවිධානයේම යම් පිහිටුවා තිබෙන ආයතනයක්ද?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ස්වාමිනි. ඒ නඒෆ් මවුලවිතුමා ලබා දුන්නු තොරතුරුවලට අනුව ඔය සංවිධානයේ ඉන්න තරුණ ඒ පිරිසම තමයි ඔය ෂෙෆායි සබාබා සංවිධානයේ ක්‍රියාත්මක වෙන්නේ කියලා එතුමා තොරතුරු ලබා දුන්නා.

ප්‍ර : දැන් මේ සංවිධානයේ ඉන්න පිරිසට මෙම ෂයින් උල්ලා මාර්ෂල් ආර්ට් ඇකඩමිය මඟින් යම් කිසි යුධ පුහුණුවක් එහෙම ලබා දීලා තියෙනවද ඔබට ලැබුණු තොරතුරු අනුව?

පි : සටන් පුහුණුවක් ලබා දෙනවා කියලා තමා කිව්වේ ස්වාමිනි ඊට පස්සේ බුද්ධි අංශ නිලධාරීයෙක් මගෙන් තොරතුරු අරගෙන එයා සොයා බැලීම් කරලා එයා පැවසුවා සටන් පුහුණුවක් ලබා දෙනවා ඒ වුණාට දැන් තැන වෙනස් කරලා තියෙන්නේ දැන් කාත්තන්කුඩිවල නෙවෙයි තවත් ප්‍රදේශයක ඔය දේ කෙරෙන්නේ. තාමත් අපි සොයා ගෙන යනවා කියලා.

ප්‍ර : දැන් ඔබට ලැබුණු තොරතුරු අනුව මෙවැනි තරුණයින් කීයක් විතර පුරුදු පුහුණු කරලා තියෙනවද මේ සංවිධානය යටතේ?

පි : දැනට 200 කට ආසන්න පිරිසක්.

ප්‍ර : ආසන්න ප්‍රමාණයක් පුහුණු වෙලා සිටිනවා මේ අන්තවාදී මතයක් එක්ක කිව්වොත් නිවැරදි?

පි : නිවැරදි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ සඳහන් කළා මොවුන් හිස්බුල්ලා නැමැති හිටපු ආණ්ඩුකාරතුමාගේ මැරකල්ලියක් විදිහට පාවිච්චි වුණා කියලා?

පි : දේශපාලනමය වශයෙන් ස්වාමිනි.

ප්‍ර : ඔබට මොකක්ද ඒ සම්බන්ධයෙන් තියෙන තොරුතුරු?

පි : හිස්බුල්ලා ආණ්ඩුකාරවයා සම්බන්ධයෙන් එතුමා නඒෆ් මවුලවිතුමා දැන් එයාට අවශ්‍ය නම් එයාට මෙයාගේ තියෙන තරහක් පිරිමහ ගන්න එහෙම ප්‍රකාශයක් ලබා දෙන්නත් පුළුවන් ඒ වුණාට ස්වාමිනි අපි එතුමාගේ ගොඩාක් දේවල් තොරතුරු හොයා ගෙන යන කොට ළඟින්ම ආශ්‍රය කරන පුද්ගලයෙක් තමා හාරුන් සහී කියන පුද්ගලයා. ඉතින් අර කල්කුඩාවල සංවිධායකකම ලබා දීලා තියෙන්නෙත් එතුමාම තමා. ඒ වගේම ඔය සංවිධානයේ මුදල් සෑහෙන මුදල් ප්‍රමාණයක් ලංකාවට ඇවිල්ලා තියෙනවා හිතා ගන්න බැරිතරම්. දැන් එයා ඒක හින්දා මං අපි ඒ තොරතුර ඇත්ත කියලා පිළිගත්තා ඉතින් එයා කියපු දේ අපිට දන්න විදිහට ස්වාමිනි.

ප්‍ර : ඔබට තව ඡායාරූප ඉදිරිපත් කරන්න පුළුවන්ද මේ සංවිධානය ඔබ දැන් නම් කරානේ පුද්ගලයින්?

පි : ඔව්.

FAIR COMMENT BY JEZEEM

ප : ඔවුන් සම්බන්ධයෙන් මේ ගරු කොමිෂන් සභාවට ඔවුන්ගේ සබඳතා පැහැදිලි කරමින් තව ඡායාරූප ඉදිරිපත් කිරීමේ හැකියාවක් තියෙනවද?

පි : පුළුවන් ස්වාමිනි. ඔව් ඔතන සිටින්නේ ස්වාමිනි එදිරිස් කියන පුද්ගලයා ඔතන වම් අතින්.

ප : පොඩ්ඩක් ඉන්න.

සාක්ෂිකරු ඡායාරූපයක් ඉදිරිපත් කරනවා ස්වාමිනි.

ප : මේ ඡායාරූපය කුමක්ද කියලා මහත්මයාට පැහැදිලි කරන්න පුළුවන්ද?

පි : 2016/06/15 වෙනි දින හාරූන්ගේ මෙහෙයවීම යටතේ ප්‍රහාරයට සම්බන්ධ වූ අයවලුන් ඇතුළු ෂෙයිෆුල්ලා ජීවිත ආරක්ෂක පදනමේ උත්සවයක් ද සමඟ පවත්වන ලද ස්තාර් වැඩ සටහන.

ප : දැන් මහත්මයා ස්තාර් වැඩසටහන කියලා කියන්නේ මොකක්ද මේ ස්තාර් වැඩ සටහන් කියලා කියන්නේ?

පි : නොම්බි සමයේ තියපු ඒ අදාළ වැඩසටහනක් පස්වරුවේ තියෙන.

ප : දැන් මෙහි සඳහන් කරපු ඔය මොහොමඩ් එදිරිස් කියන පුද්ගලයා ඉන්නවද?

පි : ඔව් ස්වාමිනි. එදිරිස් කියන පුද්ගලයා ඔතන ඔය පුද්ගලයා එදිරිස් ස්වාමිනි.

ප : මේ රතු පාටින් දැක්වෙන්නේ එදිරිස්?

පි : ඔව් ස්වාමිනි.

ප : ඉන් පසුව මොහොමඩ් රිෆයිඩීන් කියන පුද්ගලයා ඉන්නවද?

පි : ඔව්. ඒ පුද්ගලයා රිෆයිඩීන් සලෆි ස්වාමිනි.

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන මෙම ඡායාරූපය C 941 ලෙස ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප : දැන් මහත්මයා ඔබ දැන් හඳුනා ගත්තනේ මොහොමඩ් එදිරිස් සහ මවුලවි රිෆයිඩීන් කියලා පුද්ගලයෝ?

පි : ඔව් ස්වාමිනි.

ප : ඔවුන් මොනවද මේ අන්තවාදී සංවිධානත් එක්ක ඔවුන් කරන කර්තව්‍යයන් මොනවද?

පි : රිෆයිඩීන් කියන පුද්ගලයා ඒ කියන්නේ එදිරිස් කියන පුද්ගලයගේ ස්වාමිනි හොඳම ළඟම මිතුරෙක් ඥාතියෙක් ඔය රිෆයිඩීන් කියන පුද්ගලයා සලෆි ඒ කියන්නේ තවුහිද් සංවිධානයේ ඒ අදාළ ඒ පාසලක ඉගෙනුම ලබලා අධ්‍යාපනය ලබලා මවුලවිවරයෙක් වුන සලෆිවරයෙක්. ඒ කියන්නේ පරහදෙණියේම තමා ස්වාමිනි. එතුමා අරමුදල් සපයන කෙනෙක්. ඒ කියන්නේ ඔකට සෑහේන අනුබල දෙන කෙනෙක්. එදිරිස් කියන කෙනා ස්වාමිනි දැනට Digital way කියලා Studio එකක් කරන් යනවා. එයා IT

FAIR COMMENT BY JEZEEM

විශේෂඥයෙක් එයා. දැනට Proposition එක හැටියට කර ගෙන යන්නේ Digital way Studio එක. එයා photographer කෙනෙක් හැටියට වැඩ කරන්නේ. එයා තමා ඕක මෙහෙය වන්නේ ස්වාමිනි ඒ පුහුණු වීම් කරන්නේ ඔය පන්ති පවත්වන්නේ ඔතන වෙන මවුලවිවරුනුත් ඉන්නවා ස්වාමිනි.

ප්‍ර : දැන් මහත්මයා ඔබට තවත් ඡායාරූපයක් ඉදිරිපත් කරන්න පුළුවන්ද මේ මවුලවි රිස්වි සම්බන්ධයෙන් මේ ආයතනයට සම්බන්ධ?

පි : වෙන ඡායාරූප නෑ ස්වාමිනි මං ළඟ.

ප්‍ර : මෙම ඡායාරූපයේ කවුද දැක්වෙන්නේ මහත්මයා කවුද ඉන්නේ?

පි : මවුලවි රිස්වි නැගෙනහිර විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙක් මෙම පුද්ගලයා පාකිස්ථානයේ ක්‍රියාත්මක ෂියා විරෝධී ෂෙෆායි සබාබා ත්‍රස්ත සංවිධානයට අරමුදල් සපයන සහබාස් home සංවිධානයේ ශ්‍රී ලංකා න්‍යාය ආචාර්යවරයා වශයෙන් කටයුතු කරනවා.

ප්‍ර : දැන් මේ ඔබ කියන මේ මවුලවි රිස්වි යන පුද්ගලයා නැගෙනහිර විශ්ව විද්‍යාලය කියලා කියන්නේ අර හීරා පදනම යටතේ විවෘත කරන්න හදන එම විශ්ව විද්‍යාලයද නැත්නම් රජයේ නැගෙනහිර විශ්ව විද්‍යාලයේද රාජකාරී කරන්නේ?

පි : ඒ සම්බන්ධයෙන් තොරතුරක් මං හරියට සනාථ කර ගත්තේ නෑ ස්වාමිනි.

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන මෙම ඡායාරූපය C 942 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර : තවදුරටත් මහත්මයා ඔබ හිතනවද මෙම ෂෙෆායි සබාබා සංවිධානයට නැවතත් ලංකාවට මේ පාස්කු ප්‍රහාරය එල්ල කළා හා සමාන ප්‍රහාරයක් එල්ල කිරීමේ හැකියාවක් තියෙනවද?

පි : අනිවාර්යෙන් වර්තමාන තත්ත්වය අනුව හැකියාවක් නෑ ස්වාමිනි. ඒ කියන්නේ අනිවාර්යෙන් අපි දන්නවා ආරක්ෂාව තහවුරු වෙලා තියෙන්නේ ඒත් ස්වාමිනි ඔය වහබ්වාදය ව්‍යාප්ත වෙන එක නවත්වන්න තමා මං ඕක හෙළිදරව් කළේ ආරක්ෂක අංශවලට දැනුම් දුන්නේ ඒ කියන්නේ ඕක තවදුරටත් වැඩි වෙන්න ඉඩ දෙන්න එපා කියන එක තමයි මගේ මතය තිබුණේ ස්වාමිනි.

ප්‍ර : දැන් මහත්මයා මේ සාක්ෂි දෙන ගමන් සඳහන් කළා හාරූන් සහවී කියන මවුලවිතුමා ගැන?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : ඔහු යම් කිසි රාජ්‍ය නොවන සංවිධානයක් පිහිටුවා ගෙන සිටිනවද?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : මොකක්ද ඒ රාජ්‍ය නොවන සංවිධානය?

FAIR COMMENT BY JEZEEM
Presidential Secretariat Copy

පි : අල්කිම්මා සවුදි අල්කිම්මා සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාව පිහිටුවා ගෙන ඉන්නවා.

ප්‍ර : දැන් මේ අල්කිම්මා කියන සංවිධානයෙන් කුමන ආකාරයේ සංවිධානයක්ද?

පි : ඒක සවුදියේ තියෙන NGO සංවිධානයක්. ඉතින් ඒ අදාළ පුද්ගලයින් මේ රටට ඇවිල්ලා ශ්‍රී ලංකාවට ඇවිල්ලා විවිධ මාදිලියේ උදව් ලබා දෙනවා. ඉතින් එතන ඒ ගොල්ලන් අන්තවාදී පිරිසක්ද කියන එක මට සනාථ කරන්න බැහැ. ඒ වුනාට ඔය තරම් මුදල් වැය කරන්න හේතුවක් තියෙන්න ඕනේ ශ්‍රී ලංකාවට ඇවිල්ලා.

ප්‍ර : ඔවුන් ඒ තරම් මුදල් වැය කරනවා කියන්නේ ඔවුන් මොනවද මේ අල්කිම්මා සංවිධානය යටතේ කරලා තියෙන්නේ?

පි : ඒ ගොල්ලන් එතන වැඩි හරියක්ම හදන්නේ ඔතන ළිං ඒ වගේම සාමාන්‍ය අවශ්‍යතාවයන් තියෙනවා ඒ කියන්නේ ඔය ගෙදරකට අවශ්‍ය Toilet එකක් හරි මොනා හරි ඒක ප්‍රශ්නයක් නැහැ. ඔතන ප්‍රශ්නේ තියෙන්නේ ස්වාමිනි මුස්ලිම් දේවස්ථාන හදන එකයි ප්‍රශ්නේ. ඒ කියන්නේ සාමාන්‍යයෙන් ගමක මුස්ලිම් දේවස්ථානයක් තියෙනවා නම් එක මහ පල්ලියක් තියෙනවා නම් එතන පවුල් 400 ක් ජීවත් වෙනවා නම් ඒ 400 ම ඒකට යටත්වයි ජීවත් වෙන්නේ. එතනට තව පල්ලියක් අවශ්‍ය නෑ. ඒකයි ස්වාමිනි අපි කියන්නේ ඔතන ඕනේ නම් පල්ලියක් හදනවා පල්ලියක් හදපු ගමන්ම ඒ ගොල්ලන් එතන ඒ ගම දෙකට බෙදනවා ස්වාමිනි. ඒ ගම දෙකට බෙදුණු ගමන් ඔතන අන්තවාදය ව්‍යාප්ත වෙනවා. ආයි ඒ ගම දෙකට බෙදිලා වෙනම මතවාදයක් එතන ගොඩ ගන්නවා. ඒ වගේ පල්ලි මීටර් 100 න් 100 ට ඕනෑ තරම් තියෙනවා ස්වාමිනි අනුරාධපුර දිස්ත්‍රික්කයේ තියෙනවා. ඕනෑ තරම් තියෙනවා. ඒ වුනාට ආගම කියන්න යන්නවත් කවුරුත් නෑ ස්වාමිනි.

ප්‍ර : දැන් මොහු ඔබ සඳහන් කළානේ මොහු හිස්බුල්ලා හිටපු ආණ්ඩුකාරතුමාගේ ළඟම හිතවතෙක් කියලා?

පි : ළඟම හිතවතෙක් ස්වාමිනි.

ප්‍ර : ඔබ දැකලා තියෙනවද ඔවුන් එකට ඉන්නවා?

පි : අනිවාර්යෙන් ස්වාමිනි.

ප්‍ර : ඔබට ඒ සම්බන්ධයෙන් ඡායාරූප ඉදිරිපත් කරන්න පුළුවන්ද මහත්මයා?

පි : ඔව්.

ප්‍ර : හාරූන් සහ හිස්බුල්ලා ආණ්ඩුකාරතුමා එකට ඉන්න ඡායාරූප ඉදිරිපත් කිරීමේ හැකියාවක් තියෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි : ඔතන හිස්බුල්ලා සමඟ ඉන්නේ ස්වාමිනි හාරූන් සර්වේ මවුලවිතුමා තමා.

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන මෙම ඡායාරූපය C 943 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර : මහත්මයා දැන් මේ අල්කිම්මා සංවිධානය ISIS මතවාදය ප්‍රචාරය කරන සංවිධානයක්ද?

පි : නෑ ස්වාමිනි අල්කිම්මා සංවිධානයයි ISIS මතවාදය ප්‍රචාරණය කරන සංවිධානයක් නෙවෙයි. ඒ වුනාට ස්වාමිනි ISIS කියන සංවිධානයේ බිහිවීමත් සමඟ නොයෙකුත් සංවිධාන තවුහිද් ජමාත් සංවිධාන වෙන්න පුළුවන් ඒ හාරූන් සර්වේ මවුලවිතුමා වෙන්න පුළුවන් දැන් ඔතන මෙතන මේ පින්තූරෙත් තියෙන්නේ එතුමා 2014/2015 වකවානුවල වාලච්චේනයේ උද්ඝෝෂණයක් කරලා තියෙනවා IS එකට තමන්ගේ ප්‍රසාදය පල කරලා IS කොඩිය ඔසව ගෙන.

ප්‍ර : කවුද?

පි : හාරූන් සර්වේ මවුලවිතුමා.

ප්‍ර : කොයි කාලේද උද්ඝෝෂණයක් කරලා තියෙන්නේ?

පි : 2015 වකවානුවේදී 2015/2016 වාලච්චේනවල.

ප්‍ර : ඊට අදාළව ඔබ ඡායාරූපයක් ඉදිරිපත් කළාද?

පි : ඔව් ස්වාමිනි. ඔතන තියෙන ඡායාරූපය තමයි.

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඡායාරූපයක් ඉදිරිපත් කරනවා.

ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන මෙම ඡායාරූපය C 944 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර : දැන් මහත්මයා මෙම ඡායාරූපයේ මොකක්ද දැක්වෙන්නේ C 944?

පි : ස්වාමිනි හාරූන් සර්වේ මවුලවිතුමා ඇතුළු තවත් එතන රියාල්ඩීන් කියලා එයාගේ අනුගාමිකයෙකුයි අදාළ පිරිස IS කොඩිය ඔසවාගෙන යන්නේ. IS කොඩියක් කියලා අපි සනාථ කරන්නේ ස්වාමිනි IS කොඩියේ තියෙන මුද්‍රාව ඒ ලායිලා හයිලල්ලා කියන මුද්‍රාව අනිකුත් තියෙන ඔය වැකියයි ඕක නබිතුමාගේ අතේ තිබ්බ මුද්දේ තිබ්බ මුද්‍රාව. ඕකයි ඔය IS වරුන් ඔය කොඩියට ඔය ධජයට යොදා ගත්තේ ස්වාමිනි. ඉතින් ඔතනදී සනාථ වෙනවා ඕකක් edit එකක් කියලා තමා ගොඩක් කට්ටිය කිව්වේ ස්වාමිනි ඕක edit එකක් නෙවෙයි ඒ ගොල්ලන් ඒ දවස්වල ඒ ගොල්ලන් ස්වාමිනි IS කියන සංවිධානය ඒ ගොල්ලන්ගේ ක්‍රියා මාර්ග හරි කියලා ඒ ගොල්ලන් විශ්වාස කළා. ඒ කියන්නේ ඒ ගොල්ලන් ඔය හැම තවුහිද් ජමාත් සංවිධානයක්ම කිලාෆතය විශ්වාස කරන

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

හන්දා ඔය කිලාෆත් කියලා එකක් එනවා අනිවාර්යෙන් ගැලවුම්කරුවෙක් එනවා මහදි කියලා චරිතයක් එනවා සමහර විට භද්‍රාදී කියන්නේ මහදි කියන චරිතය දන්නේ නෑ. සමහර විට ඕසාමා බිල්ලාඩන් කියන්නේ මහදි කියන චරිතයද දන්නේ නෑ කියලා අපේ සෑහෙන බොළඳ විශ්වාස තිබ්බා ස්වාමිනි. පස්සේ ඒ ගොල්ලන් තේරුම් ගත්තා.

ප්‍ර : දැන් මහත්මයාට කියන්න පුළුවන්ද මෙම ඡායාරූපය අරන් තියෙන්නේ කොහේද කුමන ස්ථානයේද කියලා?

පි : වාලව්චේන වල පාසලක.

ප්‍ර : ශ්‍රී ලංකාවේ?

පි : ශ්‍රී ලංකාවේ වාලව්චේනවල.

ප්‍ර : මේ පිටිපස්සෙන් දැක්වෙන ගොඩනැගිලි ඔබ හඳුනනවද?

පි : ඒ වාලව්චේනවල පාසලක් කියලා තමා සනාථ කර ගත්තේ ස්වාමිනි.

ප්‍ර : වාලව්චේනයේ පාසලක්? මේ කොයි කාලේද මේ ඡායාරූපය අරන් තියෙන්නේ?

පි : 2015/2016 ස්වාමිනි.

ප්‍ර : ඒ වකවානුව?

පි : ඒ වකවානුව තුළ.

ප්‍ර : මේ ඡායාරූපයේ මේ දමිළ භාෂාවෙන් ලියලා තියෙන්නේ මොකක්ද?

පි : ඊශ්‍රාලයේ උන් මට ඒ තරම් දමිළ භාෂාව දන්නේ නෑ ස්වාමිනි මම සිංහල මාධ්‍යයෙන් ඉගෙන ගත්තේ.

ප්‍ර : මොකක්ද ඒකේ තේරුම?

පි : එතන ඊශ්‍රායල් රාජ්‍යයට ඒ ගොල්ලන් ඒ කොහොම හරි ඔතන තියෙන්නේ protect එකක් ස්වාමිනි. මං ඒක දමිළෙන් කියවිනන මං ඒ තරම් මම දන්නේ නෑ සිංහල.

ප්‍ර : දැන් ඔබට මෙතන හඳුනා ගත හැකි පුද්ගලයෝ කවුද ඉන්නේ?

පි : ඔය හාරූන් සර්වේ මවුලවිතුමා ඉන්නවා.

ප්‍ර : මේ curser එකෙන් පෙන්වන තැන ඉන්නේ කවුද?

පි : හාරූන් සර්වේ මවුලවිතුමා.

ප්‍ර : මවුලවිතුමා. ඒ කියන්නේ ඔබ සඳහන් කරන්නේ මේ ඡායාරූපයට අනුව මේ හාරූන් සහාබි කියන හිස්බුල්ලා ඇමතිතුමාගේ ඉතාමත් ළඟ පුද්ගලයෙක් වෙන මවුලවිතුමා 2015/16 වකවානුවේදී ISIS මතවාදය හොඳ යනුවෙන් උද්ඝෝෂණවලට සහභාගි වුණා කියලා?

පි : අනිවාර්යෙන්ම ස්වාමිනි.

ප්‍ර : මහත්මයා

FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : මෙහි තව ඔබ අඳුරන කට්ටිය ඉන්නවද මේ ඡායාරූපවල ?

පි : ඔතන රියාල්දීන් කියලා පුද්ගලයෙක් ඉන්නවා ඔතන වම් පැත්තෙන් ස්වාමිනි එතන රතු පාට ටී ෂර්ට් එකක් ඇඳගෙන කළු පාට ඔය පුද්ගලයා.

ප්‍ර : ඒ පුද්ගලයා කවුද?

පි : එයා හාරූන් සර්වේ මවුලවිතුමාගේ ළඟම ආත්ම ආරක්ෂකයෙක් හැටියට එයා සේවය කරන කෙනෙක් රියාල්දීන් කියලා.

ප්‍ර : දැන් මහත්මයා මෙම සිද්ධිය ඇති වුණේ ඔබේ මතකේ හැටියට 2015/16 කියන්නේ ආණ්ඩු පෙරළියක් ඇති වෙච්චි සමයක්නේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : ඒ ආණ්ඩු පෙරළිය ඇති වීමට ප්‍රථමද නැත්නම් ආණ්ඩු පෙරළිය ඇති වුණායින් පස්සේද?

පි : ඕක ආණ්ඩු පෙරළිය ඇති වුණායින් පස්සේ වෙච්ච දෙයක් 2015/2016 අතර

ප්‍ර : කියලා තමයි ඔබට මතක?

පි : 2014 නෙවෙයි අපිට දැන ගන්න ලැබුණේ එහෙමයි ස්වාමිනි 2015 ත් 2016 ත් අතර.

****

දැන් වේලාව : ප.ව.06.55 යි.
මෙතැන් සිට ල/ලේ :- සචිනි මෙය.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව.06.55
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: දැන් මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවේ දී යම්කිසි මතයක් පළවුණ බව ඔබ දන්නවද?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: මොකද්ද ඒ සිදුවීම ඔබට පැහැදිලි කරන්න පුළුවන් ද මේ කොමිෂන් සභාවට?

උ: ඔව් ස්වාමීනි පාර්ලිමේන්තු විශේෂ තේරීම් සභා කමිටුවේ දී ඔය සම්බන්ධව හිස්බුල්ලා ආණ්ඩුකාරවරයගෙන් ඒ වගේම අබ්දුල් රාසික් කියන තවුහිද් ජමාත් සංවිධානයේ නායකයගෙන් ප්‍රශ්න කරනවා ඔය IS කොඩියක් ද එහෙම නැත්නම් ඕක ලංකාවේ ද කියලා. එතකොට එතැන දී එතුමා ප්‍රකාශ කළේ ස්වාමීනි දෙදෙනාම ප්‍රකාශ කළේ ඕක IS කොඩියක් ද කියලා අපිට හරියටම කියන්න බැහැ. ඕක ලංකාවේ වෙච්ච සිද්ධියක් ද කියලත් හරියට කියන්න බැහැයි කියලා ස්වාමීනි.

ප්‍ර: තමයි ඔවුන් ඒ මතය ප්‍රකාශ කළේ?

උ: එහෙමයි ප්‍රකාශ කළේ ස්වාමීනි.

ප්‍ර: දැන් මහත්මයට කියන්න පුළුවන් ද මේ හාරූන් සාබී කියන මවුලවීවරයා අරාබි ජාතික මවුලවීවරුන් සමඟ සබඳතා පවත්වනව ද නැද්ද කියලා?

උ: අනිවාර්යෙන්ම සම්බන්ධතා පවත්වනවා. ඒ කියන්නේ අල්කිමා කියන්නෙත් අරාබි ජාතික සංවිධානයක්. එහි අනුශාඛා තමයි පිහිටවලා තියෙන්නේ ස්වාමීනි. ඒක හින්දා අනිවාර්යෙන් සම්බන්ධතා පවත්වනවා.

ප්‍ර: මහත්මයට සඳහන් කරන්න පුළුවන් ද ඔය දැන් අල්කිමා කියලා සංවිධානයක් තියනවා කිව්වනේ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඔවුන්ගේ තියෙනව ද මේ විදේශ පුද්ගලයින් මේ විදේශගත වීමේ ආයතනයක්?

උ: ඔව් ස්වාමීනි. මේ ගොල්ලොන්ගේ තියෙනවා ස්වාමීනි අල්කිම්මා travel කියලා එකක් ස්වාමීනි. ඒ හාරූන් සාවී මවුලවීතුමා ඒකේ ප්‍රධාන කර්තව්‍යය කරන්නේ. ඒකෙන් උම්රා වන්දනාව සඳහා ඒ කියන්නේ අපේ මක්කම වන්දනාව කිරීම සඳහා මේ පිරිස් ගෙන යනවා. එවැනි සිද්ධියක් සිද්ධ වුණාම ඔය පාස්කු ප්‍රහාරයට කලින් හෝ ඉන් පස්සේ මිල්හාන් කියලා පුද්ගලයෙක් අත්අඩංගුට පත්වුණා. ඒ කියන්නේ ඒ රටට ගිහිල්ලා අරන් ආවයි කියලා ඒ ගියෙත් ඔය හාරූන් සාවී මවුලවිතුමාගේ අල්කිම්මා travel එකෙන්ම තමයි ස්වාමීනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ කියන්නේ මේ පාස්කු ප්‍රහාරයේ සැකකරුවෙක් වන මොහොමඩ් මිල්හාන් කියන පුද්ගලයා සවුදි අරාබියට ගියේ මේ අල්කිම්මා travel කියන ආයතනය පාවිච්චි කරලා කියලද?

පි: අනිවාර්යෙන් ස්වාමිනි.

ප්‍ර: ඔහු එම ස්ථානයට ගිහිල්ලා තියෙන්නේ මේ සවුදි අරාබියට වන්දනා නඩයක් සමඟද?

උ: ඔව් වන්දනා නඩයක් සමඟ තමයි ගියේ.

ප්‍ර: එතකොට ඔහු පැමිණිලා තියෙනවද නැවත ඒ නඩයත් සමඟ ?

උ: නැහැ. එනකොට ඒ ගොල්ලන් නැවත එන කොට ඒ මිල්හාන් කියන පුද්ගලයා පැමිණිලා සිටියේ නැහැ. නැවත මං හිතන්නේ ආරක්ෂක අංශ තමා ගිහිල්ලා ඔහුව අත්අඩංගුවට ගත්තෙ ස්වාමිනි. ඒ පුද්ගලයා තමයි ස්වාමිනි.

ප්‍ර: ඔබ මිල්හාන් කියන කෙනාගේ ඡායාරූපයක් මෙම ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

උ: මා සතුව ඔය ඡායාරූපය විතරයි තියෙන්නේ ස්වාමිනි.
ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන මෙම ඡායාරූපය C 945 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර: මහත්මයා මේ C 945 යට පින්තූරයෙන් වම් පැත්තෙන් යට පින්තූරය දකින්නේ කවුද ?

උ: ස්වාමිනි මිල්හාන් කියන පුද්ගලයා ස්වාමීනි එතන එකේ තියෙනවා වර්ණ ඡායාරූපයක් තියෙනවා ස්වාමිනි.

ප්‍ර: එය ඔබට ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන් ද?

උ: පුළුවන් ස්වාමීනි.

ප්‍ර: දැන් මේ මොහොමඩ් මිල්හාන් දැක්වෙන ඡායාරූපයට අමතරව තවත් ඡායාරූප කීපයක් දැක්වෙනවා. දැන් ඔබ කිව්වානේ දැන් ඔබ හඳුනා ගත්තානේ මිල්හාන් කියන පුද්ගලයෙක් ගැන?

උ: මේ මිල්හාන් කියන පුද්ගලයා කියන්නේ මේ පාස්කු ප්‍රහාරයේ සැකකරුවෙක් බවට පත් වූ පුද්ගලයා කියලා කිව්වොත් නිවැරදිද?

උ: ඔව් එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කියන්නේ මේ සෞදිඅරාබියේදි මේ අත්අඩංගුවට පත්වුණ පුද්ගලයා කියලා කිව්වොත් නිවැරදියිද?

උ: එහෙමයි ස්වාමිනි.
මිල්හාන් යන පුද්ගලයා ස්වාමිනි සාකෂිකරු විසින් හඳුනා ගන්නවා. එය C 945 A වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර: මේ මිල්හාන් සම්බන්ධයෙන් මිල්හාන් යම්කිසි උද්ඝෝෂණයකට සහභාගිවෙලා තියෙනවද මහත්මයා?

උ: නෑ ඒ සම්බන්ධව ආරංචියක් නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔහු ඔබ මේ එකතු කරේ මිල්හාන්ගේ ඡායාරූපයක් පමණයි මෙතැන්ට?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ඔව් ස්වාමිනි .

ප්‍ර: දැන් මේ ඡායාරූපෙයේ C 945 ඡායාරූපයේ තියෙන ලේඛනයේ තවත් ඡායාරූප දැක්වෙනවා මේ ඉහළින් දැක්වෙන ඡායාරූපයේ මොනවද තියෙන්නේ?

උ: ඔතන පොලිසියේ නිලධාරී මහත්මයෙක් එතන මාක් කරලා තියෙනවා. ඉතින් එතනදී ලැබුණු තොරතුරුවලට අනුව හාරුන් මවුලවිතුමා සම්බන්ධව යම් කිසි පරික්ෂණයක් කරන්න කියලා ඉහළ නියෝගයක් එන අවස්ථාවලදි මෙම ස්ථානාධිපති තුමා වාලච්චේන පොලිස් මුලස්ථානයේ ස්ථානාධිපතිතුමා එහෙම නැහැයි කියලා ඔහු සම්බන්ධව එහෙම ප්‍රශ්නයක් නැහැයි කියලා ඒ විදියේ හොඳ වර්තාවක් ලබා දෙනවා කියලා ඔහුට සාපේක්ෂව ලබා දෙනවා කියලා එහෙම පුද්ගලයෙක් කියලා තමා ඔහු සම්බන්ධව තොරතුරක් වාර්තා වුණේ ස්වාමීනි.

ප්‍ර: ඔබ ඔය සඳහන් කරානේ ඔය OIC වරයා ඔබට හදුනා ගන්න පුළුවන් ද නමක් දන්වාද?

උ: ඔහුගේ නම මට කියා ගන්න අපහසුයි ස්වාමිනි මට ඒක ඉදිරියේදී කියන්න පුළුවන් ස්වාමිනි ඔතන වාලච්චේනයේ සිට 45 KM දුරින් වලින් උර්තු වෙන්නයි ප්‍රදේශයේ තාවකාලික පොලිසියක් විවෘත කල අවස්ථාවකට සහභාගි වුණ පිරිස ස්වාමිනි.

ප්‍ර: මේ පිරිස අතර කවුද ඉන්නේ?

උ: හාරුන්සාවී මවුලවිතුමා ඉන්නවා ඉන් අනතුරුව ඉන්න අදාළ පොලිසියේ නිලධාරීන් මඩුල්ල මං දැන්නේ නැහැ.

ප්‍ර: හාරුන්සාවී මවුලවිතුමා ඔබට පෙන්වන්න පුළුවන්ද?

උ: ඔව් ඔතන ඒ පොලිස් නිලධාරින් ,ඉහළ නිලධාරීන් දෙදෙනා මැද්දේ ඉන්නේ හාරුන්සාවී මවුලවිතුමා.

ස්වාමිනි එම ඡායාරූපය C 945 B වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

ප්‍ර: මහත්මයා ඔබට සඳහන් කරන්න පුළුවන්ද මීට අමරතව බක්මිටියාව තිඹිරිගොල්ල රක්ෂිත වනාන්තරය සම්බන්ධයෙන් මේ සම්බන්ධයෙන් ඔබට යම් කිසි අධ්‍යනයක් කරාද?

උ: ඔව් ස්වාමිනි ඔට්ට මඩු රක්ෂිතයේ වන විනාශයක් සිදුවෙන බවටත් එහේ සොහොන් කොත් වන්දනාවක් සිදුවෙන බවටත් තොරතුරු වගයක් හෙළිවුණා එතන දී ඒ සම්බන්ධව අපි අධ්‍යයනය කරා අධ්‍යයනය කරපු අවස්ථාවක.

ප්‍ර: මේ රක්ෂිතය තියෙන්නේ කොහේද මහත්මයා? මේ තිඹිරිගොල්ල රක්ෂිත වනාන්තරය කොයි පළාතේ ද තියෙන්නේ මහත්මයා?

උ: අම්පාර දිස්ත්‍රික්කයේ.

ප්‍ර: මේ රක්ෂිතයක් බවට පත් කරේ ගැසට් නිවේදනයකින්ද?

FAIR COMMENT BY JEZEEM

උ: ඔව් ස්වාමිනි.

ප්‍ර: ඒ ගැසට් නිවේදනය 2010 ඔක්තෝම්බර් 01 වන දින 1673/45 ගැසට් නිවේදනය කිව්වොත් නිවැරදි ද?

උ: ඔව් අනිවාර්යෙන් ස්වාමිනි.

ප්‍ර: ඒ ගැසට් නිවේදනයට අනුව මෙය රක්ෂිතයක් බවට කරලා තියෙන්නේ 2010 වර්ෂයේ කියලා කිව්වොත් නිවැරදිනේ?

උ: ඔව් ස්වාමිනි 2010 දි.

ප්‍ර: ඒ රක්ෂිතයට මොකක්ද මහත්මයා සිද්ධවෙලා තියෙන්නේ මේ වෙන කොට?

උ: ඔතන දී ස්වාමිනි ඔතන ඔය රක්ෂිතය තුළට යම් අමාත්‍යවරයෙක් එතැන්ට පැමිණිලා වන විනාශයක් කරනවා කියලා පුෂ්පරාජා කියලා පළාත් සභා මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කරලා තියෙනවා.

ප්‍ර: කවුද ඔය වන විනාශය කරන්නේ ?

උ: ඔතන රවුල් හකීම් කියන මන්ත්‍රීවරයා සම්බන්ධයෙන් තමයි හෙළිදරව්ව කරේ.

ප්‍ර: ඔහු මොක්කද සිද්ධ කරන්නේ ඒ අනුව මහත්මයා?

උ: ඔතන තියෙන ඡායාරූපවලින් සනාථ වෙන්නේ ස්වාමිනි එහෙම එතන සඳහන් වෙන්නේ සොහොන් කොත් වදින ආකාරයක් . එහෙට එතුමා සහභාගි වෙන ආකාරයක් විතරයි මේ ඡායාරූපවලින් තියෙන්නේ එතනින් එහාට ගිය කිසිම තොරතුරක් මෙතන නැහැ. එත් ස්වාමිනි ඔතන සිද්ධ වෙන්නේ බ්‍රහස්පතින්දා සොහොන් කොත් වදින ආකාරයෙන් එතන ජනතාව මුලාවට පත්කරලා බ්‍රහස්පතින්දා රාත්‍රියේ කට්ටිය සොහොන් කොත් වදින්න කියලා ඇතුල්වන පිණිස. සිකුරාදා හැන්දෑ වෙනකන් ඒ කොටි වලස්සු ඉන්න ඒ වනාන්තරයේ ඉඳලා තියෙනවා 25 ට,30 ට ආසන්න තරුණයෝ පිරිසක්. එතනදී මේ ගොල්ලන් ඒ දවසත් පුරාවට මොකක්ද කරේ කියන එක ප්‍රශ්නයක් ඒ වගේම එතන ඇතුල් වෙන්න එපායි කියලා මෙවැනි ඡායාරූපයක් මෙතනදී හරක් දෙන්නෙක්ගේ බෙලි කපලදාලා එතන ඒ ගොල්ලන් දෙමළින් ඒ ගොල්ලන් පුරුවක් පලකරලා තියෙනවා එච්චරික්කෙයි කියලා ගහලා මින්මත්තට මේ දේමයි සිදු වෙන්නේ මේකට ඇතුළු වෙන පුද්ගලයින්ටත් කියලා අල්ලාහු අක්බර් කියලා අල්ලාහ් අති ශ්‍රේෂ්ඨයි කියලා වැකියක් සනාථ කරනවා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: ඒ ඇමතිවරයා සම්බන්ධ මොකක්ද ඒකට?

උ: ඇමතිවරයා එතැනට ගිහින් සොහොන් කොත් වදින එක විතරයි එතැන තියෙන සම්බන්ධය ස්වාමිනි. එච්චරයි සනාථ කර ගන්න පුළුවන් වුණේ ස්වාමීනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: ඇමතිවරයා එම ස්ථානයට ගිහිල්ලා සොහොන් කොත් වඳින්නට අදාළ ඡායාරූපයක් ඔබ සතුව තියෙනවද?

උ: අනිවාර්යෙන්

ප්‍ර: එය ඔබට මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

උ: පුළුවන් ස්වාමිනි.

****

<u>ගරු අදිකාරි මැතිණිය.</u>

ප්‍ර: ඔබ ඔය සඳහන් කළ අමැතිවරයා ගිහිල්ලා සොහොන් කොතක් වඳිනවා කියලා ඔබ ප්‍රකාශ කරානේ එතන ඇත්ත වශයෙන්ම සොහොන් කොතක් තියෙන ස්ථානයක්ද?

උ: සොහොන් කොතක් තිබ්බ ස්ථානයක් නෙමේ ස්වාමිනි සොහොන් කොතක් නිර්මාණය කරලා තියෙනවා එතැන. ඒ රක්ෂිතය තුළ සොහොන් කොතක් 20 km එහා සොහොන් කොතක් නිර්මාණය කරලා මේ ගොල්ලන් ඇයි ඔතන එහෙම වත්පිළිවෙත් කරන්න අවශ්‍යතාවය කියලා දන්නේ නැහැ. එතනදි ඇයි මෙතුමා එතැන්ට ගියේ කියන එක ප්‍රශ්නයක්.

ප්‍ර: නිර්මාණය කරලා තියෙන්නෙත් මේ කණ්ඩායම ද සොහොන් කොත?

උ: ඔය කණ්ඩායම.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර: දැන් ඔබ කිව්වානේ මේ සොහොන් කොත නිර්මාණය කරලා තියෙන්නේ යම් කණ්ඩායමක් කියලා මොන කණ්ඩායමද?

උ: ඔක අපිට තොරතුරු ලැබුණේ සහරාන් ඇතුළු කණ්ඩායම ඔතන යුධ පුහුණුවීම් කරන්න යොදා ගත්තායි කියලා තමයි තොරතුරු ආවේ ස්වාමිනි.

ප්‍ර: දැන් මං අහන්නේ මේ සොහොන් කොතක් කියලා කිව්වානේ ඔබ?

උ: ඔව් .

ප්‍ර: ඒක නිර්මාණය කරේ කවුද ?

උ: නිර්මාණය කරන්න එතැනදි අනිවාර්යෙන් දේශපාන වශයෙන් අනුබල දුන්නේ එතන හිටපු ඒ අදාළ අමාත්‍යවරයා වෙන්න ඕන.

ප්‍ර: කවුද අමාත්‍යවරයා?

උ: ආමාත්‍යවරයා හිටියේ රවුල් හකීම් අමාත්‍යවරයා එවකට අධිකරණ ඇමති වශයෙන් කාලේ හිත්නේ ඒ වකවානුව තුළ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ස්වාමිනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ඡායාරූප තුනක් අඩංගු ලේඛනය C 946 වශයෙන් ලකුණු කිරීමට අවරස පතනවා. එම C 946 ඡායාරූපයේ රවුම් හකීම් ඇමතිවරයා වශයෙන් සාක්ෂිකරු වශයෙන් පෙන්නුම් ඇමතිවරයා සිටියේ යැයි සාක්ෂිකරු විසින් පෙන්නුම් කරන ඡායාරූපය C 946 A වශයෙන් ලකුණු කිරීමට අවසර අයැදිනවා.

උ: ස්වාමිනි මෙතනදි ඔය ලැබුණු තොරතුරු ටික විතරයි මට ඔයින් ඕකෙන් එහාට ඔබ්බට ගිහිල්ලා එතුමයි ඔතන වන විනාශය සිදු කරේ එතුමාමයි ඒක කරේ කියලා මට සනාථ කරන්න බැහැ. ඒත් ස්වාමිනි මාධ්‍ය හමුවේදී හෙළිදරව්ව කරන අවස්ථා වලදී විවිධ නොයෙකුත් පාර්ශව ඕක දේශපානය වශයෙන් පාවිච්චි කරන්න සැහෙන උත්සහායක් දැරුවා එතුමාමයි කරේ කියලා ප්‍රකාශ කරන්න කියලාත් බලකිරීම් කරා.

ප්‍ර: කවුද ඒසේ බලකිරීම් කරේ?

උ: ප්‍රංශයේ සිටින තුෂාර පීරිස් කියලා පුද්ගලයෙක්. නාමල් කුමාර හා සම්බන්ධ වුණු ඒ Case එකේ ඉන්න පුද්ගලයා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර: තමන් මොකද්ද ඒ එක්කෙනෙක් කියපු නිසා තමන් කියන්නේ මේක?

උ: නැහැ ස්වාමිනි වෙන එක්කෙනෙක් කියපු හින්දා නෙමෙයි ස්වාමිනි. මං ඔතනදී ඔතන තොරතුරු ලැබුණා ආකාරයක් තියෙනවා නමුත් මේ තොරතුරු වල මෙකෙන් එහාට ගිහිල්ලා මෙයාමයි කරේ කියලා මට කියන්න බැහැ. මං මාධ්‍ය හෙළිදරව්වේ කිව්වේ මට දන්න තොරතුරු ටික විතරයි.

ප්‍ර: සහරාන්ගේ කණ්ඩායම එතන හිටියයි කියලා කියන්නේ කොහොමද?

උ: හිටියේ කියලා මං දැක්කේ නැහැ ස්වාමිනි. මං දැකපු දෙයක් නෙමේ මේ කිසිම දෙයක් මං ඇහෙන් දැකපු දෙයක් නෙමේ ම ස්වාමිනි ලැබුණු තොරතුරු අනුව කියන දේවල් ස්වාමිනි.

ප්‍ර: ඒ තොරතුරු කොහෙන්ද ලැබුණේ?

උ: තොරතුරු ලැබුණේ වැඩි හරියක්ම 75% ක්ම තොරතුරු ලැබිලා තියෙන්නේ නජීබ් කියන පුද්ගලයාගෙන් තමයි ස්වාමීනි.

ප්‍ර: කවුද නජීබ් කියන්නේ?

උ: ඒ අදාළ ෂෙෆෙයි සංවිධානයේ අදාළ පුද්ගලයාම තමයි ස්වාමීනි.

ප්‍ර: දැන් කොහේද ඉන්නේ එයා?

උ: එයා ඔට්ටමාඩුවල ඉන්නේ ස්වාමීනි.

****

FAIR COMMENT
BY JEZEEM

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: මහත්මයා දැන් අපි වෙනස් වෙනස්ම කාරණයකට යන්. ලංකාව තුළ ජිහාඩ් සංවිධාන තියෙනවනේ?

උ: ලංකාව තුළ ජිහාඩ් සංවිධාන තියෙනව ද කියලා ඒ කියන්නේ මෙහෙමයි ස්වාමීනි මුස්ලිම් කොංග්‍රසය පටන් ගැන්මත් සමඟම අෂ්ෆත් මැතිතුමා ඉන්න කාලේ ඉඳලම යම් යම් ප්‍රශ්න තිබ්බා දෙමළ සංවිධාන වලින් ඒ කොටි සංවිධානව වෙන්න පුළුවන්. ඒකට එරෙහිව මුස්ලිම් තරුණයෝ ක්‍රියාත්මක වුණා. ඒ වගේම ග්‍රාම ආරක්ෂක හමුදාවේ හැටියට සමහරක් කට්ටිය අරගෙන පුහුණුවීම් කරා. ඒ පුහුණුවීම් කරපු වේලාවේ අපේ මුස්ලිම් තරුණයෝ පුහුණු වුණා. ඒකේ වැඩි හරියක්ම තවුහිද් සංවිධානයට අදාළ කට්ටියත් හිටියා. ඉතිං ඔය කිලාෆර් කියන එක ගොඩක් කට්ටිය විශ්වාස කරන හින්දා ස්වාමීනි කුඩා කුඩා කණ්ඩායම් ඒ ගොල්ලන් බිහි වෙනවා. ඔය ජිහාඩ් සංවිධාන වශයෙන් ක්‍රියාත්මක වෙනවා. ඒ වුණාට ඕක ලංකාවට තර්ජනයක් වෙනවා කියලා මං කියන්නේ නැහැ ස්වාමීනි. ඒ වුණාට අනිවාර්යෙන්ම මුස්ලිම් කොංග්‍රස් එක යටතේ එවකට ඒ වගේ සංවිධාන ක්‍රියාත්මක වුණා ස්වාමීනි. ඒකෙන් පුරුදු වෙච්ච කට්ටිය අනන්තවත් ඉන්නවා දැනටත් පිටරට වල සේවය කරනවා ස්වාමීනි. මුහුදුවූර්වල ඒ ගොල්ලන්ගේ පුහුණුවීම් කටයුතු කරපු අනන්තවත් උදවිය දැනටත් පිටරටවල ඉන්නවා ස්වාමීනි. ඒ කියන්නේ මං ආගමික කෙනෙක් වශයෙන් මං ඒක ස්ථිරවම ප්‍රකාශ කරනවා එච්චරයි ස්වාමීනි.

ප්‍ර: ඔබට සඳහන් කරන්න පුළුවන් ද ජිහාඩ් සංවිධාන කියක් විතර ලංකාවේ තියෙනවද කුමන ප්‍රදේශවලද සාමාන්‍යයෙන් තියෙන්නේ කියලා?

උ: වැඩිහරියක්ම ඔය මතවාදය ඔය ජිහාඩ් සංවිධානය ඔය කිලාෆත් කියන මතවාදය වැඩිහරියක්ම තියෙන්නේ ඔය කාත්තන්කුඩි වගේ ප්‍රදේශවල තමා. ඒ හැරෙන්නට කොළඹ ප්‍රදේශයේ ඒවත් අනිකුත් ප්‍රදේශවල ඔය වගේ ප්‍රශ්න තිබ්බේ නැහැ. එහෙන් බිහි වෙච්ච දේවල් තමා ඔය හැමදේම ස්වාමීනි.

ප්‍ර: මහත්මයා ඔබ තවදුරටත් ඔබට පැහැදිලි කරන්න පුළුවන් ද මේ ජමාතුල් මුස්ලිමීක් කියන සංවිධානය ගැන?

උ: ජමාතුල් මුස්ලිමීන් කියන්නේ උමර් අලි කියන පුද්ගලයෙක් යටතේ ඒ කාල පුත්තලම බිහිවෙච්ච සංවිධානයක්. කුඩා කණ්ඩායමක්. ඒ සංවිධානයේ ඒ ගොල්ලන්ගේ තියෙන්නේ කිලාෆත් මතවාදයේමයි. එතැන තියෙන ප්‍රශ්නය ස්වාමීනි ඒ ගොල්ලන් ඔය කුඩා කුඩා පල්ලි වශයෙන් ඒ කියන්නේ හතරදෙනෙක් ඉන්නව නම් ස්වාමීනි හතරදෙනෙක් විතරක් වත්පිළිවෙත් කරන්න. ඒ ගොල්ලොන්ට වෙනම පල්ලියක්. මීටර් 100 කින් එහා 400 ක් වදින පල්ලියක් තිබියදී තවත් පල්ලියක් මෙතැන. ඒ ගොල්ලන් අපිව සාමාන්‍යයෙන් ඒ ගොල්ලන්

FAIR COMMENT BY JEZEEM

බලන්නේ ඒ ගොල්ලන් හැරෙන්නට අනෙකුත් සියල්ලෝම මුස්ලිම් සියල්ලම කාෆීර්වරු හැටියට. ඒ ගොල්ලන් විතරයි මුස්ලිම්වරු හැටියට ඒ ගොල්ලන් සලකන්නේ.

ප්‍ර: ඒ කියන්නේ ජමාතුල් සංවිධානයේ අනෙක් සංවිධාන වල කට්ටිය කාෆීර්වරු විදියට සලකනවා?

උ: අනිවාර්යෙන්ම.

ප්‍ර: ඔවුන්ට අධාර ලැබෙන්නේ කොහෙන්ද මහත්මයා?

උ: ඔවුන්ට ආධාර ලැබෙන ආකාරයක් සම්බන්දව නැහැ. ඒ ගොල්ලොන් තුළම ඒ ගොල්ලන් එකතු කරගන්න දේවල් තමයි. වැඩියෙන් ඒවා ක්‍රියාත්මක වෙන්නේ පුත්තලම ඒතාල හොරාපොල කැකිරාව අනුරාධපුර ප්‍රදේශයේ.

ප්‍ර: දැන් මොවුන්ගේ මතවාදයේ මොකක් හරි තියෙනව ද ඔවුන්ට ස්වර්ගයට යන්න පුළුවන් මේ මහාදී පාලනයට එකතු වෙන්න පුළුවන් කියලා එහෙම මතවාදයක් තියෙනව ද?

උ: අනිවාර්යෙන්ම ඒක දේව සංකල්පවාදය විශ්වස කරන සෑම මුස්ලිම්වරයගේම මතවාදය අන්තිම අවසන් ඒ ගොල්ලන්ගේ කැමැත්ත මහදි කියන චරිතය එක්ක එකතුවීම. මේක ඉතිං මම කියන්නේ ස්වාමීනි මම සාමාන්‍යය මගේ සමාජයේ ඉන්න කට්ටිය දැන් බලන්නේ ආගම් විරෝධියෙක් හැටියට. ආගම පවලා දුන්න කෙනෙක් හැටියට. ඒ කියන්නේ ස්වාමීනි මට දැන් මේකෙන් එහාට යන්න දෙයක් නැහැ. ඒ හන්දා ඔක මං ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරනවා. ඔතන ඔහොමයි ඔය ගොල්ලන් බලන්නේ. ඔය ගොල්ලන් බලන්නේ කොහොම හරි කවද්ද ඔය මහදි කියන චරිතය එක්ක එකතු වෙන්නේ එතකු වෙලා අපි ඔය 9 යි 5 කියන වැකියට අනුව ඒ කියන්නේ අදේවවාදීන් මරා දමන්න කියලා ඔය වැකිය හැම වේලේම මං දැකලා තියෙනවා මාධ්‍යය වල ඥානසාර හාමුදුරුවෝ කියනවා. ඔය වචනයට ගැළපෙන දේම තමයි කිලාෆතයේ කියන්නේ. අදේවවාදීන් මරා දමන්නේ ඔය මහදි කියන චරිතය විසින්ම තමා. ඉස්ලාම් දහම පිළිනොගන්නා අයව ඒ අන්තිම දවසේ දී මරා දමනවා කියන එක ස්වාමීනි.

ප්‍ර: මේ ජමාතුල් මුස්තමීන් සංවිධානය ඉන්න පුද්ගලයින් සාමාන්‍යයෙන් ඔවුන් ඔවුන්ගේ ළමයිට හොද අධ්‍යාපන ක්‍රමයක් එහෙම ලබා දෙනව ද?

උ: නැහැ අනිවාර්යෙන් ස්වාමීනි ඒ ගොල්ලන් පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් වැඩිදුර යොමු කරන්නේ නැහැ. ඒ කියන්නේ ඒ ගොල්ලන් 7 වසර 8 වසරෙන්ම ඒ ගොල්ලන්ගේ ළමයිව පාසල් වලින් අයින් කර ගන්නවා ඒ ගොල්ලොන්ගේ ඉන්න ගෙදර උදවියවත් ඒ ගොල්ලන් හැරෙන්න කාවවත් එතැන හම්බුවෙන්නත් බැහැ සම්පූර්ණයෙන් ඒක වහලා ආවරණය කරලා තියෙන්නේ ගෙවල්ලුත් ඒ ගොල්ලන්ගේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ කියන්නේ ඔවුන් separate නැත්නම් සමාජයෙන් වෙන් වෙලා ජීවත් වෙන පුද්ගලයින් විදියට ද ඉන්නේ?

උ: සමාජයෙන් වැඩි හරියක්ම වෙන් වෙලා ඉන්න පුද්ගලයින් වශයෙන් තමයි ඒ ගොල්ලන් ක්‍රියාත්මක වෙන්නේ.

ප්‍ර: මෙහි ශාඛා කොච්චර විතර තියෙනව ද ලංකාව වටේ?

උ: ශාඛා දැනට තිස් ගාණක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබට සඳහන් කරන්න පුළුවන් ද මේ ජමාතුල් මුස්ලිමීන් සංවිධානයට යම්කිසි දේශපානඥයින්ගේ ආධාර අනුබල දීමක් හෝ ආශිර්වාදයක් තියෙනව ද නැද්ද කියලා?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: කිසිවෙකුගේ දේශපාලනඥයෙක් සම්බන්ධ නැහැ?

උ: ඔය කිසිම තවුහිද් සංවිධානයකටත් කිසිම සංවිධානයකට දේශපාලනමය අතගැසීමක් කොහෙන්වත් නැහැ. ඒ ගොල්ලන් ඒ ගොල්ලන්ම බිහි කරපු ඒ එක එක මතවාදයන් ඒ කියන්නෙ ඉස්ලාම් ආගමේ මතයක් තියෙනවා අවසන් දවස වෙන කොට කණ්ඩායම් 73 කට බෙදෙනවා කියලා. ඉස්ලාම් ඔය ආගමිකයින්. ඔය 73 ඔය වගේ කොටස් අනන්තවත් තියෙනවා ස්වාමීනි.

ප්‍ර: මහත්මයට කියන්න පුළුවන් ද ජමාත් අන්සාරී සුන්නතී මොහොම්මදියා පරගහදෙණිය . එසේ සංවිධානයක් තියෙනව ද?

උ: ජමාත් අන්සාරී සුන්නතී මොහොම්මදියා කියන්නේ පරගහදෙණිය ඒ කියන්නේ තවුහිද් සංවිධානයේම කොටසක් තමා. ඒ කියන්නේ ඒ ජමාත් අන්සාරී සුන්නතී කියන්නේ JASM කියන සංවිධානයම තමා විවිධ නම් වලින් CTJ ,SLTJ එක එක කල්කුඩා තවුහිද් ජමාත් කියලා එක එක තැන් වලින් එතැන main තැන තිනේනේ වෙන්නේ. එතැනින් තමයි හැමදේම පාලනය වෙන්නේ. පරගහදෙණිය.

ප්‍ර: ඒ කියන්නේ සියළුම තවුහිද් ජමාත් මතවාදය නිරූපනය කරන සංවිධාන වල මහගෙදර නැත්නම් එතැන ඔක්කොම පාලනය වෙන තැන තමයි මේ JASM එක කියලද?

උ: අනිවාර්යෙන් ස්වාමීනි.

ප්‍ර: මේ JASM එක කුමන ස්ථානයකින් ද පරිපාලනය වෙන්නේ?

උ: ඕක පරිපාලනය වෙන්නේ කියන්නේ ස්වාමීනි ඔකට සවුදි අරාබියෙන් තමයි එකට මුදල් එන්නේ. ඒ කියන්නේ මෙයින් මතවාදය වපුරවන්නේ මෙහෙට සවුදි රාජ්‍යයෙන්. ඔය වහාබ්වාදය වැඩිහරියක්ම මේ ලංකාවට එන්න හේතුව සවුදි රාජ්‍යය. ඒ සවුදි රාජ්‍යයේ ඉගෙන ගත්ත කට්ටියට ඒ අධ්‍යාපනය ලබපු මවුලවීවරුන්ට කියන්නේ මදනිවරු කියලා. ඔය මදනිවරුන් ලංකාවේ දැනට සෑහෙන්න පිරිසක් ඉන්නවා. ඒකේ ප්‍රධාන කට්ටිය තමා මේ ඉන්නේ. මේ අදාළ පුද්ගලයින්. ඉතිං ඔතන අබූ බකර්

FAIR COMMENT BY JEZEEM

සිද්ධික් මදනි කියන ඒ පරහදෙණියේ ඉන්න ප්‍රධාන පුද්ගලයා කියන්නෙ නැතුව ඔය තවුහිද් ජමාත් එකට කිසිදු අයුරකින් NGO එකටවත් කිසිම මුදලක් මදීනා වලින්වත් සෞදියෙන්වත් ලැබෙන්නේ නැහැ. එය අනුමත කරොත් විතරයි ලැබෙන්නේ ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ කියන්නේ නැෂනල් තවුහිද් ජමාත් කියන සහරාන් නායකත්වය දැරූ පල්ලියටත් මුදල් එන්නට නම් මේ අබු බකර් සිද්ධික් මදනි කියන පුද්ගලයාගේ අනුග්‍රහ හෝ අනුදැනුම තියෙන්න ඕනී කියල ද?

උ: නෑ ස්වාමිනි හේතුව මේ ගොල්ලන් සහරාන් කියන පුද්ගලයා ඉස්සෙල්ලා හිටියේ JASM කියන එකේ ඉදලා ඔතන SLTJ එකේ ඉදලා ඔය එක එක සංවිධානවලින් ඒ ගොල්ලන් extreme ගියාට පස්සේ තමයි ඒ ගොල්ලන් NTJ කියලා සංවිධානයත් පවත්ව ගත්තේ. ඒකේ මුදල් ආපු විදිය සම්බන්ධයෙන් අපි දන්නේ නැහැ ඒ වරදට දේශපාලන අතගැසිමක් ඇති අපි ඒ සම්බන්ධව දන්නේ නැහැ ස්වාමිනි.

ප්‍ර: ඔබට සඳහන් කරන්න පුළුවන්ද මේ JASM ජමාත් අන්සාරික් සුන්නි මොහොමදියා යන සංවිධානය මත්ද්‍රසා පාසල් ආරම්භ කරලා තියෙනවද?

උ: ඒ ගොල්ලන්ගේ මත්ද්‍රසා පැසැල් තියෙනවා පරහාදෙණියේ තියෙනවා, දාරුල් හුදා නමින් මත්ද්‍රසා පාසල් තියෙනවා ladies ලාට වෙනමයි, jeansලට වෙනමයි මත්ද්‍රසා පාසල් පවත්වාගෙන යනවා.

ප්‍ර: ඒ මත්ද්‍රසා පසැල්වලට මොන වගේ ඉගැන්වීමක් ද සිද්ධ කරන්නේ?

උ: නෑ ඔතන අන්වාදයක් සම්බන්ධයෙන් ඉගැන්වීමක් වෙන්නේ නැහැ. ඒ ගොල්න්ගේ කියලා වෙනම syllabus එකක් තියෙනවා මෙතන ලංකාවේ කිසිම මත්ද්‍රසා පාසැලක එකම syllabus එකක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ සුනාානම් ඒ සියානම් ඒ එක එක syllabus එකෙන් එළියට එන හැම මවුලවිවරයෙක්ම තමන් දන්න ඒ මතය තමයි වපුරවන්නේ. තමන්ගේ ආගමික දේශනවලත් ඒක වපුරවන කොටත් එතැන වෙනම මතවාදයක් ඇති වෙලා වහබ්වාදය බිහිවෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබට කියන්න පුළුවන් ද මේ පාස්කු ප්‍රහාරයට සහරාන්ට අමතරව අනිකුත් තවත් පුද්ගලයින් සම්බන්ධ වුණානේ. ඔවුන් මේ ජමාත් අන්සාරී සුන්නතිල් මොහොම්මදියා කියන සංවිධානයට සම්බන්ධද නැද්ද කියන එක සම්බන්ධයෙන්?

උ: සහරාන්ට අමතරව සම්බන්ධ වුණු කට්ටිය මෙහෙමයි ස්වාමිනි. පරහාදෙණි JSM එකට සම්බන්ධද නැද්ද කියලා දන්නේ නැහැ. ඒ වුණාට හැම පුද්ගලයෙක්ම අත්අඩංගුවට පත් වෙච්ච පුද්ගලයින් දැන් අපි ඉන්න ප්‍රදේශයේ මරාටු ගමදි සිද්ධියක් වුණා. NTJ කෙනෙක්ව අත්අඩංගුවට ගත්තා නියාස් කියලා පුද්ගලයෙක්. ඒ පුද්ගලයා. ඒ හැම කෙනාම ඉස්සෙල්ලම පටන් ගැන්ම JASM එකෙන් ඉන්පස්සේ ආයි SLTJ. ඊට

FAIR COMMENT BY JEZEEM

පස්සේ CTJ අන්තිමට NTJ. ඉතිං හැම කෙනාගේම පටන්ගැන්ම එතැන. ඒකයි ප්‍රශ්නේ ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ මූලික ආගමික ඉගැන්වීම ඔවුන්ගේ සමානයි කියන එකද ඔබ කියන්නේ?

උ: මූලික ඉගැන්වීම සමාන නැහැ. ඒ ඉගැන්වීම ඒ ගොල්ලන් තෘප්තිමත් නැති හන්දා තමයි ඔතැනින් එහාට ඔබ්බට ගිහිල්ලා ඒ ගොල්ලන් extreme ගියේ. නැත්නම් ඔතන JASM ඔක්ට සම්බන්ධයි කියලා කියන්න බැහැ. ඒ ගොල්ලන් ඒ ගොල්ලන්ගේ මතවාදය ව්‍යාප්ත කරන එක විතරයි කරන්නේ.

ප්‍ර: ඔබට සඳහන් කරන්න පුළුවන් ද ISIS සංවිධානයට ජාතික තවුහිද් ජමාත් සංවිධානය ඒ කියන්නේ NTJ සංවිධානය හරහා පිරිස් බඳවා ගැනීමක් සිද්ධ වුණා ද නැද්ද කියන එක සම්බන්ධයෙන්?

උ: අනිවාර්යෙන් අලුත්ගම, දිගන එක එක තැන්වල මුස්ලිම් කලකෝලහාල ඇතිවෙන කොට එක එක සංවිධාන වලින් මුස්ලිම් පල්ලි වලට පහර දුන්නා කියන ප්‍රවෘත්ති පල වෙන කෙට සහරාන්ගේ වීඩියෝස් අපි දැකලා තියෙනවා you tubes එකේ දරුණු විදියට තිබ්බා ස්වාමීනි. එතැන දී අපිට පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ආරංචි වුණ දෙයක් පාස්කු ප්‍රහාරයට කලින් කිසිම දෙයක් දන්නේ නැහැ ඇත්තෙන්ම. පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ආරංචි වුණ දෙයක් ගමින් ගමට ගිහිල්ලා තරුණයෝ 18 ත් -35 ත් අතර තරුණයින් 12 දෙනෙකේ බඳවා ගත්තා කියලා. ඒත් තවුහිද් පල්ලි ගොඩක්ම තියෙන්නේ අපි ඉන්න ප්‍රදේශයේත් තියෙන්නේ තවුහිද් පල්ලි. ඉතිං මං ගිහිල්ලා application form එක හෙව්වා ඕක හොයාගන්න බැරි වුණා. අන්තිමේ දී ඕක මට තොරතුරු මාර්ගයෙන් හම්බ වුණා මේ application form එක. ඔකේ කෙළින්ම දිවුරමුකුත් තියෙනවා අන්තිමේ දී IS මතවාදයට අනුව කුරාණයේ තියෙන දේවල් වලට අනුව අපි දිවුරනවා ඔකෙන් එහාට අපි යන්නේ නැහැයි කියලා. ඕක දිවුරලයි ඕක අත්සන් කරලා application එක භාර දෙන්නේ ස්වාමීනි.

ප්‍ර: ඔබ ඒ අනුව NTJ සංවිධානය හරහා ISIS සංවිධානයට පුද්ගලයින් බඳවා ගැනීමට අදාළ අයදුම්පතයක් ලබාගැනීමට කටයුතු කරාද?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: එය මේ ගරු කොමිෂන් සභාවට ඔබට ඉදිරිපත් කරන්න පුළුවන් ද?

උ: ඔව් පුළුවන් ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන නැෂනල් තවුහිද් ජමාත් සංවිධානය තුළින් ISIS සංවිධානයට පුද්ගලයින් බඳවා ගැනීමට අදාළ අයදුම්පත්‍රය C 947 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.

FAIR COMMENT
BY JEZEEM

ප්‍ර: මේ කොයි වකවානුවේ ද මහත්මයා මේ NTJ එක හරහා ISIS සංවිධානයට පුද්ගලයින් බඳවා ගැනීම සිද්ධ වුණේ?

උ: දිගන ප්‍රශ්නය සිද්ධ වෙච්ච වේලාවේ.

ප්‍ර: ඒ කියන්නේ 2018 වර්ෂයේ කිව්වොත් නිවැරදි?

උ: 2018 .

ප්‍ර: ඒ අනුව ඔබ දන්නව ද ISIS සංවිධානයට සම්බන්ද වෙලා පුද්ගලයින් කියක් විතර ඉන්නව ද කියලා ඔබගේ තොරතුරු අනුව මේ වෙන කොට ලංකාවට?

උ: ලංකාවේ සම්බන්ධ වුණ කට්ටිය සම්බන්ධයෙන් අපිට තොරතුරු ලැබුණා ඕක වැඩි පිරිසක් නැහැ 200 ක් හෝ 400 ට වැඩි පිරිසක් ඉන්නවා කියලා. ඒකෙන් වැඩි හරියක්ම ඔය තරුණයෝ. දැන් මේ ප්‍රශ්නයෙන් පස්සේ මේ ගොල්ලන් සාමාන්‍යය පරිදි ඒ ගොල්ලන්ගේ ජීවිතේ වෙනස් ආකාරයෙන් ඕකට සම්බන්ධ නැති උදවිය වගේ ඒ අදාළ ඒ ප්‍රදේශවල ජීවත් වෙනවයි කියලත් ආරංචි වුණා ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: ඔය දිවුරුම් ප්‍රකාශයේ මොකද්ද සඳහන් වෙන්නේ ?

උ: ඔකේ සඳහන් වෙන්නේ ස්වාමීනි දිවුරුම් ප්‍රකාශය (දෙමළ බසින් කියවයි)

ප්‍ර: සිංහලෙන් තේරුම් කරලා දෙන්න?

උ: මේකේ තියෙන්නේ ත්‍රස්තවාදය දැන් ඔය හැමදේම කරන්නේ අපි නබිතුමා කියපු දේවල් වලට අනුව ඒ අදාළ හදීස් ග්‍රන්ථ වල ඔක්කොම ඒ සාක්ෂි අරගෙනයි කරන්නේ. ඔය කිසිම දෙයකින් ඔබ්බට ගිය දෙයක් නැහැ. ඒ වගේම මේ දැන් මේකට බැඳෙන උදවිය කිසිදු අයුරකින් කිසිදු සංවිධානයකට බැඳෙන්නත් බැහැ. තමන්ගේ ජීවිතයම ඔය IS මතවාදයටත් ඒ වගේම ඔය කුරාණයේ තියෙන ඒ වැකි වලටත් ඒ නබිතුමාගේකීම් වලටත් කැප කරනවා කියලා තමන් දිවුරලා ඔතන අත්සන් කරන්න තියෙන්නේ ස්වාමීනි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: ඔබ මේ ISIS සංවිධානයට නැෂනල් තවුහිද් ජමාත් සංවිධානය හරහා සම්බන්ධ විය හැකි C 947 ලේඛනය ඔබ කොහෙන්ද හොයා ගත්තේ?

උ: මේක ඒ නජීම් මවුලවීතුමා කියන පුද්ගලයාගෙන් දැනගන්න ලැබුණා යම්කිසි පුද්ගලයෙක්. ඒ පුද්ගලයගේ නම මට හරියට මතක නැහැ ස්වාමීනි. එතුමාගේ මුහුණු පොත පුළුවන් තරම් සොයා බැලීමක් කරන්න අනිවාර්යෙන් ඒ application form එක එතුමා share කරලා තිබුණා එක

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පරාක්. ඒකෙන් සොයාගත හැකියි කියලා. ඒකෙන් මට හරියටම කියන්න බැහැ. දැන් අවුරුද්දක් ගත වෙනවා ඕක හරියටම.

ප්‍ර: ඔබ සඳහන් කරන්නේ මේ ISIS සංවිධානයට පුද්ගලයින් බඳවා ගැනීම ෆේස්බුක් සමාජ ජාලා හරහා විවෘතව සිද්ධ වුණාද?

උ: සමාජ ජාලා හරහා සිද්ධ වුණේ නැහැ. ඕක මුස්ලිම් තවුහිද් දේවස්ථාන වලට විතරයි ඕක දීලා තිබ්බේ. ඒකත් එක ගමකට 12 දෙනෙක් විතරයි.

ප්‍ර: ඒ අනුව මොන වගේ ගම්වලින් ද බඳවා ගෙන තියෙන්නේ?

උ: ඔහු බඳවා ගත්තේ නුවර ප්‍රදේශයේ. කොහෙන්ද කෝලාහල ඇති වුණේ දිගන වෙන්න පුළුවන් ගාල්ල වෙන්න පුළුවන් ගිංතොට ඔය වගේ ප්‍රශ්න ඇති වුණ ප්‍රදේශවල තමා ඒ කට්ටියව අරගෙන දේශන කරලා මුස්ලිම් පල්ලි වලට පහර දෙනවා අපි මොනව හරි දෙයක් කරන්න ඕන.

ප්‍ර: ඒ කියන්නේ පිඩාවට පත් වූ පුද්ගලයින් එතකු කරගෙන බඳවා ගත්ත කිව්වොත් හරිද?

උ: අනිවාර්යෙන් ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: එහි දිනය මොකද්ද?

උ: දිනයක් නැහැ ස්වාමීනි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: දැන් මහත්මයා මේ ගරු කොමිෂන් සභාවට අද කාරණා රාශියක් කිව්වා මේ අන්තවාදී සංවිධානවලින් ශ්‍රී ලංකාවට කරන මහා විනාශය සම්බන්ධයෙන්. දැන් මීට ප්‍රථම ඔබ මේ සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයින්ට පැමිණිලි කරීමක් සිද්ධ කරාද?

උ: මේ අදාළ දේවල් සම්බන්ධව අපි පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න කියලා එවකට හිටපු යහපාලන ආණ්ඩුවේ මෛත්‍රීපාල සිරිසේන මහත්මයගේ ලේකම්වරයෙක් වෙන සනත් විරසූරිය මහත්මයා හම්බවුණා ස්වාමීනි. ඒ හම්බ වුණ වේලාවේ දී එතුමා ඇහුවා ඔබතුමාට මේ තොරතුරු submit කරන්න කාවද විශ්වාස කියලා. එතකොට අපි කිව්වා හමුදාවට මේ අපි භාර දෙන්නම් මේ ටික කියලා. එතැන දී බ්‍රිගේඩියර් චූල කියලා සර් කෙනෙක් ආවා. තවත් මේජර් දිනේෂ්. ඒ වගේ කට්ටිය එතැන්ට ආවා. තවත් පොලීසියේ ජනාධිපති ආරක්ෂක අංශයේ උදවියත් ආවා. ඒ ගොල්ලන්ට මේ හැම දේම ලබාදුන්නා. ඒ වුණාට ඒ ගොල්ලෝ ස්වාමීනි මේ හැම දෙයක්ම තමන්ට අවශ්‍ය පරිදි ෆෝටෝස් ගහගත්තා. ඊට පස්සේ මේක ගැන වැඩිය තැකීමක් ලක් කරේ නැහැ. ඔබතුමා ළඟ නැද්ද

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සහරාන් යුධ පුහුණුව ලබන පින්තූර ඒ වගේ සමව්වලයට ලක් කරලා කතා කරා. ඉතිං එතැනදී මං එතුමට ප්‍රකාශ කරා මට පුළුවන් දේ මං.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා බ්‍රිගේඩියර් චූල කොඩිතුවක්කු එහෙම ඔබ හමුවුණා?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ජනාධිපති ලේකම්වරයෙක් ඔබ හමුවුණා?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: කොයි වකවානුවේ ද මේ හම්බ වුණේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක් හම්බු වුණාද?

උ: සම්බන්ධීකරණ ලෙක්මවරයෙකු හම්බ වුණා.

ප්‍ර: කොයි කාලේ වගේද ඔබ එසේ මුණ ගැසුණේ?

උ: පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ඔය 6 වැනි මාසේ මාධ්‍යය හෙළිදරව් කෙරීගෙන යන අවස්ථාවේ දීම තමා. මං හරියට දිනයක්

ප්‍ර: 2019. 06 වැනි මාසේ වගේ?

උ: 06 වැනි මාසේ 07 වැනි මාසේ වගේ.

ප්‍ර: 2019/04/21 පාස්කු ප්‍රහාරයෙන් අනතුරුව තමයි ඔබ මේ හෙළිදරව්ව කළේ?

උ: අනතරුව.

ප්‍ර: මේ අනෙකුත් අන්තවාදී සංවිධානව ගැන?

උ: ඔව් මින් ඉදිරියට මේ වගේ දෙයක් නොවෙන්න අපි මේ දේවල් ඉදිරිපත් කරන්න ඕන කියන මතයෙන් තමයි ඉදිරිපත් කළේ ස්වාමීනි.

ප්‍ර: ඔබ ඊට අමතරව තවත් ප්‍රබල දේශපානඥයින්ට මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිද්ධ කරාද?

උ: ඔව් ස්වාමීනි. මං ඔය සම්බන්ධව හෙළිදරව් කරන කොට ගිහිල්ලා ස්වාමීනි මං හම්බ වුණා අපේ කාදිනල්තුමා. ගරු මැල්කන් රංජිත් කාදිනල්තුමා හම්බ වුණා. එතුමා හම්බ වෙලා එතුමත් එක්ක කතා කළා. එතුමා කිව්වා ස්වාමීනි මුස්ලිම් ජාතික පිරිස කිසිදු අයුරකින් අපිට උදවු වුණේ නැහැ. අපි අපිට පුළුවන් දේ අපි කරා. රටේ කෝලාහාලයක් ඇති නොවෙන්න. ඉතිං ඔබතුමා මේ ඇවිල්ලා තියෙන ගමන ඔබතුමා මේ හෙළිදරව් කරන එකත් ලොකු දෙයක් කියලා සඳහන් කරා ස්වාමීනි.

ප්‍ර: ඔබ ඊට අමතරව තව කවුද හමුවුණු ප්‍රබල පුද්ගලයින්?

උ: කාදිනල්තුමා ඔතන අවස්ථාවක් ලබාදුන්නා එවකට සිටිය අග්‍රාමාත්‍යය රනිල් වික්‍රමසිංහ මහත්මයා හම්බ වෙන්න. ඒ වෙලාවේ දී ස්වාමීනි විනාඩි 15 ක් විතර අපිට රනිල් වික්‍රමසිංහ මහත්මයයි මායි කාදිනල්තුමා අතර කතා කරන්න අවස්ථාවක් ලැබුණා. එතැනදී ඔය කියන මගේ හැම විස්තරයක්ම එතුමට ලබාදුන්නා. ලබාදීලා එතුමා ඒ සම්බන්ධව ක්‍රියාකරනවයි කියලත් කිව්වා. ඒ වුණාට ඒ සම්බන්ධයෙන් කිසිදු

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ක්‍රියාමාර්ගයක් නැති හින්දා මං ඒ සම්බන්ධවත් මාධ්‍යය හෙළිදරව්වක් කරා. ඒක දේශපාලන වශයෙන් සෑහෙන්න බලපෑමක්.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: ඒක කොයි කාලෙද හම්බ වුණේ?

උ: ඕක හම්බ වුණේ ජනාධිපතිවරණයට කලින්.

ප්‍ර: ඒ කියන්නේ පාස්කු ප්‍රහාරයෙන් පසුව ද?

උ: පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ස්වාමීනි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා.</u>

ප්‍ර: දැන් මෙසේ ඔබ කිව්වනේ මේ සම්බන්ධව මාධ්‍යය හෙළිදරව්වකුත් කරා කියලා?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: මාධ්‍යය හෙළිදරව්ව කලේ කොයි වකවානුවේද?

උ: මාධ්‍යය හෙළිදරව්ව කළේ 06 වැනි මාසේ ඉඳලා 09 වැනි මාසේ 10 වැනි මාසේ වෙනකන් කරා ජනාධිපතිවරණ සමය වෙනකන්ම. ඔන අවසන් මාධ්‍යය හෙළිදරව්ව ස්වාමීනි. ඒකෙන් එහාට අපි කළේ නැහැ.

ප්‍ර: ඒ කියන්නේ ඔබ 2019 වර්ෂයේ පාස්කු ප්‍රහාරයෙන් පස්සේ සිදු කළ මාධ්‍යය හෙළිදරව්ව ගැන තමයි කියන්නේ මේ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: දැන් මේ මාධ්‍යය හෙළිදරව් කිරීමෙන් අනතුරුව ඔබට යම් කිසි පෞද්ගලික කරදර වලට මුහුණ පාන්න සිද්ධ වුණා ද?

උ: ඔව් ස්වාමීනි . මාධ්‍යය හෙළිදරව් කිරීමෙන් පස්සේ ස්වාමීනි ඕක මාධ්‍යයට ගියේ නැහැ. කිසිම අයුරිකින් ඕක මාධ්‍යයට Releas කලේ නැහැ. ඉන්පස්සේ ඒ අදාළ දඹුල්ල පොලීසියේ HQI මහත්මයා විසින් මාව කැඳවලා ප්‍රශ්න කිරීම් කරා. ඔබ ඇයි මේ වගේ දෙයක් කරේ කියලා. ඒ වගේම මං ඔය සම්බන්ධව වාර්තාව CID එකට ලබා දෙන්න කියලා මට කිව්වා. ඇවිල්ලා CID එකේ inquiry ක් තියෙනවා එන්න කියලා. ඉතින් HQI මහත්මයා හම්බවෙලා මං රෑ 12ට විතර එහේ කැකිරාව දඹුල්ලෙන් පිටත් වුණා. පිටත් වෙලා එනවිට අලව්වට 4km තිබියදී ටිපර් එකකින් ලුහුබැඳන් ඇවිල්ලා මගේ ස්කූටිය accident කළා. එතනින් එහාට මට අත fracture වුණ හින්දා ඒත් මං ආයේ ගියා පහුවදා CID, TID එකට ගියා. එතන ඉඳලා ආයේ දවස් 3ක්ම ඒගොල්ලන් ඒක තැකීමකට ලක් කරේ නැහැ. දවස් 13ක් විතර. උදේ 8.30 ඉඳලා රෑ 9.30 වෙනකම් මාව තියාගෙන විමර්ශනය කරා.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: කවුද accident කළේ කවුද?

උ: ටිපර් එකක් ආවේ ස්වාමිනි. දඹුල්ලේ ඉඳලාම ලුහුබැඳන් ආවේ. මං හරියට slow ආවේ. ඇවිල්ලා එක පාරම ඒ පාළු තැනකට ඇවිල්ලා තමයි over take කරලා ස්කූටිය එකට හරස් කරලා ගැහුවේ. ගහලා නවත්වලා බලලා කතා කරන්න ගිය තැන කැමරාවක් මොකුත් නැහැ ස්වාමිනි.

ප්‍ර: පොලිසියට ගෙනියන්න මොකක් හේතුවෙන්ද?

උ: පොලිසියට ගෙන්නුවේ ඔය සම්බන්ධව.

ප්‍ර: මෙකද්ද?

උ: හමුදා නිලධාරීන් සම්බන්ධව අග්‍රමාත්‍යතුමාට ඔය කළ හෙළිදරව්ව. ඒ සම්බන්ධව ප්‍රකාශයක් ලබා දෙන්න කියලා තමයි මට පොලිසියට ගෙන්වුයේ ස්වාමිනි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>.

ප්‍ර: මේ සම්බන්ධයෙන් ඔබ ඉදිරිපත් කරා ඔබට මේ මුස්ලිම් සමාජය තුළ තියෙන භයානක අන්තවාදී සංවිධාන ගැන ඔබ ඉදිරිපත් කිරීම් කරා දැන් ඒ සංවිධාන සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ ක්‍රියාකලාපයන් සම්බන්ධයෙන් මේ පරීක්ෂණයට විසඳුමක් ලෙස ඔබට මොනවාහරි Recommendation එහෙම නැත්නම් රෙකමදාරුවන් මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමේ හැකියාවක් තිබෙනවද?

උ: එහෙමයි ස්වාමිනි මට නිර්දේශයක් හැටියට කියන්න තියෙන්නේ මෙහෙමයි දැන් අපේ මදුසා පාසල් සෑහෙන්න තියෙනවා. ඒ වුණාට හැම මදුසා පාසලකම ඒගොල්ලන්ගේ එක් එක් මතවාදයට අනුව එක එක syllabus වෙනස්. එහෙම නැතුව හැම මදුසා පාසලකම එකම syllabus එකක් කරන්න ඕන. ඒ ආගම උගන්වනවනම් ආගම ඒ විදියට උගන්වන්න ඕන ඒ විදියට. එතකොට ඒ syllabus එක ඉගනගෙන එළියට එන කෙනත් ඒ එකම මතයයි පතුරවන්නේ. දැන් මේ විවිධ මත පතුරවලා විවිධ මදීනාවට ගිහිල්ලා ඉගෙනගෙන එනවා. පකිස්ථානයට ගිහිල්ලා ඉගනගෙන එනවා. එක එක මදුසා පාසල් වලට යනවා. ඇවිල්ලා මෙහෙ නොයෙකුත් නැති ප්‍රශ්න ඇති කරනවා. ඉතිං ඔය හේතුවෙන් තමයි ඕක හෙළිදරව් කළේ ඕක එහෙමවත් නවතී කියලා. ඉතිං ඒකෙන් පුළුවන් තරම් පීඩා වින්දා ස්වාමීනි ඒකයි මේ මාස 04 ක් තිස්සේ නිහඬවම ඉන්නේ ස්වාමීනි. ඒ අනන්තවත් මානසික පීඩාවින්දා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මහත්මයා සඳහන් කරා නේද ඔබ ගරු එවකට ගරු අග්‍රාමාත්‍යය රනිල් වික්‍රමසිංහ මහතා හමුවී මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ අන්තවාදී සංවිධාන සම්බන්ධයෙන් එතුමාව දැනුවත් කර කියලා?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒ අවස්ථාවේ දී ඔබ ඡායාරූප ලබාගත්ත ද අග්‍රාමාත්‍යයවරයා සමඟ?

උ: ඔව් ස්වාමීනි මට ඒ සම්බන්ධව තහවුරු කරන්න ඕන හන්දා මං මෙතුමාත් හම්බ වුණා කියන එක තහවුරු කරන්න ඕන හන්දා ස්වාමීනි මං ඡායාරූපයක් ලබාගන්න අවස්ථාව ඉල්ලුවා එතුමගෙන්.

ප්‍ර: එම ඡායාරූපය ඔබට අද මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන් ද?

උ: පුළුවන් ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරු ඉදිරිපත් කරන ඔහු එවකට ගරු අග්‍රාමාත්‍යවරයා සමඟ සිටින ඡායාරූපය C 948 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතමි.

ප්‍ර: මහත්මයා මේ C 948 මේ දැක්වෙන ඡායාරූපය කුමන ස්ථානයේ දිද ලබාගත්තේ?

උ: මේක Bishop house එකේ ලබාගත්ත එකක්. එතැන කාදිනල්තුමත් ඉන්නවා. ඒ වුණාට ඉතිං කාදිනල්තුමාගේ අනුදැනුම නැතුව කාදිනල්තුමා අකමැති හින්දා ඔය දේ හෙළිදරව්කරනවට මම කාදිනල්තුමාව එතැනින් නැවත ඉවත් කරලා මායි අග්‍රාමාත්‍යයතුමයි ඉන්න පින්තූරේ මං හෙළිදරව් කරා ස්වාමීනි.

****

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ සඳහන් කරානේ අර බක්මිටියාව තිඹිරිගොල්ල රක්ෂිත වනාන්තරේ ඉඩමක් අල්ලලා සහරාන්ලගේ කණ්ඩායමක් එහි ගත කරනවා කියලා?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම ඔබ සඳහන් කරනවා මේ ෆෙටෝ කියන සංවිධානයක් විසින් මෙම කඳවුරේ බෝම්බ ඇටවීම සම්බන්ධයෙන් ඔවුන්ට පුහුණුවීම් ලබාදුන්න මොකද්ද ඒ කියන්නේ?

උ: ෆෙටෝ සංවිධානය සම්බන්ධයෙන් ඒ මම ලබාදුන්නු ප්‍රකාශයක් විතරක් නෙවෙයි. ඒක තුර්කියේ තනාපතිවරයා වශයෙන් ශ්‍රී ලංකාවේ ඉන්න එතුමියගේ ප්‍රකාශයක් තියෙනවා. ඒ සම්පූර්ණ ලියවිල්ල තියෙනවා. මං ගෙනාවේ නැහැ ස්වාමීනි. එතුමිය ඒ සම්බන්ධව කිව්වේ ඒ ගොල්ලන් ලංකාවට ඇතුල් වෙලා ඉන්නවා. ඒ වුණත් තවත් ඉන්න ප්‍රසිද්ධ දේශපාලන නායකයොත් එක්ක කිව්වා. ඊට පස්සෙ තමා අපි ඔය ගැන

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

හොයල බලලා අපිත් ඔය දේ ප්‍රකාශ කළේ. එහෙම නැතුව අපේ තනි මතයට කිව්වේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් මොනවද ඔබලාට හොයාගත්තම දැන ගන්නට ලැබුණේ ෆෙටෝ සංවිධානය සහරාන්ලාගේ කණ්ඩායමට මොනවද ඔබ කියන්නේ බෝම්බ ඇටවීම සම්බන්ධව පුහුණුවීම් ලබාදිලා තියෙනවා කියලා 54 දෙනෙක්ගෙන් යුත් කණ්ඩායමක්?

උ: ෆෙටෝ කියන්නේ පේතුල්ලා කියන සංවිධානය. ඒ ගොල්ලන් වැඩිහරියක්ම අල්මාරීත් පවුඩේෂන් කියලා education අර ප්‍රශ්නයක් ඇති වුණාම තමයි ක්‍රියාමක වෙන්නේ. ඒ ගොල්ලන් සාමාන්‍යයෙන් වැඩි හරියක්ම රටවල් වලට ඇතුල් වෙන්නේ කතිකාචාරවරයින් එහෙම ගුරුවරුන් ඒ වගේ Student ලා හැටියට ඉතිං එවකට එයාලා අර විශ්වවිද්‍යාලයක් සම්බන්ධ තිබ්බ ෂරියා විශ්වවිද්‍යාලයක් සම්බන්ධව තිබ්බ ප්‍රශ්න ඒ වගේම සහරාන්ලගේ පුහුණුවීම් සම්බන්ධව තුර්කියේ ඒ තානාපතිවරයා දුන්න ලිපියේ article එකේ තියෙන දේවල් අනුව තමයි ඔය දේවල් සනාථ කරගෙන.

ප්‍ර: මොකද්ද ඒ තුර්කිය් තානාපතිවරිය දීපු ආටිකල් එක ඔබ ළඟ තියෙනව ද දැන්?

උ: දැනට ගෙනාවේ නැහැ ස්වාමීනි. මං ඉදිරියේදී

ප්‍ර: මොකේද තිබුණේ ඒ article එක ?

උ: ඒක සයිඩ් එකකමයි තිබුණේ. ඒක එතුමියගේ ප්‍රකාශයක් තිබුණේ සම්පූර්ණ ප්‍රකාශයක් සිංහලෙනුත් තියෙනවා.

ප්‍ර: වෙබ් සයිට් එකක?

උ: ඔව් මං ඒක ඉදිරියේ දී මං අද ගෙනාවේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම ඔබ කියනවා මේ ආමී මොහිදීන් කියන පුද්ගලයෙක් තමයි ඔය කැලේ ඇතුළේ සහරාන්ලගේ කණ්ඩායමට යුධ පුහුණුව ලබාදුන්නේ කියලා ඒ කොහොන්ද ඒ තොරතුර ලැබුණේ?

උ: ආමී මොහිදීන් කියන්නේ සහරාන්ලට පුහුණුවීම් කරපු කෙනෙක් කියලා සම්බන්ධව ඒ මාධ්‍යයෙන් ගිය තොරතුරක් ඒ වගේම ආමී මොහිදීන් කියන්නේ මුස්ලිම් කොංග්‍රසයේ නායක රවුෆ් හකීම්ගේ Secretary කෙනෙක් වන සිබ්ලි ෆාරුක් කියන පුද්ගලයත් එක්ක හිටපු ආත්මාරක්ෂකයෙක් ස්වාමීනි.

ප්‍ර: සිද්ධි ෆාරුක්ගේ ආත්මාරක්ෂකයෙක් ?

උ: ඔව්. මෙතැන පින්තූර තියෙනවා ස්වාමීනි.

ප්‍ර: පින්තූරේ බලන්නකෝ පොඩ්ඩක්.

උ: හිස්බුල්ලා ආණ්ඩුකාරවරයගේ driver කෙනෙක් හැටියට වැඩ කරලා තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ අර සඳහන් කරපු තුර්කි තානාපතිනිය වෙබ්සයිට් වලට ප්‍රචාරය කරපු එකේ ලින්ක් එකක් තියෙනව නම් කින්නට පුළුවන් ද අපිට ඒ පිළිබඳව වුට්ටක් කියවලා බලන්න?

උ: මගේ දුරකථනයේ එකේ Screen shot එකක් තියෙයි සමහර වෙලාවට.

ප්‍ර: Not this. The තුර්කි තානාපති has mentioned about the involvement of the FETO organization and 54 members. What he says is they have given Military Training for the bomb in this particular land. Consolation forest.

උ: forest එකේ ස්වාමීනි මේ forest එකේ ස්වාමීනි එහෙම පුරුදු වුණාම ලංකාවට පිරිසක් ත්‍රස්තවාදී සංවිධානයක පිරිසක් ඇතුල් වෙලා ඉන්නවා කියලා තමයි එතුමිය කිව්වේ.

ප්‍ර: නැහැ ඔබ කියනවා 2017 වසරේදී පැමිණි තුර්කි රාජ්‍යයේ ෆෙටෝ නම් වූ කණ්ඩායම මෙම කඳවුරේ බෝම්බ ඇටයීම සම්බන්ධව පුහුණුවීම් ලබා දී ඇති බවට ද තොරතුරු ඇත.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ඡායාරූප 04ක් දැක්වෙන මෙම ලේඛනය C 949 ලෙස ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර: මහත්මයා මෙම **C 949** වශයෙන් ලකුණු කරපු ලේඛනයේ වම්පස ඉහළ කෙළවර දැක්වෙන ඡායාරූපයේ ඉන්නේ කවුද කියලා මහත්මයාට පැහැදිලි කරන්න පුළුවන් ද?

උ: වම්පස ඉහළ කෙළවරේ ඉන්නේ ඉදිරියේ නම් ඉන්නේ ඔතන සිබ්ලි ෆාරුක් කියන පුද්ගලයා. යටින් ඔය mark කරලා තියෙන එකේ. පිටුපස්සෙන් ඉන්නේ ආමී මොහිදීන් කියන පුද්ගලයා. එතුමාගේ ආත්මාරක්ෂකයා විදියට සේවය කරපු කෙනා.

ස්වාමීනි මෙම ඡායාරූපය C 949 A වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර: දැන් මහත්මයා ඊට යටින් තියෙනවා තවත් ඡායාරූපයක් **C 949 A** ඡායාරූපයට යටින් දැක්වෙන ඊළඟ ඡායාරූපය. එම ඡායාරූපයේ ඉන්නේ කවුද ?

උ: එතැනත් ඉන්නේ සිබ්ලි ෆාරුක් සහ ආමී මොහිදීන් ස්වාමීනි. ඒ අනෙක් පුද්ගලයා සම්බන්ධව දන්නේ නැහැ ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරු ආමී මොහිදීන් යනුවෙන් පෙන්වන තැනැත්තා දැක්වෙන ස්ථානය C 949 (i) ලෙස ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර: මහත්මයට පෙන්නුම් කරන්න පුළුවන් ද **C 949 A** ඡායාරූපයේ ආමී මොහිදීන් ඉන්න ස්ථානය, සිබ්ලි ෆාරුක් මහත්මයා ඉන්න ස්ථානය?

FAIR COMMENT BY JEZEEM

උ: පළවෙනි පින්තූරයේ සිබ්ලි ෆාරුක් මහත්මයා මැදින් ඉන්නේ.

ස්වාමීනි සාක්ෂිකරු විසින් සිබ්ලි ෆාරුක් යැයි ඉන්න තැනැත්තා පෙන්නුම් කරන ස්ථානය C 949 A ii වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතමි.

C 949 A ඡායාරූපයට පහළින් ඇති තවත් ඡායාරූපයක් සාක්ෂිකරුට පෙන්වා සිටිනවා ස්වාමිනි. මෙම ඡායාරූපය පරීක්ෂා කරන්න.

ප්‍ර: මෙම ඡායා රූපයේ කවුද ඉන්නේ මහත්මයා?

උ: ඒ ඉදිරියෙන්ම ඉන්නේ සිබ්ලි ෆාරුක් , පිටුපස්සෙන් ඉන්න පුද්ගලයා ආමී මොහිදීන්.

ස්වාමීනි එම ඡායාරූපය C 949 B වශයෙන් ලකුණු කරනවා.

ප්‍ර: මහත්මයට පුළුවන්ද සිබ්ලි ෆාරුක් ඉන්න ස්ථානය පෙන්නුම් කරන්න **C 949 B** ඡායාරූපයෙන්?

උ: ඔව් ඉදිරියෙන්ම ඉන්න පුද්ගලයා ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරු විසින් සිද්ධි ෆාරුක් යන තැනැත්තා පෙන්නුම් කරන ස්ථානය **C 949 B** i ලෙස ලකුණු කරනවා.

ප්‍ර: ඔබට පුළුවන් ද පෙන්නුම් කරන්න ආමී මොහිදීන් ඉන්න ස්ථානය මේ **C 949 B** ඡායාරූපයෙන්?

උ: සිද්ධි ෆාරුක්ට පිටුපස්සෙන් ඉන්නේ ආමි මොහිදින් ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරු විසින් ආමී මොහිදීන් යන තැනැත්තා සිටින ස්ථානය පෙන්නුම් කරනවා එම ස්ථානය **C 949 B ii** වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර: මේ **C 949** ලේඛනයේ දකුණු පස උඩින් තවත් ඡායාරූපයක් දැක්වෙනවා. මේ දැක්වෙන ඡායාරූපය මොකද්ද මහත්මයා?

උ: ඒ සඳහන් කරලා තියෙන්නේ එතුමා ආමී මොහිදීන් ඔහුගේ ෆේස්බුක් පිටුවේ සඳහන් කරලා තිබුණේ එතුමාගේ දුව කියලා තමයි සඳහන් කරලා තිබුණේ ස්වාමීනි.

ප්‍ර: ඒ ඡායාරූපයේ දැරිය මොකද්ද අතේ තියන් ඉන්නේ?

උ: දුව ආයුධයක් උස්සගෙන ඉන්නවා. ඒ කියන්නේ තුවක්කුවක්. ඒ කියන්නේ ආමී මොහිදීන් මීට කලින් අර හමුදාවේ සේවයේ නිරතව සිටි කෙනෙක් . ඉතිං එයා එවකට ගත්ත පින්තූරයක් ද කියලා මම දන්නේ නැහැ ස්වාමීනි. මේ පින්තූරය පළ කරලා තිබුණා.

ප්‍ර: මේ ඡායාරූපය කොයි කාලෙද පල කරලා තිබුණේ මහත්මයා?

උ: දිනය මතක නැහැ ස්වාමීනි.

ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ඒ කුඩා දැරියක් ආයුධයක් අතේ තියන් ඉන්න ඡායාරූපය C 949 C වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මේ C 949 C ඡායාරූපයට පහළින් තියෙනවා තවත් ඡායාරූපයක්. මේ ඡායාරූපය මොකද්ද මහත්මයා ?

උ: එය ආමී මොහිදින්ගේ ෆේස්බුක් ගිණුම ස්වාමීනි.

ප්‍ර: ඔබ මේ ඡායාරූපය කොහෙන්ද ගත්තේ?

උ: ෆේස්බුක් පිටුවෙන් ස්වාමීනි.

ස්වාමීනි ආමී මොහිදින් යන අයගේ ෆේස්බුක් ගිණුමේ Profile picture එක දැක්වෙන ඡායාරූපයක් C 949 D වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.

ප්‍ර: මහත්මයා මේ C 949 D ඡායාරූපයේ දැක්වෙන නම් මොකද්ද?

උ: මොහොමඩ් මොහිදින් කියලා දැක්වෙන්නේ ස්වාමීනි.

ප්‍ර: ඊට පහළින් දැක්වෙන යම්කිසි දුරකථන අංකයක් දැක්වෙනව ද?

උ: ඔව්.

ප්‍ර: මොකද්ද ඒ දුරකථන අංකය?

උ: 0774138030 කියන ස්වාමීනි.

****

<u>ගරු අදිකාරී මැතිණිය.</u>

ප්‍ර: ඔබ සඳහන් කරපු ඡායාරූපයේ සිබ්ලි ෆාරුක් කියන්නේ කවුද?

උ: රවුෆ් හකීම් මැතිතුමාගේ මුස්ලිම් කොංග්‍රස් එකේ නියෝජිතයෙක්. කියන්නේ මුස්ලිම් කොංග්‍රස් එකේ පරණ සාමාජිකයෙක් එයා පළාත් සභා මන්ත්‍රී කෙනෙක් හැටියටත් ඉඳලා තියෙනවා ස්වාමීනි. ඉංජිනේරුවෙක් එයා.

ප්‍ර: ආමී මොහිදීන් පිළිබඳ ඔබ තව මොනවද දන්නේ ආමී මොහිදීන් ගැන?

උ: ස්වාමීනි ආමී මොහිදීන් සම්බන්ධව ඇත්තටම ආමී මොහිදීන් කියන චරිතය සම්බන්ධව අපි දැනන් හිටියේ නැහැ. ඊට පස්සේ එයා ගැන හොයන් ඉන්න කොට හමුදා බුද්ධි අංශ නිලධාරියෙක්ම තමා ගුවන් හමුදා බුද්ධි අංශ නිලධාරියෙක්ම තමා තොරතුරු දන්න කෙනෙක්ම ආමී මොහිදීන්ව හඳුනගන්න පුළුවන් කියලා ෆේස්බුක් පිටුවේ LINK එක යැවේව් එතුමාමයි ස්වාමීනි. ඒක මගේ පරණ දුරකථනයේ තියෙනවා ස්වාමීනි. එයා යවපු විස්තර.

ප්‍ර: ඒ හැර වෙනත් තොරතුරු ඔබ දන්නව ද ආමී මොහිදීන් මොනවද කරේ?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: ෆෙටෝ සංවිධානය 2019 අප්‍රේල් 21 ත්‍රස්ත ප්‍රහාරයටත් සම්බන්ධ වූ බවට ඔබට තොරතුරු වාර්තා වෙලා තියෙනව ද?

උ: ඒ තොරතුරු වාර්තා වුණේ ඒ අදාළ මං කියපු පුද්ගලයම තමා ස්වාමීනි. ඒ වුණාට ඒ පුද්ගලයා සම්බන්ධව විශ්වාසයක් නැති හින්දා ඒක මට සනාථ කරන්න බෑ ඒ කියන්නේ තුෂාර පිරීස් කියන පුද්ගලයාම තමයි ඒ සම්බන්ධව මං කොමිෂමේ ඉන්න අදාළ නිලධාරීන්ටත් කිව්වා. එයා

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

කිව්වේ එතකොට SSP මහත්වරුන් කිව්වේ ඒ පුද්ගලයා විශ්වාස කළ හැකි පුද්ගලයෙක් නෙවෙයි ඒ පුද්ගලයා විවිධ කල්ලිවලට සම්බන්ධ කෙනෙක් ඒක හන්දා එයාගේ තොරතුරක් විශ්වාස කරන්න බැහැයි කියලා ස්වාමීනි.

ප්‍ර: ඔබ සම්බන්ධ වුණේ කොහොම ද මේ තුෂාර පීරිස් කියන මහත්මයා?

උ: එයා මුහුණු පොතේ මං කරන මාධ්‍යය හෙළිදරව් බලලා එයා එකපාරටම මට කතා කරා ස්වාමීනි. කතා කරලා ඇහුවා ස්වාමීනි ඔබ දැන් මෙච්චර හෙළිදරව් කරල ඔබට නීතියෙන් යම් දෙයක් ඉටු වුණා ද ඊට වැඩිය හොඳයි ඔබ අපේ සංවිධානයත් එක්ක බැඳුණ නම් අපේ ජාතික නිදහස් විමුක්ති සංවිධානය කියලා. ඉතිං මං ඇහුවා ඔය ගොල්ලන්ගේ දර්ශනය මොකද්ද vision එක මොකද්ද එතකොට නැහැ අපි ඔය ගොල්ලො වගේ මාධ්‍යය ඉදිරියට ගිහිල්ලා කියව කියව ඉන්නේ නැහැ අපි එහෙම්ම නැති කරලම දානවා. ඒක blast කරලාම දානවා කියලම කිව්වා ස්වාමීනි. එහෙම කිව්වා. ඒක හන්දා ඔබටත් පුළුවන් ඕන්නම් අපිත් එක්ක එකතුවෙන්න කියලා. මං කිව්වා නැහැ එහෙම අවශ්‍යතාවයක් මට නැහැ. මේ රටේ ජාතිවාදයක් තියෙනව නම් නැත්නම් අපි මුස්ලිම් සිංහල කෝලහාලයක් තියෙනව නම් ඒක නැති කරන්න ඕන කියලා විතරයි මතේ තියෙන්නේ. එහෙම නැතුව ඔය ආගමික ස්ථාන නැති කරන්න එහෙම අවශ්‍යතාවයක් මට නැහැයි කියලා කිව්වා.

වේලාව:ප.ව. 07.55
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretariat Copy

FAIR COMMENT
BY JEZEEM

දැන් වේලාව : ප.ව.7.50
පෙර සටහන් ල/ලේ : සචිනි මෙනවිය
මෙතැන් සිට ල/ලේ : නිල්මිණි.

<u>ගරු විනිසුරු අදිකාරි මැතිනිය</u>

ප්‍ර: දැන් තුෂාර පිරීස් කොහේ ඉඳලාද ඔබට කතා කළේ?

පි: ප්‍රංශයේ ඉඳලා මැසෙන්ජර් මාර්ගයෙන් කතා කළේ ස්වාමිනි.

ප්‍ර: තුෂාර පිරීස් ඔබට මොනවද කිව්වේ දැන් ඔය ෆෙටෝ සංවිධානය ප්‍රහාරයට සම්බන්ධයි කියලා කිව්වානේ මොනවද ඔබට තුෂාර පිරීස් කිව්වේ?

පි: ෆෙටෝ සංවිධානය ඔය ලංකාවට ඇවිල්ලා ඉන්නවා තුර්කියේ තානාධිපතිවරියත් ඒකේ article එකක් දීලා තියෙනවා. ඒ සංවිධනාය මෙහෙම 54 දෙනෙක් ලංකාවට ඇතුළු වෙලා ඉන්නවා. එකේ තොරතුරුත් තියෙනවා. ඒවගේම මටත් කිව්වා වගේම මැඩිල්ලේ හාමුරුදුවන්ටත් ඔය සම්බන්ධව ප්‍රකාශ කළා. මං ඒ දේම ඇවිල්ලා මේ කොමිෂමටත් මං ඇවිල්ලා ප්‍රකාශ කරලා කොමිෂමේ අදාළ නිලධාරී මහත්මයා SPP ස්ටැනිස්ලෝස් මහත්තයාටත් එතුමාත් එක්ක කතා කරන්න දුන්නා. එතනදී එතුමාගේ අවශ්‍යතා තිබ්බේ ඔය දේ සම්බන්ධව හෙළිදරව් කිරීම නෙවෙයි එතුමා කොහොම හරි ආරක්ෂා සහිතව ලංකාවට එන්න එයාව ගෙන්න ගන්න කියලා. එතකොට එයා තොරතුරු දෙන්නම් කියන මතය තමයි එයාගේ තිබ්බේ.

ප්‍ර: ඔබට තුෂාර පිරීස් කිව්වද මේ 2019 අප්‍රේල් 21 ඔය ත්‍රස්ත ප්‍රහාරයට මේ ෆොටෝ සංවිධානයත් සම්බන්ධ වුණා කියලා?

පි: ඔව් ස්වාමිනි එතුමා එහෙම ප්‍රකාශ කරා. ප්‍රකාශ කරලා එයා කිව්වා මාව ගෙන්වනවානම් මම මේ හැමදේම කොමිෂන් එක ඉදිරියේ කියන්න ලෑස්තියි කියලා. හැම දෙයක් සම්බන්ධයෙන් සාක්ෂි සහිතව ඔප්පු කරන්න මම ලෑස්තියි කියලා කිව්වා. මං ඒක කිව්වට ඒ සම්බන්ධව එයා ගැන වැඩි හොඳ ප්‍රතිචාර තිබ්බේ නැහැ අදාළ ඉහළ බලධාරීන්ගෙන්

ප්‍ර: මේ තුෂාර පිරීස් කියන එක්කනා ඔබට විශේෂයෙන්ම කිව්වද මේ නිවසක් ඇතුලේ සිදු වෙච්ච ත්‍රස්ත ප්‍රහාරයක දී දුරස්ථ පාලකයකින් වෙනත් ස්ථානයක ඉඳලා මේ බෝම්බ ප්‍රහාරය පුපුරුවා හැරීම කළේ මේ ෆොටෝ සංවිධානය කියලා?

පි: ඔව් එහෙම විශේෂයෙන්ම කිව්වා. ඒවගේම

ප්‍ර: මොකක්ද කිව්වේ කියලා හොඳට කියන්න බලන්න මේ කොමිෂන් එකට?

පි: නැහැ ස්වාමිනි එයා කිව්වේ ඕක ෆොටෝ සංවිධානය තමයි ඕක මෙහෙයවුයේ ඕක. ඒගොල්ලන් කුලී හමුදාවක් වශයෙන් තමයි ඒගොල්ලන් ලංකාවට ඇවිල්ලා ඉන්නේ. ඒගොල්ලන් තමයි

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

මෙහෙයවුයේ. සමහර වේලාවට ඔය blast එක සම්බන්ධයෙන් ඒගොල්ලන්ම නොදැන ඉන්න ඉඩ තිබුණා. මේ ෆොටෝ සංවිධානය තමයි හැමදේම කළේ. ඒගොල්ලන් තාම ලංකාවේ ඉන්නවා. ඒ සම්බන්ධව තුර්කියේ තානාදිපති article එකක් දාලා තියනවා. ඒ වුණාට තව වසන්ත සේනානායක කියලා කවුරුහරි ඇමැතිවරයෙක් ඔය සම්බන්ධව ප්‍රකාශකයක් කරලා තියෙනවා කියලා එයා ප්‍රකාශයක් කරා. ඒවගේම අන්තිම අවස්ථාවේ දී මං කොමිෂමට වාර්තාව දෙන අවස්ථාවේ දී එතුමා ඒ පුද්ගලයා පැවසුවා ස්වාමිනි ඔතන ප්‍රහාරයට ආපු පුද්ලගයින් 12 දෙනෙක් එකෙන් 9 දෙනෙක් තව ප්‍රහාරය එල්ල කරේ. එකෙන් ඉතුරු 3 දෙනෙක් තාම ඉන්නවා. එකෙන් එක්කෙනෙක්ගේ තොරතුරු මම දන්නවා. ඒ වුණාට මාව UN එක මාර්ගයෙන් ලංකාවට ගෙන්වන්න කියන්න. ඉතින් මට තේරුණේ එයා මොකක් හෝ එයාගේ අවශ්‍යතාවයක් සපුරා ගන්න මේ දේවල් කරනවා වගේ තේරුණා ස්වාමිනි. ඊට පස්සේ එයත් එකක් තියෙන සම්බන්ධකම් එහෙන්ම මේවා කරා ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේ අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයාට අවශ්‍ය දැයි විමසමි.

අවශ්‍ය බව ප්‍රකාශ කරයි. අවස්ථාව ලබා දෙමි.

****

<u>ජනාධිපති නීතිඥ ශාමිල් පෙරේරා මහතා</u>

ප්‍ර: ඔබතුමාට කියන්න පුළුවන්ද මේ සුෆි මුස්ලිම් බැතිමතෙක් වශයෙන් කතෝලික කිතුණු ජනතාව ඉලක්ක කර මේ පාස්කු ප්‍රහාරය කිරීමට යම් හේතුවක් කියන්න පුළුවන්ද ඇයි කතෝලික ජනතාව ඉලක්ක කරගෙන මේ පාස්කු ප්‍රහාරය කෙරුවේ කියලා?

පි: ස්වාමිනි කතෝලික ජනතාව ඉලක්ක කරමින් කරේ ඇයි කියන එක අපට හරියට සඳහන් කරන්න බැහැ. ඒ වුණාට ස්වාමිනි ඕක කතෝලික ජනතාව ලෝකේ බහුලව ජීවත් වෙන හන්දා ඒගොල්ලන්ට ප්‍රහාරයක් එල්ල කරලා තමන්ගේ සංවිධානය සම්බන්ධව රට ලෝකය වටා දැන ගන්න තියන්න ඕනි කියලා අවශ්‍යතාවයක් තිබුණාද කියලා අපි දන්නේ නැහැ ස්වාමිනි. ඒක අපි කාදිනල් තුමාටත් ඒ සම්බන්ධව ප්‍රකාශ කරා ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබතුමා කිව්වා මේ කුරානයේ 9(5) වගන්තිය ගැන එකේ තිබෙනවා කාෆීර්වරුන් සම්බන්ධයෙන්?

FAIR COMMENT BY JEZEEM

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබතුමා කියන්නේ මේ සුෆි මුස්ලිම්වරුත් මේ කාෆිර් ගණයට වැටෙනවා කියලද?

පි: සුෆි මුස්ලිම්වරුන් කාෆිර් ගණයට වැටෙනවා කියන්නේ ඔය කියන අන්තවාදී මතය පතුරන වහාබ්වාදය සංවිධානවල ඒගොල්ලෝන්ගේ මතය අපිත් කාෆිර්වරුන් කියලා තමයි. එවාගේම අපිත් කාෆිර්වරුන්නම් එතකොට අනිකුත් ආගම් ගැන කියන්න දෙයක් නැහැ ස්වාමිනි.

ප්‍ර: දැන් ගරු කොමිෂන් සභාවෙන් අහපු ප්‍රශ්නයකට තුර්කියේ ෆෙටෝ සම්බන්ධයෙන් තමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා?

පි: ඔව් ස්වාමිනි.

ප්‍ර: දැන් තුර්කියේ සුෆි මුස්ලිම් අයව විශාල ප්‍රමාණයක් ඉන්නවා කිව්වොත් හරිද?

පි: මං ඒ තරම් ඒ සම්බන්ධව දැනුවත් නැහැ ස්වාමිනි. සාමාන්‍ය දැනුවත් කමක් තියෙනවා ඉන්නවා කියන එක විතරක් දන්නවා ස්වාමිනි.

ප්‍ර: ඒ වගේම තුර්කියේ දැන් වර්තමන තත්වය අනුව දැන් මේ ෆෙටෝ සංවිධානය නිසා මේ සුෆි මුස්ලිම් අයව සම්පූර්ණයෙන්ම නැති කරන්න හදනවා කියලා කිව්වොත් හරිද දන්නවද ඒක ගැන?

පි: එහෙම තොරතුරක් ආරංචි වුණා ස්වාමිනි. ඒකත් අපි දැන ගත්තේ මාධ්‍ය Web site වලින් තමයි දැන ගත්තේ ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි. සාක්ෂිකරු මුදා හරිමි.

සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂි හේතුවෙන් 2015 අංක 4 දරන සාක්ෂිකරුවන් හා වින්දිතයන් හට ආරක්ෂාව ලබා දීම සහ පහසුකම් සලසා දීමේ පනතේ 25(4) උපවගන්තිය ප්‍රකාරව සාක්ෂිකරුට හිමිවිය යුතු සියලු අයිතීන් සහ වරප්‍රසාදයන් සාක්ෂිකරුට ලබා දෙන ලෙසට සාක්ෂිකරුවන් හා වින්දියන් ආරක්ෂාව සහ පහසුකම් සලසා දීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි.

කොමිෂන් සභාවේ කටයුතු රාත්‍රී ආහාරය සඳහා රාත්‍රී 8.45 තෙක් කල් තබනවා.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදුවූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශණය කර පරීක්ෂා කොට වාර්තාකිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය - 2020-.07.25 වේලාව- පෙ. ව. 10. 50

සටහන්කළේ යමුනා දසනායක විසිනි.

ගරු විනිසුරු මඩුල්ල -

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා සභාපති.

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා. සාමාජික

03. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා. සාමාජික

04. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා සාමාජික

05 හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් . එම්. එම්. ආර් අදිකාරි මහත්මිය සාමාජික

පෙනි සිටීම

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය. , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සුහර්ෂි හේරත් මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනිතිඥ නයනා සෙනවිරත්න මහත්මිය , රජයේ අධිනිතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය , රජයේ අධිනිතිඥ චතුරංග බණ්ඩාර , රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ සහ රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ පෙනි සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ ඉල්ලීම සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර ලබා දෙන ලදි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u> .

අද දින සාක්ෂි මෙහෙයවීමට ආරම්භ කිරීමට ප්‍රථම මාධ්‍යයෙන් ඉල්ලීමක් කිරීමට කොමිෂම බලාපොරොත්තු වෙනවා. කොමිෂමට මේ වන විට මෙම කොමිෂම ඉදිරියේ සාක්ෂි ලබාදුන් සාක්ෂිකරුවන් කිහිපදෙනෙක් විසින් පැමිණිළි ඉදිරිපත් කර තිබෙනවා, ඔවුන්ගේ සාක්ෂිය නිසි පරිදි මාධ්‍යයෙන් වාර්තා වෙලා නෑ කියලා. මෙම කොමිෂම සොයා බලනු ලබන කාරණා මේ රටේ ජාතික ආරක්ෂාවටත්, විශේෂයෙන්ම මේ සිද්ධිවලින් මියගිය , තුවාල ලැබූ පිරිස්වල පවුලේ අයට විශාල වශයෙන් බලපෑමක් කිරීමට හැකියාවක් වූ සිද්ධියක් , සිද්ධීන් දාමයක් හේතුවෙන් ආරම්භයේදී පටන් මෙම කොමිෂම තීරණය කෙරුවා, හැකිතාක් කොමිෂමේ කටයුතු විවෘතව ලබාගැනීමට. එහි ප්‍රධාන අරමුණ වුනේ, කොමිෂම ඉදිරියේ සිදුවන සියලු කටයුතු විනිවිදභාවයකින් යුක්තව මහජනතාවට දැනගැනීමට හැකිවන පරිදි සිදුකිරීම තමයි ඒ තීරණයට බලපෑවේ. ඒ පරමාර්ථය ව්‍යර්ථවීමක් සිදුවෙනවා , කොමිෂම ඉදිරියේ සිදුවන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි නිවැරදිව මහජනතාව අතරට ගියේ නැත්නම්. කොමිෂමේ ආරම්භයේ පටන් සියලු මාධ්‍යය කොමිෂමේ කාර්යන්වලට දැක්වූ සහයෝගය කොමිෂම ඉතා අගය කොට සලකනවා. විශේෂයෙන්ම අපි නොයෙක් අවස්ථාවලදී මාධ්‍යයෙන් ඉල්ලීම් කෙරුවා, යම් සාක්ෂිකරුවන්ගේ නම් ප්‍රසිද්ධ නොකරන ලෙසට, යම් යම් කරුණු ප්‍රසිද්ධ නොකරන ලෙසට, ඒ සම්බන්ධයෙන් මාධ්‍යයෙන් අපට දැක්වූ සහයෝගය අපි ඉතා අගය කොට සලකනවා. ඉතින් ඒ දායකත්වය මතක් කරමින්, කොමිෂමේ ඉදිරි කටයුතුවලටත් අර අපි මේ කටයුතු විවෘත කිරීමට හේතුවුණු, මහජනතාවට නිවැරදිව දැනගැනීමට ලැබෙන හැකියාව ඒ අයුරින්ම ඉටුකරන ලෙසට මාධ්‍යයෙන් ඉල්ලීමක් කරනවා.

දමිල භාෂාවෙන් සාක්ෂි ලබාදේ
නම - රාසරත්නම් කවිදා.
වයස - 43
ආගම හින්දු
ජාතිය -දෙමළ
විවාහකයි. ස්වාමිපුරුෂයාගේ නම මුරුගේසු මහෙන්ද්‍රන්
දෙමල භාෂාවෙන් සහතික වෙයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

උ තේටාතීල් ගමේ නිවසේදි තමයි මම උපත ලැබුවේ.
ප්‍ර ඒක මොන දිස්ත්‍රික්කයේද තියෙන්නේ?
උ මඩකලපු දිස්ත්‍රික්කයේ.
ප්‍ර කවිදම්මගේ ගෙදර කොහෝද තියෙන්නේ? අම්මයි, තාත්තයි , කවිදම්මයි හිටිය ගෙදර කොහේද තියෙන්නේ?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ බොම්බු පාර, මාන්කාඩු කියන ගමේ.

ප්‍ර කවිදම්මගේ තාත්තා මොකද කළේ?

උ ඔහු මාලු වෙළඳාම කළේ. දැනට ගෙදර ඉන්නවා.

ප්‍ර අම්මා?

උ අම්මා නිවසේ ඉන්නවා.

ප්‍ර තාම අම්මයි, තාත්තයි කවිදම්මත් එක්ක නේද ඉන්නේ?

උ ඔව්.

ප්‍ර එතකොට කවිදම්මට තව ඉන්නව නේද අයිය කෙනෙක්?

උ ඔහු විදේශගතව ඉන්නවා.

ප්‍ර අයියා විවාහකයිද?

උ ඔව්.

ප්‍ර එතකොට කවිදම්මගේ මල්ලී?

උ ඔහු ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඩීඕ වශයෙන් සේවය කරනවා. සංවර්ධන නිලධාරි වශයෙන් සේවය කරනවා.

ප්‍ර එයත් විවාහකද?

උ ඔව්.

ප්‍ර එයා කොහේද ජීවත්වෙන්නේ? පුත්තලමෙද?

උ ඔව්. ඔහු පුත්තලමේ ජීවත්වෙනවා.

ප්‍ර. එතකොට නංගී?

උ නංගී මගේ නිවස ආසන්නයේම ජීවත්වෙනවා.

ප්‍ර කොච්චර කිට්ටුවෙන්ද?

උ එක අඩියක් පමණ. ඒ කියන්නේ එකම වැටේ.

ප්‍ර කවිදම්මගේ ගෙදර එඩ්‍රස් එක මොකක්ද?

උ අංක 456, බෙම්බු පාර, මාණ්කාඩු, කලවන්චිකුඩි.

ප්‍ර දැන් ගොඩක් කිට්ටුවෙන්නේ නංගි ඉන්නව කියලා කිව්වේ?

උ ඔව්.

ප්‍ර නංගිත් විවාහකද?

උ ඔව්

ප්‍ර නංගීගේ මහත්තයගේ නම මොකක්ද?

උ සෙල්වරාජා ජෙයකුමාර්

ප්‍ර ජෙයකුමාරුත් පිටරටටද රක්ෂාව කරන්නේ?

උ ඔහු සෞදි එකේ රියදුරෙකු වශයෙන් කටයුතු කරනවා.

ප්‍ර එතකොට ඔය ජෙයකුමාර්ට තව සහෝදර සහොදරියෝ ඉන්නවාද?

උ ඔව්.

ප්‍ර සහෝදරයෝද? සහෝදරියෝද?

උ සහෝදරයෙක් සහ සහෝදරියන් දෙදෙනෙක් ඉන්නවා.

ප්‍ර සහෝදරියෝ දෙන්නෙක් ඉන්නවා. මොනවද ඒ අයගේ නම්?

උ සෙල්වරාසා අරුන්දතී, සෙල්වරාසා ලලිතා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප එතකොට සහෝදරයාගේ නම?

උ දේවකුමාර්.

ප කවිදම්මත් විවාහ වුනානේ නේද? මහත්තයාගේ නම මොකක්ද?

උ මුරුගේසු මහේන්ද්‍රන්.

ප මොන අවුරුද්දේ විවාහ වුනේ?

උ අපි විවාහය ලියාපදිංචි කරලා නැහැ.

ප නැහැ කමක් නැහැ. ඒ කියන්නේ සාමාන්‍යයෙන් හින්දු ආගමේ චාරිත්‍රානුකූලව විවාහ වෙනවානේ නේද? කස්ටම්, කස්ටම්, ඔව්. ඒකේ වැරැද්දක් නැහැ. කොයි අවුරුද්දේ ඉඳලද මහත්තයත් එක්ක ජීවත් වෙන්න පටන් ගත්තේ?මන් ඒක අහන්නේ , මොකද මතකද 2006 අවුරුද්දේදී කවිදම්මගේ මහත්තයා නැතිවුනා නේද?

උ ඔව්.

ප එතකොට කවිදම්මට දරුවෝ හිටියනේ?

උ ඔව්.

ප ඒක ගැන දැනගන්න මේ කතාකරන්නේ හොඳද? කවිදම්මට ඒ විවාහයෙන් දරුවෝ කී දෙනෙක් ලැබුණද?

උ දරුවන් දෙදෙනෙක්.

ප දෙදෙනෙක් හම්බවුණා, දුවලද? පුතාලද?

උ පිරිමි දරුවෙකුයි, ගැහැණු දරුවෙකුයි.

ප වැඩිමල් එක්කෙනා කවුද?

උ. පුලස්තිනි.

ප පුලස්තිනි තමයි වැඩිමල් එක්කෙනා. එතකොට බාලයා පුතාද?

උ ඔව්.

ප පුතාගේ නම මොකක්ද?

උ මහේන්ද්‍රන් කේමරාජන්.

ප කේමරාජන් මේ වන විට පිටරටද රක්ෂාව කරන් නේ?

උ ඔව්

ප එයා මොන අවුරුද්දේද ඉපදුණේ? කවදද එයාගේ උපන්දිනේ?

උ 1998 පෙබරවාරි මාසේ 10 වෙනිදා.

ප එතකොට පුලස්තිනි ඉපදුනේ කවදද?

උ 1996 මාර්තු මාසේ 07 වෙනිදා.

ප පුලස්තිනි ඉපදුනාට පස්සේ ඒ ඉපදීම ලියාපදිංචි කළා නේද?

උ ඔව්.

ප කවිදම්මට මම ඒ උප්පැන්න සහතිකය පෙන්නුවොත්, මතක් වෙයිද?

උ ඔව්.

ප බලන්නකෝ මේ ලේඛණය,

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ස්වාමීනි එම උප්පැන්න සහතිකය පුලස්තිනීගේ බවට සාක්ෂිකාරිය විසින් හඳුනාගන්නා ලද එම උප්පැන්න සහතිකය C.950 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා

කවිදම්මා පුලස්තිනීගේ පින්තූරයක් පෙන්නුවොත් , කවිදම්මට හඳුනාගන්න පුලුවන් නේද? දැන් සමහර ප්‍රශ්ණ අපිට අහන්න වෙනවා හොඳේ, දුකයි තමයි, ඒ ප්‍රශ්න මට අහන්න සිද්ධවෙන නිසා අහනවා හොඳේ? කල්පනා කරලා ඒකට උත්තර දෙන්න.

මේ අවස්ථාවේදී C.950 වශයෙන් ලකුණු කරන ලද ලේඛණය දමිළ භාෂාවෙන් දෙන ලේඛණයක් හෙයින්. එය සිංහලයට පරිවර්තනය කර ඉදිරිපත් කරන ලෙසට ඔබ සභාවේ භාෂා පරිවර්තකට නියෝග කරන අතර. එසේ ඉදිරිපත් කළ පසු එම පරිවර්තනය C.950 A වශයෙන් ලකුණු කරන බව සටහන්කර තබනවා.

මේ අවස්ථාවේදී සාක්ෂිකාරිය සංවේදී වූ බව සටහන් කර තබමි.

ප්‍ර අර ස්ක්‍රීන් එකේ පින්තූර 02ක් තියෙනවා නේද? ඒකේ ඉන්නේ කවුද කියලා හඳුනන්න පුලුවන්ද?

උ පින්තූර දෙකේම ඉන්නේ මගේ දුව තමයි. මේ පින්තූර දෙකේම ඉන්නේ මගේ දුව පුලස්තිනීමයි. මහේන්ද්‍රන් පුලස්තිනි.

(ස්වාමීනි එම ඡායාරූප C.951 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා.)

ප්‍ර කවිදම්මා පුලස්තිනි මොන ඉස්කෝලෙද ඉගෙන ගත්තේ?

උ තේටාතිව් මහාවිද්‍යාලයට තමයි ඇය ගියේ.

ප්‍ර පුලස්තිනී කීයට වෙනකම් ඉගෙන ගත්තද?

උ තේටාතිව් මහාවිද්‍යාලයේ සාමාන්‍ය පෙළ දක්වා ඉගෙනුම ලැබුවා.

ප්‍ර සාමන්‍ය පෙළ විභාගය සාමාන්‍යයන් හොඳට පාස්වුනා නේද? සමත්වුනා නේද පුලස්තිනී?

උ ඔව්. ඒ සාමාර්ථ 08 කුයි, බී සාමාර්ථ එකකුයි අරගෙන සමත්වුණා.

ප්‍ර. ඊට පස්සේ පුලස්තිනීගේ තාත්තා, ඒ කියන්නේ කවිදම්මගේ මහත්තයා නැතිවුනේ කොයි කාලේද? 2006 නේද?

උ. ඔව්.

ප්‍ර. කවිදම්මා මේ පොඩි ප්‍රශ්ණයක් දැනගන්න ඕන, මේකේ පින්තූර දෙකක් තියෙනවානේ ඒ දෙකම පුලස්තිනි කියලා කිව්වනේ, අර පළවෙනි පින්තූරය ගත්තේ කොයිකාලයේද කියලා මතකද?

උ. මම මාගේ දුවව මාස 04කට අබුඩාබියට එක්කන් ගියා. එම අවස්ථාවේ ගත්ත පින්තූරය තමයි 01 වෙනි එක. වම් පැත්තේ කොනේම තියෙන්නේ.

ප්‍ර කොයි වකවානුවේද?

උ 2016 ජනවාරි මාසයේ 06 වෙනිදා. පිටරට ඉදලා ආපසු ආවේ 2016 ජනවාරි 06 වෙනිදා.

FAIR COMMENT BY JEZEEM

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

අහන ප්‍රශ්ණයට විට උත්තර දෙන්න. පින්තූරය ගත්තේ කවදාද?

උ මෙය 2016 දී මං සමඟ අබුඩාබි වල සිට පැමිණෙමින් සිටි අවස්ථාවේදී තමයි ඒක ගත්තේ,
ස්ටුඩියෝ එකකින්.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයෙෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර ඊළඟට දකුණු පැත්තේ තියෙන පින්තූරය කවදද ගත්තේ?

උ එය අපේ ගෙදර ඇය පාසලට යන අවස්ථාවේදි ගත් පින්තූරයක්. දකුණු පැත්තේ එක තමයි විදේශගතව සිටින විට ගත්ත එක.

ප්‍ර ඔව් අපිට තේරුණා, පොඩ්ඩක් අමතක වුණා කියලා, ඒ කියන්නේ දකුණු පැත්තේ තියෙන්නේ අබුඩාබිවල ගියපු වෙලාවේ ගත්ත එක නේද?

උ ඔව්.

ප්‍ර වම් පැත්තේ තියෙන්නේ ඉස්කෝල් යන කාලේ ගත්ත එක?

උ ඔව්. වම් පැත්තේ තියෙන්නේ ඉස්කෝලේ යන අවස්ථාවේදි ගත්ත පින්තූරය. දකුණු පැත්තේ තියෙන්නේ අබුඩාබියේදි ගත්ත පින්තූරය.

ප්‍ර එතකොට දැන් අර මම ඇහුවනේ කවිදම්මගෙන් මහත්තයා නැතිවුන වෙලාව , එතකොට 1996 නේ පුලස්තිනි ඉපදුනේ, එතකොට 2006 මහත්තයා නැතිවන විට පුලස්තිනීට අවුරුදු 10ක් විතර වෙනවානේ,

උ ඔව්.

ප්‍ර දැන් මහත්තයා මොකක්ද කරපු රැකියාව?

උ ඔහු කටාර් රටේ ක්ලීනින් ආයතනයක සේවය කළා.

ප්‍ර. එතකොට මහත්තයා නැතිවුනාට පස්සේ කොහොමද ජීවත් වෙන්ඩ සල්ලි හොයාගත්තේ කවිදම්මලා?

උ මම කඩයක් කලා. ඒ සමගම මගේ ඉඩමේ එලවලු වගා කළා. ඊට පස්සේ තමයි මම රට ගියේ.

ප්‍ර ඒ කොයි කාලේද කවිදම්මා පිටරට ගියේ? මතකද දළ වශයෙන් කොයි කාලේද කියලා?

උ. මම අවුරුදු 10ක් පිටරට සේවය කරලා තියෙනවා, යනවා එනවා මුලින්ම ගියේ කවදාද කියන එක මතක නැහැ.

ප්‍ර මතක නැහැ. කමක් නැහැ. දැන් පුලස්තිනි හොදට විභාගය පාස්වුනා කිවානේ ඕලෙවල් ඒ 08යි, බී.01යි නේද?

උ ඔව්.

ප්‍ර ඊට පස්සේ ඇය අධ්‍යාපන පොදු සහතික උසස් පෙළ, ඒ ලෙවල් විභාගයට ලැස්තිවුනාද?

Proof Copy
FAIR COMMENT
BY JEZEEM

උ පට්ටිරිප්පු කලවංචිකුඩි මහාවිද්‍යාලයේ ඇය උසස්පෙළ අධ්‍යාපනය ලැබුවා.

ප්‍ර එතකොට ඒ කාලයේදී කවිදම්මා පිටරට ගිහිල්ලාද හිටියේ?

උ ඔව්.

ප්‍ර මොන රටේද හිටියේ?

උ අබුඩාබි.

ප්‍ර අබුඩාබි වල රැකියාව කෙරුවා, එතකොට ඔය උපකාරක පංති ටියුෂන් ගියාද පුලස්තිනී? ඔය කාලයේ?

උ කල්මුණේදී බයෝ සයන්ස් ටියුෂන් ක්ලාස් ගියා.

ප්‍ර එතකොට දැන් කවිදම්මත් ගෙදර නැනේ, මහත්තයත් මියගිහිල්ලානේ, එතකොට පුලස්තිනියි එයාගේ මල්ලියි හිටියේ කා ගාවද?

උ මගේ අම්මා සහ තාත්තා. අපේ මල්ලිත් හිටියේ අපේ ගෙදරමයි. ඔවුන් එක්ක හිටියා.

ප්‍ර. ඒ හිටපු ගෙදර එඩ්‍රස් එක මොකක්ද?

උ. ඒ ගෙදරමයි හිටියේ.

ප්‍ර. අර කලින් ඇඩ්‍රස් එක දුන්න ගෙදරමයි හිටියේ?

උ. ඔව්.

ප්‍ර. ඉතින් කවිදම්මට මහත්තයා නැතිවුනාට පස්සේ හිටියේ තමන්ගේ දරුවෝ දෙන්නනේ, නේද?

උ. ඔව්.

ප්‍ර. ඉතින් දැන් පිටරට ඉන්නකොට අබුඩාබි වල ඉන්නකොට නිතර දරුවෝ ගැන හොයලා බැලුවද?

උ. මම නිතරම ඔවුන් සමග දුරකථනයෙන් කතා කරනවා.

ප්‍ර. දුරකථනයෙන් කතාකරනවා?

උ. ඔව්.

ප්‍ර. එතකොට තොරතුරු දැනගත්තා එහෙමද?

උ. ඔව්. අපි ඉගෙනගන්නවා කියලා ඔවුන් කියනවා.

ප්‍ර. කවිදම්මා දන්නවාද පුලස්තිනි සමාන්‍ය යෙන් ගොඩක් යාලුකම් එහෙම පැවත්තුවාද කියලා යාලුවෝ ත් එක්ක?

උ. එහෙම නෑ. නමුත් කල්මුණේ ටියුෂන් පන්ති ගියාට පස්සේ, ඇයට ගොඩාක් සම්බන්ධකම් ඇතිවෙලා තිබ්බා.

ප්‍ර. මොකක්ද කවිදම්මා ඒ කිව්ව එකේ තේරුම? ඇයි එහෙම කීවේ?

උ. මට දුරකථනයෙන් කතා කරන අවස්ථාවේ කියනවා, මම අහවල් එක්කෙනා එක්ක කෑම කනවා, ඒ විදියට නිතර මට දන්වනවා.

ප්‍ර. දැන් ඕලෙවල් වලින් පස්සේ කවිදම්මා ලංකාවේ නැති කාලේ කොයිවෙලාවක හරි දැනගන්න හම්බවුනාද පුලස්තිනි ගෙදරින් ගිහිල්ලා කියලා?

උ. ඇය ටියුෂන් ක්ලාස් එකට ගිය වෙලාවේ තමයි අතුරුදහන් වුනේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර. අතුරුදහන් වුනා. ඒ කවද විතරද කවිදම්මා?

උ. 2015.07.25 වෙනිදා.

ප්‍ර. 25ද, 29ද කවිදම්මේ?

උ. 29 වෙනිදා.

ප්‍ර. ඉතින් ඔය තොරතුර අබුඩාබි ඉන්න කවිදම්මට කවුද කීවේ?

උ. මගේ අම්මා සහ නංගී කෝල් කරලා කීවා, ක්ලාස් එකට ගිය පුලස්තිනි ආවේ නෑ කියලා.

ප්‍ර. ඉතින් එතකොට කවිදම්මා කලබල වුනාද?

උ. ඔව්.

ප්‍ර. ඉතින් මොකක් හරි උපදෙසක් දුන්නද කවිදම්මගේ අම්මට මොනවද කරන්න ඕන කියලා?

උ. කලවංචිකුඩි පොලිසියට ගිහිල්ලා පැමිණිල්ලක් දාන්න කියලා මම අම්මාට උපදෙස් දුන්නා.

ප්‍ර. ඒ අනුව පැමිණිල්ලක් දාලා තිබ්බාද අම්මා?

උ. අම්මා නංගී ඔක්කොම ගිහිල්ලා පැමිණිල්ලක් දාලා තිබුණා.

ප්‍ර. පැමිණිල්ලක් දාලා තිබුණා. එතකොට ඔය සිද්ධියට පස්සේ, ඒ පැමිණිල්ල දැම්මේ කවද්ද කියලා මතකයිද ඔබට? ඒ පළවෙනියෙන්ම නැතිවුනාට පස්සේ?

උ. 2015.07.30 වෙනිදා.

ප්‍ර. කලවංචිකුඩි පොලිස් ස්ථානයට ඒ පැමිණිල්ල දැම්මට පස්සේ, කවිදම්මගේ ගෙදර හිටපු අම්මව කවුරු හරි එතෙක් අම්මා අදුනන්නේ නැති කෙනෙක් දුරකථනයෙන් කතාකරලා සම්බන්ධවෙලා තිබුණාද?

උ. රාසික් යන තැනැත්තා කෝල් කරලා තියෙනවා.

ප්‍ර. කාටද කතා කරලා තියෙන්නේ?

උ. මගේ මල්ලිට කතා කරලා තියෙනවා.

ප්‍ර. ඒ රාසික් කියන තැනැත්තාගේ සම්පුර්ණ නම කවිදම්මට මතකද මේ වෙලාවේ?

උ. අබ්දුල් රාසික් කියලා දන්නවා. ඊට වැඩිය සම්පුර්ණ නමක් දන්නේ නැහැ.

ප්‍ර. එහෙම කතා කරලා අබ්දුල් රාසික් මොනවද කියලා තිබෙබේ?

උ. අපි පොලිසියට පැමිණිලි කරපු බව දැනගෙන වෙන්ඩ ඇති, ඔහු අපිට කතා කරලා කිව්වා , අපේ කස්ටඩිය අපේ භාරයේ තමයි ළමයා ඉන්නේ. අපි සතියකින් පස්සේ හෝ ඊට පසුදිනක අපි එවන්නම් කියලා.

ප්‍ර. මා කිව්වොතින් නිවැරදිද ඔය පුලස්තිනි ගෙදරින් යන වෙලාව වෙනකොට ඒ කියන්නේ, 2015 ජුලි මාසයේ 29 වෙනිදා වෙනකොට ඇයට වයස අවුරුදු 19ක් වුනා කියලා.

උ. 18 අවසන් වෙලා තිබුණා.

ප්‍ර. මොනවද දැනගත්ත තොරතුරු ඔය අබ්දුල් රාසික් කතාකරපු වෙලාවේදි?

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ඇ. දුව අපේ බාරයේ කස්ටඩි එකේ ඉන්නවා, ඇය අපි එක්ක ඉන්න කැමතියි කියලාත් කියනවා, යනුවෙන් තමයි මම දැනගත්තේ.

ප්‍ර. එතකොට කවිදම්මා ද්‍රවිඩනේ නේද?

ඇ. ඔව්.

ප්‍ර. ආගම මොකක්ද?

ඇ. හින්දු.

ප්‍ර. එතකොට පුලස්තිනි? පුලස්තිනිත් හින්දුනේ?

ඇ. හින්දු

ප්‍ර. දැන් අර අබ්දුල් රාසික් එක්ක කතාකරන අවස්ථාවේදී පුලස්තිනී තවදුරටත් හින්දු ආගම අදහනවද නැද්ද කියන එක ගැන දැනගන්නට ලැබුණද?

ඇ. අබ්දුල් රාසික් ළඟ ඉන්න කාලයේ මුස්ලිම් ආගමට ආගම වෙනස් කරලා තිබුණා.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර. අබ්දුල් රාසික් හඳුනන්නේ කොහොමද තමන්ලා?

ඇ. අපි දැනගෙන හිටියේ නැහැ ඔහු තමයි දුරකථනයෙන් කතාකරලා කීවේ.

ප්‍ර. කලින් අඳුනනවද? අබ්දුල් රාසික්?

ඇ. දන්නේ නැහැ.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය</u>

ප්‍ර. ඔබ දැන් සඳහන් කරපු ඔය යම් යම් තොරතුරු , ඒ කියන්නේ අබ්දුල් රාසික් කියන තැනැත්තා කතාකරලා, ඔවුන් ළඟ ඔබේ දුව පුලස්තිනි ඉන්නව කිව්ව එක, ඒවගේම ඇය මුස්ලිම් වෙලා තියෙනවා කියන කරුණ , ඒවා සියල්ම ඔබට නෙවෙයිනේ කිව්වේ?

ඇ. නැහැ.

ප්‍ර. ඒව කිව්වේ ඔබ කියන්නේ ඔබේ සහෝදරයාට කියලා?

ඇ. ඔව්.

ප්‍ර. අම්මටත් කියලා තිබ්බද? ඔබේ අම්මටත්?

ඇ. ඔව්.

ප්‍ර. එතකොට ඔවුන්ගෙන්ද ඔබ ඔය තොරතුරු දැනගත්තේ?

ඇ. ඔව්

ප්‍ර. ඔබ ඔය තොරතුරු දැනගත්ත අවස්ථාවේ එතකොට හිටියේ අබුඩාබිවලනේ?

ඇ. ඔව්

ප්‍ර. ඔබ එතකොට මොකද කළේ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ. ටිකට් අරගෙන ආවා.

ප්‍ර. ඔව් දැන් දුව හොයන්න ඕනනේ, ඒක නිසා කවිදම්මා ලංකාවට ආවා නේද?

උ. ඔව්.

ප්‍ර. දැන් කවිදම්මාට මතකද කවද වගේද ලංකාවට ආවේ කියලා කියන්න?

උ. 2015.07.05

ප්‍ර. 2015.07.05 එන්න බෑනේ, දුව ගියේ 29නේ. කවිදම්මේ ජුලි මාසේ 29නේ දුව ගියා කියලා දැනගත්තේ, දැන් කවිදම්මා ලංකාවේ හිටියද ඔය අබ්දුල් රාසික් කතාකරලා, සහෝදරයටයි අම්මටයි ඔය තොරතුරු කියන කොට පුලස්තිනි ගැන?

උ. හිටියේ නැහැ. මම විදේශගත වෙලා හිටියේ.

ප්‍ර. එතකොට පුලස්තිනි ගියා කියලා දැනගත්තේ 2015 ජුලි මාසේ 29 වෙනිදානේ? ගෙදර ආවේ නැත්තේ?

උ. ඔව්.

ප්‍ර ඒ තොරතුරු දැනගත්තට පස්සේ නේද, අබ්දුල් රාසික් කතාකරලා පුලස්තිනි ගැන තොරතුරු කිව්වට පස්සේනේ කවිදම්මා අබුඩාබිවල ඉදලා ආවේ ලංකාවට?

උ. ඔව්. පණිවිඩය ලැබිලා සතියක් තුළ මම ආවා.

ප්‍ර. පණිවිඩය ලැබිලා සතියක් තුළ ආවා. ඒ පණිවිඩය ලැබුණට පස්සේ ආවේ. ලංකාවට ඇවිල්ලා මොකද කළේ?

උ. මාලිගාවත්තේ රාසික්ගේ තැන හොයාගෙන ගියා.

ප්‍ර. කොහොමද ගියේ? තනියමද ගියේ?

උ. මගේ මල්ලියි, මල්ලිගේ නැන්දයි සමග ගියේ.

ප්‍ර. කොහාටද ගියේ?

උ. ඔෆිස් එක මම දන්නේ නැහැ. මාළිගාවත්තේ තව්හිද් ජමාත් .

ප්‍ර. කවිදම්මේ මට තේරෙන්නේ නැති දෙයක් තියෙනවා, කවිදම්මා කිව්වා අබ්දුල් රාසික් කියල කෙනෙක් කතා කරලා තිබුණා අම්මටයි, මල්ලිටයි. ඒ කතා කරලා පුලස්තිනි ඒගොල්ලන් ගාව ඉන්නවා කියලා කීවා. කවිදම්මා ඊට සුමානයකට පස්සේ ඇවිල්ලා තමන්ගේ නෑදෑයොත් එක්ක දැන් යනවා. දුවව හොයාගෙන. මාළිගාවත්තේ තව්හිද් ජමාත් කාර්යාලයට යන්න හේතුවුනේ මොකක්ද?

උ. අබ්දුල් රාසික්ට දුරකථනයෙක් කතා කරලා, ඒ ස්ථානය කොහේද තියෙන්නේ කියලා දැනගෙන මගේ මල්ලී සහ මල්ලිගේ නැන්දා තමයි මාව එතනට එක්කන් ගියේ.

ප්‍ර. කොයි වෙලාවේද ඒ ගැන දැනගත්තේ අබ්දුල් රාසික්ගෙන් මේ ස්ථානය ගැන?

උ. 2015.07 වෙනි මාසේ තමයි නමුත් දිනය හරියට මතක නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර. 2015.07 වෙනි මාසේ වෙන්න බැහැනේ කවිදම්මේ, 29 වුනාට පස්සේ 30 ගිහිල්ලා complain කරනවා, ඊට පස්සේ කොහොමද ජූලි මාසෙම වෙන්නේ , මතක් කරලා කියන්නකෝ?

උ. අපි ගියා ඒ ගිය දවස දිනය මට හරියට මතක නැහැ.

ප්‍ර. හරි හරි අර ලංකාවට සුමානයකට පස්සේ ඇවිල්ලා ඊට පස්සෙනේ මේක වෙන්නේ?

උ. ඔව්.

ප්‍ර. එතකොට අබ්දුල් රාසික් කිව්වයි කියලා කිව්වා, මේ තව්හිද් ජමාත් සංවිධානයේ කාර්යාලය කොතනද තියෙන්නේ කියලා?

උ. ඔව්.

ප්‍ර. ඒ පිළිබඳව අබ්දුල් රාසික්ගෙන් දැනගත්තේ දුරකථනයෙන්ද?

උ. ඔව්.

ප්‍ර. ඔබද කතා කළේ?

උ. අපේ ගෙදර අයත් කතාකරලා තිබුණා දුරකථනයෙන්. මම පිටරට ඉන්දැද්දිත් අබ්දුල් රාසික්ට කතාකලා.

ප්‍ර. අබ්දුල් රාසික්ගේ මොන අංකයකටද කතාකළේ? ඒ කියන්නේ කවිදම්මා දැන් ස්ථාවර දුරකථන තියනවා, මොබයිල් තියෙනවා,

උ. මම මෙහෙට ඇවිල්ලා තමයි අබ්දුල් රාසික් එක්ක දුරකථනයෙන් කතා කලේ. 075-2607503

ප්‍ර. කොයි වෙලාවක හරි 077-8747377 කියලා අංකයකට කතාකරලා තියෙනවාද? එක්කෝ කවිදම්මා හරි නැත්නම් කවිදම්මාගේ ගෙදරින් හරි මේ අබ්දුල් රාසික්ව සම්බන්ධ කරගන්න?

උ. ඔව්. කතාකරලා තියෙනවා.

ප්‍ර. ඒ දුරකථනයෙන් කතාකරලා ඒක අබ්දුල් රාසික්වද සම්බන්ධ කරගත්තේ, ඒ දුරකථන අංකයෙන්?

උ. ඔව්.

ප්‍ර. එතකොට දැන් ඔය තවුහිද් ජමාත් කාර්යාලයට ගියාට පස්සේ මොකක්ද වුනේ? ඒක මාලිගාවත්තේද තියෙන්නේ?

උ ඔව්.

ප්‍ර මොකක්ද වුනේ කවිදම්මා?

උ. එහි ගිහිල්ලා වාඩිවෙලා ඉන්නකොට ටික වෙලාවකින් පසු එක් ගැහැණු කෙනෙක් සම්පූර්ණයෙන් වහගෙන, මගේ දුවත් ඒ වගේම සම්පූර්ණයෙන් වහගෙන එක්කගෙන ආවා.

ප්‍ර. එතකොට කවිදම්මා දැක්කා පුලස්තිනීව නේද?

උ. දැක්කා.

ප්‍ර. පුලස්තිනීත් එක්ක කතාකරන්න පුලුවන් වුනාද ඒ වෙලාවේ?

FAIR COMMENT BY JEZEEM

උ. ඔව්. සම්පූර්ණයෙන්ම කතාකරන්න දුන්නේ නැහැ. සීසීටීවී කැමරා එකෙන් බලලා, මම කතාකරනවා දැක්කහම එනවා එතකොට අපි නතරකරනවා ආයේ කතාකරනවා.

ප්‍ර. කවුද මේ එන්නේ?

උ. රාසික් සහ ඔහු සමග සිටි ඔහුගේ සගයන්.

ප්‍ර. එතකොට දැන් අපි ඒකට එමු, පුලස්තිනි ව දැක්ක වෙලාවෙදි ඔය කාර්යාලයට ගෙනාව කියලා කිවනේ තව ගැහැණු එක්කෙනෙක් එක්ක? ඇය කොයිවගේද ඇදගෙන හිටියේ පුලස්තිනි ?

උ. අබායා ඇදගෙන හිටියේ.

ප්‍ර. හොදයි. දැන් ඡායාරූපයක් පෙන්වනවා ඒවගේද පුලස්තිනිව දැක්කේ කියලා කියන්නකෝ?

ස්වාමීනි C.918 ඡායාරූපය සාක්ෂිකාරියගේ අවධානයට යොමුකරනවා.

උ. ඔව්.

ප්‍ර. එතකොට කවිදම්මා කිව්වා පුලස්තිනිත් එක්ක දිගටම කතාකරන්න හම්බවුනේ නැහැ, මොකද සීසීටීවී එකෙන් බලලා ඒගොල්ලන් එතනට ආවා කියලා සැරෙන් සැරේ?

උ. මම මගේ ස්ථානයට බලෙන් එයා එක්කගෙන යන්න උත්සාහ කලා. ඒ අවස්ථාවේදී ඔහු සීසීටීවී කැමරාවෙන් බලලා එතනට එනවා.

ස්වාමීනි මේ අවස්ථාවේදී ඉතා ගෞරවයෙන් ගරු කොමිෂන් සභාවේ අවධානය යොමුකරනවා, සාක්ෂිකාරිය විසින් එම සාක්ෂි ඛණ්ඩය ලබාදීමේදී කැමරාවක් දෙස බලා එය සිදුවන ආකාරය පිළිබඳව අභිනයෙන් පෙන්නුම් කරනු ලැබුවා. එමනිසා ඇගේ හැසිරීම සම්බන්ධයෙන් සටහන් කරන අවස්ථාවේදී එය ගරු අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටිනවා.

ප්‍ර. ඔව්. එතකොට ඒ එහෙම සීසීටීවී කැමරා එකෙන් බලලා ඒගොල්ලන් ආවේ කවිදම්මා පුලස්තිනිට ගෙදර යන්න කතාකරපු වෙලාවේද?

උ. ඔව්.

ප්‍ර. ඉතින් මොනව මොනවද කතාකළේ පුලස්තිනියි. කවිදම්මයි?

උ. මම කීවා ඇයි මෙහෙට ආවේ. දැන් අම්මා ඇවිල්ලා ඉන්නවානේ. අපි යන් ගෙදර කියලා කතා කලා. ඇය මාව දිහා බලලා යන්න කැමතිවෙනවා. පස්සේ ඔහු දිහා දැක්කම අකමැති වෙනවා.

ප්‍ර. කොච්චර විතර වෙලාවක් මෙහෙම තිබ්බද?

උ. 10.00 සිට පස්වරු 3.30 දක්වා එසේ කතාකරමින් සිටියා. මට හරියටම වෙලාව මතක නැහැ 11.00ට විතර මම ඇතුලට යන්න ඇති පැය 4ක් විතර ඇය සමග මම කතාකරන්න ඇති.

ප්‍ර. ඒ කියන්නේ ඔය මුලු කාලය තුලදීම කවිදම්මත්, පුලස්තිනිත් එකිනෙකත් එක්ක කතාකරලා පුලස්තිනි ගෙදර යන්න කැමතිවන අවස්ථාවේදීම , ඒක වැළකෙනවා ඔබ කියන්නේ එතනට කවුරු හරි එන නිසා.

FAIR COMMENT BY JEZEEM

උ. ඔව්

ප්‍ර. එහෙම වරින් වර එතනට ආවේ එක්කෙනෙක් විතරද? නැත්නම් කිහිපදෙනෙක් ආවාද?

උ. ඔහු සමග තව දෙන්නෙක් හිටියා. ඒ තුන්දෙනා තමයි විටින් විට මාරුවෙන් මාරුවට ආවේ.

ප්‍ර. අබ්දුල් රාසික් ඔතන හිටියද?

උ. අබ්දුල් රාසික් තමයි නිතරම ආවේ.

ප්‍ර. එතකොට අර කාන්තාවක් ආවයි කියලා කිවානේ පුලස්තිනිත් එක්ක ඇතුලට?

උ. ඇයගේ ඇස් පමණයි මට පෙනුනේ. කවුද කියලා හඳුනාගන්න බැරිවුනා.

ප්‍ර. ඔබත් පුලස්තිනිත් කතාබහ කරනකොට ඒ කාන්තාව කොහේද හිටියේ?

උ. ඇය කොතනද හිටියේ කියලා මට මතක නැහැ. නමුත් එහේ කාර්යාලයේ තමයි හිටියේ.

ප්‍ර. එතකොට දැන් ඔය ගෙදර ඉන්නකොට පුලස්තිනි ඔය වගේ හිස ආවරනය කරගෙන හිටියේ නැහැනේ, නේද? හිජාබ් එකක් ඇදන් හිටියේ නැනේ.

උ. නැහැ.

ප්‍ර. ඉතින් ඔබ එය ඉවත්කරන්නට එහෙම උත්සාහ කළේ නැද්ද?

උ. මම උත්සහා කළා.

ප්‍ර. ඔය අබ්දුල් රාසික් කියන තැනැත්තාගේ පින්තූරයක් දැක්කොත් ඔබට හඳුනාගන්නට පුලුවන්ද?

උ. ඔව්.

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර. සාක්ෂිකාරිය ඔබ දුවත් එක්ක මොනවද කතා කලේ?

උ. අම්මා ඇවිල්ලා ඉන්නවා යන් ගෙදර කියලා තමයි කතා කළේ.
ස්වාමිනි අන්තර්ජාලයෙන් බාගත කරගන්නා ලද ඡායාරූපයක් සාක්ෂිකාරියගේ අවධානය යොමුකරනවා.

උ. මොහු තමයි රාසික්.
ස්වාමිනි සාක්ෂිකාරිය විසින් හඳුනාගන්නා ලද එම ඡායාරූපය සි.952 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරන්නට අවසර අයදිනවා.

ප්‍ර. දැන් කවිදම්මා කියන විදියට කවිදම්මා කවිදම්මාගේ දුවව ගෙදර ගෙනියන්නට හදනවා, පුලස්තිනීත් කවිදම්මා කතාකරනකොට ගෙදර එන්නට කැමති වෙනවා. ඒ වුනාට අබ්දුල් රාසික් සහ ඔහු සමග සිටි ඇතැම් අය වරින් වර එනවිට පුලස්තිනි ඇගේ අදහස් වෙනස් කරනවා.?

උ. ඔව්.

Practical Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර. ඉතින් ඒක නිසා දැන් කවිදම්මට දරුවව අරගෙන යන්න විදියක් නැනේ, නේද? මොකක්ද කළේ එතකොට?

උ. මාළිගාවත්ත පොලිසියට එක්කගෙන ගියා.

ප්‍ර. කවුරු කවුරුද ගියේ?

උ. මල්ලි, මම, මල්ලිගේ නැන්දම්මා

ප්‍ර. කවුද මේ මාළිගාවත්ත පොලිසියට යන්න ඕන කියන තීරණය ගත්තේ?

උ. මගේ මල්ලිගේ නැන්දම්මා තමයි තීරණය ගත්තේ, ඇයට සිංහල ටිකක් පුලුවන්. ඇය තමයි තීරණය ගත්තේ.

ප්‍ර. ඒ අනුව කවිදම්මලා ගියාද මාළිගාවත්ත පොලිසියට?

උ. ඔව්.

ප්‍ර. එතකොට පුලස්තිනි?

උ පුලස්තිනිව එක්කරගෙන රාසිකුත් ආවා.

ප්‍ර මොනවද කවිදම්මා මාලිගාවත්ත පොලිසියට කීවේ?

උ මගේ දුවව අරන් දෙන්න ගෙදර එක්කන් යන්න ඕන මුස්ලිම් වෙන්ඩ එයාට ඉඩ දෙන්න බැහැ කියලා කීවා.

ප්‍ර එතකොට පොලීසියෙන් මොකක් හරි ප්‍රතිචාරයක් ලැබුනද? ඒක විභාග කරාද? කවිදම්මගේ ඔය පැමිණිල්ල?

උ මේ දරුවව දෙනවා. දවස් 15කට. ඒ දවස් 15 ඇතුලත ඇය හින්දු ධර්මය අනුගමනය කරගෙන හිටියොත් ඔයාට තමයි අයිති. එහෙම නැතිව ඉස්ලාම් ධර්මය අනුගමනය කළොත් ඔයාලා ආපහු මෙයා ගෙනත් දාන්න ඕන නැතිනම් අපි ඔයාව arrest කරනවා කියලා.

ප්‍ර කවුද මේ කියන්නේ?

උ පොලිසියේ අය තමයි කිවේ. එයා වයස අවුරුදු 18ට වැඩි අයෙක්. එයා මේජර් කෙනෙක්. ඒක නිසා එයා කියන විදියට තමයි අපිට කටයුතු කරන්න වෙන්නේ කියලා. පොලිසිය කීවා.

ප්‍ර කියලා පොලිසිය ඉතින් කවිදම්මා මොකද කෙලේ ඒ වෙලාවේ?

උ මම ඒක පිළි අරගෙන දවස් 15කට අත්සන් කරලා දුවව එක්කරගෙන ගියා.

ප්‍ර කොහෙටද එක්කන් ගියේ?

උ අපේ ගෙදර එක්කරගෙන ගියා.

ප්‍ර ඒ කියන්නේ කලවංචිකුඩිවලට?

උ මාන්කාඩු එක්කන් යනවා, ඒ බස් එකේ එන අතරතුරේම ඇය ඒ ඇදුම් ඔක්කොම ගලවලා විසිකරලා දැම්මා.

ප්‍ර ඇදුම් ගැලෙව්වා කියලා කියන්නේ, මොන ඇදුම්ද එයා ඉවත් කරේ?

උ ඇතුලේ සල්වාර් ඒවා දාගෙන හිටියා. ඒ නිසා අනෙක් ඒවා ඉවත්කරලා දැම්මා.

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර ඒ කියන්නේ කවිදම්මා කිව්වා , දැන් අර හිස වහගෙන හිටපු හිජාබ් එකක් දාගෙන හිටිය කිවුවනේ, ඒ හිජාබ් ඇදුම ගැලෙව්වද ඇය?ඒක ගැලෙව්වාද?

උ ඔව්.

ප්‍ර දැන් ගෙදර ගිහිල්ලා ඊට පස්සේ මොකද වුනේ?

****

<u>ගරු විනිසුරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර සාක්ෂිකාරිය ඔබ මාලිගාවත්ත පොලිසියට අබ්දුල් රාසික් සමග යන වෙලාවේ පුලස්තිනි කියන ඔබගේ දියණිය විවාහ කරගත්ත පුද්ගලයාත් එතනට ආවාද?

උ ආවේ නැහැ

මින්පසු සටහන් ගැනිම ල/ලේ මුතුමාලි

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව : පෙ.ව.11.50 යි.
පෙර සටහන් ල/ලේ : යමුනා මිය.
මෙතැන් සිට ල/ලේ : මුතුමාලි.

සාක්ෂිකාරිය විසින් දෙමළ බසින් දෙන ලද පිළිතුරු කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක වන ජෝන් කන්දසාමි මහතා විසින් සිංහලයට පරිවර්තනය කරන ලදී.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප : ඇඳුම් ගැලෙවේවා කියලා කියන්නේ මොන ඇඳුම්ද එයාගේ ඉවත් කළේ?

පි : ඇතුලේ සල්වාර් එහෙම දාගෙන හිටියා. ඒ නිසා අනිත් ඒවා ඉවත් කරලා දැම්මා.

ප : ඒ කියන්නේ කවිදම්මා කිව්වා දැන් අර හිස වහගෙන හිටපු හිජාබ් එකක් දාගෙන හිටියා කියලා කිව්වනේ. ඒ හිජාබ් ඇඳුම ගැලෙව්වද ඇයි?

පි : කලේ.

ප : ඒක ගැලෙව්වා?

පි : ඔව්.

ප : දැන් ගෙරද ගිහිල්ලා ඊට පස්සේ මොකද වුණේ? එතකොට දැන් දවස් 15 ක කාලයකටනේ පුලස්තිනිව දුන්නා කියලා කිව්වේ කවිදම්මට පොලිසියෙන්?

පි : ඔව්.

ප : ගෙදර ගෙනල්ලා පුලස්තිනී හිටියේ කවිදම්මලා එක්කද?

පි : මං ළඟ මාස එක හමාරක් පමණ කාලයක් හිටියා.

ප : එතකොට ඔය කාලය තුළදී අබ්දුල් රාසීක් ඔබේ ගෙරද කාට හරි කතා කළාද?

පි : දවස් 15 අවසන් වුණායින් පස්සේ දුරකථනයෙන් කතා කළා.

ප : හා හා කතා කරලා මොකද වුණේ?

පි : දවස් 15 කට තමා ඔයාලා අරන් ගියේ. ඔයාලා ආපහු ගෙනල්ලා භාර දුන්නේ නෑ. අපි නිත්‍යානුකූලව කටයුතු කරනවා කියලා කිව්වා.

ප : එතකොට කවිදම්මා කිව්වා පොලීසියෙන් භාර දෙන කොට කිව්වා කියලා දැන් මේ වෙනකොට පුලස්තිනී වැඩිහිටි කාන්තාවක්. ඒ කියන්නේ වයස අවුරුදු 18 ට වැඩි කෙනෙක්. එතකොට ඇය මේ දවස් 15 ඇතුළතදී හින්දු ආගම අනුගමනය කළොත් ඔබත් එක්ක ඉන්න පුළුවන්. නමුත් මුස්ලිම් ආගම ඒ කියන්නේ ඉස්ලාම් ආගම

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ඇය අනුගමනය කළොත් ඇයව ආපහු භාර දෙන්නට ඕනේ කියලා නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔය දවස් 15 ක කාලයකට ගෙදර ගෙනාවාම පුලස්තිනී ඇය මොකක් හරි ආගමක් ඇඳහුවාද?

පි : ඔව්. හින්දු ආගම තමා අනුගමනය කළේ. මේ හින්දු ආගම අනුව වරලජ්ජී කාප්පු කියන ඒ කාප්පුවත් බැඳලා රතු පාට සාරියකුත් ඇඳලා ඉන්නවා එයා.

ප්‍ර : මම ඔබට ඡායාරූපයක් පෙන්නුවොත් ඒ මොන අවස්ථාවේද කියලා ඔබට කියන්න පුළුවන්ද?

C 919 ඡායාරූපය සාක්ෂිකාරියගේ අවධානයට යොමු කරනවා ස්වාමිනි.

ප්‍ර : මේ කොයි වෙලාවේද කවිදම්මා ඔය පින්තූරේ අරන් තියෙන්නේ?

පි : ඇය මේ කාප්පුව ආගමික කාප්පුව ලබා ගැනීම සඳහා සාරි ඇඳගෙන හිටියා. මම ගේ මිදුලේ ඉස්සරහදී මම මේ photo එක ගත්තා.

ප්‍ර : එතකොට දැන් අබ්දුල් රාසික් අර දවස් 15 ඉවර වුණාට පස්සේ කවිදම්මලාගේ ගෙදරට කතා කළා කියලා කිව්වනේ? කතා කරලා දැන් දවස් 15 ඉවරයි. මොකද පුලස්තිනීව භාර දුන්නේ නෑ කියලා ප්‍රශ්න කෙරුවයි කියලා කිව්වනේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔය කතා කළේ කාටද අබ්දුල් රාසික්?

පි : මගේ මල්ලිට තමයි එහෙම කතා කළේ.

ප්‍ර : එතකොට ඔබේ සහෝදරයා මොකක්ද කියලා තිබ්බේ මල්ලි මොකක්ද කියලා තිබ්බේ අබ්දුල් රාසික්ට?

පි : ළමයා අපේ ආගමට ඇවිල්ලා තියෙනවා ඒ නිසා අපි යවන්නේ නෑ කියලා කිව්වා අපේ මල්ලි. එතකොට ඔහු අපි දන්නවා කොහොමද ගන්න ඕනේ කියලා අපි ඒ විදිහට ගන්නම් කියලා කිව්වා අබ්දුල් රාසික්.

ප්‍ර : ඒ කියන්නේ එහෙම තර්ජනයක් කෙරුවා?

පි : ඔව්.

ප්‍ර : ඉතින් එතකොට කවිදම්මට හිතුන් නැද්ද මොනවා හරි සිද්ධ වෙන්න ඉඩ තියෙයිද කියලා?

පි : ඇය මම සමඟ අපේ ආගමත් අදහමින් සන්තෝෂයෙන් හිටියා. ඒ නිසා මම ඒ ගැන එහෙම හිතුවේ නෑ.

ප්‍ර : කවිදම්මට ඔය කාලේ අසනීප වුණා මතකද?

පි : ඔව්.

ප්‍ර : බෙහෙත් ගන්නත් ගියානේ ඒකට?

පි : ඔව්.

Prosecutor's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙම බෙහෙත් ගන්න යන අවස්ථාවකදී කවිදම්මා පුලස්තිනීත් එක්ක ගියාද?

පි : ඔව්.

ප්‍ර : එහෙම බෙහෙත් ගන්න පුලස්තිනිත් එක්ක ගිය එක වෙලාවකදී කවිදම්මා බෙහෙත් අරගෙන එන කොට පුලස්තිනීව හොයා ගන්න පුළුවන් වුණාද?

පි : මම ඉස්පිරිතාලේට ගිහිල්ලා දොස්තර හම්බ වෙන්න ඇතුළට ගියා ඇවිත් බලන කොට ඇය හිටියේ නෑ.

ප්‍ර : ඉතින් කවිදම්මාට පුලස්තිනී කියලා තිබ්බද ඇය කෝහාට හරි යනවා කියලා එදා?

පි : කිව්වේ නෑ.

ප්‍ර : එහෙනම් කවිදම්මා පුලස්තිනී හෙව්වද?

පි : ඔව්.

ප්‍ර : කොහේ කොහේද හෙව්වේ?

පි : ජීව Hospital එක ළඟ ත්‍රී රෝද රථයක් අරගෙන මඩකලපුව දුම්රිය පොළට ගිහිල්ලා බැලුවා. ඊට පස්සේ හය හමාර විතර රෑ වුණා. පස්සේ මඩකලපුව පොලීසියට ගොස් පැමිණිල්ලක් කළා.

ප්‍ර : කවදද කවිදම්මේ මේක වුණේ?

පි : 2015 සැප්තැම්බර් 24 වෙනිදා.

ප්‍ර : 24 වෙනිදා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී සාක්ෂිකාරිය සංවේදීව පිළිතුරු ලබා දෙන බව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අජේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : කවිදම්මා ඒ පැමිණිල්ල මඩකලපුව පොලීසියට කළාට පස්සේ මඩකලපුව පොලීසියෙන් රිසිට් එකක් දුන්නද?

පි : ඔව් දුන්නා. ඒක මම ගෙනත් තියෙනවා.

ප්‍ර : ඒක තියෙනවා නේද?

පි : ඔව්.

ප්‍ර : ඒක ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : මගේ බෑග් එකේ තියෙනවා.

ප්‍ර : ඒකේ පිටපතක් දැක්කොත් අඳුරන්න පුළුවන්ද?

පි : ඔව්.

ප්‍ර : ඒකද රිසිට් එක?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ස්වාමිනි මඩකලපුව පොලිසිය විසින් සාක්ෂිකාරිය වෙත 2015 සැප්තැම්බර් මස 24 වෙනි දින නිකුත් කොට ඇති එම පැමිණිලි ලඳුපත C 953 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැදිනවා.

ප්‍ර : ඔය 2015 සැප්තැම්බර් මස 24 වෙනිදනේ කවිදම්මා බෙහෙත් ගන්න ගියේ දොස්තර මහත්මයා ගාවට පුලස්තිනීත් එක්ක?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඒ වෙලාවේනේ ඔය පුලස්තිනී නැති වුණා කියලා කිව්වේ හොයා ගන්න?

පි : ඔව් ඒ දිනයේ තමයි අන්තිමටම නැති වෙලා ගියේ.

ප්‍ර : එතකොට පුලස්තිනීව හොය හොය හැම තැනම ගියා කියලා කිව්වනේ කවිදම්මා?

පි : ඔව්.

ප්‍ර : ඔය කාලේ වෙනකොට කවිදම්මට ජංගම දුරකථනයක් තිබ්බද Mobile Phone එකක්?

පි : මං ළඟ තිබුණා. දුවට නම් තිබුණේ නෑ.

ප්‍ර : පුලස්තිනීට Telephone එකක් තිබුණේ නෑ කියලද කියන්නේ ජංගම දුරකථනයක්?

පි : මම රාසීක්ගෙන් ඇයව එක්කන් ආවාට පස්සේ ඇයට දුරකථනයක් ලබා දී තිබුණේ නෑ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදී C 953 වශයෙන් ලකුණු කරන ලද ලේඛනය දමිළ භාෂාවෙන් ඇති ලේඛනයක් හෙයින් එහි සිංහල පරිවර්තනයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ භාෂා පරිවර්තකට නියෝග කරන අතර එසේ ඉදිරිපත් කළ පසු එය C 953 (A) වශයෙන් ලකුණු කරන බන සටහන් කර තබමි.

****

<u>**අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය**</u>

ප්‍ර : මේ පැමිණිල්ල මඩකලපුව පොලිසියට කළාට පස්සේ 24 වෙනිදා කවිදම්මා ඊට පස්සේ මොකද කළේ?

පි : මම ගෙදර ගියා.

ප්‍ර : දැන් කවිදම්මට කවුරු හරි දුරකථනයෙන් කතා කළාද ඔය පැමිණිල්ල දැම්මට පස්සේ?

පි : ඊට පස්සේ රාසීක් තමයි දුරකථනයෙන් සම්බන්ධ වුණේ.

ප්‍ර : කාටද කතා කළේ රාසීක්?

පි : මගේ මල්ලි මටත් කතා කළා මල්ලිටත් කතා කළා.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඔය රාසීක් කියන්නේ අබ්දුල් රාසීක් නේද?

පි : අබ්දුල් රාසීක්.

ප : ඔහු කතා කරලා මොනවද කිව්වේ?

පි : ඔබගේ දුව අපි ළඟ තමයි ඉන්නේ අපේ භාරයේ ඉන්නේ ඇයට අපි විවාහයක් කරන්න යනවා කියලා කිව්වා.

ප : දැන් මාළිගාවත්ත පොලීසියෙන් කවිදම්මට පුලස්තිනීව දුන්නේ කොන්දේසියක් මතනේ. ඒ තමයි දවස් 15 කට දරුවා දෙනවා ඇය හින්දු ආගම අනුගමනය කළොත් ඔබලා සමඟ ඉන්න පුළුවන් ඇය ඉස්ලාම් ධර්මය අනුගමනය කළොත් නැවත මේ අයට භාර දෙන්නට ඕනේ අබ්දුල් රාසීක් ඇතුළු අයට භාර දෙන්නට ඕනේ ඒක නේද කොන්දේසිය?

පි : ඔව්.

ප : එතකොට දැන් කවිදම්මා මේ ගරු කොමිෂන් සභාවට කිව්වා පුලස්තිනී ඔබලා සමඟ හිටපු ඒ දවස් 15 ව කාලය තුළදී නැවත හින්දු ආගම අදහන්නට පටන් ගත්තද කියලා අර ඡායාරූපයකුත් ඔබ ගත්තනේ ඇය කෝවිලට යන්නට පෙර C 919?

පි : ඔව්.

ප : ඉතින් එතකොට කොහොමද පුලස්තිනී ඔබේ භාරයේ හිටපු පුලස්තිනීව අබ්දුල් රාසීක් මහත්මයා අරගෙන යන්නේ?

පි : ඒ ගැන මම දන්නේ නෑ ඉස්පිරිතාලේ ඉඳලා නැති වෙච්ච එක තමයි මම දන්නේ.

ප : එතකොට දැන් මේ දුරකථනය මඟින් කතා කරලා කිව්වයි කිව්වා නේද ඇයගේ විවාහය සිද්ධ වෙනවා කියලා දුව ඉන්නේ ඔවුන් ගාව අබ්දුල් රාසීක් දුරකථනයෙන් කතා කරලා කිව්වයි කිව්වා දුව ඉන්නේ ඒ අය ගාව දුවගේ විවාහය සිද්ධ වෙනවා කියලා?

පි : ඔව් විවාහයක් කරන්න නියමිතයි කියලා කිව්වා.

ප : නියමිතයි කියලා කිව්වා. දැන් ඔබනේ පුලස්තිනීගේ මව?

පි : ඔව්.

ප : එතකොට දුවගේ විවාහය කරලා දෙන එක කවිදම්මට ලොකු දෙයක් නේද?

පි : ඔව්.

ප : දැන් අබ්දුල් රාසීක් මහත්මයා කවිදම්මට කියන කොට පුලස්තිනීගේ විවාහය සිදු වෙන්න යනවා කියලා කවිදම්මා ඒ ගැන දැන ගෙන හිටියද?

පි : නැත.

ප : ඉතින් කවිදම්මා මොකද කළේ එතකොට?

පි : මම ඒ වෙලාවේ කිව්වා එහෙම කරන්න දෙන්න බෑ එයා දොස්තරකෙනෙක් වෙන්න ඉගෙන ගන්න ඉන්න ළමයෙක්.

President's Copy
FAIR COMMENT BY JEZEEM

ආගම වෙනස් කරන්න බෑ. ඒ මගේ දරුවා. එයාට විවාහයක් කරලා දෙන අයිතිය මටයි තියෙන්නේ කියලා මම ඔහු සමඟ වාද කරමින් ඇඬුවා වැළපුණා.

ප්‍ර : මෙහෙම ඔබ කිව්වේ අබ්දුල් රාසීක්ට?

පි : ඔව්.

ප්‍ර : කවිදම්මා එහෙම කිව්වේ දුරකථනයෙන්ද?

පි : ඔව්.

ප්‍ර : ඉතින් දැන් දුරකථනයෙන් විතරක් කතා කරලා හරියන්නේ නෑනේ ඊට පස්සේ මොකද කළේ කවිදම්මා?

පි : බස් එක අරගෙන බස් එකෙන් ආවා නැවත මාළිගාවත්ත Head office එකට.

ප්‍ර : කවදද?

පි : මෙයා නැති වෙච්චි දවසට පහුවෙනිදා තමයි අබ්දුල් රාසීක් කතා කළේ. එදාම රාත්‍රියේ බස් එකෙන් ආවා කොළඹට.

ප්‍ර : තනියමද ආවේ?

****

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු දැන් ඔබ කියන්නේ දැන් ඔය අබ්දුල් රාසීක් සමඟ තමන්ගේ පවුලේ කවුරු හරි සම්බන්ධතාවයක් තියෙනවද?

පි : කාටවත් තිබුණේ නෑ.

ප්‍ර : ඈ.....?

පි : කාටවත් තිබුණේ නෑ.

ප්‍ර : තමන්ට පැහැදිලි කරන්න පුළුවන්ද කොහොමද අබ්දුල් රාසීක් තමන්ගේ දියණිය ගෙන්න ගත්තේ මොකක්ද සම්බන්ධතාවය?

පි : ඒක තාම මට මේ ප්‍රහේලිකාවක් වෙලා තියෙන්නේ. මම හිතන්නේ ටියුෂන් ක්ලාස් එකට ගියානේ. ඒ වෙලාවේ මොකක් හරි කල්මුණේ ක්ලාස් එකට ගියා. ඒ වෙලාවේ මොකක් හරි වෙන්න ඇති.

ප්‍ර : ඒ ක්ලාස් එකට යන කොට මෙයා කවුරු හරි එක්ක යාළු වෙලා හිටියද?

පි : ගෙදරදී එහෙම සම්බන්ධකමක් තිබුණ බවට කිසිම සාක්ෂියක් තිබුණේ නෑ.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප්‍ර : දැන් මේ සාක්ෂිකාරිය ඉස්සෙල්ලම මාළිගාවත්ත පොලිසියේදී පුලස්තිනීව හම්බ වෙලා පැය 3 ක් 4 ක් කතා කළා කිව්වනේ?

පි : ඔව්.

Free Copy Secretary's
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : අබ්දුල් රාසීක්ගේ Office එකේදී ඒක පොලීසියේදී නෙවෙයි?

පි : දුව එක්ක කතා කළා.

ප්‍ර : එතකොට ඔබ දුවගෙන් ඇහුවද එයා ඉස්සෙල්ලාම ටියුෂන් ක්ලාස් එකකට ගිහිල්ලා නැති වුණා කියලා ගෙදරින් පණිවිඩයක් ආවානේ මෙයාට මැද පෙර දිග ඉන්න කොට?

පි : ඔව්.

ප්‍ර : එතකොට දුවත් එක්ක අර කතා කරපු පැය තුනේදී හතරේදී ඔබ දුවගෙන් ඇහුවද එදා නැති වුණේ කොහොමද කියලා?

පි : මම ඇහුවා නමුත් ඇය කිව්වේ නෑ මොකුත් කිව්වේ නෑ.

ප්‍ර : මොකුත්ම කිව්වේ නෑ?

පි : මම ඇහුවා නමුත් ඇය මොකුත් කිව්වේ නෑ මම එයාට මේ බලපෑම් කරන තත්ත්වයේ හිටියේ නෑ කොහොමහරි ඇයව ගෙදරට එක්කන් යන්න ඕනේ කියලා මතයේ තමයි හිටියේ.

ප්‍ර : ගෙදරට ගියාට පස්සේ හරි කිව්වද කියලා අහන්න?

පි : එතකොට මම ගෙදර ඉන්න කාලේත් මම ඇහුවා නමුත් මොකුත් කිව්වේ නෑ.

ප්‍ර : මොකුත් කිව්වේ නෑ?

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : කොළඹ ආවේ තනියමද?

පි : නැවතත් මල්ලී, මල්ලීගේ නැන්දම්මා සහ මගේ පුතා සමඟ ආවා.

ප්‍ර : කෝහාටද ගියේ?

පි : එම ස්ථානයටම ගියා.

ප්‍ර : එම ස්ථානය කියන්නේ කොතැනද?

පි : අබ්දුල් රාසීක්ගේ තවුහිද් ජමාත් Office එකේ මම හරියටම ලිපිනය දන්නේ නෑ ඒ Office එකට. මාළිගාවත්ත පොලීසිය දන්නවලු ඒ ලිපිනය.

ප්‍ර : එතකොට දැන් කවිදම්මා අර අබ්දුල් රාසීක් කතා කරපු දවසේම රාත්‍රියෙනේ පිටත් වුණා කියලා කිව්වේ ගෙදරින් ඔය ගමන එන්න?

පි : ඔව්.

ප්‍ර : එතකොට පහුවදාත් ගියේ අබ්දුල් රාසීක් මහත්මයාගේ තවුහිද් ජමාත් කාර්යාලයටද මාළිගාවත්තේ තියෙන?

පි : ඔව්.

ප්‍ර : එහේදී වෙලාව කීයට විතර ඇද්ද? ඒ කියන්නේ පහුවදානේ ගියේ?

පි : දොළහ දොළහ හමාර විතර වගේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දුරකථන ඇමතුම අබ්දුල් රාසීක් මහත්මයාගෙන් හම්බවුණදාට පහුවදා තමයි දැන් මේ ඔහුගේ කාර්යාලයට මාළිගාවත්තේ ඔබලා යන්නේ දොළහ හමාරට පමණ?

පි : ඔව්.

ප්‍ර : ඒ අවස්ථාවේදී ඒ කාර්යාලයේදී ඔබේ දුව පුලස්තිනීව මුණ ගැහුණද?

පි : පුලස්තිනී සහ හස්තුන් යන දෙදෙනා මම යන විට ඔවුන්ට විවාහය සිදු කරලා අවසානයි.

ප්‍ර : හස්තුන් යන අයව කවිදම්මා ඔයිට ඉස්සෙල්ලා දැන ගෙන හිටියද?

පි : දන්නේ නෑ.

ප්‍ර : එතකොට ජීවිතේ පළවෙනි වතාවටද මේ හස්තුන්ව දැක්කේ අබ්දුල් රාසීක් මහත්මයාගේ කාර්යාලයේදී?

පි : ඔව්.

ප්‍ර : පුලස්තිනී හස්තුන් ඇරෙන්නට ඔතන වෙන කවුද හිටියේ?

පි : රාසීක් සහ රාසීක්ගේ සමඟ සිටින තවත් දෙන්නෙක් යන අය හිටියා. රාසීක් හිටියා අර දෙන්නා. රාසීකුයි අර වෙනදා හිටිය දෙන්නෙක් ඉන්නවනේ partners ලා ඒ දෙන්නයි මේ අයට අමතරව හිටියේ.

ප්‍ර : ඒ කියන්නේ පිරිමි අය නේද?

පි : ඔව් දෙවෙනි වතාවට යන අවස්ථාවේදී සියළු දෙනාම පිරිමි අය.

ප්‍ර : ඔය හස්තුන්ගේ ඡායාරූපයක් දැක්කොත් ඔබට නැවත අඳුනන්න පුළුවන්ද?

පි : ඔව්.

ස්වාමිනි ඡායාරූපයක් සාක්ෂිකාරියගේ අවධානයට යොමු කරනවා.

ප්‍ර : මේ පින්තූරයේ ඉන්න තැනැත්තව අඳුරන්න පුළුවන්ද කවිදම්මට?

පි : පුළුවන්.

ප්‍ර : කවුද කවිදම්මේ?

පි : මේ තමයි හස්තුන්.

ස්වාමිනි මෙම සාක්ෂිකාරිය විසින් හඳුනා ගන්නා ලද එම ඡායාරූපය C 954 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර : දැන් කවිදම්මා කිව්වා අබ්දුල් රාසීක් මහත්මයා ඊට ඉස්සර වෙලා දවසේ කවිදම්මට කතා කළහම කවිදම්මාව කිව්වයි කියලා ඒ වගේ විවාහයකට කවිදම්මා කැමති නැහැ කවිදම්මගේ දුව නිසා කවිදම්මා ඕනේ ඒවා කරන්නට කියලා?

පි : ඔව්.

ප්‍ර : ඉතින් දැන් කවිදම්මා කියනවා කවිදම්මා එතෙන්ට යන අවස්ථාව වෙන කොට පුලස්තිනීගෙත් හස්තුන්ගෙත් විවාහය සිදු කරලා කියලා?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මම යන්න කලින් දවසේම විවාහය සිදු කරලා තියෙනවා. විවාහය සිදු වුණයි කියලා කිසිම සාක්ෂියක් මට පෙන්නුවේ නෑ.

ප්‍ර : ඉතින් කවිදම්මා මොකද එතකොට කළේ?

පි : නැවතත් අපි එක්කගෙන මාළිගාවත්ත පොලීසියට ගියා. මාළිගාවත්ත පොලීසියෙන් කියා හිටියා දෙදෙනාටම වයස අවුරුදු 18 සම්පූර්ණ වෙලා තියෙනවා. ඒක නිසා ඒ විවාහය නීත්‍යානුකූලයි. නමුත් කිසිවක් කරන්න බෑ කියලා පොලීසියෙන් කියා සිටියා.

ප්‍ර : පොලීසිය කවිදම්මට කිව්වා. එතකොට කවිදම්මා මොකද කළේ?

පි : මම නැවතත් අඬා වැළපෙලා කිව්වා මගේ දුව දොස්තරකෙනෙක් වශයෙන් උගන්වන්න මට ඕනේකම තියෙනවා. ඇයි මෙහෙම කළේ කියලා එතකොට එයාලා කිව්වා දැන් ඔයාලා ගෙදර යන්න අපි එයාලට වෙනම නිවසක් අරගෙන දෙනවා. අපිට යන්න කිව්වා.

ප්‍ර : කවුද මේ කාටද නිවසක් අරන් දෙනවා කියලා කිව්වේ කවුද නිවසක් අරන් දෙනවා කිව්වේ?

පි : රාසීක් කිව්වේ මගේ දුවට නිවසක් අරන් දීලා එයාලා ජීවත් වීමට සල්ලිත් දෙනවා කියලා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේදීත් සාක්ෂිකාරිය සංවේදීව පිළිතුරු ලබා දෙන බව සටහන් කර තබමි.

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය</u>

ප්‍ර : එතකොට ඔබ කියන ආකාරයට මේ සියළුම දේවල් කරන්නේ මේ අබ්දුල් රාසීක් මහත්මයා නේද?

පි : ඔව්.

ප්‍ර : දැන් ඔය විවාහය සිදුවුණයි කියලා ඔබට කිව්වා කියලා කිව්වනේ හස්තුන් සහ පුලස්තිනී අතර?

පි : ඔව්.

ප්‍ර : එතකොට එතෙක් කල් ඔබ ඔබේ බිළිදියට දැරියට ලබා දුන්න ඔය පුලස්තිනී කියන නම අවුරුදු 19 ක් තිස්සේ පාවිච්චි කරපු පුලස්තිනී කියන නම කොයි වෙලාවක හරි වෙනස් වෙලා තිබුණද කියලා ඔබට දැන ගන්නට ලැබුණද?

පි : විවාහය සිදු කරපු දිනයේදීම මට දැන ගන්නට ලැබුණා.

ප්‍ර : මොකක්ද දැන ගත්තේ කවිදම්මා?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සාරා ජෙස්මින් කරලා නම වෙනස් කරලා තියෙනවා කියලා.

ප්‍ර : නම වෙනස් කළා. එතකොට ආගම ඉස්සර වෙලා හින්දුනේ?

පි : කලින් හින්දු ආගම තමයි හිටියේ. ඊට පස්සේ නම වෙනස් කරලා විවාහය සිදු කරලා තිබුණා. විවාහය සිදු කළාට පස්සේ මුස්ලිම් ආගම ඒ කියන්නේ ඉස්ලාම් ධර්මයේ හිටියේ.

ප්‍ර : ඇය මුස්ලිම් කාන්තාවක් බවට පත් වෙලා තිබුණා?

පි : ඔව් නැවතත් මාරු වෙලා.

ප්‍ර : එතකොට දැන් ඔය තොරතුරු දැන ගත්තහාම කවිදම්මට ගොඩක් දුක හිතුණනේ?

පි : මම ගොඩාක් වාද කරලා ඇඩුවා, වැළපුනා එතකොට රාසීක් මගේ දුව වගේ ඔයාගේ දුවවත් බලා ගන්නවා ඔයා පිටරට යන්න කියලා අබ්දුල් රාසීක් කිව්වා.

ප්‍ර : ඉතින් කවිදම්මලා ආපහු ඕගොල්ලොන්ගේ ගෙදරට ගියාද?

පි : නෑ මම ගියේ නෑ මම ඒගේ ඉඳලම නැවත පිටරට ගියා.

ප්‍ර : නැවතත් අබුඩාබිද ගියේ?

පි : ඔව්.

ප්‍ර : එහෙම අබුඩාබි ඉන්න කොට පුලස්තිනී නැත්නම් අර පස්සේ නම වෙනස් කරානේ සාරා කියලා සාරා ජෙස්මින් ඇය ඔබනේ අම්මා ඔබ සමඟ කතා කළාද ඔබ පිරටර ඉන්න කොට?

පි : මම ගිහිල්ලා මාසයක් විතර තරහෙන් හිටියේ කතා කළේ නෑ.

ප්‍ර : දුව එක්ක කතා කළේ නෑ?

පි : මාසයක්. ඊට පස්සේ කතා කළා.

ප්‍ර : මාසයක් විතර කතා නොකර හිටියට කොයි වෙලාවක හරි කතා කරන්න ඇතිනේ කවිදම්මත් එක්ක දුව නේද?

පි : ඔව්. ඇය කතා කළේ නෑ මම තමා උත්සාහ කළේ කතා කරන්න.

ප්‍ර : ඇය කතා කළේ නෑ?

පි : මාසයකට කලින් ඇය මට දුරකථනයෙන් කතා කළා ඇමතුම ගත්තා මම කතා කළේ නෑ.

ප්‍ර : ඔව්.

පි : මාසයක් ගියාට පස්සේ මම කතා කළා.

ප්‍ර : කතා කළා. ඒ දුරකථන ඇමතුමට ඔබ උත්තර දුන්නා තරහ එහෙම නිවිලා කතා කෙරුවා?

පි : ඔව්.

ප්‍ර : එහෙම කතා කරන කොට දැන ගන්න හම්බ වුණාද ඒ අවස්ථාවේ ඒ කවිදම්මා ඇයත් එක්ක කතා කරන කොට ඔය මාසේකට විතර පස්සේ ඔය සිදුවීමෙන් කොහේද පුලස්තිනී නැත්නම් සාරා ජීවත් වුණේ කියලා?

පි : මල්වානේ පදිංචි වෙලා ඉන්නවා කියලා තමයි මට කිව්වේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙම එකක් කියලා නැනේ?

පි : මල්වානේ කිව්වා. පස්සේ කිව්වා කොළඹ කියලා ඔහොම මාරුවෙන් මාරුවට කිව්වා.

ප්‍ර : කවිදම්මේ මල්වානේද මාළිගාවත්තේද?

පි : මාළිගාවත්තේ තමයි විවාහ වෙලා හිටියේ පස්සේ රාසීක් ගිහිල්ලා මෙයාව මල්වානේදී නතර කරලා තිබුණා.

ප්‍ර : ඊට පස්සේ ගියා මල්වානේට?

පි : මල්වානේ.

ප්‍ර : එතකොට හස්තුන් එක්ක තමයි ඇය ජීවත් වුණේ එහෙම නම් නේද?

පි : එම අවස්ථාවේදී මට දැන ගන්න ලැබුණා හස්තුන් එක්ක ඉන්නවා කියලා. නමුත් ඒ අවස්ථාවේදී මම හස්තුන්ව දැක්කේ නෑ කතා කළේ නෑ.

ප්‍ර : එතකොට ඔය කොයි වෙලාවක හරි ඔබට දැන ගන්න ලැබුණද සාරා එහෙම නැත්නම් පුලස්තිනී කල්මුණේ මරදමුණේ පදිංචියට ගියා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ ඔය විවාහය සිදු වෙලා කොච්චර කාලේකට විතර පස්සේද?

පි : මාස දෙකකට පස්සේ වෙන්න ඇති.

ප්‍ර : මාසද අවුරුදුද? දැන් මේ ඔක්කොම වෙන්නේ 2015 අවුරුද්දෙනේ නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබ කියන්නේ 2015 අවුරුද්දෙමයි මාස දෙකකට විතර පස්සේ දැන් මේ පුලස්තිනී ඔබට කතා කරලා ඒ ගොල්ලන් කල්මුණේ පදිංචියට ගියා කියලා දැන ගන්න ලැබුණේ?

පි : මට හරියටම මාස ගණන් නිශ්චිතව කියන්න බෑ. නමුත් කල්මුණේ මරදමුණේ එයා හිටියා.

ප්‍ර : නමුත් ඒ 2015 අවුරුද්දෙමනේ නේද?

පි : ඔව් ඔක්කොම 2015 තමයි.

ප්‍ර : එතකොට කොයි වෙලාවක හරි තවදුරටත් ඒ ස්වාමි පුරුෂයාත් එක්ක ඉන්න බෑ කියලා පුලස්තිනී ගෙදර ආවාද?

පි : ඔව්.

ප්‍ර : කවිදම්මා දැන් කවිදම්මා කිව්වා හස්තුන් එක්ක ඉන්න අමාරුයි කියලා පුලස්තිනී යම් වෙලාවක කිව්වා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඉතින් එතකොට කවිදම්මා මොනවා හරි උපදෙසක් දුන්නද පුලස්තිනීට?

පි : ඔව්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මොකක්ද දුන්න උපදෙස්?

පි : මම කොයි වෙලෙත් උත්සාහ කළේ ඇයව ආපහු ගන්න. මේක මට හොඳ අවස්ථාවක් වුණා. ඒ නිසා මම කිව්වා ඔයා එන්න මම ඔයාව පිටරට එක්කන් යන්නම් කියලා පිටරට ගන්නම් කියලා.

ප්‍ර : දැන් එතකොට ඔය පණිවිඩය දැන් පුලස්තිනී ඔය ගැන කියන කොට කවිදම්මා කොහේද හිටියේ?

පි : අබුඩාබි එකේ හිටියේ.

ප්‍ර : එතකොට අබුඩාබි ඉන්න කවිදම්මා කොහොමද පුලස්තිනීව ලංකාවේ ඉඳලා ගෙන්ව ගන්නේ?

පි : Visiting Visa මඟින්.

ප්‍ර : ආ... Visiting Visa ලබා ගන්නට කටයුතු කෙරුවා පුලස්තිනීට?

පි : ඔව්.

ප්‍ර : ඒ අනුව මතකද කවිදම්මට කවදද ගෙන්ව ගත්තේ කියලා? පුලස්තිනී ඉතින් ගෙන්ව ගන්න ඉස්සර වෙලා එහෙම ගෙදර එහෙම යන්න ඇතිනේ සමහර විට නේද?

පි : ඔව්.

ප්‍ර : ඒ කවදද කවිදම්මේ මතකයිද කවිදම්මට මම කිව්වොත් 2015 දෙසැම්බර් මාසේ 28 කියලා මතක් වෙයිද ඒක හරිද?

පි : ඒක හරි.

ප්‍ර : එතකොට වීසා ලබා ගෙන Visiting Visa ලබා ගෙන පුලස්තිනීව කවදද කවිදම්මා අබුඩාබිවලට ගෙන්ව ගත්තේ?

පි : දවස් 09 ක් ඇතුළත වගේ Visiting Visa එයාට ලැබුණා.

ප්‍ර : මම කිව්වොත් කවිදම්මා ගෙන්ව ගත්තේ පුලස්තිනිව 2016 ජනවාරි මාසේ 06 වෙනිදා විතර කියලා ඒක හරිද?

පි : ඔව්.

ප්‍ර : එතකොට කවිදම්මා පුලස්තිනි ඇවිල්ලා කොහේද ජීවත් වුණේ කාත් එක්කද අබුඩාබිවල?

පි : මා සමඟ තමයි හිටියේ.

ප්‍ර : දැන් ඔය පිටරටනේ ඉන්නේ. එතකොට කවිදම්මා පුලස්තිනීට රස්සාවක් එහෙම හොයලා බැලුවද?

පි : මාස තුනක් අවසන් වී මාස හතරක් ඇතුළත අවුරුදු දෙකකට වීසා ලැබුණා.

ප්‍ර : දැන් මම ඇහුවේ රස්සාවක් ගැන?

පි : ඇයට කැෂියර් රස්සාවක් හම්බ වුණා හදිස්සියේම.

ප්‍ර : කොච්චර කාලයක් පුලස්තිනී ඔය රස්සාව කළාද?

පි : දවස් තුනකට ගියා.

ප්‍ර : ඊට පස්සේ ගියේ නැද්ද?

FAIR COMMENT BY JEZEEM

පි : ඊට පස්සේ මම ගෙදර යන්න යනවා මම ඉගෙන ගන්න ඕනේ කියලා එයා කිව්වා මට.

ප්‍ර : කොච්චර කාලයක් පුලස්තිනී කවිදම්මත් එක්ක අබුඩාබිවල හිටියද?

පි : මාස හතරක්.

ප්‍ර : ඒ මාස හතර ඉවර වුණාට පස්සේ මොකද වුණේ?

පි : ලංකාවට ආවා.

ප්‍ර : ඊට පස්සේ මොකද වුණේ?

පි : දවස් තුනක් ගෙදර හිටියා. ඊට පස්සේ හස්තුන් කාත්තන්කුඩි පොලීසියට පැමිණිල්ලක් කරලා තිබුණා මගේ භාර්යාව මෙහි තියාගෙන ඉන්නවා එයාව මට ආපහු අරන් දෙන්න කියලා.

ප්‍ර : පුලස්තිනි ආපහු ලංකාවට එනකොට කවිදම්මා එයත් එක්ක ආවාද?

පි : මම ඉගෙන ගන්න යනවා. මම ආයි නැවත ඔහු එක්ක යන්නේ නෑ කියලා මට දිවුරලා පොරොන්දු වෙලා තමයි ඇය ආවේ.

ප්‍ර : දැන් ඔබ කිව්වා හස්තුන් යම් අවස්ථාවක පොලීසියේ පැමිණිල්ලක් කළා කියලා?

පි : ඔව්.

ප්‍ර : කවදද ඔහු කාත්තන්කුඩි පොලීසියට පැමිණිල්ල කළේ? මොනවා ගැනද පැමිණිල්ල කරලා තිබ්බේ?

පි : පැමිණිලි කරපු දිනේ මට මතක නෑ. නමුත් මගේ බිරිඳව පැහැර ගෙන ගොස් ඔහුගේ පවුලේ අයවලුන් තියා ගෙන ඉන්නවා ඇයව නැවත ලබා දෙන්න කියලා තමයි පැමිණිල්ල කරලා තිබ්බේ.

ප්‍ර : ඒ පැමිණිල්ල කරලා තිබ්බේ 2016 මැයි මාසේ 25 වෙනිදා විතර වගේද?

පි : ඔව්.

ප්‍ර : ඒ පැමිණිල්ල සම්බන්ධයෙන් එතකොට විභාග කෙරුවද කාත්තන්කුඩි පොලීසිය?

පි : අපේ ගෙදර පවුලේ අයවලුන් තමයි යන්න හිටියේ. පුලස්තිනීත් ලෑස්ති වෙලා බස් එකේ යන්න ගියා. ඊට පස්සේ පවුලේ අය ඔක්කොම පොලීසියට ගිහිල්ලා තියෙනවා.

ප්‍ර : එතනදී මොකද වෙලා තිබුණේ කියලා කවිදම්මා දැන ගත්තද?

පි : ඒ කාත්තන්කුඩි පොලීසියට ගිය අවස්ථාවේ ඒ හිටපු OIC මහත්මයා මුස්ලිම් කෙනෙකු ඒ අවස්ථාවේ. ඒ වගේම පොලීසියට මුස්ලිම් සම්මේලනයේ රැවුල තියපු කීප දෙනෙකුත් ඇවිල්ලා හිටියාලු. ඊට පස්සේ නැවත ඔවුන් එකට එකතු කරලා කාත්තන්කුඩියේ පදිංචි කළාලු.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ නැවත හස්තුන් සහ පුලස්තිනී එකට එකතු වීමක් ඔය පැමිණිල්ලෙන් පස්සේ වුණා?

පි : පොලීසියෙන් කිව්වා එහෙම විවාහ වූ අයව වෙන් කරලා තැබීම නීත්‍යානුකූල විරෝධී කියලා අපට අපි වැරදිකරුවන් යැයි කියලා කියා හිටියා පොලීසියෙන්.

ප්‍ර : ඇයි ඔය කාත්තන්කුඩි පොලීසිය ඔය ගැන විභාග කෙරුවේ? ඔබ ඉන්නේ කාත්තන්කුඩි පොලීසි වසමටද?

පි : අපි ඉන්නේ කලවංචිකුඩි පොලිස් වසමේ.

ප්‍ර : නමුත් පැමිණිල්ල කරලා තිබ්බේ කාත්තන්කුඩි පොලීසියට?

පි : ඔව් කාත්තන්කුඩි.

ප්‍ර : එතකොට කාත්තන්කුඩි පොලීසිය තමයි මේ පැමිණිල්ල විභාග කළේ?

පි : ඔව්.

ප්‍ර : විවාහය සිදු වුණේ කාත්තන්කුඩියේ නෙවෙයිනේ?

පි : නෑ.

ප්‍ර : ඔබ පදිංචි වෙලා හිටියෙත් කාත්තන්කුඩියේ නෙවෙයිනේ?

පි : නෑ.

ප්‍ර : ඒ අනුව අබුඩාබේ ඉඳලා ඔබේ ගෙදරට ආපු පුලස්තිනීත් එතකොට පදිංචි වෙලා හිටියේ කාත්තන්කුඩියේ නෙවෙයිනේ?

පි : නෑ.

ප්‍ර : නමුත් ඔබ කියන්නේ හස්තුන් ගිහිල්ලා පැමිණිල්ල කරලා තිබ්බේ කාත්තන්කුඩි පොලීසියට කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ වගේම ඔබ කිව්වා කාත්තන්කුඩිය පොලීසිය මේ පැමිණිල්ල විභාග කරන අවස්ථාවේදී එතනට යම් තව බාහිර පුද්ගලයෝ පැමිණිලා හිටියයි කියලා අර රැවුල තියෙන අය ඇවිල්ලයි හිටියා කිව්වා?

පි : ඔව්. මගේ අම්මා තමා කියා හිටියේ රැවුල තිබුණු අය ගොඩාක් ඇවිල්ලා හිටියා කියලා?

ප්‍ර : ගොඩාක් ඇවිල්ලා හිටියා?

පි : ඔව්.

ප්‍ර : ඒ ගොල්ලො කවුද?

පි : පුද්ගලයන් දන්නේ නෑ. පොලීසියේ අය දන්නවා ඔවුන් කවුද කියලා.

ප්‍ර : පොලීසිය දන්නවා අන්තිමට වුණේ ගෙදර ආපු පුලස්තිනීව නැවත මේ පොලීසිය මේක විභාග කෙරුවට පස්සේ හස්තුන්ට හාර දුන්නා නේද?

පි : ඔව් .

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : මෙහෙම භාර දුන්නට පස්සේ ඔබ කියන ආකාරයට කාත්තන්කුඩිය පොලීසිය පැමිණිල්ල විභාග කළාට පස්සේ හස්තුන් සහ සාරා එහෙම නැත්නම් ඔබේ දුව පුලස්තිනී කොහේද ජීවත් වුණේ කියලා ඔබට දැන ගන්න ලැබුණද?

පි : කාත්තන්කුඩියේ තමයි ඔවුන් ජීවත් වුණේ.

ප්‍ර : දැන් අබුඩාබිවල ඉඳලා පුලස්තිනී නැවත ගෙදර එන්නට ඕනේ කියලා ඔබට කිව්වේ ඇයට තව වැඩිදුර ඉගෙන ගන්න ඕනේ හින්දා කියලා කිව්වනේ?

පි : මම කල්මුණේ ටියුෂන් ක්ලාස් එකටත් යන්නේ නෑ ගෙදර ඉඳගෙන සර්ලාගෙන් paper class කරන්නම් කියලා තමා කිව්වේ සර්ලා එක්ක.

ප්‍ර : එතකොට ඒයා ඇයට වැඩිදුර අධ්‍යාපනය ලැබීම සඳහා ඔබ මුදල් එහෙම ලැබුවද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඇය අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින්නට ලියාපදිංචි වෙලා තිබ්බද admission අරන් තිබ්බද?

පි : ඔව්.

ප්‍ර : අරගෙන තිබුණා?

පි : ඔව්.

****

දැන් වේලාව : ප.ව.12.50 යි.
මෙතැන් සිට ල/ලේ :- ඉන්ද්‍රානි මිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කළේ මුතුමාලි මෙය
දැන් වේලාව : ප.ව. 12.50 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඇයට විභාගයට ලියන්නට පුළුවන් වුණාද?

පි : ඇයට ලියන්න දුන්නේ නැහැ.

ප්‍ර : කවුද?

පි : ඇය විභාගයට ලියන්න තිබිච්ච දිනයේ තමයි ඇයව නාරම්මලට එක්කගෙන ගිහින් තිබුණේ.

ප්‍ර : කවුද?

පි : කවුද එක්ක ගිය විත්තිය මම දන්නේ නැහැ. ඒ Admission එක එනකම් එයා පදිංචි වෙලා හිටියේ කාත්තන්කුඩියේ. හෙට විභාගය ලියන්න නියමිතව තිබියදී තමයි ඇයව එක්කන් ගියේ නාරම්මලට. අවුරුද්දක් තිස්සේ මම ඇයට සල්ලි දීලා තියෙනවා ඉගෙන ගන්න.

ප්‍ර : එතකොට නාරම්මල ඔබේ කවුරුත් ඉන්නවද?

පි : කවුරුවත් නැහැ.

ප්‍ර : එහෙමනම් ඇයි මේ නාරම්මල ගිහිල්ලා තිබුණේ කියලා ඔබට දැන ගන්න ලැබුණාද?

පි : මේ ඇය නාරම්මලට ගියපු බව මම දැනගෙන හිටියේ නැහැ. මම විදේශ රටක අබුඩාබි ඉඳලා ඇයට බඩු වගයක් යවන්න ඕන කියලා ඇයට දැනුම් දුන්නා. එතකොට තමයි ඇය කියා හිටියේ මම දැන් පදිංචි වෙලා ඉන්නේ නාරම්මල කියලා.

ප්‍ර : ඉතිං ඔබට ඇයගේ ලිපිනය ලබා ගන්න පුළුවන් වුණාද?

පි : මම හතරවන තට්ටුවට ගිය අවස්ථාවේදී සහරාන්ගේ...,

ප්‍ර : කොහේ තියෙන හතරවන තට්ටුවද?

පි : විමර්ශන ඒකකයේ ....,

ප්‍ර : CID එකට ගියාද?

පි : ඔව්.

ප්‍ර : ආ ඒක කියන්න?

පි : මම CID එක අවස්ථාවේ සහරාන්ගේ බිරිඳ හිටියා. ඇය තමයි කියා හිටියේ ඇය තමයි පුලස්තිනීව නාරම්මලට එක්ක ගිය විත්තිය මම දැන ගත්තේ.

ප්‍ර : ඒ කියන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඔබට සහරාන්ගේ බිරිඳව මුණ ගැහුණ අවස්ථාවේ තමයි ඔබ මේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දැනගත්තයි කියලා කිව්වේ නාරම්මලට පුලස්තිනීව එක්කගෙන ගිහිල්ලා තිබුණේ සහරාන්ගේ බිරිඳ බව?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඉතිං ඔබ දැන ගත්තද කොයි වෙලාවක හරි නාරම්මල මේ පුලස්තිනීලා පදිංචි වෙලා හිටියේ කොහේද? ඒ ගෙදර ඒගොල්ලන්ට අයිතිද ඒ කියන කරුණු?

පි : ඇයට අයිති ගෙයක් කියලා තමයි මට දුරකථනයෙන් දැනුම් දුන්නේ. ඒකට ටයිල්ස් අල්ලන්න සල්ලි ඉල්ලලා මම ඒකටත් සල්ලි දීලා තියෙනවා. කර්ටින් කරන්න, ටයිල්ස් අල්ලන්න සල්ලි දීලා තියෙනවා.

ප්‍ර : ඔව්. ටයිල්ස් අල්ලන්න සල්ලි එව්වා කියලා කියන්නේ. කොහොමද එව්වේ සල්ලි?

පි : ඇයගේ ගිණුම් අංකයට තමයි මම සල්ලි දැම්මේ. අවසාන වශයෙන් මට දැන ගන්න ලැබුණා නාරම්මල බැංකු ශාඛාවෙන් එම මුදල ලබාගෙන තියෙනවා කියලා?

ප්‍ර : එතකොට කවිදම්මා දැන් ඒ කියන්නේ ඔබත්, පුලස්තිනිත් නිතර දුරකථනයෙන් කථා කළා කියලනේ නේද?

පි : ඔව්.

ප්‍ර : ඔබේ ජංගම දුරකථනයේ වීඩියෝ කෝල් ගන්න පුළුවන්ද?

පි : Emවලින් ගත්තා.

ප්‍ර : ආ Emoවලින් ගත්තා?

පි : ඔව්.

ප්‍ර : ඒ Emoවලින් ගත්ත අවස්ථාවේදී පුලස්තිනීගේ රූපය පෙණුනද? එයා කථා කරනවා පෙනුණද?

පි : ඔව්.

ප්‍ර : එතකොට පුලස්තිනී ඔබත් එක්ක කථා කරනකොට ඇය කොහොමද ඇඳ පැළඳලා හිටියේ?

පි : නිකම් ගවුමක් ඇඳගෙන හිටියා.

ප්‍ර : ඔබ කිව්වා අර පළවෙනි අවස්ථාවේ අබ්දුල් රාසික්ගේ කන්තෝරුවට ඔබ මාළිගාවත්තේ ඔහුගේ කාර්යාලයට ගිය වෙලාවේදී, ඉස්සර වෙලාම සැරේ පුලස්තිනී හිජාබයක් ඇඳගෙන හිටියා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ ඔබ දෙවන වර ගියේ අබ්දුල් රාසික්ගේ කාර්යාලයට යන අවස්ථාව වෙනකොට පුලස්තිනීත්, හස්තුනුත් විවාහ වුණ බවට ඔබට දැනුම් දුන්නයි කියලා කිව්වනේ ඔවුන්?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : ඒ අවස්ථාවේදීත් පුලස්තිනී හිටියේ හිජාබයක් ඇඳලද?

පි : ඔව්. හිජාබ් තමයි ඇඳන් හිටියේ. විවිධ වර්ණවලින් යුත් හිජාබයක්.

ප්‍ර : එතකොට දැන් ඔබ සමඟ අර Emoවලින් කථා කරනකොට පුලස්තිනී ඇඳලා හිටියද හිජාබ්?

පි : මා එක්ක කථා කරනකොට හිජාබ් අඳින්නේ නැහැ. එම කථා කරන අවස්ථාවේදී හස්තුන් ආවොත් බයෙන් හිජාබ් අඳිනවා.

ප්‍ර : ආ.. එතකොට හිජාබ් අඳිනවා. ඒක ඔබ දැකලා තියෙනවා නේද මේ Emo හරහා?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔබට යම් වෙලාවක දැන ගන්න ලැබුණද Television එහෙම බලන්න පුළුවන්ද කියලා පුලස්තිනීට රූපවාහිනී?

පි : TV බලන්න අවසර දෙන්නේ නැහැ. Birthday එකට උපන්දිනයට Wish කරන්න, පිරිමි අය මගේ පුතා එක්ක පවා කථා කරන්න එපා කියලා තිබුණා.

ප්‍ර : ඡායාරූප ගන්න ...?

පි : Photo ගන්න එපා කීවලු. මෙසේ කරන්න එපා කියලා හස්තුන් කියන බවට තමයි මගේ දුව මට කිව්වේ.

ප්‍ර : ඒ සාරා. එහෙම නැත්නම් පුලස්තිනී ඔබට කිව්ව හින්දා තමයි ඔබ ඔය කියන කරුණු දන්නේ. එහෙමද?

පි : ඔව්.

ප්‍ර : යම් අවස්ථාවකදී කවිදම්මා පුලස්තිනී කිව්වද ඇයට තවදුරටත් හස්තුන් එක්ක ඉන්නට බැහැ කියලා නැවතත්?

පි : මේ ප්‍රහාරයට පෙර Video Call එකෙන් මට දෙවෙනි මාසේ 19 වෙනිදා මට අවසානයේ කථා කළා.

ප්‍ර : අවුරුද්ද?

පි : ගිය අවුරුද්දේ.

ප්‍ර : ඒ කියන්නේ 2019?

පි : ඔව්.

ප්‍ර : 2019 පෙබරවාරී 19 වෙනිදා මොනවද කිව්වේ පුලස්තිනී?

පි : එහෙම කථා කරන අවස්ථාවේ ගෙදර සද්දය වැඩියෙන් තිබුණා. මිනිස්සු කථා කරන සද්දය ඇහුණා. අඩනවා වගේ කොණ්ඩය කඩාගෙන හිටියේ.

ප්‍ර : කවුද?

පි : පුලස්තිනී.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඉතිං?

පි : ලංකාවේ වෙලාවට 12.30 ට Video Call එකක් අරන් තිබුණා.

ප්‍ර : ඒ කියන්නේ දවල්ද රෑද?

පි : රාත්‍රියේ.

ප්‍ර : ඒ වෙලාවට තමයි මේ ගෙදර සද්ද ඇහෙනවා කියලා කිව්වේ ගොඩක් අය කථා කරනවා. ඉතිං?

පි : සද්දේ ඇහුණා. කලබල ගතියක් දැනුණා. Net එක වැඩ කරන්නේ නැහැ. මේක Phone එක හදන්න මම දෙනවා කඩයකට. තව දවස් හතර පහකට Call ගන්න එපා කියලත් මට කිව්වා.

ප්‍ර : වෙන මොනවද කිව්වේ?

පි : මට සැකයක් හිතුණු දෙදෙනා අතර මොකක් හරි රණ්ඩුවක් ඇති වුණාද කියලා. ඒ නිසා මම නැවත Call ගත්තා.

ප්‍ර : කාටද කථා කළේ ආයෙත්?

පි : දුවට.

ප්‍ර : කථා කරලා, දුරකථන ඇමතුම අරගෙන කථා කළාද?

පි : රෑ වුණා අපි නිදා ගන්න යනවා. Phone එක Repair කළාට පස්සේ මම Call ගන්නම් කියලා කිව්වා

ප්‍ර : එතකොට දුරකථනය අළුත්වැඩියා කෙරුවට පස්සේ නැවත පුලස්තිනී කවිදම්මාට කථා කළාද?

පි : ඊට පස්සේ මාස දෙකකට ගත්තේ නැහැ. එදා ඉඳලා අද වෙනතුරු Call අරන් නැහැ.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : සාක්ෂිකාරිය තමන්ට කොයි අවස්ථාවක හරි තමන්ගේ දුව කිව්වද හස්තූන් තමන්ට මුලින්ම හඳුනා ගත්තේ කවදද කියලා?

පි : දෙවෙනි වරට අපි රාසික්ගේ ස්ථානයට ගිය අවස්ථාවේ තමයි හස්තූන්ව හඳුනා ගත්තේ කියලා කිව්වා. වැඩි විස්තර කිව්වේ නැහැ.

ප්‍ර : ඒ කියන්නේ දෙවෙනි වරට අබ්දුල් රාසික්ලගේ ස්ථානයට ගිය අවස්ථාවේදී?

පි : විවාහය සිදු කළාට පස්සේ තමයි කිව්වේ හඳුනා ගත්තේ.

ප්‍ර : එතකොට තමන් ඉන්න ප්‍රදේශයේ ඒ පාසල් යන කාලයේ ඔහුව හඳුනාගෙන හිටියද?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : පාසල්යන අවදියේ නම් දැනගෙන ඉඳලා නැහැ. නමුත් කල්මුණේ අර Tuition යන අවස්ථාවේදී හස්තුනුත් Tuitionවලට ඇවිල්ලා තියෙනවා.

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප : කවිදම්මා කොයි වෙලාවක හරි, දැන් ඔබ කිව්වනේ ඔය තමන්ගේ දුරකථනය අළුත්වැඩියා කරන්නට දෙනවා. ඒ නිසා දැන්ම Call ගන්න එපා කියලා පුලස්තිනී ඔබට කිව්වා කියලා?

පි : ඔව්. පුලස්තිනී එහෙම කියා හිටියා.

ප : ඔය 2019 පෙබරවාරි මාසේ 19 වෙනිදා කියලා කිව්වනේ?

පි : ඔව්.

ප : එතකොට ඔබ හිටියේ අබුඩාබිවල නේද?

පි : ඔව්.

ප : ඔය දුරකථන ඇමතුමෙන් පස්සේ ඔබ අබුඩාබි ඉඳලා ඇවිල්ලා නාරම්මල පොලීසියේ පැමිණිල්ලක් දැම්මද කොයි වෙලාවක හරි?

පි : ඔව්.

ප : ඒ ගැන පොඩ්ඩක් කියන්න මේ ගරු කොමිෂන් සභාවට?

පි : 2019.04.06 වෙනිදා මම නාරම්මල පොලීසියට පැමිණිල්ලක් කළා.

ප : ඔව්. එතකොටත් අර කලින් ඔබට මඩකලපුව පොලීසියෙන් ලැබුණ විදියට පැමිණිල්ල ලියා ගත්තට පස්සේ නාරම්මල පොලීසියෙනුත් ලදුපතක් ඉදිරිපත් කළාද? රිසිට් එකක් දුන්නාද?

පි : දුන්නා.

ප : ඒ ලදුපත නැවත දැක්කොත් හඳුනන්න පුළුවන්ද?

පි : පුළුවන්.

(ස්වාමීනි සාක්ෂිකාරිය විසින් හඳුනා ගන්නා ලද නාරම්මල පොලීසිය විසින් 2019.04.06 වන දින මෙම සාක්ෂිකාරිය වෙත නිකුත් කොට ඇති එම පැමිණිලි ලදුපත C-955 වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)

ප : දැන් කවිදම්මා පොඩි දෙයක් පැහැදිලි කරන්න ඕන. ඒ තමයි කවිදම්මා කිව්වනේ දැන් 2019 පෙබරවාරි මාසේ 19 වෙනිදට පස්සේ පුලස්තිනී ඔබ සමඟ කථා කළේ නැහැ කියලා?

පි : ඔව්.

ප : එතකොට 2019 අප්‍රේල් මාසේ 06 වෙනිදා ඔය ලදුපත හම්බ වෙන්න ඔබ නාරම්මල පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් කරන්න හේතු වුණේ මොන කරුණද? දැන් මේ මාස දෙකකට

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වැඩිය තියෙනවනේ ගැප් එකක් නේද? කියන්නකෝ බලන්න අපිට මොකද ඒ වෙලා තියෙන්නේ කියලා. මතක් කරලා කියන්න?

පි : මාස දෙකක් තිස්සේ මම නොයෙකුත් විවිධ වාර වල මම දුරකථන ඇමතුම් ගත්තා. නමුත් ඒකට ප්‍රතිචාර ...,

ප්‍ර : කාටද ගත්තේ?

පි : පුලස්තිනීගේ දුරකථනයට තමයි ගත්තේ. නමුත් ප්‍රතිචාරයක් තිබුණේ නැහැ. ස්විච් එක OFF කරලා තිබ්බා. ඒ නිසා රට ඉඳලා වැඩක් නැහැ ලංකාවට ගිහිල්ලා ඇය සඳහන් කළේ නාරම්මල ඉන්නවා කියලානේ අවසන් වරට. ඒ නිසා නාරම්මල පොලීසියට ගිහිල්ලා සොයා බලමු කියලා තමයි නාරම්මල පොලීසියට ගියේ. ගිහිල්ලා පැමිණිල්ලක් කළේ.

ප්‍ර : දැන් ඔබ කිව්වා ඔබට අබුඩාබි ඉඳලා බඩු වගයක් පුලස්තිනීට එවන්න ඕන වෙච්ච වෙලාවේදී ඇයගේ ලිපිනය ඇහුවම නාරම්මල ඉන්න බව දැන ගත්තා වුණාට ලිපිනය ඔබට ලැබුණේ නැහැ කියලා?

පි : ඔව්.

ප්‍ර : ඉතිං එතකොට කොහොමද දැන් ඔබ ඔය 2019 අප්‍රේල් මාසේ 06 වෙනිදා නාරම්මල පොලීසියට ඒ පැමිණිල්ල දාන්න නාරම්මලට ආවේ? නාරම්මල කොහේද ඔබ ගියේ? ඇයි දැන් ලිපිනයක් දන්නෙත් නැහැනේ. කොහේ කියලා යනවද?

පි : මුස්ලිම් හින්දා පල්ලිවලට යනවා ඇතිනේ. ඒ නිසා පල්ලිවලට ගියා. කඩවලට, හෝටල්වලට ගියා.

ප්‍ර : කොහේද?

පි : නාරම්මල. එයාගේ Photo එක පෙන්න පෙන්න විස්තර ඇහුවා. අපි සේරටම වගේ පෙන්නුවා. එයාලටම දීලා එයාලගෙන් ඇහුවද කියලත් දන්නේ නැහැ අපි.

ප්‍ර : කොපමණ වගේ ප්‍රදේශයක ඔබ පුලස්තිනීව සොයමින් ගියාද?

පි : පියවරෙන් පියවර අපි ස්ථාන 29 ක් 30 ක් වගේ තැනකට ගිහිල්ලා සොයලා තියෙනවා.

ප්‍ර : නමුත් සොයා ගන්නට පුළුවන් වුණාද?

පි : අවසානයේ තමයි අපි පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් කළේ?

ප්‍ර : එතකොට එක දවසක් තුළදීද ඔබ ඔය ස්ථාන ඔය විසි ගණනක් ඔස්සේ පුලස්තිනීව සොයමින් ගියේ?

පි : නාරම්මල තමයි එකම දවසේ එක පල්ලියකට ගියහම තවත් පල්ලියකට යන්න කියනවා. ඒ පල්ලියට ගියහම තවත්

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පල්ලියකට යන්න කියනවා. එහෙම තමයි ඔය ස්ථාන කිහිපයකට ගියේ එකම දවසේ.

ප්‍ර : ඊට පස්සේද එහෙනම් ඔබ ඒ වගේ පරීක්ෂා කරලා තියෙන්නේ 2019.04.06 වෙනිදද? ඒ කියන්නේ නාරම්මල පොලීසියෙන් මේ පැමිණිලි ලදුපත නිකුත් කරපු දවසෙද?

පි : ඔව්. එදාම තමයි. එම අවස්ථාවේම.

ප්‍ර : ඉතිං දැන් පුලස්තිනීව හොයා ගන්න බැරි වුණානේ?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ ඔබ මොකද කළේ?

පි : ගෙදරට ආවා.

ප්‍ර : ඊළඟට මොකද වුණේ?

පි : අපි පැමිණිල්ල දැම්මේ 06 වෙනිදා අප්‍රේල් මාසේ. 2019 අප්‍රේල් 07 වෙනිදා අපේ ගෙදරට CID එකෙන් එක්කෙනෙක් ආවා.

ප්‍ර : කොහොමද දන්නේ ඒ ආපු තැනැත්තා CID එකෙන් කියලා?

පි : ඔහු හැඳුනුම්පතක් පෙන්නුවා. අපි ඔහුව Photo ගත්තා. ඔහුමයි කියා සිටියේ ඔහු CID කියලා.

ප්‍ර : ඒ පින්තූරය ඔබ ගාව තියෙනවද දැන්?

පි : මම දීලා තියෙනවා මේ අංශයට.

(ස්වාමීනි මේ අවස්ථාවේදී සාක්ෂිකාරිය විසින් 2019.04.07 වන දින ඇගේ නිවසට පැමිණ තමන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් බවට පවසමින් ඒ පැමිණි පුද්ගලයාගේ ඡායාරූපයක් ඇය ඇගේ ජංගම දුරකථනයෙන් ලබා ගන්නා ලද බවට සඳහන් කරනු ලැබුවා. ඒ අනුව ඇයගේ ජංගම දුරකථනය විවෘත කොමිෂන් සභාවට ගෙන්වාගෙන එහි තිබෙන ඡායාරූපය ඇය දැන් ස්වාමීනි පෙන්වා සිටිනවා)

(එහි පිටපතක්, මුද්‍රිත පිටපතක් ස්වාමීනි මේ අවස්ථාවේදී C-956 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයදිනවා)

ප්‍ර : එතකොට දැන් ඔබට ඒ ආපු තැනැත්තා ඔහුගේ නම කිව්වද?

පි : රොෂාන් කියලා ඔහුගේ නම රොෂාන් කියලා කියා හිටියා.

ප්‍ර : ඔහු සිංහලද, ද්‍රවිඩද, මුස්ලිම්ද කියන කරුණ පිළිබඳව ඔබට දැන ගන්නට ලැබුණද?

පි : ඔහු කියා සිටියා ඔහු දෙමළ කියලා.

ප්‍ර : එතකොට 2019 අප්‍රේල් මාසේ 07 වෙනිදා ඔබේ නිවසට පැමිණි තැනැත්තා ද්‍රවිඩ බවත්, ඔහුගේ නම රොෂාන් බවත්, ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු බවටත් ඔබට කිව්වේ

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

මේ ආපු දැන් C-956 කියලා ලකුණු කරලා ඉදිරිපත් කරපු ඡායාරූපයේ ඉන්න අය නේද?

පි : ඔව්.

(ස්වාමීනි ඉස්සරලා ඔබතුමන්ලාගේ ගරු කොමිෂන් සභාවෙන් අවසර අයැද සිටියා මෙම රොෂාන් කියලා පෙනී සිටි තැනැත්තාගේ ඒ ඡායාරූපය C-956 ලෙස ලකුණු කරන්නට. ඒ ලකුණු කිරීම ස්වාමීනි වෙනස් කරන්නට අවසර අයැදිනවා)

(ඒ අනුව මෙම ලේඛනය X-173 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීම සඳහා අවසර අයදිනවා ස්වාමීනි)

ප්‍ර : දැන් මේ රොෂාන් කියන තැනැත්තා ඔබත් එක්ක කථා කළානේ. මොනවද කවිදම්මා කථා කළේ ඔහු?

පි : ළමයා හොයාගෙන හැම තැනම ඇවිදිනවා. හතරවෙනි තට්ටුවටත් ගිහින් තියෙනවා. මම ඇහුවා ඔයාට කවුද ඔය විස්තරය කිව්වේ කියලා.

ප්‍ර : ඔව්. මොකද්ද ඔබ දැන ගත්තේ එතකොට?

පි : එතකොට ඔහු කියා සිටියා රාසික් තමයි මාව යැව්වේ. ඒ නිසා තමයි මම ආවේ.

ප්‍ර : රාසික් කියන්නේ කවුද? ඉතිං රාසික් කියලා ඕන තරම් අය ඉන්නවනේ නේද?

පි : අබ්දුල් රාසික්.

ප්‍ර : අබ්දුල් රාසික් මහත්මයා තමයි දැන් ඔහුව එවව්වා කියලා දැන් මේ කියන්නේ. ඊට පස්සේ?

පි : ඊට පස්සේ ඔහුගේ Phone එකේ තිබිච්ච Photo එකක් පෙන්නලා මෙයාව දන්නවද, මේ සහරාන්ව දන්නවද කියලා Photo එක පෙන්නලා ඇහුවා. මම කිව්වා මම දැකලා නැහැ කියලා. එතකොට ඒ ආපු නිලධාරියා කියා හිටියා මෙයාගේ ඒ කියන්නේ සහරාන්ගේ Wife එක්ක තමයි මගේ දුව ගිහිල්ලා තියෙන්නේ. ඒ දෙන්නම හොඳම යාළුවෝ කියලා එයා විස්තර කිව්වා.

ප්‍ර : දැන් මේ රොෂාන් කියන තැනැත්තා තමයි ඔබට මේවා කියන්නේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔහු ඔබට දුරකථන අංකයක් එහෙම දුන්නද?

පි : ඔව්.

ප්‍ර : අපි ඒක ලියලා දෙමු කොළයක.

****

FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

සාක්ෂිකාරියගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලේඛනයක ලියා කොමිෂන් සභාවට ඉදිරිපත් කරයි. එය සාක්ෂිකාරියගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරක් ලෙස සටහන් කළයුතු බවට ලඝුලේඛිකාවට නියෝග කරයි.

පි : 077-6038781

****

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඇයි මේ දුරකථන අංකය ඔබට දුන්නේ මේ තැනැත්තා?

පි : දුව අපට Call ගත්තොත් ඔහුට ඒ බව දන්වන ලෙස තමයි මෙම දුරකථන අංකය ලබා දුන්නේ.

ප්‍ර : ඊට පස්සේ ඔබ දැන් මේ වගේ ඔබ නාදුනන කෙනෙක් ඔබේ දියණිය මුස්ලිම් කෙනෙක්ට විවාහ කරලා දුන්න අබ්දුල් රාසික් විසින් එව්වාය කියලා කිව්ව කෙනෙක්. මේ විදියට ඔබේ නිවසට ඇවිල්ලා ඔබට කථා කරලා ඔහුගේ දුරකථන අංකය දීලා දුව කථා කළොත් ඒ ගැන දැනුම් දෙන්න කියලා කිව්වහම ඔබ මොකද්ද කළේ?

පි : මට හිතුණේ කොහේ හරි තැනක මගේ දුවව සඟවා තබාගෙන ඉන්නවා කියලා තමයි හිතුණේ.

ප්‍ර : ඉතිං ඔබ මොකද කළේ?

පි : මම කිව්වා හරි දුව Call ගත්තොත් මම ඔයාට දන්වන්නම් කියලා කිව්වා. ඊට පස්සේ ඔහු යන්න ගියා.

ප්‍ර : ඉතිං එතනින් නැවතුණාද ඔබ මොකුත්ම කරන්නේ නැතුව?

පි : ඊට පස්සේ කලවංචිකුඩි පොලීසියට ගොස් පැමිණිල්ලක් කළා?

ප්‍ර : කවදද?

පි : රොෂාන් ඇවිල්ලා දවස් දෙකකට පස්සේ තමයි අපි ගියේ.

ප්‍ර : ගිහිල්ලා ඔබ පොලීසියට මොකද්ද කිව්වේ?

පි : මම කියා හිටියා කලිනුත් පැමිණිලි කරලා තියෙනවා. නමුත් මගේ දුව මාස දෙකක් තිස්සේ දකින්න නැහැ. ඒ නිසා පැමිණිල්ලක් කරන්න ඕන කියලා කිව්වා. නමුත් ඔවුන් ඒකට ඉඩ දුන්නේ නැහැ.

ප්‍ර : දැන් ඔබ කලවංචිකුඩි පොලීසියට ගියේ මොකද ඔබ අයිති වෙන්නේ කලවංචිකුඩි පොලිස් වසමට නිසා නේද?

පි : ඔව්.

ප්‍ර : නමුත් ඔබට ඒකට ඔබ බලාපොරොත්තු වෙන ආකාරයේ ප්‍රතිචාරයක් ලැබුණද පොලීසියෙන්?

FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : ස්ථිර පොලිස් ස්ථානාධිපතිවරයා ඒ වෙලාවේ හිටියද? නැත්නම් වැඩ බලන එක්කෙනෙක්ද හිටියේ?

පි : දෙවෙනි, වැඩ බලන එක්කෙනා තමයි හිටියේ.

ප්‍ර : එතකොට මොකද්ද ඔවුන් දක්වපු ප්‍රතිචාරය?

පි : අපි උදේ 8.00 ට ගොස් පස්වරු 3.00 වෙනකම් පොලීසියේ හිටියා අපේ පැමිණිල්ල සටහන් කරන ලෙසට. නමුත් සටහන් කර ගත්තේ නැහැ.

ප්‍ර : ඉතිං එතකොට මොකද වුණේ ඊට පස්සේ?

පි : ඇය මුස්ලිම් අයෙක් සමඟ එකතු වෙලා නේද පවුල් කන්නේ. මෙහේ ඇවිල්ලා ඇයි හොයන්නේ. කොයි පොලීසියද දෙන්නව එකතු කරලා තිබුවේ. ඒ පොලීසියෙන් ගිහිල්ලා පැමිණිලි කරන්න කිව්වා.

ප්‍ර : එතකොට දැන් ඔබ මේ වෙනකොට ගරු කොමිෂන් සභාවට කියලා තියෙනවා කාත්තන්කුඩිය පොලීසිය තමයි අර වෙන් වෙලා හිටපු හස්තූන් සහ සාරා ජෙස්මින් එහෙම නැත්නම් පුලස්තිනීව එකතු කළේ කියලා නේද? එතකොට ඔබ එහෙමනම් කාත්තන්කුඩි පොලීසියට ගියාද?

පි : ඔව් ගියා.

ප්‍ර : එතනට ගියහම මොකද වුණේ?

පි : එහේදිත් පැමිණිල්ල බාර ගන්න බැහැ කියලා කිව්වා.

ප්‍ර : ඇයි ඒ?

පි : ඔවුන් බාර ගත්තේ නැහැ. පස්සේ මම කිව්වා මෙම පොලීසියේදී තමයි හස්තූන්වයි මගේ දුවවයි එකට එකතු කළේ. එහෙම කියලා මොවුන් පදිංචි වෙලා හිටියෙත් කාත්තන්කුඩි ප්‍රදේශයේ කියලා මම කියා හිටියා. නමුත් ඔවුන් මගේ පැමිණිල්ල බාර ගත්තේ නැහැ. මම හඬා වැළපුණා. නමුත් බාර ගත්තේ නැහැ.

****

ගරු සභාපතිතුමා :

මේ අවස්ථාවේදී සාක්ෂිකාරිය හැඟුම්බරව සාක්ෂි දෙන බව සටහන් කර තබමි.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : ඔබ කාත්තන්කුඩිය පොලීසිය ඔබේ පැමිණිල්ල බාර ගත්තේ නැති අවස්ථාවේ කවිදම්මා වෙන කවුරු හරි ගාවට යන්න කල්පනා කළාද? වෙන පුද්ගලයෙක් නැත්නම් ආයතනයකට යන්න කල්පනා කළාද?

පි : මානව හිමිකම් කොමිෂන් සභාවට ගියා.

ප්‍ර : ඒ කොහේ තියෙන මානව හිමිකම් කොමිෂන් සභාවද?

පි : එම ස්ථානයේ Address එක මගේ File එකේ තියෙනවා. ඉස්පිරිතාල පාරේ තමයි.

ප්‍ර : ඒක මඩකලපුවේ තියෙන මානව හිමිකම් කාර්යාලයද කියලා මම ඇහුවේ?

පි : ඔව්.

ප්‍ර : එම කාර්යාලයට පුළුවන් වුණාද ඔබේ ප්‍රශ්නයට යම් විසඳුමක් ලබා දෙන්නට?

පි : නැත.

ප්‍ර : ඔවුන්ගෙන් ඔබ යමක් දැන ගත්තාද?

පි : මම කියා හිටියා අපේ ළමයෙක් නැති වෙලා තියෙනවා. එයා පිළිබඳ තොරතුරක් නැහැ. සහරාන්ගේ බිරිඳ සමඟ මේ ළමයා සැරිසරන බවට අපට දැන ගන්නට ලැබිලා තියෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් බාර ගන්න කියලා. සහරාන්ව අපි දන්නවා. ඔහු සාමාන්‍ය පුද්ගලයෙක්. ඔහු සමඟ අපි කථා බහ කරලා අපි විසඳන්නම්. මේකට පැමිණිල්ලක් දාන්න අවශ්‍ය නැහැ කියලා කියා හිටියා.

ප්‍ර : කවුද මේ කිව්වේ?

පි : මානව හිමිකම් කොමිසමේ මඩකලපු ශාඛාවේ ඉන්න ලොකු මහත්මයා.

ප්‍ර : නම දන්නවද?

පි : ඔහුත් මුස්ලිම් කෙනෙක්ම තමයි. එම අවස්ථාවේ හිටපු අය ඔහු මුස්ලිම්.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප්‍ර : නම දන්නේ නැද්ද?

පි : නම දන්නේ නැහැ. අපි ගියාට පස්සේ මේ විස්තරය කිව්වා. ඊට පස්සේ අපි ආපසු හැරිලා ආවා.

****

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය :

ප්‍ර : එතකොට දැන් කවිදම්මාට දුවව හොයා ගන්නට එතකොට මොකුත්ම ආධාරයක් ලැබුණේ නැහැ කලවංචිකුඩි පොලීසියෙන්වත්, කාත්තන්කුඩි පොලීසියෙන්වත්, ඒ වගේම මඩකලපුවේ තියෙන මානව හිමිකම් කාර්යාලයෙන්වත්. ඒක තමයි කවිදම්මා කියන්නේ?

පි : ඒ විතරක් නෙමෙයි. මම කල්මුණේ තියෙන මානව හිමිකම් කාර්යාලටත් ගියා. එහේදී නම් පැමිණිල්ල ලියා ගත්තා. ඔහුත් මුස්ලිම් කෙනෙකුම තමයි.

ප්‍ර : ඒ වුණත් ඔහු ලියා ගත්තා කියලා ඔබ කියන්නේ?

පි : නමුත් ඔහු කිසිදු තොරතුරක් ලබා දුන්නේ නැහැ.

ප්‍ර : ඒ කවදද ලියා ගත්තේ කල්මුණේ මානව හිමිකම් කාර්යාලයෙන්?

පි : මේ පිපිරීම සිදු වීමට පෙර තමයි දිනය 12, 15, 16 වෙන්න ඇති.

ප්‍ර : එතකොට කවිදම්මා කියපු ඔය පිපිරීම මොකද්ද? කවදද ඔය පිපිරීම වුණේ?

පි : මේ ඔක්කොටම පැමිණිලි කළා. කවුරුවත් ඒකට ප්‍රතිචාර දැක්වුවේ නැහැ. 21 වෙනිදා තමයි මේ පිපිරීම සිදු වුණේ. 24 වෙනිදා මගේ දුවගේ Photo එක, ඡායාරූපය TV එකේ දැක්කා. එතකොට තමයි මම දැන ගත්තේ මේ අයවළුන් එක්ක දුව ඉඳලා තියෙනවා කියලා.

ප්‍ර : එතකොට තමයි ඔබ දැන ගත්තේ. ඒ Television එකේ දැක්ක පින්තූරය දැක්කොත් නැවත හඳුනන්න පුළුවන්ද ඒකද පින්තූරය කියලා?

පි : පුළුවන්.

ප්‍ර : කවිදම්මා කිව්වා රූපවාහිනියේ, Television එකේ දැක්කයි කියලා අර දුවගේ පින්තූරය. ඒකේ එයත් එක්ක තව කට්ටියව දැක්කද? ඒක නැවත දැක්කොත් හඳුනන්න පුළුවන්ද?

පි : මගේ දුවගේ Photo එක විතරයි මම දන්නේ.

ප්‍ර : ඔව් ඒක විතරයි තමයි. ඒ Television එකේ දැක්ක Clip දැක්කොත් හඳුනන්න පුළුවන්ද කියලා ඇහුවේ. මේකද දැක්කේ?

පි : මෙම Photo එක මම තමයි දුන්නේ. රාසික්ට දීලා තියෙනවා. රාසික් කිව්වා ඕක Shakthi TV එකට දුන්නයි කියලා.

(ස්වාමීනි සාක්ෂිකාරිය විසින් හඳුනා ගන්නා ලද මෙම ඡායාරූපයේ ඇගේ දියණියගේ ඡායාරූපය ඇය හඳුනාගනු ලැබුවා. එම ස්ථානය ස්වාමීනි C-165(b) වශයෙන් ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටිනවා)

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහෙමනම් කවිදම්මාට කියන්න පුළුවන්ද කොයි වෙලාවෙද අබ්දුල් රාසික්ට මේ පින්තූරය කවිදම්මා දුන්නේ කියලා? ඒ කියන්නේ C-165(b) කියන පින්තූරය?

පි : අප්‍රේල් මාසයේදී අපි ළමයාව හොයන අවස්ථාවේදී අපි දුරකථනයෙන් කථා කරලා අබ්දුල් රාසික්ගෙන් ඇහුවා මගේ දුවව ඔයා ළඟ ඉන්නවා නම් අපට බාර දෙන්න කියලා.

ප්‍ර : ඒ මොන අවුරුද්දෙද?

පි : 2019.04 වෙනි මාසේ.

ප්‍ර : ඔව්. එතකොට?

පි : ඊට පස්සේ ඔහු කිව්වා Photo එකක් එහෙම තිබුණොත් මට එවන්න. මම හොයලා බලන්නම් කියලා. පස්සේ මම Watsapp මගින් මගේ දුවගේ Photo එක යැව්වා.

ප්‍ර : එතකොට මේ ඡායාරූපය ඒ කියන්නේ C-165(b) කියලා ලකුණු කරපු ඡායාරූපය අබ්දුල් රාසික්ට ඔබ දුන්නේ 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා පිපිරීම වෙන්න ඉස්සර වෙලාද පස්සෙද?

පි : පිපිරීමට කලින්.

ප්‍ර : එතකොට ඔබ කොයි වෙලාවෙද ඇත්තටම ඔය අබ්දුල් රාසික්ට සම්බන්ධ වුණේ අප්‍රේල් මාසේ?

පි : මම ආපහු ඇවිල්ලා නාරම්මල අරෙහේ මෙහේ හොයලා CID එක අපේ ගෙදරට ආවා. එතකොට CID කිව්වනේ අබ්දුල් රාසික් තමයි මාව එව්වේ කියලා. එතකොට මම Call කරලා ඇහුවා ඔයා තමයි CID එක එව්වේ. මගේ දුවව ඉන්නවා නම් මට බාර දෙන්න නැත්නම් මට හොයලා දෙන්න කියලා.

ප්‍ර : එතකකොට?

පි : එතකොට තමයි Photo එක එවන්න කිව්වහම Phot එක එව්වේ.

ප්‍ර : ඒ අවස්ථාවේ තමයි අබ්දුල් රාසික් මහත්මයා ඔබට කිව්වේ දුවගේ පින්තූරයක් තියෙනවා නම් එවන්න කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ කියන්නේ 2019 අප්‍රේල් මාසේ 07 වෙනිදා අර රොෂාන් කියන තැනැත්තා ඔබේ නිවසට ඇවිල්ලා ඔබත් සමඟ කථා කෙරුවට පස්සේ ඔබ ඒ ආසන්නයේම අබ්දුල් රාසික් මහත්මයාට කථා කථා කරපු වෙලාවේ නේද?

පි : ඔව්.

****

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

ප : සාක්ෂිකාරිය ඔබට මේ ඔබගේ දුව මේ විදියට බුර්කාව ඇඳගෙන තිබුණ පින්තූරයක් ඔබගේ ජංගම දුරකථනයට ඇතුළත් වෙන්නේ කොහොමද?

පි : විවාහ වුණාට පස්සේ රාසික්ගේ ඉඳලා ආපහු ආවනේ. ඒ ආපු අවස්ථාවේ ඇයගේ ජංගම දුරකථනයේ තිබිලා තමයි මම මේ Photo එක මගේ එකට ගත්තේ. විවාහය සිදු කළ අවස්ථාවේ රාසික් එක්ක ඉන්න වෙලාවේ තමයි මේ Photo එක එයා අරන් තිබුණේ.

ප : මේ පින්තූරය කවුද අරගෙන තියෙන්නේ කියලා අහන්න?

පි : දන්නේ නැහැ. මේ Photo එකේ තව ළමයි දෙන්නෙක් ඉන්නවා.

දැන් වෙලාව : ප.ව. 1.50 යි

මෙතැන් සිට සටහන් කළේ ධම්මිකා මිය.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

පෙර සටහන් කරන්නේ ඉන්ද්‍රාණි මිය විසින්ය.
වේලාව ප.ව. 1.50 යි
මෙතැන් සිට ධම්මිකා පෙරේරා විසින්

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>:

ප්‍ර : අහන්න ඇයගේ දුරකථනයේ තිබෙන්නේ දැන් මේ පෙන්නපු ඡායාරූපයද නැත්නම් වෙනත් අය ඉන්න ඡායාරූපයක්ද කියලා අහන්න?

පි : මේ ළමයින් දෙන්නත් එක්ක ඉන්න Photo එක තමයි මගේ Phone එකේ තිබුණේ.

ප්‍ර : ඒක ඉදිරිපත් කරන්න කියන්න?

****

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවයි:</u>

ස්වාමිනී සාක්ෂිකරු විසින් ගරු සභාපතිතුමා විසින් අසන ලද එම ප්‍රශ්නයට පිළිතුරු දෙන ගමන් ඇයගේ ජංගම දුරකථනය පරීක්ෂා කොට එම අදාල ඡායාරූපය මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. එහි මුද්‍රිත පිටපතක් C956 ලෙස ලකුණු කොට ඉදිරිපත් කිරීමට අවසර පතනවා.

ප්‍ර : මේ ඡායාරූපයේ ඉන්නේ ඔබේ දුව කියලා කිව්වනේ පුලස්තිනී නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඔය දරුවෝ දෙන්නා කවුද කියන එක පුලස්තිනීගෙන් ඔබ දැන ගත්තද?

පි : මෙම දරුවන් දෙදෙනා කාගේද කියලා අබ්දුල් රාසික් දන්නවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : දුව කිව්වේ නැද්ද කියලා අහන්න?

පි : මම ඇහුවා මේ පොටෝ එකේ ඉන්න දරුවන් දෙදෙනා කවුද කියලා ඇය කියා සිටියා අපි හිටපු නිවසේ ළමයින් දෙන්නා කියලා. මෙම දරුවන්ට දැනට අවුරුදු 5 ක් විතර වැඩි වෙලා ඇති.

ප්‍ර : මට හරියට පැහැදිලි නැහැ එයා කියන හැටියට මේ පිංතූරය ගත්තේ කවුද කියලා අහන්න? එයා දන්නවද කියලා අහන්න?

පි : මෙම පොටෝ එක රාසික් අරන් දීපු ගෙදර තමා අරන් තියෙන්නේ. ඒ ගෙදර හිටපු අය තමයි ගන්න ඇත්තේ කවුද ගත්තේ කියන එක මම දන්නේ නැහැ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

කොමිෂන් සභාවේ කටයුතු දිවා ආහාරය සඳහා පස්වරු 2 පසුවී විනාඩි 45 වන තෙක් කල් දමනවා.

****

දිවා විවේකයෙන් පසුව නැවත කොමිෂම රැස්වේ.
දැන් වේලාව ප.ව. 2.55 යි

<u>පෙර සාක්ෂි දුන් සාක්ෂිකාරිය වැඩිදුර විමසීම සඳහා කැඳවයි</u>.
<u>සාක්ෂිකාරිය නැවත කැඳවා ප්‍රතිඥ ලබා දෙයි.</u>

<u>අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය:</u>

ප්‍ර : කවිදා අම්මා අද උදේ කවිදා අම්මා කිව්වා 2019 අප්‍රේල් මාසේ 7 වෙනිදා රොෂාන් කියලා එක්කෙනෙක් කවිදා අම්මව හම්බ වෙන්න ගෙදරට ආවා කියලා?

පි : ඔව්.

ප්‍ර : ඒ තැනැත්තාව කොයි වෙලාවක හරි නැවත කවිදා අම්මා දැක්කද?

පි : මම දැක්කා. ඊට කලින් දැකලා නැහැ. නමුත් මේ සිද්ධියෙන් පස්සේ දැක්කා.

ප්‍ර : ඒ සිද්ධියෙන් පස්සේ කවද ද දැක්කේ? කොහේදී ද දැක්කේ?

පි : මේ අවුරුද්දේ ඒ කියන්නේ 2020 ජනවාරී 5 හෝ 6 වෙනි දින අම්පාර පොලීසියේ දී මම ඔහුව දැක්කා.

ප්‍ර : ඇයි කවිදා අම්මට අම්පාර පොලීසියට යන්න වුණේ?

පි : මම මෙම අවුරුද්දේ 2020 ජනවාරී 01 වෙනිදා ලංකාවට පැමිණියා. 2 වෙනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණයට ගියා. ඊට පස්සේ අම්පාර පොලීසියෙන් ඇවිත් පරීක්ෂණයක් සඳහා අම්පාර පොලීසියට එන ලෙසට දැනුම් දුන්නා. ඒ පරිදිම මම අම්පාර පොලීසියට ගියා.

ප්‍ර : ඒ පොලීසියේ ඒ අවස්ථාවේදී ද කවිදා අම්මා දැක්කේ මේ රොෂාන් කියන එක්කෙනාව?

පි : රොෂාන් විතරක් නෙමෙයි, රොෂාන් එක්ක පැමිණි CID එක්කෙනෙකුයි තවත් පිරිසක් ආවා ඒ අයවළුනුත් එහේ හිටියා.

ප්‍ර : ඒ අවස්ථාවේදී කවිදා අම්මට මොනවා හරි අදුන ගන්නට පෙන්නුවද?

පි : ඔව්.

ප්‍ර : මොනවද ඒ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : සහින්දමර්දුහිදී හමුවුණා යැයි කියනු ලබන රත්රන් භාණ්ඩ මට පෙන්නුවා. ඒවායේ පොටෝ පෙන්නුවා. මම පිටරට ඉන්න කොට දුවට අරන් දීපු මුදු මම අරන් දීලා තිබුණා. නමුත් මට මෙම පොටෝවලින් ඒවා හඳුනා ගන්න බැරි වුණා.

ප්‍ර : දැන් කවිදා අම්මගෙන් මම උදේ ඇහුවාම කිව්වා අර explosion එකක් පිපිරීමක් ගැන කිව්වානේ එතකොට කවිදා අම්මා කිව්වේ ඒ කියපු explosion එක 2019 අප්‍රේල් මාසේ 21 වෙනිදා වුණා කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට දැන් ඔය සහින්දමර්දු වලදී තිබුණු බඩු වගයක් කියලා කවිදා අම්මට ඒක පෙන්නන්න හේතු වුණේ මොකක්ද?

පි : මේවා මගේ දුවගේ රත්රන් භාණ්ඩද කියලා මගෙන් අසා සිටියා.

ප්‍ර : එතකොට මම කිව්වොත් හරිද එහෙම නම් 2019 අප්‍රේල් මාසේ 26 වෙනිදා කවිදා අම්මා කියන ඔය සහින්දමර්දු කියන ස්ථානයේ නිවසක පිපිරීම් වගයක් සිදු වෙලා තිබුණා කියලා?

පි : News වලින් තමයි මම දැන ගත්තේ මෙහෙම පිපිරීම් සිදු වුනාය කියලා.

ප්‍ර : එතකොට ඊට පස්සේ තමයි එහෙමනම් කවිදා අම්මා කියන විදියට 2020 ජනවාරි මාසේ 10 වෙනිදා අර අම්පාර පොලිසියට යන්නට සිද්ධ වුනේ නේද?

පි : ඔව්. මගේ File එකේ තියෙනවා ඒ date එක. නමුත් මම ගියා ජනවාරි මාසේ.

ප්‍ර : එතකොට ඔය සහින්දමර්දු සිද්ධිය වුනේ 26 වෙනිදා නේද අප්‍රේල් මාසේ 2019?

පි : ඔව්.

ප්‍ර : ඊට පස්සේ කවද්ද සාරා කතා කෙරුවේ කවිදා අම්මට?

පි : 2019 දෙවන මාසේ, පෙබරවාරී මාසේ 19 වෙනිදායින් පස්සේ මගේ දුවගේ කටහඬ මට ඇහිලාවත් නැහැ, එයාව දැකලාවත් නැහැ.

ප්‍ර : එයා කතා කලෙත් නැහැ කවිදා අම්මා දැක්කෙත් නැහැ කියලද කියන්නේ?

පි : ඔව්, මම ඇයගේ කටහඬ ඇසුවෙත් නැහැ. දැක්කෙත් නැහැ, දුටුවෙත් නැහැ ඒක තමයි ඇත්ත.

ප්‍ර : කවිද අම්මා දන්නවද ඔය සහින්දමර්දුවල කිහිප දෙනෙක් මැරුණේ ඔය පිපිරීම්වලින් නේද?

පි : ඔව් මම දන්නවා.

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඊට පස්සේ මතකද කවිදා අම්මාගෙන් ලේ ගත්තා පොලීසියෙන් දොස්තර මහත්තයා ලේ ගත්තා මතකයිද? සාම්පල් එකක් දුන්නා නේද?

පි : ඔවුන් ගත්තේ නැහැ මම තමයි ගන්න කියලා කිව්වේ.

ප්‍ර : කාටද ගන්න කියලා කිව්වේ?

පි : අපේ ගෙදරට මේ සිද්ධියෙන් පස්සේ පුවත්පත්වලින් සහ අනෙකුත් මාධ්‍යවලින් ආවා. ඒ අය කියා සිටියා මගේ දුව ජීවතුන් අතර ඉන්නවා කියලා, මට නඩුවක් දාන්නත් කිව්වා. මම කිව්වා..

ප්‍ර : මොකටද නඩු දාන්නේ?

පි : මුස්ලිම් ආගමට මාරුකර ගත්තේ. බලහත්කාරයෙන් එක්කන් ගියේ. ඔය සම්බන්ධයෙන් අබ්දුල් රාසික්ට විරුද්ධව නඩුවක් දාන්න ඕන කියලා කියා සිටියා. ඔහුව අත්අඩංගුවට ගන්න ඕන කියලා කියා සිටියා. මම කිව්වා ඊට ඉස්සරවෙලා DNA පරීක්ෂාවක් පවත්වන්න ඕනේ කියලා.

ප්‍ර : ඒක කිව්වේ කවුද කවිදා අම්මද එහෙම නැත්නම් ඒ ආපු අයද කිව්වේ?

පි : සහින්දමර්දු සිද්ධියේදී ඒ සිද්ධියේදී මියගිය අයගේ මෘතදේහයන් කවුරුවත් මාව එක්කරගෙන ගෙනහිල්ලා පෙන්නුවේ නැහැ, මම ගියා නම් මම හඳුනා ගන්නවා. ඒ නිසයි මම කිව්වේ DNA පරීක්ෂාවක් කරන්න කියලා.

ප්‍ර : කාටද මෙහෙම කිව්වේ?

පි : ඥාණසාර කියන ස්වාමීන් වහන්සේ ඇවිත් හිටියා, ඔහු සමඟ නීතිඥ මහත්වරු 4 දෙනෙක් ඇවිත් හිටියා, ඔවුන් තමයි නඩුවක් දාන්න කියලා බල කලේ. ඒ නිසා තමයි මම ඒක කිව්වේ.

ප්‍ර : එතකොට දැන් කවිදා අම්මගේ DNA වලට Blood සාම්පල් කොයි වෙලාවක හරි ගත්තද?

පි : අම්පාර පොලීසියෙන් එන්න කිව්වා. අම්පාර පොලීසියට ගියාට පස්සේ අම්පාර රෝහලට එක්කරගෙන ගිහිල්ලා වම් අතේ මැදගිල්ලෙන් තමයි පොඩ්ඩයි ගත්තේ ලේ.

ප්‍ර : ඒ අවශ්‍ය ප්‍රමාණයනේ ගන්නේ කවිදා අම්මා, එතකොට කවිදා අම්මා දන්නවද මේ වන කොට කවිදා අම්මගේ ලේයි එතන තිබුණ මැරිච්ච ඒගොල්ලන්ගේ ශරීරයි සංසන්දනය කරලා බැලුවට පුස්තිනීගේ ශරීරයත් එක්ක එයාගේ DNA ත් එක්ක ඒ එකක්වත් ගැලපෙන්නේ නැහැ කියලා දැන් දන්නවද ? මේ වෙනකොට?

පි : ඔව් මටත් ඒක සැකයක් තියෙනවා. තව සැරයක් මම DNA පරීක්ෂාව කරන්න ඕනේ. සහරාන්ගේ wife ෆාතිමා කියනවා එයා

Fair Comment by Jezeem

එක්ක ඇවිල්ලා එහෙම ගෙදර තුළම හිටියා කියන නිසා තව සැරයක් DNA පරීක්ෂාවක් පවත්වන්න ඕනේ.

ප්‍ර : දැන් ඒ විමර්ශනය කරන ඒගොල්ලන් දැන් ඒවා නිසි පරිදි කරනවා හොඳේ. ඒ නිසා ඒ විමර්ශකයන්ගේ විමර්ශනයේදී අවශ්‍ය කියලා පේනවා නම් එතකොට ඒ විදියට නැවත ලබාගනී. නැත්නම් අවශ්‍ය වුනොතින් ඒක ඒගොල්ලන් කරාවි තේරුණානේ?

පි : හරි.

ප්‍ර : එතකොට එහෙම නම් කවිදා අම්මා කියන්නේ ඔය සහින්දමර්දු සිද්ධියෙන් පස්සේ සාරාව දැක්කේ නැහැ කියලද?

පි : අද වෙන කල්, දැනට අවුරුදු 1 ½ ක් වෙනවා මම දැකලත් නැහැ, දුරකථනයෙන්වත් මට කතා කරලත් නැහැ එක් එක්කෙනා නොයෙක් විදියේ කියනවා.

ප්‍ර : 2019 සැප්තැම්බර් මාසේ වෙන කොට කවිදා අම්මා හිටියේ මොන ලිපිනයේද?

පි : මම පිටරට හිටියේ විදේශගතව. සැප්තැම්බර් මාසේ 26 වෙනිදා මම පිටරටට ගියා.

ප්‍ර : ඔය කාලය වෙන කොට ඒ කියන්නේ 2019 සැප්තැම්බර් වෙන කොට කවිදා අම්මගේ සහෝදරී කීතා කොහේද පදිංචි වෙලා හිටියේ?

පි : අපේ ගෙදරයි ඔවුන්ගේ ගෙදරයි, අපේ ගෙදරට අල්ලපු ගෙදර.

ප්‍ර : ඒ කියන්නේ ඔය ගෙවල් දෙකම එක ආසන්නයේ නේද තියෙන්නේ?

පි : එක ලඟ තමයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකාරිය ඔබ සාක්ෂියේදී කිව්වා අර අබ්දුල් රාසික්ගේ මාළිගාවත්ත ප්‍රදේශයේ තිබ්බ කාර්යාලයේදී ඉස්සෙල්ලම ඔබගේ දුව දකින කොට ඇය ඇඳගෙන හිටියා කියලා ඔළුව ඔතාගෙන යම්කිසි ඇදුමක්?

පි : ඔව්.

ප්‍ර : ඒ වෙලාවේ ඔබ කිව්වා ඒ හිස් ආවරණය ඔබ ගලවන්න හැදුවා කියලා?

පි : ඔව්.

ප්‍ර : ගලවන්න පුළුවන් වුණාද?

පි : බැරි වුණා.

ප්‍ර : ඇයි?

FAIR COMMENT BY JEZEEM

පි : එයා අයින් කරන්න දුන්නේ නැහැ.

ප්‍ර : කවුද අයින් කරන්න දුන්නේ නැත්තේ?

පි : රාසික් හිටපු නිසා මගේ දුව බයට අයින් කරන්න ඉඩ දුන්නේ නැහැ.

ප්‍ර : ඔබගේ දුව සහ හස්තුන් අතර සිදු වුණු විවාහයක යම්කිසි ලේඛනයක් නැත්නම් විවාහ සහතිකයක් කොයි අවස්ථාවක හරි ඔබට පෙන්නුවද?

පි : නැහැ.

ප්‍ර : ඔබ ඉල්ලුවද?

පි : මම ඇහුවා ඔවුන් ලඟ තිබෙනවා කිව්වා නමුත් මට පෙන්නුවේ නැහැ.

ප්‍ර : දුවවත් පෙන්නුවේ නැද්ද?

පි : නැත.

ප්‍ර : ලංකාවට නැවත එන්නේ කොයි කාලෙද?

පි : මම 2019.09.26 වන දින ගොස් 2020 ජනවාරී මාසේ එහෙන් 1 වෙනිදා පිටත් වෙලා ලංකාවට අවේ 02 වෙනිදා ජනවාරී.

ප්‍ර : 2019 වර්ෂයේ සැප්තැම්බර් මාසෙට ඉස්සෙල්ලා කොහේද හිටියේ?

පි : ගෙදර හිටියේ.

ප්‍ර : ඒ කියන්නේ 2019 ජනවාරි ඉදලා සැප්තැම්බර් මාසේ වෙන කල් ගෙදරද හිටියේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට 2018 වර්ෂයෙත් ලංකාවේද හිටියේ?

පි : ඔව් ලංකාවේ හිටියේ.

ප්‍ර : එතකොට 2018 වර්ෂයේදී තමන්ගේ දුව ගැන හෙව්වේ නැද්ද?

පි : මම හෙව්වේ නැහැ එයා ඉන්නවා කියනවා කොහේ ඉන්නවද කියලා මම දන්නේ නැහැ, ඒ හින්දා මම හෙව්වේ නැහැ.

ප්‍ර : එතකොට දුවව හොයලා දෙන්න කියලා පොලීසියට පැමිණිල්ලක් කරන්නේ ඉස්සෙල්ලම කොයි කාලෙද?

පි : 2015.07.29 වෙනිදා තමයි පළමු වතාවට පැමිණිලි කළේ.

ප්‍ර : නැහැ ඒක නෙමෙයි මම ඇහුවේ, 2018 වර්ෂයේ නැත්නම් 2019 වර්ෂයේ දුවව හොයලා දෙන්න කියලා ඉස්සෙල්ලම පැමිණිල්ලක් පොලීසියට කරන්නේ කවදද?

පි : 2019 අප්‍රේල් මාසේ 07 වෙනිදා සිට මම ඇයව සොයනවා.

ප්‍ර : ඇයව සොයනවා නෙමෙයි පොලීසියට පැමිණිල්ලක් කලේ?

පි : අප්‍රේල් මාසේ 6 වෙනිදා නාරම්මල පොලීසියටත් පැමිණිල්ලක් කළා.

Parliament Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඇයි ඔව්වර කාලෙකට පස්සේ 2019 අප්‍රේල් 06 වෙනිදා පැමිණිල්ලක් පොලීසියට කෙරුවේ?

පි : ඇය දිගටම මගේ දුරකථනය සමඟ සම්බන්ධ වෙලා හිටියා. මාස 2 ක් තිස්සේ ඇය දුරකථනයෙන් කතා නොකල නිසා තමයි මම අප්‍රේල් මාසේ පැමිණිල්ල කලේ.

ප්‍ර : දැන් පොලීසියට පැමිණිල්ලක් කරන්න ඉස්සරවෙලා අබ්දුල් රාසික්ට කතා කරලා බැලුවේ නැද්ද?

පි : මම ඇහුවා අබ්දුල් රාසික්ගෙන්. නාරම්මල පොලීසියට පැමිණිලි කරන්න ඉස්සෙල්ලා අබ්දුල් රාසික්ට කතා කරලා මම ඇහුවා දුව කෝ කියලා.

ප්‍ර : කවද්ද ඇහුවේ?

පි : මම අබුඩාබි ඉන්න අවස්ථාවේදී දුව මා සමඟ කතා නොකර සිටීමෙන් පසු මාසයක් ඇතුළත මම ඔහුගේ Whatapp Number හොයාගෙන ඔහුට කතා කලා අබුඩාබියේ ඉදලා.

ප්‍ර : ඒ කියන්නේ 2019 මාර්තු මාසේ ඉන්නේ කොහොමද කියලා අහන්න, ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නෙට කිව්වේ 2019 ලංකාවේ හිටියා කියල නේ?

පි : 2019 අප්‍රේල් මාසේ තමයි මම ශ්‍රී ලංකාවට පැමිණියේ එතකල් මම හිටියේ අබුඩාබියේ තමයි.

ප්‍ර : මම ඉස්සෙල්ලා අහපු ප්‍රශ්නෙට කිව්වේ සැප්තැම්බර් මාසේ ගිහිල්ලා ජනවාරි මාසේ ආවා කියලා?

පි : මාස 2 ක් දුව මාත් එක්ක කතා නොකර සිටියා, ඒ අවස්ථාවේදී තමයි මම ඔහුට ඔහුගේ Whatapp Number අරගෙන දුරකථනයෙන් කතා කරලා දුව ගැන විපරම් කලේ.

ප්‍ර : ඒ කියන්නේ 2019 ජනවාරී මාසේ 01 වෙනිදා ඉදලා 2019 අප්‍රේල් මාසේ 6 වෙනිදා වෙන කල් පිටරටද හිටියේ?

පි : 2019 අප්‍රේල් මාසේ තමයි මම ලංකාවට ආවේ, එතකල් මම හිටියේ පිටරට.

ප්‍ර : එතකොට දැන් 2019 පෙබරවාරී 19 න් පස්සේ දුව ඇය සමඟ කතා කලේ නැහැ කියනවානේ?

පි : ඔව්.

ප්‍ර : දුවට කතා කෙරුවද කියලා අහන්න ටෙලිෆෝන් එකෙන්?

පි : ඇය නොකල හිටියායින් පස්සේ මම ගත්තා. නමුත් ස්විච් ඔෆ් වෙලා තිබුණා.

ප්‍ර : ටෙලිෆෝන් එක ස්විච් ඕෆ් කරලා තිබ්බේ?

පි : වැඩ කලේ නැහැ.

ප්‍ර : දැන් එතකොට ඒ වෙන කොට මෙයාගේ දෙමාපියෝ ලංකාවේ නේ හිටියේ කියලා අහන්න?

Proceedings Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව්.

ප්‍ර : එතකොට එහෙම දුරකථනයට දුව උත්තර දුන්නේ නැත්නම් ඇයි දෙමාපියන් මාර්ගයෙන් පොලීසියට පැමිණිල්ලක් කලේ නැත්තේ කියලා අහන්න?

පි : මම කිව්වා ඔවුන්ට පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් කරන්න කියලා. ඔවුන් කිව්වා අපිට ඒවා දන්නේ නැහැ ඔයා තමයි එන්න ඕනේ කියලා කිව්වා.

ප්‍ර : දැන් අර කිව්වානේ ඉස්සෙල්ලා දුව එක සැරයක් නැවත ගෙදර ආවා කියලා බැන්දායින් පස්සේ?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඊට පස්සේ දුව ආයි ආපහු ගියේ ඇයි කියලා දන්නවද?

පි : මම දන්නේ නැහැ ඇයි කියලා.

ප්‍ර : දුවත් එක්ක ටෙලිෆෝන් එකෙන් කතා කරන කොට ඇහුවේ නැද්ද?

පි : මම ඇහුවා. පිළිතුරක් දුන්නේ නැහැ. මම හැම අවස්ථාවේම කෝල් කරන අවස්ථාවේම ඒ ගැන අහනවා බනිනවා නමුත් එයා ඒකට උත්තරයක් දෙන්නේ නැහැ.

ප්‍ර : එතකොට ඒ කොයි අවස්ථාවකවත් එයාගේ ස්වාමි පුරුෂයා ගැන නරකක් කියලා තියෙනවද අහන්න හස්තුන් ගැන?

පි : ඔහු ගැන වැරැද්දක් කිව්වේ නැහැ, නමුත් ඔක්කොම rules වලට, නීත්‍යානුකූලව කටයුතු කරනවා කියන එක නම් කිව්වා. ෆාමසියේ වැඩ කරනවා rules අනුව තමයි වැඩ කරන්නේ කියලා කිව්වා. මට එළියට යන්න දෙන්නේ නැහැ ගෙදරට දාලා වහලා තියෙනවා කියලා එහෙම කිව්වා.

ප්‍ර : එතකොට දුරකථන ඇමතුම් ගත්තේ කොහොමද?

පි : ඇයට දුරකථනයෙන් කතා කිරීමට අවසර දීලා තිබුනා.

ප්‍ර : දැන් ඉස්සෙල්ලා ආරංචි වුණේ දුව මැරුණා කියලා නේද?

පි : ඔව්.

ප්‍ර : එතකොට ඊට පස්සේ තොරතුරක් ආවනේ දුව ජීවත්ව සිටිනවා කියලා?

පි : ඔව්.

ප්‍ර : එතකොට දුවව ඒ සම්බන්ධයෙන් හොයලා බැලුවද?

පි : මම කොහේ කියලා හොයන්නද කවුරු හරි ඇවිල්ලා මාගෙන් ප්‍රශ්න කරන කොට තමයි මම ඒ අයට කියන්නේ.

****

President Secretary's Copy
FAIR COMMENT
BY JEZEEM

<u>ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකාරිය තමුන්ගේ දුව හිතුවක්කාර කෙනෙක්ද?

පි : ඒ වගේ කෙනෙක් තමයි, එයාට මානසිකව හිටපු හැටියේ එයාට ෆිට්ස් හැදෙනවා. ඉස්පිරිතාලෙන් දීපු වාර්තා එහෙම තියෙනවා. වාර්තා තියෙනවා.

ප්‍ර : එයාට නිතර තරහා යන කෙනෙක්ද?

පි : නැත, සාමයෙන් තමයි මා එක්ක කතා කරන්නේ.

ප්‍ර : ගෙදර ඉන්දැද්දි තමුන්ටත් නීති රීති දාන්න ගියාද?

පි : මම වැඩි කාලයක් හිටියේ විදේශගතව. මාස 2, 3 ට තමයි මම නිවාඩුවට එන්නේ. ඒ කාලවලදී හොඳින් තමයි හිටියේ.

ප්‍ර : දැන් මේ හස්තූන් එක්ක විවාහ වුණා කියලා තමුන් දැනන් හිටියා නේද?

පි : ඔව්.

ප්‍ර : තමුන් ඇහුවේ නැද්ද ඇයි දරුවෝ හැදුවේ නැත්තේ කියලා?

පි : ඔව් මම ඇහුවා.

ප්‍ර : එතකොට මොකද කිව්වේ?

පි : සාමාන්‍යයෙන් එයාගේ මාස් ශුද්ධිය මාස 3 කට සැරයක් වගේ තමයි වෙන්නේ. හැම මාසෙම නියමිත දිනයේ වෙන්නේ නැහැ.

ප්‍ර : තමුන් 2019 අප්‍රේල් 06 වෙනිදා ඇයි හදිසියේ ලංකාවට ආවේ?

පි : එයා හැමදාම දිනකට කිහිප වාරයක්ම පැය 24 ඇතුළත කිහිප වාරයක්ම කෑවද, බිව්වද කියලා කතා කරනවා. මාස 2 ක් එයාගෙන් ඇමතුම් නැති නිසා තමයි මම ආවේ.

ප්‍ර : ඒ කියන්නේ තමුන් ආවේ එයාට මොකද වුනේ කියලා හොයන්නද?

පි : බැඳලා හිටියෙත් මුස්ලිම් කෙනෙක් කොහේ ගෙනිච්චාද දන්නේ නැහැ ළමයාව හොයා ගන්න ඕන කියන එකයි මගේ පරමාර්ථය.

ප්‍ර : දැන් තමුන් ලංකාවට ආවට පස්සේ ඔය තමුන්ගේ නෑදෑයොන්ගෙන් හරි, එහෙම නැත්නම් යාළුවන්ගෙන් හරි, අසල්වාසීන්ගෙන් හරි තමුන්ට දැන ගන්න හම්බ වුණාද මෙයා එහෙම මුස්ලිම් අන්තවාදී කටයුතුවලට පෙළඹිලා ඒ කටයුතුවල යෙදනවා කියන එක?

පි : නැහැ. මෙම සිද්ධිය සිදු වෙන කල් දැන ගන්න හම්බ වුණේ නැහැ.

ප්‍ර : තමුන්ට ඒක දැන් එයා එවැනි කටයුතුවල යෙදුනා කියන එක තමුන්ට දැන්වත් විශ්වාස කරන්න පුළුවන්ද?

පි : ඇය විශ්වාස කරනවාද නැද්ද කියන්න දන්නේ නැහැ. ඇය උප්පත්තියෙන් මුස්ලිම් නෙමෙයි. දෙමළ ගැනියෙක්. අද වනතුරු

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මම දන්නේ නැහැ නමුත් එයාව අල්ල ගත්ත දවසට දැන ගන්න පුළුවන්.

ප : අල්ල ගන්න එයා කොහේද ඉන්නේ කියලා තමුන්ට තියෙනවාද අදහසක්වත්?

පි : ස්ථානය දන්නේ නැහැ නමුත් ඇය ඉන්දියාවට පැන ගොස් ඉන්න විත්තිය News වලින් මම දැන ගත්තා. මගෙන් DNA පරීක්ෂණ 2 ක් සිදු කළ බවට ප්‍රවෘත්තියේ සඳහන් වුණා. නමුත් එක වතාවයි DNA පරීක්ෂාව සිදු කරලා තියෙන්නේ.

****

<u>ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා:</u>

ප : සාක්ෂිකාරිය තමන්ගේ දියණිය විවාහ වුණාට පස්සේ මුස්ලිම් ආගම ඇදැහැව්වද කියලා තමන් දන්නවද ?

පි : ඇයගේ ගෙදරටවත් මම ගිහිල්ලා නැහැ. ඇය මා සමඟ කතා කරන කොට හබායා ඉවත් කරලයි කතා කරන්නේ. ඔහු ආපු ගමන්ම හබායා දා ගන්නවා. මොන ආගම පිළිපදිනවද කියලා මම දන්නේ නැහැ.

ප : තමන්ලගේ ගෙදර ඇවිල්ලා ඉන්න දවස්වල මුස්ලිම් ආගමද..?

පි : නැත හින්දු ආගම තමයි ගෙදර ආපු දවසට.

ප : කෝවිලට ගියාද?

පි : ඔව්.

ප : දැන් අබ්දුල් රාසික් ලඟට මුල් අවස්ථාවේ ගිහිල්ලා කොච්චර කලක් හිටියද එයා ලඟ?

පි : අවුරුද්දක්, අවුරුදු 1 ½ ක් ඔහුගේ භාරකාරයේ, custody එකේ ඉදලා තියෙනවා.

ප : එතකොට විවාහ වෙන්න ඉස්සෙල්ලා අවුරුදු 1 ½ ක් හිටියද?

පි : ඔහු තමයි කියා හිටියේ මල්වානේ ඉන්නවා, කොළඹ දුව ඉන්නවා කිය කියා අවුරුද්දක් අවුරුදු 1 ½ ක් තියාගෙන හිටියා.

ප : එතකොට අවුරුදු 1 ½ ට පස්සේ තමයි විවාහ කර දුන්නේ ගෙන්නලා හස්තූන්ට?

පි : පළමු අවස්ථාවේ ගිහිල්ලා මුස්ලිම් ආගම වැළඳ ගත්තා. ඊට පස්සේ අපේ ගෙදර ආවා.

ප : ඔව් ඒක තමයි, මුස්ලිම් ආගම වැළඳගෙන ගිහිල්ලා ඒ කාලේ කොච්චර හිටියද?

පි : සතියක් පමණ.

ප : දෙවෙනි වරට ගියාම ඊට පස්සේ කොච්චර කලක් හිටියද?

පි : අවුරුද්දක් හෝ ඊට වැඩිය.

FAIR COMMENT — BY JEZEEM

ප්‍ර : තමන්ට කියන්න පුළුවන්ද ඇයි අබ්දුල් රාසික් තමන්ගේ දියණියව ගෙන්වා ගත්තේ?

පි : දෙමළ අයව ඉස්ලාම් ධර්මයට බඳවා ගැනීම ඔහුගේ අරමුණ වී තිබුණා.

ප්‍ර : දැන් තමන්ගේ දියණිය ගැන අබ්දුල් රාසික් දැන ගත්තේ කොහොමද?

පි : පළමු වතාවට මොහු ළඟට ගොස් තමයි අතුරුදහන් වුනේ කල්මුණේ ගිය අවස්ථාවේදී. ඔහු සමඟ මොනවද තිබුණු සම්බන්ධතාවය මම දන්නේ නැහැ.

****

<u>**ගරු බන්දුල අතපත්තු මැතිතුමා:**</u>

ප්‍ර : සාක්ෂිකාරිය දැන් ඔබට මාළිගාවත්තේදී ඉස්සෙල්ලාම අබ්දුල් රාසික් හම්බ වුනාම ඔබට හස්තූන්ව හඳුන්වලා දුන්නාද?

පි : නැහැ.

ප්‍ර : එහෙමනම් ඔබට කිව්වා නේද හස්තූන් කියන පුද්ගලයෙකුට දුවව විවාහ කර දෙනවා කියලා?

පි : දෙවෙනි අවස්ථාවේ තමයි එහෙම කියා සිටියේ.

ප්‍ර : ඔහු මොනවා කරන කෙනෙක්ද, රැකියාවක් කරන කෙනක් කියලාවත් කිව්වද, මොන විදියේ රැකියාවක් කරනවද කියලා?

පි : කිව්වේ නැහැ.

ප්‍ර : තමුන්වත් ඇහුවේ නැද්ද?

පි : ඔහුට අපි රැකියාවක් ලබා දෙනවා, කඩේක රැකියාවක් ලබා දෙනවා, නිවසේ කුළිය අපි දෙනවා, කෑමබීම් සඳහා වියදමත් අපි ගෙවනවා කියලා තමයි ඔහු කියා සිටියේ.

ප්‍ර : දැන් මීගමුවේ කටුවපිටිය පල්ලියේ බෝම්බ පිපිරීම ඔබට දැන ගන්න හම්බ වුනේ කවද්ද?

පි : 21 වෙනිදා News එකේ අහපු එක තමයි අපි Video එකෙන් බැලුවේ.

ප්‍ර : ඒකෙන් මේ හස්තූන් ඒකට සම්බන්ධයි කියලා කොහොමද දැන ගත්තේ?

පි : මම දන්න මුහුණක්. ඒ මුහුණෙන් තමයි හඳුනා ගත්තේ. නමත් කියලා තමයි දැම්මේ. අපිට බයක් ඇති වුණා මොහු Video එකේ ඉන්නවා, දරුවා ගැනත් කිසිම ආරංචියක් නැහැ කියලා අපිට බයක් හිතුනා.

ප්‍ර : දරුවා කියන්නේ තමන්ගේ දුව?

පි : ඔව්. මගේ දුව පේන්න නැහැ Video එකේ මොහු විතරයි ඉන්නේ ඒ නිසා බයක් ඇති වුණා.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දුව කොල් එකක් එහෙම දුන්නේ නැහැනේද?

පි : 2 වන මාසේ 19 න් පස්සේ මම කිසිම අවස්ථාවක කතා කරලා නැහැ. නමුත් කට්ටිය කියනවා මම දුව එක්ක කතා කලා කියලා මට කට්ටිය කියනවා. අසන්න ලැබුනා කට්ටිය කියනවා මම දුවත් එක්ක කතා කලයි කියලා.

ප්‍ර : දුවගේ වයස කොච්චරද?

පි : 24 යි.

ප්‍ර : ඔබලා දැන් ඇත්ත වශයෙන් ද්‍රවිඩ ජාතිකයෝ හැටියට කේන්ද්‍ර බලන ඒවා විශ්වාස කරනවද?

පි : ඔව් අපි ඒවා විශ්වාස කරනවා, මෙයා ඉන්නවද කියලා ගිහිල්ලා අපි බලනවා. නමුත් අපි එසේ බලන්න යෑමත් කවුදෝ කියලා ඒ ගැනත් හොයාගෙන එනවා මෙයාව ඔයාලා හොයනවා නේද කියලා.

ප්‍ර : ජීවත් වෙලා ඉන්නවදවත් කියලා දැන ගන්න බැරි වුණාද?

පි : නිශ්චිත වශයෙන් කියන්න බැහැ, නමුත් News වල දුව ඉන්නවා කියලා දැන ගන්න ලැබෙනවා.

දැන් වේලාව : ප.ව. 3.55 යි

මෙතැන් සිට ල/ලේ :- සචිනි මෙනවිය විසින්ය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව. 03.55
පෙර සටහන්:ධම්මිකා මිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: කවීදා මහත්මිය ඔබ සහ ඔබගේ දියණිය ඉතාමත්ම හින්දු ආගමට ලැදි බැතිමතුන්ද?

උ: මං එක්ක ඉන්නැද්දිත් පූජාවට අයිති ඔක්කොම මාල ඒවා මේවා ඔක්කෝම ගෙනියනවා.

ප්‍ර: පුජාව සාමන්‍යයෙන් හැමදාම තියෙනවද ඔබලාගේ හින්දු කෝවිලේ සිකුරාදාටද තියෙන්නේ?

පි: දිනපතාම පූජාව තියෙනවා. සිකුරාදා වල විශේෂ පූජා තියෙනවා.

ප්‍ර: එතකොට ඔබගේ දියණිය ඔබත් සමඟ නිවසේ සිටින කොට හැමදාම හින්දු කෝවිලට යනවද නැත්නම් සිකුරාදා තියෙන විශේෂ දේව මෙහෙයට යනවද?

පි: අපි සිකුරාදා තමයි පාරිශුද්ධව ඉන්නේ නිවසේ අනෙක් දවස්වල මස් මාළු කන නිසා කෝවිලට යන්නේ නැහැ.

ප්‍ර: දැන් ඔබ මෙම කොමිෂම හමුවේ කිව්වානේ ඔය අබ්දුල් රාසික් කියන එක්කෙනා ඔබගේ දියණියව බලයෙන් ඉස්ලාම් ආගමට හැරෙව්වා කියලා?

පි: ඔව් .ඒක සහතිකයි ඔහුගේ පා අල්ලලත් මම වැඳලා ඉල්ලුවා.

ප්‍ර: එතකොට දැන් ඔබ ඒ වගේම මෙම කොමිෂම හමුවේ කියා සිටියා 2015 වසරේ ඔබ පළමු වරට අබ්දුල් රාසික්ගේ මාළිගාවත්ත කාර්යාලයට ගියාම ඔබගේ දියණිය ඔබ ඉදිරියේදී හිස් වැසුම ගලවන්න උත්සහා කලත් අබ්දුල් රාසික් එබී බලනකොට ඇය බය වී හිස් වැසුම දාගත්තා කියලා?

උ: සතියක්ම ඔහු ළඟ තමයි දුව හිටියේ දවස් 06 කින් brain wash කරන්න ඇති ඒ නිසායි ඇය එහෙම.

ප්‍ර: බලහත්කාරයෙන් එය කරා කියලත් කිව්වා නේද?

උ: මම දන්නවා හොඳටම බලහත්කාරයෙන් තමයි ආගම වෙනස් කළේ කියලා .

ප්‍ර: ඔබට කියන්නට පුළුවන් ද ශ්‍රී ලංකාවේ හින්දු බැතිමතියක් ලෙස සහ හින්දු පවුලක සාමාජිකයන් ලෙස ඔබලාට ඔබලාගේ ආගම නිදහසේ ඇදහීමට තිබිච්ච අයිතිය අබ්දුල් රාසික් විසින් බලහත්කාරයෙන් නැති කර දැමුවා කියලා ඔබට සිතෙනවද?

උ: ඔවුන් නිසා තමයි මේ වගේ සිද්ධීන් අපිට ඇති වුණේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ වගේම ඔබ ප්‍රකාශ කරා අබ්දුල් රාසික් දුටුවාම ඔබගේ දියණිය අර කලු රෙද්දෙන් සම්පූර්ණයෙන් හිස වසා ගන්නට හදනවා කියලා?

උ: ඔහු සමඟ ඉන්නැද්දි වහගන තමයි හිටියේ. මම අයින් කරන්න හැදුවත් ඔහුව දැක්කාම .

ප්‍ර: ඔහු ඒක අයින් කරන්න දුන්නේ නැහැ කියලා තමයි එයා කියන්නේ?

උ: ඔහු ගලවන්න දුන්නේ නැහැ ඔහු බැලුවාම වෙනස් වෙනවා ඇයි dress එක ගලවන්නේ කියන්නේ ඇයගේ කැමැත්තෙන් එයා දාගෙන ඉන්නවා. ඒ වගේ ඔහු කියනවා.

ප්‍ර: ඔබට කියන්නට පුළුවන්ද මේ අබ්දුල් රාසික් ඔබගේ දියණියට එම කලු හිස් වැසුම ඇඳ ගැනීමට කිසියම් ආකාරයකින් භයකරා හෝ කිසියම් ආකාරයකින් බලපෑම්කරා කියලා ඔහු?

උ: ඒක ඇත්ත එහෙම කරලා තියෙනවා.

ප්‍ර: දැන් මම ඔබගෙන් තවත් ප්‍රශ්නයක් අහනවා කවීදා මහත්මිය 2015 ඉස්සෙල්ලාම ඔබගේ දියණිය නැතිවුණ අවස්ථාවේදී මාළිගා වත්තේ අබ්දුල් රාසික්ගේ කාර්යාලයට ආවානේ?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ ගියානේ මාළිගාවත්තේ පොලීසියට?

උ: ඔව් .

ප්‍ර: එතකොට අබ්දුල් රාසික් මහත්තයයි එයාගේ අර Office එකේ කට්ටියයි පොලීසියට ආවාද?

උ: යතුරු පැදි දෙකකින් කට්ටිය ආවා.

ප්‍ර: අර කාන්තාවෝ කලු ඇදගෙන හිටපු කාන්තාවෝ දෙන්නත් ආවද?

උ: එක්කෙනෙක් ආවා.

ප්‍ර: දැන් කවීදා මහත්මිය පොලීසියට ගිහිල්ලා ඉස්සෙල්ලාම පොලීසියට කතා කරේ කවුද? පොලීසියේ ස්ථානාධිපති හරි කවුරු හරි හම්බවෙලා ඉස්සෙල්ලාම කතා කළේ කවුද?

උ: නැන්දාම්මට සිංහල දන්නවා එයා තමයි කතා කළේ.

ප්‍ර: කාටද කතා කළේ එයා පොලීසියේ?

උ: මම දන්නේ නැහැ කවුද කියලා ඒ හිටපු කාන්තා පොලීසියත් එක්ක කතා කරා.

ප්‍ර: මොනවද දැන් කවීදගේ මල්ලිගේ නැද්දම්මා පොලීසියට මොනවද කිව්වේ?

උ: මේ අපේ දුවව ගෙදරට එක්කන් යන්න තමයි අපි උත්සාහ කළේ .

ප්‍ර: ඉතිං පොලීසිය ඇහුවද දැන් මේ දුව මෙහෙම දැන් කවුද අරන් ඇවිල්ලා තියෙන්නේ මේ දුවට මොකද්ද දැන් ඔබ කියනවනේ දුව අරගෙන යන්නයි අපි ආවේ කියලා. පොලීසියෙන් ඇහුවද දුවව කවුද අරගෙන ඇවිල්ලා තියෙන්නේ කියලා?

FAIR COMMENT BY JEZEEM

උ: ඇහුවේ නැහැ අපි හිතුවා යම්කිසි සම්බන්ධතාවයක් රාසික්ට ඇති කියලා මේ සම්බන්ධයෙන්.

ප්‍ර: මේ ළමයාව අනේ එන්න.එතකොට දැන් රාසික් කියන එක්කෙනා පොලිසියට ඇවිල්ලා මොනව හරි කිව්ව ද?

උ: පොලීසියට ඇවිල්ලා කතා කරා ඔහු මොනවද පොලීසියට කිව්වේ කියන එක මතක නැහැ. දන්නේ නැහැ කියන්න.

ප්‍ර: ඔහු පොලීසියේ ගොඩක් වෙලා කතා කරාද කියලා අහන්නකෝ කාත් එක්ක හරි?

උ: අපි එළියේ වාඩිවෙලා හිටියේ. ඔහු තමයි ඇතුළට වෙලා පොලීසියේ ගොඩක් වෙලා කතා කර කර හිටියේ ඇතුළේ.

ප්‍ර: දැන් ඔබලාගෙන් පොලීසිය ඇහුව ද මේ අබ්දුල් රාසික් කවුද කියලා?

උ: පොලීසියෙන් ඇහුවේ නැහැ. මෙම ළමයා අබ්දුල් රාසික් ළඟට යම්කිසි විදියකින් ඇවිල්ලා තියෙනවා. ඒක නැවත දුව ලබාදෙන ලෙස තමයි අපි පොලීසියෙන් ඉල්ලා සිටියේ.

ප්‍ර: එතකොට පොලීසිය මොකද කිව්වේ?

උ: එම ළමයාට වයස අවුරුදු 18 යි. ඒ ළමයා කියන එක තමයි අපිට අහන්න වෙලා තියෙන්නේ කියලා පොලීසියෙන් කියා හිටියා.

ප්‍ර: එතකොට ඔබගේ දුව මොකද කිව්වේ කියලා දන්නවද?

උ: එන්න බැහැයි කිව්වා. පස්සේ ගොඩක් වෙලා උත්සාහ කරාට පස්සේ තමයි එන්නම් කියලා කිව්වේ. මම තමයි අත්සන් කරලා අරන් ගියේ.

ප්‍ර: කොහේද අත්සන් කළේ?

උ: දින 15 පස්සේ ආයි භාර දෙන්න ඕන කියලා අත්සන් ගත්තා entry Copy.

ප්‍ර: දින 15 පස්සේ කාට භාර දෙන්න කියල ද මෙයාගෙන් අත්සන ගත්තේ පොලීසිය?

උ: පොලීසියට ඇවිල්ලා භාර දෙන්න ඕන. පොලීසිය විසින් රාසික්ට භාර දෙන බව තමයි කිව්වේ.

ප්‍ර: දැන් ඔබ ඇහුවේ නැද්ද මගේ දුවව මං මොකටද රාසික්ට භාර දෙන්නේ කියලා?

උ: ඔව් ඇහුවා.

ප්‍ර: එතකොට මොකද කිව්වේ?

උ: මෙම ළමයා සියළු දේ ඉගෙන ගෙන දැන් ආගම වෙනස් කරගෙන තියෙන්නේත් දැන් අපිටයි මේ ළමයා අයිති කියලා රාසික් කිව්වා.

ප්‍ර: රාසික් ඒක කිව්වේ පොලීසියට නැත්නම් ඔබට ද?

උ: පොලීසිය ඉදිරියේ අපිත් ඉන්න අවස්ථාවේ තමයි ඔහු කිව්වේ. මේ ළමයා දැන් ශුද්ධ මුස්ලිම් පරිශුද්ධ මුස්ලිම් කෙනෙක් එයා ආගම වෙනස් කරගෙනයි ඉන්නේ. එයා එහෙම කිව්වා.දින 15 ඇතුළත භාරදුන්නේ නැත්නම් අපි නීත්‍යානුකූලව කටයුතු කරනවා කියලත් කිව්වා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කවුද කිව්වේ පොලීසිය ද කිව්වේ නීත්‍යානුකූලව කටයුතු කරනවා කියලා?

උ: පොලීසිය ඉදිරියේ දී රාසික් කිව්වේ.

ප්‍ර: ගෙනැත් දුන්නේ නැත්නම් දවස් 15 කින් නීතියෙන් කටයුතු කරලා ළමයව ගන්නවා කියලා?

උ: ඔව්.

ප්‍ර: දැන් ඔබ ඔය කියන දේවල් පොලීසියේ නිලධාරීයෙක් ලියාගත්ත ද සටහන් පොතක?

උ: ඔව් සියළු දේ ලියලා අවසානයේ දී ළමයව දින 15 කට මවට භාර දෙන්න කියලා තමයි මට භාර දුන්නේ.

ප්‍ර: ඊට පස්සේ එකේ ලිව්ව ද දින 15 න් පස්සේ ආපහු ගෙනැල්ලා අබ්දුල් රාසික්ට භාර දෙනවයි කියලා?

උ: ඔව්. ඒ ළමයා හින්දු ආගම අනුව හිටියොත් එහෙ තියාගන්න. එහෙම නැතුව මුස්ලිම් ආගම අනුගමනය කරන්න කියලා කරදර කරොත් ඔයාලට විරුද්ධව අපි නීත්‍යානුකූලව කටයුතු කරනවා කියලා කිව්වා.

ප්‍ර: කවුද කිව්වේ එහෙම කටයුතු කරනවා කියලා?

උ: රාසික් තමයි පොලීසිය ඉදිරියේ දී කිව්වේ.

ප්‍ර: එතකොට දැන් මේ ළමයගේ අම්මනේ කවීදා අම්මනේ ළමයගේ. එතකොට කිව්වේ නැද්ද මේ ළමයාගේ ආගම නෙවෙයි ප්‍රශ්නේ. මේ ළමයා මගේ ළමයා. මට මේ ළමයා අයිති කියලා කිව්වේ නැද්ද ඔබ ?

උ: මම හොඳටම පොලීසියේ එක්කෙනක්ටත් කියලා වාද කරා. පොලීසිය මට කිසිම සහායක් දැක්වුයේ නැහැ. නීතිය එහෙම නම් මම මොනව කරන්නද.

ප්‍ර: ඒ පොලීසියේ හිටපු මහත්වරුන් සිංහල ද දෙමළ ද මුස්ලිම් ද?

උ: සියළු දෙනාම කතා කළේ සිංහලෙන් තමයි.

ප්‍ර: දැන් ඔබ අත්සන් කරා කිව්වනේ ඒ ළමයව ආපහු ගෙනැත් දෙන්නවා කියලා දවස් 15 කින් පස්සේ කියලා. එයා ඉස්ලාම් ආගම අදහනව නම් ඒ අත්සන් කරපු කොළ ඔබ කියෙව්වනේ. පිටු කියක් අත්සන් කරාද කියවලා?

උ: 2, 3 ක් වෙන්න ඇති මම දෙතුන් වතාවක්

ප්‍ර: ඔබ ඒක කියවලද අත්සන් කළේ?

උ: නැහැ සිංහලෙන් ලියලා තිබ්බෙ.

ප්‍ර: ඔබට පිටපතක් ඉල්ලුව ද ඒකෙන්?

උ: මම ඉල්ලුවේ නැහැ.

ප්‍ර: ඔබට ඒ ඉල්ලුවහම ඔබගේ ඒ පැමිණිල්ලේ අංකයක් ලියලා කොළයක් දුන්න ද පොලීසියෙන්?

උ: දුන්නේ නැහැ.

ප්‍ර: අංකය දුන්න ද ඒ පැමිණිල්ලේ අංකය?

FAIR COMMENT
BY JEZEEM

උ: මං ළඟ නැහැ ඒක මගේ අතින් මිස් වුණා ඒක. මට මතක නැහැ.

ප්‍ර: දැන් කවීදා මහත්මිය දැන් 2015 ඉඳලා ඔබගේ දුවව මෙහෙම සඟවාගෙන ඉන්නවනේ මේ අබ්දුල් රාසික් කියන ශ්‍රී ලංකා තවුහිද් ජමාත් පුද්ගලයා. ඔබට හිතෙනව ද දැන් මේ මෑත කාලයේදීත් ඔබගේ දුව තාම ජීවතුන් අතර ඉන්නවා කියන නිසා තවමත් මේ අබ්දුල් රාසික් ඔබගේ දුව කොහෝ හරි හංගගෙන ඉන්නවා කියලා?

උ: ඔව් එහෙම වෙන්නත් පුළුවන්.

ප්‍ර: දැන් ඔබට එහෙම හිතෙනව නම් අපිට තව ටිකක් කියන්නකෝ. මොනවද ඒ හිතෙන්නේ. අබ්දුල් රාසික් ළඟ ඉන්නවා කියලා ඔබට හිතෙනවා නම් මොනවද ඒ ඔබට හිතෙන්නට තියෙන තව කරුණු මොනව හරි තියෙනව නම් කියන්න අපිට.

උ: මම තොරතුරු වශයෙන් දන්නේ නැහැ. ඔහුගේ ආගමේ තමයි ඇය හිටියේ. කලිනුත් හිටියා. ඒ නිසා ඔහු ළඟ ඉන්න පුළුවන් කියලා මට එහෙම සැකයක් තියෙනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අති උතුම් මැල්කන් කාදිනල් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයාට අවශ්‍ය දැයි විමසමි. අවශ්‍ය නොමැති බව දන්වයි.

කොමිෂන් සභාව වෙත පැමිණ සාක්ෂි ලබාදීමෙන් කොමිෂන් සභාවට දැක්වූ සහායෝගය සම්බන්ධයන් සාක්ෂිකාරියට ස්තූති කරමි. සාක්ෂිකාරියට හිමි විය යුතු දීමනා නීතියට අනුව හිමි විය යුතු දීමනා සාක්ෂිකාරියට ලබාදෙන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

එසේම 2015 අංක 04 දරණ සාක්ෂිකරුවන් සහ වින්දිතයන්හට සහාය ලබාදීම සහ ආරක්ෂා කිරීමේ පනතේ 25 (04) වගන්තිය ප්‍රකාරව සාක්ෂිකාරියට හිමිවිය යුතු සියළු අයිතීන් සහ වරප්‍රසාදයන් ඇයට ලබාදෙන ලෙසට සාක්ෂිකරුවන් සහ වින්දිතයන් හට සහාය ලබා දීමේ සහ පහසුකම් සැලසීමේ ජාතික අධිකාරිය වෙත නියෝග කරමි.

උ: මගේ දුවව මම 2019 පෙබරවාරී 19 යින් පස්සේ දැකලවත් නැහැ. කතා කරලත් නැහැ. නමුත් කට්ටිය කියනවා අපි කතා කරනවා දැකලා තියෙනවා කියලා. ඒක අමූලික බොරුවක් . මම දිවුරා කියනවා මම ඒ දිනයෙන් පස්සේ කතා කරලා නැහැ. දැකලත් නැහැ කියලා. ජීවතුන් අතර ඉන්නව නම් ඇයව පණ පිටින් අල්ලලා ඇය වරදක් කරලා තියෙනව නම් එයාට දඬුවමක් කරන්න ඕන. නැත්නම් මේ සමාජයෙන් මාව කොන් කරලා තියෙනවා. මට නෑදයින්ගේ ගෙවල් වලට යන්න

FAIR COMMENT BY JEZEEM

බැහැ. කොවිල් වලට යන්න බැහැ කිසිම තැනක යන්න බැරුව මම දුක් විඳිනවා. Media එකේ අය කියනවා මගේ දුව කිලෝ 05 බර ඇති බෝම්බයක් අරගෙන ගියා කියලා. මගේ DNA සඳහා දෙවතාවක් ලේ ගත්තා කියනවා. එම news එක ඔක්කෝම ෆෝන් එකෙන් අරන් තියෙනවා. ඒවායේ ගොඩාක් බොරු තියෙනවා. මේ සම්බන්ධයෙන් දේව කුමාර් බාප්පව අත්අඩංගුවට අරගෙන තියෙනවා කියලා මාධ්‍යයෙන් ප්‍රචාරය වෙනවා. ඔවුන්ගේ පවුල්වල අය මට සාප කරනවා. වැලි විසිකරමින්. මේ සිද්ධියෙන් පස්සේ අල්ලපු ගෙදර අයත් මා සමඟ රණ්ඩු වෙනවා. ගමේ අයත් රණ්ඩු වෙනවා. කට්ටිය ඇවිල්ලා කියනවා මං ළඟ බෝම්බ තියෙනවා කියලා. වත්තේ බෝම්බ තියලා අපි දැනුම් දෙනවා නිවසේ බෝම්බ තියෙනවා කියලා බය කරනවා තර්ජනය කරනවා. බස් එකක යන්න බෑ. මාකට් එකට යන්න බැහැ මාව දැක්කාම මේ එන්නේ බෝම්බකාරියගේ අම්මා කියලා සමච්චලයට පත් කරනවා. සහරාන්ගේ wife ෆාතිමා කියනවා මේ සිද්ධිය වෙන අවස්ථාවේ සයින්දමර්දුහි මගේ දුව එම නිවස තුල හිටියා කියලා. ඒ නිසා තව සැරයක් DNA පරීක්ෂාව කරන්න. සහරාන්ගේ wife ෆාතිමා මේ සියළුම විස්තර දන්නවා. එයාගෙන් විස්තර දැනගන්න පුළුවන්. 2019 පෙබරවාරී 19 පස්සේ මා එක්ක මගේ දුව කතා කරලා නැහැ . මම මෙම සිද්ධි වෙනකම් මගේ දුව ඉඳලා තියෙන්නේ සහරාන්ගේ wife එක්ක බිරිඳත් එක්ක. ඒ නිසා එයා විස්තර දන්නවා. මේ සිද්ධි වෙනකම් මෙම සහරාන්ගේ wife ෆාතිමා ඇයගේ අම්මා සමඟ දුරකථනයෙන් කතා කරලා තියෙනවා. නමුත් මගේ දුවට එවැනි අවස්ථාවක් හිමි වෙලත් නැහැ. මගේ දුව ජීවතුන් අතරේ ඉඳලා අල්ලනකම් සහරාන්ගේ wife එළියට දාන්න හොඳ නැහැ. සමහර විට සල්ලි වියදම් කරලා එළිට යන්න ඉඩ තියෙනවා. මට මෙම සාක්ෂිය නිසා මේ අනතුර තියන එක මම දන්නවා. ඔබලා තමයි මට ආරක්ෂාව ලබාදිය යුතු. මගේ ස්වාමී පුරුෂයා මිය ගියාට පස්සේ දරුවන් දෙදෙනා තියලා රට ගිහිල්ලා මහන්සි වෙලා හදාගත්තා. නමුත් මෙම අබ්දුල් රාසික් මගේ දුව එක්කගෙන ගිහිල්ලා මට මේවගේ අකරතැබ්බයකට පත්කරලා තිබෙනවා. News වලනම් එනවා දුව අරෙහේ ඉන්නවා මෙහේ ඉන්නවා මාව හම්බුවෙනවා මට කතා කරනවා මම දැනගත්තොත් අනිවාර්යෙන්ම දිවුරලා කියනවා මම ඇවිල්ලා භාර දෙනවා නැත්නම් දැනුම් දෙනවා මේ කොමිෂමට. මම විතරයි මගේ දරුවා වෙනුවෙන් සාක්ෂි දීමට ඉන්නේ. මාව ආරක්ෂා කිරීම ඔබලාගේ යුතුකමක්. රාත්‍රියේ මට නිදාගන්නත් නැහැ. මට මොනව හරි අනතුරක් කරයි කියලා හිතෙනවා. මගේ ගේ ඉදිරිපිට වාසය කරන ගේ අයිතිකරුට සල්ලි තියෙනවා. මේ පොලීසියේ බලතල තියෙනවා මම කොහොම හරි ඔයාව මරලා දානව කියලා මගේ ගේ ඉදිරිපිට ඉන්න මනුස්සයා නිතර

FAIR COMMENT
BY JEZEEM

කියනවා. මං වගේ වෙන කිසිම මවෙකුට අකරතැබ්බයක් සිද්ධ නොවෙන්න ඕන. එයා ඉගෙනගෙන දොස්තර කෙනෙක් වෙයි කියලා මම නොයෙකුත් අවස්ථා වල සල්ලි දැම්මා බැංකුවට නමුත් ඒකෙනුත් ප්‍රයෝජනයක් ඇති වුණේ නැහැ. නාරම්වල ගෙයක් හදලා තියෙනවා ඒ ගේ හදන්න මම තමයි සල්ලි දීලා තියෙන්නේ. මට ඒ ගේත් එපා මුකුත් එපා මගේ ළමයව හොයාගන්න. මම පිටරට වළං හෝදලා ග්ලාස් හොඳලා තමයි මේ සල්ලි හම්බ කළේ. සමහර අය කියනවා අන්තවාදීන්ගෙන් මට සල්ලි ලැබුණා කියලා. එහෙම ලැබුණේ නැහැ. මගේ දුවව ඉතා ඉක්මනින් හොයාගන්න. එහෙම හොයා ගත්තම එයාගේ මුණ හරි පෙන්වන්න. ඇයට හිමි දඩුවම ලබාදෙන්න . නමුත් එයාගේ මුණ මට පොඩ්ඩක් පෙන්වන්න. කොයි වෙලේත් පොලීසියෙන් CID එකෙන් ඇවිල්ලා දුව ආවලු කතා කරාලු අල්ලපු ගෙදර අය දැක්ක කියලා කොයි වෙලෙත් ඇවිල්ලා කරදර කරනවා. ඒක නවත්වලා දෙන්න. ස්වාමී පුරුෂයත් නැහැ දරුවෙකුත් නැහැ එයා ඉන්නව ද නැද්ද කියලත් දන්නෙ නැහැ. සහරාන් මේ මාස දෙකක් ඇතුළත එයා ඉඳලා තියෙන්නේ සහරාන්ගේ wife සමඟ. සහරාන්ගේ wife දන්නවා. මේ දරුවට මොනව ද වුණේ කියලා. එයාගෙන් දැනගන්න. 2019 පෙබරවාරී 19 ඉඳලා සිද්ධි වෙනකම් ඇය ඉඳලා තියෙන්නේ සහරාන් එක්ක. සමහර විට මරලා දාලා ඇති. නැත්නම් කොහේ හරි යන්න දීලා යන්න ඇති. සහරාන්ගේ wife සියළුම කටයුතු දන්නවා. එයාගෙන් තොරතුරු දැනගන්න. කට්ටිය කියනවා මම දුවව හංගලා තියාගෙන ඉන්නවා කියලා. නමුත් එයාගේ කටහඬ පවා මට ඇසුණේ නැහැ. ඔයාලා හොයා ගන්න දුවව. ඔය කොහේද ඉන්නවයි කියලා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකාරිය විසින් ඉහතින් කරන ලද ප්‍රකාශය සාක්ෂි කූඩුවේ සිට හඬමින් සංවේදීව කරන ප්‍රකාශයක් බව සටහන් කර තබමි. ඊට අමතරව මෙම සාක්ෂිකාරියගේ සාක්ෂිය මුල සිටම අවසාන වන තෙක් ඇයගෙන් ප්‍රශ්න අසන ලද්දේ සිංහල භාෂාවෙන් බවත් එයට ඇය දමිළ භාෂාවෙන් පිළිතුරු දුන් බවත් එය සිංහලයට පරිවර්තනය කර බවත් සටහන් කර තබමි. පරිවර්තනය කෙරුවේ කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක බවත් සඳහන් කර තබමි. මාධ්‍යයෙන් ඉල්ලීමක් කරනවා ඇගෙන් ප්‍රශ්නයක් අසනු ලැබුවා දැන් ඇගේ දුව කාගේ භාරයේ ද ඉන්නේ කියලා එක් අබ්දුල් රාසික්ගේ නම සඳහන් කෙරුවා. එම ප්‍රශ්නයයි ඊට ලැබුණු පිළිතුරයි ප්‍රසිද්ධ නොකරන ලෙසට මාධ්‍යයෙන් ඉල්ලීමක් කරනවා. ඇගේ ආරක්ෂාව සඳහා. ඊට අමතරව දැනටමත් මෙම කොමිෂන් සභාවේ විසින්

FAIR COMMENT BY JEZEEM

කරන ලද නියෝගයට අනුව ඇයට ලබාදෙන ආරක්ෂාව සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් හා වින්දිතයන්හට සහාය ලබාදීමේ සහ ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් සතියක් ඇතුළත ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග ලිඛිතව කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු බවද නියෝග කරමි. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

වේලාව:ප.ව. 04.30

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශයේ නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT
BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදුවූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශණය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය - 2020-07-27 වේලාව- ප. ව. 01.05

සටහන් කලේ යමුනා දසනායක විසිනි.

ගරු විනිසුරු මඩුල්ල -

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් දසිල්වා මැතිතුමා - සභාපති.

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා. -සාමාජික

03. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා. - සාමාජික

04. හිටපු ගරු අභියාචනාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05 හිටපු අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව් . එම්. එම්. ආර් අදිකාරි මහත්මිය - සාමාජික

පෙනී සිටීම

අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය. , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය , රජයේ අධිනීතිඥ නිමේෂාද අල්විස් මෙනවිය , රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර ,රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ සහ රජයේ අධිනීතිඥ අරීන්ද්‍ර ජයසිංහ පෙනී සිටි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ගේ ඉල්ලීම සලකාබැලු මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නිති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ෂමිල් පෙරේරා මහතා, නීතීඥ දුනික පෙරේරා මහතා සහ නීතිඥ ගිම්හානි ගමගේ මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදි පෙනී සිටීමට අවසර ලබා දෙන ලදි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නම - හේරත් මුදියන්සේලාගේ බුවනෙක පද්මකුමාර හේරත්
වයස - අවු 53.
ජාතිය - සිංහල
ආගම - බුද්ධාගම
තනතුර- ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම්.
ප්‍රතිඥා වෙයි.

<u>අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන මෙනවිය.</u>

ප්‍ර හේරත් මහත්මයා මෙම ගරු කොමිෂන් සභාව වෙත මෙතෙක් ඉදිරිපත් වී ඇති සාක්ෂි ප්‍රකාරව අද දින එනම් 2020 ජුලි මස 27 වෙනි දින සිට ඉදිරියට පවත්වනු ලබන සාක්ෂි විභාග කිරීමේදී තමන් වෙනුවෙන් මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ නීතිඥ නියෝජනයක් ඉදිරිපත් කරමින් පෙනී සිටීමේ අයිතිවාසිකම ඔවුන්ට ඇති බව දන්වමින් මෙම ගරු කොමිෂන් සභාවේ අණ පරිදි ඔවුන් විසින් පුද්ගලයින් කී දෙනෙක් වෙත නොතීසි යවා තිබෙනවාද?

උ ස්වාමීනි 15 දෙනෙක් විතර යවා තිබෙනවා.

ප්‍ර ඒ අයගේ නම් කරුණාකරලා සඳහන් කරන්න ?

උ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා
හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා.
රුවන් විජේවර්ධන මැතිතුමා.
සාගල රත්නායක මැතිතුමා.
රංජිත් මද්දුම බංඩාර මැතිතුමා.
හේමසිරි ප්‍රනාන්දු මහතා
කපිල වෛද්‍යරත්න මහතා.
කරුණාසේන හෙට්ටිආරච්චි මහතා.
පුජිත් ජයසුන්දර මහතා.
සිසිර මෙන්ඩිස් මහතා.
නාලක ද සිල්වා මහතා.
චූලා කොඩිතුවක්කු මහතා
රවි සෙනවිරත්න මහතා.
ශානි අබේසේකර මහතා.

ස්වාමීනි මම ඉස්සෙල්ලා 15 ක් කිව්වා ඒක 14 ක් ලෙස නිවැරදි විය යුතුයි.

ප්‍ර එම තැනැත්තත් විෂයෙහි කොමිෂන් සභාව විසින් එම නොතීසිය නිකුත් කොට ඇත්තේ කොමිෂන් සභා පනතේ කුමන වගන්තිය යටතේද ?

උ 16 වෙනි වගන්තිය යටතේ .

FAIR COMMENT BY JEZEEM
President's Secretary's Copy

ප්‍ර එකී වගන්තිය යටතේ නොතිසි නිකුත් කරමින් ඔවුන් වෙත නොතීසි ලබා දීම සඳහා ඔබ ක්‍රියා කර ඇත්තේ කුමන ආකාරයටද ?

උ ස්වාමීනි මේ නොතීසි ක්‍රම දෙකක් මාර්ගයෙන් යැව්වා . කොළඹ නගරයේ පදිංචි කට්ටියට අපි අපේ ලිපිකරුවෙක් මඟින් අපි අතින් ගිහින් බාරදුන්නා . ඒ වගේම දුර බැහැර පදිංචි කට්ටියට සීඝ්‍රගාමී තැපැල් ඔස්සේ තමයි යොමු කලේ.

ප්‍ර එසේ නම් ඔබ කිව්ව ආකාරයට කොළඹ ප්‍රදේශයේ පදිංචි තැනැත්තන්ට අතින් බාර දුන්නා නම් ඒ බාරදුන් පුද්ගලයින් කව්ද ඔවුන් වෙත සැබැවින්ම එම නොතිසිය ලැබී තිබුනේද යන්න සනාථ කිරීම සඳහා ඔබට යම් සාක්ෂියක් ඉදිරිපත් කරන්න පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට ?

උ ඉදිරිපත් කල හැකියි ස්වාමීනි.

ප්‍ර එහෙමනම් කියන්න කාටද බාරදීලා තියෙන්නේ, මොකක්ද ඔබට තියෙන සාක්ෂිය, එය සනාථ කරන්නට ?

උ අතින් බාර දුන් ලේඛණයේ ගරු මෛත්‍රී පාල සිරිසේන මැතිතුමා වෙනුවෙන් බාර අරන් තියෙනවා ආරක්ෂක අංශයේ ඩබ්. පී. සී. 9679 හේරත් දරන නිළධාරියා.

ප්‍ර කුමන ලේඛණයක් ආශ්‍රයෙන්ද ඔබ ඔය කරුණු මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්නේ?

උ අපේ කොමිෂන් සභා කාර්යාලයේ තියෙන ලිපි අතින් බාරදීමේ ලේඛණය .

ප්‍ර ඔබ ලඟ තිබෙන ලිපි බාරදීමේ එම ලේඛණය කවදා සිට මෙම කොමිෂන් සභාවේ භාවිතා වන ලේඛණයක්ද ?

උ ස්වාමීනි 2019/10/02 වෙනිදා සිට භාවිතා වන පොත තමයි මගේ අතේ දැන් තියෙන්නේ.

ප්‍ර ඔබ සඳහන් කරා එවකට ගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ඔහු විෂයෙහි නිකුත් කරන ලද නොතීසිය බාරදී තිබෙන බව ? එය කවදාදා බාරදීලා තිබෙන්නේ?

උ ඒක 2020/07/18 දිනේ තමයි බාරදීලා තියෙන්නේ.

ප්‍ර කව්ද ඒක බාර අරගෙන තිබෙන්නේ ?

උ ඩබ්. පී.සී හේරත් කියන නිළධාරියා තමයි බාර අරගෙන තියෙන්නේ.

ස්වාමීනි මෙම ලේඛණය ලිපි ගොනු බාරදීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ නඩත්තු කරන එම ලේඛණය C. 957 ලෙසත් එකී සටහන C. 957 A ලෙසත් ලකුණු කොට ඉදිරිපත් කරනවා .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර මීලඟට ඔබ කාටද ලේඛණ බාරදීමට කටයුතු කරලා තියෙන්නේ ?

උ හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙනුවෙන් බාර අරන් තියෙනවා.

ප්‍ර එතුමාට බාරදීලා තියෙන්නේ කවදාද ? බාර අරගෙන තියෙන්නේ කව්ද ?

උ 2020/07/18 තමයි බාරදීලා තියෙන්නේ. මෙතන ඒ බාරගත් පුද්ගලයාගේ නම පැහැදිලිව සඳහන් වෙන්නේ නැහැ E.B.P කියලා ඉතුරු ටික සිංහලෙන් සඳහන් වෙනවා එතන අපැහැදිලියි . නමුත් හැඳුනුම්පත් අංකය තියෙනවා 892333388 වි.

ස්වාමීනි එම සටහන C.957 .B අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා .

ප්‍ර 3 වෙනි පුද්ගලයා ?

උ සාගල රත්නායක මහතා.

ප්‍ර එතුමාට කවදාද බාර දීලා තියෙන්නේ නොතීසිය ?

උ 2020/07/18 වෙනිදින.

ප්‍ර කව්ද බාර අරගෙන තියෙන්නේ ?

උ බන්දුල කියන පුද්ගලයෙක් තමයි බාර අරන් තියෙන්නේ.

එම සටහන C.957 C අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා

ප්‍ර 4 වෙනි පුද්ගලයා කව්ද ?

උ 4 වෙනි පුද්ගලයා ඩී. රුවන් විජේවර්ධන මැතිතුමා.

ප්‍ර එතුමාට කවදාද බාරදීලා තියෙන්නේ නොතිසිය ?

උ එතුමාට බාරදීලා තියෙන්නෙත් 2020/07/18 වෙනි දින

ප්‍ර කව්ද බාර අරගෙන තියෙන්නේ ?

උ කුමාර කියල මහත්මයෙක්බාර අරගෙන තියෙන්නේ හැඳුනුම්පත් අංක 672761018 වි.

ස්වාමීනි එම සටහන C.957D අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරනවා.

ප්‍ර පස්වන පුද්ගලයා ?

උ ජී. ශානි අබේසේකර මහතා.

ප්‍ර කවදාද එතුමාට බාර දීලා තියෙන්නේ ?

උ 2020/07/18 වෙනිදා.

ප්‍ර කව්ද බාර අරගෙන තියෙන්නේ ?

උ ශානි අබේසේකර මහතා විසින් පුද්ගලිකව බාර අරන් තියෙනවා.

ස්වාමීනි C.957E අක්ෂරයෙන් ලකුනු කොට ඉදිරිපත් කරනවා

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර එපමණයිද ?

උ අතින් බාර දුන්න අය එපමණයි.

ප්‍ර එතකොට ඔබ කිව්වා ඒ තමයි කොළඹ ප්‍රදේශයේ වාසය කරන තැනැත්තන්,කොළඹින් බැහැරව සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් ඔබ කිව්වා සීග්‍රගාමී තැපෑලෙන් ඒවා යැවීමට කටයුතු කලාය කියලා ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර ඒ බව සනාථ කරන්නට ඔබට මොනවාද ඉදිරිපත් කරන්න පුලුවන් මේ අවස්ථාවේදි?

උ සීග්‍රගාමී තැපෑලට බාරදුන්නු බාරගත්ත රිසිට් පත තියෙනවා ඒ රිසිට් පතේ ඡායා පිටපතක් තියෙන්නේ මොකද මේ කේ මුල් පිටපත අපි ජනාධිපති කාර්යාලයට ඉදිරිපත් කරලා තියෙන නිසා .

ප්‍ර හොඳයි ඒවා වෙන වෙනම ඔබේ ගොනු වේ තිබෙනවාද?

උ ඒත් සියලු දෙනා වෙනුවෙන්ම එක රිසිට් පතක් පමණයි නිකුත් කරලා තියෙන්නේ. නාමලේඛණය මගේ අතේ තියනවා කාටද බාර දුන්නේ කියලා.

ප්‍ර එහෙමනම් ඔබට කියන්නට පුලුවන්ද සීග්‍රගාමී තැපෑලෙන් යැවීම සඳහා එම නොතිසි බාර දීලා තියෙන්නේ කුමන පුද්ගලයන් විෂයෙහිද ?

උ පුලුවන් කියන්න
රවීන්ද්‍ර බංඩාර සෙනවිරත්න විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති.
ඒ වගේම බ්‍රිගේඩියර් එච්.කේ. ඒ.චුල රත්නසිරි කොඩිතුවක්කු මහතා නියෝජ්‍ය සේනාවිධායක.
ඩබ්. කේ නාලක ද සිල්වා මයා පොලිස්පති දැනට වැඩ තහනමට ලක් වෙලා ඉන්න
ඒ වගේම ඒ. එන් සිසිර මෙන්ඩිස් මයා .
රන්ජිත් මද්දුම බංඩාර මහතා. හිටපු අමාත්‍ය.
ඒවාගේම හිටපු පොලිස්පති පූජිත් සේනාධි බංඩාර ජයසුන්දර මහතා.
කපිල වෛද්‍යරත්න මහතා.
කරුණාසේන හෙට්ටිආරච්චි මහතා.

ප්‍ර ඔබ කිව්වා එම තැනැත්තන් විෂයෙහි සීග්‍රගාමී තැපෑලෙන් මෙම නොතිසි යවනු ලැබූ අවස්ථාවේදී ඒ සියලු නොතිසි සම්බන්ධයෙන්ම එක් ලියා පදිංචි රිසිට් පතක් ලදු පතක් ලැබුනාය කියලා?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර එම ලදු පත ඒ වගේම ඔබ කිව්වා එහි මුල් පිටපත ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරලා තියෙනවා කියලා . එහෙමනම් එහි ඡායාස්ථ පිටපතක් ඔබ ලඟ තියෙනවාද නැත්නම් සහතික කරන ලද පිටපතක් තියෙනවාද ?

උ ඡායා පිටපතක් මේ අවස්ථාවේ තියෙනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර ස්වාමීනි එම ඡායා පිටපතේ දිනය කවද්ද ?

උ 2020/07/20 මුද්‍රාව සඳහන් වෙලා තියෙනවා.

ප්‍ර ඒ කියන්නේ 2020/07/20 වෙනිදාද ඔබගේ උපදෙස් පරිදි කොළඹින් බැහැරව සිටින පුද්ගලයින් විෂයෙහි මෙම නොතීසි යැවීමට කටයුතු කලේ?

උ එහෙමයි ස්වාමීනි.

ස්වාමීනි එම ලදු පත C.957 F අක්ෂරයෙන් ලකුණු කොට ඉදිරිපත් කරන්නට අවසර පතනවා.

ප්‍ර එකී නොතීසි යැවීමෙන් පසුව අද දින කුමන නිළධාරීන්ද මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියට පැමිණිලා තිබෙන්නේ ?

උ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා වෙනුවෙන් නියෝජනයක් වෙනවා කියලා සඳහන් කරලා තියෙනවා . පුජිත් ජයසුන්දර මහතා වෙනුවෙන් නියෝජනයක් වෙනවා කියලා සඳහන් කරලා තියෙනවා. හේමසිරි ප්‍රනාන්දු මහතා වෙනුවෙන් නියෝජනයක් වෙනවා කියලා සඳහන් කරලා තියෙනවා . කරුණාසේන හෙට්ටිආරච්චි වෙනුවෙනුත් නියෝජනයක් තියෙනවා කියලා සඳහන් කරලා තියෙනවා . සිසිර මෙන්ඩිස් මහතා වෙනුවෙනුත් නියෝජනයක් වෙනවා කියලා සඳහන් කරලා තියෙනවා. ශානි අබේසේකර මහතා සහ රවි සෙනවිරත්න මහතා වෙනුවෙන් නියෝජනයක් වෙනවා කියලා මේ අවස්ථාවේ සඳහන් කරනවා.

ප්‍ර එම නිළධාරීන් හැරෙන්නට අනිකුත් නොතිසි නිකුත් කරන ලද අනිකුත් නිළධාරීන් මේ ගරු කොමිෂන් සභාවට පැමිණිලා තියෙනවාද ?

උ නැත ස්වාමීනි.

ප්‍ර පෞද්ගලිකව මෙම කොමිෂන් සභාවට අද දින නීති නියෝජනයක් නොමැතිව හෝ ඔබේ නොතිසිය ප්‍රකාරව පැමිණි වෙනත් නිළධාරීන් ඉන්නවාද ?

උ ඒ පිළිබඳව මා දැනුවත් වෙලා නැහැ ස්වාමීනි.

ප්‍ර ඔබ දන්නා ආකාරයට වෙනත් නිළධාරීන් එහෙමනම් පැමිණිලා නැහැ ?

උ නැහැ.

ප්‍ර ඔබ කිව්වානේ අර සිග්‍රගාමී තැපෑලෙන් කොළඹින් බැහැරව සිටින නිළධාරීන් වෙත නොතීසි යවනු ලැබුවාය කියලා ?

උ එහෙමයි ස්වාමීනි.

ප්‍ර සාමාන්‍යයෙන් එම ලිපි බාර නොදුන්නහොත් සාමාන්‍ය ක්‍රමවේදය අනුව ලිපිය බැහැර කරනු ලබන තැනැත්තා වෙත නැවත එය ලබා දෙනවා නේද තැපැල් දෙපාර්තමේන්තුවෙන් ?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ ආපහු එවනවා.

ප්‍ර ඒ ආකාරයට ඔබට නැවත ලැබුණු නොතිසි යමක් තිබෙනවාද?

උ අද වෙනතෙක් කිසිවක් එහෙම නැවත ලැබිලා නැහැ.

ප්‍ර මේ මොහොත වෙනතුරු නැහැ ?

උ නැහැ ස්වාමීනි.

සාක්ෂි අවසන්.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.08.11 වේලාව :- ප.ව. 3.45

(සටහන් කළේ :- කේ.එම්.චන්දිමා දිල්හානි)

ගරු විනිසුරු මඩුල්ල :-

01. ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා - සභාපති

02. ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා - සාමාජික

03. විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා - සාමාජික

04. විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා - සාමාජික

05. විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය - සාමාජික

පෙනී සිටීම:-

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ සංජීව දිසානායක මහතා, ,ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ සුහර්ශි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ නීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධිනීතීඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා රජයේ අධි නීතීඥ චතුරංග බණ්ඩාර මහතා ,, සමඟ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටියි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අඟරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම : ඉස්මයිල් සාහිදා ෆර්නි
වයස : අවුරුදු 24
ජාතිය : මුස්ලිම්
ආගම : ඉස්ලාම්
ලිපිනය : අංක 85 ඊ,තෙයිකා පාර,එරාවුර් 01.(විවාහකයි)
ප්‍රතිඥා දී කැඳවයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය</u>

ප්‍ර: තමන් විවාහකයිද?
පි: ඔව්.
ප්‍ර: විවාහක ස්වාමිපුරුෂයාගේ නම මොකක්ද?
පි: අලියාර් පස්මීර්
ප්‍ර: තමන්ගේ ස්වාමි පුරුෂයා අන්තිමට රට ගියේ කවදද?
පි: 2017 නොවැම්බර් මාසයේ 30 වෙනිදා.
ප්‍ර: තමන් එදා ගියාද මේ කටුනායක ගුවන් තොටුපලට?
පි: මම ගියේ නැහැ.
ප්‍ර: තමන්ගේ ස්වාමි පුරුෂයා සමඟ ගෙදර කවුරුහරි ගියාද?
පි: මගේ නන්ගිගේ ස්වාමි පුරුෂයා ගියා.
ප්‍ර: මොකක්ද එයාගේ නම?
පි: අලියාර් රිම්සන්.
ප්‍ර: තමුන්ගේ ස්වාමි පුරුෂයා රට ගියාට පස්සේ තමුන්ට මොනවා හරි එව්වද ගුවන් තොටුපලේදී?
පි: එක්කන් ගිය කෙනා අතේ ඉතුරු සල්ලිත් අයිඩින්ටියයි,ළමයාට ආහාර වර්ගයකුයි එවලා තිබ්බා.
ප්‍ර: දැන් තමුන් දන්නවාද තමනගේ ස්වාමි පුරුෂයාගේ ජාතික හැඳුනුම්පතේ අංකය තමන් දන්නවද?
පි: නැත.
ප්‍ර: දැන් ඒ ජාතික හැඳුන්ම් පත කවදාද තමන්ට ලැබුණේ?
පි: ඔවුන් ගිහිල්ලා ආපහු ඊළඟ දවසේම පැමිණි විගසම මට දීලා ගෙදර ගියා.
ප්‍ර: දැන් තමන්ගේ ස්වාමි පුරුෂයාගේ ජාතික හැඳුනුම් පත තමන්ගේ ස්වාමිපුරුෂයා නැවත ලංකාවට එන කම් කා භාරයේ ද තිබුණේ?
පි: මං ළඟ තිබුණේ.
ප්‍ර: තමුන් ළඟ කොහේද තිබුණේ?
පි: අල්මාරියේ
ප්‍ර: ඒ අල්මාරිය දොරඅගුලු යතුරු දාන්න පුළුවන් එකක්ද?

FAIR COMMENT BY JEZEEM

පි: එහෙම වහලා යතුර ගන්න පුළුවන් නමුත් නිකම්ම තමයි වහලා තියෙන්නේ.

ප්‍ර: තමුන් නිවසින් පිටතට යනවනම්?

පි: අල්මාරිය ලොක් කරන්නේ නැහැ.නිකම් වහලා ගෙදර දොර වහලා යනවා.

ප්‍ර: දැන් තමන් ඒ ස්වාමි පුරුෂයාගේ ජාතික හැඳුනුම් පත මොනයම් අවස්ථාවකදී හෝ වෙන කාට හරි දුන්නාද?

පි: නැත නමුත් මේ සම්බන්ධයෙන් CID විමර්ශනය සඳහා පැමිණි අයට පමණයි මා හැඳුනුම් පත ලබා දී තියෙන්නේ.

ප්‍ර: විමර්ශනයට එන අවස්ථාව වන විට තමන්ගේ ස්වාමි පුරුෂයා ලංකාවට ඇවිල්ලා තිබුණාද?

පි: ඔහු විදේශගත වී ඉන්න අවස්ථාවේදී ඇවිල්ලා තිබෙනවා ඊට පහුවත් ඇවිල්ලා තිබෙනවා.

ප්‍ර: කවුද ආවේ විමර්ශනයට?

පි: දන්නේ නැහැ CID කියලා ඔවුන් කියනවා.

ප්‍ර: 2018.04 වෙනි මාසේ 22 වෙන කොට තමන් කොහේද හිටියේ?

පි: එරාවුල්වල.

ප්‍ර: ඒ දිනය වන විට මේ තමන්ගේ ස්වාමි පුරුෂයාගේ ජාතික හැඳුනුම් පත කොහේද තිබුණේ?

පි: මං ළඟ තමයි තිබුණේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

වෙනත් ප්‍රශ්න නොමැති බව දන්වයි. සාක්ෂිකාරිගෙන ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් හිමි පානන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීඥවරියගෙන අසයි නොමැති බව දන්වයි.සාක්ෂිකාරිය මුදා හරිමි.

සාක්ෂිකාරිය එරාවුර්වල සිට පැමිණි සාක්ෂි ලබා දුන් හෙයින් නීතියට අනුව ඇයිට හිමිවිය යුතු දිමනාව ලබා දෙන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.සාක්ෂිකාරිය මුදා හරිමි.

දැන් වේලාව.ප.ව.3.55

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.08.11 වෙලාව: ප.ව 2.15

සටහන් කළේ - නිල්මිණි කුමාරි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය
-සාමාජික

පෙනී සිටීම

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා,ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, රජයේ නීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා, රජයේ නීතිඥ චතුරංග බණ්ඩාර මහතා සමඟ රජයේ නීතිඥ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ කෞෂි සෙල්වනායගම් මහත්මිය කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මේ අවස්ථාවේදී කොමිෂන් සභාවේ කටයුතු මාධ්‍යට විවෘත පවත්වන බව සටහන් කර තබමි.

<u>සාක්ෂි කැඳවීම ආරම්භ කරමි.</u>

සාක්ෂි අංකය	:	1163
නම	:	**අලියාර් පස්මීර්**
වයස	:	**අවු 29යි**
ජාතිය	:	**මුස්ලිම්**
ආගම	:	**ඉස්ලාම්**
රැකියා	:	**කුලීවැඩ**
ලිපිනය	:	**85/ ඊ, වාලිය පාර තෙකා පාර, ඒරාවුල් 01.**

දෙමළ භාෂාවෙන් ප්‍රතිඥා දී කැඳවයි.
මා කියන සාක්ෂිය සැබෑය. සැබෑවක් මිස අන් කිසිමක් නොකියන ලෙද දිවුරා පොරොන්දු වෙමි.
මෙම සාක්ෂිකරු කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක ජෝන් කන්දසාමි මහතාගේ සහාය ඇතිව දෙමළෙන් සාක්ෂි ලබා දෙන අතර එය පරිවර්තනය කරන බව සටහන් කර තබමි.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

ප්‍ර: තමන් කොහේද දැන් පදිංචි වෙලා ඉන්නේ?
පි: 85/ ඊ, වාලිය පා තෙකා පාර, ඒරාවුල් 01 පදිංචි වී සිටිනවා.
ප්‍ර: කොච්චර කාලයක ඉඳලාද ඒ ස්ථානයේ පදිංචි වෙලා ඉන්නේ?
පි: අවුරුදු 5ක් හෝ 6 සිට මම එහි පදිංචිව සිටිනවා.
ප්‍ර: දැන් ඔබ අවුරුදු 5ක 6ක වයසේ ඉඳලා තමයි ඔය කියපු ලිපිනයේ පදිංචි වෙලා ඉන්නේ කියලයි කිව්වේ නේද?
පි: ඔව්.
ප්‍ර: දැන් අවුරුදු 5ක 6ක මෙයාගේ වයස ද දැන් අවුරුදු 5කට කළින් ඉඳලාද?
පි: මා හට විවාහයෙන් පසුව අවුරුද්දක කාලයේ සිට ඉහත ලිපිනයේ පදිංචි වී සිටිනවා.
ප්‍ර: දැන් තමා රැකියාවක් කරනවද?
පි: දැනට මම කුලී වැඩ කරනවා.
ප්‍ර: ඊට කළින් රැකියාව කරාද තමන්?
පි: ඊට කළින් තැඹිලි business කරා.
ප්‍ර: කොහේද ඒ තැඹිලි විකිණීම කළේ?
පි: මම කළින් තැඹිලි විකුණුවා. ඊට පස්සේ බඩියක් අරගෙන කුරුණෑගල ප්‍රදේශයට ඇවිල්ලා තැඹිලි අරගෙන ගොස් කඩවලට දාලා business කරා.
ප්‍ර: තමන් යම් කාල වකවානුවකදී විදේශ ගත වුණාද?

Proposed Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්.

ප්‍ර: ඒ මුලින්ම කවදාද රට ගියේ?

පි: 2011 නොවැම්බර් මාසේ අවසානයේ.

ප්‍ර: ඒ කොයි රටටද ගියේ?

පි: ඩුබායි වලට ගියා.

ප්‍ර: නැවත ලංකාවට ආවේ කවදාද ?

පි: 2014 ජනවාරි මාසේ 01 වෙනිදා ආපහු ලංකාවට ආවා.

ප්‍ර: ඩුබායි රටේ තමුන් රැකියාවක් කරනවද?

පි: කවුටර්යේ සහකරු super market

ප්‍ර: දැන් 2014 ජනවාරි 01 වෙනිදා ලංකාවට ආවාට පස්සේ තමුන් නැවත වතාවක් විදේශ ගත වුණාද?

පි: ඔව්.

ප්‍ර: ඒ කවදාද මොන රටටද ගියේ?

පි: 2014 පෙරවාරි 28 වෙනිදා එම ස්ථානයටම නැවත රැකියාවට ගියා.

ප්‍ර: ලංකාවට ආවේ කවද්ද?

පි: 2014 සැප්තැම්බර් මාසයේ මුල් හරියේ ආවා කියලා මට මතකයි.

ප්‍ර: නැවත වතාවක් ඒ කියන්නේ 3 පාරටත් තමුන් විදේශ ගත වුණාද?

පි: 2017 නොවැම්බර් මාසේ 30 වෙනිදා මා අවසන් වරට විදේශ ගත වුණා.

ප්‍ර: නැවත කවදාද ලංකාවට ආවේ?

පි: 2020 ජනවාරි මාසේ 05 වෙනිදා. 5 වෙනිදා එහෙන් පිටත් වුණා ලංකාවට 6 වෙනිදා ආවා.

ප්‍ර: දැන් තමන්ගේ ඒ 3 වෙනි පාර තමන් රට ගියේ තමන් කළින් රැකියාව කරපු ස්ථානයටමද?

පි: නැත.

ප්‍ර: ඒ කොහෙටද ගියේ අවසාන වතාවට?

පි: ඩුබායි වල රෙස්ටුන්ට් එකකට රැකියාවට ගියා. පාරී ඉරානි රෙස්ටුන්ට් එහි නම

ප්‍ර: තමන්ගේ ගුවන් ගමන් බලපත්‍රයේ අංකය තමන්ට මතකයිද?

පි: පාස්පෝට් එක තියෙනවා. අංකය මතක නැහැ.

ප්‍ර: තමන්ට මේ ඉසේකාලේ කීයට යනකම් ඉගෙන ගෙන තියෙනවද ?

පි: වසර 9 දක්වා අධ්‍යාපනය ලබලා තිබෙනවා.

ප්‍ර: තමන්ගේ ගුවන් ගමන් වාර්තා ඉංග්‍රීසියෙන් තියෙන්නේ දැක්කොත් හඳුනා ගන්න හැකියාව තියෙවනද තමුන්ට?

පි: මා ඉංග්‍රීසි භාෂාව දන්නේ නැහැ. කියවන්න බැහැ.

ප්‍ර: දැන් තමන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය තමන්ට කියන්න පුළුවන්ද?

පි: පාඩම් නැහැ බලලා කියන්නම්.

මේ අවස්ථායේදී ගරු කොමිෂන් සභාවේ අනුමැතිය අනුව සාක්ෂිකරු ජාතික හඳුනුම්පත පරීක්ෂාර කරයි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: 902772219V

ප්‍ර: ඒ ජාතික හඳුනුම්පත ලබා ගන්න වෙලාවේ තමන් කොහේද පදිංචි වෙලා හිටියේ?

පි: පල්ලිඅඩි පාර, ඒරාවුල් 2C. ගෙදර අංකය 246

ප්‍ර: දැන් තමන් ඒ ජාතක හැඳුනුම් පත ලබා ගන්න කාලේ පදිංචි වෙලා හිටපු ගෙදර ලිපිනය තමයි තමුන් දැන් ඔය සඳහන් කරේ?

පි: ඔව්.

ප්‍ර: දැන් තමන් ජංගම දුරකථන පාවිච්චි කරනවද?

පි: ඔව්.

ප්‍ර: තමන් මොන ආයත වලින්ද ජංගම දුරකථන සිම් පත් ලබාගෙන තියෙන්නේ?

පි: ඩයලොග් අරන් තියෙනවා නම්බරය කියන්නද

ප්‍ර: කියන්න

පි: 0774673789

ප්‍ර: ඒ ජංගම දුරකථන සිම්පත කවදාද තමන් ලබා ගත්තේ?

පි: මා පළවෙනි වතාවට විදේශ ගතවීමට පෙර තමයි මෙම සිම්පත් කාඩ් පත ලබා ගත්තේ.

ප්‍ර: ඊට අමතරව වෙනත් ජංගම දුරකථන සිම්කාඩ්පත් තමන් ලබාගෙන තිබෙනවද?

පි: දැනට මම පාවිච්චි කරන නොම්බරයක් තියෙනවා. 0765273750 තවද මම මගේ තාත්තාගේ නමින් සිම්කාඩ් එකක් අරගෙන ඒකත් පාවිච්චි කරලා තියෙනවා. ඒකේ නොම්බරය මට මතක නැහැ.

ප්‍ර: තමන් ඒ ඩයලොග් කියන දුරකථන සමාගමෙන් තමයි ඒ දුරකතන සිම්කාඩ්පත් ලබාගෙන තිබෙන්නේ?

පි: ඔව්.

ප්‍ර: දැන් ඒ අවස්ථාවේදී තමන්ට දැනීමක් තිබෙනවද ජංගම දුරකතන සිම් කාඩ්පතක් ලබා ගන්න කොට තමන්ගේ ජාතික හැඳුනුම්පත හෝ එකේ පිටපතක් ඉදිරිපත් කළ යුතුයි කියලා?

පි: ඔව්. දැනට ID කාඩ් එකේ පිටපත් නැතුව සිම්කාඩ් විකුණනවා.

ප්‍ර: තමන්ගෙන් අහන්නේ දැන් වෙන්නේ මොකක්ද කියන එක නෙවෙයි. තමන් දැන් කිව්වානේ මේ ඩයලොග් ආයතනයෙන් තමයි අරගෙන තියෙන්නේ. ඒ ලබා ගන්නා අවස්ථාවේදී තමයි ජාතික හැඳුනුම්පත හා එකේ copy ක් ඉදිරිපත් කළ යුතුයි නේද?

පි: ඔව්

මේ අවස්ථාවේ දී දැනටමත් C- 837 වශයෙන් ලකුණු කොට ඇති ඩයලොග් සමාගමේ පාරිභෝගිකයන්ට දුරකථන ඇමතුම්, දුරකථන සිම්කාඩ්පත් නිකුත් කිරීමේ දී නිකුත් කෙරෙන විස්තර ඇතුළත් පත්‍රිකාවක් සාක්ෂිකරුට පෙන්වා සිටී. සාක්ෂිකරුට C- 837 පෙන්වා සිටී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඕකේ තමන්ගේ නම තියෙනවද? නම කියව ගන්න පුළුවන්නේ තමන්ට? කියවා ගන්න පුළුවන්ද ඉංග්‍රීසියෙන් තමන්ගේ නම?

පි: ඔව් තියෙනවා.

ප්‍ර: දැන් තමන්ට පෙන්නපු ලේඛනයේ තමන්ගේ නම පස්මීර් A කියලා සටහන් වෙලා තියෙනවා කියලා කිව්වොත් පිළිගන්නවද?

පි: ඔව්.

ප්‍ර: ඒක හරිද තමන්ගේ නමද ඒකේ පස්මීර් A කිව්වාම?

පි: ඔව්.

ප්‍ර: දැන් එකේ අංකය, අංක 246, පල්ලිය අසල පාර, ඒරාවුල් 2 C කියලා සටහන් වෙලා තියෙනවා ලිපිනක්?

පි: මගේ ලිපිනය තමයි ඒ.

ප්‍ර: එසේම තමන් කළින් සඳහන් කරපු තමන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය 902772219V වශයෙන් සටහන් වෙලා තියෙනවා?

පි: ඔව්.

ප්‍ර: ඒ තමන්ගේ ජාතින හඳුනුම්පතේ අංකය කියලා තමන් පිළිගන්නවද?

පි: ඔව්.

ප්‍ර: ඒ අනුව දැන් තමන්ට පෙන්නපු ලේඛනය අනුව ඒ තමන්ගේ ජාතික හැඳුනුම් පතට ඩයලොග් සමාගමෙන් යම්කිසි දුරකථන අංකයක් නිකුත් කරලා තිබෙනවා යැයි කියන දේ මේ ලේඛනයේ සටහන් වෙලා තියෙනවා කිව්වොත් තමන් පිළිගන්නවද?

පි: ඔව්. දිනය කුමක්ද

ප්‍ර: ඒ දුරකථන අංකය ඉස්සෙල්ලා මං දුරකථන අංකය කියන්නනම් ඊට පස්සේ තමන්ට දිනය සඳහන් කරන්නම්. ඒ දුරකථන අංකය 767998752?

පි: ඔව් හරි.

ප්‍ර: දැන් මේ ලේඛනය අනුව තමන් අදාළ සිම්පත ලබාගෙන තිබෙන්නේ 2018.04 මාසේ 22 කියලා සඳහන් වෙලා තියෙනවා කියලා කිව්වොත් ඒක හරිද?

පි: ඔව් තියෙනවා. මම ඒ දිනයේ විදේශ රටක තමයි හිටියේ.

ප්‍ර: දැන් තමන් විදේශ ගත වෙනකොට තමන්ගේ ජාතික හැඳුනුම්පත අරගෙන ගියාද?

පි: මම දීලා ගියා.

ප්‍ර: කාටද දීලා ගියේ?

පි: මාව එක්කගෙන ආපු රිම්සාම් නැමැති එක්කෙනුකුට මම දීලා ගියා.

ප්‍ර: කවුද මේ රිම්සාම් කියන්නේ ?

පි: මගේ බිරිඳගේ නංගී විවාහ වෙලා ඉන්නේ රිම්සාම් සමඟ.

ප්‍ර: කවදාද රිම්සාම්ට තමන්ගේ ජාතික හඳුනුම්පත දුන්නේ?

පි: මම විදේශ ගත වෙනකොට ගුවන් තොටුපොලේදී රිම්සාන්ට ID කාඩ් එකකයි ඉතුරු සල්ලියි භාර දුන්නා.

Project Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දිනය?

පි: අවසාන වරට මා විදේශ ගත වන අවස්ථාවේ තමයි මම ඔහුට දුන්නේ. 2017 නොවැම්බර් මාසේ අවසාන භාගයේ.

ප්‍ර: ඒ කියන්නේ තමන් විදේශ ගත වෙච්චි දිනයේ තමයි දුන්නේ?

පි: ඔව්.

ප්‍ර: ඇයි ඒක ලබා දුන්නේ රිම්සාන්ට?

පි: ඔහු තමයි මාව එක්කරගෙන ගුවන් තොටුපළට ගියේ. ගෙදරින් වෙන කවුරුවත් ඇවිල්ලා හිටියේ නැහැ. ඒ නිසා ඔහුට දුන්නා.

ප්‍ර: මොනවා කරන්න කියලද දුන්නේ?

පි: මේක ගෙනියලා මගේ බිරිඳට භාර දෙන්න කියලා තමයි දුන්නේ.

ප්‍ර: තමන්ගේ බිරිඳ ඒ කාලේ කොහේද පංදිච් වෙලා හිටියේ?

පි: 85E, තෙකා පාර, ඒරාවූල් 1 A ඇය පදිංචි වී සිටියා.

ප්‍ර: මොකක්ද ඇයගේ නම ?

පි: ස්මයිල් සාහිදා ෆර්වින්

ප්‍ර: දැන් ඒ රිම්සාන්ට තමන් දීපු තමන්ගේ ජාතික හඳුනුම්පත රිම්සාන් මොකක් ද ඊට පස්සේ කරලා තියෙන්නේ?

පි: ඔහු ගෙනවිත් ගෙදර මගේ බිරිඳට භාර දීලා තිබ්බා.

ප්‍ර: කවදාද භාර දීලා තියෙන්නේ ?

පි: ඔහු ආපු ගමන්ම ගෙදෙට්ට ගිහින් දීලා තියෙනවා.

ප්‍ර: කාගෙන්ද තමන් ඒක දැන ගත්තේ?

පි: මම බිරිඳට call කරලා කතා කරා. ඒ අවස්ථාවේදී ඇය කියා හිටියා එහෙම.

ප්‍ර: තමන්ගේ බිරිඳ ඒ අනුව තමන්ට කිව්වද රට ගියාට පහුවෙනිදාත් ඒ අදාළ ජාතික හැඳුනුම්පත ඇයට ලැබුණායි කියලා?

පි: ඔව් බිරිඳ එහෙම කියා සිටියා.

ප්‍ර: දැන් තමන් පිළිගත්තා මේ ඩයලොග් ආයතනයේ ලේඛනය අනුව C- 837 සාක්ෂිකරුට පෙන්වා සිටී. ලේඛනය අනුව මේ තමන්ගේ ජාතික හැඳුනුම් පතට තමයි මේ දුරකථන අංක 0767998752 කියන දුරකථනය සිම් කාඩ් පත නිකුත් වෙලා තියෙන්නේ කියලා?

පි: ඔව්

ප්‍ර: දැන් තමන්ට මේ ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න මේ තමන්ගේ ජාතික හැඳුනුම්පත ඒ අනුව නිකුත් කරලා ඒක කොහොමද ඒ අංකයක් ලබා ගැනීමක් ලබා ගත් බවට මේ සටහන් වෙලා තියෙන දේ ගැන මොකක්ද තමන්ට කියන්න තියෙන්නේ ?

පි: එක් අවස්ථාවකදී මගේ ජාතික හැඳුනුම්පත නැතිවුණා.

ප්‍ර: ඒ කවදාද තමන් ඒ සම්බන්ධයෙන් පොලිසියට පැමිණිල්ලක් දැම්මද?

පි: මා පොලිසියට පැමිණිලි කළේ නැහැ. නැතිවෙලා දවසක් හෝ දවස් 2කින් එම හැඳුනුම්පත නැවත මට ලැබී තිබෙනවා. ජාතික හැඳුනුම්පත නැති වුණාට පස්සේ ඒ මං ළඟ මගේ ජාතික හැඳුනුම්පතේ ජායාස්ථ පිටපතක්

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තිබුණා. ඒක මම face book එකේ දාලා ප්‍රචාරය කරා. පසුව එම ජාතික හැඳුනුම්පත මට ලැබුණා.

ප්‍ර: කොහොමද ලැබුණේ?

පි: ඒක කොල්ලෙක් ගෙනත් දුන්නා.

ප්‍ර: කාටද ගෙනල්ලා දුන්නේ?

පි: මටයි ගෙනත් දුන්නේ.

ප්‍ර: කවුද ඒ ගෙනත් දීපු පුද්ගලයා?

පි: මම කළින් ප්‍රකාශ ලබා දීමේ දී කොල්ලාගේ නම මතක නැහැ කියලා තියෙනවා. නමුත් දැන් මට මතකයි. ඔහු අපගේ අල්ලපු පාරේ තලෙමගර් පාරේ පදිංචි වෙලා ඉන්නවා. රියාස් කියලා. ඔහු අපේ පවුලට ඥාති සම්බන්ධකමක් තියෙන කෙනෙක්.

ප්‍ර: මොකක්ද ඔහුගේ සම්පූර්ණ නම රියාස්ගේ ?

පි: ඔහුගේ සම්පූර්ණ නම මම දන්නේ නැහැ.

ප්‍ර: ඔහුගේ පියාගේ නම දන්නවද?

පි: නැත.

ප්‍ර: ගෙදර ලිපිනය මොකක්ද රියාස්ගේ ?

පි: ඔහුගේ ලිපිනය දන්නේ නැහැ. නමුත් කලෙමගර් පාරේ පදිංචි වෙලා ඉන්න බව මම දන්නවා.

ප්‍ර: කලෙමගර් පාර කොහේද?

පි: ඒරාවුල් ආරුමුහත්තම් කුඩිඋරුප්පු ඒරාවුල් යන ස්ථානයේ පිහිටි කලෙමගර් පාරේ තමයි ඔහු පදිංචි.

ප්‍ර: දැන් ඔය රියාස් තමන්ට ජාතික හැඳුනුම්පත ගෙනල්ලා දුන්නාම කොහෙන්ද රියාස්ට මේ ජාතික හැඳුනුම්පත හම්බුණේ එයාට ලැබුණේ කොහොමද කියලා තමන් අහලා බැලුවද?

පි: මම ඇහුවා ඔහු කිව්වා ඒරාවුල්හි සෙඩ් එක පිරවුම් හල අසල තිබී ඔහුට ඒක ලැබුණු බව ඔහු කියා සිටියා.

ප්‍ර: දැන් තමන් මේ ගරු කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ප්‍රකාශය ලබා දෙන අවස්ථාවේ දී තමන්ට මේ නම අමතක වෙලා තිබ්බායි කිව්වා නේද ?

පි: පුද්ගලයාව දන්නවා නමුත් නම මතක නැහැ කියලා මම කියා තිබෙනවා.

ප්‍ර: දැන් තමන්ගේ මේ ජාතික හැඳුනුම්පත කොහොමද නැති වුණේ?

පි: ඔහු තමයි පහු වෙනිදා පාරේ තිබුණා කියලා මට ගෙනත් දුන්නා. යාපනයට මම බස් එකේ යද්දී මගේ සාක්කුවේ තිබිලා ඒක නැතිවුණා.

ප්‍ර: දැන් ඒ නැතිවෙලා තිබිලා කොච්චර දවසකට පස්සේද ද ආයේ හම්බුණේ?

පි: ඒක නැති වුණේ එක් දිනක රාත්‍රියක හම්බවුණේ පහුවෙනිදා පස්වරු 5ට පමණ.

ප්‍ර: ඒ කියන්නේ තමන් කියන විදිහට මේ එක දවසක් ඇතුළත තමන්ට ඒ ජාතික හැඳුනුම්පත හම්බුණා නැවත?

පි: ඔව්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් 5ට විතර කිව්වේ දවසේ උදේද හැන්දෑවේද?

පි: පස්වරු. දවල් මම face book එකේ දැම්මා 12ට පමණ.

ප්‍ර: දැන් තමන් කිව්වනේ ඔය හැඳුනුම්පත නැතිවුණේ බස් එකේ යද්දී?

පි: ඔව් බස් එකේ මම නඟින අවස්ථාවේ ඒක වැටෙන්න ඇති.

ප්‍ර: කොහේද තිබුණේ තමන්ගේ ඔය ජාතික හැඳුනුම්පත ?

පි: පිටිපස්ස සාක්කුවේ. කලිසමේ පිටිපස්ස සාක්කුවේ තමයි තිබ්බේ.

ප්‍ර: ඒ කියන්නේ ඒක තිබුණේ මොකක් හරි පර්ස් එකකද එහෙම නැත්නම් දැන් සාමාන්‍යයෙන් තමන්ගේ ජාතික හැඳුනුම්පතක් නිකන් එහෙම රඳවගෙන යනවද නිකන්?

පි: පර්ස් එකේ තියන් හිටියද නැත්නම් නිකන් හිටිය ද කියලා මට මතක නැහැ.

ප්‍ර: දැන් තමන්ගේ අර මස්සිනා කෙනෙක් තමන් කිව්වනේ රිම්සාන් කියලා ?

පි: ඔව්.

ප්‍ර: ඔහු කොහේද ඉන්නේ?

පි: ඔහු කලෙමගර් පාර, ඒරාවුල්හි පදිංචි වෙලා ඉන්නවා. ඔහුගේ ලිපිනය මගේ බිරිඳගෙන් call කරලා තමයි මම ප්‍රකාශය දෙන අවස්ථාවේදී කියලා තියෙන්නේ.

ප්‍ර: රිම්සාන් දැන් කොහේද ඉන්නේ?

පි: දැනට ඒරාවුල් කලෙමගර් පාරේදී ඔහු පදිංචිව සිටිනවා.

ප්‍ර: දැන් ඔය තමන් කළින් කියපු රියාසුත් කලෙමගර් පාර, ඒරාවුල් වලම තමයි පදිංචිකාරයෙක්ද?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔය තමන් පදිංචි ප්‍රදේශය තමන් ඔය පදිංචි ලිපිනයේ ඉඳලා කලෙමගර් පාරේ ඒරාවුල් වලට කොච්චර විතර දුරක් ද තියෙන්නේ?

පි: අල්ලපු පාරේ. මම එහි පදිංචි වෙලා ඉන්නේ තෙකා පාර, ඔවුන් පදිංචි වෙලා ඉන්නේ ඊළඟ පාර කලෙමගර් පාරේ.

ප්‍ර: තමන් කිව්වේ මේ බස් එකේ යනකොට වැටෙන්න ඇති කියලානේ?

පි: ඔව්.

ප්‍ර: දැන් තමන් කිව්වේ මේ රිම්සාන් තමන්ට කිව්වේ, තමන් කොහෙන්ද බස් එකට නැන්ගේ?

පි: ඒරාවුරෙහි පෙට්ට්‍රල් සෙඩ් එක ළඟ ඉඳලා තමයි මම බස් එකට නැන්ගේ.

ප්‍ර: දැන් රියාස්ට කවදාද තමන්ගේ ජාතික හැඳුනුම්පත හම්බවෙලා තිබුණේ?

පි: ඔහුට කවදාද ඒක හම්බුණේ කියලා කිව්වේ නැහැ. ඔයාගේ හැඳුනුම්පත සෙඩ් එක ළඟ තිබුණා කියලා තමයි මට දුන්නේ.

ප්‍ර: කළින් අඳුනනවද රියාස්ව තමා?

පි: ඔව් අඳුනනවා.

ප්‍ර: ඇයි තමන් පොලිසියේ පැමිණිල්ලක් දැම්මේ නැත්තේ ජාතික හැඳුනුම්පත නැතිවුණා කියලා?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: පහුවෙනිදාම මට ජාතික හැඳුනුම්පත ලැබුණා. ඒ නිසා මම පොලිසියට ගියේ නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ID එක විතර ද නැති වුණේ?

පි: identity එක පමණක් නැති වුණාද නැත්නම් පර්ස් එකත් එක්ක identity එක නැතිවුණාද කියලා මට මතක නැහැ.

ප්‍ර: දිවුරුම් පිට සාක්ෂි දෙන්නේ ඇත්ත කියන්න.

පි: පිළිගත්තා.

ප්‍ර: පර්ස් එකේ සල්ලි කීයක් තිබ්බද?

පි: පර්ස් එක පමණක් නැතිවුණාද නැත්නම් identity එක පමණක් miss වුණාද කියලා මට මතක නැහැ.

ප්‍ර: තමන් මේ කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ප්‍රකාශයක් දුන්නා නේද?

පි: ඔව්.

ප්‍ර: ඊට පස්සේ ඒක කියවලා තේරුම් කරලා දුන්නට පස්සේ ඒක අත්සන් කෙරුවා නේද?

පි: ඔව්

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය</u>

ප්‍ර: දැන් තමන්ගේ අත්සන හඳුන ගන්න පුළුවන් ද තමන්ට?

පි: ඔව්. (සාක්ෂිකරු ප්‍රකාශයේදී අත්සන හඳුනා ගනී)

ප්‍ර: තමන් මේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ප්‍රකාශය ලබා දෙන අවස්ථාවේදී මොකක්ද තමන් කිව්වේ?

පි: identity සම්බන්ධවද

ප්‍ර: දැන් තමන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ප්‍රකාශයක් ලබාදෙන කොට දැන් ඔය තමන්ගේ, තමන් නැතිවුණායි කිව්වේ තමන්ගේ identity card එකද නැත්නම් පර්ස් එකද ඒ ගැන මොකක්ද තමන් කිව්වේ ?

පි: පර්ස් එකත් සමඟ නැතිවුණා කියලා තමයි කිව්වේ.

ප්‍ර: දැන් මොහොතකට කළින් තමන් සාක්ෂි දෙනකොට මොකක්ද කිව්වේ තමන්?

පි: පර්ස් එකත් සමඟ නැතිවුණාද නැත්නම් identity පමණක් නැතිවුණාද කියන එක මට මතක නැහැ කියලා මම කළින් කියා හිටියා.

ප්‍ර: දැන් තමන්ගේ ඔය පර්ස් එහෙම නැත්නම් identity card එක එකත් නැති වෙනවා කියන්නේ ඒක විශේෂ දෙයක් නෙවෙයිද?

පි: ඔව්.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් ඒ වගේ දෙයක් තමන්ට කොහොමද අමතක වෙන්නේ කරුණු?

පි: රියාස් ලබා දුන්නා ඒ ගැන ද අහන්නේ කියලා අහනවා.

ප්‍ර: දැන් තමන්ගෙන් ඇහුවානේ මම ඇහුවා තමන්ගෙන් ප්‍රශ්නයක් කළින් පර්ස් එකක දාලා තිබුණේ පර්ස් එකත් එක්කද නැතිවුණේ නැතනම් identity card විතර ද නැති වුණේ කියලා? මේ ගරු කොමිෂන් සභාවේ සභාපති විනිශ්චයකාරතුමත් ඇහුවා ඒක තමන්ගෙන් ඇහුවා ඒක?

පි: ඔව්.

ප්‍ර: දැන් එතකොට තමන් ඒ අවස්ථාවේදී කිව්වේ තමන්ට පර්ස් එක නැතිවුණාද ඒකත් එක්කද නැතිවුණේ කියලා තමන්නට හරියට මතක නැහැ කියලානේ?

පි: ඔව්.

ප්‍ර: ඇයි එහෙම ඒ වගේ විශේෂ දෙයක් කොහොමද තමන්ට අමතක වෙන්නේ ?

පි: identity එක නැතිවුණ ගමන්ම ඒක මට ආපහු ලැබුණා. ඒ කාලේ කිසිදු ප්‍රශ්නයක් නැති කාලයක්. ඒක ලැබී මාසයක් ඇතුළත මම විදේශ ගත වුණා.

ප්‍ර: දැන් තමන් සාක්ෂි දෙනකොට අද කිව්වේ අදාළ මේ නැතිවෙච්ච ජාතික හැඳුනුම්පත රියාස් කියාල කලෙමගර් පාරේ ඉන්න පිරිමි ළමයෙක් ඇවිල්ලා තමන්ට දීලා ගියායි කියලා?

පි: නැත ජාතික හැඳුනුම්පත නැවත අරගෙන ඇවිත් මට දුන් පුද්ගලයා මම දන්නවා කියලා කියලා තිබෙනවා.

ප්‍ර: දැන් තමන් සාක්ෂිදෙනකොට කිව්වේ තමන්ගේ නැතිවෙච්ච ජාතික හැඳුනම්පත කලෙමගර් පාරේ ඉන්න රියාස් කියලා පිරිමි ළමයෙක් ඇවිල්ලා තමන්ට පහුවදා ගෙනත් දුන්නායි කියලාද දැන් තමන් සාක්ෂි දෙනකොට තමන් මොහොතකට කළින් කිවවේ?

පි: ඔව්.

ප්‍ර: දැන් නැවතත් තමන්ගෙන් අහන්නේ තමන් සාක්ෂි දෙනකොට සඳහන් කළේ රියස් කියලා කලෙමගර් පාර ඉන්න පිරිමි ළමයෙක් පහුවදා නැති වෙච්ච ජාතික හැඳුනුම්පත තමන්ට ගෙනල්ලා භාර දුන්නා කියලා?

පි: ඔව්.

ප්‍ර: දැන් තමන් මේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ පොලිස් ඒකකයට ප්‍රකාශ ලබා දෙන්න අවස්ථාවේ දී කියලා තියෙන්නේ wifeගේ අක්කාගේ ගෙදරට කොල්ලෙක් ඇවිල්ලා identity card දීලා තිබුණා කියලා එහෙම සඳහන් වෙලා තියෙනවානම් මොකක්ද තමන් කියන්නේ ? මොකක්ද ඒ දෙකෙන් හරි?

පි: දැන් කියපු එක තමයි හරි. එදා මම තැති ගැනීමකින් තමයි ඒ ප්‍රකාශය දුන්නේ. මම පස්සේ ගෙදෙට්ට ගිහිල්ලා ඇයගෙන් ඇහුවා. ඇය කියා හිටියා නැහැ මට දුන්නේ නැහැ ඔයාට තමයි දුන්නේ කියලා.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් එතකොට තමන් මේ පොලිසියට ප්‍රකාශය ලබාදෙනකොට කිව්වේ බොරුවක් ද මේ wifeගේ අක්කාගේ ගෙදරට කොල්ලෙක් ඇවිල්ලා identity card එක දීලා තිබුණා කියලා?

පි: ඔව්.

ප්‍ර: ඇයි තමන් ඒවගේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට ඒ වගේ ආකාරයේ බොරුවක් ප්‍රකාශ කළේ ඇයි තමන් මේ ප්‍රකාශය ලබාදෙන අවස්ථාවේ?

පි: මම ප්‍රකාශ දෙන අවස්ථාවේදී ඉක්මනින් තැති ස්භාවයකින් තමයි මම එහෙම කියන්න ඇති. මම ගෙදර ගිහිල්ලා ඇයගෙන් ඇහුවා එතකොට ඇය කිව්වා මට නෙවෙයි ඔයාට තමයි දුන්නේ කියලා.

ප්‍ර: දැන් ඔය තමන්ගේ ජාතික හැඳුනුම්පත නැති වෙන එක නිතර වෙන දෙයක්ද?

පි: නැහැ. එක් අවස්ථාවකදී පමණයි ඒක නැති වෙලා තියෙන්නේ.

ප්‍ර: නැති වෙන්නේ නැහැනේ එහෙම?

පි: නැහැ

ප්‍ර: දැන් එක අවස්ථාවකදී විතරයි නැති වෙලා තියෙන්නේ ?

පි: ඔව්.

ප්‍ර: දැන් එක අවස්ථාකදී ජාතික හැඳුනුම්පත නැති වුණාම ඒක ලැබිච්ච විදිහ ගැන තමන්ට එහෙම අමතක වෙන්න පුළුවන් ද ඒක විශේෂයෙන් එක පාරක් විතරක් ජීවිතේ වෙච්ච දෙයක්නේ?

පි: නැහැ මට මතකයි ඒ නිසා තමයි මම ප්‍රකාශ දෙන අවස්ථාවේදී කිව්වේ පුද්ගලයා මතකයි ඔහුගේ නම මතක නැහැ කියලා.

ප්‍ර: ඒක ගැන නෙවෙයි අහන්නේ. අපි අහන්නේ අක්කා ගැන?

පි: මට මතකයක් තිබුණා. අක්කාට කොල්ලෙක් දීලා ඇයගෙන් මට ලැබුණු බවට. නමුත් මම ආපහු ගිහිල්ලා ඇයගෙන් විමසුවා. එතකොට ඇය කිව්වා නැහැ නැහැ ඔයාට තමයි කොල්ලා දීලා ගියේ කිව්වා.

දැන් වේලාව : ප.ව. 3.05

මෙතැන් සිට ල/ලේ : චන්දිමා මෙනවිය.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

වේලාව:ප.ව.3.05
පෙර සටහන් :ල/ලේ නිල්මිණි කුමාරි.
මෙතැන් සිට: චන්දිමා දිල්හානි.

ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනවිරත්න

ප්‍ර: දැන් ඒක තමා තමන් අහලා එන්න තිබුණේ තමන් මේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට ප්‍රකාශය දෙන්න කලින් නේද තමන් ඒක අහල දැන ගෙන එන්න ඕනේ තමන්ට සැකයක් තියෙනවානම්?

පි: මෙයා මෙම ස්ථානයට පැමිණියාට පස්සේ තමයි එම ප්‍රශ්නය ඇහුවේ ඒ වැරැද්ද මම පිළිගන්නවා.

****

ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා

ප්‍ර: ඔබ 2020 ජනවාරි 06 වෙනිදා නේද ලංකාවට ආපහු ආවේ?

පි: ඔව්.

ප්‍ර: එයාපෝර්ට් එකේ දී කට උත්තරයක් ගත්තා නේද?

පි: ඔව්.

ප්‍ර: කවුද ගත්තේ?

පි: CID කියලා කිව්වා.

ප්‍ර: ඒකේ මොකක්ද කිව්වේ?

පි: එහිදි මගේ ෆේස්බුක් එකේදී සහරාන් සමඟ ගණු දෙනු කරා කියලා තමයි මගේ ෆෝන් එක අරගෙන ප්‍රශ්න කරේ.මම විදේශ ගත වෙච්ච දිනය සහ ආපසු පැමිණි දිනය ගැන ප්‍රශ්න කරා.

ප්‍ර: වෙන මොනවද ඇහුවේ?

පි: විදේශ ගත වෙන්න ඉස්සර වෙලා කරපු රැකියාව කුමක්ද ඇක්සිඩන් වුනාද කියලා එහෙම ඇහුවා.

ප්‍ර: එතකොට අයිඩින්ටි කාඩ් එක ගැන ඇහුවද ?

පි: ඔව්.

ප්‍ර: මොකක්ද ඇහුවේ?

පි: ඔබ විදේශ ගත වෙන කොට කාට දීලා ගියාද නැත්නම් නැති වුනාද කියලා මගෙන් ප්‍රශ්න කරා.

ප්‍ර: එතාකොා මොකක් ද කිව්වේ?

පි: මම රිමිසාන්ට දුන්නා කියලා තමයි මම උත්තරය දුන්නේ.

ප්‍ර: ඒ අපරාධ පරීක්ෂණ දෙපාරතමේන්තුවට දුන්න කට උත්තරයේ කිව්වද අහන්න මේ අයිඩින්ටි කාඩ් එක මීට කලින් නැති වුණාද කියලා ?

පි: මම කිව්වේ නැහැ. ඔවුන් අහපු ප්‍රශ්නවලට පමණයි මම පිළිතුරු දුන්නේ.

ප්‍ර: අයිඩින්ටි කාඩ් එක ගැන ඇහුවා නේද?

Proceedings Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: විදේශ ගත වුණු අවස්ථාවේදී අයිඩින්ටි එක් කාටද දීලා ගියේ කියන එක තමයි මගෙන් ඇහුවේ.

ප්‍ර: එතකොට එහෙම නම් අයිඩින්ටි කාඩ් එක එක සැරයක් නැති වුණා කියන එක කිව්වේ නැත්තේ ඇයි?

පි: ඔහු මට කියා සිටියා අහන ප්‍රශ්නයට පමණක් උත්තර දෙන්න කියලා.

ප්‍ර: ඒයා ඇහුවානේ අයිඩින්ටි කාඩ් එක කාටද දීලා ගියේ කියලා?

පි: ඔව්.

ප්‍ර: රිම්සාන්ගේ නම විතර ද කිව්වේ අහන්න?

පි: ඔව්. රිම්සාන්ට දුන්නා කියලා තමයි කිව්වේ.

ප්‍ර: ඇත්ත වශයෙන්ම අයිඩින්ටි කාඩ් එක නැති වුනානම් එතකොට අයිඩින්ටි කාඩ් එක තවත් එක්කෙනෙක්ගේ අතට ගියා නේද ?

පි: ඔව්.

ප්‍ර: ඇයි ඒක කිව්වේ නැත්තේ?

පි: ඔවුන් මගෙන් ඒ ගැන ඇහුවේ නෑ ඒ නිසා මම කිව්වේ නෑ.

****

<u>ජ්‍යෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනවිරත්න</u>

ප්‍ර: දැන් තමන්ගෙන් ගුවන් තොටුපලේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේදී තමන්ගෙන් මේ නැතිවෙච්ච ජාතික හැඳුනුම්පත ගැන ප්‍රශ්න කරන කොට තමුන්ට ඒක වැදගත් කාරණයක් නෙමේ ද තමුන්ට සඳහන් කරන්න ජාතික හැඳුනුම් පත එක අවස්ථාවකදී නැති වුනා නම් ඒ ගැන?

පි: ඔව්.

ප්‍ර දැන් තමුන්ට දැනිමක් තියෙනවද ජාතික හැඳුනුම් පත කියන්නේ පුද්ගලයෙක්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමේ වැදගත්ම ලේඛනයක්?

පි: ඔව්.

ප්‍ර: දැන් ඒක යම් අවස්ථාවකදී තමුන් කියන විදියට ඒක නැතිවුනා නම් තව කෙනෙක් අතට පත් වුනා නම් ඒක පාවිච්චි කරලා වෙනත් අපරාධ වෙනත් එවැනි අපරාධ වලට යොදා ගන්න හැකියාවක් තිබෙන නිසා තමන්ට මේ ගැන විශේෂයෙන්ම පොලීසියට මේ ගැන දැනුම් දීමක් කල යුතුව තිබුණායි කියලා මා තමුන්ට යෝජනා කරනවා.

පි: මම පිළිගන්නවා ඒක ඇත්ත වශයෙන්ම නැතිවිච්ච බව මම ෆෙස් බුක් ඒක සම්බන්ධයෙන් සටහනක් දාලා තියෙනවා දැම්මා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබේ ෆේස් බුක් එකේ ද දැම්මේ?

පි: වයිෆ්ගේ අක්කාගේ ෆේස්බුක් එකේ තමයි දැම්මේ.

****

FAIR COMMENT BY JEZEEM

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනවිරත්න</u>

ප්‍ර: දැන් තමන් කියන්නේ ජාතික හැඳුනුම්පතක් නැතිවුණාම ඒ ගැන පොලීසියට දැනුම් දීමක් පැමිණිල්ලක් කරන් නැතිව ෆේස්බුක් එකේ දැම්මාම ඒක හරි ක්‍රමයක්ද?

පි: ජාතික හැඳුනුම් පත එක් දින රාත්‍රියක නැති වුණා පහුවෙනිදා පහට පමණ ඒක නැවත ලැබුණා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: එයාට කියන්න ජාතික හැඳුනුම්පත් අංකය කියන්න කියලා?

මේ අවස්ථාවේ දී සාක්ෂිකරු ඔහුගේ ෂර්ට් කමිසයේ උඩ සාක්කුවෙන් ලබාගත්ත ජාතික හැඳුනම්පත අතට අරගෙන අංකය ලබා දෙන බව සටහන් කර තබමි.

පි: 902772219 V

ප්‍ර: දැන් ඔය ෆේස්බුක් එකේ දානකොට අංකයක් දැම්මද?

පි: අයිඩින්ටි කාඩ් එකේ ඡායාස්ථ පිටපතක් මං ළඟ තිබුණා ඒකේ තමයි post එකක් අරගෙන තමයි ෆේස් බුක් දැම්මේ.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනවිරත්න</u>

ප්‍ර: දැන් තමන් කිව්වානේ තමන්ගේ බිරිඳගේ සහෝදරියගේ ෆේස්බුක් එකේ පොටෝ එකක දැම්මායි කියලා කිව්වේ තමන්ගේ ජාතික හැඳුනුම්පත නැතිවුණායි කියලා?

පි: ඔව්.

ප්‍ර: මොකක්ද ඒකේ දැම්මේ පෝස්ට් එකේ මොකක්ද තමන් දැම්මේ?

පි: මගේ අයිඩින්ටින්ටි කාඩ් එකේ ඉස්සරහා පැත්තත් පිටපස්ස පැත්තත් පොටෝ අරගෙන මෙම ජාතික හැඳුනුම්පත නැතිවෙලා තියෙනවා කියලා දැම්මා පෝස්ට් එකක්.

ප්‍ර: දැන් ඔය නැතිවෙච්ච එකේ කොහොමද මේ ඔය දෙපැත්තේ පොටෝකෝපි එකක් දැන්මේ තමන්?

පි: ගෙදර තිබුණා.

ප්‍ර: මොකක්ද ගෙදර තිබුණේ?

පි: අයිඩින්ටි කාඩ් එකේ පොටෝ කොපියක් ගෙදර තිබුණා.

ප්‍ර; දැන් ඔය තමන් ඒ ෆෙස්බුක් එකේ දාපු post එක දැනට අපට නැවත ලබා ගන්න හැකියාවක් තිබෙනවද තමන් ට ඉදිරිපත් කරන්නට හැකියාවක් තියෙනවාද?

පි: ඔව් පෝන් එකේ තියෙනවා කියලා කියන්නේ.

ප්‍ර: ෆේස් බුක් එකේ තියෙනවද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: දැන් මගේ පෝන් එකේ එයා පාවිච්චි කරපු ඇඩ්‍රස් එක දාලා පොටෝ එක තියෙනවා කියලා.

ප්‍ර: ෆේස්බුක් එකේද එම පොටෝ එක දැම්මේ?

පි: මගේ නෙමේ අක්කාගේ පෝන් එකෙන් තමයි පෝස්ට් එක දැම්මේ.

ප්‍ර: ෆේස් බුක් එකේ එම පොටෝ එක දැනුත් තියෙනවද?

පි: ඔව් තියෙනවා.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනවිරත්න</u>

ප්‍ර: දැන් තමන්ට තමන්ගේ ජංගම දුරකථනය දුන්නොත් ඒ පේස් බුක් එකට ගිහිල්ලා තමන්ට මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට පෙන්වන්න පුළුවන්ද?

පි: ඔව්.

ප්‍ර: දැන් අක්කා ඔය තමන්ගේ ඔය බිරිඳගේ සහෝදරිය තමන්ගේ ෆේස්බුක් ගිනුමේ තමන් friend කෙනෙක් කර ගෙන එහෙම කරගෙන තියෙනවද තමන්ට මේක මේ පොටෝස් share කරනවා කියන දේ කරන්න හැකියාවක් තිබෙනවා නේද එතකොට ඒක තමන්ගේ එකෙන් පෙන්වන්න තමන්ට හැකියාවක් නැද්ද?

පි: ඇය දැනට පාවිච්චි කරන ෆේස්බුක් එක වෙනයි කලින් පාවිච්චි කර එක වෙනයි.

****

<u>ගරු අදිකාරි මැතිණිය</u>

ප්‍ර: දැන් සාක්ෂිකරු කිව්වා සහරාන්ව ෆේස් බුක් එකෙන් ලයික් දැම්මා කියලා CID එක Question කරා කියලා සහරාන්ට ලයික් දැම්මේ කවදා ඉඳලාද ?

පි: මම ලයික් කරේ නැහැ

ප්‍ර: සහරාන්ව දන්නවද?

පි: මෙම සිද්ධියෙන් පස්සේ මම දන්නවා.

ප්‍ර: මොන සිද්ධියෙන් පස්සේද?

පි: බෝම්බ පිපිරීමේ සිද්ධිය

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධි නීතිඥ නයනා සෙනවිරත්න</u>

ප්‍ර: දැන් තමන් තමන්ගේ ඔය ජාතික හැඳුනුම්පත පාවිච්චි කරලා කාට හරි සිම්කාඩ් පතක් අරන් දීලා තියෙනවද?

පි: නැත.

ප්‍ර: මේ 0767998752 කියන දුරකථන අංකය තමන් කොයි යම් හෝ අවස්ථාවකදී පාවිච්චි කරලා තියෙනවද?

පි: නැත.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ අංකයෙන් තමන් පාවිච්චි කරන දුරකථනවලට ඇමතුම ලැබිලා තියෙනවද?

පි: නැත.

ප්‍ර: ඒ අංකයෙන් තමන් පාවිච්චි කරන දුරකථනවලට ඇමතුම් ලැබිලා තියෙනවද?

පි නැත.

ප්‍ර: දැන් මේ අංකය 0767998752 කියන අංකය කවුද පාවිච්චි කරන්නේ කියලා තමන් හොයලා බැලුවද තමන් දැනගත්තද?

පි: මං ලංකාවට ආවට පස්සේ තමයි මට දැනගන්න ලැබුණේ .

ප්‍ර: කවුද මේක පාවිච්චි කරන්නේ කියලා තමන් දන්නවද?

පි: සහරාන්ගේ මල්ලි මෙය පාවිච්චි කරලා තියෙනවා කියලා දැන ගන්නා ලැබුණා

ප්‍ර: සහරාන්ගේ මල්ලී කියන්නේ මොකක්ද නම ඒ පුද්ගලයාගේ නම?

පි දන්නේ නැහැ.

ගරු සභාපති තුමනි මේ අවස්ථාවේදී සාක්ෂිකරු ඔහුගේ සාක්ෂිකරුගේ බිරිඳගේ සහෝරියගේ මුහුණු පොත් ගිණුම පරීක්ෂා කර අදාල ඔහුගේ ජාතික හැඳුනුම්පතහි ඡායාරූපයක් සමඟ ඇති සටහන 2017.නොවැම්බර් 12 වෙනි දින අදාල මුහුණපොත් ගිණුමේ ඇති සටහනක් මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කර සිටියි. එය සම්භා සාතු SAMHASATHU වශයෙන් සඳහන් වී ඇති ගිණුමකට නම සටහන් වී ඇති බවත් ගෞරවයෙන් සැල කර සිටිනවා එහි ඡායාස්ථ පිටපත් එහි මුද්‍රිත පිටපතක් මේ අවස්ථාවේ දී ගරු කොමිෂන් සභාවට ඉදිරි පත් කර සිටිනවා. C 991 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවරස ඉල්ලා සිටිනවා.

ප්‍ර: තමන් අඳුරනවාද මොහොමඩ් මර්සුද් රිලා කියලා පුද්ගලයෙක්ව?

පි: නැහැ.

ප්‍ර: තමන් සෆ්රාස් කියන පුද්ගලයෙක්ව අඳුරනවාද?

පි: නැත.

ප්‍ර: තමන් වෛද්‍යවරයෙක් අඳුරනව වෛද්‍ය සෆ්රාස් කියලා?

පි: එරාවුල්ද

ප්‍ර: නෑ මරදමුල්ලේ?

පි: නැත.

ප්‍ර: තමන් අබ්දුල් රහුෆ් කියලා පුද්ගලයෙක් අඳුරනවද?

පි: නැත.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් වෙනත් ප්‍රශ්න නොමැති බව දන්නවයි. සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍ය ද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත්

FAIR COMMENT BY JEZEEM

හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසමි. අවශ්‍ය නොවන බව දන්වයි. සාක්ෂිකරු මුදා හරී.

මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දීම සඳහා එරාවුර් සිට පැමිණ ඇති බැවින් සාක්ෂිකරුට නීතියට අනුව හිමිවිය යුතු දීමනාව ලබා දෙන ලෙස කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

දැන් වේලාව. ප.ව 3.45

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.08.11 වේලාව: ප.ව. 05.40

සටහන් කළේ - සචිනි මදුෂිකා.

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය
-සාමාජික-

පෙනී සිටීම:-

* ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වන ගරු නීතිපතිතුමා වෙනුවෙන් අතිරේක සොලිසිටර් ජෙනරාල් ජනාධිපති නීතිඥ අජේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය, රජයේ අධිනීතිඥ දිලන්ත එස් කළුදුරුවගේ මහතා, රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, සහ රජයේ අධිනීතිඥ අරින්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* රෝමානු කතෝලික දේවස්ථානය වෙනුවෙන් අද දින ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා පෙනී සිටී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

මෙම අවස්ථාවේ සිට කොමිෂන් සභාවේ සාක්ෂි විමසීම මාධ්‍යයට විවෘතව පවත්වන බව සටහන් කර තබමි.

නම : තල්අඹර බුලත්ගේ සුරංග කල්යානතුංග.
වයස : අවු 41
ජාතිය : සිංහල
ආගම : බුද්ධාගම
දැනට දරණ තනතුර : ප්‍රධාන පොලිස් පරීක්ෂක ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ විමර්ශන ඒකකය.

ප්‍රතිඥා දී කැඳවයි.

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය.</u>

ප්‍ර: මහත්මයා ඔබ පොලිසියට බැඳුණේ මොන වසරේදී ද?

උ: 2001 ජනවාරී 14 වන දින නිත්‍යය සේවා ආධුනික උපපොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන් සේවයට බැඳුණා ස්වාමීනි.

ප්‍ර: වර්තමානයේ දී ඔබ ප්‍රධාන පොලිස් පරික්ෂක ධූරයේ කටයුතු කරනු ලබනවා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ පොලිස් පරීක්ෂක ධූරයට සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක ධූරයට උසස්වීම් ලැබුණේ කවදද?

උ: 2010 . 02 වැනි මස 08 වැනි දින පොලිස් පරික්ෂක තනතුරට උසස්වීම් ලැබුවා. 2019 .02 වැනි මස 08 වන දින ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම් ලැබුවා ස්වාමීනි.

ප්‍ර: මේ වන විට ඔබ ආසන්න වශයෙන් පොලිස් සේවය තුළ කොපමණ සේවා කාලයක් සම්පූර්ණ කරලා තියෙනව ද?

උ: අවුරුදු 20 ක පමණ සේවා කාලයක් ස්වාමීනි.

ප්‍ර: ඔබ දැනට මෙම ජනාධිපති කොමිෂන් සභාවේ පොලිස් විමර්ශන ඒකකයට අනුයුක්තව සේවය කරනු ලබනවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ ඊට පෙර අපරාධ විමර්ශන කටයුතු භාරව කටයුතු කරලා තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි. පොලිස් ස්ථාන 05 ක පමණ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති වශයෙන් සේවය කරලා තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබ මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයේ අද සාක්ෂිදීමට නියමිත යම්කිසි විශේෂ විමර්ශනයක් භාර නිලධාරියා විදියට ඔබ කටයුතු කරනු ලැබුවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකද්ද ඒ විමර්ශනය?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ස්වාමීනි 2018 අගෝස්තු මස 27 වැනි දින කොළඹ ජාතික රෝහලේ ඇඳහිසපත් අංක S 022231/18 යටතේ එම්.අයි. ෂහීඩ් නමින් රෝහල් ගත වූ පුද්ගලයා සම්බන්ධයෙන් විමර්ශනයක් කරා ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර: මේ අවස්ථාවේ දී ඇඳහිසපත් අංකය කියන්න?

උ: S / 022231/18.

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය.</u>

ප්‍ර: කොළඹ ජාතික රෝහලෙන් එකී ඇඳහිසපත් අංකයේ ප්‍රතිකාර සටහන් විමර්ශනයේ දී එහි මුල් පිටපත ඔබ කැඳවාගැනීමට පියවර ගත්ත ද?

උ: එහෙමයි ස්වාමීනි. කොළඹ ජාතික රෝහලේ අධ්‍යක්ෂකවරයා මගින් කොමිෂන් සභාවේ ගරු ලේකම්තුමා මඟින් යොමු කරන ලද ලිපියකට අනුව මුල් පිටපත් ගෙන්වා එහි පිටපත් ලබාගැනීමක් කරා ස්වාමීනි.

ප්‍ර: ඒ ඔබ පරිශීලනය කරාද ඒ ඔබේ කටයුතු අතර තුළදී?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එය නැවත දැක්කොත් හඳුනගන්න පුළුවන් ද?

උ: හැකියාව තිබෙනවා ස්වාමීනි.

මේ අවස්ථාවේ ස්වාමීනි ගෞරවයෙන් සැල කර සිටින්නේ ජාතික රෝහලේ අදාළ වෛද්‍ය වාර්තා භාර කටයුතු කරන නිලධාරියා මෙම ගරු කොමිෂන් සභාවේ පෙනී සිටින බවත් එම නිලධාරියා විසින් එකී මුල් පිටපත මේ අවස්ථාවේ දී ඉදිරිපත් කරන බවත්. එකී දැනටමත් C 598 වශයෙන් එහි පිටපත ලකුණු කර තිබෙනවා. මුල් පිටපත සාක්ෂිකරුට පෙන්වීමට අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර: ඔබ මේ දෙල්ගහගොඩ හිඟුල කියන ලිපිනයේ සාක්ෂිකරුට පෙන්වා සිටී. දැන් ඔබ විමර්ශනයේ දී පරීශීලනය කරන ලද S 022231/18 දරණ ඇඳහිසපත් අංක ප්‍රතිකාර සටහන් පොත වශයෙන් ඔබට හඳුනාගන්න පුළුවන් ද?

උ: එහෙමයි ස්වාමීනි. මා විසින් විමර්ශනයේ දී ගෙන්වා පරීශිලනය කරන ලද පිටපත් ලබාගත් එම ගොනුව තමයි ගරු අධිකරණයට ඉදිරිපත් කර තිබෙන්නේ ස්වාමීනි.

ප්‍ර: මෙම වාර්තාවේ සටහන් වන ආකාරයට රෝගියා කුමන නමකින් ද ඇතුළත් වෙලා තිබෙන්නේ?

උ: එම්.අයී. ෂහීඩ් නමින් ස්වාමීනි.

ප්‍ර: කවදද ඇතුළත් කරලා තිබෙන දිනය?

උ: ස්වාමීනි 2018/08 වැනි මස 27 වැනි දින.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: පැය කියට ද?

උ: පැය 11.42 ට ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ඔය වාර්තා පරීශීලනය කරලා කියන්න පුළුවන්ද රෝගීයගේ භාරකරු වශයෙන් නම සටහන් වෙන්නේ කවර පුද්ගලයෙකුගේ ද කියලා?

උ: එහෙමයි ස්වාමීනි. එම්.අයි. සාදික්, නොම්බර 14 , දෙල්ගහගොඩ , හිඟුල යන අය තමයි ස්වාමීනි භාරකරු හැටියට සඳහන් වෙන්නේ.

ප්‍ර: ඔබ මේ දෙල්ගහගොඩ හිඟුල කියන ඒ ලිපිනයේ එවැනි ආකාරයේ ලිපිනයක් තිබෙනව ද කවුරුද එහි පදිංචි වෙලා ඉන්නේ කියලා විමර්ශනයේ දී හොයලා බැලුවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොනවද ඔබට අනාවරණය වුණේ?

උ: ස්වාමීනි මේ වන විට එවැනි ලිපිනයක් නොමැති බවත් මීට පෙර මොහොමඩ් ඊබ්‍රාහිම් පවුල විසින් ඔවුන්ගේ තැපැල් කටයුතු සඳහා මෙම ලිපිනය භාවිතා කළ බව අනාවරණය වුණා ස්වාමීනි.

ප්‍ර: මොහොමඩ් ඊබ්‍රාහිම් පවුල කියලා මොකද්ද ඔබ අදහස් කරන්නේ වැඩිදුරටත් පැහැදිලි කරන්න?

උ: ස්වාමීනි මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික්, මොහොමඩ් ඊබ්‍රාහිම් සහීඩ් කියන ඒ පවුලේ අය විසින් මෙම ලිපිනය භාවිතා කර තිබුණා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා මෙම ඇදහිසපතේ භාරකරු වශයෙන් සටහන් කර තිබෙන්නේ එම්.අයි. සදීක් කියලා පුද්ගලයෙක්ගේ නමක් කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එසේම ඒ ඇදහිසපතේ භාරකරුගේ යම්කිසි දුරකථන අංකයක් සටහන් කරලා රෝහලට ලබාදීමක් සිද්ධ කරලා තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකද්ද ලබාදීලා තිබෙන අංකය?

උ: ස්වාමීනි 0783321886 කියන දුරකථන අංකය ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ විමර්ශනයේ දී පියවර ගත්ත ද මේ 0783321886 කියන සිම් කාඩ්පත කුමන ආයතනයෙන් ද නිකුත් කර තිබෙන්නේ ඒක කාටද නිකුත් කර තිබෙන්නේ කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොනව ද ඔබේ නිරීක්ෂණය ?

උ: ස්වාමීනි මෙම දුරකථනය Hutch දුරකථන සමාගමෙන් නිකුත් කළ දුරකථන අංකයක්. එහි අයිතිකරුගේ විස්තර සහ 2018 මැයි මස 31 වන දින සිට 2019 මැයි මස 31 වන දින දක්වා ලබාගත් හා ලැබුණු ඇමතුම් සම්බන්ධයෙන් කුළුණු විස්තර වාර්තාවක් ගරු ලේකම්තුමාගේ අත්සනින් යුතුව මා විසින් කැඳවනු ලැබුවා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මුලින්ම කියන්න මෙම Hutch සමාගමෙන් කා වෙත ද නිකුත් කරලා තියෙන්නේ? අර Subscriber information තියෙන්නේ. පරිභෝගියා කවුද කියලා. ඒ ලේඛනය තිබෙනව ද මේ අවස්ථාවේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ලේඛනය අනුව කුමන පුද්ගලයෙකුට නිකුත් කරලා තියෙන්නේ?

උ: ස්වාමීනි මෙහි නමක් සහ ලිපිනයක් සඳහන් වුණේ නැහැ මේ වාර්තාවේ. ජාතික හැඳුනුම්පත් අංකයක් පමණක් සඳහන් වුණා ස්වාමීනි.

ප්‍ර: ඇයි ඒ නමක් සඳහන් වෙන්නේ නැත්තේ කියලා ඔබ හොයලා බැලුව ද?

උ: එහෙමයි ස්වාමීනි. මම එම දුරකථන සමාගමේ නිලධාරියෙක් වෙත දුරකථනයෙන් කතා කරලා ඒ සම්බන්ධයෙන් විස්තර විමසා සිටියා ස්වාමීනි. ඔහු දන්නවා සිටියේ ඔවුන්ගේ පරිගණකගත දත්තවල එම තොරතුරු සඳහන් නොවන බව ස්වාමීනි.

ප්‍ර: කොයි කාලෙද මේක ලබාගෙන තිබෙන්නේ සිම් කාඩ්පත?

උ: ස්වාමීනි 2017.07 වැනි මාසේ 12 වැනි දින ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ කිව්වා නමුත් යම් කිසි ජාතික හැඳුනුම්පත් අංකයක් සටහන් වෙනවා කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකද්ද ඒ අංකය?

උ: 199529004592.

ප්‍ර: ඒ වාර්තාව ඔබට මේ අවස්ථාවේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාව තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

උතුමාණනි මෙම Hutch සමාගමෙන් දුරකථන අංක 0783321886 දරණ සිම්කාඩ් පත සම්බන්ධයෙන් නිකුත් කර ඇති වාර්තාව C 992 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කර ලබනවා.

ප්‍ර: දැන් ඔබ කිව්වා C 992 ලේඛනයේ ජාතික හැඳුනුම්පත් අංකයක් සටහන් වුණයි කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ ඒ ජාතික හැඳුනුම්පත් අංකය සම්බන්ධයෙන් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් සොයා බැලුවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොනවද ඔබට දැනගන්නට ලැබුණේ?

උ: ස්වාමීනි එම අංකයට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ තොරතුරු නැති බවට තමයි ස්වාමීනි වාර්තාව ලැබී තිබෙන්නේ ස්වාමීනි.

ප්‍ර: තොරතුරු නැහැ කියලා කියන්නේ මොකද්ද පැහැදිලි කරන්න ඒක ?

උ: ස්වාමීනි පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ජාතික හැඳුනුම්පත් අංක වලට අදාළව තියෙන පරිගණක දත්ත අනුව මෙම අංකයට හැඳුනුම්පතක් නිකුත් කර නොමැති බව තමයි සඳහන් වෙන්නේ ස්වාමීනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මේ ගරු කොමිෂන් සභාවට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කවර නිලධාරීයෙක් විසින් ද මෙම වාර්තාව ඉදිරිපත් කරලා තියෙන්නේ ?

උ: ස්වාමීනි A.W.H.I.P ස්වාමීනි ඡායා පිටපතක් තියෙන්නේ ස්වාමීනි. සහකාර කොමසාරිස් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව කොළඹ.

ප්‍ර: එකී වාර්තාවේ දිනය කවදද?

උ: ස්වාමීනි 2019/08 වැනි මාසයේ 16 වැනි දින.

ප්‍ර: ඒ වාර්තාවේ පිටපතක් මේ අවස්ථාවේ දී ඔබට ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.
අංක 952904592v දරණ ජාතික හැඳුනුම්පතට අදාළව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කර ඇති එකී වාර්තාව C 993 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් ඔබට විමර්ශනයේ දී අනාවරණය වුණා ද මේ දුරකථන අංකය 0783321886 දරණ දුරකථන අංකය විසන්ධි කරලා තියෙන දිනය කවදද කියලා?

උ: එම වාර්තාව කැඳවන අවස්ථාවේ දී ස්වාමීනි ලැබී තිබුණේ නැහැ ස්වාමීනි. විසන්ධි කල දිනයක් සටහන් වෙන්නේ නැහැ ස්වාමීනි. Status terminated කියලා තියෙනවා ස්වාමීනි. දිනයක් නැහැ ස්වාමීනි. ස්වාමීනි පසුව ගත් වාර්තාවක සඳහන් වෙනවා . ස්වාමීනි Hutch දුරකථන සමාගමෙන් දීලා තියෙන්නේ නව අංකය ස්වාමීනි. මේ නව අංකයට අදාළ පැරණි අංකය තමයි ස්වාමීනි මා භාරයේ තියෙනවා ස්වාමීනි Hutch එකේ පැරණි අංකයටත් ලබාගත් වාර්තාව ස්වාමීනි. ස්වාමීනි ජාතික හැඳුනුම්පතේ ඉලක්කම් 09 කින් එන අංකය සහ පසුව හඳුන්වාදුන් ඉලක්කම් 12 කින් එන අංකය වශයෙන් තියෙනවා.

ප්‍ර: දැන් මහත්මයා නැවතත් පැහැදිලි කරගන්න අහන්නේ. දැන් ඔබ කිව්වා මේ දුරකථන අංක 0783321886 කියන දුරකථන අංකය කාටද නිකුත් කරලා තියෙන්නේ කියලා ඔබ Hutch සමාගමෙන් වාර්තාවක් කැඳෙව්වයි කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ඔබට ජාතික හැඳුනුම්පත් අංකයක් තමයි ලබාදුන්නේ කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ ජාතික හැඳුනුම්පත් අංක අලුත් සහ පරණ කියලා දෙකක් තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මුලින් කියන්න පරණ ජාතික හැඳුනුම්පත් අංකය?

උ: 952904592 v .

ප්‍ර: නව ජාතික හැඳුනුම්පත් අංකය ?

උ: 199529004592

FAIR COMMENT BY JEZEEM
President's Secretary's Copy

ප්‍ර: දැන් ඒ පරණ ජාතික හැඳුනුම්පත් අංකය සහ නව ජාතික හැඳුනුම්පත් අංකය අතර මොකද්ද තියෙන වෙනස?

උ: ස්වාමීනි මුලට උපන් අවුරුද්දේ මුල් ඉලක්කම් දෙක එකතුවෙනවා ස්වාමීනි. ඊට පසුව පැරණි අංකයේ මැද ඉලක්කමට පෙර "0" ක් එකතුවෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ මොහොතකට කලින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් මේ වාර්තාවක් කැඳෙව්වේ මේ අලුත් ජාතික හැඳුනුම්පත් අංකයට ද පරණ ජාතික හැඳුනුම්පත් අංකයට ද?

උ: පැරණි ජාතික හැඳුනුම්පත් අංකයට ස්වාමීනි.

ප්‍ර: එකී වාර්තාවේ ඒ මුල් පරණ සහ අලුත් ජාතික හැඳුනුම්පත් අංක දෙකම ගැන සටහන් වෙන්නේ නැද්ද?

උ: නැහැ ස්වාමීනි පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ලැබුණු වාර්තාවේ සටහන් වෙන්නේ පැරණි අංකය ස්වාමීනි.

ප්‍ර: ඇයි ඒ පැරණි අංකය පමණක් සටහන් වෙන්නේ ?

උ: ඒ ගැන ස්වාමීනි මට අවබෝධයක් නැහැ.

ප්‍ර: ඒ අදාළ ප්‍රශ්නාවලිය යවන කොට අලුත් සහ පරණ කියන අංක දෙකම ඔවුන් වෙත ලබාදීලා ඒ සම්බන්ධයෙන් විමසීමක් සිද්ධ කරන්නේ නැද්ද?

උ: පැරණි අංකයෙන් තමයි ස්වාමීනි විමසීම කළේ.

ප්‍ර: ඒ අනුව තමයි ඔබට කලින් සඳහන් කරපු පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ එකී වාර්තාව ඔබ වෙත ලැබුණේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ වැඩිදුරටත් සඳහන් කරා 0783321886 කියන දුරකථන අංකයට අදාළව දුරකථන විශ්ලේෂණ වාර්තාවක් සහ කුළුණු වාර්තාත් ඔබ කැඳවනු ලැබුවයි කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: කුමන කාල පරිච්ඡේදයට අදාළව ද එකී වාර්තාව කැඳවනු ලැබුවේ?

උ: ස්වාමීනි 2018/05 වැනි මාසේ 31 වන දින 2019/05 වැනි මාසේ 31 වැනි දින දක්වා ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ අවසාන වශයෙන් වසර කාලයක්?

උ: වසරක කාලයක් සඳහා පමණි.

ප්‍ර: කුමන ආයතින්ද එකී වාර්තා කැඳෙව්වේ?

උ: Hutch දුරකථන සමාගමෙන් ස්වාමීනි.

ප්‍ර: එහි එකී වාර්තාවේ පිටපතක් ඔබට මේ අවස්ථාවේ දී මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාව තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි හැකියාව තිබෙනවා.

මේ අවස්ථාවේ දී සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලබන 0783321886 දරණ දුරකථන අංකයට අදාළව 2018.05.31 වන දින සිට 2019.05.31

Register General's Copy
FAIR COMMENT BY JEZEEM

කාලවකවානුවට අදාළව දුරකථන විශ්ලේෂන සහ කුළුණු වාර්තා ඇතුළත් මෙම වාර්තාව C 994 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මහත්මයා ඔබ මේ C 994 දරණ වාර්තාව පරිශීලනය කරනු ලැබුව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ 2018.08 වැනි මාසේ 26 වන දින සහ 2018.08 වන මාසේ 27 කියන කාලවකවානුවට අදාළව මෙම දුරකථන අංකය භාවිතා කරපු පුද්ගලයා නැත්නම් ඒ දුරකථනයේ රැඳී තිබෙන්නේ කොයි ප්‍රදේශ වලද කියලා ඔබේ විමර්ශනයේ දී සොයලා බැලුවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබට ඒ වාර්තාව පරිශීලනය කරලා ඒ සම්බන්ධයෙන් මේ ගරු කොමිෂන් සභාවට වැඩිදුර සාක්ෂිදෙන්න පුළුවන් ද ?

උ: එහෙමයි ස්වාමීනි හැකියාවක් තියෙනවා.

ප්‍ර: ඒ අනුව 2018.08 වන මාසේ 26 දිනෙන් පටන් ගෙන මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරාද?

උ: එහෙමයි ස්වාමීනි. ස්වාමීනි 2018.08 වන මාසේ 26 දින පැය 23.36 වන විට එම දුරකථනය ක්‍රියාත්මක වෙලා තිබෙනවා ස්වාමීනි හම්බන්තොට 03 කියන කුළුණ යටතේ ස්වාමීනි. ඉන්පසු ස්වාමීනි එම කුළුණ යටතේ 2018.08 වැනි මාසේ 27 වන දින පැය 04.10 දක්වා හම්බන්තොට 03 කුළුණ යටතේ දුරකථන සංවාද 04 ක් පමණ සිදුවෙලා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: ඒ දුරකථන අංක මොනවද කියලා ඔබට මේ අවස්ථාවේ සඳහන් කරන්න පුළුවන් ද?

උ: එහෙමයි ස්වාමීනි. 08 වැනි මාසේ 26 වන දින පැය 23.36 ට සම්බන්ධ වෙන්නේ ස්වාමීනි 0770771758 කියන දුරකථන අංකය සමඟ ස්වාමීනි. නැවතත් ස්වාමීනි 08 වැනි මාසේ 27 වැනි දින පැය 00.39 ට සම්බන්ධ වෙනවා ස්වාමීනි 0779197575 කියන අංකයට ස්වාමීනි. නැවත 2018.08 වැනි මාසේ 27 වන දින පැය 00.46 ට එම අංකයටම සම්බන්ධ වෙනවා ස්වාමීනි. ඉන්පසු ස්වාමීනි 08 වැනි මාසේ 27 දින පැය 04.10 ට 0777849916 කියන දුරකථන අංකය සමඟ සම්බන්ධ වෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ කිව්වා රාත්‍රී 11.31 ත් පාන්දර 04.10 ත් අතර 2018.08 වන මාසේ 26 වැනිදා වෙන කොට හම්බන්තොට ප්‍රදේශයේ කුළුණක තමයි මේක වාර්තා වෙන්නේ කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඉන්පස්සේ කුළුණු වාර්තා අනුව මොකද්ද නිරීක්ෂණය වෙන්නේ ?

උ: ස්වාමීනි 2018/08 වැනි මාසේ 27 වන දින පැය 06.18 ට දුරකථන සංවාදයක් සටහන් වෙනවා ස්වාමීනි එහි පාතේගම 02 කියන දුරකථන කුළුණ තමයි තියෙන්නේ ස්වාමීනි. මෙය මාතර ප්‍රදේශයේ කුළුණක් ස්වාමීනි. ඉන්පසුව 2018.08.27 වන දින පැය 06.55 ට මාතර bus stand 02 කියන කුළුණෙන් සංවාදයක් සම්ප්‍රේෂණය වෙනවා ස්වාමීනි. එම කුළුණ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පැය 06.56 ටත් සංවාදයක් සටහන් වෙනවා ස්වාමීනි. ඉන්පසුව 2018.08.27 වන දින පැය 08.07 ට වැලිපැන්න 03 කියන දුරකථන කුළුණෙන් සංවාදයක් සටහන් වෙනවා ස්වාමීනි. ඉන්පසු ස්වාමීනි එදිනම පැය 08.48 ට මාලඹේ 02 කියන කුළුණෙන් සංවාදයක් සටහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් යම් පුද්ගලයෙක් කොළඹ මාතර දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගමන් කරනවා නම් ඔය ඔබ සටහන් කරපු කුළුණු වාර්තා හා යම්කිසි ආකාරයක සැසැඳීමක් තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි වැලිපැන්න කුළුණ සම්බන්ධ වෙන්නේ දක්ෂිණ අධිවේගී මාර්ගය හරහා ගමන් කරන පුද්ගලයෙක් ගමන් කරොත් පමණයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ කිව්වා මාලඹේ ප්‍රදේශය සම්බන්ධව?

උ: එහෙමයි ස්වාමීනි. අතුරුගිරිය හුවමාරුවෙන් යම්කිසි පුද්ගලයෙක් පිටත් වුණොත් එළියට පැමිණියොත් ස්වාමීනි මේ මාලඹේ කුළුණෙන් සටහන් වෙන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: ඉන් අනතුරුව ඒ ගමන් මාර්ගයේ මොන ආකාරයට ද කුළුණු වාර්තා අනුව ඔබට නිරීක්ෂණය වුණේ ?

උ: ස්වාමීනි 2018.08.27 දින 10.07 ට ඔරුගොඩවත්ත 1803 කියන කුළුණෙන් සම්බන්ධ වෙනවා ස්වාමීනි. ඉන්පසුව 10.17 ට mount පේරි one කියන කුළුණෙන් සම්බන්ධතාවයක් ඇති වෙනවා ස්වාමීනි. ඒ අවස්ථා දෙකකදී සිදුවෙනවා ස්වාමීනි. එම කාලපරාසය ආසන්නයේ. 2018.08.27 වැනි දින පැය 10.48 ට ස්වාමීනි general hospital 03 කියන කුළුණෙන් සම්බන්ධතාවයක් සටහන් වෙනවා ස්වාමීනි. මේ ජාතික රෝහල ආවරණය වෙන කුළුණෙන් සම්බන්ධතාවය සටහන් වෙනවා ස්වාමීනි 08 වැනි මාසේ 27 වැනි දින පැය 10.48 ට පමණ ස්වාමීනි.

ප්‍ර: දැන් 2018.08 වැනි මාසේ 27 වැනිදා 10.48 ට වාර්තා වෙනවා කියලා ඔබ සඳහන් කරා කොළඹ ජාතික රෝහල අසල කුළුණකින් ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ කලින් සඳහන් කරා මේ රෝගියා රෝහලට ඇතුළත් කරලා තියෙන්නේ වේලාව කියද ඔබ සටහන් කළේ?

උ: ස්වාමීනි පැය 11.42 ට.

ප්‍ර: ඒ අනුව ඒ කාලවකවානුව හා ස්ථාන සැසඳීමක් තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි සැසඳීමක් තිබෙනවා ස්වාමීනි.

මේ අවස්ථාවේ දී දැනටමත් C 994 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයේ 2018.08.26 දිනට අදාළ කුළුණු වාර්තා C 994 A වශයෙනුත් 2018.08.27 දිනට අදාළ කුළුණු වාර්තා දත්තයන් ඇතුළත් කොටස C 994 B වශයෙනුත් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මහත්මයා ඔබ ඔය කුළුණු වාර්තා සහ රෝහලට ලබාදී ඇති ඒ කුළුණු වාර්තාවල සඳහන් වී ඇති දුරකථන අංක අනුව හම්බන්තොට ප්‍රදේශයේ

FAIR COMMENT BY JEZEEM

සිට තමයි ඔබට ඒ කුළුණු වාර්තා අනුව යම්කිසි පුද්ගලයෙක් රෝහල වෙත පැමිණ සටින්නේ කියලා ඔබට අනාවරණය වෙන්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ අතරතුරෙත් ජාතික රෝහල් ගණනාවක් පසුකරමින් ගමන් කළ යුතු වෙනවා නේද?

උ: එහෙමයි ස්වාමීනි. ප්‍රධාන රෝහල් ගණනාවක් පසු කරමින් ගමන් කරමින් සිදු වෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ විමර්ශනයේ දී සොයා බැලීමක් සිදුකරනු ලැබුව ද මේ එම්.අයි. ෂාහිඩ් නමින් ඇතුළත් වෙච්ච රෝගීයා පිට පළාතක විශේෂයෙන්ම පුද්ගලයෙක් කොළඹ ජාතික රෝහලට කොහොමද එකපාරටම මේ ඇතුළත් වෙලා තියෙන්නේ කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් සොයලා බලන කොට ඔබට විමර්ශනයේ දී යම්කිසි කරුණු අනාවරණය වීමක් වුණා ද?

උ: එහෙමයි ස්වාමීනි. මීට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනයක් සිදු කරලා තිබුණා මා විමර්ශන ආරම්භ කරන කොට. ඒ අත්අඩංගුවේ පසු වූ සැකකරුවන් සහ එම ප්‍රකාශ පරිශීලනය කිරීමේ දී යම්කිසි විදේශගත වී සිටි පුද්ගලයෙක් කොළඹ ජාතික රෝහලේ සේවය කරන වෛද්‍යවරයෙකු හා සම්බන්ධවෙලා ඒ සඳහා උපදෙස් ලබාදීමක් සිදු කරලා තියෙනවා කියලා අනාවරණය වුණා ස්වාමීනි.

ප්‍ර: දැන් ඒ විදේශගතව සිටි පුද්ගලයා සහ ජාතික රෝහලේ වෛද්‍යවරයාගේ නම් මොනවද?

උ: ස්වාමීනි විදේශගත සිටි පුද්ගලයා මොහොමඩ් රිලා මර්සු යන පුද්ගලයා මට අනාවරණය වුණා ස්වාමීනි. කොළඹ ජාතික රෝහලේ වෛද්‍යවරයා මොහොමඩ් සෆ්රාස් මොහොමදු සුෆියාන් මොහොමදු සෆ්රාස් යන අය බවත් අනාවරණය වුණා ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

මෙම විමර්ශන කොටස සම්බන්ධයෙන් පසුගිය දිනයේ දී සාක්ෂි මෙහෙය වීමේ දී මාධ්‍යයෙන් ඉල්ලීමක් කෙරුවා මෙම වෛද්‍යවරයාගේ නම පළ කරන්න එපා කියලා. ඒක හින්දා ඒක පළ කෙරුවේ නැහැ කියලා අපි දන්නවා. ඒක හින්දා මේ පාරත් වෛද්‍යයවරයාගේ නම පළ කරන්න එපා මොකදව ඔහුත් දැනටත් සේවයේ යෙදී ඉඳලත් අපේ මේ විමර්ශන අවසන් වෙලා නැති හින්දා.

****

FAIR COMMENT BY JEZEEM

<u>ජ්‍යෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය.</u>

ප්‍ර: දැන් ඔබ සඳහන් කරා 10.48ට කොළඹ ජාතික රෝහල මෙම කුළුණු වාර්තා අනුව මෙම දුරකථන වාර්තා කළ පුද්ගලයා රැඳිසිටි බවට වාර්තා වන බවට ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබේ වැඩිදුර විමර්ශන කටයුතුවලදී දැනටමත් C 598 කියලා ලකුණු කරලා ඉදිරිපත් කරපු ඇදහිසපතේ රෝගියාට පොලිස් පරීක්ෂණ අනවශ්‍යයි කියලා සටහන් වෙච්ච කාරණයක් සම්බන්ධයෙන් විමර්ශනය කරා ද ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැනටමත් C 598 A වශයෙන් ලකුණු කර ඇති ද්‍රවිඩ භාෂාවෙන් ලියා ඇති කොටසක් කෙරෙහි සාක්ෂිකරුගේ අවධානය යොමු කරනවා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරාද?

උ: විමර්ශනය කර දමිළ පරිවර්තකයෙක් ලවා මේ සම්බන්ධයෙන් කියවා බැලුවා ස්වාමීනි. එහි දී පොලිස් පරීක්ෂණ අවශ්‍යය නොවේ යන්න තමයි දමිළ භාෂාවෙන් සඳහන් කරලා තියෙන්නේ කියලා අනාවරණය වුණා ස්වාමීනි. එහි අගින් ඉංග්‍රීසි බසින් සාදික් ලෙස අත්සනක් යොදා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබේ විමර්ශන කටයුතුවලදී මේ ගරු කොමිෂන් සභාවේ ලේකම්වරයා මාර්ගයෙන් රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ අත්අකුරු පිළිබඳ විශේෂඥවරයාගෙන් මෙම ද්‍රවිඩ භාෂාවෙන් ලියා ඇති කොටස සම්බන්ධයෙන් වැඩිදුර වාර්තාවක් කැඳවීමට පියවර ගත්ත ද ?

උ: එහෙමයි ස්වාමීනි. තාම වාර්තාව ලැබිලා නැහැ ස්වාමීනි.

ප්‍ර: නැවත කියන්න ඒ මොකද්ද කියලා?

උ: ඒ සම්බන්ධයෙන් පියවර ගත්තා ස්වාමීනි. අදාළ ආයතනයට යොමු කරලා තියෙනවා ස්වාමීනි. තවම වාර්තා ලැබිලා නැහැ ස්වාමීනි.

ප්‍ර: අදාළ ආයතනය කියලා ඔබ අදහස් කරන්නේ රජයේ රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අත්අකුරු පිළිබඳ විශේෂඥවරයාගේ මතය සම්බන්ධයෙන් වාර්තාවක් කියලා කිව්වොත් ඒක නිවැරදිද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් එසේම එකී වාර්තාවේ මෙම ඇදහිසපතේ 02 වැනි පිටුවේ සුදුසු නිර්වින්දනය යටතේ එසේ සිදුවන සැත්කමට කැමැත්ත පළ කරමි කියලා සිංහලෙන් ලියා ඇති සටහනකට පසුව යම්කිසි ද්‍රවිඩ භාෂාවෙන් අත්සනක් යොදල දුරකථන අංකයකුත් යොදලා තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ද්‍රවිඩ භාෂාවෙන් ලියා ඇති අත්අකුරු සහ එකී අත්සන සම්බන්ධයෙනුත් පෙර කී ආකාරයටම ඔබ මේ ගරු කොමිෂන් සභාවේ ලේකම්තුමා මාර්ගයෙන් රජයේ රස පරීක්ෂක අංශයේ දෙපාර්තමේන්තුවේ වාර්තාවක් කැඳවීමට පියවර අරගෙන තියෙනව ද?

FAIR COMMENT BY JEZEEM

උ: ඒ සම්බන්ධයෙන් ස්වාමීනි මේ වන තෙක් යොමු කර නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් ඔබ මැදිහත් වුණේ ?

උ: මා මැදිහත් වුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ කිව්වා මේ කොළඹ ජාතික රෝහලේ වෛද්‍යය සෆ්රාස් කියලා පුද්ගලයෙක් සම්බන්ධයෙන් ඔබේ විමර්ශනයේ දී අනාවරණය වුණායි කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව මේ වෛද්‍ය සෆ්රාස් කියන පුද්ගලයා සම්බන්ධයෙන් ඔබ විමර්ශනය කරාද?

උ: එහෙමයි ස්වාමීනි. ලේකම්තුමාගේ අත්සනින් යුතුව ලිපියක් යොමු කරලා කැඳවා ප්‍රකාශ සටහන් කරා ස්වාමීනි.

ප්‍ර: ඊට අමතරව ඔබ එම වෛද්‍ය සෆ්රාන් යන අයගේ ජංගම දුරකථනය සම්බන්ධයෙන් සහ ජංගම දුරකථනයෙහි විශ්ලේෂණ වාර්තාවන් කැඳවීමට පියවර ගත්ත ද?

උ: එහෙමයි ස්වාමීනි.

දැනටමත් C 661 වශයෙන් ලකුණු කර ඇති ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වා සිටී.

ප්‍ර: ඒ අනුව වෛද්‍ය සෆ්රාස් යන අය අදාළ කාලවකවානුවේ දී පාවිච්චි කරලා තිබෙන දුරකථනයේ අංකය කුමක් ද?

උ: ස්වාමීනි 0772276655

ප්‍ර: දැන් ඔබ ඒ අනුව C 661 කියන ලේඛනය හඳුනගන්නව ද?

උ: එහෙමයි ස්වාමීනි. මා විසින් කැඳවන ලද වාර්තාවක් ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව ඒ සිම්කාඩ් පත යොදාගෙන පාවිච්චි කරලා තිබෙන ජංගම දුරකථනය කුමක්ද ඒකේ ඉමී Number එකද මොකද්ද අංකය ඒ වාර්තාවේ සටහන් වෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි සටහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර: මොකද්ද අංකය?

උ: ඉමී අංකය ලෙස 355440079893390 කියන අංකය සටහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් මේ දුරකථන විශ්ලේෂණ වාර්තාවට අමතරව මෙම වෛද්‍ය සෆ්රාස් විසින් භාවිතා කරන ලද අදාළ ජංගම දුරකථනය සම්බන්ධයෙන් වෝහාරික digital වාර්තාවක් කැඳවීමටත් පියවර ගත්ත ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කුමන ආයතනයෙන් ද මොන ආකාරයට ද ?

උ: ස්වාමීනි ශ්‍රී ලංකා හදිසි පරිගණක ප්‍රතිචාර සංසඳයෙන් මා විසින් ලේකතුමාගේ අත්සනින් යුතුව වාර්තාවක් කැඳවනු ලැබුවා ස්වාමීනි.

ප්‍ර: **CERT** කියලා කෙටි ඉංග්‍රීසි වචනයෙන් ආයතනය කිව්වොත් ඒක නිවැරදි ද?

Registered Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: එහෙමයි ස්වාමීනි. මේ මොහොමදු සෆ්රාස් යන වෛද්‍යයවරයාගේ එම කාල තුළ භාවිතා කළ ජංගම දුරකථනය කැඳවා මෙම දුරකථන වාර්තාව සමඟ සංසන්දනය කර බැලුවා ඒකේ ඉමි අංකය හා ගැළපීමක් තිබෙනව ද කියලා ඒ අනුව එම ගැළපෙන දුරකථනය මා විසින් භාරයට ගෙන **CERT** ආයතනයට යොමු කර වාර්තාවක් කැඳෙව්වා ස්වාමීනි.

ප්‍ර: වෛද්‍යය සෆ්රාස් යන අයගේ ජංගම දුරකථනය විමර්ශනය අතරතුර දී ඔබ භාරයට ගත්තේ කවදද?

උ: ස්වාමීනි 2020.06 වැනි මාසේ 10 වැනි දින ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව **CERT** ආයතනයෙන් අදාළ ජංගම දුරකථන වාර්තාව වෝහාරික වාර්තාව ලබාදීලා තියෙන්නේ ?

උ: ස්වාමීනි 2020.07 වැනි මාසේ 30 මා වෙත වාර්තාව ලබාදෙනවා ස්වාමීනි.

ප්‍ර: එය කවුරුන් විසින් ද විශ්ලේෂණය කර වාර්තාව ලබාදීලා තියෙන්නේ?

උ: ස්වාමීනි ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදයේ තොරතුරු ආරක්ෂණ ඉංජිනේරු ආර්.එම්.රවිඳු විජේබණ්ඩාර මීගස්මුල්ල මහතා විසින් තමයි එම වාර්තාව ලබාදුන්නේ ස්වාමීනි.

ප්‍ර: එකී වාර්තාව මේ අවස්ථාවේ දී ඔබ භාරයේ තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි. එහි පිටපතක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔබට මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනව ද?

උ: තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් එකී ඒ වාර්තාව CD තැටියක අන්තර්ගත කරලා ලබාදීලා තියෙනවා කියලා කිව්වොත් ඒක නිවැරදිද?

උ: එහෙමයි ස්වාමීනි. මුද්‍රිත පිටපතක් සහ CD තැටියකින් එම වාර්තාව මා වෙත ලබාදුන්නා ස්වාමීනි.

මේ අවස්ථාවේ දී සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරනු ලබන සර්ට් ආයතනයේ ශ්‍රී ලංකා CERT යන ආයතනයේ රවිඳු විජේබණ්ඩාර යන නිලධාරියා විසින් සකස් කරලා ඉදිරිපත් කරන ලද වාර්තාව C 995 ලෙසත් එකී වාර්තාවේ CD තැටියක අඩංගු කරලා තිබෙනවා එය C 995 A වශයෙනුත් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මහත්මයා ඔය **CERT** ආයතනයෙන් මෙම ගරු කොමිෂන් සභාවේ විමර්ශනයේ දී ඔබ ඔය ජංගම දුරකථනය සම්බන්ධයෙන් වාර්තාව කැඳවන්න කලින් එකී වෛද්‍ය සෆ්රාස් යන අයගේ ජංගම දුරකථනය වෙනත් විමර්ශන ආයතනයක් මඟින් භාරයට ගෙන වෝහාරික වාර්තාවක් කැඳවීමට පියවර ගෙන තිබූ බවට ඔබට විමර්ශනයේ දී අනාවරණය වුණාද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කවර ආයතනය විසින් ද?

උ: අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව මඟින් මෙම දුරකථනය භාරයට ගෙන වාර්තාවක් කැඳවලා තිබුණා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ අනුව ඒ වාර්තාව කැඳවලා තිබෙන්නේ ඔබ විසින් මේ **CERT** ආයතනයට වාර්තාව කැඳවන්න කලින් කියලා කිව්වොත් ඒක නිවැරදිද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: කවදද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වෛද්‍ය සෆ්රාස් යන අයගේ ඒ ජංගම දුරකථනයට අදාළ වාර්තාව කැඳවලා තිබෙන්නේ ?

උ: ස්වාමීනි අප වෙත එම වාර්තාව ලැබිලා තියෙන්නේ ස්වාමීනි 2020 ජූනි මස 12 වැනි දින ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ සඳහන් කරන්නේ මේ ගරු කොමිෂන් සභාවේ ලේකම්වරයා මාර්ගයෙන් අදාළ ජංගම දුරකථනය සම්බන්ධයෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තුමේන්තුවෙන් කැඳවපු වාර්තාවක් සම්බන්ධයෙන් ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වාර්තා පිටපතක් ඔබට මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි. එම වාර්තාවේ මුල් පිටපත සහ එම වාර්තාවට ඇමුණුම්ගත කර යොමු කර ඇති CD තැටිය මා භාරයේ තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබේ වැඩිදුර පැහැදිලි කරන්න මෙහෙම ඇහුවොතින් ඒ වාර්තාව මුද්‍රිත මාධ්‍යයෙන් තියෙනව ද ?

උ: නැහැ ස්වාමීනි ඒක විශාල වාර්තාවක්.

ප්‍ර: විශාල කියන්නේ පිටු කීයක විතර වාර්තාවක් ද?

උ: පිටු ස්වාමීනි 19730 වාර්තාවක්. ඒක CD තැටියකට තමයි ආවරණ ලිපියක් සමඟ යොමු කරලා තිබුණේ ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව ඔබ සඳහන් කරන්නේ ආවරණ ලිපිය සහ CD තැටියේ තමයි ඒ සමඟ තමයි ඉදිරිපත් කරලා තියෙන්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මේ අවස්ථාවේ දී ඒ ලිපිය මුලින් ඉදිරිපත් කරන්න පුළුවන් ද?

උ: එහෙමයි ස්වාමීනි. ලිපිය සහ CD තැටිය.

ප්‍ර: දැන් එය අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අපරාධ පරීක්ෂණ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රසන්න ද අල්විස් මහතාගේ අත්සනින් යුතුව ඉදිරිපත් කරන ලද ලිපියක් කියලා කිව්වොත් ඒක නිවැරදිද?

උ: නිවැරදි ස්වාමීනි.

ප්‍ර: එය මෙම කොමිෂන් සභාව වෙත ලැබී තිබෙන්නේ 2020.06 වැනි මාසේ 12 වැනි දින කියලා කිව්වොත් නිවැරදිද ?

උ: එහෙමයි ස්වාමීනි.

මේ අවස්ථාවේ දී මෙම ලිපිය සහ එම ආවරණ ලිපියට අමුණා ඉදිරිපත් කර ඇති CD තැටිය පිළිවෙලින් C 996 සහ C 996 A වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මහත්මයා එම CD තැටියේ අඩංගු වාර්තාව ඔබ පරිගණකයක් ආශ්‍රයෙන් පරිශීලනය කරලා බැලුව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව මේ 2018 .08 වැනි මාසේ 26 වැනි දින සහ 2018.08 වැනි මාසේ 27 වන දින වෛද්‍ය සන්රාස් යන අයට ලැබිච්ච දුරකථන අංක සහ පණිවිඩ සම්බන්ධයෙන් ඔබ නිරීක්ෂණය කරාද?

උ: එහෙමයි ස්වාමීනි වෛද්‍ය සන්රාස් මහතාගේ දුරකථන කුළුණු වාර්තාවේ 2018.08 වැනි මාසේ 27 වැනි දින රාත්‍රී සඳහන්ව තිබූ විමර්ශනයට භාජනය වූ අංක වලට අදාළව මෙම වාර්තාවේ SMS පණිවිඩ සම්බන්ධව යොමු කරලා තිබුණු කොටසේ එක් කොටසක් සොයාගැනීමට හැකි වුණා ස්වාමීනි. SMS පණිවිඩයක් ස්වාමීනි.

ප්‍ර: එය පිටු අංක 3312 කියලා කිව්වොත් නිවැරදිද ඒ ඔබ CD තැටියෙන් එකී වාර්තවේ අදාළ කාලවකවානුවට අදාළව ඔබ ලබාගත්ත පිටුව ?

උ: එහෙමයි ස්වාමීනි. අර මා පෙර කී පිටු 19730 වාර්තාවේ 3312 වැනි පිටුවේ තමයි එය සඳහන් වෙලා තිබුණේ ස්වාමීනි.

ඒ අනුව උතුමාණනි මේ අවස්ථාවේ දී අදාළ වාර්තාවේ 2018/08 වැනි මාසේ 26 දිනට සහ 27 දිනට අදාළ දත්ත ඇතුළත් පිටු අංක 3312 හේ මුද්‍රිත පිටපතක් මේ අවස්ථාවේ දී C 996 B වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර අයැද සිටී . දැනටමත් C 996 B වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: දැන් මහත්මයා මේ C 996 B වශයෙන් ලකුණු කරපු පිටු අංක 3312 අංක 1055 ට අදාළව යම්කිසි SMS පණිවිඩයක් සම්බන්ධයෙන් ඔබ විශේෂයෙන් විමර්ශනය කරනු ලැබුව ද?

උ: එහෙමයි ස්වාමීනි. අනු අංක 1055 යටතේ SMS පණිවිඩයක් සම්බන්ධයෙන් වාර්තාගත වෙනවා ස්වාමීනි.

ප්‍ර: කවදද පැය කියට ද කියලා නැවතත් වේලාව කියන්න?

උ: 2018 .08 වැනි මාසේ 26 දින පැය 11. 25 ට ඒක ස්වාමීනි UTC කියන සංකේතයක් සඳහන් වෙනවා මං හිතන්නේ

ප්‍ර: ඒ කියන්නේ ලංකාවේ වෙලාවෙන් නම් කියට ද?

උ: මේ ස්වාමීනි මා දන්නා තරමින් පැය 051/2 ක් මේ වෙලාවට එකතුවීම අවශ්‍යයයි. එහෙම වුණොත් ස්වාමීනි 2018.08 වැනි මාසේ 27 වැනි දින පැය 04.55 ආසන්න විය යුතුයි ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ 2018/08 වැනි මාසේ 27 වැනිදා උදේ 04.55 ට වගේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකද්ද ඒ SMS පණිවිඩයෙන් ලැබිලා තියෙන්නේ?

උ: ස්වාමීනි මේක වෛද්‍ය සන්රාස් මහතාගේ දුරකථනයට ලැබුණු SMS පණිවිඩයක්. ඒක ලැබිලා තියෙන්නේ ස්වාමීනි

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒක ලැබිලා තිබෙන අංකය කුමක්ද?

උ: 0778469250 කියන අංකය ස්වාමීනි.

අදාළ දුරකථන අංකය සම්බන්ධයෙන් දැනටමත් සාක්ෂි මෙහෙයවා තිබෙනවා ස්වාමීනි. එය ජිෆ්රි යන පුද්ගලයෙකුගේ නමින් නිකුත් වී ඇති බවටත් එය ඔහුගේ මස්සිනා කෙනෙකු වන රවුෆ් යන කෙනෙකුට ලබාදී ඇති බවටත් දැනටමත් සාක්ෂි මඟින් ඉදිරිපත් වී තිබෙනවා.

ප්‍ර: දැන් එම දුරකථන අංකයෙන් ලබාදීලා තියෙනවා SMS පණිවිඩයක් වෛද්‍ය සෆ්රාස් යන අයට?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ SMS පණිවිඩයේ අන්තර්ගතය කුමක්ද?

උ: ස්වාමිනි ඒකේ දුරකථන අංකයක් සඳහන් වෙනවා ස්වාමීනි එයට පිටුපසින් මොහොමඩ් යන නම සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර: මොකද්ද ඒ දුරකථන අංකය?

උ: 076998752 කියන දුරකථන අංකය ස්වාමීනි.

0767998752 කියන දුරකථන අංකය අද දින මෙම සාක්ෂිකරුට පෙර සාක්ෂි ලබාදුන් ඒ. පස්මීර් යන අයගේ නමට නිකුත් වී තිබූ දුරකථන අංකය බවටත් මේ අවස්ථාවේ දී ගෞරවයෙන් ඇයැද සිටිනවා.

ප්‍ර: ඉතිං මහත්මයා ඊට අමතරව මෙම විශ්ලේෂන වාර්තාවේ දී වෛද්‍ය සෆ්රාස් යන අයට ලැබිලා තිබ්බ ඡායාරූප ආදිය සම්බන්ධයෙනුත් දත්ත හෙළිදරව් කරගන්න හැකියාවක් ලැබිලා තිබෙනව ද?

උ: ස්වාමීනි මෙය මා විසින් කළ විමර්ශනයට අදාළව අනාවරනය වූ කරුණු මත ඉල්ලීමක් කරත් ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් යොමු කළ ලිපියේ සඳහන් වෙනවා ස්වාමීනි. එම ඡායා රූප ලබාගැනීමට නොහැකි බව එහෙත් වෙනත් මෙම දුරකථනයේ සඳහන් ඡායාරූප සහ විස්තර ඇතුළත් වාර්තාව තමයි ස්වාමීනි පිටු 19730 කින් අප වෙත යොමුකරලා තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර: දැන් මෙම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඒ වාර්තාව ලබාදීමෙන් අනතුරුව නැවතත් වැඩිදුර විමර්ශන අතරතුරදී මෙම ගරු කොමිෂන් සභාවේ ලේකම්තුමා මාර්ගයෙන් ප්‍රශ්නාවලියක් නැවත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරලා වඩා පැහැදිලි කරගැනීමට පියවර ගෙන තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි. වෝහාරික වාර්තාව පරිශීලනය කරලා ප්‍රශ්නාවලියක් යොමු කර වාර්තාවක් ලබාගත්තා ස්වාමීනි.

ප්‍ර: ඒ වාර්තාව කවදද ලැබී තිබෙන්නේ?

උ: ස්වාමීනි 2020 ජූනි මස 02 වැනි දින ස්වාමීනි.

ප්‍ර: කවුරුන් විසින් ද එකී වාර්තාව ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ස්වාමීනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රසන්න ද අල්විස් මහතාගේ අත්සනින් යුතුව තමයි යොමු කරලා තිබෙන්නේ ස්වාමීනි.

ප්‍ර: එකී වාර්තාවේ පිටපතක් ඔබට මේ අවස්ථාවේ දී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි ඒ වාර්තාවේ මුල් පිටපත මා භාරයේ තිබෙනවා ඉදිරිපත් කරනවා ස්වාමීනි.

ඒ අනුව 2020.07.01 දරණ අංක PA/DCI/P/698420 වශයෙන් අංක සහිත මෙම වාර්තාව ස්ථානාධිපති Digital චෝභාරික විද්‍යාගාරය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යොමු කර තිබෙනවා. එම වාර්තාව C 997 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කරනු ලබනවා.

ප්‍ර: එම වාර්තාවේ අප විසින් යොමු කරන ලද ප්‍රශ්න සහ පිළිතුරු වෙන වෙනම සටහන් කර තියෙනෙ කිව්වොත් ඒක නිවැරදිද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයා ඔබේ විමර්ශන අතරතුරදී වෛද්‍ය සෆ්රා යන අයගේ විදේශ ගමන් සම්බන්ධයෙන් ඔබ සොයාබැලීමක් කරාද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ මොන ආකාරයට ද?

උ: ස්වාමීනි කොමිෂන් සභාවේ ලේකම්තුමාගේ අත්සනින් යුතුව ආගමන විගමන දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් කරලා වාර්තාවක් ලබාගත්තා ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව වෛද්‍ය සෆ්රා යන අයගේ විදේශ ගමන් වාර්තාවේ පිටපතක් ඔබට මේ අවස්ථාවේ දී ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි එහි මුල්පිටපත මා භාරයේ තිබෙනවා අද දින ගරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනවා ස්වාමීනි.

ප්‍ර: එකී වාර්තාව 2020/06 මාසේ 30 දරණ සහ ආගමන විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක රුවිරා දබරගේ මහත්මිය විසින් මෙම ගරු කොමිෂන් සභාවේ ලේකම්තුමා වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව කියලා කිව්වොත් ඒක නිවැරදිද ?

උ: එහෙමයි ස්වාමීනි ඒ නිවැරදි.

ප්‍ර: එහි වෛද්‍ය සෆ්රාන් යන අයගේ ගුවන් බලපත්‍ර අංකය සටහන් වෙනවද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කුමක්ද අංකය?

උ: ස්වාමීනි N 3155026 කියන අංකය සඳහන් වෙනවා ස්වාමීනි.

ප්‍ර: ඔහු කුමන වකවානුව මොන රටවලටද විදේශගත වෙලා තිබෙන්නේ කියලා මහත්මයට මේ වාර්තාවල් බලලා කියන්න පුළුවන් ද?

උ: හැකියාව තිබෙනවා ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කියන්න වෛද්‍ය සන්‍රාන් කොයි කාලවකවානුවකද විදේශගත වෙලා තිබෙන්නේ?

උ: 2019/04/12 දින ලංකාවෙන් පිටත්වෙලා තියෙනවා ස්වාමීනි.

වේලාව: ප.ව.06.40
මෙතැන් සිට: නිල්මිණි මෙනවිය.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වෙලාව : ප.ව.6.40
පෙර සටහන් : සචිනි මෙනවිය
මෙතැන් සිට : නිල්මිණි

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනවිරත්න මහත්මිය.</u>

පි: 2019/04/12 වන දින ලංකාවෙන් පිටත්වෙලා තියෙනවා ස්වාමිනි. ස්වාමිනි 2019/03/06 වන දින ලංකාවෙන් පිටත්වෙලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: කුමන රටකට ද ඔහු විදේශගත වෙලා තියෙන්නේ ?

පි: RUML කියලා departure Air ගුවන්තොටුපල තමයි සඳහන් වෙන්නේ ස්වාමිනි. ඒක කේතයක් හැටියට සඳහන් වෙන්නේ ස්වාමිනි. මට ඒක කියන්න අවබෝධයක් නැහැ. ආපසු 2019.03.16 දින සිට ලංකාවට පැමිණිලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: 2019.03.06 සිට 2019.03.16 දක්වා ඔහු විදේශගතව සිටි බවට එකී වාර්තාව අනුව සටහන් වෙන්නේ?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඉන් අනතුරුව පසු අවස්ථාවකදීවත් විදේශගතවෙලා තිබෙනවද?

පි: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ කවදද?

පි: එහෙමයි ස්වාමිනි. 2019.04.12 වන දින නැවත ලංකාවෙන් විදේශ ගත වෙලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර: නැවත ලංකාවට පැමිණ තිබෙන්නේ?

පි: දෙදහස් ... සමාවෙන්න ස්වාමිනි. මේ පෙර සඳහන් කළ දිනයට කලින් තමයි මේ ගුවන් ගමන සිදු වෙලා තියෙන්නේ ස්වාමිනි . 2012.04 මාසේ 19 වන දින පිටත් වෙලා 2012 /04 වැනි මාසේ 30 වැනි දින නැවත ලංකාවට පැමිණ තිබෙනවා ස්වාමිනි.

ප්‍ර: නැවත පැහැදිලි කර ගත්තොතින් 2019/03 වැනි මාසේ 06 වැනිදා ඉදලා 2019/03 වැනි මාසේ 16 වෙනකන් ඔහු විදේශගත වෙලා සිටිය බවට එහි සඳහන් වෙනවා කිව්වොත් ඒක හරිද?

උ: සඳහන් වෙනවා ස්වාමිනි. නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: මහත්මයා ඔබ ඊට අමතරව ආගමන විගමන දෙපාර්තමේන්තුවෙනි ඔබේ විමර්ශන කටයුතු අතර තුළදී ඒ පස්මීර් කියලා පුද්ගලයෙක්ගේ විදේශ ගමන් සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවනු ලැබුව ද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒ වාර්තාව කැඳවන්න හේතු වුණේ මොකද්ද?

උ: ස්වාමිනි මෙම වෛද්‍ය සන්රාස් මහතාගේ දුරකථන විශ්ලේෂණයේ දී අදාල සිද්ධි ගත දිනයේ දී දුරකථන ඇමතුම් කිහිපයක් ලැබිලා තිබුණා. එම දුරකථන ඇමතුම් කිහිපයෙන් එක් දුරකථන අංකයක එනම් 0767998752 කියන දුරකථන අංකයේ හිමිකරු වුණේ ස්වාමිනි අලියාර් පස්මීර් කියන

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

තැනැත්තා ස්වාමීනි. ඔහු විමර්ශනයට කැඳවා ප්‍රකාශයක් සටහන් කරා ස්වාමිනි. ඒ සටහන් කිරීමේදී මෙම දුරකථන සම්බන්ධතාවය ලබාගෙන තිබුණේ ස්වාමීනි 2018/ අප්‍රේල් මස 22 වැනි දින ස්වාමීනි. ඒ වන විට ඔහු විදේශගත වෙලා සිටිය බවට තමයි ඔහු ප්‍රකාශය ලබාදුන්නේ. එය තහවුරු කරගැනීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් කැඳෙව්වා ස්වාමිනි.

ප්‍ර: එම වාර්තාව 2020/07 වැනි මාසේ දින දරණ සහ ආගමන විගමන දෙපාර්තමේන්තුවේ සහකාර පාලක තොරතුරු තාක්ෂණ රුවිරා දබරගේ කියන මහත්මියගේ අත්සනින් යුතුව ලබාගත්ත වාර්තාවක් කියලා කිව්ව නම් නිවැරදිද?

උ: නිවැරදි ස්වාමීනි.

ප්‍ර: මුල් පිටපත මේ අවස්ථාවේදී ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න හැකියාවක් තිබෙනවද?

උ: හැකියාව තියෙනවා ස්වාමීනි. ඉදිරිපත් කරනවා ස්වාමීනි.

අදාල වාර්තාව C 999 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටීම්.

ප්‍ර: මහත්මයා ඒ වාර්තාව අනුව වෛද්‍ය සන්රාස් යන අයගේ ජංගම දුරකථනයට SMS එකක් මාර්ගයෙන් මොහොමඩ් කියන නමින් ලබා දීලා තිබෙන දුරකථන අංකයට අදාළ සිම් පත නිකුත් කරන කාලයේ දී එනම් 2018/ 04 වැනි මාසේ 22 වෙන විට මේ ඒ පස්මීර් කියන අය ලංකාවේ හිටිය ද විදේශගතව සිටිය ද කියලාද ඒ කරුණ ඔබට විමර්ශනයේ දී අනාවරණය කරගත්ත ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකද්ද ඔබට පැහැදිලි වුණේ ?

උ: ස්වාමීනි ඔහු 2017/11 වැනි මාසේ 30 දින ලංකාවෙන් විදේශගත වෙලා තිබෙනවා ස්වාමීනි. ආපසු ඔහු ලංකාවට පැමිණෙන්නේ 2020 ජනවාරි 06 දින ස්වාමීනි. ඒ අනුව අදාළ දුරකථන අංකය ලබාගෙන තියෙන දිනය වන විට ඔහු ලංකාවේ රැදී හිඳලා නැහැ ස්වාමීනි. විදේශ ගතවෙලා සිට ස්වාමීනි.

ප්‍ර: මහත්මයා ඒ ඔබ මෙම විමර්ශනයට අදාළව තවත් සැකකරුවන්ගේ ප්‍රකාශ රාශියක් සටහන් කරලා ඇති?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ M.I. ෂාහිඩ් කියන පුද්ගලයෙකුගෙත් ප්‍රකාශයක් සටහන් කරගත්ත ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ප්‍රකාශය කවදද සටහන්කර ගත්තේ?

උ: ස්වාමීනි 2020/06 වැනි මාසේ 23 වැනි දින.

Registrar Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒ ප්‍රකාශය සටහන් කරගන්නා අවස්ථාවේ දී මේ M.I. ෂාහිඩ් කියන පුද්ගලයාව ඔබ බාහිරෙන් නිරීක්ෂණය කරද්දි ඔබට මොනවද දක්නට ලැබුණේ?

උ: ස්වාමීනි

ප්‍ර: ඔබේ නිරීක්ෂණ කියන්න?

උ: ස්වාමිනි මම ඒ සම්බන්ධයෙන් මගේ ප්‍රකාශය ලබා ගන්නා අවස්ථාවේදී සටහනක් යෙදුවා ස්වාමීනි. ඔහුගේ බාහිර ස්වරූපය සම්බන්ධයෙන්. ඒකට හේතුවුණේ ස්වාමීනි මා විසින් විමර්ශනය කල ජාතික රෝහලේ ඇඳ හිසපත්හි එහි සඳහන් රෝගියාගේ නම ලෙස සඳහන් වුණේ M.I. ෂාහීඩ්. ඒ අනුව ඔහුගේ ප්‍රකාශ සහටන් කිරීමේදී ඔහුගේ රූප විස්තර සම්බන්ධයෙන් සටහනක් යෙදුවා ස්වාමීනි. මා විසින් නිරීක්ෂණය කරලා. ඒකෙදි මම සටහන් කරා ස්වාමීනි සැකකරු අඩි 05 යි, අඟල් 06 ක් පමණ උස සාමාන්‍යය සිරුරක් හිමි පුද්ගලයෙකි. නිල් පැහැති කොටු කොටු අත් කොට ෂර්ට් එකක් සහ තද නිල් පැහැති කලිසමක් ඇඳ සිටි ඔහුගේ යට රැවුල වවා කොණ්ඩය කොටට කපා පැත්තට පීරා ඇත. ඔහුගෙන් පිටතින් පෙනීමට තුවාල හෝ තුවාල කැළැල් කිසිවක් නොමැති අතර දෑතේ ඇඟිලි 10 ම හරියාකාරව ඇත. ඔහුගේ මුහුණේ තුවාල කැළැල් කිසිවක් නොමැති අතර දෑස් හොඳින් විවෘතව සාමාන්‍ය පරිදි ඇත. මා විසින් මාගේ නිරීක්ෂණය ඔහුගේ ප්‍රකාශ සටහන් කිරීමට පෙර ඒ ආකාරයෙන් සටහන් කරා ස්වාමීනි.

ප්‍ර: මහත්මයා ඔබ ඔබේ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ, පොලිස් ඒකකයේ සේවය කරන කාලය තුළදී විමර්ශන කටයුතුවලදී වෙනත් පොලිස් නිලධාරින්ගේ , දේශපාලනඥයන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීමක් විමර්ශන අතර තුලදී සිදු කිරීමක් කරලා තියෙනවද?

උ: එහෙමයි ස්වාමීනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

මේ අවස්ථාවේ දී සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැල්කන් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥවරයගෙන් විමසමි. අවශ්‍ය නොමැති බව දන්වා සිටී.

මෙම සාක්ෂිකරු විසින් මෙම කොමිෂන් සභාවට අයුක්තව සිටි කාලය තුළදී සිදුකරන ලද රාජකාරී කටයුතු හේතුවෙන් 2015 අංක 04 දරණ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 25 (04) උපවගන්තිය ප්‍රකාරව මෙම සාක්ෂිකරුට හිමිවිය යුතු සියළු වරප්‍රසාදයන් සහ අයිතීන් හිමිවිය යුතු බව කොමිෂන් සභාව නියෝග කරමි. නියෝගය අවශ්‍ය වූ විටක සාක්ෂිකරුට යොදා ගැනීම සඳහා කොමිෂන් සභාවේ ලේකම් විසින් අදාළ නියෝගය ඇතුළත් ලිපි දෙකක් සාක්ෂිකරුට නිකුත් කළ යුතු අතර පළමු ලිපිය

Project Document Copy
FAIR COMMENT BY JEZEEM

අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ජාතික අධ්‍යක්ෂවරයා වෙත ආමන්ත්‍රණය විය යුතු බව සටහන් කර තබමි.

සාක්ෂිකරු මුදාහරී.

තවද මේ අවස්ථාවේදී ජාතික රෝහලේ ලේඛනාගාරයේ සිට මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද අදාළ ඇඳහිසපත් ටිකට් පතේ මුල් ගොනුව අදාළ නිලධාරියාට නැවත භාර දුන් බව සටහන් කර තබමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බවට පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.

දිනය: 2020.08.11 වෙලාව: ප.ව 6.40

සටහන් කළේ - නිල්මිණි කුමාරි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය
-සාමාජික-

පෙනී සිටීම

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මියජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, රජයේ අධිනීතිඥ දිලන්ත එස්. කළුදුරුවගේ මහතා, රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා, සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

<u>සාක්ෂි කැඳවීම ආරම්භ කරමි.</u>

නම	:	**රත්නායක මුදියන්සේලාගේ රවිඳු විජේබණ්ඩාර මීගස්මුල්ල**
වයස	:	**අවු 33යි**
ජාතිය	:	**සිංහල**
ආගම	:	**බෞද්ධ**
දැනට දරණ තනතුර	:	**තොරතුරු ආරක්ෂක ඉංජිනේරු**

ප්‍රතිඥා දී කැඳවයි.

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය</u>

ප්‍ර: මහත්මයා ඔබ දැනට සේවය කරනු ලබන්නේ කුමන තනතුරකද?

පි: තොරතුරු ආරක්ෂක ඉංජිනේරුවරයෙක් වශයෙන් කටයුතු කරනවා.

ප්‍ර: තොරතුරු ආරක්ෂක ඉංජිනේරුවරයෙකු වශයෙන් ඔබ සේවය කරනු ලබන්නේ කුමන ආයතනකද?

පි: ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසැදය.

ප්‍ර: ඔබ පරිගණක විද්‍යාව සම්බන්ධයෙන් ලබා තිබෙන මූලික සුදුසුකම කුමක්ද?

පි: Bachelor's degree එකක් තියෙනවා. Computing Science වලින් ලබා ගත්ත.

ප්‍ර: ඔබ එය ලබා ගත්තේ කුමන විශ්ව විද්‍යාලකින්ද?

පි: මම Staffordshire University එකේ දී තමා ලබා ගත්තේ එංගලන්තයේ.

ස්වාමිනි මේ අවස්ථාවේ දී ඉතා ගෞරවයෙන් සැල කර සිටින්නේ සාක්ෂිකරු විසින් මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ දැනටමත් විශේෂඥ සාක්ෂි ලබා දෙමින් සාක්ෂියක් ලබාදී තිබෙන බවයි. එම පසුගිය වාරයේ දී සාක්ෂි ලබාදෙන විට මෙම සාක්ෂිකරුගේ විශේෂඥ භාවය සම්බන්ධයෙන් වූ සාක්ෂි මෙහෙයවනු ලැබුවා ස්වාමිනි. ඒ අනුව අද දිනත් මෙම සාක්ෂිකරුගෙන් විශේෂඥ මතයක් ලබා ගැනීමට සහ විශේෂඥ සාක්ෂි මෙහෙයවීම සඳහා අවසර ඉල්ලා සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

අවසර ලබා දෙනවා.

****

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය</u>

සාක්ෂිකරු 2020 පෙබරවාරි 25 දින සාක්ෂි ලබා දීලා තියෙනවා.

ප්‍ර: මහත්මයා ඔබ ඔබගේ රාජකාරි කටයුතුවල යෙදීමේ දී ඉලෙක්ට්‍රොනික උපාංග සම්බන්ධයෙන් වෝහාරික පරීක්ෂණයන් සිදු කරනු ලබනවද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්. මම Digital Forensic Investigations කරනවා අපේ ආයතනයේ.

ප්‍ර: මොනවගේ උපාංගද ඔබ විසින් වෝහාරික පරීක්ෂණයට ලක් කරනු ලැබ තිබෙන්නේ?

පි: බොහොමයක් පරිගණක සහ laptop පරිගණක තමයි අපේ ආයතනයට ගොඩාක් එන්නේ ප්‍රතිශතයක් වශයෙන් ගත්තොත් 75%ක් විතර. ඉතිරි 25% තමයි hand held devices අපිට හම්බවෙන්නේ. උදාහරණයක් වශයෙන් mobile phone, tablets ඒවගේ උපකරණ හම්බවෙන ොසම්භාවිතාව ටිකක් අඩුයි.

ප්‍ර: එහෙත් ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසැඳය විසින් ජංගම දුරකථන වැනි උපාංගත් වෝහාරික පරීක්ෂණයට බඳුන් කරනු ලබනවා?

පි: ඔව්.

ප්‍ර: සාමාන්‍යයෙන් ඔබගේ ආයතනයට එවැනි උපාංගයක් උදාහරණයක් වශයෙන් ගත්තොත් ජංගම දුරකථනයක් ලැබුණු අවස්ථාවකදී වෝහාරික විශ්ලේෂණයක් සඳහා ඒ සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ඔබ විසින් ගනු ලබන ක්‍රියා මාර්ගය මොකක්ද?

පි: මෙහෙමයි. ඉස්සෙල්ලාම අපේ ආයතනයට මේ වගේ mobile phone එකක් එනවානම් ගොඩක් වෙලාවට smart mobile phone එකක් නම් අපි කියලා තියෙනවා අදාළ නීති ක්‍රියාත්මක කරන ආයතන නිලධාරීන්ට ඒක Aero plane Mode දාලා අරන් එන්න කියලා. මොකද මේ devices වල තියෙනවා remotely log in වෙලා data wipe කිරීමේ හැකියාව.

ප්‍ර: මහත්මයා ඔබට පැහැදිලි කරන්න පුළුන්ද Airplane Mode වශයෙන් අදහස් කරන්නේ කුමක් ද කියලා?

පි: Aero plane Mode වශයෙන් හඳුන්වන්නේ ඒ option එක on කෙරුවාම අපේ ජංගම දුරකථනයේ අන්තර් ජාලයට සම්බන්ධ වීමක් සිදු ඒ කියන්නේ ඒක නැවැත්වීමක් තමයි කරන්නේ. එතකොට අන්තර්ජාලයට සහ GSM network එකට එහෙම නැත්නම් Telecommunication Network එකකට සම්බන්ධ වීමක් වෙන්නේ නැහැ. එතකොට device එක Isolate වෙනවා. එතකොට එළියේ ඉඳන් කෙනෙක්ට මෙම mobile දුරකථනයට ඇතුල් වීමේ හැකියාවක් නැහැ මොකද මේ smart දුරකථනවල පුළුවන් remotely connect වෙන applications බාගත කරලා තියා ගන්න. ඉතින් අපි ඉස්සෙල්ලාම ඒ Aero plane Mode කියන Mode එක on කරනවා අපිට ආයතනයට හම්බ වෙනවානම් අපි හැබැයි

ප්‍ර: දැන් මහත්මයා පැහැදිලි කිරීමක් ලබා ගැනීම සඳහා. ඇයි ඔබගේ ආයතනය විසින් නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙත දැනුම් දී තිබෙන්නේ යම් උපාංගයක් ලබා ගන්නා විට එයට Aero plane Mode option එක දමා ලබා ගන්න කියලා?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි: එහෙම කරන්නේ බාහිරින් කිසිම කෙනෙකුට ඒ අදාළ ජංගම දුරකථනයට සම්බන්ධ වෙලා ඒකේ දත්ත වෙනස් කිරීමේ හැකියාව නතර කරන්නට තමයි ඒ option එක දීලා තියෙන්නේ. අපි කියනවා ඒක පාවිච්චි කරන්න කියලා ඒ නිලධාරීන්ට.

ප්‍ර: ඒ අනුව Aero plane Mode නැමැති එම option එක ක්‍රියාත්මක කරනු ලැබුවායින් අනතුරුව ඔබ විසින් අදාළ විශ්ලේෂණයට බඳුන් කිරීමට නියමිත උපාංගය සම්බන්ධයෙන් ගන්නා ඊළඟ ක්‍රියාමාර්ගය කුමක්ද?

පි: ඊළඟට අපි කරන්නේ අපේ forensic lab එකේ වෝහාරික විශ්ලේෂණ කරන lab එකේ පරිගණකයට සම්බන්ධ කිරීමක් කරනවා. ඒ පරිගණකයට සම්බන්ධ කරනකොට අපි භාවිතා කරනවා write blocker කියන device එක. මේකෙන් වෙන්නේ අපේ පරිගණකයෙන් ඒ අදාළ දුරකථනයට කිසිම දත්තයක් ඇතුලත් වීම වැළැක්වීම. මොකද electronic evidenceවල තියෙන එක ගුණාංගයක් තමයි ඉක්මනට දත්ත වෙනස් වෙන්න පුළුවන්. ඉතින් අපි අපේ පරිගණකයකට ඒ ජංගම දුරකථනය play කරපුවාම අපේ පරිගණකයෙන් යම් දත්ත ඒ දුරකථනයට ගිහිල්ලා දුරකථනයේ දත්ත වෙනස් වීමේ හැකියාවක් තියෙනවා. ඒක නවත්වන්න තමයි අපි ඔය write blocker කියන devices එක play කරන්නේ. ඒක play කරලා තමයි අදාළ ජංගම දුරකථනය අපේ පරිගණකයට සම්බන්ධ කරන්නේ.

ප්‍ර: මා පැහැදිලි කර ගැනීමට නැවතත් ඔබගෙන් ඇහුවොත් රවිඳු මහත්මයා යම් උපාංගයක් උදාහරණයක් වශයෙන් ජංගම දුරකථනයක් ඔබගේ වෝහාරික විද්‍යාගාරය වෙත ලැබුණායින් අනතුරුව ඔබගේ විද්‍යාගාරය තුළ තිබෙන යම් පරිගණකයක් වෙත එය සම්බන්ධ කිරීමට ප්‍රථමයෙන් write blocker යනුවෙන් හඳුන්වනු ලබන යම් උපාංගයක් සමඟ එය සම්බන්ධ කර ඔබගේ විද්‍යාගාරයේ තිබෙන පරිගණකයේ තිබෙන දත්තයන් විශ්ලේෂණයට බඳුන් කිරීමට නියමිත වූ ජංගම දුරකථනය වෙත ගලා යෑමට හෝ එයට ඇතුළු වීම නැවැත්වීම සඳහා භාවිතා කරනවා කිව්වොත් නිවැරදිද?

පි: නිවැරදියි.

ප්‍ර: ඉන් අනතුරුව ඔබ ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද?

පි: ඊට පස්සේ අපි සාමාන්‍යයෙන් ජංගම දුරකථනයත් සමඟ විශ්ලේෂණය කරන්නේ නැහැ. අපි ජංගම දුරකථනයේම copy එකක් ගන්නවා. අපි ඒකට කියනවා bitwise copy එකක් කියලා.

ප්‍ර: දැන් මහත්මයා ඔබ සඳහන් කරාම ජංගම දුරකථනයේම copy එකක් ලබා ගන්නවා කියලා එයින් අදහස් වෙන්නේ මොකක්ද? ජංගම දුරකථනය තුළ තිබෙන දත්තවල පිටපතක් ද ලබාගනු ලබන්නේ ?

පි: ජංගම දුරකථනයේ තියෙන දත්ත පමණක් නෙවෙයි ජංගම දුරකථන උදාහරණයක් කිව්වොත් ජංගම දුරකථනයම තමයි එතන තියෙන්නේ. එතකොට දත්ත තියෙන්න පුළුවන්. එතකොට exact copy එකක් තමයි

FAIR COMMENT BY JEZEEM

අපි ගන්නේ. එතකොට ඒ mobile phone එකේ තියෙන සියලුම දේ delete කරපුවා වෙන්න පුළුවන්, install කරපු දේවල් වෙන්න පුළුවන්, applications වෙන්න පුළුවන් ඒ හැම දෙයක්ම මේ copy එකේ අඩංගු වෙනවා. ඒක සාමාන්‍යයෙන් අපි copy paste කරනවා කියන එකට වැරදියි. ඒක අපි කියන්නේ bitwise copy එකක්.

ප්‍ර: මා සඳහන් කළොත් අදාළ උපාංගය විශ්ලේෂණය කිරීමට නියමිත උපාංගය clone කිරීමක් සිදු වෙනවා කියලා එය නිවැරදිද?

පි: ඔව්. ගොඩාක් දුරට clone කිරීමක් තමයි සිදු කරන්නේ. ඒ clone කරාට පස්සේ එන ප්‍රශ්නේ තමයි අපි ඔප්පු කරන්න ඕනි අපේ තියෙන ජංගම දුරකථනය සහ අපි ඒ clone දේ එකයි කියන එක. ඒ දේ මේකම තමයි මේ represent කරන්නේ කියන එක අපි ඔප්පු කරන්න ඕනි. ඒ සඳහා අපි භාවිතා කරනවා hashing කියලා concept එකක්. ඒ hashing කියන concept එකේදී වෙන්නේ අපි ඉස්සෙල්ලාම අපිට හම්බවෙන ජංගම දුරකථනයේ ඒ hashing කියන concept එක හරහා යවලා අපි value එකක් generate කරනවා. උදාහරණයක් වශයෙන් අපි හිතමුකෝ මගේ මේ laptop එක hash කරාට පස්සේ අපිට හම්බවෙනවා value එකක් 100. මම මේ උදාරණයකට කියන්නේ. එතකොට 100 කියලා value එක එනවා. ඊළඟට මම අර clone කරපු image එක තියෙනවා. ඒකත් මම hashing කියන concept එක හරහා යවලා value එකක් ගන්නවා. මේ value 2 සමාන නම් අපි කියනවා මගේ ළඟ තියෙන clone එක මේ තියෙන ජංගම දුරකථනය හා සමානයි කියන එක. දත්තවල කිසිම වෙනසක් සිදු වී නැති බව හඳුනා ගන්න පුළුවන් එක ක්‍රමයක් තමයි hash check කියලා කියන්නේ කරන දේ.

ප්‍ර: වැඩිදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා මෙහෙම සඳහන් කළොත්. ඔබ විසින් ලබා ගන්නා ජංගම දුරකථනයේ පිටපත සහ ජංගම දුරකථනය යන එම ආයිත්තම දෙකම සෑම අතකින්ම එක හා සමානයි එම ආයිත්තම දෙකේම තියෙන දත්ත සෑම අතකින් සමාන බවට ඔප්පු කිරීම සඳහා hashing ක්‍රමවේදය භාවිතා කරනවා කිව්වොත් නිවැරදිද?

පි: හරියට හරි. ඕනෑම file එකක සහ උපකරණයක integrity එක cheek කරන ක්‍රමවේදයක් තමයි hash කියලා කියන්නේ. ඊට පස්සේ අපි ජංගම දුරකථනය අපේ safe එකේ save කරනවා. ඒක වෙන කෙනෙකුට access කරන්න බැහැ. ඒක පුළුවන් lab එකට අවසර තියෙන පුද්ගලයොන්ට පමණයි. ඊළඟට අපි වැඩ කරන්නේ අර clone කරපු image එකේ තමයි අපිට ගොඩක් වෙලාවට වැඩ කරන්නේ. එතකොට ඒකට අපි අධිකරණ නියෝගයක් හරහා ප්‍රශ්නාවලියක් තමයි එන්නේ. ඒ ප්‍රශ්නාවලියට අවශ්‍ය වන ක්‍රියාමාර්ග අපි ඒ image එකේ කරනවා. කරලා ඉවර වෙලා අපි දත්ත

වාර්තාවක් ලබා දෙනවා. ඒ වාර්තාව ලබා දුන්නාට පස්සේ ඒ කියන්නේ ඒ විශ්ලේෂණය කරාට පස්සේ අපි ඒ අර clone එකේ ආයේ අර hash කියන value එකක් ගන්නවා. අරගෙන අපි තියාගෙන ඉන්නවා බලනවා ඒක අර කළින් ආපු සියයමද කියලා. එතකොට අපිට කියන්න පුළුවන් අපි මේ ජංගම දුරකථනයෙන්ම තමයි මේ clone එකෙන් represent වෙන්නේ එකක්. ඊළඟට මේක analyse කරාට පස්සෙත් මේ clone එකේ දත්ත වෙනස් වුණේ නැහැ කියන එක ඔප්පු කරන්නේ ඒ analyze කරාට පස්සෙත් අපි අර hash calculate කරලා value එකට සමාන කරනවා. ඒකෙන් තමයි integrity කියන එක අපි maintain කරන්නේ.

ප්‍ර: ඒ අනුව මහත්මයා යම් ජංගම දුරකථනයක් සම්බන්ධයෙන් ඔබ විසින් ඔබගේ ආයතනයේ වෝහාරික විද්‍යාගාරය තුළ විශ්ලේෂණයක් සිදු කරනු ලැබූ විටක අවස්ථා 3කදී hashing process එක මඟින් value ලබාගනු ලබනවා?

පි: ඔව්.

ප්‍ර: එම අවස්ථා තුනේම ලැබෙන hashing value ඔබගේ ආයතනය විසින් ගබඩා කර තබා ගැනීමක් සිදු කරනවද?

පි: ඔව්. ඒක කෙනෙක් ප්‍රශ්න කළොත් උසාවියක දී ප්‍රශ්න කළොත් ඒ අදාළ value එක අපිට ඕනි වෙලාවක දෙන්න හැකියාවක් තියෙනවා.

ප්‍ර: ඔබ 2019 අප්‍රේල් 21 වෙනි දින සිදු වූ බෝම්බ ප්‍රහාර සම්බන්ධයෙන් පරීක්ෂණ කරනු ලබන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට සහාය වීම සඳහා අනුයුක්ත කර සිටින නිලධාරියෙක් කිව්වොත් නිවැරදිද?

පි: නිවැරදියි.

ප්‍ර: ඒ අනුව ඔබට යම් අවස්ථාවකදී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම්තුමා හරහා යම් ජංගම දුරකථනයක් විශ්ලේෂණ කිරීම සඳහා ලැබුණද?

පි: ඔව් 6 මාසේ 11 වෙනිදා මට ඒක ලැබුණා. ලියුම මං ළඟ තියෙනවා.

ප්‍ර: ඔබට සඳහන් කරන්නට පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට ඔබට විශ්ලේෂණට කිරීමට ලැබුණු එම ජංගම දුරකථනයේ IMEI අංකය කුමක්ද කියලා?

පි: ඔව් IMEI Number තමයි 355440079893391

ප්‍ර: එම ජංගම දුරකථන කුමන මාදිලියේ දුරකථනයක්ද?

පි: Apple මාදිලියේ SE වර්ගයේ mobile phone එකක්.

ප්‍ර: එම දුරකථනය තුළ සිම්පත් කොපමණ ප්‍රමාණයක් එකවර භාවිතා කිරීමේ හැකියාවක් තියෙනවද?

පි: එකවරට එක සිම්පතයි පාවිච්චි කරන්න පුළුවන්.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: මීට අමතරව ඔබට අනාවරණය වුණාද අදාළ ජංගම දුරකථනයේ මතක ධාරිතාව එහෙම නැත්නම් memory capacity එක කොපමණ ප්‍රමාණයක් තියෙනවද කියලා?

පි: මෙහි memory capacity එක 16GB තියෙනවා.

ප්‍ර: ඔබට ඔබ සඳහන් කළ එම දුරකථනය ලැබුණායින් පසුව එය විශ්ලේෂණය කිරීමේදී ඔබ දැනටමත් මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් සඳහන් කරන්නට යෙදුණු ඒ සම්පූර්ණ ක්‍රියාවලිය හරහා ද එම විශ්ලේෂණය සිදු වුණේ?

පි: ඔව් අපි අපිට ලැබෙන ඕනෑම Investigation එකක් ඒ process එක හරහා තමයි යන්නේ. අපි Standard operation procedure එකක් තියෙනවා. ඒක හැම employee කෙනෙක්ම follow කළ යුතුමයි.

ප්‍ර: ඒ අනුව ඔබ විසින් අදාළ ජංගම දුරකථනය විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව යම් වාර්තාවක් සම්පාදනය කරනු ලැබුවද?

පි: ඔව්.

ප්‍ර: ඔබට එම වාර්තාව නැවත දුටුවොත් හඳුනා ගන්න පුළුවන්ද?

පි: පුළුවන්.

මේ අවස්ථාවේදී ස්වාමිනි C - 995 වශයෙන් ලකුණු කරනු ලැබූ ලේඛනය සාක්ෂිකරු වෙත පෙන්වා සිටීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.

ප්‍ර: ඔබ එය හඳුනා ගන්නවද?

ස්වමිනි සාක්ෂිකරු විසින් C- 995 ලේඛනය හඳුනා ගනී.

ප්‍ර: ඔබ මෙම වාර්තාව අත්සන් කර තිබෙනවද?

පි: ඔව් අත්සන් කර තියෙනවා.

ප්‍ර: එහි ඔබගේ අත්සන ඔබ හඳුනා ගන්නවා?

පි: ඔව්.

ප්‍ර: ඔබ මෙම ජංගම දුරකථනය විශ්ලේෂණය කිරීමේදී ඔබට යම් ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරනු ලැබුවාද අදාළ පරීක්ෂණ ආයතනය විසින්?

පි: ප්‍රශ්න 3ක් ඉදිරිපත් කරනු ලැබුවා.

ප්‍ර: මොනවද ඒ ප්‍රශ්න?

පි: පළවෙනි ප්‍රශ්නය තමයි මේ ජංගම දුරකථනයෙන් Delete කරපු application එකක් හරහා ලිපි, ඡායාරූප හා වීඩියෝ දර්ශන හුවමාරු කරලා තියෙනවද ඒක ප්‍රශ්න අංක 1, ප්‍රශ්න අංක 2 තමයි මෙම ජංගම දුරකථනයේ ධාරිතාව එහෙම නැත්නම් memory එකෙන් Delete කරලා තියෙන දත්ත මොනවද කියන එක සම්බන්ධයෙන් වාර්තාවක්. ඒ වාර්තාව ඉහත ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නයේ දී අහලා තියෙන්නේ 2018 සහ 2019 කාල වකවානු තුළ දී දත්ත.

ප්‍ර: ඒ අනුව මහත්මයා ඔබගේ වාර්තාව තුළින් හා විශ්ලේෂණය මඟින් එම ප්‍රශ්න 2ට ඔබගේ පිළිතුර වෙන්නේ මොකක්ද?

පි: ඇත්තටම මගේ Investigation එකේදී මට මේ ප්‍රශ්න 1ට සහ 2ට අදාළ කිසිවක් ඒ ජංගම දුරකථනයෙන් සොයා ගන්නට බැරි වුණා.

Fair Comment BY JEZEEM

ප්‍ර: ඔබට හේතුවක් දක්වන්නට පුළුවන්ද එලෙස කිසිවක් ඔබට සොයා ගැනීමට නොහැකි වුණේ ඇයි කියන එක සම්බන්ධයෙන්?

පි: හේතු 2ක් තියෙනවා. එකක් තමයි අපි Apple phone එකක් සහ Android phone එකක් ගත්තොත් ඒ දෙකෙන් Investigation එකක් කරනකොට හම්බවෙන ප්‍රතිඵල වෙනස්. ඒ මොකද ඒ operating system එක එහෙම නැත්නම් මෙහෙයුම් පද්ධතිය ක්‍රියාකරන ආකාරය වෙනස්. ඒ නිසා සමහර වෙලාවට Apple මෘදුකාංගයක් තියෙන phone එකකින් data ස්වල්ප ප්‍රමාණයක් හම්බ වෙනකොට සමහර විට Android mobile phone, එක data ප්‍රමාණය ඊට වඩා වැඩි වෙන්න පුළුවන්. ඉතින් ඒ හින්දා operating system එකේ ආරක්ෂිත භාවය සාමාන්‍යයෙන් මේ products වලදී use කරන කෙනාගේ privacy එක ආරක්ෂා කරන්න ගොඩක් මෙවලම් මේකේ පාවිච්චි කරනවා. ඉතින් ඒ නිසා වෙන්න පුළුවන් අංක 1. දෙවෙනි එක තමයි මට මේක හම්බවෙන අවස්ථාවේ දී factory resetෙoption කරලා use කළොත් factory reset කියන option කියන එක use කළොත් දත්ත recover කර ගැනීමේ හැකියාවක් නැහැ.

ප්‍ර: ඔබට පැහැදිලි කරන්නට පුළුවන්ද factory reset option යනුවෙන් අදහස් වෙන්නේ මොකක්ද කියලා?

පි: මුළු ජංගම දුරකථනයම මිලදී ගත්ත අවස්ථාවට යෑමක් තමයි සිදු කරන්නේ. සාමාන්‍යයෙන් අපි ළඟ තියෙන ජංගම දුරකථනයක් කෙනෙක්ට විකුණනවානම් තව කෙනෙකුට භාර දෙනවානම් ඒ කෙනාට හැකියාව තියෙනවා අපි පාවිච්චි කරපු දේවල් නැවත recover කරලා එතකොට අපේ Privacy එකට ප්‍රශ්නයක් වෙනවා. ඒක නවත්වන්න තමයි මේ settings එක තියෙන්නේ. ඉතින් අපි ගොඩාක් වෙලාවට recommend කරන්නේ කෙනෙක්ට විකුණනවානම්, කෙනෙක්ට තෑග්ගක් වශයෙන් දෙනවානම් තමන් use කරපු phone එකක් factory reset කරලා දෙන්න. එතකොට දත්ත recover කර ගැනීමේ හැකියාවක් නැහැ.

ප්‍ර: එයින් අදහස් වෙනවාද factory reset කියන එකෙන් අදහස් වෙනවද මහත්මයා එම ජංගම දුරකථනය භාවිතා වන තුරු එහි තිබූ සියලුම දත්ත, බාගත කරනු ලැබූ යෙදුම් වැනි සියලුම දෑ මැකීයාමක් සිදු වෙනවා කියලා?

පි: ඔව්.

ප්‍ර: එමෙන්ම එය එවැනි factory reset ක්‍රියාවලියකට භාජනය වූ ජංගම දුරකථනයක් SL CERT ආයතනය වැනි වෝහාරික විශ්ලේෂණ ආයතනයකට ලැබුණායින් පසුව විශ්ලේෂණය කිරීමෙන් අදාළ මැකී ගිය දත්ත ප්‍රතිඋත්පාදනය කිරීමක් සිදු කරන්න පුළුවන්ද?

පි: factory reset කළොත් ඒක ප්‍රතිඋත්පාදනය කිරීමේ හැකියාවක් කොහෙත්ම නැහැ.

****

FAIR COMMENT BY JEZEEM

Presidential Secretariat Copy

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු Apple iphone එක ඔබ මේ දැන් පරීක්ෂා කළේ Apple iphone එකනේ. Apple iphone එකක WhatsApp මෘදුකාංගයක් ඒ phone එක භාවිතා කරන පුද්ගලයා යම් අවස්ථාවක බාගත කරලා පාවිච්චි කරනවා. ඊට පසු අවස්ථාවක ඒ WhatsApp application එක uninstall කෙරුවොත් විතරක් WhatsApp මාර්ගයෙන් ලැබුණු ඡායාරූප, දත්ත පසු අවස්ථාවකදී ඔබගේ පරීක්ෂණ ක්‍රමවේදයට අනුව හොයා ගැනීමේ හැකියාවක් තියෙනවද factory reset කරලා නැත්නම්?

පි: factory reset කරලා නැත්නම් දත්ත ලැබීමේ සම්භාවිතාවක් තියෙනවා. Delete කරලා ආයේ install කරත්. හැබැයි අර ඒක රඳා පවතිනවා ඒක Delete කරලා කොච්චර කාලයක් පාවිච්චි කරාද කියන එකත් මත. මොකද අපි දන්නවා අපේ ධාරිතාව දැන් 16GB නම් අපි Delete කරාට පස්සේ අපි තව පාවිච්චි කරනවා. එතකොට අර කළින් මැකිලා ගියපුවා උඩට මේක මේ අලුතින් එන දත්ත එකතු වෙනවා. එතකොට Delete කරපුවා ගැනීමේ සම්භාවිතාව අඩු වෙනවා නමුත් recover කර ගන්නට පුළුවන්.

ප්‍ර: යම්කිසි අවස්ථාවක මේ iphone එක ඔබ පරීක්ෂා කරපු iphone එකේ factory reset එකක් කරන්නේ නැහැ. නමුත් WhatsApp uninstall කරනවා. ඒ WhatsApp එක, ඒ කියන්නේ ඒකේ තිබ්බ දත්ත අමතක කරන්න. ඒ WhatsApp එක එක සැරයක් බාගත කරලා පාවිච්චි කෙරුවද නැද්ද කියන එක හොයා ගැනීමට පුළුවන්ද ඔබගේ ක්‍රමවේදය අනුව?

පි: ඔව් පාවිච්චි කරන ලද application එහෙම නැත්නම් install කරන ලද application සම්බන්ධයෙන් list එකක් එනවා අපේ විමර්ශනය කරන කොට.

ප්‍ර: හරි. ඒ කියන්නේ factory reset එකක් කෙරුවේ නැත්නම් phone එකට ඔබේ iphone එකට ඒ WhatsApp application එක ඒ phone එකේ කවදා හරි පාවිච්චි කෙරුවානම් ඒ බව ඔබගේ විමර්ශනයේදී අනාවරණය වෙන්න ඕනි නේද?

පි: ඔව්.

ප්‍ර: දැන් ඔබ මේ iphone එකට කරපු විමර්ශනයේදී අනාවරණය වුණාද මේ WhatsApp application එක මේ phone එකෙන් භාවිතා කෙරුවද නැද්ද කියලා?

පි: මේ phone එකෙන් භාවිතා කරපු බවක් මට දැනුණේ නැහැ. පෙනුනේ නැහැ අපේ report එකේ එහෙම නැත්නම් අපේ විමර්ශනයේදී සොයා ගන්නට බැරිවුණා.

****

FAIR COMMENT BY JEZEEM

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය</u>

ප්‍ර: මීට අමතරව ඔබ සඳහන් කරා 3 වන ප්‍රශ්නයක් ඔබ වෙත යොමු කර තිබුණු බව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ලේකම්තුමා හරහා. එම 3 වන ප්‍රශ්නය මොකක්ද ?

පි: මෙහි මතක ගබඩාවේ දැනට ඇති දත්ත සම්බන්ධයෙන් වාර්තාවක්.

ප්‍ර: ඒ අනුව ඔබ දැනට තිබෙන දත්ත සම්බන්ධයෙන් විස්තර C -995 ලේඛනය තුළ ඇතුලත් තිබෙනවද?

පි: එසේයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: දැනටමත් මෙම කොමිෂන් සභාව ඉදිරියේ මෙහෙයවා ඇති සාක්ෂි අනුව ඔබ විසින් මේ පරීක්ෂා කරන ලද IMEI අංකය 355440079893391 දරණ ඒ IMEI අංකයට අදාළව දුරකථන අංක භාවිතා කරපු පුද්ගලයා මෙම කොමිෂම ඉදිරියේ දැනටමත් සාක්ෂි ලබා දීලා තියෙනවා. ඔහු ප්‍රකාශ කරනවා යම්කිසි අවස්ථාවක මේ ජංගම දුරකථනයෙන් ඔහුට WhatsApp පණිවිඩ එනවා කියලා. ඔහුගේ එම සාක්ෂිය නිවැරදිනම් ඔබගේ විමර්ශනයේදී එම ජංගම දුරකථනයේ WhatsApp application කිසිම අවස්ථාවක පාවිච්චි කරලා තියෙනවද නැද්ද කියන එක ඔබගේ ක්‍රමවේදය අනුව ඔබට හොයා ගන්න බැරි වුණානම් ඔබගේ විශේෂඥ දැනුම අනුව ඒ සිදුවිය හැක්කේ මොන හේතුවක් හින්දාද?

පි: මගේ opinion එක තමයි මට මේ mobile phone එක හම්බුණාට පස්සේ Investigation එක කරාට පස්සේ මට හිතුණ දෙයක් තමයි මේක reset කරලා තමයි දැන් පාවිච්චි කරලා තියෙන්නේ.

****

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය</u>

ප්‍ර: මහත්මයා ඔබට යම් අවස්ථාවකදී දැන ගන්නට ලැබුණද ඔබ විසින් විශ්ලේෂණය කරනු ලැබූ Apple ජංගම දුරකතනය වෙනත් ආයතනයක් විසින් මීට ප්‍රථමයෙන් විශ්ලේෂණය කර ඒ සඳහා වාර්තාවක් ලබා දී තිබුණු බව?

පි: ඔව්

ප්‍ර: ඔබ දැනුවත් ද ඒ කුමන ආයතනයක්ද කියලා?

පි: CID ආයතනයෙන් මීට මාස කිහිපයකට කළින් විශ්ලේෂණයක් කරලා තියෙනවා.

ප්‍ර: ඔබට යම් අවස්ථාවකදී අදාළ වාර්තාව පරිශීලනය කරන්නට අවස්ථාව ලැබුණද?

FAIR COMMENT BY JEZEEM

පි: ලැබුණා ස්වාමිනි.

ප්‍ර: ඔබට පුළුවන්කමක් තියෙනවද අද දින මෙම විවෘත ගරු කොමිෂන් සභාව ඉදිරියේ අදාළ වාර්තාව පරිශීලනය කරමින් එහි මෘදු පිටපත පරීශීලනය කරමින් යම් ප්‍රශ්නවලට උත්තර ලබා දෙන්නට?

පි: හැකියාවක් තියෙනවා.

ස්වාමිනි ඉතා ගෞරවයෙන් C – 996 (A) වශයෙන් ලකුණු කර තියෙන සංයුක්ත තැටිය විවෘත කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිකරු වෙත පරිශීලනය කිරීමට අවස්ථාව ලබාදෙමින් ඉදිරි ප්‍රශ්න ඇසීමට අවසර ඉල්ලා සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

අවසර ලබා දෙමි.

****

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය</u>

ප්‍ර: මහත්මයා දැන් මේ තිරයේ දිස් වන්නේ ඔබ විසින් සඳහන් කරන්නට යෙදුණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් IMEI අංක 355440079893391 දරන ජංගම දුරකථනය හරහා සකස් කර තිබූ වාර්තාවද?

පි: ඔව්. මේ තියෙන්නේ IMEI number එක වාර්තාවේ සඳහන් වෙනවා.

ප්‍ර: දැන් ඔබට මෙම ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්නට පුළුවන්ද Apple iphone මාදිලියේ ජංගම දුරකථනයක් දැන් ඔබ සඳහන් කරා මෙම C – 996 (A) CD තැටිය තුළ තිබෙන්නේ Apple මාදිලියේ ජංගම දුරකථනයකට අදාළ විශ්ලේෂණ වාර්තාවක් බවට. Apple මාදිලියේ ජංගම දුරකථනයක සමාජ මාධ්‍ය යෙදුම් එහෙම නැත්නම් Social media apps උදාහරණයක් වශයෙන් WhatsApp, Viber, Face Book වැනි applications default appsවශයෙන් තිබෙනවද?

පි: නැහැ. අපි ඒවා බාගත කරලා ස්ථාපිත කර ගන්නට ඕනි.

ප්‍ර: යමෙකු Apple දුරකථනයක් මිලදී ගත් විට අදාළ යෙදුම් ඔහු විසින් බාහිරව බාගත කිරීමක් සිදු කරගත යුතුයි?

පි: ඔව් අවශ්‍යයි.

ප්‍ර: දැන් එලෙස අපි උදාහරණයක් වශයෙන් WhatsApp සමාජ මාධ්‍යය යෙදුම අරගත්තොත් install කරගනු ලබන WhatsApp යෙදුම ඕනෑම අවස්ථාවක එම ජංගම දුරකථනය භාවිතා කරනු ලබන පුද්ගලයාට නැවත uninstall කිරීමේ හැකියාවක් තිබෙනවද?

පි: ඔව් අපි බාගත කරන සහ බාගත කර ස්ථාපිත කරන ඕනෑම application එකක් uninstall කිරීමේ හැකියාවක් ඒ user ට තියෙනවා.

ප්‍ර: දැන් සාමාන්‍යයෙන් රවිඳු මහත්මයා WhatsApp වැනි යෙදුමක් භාවිතා කරමින් සිදු වන්නේ පණිවිඩ හුවමාරුව කිව්වොත් නිවැරදිද?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි: ඔව්. පණිවිඩ කිව්වාම පින්තූර තියෙන්න පුළුවන්, videos තියෙන්න පුළුවන් ඊට සම්බන්ධව ඊට අමතරව calls ගැනීමේ හැකියාවකුත් තියෙනවා.

ප්‍ර: යම් පුද්ගලයෙකු විසින් WhatsApp යෙදුම යම් කාලයකට භාවිතා කිරීමෙන් පසුව එය එකවර uninstall කර නැවත reinstall කළ විට ඔහුගේ එම යෙදුම තුල තිබූ දත්තයන්ට සිදු වෙන්නේ කුමක්ද?

පි: සාමාන්‍යයෙන් WhatsApp අපි ගත්තොත් WhatsApp, Apple phone එකට install කරපුවම ඒකේ data කියලා folder එකක් හැදෙනවා. ඒ data කියන folder එකේ තමයි අපි කරපු chats මොනවද, යවපු images මොනවද, videos මොනවද කියන දේවල් සඳහන් වෙන්නේ. එතකොට අපි ඒ application එක uninstall කරොත් ඒ data කියන folder එකත් mobile phone එකෙන් අයන් වෙනවා.

ප්‍ර: ඔබ දැන් මේ සඳහන් කරන්නේ Apple මාදිලියේ ජංගම දුරකථනයක වෙන ක්‍රියාවලිය එහෙම නේද?

පි: එහෙමයි.

ප්‍ර: සාමාන්‍යයෙන් මහත්මයා WhatsApp මාර්ගයෙන් යම් රූපයක් ලැබුණාම එය ජංගම දුරකථනය වෙත බාගත කර ගත යුතුයි නේද එය දිස් වෙන්නට?

පි: මෙහෙමයි සාමාන්‍යයෙන් WhatsApp application එක mobile phone එකේ install කරාට පස්සේ අපිට chat එකක් හරහා එන Videos, පින්තූර automatically අපේ ධාරිතාවය hard disk එකේ save වෙනවා automatically. ඒක කෙනෙක්ට පුළුවන් ඕන්නම් option එකක් තියෙනවා save නොවී තියන්න හදාගන්නත් හැකියාව තියෙනවා. සාමාන්‍යයෙන් by default automatically save වෙනවා mobile phone එකේ.

ප්‍ර: එයින් අදහස් වෙන්නේ යමෙකු විසින් තම settings මාරු කර නොතිබෙනම් එය ජංගම දුරකථනය ලබා ගත් ආකාරයටම තිබෙනවානම් WhatsApp මාර්ගයෙන් ඔහුට ලැබෙන යම් රූපයක් ක්ෂණිකව දිස් වෙනවායි කියලද එය බාගත කිරීමක් අවශ්‍ය වෙන්නේ නැහැ?

පි: නැහැ ඒක automatically එයා ඒ chats එකේදී ඒක බැලුවොත් click කළොත් ඒක බාගත වීමක් සිදු වෙනවා automatically පිටිපස්සෙන්.

ප්‍ර: දැන් ඔබ සඳහන් කළ option එක තෝරාගෙන තිබුණොත් එය ඔහු විසින් තමන්ගේ command එකක් මත බාගත කිරීමක් සිදු කරගෙන ඉන් අනතුරුව නැරඹිය යුතුයි?

පි: ඔව්. මට නරඹන්න හැකියාවක් තියෙනවා. නමුත් මට save කරන්න ඕන්නම් අර option එක දාලා නැත්නම් මට save කරන්න ඕනිනම් save කිරීමේ function එක දීලා තියෙනවා. හැබැයි අර මං කිව්වා වගේ by default අපිට save කරන්න ඕනි නැහැ automatically save වෙනවා. හැබැයි දැන් මං වගේනම් දත්ත දැන් chat වැඩි වෙනකොට වැඩිවෙනකොට

FAIR COMMENT BY JEZEEM

Presidential Secretary's Copy

දත්ත ප්‍රමාණය වැඩි වෙනවා. එතකොට මම කරන්නේ ඒ option එක අයින් කරලා තියෙන්නේ. මට ඕනි ඒවා විතරයි මම save කර ගන්නේ. මට selected ඒවා මට save කිරීමේ හැකියාවක් තියෙනවා.

ප්‍ර: දැන් මහත්මයා ඔබ සඳහන් කරානේ ඔබ විසින් විශ්ලේෂණය කරන්නට යෙදුණු සහ C – 996 (A) වශයෙන් ලකුණු කර තිබෙන වාර්තාවට ප්‍රස්තුත ජංගම දුරකථනයේ memory capacity එක 16GBක් බවට?

පි: ඔව්.

ප්‍ර: යම් පුද්ගලයෙකුට හැකියාවක් තිබෙනවද යෙදුම් හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ඔස්සේ මීට වඩා වැඩි memory capacity එකක් ලබා ගන්නට?

පි: බැහැ. 16GB යිනම් අපිට පාවිච්චි කරන්න පුළුවන් වෙන්නේ 16GB යි. නමුත් දැන් තාක්ෂණයේ දියුණුවත් සමඟම තියෙනවා cloud services.

ප්‍ර: cloud services යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

පි: cloud services කියලා කියන්නේ අපේ දැන් අපි ගත්තොත් උදාහරණයක් වශයෙන් මේ iphone එක ගත්තොත් අඩුම capacity එක තමයි 16GB. Entry point එක තමයි ඒ product එකේ 16GB mobile phone එක. තව කෙනෙක්ට යන්න පුළුවන් ඒ mobile phone එකේම 256GB ප්‍රමාණයට යන්න පුළුවන්. නමුත් මිල වැඩිවෙනවා. එතනින් 16GB තියෙන mobile phone එකක් ගත්ත කෙනෙක්ට දැන් තමන්ගේ දත්ත වෙන තැනක save කර ගන්න පුළුවන් හැකියාවක් තියෙනවා වෙන මෘදුකාංගයක් හරහා save කරන්න හැකියාවක් තියෙනවා මේ cloud application පාවිච්චි කළොත්. එතකොට වෙන්නේ මම මොකක් හරි දෙයක් බාගත කරාට පස්සේ මම ඒ cloud services එකට upload කරනවා. ඒ අපි හිතමුකෝ පින්තූරයක් කියලා ඒ පින්තූරය මම මගේ mobile phone එකේ save කර ගන්නේ නැහැ. මම ඒක cloud service එකකට upload කරලා තියා ගන්නවා. එතකොට මට ඕනි වෙලාවකම මට ඒ cloud service එකට access තියෙනවානම් මට ඕන අවස්ථාවකදී ඒ පින්තූරය නැවත මගේ ජංගම දුරකථනයට ලබා ගැනීමේ හැකියාවක් තියෙනවා. ඉතින් මේක එක facility එකක් මේ cloud service වලදී දීලා තියෙන එක facility එකක්.

ප්‍ර: එයින් අදහස් වෙන්නේ මහත්මයා දැන් මේ cloud services භාවිතා කරන ජංගම දුරකථනයක් තුළ ජංගම දුරකථනයේ තිබෙන memoryට එය save කිරීමක් අවශ්‍ය වෙන්නේ නැහැ. cloud services හරහා එම service එක වෙත upload කිරීමක් සිදු කර එයින් අවශ්‍ය පරිදි පරිශීලනය කිරීමට හැකියාවක් ලැබෙනවායි කියලාද?

පි: සමහර cloud services තියෙනවා අපේ camera roll එක අපේ camera එකෙන් ගන්න පින්තූර නැතනම් gallery එකේ තියෙන පින්තූර

FAIR COMMENT BY JEZEEM

automatically update වෙනවා. ඒ cloud service එකෙන්ම දීලා තියෙනවා තව option එකක් automatically upload වෙන්න එපා අපිට ඕනි දේවල් select කරලා upload කරන්නත් හැකියාව තියෙනවා. ඒ වගේ option 2ක් තියෙනවා ඒ cloud services ගත්තොත්.

ප්‍ර: ඔබට උදාහරණ වශයෙන් ගරු කොමිෂන් සභාවට දක්වන්න පුළුවන්ද Apple මාදිලියේ ජංගම දුරකථනයක භාවිතා කළ හැකි cloud services මොනවද කියලා?

පි: සාමාන්‍යයෙන් Apple ජංගම දුරකථනයක් පාවිච්චි කරනවානම් Apple Account එකක් තියෙන්නට ඕනි. ඒ Apple Account එකත් එක්කම associate වෙනවා i cloud account එකක්. එතකොට by default user කෙනෙක්ට 5GB හම්බවෙනවා ධාරිතාවක් හම්බවෙනවා i cloud එකේ. i cloud storge එකක් හම්බ වෙනවා 5GB. ඒක ඉතාම දැන් කාලේ හැටියට ගත්තොත් ඉතාම ස්වල්ප ප්‍රමාණයක්. ඊට වඩා වැඩියෙන් අපිට ගන්නට පුළුවන් හැබැයි subscription fee එකක් තියෙනවා. එතකොට අපිට උදාහරණයක් වශයෙන් ඩොලර් මාසෙකට ඩොලර් 2ක් ගෙවලා 200GB ක් අර ගන්නට හැකියාවක් තියෙනවා. ඒ වගේ facility එකක් තියෙනවා. හැබැයි by default හම්බ වෙන්නේ user කෙනෙක්ට 5GB. ඒක අනිවාර්යයෙන් Apple Phone එකකින් දෙනවා. ඊළඟට තෙවන පාර්ශවීය cloud application තමන්ට පාවිච්චි කරන්න පුළුවන්. උදාහරණයක් වශයෙන් Google drive එක පාවිච්චි කරන්න පුළුවන්. Drop box කියලා තියෙනවා. ඊට පස්සේ File share කියලා තියෙනවා. ඒවගේ විවිධාකාරයේ මෘදුකාංග තියෙනවා. Third party softwares තියෙනවා අපිට install කරලා තියා ගන්නට පුළුවන්.

ප්‍ර: දැන් ඔබ සඳහන් කළ පිළිතුරට අනුව අදහස් වෙන්නේ Apple මාදිලියේ ජංගම දුරකථනයක එම දුරකථනයේ තියෙන 16GB ට අමතරව by default i cloud ගිණුමක් හරහා තවත් 5GB ක ධාරිතාවක් ලැබෙන බව?

පි: හරි.

ප්‍ර: ඊට අමතරව එම ජංගම දුරකථනය භාවිතා කරන පුද්ගලයාගේ කැමැත්ත අනුව i cloud ධාරිතාව වැඩි කර ගැනීමේ හැකියාවක් තිබෙනවා ගෙවීමක් කිරීමෙන් පසුව?

පි: ඔව් නිවැරදියි.

ප්‍ර: ඊටත් අමතරව වෙනත් යෙදුම් Drop box සහ Google drive වැනි වෙනත් යෙදුම් මාර්ගයෙන් තවදුරටත් ඔහුගේ ජංගම දුරකථනයේ memory capacity එක වැඩි කිරීමේ හැකියාවක් තියෙනවා එය නිවැරදිද?

පි: නිවැරදියි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: i cloud සහ Drop box වැනි cloud services තුළට ඕනෑම වර්ගයේ දත්තයක් upload කළ හැකිද?

පි: ඕනෑම file එකක් upload කිරීමේ හැකියාවක් තියෙනවා.

ප්‍ර: රූපමය මාධ්‍ය images ?

පි: පුළුවන්. ගොඩක් වෙලාවට රූප, ලියකියවිලි අපි කියනවා PDF file, document files, presentation files ඒවා ඕනි දෙයක් upload කිරීමේ හැකියාවක් තියෙනවා.

ප්‍ර: WhatsApp මාර්ගයෙන් යම් පුද්ගලයෙකු විසින් හුවමාරු කරගෙන තිබෙන පණිවිඩ එහෙමත් නැත්නම් අපි කියනවා chats කියලා එම chats upload කිරීමක් කරන්න පුළුවන්ද i cloud ගිණුමකට හෝ Drop box ගිණුමකට?

පි: Drop box ගිණුමකට අමාරුයි. දැන් Apple ගත්තොත් එයලාගේ by default එන්නේ i cloud ගිණුම. එතකොට WhatsApp එකෙන් support කරනවා chat එක Backup කරන්නට i cloud Storage එකෙන්. ඒක මට disable කරන්නත් පුළුවන්. මට Enable කරන්නත් පුළුවන්. ඒක userට පුළුවන් define කරන්න ඒක කරන්නද බැරිද කියන එක. එතකොට Android පැත්තට ගත්තොත් by default ඒ කියන්නේ ඒක වෙනස් කරන්න අමාරුයි. වෙනස් කරන්න බැහැ. By default Android ගත්තොත් ඒක upload වෙන්නේ Google drive එකට. මොකද Android ගොඩක් වෙලාවට Google ආයතනය හරහා තමයි කටයුතු කරන්නේ.

ප්‍ර: දැන් Apple මාදිලියේ ජංගම දුරකථනයක් ගත්තොත් එය බොහෝ වෙලාවට WhatsApp හරහා සිදු වෙන chats upload වීමක් සිදු වෙන්නේ i cloud ගිණුමට?

පි: නිවැරදියි.

ප්‍ර: දැන් එම upload වීම ස්වයංක්‍රියව සිදු වීමට යම් පුද්ගලයෙකුට තමන්ගේ ජංගම දුරකථනය සැකසුම් කරන්න පුළුවන්ද?

පි: පුළුවන්. ඒක දාන්න පුළුවන් Wi-Fi enable වෙලා තියෙන වෙලාවක automatically update වෙන්න දාන්න පුළුවන් facility එකක් තියෙනවා. එතකොට අපිට manually ගිහිල්ලා upload කරන්න ඕනි නැහැ. Wi-Fi තියෙනවානම් Internet access එක තියෙනව නම් ඒක automatically device එකෙන් upload කරනවා.

ප්‍ර: දැන් එලෙස upload වුණායින් අනතුරුව ජංගම දුරකථනයේ memory තුළ save වෙලා තියෙන අදාළ chats මකා දැමීමක් සිදු වෙනවද?

පි: අපිට පුළුවන් මකන්න. Userට පුළුවන් chats සහ ඒකේ තියෙන පින්තූර delete කිරීමේ හැකියාවක් තියෙනවා.

ප්‍ර: ජංගම දුරකථනය භාවිතා කරන පුද්ගලයාගේ අභිමතය පරිදි එය මකා දැමීමේ හැකියාවක් තිබෙනවා?

FAIR COMMENT BY JEZEEM

පි: පුළුවන්. හැකියි.

ප්‍ර: දැන් යම් පුද්ගලයෙකු විසින් තමන්ගේ WhatsApp ගිණුමේ තියෙන දත්තයන් i cloud හෝ Drop box ගිණුමකට උඩුගත කිරීමෙන් අනතුරුව තමන්ගේ ජංගම දුරකථන memory යේ තියෙන අදාළ දත්ත මකා දමා තිබෙන අවස්ථාවක අදාළ ජංගම දුරකථනය ඔබගේ ආයතනය වැනි ආයතනයක් විසින් විශ්ලේෂණය කිරීමේ දී අදාළ දත්ත ප්‍රතිඋත්පාදනය කිරීමක් සිදු වෙනවද ?

පි: සිදු වෙනවා.

ප්‍ර: එම දත්ත අදාළ වාර්තාවේ අඩංගු විය යුතුයි?

පි: දත්ත ලබා ගැනීමේ possibility එකක් තියෙනවා.

ප්‍ර: ඔබ විසින් සකස් කරනු ලැබූ C – 995 දරණ වාර්තාව මඟින් එවැනි දත්ත සොයා ගැනීමට ඔබට හැකියාවක් ලැබුණාද 2018, 2019 කාලය සඳහා?

පි: Delete කරන ලද කිසිම දත්තයක් සොයා ගන්නට ලැබුණේ නැහැ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු දැන් ජංගම දුරකථනයක් සාමාන්‍යයෙන් පුද්ගලයෙකු අරගෙන ප්‍රථම වරට භාවිතා කරන විට (අපි Apple එකක් ගැන විතරක් කතා කරමු) ඒකට තමන්ගේ නම , ඉන්න රට කොහේද හුඟාක් අවස්ථාවල සහ විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබා දීම අනිවාර්යයි නේද?

පි: අනිවාර්යයි.

ප්‍ර: ඒ ලබා දෙන විද්‍යුත් තැපැල් ලිපිනයට අනුව තමන්ගේ ජංගම දුරකථනය ඊට පසුව කරන සියලු ක්‍රියාකාරකම් එම ලබාදීලා තියෙන විද්‍යුත් තැපැල් ලිපිනය යටතේ ඒ සමාගමට save කරලා තියෙනවා නේද ඒකේ යම් කිසි අවස්ථාවක භාවිතා කරන පුද්ගලයාට අවශ්‍ය වුණොත් ඒක ගන්න පුළුවන් වෙන විදිහට?

පි: මෙහෙමයි අපි mobile phone එක ගත්තොත් මේ iphone එකේ userට email account එකක් තිබිය යුතුමයි. එතකොට තමයි එයාට i cloud එක එහෙම නැත්නම් mobile phone එක පාවිච්චි කරන්නට වෙන්නේ. එතකොට මේ phone එකේ තියෙන සියලුම දත්ත ඒ අයිති වෙන්නේ ඒ email එක අයිති කෙනාට තමයි. Email Address එක අයිති කෙනාටයි. නමුත් ඒ iphone එකේ තියෙන දත්ත මොනවද කියන එක Apple ආයතනයවත් දන්නේ නැහැ.

ප්‍ර: එහෙමනම් විද්‍යුත් තැපැලක් දෙනවානේ භාවිතා කරන එක්කෙනාට. ඒ විද්‍යුත් තැපැල් ලිපිනය භාවිතා කරලා ඒ දුරකථනයෙන් භාවිතා කරපු ඒ ලැබුණු දත්තයන් එහෙම වාර්තාගත කරන වාර්තා වෙලා තියෙන මොනවා හරි යම්කිසි ස්ථානයක් තියෙනවද?

FAIR COMMENT BY JEZEEM

පි: අපි සාමාන්‍යයෙන් මොනවා හරි මිලදී ගන්නවානම් එකක්. අනිත් එක සාමාන්‍යයෙන් Apple phone එකක soft ware එකක් install කරනකොට Apple store එක හරහා තමයි install කරන්න ඕනි. Apple store එක හරහා install කරනවා කියලා කියන්නේ Apple Account එකක් තියෙන්න ඕනි. එතකොට ඒකේදී බාගත කරන්නේ මොනවද ඒ පිළිබඳ විස්තරයක් Apple සමාගමේ තියෙන්න පුළුවන්. මේ user Account එකෙන් මොනවද මෙයා බාගත කරලා තියෙන්නේ. ඒ විස්තර තිබිය හැකියි.

ප්‍ර: ඒ කියන්නේ ඒ විස්තරවල තියෙන්නේ භාවිතා කරපු යෙදුම් නැත්නම් Apps විතරද නැත්නම් ඒ Apps මාර්ගයෙන් ලබා ගත්ත දත්තයනුත් හොයා ගන්න පුළුවන්ද?

පි: දත්ත ගැන සටහනක් නම් නැහැ. තියෙන්නේ මොනවද download කරේ මොනවද install කරේ කියන දේවල් තමයි එයලා තියාගෙන ඉන්නේ. අනිත් එක තමයි documents වගේ ඒවා ගත්තොත් ඒවා අර i cloud එකේ තමයි save වෙන්නේ. නමුත් ඒවා Apple ආයතනයට බැලීමේ හැකියාවක් නැහැ. නමුත් අධිකරණ නියෝගයක් හරහා මේ දැන් මම අර i cloud Account එකක් තියෙනවානේ. අධිකරණ නියෝගයක් හරහා Apple ආයතනයට කිව්වොත් මෙන්න මේ අදාළ විස්තර හොයලා දෙන්න කියලා එයාලට i cloud account access කරලා ඒ දේවල් ගැනීමේ හැකියාවක් තියෙනවා. ඒක කරන්නේ නැත්තේ අර Privacy issue එක හින්දා. නමුත් අධිකරණයක් වගේ තැනකින් කිව්වොත් ඒ දේ කරනවා එයාලා.

ප්‍ර: ඔබ මේ පරීක්ෂා කරපු iphone එකේ අදාළ i cloud එකට ඔබට ඇතුළත් වීමට අවකාශයක් ලැබුණාද?

පි: නැහැ ස්වාමිනි.

ප්‍ර: ඒක ලැබුණේ නැත්තේ ඔබට අර password එක නැති හින්දාද?

පි: ඔව් එසේයි ස්වාමිනි.

ප්‍ර: ඒ password එක phone එකේ අයිතිකාරයා ලබා දුන්නොත් ඔබට ඒකට ඇතුළු වෙන්න පුළුවන්ද?

පි: ඔව් password එක ලබා දුන්නොත් i cloud account එකට ඇතුළු වීමේ හැකියාවක් තියෙනවා.

ප්‍ර: ඇතුළු වීමේ හැකියාවක් තිබ්බොත් ඒක දැන් අපි හිතමු අද දිනය ගත්තොත් අද දිනයේ ඒ i cloud එකට ඇතුලත් වුණානම් අවුරුදු කීයක් පිටිපස්සට අපිට බලන්න පුළුවන්ද?

පි: i cloud එකේ ඇත්තටම තියෙන්නේ අපි විසින් upload කරන ලද දත්ත. මට ඕනිනම් i cloud එකෙන් ඒ දත්ත අයින් කිරීමේ හැකියාවක් තියෙනවා. එතකොට මම Delete කරපු items i cloud එකේ තියාගෙන ඉන්නේ නැහැ. හැබැයි i cloud එකේ තියෙනවා trash එකක්. අපි laptop වලත්

FAIR COMMENT BY JEZEEM

තියෙන්නේ recycle bin කියලා. ඒවගේ යම්කිසි කාලයක් ගොඩාක් වෙලාවට මාසයක් වගේ ඒ දත්ත server එකේ තියා ගන්නවා අපිට නැවත recover කර ගන්නට හදිස්සියක් වුණොත්.

****

දැන් වේලාව : ප.ව. 7.40
මෙතැන් සිට ල/ලේ : චන්දිමා මෙනවිය

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

ප.ව.7.40
පෙර සටහන් :ල/ලේ නිල්මිණි කුමාරි
මෙතැන් සිට:ල/ලේ චන්දිමා දිල්හානි.

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: එච්චරයිද තියෙන්නේ?

පි: ඔව් ඊට පස්සේ ඒකත් Sever එකෙන් අයින් වෙනවා නමුත් අවස්ථා තියෙනවා ලංකාවේ නම් මං දන් නෑ ගොඩාක් වෙලාවට පිටරට සිද්ධීන් දැකලා තියෙනවා එහෙම මාසෙකට පස්සෙත් අධිකරණ නියෝගයක් හරහා ඇපල් ආයතනයෙන් ඉල්ලුවොත් ඒ දත්ත දීපු අවස්ථා තියෙනවා.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා</u>

ප්‍ර: chairman අහපු ප්‍රශ්නයට මම continuation එකක් විදියට අහන් නම් මීගස්මුල්ල මහත්මයා දැන් ඒ iphone එක ගැනමයි මම අහන්නේ එතනදි අද තියෙන password එක එයා අපිට දෙනවා මේකයි password කියලා එතකොට අපි icloud එකට ගිහිල්ලා විස්තර හොයා ගන්න පුළුවන් බැරි වෙලාවක්වත් එයාට හොර හිතක් තියෙනවා නම් එයා password එක වෙනස් කරලා තිබුණොත් මීට පෙර password එක යටතේ තියෙන තොරුතුරු නැවත retrieve කරන්න බෑනේ ?

පි: Retrieve කරන්න බෑ එක තමයි අනිත් අපිට පාස්වර්ඩ් එක දීලා අපිට කලින් එයාට පුළුවන් පරිගණකයක් හරහා icloud එක ඇතුලට යන්න ගිහිල්ලා delete කිරීමේ හැකියාවකුත් තියෙනවා.

ප්‍ර: හරී ඊට අමතරව ටෙලිග්‍රෑම් ඇප් එක හරි ත්‍රීමා ඇප් එක හරි කොයි ක්‍රමයෙන් හරි Retrieve කරන්න පුළුවන්කමක් තියෙනවද?

පි: මට තේරුන් නැහැ ස්වාමිනි.

ප්‍ර: ටෙලිග්‍රෑම් ඇප් එකෙන් කරන ලද ගනුදෙනුවලට අදාල තොරතුරු නැවත එළියට ගන්න පුළුවන් කමක් තියෙනවාද?

පි: ඒ Telegram, whatsapp ,වට්සැප් ඒ හරහා වෙන හුවමාරු දත්ත ගොඩාක් වෙලාවට ඒ අදාල ආයතනයේ ස්ථාපිත වෙලා තියෙන්න පුළුවන්. ඒ ආයතනයේ ඒ පුද්ගලයාට account එකක් තියෙනවා නම් ඒ පුද්ගලයාට පොඩි අවකාශයක් දීලා තියෙනවා එයා customer කෙනෙක් හින්දා ඒ වුනාත් ඒවා කම්පැනි එකේ තියෙන කාලය වෙනස් වෙන්නට පුළුවන්. නමුත් අපිට ගිහිල්ලා investigation එකකදි අපිට ගිහිල්ලා application එකේ මොනවද වුණේ කියන එක හොයා ගන්න අමාරුයි. දැන් උදාහරණයක් ගත්තොත් Whats APP අලුත්ම එක තමයි අපි කථා කරන දෙයක් හරි යවන එක ගැන හරි encrypt වෙලා තමයි යන්නේ එතකොට

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Third party එකකින් Access කරොත් අපිට ඒ දත්ත කියවා ගන්නට බැහැ. නමුත් whatsapp ආයතනයට අධිකරණ නියෝගයක් හරහා කිව්වොත් මේ කාල වකවානුව තුලදි මේ පුද්ගලයා කථා කරේ මොනවද කියන එක හොයලා දෙන්න කියලා කිව්වොත් ඒ ආයතනවලින් ලබා දීලා තියෙනවා. අනිත් ඒක තමයි මේ mobile phone සම්බන්ධයෙන් investigation එකක් කරන කොට ඒකටම proprietary software's තියෙනවා. එතකොට මේ දැන් CID එකේ ආයතනයේ පාවිච්චි කරලා තියෙන්නේ එහෙම proprietary software's එකක් එතකොට මගේ ආයතනය අපේ ආයතනය පාවිච්චි කරපු එක mobile phone වලට proprietary software's එකක් නෙමේ . එතකොට සමහරවිට දත්ත වෙනස් වෙන්න මෙහෙමයි දත්ත වෙනස් වීමේ හැකියාවක් තියෙනවා නමුත් මගේ පෞද්ගලික අදහස තමයි මට කිසිම දෙයක් හොයා ගන්න හම්බුණේ නැහැ delete කරපුවා ඒ කියන්නේ 75% ක් විතර factory rest කිරීමේ හැකියාවක් තිබිලා තියෙනවා කරලා තියෙනවා . නමුත් මේ CID එකෙනේ කරලා තියෙන රිපෝට් එකෙන් ගොඩාක් දත්ත හොයාගෙන තියෙනවා. නමුත් delete කරපුවා පැත්තට ගියොත් ඒවල delete කරපු ටයිම් එක ඒවා install කරපු ටයිම් එක වගේ දත්ත මේ application එකෙන් අරගෙන නැහැ. ඒ අරගෙන නැතිවෙන්න හේතුව තමයි ඒ apple ජංගම දුරකථනයේ මෙහෙයුම් පද්ධතියේ දාලා තියෙන ආරක්ෂක මෙවලම් ඒ User ගේ privacy එක ආරක්ෂා කරන්න තමයි මේක දාලා තියෙන්නේ මේ tools වලින් කරන්නේ අර ඒක කඩලා information ගැනීමක් එතකොට සමහර අවස්ථාවලදි whatsapp අලුතෙන් install කරලා තියෙනවා නම් දත්ත ආපහු බලා ගන්න හැකියාවක් නැහැ.

ප්‍ර: තව එක ප්‍රශ්නයක් තියෙනවා factory resetting කරලා තියෙනවා නම් එතකොට පුළුවන්ද Google ආයතනයට Retrieve කරලා ගන්න?

පි: factory resetting කරන්නේ අපේ device එකේ එතකොට Google ආයතනයේ save වෙනවා නම් ගූගල් ආයතනයේ මොකක් හරි cloud service එකක් පාවිච්චි කරන්නට ඕනේ. එතකොට එහෙම අවස්ථාවකදී ඒ ආයතනයට recover කිරීමේ හැකියාවක් තියෙන්නට පුළුවන්.

ප්‍ර: ඒකටත් අධිකරණ නියෝගයක් අවශ්‍යයි?

පි: අවශ්‍යයි හැබැයි තමන්ගේ mobile phone එකේ තමන්ගේ මට හම්බෙනවානේ Storage එකක් ඒ Storage එකේදි මම factory reset කරොත් ඒ Storage එකේ කිසිම දෙයක් Recover කරන්නට බැහැ. හැබැයි factory reset කරා කියලා icloud එකේ තියෙන ඒවා අයින් වෙන්නේ නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: Dark web එක හරි ත්‍රීමා ඇප් එක හරි ඒ සියලු දේ ඔය කියන සිද්ධාන්ත අදාල වෙනවද ?

පි: අදාල වෙනවා Dark web එකේ ප්‍රශ්නය තමයි ඒ Dark web එකේ වගකියන ආයතනයක් නැහැ. අපිට ගිහිල්ලා දෙයක් ඉල්ලන් තැනක් නැහැ. End point එකක් නැහැ. ඒක තවත් chain එකක ආරම්භයක් විතරයි. ඒ කියන්නේ අර පරිගණක ගොඩාක් හරහා නැත්නම් ජාල ගොඩාක් හරහා තමයි Dark net එක වැඩ කරන්නේ ඉතින් ගොඩාක් වෙලාවට මට මගේ investigation එක කරගෙන යනකොට මට හම්බෙන්න පුළුවන් වීනේ තියෙන IP address එකක් එක එතකොට වීනේ විදියට තමයි මං ඇවිල්ලා තියෙන්නේ වීනේ තැනට මං කොහොමද කියලා ගිහිල්ලා බැලුවොත් සමහර වේලාවට ඒ වීනයට මං ඇවිල්ලා තියෙන්නේ තව රටක ඉදන් වෙන්න පුළුවන් ඉතින් ඕක කෙලවරක් නැතිව හොයාගෙන යන්නට වෙනවා. ඒක අමාරුයි.

****

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය</u>

ප්‍ර: දැන් මහත්මයා ඔබ සඳහන් කරනු ලැබුවා යම් ජංගම දුරකථනයක් තුල I cloud Drop box වැනි cloud services භාවිතා කිරීමේ හැකියාවක් තිබෙනවායි කියලා ඔබට දැන් මෙම ගරු කොමිෂන් සභාවේ දිස්වෙන C 999 A වශයෙන් ලකුණු කරනු ලැබූ CD තැටිය තුල තිබූ වාර්තාව පරිශීලනය කරමින් ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්නට පුළුවන් ද ඉමි අංක 355440079893391 දරණ ඇපල් මාදලියේ ජංගම දුරකථනය තුල එවැනි Backup services එහෙම නැත්නම් cloud services භාවිතා වීමක් සිදු වී තිබුණද ?

පි: ඔව් මෙකේ Drop box තිබිලා තිබෙනවා. ඊට අමතරව Icloud account එකකුත් තිබිලා තිබෙනවා

ප්‍ර ඔබ පිළිතුර ලබා දෙන්නේ මෙම වාර්තාවේ කීවෙනි පිටුව නිරීක්ෂණය කරමින් ද?

පි: ඒක මට මෙතැනින් හොයන්න පුළුවන්. මේ තියෙන්නේ මෙකේ file එකක් තියෙනවා ඒක Drop box එකට upload කරපු අවස්ථාවක් තමයි මේ තියෙන්නේ.

ප්‍ර: ඒ අනුව මෙයින් අදහස් වනවද මෙම ජංගම දුරකථනය තුල Drop box යෙදුම භාවිතා වී තිබුණු බවට?

පි: ඔව් ඊට අමතරව තව ටිකක් පල්ලෙහාට ගියොත් Drop box එකේ use name එක සහ password එකත් දිස්වෙනවා.

ප්‍ර: ඔබ එය උපුටා ගන්නේ කීවෙනි පිටුවේන් ද කියලා ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න මෙම වාර්තාවේ කීවෙනි පිටුවෙන්ද?

FAIR COMMENT BY JEZEEM

පි: 2550 පිටුව

ප්‍ර: 2550 පිටුව ?

පි: ඉතින් ඇත්තටම මේකේ මේ පුද්ගලයා එයාගේ තියෙන account වල username සහ password save කරලා තියෙනවා mobile phone එකේ. ඉතින් මේක ඒ වෙලාවේ කවුරු හරි මේක investigation ඒක කරන වෙලාවේ දැක්කනම් මේ අවස්ථාවේදී එයාට Drop box ඇතුලට ගිහිල්ලා එහෙම නැත්නම් මේකේ ගොඩාක් දේවල් තියෙනවා. ඊමේල් තියෙනවා. එතකොට Microsoft email account ඒකේ username එක Password තියෙනවා මේවා බලලා පොඩ්ඩක් ගැනීමේ හැකියාවක් තිබුණා ඒ අවස්ථාවේදී.

ප්‍ර: මීට අමතරව මහත්මයා ඔබට සඳහන් කරන්න පුළුවන්ද මෙම ජංගම දුරකථනය තුල I cloud service සේවාව භාවිතා වී තිබුණා ද යන්න සම්බන්ධයෙන් ?

පි: ඔව් මේකේ අයික්ල්වුඩ් I cloud account එකක් තියෙනවා නැතිව ඇපල් පරිගණකයක් පාවිච්චි කිරන්නට අමාරුයි.

ප්‍ර: ඒ අනුව එය මෙම දුරකථනයේ අනිවාර්යෙන්ම I cloud ගිණුමක් තියෙන්නට ඕනී?

පි: තියෙන්නට ඕනි. දැන් සාමාන්‍යයෙන් ownerගේ name එකත් සාමන්‍යයෙන් වැටෙනවා ඔහු කවුද කියලා

ප්‍ර: එහි අයිතිකරුගේ නම වශයෙන් mohomad zafra's iPhone වශයෙන් සඳහන් වී තිබෙනවාය කිව්වොත් නිවැරදිද?

පි: නිවැරදියි .

ප්‍ර: එය සඳහන් වී තිබෙන්නේ කීවෙනි පිටුවේද?

පි: දෙවනි පිටුවේ.

ප්‍ර: ඔබට මහත්මයා මා ඔබගේ අවධානයට යොමු කර සිටිනවා මෙම වාර්තාව තුල 3312 වන පිටුව වෙත මෙම පිටුවෙහි දිස් වන්නේ කුමක්ද කියලා ගරු කොමිෂන් සභාවට ඔබට පැහැදිලි කරන්න පුළුවන් ද ?

පි: මේ පිටුවේ දිස්වන්නේ ඒ mobile phone එකට ආපු සහ ගියපු text messages සහ SMS Message සහ මේවා කාගෙන් කාටද ගියේ යන විස්තර?

ප්‍ර: ගරු මැතිතුමණි මේවන විටත් C 996 A CD තැටිය තුල අන්තර් ගත වාර්තාවේ 3312 වන පිටුව C 996 B වශයෙන් ලකුණු කර තිබෙන බව ගරු කොමිෂන් සභාවේ අවධානය වෙත යොමු කර සිටිනවා. මෙම පිටුවෙහි අනු අංක 1055 යටතේ යම් SMS පණිවිඩයක් දක්වා තිබෙනවා කිව්වොත් නිවැරදිද ?

පි: නිවැරදියි .

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එය ඔබට ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්නට පුළුවන් ද මෙම දුරකථනයට ලැබුණු SMS පණිවිඩයක් ද එසේත් නැතිනම් මෙම දුරකථනයෙන් පිටව ගිය SMS පණිවිඩයක් ද ?

පි: මේක. ලැබුණු SMS පණිවිඩයක් මේ Incoming කියලා තියෙන්නේ. අපිට ආපු SMS Message එකක් .

ප්‍ර: එය කවදාද මෙම දුරකථනයට ලැබී තිබෙන්නේ?

පි: මේක ලැබෙන්නේ 2018.08.26 මේක මේ 11 .25 කියලා කියන්නේ UTC + 0 එතකොට අපි මේකට පැය 05 කුත් විනාඩි 30 කුත් එකතු කරාම තමයි ලංකාවේ Time එක මෙතනට එන්නේ

ප්‍ර: ඒ අනුව 2018 අගෝස්තු 27 වන දින පෙරවරු 4.55 ට පමණ ලැබුණු පණිවිඩයක් ශ්‍රී ලංකාවේ වෙලාවේන් පෙරවරු 4.55 ට විතර ලැබුණු පණිවිඩයක් කියලා කිව්වොත් නිවැරදිද ?

පි: ඔව්

ප්‍ර: එම පණිවිඩය ලැබී තිබෙන්නේ කුමන අංකයකින් ද ?

පි: ඒ ලැබී තියෙන්නේ Form +94 ඒ කියන්නේ ලංකාවේ නම්බර් එකක් 0778469250 කියන නම්බර් එකය තමයි හම්බිලා තියෙන්නේ.

ප්‍ර: මෙම වාර්තාව තුල දක්වා තිබෙනවද අදාල SMS පණිවිඩයේ අන්තර්ගත වී තිබුණේ කුමක්ද කියලා?

පි: ඔව් අන්තර්ගත වීමක් සඳහන් වෙනවා.

ප්‍ර: මොනවද අන්තර්ගයත් මේකේ තිබෙන්නේ?

පි: number එකක් සහ නමක් තමයි සඳහන් වෙලා තියෙන්නේ. නම්බර් එක 0767998752 MOHAMMED කියන .

ප්‍ර: දැන් මහත්මයා එම තීරුවේම අවසානයට Intact වශයෙන් සඳහන් වී තිබෙනවා ඔබට ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න පුළුවන් ද මේ Intact කියන වචනයෙන් අදහස් වෙන්නේ මොකක්ද ?

පි: ඒකෙන් අදහස් වෙන්නේ මේ විශ්ලේෂණය කරන අවස්ථාවේදී මෙම SMS පණිවිඩය මෙම ජංගම දුරකථනයේ තිබිලා තියෙනවා. ඒ කියන්නේ delete කරපු එකක් නෙමේ ඒ අවස්ථාවේ තිබිච්ච SMS පණිවිඩයක් තමයි.

ප්‍ර: ගරු මැතිතුමණි මේ අවස්ථාවේදි ගරු කොමිෂන් සභාවේ අවධානය යොමු කර සිටින්නේ මෙම SMS පණිවිඩය ලැබුණු අංකය වශයෙන් සඳහන් වන 0778469250 දරණ දුරකථන අංකය දැනටමත් අබ්දුල් රවුෆ් නැමැති පුද්ගලයකු විසින් භාවිතා කරනු ලැබූ දුරකථන අංකයක් බවට ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි මෙහෙයවා ඇති බවත් එම පණිවිඩය තුල අන්තර්ගතය වී පැමිණි 0767998752 දරණ දුරකථන අංකය සම්බන්ධයෙනුත් මෙම ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි මෙහෙයවා ඇති බවට අද දින පෙර පැමිණි සාක්ෂිකරුවන් හරහා සාක්ෂි ලබා දුන්

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

බවට ස්වාමිනි. එය ඒ .පස්මීර් නැමති පුද්ගලයා නමින් නිකුත් වී තිබෙන බවට ගරු කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි මෙහෙය වනු ලැබුවා

ප්‍ර: ඒ අනුව මෙම පණිවිඩය අදාල දුරකථනය වෙත ලැබුණු SMS පණිවිඩයක්?

පි; නිවැරදියි.

ප්‍ර: දැන් ඔබට මේ C 996A වාර්තාව පරීශීලනය කරමින් ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්නට පුළුවන් ද whatsapp යෙදුම මෙම දුරකථනයට බාගත කර තිබෙනවද ?

පි: ඔව් whatsapp යෙදුම මේකේ බාගත කරලා ස්ථාපිත කරලා තියෙනවා .

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: ඔබට මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තුමෙන්තුව විසින් නිකුත් කර ඇති වාර්තාව නිරීක්ෂණය කිරීමෙන් පසු ව කියන්න පුළුවන්ද මෙම iphone දුරකථනයට whatsapp යෙදුම කරලා තියෙන දිනය වාර්තාවේ සඳහන් කරලා තියෙනවාද?

පි: මේ වාර්තාවේ සඳහන් කරලා නැහැ ස්වාමිනි. මම එතැන්ට යන්නම් මට පොඩ්ඩක් කල් දෙන්න ස්වාමිනි.

ප්‍ර: එතැන්ට යන්න ඉස්සෙල්ලා මට කියන්න සාමාන්‍යයෙන් එහෙම iphone එකකට whatsapp යෙදුම එකට බාගත කරනවා නම් ඒ කරපු දිනය අයි පෝන් එකේ සටහන් වෙනවද?

පි: සටහන් වෙනවා ස්වාමිනි. ස්වාමිනි මේ තියෙන්නේ whatsapp install කරලා තිබුණු version එක decoded yes කියලා කියන්නේ මං අර කලින් කිව්වා වගේ ස්වාමිනි දැන් අලුතෙන් එන whatsapp වල data අපි transfer කරන data encrypt වෙලා තමයි පෙන්වන්නේ නමුත් මේ celebrite මේ proprietary software එකෙන් පුළුවන් whatsapp කියන එක Down grade කරන්න ඒ කියන්නේ මේ ඔය encrypt වෙන්න කලින් version එකට අරගෙන දත්ත කියවන්න පුළුවන් ඒක තමයි මේ decoded yes කියලා වැටෙන්නේ. ඊළඟට මෙතන මේ සාමාන්‍යයෙන් මේ purchased data, installed data සහ delete data කියන ඒවා වැටෙන්නට ඕනේ නමුත් ඒවා මේ වාර්තාවෙන් සඳහන් වෙන්නේම නැහැ. මේකේ ඊට අමතරව සාමාන්‍යයෙන් Lauches, last launched time,active ,background time

ඒ දේවල් මේකේ ලැබෙන්නේ නැහැ ඒකට හේතුවක් තමයි මේක use කරන පුද්ගලයාගේ privacy එක ආරක්ෂා කිරීම සඳහා apple ආයතනයෙන් දලා තියෙන. Security restriction හින්දා වෙන්න පුළුවන්. මේක මෙහෙම වෙන්නේ.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

****

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය</u>

ප්‍ර: ඒ අනුව මහත්මයා ඔබ විසින් මෙම වාර්තාවේ කී වෙනි පිටුව පරීක්ෂා කරමින් ද මෙම කොමිෂන් සභාවට සඳහන් කරේ මෙම ජංගම දුරකථනය තුල ගරු whatsapp යෙදුම භාවිතා වී තිබුණු බව?

පි: 2524 Row number එක 279

ප්‍ර: මෙම දත්ත පදනම් කරගෙන ඔබට සඳහන් කිරීමට පුළුවන් ද මෙම දුරකථන තුලින් යම් අවස්ථාවක whatsapp යෙදුම අන් uinstall කර නැවත re- install කිරීමක් සිදු වී තිබෙන බවට ?

පි: ඒක මට මේ වාර්තා බලලා කියන්නට අමාරුයි මොකද මේ වාර්තාවේ එහෙම දෙයක් සඳහන් වෙන්නේ මොකද අඩුම ගානේ install කරපු වෙලාවක්වත් සඳහන් වෙන්නේ නැහැ මේ වාර්තාවේ නමුත් install කරලා තියෙනවා ඒකේ version එක සඳහන් වෙනවා සහ application එක තියෙනවා කියන එක මේ වාර්තාවේ තියෙනවා ඇරෙන්න අන් කිසිම දෙයක් අපිට අවශ්‍ය දේවල් ගන්නට හම්බිලා නැහැ. නමුත් whatsapp හරහා වෙච්ච chat සමහර දේවල් මේ රිපෝට් එකේ යට තියෙනවා මොනවද කථා කරපු දේවල් මොනවද කියන එක .

ප්‍ර: දැන් ඔබ මීට පෙර සාක්ෂි ලබා දෙමින් සඳහන් කරන්නට යෙදුනා මෙම දුරකථනය තුල icloud සහ Drop box යන ගිණුම් භාවිතා වී තිබුණු බව ඔබ සඳහන් කලේ I cloud ගිණුමක් නොමැතිව මෙම apple මාදිලියේ ජංගම දුරකථනය භාවිතා කිරීමට කිසිදු හැකියාවක් නොමැති බවයි එයින් ගම්‍ය වෙනවද මෙම දුරකථනය භාවිතා කිරීමට පටන් ගත් මුල් දින සිටම I cloud ගිණුමක් මෙහි ක්‍රියාත්මක වූ බවට ?

පි: නිවැරදියි.

ප්‍ර: ඔබට හැකියාවක් තිබෙනවද C 996A වාර්ථාව පරීශීලනය කරමින් ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න Drop box ගිණුම කවදා සිටද මෙහි භාවිතා වී තිබෙන්නේ?

පි: ඒකත් මේකේ සඳහන් වෙන්නේ නැහැ. මේ රිපෝට් එකේ.

ප්‍ර: එහෙත් Drop box ගිණුම භාවිතා වී තිබෙන බවට මෙම වාර්තාවේ කරුණු ඇතුලත් වී තිබෙනවද?

පි: ඔහුට ගිණුමක් තියෙන්නට අවශ්‍ය වන Username එක සහ password එක මේකේ තියෙනවා ඊට අමතරව කෙනෙක්ට පුළුවන් අපිට Drop box install නොකර තියාගෙන අපිට browser එක හරහා කෙනෙක්ට upload කරන්නත් පුළුවන් application එක තියෙන්නත් පුළුවන් නොතිබෙන්නත් පුළුවන්. මේ mobile phone එකේ Drop box කියන එකට අදාල වන account එකක් මේ රිපෝට් එකේ පෙන්වනවා.

Present Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබට හැකියාවක් තිබෙනවද මෙම වාර්තාව පදනම් කරගෙන ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න එම ගිණුම් තුල අදාල පරීශීලකයාට ලැබී තිබෙන ධාරිතා ප්‍රමාණය කොපමණ ප්‍රමාණයක් ලැබී තිබුණද කියලා?

පි: ඒක නම් කියන්නට අමාරුයි.

ප්‍ර: එසේම ඔබට සඳහන් කිරීමට පුළුවන් ද whatsapp වැනි සමාජ මාධ්‍ය යෙදුම්වල තිබෙන චැට්ස් ස්වයංක්‍රීයවම cloud services වෙත upload වීමට මෙම දුරකථනයේ සැකසුම් තිබුණද?

පි: දුරකථනයටත් අමතරව ඒ whatsapp application එකෙන් ඒ facility එක දීලා තියෙනවා.

ප්‍ර: මගේ ප්‍රශ්නය වුනේ මීගස්මුල්ල මහත්මයා මෙම දුරකථනයේ එය ස්වයංක්‍රීයව Backup වීමට එහෙමත් නැත්නම් අදාල chats ස්වයංක්‍රිය cloud service එකක් වෙත upload වීමට වන option එක ක්‍රියාත්මක වී තිබුණා ද කියලා මෙම වාර්තාව මගින් ඔබට කියන්න පුළුවන්ද?

පි: මේ වාර්තාවේ එහෙම දෙයක් සඳහන් වෙන්නේ නැහැ. ස්වාමිනි.

ප්‍ර: දැන් ඔබ මෙම ගරු කොමිෂන් සභාවට මතයක් ඉදිරිපත් කරමින් සඳහන් කරනු ලැබුවා ඔබට මෙම දුරකථනය විශ්ලේෂණය කිරීමට ලැබෙන අවස්ථාව වන විට බොහෝ විට එය factory reset ක්‍රියාවලියකට භාජනය වී තිබුණු බවට

පි: එහෙයි.

ප්‍ර: ඔබට ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්නට පුළුවන්ද C 996 A වාර්තාව සකස් කරන අවස්ථාව වන විට එම දුරකථනය factory reset ක්‍රියාවලියකට ලක් වී තිබුණද නැද්ද යන්න සම්බන්ධව?

පි: එය factory reset ක්‍රමවේදයකට ලක් වී තිබිලා නැහැ තිබුණානම් මේ deleted messages ඒවා recover කර ගැනීමට හැකියාක් වෙන්නේ නැහැ. නමුත් මේ report එකේ deled messages recover කරලා තියෙනවා. ඒ කියන්නේ Factory rest කරලා නැහැ මේ අවස්ථාවේදි.

ප්‍ර: මීට අමතරව මහත්මයා මා ඔබට පෙන්වා සිටිනවා C 997 දරණ ලේඛනය **ස්වාමිනි සාක්ෂිකරු වෙත C 997 වශයෙන් ලකුණු කර තිබෙන ලේඛනය පෙන්වා සිටීමට අවසර ඉල්ලා සිටිනවා.**

ප්‍ර; එය ස්වාමිනි ගරු කොමිෂන් සභාවේ පරීක්ෂණ ඒකකය විසින් ලේකම්වරයා හරහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලැබූ ප්‍රශ්නාවලියකට ලැබුණු උත්තර සහිත වාර්තාව මහත්මයා මෙහි සඳහන් වී තිබෙනවද යම් ප්‍රශ්යකට පිළිතුරක් වශයෙන් මෙම වාර්තාව සකස් කරන අවස්ථාව වන විට මෙම දුරකථනය factory reset ක්‍රියාවලියකට ලක් වී තිබුණාද නැද්ද යන්න සම්බන්ධයෙන්?

FAIR COMMENT BY JEZEEM

පි: මෙකේ නම් කියන්නේ factory reset ක්‍රියාවලියට ලක් කර තිබේද යන්න UFEDT විශ්ලේෂණ වාර්තාවට අනුව නිරීක්ෂණය නොවේ කියන දේ තමයි සටහන් වෙන්නේ.

ප්‍ර: මීට අමතරව මහත්මයා C 996 A ලේඛනය තුල සඳහන් වීමක් සිදු වී තිබෙනවද මෙම දුරකථනයේ තිබූ මතකයේ save කර තිබූ එහෙමත් නැත්නම් whatsapp යෙදුමේ මාර්ගයෙන් ලැබී තිබූ යම් රූපමය දත්ත මකා දැමීමක් සිදු වී තිබෙන බවට?

පි: Deleted දේවල් සඳහන් වෙලා තිබෙනවා. whatsapp හරහා නම් එකයි මේ deleted වෙලා තියෙන්නේ ඒක මං හිතන්නේ Text message එකක් එච්චරයි .

ප්‍ර: රූපමය දත්ත මකා දැමීමක් සිදු වී තිබෙන බවට එහි සඳහන් වෙනවද?

පි: මෙහි සඳහන් වෙන්නේ නැහැ මෙහි වාර්තා වෙලා තියෙන්නේ ඒ වෙලාවේ whatsapp එකේ තිබුණු පින්තූර විතරයි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර: සාක්ෂිකරු යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. දැන් මේ වාර්තාවට අනුව 2018 අගෝස්තුමාසේ 26 ,27 ඔය Apple phone එකේ තිබ්බ යම් SMS පණිවිඩ නැවත ලබාගෙන තිබෙනවා?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: හරිනේ නේද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබෙන වාර්තාවට අනුව?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: ඔබ කියන හැටියට එවැනි 2018 ලැබුණු SMS පණිවිඩ නැවත ලබා ගැනීමේ හැකියාවක් නෑ මේ I phone එක යම් කිසි අවස්ථාවක factory reset කරන එකට භාජනය වුනා නම්?

පි: හරියටම හරි ස්වාමිනි. එසේ ස්වාමිනි.

ප්‍ර එසේ වුනානම් ඒ කියන්නේ ඔබගේ මතය අනුව

ප්‍ර: මේ I phone ජංගම දුරකථනය factory resetting ඒකේ කරලා නැද්ද?

පි: මේ අවස්ථාවේදි කරලා නැහැ.

ප්‍ර: මේ අවස්ථාවේදී කියන්නේ මේ වාර්තා පිළියෙල කරන අවස්ථාව වන විට?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: මම ඔබෙන් මීට ඉස්සෙල්ලා ප්‍රශ්නයක් ඇහුවා whatsapp යෙදුමේ ලැබුණු දත්ත මෙම ජංගම දුරකථනයෙන් උකහා ගැනීමට අවකාශයක් තියෙනවද factory resetting එකක් කෙරුවේ නැත්නම්?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි: factory resetting එකක් කෙරුවේ නැත්නම් දත්ත උකහා ගැනීමේ හැකියාවක් තියෙනවා.

ප්‍ර ඒ දත්ත උකහා ගැනීමේ හැකියාවක් තිබෙනවා ඔබ පාවිච්චි කරන පරීක්ෂණ ක්‍රමවේදයත් අනුව?

පි ඔව්.

ප්‍ර: එතකොට මේ කොමිෂන් සභාව ඉදිරියේ තිබෙන යම් සාක්ෂිවලට අනුව යම් කිසි තුවාල ලැබූ තැනැත්තෙක්ගේ ඡායාරූපයක් මේ iphone එකට ලැබෙනවා 2018 අගෝස්තු මාසේ 27 වෙනිදා. එවැනි දත්ත මෙම ජංගම දුරකථනයේ නැත්නම් ඇත්තටම ලැබිලා දැන් නැත්තන් ඒකට මොකක්ද හේතුව ඔබ ඔබගේ විශේෂඥ දැනුම අනුව ?

පි: හේතුව තමයි අංක . 01 අර මං කිව්වා වගේ මෘදුකාංගයේ තියෙන Capability එක අනුව මෘදුකාංගයෙන් පුළුවන් මං අර කිව්වා වගේ Apple software එකෙන් security වාරණ දාලා තියෙනවා. ඒ වාරණ බිඳගෙන යන්න පුළුන් තරම් දුර ගිහිල්ලා තමයි මේ මෘදුකාංගයෙන් අවශ්‍ය දත්ත ගන්නේ ඒක සමහර විට මේ මෘදුකාංගයේ තියෙන Capability එක අනුව වෙන්න පුළුවන් නමුත් මේක Android phone එකක් වුණානම් සමහරවිට මීට වඩා දත්ත ගන්න පුළුවන් වෙනවා. අර මෘදුකාංගයේ වෙනසත් බලපානවා. ඊළඟට දේ තමයි overwrite වීමේ හැකියාවකුත් දත්ත overwrite හැකියාවක් තියෙනවා delete කරාට පස්සේ පාවිච්චි කරන කොට මේක 16 GB හින්දා ගොඩක් පොඩියි එතකොට අයේ overwrite වෙන්න හැකියාවකුත් තියෙනවා .

ප්‍ර: ඒ කියන්නේ ඒ ලැබුණු දත්තයන් යම් කිසි අවස්ථාවක මකා දමා තියෙන්න ඕනේ?

පි: ඔව් මෙතන නැත්නම් අනිවාර්යයෙන් මකා දමා තිබිය යුතුමයි.

ප්‍ර: අනිවාර්යෙන් මකා දමා තිබිය යුතුයි? එතකොට ඒ කියන්නේ භාවිතා කරන තැනැත්තා හිතාමතාම මකා දැමීමක් කරන්න ඕනේ ඔබේ මතය අනුව ?

පි: එසේය ස්වාමිනි.

ප්‍ර: ඒක මකා දමා තිබ්බත් මේ Google ආයතනය මගින් අධිකරණ නියෝගයක් .මගින් ගන්න හැකියාවක් තියෙනවද?

පි: මේවා මකා දමන්න කලින් මේක icould එකට හරි Google drive එකට හරි upload කරාම නම් එහෙම නැත්නම් drop box එකට upload කරා නම් අධිකරණ නියෝගය හරහා ඒ ආයතනයට දැනුම් දුන්නොත් ගන්නට පුළුවන් වීමේ හැකියාවක් තියෙනවා. නමුත් මේ investigation එක කරන අවස්ථාවේදී දැන් පුද්ගලයාට ඕන දෙයක් වෙනස් කරන්න පුළුවන් එතකොට දැන් කාලයක් ගතවෙලා නමුත් මේ විමර්ශනය කරන අවස්ථවේදී මං කලින් පෙන්නුවා මෙයා ළඟ තියෙනවා එයා පාවිච්චි කරන

FAIR COMMENT BY JEZEEM

accounts මොනවද සහ ඒවාට අදාල වන මුර පද ඉතින් අධිකරණ නියෝගයක් හරහා ගන්නවාට වඩා දැන් නම් වෙනස් කරලා ඇති නමුත් ඒ කාලේදී ගැනීමේ හැකියාවක් තිබුණා මේ විශ්ලේෂණය රිපෝට් එක බැලුවා නම්.

ප්‍ර: හරි දැන් මම දැන් ඔබෙන් ප්‍රශ්න අහන්නේ whatsapp යෙදුම ගැන ඔබගේ පරීක්ෂණ වලින් ඔබ කිව්වා හොයා ගන්න බැරිවුණා කියලා මේ ජංගම දුරකථනයට මේ whatsapp යෙදුම එක සැරයක් යොදලා නැවත ඒක ඉවත් කරලා නැවත බාගත කිරීමක් කරලා තියෙනවා ද නැද්ද කියන එක?

පි: ඔව් .

ප්‍ර: ඒක නිවැරදිද ?

පි: නිවැරදියි ස්වාමිනි.

ප්‍ර: ඒ විදියට ඔබගේ පරීක්ෂණවලින් එවැනි දෙයක් කෙරුවද නැද්ද කියන එක හොයා ගන්න බැරිවෙන්න හේතුව එක මොකක්ද?

පි: බැරි වෙන්න හේතුව තමයි අර factory reset කියන එක ප්‍රධාන වශයෙන්ම

ප්‍ර: නමුත් දැන් ඔබ කිව්වානේ මේ දුරකථනය factory reset එකක් කරලා නැහැ කියන එක ?

පි: ඔව් මේ අවස්ථාවේ දී factory resetting එකක් කරලා නැහැ.

ප්‍ර: ඒ කියන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ වාර්තාව ලබා දෙන විට factory reset එකක් කරලා නැහැ?

පි: නැහැ කරලා නැහැ.

ප්‍ර: එහෙම නම් ඒ අර මම ඉස්සෙල්ලා අහපු දත්ත ලබා ගැනීමට නොහැකි වුනේ මොකද?

පි: නොහැකි වුනේ අර iphone එකේ තියෙන මෘදුකාංගයේ තියෙන ආරක්ෂාව එකක් අනිත් එක තමයි data over ride වීමේ හැකියාවකුත් තියෙනවා. ඔය සාධක දෙක බලපානවා data එකක් recover කර ගන්න successfully recover කර ගන්න පුළුවන්ද බැරිද කියන එක.

****

<u>රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනවිය</u>

ප්‍ර: මහත්මයා ඔබට මෙම වාර්තාව අනුසාරයෙන් ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න පුළුවන්ද මෙම වාර්තාව සකස් කර තිබෙන්නේ කවදද?

පි: මේකේ Report creation Time එක එන්නේ 09 වෙනි මාසේ 20 වෙනිදා 2019 භවස 3.56 තප්පර 31

ප්‍ර: මහත්මයා යම් පුද්ගලයෙකු විසින් මෙම C 996 A වාර්තාවට පදනම් වූ ජංගම දුරකථනයේ whatsapp මාර්ගයෙන් ලැබුණු යම් රූපයක් image එකක් තමන්ගේ ජංගම දුරකථනයේ මතක ගබඩාවෙන් memory එකෙන්

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

delete කිරීමෙන් අනතුරුව තමන්ගේ whatsapp යෙදුමත් ඔබ uninstall කිරීමක් සිදුකිරිමක් සිදු කළ අවස්ථාවක ඉන් අනතුරුව මෙය විශ්ලේෂණය භාජනය වූවා නම් මකා දැමූ රූපය ප්‍රතිඋත්පාදනය කිරීමේ හැකියාවක් ඒත් ලැබෙනවද?

පි: අර මං කලින් කිව්වා වගේ ස්වාමිනි delete කරන දෙයක් නැවත මේ රිපෝට් එකේ ඕනම delete කරන දෙයක් නැවත ලබා ගන්න අර සාධක දෙක බලපානවාමයි. මෘදුකාංගයේ තියෙන Capability කිරීමක් එක ඒ Capability එක රදා පවතින්නේ mobile phone එකේ තියෙන operating system එක මත ඉතින් ඒක ආරක්ෂා කිරීමේ මනුෂ්‍යාගේ පුද්ගලයාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරන්න තමයි try කරන්නේ. එතකොට මේ tool එකේ තියෙන Capability එක බලපානවා සහ delete කරාට පස්සේ තවත් පින්තූර ගන්නවා නම් තව මේක use කරනකොට අර delete කරපු data එක උඩින් තව ලියවෙන්න පුළුවන් හැකියාවක් තියෙනවා එතන එහෙම ලියවුණ අවස්ථාවකදී data නැවත ගන්නට අමාරුයි

ප්‍ර: මහත්මයා Apple මාදිලියේ ජංගම දුරකථනයක් භාවිතා කරන යම් පුද්ගයෙකුට තමන්ගේ memory එක ජංගම දුරකථනය තුළ තිබෙන memory ඒක යම් අවස්ථාවකදි අවසන් වූ අවස්ථාවක එය Clear කර ගැනීම සඳහා තමන්ගේ whatsapp යෙදුම් වැනි යෙදුම් මකා දැමීමක් සිදු කල යුතුද ?

පි: මෙහෙමයි සමාන්‍යයෙන් whatsapp Apple phone එකක whatsapp install කරපුවාම අර data l කියන folder එකක් හැදෙනවා. මම Capacity එක ගන්නඕනේ නම් Capacity එක ගන්න ඕනේ කෙනෙක්ට නම් අංක එක delete කරන්න පුළුවන් whatsapp Application එක එහෙම නැතුව කෙනෙක්ට පුළුවන් හැකියාවක් තියෙනවා data folder එකේ තියෙන data අරන් තියෙන වැඩි පුර ඒවා විතරක් delete කරගන්නත් හැකියාවක් තියෙනවා. එතකොට whatsapp delete කරන්න ඕනේ වෙන්නේ නැහැ. නමුත් data folder එකේ තියෙන වැඩුපුර Capacity අරගෙන files delete වෙනම කරන්න පුළුවන් .

ප්‍ර: දාරිතාව memory Capacity එක වැඩි කිරීම සඳහා අදාල යෙදුම uninstall කිරීමක් සිදු කල යුතුද ?

පි: සාමාන්‍යයෙන් mobile phone එකක් පාවිච්චි කරනවා නම් එහෙම ඇප්ලිකේෂන් එක ඩිලි කරන්න ඔන නැහැ data ගන්න . ඒ කියන්නේ මේ ඉඩ ගන්න අපිට data විතරක් erase කරපුවාම ඇති .

ප්‍ර: ඔබ සඳහන් කරන්නේ එම යෙදුම uninstall කිරීමට අවශ්‍යතාවයක් නැහැ. එම යෙදුම යටතේ තියෙන දත්ත සම්බන්ධයෙන් මකා දැමීමක් හෝ Backup කිරීමක් හෝ යම් කිරීමෙන් ක්‍රියාවක් සිදු කිරීමේ හෝ අදාල ජංගම

FAIR COMMENT BY JEZEEM

දුරකථනය තුල මෙමරි ඒකේ ඉඩ සාදා ගැනීමට හැකියාවක් තිබෙනවා කියලා?

පි: පෞද්ගලිකව මම ගත්තොත් මම Application එක delete කරන්නේ නැහැ මම කරන්නේ Application එකේ මොකක්ද වැඩිම use කරලා තියෙන usage එක අරන් තියෙන file එක මොකක්ද ඒක මට වැදගත්නම් මම upload කරනවා මගේ cloud service එකකට එහෙම නැත්නම් මං ඒක delete කරනවා එහෙම නැතුව Application ඒකනම් delete කරන්නේ නැහැ.

ප්‍ර: ඔබට ගරු කොමිෂන් සභාවට මතයක් වශයෙන් ඉදිරිපත් කරන්න පුළුවන් ද යෙදුමකට පමණක් සාමාන්‍යයෙන් කොපමණ ඉඩ ප්‍රමාණයක් වැය වෙනවාද ජංගම දුරකථනයක memory එකෙන් ?

පි: ඒක සාපේක්ෂයි මෘදුකාංගයෙන් මෘදුකාංගයට

ප්‍ර: වට්සැප් වැනි යෙදුමක් වගේ සමාන්‍යයෙන් කතා කරොත් ?

පි: සාමාන්‍යයෙන් කොහොමත් ලොකු ධාරිතාවක් ගන්නේ නැහැ ගිගාබයිට් තරම් ධාරිතාවක් ගන්නේ නැහැ. මේගා බයිට් වගේ සුළු ධාරිතාවක් තමයි ගන්නේ නමුත් data කියන folder එක අපි use කරන්න use එකේ size එක වැඩි වෙනවා. ඒ අනුව Application එකේ size එක වැඩි වෙන්න පුළුවන්

ප්‍ර: මහත්මයා ඔබට C996 A ලේඛනය පරීශීලනය කරමින් ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න පුළුවන්ද 2019 මාර්තු 6 වන දින සිට 2019 මාර්තු මාසේ 16 වන දින දක්වා කාලය තුල මෙම දුරකථනය whatsapp යෙදුම භාවිතා වීමක් සිදුවී තිබුණාද ?

පි: මේකේ ඇත්තටම රිපෝට් එකේ Usage ඒක කවදා ඉදන් කවදා වෙනකම් ද USE කරේ කියන එකවත් සහ install කරේ කවදද කියන එකවත් මේ වාර්තාවේ සඳහන් වෙන්නේ නැහැ. නමුත් මේ වාර්තාවේ සඳහන් වෙනවා whatsapp එක හරහා කරන chat පොඩ්ඩක් විමර්ශනය ඉතින් ඒ chat පොඩ්ඩක් විමර්ශනය කරොත් විශ්ලෙෂණය කළොත් අපිට දින වකවානු වල අපිට timeline එකක් හදා ගන්න පුළුවන් මෙයා කවද කවදා activate active වෙලා හිටියේ කියන එක ගන්නට පුළුවන් message අනුව message පොඩ්ඩක් කියවලා බැලුවොත් කොයි කොයි කාල වකවානුවලදී මේ whatsapp use කරලා තියෙන්නේ කියන ඒකේ දළ අදහසක් ගන්නට පුළුවන්

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න එපමනයි බව උගත් රජයේ අධිනීතිඥවරිය දන්නවයි. සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් ජනාධිපති නීතිඥ මහතාට අවශ්‍ය නොවන බව දන්වයි. සාක්ෂිකරු මුදා හරියි.

දැන් වේලාව : ප.ව 8.40

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Presidential Commission of Inquiry to Investigate and Inquire into and Report or take necessary action on the Bomb Attacks on 21st April, 2019

Muhammad Sufian Muhammad Sufraz
Doctor-General Hospital-Colombo

Date	-	11.08.2020
Time	-	8:30 p.m. (1st sitting)
Stenography & Typed by	-	Mrs. Nerupa De Silva

Panel of the Judge

01.	President	-	Judge of the Court of Appeal Hon. Janak de Silva Esquire
02.	Member	-	Judge of the Court of Appeal Hon. Nissanka Bandula Karunarathna Esquire
03.	Member	-	Former Judge of the Court of Appeal Hon. Nihal Sunil Rajapaksa Esquire
04.	Member	-	Former Judge of the High Court Hon. Atapattu Liyanage Bandula Kumara Atapattu Esquire
05.	Member	-	Former Secretary to the Ministry Mrs. W.M.M.R. Adikari

The learned President's Counsel herein on behalf of His Eminence Malcolm Cardinal Ranjith

- Mr. Shamil Perera
The President's Counsel
on behalf of His. Eminence Malcolm Cardinal Ranjith

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Recall the witness in second time
Witness affirmed

State Counsel Ms. Nimesha De Alwis assisting to the Presidential Commission on behalf of Attorney General.

State Counsel Ms. Nimesha De Alwis

Q: Doctor did you receive summons to appear before this Presidential Commission of Inquiry today bearing the signature of the Secretary of the Presidential Commission of Inquiry?

A: Yes.

Q: Did your summons come with second page which stated that you are entitled to be represented by an Attorney-At-Law when testifying before this Commission?

A: Yes.

Q: Are you legally represented today?

A: No.

Q: Is it correct for me to say that it was a choice on your part?

A: Yes.

Q: Is it correct for me to say that you have already testified before this Presidential Commission of Inquiry on the 16th of June, 2020?

A: Yes.

Q: When testifying before this Honourable Commission on the 16th of June 2020, you mentioned in your evidence that you received images of the patient about whom your friend Rilah had spoken to you about on the night of 26th August 2018 or during the morning hours of 27th August 2018, is it correct?

A: Yes.

Q: What was the mobile phone that you were using at that particular time?

A: It was my i-phone 5S. I actually handed over the mobile phone already to the Commission.

Q: If I mentioned the IMEI-number of the said mobile phone would you be able to affirm whether it was the mobile phone that you referred to?

A: I can't actually remember the IMEI-number..

Q: But you state that you have already handed it over to the Presidential Commission of Inquiry for investigations?

A: Yes.

Q: The images that you received on that particular night, that is on 27th of August 2018 from what media did you receive those images?

A: WhatsApp as I can remember.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Q: Do you still have them in your phone?

A: No.

Q: Why not?

A: When I was going to Umrah that was on 2019 March, 6th. I was in Saudi from 6th to 16th. Around 7th it was only 16GB phone. So I actually deleted all the social medias to empty the space in the phone. So during that time these data's should have been deleted. So when I was actually asked this in the first inquiry at CID my WhatsApp last installed was on March 7thas I can remember. So before that the data was not available within. So there also I handed over my phone.

Q: What do you mean when you say that you deleted all your social media applications?

A: In the i-phone, if you want to delete an App you can just a long press and all the Apps will move a little and you will get arrow mark on top of them. You just delete it. Cross, cross on top of the App and just delete. And that will actually delete that and reinstalled it after, I think after I have completed the Umrah may be.

Q: So what you mean is that you un-installed the social media applications from your phone during the period from 6th March 2019 to 16th March 2019, is that correct?

A: After the 6th may be around 7th I might have deleted and I have re-installed I don't remember exactly when I re-installed.

Q: You mentioned that you had visited a particular place where was it that you visited?

A: Mecca.

Q: Mecca. If you see your passport details would you be able to recognize this?

A: Yes.

Q: Your Honour I move to show C-998 to the witness. What is the name stated in the said document?

A: Abdul Careem Muhammad Sufian other names Muhammad Sufraz.

Q: Do you recognize C-998 to be the document containing your passport and travel details?

Q: According to C-998 when have you left Sri Lanka for Mecca and when have you returned to Sri Lanka?

A: 2019 March 6th. Return is 2019 March 16th .

Q: During this time now you testified to the Honourable Commission that somewhere around the 7th of March 2019 you deleted the social media applications in your mobile phone?

A: Yes.

President Secretariat.gov.lk
FAIR COMMENT BY JEZEEM

Q: What was the necessity for you to do so?

A: Because of the memory. Memory was full. I wanted to have some space in the phone. So these social media's were un necessary for me. So I just deleted them so with that whatever the stored data also goes know? So we can get some space in the phone.

Q: Now Doctor you stated that you provided this particular mobile phone to the Criminal Investigation Department for analysis, am I right?

A: Yes.

Q: Do you remember the date when you handed it over?

A: Not exactly.

Q: If I suggest to you that it was on the 19th September 2019 can you accept it?

A: Yes may be, right.

Q: According to the analysis report provided by the Criminal Investigation Department which has been already marked as C-996(A) before this Honourable Commission, your mobile phone had contained backup services such as '*icloud*' and '*drop box'* at the time of analysis. Have you used them in your mobile phone?

A: Some time I have used. But *'icloud'* usually I don't save my photos and things in the '*icloud'*. There is an option in the i-phone you can still disable auto updates of your photos and documents to the *'icloud'*.

Q: So you state that your photographs were never uploaded to your backup services, is that what you say?

A: Yes.

Q: What did you use '*icloud'* and *'drop box'* services for? What sort of files did you transfer in to them?

A: In my '*i-clouds'* I used to transfer my notes and my contacts.

Q: Now you stated that after you deleted the social media applications or rather uninstalled them from your mobile phone, you reinstalled them again at a particular point of time. Is that right?

A: Yes.

Q: By uninstalling the application and by reinstalling it again, what did you attempt to achieve?

A: When you uninstall whatever the data apart from the application is gone. So then when you re-install you will have space. So I just wanted some space in the phone. So you will only have the application but not the data and documents which is saved in the application. That is also get deleted when you uninstall the application.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Q: Does that mean that by deleting your application you effectively erase of all the chats and images that was stored in your WhatsApp application up to the 7th of March 2019?

A: Yes.

Q: Had you used the backup option on WhatsApp to save whatever important chats or documents or files on to any '*cloud*' service?

A: No. I didn't used.

Q: Why did you not use any such backup service for the WhatsApp application?

A: I usually don't use because to me this social media is not very much important. So whenever if I find anything important I save it to my.. I download it to and I save it in a separate folder. Not to this auto backup.

Q: Now Doctor I intend to refresh your memory in relation to a portion of evidence that you gave on the 16th of June, 2020. You happened to mention that you first received a call from your friend Rilah on 27th August 2018 at 1.38 a.m. the call record has been already marked as C-661(A), am I correct?

A: Yes.

Q: Thereafter you had received a series of calls from a local number namely 0778469250, is that correct?

A: Yes. That's right.

Q: The witness perused C-661 and identified the entries which have already been marked as C-661(B) C-661(C), C-661(D). Now doctor I again bring to your attention C-661. According to the markings given you have received another call from Rilah on 27th August 2018 at 2.25 a.m. which has been marked as C-661(F). Thereafter you have received another call from the local number 0778469250 which is already marked as C-661(E). Is that correct?

A: That's right.

Q: While testifying on the previous occasion you happened to mention that on the following day you called a second local number at around 9.30 a.m. that is on the 27th of August 2018?

A: Yes.

Q: Do you recall as to how you came to know about this number, because according to C-661 which is the telephone records pertaining to your number 0772276655 the very first call that has been made from your mobile with the number 0767998752 is an outgoing call. Is that correct?

A: Yes.

Q: To make an outgoing call does it imply that you ought to know the number beforehand?

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

A: Yes.

Q: Do you recall how you came to know about this number?

A: I don't exactly remember as I already stated, there are possibilities, multiple missed calls from the normal that number would have come to me. So that I would have called back to see what who is that. Second possibility is the first call would have been a WhatsApp call. Those are the two possibilities I have already stated, but actually I don't exactly remember how I came to know this number.

Q: Your Honour I respectfully move to show the witness the document marked C-996(B). Doctor C-996(B) is a page extracted from the analysis report prepared by the Criminal Investigation Department in relation to your *Apple i-phone* which was taken for investigations. I bring your attention to the entry marked 1055 where it is stated that you have received a message from the number 0778469250. Could you please inform the Commission what does that message contained?

A: I am sorry I actually don't remember.

Q: It is stated in the particular entry where after the word from 0778469250 the left hand column states a number 0767998752 with the name Mohomad, have you located it?

A: Ah..yes Mohomad.

Q: Expert evidence has already been led before the Honourable Commission to the effect that this portion reflects the contents of that particular message. Do you recall it now?

A: Ok, so in that case I should have received a message of that particular number from another number may be that person may be contacting me or I have to contact him or something like that. I actually don't remember the sequence but somebody has sent, is it that second number which was ..

Q: I will bring it to your attention.

A: Right.

Q: I bring to your attention the telephone number 0778469250 which is the number that has been marked as C-661(B), (C), (D), & (E)?

A: Right ok.

Q: Compare the two documents C-661 and C-996(B) and state to the Honourable Commission whether you have received the message in C-996(B) from the number which is mentioned inC-661(B), (C), (D) and (E)?

A: Yes. I have received with the message.

Q: Therefore if I say that the local number which contacted you after your friend Rilah called you on 27th August, 2019 had sent a message

President's Counsel's Copy
FAIR COMMENT BY JEZEEM

containing the second local number which you called on 27th August, 2019 at 9.31 a.m. Do you accept it?

A: Yes.

Q: Your Honour I move to mark the entry in C-661 stating that the witness's mobile number 0772276655 has taken an outgoing call to the number 0767998752 on 27thAugust 2018 at 9.31 a.m. as C-661(G).

Q: Do you recall as to what was conversed between you and the caller in C-661(G) at that time?

A: As I can remember that call sorry.. it's my call, I have called so I would have asked what's happening may be I don't exactly remember but that is the summary is Sir, what is happening, what are you all doing something like that and the message is they are taking the patient to the National Hospital. That would have been the message that I remember actually.

Q: What would have caused you to call this number at 9.30 in the morning? You have received the number via SMS at approximately 4.55 a.m. on 27th August 2019 according to evidence that has been already placed before this Commission through an expert witness, what would have caused you to call this number at 9.31 a.m. on the same day?

A: At 9.55 I was about to start a surgery. I was in the plastic theater. So usually when I about to start a major surgery I think whether I have to get any messages or anything and then I call and make sure things are ok and then I start. That's how I usually proceed. So before I get in to the major surgery this patient was a suffering patient and Rilah my friend called me and asked what is happening. So somehow this message is also I have received the message so in that case I would have wanted to contact and see what's happening.

Q: Thereafter Doctor according to the call details marked as C-661(G) the call at C-661(G) had lasted for 156 seconds. Is that correct?

A: Yes.

Q: You said before the Honourable Commission that you would have checked on the situation of the patient during this 156 seconds?

A: Yes.

Q: Now I bring to your attention the second call which is mentioned to have been received from 0767998752 according to your telephone details marked C-661, the said call is said to have received at 1.13 p.m. on 27th August, 2018. Is that correct?

A: 1.31 that's right.

Your Honour I move to mark the said record as C-661(H).

FAIR COMMENT BY JEZEEM

Q: Could you state to the Honourable Commission what was the conversation that was held during the call pertaining to C-661(H)?

A: Ok, I think this could have been after they have brought the patient to the hospital because the patient gets admitted at 11.42 as I can remember. So maybe they would have told me that they have brought the patient in and what to do what is happening or something like that I don't actually remember each and every calls what is happening but what I can remember they updated me, they asked me what to do next what to do we are here there so something like that was going on, even some time when I was operating another assistant or a somebody who is unscrubbed might have answered saying that doctor is busy. Something like that also could happen when I am operating. Because I said I started a surgery at 9.55 and it lasted for about 6 hours. So in that case those things are possible.

Q: What is the duration of the call marked as C-661(H)?

A: It's 40 seconds.

Q: According to your evidence before this Honourable Commission at the time you received this call you were engaged in a surgery?

A: Yes.

Q: Is that what you say?

A: Yes.

Q: Are you capable of answering your telephone when you are performing a surgery?

A: Yes another person who is un-scrubbed should answer the call and keep it in our ears and that's how we talk. Honourbale Judges if you all want I can provide my log book when I was operating in the theater which is taken from the theater if needed.

****

Hon. Chairman

Q: Your will be asked questions and you answer the questions..

A: Ok sir.

Q: Don't make statements while the questions are being asked.

A: Ok sir thank you.

****

State Counsel Ms. Nimesha De Alwis

Q: Now I wish to bring to your attention the call received by your number 0772276655 from the number 0767998752 on 27th August 2018 at 4.03 p.m. according to the telephone records C-661?

A: Yes for 3:27.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Q: Inform the Commission as to what transpired from this conversation.

A: Ok, so that is around 4 O'clock, so in that case again it is a call that I have received after the surgery so that is actually may be after the surgery. I would have answered and I would have listen to those story what has happened to the patient. What has happened where the patient has got admitted and what treatment which has happened so in that case I know things are going ok? For me he was a patient suffering patient and I was caring for that patient. That's all.

Q: What was the duration of this particular call?

A: 178 seconds.

Your Honour I seek to mark the said record as C-661(I).

Q: According to the call record marked C-661 before this Honourable Commission you have received 3 consecutive calls from the number 0767998752 on 27th August 2018 at the times 20:11 hours, 21:00 hours, 21:01 hours. Is that correct?

A: Yes.

Your Honour I seek to mark the said 3 records as C-661(J), C-661(K), C-661(L) respectively.

Q: What is the duration of the call marked C-661(J)?

A: 177 seconds.

Q: What is the duration of the call marked C-661(K)?

A: 3 seconds.

Q: What is the duration of the call marked C-661(L)?

A: 200 seconds.

Q: Within a span of 4-5 minutes you have received 3 consecutive calls from this number during the time around 8.00 p.m.. Inform the Honourable Commission as to what was discussed between the caller who called from the said number and you?

A: I don't exactly remember but as I can recall barely that the patient was bit suffering and confused and screaming so the person who is on the other side was also stressed and seeking for my help. But even in the night I think I was in the Plastic Theater doing another surgery. So in between the surgery I think I should have spoken with this person. Because I couldn't go to the spot there were a several calls that's what I guess. I couldn't I was busy throughout the day and they didn't have anyone else to contact. So they were contacting me. And they were talking politely so I was actually responding well. That's what feels.

Q: Do you recall as to whether you received the impression whether the person who is calling you from this number was beside the patient at the time that he called?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

A: I think so because he was updating the things that was happening to the patient.

Q: What was the language in which you conversed with the other caller?

A: Tamil.

Q: Furthermore is it correct for me to say that C-661(J) & (K) are calls that you had received from 0767998752 while the called marked C-661(L) had originated from your phone, or you had taken an outgoing call to 0767998752?

A: Yes.

Q: According to the call records marked C-661 pertaining to your mobile number 0772276655 you have received the next call from the same number 0767998752 on 28th August, 2018 at 7:23 a.m. which had lasted for 64 seconds. Is that correct?

A: Yes.

Your Honour I seek to mark the said entry as C-661(M).

Q: What was discussed between you and this particular call through the called marked C-661(M)?

A: 64 seconds. I actually don't recall it.

Q: Is it correct for me to say that on the same day that is on 28th August 2018 at 8:06 a.m. you have taken a call to 0767998752 which had lasted for 156 seconds as per the call records marked C-661?

A: Yes.

Your Honour I seek to mark the said entry as C-661(N).

****

Hon. Chairman

Q: Witness now you have been taking calls to this number 0767998752 on many occasions?

A: Yes Sir.

Q: Since you are a Doctor and since you must be having many friends they must be also calling you on and off to get advised about patients?

A: Yes.

Q: And you are a leading doctor who tries to help your friends aren't you?

A: Yes.

Q: So you must be having the names of your friends saved on your telephone?

A: Yes Sir.

Q: That is how you identify them to. Now this number 0767998752?

A: Yes.

Q: Is it a friend's number?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: It is I actually saved this number as Muhammad Rilah's friend. That was the name I gave it to that number.

Q: You have saved it?

A: Yes.

Q: Is it still the in your phone contacts?

A: No Sir.

Q: Why not?

A: That's again after the incident I came to know what I have done and I was so stressed I don't want to tell any lies, I actually deleted that number about one week after that. That is the wrong thing that I have done.

Q: After when?

A: After the blast April 21st within about one week I came to know this who has contacted me and you know to whom I have helped and because I was stressed so much I didn't know what to do I actually deleted this number. I alredy given this in my statement sir.

Q: Now I have to ask you a question because you have said that. If you got to know all this and you deleted the number one week after the Easter Attack, why didn't you go to the police and make a statement?

A: Again that is the other mistake. I was confused Sir, now I will just open my heart and tell this. It's so sad that I was so confused whether to go and tell by myself or whether I remain like this. And there were lot of emotions going around the country. Even a slightest chance people were getting arrested. So I saw that in the media's and I was having two parthways now whether to go and tell or whether to remain until someone seek for me. And dear sir, Judges you might have to forgive me for this I am a professional I know. But the emotions were going around me and in the country. That I had a fear that if I got arrested by the time I prove everything and come out, my career would have gone and that was the fear I had during that time and I just remained. I already accepted these two things to everyone I don't have to lie. Thank you.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Time : 9.09 p.m. – 10.00 p.m.
Previous notes taken by : Mrs. Nirupa de Silva
Notes taken by : Mrs. Sudakshina Berugoda

Hon. Chairman Janak de Silva

At this point the Commission observes that the witness drank a glass of water while standing.

Q: Now I have another question I'll come to that later. You are a professional. You could have consulted a lawyer. Did you consult a lawyer?

A: No Sir.

Q: Why didn't you consult a lawyer?

A: Sir I know that I didn't commit anything wrong. But except this what has happened after that.

Q: That is why I am asking you if you had all the concerns about what was happening in the country at that time you could have consulted a lawyer from your community yes or no?

A: Yes.

Q: Why didn't you do that? You can be frank to the Commission. Tell us why you didn't consult a Lawyer?

A: I thought I will face it. I'll face it by myself.

Q: Did you discuss it with any of your family members?

A: No Sir.

Q: Your wife?

A: Yes.

Q: You discussed?

A: Yes.

Q: Not with any other family members?

A: No.

Q: With your friends?

A: No.

Q: You were ready to take the repercussions of not going to a Lawyer and getting advice?

A: Sorry Sir.

Q: Were you ready to take the consequences of not getting legal advice?

A: Yes.

Q: You were ready?

A: Yes.

Q: Now why did you drink the glass of water while standing?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: That's what I normally do.

Q: That's what you normally do?

A: Yes.

Q: The Commission posed this question to you because certain witnesses who were testifying before this Commission from your community when they were offered a glass of water they used to kneel and drink.

A: My point of view we don't have to.

Q: Is that stated in the scriptures?

A: I am not exactly sure. But it is not a must. There are lots of musts things they don't do. And they are doing these small small things optional.

****

Ms. Nimesha de Alwis, State Counsel

Q: After the call that you received at 8.06 a.m. on 28th August 2018 did you receive a call from the same number on 28th August 2018 at 7.17 p.m. rather it was a call which you had taken to the said number and had lasted for 36 seconds?

A: Yes.

Your Honour I move to mark the said record as C- 661(O).

Q: Do you recall as to what was the conversation that was held between you and the caller from this number?

A: I don't exactly remember but this is at around 7.00 p.m. So might be I could have called to see what's happening. It was a bit of rapport that was built between that person and me need I think. That's why I was also keen because I saw a suffering patient

****

Hon. Chairman Janak de Silva

Q: Witness since you have been quite frank with the Commission today compared to the first day that you gave evidence; I have another question to ask you.

A: Yes Sir.

Q: In 2019 on the 06th of March you went to Mecca to perform the Umbra. So it's a very holy act to perform for a person following Islam isn't it?

A: Yes.

Q: You went with your family?

A: Yes.

Q: I am sure you are blessed with children?

A: Yes.

Q: How many children do you have?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Two children.
Q: How old are they?
A: First one is 6 years, second one is 3 years.
Q: So they would have been 5 and 2 when you went to perform Umbra?
A: Yes.
Q: So since you were taking the family you would have ensured that you gave them the fullest comfort?
A: Yes.
Q: For the first time?
A: Yes Sir.
Q: Were they travelling abroad for the first time?
A: Yes.
Q: How far is Mecca from Riyadh?
A: From Riyadh it's about 1,000 k.m.
Q: So when you went where did you first land?
A: We first we straightaway went to Mecca.
Q: Straightaway from Colombo to Mecca?
A: Yes Jidda and then Mecca.
Q: Jidda and then Mecca?
A: Yes.
Q: And then came back the same route?
A: Yes.
Q: You would have been meeting your friends also in Saudi?
A: We met my wife's parents. They are living there. They also came from Riyadh.
Q: Any other friends that you met?
A: No Sir.
Q: No?
A: No.
Q: At least did you get in touch with some of your friends?
A: Yes.
Q: Who are the friends that you?
A: I called Rilah.
Q: You called Rilah?
A: Yes.
Q: How many times did you call him?
A: Two, three times.
Q: You would have been speaking to him after sometime?
A: Yes.
Q: So it would have been a long call? Catching up on old times?

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Actually I yes I talked little a bit not that long I can't exactly remember.

Q: But for some time?

A: Yes for some time yes.

Q: He would have mentioned about this incident as well?

A: This medical incident?

Q: Yes.

A: No Sir.

Q: He never mentioned?

A: No he didn't ask actually I called to call him to ask any places to visit and things like that. So then that conversation went like that.

Q: But you never remembered this call that he made about a person who was injured and how you helped them?

A: No he didn't ask about that.

Q: This is a very straight forward question and I hope you have been very frank with the Commission?

A: Yes.

Q: Did Rilah ask you to delete the pictures?

A: No Sir.

Q: Is that the truth?

A: Yes that's the truth 100%.

****

Ms. Nimesha de Alwis, State Counsel

Q: I wish to bring to your attention two calls, one which has been received from the number 0767998752 on the 04th of September 2018 at 10.37 and had lasted for 261 seconds. The second call had originated from your mobile number to the number 0767998752 on 04th September 2018 at 8.48 p.m. and had lasted for 187 seconds. Is that correct?

A: Yes.

Your Honour I move to mark the said entries as C- 661(P) and C-661(Q) respectively.

A: So the first call at 10.37 the second call is at again 8.48 that is the origin second one.

Q: Now Doctor can you inform the Hon. Commission as to what was spoken between you and this caller on the 04th of September 2018 which was a few days after the particular patient had been admitted to the hospital?

A: Yes this call might be when the patient is in the ICU.

Q: Do you remember what was said?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: So I think they wanted to know what is happening to the patient after the patient has been transferred to the ICU. So I think this call might be that asking what is happening to this patient in the ICU.

Q: According to the call did you go and see the patient?

A: Yes. I actually I visited the Neuro Trauma ETU no sorry Neuro Trauma ETU and I saw the patient and I updated about the condition. So that may be the other call I think.

Q: When you testified before this Hon. Commission on 16th June 2020 you mentioned that Rilah came with a relative of the said patient to meet you at your home around somewhere around December 2018. Am I correct?

A: Yes.

Q: Did you come to know as to who that particular relative was?

A: yes. It was Zaharan who Zaharan introduced by Rilah. Rilah actually introduced Zaharan to me. And then he said the patient whom you have seen in the hospital is his brother.

Q: So you knew that it was Zaharan who came to visit you in December 2018 at that point of time itself. Is that correct?

A: Rilah is the one who first introduced me. At that point only I knew who is Zaharan.

Q: By December 2018 you knew that it was Zaharan's brother whom you had helped as a patient?

A: Yes.

Q: At what point of time did you come to know that Zaharan and his brother were connected to the Easter Sunday attacks?

A: Around one week after when the pictures released.

Q: How did you come to know about it?

A: From the medias.

Q: As a learned professional at the time when you got to know that you had known about Zaharan and his brother a few months ago did you not think it was appropriate to inform the Police about what you know?

A: That's what I already informed the Commission that I should have but I had two pathways. Emotions and things were going on me. And I choose to remain like that until the emotional aspect of this disaster settles down. That is what I can say but yes of course as a professional it's not right. I accept that.

****

Commissioner Mr. Bandula Karunaratna

Q: Doctor now after the bomb blast did you call your friend Rilah?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Once I got to know these are the people I have helped. I tried calling but I couldn't reach his phone. I don't know what has happened to him.
Q: Did he call you after the bomb blast?
A: No Sir.
Q: Never?
A: Never.
Q: So what was the impression you got about him because you helped these people who was injured at that time?
A: Yes.
Q: Because of Rilah?
A: Yes.
Q: But when everything went out of the track you were trying to contact him. But you couldn't?
A: Yes.
Q: So what did you think about him? What was your impression about him?
A: I was actually angry with him because he put me in trouble. And now he is not answering. I don't know what has happened to him. So I was waiting to ask him.
Q: Even at that moment?
A: Sorry Sir.
Q: Even at that moment you never thought that I must go to the Police Station now because you are angry with Rilah?
A: Yes.
Q: As you mentioned?
A: Yes.
Q: Even at that moment why you never thought of going to the Police Station and informing all these?
A: Sir, during that time Dr. Shafi also got arrested and he was all over the media. So I was really worried if I was taken into custody then end of the story. So that was the impression I was having. And I didn't feel safe to come out of it.
Q: Do you really think Rilah put you in trouble?
A: I really don't know but it is because of him I came into the scene. Everything is from that call. Before that I never know these people. I had no connection with these people. I never know their ideology. Nothing. But because of that first call from there onwards this has started. So otherwise I don't have to come here and stay like this.
Q: Now you said your father-in-Law and mother-in-Law they are residing in Riyadh?

Project Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

A: Yes Sir.
Q: How long?
A: About 25 years.
Q: Still are they there?
A: Still they are there.
Q: So Rilah and father-in-Law and mother-in-Law were they having any relationship or communication among themselves?
A: No Sir.
Q: Why was that?
A: They are residing in Riyadh. Rilah was in Yanbu is more than 1,000 k.m. away from Riyadh. And they are not very much known to each other. Because Rilah is my friend but to my father-in-Law he is not much known.
Q: But when your friend is staying there it is the normal beharviour you tell your father-in-Law and mother-in-Law I have a friend who was with you during your school time and you should have mentioned these details when you are talking to your father-in-Law and mother-in-Law? Why didn't you mention that?
A: They know. They know Rilah was there. But they were not in direct contact like visiting to his place and he visiting to their place. Not that kind of a relationship.
Q: Were they communicating with each other? At least just to talk with each other?
A: No Sir.
Q: Never?
A: Not to no not to my knowledge they never talked.
Q: O.k. Thank you.
A: Thank you Sir.

****

Commissioner Mrs. Adikari

Q: Doctor Safraz you'd recalled that you mentioned you visited this patient at the hospital when was that? The date of your first visit to look at the patient that whom you have been trying to help?
A: Yes it should have been September 4th or 5th during that period.
Q: It was long time after you first talked to his family members?
A: Yes Madam.
Q: So he was admitted on which date?
A: He was admitted August 27th.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Q: So did you meet the Doctor in charge of the ward where this person was admitted?

A: No Madam.

Q: No at the first time you visited this patient did you notice anything strange in his wounds and the injuries that had taken place because you were informed that this is due to a gas tank blast?

A: Yes.

Q: Did you notice the same thing from his injuries or you had a different view about his wounds?

A: When I first saw him he was in the Neuro Trauma ETU both hands were dressed. Dressings were there. And one eye was covered. So I was not able to see the wound at that time. But as a patient I saw him.

Q: So as a Doctor have you had any opportunity previously to see patients who come to hospitals due to gas tank blasts?

A: No that I know of Madam. Because I am an Orthopedic surgeon we don't often see the burn injuries which is mostly seen by the Plastic Surgeons who work in a Burns Unit in Accident Service.

Q: So even if you do not have any opportunity to look at such patients as a Doctor so what would you see from this kind of a person you just believe what he says as a gas tank blast or you have some suspicious kind of a thinking about whether this person is lying to meet or not that kind of a situation?

A: Usually we think if patients come under our care who is un known person. This is somebody Rilah talked to me. And another known person talked to me. I am not the responsible. Actually I am not the treating Doctor there. So I just saw him because my friend asked me to see. So I didn't have that those kind of suspicion at that time.

Q: Who is the other person known to you that spoke to you about this particular person?

A: I actually didn't meet him.

Q: No, No who is that other person you just now mentioned Rilah and the other person known to you?

A: Other person known to him. Known to the patient.

Q: Sick patient. So you haven't ever met this person who spoke to you?

A: No Madam.

Q: With Zaharan and his brother someone visited your home no?

A: Yes.

Q: Did you ask are you the person who talked to me over the phone about this patient?

A: Actually I did not ask.

FAIR COMMENT BY JEZEEM

Q: You did not ask? You had no interest to know about who is this person whom you have been helping because he spoke to you over the phone? You never tried to find out who is this person who has been troubling me to help him you did not have such an idea?

A: I actually I didn't want to because I did all this all for Rilah. So I didn't want to find out who was calling me.

Q: And my other question is you just mentioned to one of the Commissioner's question and in the previous instance in which you came to testify before this Commission you mentioned your wife.

A: Yes Madam.

Q: And Rilah's wife are good friends from their childhood they went to same school and your wife and Rilah's wife are the next door neighbors?

A: Yes.

Q: Is that truth?

A: Yes Madam.

Q: So then why did you say that your wife's parents who are living in Saudi Arabia and also your friend Rilah don't have any connections because they don't know each other much?

A: Usually in Saudi they get together you know if they are living in Riyadh they used to they would have been getting together very well.

Q: No, no I just want to know why did you mention to this Commission because previously you mentioned that your wife and Rilah's wife are very good friends from the school age.

A: Yes Madam.

Q: And they are next door neighbours your wife and Rilah's wife?

A: Yes.

Q: So having such a close family ties when from the early childhood how can you say when your wife's parents go and live abroad in Saudi Arabia and also your good friend Rilah?

A: Yes

Q: whose wife is also known to your wife? So they don't have any kind of a connection at least to call over the phones not to meet them frequently but to call over the phone and have to have any good relationship?

A: Yes my father-in-Law went abroad 25 years back. Mother-in-Law is there for about 20 years. So they have been there for a long time. So the next door neighbour relationship came after my wife has got married to me. That means that is very recently only when Rilah and his wife visits to our village. They sometimes they see each other that's all.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Q: So 25 years means then your wife was brought up with whom? Parents were abroad?
A: She was brought up there in Saudi.
Q: She did not study in your school?
A: No.
Q: Your wife?
A: No, no.
Q: O.k. Thank you.

****

Hon. Chairman Janak de Silva

The Commission questions the learned President's Counsel appearing for His Eminence Malcolm Cardinal Ranjith whether he wishes to pose any questions to the witness. He answers in the affirmative. Opportunity is given for him to ask questions from the witness.

****

Mr. Shamil Perera. The President's Counsel on behalf of His. Eminence Malcolm Cardinal Ranjith

Q: Doctor how long have you been a surgeon?
A: I have been doing surgery for about now 5 years.
Q: And you are an Orthopedic Surgeon is that correct?
A: Yes Sir.
Q: Are you a specialist Orthopedic Surgeon in the sense that do you specialize in certain areas of surgery?
A: Yes. I am specialized in Orthopedic surgery.
Q: But there are certain Orthopedic Surgeons who specialize in hip and knees. Isn't that correct?
A: Yes.
Q: In your case you are a general Orthopedic?
A: General Orthopedic Surgeon.
Q: And about how many operations have you performed?
A: I think around 3,500 so far.
Q: That is what is the time duration these 5 years?
A: Yes 5 years.
Q: And if you have done about 3,500 operations, while you are operating a patient it requires a certain amount of skill isn't it?
A: Yes Sir.
Q: So when you are operating a patient is it the normal practice that you would answer telephone call from an unknown number?
A: Yes. Most of the Surgeons now they answer if you ask them.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

Q: No I am not asking a normal telephone call where you know who the party is who is calling? In this instance that is on the 24th of August 2018 you have answered a telephone call?

A: Sorry Sir 24th

Q: On the 27th of August?

A: Yes Sir.

Q: You have answered a telephone call from an unknown number?

A: Yes.

Q: Is that normally done by a Surgeon?

A: Yes some time we do answer when we operate because we don't know I am on call on that particular day.

Q: But while you are operating are you telling this Commission that while you are operating not a normal event when you are in the operating theatre and when you are using your specialized skill in operating would you answer a call from an unknown number?

A: Yes.

Q: What is the reason?

A: Even though Sir it is an unknown number it may be an important call, it may be some other Doctor, it may be from another hospital Doctor. So in that instance what we do is when we are not in the critical step of the surgery we pause for some time and ask somebody to answer the call and keep it in the ear and we answer. Some of the Surgeons are having blue tooth but I actually did not have. But we do answer the calls. You can ask any other Surgeon Sir.

Q: My question is because it is an unknown number. Now Doctor when you are in the operating theatre the phone is normally on a silent mode isn't it?

A: Sir we sometimes we put in silent but normally we don't put it in silent mode Sir.

Q: So even in an operating is it your position that in an operating theatre you have the phone not on silent mode?

A: Yes.

Q: Will it not disturb everybody else?

A: Not really.

Q: I am putting it to you that on this occasion you were aware that you would be getting this call and therefore you were ready for that call and you answered that call?

A: Usually I don't put it in silence Sir when I am operating.

Q: Answer my question?

A: Yes Sir.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Q: I am putting it to you that on this occasion in August 2018 although you were in the operating theatre you were expecting that call and therefore you got somebody to give the phone to you the moment it rang. You were expecting that call to come?

A: I don't think so Sir.

Q: You don't agree?

A: No.

Q: But this is the same number?

A: Yes.

Q: This is the same number from which you have originated calls to and where you have received a number of calls the identical number?

A: Yes Sir.

Q: Still you still preferred to answer that call while you were operating?

A: Yes.

Q: Knowing who it was who was calling?

A: Yes.

Q: Then Doctor you went on a pilgrimage in March last year?

A: Yes Sir.

Q: Pilgrimage is as the Hon. Chairman asked the question it's a generally a very holy pilgrimage isn't it?

A: Yes Sir.

Q: Where you took your whole family? What is the need when you are going on a pilgrimage for you to delete all these various applications on your phone what is the need?

A: I already stated Hon. Sir that my phone memory was full. And on a pilgrimage you might think you don't need phone but still we do take photos when we go to the pilgrimage even in Mecca we used to take photos so when the phone was full I was not thinking about phone memory and all until the exam was over. So it was soon after the exam I was so free then I needed some space in the phone also.

Q: So you deleted those applications that your intention was to have more space for photographs and therefore you deleted those applications?

A: Yes Sir

Q: But without deleting the applications could you not still without deleting all the applications could you not still have deleted certain applications and continue to use the phone to take photographs?

A: Yes.

Q: You could have?

A: Yes. But I found it easy to delete WhatsApp and face book.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Hon. Chairman Janak de Silva

Q: Your complaint is that the phone needed space?
A: Yes.
Q: You never stopped using WhatsApp?
A: No.
Q: In fact you re-installed WhatsApp as soon as you uninstalled it?
A: Yes.
Q: You only wanted the photos to be deleted?
A: I only wanted the documents and data which are in the application to be deleted.
Q: Yes right in the WhatsApp?
A: Yes.
Q: You know that what is downloaded is in WhatsApp images?
A: Yes.
Q: So you could have just deleted the images without uninstalling the application?
A: In that Sir I have to delete one by one.
Q: No, no, no you don't have to delete one by one? You know that you don't have to delete you just go to images and then clean up the images?
A: Is that so? I thought I have to. I deleted the app with the intention of getting the memory. I actually didn't know the technical stuffs.

****

Mr. Shamil Perera, The President's Counsel on behalf of His. Eminence Malcolm Cardinal Ranjith

Q: How much of memory would a WhatsApp have? If you knew that you are going to delete WhatsApp would you know how much memory WhatsApp would hold?
A: Maybe around 1 GB.
Q: How much GB was your phone?
A: 16 GB.
Q: So by deleting WhatsApp in other words you still had another 15 GBs?
A: Yes.
Q: So that would have you need not have deleted the photographs that already there?
A: But at least a little bit until I finish the journey I wanted to have some space to keep the photos.
Q: But there were other applications on your phone?
A: Yes Sir.
Q: What are the other applications that you deleted?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Face book I deleted. Viber, WhatsApp all the social medias I deleted and re-installed.
Q: And do you know how much that they contained?
A: May be around that could have given around 4, 5 GB.
Q: That is face book and what else?
A: Viber and WhatsApp.
Q: So still you would have had at least 10 GB on your phone?
A: Yes.
Q: Yes. So really there is no need to delete the photographs?
A: The photographs were in the WhatsApp. It was not separately saved in my photo album.
Q: Do you know that when you take there is an application that on WhatsApp when you take the when you use WhatsApp and when you have taken photograph it automatically gets downloaded on to your phone?
A: I know that but I usually disable it because it fills the phone.

****

Hon. Chairman Janak de Silva

Q: If you disable the function that means the space in the phone was never taken?
A: Yes.
Q: So then why did you delete it?
A: But still it'll be in the WhatsApp Sir.
Q: Doesn't take the space if it is not downloaded?
A: It does the WhatsApp will contain the memory.

****

Mr. Shamil Perera, The President's Counsel on behalf of His. Eminence Malcolm Cardinal Ranjith

Q: But your WhatsApp you just now told this Hon. Commission.
A: Yes Sir
Q: takes up only one or two GBs isn't that so?
A: Yes Sir.
Q: Yes. So there was no need to delete that WhatsApp?
A: But one or two GB was much precious for me because I had only 16 GBs phone Sir.
Q: Was it more precious for you to delete the WhatsApp or was it more much precious for you to delete those photographs on your WhatsApp?
A: I found it easy to delete WhatsApp because I don't have to worry what photo is there for me it was not very you know important App at that

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

point of time. I thought I don't have anything important so I just deleted.

Q: I am putting it to you that you deliberately deleted those the WhatsApp in order that all the photographs and WhatsApp would have got deleted because you feared that there could be problems in the future?

A: I swear the Commission that I didn't have any intention like that.

Q: You said that you had when you realized that you had treated Zaharan's brother?

A: Yes Sir.

Q: that you were emotionally disturbed?

A: Excuse me Sir I actually didn't treat him. He was treated by ..

Q: But when you made I'm sorry when you made inquiries about Zaharan's brother you were emotionally disturbed after the Easter Sunday bomb blast?

A: Yes sir.

Q: What was can you expand on that in which way do you say you were emotionally disturbed?

A: Yes. The photographs were released and identified first I identified that Zaharan. He has visited to my house. And he has told that the patient I have seen is his brother. So on that occasion I figured out that who has had received who had received my help. So in that case as a normal individual I was having a fear that I was also you know somebody might think I am also involved in these things. And what if I get arrested with all the information I could have easily get arrested. Everybody will agree with that. With the information that I have given I still think that good things that I have done might have saved but I could have got easily arrested. So in that case that is the fear that I had. Then how to prove everything all these and come out.

Q: But now you realized that, that was a mistake?

A: Yes.

****

Hon. Chairman Janak de Silva

Q: Witness how many social media applications did you uninstalled on the 06th of March 2019?

A: Hon. Sir as I can remember Facebook, WhatsApp and Viber.

Q: Did you have Twitter?

A: No Sir.

Q: Do you use telegram?

A: No Sir.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Q: Do you use messenger?
A: Yes messenger may be messenger also.
Q: Did you use Imo?
A: Yes I used.
Q: So did you uninstall all those?
A: I think so.
Q: You uninstall Imo? You uninstalled messenger?
A: Yes.
Q: You uninstalled Viber?
A: Yes.
Q: You uninstalled WhatsApp?
A: Yes.
Q: You uninstalled face book?
A: Yes.
Q: But you after uninstalling Facebook installed Facebook again?
A: Yes.
Q: On the same day?
A: May be on the same day.
Q: You know that uninstalling face book and install it again doesn't make a difference in so far as the pictures are concerned?
A: I didn't know about that Sir.
Q: Why did you uninstall face book?
A: I actually just thought because of the space I just thought uninstalling all the social Medias and reinstalling because whatever the documents and data will go away that's what I thought. I don't know whether there is any technical.
Q: How long have you been using the Apple phone?
A: Three, four years.
Q: Three, four years. And have you been using WhatsApp, Viber from the very first day that you bought the phone?
A: Yes.
Q: When you say three, four years that is from today or from 2019?
A: That is 2019.
Q: So you bought the phone somewhere in 2016?
A: Even may be before that.
Q: Before the Apple i-phone what was the phone that you have?
A: i phone 5S.
Q: How long did you use the i phone 5?
A: i phone 5S may be for four years I would have used.
Q: Before that?

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: Before that I was using a normal phone like 1100 not a very
Q: So you have been using an Apple i-phone for 10 years now?
A: Yes.
Q: So by 2019 you have been using it for nine years?
A: Yes may be. No 2012 I started, 2012.
Q: So by 2019 seven years you were using Apple i phone with the social media?
A: Yes.
Q: During that long period you would have been using taking photographs, sending Viber messages, WhatsApp messages?
A: Yes.
Q: And I am sure the memory got stuck during that period as well?
A: Yes.
Q: Then did you uninstall it at that time?
A: Yes. Previously also I have uninstalled and reinstalled.
Q: You have uninstalled and reinstalled?
A: Yes.
Q: Have you also uninstalled, have you also deleted the images?
A: Yes.
Q: So without uninstalling you have just deleted the images as well?
A: No Sir.
Q: You just said yes?
A: I didn't understand what you are telling.
Q: Surely it was a very clear question that I asked?
A: O.k. Sir.
Q: Did you delete one or more pictures at a time from WhatsApp or Viber?
A: I have actually previously also uninstalled Sir. Not individually not deleted the images.
Q: You want us to believe then? Haven't you ever deleted only the images of WhatsApp or Viber while keeping the application? Say selected images haven't you deleted?
A: Selected images yes. Yes selected images I have.
Q: You have deleted?
A: Yes, yes. Not the whole images Sir but the selected images I have deleted.
Q: So when you open the images icon on the phone?
A: O.k.
Q: you get a square box and you can tick the pictures that you want deleted right?
A: Yes, yes.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Q: So you can make a selection of the pictures out of all the pictures that is there to delete?
A: Yes.
Q: That doesn't take long?
A: Yes.
Q: Does it? If you want to delete all the pictures you just click the square right on tope left hand corner of the frame?
A: Yes.
Q: And then all the images are deleted?
A: Yes.
Q: But you didn't choose that in 2019?
A: No Sir I didn't choose.

****

Ms. Nimesha de Alwis, State Counsel

Q: When you went on your pilgrimage to Mecca on 06th March 2019 what was the Sim number that you were using at the time?
A: Same number 0772276655.
Q: When you left Sri Lanka did you activate the roaming service for that said Sim?
A: No.
Q: How did you uninstall and reinstall your social media applications if you did not activate roaming before you left from Sri Lanka?
A: You can keep on pressing the application icon and cross mark will appear on the top and I just clicked it.
Q: How did you install it without any data connection?
A: I took another Sim there for my passport.
Q: From where?
A: From Saudi.

****

Hon. Chairman Janak de Silva

Q: If you took another Sim there so Sim also has a space right? Yes or no?
A: Yes.
Q: So you had a new Sim with no pictures, no data on it?
A: Another Sim not on the very first day.
Q: When did you get there?
A: May be around two, three days after. That's what I remember. But on the very first day I wanted some space.

****

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Ms. Nimesha de Alwis, State Counsel

Q: Now you testified before this Hon. Commission saying that you uninstalled your social media applications somewhere around the 07th of March 2019?

A: Yes.

Q: And you reinstalled them almost immediately afterwards. Now you say that you obtained your new Sim from Saudi Arabia about three to four days after reaching Saudi Arabia which would have been somewhere around 10th of March.

A: Yes.

Q: How did you reinstall the applications if you almost immediately after uninstalling them if you bought the new Sim somewhere around 10th of March and if as you say you had not activated the roaming facility for the Sri Lankan Sim you had?

A: We had a local Wi-Fi at the hotel. So using that we can still install.

****

Hon. Chairman Janak de Silva

Q: What is the hotel that you were staying?

A: We stayed close to the Mecca. It was not a very high-fai hotel. There were some rooms actually don't remember the name Sir.

Q: Yanbu is 350 miles away from Mecca?

A: Yes.

Q: Three hours?

A: O.k.

Q: Yes or no?

A: I actually don't know.

Q: You didn't make inquiry?

A: No.

Q: Although you knew that your friend was 350 miles away?

A: Yes.

Q: You didn't want to go there?

A: Yes I called him.

Q: Only call?

A: I called him and asked where you are staying? He said in Yanbu. And he said that there is a flower festival going on. If you all come you can see. And then I asked my father-in-Law and mother-in-Law whether you all want to go and visit and see. Then they didn't want to go. They said no because we came to Mecca we stay here we concentrate on the pilgrimage.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

Time - 10:00 p.m.
Stenography & Typed by - Mrs. Nerupa De Silva

Hon. Chairman

Q: So for 10 days you were in Mecca?

A: Yes Sir.

Q: Not going anywhere?

A: We went to Jeddah to see some places. That also suggested by Rilah. I asked him any places to visit. He said there is a nice aquarium in Jeddah and actually he said he will also come to join us. Then we all went to that aquarium hoping that he also will come. But he didn't come. Then I called him and asked why didn't come. He said he had some other works. And actually we were telling why he said he will come and he didn't come. So we were little upset about that but anyway we came back.

****

State Counsel Ms. Nimesha De Alwis

Q: Now Doctor you said you reinstalled your social media application using the Wi-Fi network available at the hotel that you were lodging. Is that correct?

A: Yes.

Q: Under what Sim number did you use your newly installed WhatsApp account?

A: I actually don't remember. I don't know whether I used it or not but actually I did that to get some space. I really don't remember whether I used the WhatsApp or not.

Q: According to the testimony that you have provided, on the 7th of March 2019 you uninstalled the social media applications and immediately afterwards reinstalled then using the local hotel's Wi-Fi network?

A: Yes.

Q: You obtained a new Sim from Saudi Arabia using your passport somewhere around the 10th of March 2019?

A: May be yes.

Q: You also mentioned that you had not activated the Roaming facility for the Sri Lankan Sim that you were using.

A: As I can remember.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Q: My question is what was the telephone number that you added to your newly installed WhatsApp application on 7th March 2019?

A: I don't know may be the Sri Lankan number I really don't know what has happened. This is a bit more.

Q: But your Sri Lankan number would not have been operating from Saudi Arabia. Especially since you have not activated Roaming, isn't it?

A: Is it so I really don't know. It is technical stuff. Dear Honourable Judge I don't want to lie anything. I just said, I clearly remember that I deleted the Apps and I reinstalled and I remember that I have got new Sim there to use. And this Roaming stuff that also I don't remember because I did not make any calls from my Sim to country. So in that basis only I am thinking whether I have not activated the Roaming or not.

Q: Did you make in any WhatsApp calls during that period?

A: No.

Q: Are you indicating to this Honourable Commission that as a Medical Practitioner you terminated all connections what so ever with Sri Lanka so much so that any urgent calls or any urgent messages could not reach you while you were in Saudi Arabia?

A: For a brief period may be. Because my wife, as I can remember my wife's phone had roaming facility at that time.

****

Hon. Chairman

Q: When you leave the hospital you generally give an emergency contact number and go don't you as a Doctor? If there are patient that you have taken care of who have been admitted to the hospital?

A: Yes.

Q: So you have to be contactable even though you're overseas?

A: Honourable Sir, in my position there is another senior registrar will be working usually. So they can contact that person.

Q: You were not doing private practice?

A: No Sir.

Q: You are not doing private practice?

A: No Sir. We are not permitted yet.

Q: Yet. The apple phone can't be opened by anyone and by using anything, is it?

A: Yes Sir.

Q: It can be used only with that Pin that comes with the phone?

A: Yes.

Q: Did you really take that with you all the way to Saudi?

President's Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

A: No.

Q: So then how did you install that new Sim card that you got?

A: I think I used Pin that my wife had. You can still press and take it out. That's what I remember.

Q: That's what you did?

A: Yes. They use to keep it in the scarfs. Those pins that still we can use sir.

Q: Is there anything that you want to tell this Commission Doctor before you go? This is your last chance to say what you really know. Do you want to take that opportunity?

A: Yes I have gone through this so far. And to my knowledge I have not lie to you all. I have been truthful from the beginning and that's what I am telling, still telling. And as Honourable Judges, Sir's I think you all would have understood everything so what has happened so far. So I have accepted all my faults. That is my faults I am accepting. So whatever the thing that I have to bear with that because whatever the mistakes that I have made are the mistakes, so please excuse me for those errors as human being, but my intention purely, purely was to help a suffering patient, if I had known these people who are terrorists and things like that I would have never committed this. It's a suicide attack you all will know that. So I hope that the Commission will make a good judgment on this one. Thank you Sir.

****

Commissioner Bandula Athapattu

Q: Doctor..

A: Yes Sir..

Q: Where is that Sim that you purchased in Saudi Arabia?

A: That I gave it to my father-in-law. Because there was a balance money. When I was leaving from there, yes..

Q: When you were returning to Sri Lanka?

A: When I was leaving from Saudi to Sri Lanka yes, returning I gave it to my father-in-law.

Q: What was the number?

A: I actually don't remember.

****

Hon. Chairman

Q: Your father-in-law and mother-in-law joined you throughout the 10 day period?

A: Sorry Sir.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

Q: Your father-in-law and mother-in-law joined you throughout the 10 day period

A: They came in the middle like know after about 3-4 days.

Q: So you could have used their phone as well?

A: Yes, but they stayed in a different hotel. So they wanted to contact us. That was the need for another Sim.

Q: But if you had your hotel connection as you said, they could have called you on WhatsApp or Viber?

A: Yes, but we go to Mecca.

Q: But you went together?

A: No, no sometime we go separately, they come separately and people get lost that's a large area. So each of us should make sure that we have a phone otherwise, difficult to find out individuals.

Q: Commission informs that there are no further questions from the witness. Witness is released by the Commission. You can go doctor.

A: Thank you Sir.

****

Hon. Chairman

මීට අමතරව මෙම කොමිෂන් සභාවේ රැඳී සිටින ජාතික රෝහලෙන් පැමිණි නියෝජිත මහත්මාවත් කොමිෂන් සභාවෙන් මුදා හරිනවා, ලේඛන නැවත ගෙනියන්න පුළුවන්. කොමිෂන් සභාවේ කටයුතු නැවත අගෝස්තු මස 12 වෙනි දින පෙරවරු 11:00 ට නැවත රැස්වෙනවා.

****

I read and understood the above statement and accepted this statement as correct and signed it.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

<u>2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව.</u>

දිනය: 2020.08.12 වේලාව: පෙ.ව.11.25 යි.
සටහන් කළේ ල/ලේ - මුතුමාලි

ගරු විනිසුරු මඩුල්ල:

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති-

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික-

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික-

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා -සාමාජික-

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්. ආර්. අදිකාරි මහත්මිය
-සාමාජික-

පෙනී සිටීම:-

* අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මෙනෙවිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සුහර්ෂි හේරත් මහත්මිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතිඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, දිලන්ත එස්.කළුදුරුවගේ මහතා, චතුරංග බණ්ඩාර මහතා සහ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් නීතිඥ කෞෂි සෙල්වනායගම් මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

නම : **හොරංගල දිසානායකගේ ගයාන් දිලංක රත්නායක**
වයස : **අවුරුදු 33 යි**
ආගම : **බෞද්ධ**
රැකියාව : **පොලිස් පරීක්ෂක**
ලිපිනය : **ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශය**
සාක්ෂිකරු ප්‍රතිඥා දී කැඳවයි.

<u>රජයේ අධිනීතිඥ දිලන්ත එස්.කළුදුරුවගේ මහතා</u>

ප්‍ර : මහත්මයා පොලිස් සේවයට සම්බන්ධ වුණේ කුමන වර්ෂයක කුමන තනතුරකටද?

පි : ස්වාමිනි මම 2018/09/21 වෙනි දින උප පොලිස් පරීක්ෂකවරයෙකු වශයෙන් පොලිස් සේවයට බැඳුණා.

ප්‍ර : ඉන් අනතුරුව මහත්මයා කුමන ඒකකයක හෝ කුමන ස්ථානයකද සේවය කළේ?

පි : මම ස්වාමිනි මූලික පුහුණුව කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයෙන් ලබා ගත්තා. අනතුරුව පුහුණුවෙන් පසුව 2008/06/28 වන දින බණ්ඩාරවෙල මූලස්ථාන පොලිසියට අනුයුත්තව රාජකාරී කරමින් සිටියදී පොලිස්පතිතුමාගෙන් ලද ස්ථිර ස්ථාන මාරුවීමේ නියෝග මත 2009/10/14 වන දින ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශයට රාජකාරී සඳහා වාර්තා කරනවා.

ප්‍ර : මහත්මයා ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයට රාජකාරී වාර්තා කිරීමෙන් අනතුරුව එම කොට්ඨාශයේ කුමන ඒකකවලද සේවය කළේ?

පි : ස්වාමිනි මම ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයට රාජකාරී වාර්තා කිරීමෙන් පසුව විමර්ශන අංශ 02, බුද්ධි අංශය, ත්‍රිකුණාමල ඒකකය, කටුනායක ඒකකය, වව්නියාව ඒකකය, අධ්‍යක්ෂක පුද්ගලික සහකාර ඒකක වැනි ඒකකවල රාජකාරී කර තිබෙනවා.

ප්‍ර : ඔය මහත්මයා සඳහන් කරපු ත්‍රිකුණාමල ඒකකය සහ වව්නියාව ඒකකය කියන ඒවා ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ උප ඒකක කිව්වොත් නිවැරදිද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම ඒකකවල සේවය කරන කොට මහත්මයා ඒ අදාළ ප්‍රාදේශීක උප ඒකකවලට වාර්තා කරලා තමයි සේවය කළේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් මහත්මයා යම් අවස්ථාවක ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ සේවය කරන අවස්ථාවක අන්තවාදී සහ මූලධර්මවාදී ඒකකයේ සේවය කරලා තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කවදද ඒ විමර්ශන ඒකකයට සේවය කිරීම සඳහා මහත්මයා සම්බන්ධ වුණේ?

පි : මම ස්වාමිනි 2018/09/25 වන දින විමර්ශන අංශ 02 ක වශයෙන් ස්ථාපිත කර තිබූ අන්තවාදී හා මූලධර්මවාදී විමර්ශන ඒකකය වෙත රාජකාරී වාර්තා කරනවා.

ගරු මැතිතුමනි මෙම නිලධාරියා විසින් පොලිස් ඒකකයට දැනටමත් ප්‍රකාශයක් ලබා දී තිබෙනවා. එම ප්‍රකාශයේ පළවන පිටුවෙහි අවසාන පේළියෙහි විමර්ශන ඒකකයට සම්බන්ධ වූ දිනය වශයෙන් දක්වා තිබෙන්නේ 2019/08/25 වන දිනය වශයෙන්. කෙසේ වුවද ගරු මැතිතුමනි එම දිනය මුද්‍රණ දෝෂයකින් සටහන් වී ඇති දිනයක් බවත් එකී දිනය 2018/09 වන මස 25 වන දිනය වශයෙන් නිවැරදි විය යුතු බවත් ගරු පෙරදැරිව සැලකර සිටිනවා.

ප්‍ර : දැන් මහත්මයා ඔය ඒකකයට සම්බන්ධ වෙන කොට ඔය අන්තවාදී සහ මූලධර්මවාදී ඒකකයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කළේ කවුද?

පි : ස්වාමිනි එම දිනවල එම ඒකකයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කළේ එවකට පොලිස් පරීක්ෂක තරංග පතිරණ මහත්මයා.

ප්‍ර : ඒ මහතා ඔබ සම්බන්ධ වන අවස්ථාවේදීත් ඒකකයේ රාජකාරී ආවරණය කිරීම සිද්ධ කළාද?

පි : එම දිනවල ස්වාමිනි නිල වශයෙන් ස්ථානාධිපති වශයෙන් කටයුතු කළේ පොලිස් පරීක්ෂක තරංග පතිරණ මහතා. නමුත් තරංග පතිරණ මහතා එම දිනවල විශේෂ පුහුණු පාඨමාලාවක් හැදෑරීම සඳහා මා රාජකාරී ඒකකයට වාර්තා කරන කොට ස්ථානයෙන් බැහැරව ගොස් සිටියා.

ප්‍ර : ඒ අනුව තරංග පතිරණ මහතා වෙනුවෙන් ඔය ඒකකයේ ඉස්ලාම් අන්තවාදී සහ මූලධර්මවාදී ඒකකයේ ස්ථානාධිපතිවරයා වෙනුවෙන් රාජකාරී ආවරණය කිරීම කළේ කවුද?

පි : එම දිනවල මම ස්වාමිනි සිදු කළේ.

ප්‍ර : ඒ කියන්නේ ගයාන් රත්නායක වන ඔබ විසින්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔය අන්තවාදී සහ මූලධර්මවාදී ඒකකයෙන් කුමන ආකාරයේ විමර්ශන කටයුතුද මූලික වශයෙන්ම සිද්ධ කළේ?

පි : ස්වාමිනි මූලික වශයෙන් ඉස්ලාම් අන්තවාදී සංවිධාන සම්බන්ධයෙන් සහ අන්තවාදයට සම්බන්ධ පුද්ගලයින් සම්බන්ධයෙන් විමර්ශන සිදු කළා විශේෂයෙන්ම සමාජ ජාලා මාධ්‍යවල අන්තවාදී කරුණු ඉදිරිපත් කරන පුද්ගලයින් ඊට අමතරව අපිට බුද්ධි අංශවලින් අන්තවාදයට සම්බන්ධ පුද්ගලයින්ගෙන් ලැබෙන තොරතුරු සම්බන්ධයෙන් විමර්ශන සිදු කළා.

ප්‍ර : එම විමර්ශන කටයුතු සිදු කරන විට යම් අවස්ථාවක මේ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් කියන තැනැත්තෙක් සම්බන්ධයෙන්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

විමර්ශන කටයුත්තක් ඔය විමර්ශන ඒකකයෙන් සිද්ධ කරලා තිබුණද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම මොහොමඩ් සහරාන් යන අය සම්බන්ධයෙන් ඔබ ඒකකයේ විමර්ශන ගොනුවක් විවෘත කරලා තිබුණද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහි අංකය කුමක්ද?

පි : PTIR 48/2017 ස්වාමිනි.

ප්‍ර : එම ගොනුවෙන් විමර්ශන කටයුතු සිදු කර ගෙන යාම සඳහා විමර්ශන නිලධාරීයෙක් පත් කිරීමක් කරලා තිබුණද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම විමර්ශන නිලධාරීයාගේ තනතුර සහ නම සඳහන් කරන්න ගරු කොමිෂන් සභාවට?

පි : එවකට ස්වාමිනි එම ගොනුවේ විමර්ශන සිදු කරන ලද්දේ පොලිස් කොස්තාපල් 83856 නයනප්‍රියා නිලධාරීයා.

ප්‍ර : මහත්මයා එම ඒකකයේ ඉස්ලාම් අන්තවාදී සහ මූලධර්මවාදී ඒකකයේ රාජකාරී වැඩ බලන ස්ථානාධිපතිවරයා වශයෙන් ආවරණය කරද්දී මෙම සහරාන් සම්බන්ධයෙන් වන විමර්ශන වල ප්‍රගතිය කොයි ආකාරයෙන්ද තිබුණේ?

පි : ස්වාමිනි මෙම විමර්ශනය ආරම්භ කරලා තිබුණේ මාගේ මෙම විමර්ශන අංශ 02 මඟින් 2017 වසරේදී පමණ. එවකට පුද්ගලයෙක් ලබා දුන් තොරතුරක් මත මාගේ අංශය මඟින් මෙම අංශය මඟින් විමර්ශන ආරම්භ කරලා තියෙනවා මෙම සහරාන් සම්බන්ධයෙන් විශේෂයෙන්ම සහරාන් අන්තවාදී කරුණු ඇතුළත් මත සමාජ ජාලා මාධ්‍ය ඔස්සේ ප්‍රචලිත කරනවා කියලා තමයි ප්‍රධාන වශයෙන් තොරතුරු ලැබිලා තිබුණේ. එම තොරතුරු සම්බන්ධයෙන් විමර්ශන සිදු කරලා මෙම පුද්ගලයා විශේෂයෙන් Face Book සමාජ ජාලා මාධ්‍ය ඔස්සේ අන්තවාදී කරුණු ඇතුළත් වීඩියෝ පට, හඬ පට සමාජ ජාලා මාධ්‍යයට මුදා හැරලා තිබුණා. එතකොට මේ සම්බන්ධයෙන් මෙම අංශයේ විමර්ශන සිදු කරලා මෙම සහරාන් අත්අඩංගුවට ගැනීම සඳහා ඒ වන විට විවෘත වරෙන්තුවක්ද ලබා ගෙන තිබුණා.

ප්‍ර : එම විවෘත වරෙන්තුව ලබා ගෙන තිබුණේ කුමන අධිකරණයකින්ද?

පි : ස්වාමිනි කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් උසාවියෙන් තමා ලබා ගෙන තිබුණේ.

ප්‍ර : ඒ විවෘත වරෙන්තුව ලබා ගැනීමට අදාළ නීති කෘත්‍යයෙහි නඩු අංකය මහත්මයාට කියන්නට පුළුවන්ද මේ ගරු කොමිෂන් සභාවට ?

පි : එහෙමයි ස්වාමිනි. කොළඹ ප්‍රධාන ම.ඇ.B 92358/08/2018.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : ඒ අනුව ඒ අවස්ථාව වන විට ඔය වරෙන්තුව මත ක්‍රියා කරලා සහරාන්ව අත්අඩංගුවට ගැනීමට හැකියාවක් ලැබී තිබුණද ඒ අවස්ථාවේදී?

පි : නැත ස්වාමිනි.

ප : මහත්මයාට මහත්මයාගේ සටහන් බලලා මේ වරෙන්තුව ලබා ගෙන තිබුණේ කුමන දිනයකද කියලා ගරු කොමිෂන් සභාවට කියන්නට පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමිනි.

(සටහන් බලයි)

පි : ස්වාමිනි 2018/07/02 වන දින.

ප : 2018 යි?

පි : 07/02 වන දින ස්වාමිනි.

ප : 07/02 වන දින තමයි ඔය වරෙන්තුව ලබා ගෙන තිබෙන්නේ. දැන් විමර්ශන අංශයේ ඉස්ලාම් අන්තවාදී සහ මූලධර්මවාදී විමර්ශන අංශයේ වැඩ බලන ස්ථානාධිපතිවරයා වශයෙන් මොහොමඩ් සහරාන් කියන තැනැත්තා අත්අඩංගුවට ගන්න මහත්මයා ඒ අනුව යම් කිසි විමර්ශන නිලධාරීන්ට උපදෙස් ලබා දීමක් සිද්ධ කළාද ?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ කොයි ආකාරයෙන්ද කුමන නිලධාරියෙකුට කොයි ආකාරයෙන්ද උපදෙස් ලබා දුන්නේ කියලා කෙටියෙන් ගරු කොමිෂන් සභාවට පැහැදිලි කරන්න?

පි : විශේෂයෙන්ම ස්වාමිනි මෙම විමර්ශන ගොනුවේ විමර්ශන සිදු කරන ලද නයනප්‍රිය නිලධාරියාට මම උපදෙස් ලබා දුන්නා මෙම සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා හැකි ඉක්මනින් කටයුතු කරන ලෙසත් මොහු අත්අඩංගුවට ගැනීමට මොහු සැඟවී සිටින ස්ථානය සම්බන්ධයෙන් තොරතුරු සොයා බලා මා වෙත දන්වන ලෙසත්.

ප : ඒ අනුව සාක්ෂිකරු ඔබ විසින් යම් කිසි ස්ථානයකට මේ සහරාන් කියන තැනැත්තා අත්අඩංගුවට ගන්න ස්ථානයෙන් පිටත් වෙලා ගියාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ කවදද ඒ ගියේ සහ කොයි ප්‍රදේශයකටද ගියේ?

පි : මාගේ සෘජු මැදිහත්වීම මත ස්වාමිනි මෙම සහරාන් යන පුද්ගලයා අත්අඩංගුවට ගැනීම සඳහා මා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් 2019/01/14 වන දින කාත්තන්කුඩිය සහ අක්කරෙයිපත්තුව ප්‍රදේශයට පිටව යනවා.

ප : ඒ පිටව යන අවස්ථාවේදී පිටව යෑමේ අරමුණ වෙලා තිබුණේ කුමක්ද මහත්මයා ඔය කාත්තන්කුඩි ප්‍රදේශයට?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමිනි ඇත්ත වශයෙන්ම එම දිනවල මාගේ අංශයෙන් විමර්ශන කරලා තවත් පුද්ගලයන් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගැනීම සඳහා වරෙන්තු ලබා ගෙන තිබුණා. එහෙම අත්අඩංගුවට ගැනීමට වරෙන්තු ලබා ගෙන තිබුණු එක පුද්ගලයෙක් තමයි මොහොමඩ් අස්මි කියන පුද්ගලයෙක්. ඔහුත් රැදී සිටියේ එම දිනවල අක්කරෙයිපත්තුව සහ කාත්තන්කුඩිය ප්‍රදේශයේ. එතකොට මොහොමඩ් කාෂිම් මොහොමඩ් සහරාන්ගෙත් ඔහු පදිංචි ලිපිනය තිබුණේ කාත්තන්කුඩි ප්‍රදේශයේ. එබැවින් එම වරෙන්තු දෙක ක්‍රියාත්මක කිරීම සඳහා ස්වාමිනි මා පිටව ගියේ.

ප්‍ර : මහත්මයා දැන් සාක්ෂි දීලා කිව්වා ඔය කාත්තන්කුඩි ප්‍රදේශයට ගියේ මොහොමඩ් අස්මි සහ සහරාන් කියන තැනැත්තන් දෙදෙනාට ලබා දී තිබූ වරෙන්තු ක්‍රියාත්මක කරලා ඔවුන් අත්අඩංගුවට ගන්නැයි කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව මහත්මයාට හැකියාවක් ලැබුණද ඔය දෙදෙනාගෙන් එක් අයෙකු හෝ දෙදෙනාම අත්අඩංගුවට ගන්නට?

පි : මම පළමුව ස්වාමිනි අක්කරෙයිපත්තුව ප්‍රදේශයේ සංචාරය කරලා මොහොමඩ් අස්මි යන සැකකරු සම්බන්ධයෙන් තොරතුරු සොයා බැලුවා. එහෙම තොරතුරු සොයා බලන කොට මට අනාවරණය වුණා ඔහු එදින විවාහ මංගල උත්සවයක් සඳහා කොළඹ ප්‍රදේශයට පැමිණ සිටින බව. ඒ අනුව මාගේ කොළඹ ඒකකයේ නිලධාරීන් යොදවා මම මොහොමඩ් අස්මි එදින රාත්‍රියේ 2019/01/14 වන දින රාත්‍රියේ අත්අඩංගුවට ගත්තා කොළඹ ප්‍රදේශයේදී.

ප්‍ර : අස්මි අත්අඩංගුවට ගැනීමට මහත්මයලාගෙන් ඉටු වෙච්ච රාජකාරීය තමයි ඔහු සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගෙන ඔබගේ ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානයට කොළඹට දැනුම් දී ඉන් පසුව අත්අඩංගුවට ගැනීම?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මහත්මයලාට හැකියාවක් ලැබුණද සහරාන් කියන තැනැත්තා අත්අඩංගුවට ගන්න වරෙන්තුව මත?

පි : එදින ඉන් අනතුරුව ස්වාමිනි කාත්තන්කුඩි ප්‍රදේශයේ සංචාරය කරලා සොයා බැලුවත් සහරාන් රැදී සිටින ස්ථානයක් සම්බන්ධයෙන් අපිට නිශ්චිතවම කරුණක් අනාවරණය කර ගැනීමට නොහැකි වුණා. එබැවින් ඔහු අත්අඩංගුවට ගැනීමට හැකියාවක් ලැබුණේ නැහැ.

ප්‍ර : දැන් ඔය මහත්මයාලා 14 වෙනි දින කාත්තන්කුඩියට පිටත් වෙලා ගියා කිව්වනේ?

පි : එහෙමයි ස්වාමිනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ පිටත් වෙලා ගිහිල්ලා කාත්තන්කුඩි ප්‍රදේශයට මහත්මයාලා ළඟා වුණේ කීයට විතරද 14 වෙනිදා?

පි : මට ස්වාමිනි මේ අවස්ථාවේ නිශ්චිත වශයෙන්ම වේලාව මතක නැහැ. මම අපි සාමාන්‍යයෙන් 01/15 වෙනි දින තමයි ස්වාමිනි අපි කාත්තන්කුඩි ප්‍රදේශයට ළඟා වෙලා තියෙන්නේ.

ප්‍ර : කාත්තන්කුඩි ප්‍රදේශයට ළඟා වෙලා තිබෙන්නේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : ඉන් අනතුරුව මහත්මයා ඔය අස්මි සම්බන්ධයෙන් විමර්ශනය කරන්න කාත්තන්කුඩි ප්‍රදේශයේ ඉඳලා අක්කරෙයිපත්තුව ප්‍රදේශයට පිටත් වෙලා යනවා ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අක්කරෙයිපත්තුව ප්‍රදේශයේදී ද මහත්මයලාට තොරුතුරු අනාවරණය වුණේ මේ අස්මි කියන තැනැත්තා කොළඹට පැමිණිලා තිබෙනවා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව ඒ තොරතුරු ලබා දීම සිද්ධ කළේ කවද්ද අස්මි සම්බන්ධයෙන් කොළඹට?

පි : මම 01/15 වෙනි දින ලබා දීලා තියෙනවා ස්වාමිනි.

ප්‍ර : 01/15 වෙනි දින?

පි : එහෙමයි 2019/01/15 වන දින ස්වාමිනි.

ප්‍ර : අක්කරෙයිපත්තුවේ සිට?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : ඉන් අනතුරුව අස්මිව අත්අඩංගුවට ගැනීම සිද්ධ කරලා තිබෙන්නේ කුමන දවසකද?

පි : එදින රාත්‍රියේ ස්වාමිනි අත්අඩංගුවට ගැනීම සිදු කළා.

ප්‍ර : එදිනම 15 වෙනි දිනම රාත්‍රියේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කුමන ප්‍රදේශකදීද අස්මි අත්අඩංගුවට ගෙන තිබෙන්නේ?

පි : කොළඹ මරදාන ප්‍රදේශයේ විවාහ මංගල උත්සවයකට සහභාගි වෙමින් සිටියදී ස්වාමිනි.

ප්‍ර : ඔබට දැනීමක් තිබෙනවද අස්මි අත්අඩංගුවට ගත්තේ කුමන විමර්ශන කණ්ඩායමක් විසින්ද ඒ කාරණා සම්බන්ධයෙන් ඔබට දැනුමක් තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි. මාගේ මතකය හැටියට එදින මාගේ අංශයේ රාජකාරී කරපු උප පොලිස් පරීක්ෂක රාජීත නිලධාරියා විසින් අත්අඩංගුවට ගැනීම සිදු කළා.

ප්‍ර : ඔබගේ අංශය වශයෙන් ඔබ සඳහන් කළේ ඔය අන්තවාදී සහ මූලධර්මවාදී විමර්ශන අංශය?

Presidential Secretariat's COPY
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : සාක්ෂිකරු දැන් ඔය සහරාන් හෂීම් කියන තැනැත්තාව එදින අත්අඩංගුවට ගැනීමට නොහැකි වුණායින් පස්සේ ඔබ විසින් තවදුරටත් මේ තැනැත්තා ඉන්න ස්ථාන සම්බන්ධයෙන් අවදියෙන් සිට විමර්ශන කටයුතු සිද්ධ කළාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව මේ සහරාන් හෂීම් කියන තැනැත්තා ඉන්න තැනැක් සම්බන්ධයෙන් ස්ථානයක් සම්බන්ධයෙන් යම් කිසි තොරතුරක් මහත්මයලාට අනාවරණය වීමක් සිද්ධ වුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ කුමන ස්ථානයක සිටිනවා කියන කාරණයද අනාවරණය වුණේ?

පි : මීට පෙර ස්වාමිනි මාගේ අංශයේ නිලධාරීන්ට අනාවරණය වෙලා තිබුණා මෙම සහරාන් විවාහ වී සිටින ඔහුගේ බිරිඳ රැඳී සිටින නිවස අංක 382/3, කැකුණුගොල්ල, නාරම්මල ලිපිනය කියලා.

ප්‍ර : ඒ අනුව ඔය ලිපිනයේ සහරාන් රැඳී සිටිනවා නම් ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා මහත්මයලා විසින් ඔය ස්ථානයට සංචාරය කිරීමක් කළාද?

පි : එහෙමයි ස්වාමිනි. මම 2019/02/28 වන දින නිලධාරීන් කණ්ඩායමක් සමඟ මෙම සහරාන් ඉහත ලිපිනයේ පදිංචි වෙලා සිටිනවද කියලා සොයලා බලන්න ස්ථානයෙන් පිටත්ව යනවා.

ප්‍ර : ඒ පිටත්වන යන දිනය නැවත ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න?

පි : ස්වාමිනි 2019/02 වෙනි මාසේ 28 වන දින.

ප්‍ර : ඔය පිටව යන නිලධාරීන් කණ්ඩායමේ නායකත්වය ගෙන කටයුතු කළේ කවුද?

පි : මම ස්වාමිනි.

ප්‍ර : මහත්මයා සමඟ පිටත් වූ අනෙකුත් නිලධාරීන්ගේ නම් සහ ඔවුන්ගේ අංක ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න?

පි : ස්වාමිනි උප පොලිස් පරීක්ෂක රාජීත පොලිස් සැරයන් 33915 අශෝක. පොලිස් සැරයන් 53251 සියාබ්දීන්. පොලිස් කොස්තාපල් 83856 නයනප්‍රිය. පොලිස් කොස්තාපල් 77839 සමන්. පොලිස් කොස්තාපල් රියදුරු 18902 කෞෂාන්.

ප්‍ර : දැන් ඔය මහත්මයලා ඔය කැකුණුගොල්ල ප්‍රදේශයට පිටත්ව යෑම සම්බන්ධයෙන් සටහන් යෙදීමක් සිද්ධ කරලා තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ කුමන තොරතුරු පොතකද සටහන් යොදලා තියෙන්නේ?

පි : ස්වාමිනි ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ විමර්ශන අංශ 02 කට අයත් තොරතුරු සටහන් පොතේ සටහන් යොදා තිබෙනවා.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එහි පිටවීමේ සටහන මහත්මයා යොදා තිබෙන වේලාව කීයටද යොදා තිබෙන්නේ?

පි : ස්වාමිනි පැය 08.00 ට පමණ.

ප්‍ර : දැන් මහත්මයා ඔය පිටවීමේ සටහනෙහි type ඒ කියන්නේ මුද්‍රිත පිටපතක් මේ කොමිෂන් සභාවේ විමර්ශන ඒකකයට ලබා දීලා තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ සටහන මහත්මයා විසින් ලබා දුන් සටහන නැවත දැක්කොත් හඳුන ගන්න පුළුවන්ද?

පි : පුළුවන් ස්වාමිනි.

ප්‍ර : බලන්න ඔය සටහනද කියලා ඒ මහත්මයා ලබා දීපු සටහන?

පි : එහෙමයි ස්වාමිනි.

ගරු මැතිතුමනි මේ අවස්ථාවේදී සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ විමර්ශන අංක 02 හි තොරතුරු සටහන් පොතෙන් උපුටා ගන්නා ලද මෙම නිලධාරියාගේ පිටවීමේ සටහන C 1000 වශයෙන් සළකුණු කිරීම සඳහා අවසර අයැද සිටිනවා.

ප්‍ර : දැන් ඔය සටහන් යොදලා කැකුණුගොල්ලට පිටත් වුණේ මොන රථයකින්ද මහත්මයලා?

පි : ස්වාමිනි ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයට අයත් වෑන් රථයක් තිබුණා. එහි අංකය අංක 250/4365 දරන වෑන් රථයකින්.

ප්‍ර : කැකුණුගොල්ල ප්‍රදේශයේ යම් කිසි ලිපිනයකට මහත්මයා ඒ අනුව ගමන් කළේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ කුමක්ද ඒ ලිපිනය?

පි : අංක 382/3, කැකුණුගොල්ල, නාරම්වල ලිපිනයට ස්වාමිනි.

ප්‍ර : මේ ලිපිනය කවර තැනැත්තෙකුට අයිති වාසස්ථානයක් වශයෙන්ද මහත්මයලාට කරුණු අනාවරණය වෙලා තිබුණේ?

පි : මෙම ලිපිනය ස්වාමිනි මොහොමඩ් කාෂිම් මොහොමඩ් සහරාන්ගේ බිරිඳ වන අබ්දුල් කාදර් ෆාතිමා කියන තැනැත්තිය රැඳී සිටින ලිපිනය වශයෙන් අපිට කරුණු අනාවරණය වෙලා තිබුණා.

ප්‍ර : නැවත සටහන් බලලා කියන්න ඒ තැනැත්තියගේ නම සම්පූර්ණයෙන්?

පි : අබ්දුල් කාදර් ෆාතිමා හාදියා ස්වාමිනි.

ප්‍ර : අබ්දුල් කාදර් ෆාතිමා හාදියා කියන තැනැත්තියගේ නිවස. සාක්ෂිකරු ඔය නිවසට කණ්ඩායමක් සමඟ ගිහිල්ලා ඊළඟට කුමක්ද කළේ?

පි : මම ස්වාමිනි මගේ නිලධාරීන් කණ්ඩායමක් සමඟ මෙම ලිපිනයට ගිහිල්ලා නිවස වටලා නිවස තුළට ඇතුල් වී පරීක්ෂා කරලා බැලුවා

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මොහොමඩ් කාෂිම් මොහොමඩ් සහරාන් මෙම නිවසේ රැඳී සිටිනවද කියලා.

ප : ඒ අනුව මහත්යලාට මොහොමඩ් කාෂිම් මොහොමඩ් සහරාන් සිටිනවා සහ ඔහු අත්අඩංගුවට ගැනීමට හැකියාවක් ලැබුණද?

පි : නැත ස්වාමිනි. එම දින සහරාන් එම නිවසේ රැඳී සිටියේ නැහැ.

ප : ඔහුගේ බිරිඳ එම ස්ථානයේ රැඳී සිටියාද?

පි : නෑ ස්වාමිනි.

ප : එහෙනම් මහත්යලා ඔය වැටලීම සිද්ධ කරන අවස්ථාවේදී කවුද ඔය නිවසේ ඒ අවස්ථාවේදී රැඳී සිටියේ?

පි : මෙම සහරාන්ගේ බිරිඳ වන හාදියාගේ මව වන මොහොම්මදු යාසීම් සිත්ති සාහීලා කියන තැනැත්තියත්.

ප : ඒ මොහොම්මදු යාසීම් සිත්ති සාහීලා කියන තැනැත්තියගේ ජාතික හැඳුනුම්පත් අංකය මහත්මයලාට අනාවරණය කර ගන්න හැකිවෙලා තිබෙනවාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ප්‍රකාශ කරන්න මේ කොමිෂන් සභාවට?

පි : අංක 698362014 X.

ප : ඔය තැනැත්තියට අමතරව තව කවුද මේ නිවසේ රැඳී සිටියේ ඒ අවස්ථාවේදී?

පි : ස්වාමිනි සහරාන්ගේ බිරිඳගේ සහෝදරයෙකු වුණු මොහොම්මදු අබ්දුල් කාදර් මොහොම්මදු අන්සාර් යන අයද නිවසේ රැඳී සිටියා.

ප : ඒ අනුව මහත්මයලා ඔය තැනැත්තන්ගෙන් මේ සහරාන් සම්බන්ධයෙන් යම් කිසි ප්‍රශ්න කිරීමක් සිද්ධ කළාද දැන් ඔහු සිටියේ නැති නිසා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : එහෙම ප්‍රශ්න කළාම ඔය සහරාන්ගේ බිරිඳගේ මව වෙච්ච මොහොමදු යාසීම් සිත්ති සාහීලා කියන තැනැත්තිය සහරාන් සම්බන්ධයෙන් කුමක්ද ප්‍රකාශ කළේ?

පි : ඇයගෙන් ප්‍රශ්න කිරීමේදී ස්වාමිනි ඇය පවසා සිටියා සහරාන් අවසන් වරට මෙම නිවසට පැමිණියේ මීට වසර දෙකකට පමණ ඉහතදී කියලා.

ප : වසර දෙකකට පමණ ඉහතදී කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඉන් පසුව ඔබ මේ අබ්දුල් කාදර් මොහොමදු අන්ෂාන් එහෙම නැත්නම් සහරාන්ගේ බිරිඳගේ සහෝදරයාගෙන් ප්‍රශ්න කිරීමකුත් කළාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : එම ප්‍රශ්න කිරීමේදී කුමක්ද අනාවරණය වුණේ සාක්ෂිකරුට?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : මෙම මොහොමදු අන්සාර් යන තැනැත්තාගෙන් ප්‍රශ්න කිරීමේදී ස්වාමිනි අපිට අනාවරණය වුණා මෙම පුද්ගලයා පවසා සිටියා සහරාන් මීට මාස එක හමාරකට පමණ ඉහත එම නිවසට පැමිණියා කියලා.

ප්‍ර : සහරාන් මාස එක හමාරකට පමණ පෙර මේ නිවසට පැමිණියා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔය මොහොමදු අබ්දුල් කාදර් මොහොමදු අන්සාර් කියන තැනැත්තාගෙන් සාක්ෂිකරු සහ කණ්ඩායම ප්‍රශ්න කරමින් සිටියදී යම් කිසි විශේෂ සිදුවීමක් සිද්ධ වුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කුමක්ද ඒ?

පි : ස්වාමිනි මොහුගෙන් ප්‍රශ්න කරමින් සිටින අතරතුර මොහුගේ දුරකථනයට දුරකථන ඇමතුමක් ලැබුණා. එම දුරකථන ඇමතුම ලද අවස්ථාවේ මා ඔහුට කිව්වා දුරකථන ඇමතුමට ප්‍රතිචාර දක්වන්න කියලා.

ප්‍ර : ඒ අනුව ඔහු දුරකථන ඇමතුමට ප්‍රතිචාර දැක්වුවාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔහු දිගටම සංවාදය පවත්වා ගෙන ගියාද එම තැනැත්තා සමඟ අනික් පස සිටි තැනැත්තා සමඟ?

පි : ඔහු දුරකථනයට ප්‍රතිචාර දැක්වීමෙන් පසුව මට පවසා සිටියා සර් CID එකේ මහත්මයෙක් කතා කරනවා. Phone එක අරන් කතා කරන්න කියලා.

ප්‍ර : දැන් ඒ අනුව මහත්මයා ඒ අන්සාර් කියන තැනැත්තාගෙන් දුරකථනය ඉල්ලා ගෙන දුරකථනයට ප්‍රතිචාර දැක්වීමක් සිද්ධ කළාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අවස්ථාවේදී ඔය අනිත් දුරකථනයේ අනික් පසින් කතා කරපු තැනැත්තා මොකක්ද මහත්මයාට කිව්වේ?

පි : ඔහු ස්වාමිනි මගෙන් විමසා සිටියා ඔබ කවුද කියලා.

ප්‍ර : ඒ අනුව මහත්මයා මහත්මයාගේ අනන්‍යතාවය අනාවරණය කිරීමක් කළාද?

පි : එහෙමයි ස්වාමිනි .

ප්‍ර : ඉන් අනතුරුව ඔහු කුමක්ද මහත්මයාගෙන් විමසා සිටියේ?

පි : ඔහු කිව්වා මම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක ඩයස් මම ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් මොහොමඩ් කාෂිම් මොහොමඩ් සහරාන් අත්අඩංගුවට ගන්න මෙම ප්‍රදේශයට පැමිණ සිටිනවා. අපි පැමිණ සිටින්නේ පොලිස් අපරාධ පරීක්ෂණ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශ දෙකෙහි පොලිස් පරීක්ෂක මාරසිංහ, සහකාර පොලිස් අධිකාරි වික්‍රමසේකර යන මහත්වරුන්ගේ නියෝග හා උපදෙස් මත මෙම අන්සාර් කියන පුද්ගලයා ඔවුන්ගේ පුද්ගලික තොරතුරුකරුවෙක්. ඔහු විශේෂ කාර්යයක් සඳහා මේ අවස්ථාවේ නිවසට එවලා තියෙන්නේ.

ප්‍ර : ඒ ආදී තොරතුරු තමයි අනාවරණය කළේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඒ අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීනුත් ඔය සහරාන් ගැන විමර්ශනය කරනවා හෝ ඒ සම්බන්ධයෙන් කාරණාවක් අනාවරණය වීමක් සිද්ධ වුණාද?

පි : එහෙමයි ස්වාමිනි. ඔහු අපෙන් විමසා සිටියා ඔබ ඇයි සහරාන් අල්ලන්න ආවේ කියලා. මම කිව්වා අපිට ඔහු අත්අඩංගුවට ගැනීමට වරෙන්තුවක් තියෙනවා. ඒ වරෙන්තුව ක්‍රියාත්මක කරන්න අපි ආවේ කියලා. එවිට ඔහු පවසා සිටියා මෙම අන්සාර් කියන පුද්ගලයා ඔවුන්ගේ පුද්ගලික තොරතුරුකාරයෙක්. ඔහු නිවසට පැමිණියේ හදිසි අවශ්‍යතාවයක් ඉටු කර ගැනීමට සහ ඔවුන්ගේ තොරතුරක් පරීක්ෂා කිරීමට අපි එම නිවසේ රැඳී සිටියොත් ඔවුන්ගේ විමර්ශනවලට බාධාවක් වන බැවින් අපිට හැකි තරම් ඉක්මනින් එම නිවසෙන් පිටව යන ලෙස උප පොලිස් පරීක්ෂක ඩයස් මට දන්වා සිටියා.

ප්‍ර : ඒ අනුව දැන් ඔය මහත්මයාට ඩයස් අපරාධ පරීක්ෂණ දෙපාර්තාමේන්තුවේ නිලධාරීයෙක් යැයි හඳුන්වා දෙමින් කතා කළ තැනැත්තා නිසැක වශයෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීයෙක්ද යන්න තහවුරු කර ගැනීම සඳහා මහත්මයලා යම් කිසි ක්‍රමවේදයක් අනුගමනය කළාද?

පි : එහෙමයි ස්වාමිනි. මම මගේ ජංගම දුරකථනයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඇමතුමක් ලබා ගෙන උප පොලිස් පරීක්ෂක ඩයස්ගේ දුරකථන අංකය ලබා ගත්තා. ලබා ගෙන මා මාගේ දුරකථනයෙන් උප පොලිස් පරීක්ෂක ඩයස්ගේ දුරකථනයට දුරකථන ඇමතුමක් ලබා ගෙන ඔහු උප පොලිස් පරීක්ෂක ඩයස්ද යන්නත් විමර්ශන අංශ දෙකෙහි රාජකාරී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන අංශ දෙකෙහි රාජකාරී කරනවද යන්න විමසා සිටියා. එහිදී ඔහු පවසා සිටියා ඔව් මම SI ඩයස්. මම තමයි ඉස්සෙල්ලා අන්සාර්ට කතා කළේ. ඔයාලගේ Inquiry ය අතන ගෙදර රැඳී සිටියොත් අපිට Disturb වෙනවා. ඒ හින්දා ඉක්මනින් නිවසෙන් පිටත් වෙන්න කියලා ඔහු මට පවසා සිටියා.

ප්‍ර : ඒ අනුව මහත්මයලා ඒ තැනැත්තාගේ ඔය ප්‍රකාශයත් එක්ක ස්ථානයෙන් ඉවත් වීමක් සිද්ධ කළාද?

පි : එහෙමයි ස්වාමිනි. මං ඉවත් වීමක් සිදු කළා.

ප්‍ර : ඒ ඉවත් වන බව මහත්මයලාගේ ඒකකයේ යම් කිසි ප්‍රධානීන්ට මහත්මයා දැනුවත් කිරීමක් සිද්ධ කළාද?

පි : එහෙමයි ස්වාමිනි. මම මේ සිදුවීම සම්බන්ධයෙන් සහ උප පොලිස් පරීක්ෂක ඩයස් අපිට එම ස්ථානයෙන් වහාම ඉවත් වෙන්න කියපු කරුණ සම්බන්ධයෙන් ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ ස්ථානාධිපතිටත් මාගේ අංශයේ අධීක්ෂණ කටයුතු සිදු කරන ලද සහකාර පොලිස් අධිකාරිතුමාටත් දන්වා සිටියා.

ප්‍ර : ඒ මහත්මයා සඳහන් කරපු ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ ස්ථානාධිපතිවරයාගේ නම කුමක්ද කියලා කියන්න?

පි : ස්වාමිනි ප්‍රධාන පොලිස් පරීක්ෂක කේ.එන්.ඕ.පෙරේරා මහතා.

ප්‍ර : ඒ වගේම එහි සහකාර පොලිස් අධිකාරිවරයා වශයෙන් කටයුතු කළේ අංශය භාරව කටයුතු කළේ කවුද?

පි : ස්වාමිනි සහකාර පොලිස් අධිකාරි සමන් පෙරේරා මහතා.

ප්‍ර : ඒ මහත්වරුන්ට මහත්මයා කුමක්ද සඳහන් කළේ?

පි : මා පවසා සිටියා ස්වාමිනි අපි සහරාන් ගැන තොරතුරු සොයා බලා ඔහු අත්අඩංගුවට ගන්න සහරාන්ගේ බිරිඳ කැකුණුගොල්ල නිවසට ඇවිල්ලා අන්සාර්ගෙන් ප්‍රශ්න කරමින් සිටින අතරතුර ඔහුගේ දුරකථනයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක ඩයස් යන පුද්ගලයෙක් ඇමතුමක් ලබා දී අන්සාර් ඔවුන්ගේ පුද්ගලික තොරතුරුකරුවෙක් බවත් අපේම නිවසේ රැඳී සිටියොත් ඔවුන්ගෙන් තොරුතුරු ලබා ගැනීමටත් බාධා වන බැවින් අපිට හැකි ඉක්මනින් ඒ නිවසෙන් පිටත් වන ලෙසත් දැන්වූ බව පවසා සිටියා.

ප්‍ර : ඔය මහත්මයලා ඒ තමන්ගේ ඉහළ නිලාධාරීන් දැනුවත් කළාට පස්සේ ඔවුන්ගෙන් ඔබට ලැබුණු උපදෙස වුණේ කුමක්ද?

පි : මට ස්වාමිනි මගේ අංශයේ ස්ථානාධිපතිතුමාත් සහකාර පොලිස් අධිකාරිතුමාත් දන්වා සිටියා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විමර්ශනවලට බාධාවක් වෙනවා නම් එතනින් හැකි තරම් ඉක්මනින් ඉවත් වෙන්න කියලා.

ප්‍ර : ඒ අනුව මහත්මයලාට උපදෙස් ලැබුණා ඒ අදාළ ස්ථානයෙන් වහාම ඉවත් වෙන්න කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ එහෙම ඉවත් වෙලා මහත්මයාලා ඔය සහරාන් සම්බන්ධයෙන් තවදුරටත් යම් කිසි විමර්ශනයක් සිද්ධ කළාද?

පි : එහෙමයි ස්වාමිනි. අපි අන්සාර්ගෙන් ප්‍රශ්න කිරීම අතරතුර නවත්වලා නිවසින් ඉවත් වෙලා අපිට තවදුරටත් තොරතුරු තිබුණා

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

සහරාන් කටුපොත ප්‍රදේශයේ රැඳී සිටීමට ඉඩ තියෙනවා කියලා. එබැවින් අපි කටුපොත ප්‍රදේශයට පිටව ගියා ස්වාමිනි.

ප්‍ර : කටුපොත ප්‍රදේශයේදී මහත්මයලාට සහරාන් හෂීම් කියන තැනැත්තාව අත්අඩංගුවට ගැනීමට හැකියාවක් ලැබුණද?

පි : නැත ස්වාමිනි.

ප්‍ර : දැන් සාක්ෂිකරු ඔය දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත විමර්ශනය තමන් විසින් සිද්ධ කරමින් තිබූ විමර්ශන කටයුත්තකින් ඉවත් වෙලා නැවත ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයට වාර්තා කළාට පස්සේ මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරපු විමර්ශන සම්බන්ධයෙන් ඔබ විසින් ඔවුන්ගෙන් යම් කිසි විමර්ශන වාර්තාවක් කැඳවීමක් සිද්ධ කරලා තිබුණද?

පි : මම ස්වාමිනි සෘජුව කැඳෙව්වේ නෑ. මෙම එවකට ඉන් අනතුරුව අංශයේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කරපු ප්‍රධාන පොලිස් පරීක්ෂක පතිරණ මහත්මයා අංශයේ රාජකාරී සඳහා වාර්තා කළා. ඉන් අනතුරුව විමර්ශන නිලධාරියා වන පොලිස් කොස්තාපල් නයනප්‍රිය නිලධාරියා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මේ සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවා තිබෙනවා.

ප්‍ර : ඒ වාර්තාව මහත්මයා සතුව දැන් තිබෙනවද?

පි : මේ අවස්ථාවේ නෑ ස්වාමිනි.

ප්‍ර : යම් අවස්ථාවක ගරු කොමිෂන් සභාවේ පරිශීලනය සඳහා අවශ්‍ය වුනොත් ඒ වාර්තාව ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔය මහත්මයලා සහරාන්ව අත්අඩංගුවට ගන්න යම් කිසි විමර්ශන කටයුත්තක් සිද්ධ කරලා තිබුණා. ඒ අනුව මෙම විමර්ශනයට 2019/02 වෙනි මාසේ 28 වෙනිදා මහත්මලා පිටත්ව ගියා ඔය ආදී වශයෙන් කටයුතු කරලා නමුත් සහරාන්ව අත්අඩංගුවට ගැනීමට හැකියාවක් ලැබුණේ නෑ. මෙම ඔය අත්අඩංගුවට ගැනීමට නොහැකි වෙච්ච ඔය මහත්මයලාගේ සංචාරය නිසා යම් කිසි අවස්ථාවක ඔය සහරාන් හෂීම් කියන තැනැත්තාව අත්අඩංගුවට ගැනීමට කරන විමර්ශන කටයුතුවල යම් කිසි අඩාලවීමක් හෝ බිඳ වැටීමක් සිද්ධ වුණා කියලා මහත්මයලාට නිරීක්ෂණය වෙලා තිබුණද?

පි : ස්වාමිනි විමර්ශනවල අඩාලවීමක් සිදු වුණේ නැහැ. නමුත් සහරාන්ගේ මස්සිනා වන මොහොමඩ් අන්සාර්ගෙන් අපිට තවදුරටත් එම ස්ථානයේදී ප්‍රශ්න කිරීමට හැකියාවක් ලැබුණා නම් යම් තොරතුරක් එදින අනාවරණය කර ගැනීමට හැකියාවක් තිබුණු බවට මට හැඟෙනවා.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප : දැන් ඔය කැකුණුගොල්ල ප්‍රදේශයට මහත්මයලා පිටත් වෙලා ගිහිල්ලා නැවත ස්ථානයට මහත්මයලාගේ ප්‍රධාන විමර්ශන ස්ථානය වන ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයට නැවත පැමිණිලා පැමිණීමේ සටහන් මහත්මයා යොදා තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඒ කුමන තොරතුරු පොතක කුමන පිටුවකද යොදා තිබෙන්නේ?

පි : ස්වාමිනි ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ විමර්ශන අංශ 02 ට අයත් තොරතුරු සටහන් පොතේ පිටු අංක 15 හි ඡේද 01 යටතේ මගේ පැමිණීමේ සටහන මං යොදා තිබෙනවා.

ප : කවර දිනයකද එම සටහන යොදා තිබෙන්නේ?

පි : 2019/03/01 වන දින

ප : එම සටහනේ මහත්මයා සටහන් කරලා තිබෙනවද ඔය විමර්ශන කටයුත්තට ගිහිල්ලා විමර්ශනයේ යෙදී සිටියදී ඔය අන්සාර් කියන තැනැත්තාට දුරකථන ඇමතුමක් ලැබුණු බවත් ඊට පසුව ඒ අවස්ථාවේ සිදු වෙච්ච යම්කිසි සිදුවීම සම්බන්ධයෙන් මොකක්ද මහත්මයා සටහනේ දාලා තිබෙන්නේ?

පි : මම සටහනේ ස්වාමිනි යොදා තිබෙනවා මම සහරාන්ගේ බිරිඳට අයත් නිවසේ රැඳී සිටින විට සහ ඔහුගේ මස්සිනා වන අන්සාර්ගෙන් ප්‍රශ්න කිරීමේදී ඔහුට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක ඩයස් නැමැති පුද්ගලයාගෙන් දුරකථන ඇමතුමක් ලද බවත් ඉන් පසු ඩයස් අපිට මේ ස්ථානයෙන් හැකි ඉක්මනින් ඉවත් වෙන්නට දැන් වූ බවත් මා සඳහන් කර තිබෙනවා.

ගරු මැතිතුමනි සාක්ෂිකරු විසින් සඳහන් කරන ලද ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශය විමර්ශන අංක දෙකෙහි තොරතුරු සටහන් පොතේ 15 වන පිටුවෙහි දැක්වෙන නිලධාරීන්ගේ පැමිණීමේ සටහන C 1001 වශයෙන් ලකුණු කිරීම සඳහා ගෞරවයෙන් අවසර අයැද සිටිනවා.

ප : මහත්මයා ඔය කැකුණුගොල්ලේ විමර්ශන කටයුතු භාරව කරලා ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශයේ දිගටම රාජකාරී කළාද ඉන් අනතුරුවත්?

පි : එහෙමයි ස්වාමිනි.

ප : ඔය සිදුවීමට අමතරව පාස්කු ප්‍රහාරයෙන් මිය ගිය හෝ අත්අඩංගුවට ගත් වෙනත් යම් සැකකරුවන් සම්බන්ධවත් මහත්මයා විමර්ශන කටයුතු සිද්ධ කරලා තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප : මහත්මයා දෙහිවල Tropical Inn කියන ස්ථානයේදී බෝම්බ පුපුරවා ගත්ත ජමීල් කියන අය සම්බන්ධයෙන් වන විමර්ශනයට සහභාගි වුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම විමර්ශනයේදී මහත්මයාගේ අධීක්ෂණ නිලධාරියා වශයෙන් කටයුතු කළේ කවුද?

පි : එම විමර්ශනයේදී ස්වාමිනි මගේ ස්ථානාධිපති වශයෙන් කටයුතු කළේ ප්‍රධාන පොලිස් පරීක්ෂක තරංග පතිරණ මහතා. ප්‍රධාන විමර්ශන නිලධාරියා වශයෙන් කටයුතු කළේ මම.

ප්‍ර : එම පිපිරීම සම්බන්ධයෙන් දැනටමත් මේ ගරු කොමිෂන් සභාව හමුවේ තරංග පතිරණ කියන නිලධාරී මහත්මයා සාක්ෂි දීලා තිබෙනවා කියලා මහත්මයා දන්නවද?

පි : එහෙමයි ඔව් ස්වාමිනි.

ප්‍ර : දැන් සාක්ෂිකරු කැකුණුගොල්ලේ ඔය සහරාන්ගේ බිරිඳගේ නිවසට ගිය අවස්ථාවේදී මහත්මයා ඒ නිවස සම්පූර්ණයෙන් සෝදිසි කිරීමක් සිද්ධ කළාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මහත්මයාට මතකයක් තිබෙනවද ඔය නිවස මොන ආකාරයේ නිවසක් සහ එහි කාබර කීයක් තිබුණද කියන කාරණාව සම්බන්ධයෙන් මතකයක් තිබෙනවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කියන්න?

පි : එම නිවස ස්වාමිනි තනි මහලේ නිවසක්. මට මතක විදිහට පල දෙකේ වහලක් ගසා තිබුණා. ඉදිරිපස ස්තෝප්පු කෑල්ලක් සහ සාලෙකුත් මට මතකයේ හැටියට ස්වාමිනි කාබර තුනක් වගේ තිබුණා ස්වාමිනි එම නිවසේ.

ප්‍ර : එම ස්ථානයේ යම් කිසි තැනැත්තෙකුට සැඟවී සිටිය හැකි ස්ථානයක් තිබුණා කියලා මහත්මයාට නිරීක්ෂණය වුණාද ඒ කියන්නේ සොල්දොරයක් හෝ ඒ ආකාරයේ යම් කිසි ස්ථානයක්?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : දැන් මහත්මයලා සාක්ෂිකරු සඳහන් කළා අන්සාර් කියලා තැනැත්තෙක්ගෙන් යම් කිසි විමසීමක් සිද්ධ කළයි කියලා?

පි : එහෙමයි ස්වාමිනි .

ප්‍ර : ඔය අන්සාර් කියන තැනැත්තගෙන් පසු අවස්ථාවක ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශය විසින් ප්‍රකාශයක් සටහන් කර ගැනීමක් සිද්ධ කරලා තිබෙනවද?

පි : ඔව් ස්වාමිනි පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් පසුව මා මතකයේ හැටියට අපේ නිලධාරීන් ඔහුගෙන් ප්‍රකාශ ලබා ගත්තා.

ප්‍ර : ඒ අවස්ථාවේදී නෙවේ සාක්ෂිකරු ගෙදරට ගිය අවස්ථාවේදී ඔබ විසින් හෝ ඔබගේ කණ්ඩායමේ නිලධාරියෙක් විසින් අන්සාර්ගෙන් ප්‍රකාශයක් සටහන් කර ගත්තද?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : නැත ස්වාමිනි. ප්‍රකාශයක් ලබා ගැනීමට අවස්ථාවක් තිබුණේ නෑ එදින.

ප්‍ර : එසේ ප්‍රකාශයක් ලබා නොගැනීමට හේතුව මොකක්ද මහත්මයා?

පි : ස්වාමිනි මට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කතා කරපු නිලධාරියා පැවසුවා ඔහු හදිසි තොරතුරක් පරීක්ෂා කිරීමට මොහු නිවසට යොමු කර තිබෙන්නේ අපි නිවසේ රැඳී සිටියොත් ඔවුන්ගේ විමර්ශනවලට බාධාවක් බැවින් හැකි ඉක්මනින් නිවසින් පිටත් වන ලෙස. ඒ අනුව මගේ උසස් නිලධාරීන්ගෙන් ලද උපදෙස් මත මට ප්‍රකාශයක් ලබා ගැනීමට අවස්ථාවක් තිබුණේ නෑ මා ප්‍රශ්න කරමින් සිටින අතරතුර එය නවතා නැවත එම ස්ථානයෙන් පිටත් වුණේ.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු දැන් ඔබ ඔය කැකුණුගොල්ල පිහිටි 382/3 කියන නිවසට යන්නේ 2019 පෙබරවාරි 28 වන දින කියලා කිව්වොත් හරිද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : යන වේලාව සාමාන්‍යයෙන් මතකයක් තියෙනවද ඔබට?

පි : ස්වාමිනි උදෑසන 11 ට පමණ අපි ගියේ.

ප්‍ර : උදෑසන 11 ට පමණ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ ගිහිල්ලා නිවස වට කෙරුවයින් පස්සෙද ඇතුල් වෙන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දොර වහලද තිබ්බේ ගෙදර?

පි : ඇරලා තිබුණේ ස්වාමිනි.

ප්‍ර : ඇරලා තිබ්බේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඊට යාබද නිවෙසක් තිබ්බද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : පිටි පස්සෙන් යන්න බැරි වෙන විදිහටද ඔබ මේ නිලධාරීන්ව යෙදෙව්වේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ කිව්වා ඒ නිවසේ කාබර තුනක් තිබ්බා කියලා ?

පි : මාගේ මතකේ හැටියට ස්වාමිනි කාබර තුනක් තිබුණා.

ප්‍ර : ඔබ ඔය සියළු කාබර පරීක්ෂාවට ලක් කෙරුවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඊට පස්සෙනේ ඔය දුරකථන ඇමතුම එන්නේ නැද්ද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔය කාබර තුන පරීක්ෂා කිරීමේදී ඒ කාබරවල තිබ්බේ ඇඳුම් සම්බන්ධයෙන් ඔබ අවධානයක් යොමු කෙරුවද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට කාබර තුනේ කවුරු හරි හිටියා කියන කියලා කියන්න පුළුවන් තත්ත්වයකද හිටියේ තිබ්බේ?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : කාබර තුනේම?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : කවුරු හරි හිටපු බවක් පෙනුණා?

පි : පුද්ගලයින් රැඳී සිටින බව නිරීක්ෂණය වෙලා තිබුණා ස්වාමිනි.

ප්‍ර : හරි එතකොට ඒ කියන්නේ පිරිමි පුද්ගලයෙක්ගේ ඇඳුම් තිබ්බද කාන්තාවකගේ ඇඳුම්ද තිබ්බේ?

පි : ස්වාමිනි මට මතකේ හැටියට කාබර දෙකක පමණ කාන්තා ඇඳුම් තිබුණා.

ප්‍ර : හරි.

පි : තවත් එක් කාබරයක පිරිමි පුද්ගලයින්ගේ ඇඳුම් තිබුණා.

ප්‍ර : හරි එක් කාබරයක පිරිමි පුද්ගලයින්ගේ ඇඳුම් තිබ්බා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ කාගේ ඇඳුම්ද කියලා ඔබට ඒ අවස්ථාවේදී යම් නිරීක්ෂණයක් කරන්න පුළුවන් වුණාද?

පි : බෑ ස්වාමිනි.

ප්‍ර : බැරි වුණා?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : අන්සාර් හිටියේ කොතැනද ඔබ නිවසට ඇතුල් වෙන විට?

පි : අන්සාර් ස්වාමිනි මගේ මතකේ හැටියට ඉස්සරහායින් හිටියා ස්වාමිනි ඉදිරිපසින් වගේ නිවසේ.

ප්‍ර : එතකොට මේ අන්සාර්ගේ මව නේද?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : මව කොතැනද හිටියේ?

පි : මව ස්වාමිනි නිවස ඇතුළේ ඉඳලා තමයි එළියට ආවේ

ප්‍ර : ඇතුලේ ඉඳලා එළියට ආවේ ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ කිව්වනේ එකේ එක කාමරයක පිරිමි ඇඳුම් තිබ්බා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ කාබරයෙන් ඔබට නිරීක්ෂණය වුණාද ඒ කාබරයේ ඒ කියන්නේ මේ එදින ආපු තැනැත්තෙක් ඒ කාබරයේ රැඳී සිටියද නැත්නම් ඊට පෙර දින කිහිපයකට හරි පෙර නැත්නම් එහෙම රැඳී ඉන්න බවක් පෙනුනද ඔබගේ නිරීක්ෂණවලට?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : මගේ මතකය හැටියට ස්වාමිනි මට නිශ්චිතවම කියන්න බෑ එදින ආවද කියලා නමුත් පිරිමි පුද්ගලයන්ගේ සරම් ෂර්ට් වගේ දේවල් තමා තිබුණේ.

ප්‍ර : ඒක තමා සරම් ෂර්ට් වගේ එල්ලලා තිබුණා?

පි : එල්ලලා සහ ඉස්කිරිම්ම මේ රාක්කවල දාලා තිබුණා ස්වාමිනි ඇඳුම් දාන.

ප්‍ර : හරි එතකොට අර ඔබ කියනවනේ දැන් ඔබ මේ පරීක්ෂා කරන අතරතුර මේ අන්සාර්ගේ Telephone එකට දුරකථන ඇමතුමක් එනවා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ ඇමතුම ඔබ ඔහුට ගන්න කියන්නේ ඔබ දුරකථනය පරීක්ෂා කිරීමෙන් පසුවද?

පි : නෑ ස්වාමිනි ඔහු මම ප්‍රශ්න කරමින් ඉන්න කොට ඔහුගේ සාක්කුවේ දුරකථනය තිබුණේ. ඒකට තමයි ඇමතුම ආවේ. එම අවස්ථාවේ මම ඔහුට කිව්වා loud speaker දාලා phone එක answer කරන්න කියලා.

ප්‍ර : හරි එතකොට දැන් ඔහු දුරකථනය එළියට ගත්තාම answer කරන්න ඉස්සෙල්ලා ඔබට ඔහුගේ දුරකථනයේ මූණත පෙනුනද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ දුරකථන ඇමතුම එන තැනැත්තාගේ නම කොයි විදිහටද එහි මේ save කරලා තිබ්බේ?

පි : ස්වාමිනි මට ඒ සම්බන්ධයෙන්.

ප්‍ර : මතකයක් තියෙනවද?

පි : නිශ්චිත මතකයක් නෑ ස්වාමිනි.

ප්‍ර : මතකයක් නෑ? හරි දැන් ඔබ ඉදිරිපිටනේ ඔහු loud- speaker එක දාන්නේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඉස්සෙල්ලා කතා කරන්නේ අන්සාර්ද අනෙක් පැත්තෙන් කතා කරපු පුද්ගලයාද?

පි : අනිත් පැත්තෙන් කතා කරපු පුද්ගලයා කතා කරලා ස්වාමිනි මට මතක විදිහට මොකද මට දෙමළ භාෂාවෙන් තමයි ස්වාමිනි ඇමතුම ආවේ. එතකොට මගේ හිටියා මාත් සමඟ ගියා මුස්ලිම් නිලධාරීයෙක් සාජන් සියාබ්දීන් කියලා එයා තමයි දුරකථනයට සවන් දීලා මට දුරකථනය ලබා දුන්නා. ඊට පස්සේ මම කතා කරන කොට කතා කළේ සිංහල භාෂාවෙන්.

ප්‍ර : ඒ කියන්නේ දැන් ඒ අනෙක් පැත්තෙන් කතා කරපු පුද්ගලයා දෙමළ භාෂාවෙන්ද කතා කළේ?

පි : අන්සාර්ට කතා කළේ ස්වාමිනි දෙමළ භාෂාවෙන්.

Prosecutor's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : එතකොට ඒකට අන්සාර් උත්තර දුන්නද නැත්නම් කෙළින්ම සියාබ්දීන් උත්තර දුන්නද?

පි : අන්සාර් උත්තර දෙන්න කලින් ස්වාමිනි මම phone එක අරන් ඔයා කවුද කියලා ඇහුවා මට මතක විදිහට ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ අන්සාරුයි අර එහා පැත්තෙන් කතා කරපු ඩයසුයි අතර කිසිම සංවාදයක් සිදු වුණේ නැද්ද?

පි : මට මතක විදිහට ස්වාමිනි එම අවස්ථාවේ සිදු වුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ කියන හැටියට මේ ඩයස්ද දෙමළ භාෂාවෙන් කතා කෙරුවේ?

පි : මම හිතන විදිහට ස්වාමිනි ඩයස් හෝ ඔහුත් සමඟ සිටින නිලධාරීයෙක් විය හැකියි.

ප්‍ර : ඩයස් මේ වෙන කොටත් මේ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දීලා කියලා තියෙනවා ඔහු ඔබට කිව්වේ නෑ කියලා එතනින් ඉවත් වෙන්න කියලා. ඔබ මොකක්ද ඒ සම්බන්ධයෙන් කියන්න තියෙන්නේ?

පි : ඔහු මට පැහැදිලිව කිව්වා ස්වාමිනි එම ස්ථානයෙන් වහාම ඉවත් වෙන්න කියලා. මොකද මගේ හිටපු නිලධාරීන් කණ්ඩායමටත් ඒක ඇහුණා. මාත් සමඟ සිටි අනිත් නිලධාරීන්ටත් මං හිතන්නේ එම ඇමතුම ගත්ත අන්සාර්ටත් ඒ සම්බන්ධයෙන් දැනුමක් ඇති ස්වාමිනි.

ප්‍ර : ඒක කිව්වේ සිංහලෙන්ද?

පි : සිංහලෙන් ස්වාමිනි කිව්වේ.

ප්‍ර : කියපු වචන ඔබට මතකයක් තියෙනවද?

පි : ඔව් ස්වාමිනි මගෙන් ඇහුවේ ඔයා කවුද කියලා ඇහුවා. මං කිව්වා මං SI රත්නායක TID එකේ කියලා. ඊට පස්සේ එයා කිව්වා මම SI ඩයස් CID එකේ කියලා. ඊට පස්සේ මගෙන් ඇහුවා ඇයි ඔයාලා මෙහේ ගෙදරට ආවේ කියලා. මම කිව්වා ස්වාමිනි අපි මේ සහරාන් කියන පුද්ගලයාට වරෙන්තුවක් අරන් තියෙනවා ඒ වරෙන්තුව ක්‍රියාත්මක කරන්න තමයි අපි ගෙදරට ආවේ කියලා. ඊට පස්සේ ඩයස් කිව්වේ මට අපිත් මේ සහරාන් අල්ලන්න තමයි මෙහෙට ඇවිල්ලා ඉන්නේ දැන් සති ගාණක් ඉඳලා මෙහේ නැවතිලා ඉඳලා විමර්ශන කරනවා. එතකොට අපි දැන් මේ අන්සාර් එයාගේ පුද්ගලික තොරතුරුකාරයෙක්. එබැවින් මෙයා ගෙදරට එවලා තියෙන්නේ හදිසි තොරතුරක් පරීක්ෂා කර ගන්න. ඒ හින්දා ඔයාලා හැකි ඉක්මනින් මේ නිවසින් පිටත් වෙන්න කියලා අපිට කිව්වේ.

ප්‍ර : දැන් එතකොට ඩයස් ඔබට කියනවා මේ අන්සාර්ව ඔය ගෙදරට එවලා තියෙන්නේ ඩයස්ගේ කාර්යයකට කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : නමුත් ඔබ කියනවා ඔබ මේ නිවස නිරීක්ෂණය කිරීමෙන් පසු පේනවා එක කාබරයක පිරිමි පුද්ගලයෙක් හිටියා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔය ඩයස් කියන කතාවයි ඔබගේ නිරීක්ෂණවලයි අතර යම් කිසි ගැටීමක් තිබ්බා කියලා ඔබට ඒ වෙලාවේ අවබෝධ වුණාද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබට ඒ පිළිබඳව වැටහීමක් තිබ්බේ නැද්ද ඒ අවස්ථාවේදී?

පි : නෑ ස්වාමිනි ඒ අවස්ථාවේ.

****

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මහත්මයා</u>

ප්‍ර : රත්නායක මහත්මයා දැන් ඒ ඩයස් කියන නිලධාරියා කතා කරලා කියපු විදිහට ඔබට හැඟුණේ ඩයස් නිලධාරියා ඒ ආසන්නයේ ඒ කිට්ටුවක ඉන්න බවක්ද ඔබට?

පි : එහෙමයි ස්වාමිනි. ඔහු කිව්වා ඔහු ඒ නිවස අවට ඔවුනුත් රැඳී සිටිනවා කියලා.

ප්‍ර : එතකොට ඔබ ඇහුවේ නැද්ද කොහේද ඉන්නේ කවදද ආවේ ඒ විස්තර ඇහුවේ නැද්ද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : ඒවා ඇහුවේ නෑ?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : දැන් ඔහුත් එවකට උප පොලිස් පරීක්ෂක.

පි : එහෙමයි.

ප්‍ර : ඔබත් උප පොලිස් පරීක්ෂක?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතකොට ඒ සම තත්ත්වයේ ඉන්න දෙන්නෙක්ට කියන්න පුළුවන්ද ඔබ යන්න කියලා එහෙම නියෝගයක් දෙන්න පුළුවන්ද?

පි : ඇත්තටම බෑ ස්වාමිනි. නමුත් මම මගේ උසස් නිලධාරීන්ට මං පැවසුවාට පස්සේ මං උසස් නිලධාරීන් මට උපදෙස් ලබා දුන්නා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ Investigations වලට disturb නම් ඔයා ඔතනින් අයින් වෙන්න කියලා. ඒ හින්දා ස්වාමිනි මං නිවසින් අයින් වුණා.

ප්‍ර : දැන් මෙවැනි අත්දැකීමක් මීට කලින් තියෙනවද දැන් ඒ කියන්නේ එකම පොලිසියේ ආයතන දෙකක් එකම ස්ථානයකට ඇවිත් එහෙම එක කට්ටියක් අනිත් අයට යන්න කියලා කියන ඒ වගේ තත්ත්වයක් මින් පෙර පොලිස් රාජකාරී දිවියේ ඔබට එහෙම අහලා හෝ අත්දැකලා තියෙනවද?

පි : මම අත්දැකලා නෑ ස්වාමිනි.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප : එහෙම නෑ?

පි : ඔව් ස්වාමිනි.

ප : දැන් එතකොට ඒ අවස්ථාවේදී ඔබට කිසියම් වූ සැකයක් හෝ එහෙම නැත්නම් ඒ පිළිබඳ අවිනිශ්චිත භාවයක් මතු වුණේ නැද්ද කියපු දේ අහලා එහෙම්මම යන්න තීරණය කළාද?

පි : මම ස්වාමිනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කතා කරලත් නැවත ඩයස්ගේ දුරකථන අංකයට ඇරගෙන ඔහු කියපු කතාව ඇත්තද කියලත් මම check කරලා බැලුවා. එතකොට SIU දෙකටත් මං කතා කරලා ඇහුවා මෙහෙම නිලධාරීයෙක් විමර්ශනවලට ගිහිල්ලා තියෙනවද කියලා. ඔවුනුත් කිව්වා ගිහිල්ලා තියෙනවා කියලා එම නිසා මම හිතුවා CID කියන්නේ මෙම නිලධාරීයාගේ informer කෙනෙක් කියලා ඔහුම මට පවසපු හින්දයි මම අයින් වුණේ ස්වාමිනි එයාගේ informer කෙනෙක් හින්දා සහ ඔවුන් ඒ වන විටත් සහරාන්ගේ මං හිතන්නේ අර ලැක්ටෝ වත්තේ තිබුණේ පුපුරන ද්‍රව්‍ය සොයා ගැනීම සම්බන්ධයෙන් විමර්ශන කරමින් සිටි බවට යම් තොරතුරක් අපි දැනන් හිටියා. ඒ හින්දා ස්වාමිනි අපි එතනින් අයින් වුණේ.

ප : අන්සාර්ගෙන් හරි ගෙදර අනිත් අයගෙන් හරි ඒ අවස්ථාවේදී ඔබ විමසුවේ නැද්ද CID එකේ ඩයස් කියන මහත්මයා මේ ගෙදරට ආවාද ඊයේ පෙරේදා එහෙම කියලා විමසුවේ නැද්ද?

පි : ඔව් අන්සාර් මට පවසා සිටියා ස්වාමිනි ඩයස් ආවා කියලා මීට පෙර.

ප : කවදද?

පි : මට දිනයක් නම් මතක නෑ ස්වාමිනි.

ප : නෑ නෑ ඊට දවසකට දෙකකට පෙරද එහෙම නැත්නම් මීට මාස ගාණකට පෙරද ඒ කියන්නේ ඒ මොහොත වන විට ඒ අය හිටියේ ඒ කිට්ටුව කියන හැඟීමක් ආවා නම් ඒ දින කීපයක් තුළ ඩයස් ඔය නිවසට පැමිණි බවද ඔබට වැටහුණේ?

පි : ඔව් ස්වාමිනි.

ප : නමුත් ඩයස්ගෙන් නිශ්චිතවම කියවුණේ නෑ ඔහු කොතැනද ඉන්නේ කියලා?

පි : නෑ මට කිව්වේ නෑ ස්වාමිනි. අපි සාමාන්‍යයෙන් ස්වාමිනි අර විමසන්නෙත් නෑ අනිත් නිලධාරීයෙක්ගෙන් අපි එයාලගේ investigation වලට බාධාවක් වෙන හින්දා.

****

<u>ගරු විනිසුරු අදිකාරි මහත්මිය</u>

ප : සාක්ෂිකරු

පි : ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : දැන් ඔය සහරාන්ගේ බිරිඳගේ සහෝදරයා අන්සාර් CID එකේ ඔය නිලධාරියාගේ ඔත්තුකරුවෙකු කියලා කිව්වහම ඔබ ඔහුගෙන් විතරක් අහලා සෑහීමකට පත් වුණාද එහෙම නැත්නම් ඔබව විමර්ශනයට පත් කරපු ඉහළ නිලධාරීන්ට මේ පිළිබඳව පැවසුවාද?

පි : මගේ ඉහළ නිලධාරීන්ට මං මේ සම්බන්ධයෙන් පැවසුවා ස්වාමිනි.

ප්‍ර : ඔවුන් සොයා බැලුවද මේක සත්‍ය කතාවක්ද මොහු මේ ඒ ගොල්ලන්ගේ තොරතුරුකරුවෙක්ද කියලා අන්සාර් කියන සහරාන්ගේ බිරිඳගේ සහෝදරයා?

පි : එම අවස්ථාවේ සොයා බැලීමක් සිදු කළේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඊට පස්සෙවත්?

පි : ඊට පස්සේ අපි CID එකෙන් වාර්තාවක් කැඳෙව්වා සහරාන් ගැන inquiry කරනවද ඔයාලට මොනවද අනාවරණය වෙලා තියෙන කරුණු කියලා. එත් අපි කොළඹ ආවාට පස්සේ තමයි ස්වාමිනි කැඳෙව්වේ.

ප්‍ර : එතකොට තහවුරු වුණාද CID එකේ ඔත්තුකරුවෙකු කියලා මේ අන්සාර් කියන පුද්ගලයා?

පි : නෑ අපිට ඔත්තුකරුවෙක් කියලා වාර්තාවක් දුන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : දුන්නේ නෑ?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : එතකොට ඔබ හිතනවද ඒ අවස්ථාවේදී ඔබගේ පරීක්ෂණය වැළැක්වීම සඳහා ඔවුන්ගේ ඔත්තුකරුවෙකු මොහු කියලා ප්‍රකාශයක් කළාද කියලා?

පි : පරීක්ෂණය වැළැක්වීමට කියලා ස්වාමිනි මං හිතන්නේ නැහැ. නමුත් යම් කිසි අපි අර විමර්ශන කරනවට පොලිස් නිලධාරීන් අතර තිබෙන තරහයට මං හිතන්නේ ස්වාමිනි මොකක් හරි හේතුවක් හින්දා අපිට එතනින් ඉවත් වෙන්න කියන්න ඇති කියලා මම හිතනවා එක එක අංශ අතර පවතින තරහකාරීත්වය සහ එක් විමර්ශන අංශයක් කරන විමර්ශන අනික් විමර්ශන අංශ දැන ගැනීමට සම්බන්ධීකරණය ඒ දවස්වල ගොඩක් අඩුවෙලා තිබුණා ස්වාමිනි. අපි TID එකයි CID එකයි අතර එම දිනවල තිබුණු ප්‍රශ්නත් එක්ක. මං හිතනවා එම හින්දා ඒක තමයි ස්වාමිනි මට පැවසුවේ.

ප්‍ර : දැන් ඔබලාට අවසානය දක්වාම වාර්තා වුණේ නැතිනම් මේ CID එකට අයිති informer කෙනෙක් කියලා මේ ඔය අන්සාර් කියන පුද්ගලයා. ඒ පිළිබඳව ඉතින් ඔබලා බැලුවේ නැද්ද ඔබලාගේ පරීක්ෂකටයුතුත් දිගින් දිගටම කර ගෙන යෑමට සහරාන්ව අත්අඩංගුවට ගැනීම පිළිබඳව?

පි : ස්වාමිනි මේ විමර්ශනයට මං මැදිහත් වුණේ මේ අවස්ථාවේදී පමණයි. ඊට පස්සේ මේ Brach එකේ OIC හිටියේ CI පතිරණ

President's Secretary's Copy
LAW COMMENT BY JEZEEM

මහත්මයා. මං හිතන්නේ පතිරණ මහත්මයා නිලධාරීන්ට උපදෙස් දීලා මේ සම්බන්ධයෙන් සොයා බලන්න ඇති.

ප්‍ර : ඔබ ප්‍රකාශ කළා මෙම කොමිෂම හමුවේදී ඔබ අන්සාර් සමඟ කතා කරමින් ඉන්න අවස්ථාවේදී තමයි ඔබට බාධාව ඇති වුණේ කියලා මේකෙන් අයින් වෙන්න කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ අන්සාර් එක්ක මොනවද කතා කළේ?

පි : අපි ඇහුවා ස්වාමිනි ඒ කියන්නේ මගේ නිලධාරියා සියාබ්දීන් කියන මගේ මුස්ලිම් නිලධාරියා තමයි ප්‍රශ්න කළේ අන්සාර්ගෙන්. ඔහුට සිංහල භාෂාව කතා කිරීමට තරමක් අපහසු බව නිරීක්ෂණය වුණා. ඔහුගෙන් ප්‍රශ්න කරමින් සිටියා කවද්ද සහරාන් අන්තිමට ආවේ සහරාන් කොහේද ගියේ සහරාන්ගේ නංගිලා wife කෝ. Wife කොහේද ගියේ. එතකොට ගෙදර තව කාන්තාවක් හිටියා කිව්වා. ඒ කාන්තාව කවුද කියන තොරතුරු සම්බන්ධයෙන් අපි ප්‍රශ්න කරමින් සිටියා ඔහුගෙන්.

ප්‍ර : එතකොට මොනවද ලැබුණු පිළිතුරු ඔහුගෙන්?

පි : ඔහු කිව්වේ ස්වාමිනි මීට මාස එක හමාරකට පමණ පෙර සහරාන් ඇවිල්ලා ගියා. ගියාට පස්සේ ආයේ අද වෙනකල් ආවේ නෑ ඊට සතියකට විතර පස්සේ සහරාන්ගේ wife ත් නිවසින් පිටත්ව ගියා. ඉන් අනතුරුව මොවුන් කොහේ ගියාද කියලා දන්නේ නෑ කියලා ඒ කරුණු තමයි ස්වාමිනි කිව්වේ.

ප්‍ර : ඔබ Tropical inn බෝම්බ ප්‍රහාරය පිළිබඳවත් එම ස්ථානීය පරීක්ෂාවකට සම්බන්ධ වුණාද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ කියන්නේ බෝම්බ පිපිරීම අවසන් වූ අවස්ථාවේදී ද නැත්නම් ඊට පසුවද?

පි : මම ස්වාමිනි Tropical inn බෝම්බ ප්‍රහාරය සිදු වූ අවස්ථාවේ ඊට පැය එක හමාරක් වගේ ඇතුළත මගේ එවකට සිටි අධ්‍යක්ෂකතුමාගේ නියෝග හා උපදෙස් පරිදි වැඩිදුර විමර්ශන කටයුතු සඳහා එම ස්ථානයට පිටත්වෙලා ගියා. ගිහිල්ලා මම පැයක් වගේ ඇතුළත එම බෝම්බකරු සම්බන්ධයෙන් හඳුනා ගැනීමක් සිදු කළා මගේ විමර්ශනවලින් සහ ඉන් අනතුරුව ඔහුගේ බිරිඳ සහ සහෝදරයින් අත්අඩංගුවට ගැනීම සිදු කළා.

ප්‍ර : ඒ කියන්නේ ඔබලාගේ විමර්ශන ගොනුවල මෙම ජමීල් මොහොමඩ් කියන බෝම්බකරුවා පිළිබඳව පූර්ව තොරතුරු තිබුණා නේද?

පි : බෝම්බකරුවෙක් කියලා තොරතුරු තිබුණේ නෑ ස්වාමිනි මෙම අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් කියන පුද්ගලයා අන්තවාදයට නැඹුරුව කටයුතු කරන පුද්ගලයෙක් කියලා මීට පෙර අපිට

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

තොරතුරක් ලබලා දීලා තිබුණා. ඒ තොරතුර සම්බන්ධයෙන් විමර්ශන අංශ 02 මඟින් විමර්ශනයක් සිදු කරමින් පැවතුණා.

ප : ඔහුව කිසියම් අවස්ථාවක ඔබලාගේ අංශය විසින් කැඳවලා ප්‍රශ්න කිරීමක් කරලා තියෙනවද ජමීල් මොහොමඩ්ගෙන් ?

පි : මා දන්නා තරමින් ඔව් ස්වාමිනි.

ප : ඒ අනුවද ඔබ කියන්නේ ඔබලා ළඟ තොරතුරු තිබුණා කියලා ජමීල් මොහොමඩ් ගැන?

පි : ඔය ජමීල් මොහොමඩ් කියන පුද්ගලයා සම්බන්ධයෙන් සහ ඔහු පදිංචි වී සිටින ස්ථානය සහ ඔහුගේ බිරිඳගේ සහ දරුවන්ගේ තොරතුරු අපි ළඟ තිබුණා. ඊට අමතරව ස්වාමිනි මොහු මීට පෙරත් කැඳවීමක් කරලා මං හිතන්නේ ප්‍රකාශයක් ලබා ගෙන තිබුණා අපේ කොට්ඨාශයෙන්. ඒ තොරතුරු මත ජමීල් කියන පුද්ගලයාගේ සම්බන්ධ තොරතුරු අපේ Branch එකේ තිබුණා. ඊට අමතරව Tropical inn හෝටලයට ඔහු ලබා දුන්න Identity ය දීලා තිබුණා ඔහු Tropical inn හෝටලයේ නවාතැන් ගන්න අවස්ථාවේ. එම Identity යේ තොරතුරු සහ මාගේ අංශයේ මෙම කොට්ඨාශයේ තිබුණ විමර්ශන තොරතුරු සමඟ සසඳා බැලීමේදී ගැළපුන හින්දා තමයි මම අඳුර ගත්තේ මේ පුද්ගලයා අනිවාර්යෙන් අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් විය යුතුයි කියලා අපි සැකයක් ඇති කර ගත්තේ.

ප : දැන් ඔබට තොරතුරක් වාර්තා වුණාද ජමීල් මොහොමඩ් කියන පුද්ගලයා Tropical inn අවන්හලේදී බෝම්බය පුපුරවා ගෙන මිය ගිය අවස්ථාවේදී ඔහුගේ මළ සිරුර ආසන්නයේ Mobile Phone එකක සිම්කාඩ් පතක් තිබුණු බවට?

පි : මං හිතන්නේ ස්වාමිනි මට දැන් මේ අවස්ථාවේ නිශ්චිතවම ප්‍රකාශ කරන්න අමාරුයි. ඔහුගේ එම සිරුර ආසන්නයේ Mobile Phone 2 ක් හෝ 3 ක් දෙකක් වගේ මගේ මතකේ හැටියට සොයා ගැනීමක් අපරාධ ස්ථාන පරීක්ෂණ නිලධාරීන් සිදු කර තිබෙනවා.

ප : ඔබ ඇයි පවසන්නේ මේ ඔබගේ ප්‍රකාශයේදී ටාජ් සමුද්‍රා හෝටලයේදී ජමීල් මොහොමඩ් වයර් කෑලි දෙකක් අටවමින් කිසියම් දෙයක් කිරීමට උත්සාහ කරන බවට ඔබ නිරීක්ෂණය කළා කියලා මොකක්ද ඔබ CD එක බැලුවාම දැකපු දෙයක්ද ඔබ මේ කියන්නට උත්සාහ කරන්නේ?

පි : ස්වාමිනි මම මේ සම්බන්ධයෙන් විමර්ශන කරමින් යන අතරතුර අපිට තොරතුරු ලැබුණා අබ්දුල් ලතීෆ් ජමීල් මොහොමඩ් කියන පුද්ගලයා 2019/04/21 වන දින උදෑසන ටාජ් සමුද්‍රා හෝටලය තුළ රැඳී සිට ඉන් අනතුරුව Tropical inn හෝටලයට ගියා කියලා. ඒ අනුව මම මගේ නිලධාරීන් කණ්ඩායමක් සමඟ ටාජ් සමුද්‍රා හෝටලයට ගිහිල්ලා ඔහු මීට පෙර හෝටලයට පැමිණීම පිටවීම

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

නැවත හෝටලයට ඇතුල් වීම සම්බන්ධයෙන් CCTV දර්ශන ලබා ගෙන ඒවා එකින් එක නිරීක්ෂණය කළා. එහෙම නිරීක්ෂණය කරන කොට මට නිරීක්ෂණය වුණා එදින උදෑසන අට හමාරත් 08.38 ත් 08.40 ත් අතර වගේ කාල සීමාව තුළ මොහු පිටේ එල්ලා ගෙන යන බෑග් එකක් සමඟ මෙම ටාජ් සමුද්‍රා හෝටලයේ අවන්හලට පැමිණ අවන්හලේ එහා මෙහා ඇවිදිමින් සිට ඉන් අනතුරුව එක අසුනක වාඩි වෙනවා. වාඩි වෙලා මොහුගේ පිටේ එල්ලා ගෙන යන්න තිබුණ බෑග් එක ගන්නවා ඔහුගේ උකුළට. උකුළට අරන් ඔහු එම බෑග් එකේ තිබුණු වයර් කැබලි වැනි යම් කෑලි දෙකක් රැගෙන එය short කරන්න අපි එය එකිනෙක ගැටීමක් සිදු කරන දර්ශන නිරීක්ෂණය වුණා. ඒකෙන් මට තහවුරු වුණා යම් කිසි බෝම්බයක් වැනි යමක් මොහු මෙතන පුපුරවා හැරීමට වයර් කෑලි දෙක short කිරීම මඟින් උත්සහායක් දරන බවට.

ප්‍ර : ඔබට නිරීක්ෂණය වුණාද ජමීල් මොහොමඩ් ඔය ටාජ් සමුද්‍රා හෝටලයේ අවන්හල තුළ ඇවිදිමින් ගමන් කරන අවස්ථාවේදී ඔහුගේ බෝම්බය පුපුරවා ගැනීමට ඔබ ඔය කියන ආකාරයේ උත්සාහයක යෙදෙන බවට නිරීක්ෂණය වුණාද?

පි : ඇවිදිමින් සිටින අවස්ථාවේ නිරීක්ෂණය වුණේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබට නිරීක්ෂණය වුණාද ටාජ් සමුද්‍රා හෝටලයේ ඔය ජමීල් මොහොමඩ් කියන බෝම්බකරුවා මිනිසුන් කිසිවකුත් නැති හුදකලා ස්ථානයක සිට තමයි ඔය ඔබ කියන වයර් කැබලි දෙක එකට අතුල්ලමින් බෝම්බයක් පුපුරවා ගැනීමට වැනි උත්සාහයක් දරන්නේ කියන එක?

පි : නෑ ස්වාමිනි ඔහු එම ස්ථානයේ අසුන් ගෙන සිටින විට ආහාර ගැනීමට පැමිණි පුද්ගලයින් සහ ආහාර අනුභව කරමින් සිටි තවත් විදේශීය හා දේශීය පුද්ගලයින් එම අවට අසුන්වල ඇඳී ගෙන සිටියා.

ප්‍ර : ඔබ එහෙම දුටුවද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ළඟම හිටියා කියලා?

පි : ඔව් ස්වාමිනි.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ මේ කැකුණුගොල්ල නිවසට පෙබරවාරි 28 වෙනිදා 2019 ගිය වෙලාවේ දැන ගත්තද අන්සාර් කියන්නේ සහරාන්ගේ මස්සිනා කියන එක?

පි : ප්‍රශ්න කරන අවස්ථාවේ තමයි ස්වාමිනි දැන ගත්තේ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ප්‍රශ්න කරන අවස්ථාවේදී දැන ගත්තා. එතකොට ඔබ කිව්වනේ ඩයස් ඔබට කිව්වයින් පස්සේ එතනින් අයින් වෙන්න කියන එක ඔබ ත්‍රස්ත විමර්ශන ඒකකයේ ඔබගේ ජ්‍යෙෂ්ඨයින්ට දුරකථන ඇමතුම් ලබා දීලා මේ බව දැන්නුවා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අවස්ථාවේදී ඔබ ඔබගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට දැන්නුවාද මේ ඔත්තුකරුවෙක් වශයෙන් තියාගෙන ඉන්නේ සහරාන්ගේ මස්සිනා කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ කිව්වද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මතකයිද ඒක?

පි : ඔව් ස්වාමිනි.

ප්‍ර : කවුද ඔය ඒ තොරතුරු ලබා දුන් නිලධාරීන් දෙදෙනාගේ නම් මොකක්ද?

පි : ස්වාමිනි මගේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කේ.එන්.ඕ.පෙරේරා මහත්මයා මගේ අංශය අධීක්ෂණය කරපු සහකාර පොලිස් අධිකාරි සමන් පෙරේරා මහත්මයා.

ප්‍ර : ඒ දෙන්නට කිව්වා මේ අන්සාර් කියන්නේ සහරාන්ගේ මස්සිනා කියන බව?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ දැන්නුවායින් පස්සේ තමයි ඔබට කිව්වේ මේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් කියනවා නම් ඉවත් වෙන්න කියලා එතනින් ඉවත් වෙන්න කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනි සිටින උගත් නීතිඥවරියගෙන් අසයි.
අවශ්‍ය නොවන බව දන්වයි.
වැඩිදුරටත් ප්‍රශ්න කීපයක් ඇසීමට උගත් රජයේ අධිනීතිඥවරයා අවසර ඉල්ලයි.
අවසර ලබා දෙමි.

****

<u>රජයේ අධිනීතිඥ දිලන්ත එස්.කළුදුරුවගේ මහතා</u>

ප්‍ර : සාක්ෂිකරු මෙම කොමිෂන් සභාවේ ගරු සභාපති විනිසුරුතුමාගේ ප්‍රශ්නයකින්ම තවත් දිගුවකින් මා ප්‍රශ්නයක් අහන්නට කැමතියි ඔබෙන්. දැන් ඔබ කියා සිටියා ඔබ ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයට සම්බන්ධ වුණේ 2009 වර්ෂයේදී කියලා?

පි : 2010 වර්ෂයේදී ස්වාමිනි.

ප්‍ර : 2010 වර්ෂයේ?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : 2009 ස්වාමිනි.

ප්‍ර : 2009 වර්ෂයේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : මේ විමර්ශනය මේ අපි අද සාක්ෂි මෙහෙයවන විමර්ශනය සිදු කරන අවස්ථාව වෙන කොට ඔබ ත්‍රස්ත විමර්ශන කොටඨාශයේ අවුරුදු 10 ක පළපුරුද්දක් තිබෙන නිලධාරියෙක්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ අනුව දැන් ඔබට විමර්ශනයේදී අනාවරණය වුණේ ඩයස් කියන තැනැත්තෙක් ඔබට කතා කරලා කිව්වා අන්සාර් කියන තැනැත්තා ඔහුගේ පුද්ගලික ඔත්තුකරුවෙක් බව?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ වගේම අන්සාර්ගෙන් අනාවරණය වුණා ඔබට අන්සාර් කියන්නේ සහරාන්ගේ මස්සිනා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එහෙම නැන්තම් සහරාන්ගේ බිරිඳගේ සහෝදරයා බව? ඔබ අවුරුදු 10 ක් පළපුරුද්දක් තිබෙන විමර්ශන නිලධාරියෙක් හැටියට ඔබ විශ්වාස කළාද වරෙන්තුවක් මත සිටින අත්අඩංගුවට ගැනීමට නියමිතව සිටින අපරාධකාරයෙක් ගැන තොරතුරු සොයන්න ඔහුගේ ළඟම ඥාතීයෙක් තොරතුරුකරුවෙක් වශයෙන් පත් කර ගෙන තිබෙන අවස්ථාවක් ගැන ඔබ මීට පෙර ඔබේ විමර්ශන දිවියේදී අනාවරණය වෙලා තිබුණද?

පි : මගේ විමර්ශන දිවියේදි අනාවරණය වීමක් වෙලා නෑ ස්වාමිනි.

ප්‍ර : එම කාරණයක් විශ්වාස කරන්න පුළුවන්ද ඔබට?

පි : ඔව් ස්වාමිනි. සාමාන්‍යයෙන් සමහර අවස්ථාවල දැන් මස්සිනා කියන්නේ සමහර සහෝදරයේ අතර ගැටීම් තිබෙනවා. සමහර සහෝදර සහ ඥාති මිත්‍රාදීන් අතර ආරවුල් ඇති වෙනවා. එම අවස්ථාවල සමහර ඥාති මිත්‍රාදීනුත් තොරතුරු ලබා දෙනවා ඔවුන් සම්බන්ධයෙන්.

ප්‍ර : දැන් ඔබට ඔය ඩයස් කියන නිලධාරියා ඔහුව හඳුන්වා දෙමින් කතා කරන අවස්ථාවේදී ඩයස් කියන නිලධාරියා අනාවරණය කළාද ඔහු වැඩ කරන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කවර නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේද කියලා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඒ නිලධාරීන්ගේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඒ නිලධාරීන්ගේ නම් මේ ගරු කොමිෂන් සභාවට සඳහන් කරන්න පුවළුන්ද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : කියන්න?

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : විශේෂ විමර්ශන අංශ දෙකේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක මාරසිංහ මහතාත්, සහකාර පොලිස් අධිකාරි වික්‍රමසේකර මහතාත් යටතේ ඔහු රාජකාරී කරනවා කියලා මට පවසා සිටියා.

ප්‍ර : ඒ දුරකථන ඇමතුම ලබා දෙන අවස්ථාවේදී?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ සාක්ෂි දීලා ප්‍රකාශ කළා ඔය විමර්ශනය සම්බන්ධයෙන් පසු අවස්ථාවක ඔබ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් කැඳෙව්වයි කියලා?

පි : මම නෙවේ ස්වාමිනි මගේ ගොනුව අධීක්ෂණය කරපු .

ප්‍ර : ඔබගේ අංශය විසින් කැඳෙව්වා?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබට දැනීමක් තිබෙනවද එම වාර්තාවේ ඔය මොහොමඩ් සහරාන් සහ ඔහුගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කුමන කරුණුද අන්තර්ගත වෙලා තිබුණේ කියල?

පි : මාගේ මතකය හැටියට ස්වාමිනි මේ අවස්ථාවේදී මා ළඟ එම report එක නෑ. නමුත් මාගේ මතකේ හැටියට මට මතකයි එම report එකේ දාලා තිබුණා වනාතවිල්ලුව ලැක්ටෝවත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පුපුරන ද්‍රව්‍ය සොයා ගැනීමට සම්බන්ධ ප්‍රධාන සැකකරුවෙක් මොහොමඩ් කාෂිම් මොහොමඩ් සහරාන් කියන්නේ. එබැවින් ඔහු අත්අඩංගුවට ගැනීමට ඔවුන් විසින්ද විමර්ශන සිදු කරමින් පවතින බවට.

ප්‍ර : ඊට අමතරව සහරාන්ගේ අන්තවාදී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් යම් කිසි සඳහනක් එහි තිබුණා කියලා මතකයක් තිබෙනවද?

පි : මට නිශ්චිත මතකයක් නෑ ස්වාමිනි.

ප්‍ර : දැන් ඔබ කියපු ඔය වාර්තාවට ඔබ විසින් ඔබේ ආයතනය විසින් ඒ කියන්නේ ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාශය විසින් යම් කිසි පිළිතුරු වාර්තාවක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කළා කියලා ඔබට දැනීමක් තිබෙනවද?

පි : ඒ සම්බන්ධයෙන් මා නිශ්චිතව දන්නේ නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබට දැනුමත් තිබෙනවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඔබේ ආයතනය විසින් වාර්තාවක් කැඳවා ගැනීමෙන් අනතුරුව එම වාර්තාවේ සඳහන් වෙච්ච කරුණු සම්බන්ධයෙන් ඔබ ආයතනයේ ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාශය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පිළිතුරු වාර්තාවක් යවා තිබෙනවද යන කාරණය සම්බන්ධයෙන් ඔබට දැනුමක් තිබෙනවද?

පි : මම ස්වාමිනි මේ ගොනුවට අදාළ විමර්ශන සිදු කරපු නොමැති හෙයින් මට ඒ සම්බන්ධයෙන් ඉන් අනතුරුව පිළිතුරු වාර්තාවක් යැව්වද කියලා මේ අවස්ථාවේදී නිශ්චිතවම මතකයක් නෑ ස්වාමිනි.

Proofreader's Copy
LAW COMMENT BY JEZEEM

****

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා</u>

ප්‍ර : ඔබට ඒ වාර්තාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කැඳවපු වාර්තාව මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : අද දිනයේම වුනත්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : දෙවැන්න එයට පිළිතුරු වාර්තාවක් සපයා දී තිබේ නම් එයත් ඔබට අද දින ඉදිරිපත් කිරීමේ හැකියාවක් තිබෙනවද?

පි : පිළිතුරු වාර්තා යොමු කර තිබෙනවා නම් පුළුවන් ස්වාමිනි.

ප්‍ර : ඔබ කියා සිටියා උප පොලිස් පරීක්ෂක ඩයස් ඔබට දැන්නුවා කියලා ඉහළ නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධයෙන්?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම නිලධාරීන් දෙදෙනා මෙම අන්සාර් කියන තැනැත්තාව තොරතුරුකරුවෙක් වශයෙන් පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඔවුන් අවබෝධයෙන් සිටි බව කියා සිටියාද?

පි : මම විමසීමක් සිදු කළේ නෑ ස්වාමිනි.

ප්‍ර : කුමක්ද ඔහු ප්‍රකාශ කළේ මෙම පොලිස් පරීක්ෂක මාරසිංහ සහ සහකාර පොලිස් අධිකාරි වික්‍රමසේකර සම්බන්ධයෙන්?

පි : එහෙමයි ස්වාමිනි. ඔහු පවසා සිටියේ මෙම සහරාන් සම්බන්ධයෙන් කරන විමර්ශන කටයුතු විශේෂ විමර්ශන අංශ දෙකේ ස්ථානාධිපති පො.ප.මාරසිංහ මහතාගේ උපදෙස් සහ නියෝග මතත් ASP වික්‍රමසිංහ මහත්මයාගේ උපදෙස් හා නියෝග මතත් සිදු කරන බව තමයි මට පවසා සිටියේ ස්වාමිනි.

ප්‍ර : වික්‍රමසිංහද වික්‍රමසේකරද?

පි : වික්‍රමසේකර ස්වාමිනි.

ප්‍ර : ඔබ එම උප පොලිස් පරීක්ෂක ඩයස් පවසපු එම තොරතුර ඒ අවස්ථාවේදී තහවුරු කර ගැනීමට ඔබ යම් පියවරක් ගත්තද?

පි : නෑ ස්වාමිනි.

ප්‍ර : ඔබ ගත්තේ නෑ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ ඔබේ ඉහළ නිලධාරීන්ට දැන්නුවාට පසුව අර withdraw

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එතනින් නික්ම යන්න කියලද ඔබට උපදෙස ලැබුණේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : ඔබ කියා සිටියා දැන් ලේඛනයක් ඉදිරිපත් කරනවා. තවත් ලේඛනයක් තිබෙනවා නම් ඉදිරිපත් කරන බව?

පි : එහෙමයි ස්වාමිනි.

FAIR COMMENT BY JEZEEM

President's Secretary's Copy

ප්‍ර : ඊට අමතරව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් කැඳවීමට TID එක ක්‍රියා කළා කියලා ඔබ කිව්වනේ?

පි : එහෙමයි ස්වාමිනි.

ප්‍ර : එම වාර්තාව කැඳවීමේ ඉල්ලීම ලිඛිත ඉල්ලීමත් ඔබට මෙම ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබේද පරීක්ෂා කර බලා?

පි : මම පරීක්ෂා කර බලා ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබෙනවා ස්වාමිනි.

මේ අවස්ථාවේදී දිවා ආහාරයෙන් පසුව එකී ලේඛන පරීක්ෂා කර බලා ඉදිරිපත් කිරීමේ හැකියාව සහ තිබේ නම් ඉදිරිපත් කිරීමට අවසර ඉල්ලා සිටිනවා ගරු කොමිෂන් සභාවෙන්.

****

<u>ගරු විනිසුරු සභාපති ජනක් ද සිල්වා මැතිතුමා</u>

කොමිෂන් සභාවේ කටයුතු දිවා ආහාරය සඳහා පස්වරු 01.00 පසු වී විනාඩි 30 තෙක් කල් තබනවා.

දැන් වේලාව : ප.ව.12.35 යි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

වේලාව: ප.ව.01.45
පෙර සටහන්: මුතුමාලි මෙනවිය.
මෙතැන් සිට: සචිනි මෙනවිය.

විවේකයෙන් පසුව කොමිෂන් සභාව නැවත රැස්වේ.
නම: හොරන්ගල දිසානායකගේ ගයාන් දිලන්ක රත්නායක.
නැවත ප්‍රතිඥා දෙයි.

<u>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සංජීව දිසානායක මහතා.</u>

ප්‍ර: සාක්ෂිකරු ඔබ කියා සිටියා මෙම සහරාන් කියන පුද්ගලයා සම්බන්ධයෙන් ඔබ වරෙන්තුව ක්‍රියාත්මක කිරීමට ගොස් ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උප පොලිස් පරීක්ෂක ඩයස්ගේ ඉල්ලීම මත ඒ සම්බන්ධයෙන් ක්‍රියාකිරීම නතරකර නැවත පැමිණි බව?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඉන් අනතුරුව ඔබගේ කොට්ඨාශය විසින් මෙම සහරාන් සම්බන්ධයෙන් පවත්වනු ලබන විමර්ශනයක් පවත්වන්නේ ද නැද්ද යන්න සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව විමසූ බව?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔබ ප්‍රථමයෙන් කියන්න ඔබ කවද්ද මෙම සහරාන් විවෘත වරෙන්තුව අනුව අත්අඩංගුවට ගැනීම සඳහා කැකුණුගොල්ලට ගියේ කියලා?

උ: ස්වාමිනි 2019/02/28

ප්‍ර: මා සාක්ෂිකරුට ලේඛනයක් පෙන්වා සිටිනවා මේ අවස්ථාවේ දී. පරීක්ෂා කර බලන්න. මෙම ලේඛනය ඔබට හඳුනා ගැනීමට හැකියාවක් තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එය ඡායාස්ථිතික පිටපතක්?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: එම ලේඛනය යම් තැනැත්තෙකු විසින් අත්සන් කරලා තියනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: කවුරු විසින් ද?

උ: එවකට අප කොට්ඨාශයේ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කළ වර්තමානයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජගත් නිශාන්ත මහතා.

ප්‍ර: ඔබ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශයේ වැඩබලන අධ්‍යක්ෂක වශයෙන් සිටි ජගත් නිශාන්ත මහතා. ඔය ලේඛනයේ දිනය කවද්ද?

උ: ස්වාමිනි 2019.03.16.

ප්‍ර: ඒ කියන්නේ ඔබ අර කැකුණුගොල්ලට ගිහිල්ලා සති දෙකක් පසු වෙච්ච දිනයක්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මේ ලේඛනය කා වෙත ආමන්ත්‍රණය කරලා තියෙන ලේඛනයක් ද?

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

උ: අධ්‍යක්ෂ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ස්වාමීනි.

ප්‍ර: ඔබ ජගත් නිශාන්ත මහතාගේ අත්සන හඳුනනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: හොඳට?

උ: එහෙමයි ස්වාමීනි.

මේ අවස්ථාවේ දී එකි ඡායාස්ථ පිටපත C 1002 ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.

ප්‍ර: මෙම C 1002 ලේඛනය කුමන කරුණක් අරඹයාද යොමු කරලා තියෙන්නේ කියලා එහි ශීර්ෂයේ සඳහන් වන්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකද්ද?

උ: විස්තර වාර්තාවක් ලබාගැනීම සඳහා කියලා.

ප්‍ර: ඔබ මේ C 1002 කියවලා බලලා මෙම ගරු සභාවට දන්වන්න C 1002 මගින් ඔබගේ කොට්ඨාශය ඒ කියන්නේ ත්‍රස්තවාදී විමර්ශන කොට්ඨාශය තොරතුරු ඉල්ලලා තියෙන්නේ කුමන කරුණක් ගැනද කියලා?

උ: ස්වාමීනි මෙම ලේඛනයේ සඳහන් කරලා තියෙන්නේ ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශය මගින් ISIS සංවිධානයට පක්ෂපාති ඡායාරූප සහ වීඩියෝ පට අන්තර් ජාලය හා සමාජ ජාලා ගිණුම් මගින් ප්‍රදර්ශනය කරන පුද්ගලයෙකු වන මොහොමඩ් කාසීන් මොහොමඩ් සහරාන් නැමැති පුද්ගලයා සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකරනවා.

ප්‍ර: එසේම ඔහු ජාතිවාදී අදහස් පතුරවනවා කියලා සඳහන් කරලා තියෙනවා ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙම C 1002 හි මෙම පුද්ගලයාගේ සහරාන්ගේ සම්පූර්ණ නම ස්ථිර ලිපිනය , තාවකාලික ලිපනය සහ බිරිඳගේ ලිපිනයන් සඳහන් කරලා තිබෙනවා ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එසේම ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකයයි විදේශ ගමන් බලපත්‍ර අංකයත් මේ C 1002 හි සඳහන් කරලා තිබෙනවා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙම ලේඛනයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඔබගේ කොට්ඨාශය දන්වලා තිබෙනව ද සහරාන් කියන පුද්ගලයාට එරෙහිව ඔබලාගේ කොට්ඨාශය විසින් කොළඹ ම.ඵ. 92358/18 යටතේ විවෘත වරෙන්තුවක් ලබාගෙන තියෙනවා කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මේ C 1002 න් කුමක්ද ඔබලා ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂකවරයා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාගෙන් විමසලා තියෙන්නේ?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ස්වාමීනි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් මෙම මොහොමඩ් කාසීන් මොහොමඩ් සහරාන් සම්බන්ධයෙන් විමර්ශන සිදු කරනව නම් ඒ සම්බන්ධයෙන් එම සිදු කරන විමර්ශන සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් අප වෙත ලබාදෙන ලෙස දන්වා තිබෙන්නේ.

ප්‍ර: ඔබට දැන් දැනීමක් තිබෙනව ද මෙම C 1002 ලේඛනයට පිළිතුරක් වශයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් යම් ලිපියක් ඔබගේ කොට්ඨාශයට එවන්නට යෙදුණ ද කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එම ලේඛනය ඔබට ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට පුළුවන් ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එකී ලේඛනයේ දිනය කවද්ද?

උ: ස්වාමීනි 2019.03.28

ප්‍ර: කවුරු විසින් ද එය අත්සන් කරලා තියෙන්නේ ?

උ: අධ්‍යක්ෂ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙනුවට නිහාල් ජයතිලක සහකාර පොලිස් අධිකාරී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.

ප්‍ර: එහි මාතෘකාවක් සඳහන් වෙලා තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකද්ද මාතෘකාව?

උ: ලේඛන පරීක්ෂාකර වාර්තාවක් ලබාගැනීම සඳහා යනුවෙන් සඳහන් කරලා තියෙනවා.

ප්‍ර: එහි මේ ඔබගේ අධ්‍යක්ෂකවරයා වෙතද ආමන්ත්‍රණය කරලා තිබෙන්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ඔවුන් විසින් මෙම සහරාන් කියන තැනැත්තා සම්බන්ධයෙන් පවත්වනු ලබන විමර්ශනය ගැන යම් තොරතුරු හෝ තොරතුරක් ඉදිරිපත් කරලා තියෙනවද ?

උ: එහෙමයි ස්වාමීනි.

මෙම ලේඛනය මා C 1003 ලෙස ලකුණු කර ඉදිරිපත්කර සිටිනවා.

ප්‍ර: මෙම C 1003 මඟින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ත්‍රස්ත මර්ධන විමර්ශන කොට්ඨාශය වෙත කුමක්ද දන්වලා තියෙන්නේ ?

උ: එම තොරතුරේ සඳහන් කරලා තියෙනවා ස්වාමීනි මොහොමඩ් කාසීන් මොහොමඩ් සහරාන් නැමති පුද්ගලයා මුස්ලිම් අන්තවාදී අදහස් දරමින් දේශන පවත්වා සංවිධානාත්මකව පුද්ගලයින් එක්රැස් කරන පුද්ගලයෙකු බවත් මාවනැල්ලේ බුදු පිළිම කැඩීමේ සිදුවීමට සම්බන්ධ සැකකරුවන් මෙහෙයවා ඇති බවත් පුත්තලම ලැට්ටෝවත්ත නැමති පොල් ඉඩමේ අවිආයුධ සඟවා තැබීමේ සිද්ධීන්වලට සම්බන්ධ බවත් මොහු විසින් පුද්ගලයින් වෙත පුපුරන ද්‍රව්‍ය හා අවිආයුධ පරිහරණය කිරීම පිළිබඳව පුහුණු කිරීමට කඳවුරක් පවත්වා ගෙන යාමට සැලසුම්කර තිබී ඇති බවත් එම දෙපාර්තමේන්තුව වෙත අනාවරණ වී ඇති බවත් ඉහත කරුණු මත

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

මෙම සහරාන් යන සැකකරු අත්අඩංගුවට ගැනීමට වැඩි දුර විමර්ශන පවත්වමින් සිටින බව.

ප්‍ර: දැන් සාක්ෂිකරු කෙසේ වෙතත් මෙම සහරාන් පුද්ගලයා අත්අඩංගුවට ගැනීමට ඔබ ගිය 2019/02/28 දින සිද්ධිය සම්බන්ධයෙන් C 1002 කියන ඔබගේ කොට්ඨාශයේ වැඩ බලන අධ්‍යක්ෂකවරයා විසින් යොමු කරන ලද ලිපියේ කිසිවක් සඳහන් වෙන්නේ නැහැ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වගේම ඔබ ඉදිරිපත් කරන්නට යෙදුණු C 1003 කියන ලේඛනයේ සහරාන්ගේ බිරිඳගේ සහෝදරයා ඔත්තුකරුවෙකු වශයෙන් පාවිච්චි කරන බවක් සඳහන් වෙන්නෙත් නැහැ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහි එම C 1003 කියන ලේඛනයේ 2019.02.28 වන දින ඔබ සහ උප පොලිස් පරීක්ෂක ඩයස් අතර සිදු වූ දුරකථන සංවාදය ගැනවත් කිසිවක් සඳහන් වෙනව ද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: සඳහන් වන්නේ නෑ මෙම C 1003 ඔබගේ ත්‍රස්ත මර්ධන විමර්ශන කොට්ඨාශයට ලැබුණට පසුව ඒ සම්බන්ධයෙන් යම් ඉදිරි පියවරක් එහෙම නැත්නම් ඒ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් ඔබලා විසින් සිදු කරාද නැද්ද කියන්න ඔබට දැනුමක් තියෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මොකද්ද?

උ: මා දන්නා තරමින් මේ විමර්ශනය සිදු කරන නිලධාරීයා මෙම මොහොමඩ් කාසීන් මොහොමඩ් සහරාන්ගේ සහ මස්සිනා වන අන්සාර් යන පුද්ගලයා අප කොට්ඨාශයට කැඳවා ප්‍රශ්න කර ප්‍රකාශ ලබාගැනීමට ගොනු මගින් අවසර ඉල්ලා තිබුණා.

ප්‍ර: සමාවෙන්න.

උ: මෙම සහරාන්ගේ මස්සිනා වන අබ්දුල් කාදර් මොහොමඩ් අන්සාර් යන පුද්ගලයා අපේ කොට්ඨාශයට කැඳවා ඔහුගෙන් ප්‍රශ්න කිරීමට අවසරය ඉල්ලා තිබුණා.

ප්‍ර: කවුරු විසින් ද නයනප්‍රිය?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ලිඛිතව කරපු ඉල්ලීමක් ද නැද්ද කියන්න ඔබට දැනීමක් තියෙනව ද?

උ: එහෙමයි ස්වාමිනි. ලිඛිතව ඉල්ලා තිබෙනවා ගොනුව මඟින්.

ප්‍ර: කෙසේ වෙතත් එම ලිඛිත ඉල්ලීමට ලැබුණු ප්‍රතිචාරය සම්බන්ධයෙන් ඔබට අවබෝධයක් තිබෙනව ද?

උ: මා දන්නා තරමින් ස්වාමීනි බෝම්බ ප්‍රහාරයට පෙර ඔහු කැඳවා ප්‍රකාශ ලබා ගැනීමට නොහැකි වුණා.

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: දැන් මෙම ප්‍රකාශ ලබා ගැනීම සඳහා වන ඉල්ලීම කවුරු විසින් කා වෙතද යොමු කර තිබ්බේ?

උ: මා දන්නා තරමින් ස්වාමීනි විමර්ශන මොනද මං මේ ගොනුවට අදාළ මං විමර්ශන සිදු කළේ මේ සැකකරු අත්අඩංගුවට ගැනිමට යාමට පමණයි. ඊට අමතර යමක් විමර්ශනයක් මා විසින් සිදු කළේ නැහැ.

ප්‍ර: ඔබගේ දැනීමේ හැටියට?

උ: විමර්ශන නිලධාරියා ස්වාමීනි ස්ථානාධිපති විමර්ශන අංශ 02 මඟින් ASP සහකාර පොලිස් අධිකාරී මගින් අධ්‍යක්ෂකට මා දන්නා තරමින් යොමු කර තිබෙනවා.

ප්‍ර: අධ්‍යක්ෂකවරයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මේ සඳහා අවසර පැතීමක් හෝ මේ සඳහා ඉල්ලීමක් සිදුකරාද නැද්ද කියන්න ඔබට අවබෝධයක් තියෙනව ද?

උ: මේ අවස්ථාවේ දි නැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ වන විට කවුද TID එකේ අධ්‍යක්ෂක වශයෙන් සිටියේ?

උ: මට මතකයේ හැටියට ස්වාමීනි වැඩබලන අධ්‍යක්ෂක වශයෙන් හිටියේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජගත් නිශාන්ත මහත්මයා. ඊට පස්සේ අධ්‍යක්ෂකවරයෙක් වශයෙන් ආවා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වරුණ ජයසුන්දර මහත්මයා නමුත් මට නිශ්චිතවම මතක නැහැ වරුණ ජයසුන්දර මහත්මයා ද.

ප්‍ර: ඔබට කීමට හැකියාවක් තිබෙනව ද මෙම ඉල්ලිම සිදු කළේ 2019.03.16 දරණ C1002 දරණ ඉල්ලීමෙන් පසුව ද ඊට පෙරද කියන්නේ?

උ: මට ස්වාමීනි ගොනුව පරික්ෂා කරලා තමයි උත්තර දෙන්න වෙන්නේ ස්වාමීනි. එම ලිපිය ලැබීමට පෙර ස්වාමීනි. 2019/03/06

ප්‍ර: ලිපිය ලැබීමට පෙර?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබ කියා සිටියා 2019/03/06 වෙනි දින තමයි මෙම ඉල්ලීම සිදුකර තිබෙන්නේ කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එය ලිඛිතව සිදුකර තිබෙන්නේ කියලත් ඔබ කිව්වා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: කවුරු විසින් කා වෙත ද එය ලිඛිතව ඉදිරිපත් කර තිබෙන්නේ?

උ: මෙම ඉල්ලීම ස්වාමීනි මුල්ම විමර්ශන නිලධාරියා වන පො.කො. 83856 නයනප්‍රිය නිලධාරියාත් විමර්ශන අංශයේ ස්ථාන අංශ 02 හි ස්ථානාධිපති වෙත ඉල්ලීම් කරනවා. ඒ අනුව විමර්ශන අංශ 02 හි ස්ථානධිපති වශයෙන් එවකට සිටිලා තියෙන්නේ මම. මම එය අනුමත කරලා එවකට මගේ අංශය අධීක්ෂණය කරනු ලබන සහකාර පොලිස් අධිකාරීතුමා වෙත මෙම ඉල්ලීම ඉදිරිපත් කරනවා.

Register Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඔබ කියා සිටියා පොලිස් කොස්තාපල් නයනප්‍රිය විසින් මෙම ඉල්ලීම සිදු කළ බව?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එය සිදුකරපු දිනය කවද්ද?

උ: 2019.03.06 ස්වාමීනි.

ප්‍ර: 2019.03.06 පොලිස් කොස්තාපල් නයනප්‍රිය විසින් කරන ලද ලිඛිත ඉල්ලීම විමර්ශන අංශ 02 ක භාර සහකාර පොලිස් අධිකාරිවරයා වෙත ඉදිරිපත් කර තිබෙන්නේ ඔබ විසින් කියලා ඔබ කිව්වා ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කවද්ද?

උ: මම අත්සන් කරලා තියෙනවා ස්වාමීනි 2019.03.06. මෙය සහකාර පොලිස් අධිකාරීතුමාගේ කාර්යාලයට ගිහිල්ලා තියෙනවා 2019.03.07.

ප්‍ර: මෙම ලේඛන දෙකෙහිම ඔබ කියා සිටින ලේඛන දෙකෙහිම සඳහන් වෙනවද කැකුණුගොල්ලට ත්‍රස්ත මර්ධන විමර්ශන කොට්ඨාශයේ නිලධාරීන් ගිය පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශකයන් සමඟ සිදු වූ සංවාදය සහ ඒ අනුව ඔබලා ඒ ස්ථානයෙන් වැඩිදුර විමර්ශනය නොකර පිටත් වීම සම්බන්ධව?

උ: එහෙමයි ස්වාමීනි.

මේ අවස්ථාවේ දී පොලිස් කොස්තාපල් 83856 නයනප්‍රිය නිලධාරියා විසින් විමර්ශන අංශ දෙකෙහි ස්ථානාධිපති වන මෙම සාක්ෂිකරු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම C1004 ලෙස ද එම ඉල්ලීම මත T 03 සහකාර පොලිස් අධිකාරීවරයා වෙත සාක්ෂිකරු විසින් කරන ලද ඉල්ලීම C 1004 A ලෙසද ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.

ප්‍ර: ඔබගේ ඉල්ලීම පරිදි ඒ කියන්නේ C 1004 A වලට කරන ලද ඉල්ලීම පරිදි සහකාර පොලිස් අධිකාරීවරයා විසින් අධ්‍යක්ෂක ත්‍රස්ත මර්ධන විමර්ශන කොට්ඨාශය වෙත ලිඛිත ඉල්ලීමක් කරලා තියෙනව ද?

උ: ස්වාමීනි සහකාර පොලිස් අධිකාරීතුමා විසින් අධ්‍යක්ෂතුමා වෙත යොමු කර තිබූ වාර්තාවේ අප විසින් කර තිබූ ඉල්ලීම සඳහන් වෙලා නැහැ. එහි අවසානයේ සහකාර පොලිස් අධිකාරීතුමා දක්වා ඇත්තේ මොහොමඩ් කාසීන් මොහොමඩ් සහරාන් යන අයගේ බිරිඳගේ හැදුනුම්පතට අදාළ සහ බිරිඳගේ සහෝදරයෙකු වන මොහොමඩ් අබ්දුල් කාදර් මොහොමඩ් අන්සාර් යන අයගේ අංක 0788352481 දරණ දුරකථන අංකයට අදාළ වැඩිදුර විස්තර වාර්තා ලබාගෙන ඉදිරි විමර්ශන සිදුකිරීම සම්බන්ධයෙන් සඳහන් කර තිබෙන්නේ.

එකී සහකාර පොලිස් අධිකාරීවරයා විසින් අධ්‍යක්ෂක ත්‍රස්ත මර්ධන විමර්ශන කොට්ඨාශය වෙත C 1004 A අනුව කරන ලද ඉල්ලීම C 1004 B ලෙස ලකුණු කර ඉදිරිපත් කරනවා.

ප්‍ර: මෙම C 1004 B කියන ලේඛනයේ දිනය කවද්ද?

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

උ: ස්වාමීනි සහකාර පොලිස් අධිකාරීතුමා අත්සන් කරලා තියෙන දිනය 2019.03.11.

ප්‍ර: මෙම C 1004 B කියන ලේඛනයෙහි ඔබ විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු C 1004 A දරණ ඉල්ලීම සහිත වාර්තාව ගැන සඳහන් වෙනව ද?

උ: නැත ස්වාමීනි. මගේ වාර්තාව සඳහන් කරලා නැහැ පිටු අංක ස්වාමීනි. ස්වාමීනි සහකාර පොලිස් අධිකාරීතුමාගේ වාර්තාවේ මා විසින් සඳහන් කර තිබූ වාර්තාවේ පිටු අංක සඳහන් කරලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා කියලා පිටු අංක සඳහන් කර තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: මෙම C 1004 B කියන සහකාර පොලිස් අධිකාරීවරයා විසින් යොමු කරන ලද ලේඛනයේ ප්‍රකාශයක් සටහන් කිරීමේ අන්සාර් යන පුද්ගලයාගේ ප්‍රකාශයක් සටහන් කිරීමේ තිබෙන අවශ්‍යතාවය ගැන සඳහනක් වෙනව ද?

උ: සහකාර පොලිස් අධිකාරීතුමා අධ්‍යක්ෂකතුමා වෙත යොමු කරන ලද වාර්තාවේ ඒ සම්බන්ධව සඳහනක් කරලා නැහැ ස්වාමීනි. නමුත් අර මා විසින් යොමු කරන ලද ස්ථානාධිපති විමර්ශන 02 ක විසින් යොමු කරපු පිටු අංක 132 ඉදලා 134 වාර්තාව ඔබගේ කාරුණික අවධානය සඳහා යොමු කරමි වශයෙන් සඳහන් කරලා තිබෙනවා.

ප්‍ර: දැන් මෙම C 1004 B කියන වාර්තාව අවසානයට සඳහන් වන්නේ ඔබ පෙර කී ලෙස දුරකථන වාර්තා ලබාගැනීම සම්බන්ධයෙන් පමණක් ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ අනුව මෙම C 1004 B මත පිහිටා අධ්‍යක්ෂක ත්‍රස්ත මර්ධන විමර්ශන කොට්ඨාශය විසින් කිසියම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ වෙන යම් හෝ ආයතනයකට වාර්තාවක් හෝ ඉල්ලීමක් ඉදිරිපත් කරලා තියෙනව ද?

උ: ඒ සම්බන්ධයෙන් මා නිශ්චිතවම ප්‍රකාශ කරන්න බැහැ ස්වාමීනි.

ප්‍ර: ඒ සම්බන්ධයෙන් කිසියම් ලේඛනයක් ඔබගේ ගොනුවේ තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි. මෙම වාර්තාව සහකාර පොලිස් අධිකාරීතුමා අධ්‍යක්ෂකතුමා වෙත යොමු කරපු වාර්තාව අධ්‍යක්ෂකතුමා වැඩිදුරටත් එවකට හිටපු පොලිස්පතිතුමා වෙත යොමු කර තිබෙනවා.

ප්‍ර: කවුද ඒ පොලිස්පතිතුමා?

උ: පූජිත් ජයසුන්දර මහතා පොලිස්පතිතුමා පොලිස් මූලස්ථානය වශයෙන් ලිපිය address කරලා තිබෙනවා.

ප්‍ර: දිනය?

උ: 2019.03.15

ප්‍ර: 2019.03.15 දින දරණ අධ්‍යක්ෂකවරයගේ ලිපියේ මාතෘකාව කුමක්ද?

උ: ඉස්ලාම් අන්තවාදී සංවිධානයේ ක්‍රියාකලාපය සම්බන්ධව.
එකී ලේඛනය C 1004 C ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා.

ප්‍ර: මෙම C 1004 C කියන ලේඛනය මා ඔබට කියා සිටියොත් එය සහරාන් කියන පුද්ගලයා සහ ජාතික තවුහිද් ජමාත් කියන ඒ සංවිධානයේ

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ක්‍රියාකාරකම් එසේම මාවනැල්ලේ සිද්ධිය සම්බන්ධව විස්තර ඇතුළත් ප්‍රගති වාර්තාවක් වශයෙන් ද ඉදිරිපත් වෙලා තියෙන්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එහි ඉල්ලීමක් සිදු කිරීමක් වෙලා තියෙනව ද?

උ: ඉල්ලීමක් සිදු කර නැහැ ස්වාමීනි. මේ දක්වා සිදුකළ විමර්ශන සම්බන්ධයෙනුත් ඉදිරියටත් මෙම දුරකථන අංක ලබාගෙන ඉදිරි විමර්ශන සිදු කරන බවත් දන්වා තිබෙනවා.

ප්‍ර: මෙම C 1004 C කියන ලේඛනයේ ඒ කියන්නේ ත්‍රස්ත මර්ධන විමර්ශන කොට්ඨාශය අධ්‍යක්ෂක විසින් පොලිස්පති වෙත යොමු කරන ලද ලේඛනයේ හි 2019.02.28 ඔබ ඇතුළු නිලධාරී කණ්ඩායම කැකුණුගොල්ල ප්‍රදේශයට යෑම සම්බන්ධයෙන් සඳහන් වෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කැකුණුගොල්ලට ඔබ නිලධාරී කණ්ඩායම ගියාට පසුව සිදුවූ දේ සම්බන්ධයෙන් එහෙම නැත්නම් කුමක්ද අධ්‍යක්ෂකවරයාගේ නිරීක්ෂණ සටහන් කරලා තියෙනව ද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: කුමක්ද සඳහන් වෙන්නේ කැකුණුගොල්ලට ගියපු ගමන ගැන?

උ: මම මොහොමඩ් කාසීන් මොහොමඩ් සහරාන් යන අය සම්බන්ධයෙන් ලබාගෙන ඇති වරෙන්තුව ක්‍රියාත්මක කිරීම සඳහා 2019.02.28 වන දින නාරම්වල කැකුණුගොල්ල ප්‍රදේශයටත් නිලධාරීන් කණ්ඩායමක් යොමු කරන ලද අතර එහිදි පහත කරුණු අනාවරණය වී ඇත. මොහුගේ බිරිඳ වන අබ්දුල් කාදල් ෆාතිමා හාදියා යන අය හා දරුවන් දෙදෙනා බිරිඳගේ පියාට අයත් අංක 383 න් 03 කැකුණුගොල්ල ලිපිනයේ 2017 වර්ෂයේ සිට 2019.02.19 වන දින දක්වා පදිංචිව සිට ඇති බවත් සහරාන් යන අය 2018 වර්ෂයේ අගභාගය දිනක මෙම නිවසට පැමිණ ඇති බවටත් මොහුගේ බිරිඳ හා දරුවන් එම නිවසින් පලාගොස් ඇති බවටත් කරුණු අනාවරණය වී ඇති අතර මොවුන් දැනට සිටින ස්ථානය පිළිබඳව අනාවරණය කරගැනීමට නොහැකි වී ඇත.

ප්‍ර: ඒ වගේම මෙම C 1004 C දරණ ලේඛනයේ සඳහන් වෙනව ද සහරාන්ගේ බිරිඳගේ සහෝදරයා වන අන්සාර් ගැන යම් කරුණක්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: කුමක්ද සඳහන් වෙන්නේ?

උ: මෙම ලේඛනයේ සඳහන් වෙනවා ස්වාමීනි මෙම සහරාන් යන අය 2018 වර්ෂයේ දෙසැම්බර් මාසයේ මාවනැල්ල සහ පොතුහැර ප්‍රදේශවල බුදුපිළිම කැඩීමේ සිද්ධියට අදාළව සහ පුත්තලම වනාතවිල්ලුව ප්‍රදේශයෙන් සොයාගන්නා ලද පුපුරන ද්‍රව්‍යය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද විමර්ශනයේ දී පුපුරන ද්‍රව්‍යය ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගන්නා ලද වැන් රථය මේ වන විට වෙනත්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පුද්ගලයෙක්ට විකුණා ඇති බවටත් එම ගනුදෙනුවේත් තැරැවුකාරයෙකු වශයෙන් සහරාන්ගේ බිරිඳගේ සහෝදරයා වන මොහොමඩ් කාදර් මොහොමඩ් අන්සාර් යන අය කටයුතු කර ඇති බවටත් එම සිද්ධිය ප්‍රධාන සැකකරු මොහොමඩ් කාසීන් මොහොමඩ් සහරාන් යන බවටත් අනාවරණය වී ඇත. තවද මෙම මොහොමඩ් කාදර් මොහොමඩ් අන්සාර් යන අයගේ දුරකථන අංකය 07883352481 බවට හඳුනාගෙන ඇති අතර එම අංකයට අදාළ දුරකථන වාර්තා ලබා ගැනීමට ලිපි යොමු කර ඇත. අවසාන වශයෙන් සඳහන් කර තිබෙනවා.

ප්‍ර: එපමණයි?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙම C 1004 C කියන ලේඛනයට යම් සම්බන්ධයෙන් පොලිස්පතිතුමා යම් පිළිතුරක් ලබා දීලා තිබෙනව ද?

උ: Further report වශයෙන් සඳහන් කර ලිත් දිනයක් යොදා තිබෙනවා ස්වාමීනි.

ප්‍ර: Further report වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරන්න කවද්ද එහි දිනය?

උ: 2019.04.15. ස්වාමීනි අත්සන් කර තිබෙන්නේ 2019.03.18 පොලිස්පතිතුමා විසින් අත්සන් කර තිබෙන්නේ 2019.03.18 ලිත් දිනය වශයෙන් ලබාදී තිබෙනවා 2019.04.15.

මේ අවස්ථාවේ දී පොලිස්පතිවරයා විසින් වැඩිදුර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා අධ්‍යක්ෂක ත්‍රස්ත මර්ධන විමර්ශන කොට්ඨාශය වෙත 2019. 03. 18 දිනැති සටහන C 1004 D ලෙස ලකුණු කර ඉදිරිපත් කර සිටිනවා. එසේම අද දින ලකුණු කර ඉදිරිපත් කරන ලද C 1004 A , C 1004 B , C 1004 C සහ C 1004 D දරණ ලේඛනයන්වල ඡායාස්ථ පිටපත් ලබාගෙන ඒවා මෙම කොමිෂන් සභාවේ ලේකම්වරයා මාර්ගයෙන් නිවැරදි ලේඛන බවට සහතික කර ඒ අදාළ ගොනුව එම පොත් රැගෙන එන ලද නිලධාරීයා වෙත මුදාහරින ලෙසට නියෝගයක් නිකුත් කරන මෙන්ද ඊට අමතරව ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක්ද සිල්වා මැතිතුමා.</u>

C 1004 සිට C 1004 D දක්වා ලකුණු කරන ලද ලේඛනවල ඡායා පිටපත් ලබාගෙන එය සහතික කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරන අතර ඉන්පසුව මුල් ලේඛන අදාළ ගොනුව ත්‍රස්ත විමර්ශන හා මර්ධන ඒකකයෙන් කොමිෂන් සභාවට රැගෙන ආ නිලධාරීයාට නිදහස් කරන ලෙසට ද නියෝග කරමි.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු බන්දුල කරුණාරත්න මැතිතුමා.</u>

ප්‍ර: රත්නායක මහත්මයා ඔබ මීට පෙර අවස්ථාවේ දී සාක්ෂිදෙන කොට කියා හිටියා මේ ඉස්ලාම් අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වාගෙන යන අතරතුරදී ඔබ නිරීක්ෂණය කලා කියලා ත්‍රස්ත විමර්ශන අංශයත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් අතර කිසියම් තරගකාරී තත්ත්වයක් දුටුවයි කියලා?

උ: මෙම සිද්ධියට අදාළ තරගකාරී තත්ත්වයක් නැහැ ස්වාමීනි. නමුත් කොට්ඨාශ කොට්ඨාශ අතර විමර්ශන සිදු කිරීමේ දී .

ප්‍ර: ඇයි ඔබ එහෙම කිව්වේ කියන්න බලන්න ඇයි මොකද එහෙම වෙන්නේ. CID එකයි TID එකයි අතර තියෙන තරඟය මොකද්ද මොනවට ද තරඟය?

උ: එම දිනවල ස්වාමීනි තරඟයක් වශයෙන් මා සඳහන් කළේ තරඟයක් නෙවෙයි ඇත්තටම ස්වාමීනි එම දිනවල අපි තොරතුරු හුවමාරු කරගැනීමක් සිදුවුණේ නැහැ මා දන්නා තරමින් ඇත්තටම මේ සහරාන් සම්බන්ධයෙන් අපි සහ CID එක inquiry කරාට දෙගොල්ලෝ අතර තොරතුරු හුවමාරුවක් සිදු වුණේ නැති බව මට යම් දැනුමක් තිබුණා ඒ දවස් ටිකේ.

ප්‍ර: දැන් ඔබ කොපමණ කාලයක් වෙනව ද මේ TID එකේ සේවය කරන්න පටන් අරගෙන ?

උ: දැන් වසර 10 කට ආසන්න වෙනවා ස්වාමීනි.

ප්‍ර: එතකොට ඒ ආරම්භක කාලේදී ඒ කියන්නේ මීට අවුරුදු 08 කට 09 කට ඉස්සෙල්ලා තොරතුරු හුවමාරු වීම සහ මේ ලැබෙන තොරතුරු බෙදා හදාගෙන පරීක්ෂණ විමර්ශන කටයුතු කිරීම සිදුවුණා කියලද ඔබ කියන්නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ තත්ත්වය නැති වුණේ කොයි කාලෙද?

උ: මට නිශ්චිවම කියන්න අමාරුයි ස්වාමීනි.

ප්‍ර: ඔබට වකවානුවක් හැටියට හෝ සඳහන් කරන්න පුළුවන් කමක් තියෙනව ද අහවල් කාලේ වගේ ඉඳලා මේ තත්ත්වයේ වෙනසක් වුණා කියලා අඩුම ගාණේ?

උ: දැන් ස්වාමීනි අපි ඉස්සෙල්ලා එක නියෝජ්‍යය පොලිස්පතිවරයෙක් යටතේ ගොඩක් කල් හිටියේ. එතකොට CID ,TID බැලුවේ එක නියෝජ්‍යය පොලිස්පතිවරයෙක්. එතකොට ඉතිං ගොඩක් තොරතුරු එන ඒවා CID එකේ එන එවා CID DIG හරහා අපේ Director ටත් එනවා. පොලිස්පතිතුමාගේ සෘජු තොරතුරු යොමු කරන ටිකත්. එතකොට මා දන්නා තරමින් ඔය වකවානුවේ අපිට වෙනම DIG කෙනෙක් හිටියා. එම කරුණු සමහර විට බලපෑවද කියන්න මට නිශ්චිවම කියන්න බැහැ ස්වාමීනි.

ප්‍ර: කොයි කාලේ වගේ ද ඒ සිද්ධ වුණේ?

උ: 2018, 2019 කාල වකවානුවේ ස්වාමීනි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: කවුද එවකට හිටියේ TID , DIG දෙකම භාරව හිටපු නියෝජ්‍යය පොලිස්පතිවරයා කවුද ?

උ: ඉස්සෙල්ලා සිටියා ස්වාමීනි නන්දන මුණසිංහ මහත්මයා. ඊට පස්සේ රවී සෙනවිරත්න මහත්මයා හිටියා. ඉන් අනතුරුව TID , CID, GID වශයෙන් නාලක සිල්වා මහත්මයා පත් වුණාට පස්සේ අපි TID එක CID අධීක්ෂණයෙන් මං හිතන්නේ අපි සෘජු ආයතනයක් බවට පත් වුණා.

ප්‍ර: එතකොට කවුද එහි හිටිය ප්‍රධානියා?

උ: එතකොට TID එකේ හිටියේ නියෝජ්‍යය පොලිස්පති නාලක සිල්වා මහත්මයා.

ප්‍ර: CID එකේ ප්‍රධානියා හැටියට හිටියේ?

උ: මට මතක නැහැ ස්වාමීනි. මේ අවස්ථාවේ දී

ප්‍ර: දැන් ඔබ සඳහන් කරපු ආකාරයට කැකුණුගොල්ලට ගිහිල්ලා මේ සහරාන් පිළිබඳව සොයන අවස්ථාව වන විටත් TID එකත් CID එකත් අතර කිසියම් තරගකාරීත්වයක් තිබිලා තියෙනවා නේද?

උ: තරහකාරීත්වයක් තිබුණ ද කියන්න මට හරියටම කියන්න බැහැ ස්වාමීනි. නමුත් අපි දෙගොල්ලො දැන් LTTE ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් අපිත් සහරාන් හොයනවා CID එකත් සහරාන් හෙව්වා. නමුත් ඇත්තටම මම දන්න තරමින් අර තොරතුරු share වීමක් වෙන්නෙ නැතිවෙන්න ඇති ඒ කාලේ සිමාවේ.

ප්‍ර: ඒ තොරුතුරු බෙදා හදා ගැනීම නතර වීමට හේතුව මොකද්ද ඔබ දකින විදියට ඔබ TID එකේ අවුරුදු 10 ක් වැඩ කරානේ ඔබට තියෙනවනේ අත්දැකීම් කියන්න බලන්න ඇයි එහෙම වුණේ කියලා?

උ: මට නිශ්චිතවම කියන්න අමාරුයි ස්වාමීනි.

ප්‍ර: ඔබ දකින විදියට ඒක කිසියම් පරිපාලනමය හේතුවක් මත සිදු වූවක්ද?

උ: බොහෝ දුරට පරිපාලනමය වෙන්නත් පුළුවන් ස්වාමීනි.

ප්‍ර: දැන් අවසානයේ දී TID එකටත් සහරාන්ගේ තොරතුරු පස්සේ ගිහිල්ලා ඔහුව අත්අඩංගුවට ගන්න බැරි වුණා 2019 බෝම්බ පුපුරවන්න ඉස්සෙල්ලා අඩුම ගානේ CID එකටත් තොරතුරු තිබිලාත් ඔහුව අත්අඩංගුවට ගන්න බැරි වුණා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ දෙපැත්තේ අතර තිබ්බව ඒ තරහකාරී ස්වරූපයේ ප්‍රතිඵලය නේද ඒක?

උ: වෙන්න පුළුවන් ස්වාමීනි.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා.</u>

ප්‍ර: සාක්ෂිකරු මෙම ජමිල් නැමැති පුද්ගලයා පසුපස හමුදා බුද්ධි අංශයද ඔහු පසුපස ආවේශණව කරලා තියෙනවා නේද තමාගේ පරීක්ෂණ වලදී හෙළිවුණා නේද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔවුන් ඉතා දීර්ඝ කාලයක් මේ ජමිල් සම්බන්ධව ආවේෂණ කටයුතු කරලා තිබුණ ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මෙම සිද්ධිය වූ දිනයේදීත් හමුදා බුද්ධි අංශය ඒ කිහිපදෙනෙක් මේ ඔහුව සොයාගෙන ගොස් තිබෙනවානේ ඔහුගේ නිවසට ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට මෙම ජමිල් නැමැති පුද්ගලයා දෙහිවල මුස්ලිම් පල්ලියක දේවස්ථානයක දී සිටින අවස්ථාවකදී අමීන් නැමැති ආරක්ෂක පෞද්ගලික ආරක්ෂක අංශයක සිටින පුද්ගලයෙක් වශයෙන් සලකන ලබන පුද්ගලයෙක් ඔහුව පරීක්ෂා කරලා තිබෙනවා නේද?

උ: ස්වාමීනි මුස්ලිම් දේවස්ථානයක් ද ?

ප්‍ර: ඔව් Ebenezer Place එකේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ ඔහු ආරක්ෂක නිලධාරීයෙක් කලින් පෞද්ගලික ආරක්ෂක නිලධාරීයෙක් වශයෙන් සඳහන් කරන පුද්ගලයෙක් ඒ ජමිල්ව පරීක්ෂා කරලා තියෙනවා නේද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: තමන් කිව්වා ජමිල් ළඟ දුරකථන 03 ක් තිබිලා හමුවුණාද?

උ: නැහැ ස්වාමීනි මම කිව්වේ දුරකථන 03 ක් නෙමේ මගේ මතකයේ හැටියට දුරකථන 02 කට ආසන්න සංඛ්‍යාවක් බෝම්බ පිපුරුණු අවස්ථාවේ එම ස්ථානයේ තිබුණු සුන්බුන් බවට පත්වුණ හොයාගෙන තිබුණා කියලා.

ප්‍ර: නමුත් තමන් මුස්ලිම් දේවස්ථානයේ සිටින ජමිල් එළියට පැමිණි අවස්ථාවේ දී අර අමීන් නැමැති පුද්ගලයා එම ජමීල්ව පරීක්ෂා කිරිමක් කරලා තියෙන බවක් තම පරීක්ෂණවලදී හෙළිවුණාද?

උ: පරීක්ෂා කිරීමක් කියලා දෙයක් කරලා නැහැ ස්වාමීනි. එම අවස්ථාවේ ජමීල්ගේ බිරිඳට දුරකථන ඇමතුමක් ලබාගෙන මොහු ඇයගේ ස්වාමීපුරුෂයා ද යන්න විමසීමක් සිදු කර තිබෙනවා.

ප්‍ර: ඒ දුරකථන පණිවිඩය අරන් තියෙන්නේ ජමීල්ගේ දුරකථනයෙන් ද නැත්නම් ඒ කාගේ දුරකථනයෙන් ද? දැන් ජමීල් ළඟ දුරකථන තිබ්බ නම් 03 ක් තිබ්බා කියනවා තමාලා පරීක්ෂණවලදී හෙළි වුණා කියනවා කාමරේ සුන්බුන්. දැන් ජමිල් මුස්ලිම් දේවස්ථානයේ එළියට එන අවස්ථාවේ දී තමන්ගේ පරීක්ෂණ අනුව ඔහු ළඟ දුරකථනයක් තිබිලා තිබෙනව ද?

උ: එහෙමයි ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර: තිබිලා තිබෙනවා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට තමන්ගේ ගෙදරට දුරකථන අර ආරක්ෂක නිලධාරියා දුරකථන පණිවිඩය අරන් තියෙන්නේ එම දුරකථනයෙන් ද නැතහොත් එය අමීන් නැමැති පුද්ගලයාගේ දුරකථනයෙන් ද කියලා තමාලගේ පරීක්ෂණවලදී හෙළිවුණා ද?

උ: ස්වාමීනි මට මේ අවස්ථාවේ දී නිශ්චිතවම ප්‍රකාශ කරන්න බැහැ මට පරීක්ෂා කරලා බලලා කියන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: අමීන් නැමැති පුද්ගලයාගේ දුරකථනය තමාලා පරීක්ෂා කරාද?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: එම අවස්ථාවේ දී පරීක්ෂා කළේ නැහැ?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: අමීන් නැමැති පුද්ගලයාගේ ආරක්ෂක ඒ සමාගමේ ප්‍රධානියා බුද්ධි අංශයක විශ්‍රාමලත් නිලධාරියෙක් හැටියට තමාලට හෙලිවුවාද?

උ: ඉන්පසුව හෙළිවුණා ස්වාමීනි.

ප්‍ර: මුස්ලිම් නිලධාරියෙක් හැටියට?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: හෙළිවුණා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට ආරක්ෂක අංශයේ නිලධාරියෙක් වශයෙන් මුස්ලිම් දේවස්ථානයට ඇවිල්ලා පරීක්ෂා කළ ආරක්ෂක අංශයේ පුද්ගලයන් මුස්ලිම් පුද්ගලයෙක් බව තමාට හෙලි වුණාද අමීන් නැමැති පුද්ගලයා?

උ: ඉන්පසුව අනාවරණය වුණා ස්වාමීනි.

ප්‍ර: අනාවරණය වුණා තමන්ලා අර ඒ ආරක්ෂක සමාගමේ ප්‍රධානියාගෙන් ප්‍රකාශයක් ලබාගත්ත ද?

උ: ස්වාමීනි මේකේ නිලධාරීන් කණ්ඩායමක් තමයි විමර්ශන සිදු කළේ.

ප්‍ර: අමීර් නැමැති පුද්ගලයා එවලා තියෙන මුස්ලිම් දේවස්ථානයට ආරක්ෂක අංශයේ සමාගමේ ප්‍රධානියා විසින් මුස්ලිම් දේවස්ථානයට ආරක්ෂාව ලබාදීම තමන් දන්නවද?

උ: මම දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: තමාලාගේ ඇයි පරීක්ෂණවලදී ඒවා හෙළිවුණේ නැද්ද?

උ: මට ස්වාමීනි මේ අවස්ථාවේදී නිශ්චිතවම කියන්න අමාරුයි මට පරීක්ෂා කරලා බලලා තමයි කියන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර: එතකොට දුරකථන 03 ක සුන්බුන් තිබුණා කියලා තමාලා කොහොමද පරීක්ෂණවලදී හෙළිවුණේ?

උ: දුරකථන 03 නෙමේ ස්වාමීනි මට මතක හැටියට දුරකථන 02ක්.

ප්‍ර: ඕ දෙකක සුන්බුන් කොහේද තිබ්බේ?

උ: එම බෝම්බ පිපිරුණු ස්ථානයේ තිබිලා සොයාගෙන තිබෙනවා ස්වාමීනි.

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: ඒවා පරීක්ෂා කිරීමට අදාළ බලධාරීන්ට භාර දුන්නද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: සිම්පත් එහෙම සොයාගත්ත ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ සම්පත් වල පරීක්ෂා කිරීමක් එහෙම කරාද?

උ: එහෙමයි ස්වාමීනි. ඒවා අපි යවලා තියෙනවා ස්වාමීනි වැඩිදුර වාර්තා ගන්න.

ප්‍ර: හම්බවුණාද?

උ: මට පරීක්ෂා කරලා ස්වාමීනි පවසන්න පුළුවන් .

ප්‍ර: එය තමන්ට දැනට කියන්න බැහැ සිම්පත්වලින් මොකද කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: එතකොට හැදුනුම්පත කොහේ තිබිල ද හම්බ වුණා කියලා කියන්නේ?

උ: ස්වාමීනි ජමිල්ගේ හැඳුනුම්පත හෝටලයට ඇතුල් වෙන අවස්ථාවේ එම හෝටලයේ පිළිගැනීමේ කවුළුවේ නිලධාරියාට ලබාදීලා තිබුණේ.

ප්‍ර: දීලා ගිහිල්ල ද නැත්නම් කාඩ්පත දීලා ද නැත්නම් අංකය ලබාදීලද?

උ: නැහැ අයිඩින්ටිය දීලා තිබුණා ස්වාමීනි.

ප්‍ර: ඔහුට දීලයි පිටව ගොස් තිබෙන්නේ?

උ: නැහැ ඔහුට දීලා තමා ස්වාමීනි හෝටලයේ කාමරය වෙන් කරවා ගන්නේ.

ප්‍ර: ඔහුගේ හැඳුනුම්පතඔයගොල්ලො සොයාගත්තේ නැහැ?

උ: අපි සොයා ගත්තා ස්වාමීනි.

ප්‍ර: කොහේ තිබිලා ද සොයාගත්තේ?

උ: එම හෝටලයේ තිබිලා අපි භාරයට ගත්තා ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ පිළිගැනීමේ නිලධාරියා ළඟ තිබිලා ද ගත්තේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් ඔබගේ පරීක්ෂණවලදී අර අමීන් නැමැති පුද්ගලයාට ඔහුගේ නිවැසින් දුරකථන පණිවිඩයක් දීලා තිබ්බා ජමිල් තමාගේ පුරුෂයා කියලා භාර්යාව කියලා තියෙනවා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: හෙළිවුණා නේද?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඔහුව තබාගන්න කියලා ඊට පස්සේ කෝල් එකකින් කියලා තියෙනවා යවන්න එපා අපි එනවා කියලා?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: ඒ අමීන් නැමැති නිලධාරියා ඒ අරාක්ෂක අංශයක නිලධාරියෙක් ඔහු රඳවා නොගෙන ඔහුට යන්න ඉඩදී තිබෙන්නේ කුමක් නිසාද කියලා ඔබලාගේ පරීක්ෂණවලදී හෙළිවුණා ද? සාක්ෂිකරු තමන් සම්පූර්ණ පරීක්ෂණ කටයුතු තමා නොවේද කලේ?

උ: නැහැ ස්වාමීනි ඒක විමර්ශන කණ්ඩායමක් තමයි ස්වාමීනි මේ සියළුම පරීක්ෂණ සිදු කළේ. මමත් ඒ විමර්ශන කණ්ඩායමේ හිටපු නිලධාරියෙක්.

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර: එතකොට තමන් ටජ් හෝටලයට ගිය අවස්ථාවේ දී තමන් කලින් කිව්වා මොකද්ද ඒ පුද්ගලයා ජමිල් නැමැති පුද්ගලයා වයර් දෙකක් එකතු කර යමක් කිරීමට ලෑස්ති වෙනවා දැක්කයි කියලා CCTV කැමරා මඟින් ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: තමන් ඒ පරීක්ෂණ වලදී හෙළිවුණා ද ඒ කුමක් කරන්න ද කියලා එය ලෑස්ති වුණේ කියලා?

උ: ස්වාමීනි මෙම 04/21 වැනි දින සිදු වූ ප්‍රහාර මාලාව සම්බන්ධයෙන් සලකා බලන කොට මේ ප්‍රහාර ඔක්කොම සිදුවුණ ආකාරය සම්බන්ධයෙන් සලකා බලන කොට මෙතැනත් මොහු මෙම ජමීල් යන පුද්ගලයා ඔහු එදා පිටේ එල්ලගෙන ආ බෑග් එක අපිට සැක කරන්න පුළුවන් බෝම්බ සහිත බෑගයක් තමා මොහු එදා රැගෙන ආවේ කියලා. එතකොට ඒ බෝම්බ බෑගය තුළින් වයර් කැබලි දෙකක්වැනි යමක් ගෙන එය ෂෝට් කිරීමට මා අදහස් කළේ එකට දර්ශනය කිරීමෙන් යම්කිසි පිපිරීමක් සිදු කිරීමට උත්සාහ දැරූ බවට අපිට යම් සැකයක් මතුවුණා ස්වාමීනි.

ප්‍ර: තමන්ලා ජමීල් නැමැති ඒ පුද්ගලයගේ බිරිඳ සහ බිරිඳගේ සහෝදරයා යන අයගේ ප්‍රකාශ ලබාගත්ත ද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒක තමන්ලද කළේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඔවුන් ප්‍රකාශ කරාද අර යුධ හමුදා බුද්ධි අංශයේ නිලධාරීන් එම නිවසට කලින් සිට පැමිණ තිබෙනවා ද කියලා?

උ: ස්වාමීනි එම කොටස මම විමර්ශනය කළේ නැහැ. මා දන්නා තරමින් ප්‍රකාශ කරලා තිබුණා.

ප්‍ර: ප්‍රකාශ කරලා තිබුණා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: අමීර් නැමැති ත්‍රීවීල් රියදුරාගේ සම්බන්ධයෙන් වැඩිදුර යම්කිසි පරීක්ෂණයක් තමාලා කරාද?

උ: සමාවෙන්න ස්වාමීනි.

ප්‍ර: අමීර් නැමැති ආරක්ෂක නිලධාරියා සම්බන්ධව ?

උ: මට මේ අවස්ථාවේ නිශ්චිතම කියන්න බැහැ ස්වාමීනි.

ප්‍ර: ඔහු කවුද ඔහු කුමන විදියේ පුද්ගලයෙක් ද ඔහුගේ පසු ක්‍රියාකාවලිය සම්බන්ධව සහ ඔහු කුමන තත්ත්වයක සිටින පුද්ගලයෙක් ද කියලා

උ: ස්වාමීනි මගේ අංශයේ ස්ථානාධිපතිවරයා සමඟ සාකච්ඡා කරලා තමයි මට කියන්න වෙන්නේ. මේ අවස්ථාවේ මට නිශ්චිතවම පිළිතුරක් දීමට අපහසුයි.

ප්‍ර: මොකද ඒ ප්‍රශ්නය අහන්නේ ඔහු විසින් එම පුද්ගලයාට නවත්වගන්නට කියලා තිබියදීත් යෑමට ඉඩ දීම හෝ නවත්වගන්නට තිබුණු අවස්ථාවක ජමීල් පිට වී යැමෙන් මෙම අනතුර වැළැක්විමට නොහැකි වී තිබෙන නිසා. එම නිලධාරියා කවුද කියන එකයි ඔහු බුද්ධි නිලධාරියෙක් වශයෙන් සිටි

Fair Comment BY JEZEEM

පුද්ගලයෙක් ද කියලා පරීක්ෂා කරාද, කලින් බුද්ධි නිලධාරීයෙක් වශයෙන් සේවය කළ පුද්ගලයෙක් ද කියලා?

උ: මට නිශ්චිතවම කියන්න අමාරුයි ස්වාමීනි මේ අවස්ථාවේ.

ප්‍ර: නමුත් ඔහු සාමාන්‍යයෙන් යම්කිසි පුහුණුවක් ලැබූ අයෙකු බව කොමිෂන් සභාවට හෙළි වූ නිසයි ඒ ප්‍රශ්නය ඇහුවේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: තමන්ලා ඒ ගැන පරීක්ෂණ සිදු කළේ නැහැ?

උ: දැනීමක් නැහැ ස්වාමීනි.

****

<u>ගරු විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා.</u>

ප්‍ර: රත්නායක මහත්මයා දැන් ඔබ කැකුණුගොල්ලේ ඉඳලා හිටන් කොළඹ ආපු වේලාවක ඇවිල්ලා මොනම අවස්ථාවකදී හරි අර SI ඩයස් හම්බවුණා ද?

උ: නැහැ ස්වාමීනි මට හම්බ වුණේ නැහැ.

ප්‍ර: මොන අවස්ථාවකදීවත් හම්බවුණේ නැද්ද?

උ: නැහැ ස්වාමීනි අද වෙනකන් හම්බවුණේ නැහැ.

ප්‍ර: ඊට පස්සේ කතා කරේවත් නැද්ද?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: දැන් අර මේ දැන් ඔය බෝම්බ පිපිරුණාට පස්සේ අර හෝටලයේ දෙහිවල හෝටලයේ මේ එතැන ඒ කාමරය ඇතුළේ බිත්ති කඩා වැටිල තිබ්බ ද?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: එතකොට මේ අර තව ෆෝන් එකක් අහුවුණා කිව්වේ ඒක අර අල්ලපු කාමරේ හිටිය කාගෙවත් ද?

උ: එහෙමයි ස්වාමීනි. එම Phone දෙකක් ජංගම දුරකථන දෙකක් එම කාමරයට ආසන්න කාමරයේ නවාතැන් ගෙන සිටි මිය ගිය යුවලට අයිති බව අපිට තහවුරු වුණා විමර්ශන වලදී තවත් ජංගම දුරකථනයක් සහ සිම්කාඩ්පත් කිහිපයක් එම කාමරයට ආසන්න කාමරයක නවාතැන් ගෙන සිටි පුද්ගලයෙකුට අයිති බවත් අනාවරණය වුණා ස්වාමීනි.

ප්‍ර: එතකොට මේ පුද්ගලයාට මේ කවුද බෝම්බ පුපුරවාගත් පුද්ගලයට අයිති ෆෝන් එකද තිබිලා තියෙන්නේ?

උ: ඔව් ඒකෙත් ස්වාමීනි අපිට ෆෝන් එකක් සොයා ගන්න බැරි වුණා. ෆෝන් එක සුන්බුන් වලට විසි වෙලා තමයි ස්වාමීනි තිබුණේ ස්වාමීනි.

ප්‍ර: ජමිල්ගේ ?

උ: එහෙමයි ස්වාමීනි.

****

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් අවශ්‍යද යන්න අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසමි. අවශ්‍ය නොවන බව දන්වයි.
සාක්ෂිකරු මුදාහරිමි.

වේලාව:ප.ව.02.45

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

2019 අප්‍රේල් මස 21 වැනි දින සිදු වූ බෝම්බ ප්‍රහාරයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පරීක්ෂා කොට වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව

දිනය :- 2020.08.17 වේලාව :- පෙ.ව. 11.15

සටහන් කළේ :-ධම්මිකා පෙරේරා විසින්

ගරු විනිසුරු මඩුල්ල :-

01 ගරු අභියාචනාධිකරණ විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා
-සභාපති

02 ගරු අභියාචනාධිකරණ විනිසුරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා -සාමාජික

03 විශ්‍රාමික ගරු අභියාචනාධිකරණ විනිසුරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා -සාමාජික

04 විශ්‍රාමික ගරු මහාධිකරණ විනිසුරු බන්දුල අතපත්තු මැතිතුමා
- සාමාජික

05 විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම් ඩබ්ලිව්.එම්.එම්.ආර්. අදිකාරී මහත්මිය
-සාමාජික

පෙනී සිටීම :-

* අතිරේක සොලිසිටර් ජනරාල් අයේෂා ජිනසේන ජනාධිපති නීතීඥතුමිය, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සංජීව දිසානායක මහතා, ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ සුහර්ෂි හේරත් මහත්මිය, , ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතීඥ නයනා සෙනෙවිරත්න මහත්මිය, රජයේ අධිනීතීඥ නිමේෂා ද අල්විස් මෙනෙවිය, දිලන්ත එස්. කළුදුරුවගේ මහතා, චතුරංග බණ්ඩාර මහතා, සමඟ අරීන්ද්‍ර ජයසිංහ මහතා පෙනී සිටී.

* ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ඉල්ලීමක් සලකා බැලූ මෙම කොමිසම රෝමානු කතෝලික පල්ලියේ නීති නියෝජිත වශයෙන් ජනාධිපතිනීතීඥ ෂමිල් පෙරේරා මහතා කොමිසමේ ප්‍රසිද්ධ සාක්ෂි විමසීමේදී පෙනී සිටීමට අවසර දෙන ලදී.

Registrar's Copy
FAIR COMMENT BY JEZEEM

සම්පූර්ණ නම	:	**හෙට්ටිආරච්චිගේ දොන් කපිල සිරිකුමාර ජයසේකර,**
වයස	:	**අවුරුදු 60 යි.**
ජාතිය	:	**සිංහල,**
ආගම	:	**බෞද්ධ,**
දැනට තනතුර	:	**විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් වශයෙන් නිවසේ රැඳී සිටිනවා.**
පුද්ගලික ලිපිනය	:	**අංක 82/1/4, මකුළුදුව, පිළියන්දල**

ප්‍රතිඥා දෙමි.

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා:</u>

ප්‍ර : ජයසේකර මහත්මයා ඔබ ශ්‍රී ලංකා පොලිස් සේවයට මුලින්ම සම්බන්ධ වෙන්නේ කුමන කාලයේදී ද?

පි : 1982.07.26

ප්‍ර : 1982 ඔබ මුලින්ම සම්බන්ධ වෙන්නේ කුමන තනතුරකින් ද?

පි : ආධුනික උප පොලිස් පරීක්ෂක තනතුර ස්වාමීනි.

ප්‍ර : ආධුනික උප පොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන් මුලින්ම ඔබ සම්බන්ධ වෙලා ඊට පස්සේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙනවද නැත්නම් විශේෂ කාර්ය බලකාය හා සම්බන්ධ වෙනවද?

පි : වර්ෂ 1 ½ ක් පමණ සාමාන්‍ය පොලිස් රාජකාරීවල නිරත වෙනවා. ඉන් අනතුරුව 1983 සැප්තැම්බර් මාසේ 05 වෙනිදා ඉඳලා විශේෂ කාර්ය බලකායට අනුයුක්තව බැඳී සිටිනවා.

ප්‍ර : ඔබ විශේෂ කාර්ය බලකායේ කවදා වෙනකල් සේවයේ නිරත වුණාද 83 ඉඳලා?

පි : මම විශේෂ කාර්ය බලකායේ අදියර දෙකකින් සේවය කළා. එකක් 1983 ඉඳලා 1997.07.26 වෙන කල්. ඊට පස්සේ නැවත 2007 ඔක්තෝබර් ඉඳලා 2010 මාර්තු වෙනකල් විශේෂ කාර්ය බලකායේ වැඩ කළා.

ප්‍ර : ඔබ විශේෂ කාර්ය බලකායේ රාජකාරී කරන කොට යුද්ධය තිබුණු ප්‍රදේශවල රාජකාරී කළාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොනවද රාජකාරී කරපු ප්‍රදේශ?

පි : මම මුල්ම වකවානුවේ යාපනය අර්ධද්වීපයේ රාජකාරී කළා. ඊට අමතරව ජනාධිපති ආරක්ෂක අංශයෙත් රාජකාරී කළා. ඉන් අනතුරුව යාපනයේදී 1984 ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරයකින් 1 වෙනි ප්‍රහාරයකින් තුවාල ලැබුවා. පළවෙනි නිලධාරීන් හතරදෙනා මැරුනේ 1984 සැප්තැම්බර් 01 වෙනිදා. ඒ මා සමඟ ගිය කණ්ඩායම. ඉන් අනතුරුව නැවත ප්‍රතිකාරවලින් පස්සේ නැගෙනහිර ප්‍රදේශයේ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

රාජකාරීවල කටයුතු කළා. එදා ඉදලා 1997 දක්වාම නැගෙනහිර ප්‍රදේශයේම තමයි ඉන් අනතුරුව රාජකාරී කටයුතු කළේ.

ප : නැගෙනහිර පළාතේ මොන මොන ස්ථානවලද ඔබ රාජකාරී සිද්ධ කළේ?

පි : නැගෙනහිර පළාතේ මම ඒකාලේ ඇතුළත මඩකලපුවේ සිට පොතුවිල් දක්වා ප්‍රදේශයේ හැම කඳවුරකම වගේ රාජකාරී කරලා තියෙනවා. කඳවුරු අණදෙන නිලධාරීන් වශයෙන්, ඒ වගේම සහකාර පොලිස් අධිකාරීවරුන් වශයෙන්, ප්‍රාදේශීය අණදෙන නිලධාරී වශයෙන් කටයුතු කරලා තියෙනවා.

ප : ඔබට මුලින්ම ඔබව සහකාර පොලිස් අධිකාරීවරයෙක් විදියට උසස්වීම් ලැබෙන්නේ කොයි වකවානුවේදීද?

පි : 1994.06.01 වෙනිදා ස්වාමීනි.

ප : ඉන්පසුව පොලිස් අධිකාරීවරයෙක් වෙන්නේ කොයි කාලෙද?

පි : පොලිස් අධිකාරීවරයෙක් වශයෙන් වෙනනේ මම 2000 මැයි 22 වෙනිදා ස්වාමීනි.

ප : ඊලඟ උසස්වීම ලැබෙන්නේ කොයි කාලෙද?

පි : ඊලඟට 2005 මැයි 22 ස්වාමීනි.

ප : ඒ ජ්‍යෙෂ්ඨ පොලිස්..

පි : ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වශයෙන් ස්වාමීනි.

ප : එතකොට නියෝජ්‍ය පොලිස්පති ධූරයට පත් වෙන්නේ ඔබ කොයි කාලෙද?

පි : 2013 පෙබරවාරි 01 මම නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් හැටියට උසස්වීම් ලබනවා.

ප : ඔබ අවසාන වශයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති යන තනතුරට පත් වෙන්නේ කොයි කාලෙද?

පි : මම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් වශයෙන් පත් වුණේ 2017 ජූලි මාසේ 26 වෙනිදා ඉදලා ස්වාමීනි.

ප : ඔබ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර භාර ගැනීමෙන් පස්සේ Easton Province එකට නැත්නම් ලංකාවේ නැගෙනහිර පළාතට අනුබද්ධිතව රාජකාරී සඳහා යොමු වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප : කොයි කාලෙද යොමු වෙන්නේ?

පි : ඒ 2017 අගෝස්තු මාසේ 21 වෙනිදා ස්වාමීනි.

ප : 2017 අගෝස්තු 21 සිට කවදා දක්වා ඔබ නැගෙනහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විදියට රාජකාරී කරනවද?

පි : මම 2019 විශ්‍රාම යන කල්, 2019 නොවැම්බර් මාසේ 20 වෙනි දින දක්වා රාජකාරී කළා ස්වාමීනි.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබට නැගෙනහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විදියට මොනවද පැවරිලා තිබ්බ රාජකාරී?

පි : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වශයෙන් පැවරිලා තියෙන කාර්යය තමයි අපරාධ පාලනය, පොලිස් රාජකාරී කටයුතු සැලසුම් කිරීම, මෙහෙයුම් කිරීම, අධීක්ෂණය කිරීම, එතකොට මානව හා භෞතික සම්පත් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය කිරීම්, අනෙකුත් ආයතන සම්බන්ධීකරණය සහ ප්‍රජාව සමඟ සම්බන්ධීකරණ කටයුතුවලින් ප්‍රදේශයේ ආරක්ෂාව, සාමය ස්ථාපිත කිරීම.

ප්‍ර : නැගෙනහිර පළාත භාරව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති විදියට ඔබ යටතේ පොලිස් Divisions කොච්චර තිබුණද මහත්මයා?

පි : පොලිස් කොට්ඨාශ 4 ක් තියෙනවා ස්වාමීනි. ඒක මම පැහැදිලි කරන්නම් ස්වාමීනි.

ප්‍ර : ඔව් පැහැදිලි කරන්න?

පි : නැගෙනහිර පළාත යටතේ තියෙනවා දිස්ත්‍රික් 3 ක්.

ප්‍ර : මොනවද ඒ දිස්ත්‍රික්ක?

පි : නියෝජ්‍ය පොලිස්පති දිස්ත්‍රික්ක 3 ක් තියෙනවා, එකක් අම්පාර දිස්ත්‍රික්කය, අනිත් එක මඩකලපුව දිස්ත්‍රික්කය, අනිත් එක අම්පාර දිස්ත්‍රික්කය, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය.

ප්‍ර : අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කය කියන්නේ දිස්ත්‍රික්ක 2 ක්ද, තනි දිස්ත්‍රික්කයක්ද?

පි : දිස්ත්‍රික්ක 2 ක් ස්වාමිනී.

ප්‍ර : අනිත් දිස්ත්‍රික්කය මොකක්ද?

පි : අනිත් එක ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය.

ප්‍ර : ඒ දිස්ත්‍රික්කය යටතේ මොනවද තියෙන කොට්ඨාශ?

පි : ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය යටතේ තියෙනවා කොට්ඨාශ 2 ක්.

ප්‍ර : මොනවද ඒ කොට්ඨාශ?

පි : එකක් ත්‍රිකුණාමල කොට්ඨාශය, අනිත් එක කන්තලේ කොට්ඨාශය. එතකොට මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කය යටතේම තියෙන්නේ කොට්ඨාශ 2 යි, ඒ මඩකලපුව සහ අම්පාර කොට්ඨාශ 2 පමණයි.

ප්‍ර : දැන් මේ තිරයේ දැක්වෙනවා ඔබට ඒ සටහනක්, මඩකලපුව කොට්ඨාශය යටතේ සහකාර පොලිස් අධිකාරී කොට්ඨාශ කීයක් තියෙනවද?

පි : මඩකලපුව යටතේ ස්වාමීනි මේක සහකාර පොලිස් අධිකාරී කොට්ඨාශ කියන එක අපිට තියෙන සහකාර පොලිස් අධිකාරීන් හැටියට සමහර වෙලාවට කොට්ඨාශ දිස්ත්‍රික්ක 2, 3 වෙන්න පුළුවන්. ඉතින් ඒක හින්දා සමහර සහකාර පොලිස් අධිකාරිවරුන් වැඩි වෙන කොට සමහර විට අපි ඒක 4,5 ත් කරනවා. ඉතින් ඒක නිසා මම

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

හිතන්නේ මේ අවස්ථාවේදී මම ඉන්න කාලේ තුළ තිබුණේ සහකාර පොලිස් අධිකාරී මඩකලපුව, එතකොට කලවංචිකුඩි, එතකොට එරාවුර් කියන 3.

ප : වාලච්චේන කියලා වෙනම එකක් තිබුණේ නැද්ද ඒ වකවානුව වෙන කොට?

පි : දැන් ඊට පසුව තිබුණා වාලච්චේන කියලත් එකක් අර මම කිව්වේ අදියරෙන් අදියරය කැඩෙනවා නිලධාරීන්ගේ ප්‍රමාණය අනුව.

ප : ඒ අනුව කාත්තන්කුඩි පොලිස් ස්ථානය, වච්නතිව් පොලිස් ස්ථානය, මඩකලපුව පොලිස් ස්ථානය මේ තුනම තිබුණෙත් ඔබ යටතේ තියෙන මෙ මඩකලපුව කොට්ඨාශය යටතේ කිව්වොත් නිවැරදි ද?

පි : ඔව් මඩකලපුව කොට්ඨාශය යටතේ.

ප : ඊලඟට ජයසේකර මහත්තයා අම්පාර Division එකට අවධානය යොමු කොලොත් ඒ අම්පාර Division එක යටතේ සහකාර පොලිස් අධිකාරී දිස්ත්‍රික්ක කීයක් තිබුණද?

පි : අම්පාර Division එක යටතේ වැඩි පොලිස් ස්ථාන සංඛ්‍යාවක් තියෙනවා 17 ක්. ඒකේ තිබුණා සහකාර පොලිස් අධිකාරී කොට්ඨාශ 4 ක්. ඒකෙත් අර නිලධාරීන් අනුව සමහර විට ඒක 5 ක් වෙනවා. සමහර වෙලාවට ඒක 4 ක් වෙනවා.

ප : ඒ දිස්ත්‍රික්ක මොනවද කියලා කියන්න පුළුවන්ද? අම්පාර, කල්මුණේ ..

පි : එකක් අම්පාර දිස්ත්‍රික් 1 වෙනවා. එතකොට අක්කරපත්තුව තිබුණා. එතකොට කල්මුණ තිබුණා. එතකොට මහඔය,

ප : පොතුවිල්?

පි : පොතුවිල් තිබුණා. ඊළඟට මහඔය.

ප : දැන් ඒ යටතේ ද සමන්තුරේ සහ කල්මුණේ පොලිස් බල ප්‍රදේශත් පවතින්නේ අම්පාර Division එක යටතේ ද?

පි : එහෙමයි ස්වාමීනි.

ප : ඒ අනුව ඔබ යටතේ කෙතරම් පොලිස් ස්ථාන, පොලිස් ස්ථාන කීයක් ඔබ යටතේ අධීක්ෂණයට ලක් වුණාද?

පි : පොලිස් ස්ථාන 48 ක් තියෙනවා ස්වාමීනි.

ප : ජයසේකර මහත්මයා ඔබ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් ඔබ සිදු කරන රාජකාරී අධීක්ෂණය කරන්නේ කවුද?

පි : පොලිස්පතිතුමා ස්වාමීනි.

ප : පොලිස්පතිතුමා කුමන ආකාරයකින් ද ඔබේ රාජකාරී අධීක්ෂණය කරන්නේ?

පි : පොලිස්පතිතුමාට තමයි මම වගකියන්න ඕනේ. විශේෂයෙන් මගේ ප්‍රදේශයේ අපරාධ පාලනය සම්බන්ධව, බරපතල අනතුරු, එහෙම නැත්නම් බරපතල සිද්ධීන් සම්බන්ධව සෘජුවම අපි සම්බන්ධ

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

වෙනවා. පොදුවේ ප්‍රදේශයේ මහජනතාවගේ සාමය ආරක්ෂා කිරීම සඳහා මතුවන විශේෂිත ගැටළු සම්බන්ධයෙන් වුනත් මම වගකියන්න ඕනේ හැම කරුණකදීම පොලිස්පතිතුමාට.

ප්‍ර : එතකොට පොලිස්පතිතුමා සහ පළාත් භාර Senior DIG ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් අතර මාසිකව Conferences නැත්නම් රැස්වීම් එහෙම පවත්වනවද?

පි : නැහැ ස්වාමීනි සෑම මාසයකම රැස්වීමක් කියන එකක් නැහැ, නමුත් පොලිස්පතිතුමාගේ අභිමතය පරිදි සමහර විට මාස 3 කට හෝ 4 කට වරක් විශේෂයෙන් අපි අපරාධ පාලනය, මාර්ග අනතුරු පිළිබඳව පැමිණිලි සම්බන්ධව, වරෙන්තු සම්බන්ධව සහ එහි වෙනම ප්‍රගති සමාලෝචන සාකච්ඡා පවත්වලා තියෙනවා. එවැනි අවස්ථාවලට පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් සමහරවිට නියෝජ්‍ය පොලිස්පතිවරුන් ඊට අමතරව සමහර වෙලාවට කොට්ඨාශ භාර නිලධාරීන්වත් වෙනම ගෙනල්ලා එවැනි සම්මන්ත්‍රණ පවත්වන අවස්ථාවලුත් තියෙනවා.

ප්‍ර : දැන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නැගෙනහිර පළාත විදියට ඔබ යටතේ තිබ්බ පොලිස් ස්ථානවලට අමතරව යම්කිසි ඒකක තිබුණද?

පි : පොලිස් ස්ථානවලට අයත් ඒකක කියන්නේ වෙනම අංශ. ඒ කියන්නේ අපරාධ අංශය, විවිධ පැමිණිලි අංශය..

ප්‍ර : ඊට අමතරව කොට්ඨාශ බුද්ධි අංශ තිබුණද මහත්මයා?

පි : ඔව් බුද්ධි අංශය හැටියට තියෙනවා ඒක ලංකාවේම තියෙන දෙයක්. සෑම පොලිස් කොට්ඨාශයකම කොට්ඨාශ බුද්ධි අංශයක් පවත්වාගෙන යනවා. ඒක පාලනය වෙන්නේ කොට්ඨාශ භාර නිලධාරී යටතේ එතකොට ඒ සඳහා සෑම පොලිසියකින්ම නිලධාරියෙකු හෝ දෙදෙනෙකු තමයි පත් කරන්නේ. ඒ නිලධාරියාට ඒ ප්‍රදේශය පිළිබඳ දැනුමක් සම්බන්ධයෙන් හොඳින් හොයලා බලලා තමයි ඔහුගෙන් ඒ අවශ්‍ය ඵලදායිතාවය ලබා ගැනීමේ හැකියාව මත තමයි එම නිලධාරීන් පත් කරන්නේ.

ප්‍ර : ඒ කියන්නේ ඔබගේ අධීක්ෂණය යටතේ තිබුණද මේ කොට්ඨාශ බුද්ධි අංශයක් කියලා එකක් සහ ඒ අනුව ඒ කොට්ඨාශ බුද්ධි අංශවලට පැවරී තිබුණු රාජකාරී මොනවද?

පි : කොට්ඨාශ බුද්ධි අංශවලට පැවරී තිබෙන්නේ ස්වාමීනි ඒ ප්‍රදේශයේ පිළිබඳ බුද්ධි තොරතුරු සොයා බැලීම. ඒ අනුව විශේෂයෙන් ඒ ප්‍රදේශයේ සාමාන්‍ය ජනතාවගේ නිදහසට බාධාවක් වන මත්ද්‍රව්‍ය කටයුතු, දූෂණ කටයුතු එතකොට එහෙම නැත්නම් අපරාධකරුවන් පිළිබඳ, ඒ හරහා අත්අඩංගුවට ගැනීමට සිටින පුද්ගලයන් පිළිබඳව සහ ඊට අමතරව යම් ආන්දෝලනාත්මක තොරතුරු මොනවා හරි

Fair Comment by Jezeem

තියෙනවා නම් ජාති, ආගම්, සංස්කෘතීන් පිළිබඳව. මේ සෑම තොරතුරක්ම සොයලා බලලා වාර්තා කිරීම ඔවුන්ගේ වගකීමක්.

ප්‍ර : ඒ අනුව ඔවුන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට වාර්තා, මාසිකව වාර්තා ලබාදීම් එහෙම සිද්ධ කරනවද?

පි : නැහැ ඔවුන් මාසිකව වාර්තා මට ලබා දෙන්නේ නැහැ. ඒක ඔවුන් තමා සම්බන්ධ වෙන්නේ කොට්ඨාශ භාර නිලධාරීන් අතරට. නමුත් පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හැටියට මම ගියාට පස්සේ මම මේ සියළුම නිලධාරීන්ව අවස්ථා 3 කදී කැඳවලා තියෙනවා ඒ වර්ෂ 2 ඇතුළත. ඒකෙදී මම ප්‍රමුඛතාවය අරන් තියෙනවා මේ බුද්ධි නිලධාරීන්ගේ වැදගත්කම. ඒ අනුව ඔවුන්ව පත් කිරීම සහ ඔවුන්ව දැනුවත් කිරීම පිළිබඳව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හරහා ඒ අවස්ථාවන් 3 ම ඔවුන්ව දැනුවත් කරලා තියෙනවා. ඒ අනුව නිලධාරීන් තෝරා ගැනීම ස්ථානාධිපතිවරයාගේ අභිමතය අනුව සිදු වෙන්නේ. නමුත් ඒ තෝරා ගන්නා නිලධාරීන් සම්බන්ධව නිසි ලේඛන පවත්වාගෙන යාම සහ ඔවුන් පිළිබඳ සෝදිසි අධීක්ෂණය ස්ථානාධිපතිවරයාට සෘජුවම පැවරෙනවා. නමුත් ස්ථානාධිපතිවරයාට වඩා ඒ කොට්ඨාශයේ ඉන්නවා වෙනම ස්ථානාධිපතිවරයෙක්. කොට්ඨාශ බුද්ධි ස්ථානාධිපති කියලා. ඔහු තමයි ඒ කොට්ඨාශයේ තියෙන පොලිසිවල බුද්ධි අංශ නිලධාරීන්ගේ අධීක්ෂණ කටයුතු කරන්නේ. ඔහු තමයි කොට්ඨාශ භාර නිලධාරියාට ඒ පිළිබඳව වාර්තා කරන්නේ. එහෙම විශේෂ මොනවා හරි වාර්තාවක් තියෙනවා නම් ඒක නියෝජ්‍ය පොලිස්පතිවරයාටත්, මටත් වෙනම එවනවා. ඊට අමතරව මගේ සාකච්ඡාවලදී ඔවුන් විශේෂ මොනවා හරි තියෙනවා නම් සඳහන් කරනවා. ඒ වගේම ඔවුන්ගේ රාජකාරී කටයුතුවල අරමුණු සහ බලාපොරොත්තු වෙනදේ මොනවද කියන එක ඔවුන්ව දැනුවත් කරලා තියෙනවා.

ප්‍ර : දැන් ඊට අමතරව ඔබලගේ නැගෙනහිර පළාතක් විදියට ගත්තාම රාජ්‍ය බුද්ධි අංශය, යුද හමුදා බුද්ධි අංශ එවැනි තවත් බුද්ධි අංශ ක්‍රියාත්මක වෙනවනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ බුද්ධි අංශ සමඟ ඔබලා තොරතුරු හුවමාරු කර ගැනීමක් සිද්ධ කරනවද?

පි : නැහැ පළාතක් හැටියට සහ දිසාවක් හැටියට එහෙම අපිත් එක්ක සෘජුවම සම්බන්ධ වෙන්නේ නැහැ. ඒ තොරතුරු වෙන්නේ ඔවුන්ගේ අධිකාරී නිලධාරීන්ට දැනුම්දීලා ඒ හරහා පොලිස්පතිතුමා වෙත දැනුම්දීලා එමගින් එන තොරතුරු අනුව තමයි අපිට දැනුවත් වෙන්නේ.

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි අංශයෙන් යම් තොරතුරක් ඔබලට ලැබෙනවා නම් ඒ ලැබෙන්නේ පොලිස්පතිතුමා හරහා පමණයිද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් ඔබලගේ කොට්ඨාශයේ වරෙන්තු ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මේ වරෙන්තු ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කුමන ආකාරයටද ඔබ හරහා අධීක්ෂණය වෙන්නේ කියලා කියන්න පුළුවන්ද මේ කොමිෂන් සභාවට?

පි : ස්වාමීනි පොදුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා හැටියට මගේ ප්‍රධාන වගකීමක් තමයි මුළු පළාතේම තියෙන වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගැනීම. ඒක නිසා මගේ ඔය ප්‍රගති සමාලෝචන මම මාස 3 ට සැරයක් පවත්වලා තියෙනවා. මම සාමාන්‍යයෙන් පවත්වන්නේ ඒ දිස්ත්‍රික්කයට ගිහිල්ලා. නැතුව මම ඉන්න ස්ථානයට ගෙන්නන්නේ නැහැ. ඒ නියෝජ්‍ය පොලිස්පති දිස්ත්‍රික්කයට ගිහිල්ලා මම හැම මාස 3 ට හෝ 4 ට වරක් සියළුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ස්ථානාධිපතිවරුන් ඒකට කැඳවලා ඒ සාකච්ඡාව පවත්වලා ඒක සටහනක් හැටියට ඇතුළත් කරලා ඒ සම්බන්ධයෙන් ඉදිරියට Progress එකක් බලාපොරොත්තු වෙනවා. ඒ සාකච්ඡාවේදී මම හුඟක් විශ්ලේෂණාත්මක වාර්තාවන් ඉදිරිපත් කරනවා. ඒ කියන්නේ ඒ වෙන කොට ඒ අදාල පළාතේ හෝ ඒ අදාල පොලිස් ස්ථානයේ තියෙන තත්ත්වය සහ ඒකේ වර්ධනය කරගත යුතු දේවල් ඒවා විශ්ලේෂණාත්මකව සටහන් කරනවා. එතකොට ඊලඟ අවස්ථාවේදී ඒකේ තියෙන අඩුපාඩුකම් ඒ අනුව අවස්ථාවන් 5 ක්, මම හිතන්නේ 5 ක් නැත්නම් 6 විතර මම පවත්වලා අවශ්‍ය උපදෙස් දීලා තියෙනවා. එතකොට එකේදීත් කරුණු 6 ක් යටතේ කරනවා. එකක් තමයි අපරාධ වාර්තාව වීම අපරාධ විසඳීම පිළිබඳව, ඊට පස්සේ මාර්ග අනතුරු පාලනය පිළිබඳව, ඊට පස්සේ විවිධ පැමිණිලිවල පැමිණිලි සම්බන්ධයෙන් තියෙන දුර්වලතාවයන්, එතකොට දූෂණ කටයුතු පිළිබඳව, මත් ද්‍රව්‍ය සම්බන්ධව වැටලීම් සම්බන්ධව තියෙන අඩුපාඩු, එතකොට ප්‍රජා පොලිස් කටයුතු, ප්‍රදේශයේ ප්‍රජා පොලිස් කටයුතු සහ ඒ සඳහා සහභාගී වන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, ඔවුන්ගෙන් දෙන සහාය පිළිබඳව මේ ආකාරයට වැදගත් මාතෘකා 7 ක් ඔස්සේ තමයි මේ සාකච්ඡාව කෙරෙන්නේ. ඒ අනුව ඒ පොලිසිවලින් ඒ කෙරෙන්න ඕන සියළු කටයුතු මම එතකොට මේ ඒ මාතෘකා 7 යටතේ ආවරණය වෙනවා. සියළුම පොලිස් රාජකාරී කටයුතු ටික. එතකොට ඔවුන්ට ඒක ලොකු අවස්ථාවක් වෙනවා ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කරන්න අදාල පොලිස්

Provisional Sinhala Copy
FAIR COMMENT BY JEZEEM

ස්ථානාධිපතිවරුන්ට, දිස්ත්‍රික් භාර නිලධාරීන්ට සහ නියෝජ්‍ය පොලිස්පතිවරයාට පවා.

ප : දැන් ඒ අනුව මඩකලපුව පොලිස් range එකේ ඊට අදාල වරෙන්තු මෙහෙයුම් සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට ඔබ පෙළඹුනාද?

පි : නැහැ මඩකලපුව දිස්ත්‍රික්කයට කියලා විශේෂයෙන් නැහැ, මගේ තියෙන්නේ පළාත තුලට. සමහර අවස්ථාවලදී මම සෘජුවම වෙනම කාල වකවානුව සඳහන් කරලා ක්ෂණිකව පණිවිඩ දෙනවා මුළු පළාතටම යම් යම් දේවල් කරන්න. මොකද කල් ඇතුව ඒවා දැනුම් දුන්නාම ඒකේ තොරතුරු එළියට ගියාම ඒකේ සාර්ථකත්වය නැති නිසා එහෙම අවස්ථා මම සෘජුවම කරනවා. ඊට අමතරව ඒක නියෝජ්‍ය පොලිස්පතිවරුන්, කොට්ඨාශ භාර නිලධාරීන් හා දිස්ත්‍රික් භාර නිලධාරීන් තම තමන්ගේ අධිකාරී බල ප්‍රදේශයන් තුළ ක්‍රියාත්මක කරලා මට වරින් වර ඒවායෙහි ප්‍රගතීන් වාර්තා කරන්න තියෙනවා.

ප : දැන් ඔබ රාජකාරී භාර ගත්තේ 2017.08.21, අගෝස්තු 21 වෙනිදා නේ?

පි : එහෙමයි.

ප : ඒ රාජකාරී භාර ගැනීමෙන් පස්සේ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් යන පුද්ගලයා ගැන මුලින්ම ඔබ දැනුවත් වෙන්නේ කොයි කාලෙද?

පි : ස්වාමීනි ඇත්ත වශයෙන්ම මම වාර්තා කළාට පස්සේ මට මේ නමක් කියන එක විශේෂයෙන් වාර්තා වෙන්නේ නැහැ. මේක මොකද හේතුව දැන් පසුව දැන ගත්තු සිද්ධිය තමයි ඔය කාත්තන්කුඩි අලියාර් සිද්ධිය. 2017 මාර්තු මාසේ 10 වෙනිදා වෙච්ච සිද්ධිය. නමුත් මං වාර්තා කරන කොට ඒ සිද්ධිය වෙලා මාස 5 ට, 6 ට ආසන්න ප්‍රමාණයක්. නමුත් එතකොට ඒ සිද්ධිය සම්බන්ධව යන විමර්ශනයේ ප්‍රගති වාර්තා ගොනුවක් තමයි මගේ හරහා යැවෙන්නේ. නමුත් ඒ ප්‍රගති වාර්තා ගොනුව බලපු ගමන්ම නම තිබ්බට නම හිතේ රැඳෙන නමක් නෙමෙයි මොකද මේ වගේ ගොණු ප්‍රගති ගොණු ගණනාවක් එහාට මෙහාට සංසරණය වෙනවා. ඒක නිසා ඔහු සම්බන්ධයෙන් විශේෂ අවධානයක් ඒ මුල වකවානුවේ එහෙම තිබුණේ නැහැ ස්වාමීනි.

ප : සාමාන්‍යයෙන් හරි අවධානයක් යොමු වුණේ 2017 කොයි කාලයේද කියලා කියන්න පුළුවන්ද මහත්මයාට?

පි : ඒකේ මම හිතන්නේ මට මතක හැටියට මම ආවට පස්සේ 2017 සැප්තැම්බර්, ඔක්තෝබර් විතර නිර්ණාමිකව පොලිස්පතිතුමාගෙන් ලිපියක් ආවා ඔය NTJ සම්බන්ධතාව කියන ඔය සහරාන් පුද්ගලයාගේ සමාජ ජාලා වෙබ් අඩවියේ සම්බන්ධයෙන් ආපු

President's Secretariat
FAIR COMMENT BY JEZEEM

තොරතුරු කිහිපයක් විමර්ශනය කරන්න. ඒකෙන් අභිප්‍රේරණය වෙනවා IS මතවාදය. අන්න එතකොට තමයි පොඩි මතකයක් ආවේ, මේ මොකක්ද මේ කියන එක. මේ මෙයා මේ පුද්ගලයා.

ප්‍ර : දැන් ඔබ ඔය සඳහන් කරන ලිපිය ආවේ කාගෙන්ද?

පි : ඒක පොලිස්පතිතුමාගෙන්.

ප්‍ර : පොලිස්පතිතුමාගෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත ආමන්ත්‍රණය කරපු ලිපියක්ද?

පි : ලිපියක් එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ ලිපියෙහි පොලිස්පතිතුමා ඔබට මොකක්ද කරන්න කියලා තියෙන්නේ?

පි : ඒ කරලා තිබුණේ මේ ගැන පරීක්ෂා කරලා වාර්තා කරන්න.

ප්‍ර : මොකක් ගැනද පරීක්ෂා, ඒ ලිපිය ඔබ සතුව තියෙනවද?

පි : එය තියෙනවා ස්වාමීනි.

ප්‍ර : මෙම ලිපිය කවුරුන් විසින් කා හට එවපු ලිපියක්ද මහත්මයා?

පි : පොලිස්පතිතුමා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට එවපු එකක් 2017.

ප්‍ර : ඒ අනුව පොලිස්පතිතුමාගේ අත්සන තිබෙනවද?

පි : අත්සන තිබෙනවා.

ප්‍ර : ඔබගේ කාර්යාලයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයෙන් එම ලිපිය ලබා ගැනීමේදී මුද්‍රාවක් තියෙනවද?

පි : මුද්‍රාව තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒ මුද්‍රාව තබලා අත්සන තිබෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඔබට මෙම ලේඛනය හඳුනා ගන්න පුළුවන්ද?

පි : පුළුවන්.

<u>ස්වාමීනි සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන 2017.10.11 දිනැති පොලිස්පතිතුමා විසින් එවන ලද NTJ නායකයා විසින් සමාජ ජාලා හරහා සිදු කරන ප්‍රචාරණ සම්බන්ධව මැයෙන් ඇති ලේඛනය C1006 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා.</u>

ප්‍ර : දැන් මහත්මයා මේ C1006 ලේඛනයෙන් පොලිස්පති පූජිත් ජයසුන්දර මහත්තයා ඔබට කරන්න කියලා හෝ ඔබගේ අවධානය යොමු කරලා තියෙන්නේ කුමන කාරණයක් සම්බන්ධයෙන්ද?

පි : ඒකේ තියෙන්නේ NTJ නායකයා කියන පුද්ගලයෙක් එයා සමාජ ජාලා හරහා සිදු කරන ප්‍රචාරණයක් සම්බන්ධයෙන් එවලා තියෙනවා නිර්නාමික ලිපියක්. ඒ නිර්ණාමික ලිපිය සම්බන්ධයෙන් බලලා පරීක්ෂා කරලා මගේ ඔබ්සවේෂන් ඉදිරිපත් කරන්න.

ප්‍ර : ඔබ ඒ අනුව පරීක්ෂා කිරීමක් කළාද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් මම මේක මගේ නියෝජ්‍ය පොලිස්පතිවරයාට දාලා ඒ හරහා කොට්ඨාශ බුද්ධි ස්ථානාධිපතිවරයා හරහා මේ ගැන පරීක්ෂා කරලා වාර්තාවක් කැඳවලා තියෙනවා.

ප්‍ර : ඒ අනුව මොනවද ඔබට මේ මොහොමඩ් කාසිම් මොහොමඩ් සහරාන් ගැන අනාවරණය වුණේ?

පි : ඒකෙන් පරීක්ෂණ වාර්තාවෙන් අනාවරණය වෙලා තියෙන්නේ ඒ මේ කියපු විදියට මේ පුද්ගලයාගේ නිකාය පිළිබඳව මෙයා කලින් මේ ලියාපදිංචි වෙලා තියෙනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ. එතකොට එයාගේ මතවාදයන් වැඩි දියුණු කරන්න එයා මේ සමාජ ජාලා වෙබ් අඩවිය පාවිච්චි කරලා තියෙනවා. නමුත් ඒකෙන් මේ IS මතවාදයන් හෝ වෙනත් අන්තවාදී කටයුත්තක් සිදුවෙලා නැහැ. ඒකේ දාලා තියෙනවා ඒකේ පින්තූරත් තියෙන්නේ එයාගේ අර අලියාර් සිද්ධියේදී තුවාල වෙච්ච පුද්ගලයෝ, ඊට අමතරව එයත් එක්ක ඉදලා මැරිච්ච අය, ඒ හැරෙන්න වෙන IS මතවාදය සම්බන්ධයෙන් ඉන්න ත්‍රස්තවාදීන්ගේ පිංතූරවත් ඒවත් මුකුත් මේකෙන් සිද්ධ වෙන්නේ නැහැ. එයා මේක පාවිච්චි කරන්නේ එයාගේ මතවාදය වැඩි දියුණු කරලා එයාට වැඩිපුර තරුණ කොටස් සම්බන්ධ කර ගැනීමේ අභිලාෂයක් කියන එක තමයි වාර්තා වෙලා තිබුණේ.

ප්‍ර : දැන් ඒ වාර්තාව ඔබ පොලිස්පතිතුමාට යවන්නේ කවදා දිනයකින්ද?

පි : ඊට පස්සේ එම වාර්තාව මම 2017.11.20

ප්‍ර : 2017.11.20 වෙනිදා වෙන කොට ඔබ දැන් ඔය කියන කරුණු සඳහන් කරලා පොලිස්පතිතුමාට යවනවද ඒ වාර්තාව?

පි : වාර්තාවක් යවනවා ස්වාමීනි.

ප්‍ර : ඒ වාර්තාව ඔබ සතුව තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

<u>ස්වාමීනි ඒ අනුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නැගෙනහිර විසින් පොලිස්පතිතුමා ආමන්ත්‍රණය කරමින් 2017 නොවැම්බර් 20 දිනැතිව යවන ලද ලිපිය C1007 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා</u>.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

සාක්ෂිකරු මාර්ගයෙන් ලකුණු කරන ලද C1006 සහ C1007 දරන ලේඛන සාක්ෂිකරු භාරයේ ඇති රාජකාරිමය ලිපිගොනුව මගින් ලකුණු කරන ලද මුල් ලේඛන හෙයින් ඒවායෙහි ඡායාස්ථිත පිටපතක් ලබාගෙන සහතික කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරන අතර,

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ඉන්පසුව මුල් ලේඛන අදාල ගොනුව කොමිෂන් සභාවට රැගෙන ආ නිලධාරීයාට නිදහස් කරන ලෙසට නියෝග කරමි.

****

<u>රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා</u>

ප්‍ර : ජයසේකර මහත්තයා දැන් 2017 නොවැම්බර් 21 වන දින වන කොට ඔබ දැනුවත් වුණාද මේ සහරාන් හෂීම් කියන පුද්ගලයට විරුද්ධව වරෙන්තුවක් තියෙනවා කියලා?

පි : එහෙම මට ලොකු මතකයක් නැහැ ස්වාමීනි. නමුත් මා හිතන්නේ වරෙන්තු, මගේ සමාලෝචනවලදී මට මතකයේ හැටියට වරෙන්තුවක් තිබුණා කියන එක මතකයක් තියෙනවා.

ප්‍ර : සහ ඊට අමතරව පොලිස්පතිතුමා විසින් දැනුවත් කරලා තියෙනවා ඔහු මේ අන්තවාදී මතවාදයක් සමාජ ජාලා හරහා ප්‍රචාරණය කරනවා, ඒ ගැනත් විමර්ශනය කරලා බලන්න කියලා කිව්වොත් නිවැරදි ද?

පි : එහෙමයි. මේ වාර්තාවේ හැටියට නිර්නාමික වාර්තාවක් එවලා තියෙනවා. එතකොට ඒ අනුව තමයි සඳහන් වෙලා තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඔබ හොයලා බැලුවද මේ සහරාන් හෂීම් කියන්නේ කවුද ඔහුගේ මොකක්ද මේ ආගමික මතවාදය, මේ වන කොට ඔහු කොහේද ඉන්නේ කියන එක සම්බන්ධයෙන් ඔබ හොයලා බැලුවද?

පි : එහෙමයි ස්වාමීනි, ඊට පස්සේ අර ඔහු සම්බන්ධයෙන් අලියාර් සිද්ධිය සම්බන්ධයෙන් ගොනුව පරිහරණය කිරීමේදී ඒ පුද්ගලයන් ඒ සිද්ධියෙන් පස්සේ ප්‍රදේශයෙන් පලාගොස් තියෙනවා කියන එක තහවුරු වෙලා තියෙනවා. එතකොට ඔවුන් සම්බන්ධයෙන් වෙනත් කිසිම තොරතුරක් ඒ ප්‍රදේශය තුළ අපිට සොයා ගැනීමට නොහැකි වෙලා තියෙනවා කියන එක නියෝජ්‍ය පොලිස්පතිවරයා වරින් වර ඉදිරිපත් කරන වාර්තාවලින් මට තහවුරු කරලා තියෙනවා.

ප්‍ර : දැන් ඔබ සඳහන් කළා ඔබ නිරන්තරයෙන් මේ වරෙන්තු මෙහෙයුම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙනවා කියලා. දැන් දිගින් දිගටම මේ සහරාන් හෂීම්ට පැවති වරෙන්තුව ක්‍රියාත්මක කර ගන්න නොහැකි වුණානේ. ඒ සම්බන්ධයෙන් ඔබ මොනවද ගත්ත පියවර?

පි : ස්වාමිනී මේක ඒ අලියාර් සිද්ධියේ ප්‍රගති ගොනුව මට මතකයේ හැටියට මම දකින්නේ මුලින්ම ඔය සැප්තැම්බර් මාසේ විතර. ඒකේ දෙවෙනි අවස්ථාවේදී මම සඳහන් කරලා තිබුණා ඒකේ විමර්ශනවල තිබුණා ඔහුගේ හැඳුණුම්පත සම්බන්ධයෙන් විමර්ශනය කරලා ඒකේ සිම්පත් පිළිබඳව පරීක්ෂණයක් කරලා තිබුණේ නැහැ. ඒ සම්බන්ධයෙන් මම උපදෙස් දීලා තිබුණා.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් විස්තර ලබා ගන්න කියලද උපදෙස් දීලා තිබුණේ?

President Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඔව් ඒ සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් ලබාගෙන අවශ්‍ය විමර්ශන කරන්න කියලා මම මේ ගොනුවේ සඳහන් කරලා තියෙනවා.

ප්‍ර : ඔබට හිතුන් නැද්ද මේ සහරාන් හෂීම් කියන පුද්ගලයාට විරුද්ධව විවෘත වරෙන්තුවක් ලබාගෙන දිවයිනේ තියෙන අනෙකුත් කොට්ඨාශවලටත් ඔහු සම්බන්ධයෙන් හොයන්න කියලා දැනුවත් කරලා ඔහුව අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුමක් ක්‍රියාත්මක කරන්න?

පි : එහෙම අවශ්‍යතාවයක් මට නම් පැන නැඟුනේ නැහැ, මොකද හේතුව අලියාර් සිද්ධියේදී ඔහුට චෝදනා තියෙන්නේ සංඥය වැරදි සම්බන්ධයෙන්. එතකොට ඒවට අපිට ඕනම අවස්ථාවකදී වරෙන්තුවක් නැතුව අත්අඩංගුවට ගන්නත් පුළුවන්. අපිට තොරතුරු තියෙනවා නම් මගේ පළාතෙන් පිටත ගිහිල්ලා පොලිස්පතිතුමාගේ අවසරය ඇතුවත් අත්අඩංගුවට ගැනීමේ හැකියාවක් තිබුණා.

ප්‍ර : දැන් ඒ අනුව සාමාන්‍යයෙන් මහත්මයා ඔබලගේ තියෙනවානේ බුද්ධි කොට්ඨාශ බුද්ධි අංශ රැස්වීම්?

පි : ඔව් ස්වාමීනි.

ප්‍ර : ඒ රැස්වීම්වලදී දැනුවත් කළාද මෙවැනි වරෙන්තුකරුවන් පොලිසිය මඟ හරිමින්, අධිකරණය මඟහරිමින් යන වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් කොට්ඨාශ බුද්ධි අංශයත් දැනුවත් කළාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔවුන්ගෙන් අනාවරණය වුණාද මේ සහරාන් හෂීම් කොහේද සැරි සරන්නේ, ඔහු කොයි පළාතේද එනවා යනවා සිද්ධ වෙනවද, ඒ සම්බන්ධයෙන් ඔබලා විමර්ශනය කරලා බැලුවද?

පි : ඔවුන්ට මම වාචිකව සහ ලිඛිතවත් ඒකේ දැනුම් දීලා තියෙනවා. ඒ කාත්තන්කුඩි මඩකලපු විතරක් නෙමෙයි මගේ කොට්ඨාශ හතරටම. ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට පවා. නමුත් ඔවුන් ඒකේ සොයා බලලා තියෙනවා විවිධ විදියට. එකක් තමයි තොරතුරුකරුවන් මගින්, ඊලඟ තමයි අපේ ප්‍රජා පොලිස් කටයුතු සම්බන්ධයෙන්. මොකද ඒක තමයි ලංකාව තුළ ක්‍රියාත්මක වෙන බොහොම මහජනතාව සමඟ බොහොම ඉතා ලඟින් සම්බන්ධ වෙන හොඳම සංකල්පය. ඊට අමතරවත් ප්‍රදේශයේ ප්‍රභූවරු, ආගමික නායකයන් මාර්ගයෙන් මේ සම්බන්ධයෙන් තොරතුරු සොයා බලලා සෑම වරෙන්තුකරුවෙක්, ඒ වගේම සෑම අත්අඩංගුවට ගැනීමට නොහැකි වෙලා තියෙන අපරාධකරුවන් සම්බන්ධයෙන් එහෙම නැත්නම් ප්‍රදේශයේ මොනවා හරි ආගමික, දේශපාලනික හෝ සංස්කෘතික ජාතික වශයෙන් වැදගත් වෙන නැත්නම් හානිදායක වන ඕනෑම තොරතුරක්

Presidential Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

සම්බන්ධයෙන් තියෙනවා නම් වහාම ඒ පිළිබඳව තොරතුරු ලබා දෙන්න.

ප : දැන් මේ කුමන මෙහෙයුම තිබ්බත් ඔබ රාජකාරී පටන් ගත්තු දවසේ ඉදලා 2019 අප්‍රේල් 21 දක්වාම සහරාන් හෂීම් ගැන ඔබගේ සාමාන්‍ය පොලිස් අංශයකටවත්, බුද්ධි අංශයකටවත් තොරතුරු අනාවරණය කර ගැනීමට හැකියාවක් ලැබුණේ නැද්ද?

පි : නැහැ ස්වාමිනී.

ප : ඔබ ඒකට හේතුව විදියට දකින්නේ මොකක්ද? ඒ ඔවුන් අනාවරණය කර ගැනීමට බැර වුණු හේතුව?

පි : විශේෂ හේතුවක් කියන්නේ ස්වාමීනි සාමාන්‍යයෙන් ඉතින් වරෙන්තුකාරයෝ හැටියට මෙතන ඉන්න සැකකරුවන් තුන්දෙනා විතරක් නෙමෙයි මුළු පළාතේම බැලුවොත් වරෙන්තුකාරයෝ වරෙන්තු සම්බන්ධයෙන් 500 ගානක් 600 ගානක් තියෙනවා අපිට අත්අඩංගුවට ගැනීමට. නමුත් අභිප්‍රාය තමයි මගේ සමාලෝචනවලදී කොහොම හරි අපේ එලදායීතාවය වැඩි කරගන්න. මේක පුළුවන් තරම් අවම කර ගන්න. සහ අවම කර ගැනීමට නිලධාරීන්ව දිරිගන්වන එක උනන්දු කරවන එකට. එතකොට මේ සහරාන් කියන පුද්ගලයා ඇතුළු වරෙන්තු කණ්ඩායම මේකටම ඇතුලත් වෙන කණ්ඩායමක්. එතකොට ඒ අනුව පොදු උපදෙස් මාලාවේ තමයි අපි කටයුතු කරන්නේ. ඒකේ වගකීම් පැවරෙනවා ස්ථානාධිපතිවරයාට සෘජුවම. සහ දිස්ත්‍රික් භාර නිලධාරියාට. ඔවුන්ගේ යම් යම් ඒවා සෘජුවම සොයා බලලා මේ කියන එලදායීතාවය අත්කර ගන්න.

ප : දැන් ජයසේකර මහත්මයා කොමිෂන් සභාවට ලකුණු කරලා ඉදිරිපත් කළා C1006 කියන පොලිස්පතිතුමා විසින් මේ සහරාන් හෂීම්ගේ සමාජ මාධ්‍ය ක්‍රියාකලාපය ගැන හොයන්න කියලා එවපු ලිපිය?

පි : එහෙමයි ස්වාමීනි.

ප : ඊට අමතරව පොලිස්පතිතුමා විසින් ලිපියක් එවලා තියෙනවද ඔහුව අත්අඩංගුවට ගන්න හෝ ඒ සම්බන්ධයෙන් වැටලීම් හෝ ක්‍රියාත්මක කරන්න කියලා යම්කිසි උපදෙස් එවලා තියෙනවද ඊට අමතරව, C1006 ට අමතරව?

පි : අත්අඩංගුවට ගැනීම කියන්නේ ස්වාමීනී අර අලියාර් සිද්ධියේ, අලියාර් සිද්ධියේදී වරෙන්තුකරුවන් සම්බන්ධයෙන් ඒ ප්‍රගතිය සම්බන්ධයෙන් දැනුම් දෙන වාර්තාවේ පොලිස්පතිතුමාට වාර්තා ඉදිරිපත් කරලා තියෙනවා. ඒක නම් ඒගොල්ලන් අත්අඩංගුවට අර ගන්න විදිහක් ගත්තේ නැහැ. මේ තොරතුරු නැති නිසා. ඒක කඩිනමින් මේවා කරන්න කටයුතු කරනවා. ඒ නඩුවේ ප්‍රගතිය සම්බන්ධයෙන් දිගින් දිගට වාර්තා කරමින් පවත්වාගෙන ගියා.

ප්‍ර : පොලිස්පතිතුමා විසින් ඔබට එවන ලිපි ලේඛනවල ඒ කියන්නේ ඔබ වැඩ භාරගත් දිනයේ සිට 2019 අප්‍රේල් 21 දක්වා වන ලිපි ලේඛනවල අන්තර්ගත වෙනවද මේ නැගෙනහිර පළාතේ සහරාන් හෂීම් කියන යන පුද්ගලයාගේ අන්තවාදී ක්‍රියාකාරකම් වැඩි වෙනවා, හෝ ඒ සම්බන්ධයෙන් සොයා බලන්න කටයුතු කරන්න යන උපදෙස් තියෙන ලිපි අන්තර්ගත වුණාද?

පි : එහෙම නැහැ ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ මේ C1006 කියලා දැන් ඔබ ඉදිරිපත් කරපු ලිපියට අමතරව වෙන කිසිදු ලිපියක් සහරාන් ගැන සොයා බලන්න කියලා ලිපියක් ඉදිරිපත් වුණේ නැද්ද ඔබට?

පි : තියෙනවා ස්වාමීනි.

ප්‍ර : මොනවද තවත් තියෙන ලිපි?

පි : මේ ලිපියේ තියෙන්නේ මේක මම ඉන්න වකවානුවේ නෙමෙයි මේක මට පෙර ඉන්න ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ඉන්න වකවානුවේ. ඒ කියන්නේ අලියාර් සිද්ධිය සිදු වුණේ මාර්තු 10. මේක 2017.04.30 වෙනිදා තමයි පොලිස්පතිතුමා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට ඉදිරිපත් කරන්නේ. ඒකේ තියෙන්නේ ඉස්ලාම් ආගමට විරුද්ධව කියන සංකල්පය යටතේ වෙච්ච වාර්තාවක්. ඒක ඉදිරිපත් කරලා තියෙන්නේ අල්හාජ් අබ්දුල් ජාවත් අලීම් වලිවුල්ලා ට්‍රස්ට් කියන සංවිධානය. ඒ කියන්නේ මේ මම හිතන්නේ සුන්නතුල් වල්ජමාත් නිකාය විසින් ඉදිරිපත් කරන ලද ලිපියක්.

ප්‍ර : ඒ ලිපිය පොලිස්පතිතුමා විසින්ද ඔබට ඉදිරිපත් කරලා තියෙන්නේ?

පි : පොලිස්පතිතුමා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට තමයි ඉදිරිපත් කරලා තියෙන්නේ.

ප්‍ර : ඒ අනුව රාජකාරී ලිපි ගොනුවේ එම පොලිස්පතිවරයා විසින් එවකට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට ලැබිච්ච ලිපිගොනුවේ ඔය ලේඛනය අන්තර්ගත වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මෙම ලේඛනය ලැබිච්ච දවස කවද්ද මහත්මයා, ලේඛනයට අනුව ගොනුවට අනුව? දැන් මේ ලේඛනය ලැබෙන කොට දැන් ඔය අල්හාජ් ජවාත් වලිඋල්ලා ට්‍රස්ට් නැමැති ආයතනය මගින් මේ සම්බන්ධයෙන් පැමිණිලි කරලා ලේඛනය ලැබෙන කොට කවුද ඒ පළාතේ ඒ වකවානුව වෙන කොට හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කියලා මහත්මයාට කියන්න පුළුවන්ද?

පි : පුළුවන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සුමිත් එදිරිසිංහ මහතා ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඔය පැමිණිල්ල මුලින්ම ලැබිලා තියෙන්නේ කවද්ද කියලා කියන්න පුළුවන් මේ කොමිෂන් සභාවට?

FAIR COMMENT BY JEZEEM

පි : අප්‍රේල් 20 ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට.

ප්‍ර : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට ලැබිලා තියෙන්නේ 2017 අප්‍රේල් 20 වෙනිදා?.

පි : 20 වෙනිදා.

ප්‍ර : පොලිස්පතිතුමාට යොමු කරලා තියෙන්නේ ලිපිය කවද්ද?

පි : ඒකට පිළිතුරු ලිපිය

ප්‍ර : නැහැ, සුන්නතුල් වල්ජමාත් නැත්නම් වලිඋල්ලා ට්‍රස්ට් ආයතනය විසින් පොලිස්පතිතුමාට පැමිණිල්ල එවලා තියෙන්නේ කවද්ද?

පි : 2017.03.27

ප්‍ර : 2017 මාර්තු 27?

පි : මාර්තු 27.

ප්‍ර : ස්වාමීනි 2017 මාර්තු 27 දිනැති අල්හාජ් අබ්දුල් ජවාත් ආලිම් වලිඋල්ලා ට්‍රස්ට් නැමති ආයතනය විසින් පොලිස්පතිතුමාට එවන ලද

පි : අප්‍රේල් 13 තමයි පොලිස්පතිතුමාගේ කාර්යාලයේ ඒක මුද්‍රා **<u>පොලිස්පතිතුමා විසින් 2017.04.13 විසින් ලද ලිපිය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නැගෙනහිර පළාතට යොමු කරලා තියෙනවා 2017.04.30 වෙනිදා. එම ලේඛනය C1008 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා.</u>**

පි : එකේ සිංහල සහ ඉංග්‍රීසි පිටපත් 2 ක් තියෙනවා. සහ ඒකේ පිටපත් ඉදිරිපත් කරලා තියෙනවා අතිගරු ජනාධිපතිතුමා, අතිගරු අගමැතිතුමා..

ප්‍ර : හරි ඔය දැන් C1008 ලේඛනය පරීක්ෂා කරලා ඔබට කියන්න පුළුවන්ද ඔය අල්හාජ් අබ්දුල් ජවාත් ආලිම් වලිඋල්ලා ට්‍රස්ට් කියන ආයතනය විසින් තමාගේ පැමිණිල්ල ඉදිරිපත් කරපු පොලිස්පතිතුමා හැරුණාම තවත් පුද්ගලයෝ කවුද කියලා?

පි : ඔව් මේ වාර්තාවේ හැටියට ඒකේ පිටපත් වශයෙන් ඇතුලත් කරලා තියෙනවා ස්වාමීනි අතිගරු ජනාධිපතිතුමාට, ගරු අගමැතිතුමාට, ගරු අධිකරණ ඇමතිතුමා විජේදාස රාජපක්ෂ මහත්මයට, නීතිය හා සාමය ඇමති ගරු සාගල රත්නායක මහත්මයාට, ආරක්ෂක රාජ්‍ය ඇමති එවකට ගරු රුවන් විජේවර්ධන ඇමතිතුමාට Chief Justice අග්‍රවිනිශ්චයකාරතුමාට, සභාපති අධිකරණ සේවා කොමිෂමට, ආරක්ෂක ලේකම්තුමාට, නීතිපතිතුමාට සහ නියෝජ්‍ය පොලිස්පති ත්‍රස්ත විමර්ශන ඒකකය.

ප්‍ර : ඒ ඔය පැමිණිල්ල යොමු කරපු ආයතන කිව්වොත් නිවැරදි ද?

පි : නිවැරදියි.

ප්‍ර : දැන් මේ පැමිණිල්ල අල්හාජ් අබ්දුල් ජවාත් ආලිම් වලිඋල්ලා පැමිණිල්ලට ප්‍රකාරව ඔහු එවනවානේ පොලිස්පතිතුමා එය ඔබට යොමු කරනවානේ

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව ඔබ මොකක්ද ඒ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ගය?

පි : මේක මට ඊට කලින් හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා. .

ප්‍ර : එතුමාට තමයි ලැබෙන්නේ ඔබ වැඩ භාර ගත්තට පස්සේ ඔබ ගන්න ක්‍රියාමාර්ග මොනවද?

පි : මේක කලින් හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ඉදිරිපත් කරලා ඒක අනුව ඒක විමර්ශනයක් කරලා තියෙනවා. ඒ විමර්ශනයෙන් පස්සේ පොලිස්පතිතුමාට වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවා 2017.05.24 දින.

ප්‍ර : 05.24. එය ඉදිරිපත් කරල තියෙන්නෙත් ඔබට කලින් හිටපු පුර්වගාමී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා?

පි : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාට.

ප්‍ර : ඒ ලිපියත් මේ ගොනුවේ අන්තර්ගත වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ ලිපිය කවුද යවලා තියෙන්නේ, මොන පොලිස්පතිතුමාගේ නම කියන්න ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ?

පි : ඊ.ඒ.සුමිත් එදිරිසිංහ මහත්මයා.

ප්‍ර : ඔහු යවලා තියෙන්නේ කාටද?

පි : යවලා තියෙන්නේ පොලිස්පතිතුමාට. පොලිස් මූලස්ථානයට

ප්‍ර : පොලිස්පතිතුමාට යවලා තියෙන්නේ කවද්ද?

පි : 2017.05.24 වන දින ස්වාමීනි.

<u>ස්වාමීනි 2017.05.24 දිනැති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ඊ.ඒ. සුමිත් එදිරිසිංහ මහතා විසින් යවන ලද වාර්ථාව C1009 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.</u>

ප්‍ර : මහත්මයා මේ C1009 ලේඛනය පරීක්ෂා කරලා බලලා කියන්න මොකක්ද මේ වෙන කොට පොලිසිය විසින් මේ සිද්ධිය සම්බන්ධයෙන් අනාවරණය කරගෙන තියෙන තොරතුරු මොනවද?

පි : ස්වාමීනි ඒ වාර්තාව අනුව කියලා තිබුණේ පැමිණිල්ල අනුව කියලා තිබුනේ සහරාන් ඇතුළු කණ්ඩායමේ අනිසි හැසිරීම්, ඒගොල්ලන්ගේ IS මතවාදයන් අභිප්‍රේරණය කිරීම, මුස්ලිම් ආගමට නිහාවෙන ආකාරයට කටයුතු කිරීම, ඒගොල්ලන්ගේ ඉස්ලාම් ධර්මයට අගෞරව කිරීම පොදු තේමාව, එතකොට මෙයා IS සංවිධානයේ මතවාදයන්වලට කටයුතු කරනවා. ඔවුන් සමඟ එම ගණුදෙනු කිරීම සම්බන්ධයෙන් තමයි මේවා ඉදිරිපත් කරලා තිබුණේ. ඒ අනුව මේ ගැන පරීක්ෂා කරලා ඒ ප්‍රදේශයේ සාමය ඇති කරන්න අවශ්‍ය පියවර ගන්න කියලා තමයි පැමිණිල්ලෙන් ඉල්ලලා තිබුණේ.

ප්‍ර : ඒ වලිඋල්ලා භාරයෙන් ඉල්ලලා තිබ්බේ එසේ ක්‍රියාත්මක කරන්න කියලා?

පි : කරන්න කියලා.

ප්‍ර : ඒ මත ඔබලගේ පොලිසිය පරීක්ෂණය කරනවානේ. පරීක්ෂණය කරලා පොලිස්පතිතුමාට යවනවානේ වාර්තාවක් ඇති දැන් ලකුණු කලේ C1009 වාර්තාව?

පි : එහෙමයි ස්වාමිනී.

ප්‍ර : එතකොට ඒකේ මොනවද ඔබලට අනාවරණය වෙලා තියෙන්නේ? මොනවද ඔබලා හොයා ගත්තේ?

පි : ඒකේ අනාවරණය වෙලා තියෙන්නේ ස්වාමීනි එකේ සඳහන් වෙලා තියෙනවා අපේ බුද්ධි අංශ වාර්තාවත් එක්ක 2016.02 මාසෙ 05 වෙනි මාසෙයි. 02 වන මාසේ එක රැස්වීමක්, 05 වන මාසේ රැස්වීම් 2 ක්, 06 වන මාසේ රැස්වීමක්, සහරාන් විසින් ඒ ප්‍රදේශයේ පවත්වලා තිබෙනවා.

ප්‍ර : කොහේද පවත්වලා තියෙන්නේ?

පි : කාත්තන්කුඩි ප්‍රදේශයේ. එතකොට 2017.03 මාසේ පවත්වලා තියෙනවා. එතකොට 2017.03 වන මාසේ තව එකක් පවත්වලා තියෙනවා. එතකොට මේ හැම රැස්වීමකදීම පවත්වලා තියෙන්නේ රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය නීත්‍යානුකූල බලතල පොලිසියෙන් අරගෙන. නමුත් ඒ රැස්වීම්වලද ඔහු සාකච්ඡා කරපු බවට කියලා තියෙන්නේ 2016 රැස්වීම් දෙකේ සාකච්ඡා කර තියෙන්නේ නබීනායක තුමාගේ උපන් දිනය සැමරීම වැරදි ක්‍රියාවක් කියන එක, එතකොට ඒකේ 2016.05 වන මාසේ රැස්වීමේ කතා කරලා තියෙන්නේ මුස්ලිම් ජනයා මුදල් හා භාණ්ඩ පොළියට ලබාදීම වැරදි ක්‍රියාවක් කියන එක මතය ඉස්මතු කිරීමට. 2016.05 වන මාසේ ඊලඟ එක පවත්වලා තියෙන්නේ ඉස්ලාම් ධර්මයට අනුව රාම්සාන් දිනය සැමරිය යුතු ආකාරය තේමාව සම්බන්ධයෙන්. එතකොට 2016.06 මාසේ පවත්වලා තියෙන්නේ මුස්ලිම් ජනයාගේ පිළිකාව සිය හා සුපාව කියන තේමාව යටතේ ඒ රැස්වීම්. එතකොට 2017.03 වන මාසේ 02 පවත්වලා තියෙනවා මුස්ලිම්වරු නිදහස් උත්සවයක් පැවැත්විය යුතු ද කියන තේමාව යටතේ එහෙම අවශ්‍ය නැහැ කියන එක. එතකොට 2017.03 මාසේ 04 වෙනි දින පවත්වලා තියෙන්නේ ඒ අර ආකාරයටම යම් යම් ජාතිවාදී හැඟීම් ඉස්මතුවන ආකාරයට සාකච්ඡාව පැවැත්වුවා කියලා ඒක නිසා ඔහුගේ අනුගාමිකයන් මේකෙන් බොහොම අපහසුතාවයට සහ අකමැත්තට පත් වුණා කියලා තමයි දාලා තියෙන්නේ. ඒ අනුව අවසන් නිර්දේශයේ තියෙනවා මේක මේ සුන්නත් වල්ජමාත් සංවිධානය විසින් ඉදිරිපත් කරලා තියෙන්නේ, මේ නිකායන් දෙක අතර තියෙන එදිරිවාදීකම් නිසා මේ ඉදිරිපත් කරපු වාර්තාවක්, ඒ ඇරෙන්න මේක ඔවුන් IS සංවිධානයේ මතවාදයන් හෝ එහෙම නැත්නම් යම් ප්‍රචණ්ඩකාරී

Presidential Secretariat Copy
LEAK COMMENT BY JEZEEM

කටයුත්තක්, අන්තවාදී ක්‍රියාවක් සිදු වන බවත් අනාවරණය වෙන්නේ නැහැ කියලා තමයි ඒ වාර්තාවේ නිර්දේශ කරලා තියෙන්නේ.

ප : ඒ කියන්නේ ඔබලාගේ විමර්ශනවලින් ඒ වෙන කොට අනාවරණය වෙලා තියෙන්නේ සහරාන් හෂීම්නුයි සුන්නතුල් වල්ජමාත් අතර තියෙන්නේ නිකාය ගැටමුක් පමණයි නමුත් IS මතවාදයේ පැත්තට යොමු වෙච්ච නිකායක් නෙමෙයි කියලා මේ සහරාන්?

පි : එහෙමයි ස්වාමීනි. ඒ කියන්නේ දෙගොල්ලන් අතර තියෙන මතවාදය එකිනෙකා පරයා චෝදනා කර ගැනීම, ඒක නිසා අනික් මතවාදය දරන්නන් මේ මතවාදය දරන්නන් අපහසුතාවයට පත් කිරීම කියන තේමාව තමයි අනාවරණය වෙලා තියෙන්නේ කියලා තමයි වාර්තා වෙලා තියෙන්නේ.

ප : දැන් ඒ ඔබ රාජකාරීය භාර ගන්නට ප්‍රථමයෙන් ආපු පැමිණිල්ලක් ප්‍රකාරව යවපු වාර්තාවක් නේ. ඔබ රාජකාරී භාර ගත්තට පස්සේ පොලිස්පතිතුමා විසින් සහරාන් හෂීම් හෝ ජාතික තවුහිද් ජමාත් සංවිධානය ගැන හෝ ඉස්ලාම් අන්තවාදය ගැන සඳහන් කරමින් යම් යම් ලිපි හෝ පැමිණිලි ඔබට ඉදිරිපත් කළාද?

පි : මගේ මතකයේ එහෙම එකක් නැහැ ස්වාමීනි.

ප : ඒ කියන්නේ 2018,2019 අප්‍රේල් 21 වෙන කනුත් මීට අමතරව සහරාන් සම්බන්ධයෙන් කිසිම කරුණු හොයා බැලීමක් කරන්න කියලා ලේඛනයක් පොලිස්පතිතුමාගේ පාර්ශවයෙන් ඉදිරිපත් වුනේ නැද්ද?

පි : නැහැ ස්වාමීනි, මේ ගොනුවම දිගින් දිගටම පවත්වාගෙන යන නිසා මොනවා හරි තියෙනවා නම් මේ හරහා ඔවුන් විමර්ශනය කරනවා. එහෙම තියෙනවා නම් වාර්තා වෙනවා.

ප : දැනට මේ ගරු කොමිෂන් සභාවට ඉදිරිපත් වුණු සාක්ෂිවලින් අනාවරණය වෙලා තියෙනවා 2018 අගෝස්තු මාසේ ඔය අලියාර් සිද්ධියේම වරෙන්තුකරුවෙක් වන රිල්වාන් යන තැනැත්තා කාත්තන්කුඩි ප්‍රදේශයේම පුපුරුවා ගැනීමක්, අත්හදා බැලීමක් සිද්ධ කලා කියලා. ඒ සම්බන්ධයෙන් ඔබලාට තොරතුරු හොයා ගන්න හැකි වෙලා තියෙනවද?

පි : නැහැ ස්වාමීනි.

ප : ඒ වෙන කොට සොයා ගැනීමට හැකියාවක් ලැබිලා නැහැ?

පි : නැහැ, කිසිම තොරතුරක් ලැබිලා නැහැ ස්වාමීනි.

ප : ඔබ හිතනවාද එසේ තොරතුරු සොයා ගැනීමට නොහැකි වුණේ මේ කාත්තන්කුඩි පොලිස් ස්ථානයේ හෝ ඒ ආශ්‍රිතව වැඩ කරපු පොලිසියේ තියෙන අතපසුවීම් නැත්නම් negligence එකක් හින්දා කියලා?

FAIR COMMENT BY JEZEEM

පි : ඒක මම අතපසුවීමක් කියන එක බැහැර කරනවා ස්වාමීනි. මොකද මේ තොරතුරු සොයා ගැනීමේ, මම කිව්වේ කලින් තිබුණා මේ අපේ ප්‍රජා පොලිස් සංකල්පය. ඒ ප්‍රජා පොලිස් සංකල්පය ගැන මම කෙටි හැඳින්වීමක් කරන්නම්. මේකේ තියෙන්නේ හැම පොලිස් වසමකම මේ කමිටුවක් පිහිටුවන්න ඕන. මේ කමිටුවේ සංයුතිය 25 ක් හෝ 30 ක් වෙන්න ඕන. මේකේ පළවෙනි හතර දෙනා අනුශාසකයෝ 4 දෙනෙක් ආගම්වල. එකම ආගමක් නම් ඒ ආගමේම අනුශාසකයෝ 4 දෙනෙක්. ඉන්න ප්‍රධානම මවුලවිලා හෝ ස්වාමින්වහන්සේලා හෝ පූජකවරු. එතකොට ඊට අමතරව ප්‍රදේශයේ විද්වත් අය ඉතුරු කට්ටිය එනවා. එතකොට ව්‍යාපාරිකයන්, රාජ්‍ය ආයතනවල අය, එතකොට මේකේ සභාපති හැටියට එන්නේ ප්‍රදේශයේ විද්වත් එක්කෝ විදුහල්පතිවරයෙක් හෝ ඒ මට්ටමේ එක්කෙනෙක්. එතකොට මේවගේ ලොකු කණ්ඩායමක් තමයි පත් වෙන්නේ. එතකොට මේක මාසෙකට සැරයක් රැස් වෙන්න ඕන. මේ රැස්වීමට අපේ ස්ථානාධිපතිවරයා හැකි පමණින් යන්න ඕන. නමුත් නිලධාරීන් පත් කරලා තියෙනවා. එතකොට සහකාර පොලිස් අධිකාරීවරයත් හැකි පමණින් යන්න ඕන. කොට්ඨාශ භාර නිලධාරී යන්න ඕන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා හැටියට මමත් මේවට සහභාගී වෙලා තියෙනවා. මට පළාතේ කොට්ඨාශ 4 ක් තිබුණත් සමහර වෙලාවට මම දිස්ත්‍රික් මට්ටමෙන් මේවා කිහිපයක් එකතු කරලා ඒ එක පොලිසි 3, 4 ක් එකතු කරලා මං සමහරවිට ඒවා පවත්වලා තියෙනවා මාස 2, 3 ට සැරයක්. ඒකේ තියෙන වාසිදායක තත්ත්වය තමයි අපිට තියෙන දේවල් අපි ඒ ඔස්සේ ඔවුන්ට සඳහන් කරලා ඔවුන්ගෙන් අපිට තොරතුරු ලබා ගැනීම. මොකද ඒ සංකල්පයේ තියෙනවා ව්‍යවස්ථාවක්. ඒ ව්‍යවස්ථාවට අනුව තමයි මේක පත් කරන්නේ. ඒ ව්‍යවස්ථාවේ සඳහන් කරලා තියෙනවා අපි මොනවද ඔවුන් සමඟ සාකච්ඡා කලයුත්තේ කියලා. ඒ සාකච්ඡා කිරීමේදී වැදගත් වෙන එක තමයි අපරාධ පාලනය, දූෂණ කටයුතු සම්බන්ධයෙන්. එතකොට එහෙම නැත්නම් වෙනත් ඒ වගේ යම් බලගතු සිදුවීමකට බීජයක් වන යම්කිසි දෙයක් තියෙන්න පුළුවන්. මෙන්න මේ ගැන තොරතුරු ඔබ දෙන්නේ කියන එක. එතකොට ඔවුන්ව දැනුවත් කරලා ඔවුන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ මහජනතාවගේ අතරට යන්න. එහෙම තමයි මේ සංකල්පය ක්‍රියාත්මක වෙන්නේ. එතකොට මේ අනුව මම හිතන්නේ අපි ඔය හැමතැනින්ම ඒවා ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන් සමාජය මේ තුලින් අවදියෙන් ඉදලා ඒ නිවැරදි මේවා ලැබුනා නම් සමහර විට අපිට ඒ කියන තොරතුරු ලැබෙන්න පුළුවන් නමුත්. සමාජයට ඒවා හරියට අනුගත වෙලා නැත්නම් ඔවුන්ට දැන ගැනීමට නොහැකි

FAIR COMMENT BY JEZEEM

වෙලා තියෙනවා නම් සමහර විට ඒ අපිට තොරතුරු නොලැබෙන්න පුළුවන්. මේක අපේ පුද්ගලික ඔත්තුකරුවන්ට එහා ගිය concept එකක් ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව Community Policy වලින් නැත්නම් ප්‍රජා පොලිස් සේවය මාර්ගයෙන් ඔබලා ක්‍රියාත්මක කරපු වැඩපිළිවෙල තුළින්වත් මේ සහරාන් හෂීම්ගේ ක්‍රියාකලාපයන් ගැන හෝ ඔහු ඉන්න ස්ථානයක් ගැන තොරතුරු ඔබලාට අනාවරණය කර ගැනීමට නොහැකි වුණාද?

පි : එහෙමයි ස්වාමිනී. ඊට අමතරව අපි කළා පොලිස් ජංගම සේවාවන් කියන එක. පොලිස් ජංගම සේවාව කියන එක මම කෙටියෙන් සඳහන් කරන්නම්, ඒක කියන්නේ සෑම පොලිස් වසමකම අපි වර්ෂයකට සැරයක් මාසෙකට විතර කාලයක් ඒ වසමේ තියෙන දුෂ්කරම ප්‍රදේශයේ කෙටි පොලිස් මුරපොළක් පවත්වනවා. ඒකට පැමිණිලිවලට වෙනත් අනෙකුත් මහජනතාවගේ අවශ්‍යතාවයන්වලට ඇවිල්ලා ඒක සාමාන්‍ය පොලිසියක් හැටියට ඒ මාසේ ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා. ඒකත් ගොඩක් එදායි දේවල්. එතකොට ඒකෙනුත් අපිට යම්කිසි සමාජයේ තියෙන යම් යම් දුරාචාර සිද්ධීන් තියෙනවා නම් එහෙමනම් පොලිසියට දැනුම්දිය යුතු සිද්ධීන් තියෙනවා නම් මහජනතාව අපිට කියනවා. නමුත් මහජනතාවට දැනෙන පරිදි දෙයක් නැත්නම් ඔවුන්ට අපිට කියන්න දෙයක් නැහැ. ඒක මං හිතන්නේ ඒකත් අපේ සාර්ථකව කෙරිච්ච දෙයක්. ඔය මඩකලපුවේ හැම කාත්තන්කුඩි වගේම අනෙක් දෙමල මුස්ලිම්, සිංහල හැම ප්‍රදේශයකම පළාතේ ඒවා කරලා තියෙනවා. මුළු ලංකාව තුළම.

ස්වාමීනි සාක්ෂිකරුට ඔහු ඉදිරිපත් කල ගොනුවේම ඇති තවත් ලේඛනයක් පෙන්වා සිටිනවා.

ප්‍ර : මහත්මයා මෙම ලේඛනය පරීක්ෂා කරන්න. මෙම ලේඛනයේ දිනය කවද්ද?

පි : 2017.11.03

ප්‍ර : කවුරුන් විසින් කා හට ඉදිරිපත් කරපු ලිපියක්ද?

පි : මේක කොට්ඨාශ බුද්ධි ස්ථානාධිපතිවරයා විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාට ඉදිරිපත් කරපු ලිපියක්.

ප්‍ර : ඒ අනුව එම ලිපිය මෙම ගොනුවේම තිබිලා තියෙනවා ඔබේ අධීක්ෂණයටත් ඒ ලිපිය යොමු වුණාද?

පි : එහෙමයි, ඒ ලිපිය තමයි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා නියෝජ්‍ය පොලිස්පතිවරයාට, නියෝජ්‍ය පොලිස්පතිවරයා මට, මම ඒක refer කරලා පොලිස්පතිතුමා වෙත ඉදිරිපත් කෙරුවා.

ප්‍ර : එතකොට ඔය ලිපිය ඔය දැන් පරීක්ෂා කරපු ලිපිය පදනම් කරගෙන ඔබ යම්කිසි ලිපියක් පොලිස්පතිතුමාට යොමු කළාද?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොකක්ද ඒ ලිපිය?

පි : මේ තියෙන්නේ (සාක්ෂිකරු ලිපියක් පෙන්වා සිටී)

ප්‍ර : ඒ කියන්නේ C1007 කියන ලිපිය ඔබ යවලා තියෙන්නේ කොට්ඨාශ බුද්ධි අංශයේ ස්ථානාධිපති ඔය ඉදිරිපත් කරපු අර කලින් දිනැති දරන ලිපිය පදනම් කරගෙන?

පි : ඔව් ඒ කොට්ඨාශ භාර කොට්ඨාශ ස්ථානාධිපති විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාට එවලා, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා විසින් නියෝජ්‍ය පොලිස්පතිවරයාට එවපු ලිපිය, නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් මට ඉදිරිපත් කරපු වාර්තාව අනුව.

ප්‍ර : ඒ අනුව ඔබගේ ගොනුවේ තියෙන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වෙත එවන ලද ලිපියේ අත්සන් කරලා තියෙන්නේ කවුද?

පි : ස්ථානාධිපති කොට්ඨාශ බුද්ධි අංශයෙන්.

ප්‍ර : එහි නිළ මුද්‍රාව සඳහන් වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබට මෙම ලේඛනය නිශ්චිත ලේඛනයක් විදියට හඳුනා ගන්න පුළුවන්ද?

පි : එහෙමයි ස්වාමීනි.

<u>ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද 2017 නොවැම්බර් 03 දිනැති කොට්ඨාශ බුද්ධි අංශයේ ස්ථානාධිපති විසින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමා වෙත යවන ලද ලේඛනය C1010 වශයෙන් ලකුණු කිරීමට අවසර පතනවා.</u>

ප්‍ර : මේ C1010 හි දැක්වෙන කාරණය ඔබට කියන්න පුළුවන්ද මේ කොමිෂන් සභාවට සරලව, සාරාංශය?

පි : මම අර ස්වාමීනි මම ඉස්සෙල්ලා කියපු කාරණයටම අදාලවයි ඒ කාරණයේ ඉදිරිපත් කරලා තියෙන කරුණු 7 ට අදාලව තමයි මේ ලිපියේ කොට්ඨාශ බුද්ධි නිලධාරියා මම ඒක සම්පිණ්ඩනයක් හැටියට තමයි ඉස්සෙල්ලා ගෙනාවේ. මේක ඉදිරිපත් කරලා තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර : ඒ අනුව සහරාන් හෂීම් ගේ සමාජ ජාල ගිණුම්වලින් ප්‍රචාරය කරන කරුණු සම්බන්ධයෙන් විස්තර වාර්තාවක් අන්තර්ගත වෙනවා කිව්වොත් නිවැරදි ද?

පි : ඔව්.

****

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා:</u>

ප්‍ර : සාක්ෂිකරු ඔබ කොමිෂන් සභාවට ප්‍රකාශ කර සිටියා පොලිස්පතිවරයා ඔබට දැන්වූයේ නැත්නම් පොලිස්පතිවරයාට ලැබුණ නිර්නාමික පෙත්සමේ සඳහන් කරලා තිබ්බේ සහරාන් හෂීම්

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

IS මතවාදයට නැඹුරු වූ පුද්ගලයෙක් සම්බන්ධයෙන් කියන එක නේද?

පි : ඒකේ කරුණු7 ක්, පොදු කරුණු 7 ක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : ඒකේ එක් කරුණක් ඒකද IS මතවාදයට නැඹුරුව.?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ යම්කිසි අවස්ථාවක ඔබට නිරීක්ෂණය වුණා නම් සහරාන් හෂීම් IS මතවාදයට නැඹුරුව සිටිය පුද්ගලයෙක් කියලා ඔබ ඒ අවස්ථාවේදී ගත්තු පියවරට වෙනස් ක්‍රියාමාර්ගයක් වෙනත් පියවරක් ඔබ ඒ අවස්ථාවේ ගන්නවද?

පි : අනිවාර්යයෙන් ගන්න සිදු වෙනවා ස්වාමීනී.

ප්‍ර : දැන් C1008 දරන ලේඛනය බලන්න,

(C1010 සාක්ෂිකරුට පෙන්වයි)

C1010 දරන ලේඛනයේ 1 වෙනි පිටුවේ අවසාන ඡේදයට උඩින් තියෙන ඡේදය හොඳට කියවන්න?

පි : ස්වාමීනි ඒකේ කියලා තියෙන්නේ

ප්‍ර : නැහැ ඔබ කියවගන්න කියලයි මම කියන්නේ? ඔබ කියෙව්වද?

පි : ඔව් එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ කියෙව්වද?

පි : ඔව් එහෙමයි ස්වාමීනි.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM

පෙර සටහන් කළේ ධම්මිකා මිය
දැන් වේලාව : ප.ව. 12.15 යි
මෙතැන් සිට සටහන් කළේ : එච්.එම්. ඉන්ද්‍රානි හේරත්

ගරු සභාපතිතුමා :

ප්‍ර : දැන් ඔබට එවකට තිබ්බ දැනුම අනුව 2017 මාර්තු 10 වන දින අලියාර් හන්දියේ සිදු වූ ගැටුමෙන් කිසිවෙකු මිය ගියාද?

පි : තුවාල ලැබුවා ස්වාමීනි.

ප්‍ර : මිය ගියාද කවුරු හරි?

පි : මිය ගියේ නැහැ ස්වාමීනි.

ප්‍ර : දැන් ඔය ඔබ කියවපු ඡේදයේ මොකද්ද සඳහන් කරලා තියෙන්නේ?

පි : මේකේ තියෙන්නේ ස්වාමීනි කර ඇති බවට තොරතුරු අනාවරණය වී ඇති බවත්, IS සංවිධානයට සම්බන්ධව සිට මිය ගිය විදේශ ත්‍රස්තවාදීන්ගේ ඡායාරූප ආශ්‍රයෙන් මෙම ලිපි පළකර ඇති බවට නිරීක්ෂණය නොවන බව.

ප්‍ර : ඊට උඩහින්?

පි : සහරාන් හෂිම් නමින් පවත්වාගෙන යන Facebook ගිණුම් පරීක්ෂා කිරීමේදී විවිධ මාතෘකා යටතේ ද්‍රවිඩ භාෂාවෙන් ලිපි පළකර ඇති අතර, එම ලිපි එම සංවිධානවල අයවළුන්ගේ හා එම මතවාදයන්ට කැමති පුද්ගලයින්ගේ Facebook ගිණුම් හරහා හුවමාරු කරගෙන ඇති බව බන්ධනාගාරගතව සිටින ජාතික තවුහිද් ජමාත් සංවිධානයේ සාමාජිකයින් නව දෙනාගේ හා මිය ගිය සාමාජිකයින් කිහිප දෙනෙකුගේ ඡායාරූප....,

ප්‍ර : හා පොඩ්ඩක් ඉන්න. මිය ගිය සාමාජිකයින් කියලා ඔතන සඳහන් වෙන්නේ කවුරු ගැනද?

පි : ඔව්. එතන පොඩි වැරදීමක් වෙලා තියෙනවා. ඒ සිද්ධියෙන් නෙමෙයි. මිය ගිය සාමාජිකයින් කිහිප දෙනෙකුගේ ඡායාරූප සහරාන් නමින් පවත්වාගෙන යන Facebook ....,

ප්‍ර : ඒ කියන්නේ ඔය මිය ගිය සාමාජිකයින් කියලා දන්වන්නේ....?

පි : තොරතුරු අනාවරණය කර ඇති බවත්, IS සංවිධානයට සම්බන්ධව සිට මිය ගිය විදේශ ත්‍රස්තවාදීන්ගේ නෑ කියන එක තමයි අනාවරණය වෙලා තියෙන්නේ.

ප්‍ර : නැහැ නැහැ. නමුත් ඊට ඉස්සරලා මිය ගිය අයවළුන්ගේ පින්තූර කියලා අදහස් කරන්නේ අලියාර් හන්දියේ මිය ගිය අයවළුන් ගැන නෙමෙයි නේද?

පි : එහෙම කියන එක ගැන මෙතන වාර්තා වෙන්නේ නැහැ.

President Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : නැහැ. අලියාර් හන්දියේ සිද්ධියෙන් කවුරුත් මැරුණේ නැහැනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔය මිය ගිය අයගේ පින්තූර කියලා අදහස් වෙන්නේ IS සංවිධානයේ මිය ගිය අයගේ පින්තූර නේද?

පි : නැහැ. සමහරවිට මිය ගිය කියන්නේ සමහමරවිට මෙයාගේ අනුගාමිකයන් වෙන්න පුළුවන් ඊට පෙර.

ප්‍ර : ඔබට කොයි අවස්ථාවකවත් වාර්තා වුණාද මොහුගේ අනුගාමිකයන් මිය ගියා කියලා?

පි : නැහැ. මෙතන ස්වාමීනි මෙතන වාර්තාවේ කියන්නේ මිය ගිය සාමාජිකයන් කිව්වහම මෙයාගේ සංවිධානයේ සාමාජිකයන් කියන එක තමයි අදහස් වුණේ. ඒක එහෙම කලින් එහෙම වුණාද නැද්ද කියන එක ගැන අපි එහෙම සෙවීමක් කරලා නැහැ. නමුත් මෙතන අදහස එන්නේ මෙයාගේ සංවිධානයේ මිය ගිය අයගේ ඡායාරූප තියෙන්න වෙන්න පුළුවන් කියන එක.

ප්‍ර : ඔය පින්තූර බලලා කියන්න ඒක ලංකාවේ මිය ගිය අයගේ පින්තූරද තියෙන්නේ කියලා?

පි : එක පාරට පැහැදිලි නැහැ ස්වාමීනි මේ පින්තූර වලින්නම්.

ප්‍ර : ඔබ බලන ලේඛනය සහරාන් හෂීම්ගේ මුහුණු පොතේ ගත්තු උධෘතයක් නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔතන මිය ගිය අයගේ පින්තූරවලින් ලංකාවේ කවුරු හරි මැරිලා තියෙනවා කියලා පේනවාද?

පි : පින්තූර ස්වරූපය අනුව ඉතිං මුස්ලිම් ජාතිකයන් නිසා ටිකක් අපහසුයි හරියටම කියන්න ඒක.

ප්‍ර : ඔබ ඔය ලේඛනය පරිවර්තනය කරලා බැලුවේ නැද්ද?

පි : නැහැ මම විශේෂයෙන් පරිවර්තනය කළේ නැහැ ස්වාමීනි. මේ වාර්තාව ඉතිං පරිවර්තන වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙන නිසා මේකත් තව දිගින් දිගටම අපි මේ පරීක්ෂණය කරගෙන ගිය නිසා තව ඉදිරියේදී තව මොනවා හරි අනාවරණය වෙනවා නම් එකත් අපිට වාර්තා වෙන නිසා. ඒක පවත්වාගෙන ගියා පමණයි ස්වාමීනි.

****

රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා :

ප්‍ර : ජයසේකර මහත්මයා දැන් කොට්ඨාශ බුද්ධි අංශයෙන් මේ වගේ ලිපියක් ඔබ ගෙන්වා ගත්තයින් පස්සේ ඔවුන් ඒ සම්බන්ධයෙන් දිගින් දිගටම ගොනුවක් විවෘත කරලා, ඒ සම්බන්ධයෙන් විමර්ශන සිද්ධ කරනවද?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒ කියන්නේ මේ ...,

ප්‍ර : දැන් අපි සහරාන් හෂීම් ගැන පොලිස්පතිතුමා පැමිණිල්ලක් යොමු කරලා ඒ සම්බන්ධයෙන් ඔබ කොට්ඨාශ බුද්ධි අංශය හරහා යම් විමර්ශනයක් සිද්ධ කෙරෙව්වනේ. ඒ සම්බන්ධයෙන් ඔවුන් ඊට අනතුරුව ගොනුව වහලා දමනවද නැත්නම් ඒ සම්බන්ධයෙන් දිගටම බුද්ධි තොරතුරු හොයමින් මේ කාරණය විමර්ශනය කරනවද?

පි : මේ හරහා වරින්වර බුද්ධි තොරතුරු දිගින් දිගටම හොයනවා. හොයලා මේ ගොනුව හරහා දිගින් දිගටම මොනවා හරි විශේෂ දෙයක් තියෙනවා නම් වාර්තා වෙනවා.

ප්‍ර : ඒ අනුව අනාවරණය වෙලා නැද්ද කොයි වෙලාවකවත් මේ සහරාන් IS මතවාදය නිරූපණය කරමින්, ඔවුන් අන්‍ය ආගමිකයන් මරා දමන තත්ත්වයකට දැමිය යුතුයි කියන මතවාදී මට්ටමටම ඔවුන් යොමු වෙලා කියලා ඔබට අනාවරණය වුණේ නැද්ද?

පි : නැහැ. මේ ඉදිරිපත් වෙච්ච වාර්තා පරිශීලනයේදී එහෙම එකක් මට අනාවරණය වුණේ නැහැ.

ප්‍ර : දැන් ජයසේකර මහත්මයා මම ඔබේ අවධානය යොමු කරනවා 2018 නොවැම්බර් 30 වෙනිදා සිදු වූ යම්කිසි සිද්ධියක් ගැන?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : 2018 නොවැම්බර් 30 වෙනිදා වවුනතිව් පොලිස් මුරපොළේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරීන් දෙදෙනෙක් ඝාතනය වුණානේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ සම්බන්ධයෙන් ඔබලා විමර්ශනයක් සිද්ධ කළාද?

පි : නැහැ ස්වාමීනි. ඒක අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනය කළේ.

ප්‍ර : දැන් ඔබලාගේ Ground Level එක නැත්නම් බිම් මට්ටමේ බුද්ධි අංශ තියෙනවනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔවුන් දම්මලාවත් ඔබ සොයලා බැලුවද මේ සම්බන්ධයෙන් වගකිව යුතු සැකකරුවෝ නිවැරදිවම සැකකරුවෝ කවුද කියලා?

පි : අනිවාර්යයෙන්ම. මගේ කොට්ඨාශ බුද්ධි අංශ නිලධාරීන්, මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විතරක් නෙමෙයි මම පෞද්ගලිකවත් ඒ ප්‍රදේශයේ ජනතාව එක්රැස් කරලා විශේෂයෙන් මේක දැනුවත් කරලා ඔවුන්ගෙන් තොරතුරු විමසීම මගේ කාර්යභාරය හැටියට මම කළා.

ප්‍ර : ඉතිං පාස්කු ප්‍රහාරයට කලින් ඔබලට නිවැරදි සැකකරුවෝ සොයා ගන්න බැරි වුණේ ඇයි?

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඒ පවත්වපු රැස්වීම්වලදී විශේෂයෙන් දැන් මේ සිද්ධිය වුණේ ඇත්ත වශයෙන් වවුනතිව් ද්‍රවිඩ ජනතාව පදිංචි ප්‍රදේශයේ. එතකොට ඒ ප්‍රදේශයේ අපි ඔය ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයෝ, එතකොට ඒවායේ ඉන්න ආගමික නායකයෝ විතරක් නෙමෙයි ඒ රැස්වීම්වලට ආවා මම හිතන්නේ ඒ ප්‍රදේශයේ පුනරුත්ථාපනය වෙලා ඉන්න L.T.T.E. සාමාජිකයන් පවා. L.T.T.E. බුද්ධි සාමාජිකයන් ඒ ප්‍රදේශයේම ඉන්නවා. නමුත් ඒකෙන් අදහස් කරළා, දැනුම් දීමක් කළේ මෙවැනි සිද්ධියක් වෙලා තියෙනවා ඔබගේ ප්‍රදේශයේ. එතකොට මේක ආරක්ෂාවට ලොකු ප්‍රශ්නයක් ගැටළුවක්. ඒක හින්දා මේ පිළිබඳව තොරතුරු ඔබ දැන ගන්න ඕන. ඔබ තොරතුරු දන්නවා නම් වහාම කියන්න. නැත්නම් මෙච්චර කල් පැවති සාමයට බාධාවක් වෙනවා කියන එක ඔවුන්ව දැනුවත් කළා ප්‍රදේශවාසීන්. ප්‍රදේශවාසීන් හරහා. නමුත් ඒ දැනුවත් කිරීම් තුළවත් අපිට සාර්ථක තොරතුරක් ඒ පැත්තෙන් ලැබුණේ නැහැ මේ සිද්ධියට කවුද මුල් වුණේ කියලා. නමුත් විමර්ශන සම්බන්ධයෙන් ඉටු කළේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව නිසා ඒ විමර්ශනවල ප්‍රගතීන් පිළිබඳ මම මොකුත් කිසිවක් කියන්න දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විමර්ශන සිද්ධ කරනකොට Ground Level එකේ වැඩ කරන පොලිසි නැත්නම් බිම් මට්ටමේ වැඩ කරන පොලිසිවල වවුනතිව් පොලිස් ස්ථානය සහ ඔබගේ යටතේ ඉන්න පොලිස් නිලධාරීන්ගේ සහාය ලබා ගන්නවද තොරතුරු ලබා ගන්න?

පි : විශේෂයෙන්ම ඒ කියන්නේ විශේෂ අවස්ථාවක් වුණොත් ඒගොල්ලන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දැනුවත් කිරීම් මත පමණයි එහෙම වෙන්නේ. එහෙම නැත්නම් සමහරවිට ඒගොල්ලෝ බොහෝ විට තනිවම තම පරීක්ෂණ කටයුතු සිදු කෙරෙන්නේ.

ප්‍ර : ඒ අනුව 04.21 ට කලින්, පාස්කු ප්‍රහාරයට කලින් ඔබලාගේ පොලිස් ස්ථානයට හෝ ඔබලාගේ බුද්ධි අංශවලට මෙහි නිවැරදි සැකකරුවන් කවුද යන්න අනාවරණය කර ගැනීමට නොහැකි වුණා කිව්වොත් නිවැරදිද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් මෙහෙයවපු සාක්ෂිවලදී අනාවරණය වෙලා තියෙනවා ඔබගේ පොලිස් බල ප්‍රදේශය යටතේ තියෙන නින්දවූර්, සමන්තුරේ, ඔලුවිල් නැමැති ප්‍රදේශවල මේ ප්‍රහාරයට සම්බන්ධ පුද්ගලයින් ගිහිල්ලා, ආරක්ෂිත නිවාස මිලදී ගැනීම් යන ආදිය සිද්ධ කරලා තියෙනවා කියලා. ඔබගේ කොට්ඨාශ බුද්ධි අංශවලට හෝ ඔබගේ පොලිස් අංශවලට අනාවරණය කර ගැනීමට හැකි වුණාද මේ සම්බන්ධයෙන් 04.21 ට කලින්?

FAIR COMMENT BY JEZEEM

පි : ස්වාමීනි කොයි කොයි අවස්ථාවලද.

ප්‍ර : නින්දවූර් ආරක්ෂිත නිවාස මිලදී ගැනීම, සයින්දමර්දු, සමන්තුරේ ආරක්ෂිත නිවාස මිලදී ගැනීම් ඒවා සිද්ධ කිරීම් ඔබට පාස්කු ප්‍රහාරයට කලින් ඔබලාගේ බුද්ධි අංශවලට අනාවරණය කර ගැනීමට හැකි වුණාද?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : ඔබ හිතනවද ඒ අනාවරණය කර ගැනීමට නොහැකි වීම ඒ බුද්ධි අංශවල දුර්වලතාවයක් කියලා?

පි : මම හිතන්නේ එහෙම දුර්වලතාවයක් කියන්න බැහැ. මොකද ඒ පසුව දැන ගත්ත ඒවත් වුණේ ඒ සියළුම ස්ථාන බොහොම ආසන්න කාලයක ඇවිල්ලා සූදානම් වෙච්ච ඒවා. නමුත් අපි සෙවීම දිගින් දිගටම කරගෙන ගිය නිසා තමයි අපිට ඉක්මණින් ඒ තොරතුරු ඔස්සේ ගිහිල්ලා වෙන්න තිබිච්ච විනාශයන්, ලොකු විනාශයන් කිහිපයක් වළක්වන්න හැකියාව ලැබුණේ. නමුත් ඔවුන් මම විශ්වාස කරන්නේ නැහැ ඒ විශාල කාලයක් කියන එක. නමුත් බොහොම කෙටි කාලයකදී ඒවා ඉක්මණින් ඒ නිවෙස් අර ගත්ත බවට තමයි පසුගිය වාර්තාවල ඉදිරිපත් වුණේ.

ප්‍ර : 2019 අප්‍රේල් 16 වෙනිදා කාත්තන්කුඩි පාලමුණෙයි ප්‍රදේශයේ යතුරු පැදියක් පුපුරුවා ගියපු සිද්ධියක් සම්බන්ධයෙන් ඔබ දැනුවත්ද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ දැනුවත් වුණේ කවද්ද ඒක?

පි : 2019 අප්‍රේල් 17 රාත්‍රියේ ස්වාමීනි.

ප්‍ර : කවුද ඔබට ඒක දැනුම් දුන්නේ?

පි : මට ස්ථානාධිපති, කාත්තන්කුඩිය දැනුම් දුන්නේ ස්වාමීනි.

ප්‍ර : කුමක් කියලද දැනුම් දුන්නේ?

පි : ඔහු දැනුම් දුන්නේ රෑ 10, 11 ට විතර වගේ. සර් මෙන්න මෙහෙම බයිසිකල් එකක් ගිණි තියලා තියෙනවා කියලා පැමිණිල්ලක් ආවා. මම දැන් පොඩ්ඩක් ඒක ගිහිල්ලා බලලා ආවා. ඒක මට තේරුණා මේ මොකක් හරි පුපුරපු ගතියක් මම දැක්කා කියලා. මම ඇහුවා දැන් මොකද එතන කරලා තියෙන්නේ කියලා. මම කිව්වා වහාම ආරක්ෂා කරන්න කියලා මම හිතන්නේ රෑ 12 ට විතර ඇති. මම කිව්වා වහාම ආරක්ෂාව යොදලා හෙට උදෙන්ම SOCO නිලධාරින් යවලා ඉක්මණින් විමර්ශන කටයුතු කරලා ඕක අනාවරණය කර ගන්න සැකකරුවන් කවුද කින්ද මන්ද කියන එක සම්පූර්ණ තොරතුරු කියන එක.

President's Counsel's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඒ අනුව 2019 අප්‍රේල් 18 වෙනිදා වෙනකොට ඔබලාට යම්කිසි විමර්ශනයක් කරලා ඒ සම්බන්ධයෙන් තාවකාලිකව ඒ විමර්ශනයේ ප්‍රගතියක් අනාවරණය වුණාද?

පි : එහෙමයි ස්වාමීනි. ඒ අවස්ථාවේ මම කොට්යාශ භාර නිලධාරීට, නියෝජ්‍ය පොලිස්පතිවරයාටත් උපදෙස් දුන්නා වහාම අධීක්ෂණය කරලා කටයුතු කරන්න. මොකද සාමාන්‍යයෙන් මෙවැනි සිද්ධීන් ඒ අවස්ථාවේ වෙච්ච සිද්ධියක් නෙමෙයි මේ. ඊට පෙර වෙච්ච සිද්ධියක ප්‍රතිඵලයක්. මේ ප්‍රදේශයේ හැටියට මගේ මතකයේ හැටියට ඔය 2019, 18 වසරෙත් තියෙනවා ඔය වගේ සිද්ධීන් 80 ක් 90 ක් විතර.

ප්‍ර : මොන වගේ සිද්ධීන්ද තිබ්බේ?

පි : අත් බෝම්බ සොයා ගැනීම්, තුවක්කු සොයා ගැනීම්, ගල් කටස් සොයා ගැනීම්, ස්වයංක්‍රීය වෙපන් කැලි සොයා ගැනීම්, පතොරම් සොයා ගැනීම් ඒවා සේරම හුඟක් වෙලාවට ඔය මේ ප්‍රදේශය වසර ගණනාවක් යුධ කලාපයක් නිසා මේවා ත්‍රස්තවාදීන් අතර වෙච්ච සිදුවීම්වලදී හුඟක් වෙලාවට පොළොව යට සඟවපුවා නැත්නම් පොළොව යට තියෙන ඒවා වැහිච්ච ඒවා. බොහෝ තැන් තිබුණේ පුද්ගලයින් පදිංචි නැති තැන්වල. දැන් ඒ පුද්ගලයින් කුඹුරු කරන්න යනවා. තමන්ගේ ඉඩම්වලට පදිංචි වෙන්න යනවා. තමුන්ගේ පරණ නිවාස අළුත්වැඩියා කරනවා. ඒවා සුද්ද පවිත්‍ර කිරීමේදී මේවා සොයා ගත්තු අවස්ථා තියෙනවා. එතකොට මේකත් ඒ හා සිද්ධියටම සමාන වෙනවා. නමුත් අර යම් පිපිරීම් කැලි වගයක් තිබිච්ච නිසා මොකද මේ වගේම ක්ලේමෝ බෝම්බ අහුවෙලා තිබුණා අපිට පොළොවක් කටිනකොට.

ප්‍ර : නමුත් හැබැයි බයිසිකලයක තබලා පුපුරුවා හැරීම් වාර්තා වුණේ නැහැනේ කලින් මහත්මයා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ අනුව ඔබලා විමර්ශනය කළාද මේ බයිසිකලයක දාලා බෝම්බයක් කොහොමද පුපුරා ගියේ, කාටද අයිති වෙන්නේ ඒ සම්බන්ධව විමර්ශනයක් කළාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මොනවද ඒකෙන් 18 වෙනිදා වෙනකොට 04.18, 2019 අප්‍රේල් 18 වෙනකොට ඔබලාගේ විමර්ශන අංශ විසින් අනාවරණය කරගෙන තිබ්බේ මොනවද?

පි : 18 උදේ වෙනකොට අපේ විමර්ශන නිලධාරීන් ගිහිල්ලා කොහොම හරි හොයාගෙන තිබුණා හවස් වෙනකොට ඒකේ චැසි අංකය. එතකොට ඒ සම්බන්ධයෙන් මට ස්ථානාධිපතිවරයා දැනුම් දුන්නා මට වගේම කොට්යාශ භාර නිලධාරීට, නියෝජ්‍ය පොලිස්පතිවරයාට මම එවෙලේ වාචිකව උපදෙස් දුන්නා වහාම ඕක මෝටර් රථ

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් අහන්න, කවුද මේකේ අයිතිකාරයා කියලා. හැකි ඉක්මණින් මේකේ අයිතිකාරයාව සොයන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා මට ඒ අනුව දැනුම් දෙන්න. එතකොට ඒ අනුව තමයි හැන්දෑව වෙනකොට මම හිතන්නේ ස්ථානාධිපතිවරයා දුරකථන මාර්ගයෙන් ඒවා විශ්ලේෂණයක් කරලා තිබුණා. එතකොට හොයාගෙන තිබුණේ ඔය ජෙයරාඩ් අසස්ති කියන පුද්ගලයෙක් ගැන. ඔහුගේ හැඳුනුම්පතකට තමයි මේ යතුරු පැදිය ලියාපදිංචි වෙලා තියෙන්නේ කියලා. එතකොට ...,

ප්‍ර : ඊට අමතරව අප්‍රේල් 18 වෙනිදා වෙනකොටම මේ යතුරුපැදි පුපුරුවා හැරීමට සහරාන්ගේ යම්කිසි සම්බන්ධයක් තියෙන්න පුළුවන් කියන එක සම්බන්ධයෙන් ඔබලා සොයාගෙන තිබුණද?

පි : නැහැ. ඒකඅප්‍රේල් මම හිතන්නේ මට මතකයි අප්‍රේල් 19 වෙනකොට. එතකොට අර දුරකථනයෙන් ඒ දැනුම් දීපු පුද්ගලයා කියනවා මම මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, OIC ට කියලා තියෙන්නේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් මම මීට කලිනුත් ප්‍රකාශයක් දුන්නා. මෙන්න මේ මගේ හැඳුනුම්පත Misuse කරලා තියෙනවා. මෙන්න මෙහෙම සහරාන් කියන කල්ලියක් මේක කරලා තියෙනවා කියලා එතන හිටපු නිලධාරීන් ඔහුට කියලා තියෙනවා කියන කථාවක් තමයි ඒකේ කිව්වේ. එතකොට ඒක නිසා මම කිව්වා වහාම දැන් මේ කට්ටිය ඇරලා ඉක්මණින් මේ විමර්ශන කටයුතු කරන්න කියලා, කියලා අපි 19 වෙනිදා ඇරියා විමර්ශන කටයුතු. එතකොට දැන් මේ සම්බන්ධයෙන් මම පොලිස්පතිතුමාට වාචිකව දැනුම් දීමක් කළා. එතකොට මම අර 18 වෙනිදා උදෙන් පොලිස්පතිතුමාට මේ සිද්ධිය කිව්වා. උදේ සාමාන්‍යයෙන් Situation පොලිස්පතිතුමාත් එක්ක සම්බන්ධ වෙනකොට තත්ත්ව වාර්තාවන් උපදෙස් දෙනකොට දැනුවත් කරනකොට. එතකොට ඒකේදී මම කිව්වා මේකේ ප්‍රගතිය වාර්තා කරන්න කියලා. එතකොට මට මතක හැටියට මම 19 ද කොහේද කිව්වා. 19 වෙන්න ඕන මෙන්න මෙහෙම සිද්ධියක් තියෙනවා. මේක අපි හොයා ගත්තා මේ මෙයාගේ සිංහල පුද්ගලයෙක්ගේ හැඳුනුම්පතක් Misuse කරලා තියෙනවා. මෙහෙම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණ කරලා තියෙනවා. නමුත් මේ ආපු අය කියලා තියෙන්නේ මෙන්න මේ සහරාන් කෙනෙක්ගේ ඒගොල්ලෝ තමයි මේ Misuse කරලා තියෙන්නේ මේ හැඳුනුම්පත කියලා. නමුත් මේ සිද්ධියට ඔහු සෘජුවම සම්බන්ධද කියන එක අපි හරියටම දන්නේ නැහැ. නමුත් ....,

ප්‍ර : ඒ කියන්නේ මේ 2019 අප්‍රේල් 19 වෙනිදා වෙනකොට ඔබ පොලිස්පතිතුමාට දුරකථනයෙන් දැනුම් දීලා තියෙනවා මේ පිපිරීම

සම්බන්ධයෙන් සහරානුත් සම්බන්ධ වෙන්න පුළුවන් කියන කාරණය ගැන කියලා තියෙනවා?

පි : ඔව් මෙහෙමයි. එයා Misuse කරලා තියෙනවා මෙහෙම කියලා එක්කෙනෙක් කියනවා. එහෙම ස්ථානාධිපතිවරයාට කියලා තියෙනවා. නමුත් අපිට ඒක හරියට අනාවරණය වෙන්න ඕන ප්‍රකාශය මාර්ගයෙන් මේක විමර්ශනයක් නිසා. නමුත් වාචිකව මම මේක කියලා මම ඒ සම්බන්ධයෙන් දැනුම් දුන්නේ ඉක්මණින් සර් මේක එහෙමනම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ ගොනුව යවන එක හොඳයි. ඉක්මණින් මේවා කර ගන්න. මොකද අපට අවශ්‍ය වෙන්නේ මේක අනාවරණය කර ගන්න ඉක්මණින් සැකකරුවෝ. කිව්වයින් පස්සේ පොලිස්පතිතුමා කිව්වා රයිට් එහෙනම් ඉක්මණින්ම මට ඕකේ උධෘත දාලා File එක එවන්න මම CID එකට යවන්න කියලා.

ප්‍ර : ඒ කියන්නේ 2019 අප්‍රේල් 19 වෙනිදා පොලිස්පතිතුමා ඒ අනුව ඔබට දීපු නියෝගය මොකද්ද?

පි : ඒක තමයි දුන්න නියෝගය. ඔය විමර්ශනය ඉක්මණින් මේවා කරලා මට එවන්න අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේක ඉක්මණින් යවන්න. මම කිව්වා සර් එතන තමයි පරීක්ෂණය කරලා තියෙනවා මීට කලිනුත් මේ වගේ එකක්. ඒක හින්දා අපිට ඉක්මණින් අනාවරණය කරගන්න පුළුවන් මොකද්ද මේ සංසිද්ධිය කියන එක කියලා මම ඉක්මණින් උපදෙස් දුන්නා කොට්ඨාශ භාර නිලධාරීට සහ OIC ටයි DIG ටයි මේක ඉක්මණින් මේවා කරලා File එක එවලා ඉක්මණින් CID යට යවන්න ඕන කියලා. ඒ අනුව තමයි කණ්ඩායම් ඇරලා ඉක්මණින් කට උත්තර ටික අරගෙන ඒකට මම හිතන්නේ දවසක් විතර ගියා.

ප්‍ර : ඔබලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ යතුරුපැදි බෝම්බය ගැන ලිඛිතව දැනුම් දෙනකොට කවද්ද දවස?

පි : ඊට පස්සේ ඒගොලේල්ලෝ ආවේ මම හිතන්නේ 20 නැත්නම් 21 වැඩ කටයුතු ඉවර කරගෙන. නමුත් අපිට 21 මොකුත් කර ගන්න බැරි වුණා. මොකද 21 වෙනකොට අපි සියෝන් දේවස්ථානයේ බෝම්බය පිපිරීම නිසා සියළුම නිලධාරින් ඒ කටයුතු සඳහා එළි පහලියට ගිහිල්ලා තිබුණා.

ප්‍ර : ඒ කියන්නේ අප්‍රේල් 21 පාස්කු ප්‍රහාරයට කලින් මේ ගොනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යවන්න බැරි වුණාද?

පි : ඔව්. ගොනුව යැව්වේ නැහැ. නමුත් මම ඒ පිළිබඳව වාචිකව පොලිස්පතිතුමාව දැනුවත් කරලා තිබුණා. මම හිතනවා

FAIR COMMENT BY JEZEEM

පොලිස්පතිතුමා ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දැනුවත් කරන්න ඇතියි කියලා.

ප්‍ර : දැන් ඔබ සඳහන් කළා 2019.04.21 කියන දිනය ගැන. ඒ 04.21 දින ඔබගේ පළාතේ යම්කිසි ස්ථානයක බෝම්බ පිපිරීමක් සිද්ධ වුණාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කොහේද ඒ ස්ථානය?

පි : ඒ මඩකලපුවේ සියෝන් දේවස්ථානය ස්වාමීනි.

ප්‍ර : ඔබ සඳහන් කළා මඩකලපුව සියෝන් දේවස්ථානයේ පිපිරීමක් සිද්ධ වුණා කියලා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ පිපිරීම සිද්ධ වෙනකොට ඔබ මොකද්ද කරමින් හිටියේ?

පි : මම ස්වාමීනි එදින උදේ කාර්යාලයේ හිටියා. මොකද හේතුව මඩකලපුවේ තිබුණා එදා තමිල් උනරාල් කියන දෙමළ සංවිධානයක් විසින් විශාල පෙළපාලියක්. කල්මුණ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකක් අතර තියෙන ප්‍රශ්නයකට විරුද්ධව පෙළපාලියකින් අම්පාර දිසාපතිතුමා වෙතට ගමන් කළා. මේගොල්ලෝ මේක කලින් ඉඳන් සැළසුම් කරපු එකක්. නමුත් මේකට අපි අවකාශය දුන්නේ නැහැ. අපි කිව්වේ ඕක තියෙනවා නම් මඩකලපුවේ කොහේ හරි රැස්වීමක් කරලා සාමකාමීව විසඳ ගන්න. එහෙම නැතුව පෙළපාලි යන්න දෙන්න බැහැ. මොකද එහෙම පෙළපාලි යනවා නම් යන්න ඕන මුස්ලිම් ප්‍රධාන නගර මැදින් තියෙන හින්දා අපි ඒ සඳහා තහනම් නියෝග අරගෙන, අධිකරණ නියෝග අරගෙන මම හිතන්නේ මට ආසන්න වශයෙන් පොලිස් නිලධාරීන් 500 ක් පමණ අම්පාර, මඩකලපුව අපි ඒ නිසි ආරක්ෂක ස්ථානවලට යොදවලා පෙළපාලියක් ගියොත් එහෙම ඒක වළක්වාලන්න අපි අවශ්‍ය පියවර ගනිමින් තමයි අපි සැළසුම් කරලා කටයුතු කළේ. එතකෙට 21 වෙනිදා උදේ පාන්දර ඉඳලා නිලධාරීන් ඒ සඳහා යොමු කරලා ඒක නියාමනය කරමින් තමයි මම කාර්යාලයේ හිටියේ.

ප්‍ර : 2019.04.21 වෙන දින වෙනකොට ඔබගේ පළාතේ කොහේ හෝ ස්ථානයක මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල වෙන්න පුළුවන් කියලා ඔබට තොරතුරු ලැබිලා තිබුණද නැද්ද?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : පොලිස්පතිතුමාගෙන් නැති වුණත් අඩුම ගාණේ බුද්ධි අංශ ප්‍රධානියෙකුගෙන් හෝ කොට්ඨාශ බුද්ධි අංශයකින් හෝ එවැනි තොරතුරක් ලැබී තිබුණද?

පි : නැහැ ස්වාමීනි.

FAIR COMMENT BY JEZEEM

(ස්වාමීනි සාක්ෂිකරුට C-4(a)ලේඛනය පෙන්වා සිටියි)

ප : මහත්මයා මෙම ලේඛනය පරීක්ෂා කරලා බලන්න. මෙම ලේඛනය ඔබ මීට පෙර දැක තිබෙනවද?

පි : නැහැ ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරුට C-4(b)ලේඛනය පෙන්වා සිටියි)

ප : මෙම ලේඛනය පරීක්ෂා කරන්න. මෙම ලේඛනය ඔබ දැක තිබෙනවද මීට ප්‍රථමයෙන්?

පි : නැහැ ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරුට C-4(c) ලේඛනය පෙන්වා සිටියි)

ප : මෙම ලේඛනය පරීක්ෂා කරලා බලලා කියන්න, මෙම ලේඛනය ඔබ මීට ප්‍රථම දැකලා තියෙනවද කියලා?

පි : නැහැ ස්වාමීනි.

ප : මහත්මයා ඔබ වසර ගණනාවක් විශේෂ කාර්ය බලකායේ රාජකාරී කරලා, යුද්ධය කාලයේත් රාජකාරී කරලා අත්දැකීම් සහිත නිලධාරියෙක්. ඒ අත්දැකීම් සහිත නිලධාරියෙක් විදියට මේ ප්‍රහාරයට ප්‍රථම 2019.04.21 ට ප්‍රථම ඔබට මේ සම්බන්ධයෙන් ප්‍රහාරයක් එල්ල විය හැකි යැයි තොරතුරක් ඔබට ලැබුණා නම් ඔබ මොන වගේ ක්‍රියාමාර්ගද ගන්නේ?

පි : ස්වාමීනි මේ වගේ තොරතුරක් ලැබුණා නම් ඒකට සම්බන්ධව ඒ පළාතේ ඉන්න සියළුම ජ්‍යෙෂ්ඨ, පළමුව පොලිස්පතිතුමා දැනුවත් කරන්න ඕන මම කරන කියන කාර්යය පිළිබඳව. ඒ අනුව සියළුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ව විශේෂයෙන්ම කැඳවලා දැනුවත් කරලා අපේ ආරක්ෂක සැලැස්මක් ක්‍රියාත්මක කරන්න ඕන. විශේෂයෙන් නාමිකව තියෙනවා නම් අපි ඒවා පෞද්ගලිකව සෝදිසි කරන්න ඕන. අපිට වටලා සෙවීමක් කරන්න ඕන නම් ඒ කටයුතු සියල්ලම කරන්න ඕන. එතකොට විශේෂයෙන් මේක ඉහළින්ම දැනුවත් කිරීම සුදුසුයි. මොකද මේක අපි එවැනි කටයුත්තක් සිදු කිරීමේදී මේක එක්තරා ජාතියකට, ආගමකට පවතින ප්‍රදේශයක්. ඒක නිසා ඒක රටේ වෙනත් ආන්දෝලනාත්මක සිද්ධියක් බවට පත් වෙන්න පුළුවන් නිසා පොලිස්පතිතුමා මගින් ඒක රටේ නායකත්වය දැනුවත් කරලා කඩිනමින් ඒ කටයුත්ත සිදු කිරීම තමයි මගේ කාර්යභාරය විය යුත්තේ.

ප : ඔබ දැන් සඳහන් කළානේ මේ තොරතුරක් ආවොත් යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් කියලා. අපි හිතමු මේ ප්‍රහාරයක් සිද්ධ වෙනවා කියලා ඔබට තොරතුර ආවේ 2019 අප්‍රේල් 20 රාත්‍රියේ කියලා. එවැනි අවස්ථාවක ඔබට තොරතුරක් ආවොත් හෙට ප්‍රහාරයක් වෙන්න පුළුවන් කියලා ඔබට යම්කිසි ක්‍රියාමාර්ගයක්

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

ගන්න පුළුවන්ද මේක නවත්වන්න. ගන්න පුළුවන් නම් මොන වගේ ක්‍රියාමාර්ගයක්ද?

පි : මේ තොරතුරු අනුව මේකේ සැකකරුවෝ අපේ ප්‍රදේශයේ වාසය කරන අය. නමුත් ඒ අවස්ථාවේදී ප්‍රදේශයෙන් පළා ගෙස් තියෙන්න පුළුවන්. නමුත් මේ ප්‍රහාරය නිශ්චිතවම කොහේද කියන එක අපිට දන්නේ නැහැ. ඒක නිසා අපි කරන කියන කටයුතු සම්බන්ධයෙන් පොදුවේ යම්කිසි දෙයක් කරනවා නම් ඒක ඒ ප්‍රදේශයේ වාසය කරන සෑම ජාතියකටම, ආගමකටම අසහනයක්, පීඩාවක් නොවන ආකාරයට අපි සිදු කළයුතුව තියෙනවා. ඒක නිසා මම කරන දෙයින් එහෙම යම් දෙයක් සිදු වෙනවා නම් ඒ මම කරන දේ කලින් දැනුම් දීමක් කිරීම මගේ යුතුකමක් වෙනවා. එතකොට ඒක දැනුම් දුන්නොත් මගේ ඒ දැනුම් දීම අනුව මගේ ක්‍රියාදාමය ඉෂ්ඨ කරනවා කියන එක ඒ අනුව ලැබෙන උපදෙස් අනුව තමයි මම කටයුතු කරන්නේ.

ප්‍ර : දැන් මහත්මයාට අපි පෙන්වා සිටියනේ C-4(a) ලේඛනය. මේ C-4(a) ලේඛනය නැවත ස්වාමීනි සාක්ෂිකරුට පෙන්වා සිටිනවා. මේ C-4(a) ලේඛනය පොලිස්පතිතුමා යොමු කරලා තියෙන්නේ Senior DIG-Western Province ....?

පි : ඔව්. බස්නාහිර සහ රථවාහන. Senior DIG – STF, Special Protection Range Senior DIG – TID, Director – TID ස්වාමීනි.

ප්‍ර : දැන් මෙම ලේඛනය Senior DIG – Eastern Provinceවල නැත්නම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නැගෙනහිර පළාත වන ඔබට යොමු කරලා නැහැනේ?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : ඒ යොමු නොකරන්න මොන වගේ හේතුවක් බලපාන්න ඇද්ද? ඇයි එහෙම යොමු කරලා නැත්තේ?

පි : ඒක ස්වාමීනි පොලිස්පතිතුමාගේ අභිමතය. මොකද පොලිස්පතිතුමා තමයි මේ සම්බන්ධයෙන් මේක ඉදිරිපත් කරලා තියෙන්නේ පොලීසියේ ප්‍රධාන ආයතනවලට, STF එකට, එතකොට Protection Range එකට, TID එකට. TID එකට මුළු දිවයිනේම කඩිනම් විමර්ශනයක් සිදු කරන්න පුළුවන්. මේක Western Province එකට පමණක් පළාතක් හැටියට දීලා තියෙනවා. එතකොට විශේෂ කාර්ය බලකායෙත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට තියෙනවා. නමුත් ඒකේ විශේෂ කාර්ය බලකායේදී මම හිතන්නේ නිශ්චිතවම මොනවද කළ යුත්තේ කියන එක ගැන සඳහන් වෙන්න ඕන. නැත්නම් ඒක අපහසු වෙනවා. මම හිතන්නේ මේක බලාපොරොත්තු වුණේ මෙතනින් කඩිනමින් තහවුරු කර ගැනීම විය

Presidential Secretariat Commission
FAIR COMMENT BY JEZEEM

හැකියි කියලා සමහරවිට හිතන්න පුළුවන්. ඒ තහවුරුවීම අනුව මේක සියළුම දිවයිනටම බල පැවැත්වෙන විදියට කරනවද කියන එක ගැන වෙන්නත් පුළුවන්.

ප්‍ර : දැන් මහත්මයා මේ C-4(a) ලේඛනය ඔබට එව්වා නම්, ඔබටත් යම්කිසි පිටපත් කිරීමක් සිද්ධ කළා නම් ඔබට මේ ප්‍රහාරය වළක්වා ගැනීමට යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න තිබුණද?

පි : ඔව්. දැන් මේක මගේ පළාතට එව්වා නම් මේක මගේ පළාත තුළ මම කළ යුත්තේ මොකද්ද කියන එක මම සැලසුම් කරලා ඒක මම පොලිස්පතිතුමා වෙත දැනුම් දෙනවා. එතකොට මගේ සැලසුමට යම්කිසි ජාතියකට, ආගමකට බාධාවක් එහෙම නැත්නම් අපහසුතාවයකට පත් වෙනවා නම් ඒක ගැනත් මම පැහැදිලිව සඳහන් කිරීම මගේ වගකීමක්. එතකොට ඒ ලැබෙන උපදෙස් අනුව මගේ කඩිනම් ක්‍රියාමාර්ග ගන්නවා. මගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මම දැනුවත් කරනවා ඉතා ඉක්මණින්.

(ස්වාමීනි සාක්ෂිකරුට C-1010 වශයෙන් ලකුණු කරන ලද ලේඛනය පෙන්වා සිටිනවා)

ප්‍ර : මහත්මයා මේ C-1010 යවලා තියෙන්නේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමා වෙතද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඉන්පසු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමා නියෝජ්‍ය පොලිස්පතිට යවපු ලිපියක් මේ ගොනුවේ අන්තර්ගත වෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එම ලේඛනය පෙන්වන්න පුළුවන්ද?

පි : මේ තියෙනවා මෙතන.

ප්‍ර : හරි. එම ලේඛනයේ දවස කවද්ද මහත්මයා?

පි : 2017.11.05 ස්වාමීනි.

ප්‍ර : නියෝජ්‍ය පොලිස්පති වෙත මෙම වාර්තාව යවන්නේ කවුද?

පි : ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී.

ප්‍ර : ඔබට එම ලේඛනය හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි ඒ අනුව සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද 2017 නොවැම්බර් 05 දිනැති ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, මඩකලපුව කොට්ඨාශය විසින් නියෝජ්‍ය පොලිස්පති, මඩකලපුව දිස්ත්‍රික්කය වෙත යවන ලද ලේඛනය C-1011 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

ප්‍ර : දැන් මහත්මයා මේ C-1011 ලේඛනය යන්නේ නියෝජ්‍ය පොලිස්පති වෙතනේ?

පි : එහෙමයි ස්වාමීනි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඉන්පසු නියෝජ්‍ය පොලිස්පති එම ලේඛනය පරීක්ෂා කරලා ඔහු මොකද්ද කරලා තියෙන්නේ?

පි : ඔහු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා වෙතට වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවා 2017.11.16 වෙනිදා.

ප්‍ර : ඒ කියන්නේ නියෝජ්‍ය පොලිස්පතිතුමා ඔබට යම්කිසි වාර්තාවක් ඉදිරිපත් කරලා තියෙනවා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එම වාර්තාව කවදා දිනැතිවද එවලා තියෙන්නේ?

පි : 2017.11.16 ස්වාමීනි.

ප්‍ර : එම ලේඛනය පරීක්ෂා කරලා බලන්න, එය ඔබට හඳුනා ගැනීමේ හැකියාවක් තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

(ස්වාමීනි සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද 2017 නොවැම්බර් 16 දිනැති නැගෙනහිර නියෝජ්‍ය පොලිස්පති විසින් සාක්ෂිකරු වෙත එවන ලද මෙම ලේඛනය C-1012 වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර ඉල්ලා සිටිනවා)

ප්‍ර : එතකොට මේ C-1012 මත පදනම් වෙලා තමයි ඔබ අවසාන වශයෙන් යවන ලද, පොලිස්පතිතුමා වෙත යවන ලද C-1007 කියන ලේඛනය සැකසුවේ කිව්වොත් හරිද?

පි : එහෙමයි ස්වාමීනි.

(ඉංග්‍රිසි බසින් කරුණු පැහැදිලි කර ගනියි)

(ස්වාමීනි සාක්ෂිකරුට නැවත C-1006 ලේඛනය පෙන්වා සිටිනවා)

ප්‍ර : මහත්මයා මෙම C-1006 ලේඛනය පොලිස්පතිතුමා විසින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නැගෙනහිර පළාතට යවපු ලේඛනයක් නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : මේ C-1006 ට යම්කිසි ඇමුණුමක් තියෙනවද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ ඇමුණුමේ මොකද්ද දැක්වෙන්නේ?

පි : ඒකේ ඡායාරූප වගයක් තියෙන්නේ ස්වාමීනි.

ප්‍ර : යම්කිසි පුද්ගලයෙක්ගේ සමාජ ජාලා ගිණුමක Screen Shots කිව්වොත් හරිද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : කාගේ සමාජ ජාලා ගිණුමේ Screen Shots ද?

පි : ඒකේ තියෙන්නේ සහරාන් හෂීම් කියන එක්කෙනාගේ.

(ස්වාමීනි ඒ අනුව සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලද C-1006 ලේඛනයට ඇති ඇමුණුම C-1006(a) වශයෙන් ලකුණු කිරීමට ගෞරවයෙන් අවසර පතනවා)

****

Presidential Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ගරු සභාපතිතුමා :

සාක්ෂිකරු කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද ගොනුවේ අඩංගු ලේඛනවලින් ලකුණු කරන ලද C-1008, C-1009, C-1010, C-1011 සහ C-1012 යන ලේඛනවල ඡායා පිටපත් ලබාගෙන ඒවා සහතික කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරන අතර, ඉන්පසු මුල් ගොනුව එකී ගොනුව කොමිෂන් සභාවට රැගෙන ආ නිලධාරියාට මුදාහරින ලෙසටද කොමිෂන් සභාවේ ලේකම්ට නියෝග කරමි.

****

රජයේ අධිනීතිඥ චතුරංග බණ්ඩාර මහතා :

ප්‍ර : මහත්මයා ඔබ රාජකාරී බාර ගැනීමෙන් අනතුරුව සහරාන් හෂීම් කියන පුද්ගලයා සහ ඔහුගේ සංවිධානය වන ජාතික තවුහිද් ජමාත් සංවිධානයට විරුද්ධව නැගෙනහිර පළාතේ විශේෂයෙන්ම කාත්තන්කුඩි ප්‍රදේශය ආශ්‍රිතව විරෝධතා එහෙම තිබුණාද?

පි : නැහැ ස්වාමීනි. මම සේවයට වාර්තා ප්‍රදේශයට වාර්තා කළාට පස්සේ විරෝධතා මොකුත් තිබුණේ නැහැ.

ප්‍ර : ඊට ප්‍රථමයෙන් හෝ විරෝධතා ඊට විරුද්ධව විරෝධතා තිබුණා කියලා ඔබට වාර්තා වෙලා තියෙනවද?

පි : ඔව්. ඊට කලින් විරෝධතා තිබිලා ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විමර්ශන ගොනුවක ප්‍රගතිය පිළිබඳ ගොනුවක් සංසරණය වෙමින් පවතිනවා ස්වාමීනි.

ප්‍ර : ඊට අමතරව එම ප්‍රදේශයේ IS ධජය පෙන්වමින්, මහා මාර්ගය තුළ ගමන් කරන පුද්ගලයින්ගේ යම්කිසි විරෝධතා තිබුණා කියලා ඔබට තොරතුරු වාර්තා වෙලා හෝ අනාවරණය වීම් තියෙනවද?

පි : මට ඒ පිළිබඳවනම් දැන් මතකයක් නැහැ ස්වාමීනි. මම රාජකාරී වාර්තා කළාට පස්සේ නම් එහෙම දෙයක් තිබුණේ නැහැ කියලා මට විශ්වාසයි.

****

ගරු බන්දුල කරුණාරත්න මැතිතුමා :

ප්‍ර : ජයසේකර මහත්මයා ඔබ වසර කීයක් නැගෙනහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හැටියට සේවය කළාද?

පි : වසර දෙකක් ස්වාමීනි.

ප්‍ර : ඔබ විශ්‍රාම ගියා නේද එම ප්‍රදේශයෙන්ම?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ 2019 නොවැම්බර් මාසයේ විශ්‍රාම ගියා?

පි : විශ්‍රාම ගියා එහෙමයි ස්වාමීනි.

President's Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : බෝම්බ පුපුරණ අවස්ථාව වනවිටත් ඔබ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නැගෙනහිර පළාත?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතකොට මේ බෝම්බ පුපුරන්න පෙර මේ පළාතේ, ඒ කියන්නේ නැගෙනහිර පළාතේ ඉස්ලාම් අන්තවාදීන් ඔවුන්ගේ අන්තවාදී කටයුතු දිගින් දිගටම කරගෙන ගිය බවට වරින්වර ඔබට වාර්තා වෙලා තිබුණා නේද?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : ඔබගේ බුද්ධි අංශවල නිලධාරීන් රාජකාරී කටයුතු කරන ලද ආකාරය පිළිබඳව ඔබ සතුටුදායක තත්ත්වයකින්, එහෙම නැත්නම් සෑහීමකට පත්විය හැකි තත්ත්වයකින්ද සිටියේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔවුන් ඔවුන්ගේ රාජකාරිය නිසිලෙස ඉටු කළා කියලා ඔබ සෑහීමකට පත් වෙනවද?

පි : ඔවුන්ගේ දැනුම අනුව මම සෑහීමකට පත් වෙනවා ස්වාමීනි.

ප්‍ර : එහෙනම් කොහොමද මෙහෙම බෝම්බ පුපුරන්න සියළු දේවල් ඔබේ පළාත තුළ ඔවුන් සැළසුම් කළේ?

පි : ස්වාමීනි මේ බුද්ධි අංශ නිලධාරීන් මම ඉස්සරලා කිව්වා වගේ මේ බුද්ධි ජාලය වගේම මහජන සම්බන්ධතා ජාලයත් අපි සක්‍රීයව පවත්වාගෙන යනවා. එතකොට මහජනතාව තුළින් තමයි අපිට ගොඩක් මේ තොරතුරු ලැබෙන්න ඕනෑ. කොහොම හරි මහජනතාව තුළින් ඒ තොරතුරු ලැබීමේ යම්කිසි දුර්වලතාවයක් තියෙන්න පුළුවන්. එතකොට මේ බුද්ධි නිලධාරියාගේ කාර්යභාරය තමයි ඒක කෙසේ හෝ උකහා ගන්න එක. නමුත් ඉතිං ත්‍රස්තවාදීන්ගේ සැඟවෙච්ච ස්වභාවය, රහසිගතභාවය නිසා සමහරවිට අපේ බුද්ධි නිලධාරීන් අභිබවා ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමට හැකියාව ලැබිලා තියෙනවා. නමුත් ඒකෙන් බලාපොරොත්තු වෙන්නේ නැහැ, විශ්වාස කරන්නේ නැහැ අපේ බුද්ධි නිලධාරීන් අකර්මණ්‍යයි කියලා. නමුත් ඔවුන් ඔවුන්ගේ කාර්යය, ඔවුන්ගේ තියෙන දැනුම ප්‍රමාණය අනුව ඉටු කළා කියන එක ගැන මම සෑහීමකට පත් වෙනවා. මොකද මම විශේෂයෙන් ඔවුන්ට පෞද්ගලිකවත්, කැඳවීමකිනුත්, ලිඛිතවත් සහ ඒ සම්බන්ධයෙන් නැවත ජ්‍යෙෂ්ඨ සහකාර පොලිස් අධිකාරීවරුන්ට මාසිකව තමන්ගේ බුද්ධි නිලධාරීන් සම්බන්ධයෙන් කැඳවලා, සාකච්ඡා කරලා ඒ සාකච්ඡා කරන කරුණුත් මට සටහනක් එවන්න මම උපදෙස් දීලා තියෙනවා. මගේ උපදෙස් පත්‍රිකා මට මතක හැටියට 2018/02 කියන උපදෙස් පත්‍රිකාවකින්. එතකොට ඒ අනුවත් ඔවුන් වාර්තා කරලා තියෙනවා දිස්ත්‍රික් හාර සහකාර නිලධාරීන්. නමුත් ඒ වාර්තාවකවත් මෙහෙම අන්තවාදී කටයුත්තක්

හෝ වෙනයම් ත්‍රස්තවාදී තොරතුරක් හෝ වාර්තා වෙලා තිබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර : ඒ කියන්නේ පැහැදිලිවම ඔබගේ නිලධාරීන් කාර්යක්ෂමව වැඩ කළේ නැහැ කියන එක ඒකෙන් තහවුරු වෙනවා නේද?

පි : අකාර්යක්ෂමයි කියලා කියන්න බැහැ ස්වාමීනි. මොකද මේ කටයුත්ත වගේම පොලීසියේ අනෙකුත් සැළසුම් ක්‍රියාත්මක කරනවා සියළුම නිලධාරීන්. එතකොට අපිට එක පැත්තක් අරන් මේක අකාර්යක්ෂමව නිලධාරීන් වැඩ කළා කියලා මම සඳහන් කරන්නේ නැහැ.

ප්‍ර : ඔව්. ඔබ පිළිගන්නේ නැහැ. ඒක හරි. නමුත් අප්‍රේල් 21 වෙනිදා වෙනකොට මේ බෝම්බ පුපුරලා මිනිස් ජීවිත 300 කට ආසන්න ප්‍රමාණයක් විනාශ වෙලා යනකම් ඔබවත්, ඔබගේ පළාතේ හිටපු නියෝජ්‍ය පොලිස්පති, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, සහකාර පොලිස් අධිකාරී එහෙම නැත්නම් ඔය තිබිච්ච පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරු, බුද්ධි අංශවල හිටපු නිලධාරීන් කිසිවෙකුට මේ කිසිම තොරතුරක් පිළිබඳව ඔබට වාර්තා කරන්න බැරි වුණා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒකෙන් පැහැදිලි වෙනවා නේද කොහේ හරි, කොතනක හරි අඩුපාඩුවක් වෙලා තිබුණා කියලා?

පි : ඔව්. ඔවුන්ට තොරතුරු ලැබීමේ අඩුපාඩුවක් තියෙන්න පුළුවන් ස්වාමීනි.

ප්‍ර : එතකොට ඒ අඩුපාඩුව ඔවුන්ගේ අඩුපාඩුවක්ය කියලා වගකීම එතනින් පැහැර හැරීමේ හැකියාවක් නැහැ නේද ඔබට?

පි : නැහැ ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔබටත් යම් වගකීමක් දරන්න සිද්ධ වෙනවා නේ?

පි : එහෙමයි. රටට මේක වගකීමක් තියෙනවා ස්වාමීනි.

ප්‍ර : එතකොට ඔබට පමණක් නෙමෙයි. ඔබේ නියෝජ්‍ය පොලිස්පති, ඔය යටතේ හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරුන්, ඔබ යටතේ හිටපු සහකාර පොලිස් අධිකාරීවරුන් සහ මේ ප්‍රදේශයේ ස්ථානාධිපතිවරුන් සියළු දෙනාටම මේ වගකීම පැතිරිලා යනවා නේද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් මහත්මයා ඔබට මතකද 2019 අප්‍රේල් 12 වෙනිදා සිංහල අවුරුද්දට කලින් දවසේ ඔබ මඩකලපුවේ හිටියද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එවකට හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා මඩකලපුවේ කිසියම් වූ උත්සවයකට සහභාගී වෙන්න ආවා මතකයිද?

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ ඒ අවස්ථාවේදී ඒ එතුමා පැමිණිය ස්ථානයට ගියාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : එතුමන් සමඟ ඒ කටයුතුවල සම්බන්ධ වුණාද?

පි : ආරක්ෂාව භාරව කටයුතු කළේ මම.

ප්‍ර : ඔව්. නමුත් ඔබට කිසියම් බුද්ධි අංශයකින් හෝ කොළඹින් හෝ ජනාධිපති ආරක්ෂක අංශයෙන් හෝ මෙවැනි වාතාවරණයක් ඒ කියන්නේ මේ ත්‍රස්තවාදී ක්‍රියාවන් සිදුවන බවට ප්‍රහාරයක් එල්ල වන බවට කිසිම දැනුම් දීමක් කරලා තිබුණේ නැද්ද?

පි : නැහැ ස්වාමීනි. එහෙම තිබුණා නම් මම ඔය සාමාන්‍යයෙන් ජනාධිපතිතුමා පැමිණෙන උත්සවවලදී ඊට කලින් මගේ තියෙනවා ආරක්ෂක සමාලෝචනයක්. ඕකට රාජකාරී නියෝග යොදන්නේ කොට්යාශ බාර නිලධාරීන්. ඒ යොදන නියෝගවල පිටපත් පොලිස්පතිතුමාටත් යනවා. ඒ නියෝග අනුව රාජකාරී පිළිබඳ සමාලෝචනයක් මම එදා මට මතකයි 11 වෙනිදා මම කළා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාගේ කාර්යාලයේ. මම හිතනවා ඒකට ජනාධිපති ආරක්ෂක අංශය, අනිකුත් ඔය බුද්ධි අංශ සේරම පැමිණියා කියලා.

ප්‍ර : එතකොට ඒ සියළු දෙනා පැමිණිලා ආරක්ෂක සාකච්ඡා පැවැත්වුවා වුවත්, අප්‍රේල් 12 වෙනිදා වෙනකොට ත්‍රස්ත ප්‍රහාරයක් ඉස්ලාම් අන්තවාදීන්ගේ ප්‍රහාරයක් එල්ල වීමට ඉඩ තිබෙන බවට ඔබව දැනුවත් වෙලා තිබුණේ නැහැ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : අප්‍රේල් මාසේ 10 වෙනිදා පොලිස්පතිවරයා විසින් නිකුත් කරන ලද C-4, C-4(a,b,c) මේ ලියවිලි කිසිවක් ඔබට ලැබිලා තිබුණේ නැහැ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඔබ මේවා සියල්ල පිළිබඳව නොදැන සිටියාය කියන එක ඔබ මේ කොමිසමට සඳහන් කළා?

පි : ඔව්. මට ඉදිරිපත් වුණේ නැත්නම් මම ඒ පිළිබඳව කරුණු කාරණා නොදන්නවා කියලා කියනවා ස්වාමීනි.

ප්‍ර : අඩුම වශයෙන් දැන් ඔබ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, නැගෙනහිර පළාත. එතකොට ඔබේ සම තත්ත්වයේ සිටපු ඔබේ සමකාලීන, ඔබ හා සමාන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු කොළඹ හිටියනේ?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : ඒ අය අඩුම ගාණේ ඔබට Call එකක්වත් දීලා මෙවැනි දෙයක් තියෙනවා කියලා නිකමටවත් සඳහන් කළේ නැද්ද?

පි : නැහැ ස්වාමීනි.

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

ප්‍ර : ඔබ ඔවුන් සමඟ කථා බහ කරනවද?

පි : බහුලව සාකච්ඡා කළේ නැහැ ස්වාමීනි. මොකක් හරි රාජකාරිමය වශයෙන් අවශ්‍යතාවයක් තිබුණොත් කථා කරනවා. එහෙම නැත්නම් මොකක් හරි වුවමනාවකට කථා කරනවා ඇරෙන්න නැත්නම් සාමාන්‍ය විදියට කථාවක් ඇති වෙන්නේ නැහැ.

ප්‍ර : දැන් කොළඹ ඉන්න ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට සහ නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට මෙවැනි වැදගත් තොරතුරක් අප්‍රේල් 10 වෙනිදා, 11 වෙනිදා, 12 වෙනිදා වෙනකොට ලැබිලා තියෙද්දිත් ඔබ වැනි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට නිකමටවත් මේක දැනුම් දෙන්න නැත්තේ මේ ලංකාවේ පොලිස් සේවයේ, පොලිස් ක්‍රමයේ මොකක් හරි ලොකු අඩුපාඩුවක් තිබිලා තියෙන වග ඔබට හැඟෙනවද?

පි : ඒක දැනුම් දීමේ අභිමතය තියෙන්නේ පොලිස්පතිතුමාට ස්වාමීනි. පොලිස්පතිතුමා ඒක ඇයි දැනුම් නොදුන්නේ කියන එක ගැන මට කාරණා පැවසිය නොහැකියි ස්වාමීනි.

ප්‍ර : ඔබ දන්නේ නැහැ. නැහැ මම අහන්නේ ඒක නෙමෙයි. මම අහන්නේ ඔබ ඉතාම දීර්ඝ පළපුරුද්දක් තියෙන, ඔබ උතුරු නැගෙනහිර බොහොම විශිෂ්ඨ සේවයක් කරපු නිලධාරියෙක් බව වැටහෙනවා අපිට. දැන් මෙවැනි වැදගත් තොරතුරක් පිළිබඳව ඔබ වැනි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නිකමට හෝ දැනුවත් කිරීමක් කරලා නැත්තේ මේ පොලිස් දෙපාර්තමේන්තුවේ සන්නිවේදන ක්‍රමයේ එහෙම නැත්නම් මොකක් හරි මේ හා සමාන අඩුපාඩුවක් තිබිලා තියෙනවා කියන එක ඔබට වැටහෙනවද?

පි : දැනුවත් නොකිරීම අඩුපාඩුවක් කියන එකට වඩා ඒ දැනුවත් නොකිරීමට වෙනයම් හේතුවක් තියෙනවද කියන එක ගැන මම පැහැදිලිව කියන්න දන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර : ඔව්. දන්නේ නැහැ. ඔබට හිතෙන්නේ මොකද්ද? ඇයි මෙහෙම වුණේ? ඒකයි මේ හොයන්නේ, ඒකයි දැන ගන්න අහන්නේ?

පි : සමහරවිට ස්වාමීනි පොලිස්පතිතුමා මගේ පෞද්ගලික අදහස් මම ඉදිරිපත් කරන්නේ. මෙවැනි තොරතුරක්නේ ඉදිරිපත් කරලා තියෙන්නේ ප්‍රධාන ස්ථාන කිහිපයකට. සමහරවිට ඒකෙන් බලාපොරොත්තු වෙන්න පුළුවන් මේක කඩිනමින් තහවුරු කර ගැනීමක් මගේ අදහස. එහෙම තහවුරු කර ගැනීම මත අපිව දැනුවත් කළා නම් මොකද විශේෂයෙන් මේකේ හැටියට මේ සැකකරුවෝ ගොඩක් ඒ ප්‍රදේශයේ. එතකොට මේක මට ලැබුණා නම් මම අනිවාර්යයෙන් මේ ප්‍රදේශයේ මේ අනුව අවශ්‍ය ආරක්ෂක කටයුතු සියල්ල සිදු කරන්න සිද්ධ වෙනවා මට. එතකොට ඒක නිසා මේක ඊට කලින් මේක තහවුරු කිරීම සියයට සියක අභිමතයකට ගැනීමේ

බලාපොරොත්තුවෙන් වුණාද කියන එක ගැන මගේ යම්කිසි හැඟීමක් තියෙනවා.

ප්‍ර : ඔබට මතකද 2019 අප්‍රේල් 26 වෙනිදා සයින්දමර්දු සිදු වෙච්ච ඒ ප්‍රහාරය. එතන ඒ බෝම්බ පිපිරීමෙන් 16 දෙනෙක් මිය ගිය සිද්ධිය මතකයිනේ?

පි : එහෙමයි ස්වාමීනි. මම එම ස්ථානයටත් ගියා ස්වාමීනි.

ජ්ර : ඔව්. ඒක තමයි මම අහන්න ආවේ. ඔබ එම සිද්ධිය වෙනකොට එම ස්ථානයට පැමිණියා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : දැන් සිද්ධිය වුණේ හවස කීයට වගේද ඔබට මතක?

පි : ඔය සිද්ධිය වෙන්න ඉස්සර වෙලා අම්පාර කොට්ඨාශ භාර නිලධාරී මුලින්ම සමන්තුරේ ගබඩාව හොයාගෙන තිබුණා. ඒකෙන් තොරතුරු අරගෙන නින්දවූර් ගබඩාව හොයාගෙන තිබුණා. ඒ අතරේ තමයි තොරතුරක් ආවේ එතන හිටපු ත්‍රස්තවාදීන් පැනලා ගිහින් තියෙනවා කියලා. ඒ අතරේ තමයි ආරංචි වුණේ රථ වාහන නිලධාරීන්ට හම්බ වෙලා තිබුණා. එතකොට ඒ නිලධාරීන් ගිහිල්ලා ඔතන ඔය සයින්දමර්දු කියන තැන ඒ ත්‍රස්තවාදීන් ගිහිල්ලා එතන ඒකරාශී වෙලා ඉන්නකොට ඒ පුද්ගලයින් තමයි ඇවිල්ලා පාරේ හිටපු රථවාහන නිලධාරීන්ට දැනුම් දීලා ඒ අනුව රථවාහන නිලධාරියා යනකොට තමයි පළවෙනි පිපිරීම සිද්ධ කළේ. ඒක කොට්ඨාශ භාර නිලධාරිට දැනුම් දීලා තමයි මට දැනුම් දීමක් කළා මෙන්න මෙහෙම සිද්ධියක් තියෙනවා, පොඩි පිපිරීමක් තියෙනවා, මම ඇහුවා, කාටද අපේ කට්ටියකට ගහලා තියෙනවා. එතකොට හරියට සිද්ධිය දන්නේ නැහැ මොකද්ද කියන එක. කාටවත් තුවාල නැහැ. මම දැන් මේක මෙතන ආරක්ෂා කරලා මම එතනට යනවා. මම කිව්වා රයිට් කඩිනමින් යන්න. යන ගමන් DIG ටත් මම කියන්නම්. අවශ්‍ය නම් හමුදාවත් අරගෙන යන්න. සේරම යන්න. මම ගුවනේ ඉන්නවා කියලා. ඒ අනුව තමයි ඊට පස්සේ එතනට ගිහිල්ලා මට මතක හැටියට ඔක 7.00 ට 7.30 යි 8.00 යි අතර වගේ සිද්ධිය වෙලා. ඊට පස්සේ එයා ගිහිල්ලා යුධ හමුදාවත් එතනට ඇවිල්ලා තිබුණා. ත්‍රස්තවාදීන් ඇතුළේ බෝම්බ කිහිපයක් ගහලා තිබුණා. ඊට පස්සේ තමයි පිපිරීම කරලා තියෙන්නේ. ඒ අනුව තමයි වට ආරක්ෂාව යුධ හමුදාව විසින් කරලා පොලීසියයි, විශේෂ කාර්ය බලකායයි මේවා කළේ. එතකොට ඒ අවස්ථාව වෙනකොට මම මඩකලපුවේ හිටියේ. එදත් හිටියේ මඩකලපුවේ මම වෙනම විශේෂ සාකච්ඡාවක ඔය ආරක්ෂක කටයුතු පිළිබඳව. ඒකත් මම අවසාන කරලා ඉවර වෙලා මේකේ ඊළඟ මේක වෙනකොට මම

Presidential Secretariat's Copy
FAIR COMMENT BY JEZEEM

එතනට ආවා මට මතක හැටියට 9.00 ට විතර වගේ. මම ඒ ස්ථානයට ඇවිල්ලා එතනට යනකොට එතන ...,

ප්‍ර : පිපිරීම සිද්ධ වෙලා අවසන්?

පි : අවසන් වෙලා. යුධ හමුදාවෙන් වට ආරක්ෂාවත් දාලා. එතකොට ආරක්ෂක සේනා ආඥාපතිත් හිටියා. ඊට පස්සේ අපි දෙන්නා පාලනය කරලා තමයි ඒක ඊට පස්සේ එතන අපි ඒක Secure කළා. ඊට පස්සේ වටේ හිටපු පුද්ගලයෝ සේරම නිවැසියන් අත හැරලා ගිහිල්ලා තිබුණා. එතකොට ඒ නිවැසියන්ගේ දේපොළ ආරක්ෂාව තියෙනවා. නමුත් රාත්‍රිය හින්දා ඒක අපිට සෝදිසි කරන්න බැහැ. මොකද පිපිරීම් කිහිපයක් සිදු වෙච්ච ස්ථානයක්. ඒක හින්දා අපි ඒක ආරක්ෂා කරලා පාන්දරම තමයි ඒ කටයුතු ඊට පස්සේ ...,

ප්‍ර : එතකොට අර සහරාන්ගේ බිරිඳත්, දරුවත් එම නිවසෙන් එළියට අරගෙන රෝහල්ගත කරන අවස්ථාව වනවිට ඔබ එතනට පැමිණිලා හිටියද නැත්නම්?

පි : මම එදා රාත්‍රියේ කල්මුණේ පොලීසියේ හිටියේ ස්වාමීනි.

ප්‍ර : නැහැ නැහැ නැහැ. මම අහන්නේ සහරාන්ගේ බිරිඳත්, දරුවත් එම නිවසෙන් එළියට ගන්නකොට මතකයි නේද?

පි : එහෙමයි.

ප්‍ර : ඔබ එතන හිටියද කියලා මම අහන්නේ?

පි : ඔව් මම එතන හිටියා. ඒ නිවස ඉස්සරහා නෙමෙයි. එතන ඒ නිවසට හැරෙන තැන.

ප්‍ර : ඒ ආසන්නයේ නේ?

පි : මොකද යුධ හමුදාව තමයි එතන වට ආරක්ෂාව දාලා කටයුතු කළේ. එතකොට ඒ අස්සට අපි පොලිස් නිලධාරීන් ඇතුළට අරෙහේ මෙහේ ගියේ නැහැ. යුධ හමුදාව විසින් කළා. පොලීසිය විසින් ඉතුරු කටයුතු කළා.

ප්‍ර : එතකොට ඔබට ඒ අවස්ථාවේදී දැන ගන්න ලැබුණද මේ නිවසේ ඉඳලා කවුරුන් හෝ පැනලා ගිහිල්ලා තිබුණා කියලා?

පි : නැහැ. ඒ අවස්ථාවේදී එහෙම තොරතුරක් ඒ වෙලාවේ ආවේ නැහැ. කොහොමත් ආපු කට්ටිය වටේට වෙඩි තියලා, මිනිස්සුන්ට මුදල් විසි කරලා, මිනිස්සු බිය ගන්වලා සේරම කරලා ඒගොල්ලෝ වට වුණා කියන එක ගැන මම හිතන්නේ විශ්වාසයට ඇවිල්ලා තමයි පුපුරුවාගෙන තියෙන්නේ. බේරීමට තැනක් නැහැ කියන එක. ඒ අවස්ථාවේදී එහෙම තොරතුරක් මට ලැබිලා තිබුණේ නැහැ.

ප්‍ර : ඔවුන් එදා එම ස්ථානයේ පුපුරුවා නොගත්තා නම් මොකද්ද වෙන්න තිබුණේ කියලා ඔබට දැන් හැඟෙනවද?

President's Secretary's Copy
FAIR COMMENT BY JEZEEM

පි : ඉතා පැහැදිලියි. එතන ඒ පිපිරීම් වෙන්න තියෙනකොට අපි සොයා ගත්තු බඩු භාණ්ඩත් එක්ක ඉතා විශාල විනාශයක් මේ රටේ සිදු වෙන්න තිබිච්ච දෙයක්. නමුත් ඒක වාසනාවට වෙන්න ඕන අපේ නිලධාරීන්ගේ දක්ෂතාවය, අපි තොරතුරුවල තියෙන දක්ෂතාවය. අර මම කලින් කිව්වෙත් ඒකයි. දැන් සමාජයේ තොරතුරු ඉක්මණින් ලැබෙන්න පටන් ගත්තෙත් මේ සමාජයට මේක දැනුණට පස්සේ. ඒ සමාජයට දැනෙනකම් මම හිතන්නේ නැහැ සමාජය තුළින් මේක ඒගොල්ලොත් හරියාකාරව බහුතරයක් දැනගෙන සිටියද කියලා. නමුත් ඒක අපිට වරප්‍රසාදයක් වුණා විශාල විනාශයක් වළක්වා ගන්න. නැත්නම් ඒ අවස්ථාවේදී ත්‍රස්තවාදීන් අර කණ්ඩායම එන්න ඉස්සර වෙලා ත්‍රස්තවාදීන් ඉක්මන් වුණානම් සමහරවිට මේ කියන වාසිය අපිට නොලැබෙන්න තිබුණා. නමුත් ඒක හැකි ඉක්මණින් ඒ දෙක සිදු වෙනකොට කොට්ඨාශ භාර නිලධාරීන් මට කියනකොට, මම ඒක යුධ හමුදාවට කියලා, එතන හිටපු මේජර් ජෙනරල්ට කියලා, DIG ට කියලා ඒගොල්ලෝ ඉක්මණින් අවශ්‍ය පියවර ගත්තා. මම එතනට යන්න ඉස්සර වෙලා ඒ අවශ්‍ය කටයුතු ටික සන්නිවේදන මාර්ගයෙන් සිද්ධ කර ගන්න පුළුවන් වුණා. නමුත් ඒ අවස්ථාවෙත් මම කිව්වේ රයිට් ඔහොම දෙයක් වුණානම් තව පිපිරීම් වෙන්න පුළුවන්. නිලධාරීන් තෝරා බේරා ගන්න, යුධ හමුදාවට ඒක දෙන්න විශේෂ කාර්ය බලකායට ඒගොල්ලෝ දන්නවා ඒවා. ඒකනිසා ඕගොල්ලෝ වට ආරක්ෂාව තියාගෙන ඉන්න හරියට මේක ඉවර වෙනකම් කියලා.

ප්‍ර : හරි. අප්‍රේල් 21 බෝම්බේ පිපිරුවා. ඔබ නොවැම්බර් වෙනකම් තවදුරටත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හැටියට නැගෙනහිර පළාතේ සේවය කළා?

පි : එහෙමයි ස්වාමීනි.

ප්‍ර : බෝම්බය පිපිරුවට පස්සේ මේ පළාතේ මේ ඉස්ලාම් අන්තවාදීන්ට එරෙහිව ඔබ ගත් ක්‍රියාමාර්ග මොනවාද?

පි : මම ඊට පස්සේ ස්වාමීනි අපිට තොරතුරු ලැබුණා. රාජ්‍ය බුද්ධි සේවය හරහා තොරතුරු ලැබුණා. ඊට පස්සේ රාජ්‍ය බුද්ධි සේවය, පොලීසිය, ත්‍රස්තවාදී ඒකකය අපි සියල්ලම එකට එකතු වුණා. එකතු වෙලා ඒ හරහා මේවායේ සම්බන්ධ අනුගාමිකයන් තුන්සිය පනස් ගාණකට ආසන්න ප්‍රමාණයක් අත්අඩංගුවට අරගෙන තිබුණා. ඒ අනුව ඔවුන්ට රඳවා තැබීමේ නියෝග අරගෙන ඒ කටයුතු කොට්ඨාශ භාර නිලධාරීන් මගින් අම්පාර සහ මඩකලපුවෙන් ක්‍රියාත්මක කළා. ඒ අය වරින්වර අධීක්ෂණ කටයුතු සහ නීතිමය කටයුතු සම්බන්ධයෙන් පොදු සොයා බැලීමක් කළා. මොකද කරන ක්‍රියාවන් සේරම නීත්‍යානුකූලව සිදුවීම. ඊට අමතරව මුළු පළාතෙම සෑම

FAIR COMMENT BY JEZEEM

ග්‍රාමසේවා කොට්ඨාශයකම අපි හැඳුනුම්පත් පරීක්ෂාවක් කළා. ඒක පොලිස්පතිතුමා උපදෙස් දුන්නා. ඒක අපි නිලධාරීන් කණ්ඩායම් ඇරලා අපි ග්‍රාමසේවා නිලධාරීන්ගෙන් මම කොළඹින් ගෙන්න ගත්තා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයෙන් වාර්තාවක්. ඒ වාර්තාවෙන් හැම ගෙදරකටම ගිහිල්ලා මේක නීති විරෝධී හැඳුනුම්පත් තියෙනවද, නැත්නම් හැඳුනුම්පත් කිහිපයක් Issue කරලා තියෙනවද කියලා පෞද්ගලිකවම ගෙවල්වලට ගිහිල්ලා පරීක්ෂා කරලා ඒකට මට මාස කිහිපයක් ගියා. ඒ සම්පූර්ණ එකේ වෙළුම් හතරක් පොලිස්පතිතුමාට එවලා තියෙනවා කොට්ඨාශ හතරින්. ඊට අමතරව වෙනම සෝදිසි මෙහෙයුම් ක්‍රියාත්මක කළා එදා ඉඳලා. ඒ සෝදිසි මෙහෙයුම් ක්‍රියාත්මක කළේ හැම ග්‍රාමසේවා වසම් වශයෙන් පොලිස් වසමක තියෙන ග්‍රාමසේවා වසම් බෙදලා ඒවා Map එකට ඇතුළත් කරලා, අද කරන්නේ මේ ග්‍රාමසේවා වසම් තුන නම් ඒක Search කරලා, පවුල් කීයක් කළාද, මොනවද කළේ, කොයි නිවෙස්ද Search කළේ ඒවා සඳහන් වෙන්න ඕන. ඒවා කරලා එතකොට ඒ විදියට ඒ හැම දෙයක්ම මඟ ඇරෙන්නේ නැති විදියට ඒවා සෝදිසි කළා. එතකොට ඒකෙන් සමාජයත් පුරුදු වුණා තමුන් ගාව මොනවා හරි දෙයක් තියෙනවා නම් ඒක එක්කෝ අහුවෙන්න ඉස්සරලා එළියට දාන්න. නැත්නම් ඒ අතරේ අපිට අවශ්‍ය වුණේ ඒ ප්‍රදේශය නිරායුධ සමාජයක් බවට පත් කරන්න. තවත් මොනවා හරි ඒවා තියෙනවානම් මොකද කඩු අරවා මේවා සමහර පල්ලිවල තිබිච්ච නිසා. නමුත් ඒවා අරමුණු සමඟරවිට වෙනස් වෙන්න පුළුවන්. නමුත් පොදුවේ ඔය ක්‍රියාමාර්ග දිගින් දිගටම ක්‍රියාත්මක කළා. ඒ සඳහා විශේෂ කාර්ය බලකාය, යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව ඒ තුනෙන්ම අපිට පොලීසියට සහායෝගය ලැබුණා.

ප : ඔබ වැදගත් කරුණක් හෙළි කරා. ඒ නිසා මම මගේ අවසන් ප්‍රශ්නය එතනින් අහන්නේ. ඔබ කියනවා දැන් මේ බෝම්බය පිපිරුණාට පස්සේ SIS එක, STF එක, TID මේ හැමෝම සහයෝගයෙන් ක්‍රියා කළා. ඒ නිසා මේවා ඔක්කෝම අල්ලා ගත්තා ඉක්මණට සියළු ආරක්ෂාව තර වුණා කියලා. ඒකෙන් අදහස් කරන්නේ අප්‍රේල් 21 ට පෙර මේ කියපු ආයතන සහ පොලීසිය අතර සහයෝගීතාවයක් තිබුණේ නැහැ කියන එකද?

පි : ඔව්. අපේ ප්‍රාදේශීය මට්ටමේ සම්බන්ධීකරණයක් තිබුණේ නැහැ.

ප : ඒකට හේතුව මොකද්ද?

පි : ඒකට හේතුව ප්‍රාදේශීය මට්ටමින් ඔවුන් වග කියන්නේ ඕනේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට. එතකොට ඒ ඒකකයේ හෝ ඒ මේකේ ජ්‍යෙෂ්ඨ නිලධාරියා ඒවා සම්බන්ධ පොලිස්පතිතුමා හරහා

Presidential Secretariat
FAIR COMMENT BY JEZEEM

තමයි අපේ පළාත්වල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට යම්කිසි විශේෂ දෙයක් තියෙනවා නම් දැනුම් දීමක් කරලා ක්‍රියාත්මක වීමක් තමයි තිබුණේ.

ප : ඒක ක්‍රමයේ වැරැද්දක්ද ඒ කියන්නේ?

පි : ක්‍රමය විමධ්‍යගත කරන්න ඕන තව පැහැදිලිව.

ප : දැන් ඔබ විශ්‍රාම ගිහිල්ලා ඉන්නේ. දැන් අපි අපේ නිර්දේශ ඉදිරිපත් කරන්න තියෙනවා. දැන් මේ ක්‍රමයේ වැරැද්ද නිවැරදි කරන්න ඔබට යමක් අපිට නිර්දේශ කරන්න පුළුවන්ද? ඒ පැවති ක්‍රමයේ තිබිච්ච දුර්වලතා හෝ අඩුපාඩු නිවැරදි කරන්න යමක් නිර්දේශ කරන්න පුළුවන්ද?

පි : ස්වාමීනි අපි දුර්වලතා කියලා බොහෝ වෙලාවට කියන්නේ අපිට තියෙන සම්පත් සහ අපිට ඒ අවශ්‍ය කටයුතුවල තියෙන නිලධාරීන්ගේ දැනුම, නිලධාරීන්ගේ හැකියාවන් ඔය සියල්ල හරහා තමයි අපි දක්ෂතාවය සහ අදක්ෂතාවය ගැන නිතරම කථා කරන්නේ. නමුත් මේ වගේ ප්‍රදේශයකදී මම දකින දෙයක් තමයි මේකේ බහුතරයක් ඉන්නේ දෙමළ කථා කරන අය. එතකොට අපිට අවශ්‍ය වෙනවා හොඳට චතුර දෙමළ කථා කරන සිංහල නිලධාරීන්. අපි සරළ උදාහරණයක් ගත්තොත් අපි සිංහල ත්‍රස්තවාදය තියෙන කාලයේ මේ ප්‍රදේශවලත් තිබුණා. නමුත් ඒ කාලයේ අපේ සිංහල කවුරුත් තොරතුරු දෙන්න ගියේ නැහැ. ඒක පොලීසිය, හමුදාවම තමයි තොරතුරු හොයා ගත්තේ. ඒකේ හේතුව තමයි ත්‍රස්තවාදියත් සිංහල. ඒ අපි අත්දැකීමෙන් දැක්ක දේවල්. එතකොට මේ ප්‍රදේශයේත් ඒක නෙවෙයි කියලා අපට හිතන්න බැහැ. ඒ අපේ සමහරවිට අපේ බුද්ධි නිලධාරියාත් ඒ ජාතික බුද්ධි, ඒ භාෂාවේ, ඒ ආගමේ. එතකොට එයාට ඒක දැනෙන ස්වභාවය අඩු වෙන්න පුළුවන්. නමුත් ඒක අපේ සිංහල නිලධාරියෙකුට ගියොත් දැනෙන ස්වභාවය වැඩි වෙනවා. නමුත් සිංහල නිලධාරියාට භාෂාව දන්න ප්‍රමාණය වැඩි වෙන්න ඕන. නමුත් ඒ භාෂාවේ තියෙන හැඟීම ඔහුට දැනෙන්න ඕන. ඒ භාෂාවේ හැඟීම දැනෙන්නේ නැති වුණහම ඒ තොරතුරේ බුද්ධි තොරතුර ගැන තක්සේරුවක් ඔහුට දැනෙන්නේ නැහැ. ඒ කියන්නේ මොකද්ද, අර පැවසුවේ මොකද්ද, ඒ පැවසුවේ එකේ අර්ථය මොකද්ද, මේක ඉදිරියට ඉදිරිපත් කළයුතු එකක්ද, එහෙම නැත්නම් නිකම් ලැබුණ දෙයක්ද කියලා. ඒ හින්දා චතුර, ඒ වගේ ප්‍රදේශවල අපි කථා කරනකොට අපේ චතුරව කථා කරන්න පුළුවන් හොඳ, මුස්ලිම් වුණත් ප්‍රශ්නයක් නැහැ. අපේ හොඳ මුස්ලිම් නිලධාරීන් ඉන්නවා, දක්ෂ බුද්ධි නිලධාරීන්. දෙමළ නිලධාරීන් ඉන්නවා. නමුත් අපිට ප්‍රශ්න තියෙනවා. දෙමළ නිලධාරීන් ඒ ප්‍රදේශවලට දාන්න බැහැ. මුස්ලිම් නිලධාරීන් ඒ ප්‍රදේශවලට දාන්න බැහැ. ඒ ජාතීන් අතර ඒ තුලනයත් අපි කටයුතු කරමින් තමයි

පොලිස් රාජකාරී අපි කරන්නේ. එතකොට මේ හැමතැනටම අපිට සිංහල නිලධාරීන් දාලා වැඩක් නැහැ භාෂාව ප්‍රශ්නයක් වෙන නිසා. ඒක නිසා ශ්‍රී ලංකා පොලීසියේ දෙමළ භාෂාව උගන්වන වෙනම වැඩසටහනක් පොලිස්පතිතුමා ක්‍රියාත්මක කරලා තිබුණා. ඒකත් බොහොම සක්‍රීයව ගියා. නමුත් මම හිතන්නේ වසරකින්, අවුරුද්දකින් ඒ කථා කරන දෙමළ භාෂාව තුළ මේ උසාවි අධිකරණ කටයුතු සහ මේ වගේ ගැඹුරු කාර්යයන් ඉෂ්ඨ සිද්ධ කරන්න අපහසුයි. ඒකට අපි ඉක්මණින් අනුගත වෙන්න ඕන. ඒ අනුගත වීමේ දුර්වලතාවය දකින්නේ මම. මොකද මම විශේෂ කාර්ය බලකායට බැඳුණේ 83 මම විශේෂ කාර්ය බලකායේ ඉන්නකොට මම නැගෙනහිර තිරික්කෝවිල් ප්‍රදේශයේ වැඩ කරනකොට අපි දෙමළ මිනිස්සුන් අතරට යනකොට මිනිස්සු දුවනවා. ඒකට හේතුව තමයි අපි භාෂාව දන්නේ නැති එක. අපි සිංහලෙන් අහනකොට ඒකට උත්තර දෙන්නේ නැහැ. බයයි. නමුත් අපි දෙමළ කථා කරන්න ගත්තහම මිනිස්සු අපිට ළං වෙන්න පටන් ගත්තා. ඒක නිසා මම දෙමළ විභාගයත් පාස් වුණා මේ මිනිස්සුන්ගෙන්. ඒ මිනිස්සුන්ගේ අවශ්‍යතාවය නිසා. එතකොට ඒකෙන් ඉගෙන ගත්තා කථා කරන්න. දැන්නම් මතක නැහැ. නමුත් ඒ දෙමළ භාෂාව කථා කිරීමෙන් තමයි අපිට ඒ හැකියාව ලැබෙන්නේ. එතකොට මේක මම පෞද්ගලීකරණයක් නෙමෙයි සමස්තයක් හැටියට අපි හැමෝම ඉන්න ඕන ත්‍රිවිධ හමුදාව, පොලීසිය. නැතුව අපි සැළසුම් ක්‍රියාත්මක කළත් ඒ තුළ අවසානයේ මුහුණ දෙන්නේ අපේ බිම් මට්ටමේ සාමාජිකයන්. එතකොට ඒ බිම් මට්ටමේ ඉන්න සාමාජිකයාගේ තියෙන දක්ෂතාවය, කුසලතාවය, කැපවීම තමයි මේ හැමදේම අපිට යම් පළවෙනි පණිවිඩය ලැබෙන්නේ. ඒ තුළ තමයි අපි ඉතුරු දේවල් විග්‍රහ කරන්නේ. ඉතිං මම හිතනවා මෙන්න මේ ක්‍රමවේදය වඩාත් සාර්ථකව නමුත් අපි යුද්ධයේ වසර තිහක් කරපු යුද්ධයේ අත්දැකීම් ගත්තේ ඒ විදියට. අපි ඒ යුද්ධයේ සමහර දේවල් වසර ගණනාවක් ගියා අපි ඒක Study කරන්න. නමුත් මේක අපිට එක පාරට වෙච්ච සිද්ධියක්. එතකොට මේ සිද්ධිය වෙනකොට අපි දැන් මේ විදියට අපි විමර්ශනයක් හොයලා මේ දේ හොයන එක අපේ වගකීමක්. නමුත් අරෙකේ අඅපිට කාලයක් ගිහිල්ලා අපි 2009 වෙනකොට තමයි හරි තැනකට අපි ඇවිල්ලා ඒක යුද්ධය අවසන් කළේ. ඉතිං ඒ අත්දැකීම ආදර්ශය අපිට වැදගත් වෙනවා මම හිතන්නේ ඊට වඩා ඉක්මණින් මේක ක්‍රියාත්මක කරන්න. තවදුරටත් මේක නොවෙයි කියන්න බැහැ. මොකද මේක ලෝකයේ ව්‍යාප්ත වෙලා තියෙනවා. දියුණු වෙලා තියෙනවා. ඔය මට Retire වෙන්න ඉස්සරලා ලැබුණ රුසියාවේ බුද්ධි තොරතුරු රටවල් 80 ක ජාලය සම්මන්ත්‍රණයට මට

පොලිස්පතිතුමා දුන්නා අවස්ථාව. ඉතිං ඒකේදී මම දැක්ක එක තමයි නමුත් අපි ලංකාවේ ත්‍රස්තවාදී මේ කටයුත්තේදී අපි ගැන යම්කිසි සැළකීමකට ආවා. මොකද අපේ රටේම අය අපි ඉක්මණින් මේ තත්ත්වය වැළැක්වීම ගැන යම්කිසි ප්‍රශංසාවක් තිබුණා ලෝකයත් එක්ක බලනකොට. නමුත් ලෝකයත් එක්ක බලනකොට අපි එතන නැති වෙන්න පුළුවන්. නමුත් එතනට එන්න ඉස්සර වෙලා මේ අනුව කටයුතු කළා කියන එක. ඉතිං මම හිතනවා ඒක ප්‍රයෝනවත් වෙනවා අපිට ඉස්සරහට අපි යම් සිද්ධියක් වෙලා පරීකෂණය කරනවට වැඩිය ඒ සිද්ධියට එන මුල හොයලා ඒක අපි ඔය කියන විදියට හදන්න ඕන. නැත්නම් වෙන්නේ ඊට පස්සේ ආපහු ඕක හදාගෙන යනකොට ආපහු සම්පත් නැහැ, මුදල් නැහැ. ඒ ප්‍රශ්නය වුණහම ආපහු හිටිය තැනටම අපි ආපහු යනවා.

ප : ඔබ කියපු දෙයින් මට තව එක ප්‍රශ්නයක් අහන්න හිතුණා. ඔබ කියන විදියට මේ ඉස්ලාම් ත්‍රස්තවාදයේ අවධානම තවම පහව ගිහිල්ලා නැහැ කියන එකද කියන්නේ?

පි : ලංකාව තුළ නැති වෙන්න පුළුවන්, අපිට පේන්න තියෙන වාර්තා අනුව. නමුත් ලෝකය තුළ තියෙනවා රැඳෙනවා. අපිට ජාත්‍යන්තර තොරතුරු බලනකොට ලෝකය තුළ තියෙන එකක්. නමුත් ඉතිං ලංකාවට තිබිච්ච මේක ගැන අපිට තොරතුරු කිසිවක් නැහැ.
රයිට්. බොහොම ස්තුතියි.

****

ගරු සුනිල් රාජපක්ෂ මැතිතුමා :

ප : සාක්ෂිකරු මෙම සියෝන් දේවස්ථානයේ බෝම්බය පිපිරුණු දිනයේදී ද්‍රවිඩ ජනතාව විසින් නගරයේ පෙළපාලියක් මුස්ලිම් ප්‍රජාව සමඟ ඇති වූ යම්කිසි ආරවුලක් මත සංවිධානය කර තිබුණාද?

පි : එහෙමයි ස්වාමීනි.

ප : මොකද්ද ඒ ආරාවුල?

පි : ඒක ස්වාමීනි අර කල්මුණේ තිබුණා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්. ඒකේ ප්‍රාදේශීය ලේකම් හිටියේ මුස්ලිම්. නමුත් ඒගොල්ලන්ට දෙමළ ප්‍රදේශයටත් තිබුණා ප්‍රාදේශීය ලේකම්. නමුත් එයාට ඒ තරම් බලතල තිබුණේ නැහැ. එතකොට ඒක Upgrade කරන්න කියන එක තමයි ඒගොල්ලෝ මුල ඉඳලාම ඕක ආපු ප්‍රශ්නයක්, මේක මම හිතන්නේ රාජ්‍ය නායකයා දක්වා ගිය ප්‍රශ්නයක්. නමුත් ඒකට සාධාරණ පිළිතුරු නැහැ කියන එක තමයි මේගොල්ලෝ දිසාපතිතුමාට යම් සංදේශයක් භාර දෙන්න ලොකු රැස්වීමක් මේවා කරලා තිබ්බේ. ඒ රැස්වීමේ මම හිතන්නේ විග්නේෂ්වරන් මහත්මයා හිටියා. ඒකට එදා පෙළපාලියට සහභාගී වෙන්න.

Proof Copy
FAIR COMMENT
BY JEZEEM

ප්‍ර : ඒ රැස්වීම කොහේද තිබ්බේ සියෝන් දේවස්ථානයේ ..,

පි : ඒගොල්ලෝ රැස්වීමක් නෙමෙයි. ඒගොල්ලෝ මඩකලපුව පාලම අසළට තමයි රැස් වෙන්න තිබුණේ. නමුත් ඒගොල්ලෝ පෙළපාලි යන්න සූදානම් කරලා තිබ්බේ ප්‍රධාන මාර්ගයේ. නමුත් ස්වාමීනි අපි අධිකරණ නියෝග, තහනම් නියෝග අරගෙන ඔවුන්ට දැනුම් දීලා තිබුණා, මේක කරන්න එපා. යන්න තියෙන්නේ කාත්තන්කුඩි, කල්මුණ, සම්මන්තුර හරහා. ඒක මුස්ලිම් ජනාවාස. ඒවායින් ගියොත් මේකේ යම්කිසි ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. ඒක හින්දා මේක අධිකරණ නියෝග තහනම් කළා. ඒගොල්ලෝ මම හිතන්නේ අදහස් කළා ඊට පස්සේ කොක්අඩිවෝලේ ඒ පැත්තේ අභ්‍යන්තරයෙන් යන්න. නමුත් ඒවාටත් අපි සමන්තුරේටත්, ඒ පැත්තෙත් අපි ඒක තහනම් කරලා තිබුණා. නමුත් එතකොට කොක්අඩිවෝලේ, ඔය සිද්ධිය වෙනකොට කොක්අඩිවෝලේ කණ්ඩායම රැස් වෙමින් පැවතියේ.

ප්‍ර : සාක්ෂිකරු සියෝන් දේවස්ථානයේ බෝම්බ පිපිරීම පිළිබඳ තමන් දැන ගත්ත අවස්ථාවට පෙර කොළඹ ප්‍රදේශයේ සිදු වූ බෝම්බ පිපිරීම් පිළිබඳව තමන් දැන ගත්තද?

පි : ඒ කියන්නේ ස්වාමීනි මම හිතන්නේ මේක සිදු වෙනකොට 9.00 යි 9.05 ත් අතර. ඊට විනාඩි පහකට වගේ මට මතකයි මගේ OPS Room එක හරහා කිව්වා ස්වාමීනි කොළඹ බෝම්බ වගයක් පිපිරිලා තියෙනවා කියන එක. ඒ කියන්නේ මගේ OPS Room එකේ නිලධාරියා ඔය සන්නිවේදනය හරහා එන එකක්. ඊට පස්සේ මම, මම හිතන්නේ කොළඹ දුරකථනයෙන් ගන්න බැලුවා. දුරකථනය ටිකක් අපහසුයි. මොකද්ද වුණේ කියලා. ඒ අතරේ තමයි අපි පෙළපාලියේ කටයුතු තමයි එතකොට කොට්ඨාශ භාර නිලධාරීන් සම්බන්ධ වෙමින් පෙළපාලියට යොමුවෙලා තිබුණා. එතකොට මට මතක හැටියට ඒ ආසන්නම වෙලාවක වගේ තමයි. එතකොට තමයි අපේ පිපිරීම් සද්දයක් ඇහුණේ.

President's Secretariat
FAIR COMMENT BY JEZEEM

වේලාව-ප. ව1. 15.
පෙර සටහන් දම්මිකා
සටහන් ගැනීම ල/ලේ යමුනා දසනායක විසිනි.

<u>ගරු විනිසුරු සුනිල් රාජපක්ෂ මැතිතුමා</u> .

ප්‍ර දැන් ඔබ සාක්ෂිකරු කිව්වා රුසියාවේ පුහුණුවීමක් ලැබුවා ද මොකක්ද කියලා මොකක්ද ඒක?

උ නැහැ පුහුණුවීමක් නෙමේ ඒක වැඩ මුලුවක් ස්වාමිනි.

ප්‍ර වැඩමුලුවක් ඒකේ මොකක්ද තමන් පුහුණුව මොකක්ද වැඩ මුලුව?

උ නෑ ඒ වැඩමුළුව තිබුනේ ස්වාමිනි අන්තවාදි කටයුතු සම්බන්ධයෙන් එක එක රටවල් වල තියෙන තත්වයන් එතන ඇවිල්ලා ඒ ගොල්ලෝ එලි දක්වනවා .

ප්‍ර විශ්‍රාම යාමට කොපමණ කාලයකට ප්‍රථමද පුහුණුව ලැබුනේ ?

උ ඒක මාසයක් එක හමාරක් විතර.

ප්‍ර එතකොට විශ්‍රාම ගියේ ඊට පස්සේ කොයි?

උ මාස එකහමාරකට පස්සේ .

ප්‍ර එය ලබලා වැඩ මුලුවට ගිහිල්ලා මාස එක හමාරකින් පසුව ?

උ ඔව්.

ප්‍ර දැන් ඒ වැඩ මුලුවෙන් ලබා ගත් අත්දැකීම් තමන්ට රාජකාරි සඳහා යොදා ගැනිමට අවස්ථාවක් විශ්‍රාම යාම නිසා අවස්ථාවක් නැහැ නේද?

උ ඒ මාසය තුල ඉතිං මගේ නිළධාරින්ට කතා කරන සාකච්ඡාවලදි මම ඒවා උපදෙස් දීලා තියෙනවා .

ප්‍ර එවැනි වැඩමුලු සහ පුහුණුවීම් සඳහා විශ්‍රාම යාමට ආසන්න නිළධාරින් යැවීමට වඩා විශ්‍රාම යාමට කාලයක් තිබෙන නිළධාරින් යැවීමෙන් එම පුහුණුවීම්වලින් ලබා ගත් අත්දැකීම් යොදා ගැනීමට හැකි බවටත් හැකි වෙනවා නේද?

උ බොහෝ විට වෙන්න පුලුවන් . නොවෙන්නත් පුලුවන්.

ප්‍ර ඒ අනුව එම වැයවූ මුදල්වලින් යම් ප්‍රයෝජනයක් ලබා ගැනීමට හැකි වෙනවා නේද?

උ එහෙමත් පුලුවන් ඒ මාස එක හමාර තිස්සේ මමත් ඒ ප්‍රදේශයේ හිටපු නිසා සමහර විට ඒ මාස එක හමර තුල මට මාව දැනුවත් කිරීමත් ඒක සාධකයක් වෙන්නත් පුලුවන් ස්වාමීනි.

ප්‍ර නමුත් මම ඔබේ වරදක් කියනවා නෙමේ . නමුත් මම කියන්නේ මේ ක්‍රමයේ වරැද්දක් නිකම්වත් එතකොට විශ්‍රාම යන කෙනෙකුට වැඩිය අර මුදල් වැය කරලා යම් කාලයක් ප්‍ර යෝජන ගන්න පුලුවන් නිළධාරියෙක් යැව්වා නම් හොඳයි කියලා අදහස තමයි කිව්වේ ඔබ ගැන ප්‍රශ්නයක් නොවේ ?

****

President Secretariat Copy
FAIR COMMENT BY JEZEEM

ගරු විනිසුරු අදිකාරි මැතිණිය

ප්‍ර මිස්ට ජයසේකර ඔබ 2013 සිට සිට 2015 දක්වා නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස අම්පාර සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ රාජකාරි කරලා තියෙනවා නේද?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර ඊට පස්සේ ඔබ 2017 සිට ඔබ විශ්‍රාම යනකල්ම නැගෙනහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස සේවය කලා ?

උ එහෙමයි.

ප්‍ර ඔබට ඉස්සෙල්ලාම කවදාද දැන ගැනීමට ලැබුනේ නැගෙනහිර පළාත තුල ඉස්ලාම් අන්තවාදය නැගී සිටීමක් දරුණු ආකාරයෙන් සිදු වෙමින් තිබෙනවා කියලා ?

උ මට එහෙම කිසිවක් දැන ගන්නට ලැබුනේ නැහැ ස්වාමිනි.

ප්‍ර කිසිම දවසක දැන ගන්න ලැබුනේ නැහැ ?

උ නැහැ ස්වාමීනි .

ප්‍ර ඔබ පුවත්පත්වල දුටුවාද , ලංකාවේ සෙසු ප්‍රදේශවල බෞද්ධ අන්තවාදී නැගී සිටීමක් විශේෂයෙන්ම මුස්ලිම් අන්තවාදයට එරෙහිව කතා කිරීමක් ඔබ දුටුවාද පුවත්පත්වලින්?

උ ඔව් ස්වාමිනි පුවත්පත්වලින් ජනමාධ්‍යවලින් මාධ්‍යවල දැකලා තියෙනවා .

ප්‍ර එතකොට ඔබට කිසියම් හෝ අවස්ථාවක අවස්ථාවක් ලැබුනාද රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානියා විසින් කොළඹදී ජ්‍යෙෂ්ඨ පොලිස් නිළධාරීන් සඳහා පවත්වනු ලැබූ ඉස්ලාම් ආගමික අන්තවාදය සහ අයි එස් අන්තවාදයේ බලපෑම ශ්‍රී ලංකාවට ඒමට තිබෙන ඉඩ ප්‍රස්ථාවන් පිළිබඳ පවත්වපු දේශනා සහ power point presentation වගේ දේවල්වලට සහභාගි වීමට ?

උ අප්‍රේල් 21 ප්‍රහාරයෙන් පස්සේ නම් මට මතකයි තිබුනා.

ප්‍ර නැහැ මන් අහන්නේ ප්‍රහාරයට ඉස්සෙල්ලා ?

උ නැහැ එහෙමනම් මට මතකයක් නැහැ ස්වාමිනි.

ප්‍ර කිසිදවසක දැන් රාජ්‍ය බුද්ධි සේවයේ දිස්ත්‍රික්කයේ නිළධාරීන් හෝ ඔබලාට කියලා නැද්ද මෙහෙම අයි. එස් මතවාදයට සමඟ යමින් සිටින්නාවූ ශ්‍රී ලංකාවේ මුස්ලිම් ආගමික අන්තවාදින් පිරිසක් සිටිනවා සහ අයි. එස් ත්‍රස්ත ප්‍රහාරයන් අපේ කලාපය ආසන්න වෙන රටවල්වල සිද්ධ වෙමින් තියෙනවා . දැන් කොයි වෙලාවේ හරි අපේ රටෙත් වෙන්න පුලුවන් වැනි දේවල් ?

උ මට එහෙම විශේෂ අවධානයක් නැහැ ස්වාමිනි .

ප්‍ර ඔබත් සමඟ සාකච්ඡා කරලම නැද්ද ?

උ නැහැ ඒ ගැන විශේෂ අවධානයක් යොමු වුනා නම් සාකච්ඡාවේදි මතකයක් තියෙනවා එහෙම මතකයක් නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර දැන් ඔබ නැගෙනහිර පලාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස කොළඹ එන්නේ නැද්ද ඔය සම්මන්ත්‍රණ වගේ දේවල්වලට?

උ ඔව්. පොලිස්පතිතුමාගේ සාකච්ඡා සම්මන්ත්‍රණවලට එනවා.

ප්‍ර ඒ එක සාකච්ඡා, සම්මන්ත්‍රණයකදී වත් අඩුම තරමින් පොලිස්පතිතුමාවත් කිව්වේ නැද්ද ඔබ නැගෙනහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිසා මෙවැනි තර්ජනයක් අපේ රටට තියෙනවා ඔබ ඉන්න ප්‍රදේශය හරිම වැදගත් සන්ධිස්ථානයක් වගේ අපිට නිරීක්ෂණය වෙනවා මේ අන්තවාදය නැඟී සිටීමට . ඒක නිසා ඔබ විශේෂ අවධානයක් යොමු කල යුතුයි කියලාවත් කිව්වේ නැද්ද ?

උ නැහැ එහෙම අන්තවාදී තත්වයක් ගැන එහෙම සඳහනක් කරලා නැහැ කොයි වෙලාවෙවත් .

ප්‍ර සඳහන් කරලා නැහැ කිසිම දවසක ?

උ ප්‍රදේශයේ තියෙන අපරාධ පිළිබඳ අනිකුත් ඒ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම කෙරෙනවා.

ප්‍ර නමුත් මේ ඉස්ලාම් ආගමික අන්තවාදය පිළිබඳ ඔබට කිසිම පූර්ව දැනුම් දීමක් පොලිස්පතිතුමාවත් කරලා නැහැ ?

උ කරලා නැහැ. මම ඉන්න කාලයේ තුල ඉස්ලාම් ආගමේ අන්තවාදී කටයුතු පිළිබඳ කිසිවක් වාර්තා වුනෙත් නැහැ මට එහෙම සම්බන්ධයෙන් කිසිම පරීක්ෂණයක්වත් මම ඒවට කරලා නැහැ. මේ කියන ගොනු දෙක හැරුනම ඒ ඇරෙන්න මට කිසි තොරතුරක් ලැබිලත් නැහැ.

ප්‍ර දැන් ඔබට කොට්යාශ බුද්ධි අංශය හැර රාජ්‍ය බුද්ධි සේවාවේ නිලධාරිනුත් ඉන්නවා නේද නැගෙනහිර පළාතට අනුයුක්ත කරලා ?

උ ඉන්නවා නැගෙනහිර පළාතේ විතරක් නෙවේ ලංකාවේ පළාත් 09 යටම ඉන්නවා

ප්‍ර නැහැ මම අහන්නේ ඔබ නැගෙනහිර ජ්‍යෙෂ්ඨ පොලිස්පති නිසා නැගෙනහිර ගැන විතරයි? එතකොට ඔබ රාජ්‍ය බුද්ධි සේවාවේ සිටින නිළධාරින් සමග හෝ කිසියම් අවස්ථාවක පවත්වන්නේ නැද්ද රැස්වීම් වැනි දේවල්?

උ නැහැ .

ප්‍ර බුද්ධි නිළධාරීන් සමඟ?

උ නැහැ ඔවුන්ට මගේ රැස්වීම් සඳහා වත් කැදවීමක් අපි කරන්නේ නැහැ

ප්‍ර ඒ කියන්නේ ඔවුන්ට කිසියම් තොරතුරක් ලැබුනත් ඔබට ඒක ඔවුන් දන්වන්නෙත් නැද්ද ?

උ දන්වන්නේ තොරතුරක් ලැබුනොත් දන්වන්නේ ඒගොල්ලෝ . ඒගොල්ලන්ගේ ජ්‍යෙෂ්ඨ නිළධාරින් හරහා පොලිස්පතිතුමා මගින්.

ප්‍ර පොලිස්පතිතුමාට ඊට පස්සේ පොලිස්පතිතුමාද ඔබට දන්වන්නේ ?

උ ඔව්. අපි අතර සෘජු සම්බන්ධයක් නැහැ.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට දැන් ඔය නැගෙනහිර පළාතේ ඔබ හිටියානේ දීර්ඝ කාලයක් විශේෂයෙන්ම ඔය මඩකලපුව දිස්ත්‍රික්කයේ ඔබට නිරීක්ෂණය වුනාද මේ ඉස්ලාම් ව්‍යාප්ත වාදය වැනි දෙයක් . ඒ කියන්නේ ඉස්ලාම්වරුන් රජයේ ඉඩම් වැනි ඉඩම් මහවැලි ඉඩම් අල්ලා ගැනීම, ඊට පස්සේ බෞද්ධ පෞරාණික සිද්ධස්ථාන වලට අයිති ඉඩම් අල්ලා ගැනිම , පුරා වස්තු තියෙන තැන් අල්ලා ගෙන ඒවා විනාශ කර ඔවුන් වෙන වෙනම ඔවුන්ගේ දේවල් ගොඩනැඟීම එවැනි දේවල් දුටුවාද ඔබ නැගෙනහිර ප්‍ර දේශයේ ?

උ තියෙනවා ස්වාමිනි ඒ වගේ පැමිණිලි තිබුනා අපේ ඔය තිබුනා කින්නියා උණුවතුර ළිඳ ලඟ එතන ගැටළුවක් තිබුනා . පොතුවිල් මුහුදු විහාරයේ ප්‍රශ්නයක් තිබුනා. එතකොට අම්පාරේ තිබුනා බුදු පිළිමයක් තියන්න ගිහිල්ලා එතකොට ත්‍රිකුණාමලයේ තිබුනා ඒ දවස්වල town එකේ බුදුපිළිමයක් තියන්න ගිහිල්ලා එතන ලොකු ප්‍රශ්නයක් තිබුනා . 2006 වසරේ එතකොට ඒ වගේ ආගම් අතර ඒවා සේරම නීත්‍යානුකූලව කෙරිච්ච කටයුතු . ඒවාදී අන්තවාදයක් නෙමේ අපිට දැනුනේ ඒ අතරේ ආගම් දෙක අතරේ තියෙන යම් යම් නොහික්මුණු තත්වයන් විතරයි ඒක. නමුත් ඒක අන්තවාදයෙන් ඇති වුනේ නැහැ ඒවා නීත්‍යානුකූලව කටයුතු කරපු පැමිණිලි

ප්‍ර ඒවා විසඳුවාද ඒ ප්‍රශ්න?

උ ඔව් .

ප්‍ර එතකොට ඔය ඔරුවිල් විශ්ව විද්‍යාලයේ ඉස්ලාම් ආගමික අන්තවාදී සිසුන් බෞද්ධ සිසුන්ට බුද්ධ ප්‍රතිමාවහන්සේ කෙනෙක් එම විශ්ව විද්‍යාලය තුලට ස්ථාපිත කිරීමටත් විරුද්ධවත් යම් යම් ගැටලු තිබුනාද? ඔබට වාර්තා වුනාද
එහෙම ?

උ මට මතකයක් නැහැ ස්වාමිනි.

ප්‍ර වාර්තා වුනේ නැහැ. දැන් ඔය ඔබ නැගෙනහිර පලාතටද අයිති ඔය පුනානි බැටිකලෝ කැම්පස් කියන ස්ථානය ?

උ එහෙමයි.

ප්‍ර ඔබ නිරීක්ෂණය කලාද එතන කිසියම් ආකාරයක ඉඩම්වල අලුතෙන් ජනාවාසකරණයක් වෙනවා වගේ දෙයක් විශ්ව විද්‍යාලය ආසන්නයේ මුස්ලිම් පල්ලි හැදෙමින් මුස්ලිම් ජනතාව අලුතෙන් පදිංචි කරවනවා වගේ දේවල් ?

උ නැහැ එහෙම නිරීක්ෂණයක් වුනේ නැහැ ඉතින් මං හැමදාම ගමන් මාර්ගය තියෙන්නේ ඔය විශ්ව විද්‍යාලය ඉස්සරහ එහෙම සොයා බලන්න තරම් ඒ කාලේ එහෙම පසුබිමක් මතු වෙලා තිබුනේ නැහැනේ. ඒක විශ්ව විද්‍යාලය මේක රජයට අනුබද්ධ විය හැකි එකක් නමුත් ඒ සම්බන්ධයෙන් පැමිණිලි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එහෙම දැන් ප්‍රදේශවාසීන්ගෙන් එහෙම විරෝධතාවයක් ඉදිරිපත් වුනේ නැහැ?

උ කිසිම පැමිණිල්ලක් හෝ විරෝධතාවයක් අපිට ඇවිල්ලා තිබුනේ නැහැ.

ප්‍ර දැන් ඔබ ඔට්ටමාවඩි ප්‍රදේශයේ ඔබ රාජකාරි කරන කාලය තුල වාලච්චේනයේ ඔට්ටමාවඩි ප්‍රදේශයේදි ජාතික තව්හිද් ජමාත් කියන සංවිධානයට අයිති පිරිසක් විසින් සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සමඟ ඇති වෙච්ච ගැටුමකදි මෙම අයි . එස් කොඩිය අරගෙන පෙළපාලියක ගිය බව ඔබට වාර්තා වුනේ නැද්ද ? අයි. එස්. සංවිධානයේ කොඩියක් අරගෙන ඒ පිරිසේ ඔක්කොමලා එක කොඩියක් නෙමෙයි එහෙම ඒ ගොල්ලෝ පෙලපාලියක් ගිය එක පිළිබඳව ඔබට වාර්තා වුනේ නැද්ද?

උ මට එහෙම වාර්තා වුන බව මතකයක් නැහැ.
ඒ කොයි වකවානුවේද දන්නේ නැහැ .

ප්‍ර අවුරුද්දනම් මට මතක නැහැ හරියට නමුත් ඒක 2016 හෝ 2017 වගේ කියලා තමයි මගේ මතකයේ තියෙන්නේ ?

උ මුල් වකවානුවේ වෙන්න පුලුවන් සමහර විට. මම ගියාට පස්සේ නම් තිබුනේ නැහැ.

ප්‍ර ඔබ වාර්තා කලානේ මඩකලපුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස 2017 මාර්තු 10 වෙනිදායින් පස්සේ දවසක ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර එතකොට ඔබට වාර්තා වුනානේ මාර්තු 17 සිදුවීම,

උ සිදුවීම.

ප්‍ර එතකොට ඔබ ගැඹුරට ගිහිල්ලා සෙව්වේ නැද්ද මේ මාර්තු 17 සිදුවීම පිටිපස්සෙන් ඉන්න කණ්ඩායම මොන වගේ කණ්ඩායමක්ද මේ ගොල්ලෝ නිකම්ම සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් එක්ක ගැටෙනවාද ,එහෙම නැත්නම් ඔවුන් තුල තිබෙන්නාවූ ඔය ඉස්ලාම් රාජ්‍ය, එහෙම නැත්නම් ජිහාද් කරන එක ,අන්‍යාගමිකයන් කෑගර්ලා කියලා ඔවුන්ව මරා දැමීය යුතුයි, එවැනි දේවල් වල් කියන කණ්ඩායමක්ද මේ කියලා ඔබට වාර්තා වුනේ නැද්ද කිසිම අවස්ථාවක ?

උ නෑ එහෙම වාර්තා වුනෙත් නැහැ ඉතින් ඒ සම්බන්ධයෙන් අර පරීක්ෂණ ගොනු පවත්වාගෙන යනවා ඒවායින් වරින්වර එන ඒවගේන් එහෙම කිසිවක් අනාවරණය වෙලා නැහැ ස්වාමිනි

ප්‍ර එහෙම අනාවරණය වෙලා නැහැ ?

උ නැහැ ස්වාමිනි.

ප්‍ර නමුත් මෙම කොමිසම හමුවේ කරුණු ඉදිරිපත් වුනහම මේ සහරාන් කියන මනුෂ්‍යා මෙයාගේ කණ්ඩායම 2011 වසරේ ඉඳලාම ඉස්ලාම් ආගමික අන්තවාදී මත ඔහුගේ සමාජ ජාලා ඔස්සේ ප්‍රචාරණය කරනවා ඒ වගේම ඔහු එක්තරා අවස්ථාවක 2016 වසරේදි සියලුම ක්‍රිස්තියානිවරුන් මරා දැමීය යුතුයි කියලා ෆත්වා එකකුත් නිකුත් කරලා

Presidential Secretariat
FAIR COMMENT BY JEZEEM

තිබෙන බව මෙම කොමිසමට වාර්තා වුනා ඉතින් ඔහු එම මුස්ලිම්වරුන් මරා දැමිය යුතුයි කියන එක 2016 නත්තල් උත්සවය වෙනුවෙන් සියලුම ක්‍රිස්තියානි දේවස්ථානවලට වීඩියෝස් හදලා හිටන් බාර දීලා තියෙනවා. දැන් ඔබගේ බුද්ධි නිළධාරින්ටවත් මේවා ආරන්වි වුනේ නැත්තේ ඇයි මෙවැනි දේවල් මේ කොමිසමට ඉදිරිපත් වුනෙත් මිනිස්සු තුලින්නේ ?

උ නෑ ඉතිං ස්වමීනි මගේ කාලයේ එහෙම වාර්තා වුනෙත් නැහැ ඉතිං බුද්ධි නිළධාරින් විතරක් නෙමේ ඉතිං ඒකට විරුද්ධව සිටි සුන්නත් වල් ජමාත් නිකායේ ප්‍රධාන පල්ලිවල උත්සව වලටත් මම සම්බන්ධ වෙලා තියෙනවා නමුත් ඒ හරහාවත් එහෙම මගේ කාලයේ තුල එහෙම මේ බරපතල එහෙම අන්තවාදි කටයුත්තක් තොරතුරක් වාර්තා වෙලා නැහැ.

ප දැන් ඔබ සඳහන් කලානේ අර ප්‍රජා පොලිස් ඒකකය ඔබගේ කොට්ඨාශය තුල හොඳින් ක්‍රියාත්මක වුනා කියලා නේද ?

උ එහෙමයි ස්වාමිනි.

ප එතකොට ප්‍රජා පොලිස් ඒකකය ක්‍රියාත්මක වෙන කොට ඒ ගමේ ජනතාවවත් කිව්වේ නැද්ද මේ සුන්නත් වල් ජමාත් කට්ටියයි නැෂනල් තව්ෂික් ජමාත් කට්ටියත් අතරේ තියෙන්නේ සුලු ආගමික මතවාදයක් නෙමෙයි මේ ගොල්ලන් ලඟ තියෙන්නේ මේ බරපතල තත්වයක යමින් පවත්නාවූ උග්‍ර ආගමික අන්තවාදි මතවාදයක් කියලා එහෙම ගමේ ජනතාව කිව්වේ නැද්ද ඔය කමිටුවල හිටපු ?

උ නැහැ ස්වාමිනි එහෙම පැවසුවා නම් ඒක ඉදිරිපත් වෙනවානේ.

ප පැවසුවේ නැහැ ?

උ මොකද ඒකේ ඒ කමිටුවල විශේෂයෙන් අනුශාසකවරුන් එන්නේ මවුලවිලා විශේෂයෙන් මුස්ලිම් ප්‍රදේශවල . බෞද්ධ ප්‍රදේශවල නම් ස්වාමින් වහන්සේලා . එතකොට අනිත් දෙමළ වාසය කරන තැන්වල නම් හින්දු පුජකවරු ඔය තුන්ගොල්ලම ඉන්නවා නම් වර්ග තුනේම ආගමික නායකයක් ඉන්නවා .ඉතින් එහෙම ඒක තමයි හොඳම අවස්ථාව ඔය මොනව හරි දෙයක් තියෙනව නම් පොලිසියට දැනුවත් කරන්න. මොකද ඒ වගේ රැස්වීම්වලදී ජ්‍යෙෂ්ඨ නිළධාරින් පවා සහභාගි වෙනවා . ඒක විශේෂයෙන් නියාමනය කරපු එකක් . ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගේ සෘජු අධික්ෂණය යටතේ මොකද ඒ හරහා තමයි අපිට ගොඩක් දේවල් සමාජය තුල දැන ගන්න පුලුවන්. නමුත් ඒ සමාජය තුලින් එහෙම කිසි දෙයක් ලැබුනේ නැහැ අපිට.

ප දැන් ඔබට නිරීක්ෂණය වුනාද ඔය කාත්තන්කුඩිය ප්‍රදේශයේ කියන ප්‍රදේශයේ මේ විශාල වශයෙන් අර බුර්කාව කියන ඇඳුමට මිනිසුන් වෙනස්වීම කාන්තාවන් ඒ වගේම අරාබිකරයේ තිබෙන ආකාරයට පොඩි ප්‍රදේශයක් නිර්මාණය කර ගැනිම වැනි දේවල් ඔබ නිරීක්ෂණය කලාද ඔය කාත්තන්කුඩි ප්‍රදේශයේ මුස්ලිම් අරාබි අකුරු වලින් name board දාලා , අරාබි ආකාරයේ පාලම් හදලා, ඇතුල්වීම් දොරටු හදලා, අරාබි

FAIR COMMENT BY JEZEEM

කාන්තාවන් අදින විදියේ ඇදුම් ඇඳිමින් එවැනි සංස්කෘතියක් කරා මිනිසුන් යොමු වෙනවා කියන එකක් ඔබ නිරීක්ෂණය කළාද ?

උ ස්වාමීනි බුර්කාව නම් ඉතින් කාත්තන්කුඩි විතරක් නෙමේ මම හිතන්නේ මගේ ගමත් දර්ගා ටවුන් ඉතින් ඒ පැත්තත් මම පොඩි කාලේ ඉඳලා දකින පැත්තක් ඕක අපේ ප්‍රදේශයෙත් තියෙනවා. ඉතින් කාත්තන්කුඩි වැඩියි මොකද ඒ වැඩි ජනතාවක් ඉන්නේ මුස්ලිම් ගොඩක් ජනතාව එතකොට කල්මුණේ තිබුනා එතකොට කොළඹ ප්‍රදේශයේ මම රාජකාරි කරන කොට දැක්කා. ත්‍රිකුනාමලෙත් තිබුණා. නමුත් එහෙම ඉස්ලාම්වාදය කියන එක නෙමේ දැක්කේ නගර සංවර්ධනයත් මම දැක්කා. කාත්තන්කුඩි අපේ ප්‍රදේශයට තියෙන මුස්ලිම් ගම නගරයකට වැඩිය කාත්තන්කුඩිය නගරයේ සංවර්ධනයක් මම දැක්කා ඒගොල්ලන් ඒකේදි අරාබි සංස්කෘතිය ඉස්මතු වෙන යම් ප්‍රමුඛතාවයක් අරන් තිබුනා යම් යම් දේවල්වල නමුත් ඒක සාමයට බාධාවක් වුනේ නැහැ මට ඉතිං ඒ ගැන දැඩි අවධානයක් මගේ රාජකාරි කටයුතුවලදි අවධානය යොමුවුනේ නැහැ.

ප්‍ර ඒ වගේ මේ ගොල්ලන්ගේ තිබුනද ඔය කාත්තන්කුඩියේ හැදුවද කෞතුකාගාරයක් ඉස්ලාම් මොකක් හරි ඓතිහාසික දේවල් පෙන්වීමේ කෞතුකාගාරයක් වගේ එකක් ?

උ මම ගියේ නැති නිසා මට ඒ ගැන පැහැදිලි අදහසක් දෙන්න බැහැ ස්වාමිනි.

ප්‍ර ඒ වගේම දැන් ඔය කාත්තන්කුඩිය ප්‍රදේශයේ තරුණ පිරිස් නීතිය නියමකාරයෙන් පිලිපදින්නේ නැතුව හෙල්මට් නැතුව එහෙම තමයි යන්නේ කියන එක පිළිබඳව ඔබ ඒක ඔබට වාර්තා වුනාද ?

උ මෙහෙමයි ඒක ඉතිං පොලිස් නිළධාරින්ගේ වගකීමක් . රාජකාරිය ඉෂ්ඨකරන එක නමුත් බොහෝ මුස්ලිම් වැසියන් අපි දන්නවා දවසේ කීප වරක් පල්ලියට යන අය බොහෝ අවස්ථාවල පල්ලිය අවසන් වෙන කොට හෙල්මට් නැති කතාවක් තිබුනා ඒවා තමයි සමහර වෙලාවට එන්නේ. මම මේ පල්ලියට එනකොට තමයි ගැලෙව්වේ කියන ප්‍රශ්න නැතුව පොලිස් නිළධාරීන් රාජකාරිය කරනවා මට කාගෙන්වත් බලපෑම් කිසි දෙයක් ආවෙත්නැහැ අපි පොලිසියේ රාජකාරි කරනවා යම් යම් පොඩි පොඩි මත ගැටීම් ඇති වෙන්න පුලුවන් ඒක පොලිසිය තුලින් විසඳා අවසන් කරනවා.

ප්‍ර මොකක්ද ඔබ සඳහන් කලේ මට කාගෙන්වත් බලපෑමක් ආවෙ නැහැ කියලා හෙල්මට් කතන්දරය ප්‍රශ්නය ඇහුවහම ?

උ ඒ ප්‍රශ්නය ප්‍රමුඛ වෙන්න නම් මේ පොලිසියේ රාජකාරියට යම්කිසි බාධාවක් වුනාදෝ කියන පිලිතුර තමයි බලාපොරොත්තු වෙන්නේ කියලා මම අදහස් කලා .

ප්‍ර නෑ මම එහෙම ප්‍රශ්නයක් ඇහුවේ නැහැ ඔබගෙන් පොලිසියට ඇත්තටම එහෙම කව්රු හරි බලපෑම් කලාද හෙල්මට් නැතුව යන්න ඉඩඅරින්න අපේ කණ්ඩායමට කියලා . ?

FAIR COMMENT BY JEZEEM

උ එහේ විතරක් නෙමේ ඉතින් අනිත් ප්‍රදේශවලත් හෙල්මට් නැතුව ගියොත් වරදක් නමුත් ඒක ඔය කියන රටාව එහෙම බහුලව කොහෙත්ම දැක්කේ නැහැ යනවා . හෙල්මට් නැතුව පොලිස් නිළධාරියා නැති තැනදී යනවා ඒක හරි . ඔය බහුලව ඉන්නේ ඒ කට්ටිය නමුත් දැක්කොත් ඒක සමහර විට දාගෙන යනවා පොලිස් නිළධාරියාට අහුවුනොත් නඩුව දානවා .

ප්‍ර ඔබ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස සේවය කරන කාලෙදි ඔබට වාර්තා වුනාද කාන්තන්කුඩිය ප්‍රදේශයේ ලංකාවේ තුල ඉතාමත්ම ප්‍රසිද්ධියක් දරනවා ඔය Fake ඒ කියන්නේ International brand වල තියෙන දේවල් wrist watch perfume, සපත්තු , එවැනි දේවල් වල hand bag ඒ වගේ දේවල් වල අර ඔරිජිනල් බ්‍රෑන්ඩ් නේම් එක දාලා Fake products හදනවාට ප්‍රසිද්ධයි කියලා ඕබට ආරංචි වුනේ නැද්ද කාත්තන්කුඩි ප්‍රදේශයේ එවැනි නීති විරෝධි ව්‍යාපාරික කටයුතු වලට ප්‍රසිද්ධයි කියලා ?

උ නීති විරෝධියි කියලා නම් නැහැ මං හිතන්නේ රටේ ප්‍රබල ව්‍යාපාරිකයන් කීප දෙනෙක්ගේ නිජබිම ඒ ප්‍රදේශය මුස්ලිම් ව්‍යාපාරිකයන්ගේ මතකයේ හැටියට ඒ හැරෙන්න නීති විරෝධි කටයුත්තක් සිදුවෙනවා කියලා වාර්තා වෙලා නැහැ එහෙම වාර්තා වුනා නම් ඉතින් පොලිසියේ කාර්යය අපි ඒ ගැන විමසීමක් කරනවා .

ප්‍ර නැහැ ඒක නීති විරෝධි නැද්ද? ඒ අර අපි කියමු දැන් Fake brand එකක් දෙනවා හොඳ Swiss brand name එකක් දාලා වොච් එකක් රුපියල් හාර පන්සියකට විකුණන එකක් හදනවා එතකොට ? ඉතිං ඒක ?

උ ස්වාමිනි ඒකට ඉතිං පැමිණිල්ලක් ලැබුනොත් විමර්ශනයක් කරන්න පුලුවන්.

ප්‍ර පැමිණිල්ලක් නැතුව කරන්න බැහැ?

උ පැමිණිල්ලක් හෝ තොරතුරක් ලැබෙන්න ඕනේ එහෙම නැතුව ඉතින් සාමාන්‍යයෙන්.

ප්‍ර බුද්ධි නිළධාරින් එවැනි තොරතුරු හොයන්නේ නැද්ද බුද්ධි නිළධාරින් එවැනි තොරතුරු ඉකොනොමි ? එකට එහෙම.

උ බුද්ධි නිළධාරින්ගේ හුඟක් වෙලාවට අපි වැඩි ප්‍රමුඛතාවය තියෙන්නේ එකක් අපරාධ ,අනිත් එක දූෂණ කටයුතු, ඊලඟට තමයි රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන යම් යම් තොරතුරු ඒ හැරෙන්න ඔය ව්‍යාපාරික කටයුතු අරව මේව ගැන ඒවත් තියෙනවා තොරතුරක් දැන ගත්තොත් ඒක සඳහනක් කරනවා මහා පරිමාණයෙන් නැතුව ප්‍රමුඛතාවයක් දෙන්නේ අර කියපු කරුණු කාරණා වලට ස්වාමිනි.

****

FAIR COMMENT BY JEZEEM

<u>ගරු සභාපති විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා.</u>

ප්‍ර සාක්ෂිකරු ඔබ 2017 නැත්නම් 2018 වර්ෂයේ ජුනි මාසයේදි පොලිස්පති වරයාගේ ශ්‍රවනාගාරයේ පැවති රැස්වීමකට සහභාගි වන අවස්ථාවකදී එවකට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක වශයෙන් ක්‍රියා කර නිලන්ත ජයවර්ධන මහතා විසින් ඉස්ලාම් අන්තවාදය සම්බන්ධයෙන් ඉදිරිපත් කිරීමක් කෙරුවා ද නැද්ද ?

උ මට එහෙම මතකයක් නැහැ ස්වාමීනි. මොකද ඒකට ඇවිල්ලා හුඟ දෙනෙක් සාකච්ඡා කරනවා විවිධ නියෝජ්‍ය පොලිස්පතිවරු ප්‍රවර්ධන කටයුතු, සන්නිවේදන කටයුතු , මේක බුද්ධි අංශ නිළධාරිනුත් කතා කරනවා රටේ ජාතික ආරක්ෂාව ගැන. නමුත් ඔය කියන කරුණු කාරණා නිශ්චිතවම කිව්වද කියන එක ගැන මට මතකයක් නැහැ.

ප්‍ර ඒ කියන්නේ ඔබ පොලිස්පතිවරයාගේ ශ්‍රවනාගාරයේ තිබ්බ සම්මන්ත්‍රණයට සහභාගි වෙලා තියෙනවානේ නේද ?

උ මට කැදවීමක් කරලා තියෙනවා නම් මම සහභාගි වෙලා තියෙනවා .

ප්‍ර එතකොට එවැනි සම්මන්ත්‍රණ එකකවත් ඉස්ලාම් අන්තවාදය ගැන සඳහනක් වුනේ නැද්ද ?

උ මට මතකයේ හැටියට දැඩි අවධානයට යොමු වෙච්ච එකක් නැහැ.

ප්‍ර දැඩි අවධානයකට යොමු වුනාද කියන එක නෙවේ අහන්නේ ඔබ සහභාගි වූ සම්මන්ත්‍රණයකදි ඉස්ලාම් අන්තවාදය ගැන කතා කෙරුවාද නැද්ද ?

උ මගේ මතකයේ නම් නැහැ ස්වාමිනි . එහෙම මට සටහනක් නෝට් එකක් තිබුණා. නම් මිනිට් එකක් තියෙනවා නම් මට ඒ ගැන බලලා පිළිතුරක් දිය හැකියි.ස්වාමිනි.

ප්‍ර දැන් C 1006 A ලේඛනය බලන්න සාක්ෂිකරුට පෙන්වන්න ඔය ලේඛනය ඔබට පොලිස්පතිවරයාගෙන් ලැබෙන්නේ සහරාන් හෂිම් අයි. එස් මතවාදය දරන පුද්ගලයෙකු වශයෙන් හඳුනාගෙන තියනවා කියන එක සම්බන්ධයෙන් නේද ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර එතකොට C1006 A ලේඛණය බලන්න ඔය ලේඛනයේ තිබෙන්නේ සහරාන් හෂිම්ගේ මුහුණු පොතෙන් උපුටා ගත්ත පින්තූර දෙකක් නේ ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර දැන් ඔබට ලිපිය සහ ඊට අදාල ඇමතුම පොලිස්පතිවරයාගෙන් ලැබුනහම ඔය සහරාන් හෂිම් ගේ මුහුණු පොතේ තිබෙන දෙමලෙන් තිබෙන මේ කාරණා පරිවර්තනය කෙරුවේ නැත්තේ ඇයි?

උ ඒක මම පරිවර්තනය කෙරුවේ නැහැ ස්වාමිනි මේක මේ ඒ පරිවර්තනය.

ප්‍ර මේ ලියුම ලැබෙන්නේ ඔබට නේද පොලිස්පතිවරයාගෙන් ?

උ ඔව් මට ලැබෙන්නේ එය නියෝජ්‍ය පොලිස්පතිවරයාට මේක පරීක්ෂණයක් කරන්න තමයි ඉදිරිපත් කරන්නේ . ඊට පස්සේ නියෝජ්‍ය පොලිස්පතිවරයා තමයි පහලට ගිහිල්ලා කරන්නේ ඊට පස්සේ විමර්ශන

FAIR COMMENT BY JEZEEM

නිළධාරියා තමයි ඒක පරිවර්තනය කරලා ඒ අනුව එයාගේ වාර්තාවට ඇතුලත් කරන්නේ.

ප්‍ර විමර්ශන නිළධාරියා පරිවර්තනයක් එතන ඉදිරිපත් කරලා තියෙනවාද?

උ නෑ මේකේ පරිවර්තනයක් පිළිබඳ සඳහනක් කරලා නැහැ ස්වාමීනි.

ප්‍ර දැන් පොලිස්පතිවරයා ඔබට ලියුමක් එව්වාම ඕක පරිවර්තනය කරන්න පල්ලහාට යවන්න ඕනේද?

උ නැහැ මේ පරික්ෂණ ගොනුවනේ මම යවන්නේ .

ප්‍ර නැහැ මන් දන්නවා පරික්ෂණ ගොනුව කියලා මිස්ට ජයසේකර ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර නමුත් ඔබ තමයි එම පළාතේ ඉන්න ජ්‍යෙෂ්ඨම පොලිස් නිළධාරියා ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර පොලිස්පතිවරයා කියන්නේ සහරාන් හෂීම් අයි. එස් මතවාදයට නැඹුරුවක් දක්වනවා මෙන්න මේ මුහුණු පොතේ සටහන් වගයකුත් අමුණලා තියෙනවා ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර ඉතින් ඔබ ඒ මුහුණු පොතේ සටහන් පරිවර්තනය කෙරුවා නම් ඔබට තේරුමක් යනවා නේද සහරාන් හෂීම් මෙම ඔහුගේ මුහුණු පොතේ අයි. එස්. මතවාදයට නැඹුරු වෙන කරුණු දක්වලා තියෙනවාද නැද්ද කියන එක ?

උ ඔය පරිවර්තනය අපේ බුද්ධි නිළධාරියා හරහා සිදු වෙලා තියනවා කියලා තමයි වාර්තාවේ ඉදිරිපත් කරලා තියෙන්නේ .

ප්‍ර වාර්තාවේ කොහේවත් බලන්න බලලා කියන්න පරිවර්තනය කරලා තියෙනවාද නැද්ද කියලා ?

උ නැහැ පරිවර්තනය කරපු බවට වාර්තාවේ සඳහන් වෙලා නැහැ.

ප්‍ර සඳහන් වෙලා නැහැනේ වාර්තාවේ ?

උ නැහැ.

ප්‍ර ඉතින් ඔය පරිවර්තනය ඔබගේ කාර්යාලයෙන් කරගන්න බැරිවුනාද?

උ ඒක මගේ කාර්යාලයෙන් මන් එහෙම පරිවර්තනයක් කරලා නැහැ ස්වාමිනී

ප්‍ර නමුත් ඔබට නේද ඔබ ජ්‍යෙෂ්ඨ නිළධාරියා වශයෙන් ඔබට නේද පොලිස්පති වරයා ඔය කාර්යය පවරලා තියෙන්නේ ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර දෙමළ භාෂාවෙන් තියෙන කරුණු පරිවර්තනය කෙරුවා නම් ඔබට දැන ගන්න පුලුවන් කමක් තිබුනා නේද මුහුණු පොතේ තියන සටහනද නිවැරදි ? පල්ලහා බුද්ධි අංශයෙන් සොයා ගත්ත කරුණුද නිවැරදි කියන එක?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර පිලිගන්නවාද ඒක?

උ එහෙමයි

FAIR COMMENT BY JEZEEM

සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසිමට අවස්ථාවක් අවශ්‍යද යන්න අතිඋතුම් මැල්කම් කාදිනල් රන්ජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරියගෙන් අසමි

අවශ්‍ය බව ප්‍රකාශ කරයි

අවස්ථාව ලබා දෙමි.

ප්‍ර සාක්ෂිකරු ඔබ 2017 රාජකාරි බාර ගත්තාට පස්සේ ඔබ කිව්වා ඔබ සහරාන්ගේ ලිපිගොනු බැලුවා කියලා අලියාර් ගැටුම සම්බන්ධව ඔහු වරෙන්තු පිට සිටින සැකකරුවෙක් කියලා?එසේ නේද ?

උ එහෙමයි ස්වාමිනි.

ප්‍ර එහේ ඔහු සමඟ තව කීදෙනෙක් පමණ වරෙන්තු තව කී දෙනෙකුට පමණ වරෙන්තු නිකුත් කරලා තිබුනාද ?

උ 4 දෙනකුට.

ප්‍ර එතකොට ඔවුන්ගෙන් කී දෙනෙක් අත් අඩංගුවට අරන් තිබුනාද ?

උ ඒ වෙනකොට ඔවුන් ගෙන් 09 දෙනෙක් අත් අඩංගුවට අරන් තිබුනා.

ප්‍ර එතකොට අර සහරාන් ගේ සහෝදරයෝ දෙන්නා ෂයිනි සහ රිල්වාන් සම්බන්ධවත් තොරතුරු එහි තිබුනා නේද?

උ මං හිතන්නේ ෂෙයිනි කලින් අප්‍රේල් මාසෙද කොහේද අත් අඩංගුවට අරන් තිබුනා ඒ වාර්තාවේ හැටියට . රිල්වාන් සහ ඒ අනිත් 4 දෙනා තමයි සැඟවිලා පලාගොස් තිබුනේ.

ප්‍ර ඒ කිසිම කෙනෙක් එතකොට ඔබට දැන ගන්න ලැබුනේ නැද්ද ඔවුන් කාත්තන්කුඩිවල හරි ඒ පලාතේ සැරිසරන බවක් ඔබට සොයා ගන්න නොහැකි වුනාද ?

උ ප්‍රදේශයෙන් පලා ගොස් ඇති බවට තමයි වාර්තා වෙලා තිබුනේ ඒක අපි ඒ ත්‍රස්තවාදීන්ගේ නිවෙස්වලින් ඇහුවා ග්‍රාම සේවකවරුන්ගෙන් ප්‍රකාශ අරන් තියෙනවා .බුද්ධි අංශ නිළධාරීන් අනිකුත් සමාජයෙන් තොරතුරු අරගෙන තිබුනා එතකොට ඒ පැමිණිල්ල යොමු කරපු අනෙක් පාර්ශවවලින් තොරතුරු විමසලා තිබුනා. නමුත් කිසිම තැනකින් ත්‍රස්තවාදි ඒ පුද්ගලයන් ඒ ප්‍රදේශයේ සිටින බවට වාර්තා වෙලා තිබුනේ නැහැ.

ප්‍ර ඔබ ප්‍රකාශ කර සිටියා 21 ප්‍රහාරයෙන් පසුව සයින්දමරුදු බෝම්බ පිපිරිමෙන් ඒ සිද්ධියෙන් පසුව ඔබ ප්‍රදේශයේ හැඳුනුම්පත් පරීක්ෂා කරලා පුද්ගලයන්ව සොයා ගන්න කටයුතු කලා කියලා ?

උ ව්‍යාජ හැඳුනුම්පත් තියෙනවාද නැද්ද කියලා .

ප්‍ර දැන් අර කලින් වරෙන්තු පිට සිටින දැන් මේ සහරාන්ට නඩුවකුත් තිබුනානේ නේද? නඩුවකට ඔහු අවශ්‍යව සිටින වරෙන්තු නිකුත් කරලා තිබුනේ මේ නඩුවට ඔහු අවශ්‍ය නිසානේ ඒ නඩුව දිගටම තිබුනනේ?

උ එහෙමයි.

FAIR COMMENT BY JEZEEM

ප්‍ර එතකොට නඩුවට ඔහු ඉදිරිපත් කිරිමටවත් ඔබ ක්‍රියාත්මක කලේ නැද්ද මේ හැදුනුම්පත් පරික්ෂා කරලා ඒ අවස්ථාවේදිවත් සොයා බලන්න ඒ කාලෙදි එතකොට?

උ නැහැ ඒ විමර්ශනයේ තිබුනා යම් යම් තව ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් අර ජාතික හැඳුනුම්පත් සම්බන්ධයෙන් සිම් කාඩ්පත් සම්බන්ධයෙන් දුරකථන විශ්ලේෂණයක් සිදු කරන්න ඒ අනුව ඒ අදාල ආයතන සමඟ කටයුතු කිරීමේදී මාස කීපයක් ගතවෙලා තිබුනා ඊට පස්සේ නැවතත් මොහු ප්‍රදේශයේ ඉන්නවාද කියන එක බලලා ඒ සැකකරුවන්ගේ ඥාතීන් ගෙන් නැවතත් විමසිම් කරන්න එතකොට ඒවත් සිදු කරලා තිබුනා . ඒ අනුව මගේ මතකයේ හැටියට 2019 පෙබරවාරි 26 වෙනි දින තිබිච්ච නඩුවාරයේදි මහෙස්ත්‍රාත්තුමා උපදෙස් දිලා තිබුනා ඊලඟ නඩු වාරයේදි පැමිණිල්ල ගොනු කරන්න කියලා

ප්‍ර එතකොට ඔහුව දැන් අවුරුදු එක හමාරකට විතර කාලයක් ප්‍රමාණයකටඔහු අත් අඩංගුවට ගන්න නොහැකි වීම පිළිබඳව ඔබට කියන්න තියෙන්නේ මොනවද එතකොට පොලිසියේ රාජකාරිය වශයෙන්?

උ ඔහු විතරක් නොවේ තවත් වරෙන්තු කාරයෝ රාශියක් ඉන්නවා. පොලිසි 48 ක් තියෙනවා ඒ 48 ම තියෙනවා මේ වගේ වසර ගණනවක වරෙන්තු කාරයෝ විවෘත වරෙන්තුකාරයෝ ඉන්නවා.දින වරෙන්තු කාරයෝ ඉන්නවා මගේ කාර්යය බාරය .තමයි මේ සියලුම වරෙන්තු කාරයෝ අත් අඩංගුවට ගැනීම. ඒක ක්‍රියාත්මකකරන්න තමයි මම පොදු සැලසුම් ක්‍රියාත්මක කරලා තියෙන්නේ ඒ අනුව ඉතින් කටයුතු කරනවා සමහර වෙලාවට අනිත් වරෙන්තුකරුවෝ වගේම මේ වරෙන්තුකරුවොත් අපිට මේ දක්වා සොයා ගැනීමට නොහැකි වෙලා තියෙනවා . ස්වාමිනි.

ප්‍ර ඔබගේ මෙම නැගෙනහිර පළාත තුල අන්තවාදය පිළිබඳව හරි කලහකාරී අන්තවාදී තත්වයන් තමා . ඒ සම්බන්ධව ක්‍රියා කිරිමට වෙනම ඒකකයක් ඔබ පිහිටුවලා තිබ්බේ නැද්ද ඒ ගැන සොයලා බලන්න ?

උ නැහැ ස්වාමිනි.

ප්‍ර පොලිස්පතිතුමා ගෙන් C1006 ලේඛනය ලැබුනට පස්සේවත් ඔබ ඒ ගැන විශේෂයෙන් සොයා බැලිමක් කරන්න කොට්ඨාශ Desk එකක් දැම්මේ නැද්ද ?

උ නැහැ ඒක ඉතින් විමර්ෂණ ගොනු අනුව අදාල නියෝජ්‍ය පොලිස්පතිවරයාට වාර්තා ඉදිරිපත් කරනවා . ඒ අනුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා හරහා දිස්ත්‍රික් භාර නිළධාරින් හරහා තමයි ඒ විමර්ශන කටයුතු සිදු කරලා වාර්තා ඉදිරිපත් වෙන්නේ .

සාක්ෂිකරු මාර්ගයෙන් ලකුණු කරන ලද C1006 A දරණ ලේඛනයේ සිංහල පරිවර්තනයක් සකස් කොට කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට

Proofread Secretary Copy
FAIR COMMENT BY JEZEEM

භාෂා පරිවර්තකට නියෝග කරන අතර එසේ ඉදිරිපත් කල පසුව එය C1006 B වශයෙන් ලකුණු කරන බව සටහන් කර තබමි.

සාක්ෂිකරු මුදාහරිමි
කොමිෂන් සභාවේ කටයුතු දිවා ආහාරය සඳහා ප.ව. 2. පසුවි විනාඩි 15 තෙක් කල් තබමි.

****

ඉහත සඳහන් ප්‍රකාශය මා විසින් කියවා බලා තේරුම් ගෙන එම ප්‍රකාශය නිවැරදි බව පිළිගෙන මාගේ අත්සන තබන ලදී.

President Secretary's Copy

FAIR COMMENT BY JEZEEM